බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 7

විනය පිටකයෙහි

04 වන ග්‍රන්ථය

# චූලවග්ගපාළි

(2 කාණ්ඩය)

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන් අග්ගමහාපණ්ඩිත,
**බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක**
මහාස්ථවිරපාදයන් වහන්සේ හා
**පණ්ඩිත උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ**
විසින් කරන ලද සිංහල පරිවර්තනය

ත්‍රිපිටක පරිවර්තන සම්පාදක මණ්ඩලය
විසින් සංශොධිත වැ

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින්
ප්‍රකාශිත යි.**

ශ්‍රී බු. ව. 2557
රාජ්‍ය වර්ෂ. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 7

The Fourth Book in the
**Vinaya-Pitaka**
**4**

# CULLA-VAGGA-PĀLI (II)

With the Sinhala translation by

**The Venerable Aggamahāpandita**
**Balangoda Ānanda Maitreya Mahānāyakathera**
and
**Rev. Pandit Uduwe Janānanda Thera**

Revised and Edited by
**The Editorial Board of**
**The Tripitaka Translation Committee**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama - 12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතෙ කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනෙන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමග කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

2557
2013

## බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වී.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහැල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලීනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශීර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

විනයපිටකෙ

# චුල්ලවග්ගපාළි

දුතියො භාගො

විනයපිටකයෙහි

# චුල්ලවග්ගපාළි

දෙවැනි භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන
# CONTENTS


| | | | | පිටු |
|---|---|---|---|---|
| සංස්කාරක නිවේදනය | ... | .. | ... | xxiii |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය | ... | ... | ... | xxv |
| ප්‍රස්ථාවනා | ... | ... | ... | xxvii |
| සඞ්කේත නිරූපණය | .. | ... | ... | xxxix |
| පාළි හෝඩිය | ... | ... | ... | xxxxi |
| චුල්ලවග්ගපාළි (2 භාගය) විෂය සූචිය | | ... | ... | xxxxiii |
| පෙළ හා පරිවර්තනය | ... | ... | ... | 2 – 599 |
| ගාථාදිපාද – අනුක්කමණිකා | ... | ... | ... | 601 |
| සඤ්ඤානාම – අනුක්කමණිකා | ... | ... | ... | 603 |
| විසෙසපදානුක්කමණිකා | ... | ... | ... | 607 |

# සංස්කාරක නිවේදනය

චුල්ලවග්ගපාළිය සියබසට නඟාලීමෙහි ලා කියයුතු දෑය මෙහි ප්‍රථම කාණ්ඩයෙහි කෙටියෙන් ඇතුළත් කොට පළකරන ලදී. ත්‍රිපිටක මණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක **ලබුගම සිරි ලඞ්කානන්ද** මහානායක හිමිපාණන්ගේ ඒ ලිපිය මෙහි ලා ප්‍රමාණ වෙති යි සිතම්හ. පළවන මේ දෙවන කාණ්ඩයෙහි **වත්තක්ඛන්ධකය අවසන්** කොට ඇත්තේ **අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය** මහානායක හිමිපාණන්ගේ පරිවර්තන වෙයි. එතැන් සිට අවසානය දක්වා **පණ්ඩිතාචාර්ය උඩුවේ ජනානන්ද** ස්ථවිරයන් වහන්සේගේ පරිවර්තන වෙයි.

මේ සත්ක්‍රියායෙහි ලා ශ්‍රී ලඞ්කා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයෙහි ශ්‍රීමත් **ජනාධිපති ජේ. ආර්.** ජයවර්ධන උතුමාණන්ගේ හා අග්‍රාමාත්‍ය **ආර්. ප්‍රේමදාස** මැතිතුමන්ගේ හා **සංස්කෘතික ඇමැති ඊ. ඇල්. බී. හුරුල්ලේ** මැතිතුමන්ගේ හා අනුග්‍රහය ද සංස්කෘතික අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම් **සෝමපාල ජයවර්ධන** මහතාණන් ඇතුළු පින්වතුන් දක්වාලූ සහාය ද ඉතා අගය කොට සලකම්හ. මෙසේ මේ විනය-ග්‍රන්ථය සියබසින් තැබීම නිසා ලත් පින අප හැමට නිවන් පිණිස පවතීවයි පතම්හ.

ශාසනස්ථිති කැමැති

**කෝදගොඩ ඤාණාලෝක නායකස්ථවිර**

**ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙහි සභාපති**

1983/2525 ජනවාරි 13 දින

**කොළඹ 7, විජේරාම මාවතේ,**

**අංක 115 දරන, මහානායක චාරිකාරාමයේ**

**ත්‍රිපිටක මණ්ඩලය.**

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අභංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය, කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලඞ්කාර ත්‍රිපිටකවාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී-කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ, මාකඩවර විහාරාධිපති, ශ්‍රී රේවත පරිවෙණාධිපති, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති, රාජකීයපණ්ඩිත, කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්‍ය්‍ය, ශාස්ත්‍රාචාර්‍ය්‍ය, රාජකීය පණ්ඩිත, උඩුවේ ඥානානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# ප්‍රස්තාවනා

අප සර්වඥයන් වහන්සේ බුද්ධත්වයට පැමිණ දම්සක් පැවැත්වීමෙන් පසු අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් ප්‍රමුඛ පඤ්චවර්ගීය භික්ෂූන් වහන්සේගෙන් ආරම්භ වූ ශ්‍රාවක පිරිස ක්‍රමයෙන් දහස් ගණනින් වර්ධනය විය. ඒ ආදිම අවධියෙහි හෙවත් ප්‍රථම බොධියෙහි ශ්‍රාවකයන් වහන්සේ අතර ශ්‍රමණධර්ම ව්‍යතික්‍රමණයක් නො වූ හෙයින් ශාසනය නිරවුල් ව (නිරබ්බුද ව) පැවැති හෙයින් ශික්ෂාපද පැනවීමක් හෝ පාමොක් උදෙසීමක් (ආණාපාතිමොක්ඛුද්දෙසයක්) නො වීය. එකල උදෙසන ලද්දේ “ඛන්ති පරමං තපො” ආදි ගාථා තුනෙන් යුත් ඕවාදපාතිමොක්ඛය පමණි.

සියලු බුදුවරුන්ගේ අවවාද ප්‍රාතිමොක්ෂය වන්නේ මේ ‘ඛන්ති’ ආදි ගාථා තුන ම ය. දීර්ඝායුෂ්ක බුදුවරුන්ගේ ශාසන පර්‍යන්තය දක්වා ද අල්පායුෂ්ක බුදුවරුන්ගේ ප්‍රථම බොධියෙහි ද මේ අවවාද ප්‍රාතිමොක්ෂය උදෙසනු ලැබේ. ශික්ෂාපද පැනවීමේ පටන් ආණාපාතිමොක්ඛය උදෙසනු ලැබේ. එ ද භික්ෂූන් විසින් පමණකි. බුදුවරු නො උදෙසත්. එහෙයින් අප භාග්‍යවතුන් වහන්සේ ද ප්‍රථම බොධියෙහි විසි වසක් පමණ මේ අවවාද ප්‍රාතිමොක්ෂය උදෙසූ සේක. “සබ්බබුද්ධානං හි ඉමා තිස්සො ඔවාදපාතිමොක්ඛගාථායො හොන්ති. තා දීඝායුකබුද්ධානං යාව සාසනපරියන්තා උද්දෙසමාගච්ඡන්ති, අප්පායුකබුද්ධානං පඨමබොධියංයෙව. සික්ඛාපදපඤ්ඤත්තිකාලතො පන පභුති ආණාපාතිමොක්ඛමෙව උද්දිසීයති. තං ච ඛො භික්ඛූයෙව උද්දිසන්ති. න බුද්ධා, තස්මා අම්හාකම්පි භගවා පඨමබොධියං වීසතිවස්සමත්තමෙව ඉදං ඔවාදපාතිමොක්ඛං උද්දිසි.” යනු සමන්තපාසාදිකා විනය අටුවා යි. ඉන් පසු එක් පොහෝ දිනෙක සැවැත්නුවර මිගාරමාතු පාසාද නම් වූ පූර්වාරාමයෙහි රැස් වූ භික්ෂූන් අතර සිටි අභව්‍ය පුද්ගලයකු නිසා ඇති වූ සිද්ධියේ දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා “නදානාහං භික්ඛවෙ ඉතො පරං උපොසථං කරිස්සාමි පාතිමොක්ඛං උද්දිසිස්සාමි, තුම්හෙවදානි භික්ඛවෙ ඉතො පරං උපොසථං කරෙය්‍යාථ, පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථ. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං තථාගතො අපරිසුද්ධාය පරිසාය උපොසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍යා”යි. (චුල්ලවග්ග පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධක) “මහණෙනි, දැන් මෙයින් මතු මම් පොහෝ නො කරන්නෙමි පාමොක් නො උදෙසන්නෙමි. මහණෙනි, තෙපි ම මෙයින් මතු පොහෝ කරවු, පාමොක් උදෙසවු. මහණෙනි, තථාගත තෙම නො පිරිසුදු පිරිසෙහි පොහෝ කරන්නේ ය. පාමොක් උදෙසන්නේ ය යන යමෙක් ඇද්ද මෙය නො කරුණෙකි. වන්නට අවකාශ නැතැ”යි වදළසේක.

මේ කාලය තෙක් ද භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ශික්ෂාපද පනවා නො තිබිණ.

මෙයින් පසු වෙරඤ්ජාවෙහි වස් වසා වැඩ සිටි කාලයෙහි දිනක් සැරියුත් මහතෙරුන් වහන්සේ "ශාසනයෙහි චිරස්ථිතිය පිණිස භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්‍ෂාපද පනවන සේක් නම් මැනවැ"යි අයැද සිටියහ. එහෙත්, "ආස්‍රවස්ථානීය ධර්මයන් සඞ්ඝයා කෙරෙහි පහළ වන තුරු තථාගතයන් වහන්සේ ශික්‍ෂාපද නො පනවනසේක. ශික්‍ෂාපද පැනවීම සඳහා ශාස්තෲන් වහන්සේ සුදුසු කල් දන්නාසේක. එතෙක් පොරොත්තුවන්නැ"යි වදරා සැරියුත් තෙරුන්ගේ ඇරයුම වළක්වාලූසේක.

වෙරඤ්ජාවෙහි වස් කාලයෙන් පසු චාරිකාවෙහි වැඩි භාග්‍යවතුන් වහන්සේ සොරෙය්‍ය, සඞ්කස්ස, බාරාණසී ආදි නගරවල චාරිකා කොට විසාලාවට පැමිණ මහාවනයෙහි කූටාගාරශාලාවෙහි වැඩ විසූ සේක. එහි දී සුදින්න කලන්‍දපුත්‍ර නම් භික්‍ෂුවගේ ව්‍යතික්‍රමණය කරුණු කොට ප්‍රථම පාරාජිකා ශික්‍ෂාපදය පැනවූ සේක.

දශවිධ හිත විශේෂයන්ගේ නිෂ්පත්තිය පිණිස භාග්‍යවතුන් වහන්සේ ශික්‍ෂාපද පනවන්නාහ. එනම්:- සඞ්ඝයාගේ හිත සුව පිණිස, සඞ්ඝයාගේ පහසු බව පිණිස, දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහය පිණිස, ප්‍රියශීල භික්‍ෂූන්ගේ ඵාසුවිහරණය පිණිස, මෙලොව දී පැමිණියැ හැකි දුක් දුරුකිරීම පිණිස, පරලොව දී පැමිණෙන දුක් නැසීම පිණිස, නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස, පහන් වූවන්ගේ වැඩියක් පැහැදීම පිණිස, සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස, විනයානුග්‍රහය පිණිස යන මේ දශය යි.

(බු.ජ. පාරාජිකපාළි 49 පිට)

මෙතැන් පටන් ශ්‍රාවක සඞ්ඝයා කෙරෙහි ඇති වූ විවිධ ව්‍යතික්‍රමණ කරුණු කොට භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්‍ෂාපද පනවන ලදහ. ශික්‍ෂාපද පැනවීමෙ දී භාග්‍යවතුන් වහන්සේ සඞ්ඝයාගේ අභිවෘද්ධිය පමණක් නො ව සාමාන්‍ය ජනතාවගේ දෝෂාරෝපණ ගැන ද විශේෂයෙන් අවධානය යොමු කළ බව නිදන කථාවන්ගෙන් හෙළි-වෙයි. එහෙයින් ඉහත කී දශ කරුණෙහි නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හා පහන් වූවන්ගේ වැඩියක් පැහැදීම පිණිස යන දෙකරුණ හැම කල්හි ශ්‍රාවකයන් විසින් වෙසෙසින් සැලකියයුතු වෙයි.

මෙසේ පනවන ලද ශික්‍ෂාපද සමූහය ද ඒ හා සම්බන්ධ නිදන ආදි විස්තර කථා ද විශේෂයෙන් හදළ ශ්‍රාවකයන් වහන්සේ බුද්ධ කාලයෙහි ම විසූහ. විනයධරා, උභයානි පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි ආදි විශෙෂණ පදවලින් ඒ බව හෙළි වෙයි.

විනයධාරීන් කෙරෙහි අගතැන් ලැබුවාහු ක්ෂීණාස්‍රව උපාලි මහතෙරණුවෝ ය.

ප්‍රථම සංගීතියෙහි දී කරුණු සංග්‍රහ කිරීම වශයෙන් පාරාජික පාළි, පාචිත්තිය පාළි, මහාවග්ගපාළි, චූලවග්ගපාළි පරිවාරපාළි යැ යි ග්‍රන්ථ පසෙක්හි ලා විනය සංග්‍රහ කරන ලදි. වැළිදු විභඞ්ග

ඛන්ධක පරිවාර වශයෙන් කොටස් තුනකට ද විනය පිටකය බෙද දක්වනු ලැබේ. මහාවග්ග හා චූලවග්ග ඛන්ධක කොටස වෙයි. මෙහි පරිච්ඡෙද හෙවත් කොටස් වෙන් කොට ඇත්තේ ඛන්ධක නාමයෙනි. එක් ශීර්ෂයකට සම්බන්ධ කරුණු රැසක් රාශීභූත වන හෙයින් ඛන්ධක නාමය ව්‍යවහාර කරනලද යි සිතිය හැක්ක. ක්‍ෂුද්‍ර වස්තු රැසක් රාශීභූත වූ හෙයින් ඛුද්දකවත්ථුක්ඛන්ධක යැ යි ව්‍යවහාර කිරීම උචිත ය. සෙසු ඛන්ධක ගැන ද මේ නයින් ම සැලකිය හැකි වෙයි. පැවිදි උපසම්පද ආදි භික්‍ෂුජීවිතයෙහි ප්‍රධාන කරුණු සංගෘහීත හෙයින් මහාවග්ග යැ යි ද ප්‍රධානත්වයෙන් එයට අඩු වූ කරුණු සංගෘහීත හෙයින් චූලවග්ග යැ යි ද නම් කරන ලද සේ පෙනෙයි, ඛන්ධකවල ප්‍රමාණය වශයෙන් කුදු මහත් බවක් දක්වීමට ද ඉඩ නැත්තේ නො වේ.

මේ ග්‍රන්ථ දෙකෙහි ම විනය කරුණු වශයෙන් ඇත්තේ ඛන්ධක දශය බැගිනි. ප්‍රථම ද්විතීය සංගීති පිළිබඳ විස්තර ඇතුළත් පඤ්චසතික සත්තසතික ඛන්ධක දෙක බුද්ධදේශනා නො වන හෙයිනුත් විනයසංගීතියැ යි නම් කරන ලද හෙයිනුත් ඒ ඒ සංගීති අවසානයෙහි චූලවග්ගයේ අගට එක් කොට ඇති හෙයින් වර්තමාන චූලවග්ගයෙහි ඛන්ධක දෙළසෙකි.

## ඇතුළත් කරුණු:-

1. **කම්මක්ඛන්ධකය:-** තජ්ජනීය කම්ම, නියස්ස කම්ම, පබ්බාජනීය කම්ම, පටිසාරණීය කම්ම, ආපත්ති නො දැක්මෙහි උක්ඛෙපනීය කම්ම, ඇවතට පිළියම් නො කිරීමෙහි උක්ඛෙපනීය කම්ම, පාපදෘෂ්ටි නො හැරීමෙහි උක්ඛෙපනීය කම්ම යන සත් වැදෑරුම් කර්ම මෙහි විභාග කරන ලද්දේ ය.

2. **පාරිවාසිකක්ඛන්ධකය:-** පරිවාස, මූලායපටිකස්සන, මානත්ත, අබ්භාන යන විනයකර්මයන් පිළිබඳ වත් හා සමාදනවිධි මේ ඛන්ධකයෙහි විස්තර වේ.

3. **සමුච්චයක්ඛන්ධකය:-** සඞ්ඝාදිසෙස ආපත්තීන්ගේ පටිච්ඡන්නාපටිච්ඡන්න බව ආපත්ති සමොධාන පරිවාසදන මානත්තදන මූලායපටිකස්සන අබ්භාන යන විනයකර්මයන් පිළිබඳ විසුද්ධි අවිසුද්ධිතා ආදි විස්තර මෙහි දැක්වේ.

4. **සමථක්ඛන්ධකය:-** සම්මුඛාවිනයෙන් අධිකරණ වූපසමනය, දබ්බමල්ලපුත්ත තෙරුන්ට සතිවිනය දීම, ගග්ගභික්‍ෂුවට අමූළ්හවිනය දීම, පටිඤ්ඤාත කරණ, යෙභුය්‍යසිකා, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරක යන සත් වැදෑරුම් අධිකරණසමථ ද විවාදධිකරණ අනුවාදධිකරණ ආපත්තාධිකරණ කිච්චාධිකරණ යන අධිකරණ සතර ද, අධිකරණසමථය ද මෙහි වදරන ලද්දේ ය.

5. **ඛුද්දකවත්ථුක්ඛන්ධකය:-** ස්නානය, විවිධ ආභරණ දැරීම, හිසකෙස් හා මුහුණ සැරසීම, නෘත්‍යගීතාදි දර්ශනය, ගීතස්වරයෙන් දහම් දෙසීම, සරභඤ්ඤය, එළ පරිභොගය ඛන්ධපරිත්ත (සර්පයන් කෙරෙහි මෙත් වැඩීම), පාත්‍රය පිළිබඳ ශික්‍ෂා, චීවරකර්මය හෙසජ්ජත්ථවික,

උපාහන ඡවික, පරිස්සාවන, චඞ්කමන, ජන්තාඝර, උද්‍යානසාලා, පත්තනිකුජ්ජන හා පත්තුක්කුජ්ජන කර්ම, බොධිරාජකුමාර වස්තුව, චෙලපත්තිකා, පාදසංඝනී, විසාඛාවස්තුව, විධූපන, ඡත්ත, දණ්ඩ සම්මුතිය (දණ්ඩක් පාවිච්චිකිරීමට සඞ්ඝසම්මුතිය ලැබීම.) නඛච්ඡේදන, කෙසච්ඡේදන, කණ්ණමලහරණී, ලොහභණ්ඩ, කායබන්ධන, ගණ්ඨිපාස, ගිහිනිවත්‍ථ, දන්තකට්ඨ, දවාලිම්පන (කැලෑ ගිනිතැබීම), ගස්නැඟීම, බුද්ධවචනය ඡන්දසට නැඟීම, ලොකායත ශාස්ත්‍ර හැදෑරීම, තිරච්ඡානවිජ්ජා, කිඹිසීමෙහි ආශිර්වාද කිරීම, ලුහුනු කෑම, පස්සාවකුටි, වච්චකුටි, මාලාවච්ඡරොපණ ආදි විවිධ අනාචාර, දරුභණ්ඩ, මත්තිකාභණ්ඩ යන කරුණු පිළිබඳ ශික්‍ෂා විභාග මේ ඛන්ධකයෙහි විස්තර වෙයි.

**6. සෙනාසනක්ඛන්ධකය:-** විහාර අනුදැනීම, රජගහ සිටාණන් එක් දිනක ම විහාර සැටක් කරවීම, විහාරදානානිසංස, විහාරයෙහි දෙර කවුළු, ඇඳ, පුටු, මෙට්ට, කොට්ට, බිත්ති, බිම, පැන්හල, ගිනිහල යන දැය ද, අනේපිඩු සිටුතුමා බුදුන් හමුවීම, දෙව්රම් වෙහෙර කරවීම, නවකම්ම සම්මුතිය, වඩ්ඪාපචායනය, වන්දියාවන්දිය පුද්ගලයන්, ජේතවනය සඟසතු කොට පිදීම, සෙනාසනගාහාපක, අවිස්සජ්ජනීය වස්තු, කීටාගිරියෙහි අස්සජි පුනබ්බසුක භික්‍ෂූන් අගසවු දෙනමට සෙනසුන් නො පැනවීම, කලුරිය කළ භික්‍ෂු ආදීන්ගේ නවකම් පිළිබඳ අයිතිය, භත්තුද්දෙශක, සෙනාසන පඤ්ඤාපක, භාණ්ඩාගාරික, චීවරපටිග්ගාහක, චීවරභාජක, යාගුභාජක, ඛජ්ජභාජක, අප්පමත්තක විසජ්ජක, පත්තගාහාපක, ආරාමිකපෙසක, සාමණෙරපෙසක යන මාතෘකාවන්ගේ විස්තර හා ශික්‍ෂාවිභාග මේ ඛන්ධකයෙහි ඇතුළත් වෙයි.

**7. සඞ්ඝභෙදකක්ඛන්ධකය:-** අනුපිය නම් මල්ලයන්ගේ නියම්ගමෙහි දී භද්දිය ආදි ශාක්‍ය කුමරුන් හා උපාලි පැවිදි වීම, දෙව්දත් අජාසත් කුමරු පහදවා ගැනීම, දෙව්දත් ඍද්ධියෙන් පිරිහීම, දෙව්දත්හට මහත් ලාභ සත්කාර ඇතිවීම දෙව්දතුගේ පළමු ආඝාතය (සඞ්ඝයා පරිහරණයට ඉඩ නො ලැබීම), බුදුන්ගේ නියමයෙන් රජගහනුවර දී දෙව්දත්හට පකාසනීය කර්මය කිරීම, දෙව්දත් අජාසත් කුමරු ලවා පියා මැරවීම, දුනුවායන් යෙදවීම, ගිජුකුළු පව්වට නැඟී බුදුන් මුදුනට ගලක් පෙරළීම, පඤ්චවිධ ශාස්තෘවරු, බුදුන් නැසීමට නාලාගිරි ඇතු මෙහෙයැවීම, පඤ්චවර යැදීම, සඞ්ඝයා භෙද කොට වෙන ම උපොසථය හා සඞ්ඝකර්ම කරන බව ප්‍රකාශ කිරීම, සඞ්ඝභෙදය කොට පිරිස රැගෙන ගයාශිර්ෂයට යෑම, අගසවු දෙනම ඒ පිරිස රැගෙන පෙරළා බුදුන් වෙත පැමිණීම, දූතකාර්‍ය්‍යයට සුදුසු භික්‍ෂුවගේ අඞ්ග, දෙව්දත්ගේ අතෙකිච්ඡවූ අසද්ධර්ම, සඞ්ඝරාජි, සඞ්ඝභෙද, සඞ්ඝසාමග්ගි, පිළියම් නො කළ හැකි හා කළ හැකි සඞ්ඝභෙදක යන කරුණු පිළිබඳ දෙසනා මේ ඛන්ධකයෙහි ඇතුළත් වෙති.

**8. වත්තක්ඛන්ධකය:-**

ආගන්තුක වත, ආවාසික වත, ගමික වත, අනුමොදනික වත, භත්තග්ග වත, පිණ්ඩචාරික වත, ආරඤ්ඤික වත, සෙනාසන වත, ජන්තාඝර වත, වච්චකුටි වත, උපජ්ඣාය වත (සද්ධිවිහාරික විසින් උපජ්ඣායයන් කෙරෙහි පැවතියයුතු වීධි), සද්ධිවිහාරික වත, (උපජ්ඣායයන් විසින් සද්ධිවිහාරික කෙරෙහි පැවතියයුතු වීධි), ආචරිය වත, අන්තෙවාසික වත යන වත් පිළිබඳ දෙශනාවෝ මේ ඛන්ධකයෙහි ඇතුළත් වෙති.

## 9. පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකය:-

සැවැත් නුවර පූර්වාරාමයේ දී එක් පොහෝ දිනෙක භික්ෂූන් රැස්ව සිටි නමුත් භාග්‍යවතුන් වහන්සේ පාමොක් නො උදෙසීම, මහමුගලන් තෙරුන් වහන්සේ ඒ සඞ්ඝයා අතර සිටි අභව්‍ය පුද්ගලයා අතින් ගෙන බැහැර කිරීම, මහාසමුද්‍රයෙහි ආශ්චර්‍ය්‍යධර්ම අට, ශාසනයෙහි ආශ්චර්‍ය්‍යධර්ම අට, බුදුන් උපොසථය නො කිරීමට තීරණය කිරීම හා උපොසථය කිරීමට භික්ෂූන්ට නියම කිරීම, අධම්මික පාතිමොක්ඛට්ඨපන, දසවිධ අන්තරාය, ධම්මික පාතිමොක්ඛට්ඨපන, අත්තාදානය, චොදක විසින් ද චුදිත විසින් ද සිහි කළයුතු කරුණු මේ ඛන්ධකයෙහි දැක්වේ.

## 10. භික්ඛුනී ඛන්ධකය:-

මහාපජාපතී ගොතමී අෂ්ටගරුධර්ම පිළිගැනීම හා පැවිදි උපසම්පද ලැබීම, භික්ෂුණී ශාසනය ආරම්භ වීම, සද්ධර්මයාගේ චිරස්ථිතිය, භික්ෂුණීන්ගේ පාමොක් උදෙසීම, ඡබ්බග්ගියභික්ෂුණීන්ගේ අනාචාර ක්‍රියා, අවන්දිය පුද්ගලයෝ, භික්ෂුණීන්ට අවවාද දීම, භික්ෂුණීන්ගේ විවිධ අසංවර ක්‍රියා, කලුරිය කළ භික්ෂුණී ආදීන්ගේ පිරිකර පිළිබඳ අයිතිය, භික්ෂුණීන්ට අවශ්‍ය විශෙෂ පරිෂ්කාර අනුදැනීම, භික්ෂුණීන්ගේ උපසම්පදාව, පවාරණය, දූතෙන උපසම්පද, ගැබ්ගැනීම හා දරුවන් ලැබීම, ස්නානය පිළිබඳ ශික්ෂාවෝ මෙහි වෙති.

## 11. පඤ්චසතිකක්ඛන්ධකය:-

සුභද්‍ර වුඩ්ඪපබ්බජිතගේ පුවත, සඞ්ගායනාවට භික්ෂූන් තෝරා ගැනීම, ආනන්ද හිමියන් රහත් වීම, මහාකාශ්‍යප තෙරුන් වහන්සේ ප්‍රධාන සඞ්ඝයා රජගහ නුවර වස් වසා ධර්මවිනය සංගායනා කිරීම, ඛුද්දානුඛුද්දක සික්ඛාපද පිළිබඳ සාකච්ඡා, ආනන්ද හිමියන්ට භික්ෂූන් වහන්සේ දෙස් නැඟීම, පුරාණ තෙරුන්ගේ පුවත, උදෙන රජු හා ආනන්ද හිමියන්ගේ සාකච්ඡාව, ඡන්න තෙරුන්ට බ්‍රහ්මදණ්ඩය පැනවීම යන කරුණු මෙහි සඞ්ග්‍රහ වෙති.

## 12. සත්තසතිකක්ඛන්ධකය:-

වජ්ජිපුත්‍රක භික්ෂූන් විසාලාවෙහි අකැප දශවස්තු ප්‍රකාශ කිරීම, යස තෙරුන් එහි වැරදි දැක්වීම, වජ්ජිපුත්‍රක භික්ෂූන් යස තෙරුන්ට පටිසාරණීය කර්මය කිරීම, අනුදූතයා සමග ගොස් යස තෙරුන් විසාලා වැසියන්ට කරුණු දැක්වීම යස තෙරුන්ට උක්ඛෙපනීය කර්මය කරන්ට සූදනම් වූ විට උන්වහන්සේ අහසින් කොසඹෑ නුවරට වැඩීම, එහි දී පාවෙය්‍යක හා අවන්ති දක්ඛිණාපථක භික්ෂූන්ට පණිවිඩ යැවීම, යස තෙරුන් සාණවාසි සම්භූත තෙරුන් හමු වීම, පාවෙය්‍යක හා අවන්ති-දක්ඛිණාපථක භික්ෂූන් අහොගඞ්ග පර්වතයට රැස්වීම, රේවත තෙරුන් හමු වී දශවස්තුව විමසීම, පාචීනක පාවෙය්‍යක භික්ෂූන් අතුරෙන් ධර්මවාදීහු කවරහු දැ'යි සාළ්හ තෙරුන් විමසා බැලීම, සුද්ධාවාස බ්‍රහ්මයකුගේ ප්‍රකාශය, වජ්ජිපුත්‍රක භික්ෂූන් රේවත තෙරුන්ගේ උපස්ථායක උත්තර තෙරුන්ට (අල්ලස් වශයෙන්) පිරිකර දී රේවත තෙරුන් පක්ෂ කරගැනීමට වෑයම් කිරීම, සඞ්ඝයා රැස්වී අධිකරණ විනිශ්චයට සූදනම් වීම, සබ්බකාමී තෙරුන්

වෙත යෑම, උබ්බාහිකා ක්‍රමයෙන් විනිශ්චයට සම්මත කිරීම, විසාලා නුවර වාලිකාරාමයේ දී අධිකරණය විනිශ්චය කිරීමට ඇරඹීම, රේවත තෙරුන් සබ්බකාමී තෙරුන්ගෙන් දශවස්තුව විමසීම, සබ්බකාමී තෙරුන් කරුණු දක්වා විසඳීම, තෝරාගත් අටනම ඉදිරිපිට දී විසඳා යළි සභ මැද ද එසේ ම විමසීම හා විසඳීම ද මේ ඛන්ධකයෙහි ඇතුළත් වේ.

**විශේෂස්ථාන: සමුච්චයක්ඛන්ධකය.**

අබ්භාන කර්මය සඳහා වත් මානත් පිරීම පිණිස සඞ්ඝාදිසේසාපත්ති සමෝධානය නිවැරදි ව කළ යුත්තකි. මේ කාරණයෙහි දී මූලායපටිකස්සනය පිළිබඳ අට්ඨකථා විවරණය මෙසේ යි: "ඉදින් අනන්තරාපත්තිය මුල් ආපත්තියට ද වඩා පටිච්ඡන්න වූ නම් එහි දී කුමක් කළ යුතු ද' යි කී කල්හි මහාසුමන (සුමම) තෙරුන් වහන්සේ "මේ පුද්ගලයා පිළියම් නො කළ හැක්කෙකි. ඒ බව හෙළි කොට හළ යුත්තෙකැ'' යි කීහ. මහාපදුම තෙරුන් වහන්සේ මෙසේ කීහ:

"කවර හෙයින් අතෙකිච්ඡ නම් වේ ද? මේ සමුච්චයක්ඛන්ධකය නම් බුදුන් වැඩසිටි කාලය හා සමාන නො වේ ද? ආපත්තිය පටිච්ඡන්න හෝ අපටිච්ඡන්න හෝ සමක ඌනකතර අතිරේක පටිච්ඡන්න හෝ වේවා, කර්මවාක්‍යය යොදගැනීමට විනයධර තෙරුන්ගේ හැකියාව ම මෙහි පමණ වෙයි. එහෙයින් අතිරේක පටිච්ඡන්නාපත්තිය මූලාපත්තිය කොට සෙස්ස එහි සමෝධානය කොට පිරිවෙස් දියයුතු'' යි.

"කස්මා අතෙකිච්ඡො නාම, නනු අයං සමුච්චයක්ඛන්ධකො නාම බුද්ධානං ඨිතකාලසදිසො? ආපත්ති නාම පටිච්ඡන්නා වා හොතු අපටිච්ඡන්නා වා හොතු සමක ඌනකතර අතිරේක පටිච්ඡන්නා වා විනයධරස්ස කම්මවාචං යොජෙතුං සමත්ථභාවොයෙවෙත්ථ පමාණං, තස්මා යා අතිරේකපටිච්ඡන්නා හොති, තං මූලාපත්තිං කත්වා තත්ථ ඉතරං සමොධාය පරිවාසො දාතබ්බො'' ති. (ස. පා. 876) සමුච්චයක්ඛන්ධකයෙහි හා විනයධරත්වයෙහි මහඟුබව මෙයින් පළ වෙයි.

**අගසවු දෙනමට ගැරහීම:**

දිවි පැවැත්ම සඳහා ම අගසවු දෙනම වෙත පැවිදි වැ සිටි සවග මහණුන් අතුරෙහි දෙනමක් වූ අස්සජි-පුනබ්බසුක භික්ෂු එක් සමයෙක කීටාගිරියෙහි විසූහ. එකල අගසවු දෙනම හා පන්සියයක් පමණ භික්ෂු සඞ්ඝයා සමග බුදුන් වහන්සේ කීටාගිරියට වැඩි සේක. එපවත් ඇසූ අස්සජි-පුනබ්බසුක භික්ෂු සඟසතු සියලු සෙනසුන් තම පිරිස අතරේ බෙද වෙන් කොට ගෙන මෙසේ පැවසූහ. "ස්වාගතං ආවුසො භගවතො යස්මිං විහාරෙ භගවා ඉච්ඡිස්සති තස්මිං විහාරෙ වසිස්සති, පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපකානං ඉච්ඡානං වසංගතා. න මයං තෙසං සෙනාසනං පඤ්ඤපෙස්සාම'' "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට යහපත් පැමිණීමක් වේවා. යම් වෙහෙරෙක විසීමට භාග්‍යවතුන් වහන්සේ කැමති සේක් ද ඒ වෙහෙරෙහි වසන සේක්වා. සැරියුත් මුගලන් දෙදෙන පව්ටු අදහස් ඇත්තෝ ය. පව්ටු ඉච්ඡාවන්ගේ වසඟයට ගියෝ ය.

අපි ඔවුනට සෙනසුන් නො පනවන්නෙමු''යි. අගසවු දෙනමට මේ බරපතල චෝදනාත්මක අපහාසය කළේ තමන්ගෙන් ම පැවිද්ද ලබා ගත් ශිෂ්‍යයන් දෙනමක් විසිනි. එ ද දිවමන් බුදුන් වැඩ සිටිද්දී ය. භික්ෂූන් වහන්සේ විවේචනය කරනුවන්ගේ අවධානය යොමුවියයුතු තැනෙකි.

### දෙව්දත් පුවත

දෙව්දත් තෙරුන් පිළිබඳ වැදගත් කරුණු රැසක් සඞ්ඝභේදක ඛන්ධකයෙහි දක්වෙයි. පැවිදි ව පෘථග්ජන ඍද්ධියක් ලබාගත් දෙව්දත් තෙර අජාසත් කුමරු පහදවාගෙන ලාභසත්කාර ලබමින් රාජවල්ලභ විය. එහෙයින් නාලාගිරි ඇතු බුදුන් නැසීමට මෙහෙයවීම සඳහා ඇත්ගොව්වන් වෙත ගොස් මෙසේ කීය: ''කොලෙනි, රජු හා සම්බන්ධකම් ඇති අපි වනාහි පහත් තැන සිටින්නහු උසස් තැන තබන්නටත් බත් වැටුප් වැඩි කරවා ලන්නටත් ප්‍රතිබලවම්හ''. ''මයං ඛො භණෙ රාජඤ්ඤතකා නාම පටිබලා නීචට්ඨානීයං උච්චෙ ඨානෙ ඨපෙතුං භත්තම්පි වෙතනම්පි වඩ්ඪාපෙතුං'' යනු කීය. රාජවල්ලභ වූ කල යුතු අයුතුකම් නොසලකා කැමැති යම් මැ දයක් රජයෙන් කරවාගත හැකිබව මේ කී සැටිය. මෙය කවදත් සමාජයෙහි බෙහෙවින් සිදුවන කරුණෙකි.

බුදුන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේ ලවා රජගහනුවර දී දෙව්දත්හට පකාසනීය කර්මය කරවීම ද විශේෂයෙන් දක්වියයුතු කරුණෙකි. එහි ලා මෙසේ දක්වෙයි: ''යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො දෙවදත්තො ව තෙන දට්ඨබ්බො'' යි ''දෙව්දත් කයින් වචනයෙන් යමක් කෙරේ ද එයින් බුදුන් වහන්සේ හෝ ධර්මය හෝ සඞ්ඝයා හෝ නො දතයුතු ය. දෙව්දත් ම එයින් දතයුතු ය'' යි මෙයින් කියැවෙයි. දෙව්දත්ගේ නො මනා කම්වලට බුද්ධාදි තෙරුවන්ගේ වගකීමක් නැති බව මෙහි අදහස ය. ඇතැම් භික්ෂු කෙනකුන්ගේ ඇතැම් ක්‍රියා නිමිති කොට සසුන් ගරහන බාල දනහට මෙය මනා උපදෙසක් වියයුතු ය.

### සංඝභෙද ආනන්තරියකර්මය

දෙව්දත් බුදුන්ගේ සිරුරෙහි ලේ සෙලවීමෙන් පළමු ආනන්තරිය කර්මය සිදු විය. ඒ බැව් බුදුන් වහන්සේ විසින් ම මෙසේ වදරන ලද්දේය. ''ඉදං භික්ඛවෙ දෙවදත්තෙන පඨමං ආනන්තරියකම්මං උපචිතං යං දුට්ඨචිත්තෙන වධකචිත්තෙන තථාගතස්ස රුහිරං උප්පාදිතං.'' ''මහණෙනි, යම් හෙයෙකින් දෙව්දත් විසින් දුෂ්ටසිතින් වධක සිතින් තථාගතයන් වහන්සේගේ රුධිරය නගන ලද ද (එහෙයින්) මේ පළමු ආනන්තරිය කර්මය රැස් කරන ලද්දේ යැ යි'' ආනන්තරිය කර්මය අනුලොමපාරාජිකා හෙයින් ද බිම්සර රජු මරවන ලද හෙයින් ද ප්‍රකෘති භික්ෂුවක් විසින් ම සඞ්ඝභෙදය කළ හැකි හෙයින් ද දෙව්දත්හට සඞ්ඝභෙද කර්මය කෙසේ සිදුවී ද යි ප්‍රශ්නයෙකි. විනය අටුවාහි මෙය මෙසේ පැහැදිලි කොට ඇත. ''ඇණවීම වැරද වූ බැවින් රජු මැරවීමෙක් නැත. රුධිරොත්පාදන හේතුවෙන් දෙව්දතුගේ අභව්‍යතාව බුදුන් විසින් නො වදරන ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේගේ

ප්‍රඥප්තියක් නැති ව ඔහට අභව්‍යතාව ආරොපණය නො කළ හැකි ය. "මහණෙනි, රුධිරොත්පාදක අනුපසම්පන්නයෙකි. උපසම්පද නො කළ යුත්තෙකි. උපසපන් වූයේ ද නැසිය යුත්තෙකැ'' යි (මහාවග්ග-මහාඛන්ධක) වදරන ලද්දේ සඞ්ඝභෙදයෙන් පසුව ය. එබැවින් ප්‍රකෘති භික්‍ෂුනමක් වූ ම දෙව්දත් විසින් සඞ්ඝභෙදය කරන ලද්දේ ය.

## මාගම් පැවිද්ද

මහාප්‍රජාපතී ගෞතමිය පැවිදි වීමෙන් භික්‍ෂුණීශාසනය ආරම්භ විය. මේ කරුණෙහි ලා සර්වඥයන් වහන්සේ මෙසේ වදාළහ: "ආනන්ද, ඉදින් මාගම තථාගතයන් වහන්සේ විසින් වදරන ලද ධම්විනයෙහි පැවිද්ද නො ලැබි නම් මේ සද්ධර්මය බොහෝ කල් පවත්නේ ය. අවුරුදු දහසක් සද්ධර්මය පවත්නේ ය, යම් හෙයෙකින් මාගම තථාගත ශාසනයෙහි පැවිදි වී ද (එහෙයින්) දැන් සද්ධර්මය පන්සිය වසක් ම පවත්නේ ය'' යි. මෙය උපමා කීපයෙකින් ද විස්තර කොට මහවිලෙක ජලය රඳා සිටීම පිණිස කලින් ම මීයරක් බඳනා සේ අෂ්ටගරුධර්ම පනවන ලදැ යි ද වදාළසේක. වනිතාවන්ට පැවිදි ජීවිතය දුෂ්කර වූ බව භික්‍ෂුණීශාසනය නො බෝ කලෙකින් අවසන් වීමෙන් ම හැඟෙයි. මෙහි ශාසනයේ ආයුෂ්කාලය පිළිබඳ ආචාර්‍ය්‍යවරු විවිධ අදහස් දක්වූහ.

නුපන් වස්තුවෙහි අෂ්ට ගරුධර්මයෝ පනවන ලදහ. එසේ නො පැනවී නම් මාගම් පැවිද්ද නිසා සද්ධර්මය පන්සිය වසක් ම පවත්නේ ය. කලින් ම ගරුධර්ම පැනවූ බැවින් තව පන්සිය වසක් පවත්නේය. එහෙයින් පළමු කී වස් දහසම සදහම් පවත්නේ ය. සිවු පිළිසිඹියා පත් රහතුන්ගේ වශයෙන් මෙහි වස් දහසෙකැ යි කියන ලද. ඉන් මතු ද සුක්ඛවිපස්සකඛීණාසව වශයෙන් දහසක් ද අනාගාමී වශයෙන් දහසක් ද සකදගාමී වශයෙන් දහසක් ද සොතාපන්නවශයෙන් දහසක් දැ යි පස්වාදහසක් කල් ප්‍රතිවෙධ ශාසනය පවත්නේ ය. පර්‍ය්‍යාප්තිය නැති කල්හි ප්‍රතිවෙධය නොවන හෙයින් ද පර්‍ය්‍යාප්තිය ඇති කල්හි ප්‍රතිවෙධය නැති නොවන හෙයින් ද පර්‍ය්‍යාප්තිය ද එකී පස්වාදහස ම පවත්නේ ය. ප්‍රතිපත්තිය අතුරුදහන් වූ පසු ද ශ්‍රමණවේශය බොහෝ කල් පවත්නේ ය යනු විනය අටුවා මතය යි. මෙය ඛන්ධකභාණකයන්ගේ මතය ගෙන කියන ලද්දේ ය. දීඝනිකාය අටුවාහි පටිසම්භිදප්පත්ත ඡළභිඤ්ඤ තෙවිජ්ජ සුක්ඛවිපස්සක පාතිමොක්ඛ වශයෙන් වස් දහස බැගින් පැවති බව කියන ලද්දේය. අඞ්ගුත්තර සංයුත්ත අටුවාහි මෙයට වෙනස් ව කියන ලද්දේ ය ඒ සියල්ල එකිනෙකට විරුද්ධ වුවත් දීඝභාණකයන්ගේ මතය අනුව ලියූ හෙළටුවාහි ආ ක්‍රමයම ගෙන (බුද්ධඝොස) ආචාර්‍ය්‍යයන් විසින් ලියන ලද්දේ ය. මෙබඳු විරොධ කථාවලින් ශාසන පරිහානියක් නො වන හෙයින් ද ඒවා ශෝධනයට උපායක් නැති හෙයින් ද පරමාර්ථයට විරොධ තැන් පමණක් සුත්තාදි ක්‍රමයෙන් සෝධනීය වෙයි. කථා මාර්ගයෙහි විරොධ තැන් නො වේ'' යි විමතිවිනොදනී ටීකාහි කියන ලද්දේ ය.

### භික්ෂුණීන්ගේ නිස්සය හා අකරණීය

“ඉමිස්සා තයො ච නිස්සයෙ අට්ඨ ච අකරණීයානි ආචික්ඛෙය්‍යාථ”යි උපසම්පදව ලද භික්ෂුණියට නිස්සය තුන ද අකරණීය අට ද කියා දියයුතු යැ යි දක්වේ. මේ පිළිබඳ අටුවා විස්තරයක් නැත. එහෙයින් මෙය ඇතැම් කෙනකුට ගැටළුවක් වූ තැනෙකි. විමතිවිනොදනී ටීකාවෙන් මෙයට එළියක් ලැබෙයි. “තයො නිස්සයාති රුක්ඛමූල සෙනාසනස්ස තාසං අලබ්භනතො වුත්තං”යි එහි කියන ලදී. පිණ්ඩියාලොපභොජන පංසුකූලචීවර රුක්ඛමූලසෙනාසන පූතිමුත්තභෙසජ්ජ යි භික්ෂූන් වහන්සේට නිස්සය සතරෙකි. භික්ෂුණීන්ට රුක්ඛමූලසේනාසනය නො ලැබෙන හෙයින් නිස්සය තුනෙකැ’යි වදරන ලද්දේ ය. මේ නයින් ගත් කල භික්ෂූන්ට සිවුපරිජි අකරණීය වෙයි. එසෙයින් ම භික්ෂුණීන්ට පරිජි අට අකරණීය වේ.

### පුරාණ තෙරුන්ගේ පුවත

ස්ථවිර භික්ෂූන් විසින් ප්‍රථම සංගායනාව අවසන් කළ කල්හි දක්ඛිණාගිරියෙහි විසූ පුරාණ තෙරණුවෝ රජගහ නුවර වෙළුවනාරාමයට වැඩ ස්ථවිර භික්ෂූන් හමු වූහ. ස්ථවිර භික්ෂූහු “ඇවැත්නි පුරාණයෙනි, ස්ථවිර භික්ෂූන් විසින් ධර්මය ද විනය ද සංගායනා කරන ලද්දේ ය. එය පිළිගන්නැ”යි කීහ. එබස් අසා පුරාණ තෙරණුවෝ “ඇවැත්නි, ස්ථවිරවරුන් විසින් ධර්මය ද විනය ද මනා ලෙස සංගායනා කරන ලද්දේ ය. තවද මා විසින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි යම්සේ අසන ලද ද පිළිගන්නා ලද ද එපරිද්දෙන් ම මම දරන්නෙමි”යි පැවසූහ. මෙයින් පූරාණ තෙරණුවෝ සංගායනාවට විරුද්ධ වූ ලෙස කෙනෙක් සලකති. එසේ උන් වහන්සේ විරුද්ධ වූහු නම් **‘සුසඞ්ගීත’** යන වචනය නො කියන්නාහු ය. ස්ථවිර භික්ෂූන් විසින් කළ සඞ්ගීතිය උන් වහන්සේ ද මැනවැ යි අනුමත කළහ.

### දෙවැනි සඞ්ගීතිය

දෙවැනි සඞ්ගීතිය පිළිබඳ පුවත ද මතභේදයට හේතු වූ කරුණෙකි. මේ සඞ්ගීතියෙන් පසු භික්ෂුපිරිස නිකාය වශයෙන් කොටස්වලට බෙදිණි. ක්‍රමයෙන් වැඩී ගිය මේ භේදය ලක්දිව ද පැතිර ගියේ ය. එහෙයින් ධම්මරුචික සාගලික නිකායයෝ ලක්දිව ඇති වූහ. මහාවංසටීකායෙහි ඒ බව මෙසේ පැවසේ: “මේ ධම්මරුචිකයෝ නම් අභයගිරිවාසී භික්ෂූහුය. සාගලිකයෝ නම් මහසෙන් රජුගේ ජේතවනවාසී භික්ෂූහු යැ යි දතයුතු ය. ඔවුනතුරෙන් අභයගිරිවාසීහු ලක්දිව සසුන් පිහිටීමෙන් දෙසිය සතළොස් වසක් පමණ ඉක්මගිය කල්හි වළගම්බා රජු සමයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් මනා සම්බන්ධයෙන් යුතු ව දෙසන ලද විනයපිටකයෙන් ඛන්ධක පරිවාර දෙක අර්ථාන්තර පාඨාන්තර කිරීම් වශයෙන් භෙද කොට ථෙරවාදයෙන් බැහැර ව ධම්මරුචිකවාද නම් වූ ජේතවන වාසීහු ද සසුන් පිහිටීමෙන් තෙසිය එක් සාළිස් වසක් ඉක්මගිය කල්හි ජේතවන විහාරය පිහිටුවීමට පෙර ම ධම්මරුචික වාදයෙන් බැහැර ව දක්ඛිණවිහාරයෙහි වැස විනයපිටකයෙන් උභතොවිභංගය

ගෙන අර්ථාන්තර පාඨාන්තර කරණ වශයෙන් එය භෙද කොට සාගලිකවාද නම් වී මහසෙන් රජු විසින් ජේතවන විහාරය කරවූ කල්හි විපුලත්වයට ගියාහු එහි විසූහ. එහෙයින් කියන ලදී මහා වංසයෙහි:-

"ධම්මරුචි සාගලිකා- ලංකාදීපම්හි භින්නකා"යි. (ම.ව.ටීකා ආචරියවාදවණ්ණනා) ලක්දිව ඇති වූ මේ භේදය බොහෝ කලක් පැවති බව ඉතිහාසගත යි.

සංගායනා පිළිබඳ විචාරක මත හා එයට පිළිතුරු ද බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ මහාවග්ග ප්‍රථමභාග ප්‍රස්තාවනායෙහි ආචාර්ය පරවාහැරං සිරි වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් විස්තර වශයෙන් දක්වන ලද්දේ ය. විස්තරාර්ථීන් විසින් එයින් වැඩිදුර විස්තර දත හැකි ය.

විශේෂ වාක් ප්‍රයොග

පාළි භාෂායෙහි දුර්ලභ වචන රාශියක් චූලවග්ගපාළියෙහි සඳහන් වෙයි. භුම්මි- ප්‍රිය වූ ආමන්ත්‍රණයකි. (588) කුල්ලකවිහාරො (සැහැල්ලු විහරණයකි. 588) කලිම්භකං (කිලිඹු තල්කොළ ආදියෙන් කළ මිම්මක් 34) නමතකං (එළලොමින් කළ ඇතිරියක් වැනි දෑයක් 56) මළොරිකං - (ලීයෙන් කළ පාත්‍ර ධාරකය - 56) අඩ්ඪූරකං (යටිබඩෙහි ලෝම සිඳීම - 86) ගාමපොද්දවා (සම පැහැගන්වන ගැමියෝ - 4) පත්තකණ්ඩාලිකා (පාත්‍රය තබන සාල්ලක් 26) විකබලල (මඩ 54) යනාදිය මේ ගණයෙහි ලා දක්විය හැකි ය. ඡවස්ස දරුපත්තස්ස කාරණා (නොවටනා ලී පාත්‍රයක් නිසා) යන තැන ඡව ශබ්දය නො වටනා යන අර්ථයෙහි ද ඡවසීසස්ස පත්තං (මිනී හිස්කබලෙන් කළ පාත්‍රය) යන තැන ඡව ශබ්දය මළසිරුර යන අර්ථයෙහි ද යෙදී තිබේ.

ජනතාසරය පිළිබඳ කරුණු රැසක් මෙහි ඇතුළත්. දැනට මෙය ලක්දිව භාවිතයෙහි නැත.

භික්ෂුණීන් වහන්සේගේ උපාධ්‍යාය තැන ලබන භික්ෂුණී තොමෝ පවත්තිනී නමින් අඳුන්වනු ලබයි. භික්ෂුණිය උභතො සංඝයා කෙරෙහි උපසම්පදාව ලබන බැවින් පවත්තිනී යන්නෙන් භාරකාර තෙනැත්තී යන අදහස පැවසෙතැ යි සිතිය හැකි ය.

තවද ගේදොර, වතුපිටි, දවමුවා, මැටිමුවා, ලෝ මුවා, සෙල්මුවා විවිධ භාණ්ඩ, පාසිවුරු පිළිබඳ විවිධ උපකරණ, පාවහන් තෙල්ගුලා ආදිය ද නානාවිධ විලාසිතා හා ඒ හා සම්බන්ධ උපකරණ ද නෘත්‍ය භෙද යාන භෙද හා වෘක්ෂලතා ද පිළිබඳ පාළිවචන රාශියක් චූලවග්ගයෙහි හමු වෙයි. මෙයින් ඇතැම් වස්තු මෙකල භාවිතයෙහි නොවන හෙයින් ඇතැම් වදනෙක අරුත ද දුරවබොධ ව පවතී.

## ථෙරවාදය

දෙවැනි සංගායනා අවස්ථායෙහි ස්ථවිරවාදයෙන් බැහැර වූ භික්ෂූහු මහාසාඞ්ඝික වාදය ඇති කළහ. එය මතාන්තර හේතුවෙන් යළි යළිත් බෙදී යෑමෙන් නිකායඅටළොසක් වූ බව ඉතිහාසයෙහි කියන ලද්දේ ය. සම්පූර්ණ ත්‍රිපිටකය ප්‍රගුණ නො වීම ඇතැම් ධර්මකොටස්වලට වැරදි අර්ථ දීම මිථ්‍යා අදහස් වැළඳගැනීම ආදි විවිධ හේතු නිසා ඔවුන් එසේ බෙදීගිය නමුත් ප්‍රථම සංගායනාවේ පටන් නියම වාචනා මාර්ගය ප්‍රගුණ කළ ස්ථවිර භික්ෂූන් වහන්සේ එය මැනවින් රැකගත්හ. එහෙයින් ඒ ස්ථවිරවාදයෙන් ලැබුණු තෙවළා දහම මෙකල ද නො නැසී පවත්නා බව සාධූන්ගේ ප්‍රසාදයට කරුණෙකි.

මහ සයුරෙහි මෙන් සසුනෙහි ද ආශ්චර්ය වූ අද්භූත වූ අට වැදෑරුම් ගුණයෙක් වෙයි. එයින් දෙවැන්න දක්වන භාග්‍යවතුන් වහන්සේ "යා මයා මම සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති" (මා විසින් මාගේ සව්වනට යම් සික පදයෙක් පනවන ලද ද මාගේ සව්වෝ දිවි යතක් එය නො ඉක්මෙත්) යි වදාළසේක. ඒ වදාළ පරිද්දෙන් ම උන් වහන්සේ පිරිනිවි පසු මහාකාශ්‍යපාදී සව්වන් වහන්සේ ද බුදුන් පැනවූ සිකපද එසේ ම දරන්නට සම්මත කොටගෙන දිගුකල් සසුන් පැවැත්මට මං සැලසූහ. ඉන් පසු පහළ වූ ශාසනමාමක උතුමන්ගේ ද ශ්‍රද්ධාපූර්වක ධෛර්යය නිසා පිරිසුදු ධර්මවිනය මෙදවස තෙක් පැවත ආයේ ය. එබැවින් ඉහත දැක්වූ පරිදි බුදුන් වහන්සේගේ අදහස අනුව පවතිමින් අනාගයෙහි ද බොහෝ කලක් සස්නෙහි පැවැත්මට හේතු වන අයුරින් ක්‍රියා කිරීම සියලු බුදුසව්වන්ගේ ම යුතුකම වන්නේ ය.

"චිරං තිට්ඨතු ලොකස්මිං සම්මාසම්බුද්ධසාසනං"

05-01-1983

බුද්ධශ්‍රාවක ධර්මපීඨය,

අනුරාධපුර.

මෙයට, සසුන් වැඩ කැමති,

**උඩුවේ ඥානානන්ද ස්ථවිර**

# සංකේත නිරූපණය

සී.මු. } සීහළක්ඛරමුද්දිත චූල්ලවග්ගපාළි
සී. }

ම. } මරම්ම ඡට්ඨසංගීතියා සොධිතපොත්ථකං
ම.ඡ.සං. }

ස්‍යා. - ස්‍යාම - තායක්ඛරමුද්දිතචූල්ලවග්ගපාළි

PTS. - Pali Text Society Cullavaggapali

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ ē  ඔ ō

### CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa | | | |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña | | | |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa | | | |
| ත ta | ථ tha | ද da | ධ dha | න na | | | |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma | | | |
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | ව්හ vha |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā  ි i  ී ī  ු u  ූ ū  ෙ ē  ො o

# චුල්ලවග්ගපාළි (2 භාගය)

## විසය සූචි


5. ඛුද්දකවත්ථුක්ඛන්ධකං 2 – 127

6. සේනාසනක්ඛන්ධකං 128 – 237

7. සඞ්ඝභේදකක්ඛන්ධකං 246 – 333

8. වත්තක්ඛන්ධකං 334 – 411

- ආගන්තුකවත්තං .. .. 334 – 341
- ආවාසිකවත්තං .. .. 340 – 349
- භත්තග්ගවත්තං .. .. 348 – 353
- පිණ්ඩචාරිකවත්තං .. .. 354 – 359
- ආරඤ්ඤිකවත්තං .. .. 358 – 363
- සේනාසනවත්තං .. .. 362 – 369
- ජන්තාඝරවත්තං .. .. 368 – 371
- වච්චකුටිවත්තං .. .. 370 – 375
- උපජ්ඣායවත්තං .. .. 376 – 387
- සද්ධිවිහාරිකවත්තං .. .. 386 – 393
- ආචරියවත්තං .. .. 394 – 405
- අන්තේවාසිකවත්තං .. .. 404 – 411

9. පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකං 424 – 465

- පාතිමොක්ඛුද්දෙසයාචනං .. 424 – 427
- මහාසමුද්දෙ අට්ඨඅච්ඡරියා .. 426 – 431
- ධම්මවිනයෙ අට්ඨඅච්ඡරියා .. 430 – 435

10. භික්ඛුනික්ඛන්ධකං 468 – 537

- අට්ඨගරුධම්මා .. .. 472 – 477

11. පඤ්චසතිකක්ඛන්ධකං 544 – 565

- සංගීතිනිදානං .. .. 544 – 551
- ඛුද්දානුඛුද්දකසික්ඛාපදකථා .. 552 – 555
- බ්‍රහ්මදණ්ඩකථා .. .. 558 – 565

12. සත්තසතිකක්ඛන්ධකං 566 – 599

විනයපිටකෙ

# චූළවග්ගපාළි

(දුතියො භාගො)

# විනයපිටකෙ

# චුල්ලවග්ගපාළි

## (දුතියො භාගො)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## 5

## ඛුද්දකවත්ථුක්ඛන්ධකො

### ඛුද්දකවත්ථූනි

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම සමණා සක්‍යපුත්තියා නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙස්සන්ති, ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි, සෙය්‍යථාපි මල්ලමුට්ඨිකා ගාමපොද්දවාති?[1] අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා, "අනනුච්ඡවිකං භික්ඛවෙ තෙසං මොඝපුරිසානං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා නහායමානා රුක්ඛෙ කායං උග්ඝංසෙස්සන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායාති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"න භික්ඛවෙ නහායමානෙන භික්ඛුනා රුක්ඛෙ කායො උග්ඝංසෙතබ්බො. යො උග්ඝංසෙය්‍ය ආපත්ති දුක්කටස්සාති."

---

1. ගාමපූද්දවා ගාමපොද්දවා ති පි පාඨා දිස්සන්ති.

# විනයපිටකයෙහි

# චූළවග

(දෙවන භාගය)

---

ඒ භගවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

# 5

# ඛුද්දකවත්ථුක්ඛන්ධකය

## ක්ෂුද්‍රකවස්තු

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර නිසා කලන්‍දකනිවාප නම් වූ වේළුවනයෙහි වැඩ වසන සේක. එ කල්හි ෂඩ්වර්ගීය මහණහු ස්නානය කරන්නාහු කලවා ද අත්දඬු ද ළය ද පිට ද යි ශරීරාවයව රුකෙහි උළත්. මිනිස්සු 'කෙසේ නම් ශාක්‍යපුත්‍රීය මහණහු ස්නානය කරන්නාහු මල්ල පොරකාරයන් සේ, සම පැහැපත් කරන නුවරුන් සේ කලවාත් අත්දඬුත් ළයත් පිටත් යන ශරීරාවයව රුකෙහි උළත් ද' යි ලාමක කොට සිතත්, නොගුණ කියත්, දෙස් පතුරුවත්. මහණහු ලාමක කොට සිතන, නොගුණ කියන, දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ වචන ඇසූහු ය. ඉක්බිත්තෙන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසංඝයා එක්රැස් කරවා 'මහණෙනි, ෂඩ්වර්ගීය මහණහු නාන්නාහු කලවාත් අත්දඬුත් ළයත් පිටත් යන ශරීරාවයව රුකෙහි උළත් ද ඒ පුවත සත්‍ය දැ' යි අසා වදාළ සේක. 'භාග්‍යවතුන් වහන්ස, සත්‍ය යැ'යි මහණහු කීහ. භාග්‍යවතුන් වහන්සේ, ''මහණෙනි, ඒ හිස් පුරුෂයන්ගේ ක්‍රියාව මහණුනට නො නිසි ය, මහණුනට නො අනුලොම් ය, මහණුනට නො සුදුසු ය, අශ්‍රාමණක ය, මහණුනට නො කැප ය, මහණුන් විසින් නො කළ යුත්තෙක. මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ නාන්නාහු කලවාත් අත්දඬුත් ළයත් පිටත් රුකෙහි උළත් ද? මහණෙනි, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස ද පහන් වූවන්ගේ ප්‍රසාදය වැඩෙනු පිණිස ද නො වේ. වැළිදු මහණෙනි, මෙය නො පහන් වූවන් ගේ නො පැහැදීම පිණිස ද පැහැදුණු සමහර දෙනාගේ වෙනස් බව පිණිසද පවතී'' යැ යි නොයෙක් ලෙසින් ගැරැහූ සේක. නොයෙක් ලෙසින් ගරහා, දැහැමි කතා කොට, මහණුන් අමතා,

''මහණෙනි, නාන්නා වූ මහණහු විසින් රුකෙහි ඇඟ නො ඉළියයුතු ය. යම් මහණෙක් ඇඟ (රුකෙහි) උළන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ'' යි වදාළ සේක.

2. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නහායමානා ථම්භෙ කායං උග්ඝංසෙන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'කථං හි නාම සමණා සක්‍යපුත්තියා නහායමානා ථම්භෙ කායං උග්ඝංසෙස්සන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි, සෙය්‍යථාපි මල්ලමුට්ඨිකා ගාමපොද්දවා'ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. 'සච්චං කිර භික්ඛවෙ –පෙ–' 'සච්චං භගවා' විගරහි බුද්ධො භගවා –පෙ– විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''න භික්ඛවෙ නහායමානෙන භික්ඛුනා ථම්භෙ කායො උග්ඝංසෙතබ්බො. යො උග්ඝංසෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති

3. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නහායමානා කුඩ්ඩෙ කායං උග්ඝංසෙන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම සමණා සක්‍යපුත්තියා නහායමානා කුඩ්ඩෙ කායං උග්ඝංසෙස්සන්ති ඌරුම්පි බාහුම්පි උරම්පි පිට්ඨිම්පි, සෙය්‍යථාපි මල්ලමුට්ඨිකා ගාමපොද්දවාති –පෙ– විගරහි බුද්ධො භගවා –පෙ– විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''න භික්ඛවෙ නහායමානෙන කුඩ්ඩෙ කායො උග්ඝංසෙතබ්බො. යො උග්ඝංසෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.

4. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අට්ටානෙ. නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම –පෙ– පිට්ඨිම්පි 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ –පෙ– සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. –පෙ– විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''න භික්ඛවෙ අට්ටානෙ නහායිතබ්බං. යො නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

1. අඩ්ඪානෙ – ස. ම. (සම්බත්)

2. එ සමයෙහි ෂව්වග්ගිය මහණහු නාන්නාහු, කලවා ද අත්දඬු ද ළය ද පිට ද යන ශරීරාවයව වැඹෙහි උළත්. 'ශාක්‍ය පුත්‍රීක ශ්‍රමණයෝ නාන්නාහු, මල්ල පොරකාරයන් මෙන් සම පැහැගන්වන තියැරියන් මෙන් කෙසේ නම් වැඹෙහි කලවාත් අත්දඬුත් ළයත් පිටත් යන ශරීරාවයව උළත් ද' යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භික්‍ෂූහු ලාමක කොට සිතන, නුගුණ කියන, දෙස් පතුරුවන ඒ මිනිසුන් ගේ වචන ඇසූහු ය. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි ... සැබෑ ද "යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. 'සැබෑ යැ'යි භික්‍ෂූහු පැවැසූහ. භාග්‍යවතුන් වහන්සේ ... නොයෙක් කරුණු දක්වා ගැරැහූ සේක. නොයෙක් කරුණු දක්වා ගරහා දැහැමි කථා කොට, මහණුන් අමතා,

**"මහණෙනි, නාන්නාවූ මහණහු විසින් වැඹෙහි ඇඟ නො ඉළියැයුතු. යම් මහණෙක් ඇඟ ඉළුයේ වී නම් ඔහුට දුකුළා** ඇවැත් වන්නේ යැ" යි වදාළ සේක.

3. එ සමයෙහි ෂව්වග්ගිය මහණහු නාන්නාහු, කලවා ද අත්දඬු ද ළය ද පිට ද බිත්තියෙහි උළත්. 'ශාක්‍යපුත්‍රීක ශ්‍රමණයෝ නාන්නාහු, මල්ල පොරකාරයන් මෙන්, සම පැහැ ගන්වන තියැරියන් මෙන්, කෙසේ නම් බිත්තියෙහි කලවාත් අත්දඬුත් ළයත් පිටත් යන ශරීරාවයව උළත් ද" යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත් ... භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නොයෙක් කරුණින් ගැරැහූ සේක. ... නොයෙක් කරුණින් ගරහා, දැහැමි කථා කොට, භික්‍ෂූන් අමතා,

**"මහණෙනි, නාන්නාවූ මහණහු විසින් බිත්තියෙහි ඇඟ නො ඉළියැයුතු. යමෙක් (බිත්තියෙහි) ඇඟ ඉළුයේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ** යැ" යි වදාළ සේක.

4. එ සමයෙහි ෂව්වග්ගිය මහණහු අට්ඨානයෙහි (ගිහියන් සඳහා ඇඟ උළන පුවරු සිටුවා ඇති තොටුපලෙහි) ස්නානය කරත්. මිනිස්සු ... "කෙසේ නම් කාමභොගී ගිහියන් මෙන් ... පිට ද උළත් ද" යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භික්‍ෂූහු ලාමක කොට සිතන, නුගුණ කියන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ වචන ඇසූහු ය. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. 'මහණෙනි, ... සැබෑ ද"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. 'සැබෑ ය වහන්සැ' යි ඔහු කීහ. භාග්‍යවතුන් වහන්සේ ... නොයෙක් ලෙසින් ගැරැහූ සේක. ගරහා දැහැමි කතා කොට, මහණුන් අමතා,

**"මහණෙනි, අට්ඨානයෙහි (ගිහියන් සඳහා පිළියෙල වැ ඇති තොටුපලෙහි) නො නෑ යුතු. යමෙක් නෑයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළ සේක.

5. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගන්ධබ්බහත්ථකෙන නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති –පෙ– භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ–

**''න භික්ඛවෙ ගන්ධබ්බහත්ථකෙන නහායිතබ්බං. යො නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.''**

6. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කුරුවින්දකසුත්තියා නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''සෙය්‍යථාපි ගිහී කාමභොගිනොති''. –පෙ– භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ–

**''න භික්ඛවෙ කුරුවින්දකසුත්තියා නහායිතබ්බං යො නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.''**

7. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ විග්ගය්හ පරිකම්මං කාරාපෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති –පෙ– භගවතො එතමත්ථං ආරොචෙසුං. –පෙ–

**''න භික්ඛවෙ විග්ගය්හ පරිකම්මං කාරාපෙතබ්බං. යො කාරාපෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.''**

8. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මල්ලකෙන නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති • විපාචෙන්ති ''සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති –පෙ– භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ–

**''න භික්ඛවෙ මල්ලකෙන නහායිතබ්බං. යො නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.''**

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කච්ඡුරොගාබාධො හොති. න තස්ස විනා මල්ලකෙන ඵාසු හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**''අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස අකතමල්ලකං''ති.**

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ජරාදුබ්බලො නහායමානො න සක්කොති අත්තනො කායං උග්ඝංසෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**''අනුජානාමි භික්ඛවෙ උක්කාසිකං''ති.**

11. තෙන ඛො පන සමයෙන භික්ඛූ පිට්ඨිපරිකම්මං කාතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**''අනුජානාමි භික්ඛවෙ පුථුපාණිකං'ති.**

5. එ සමයෙහි වනාහි සවග මහණහු ගඳැවූ අතින් (නාන තොටැ තබා ඇති ලී මුවා අතින්) ඇඟ උළා නාත්. කාමභෝගී ගිහියන් මෙන් නාති' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ... මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා,

**''මහණෙනි, ගඳැවූ අතින් ඇඟ උළා නො නැයුතු. යමෙක් නැයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදළ සේක.

6. එ සමයෙහි වනාහි සවග මහණහු කිරිදිහුයින් (කිරිදිගල් සුණු ලහයෙන් අනා කළ ගුළි වැටියෙන්) ඇඟ උළා නාත්

**''මහණෙනි, කිරිදිහුයින් ඇඟ උළා නො නැයුතු. යමෙක් නැයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදළ සේක.

7. එ සමයෙහි වනාහි සවග මහණහු ඇඟින් ඇඟ ගටා පිරියම් කරවත්. මිනිස්සු 'කාමභොගී ගිහියන් මෙන් යැ' යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ... භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ...

**''මහණෙනි, ඇඟින් ඇඟ ගටා පිරියම් නො කැරැවියයුතු. යමෙක් කැරැවූයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

8. එ සමයෙහි වනාහි සවග මහණහු මල්ලකයෙන් (මුවර දත් සිද කෙමියක් මෙන් තැනූ උපකරණයෙන්) ඇඟ උළා නාත්. 'කාමභොගී ගිහියන් මෙනැ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ... භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ...

**''මහණෙනි, මල්ලකයෙණ් ඇඟ උළා නො නෑ යුතු. යමෙක් නැයේ වී නම්, දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදළ සේක.

9. එ සමයෙහි වනාහි එක්තරා මහණකුට ඇඟ කසන ලෙඩක් වෙයි. ඔහුට මල්ලකයක් නැති වැ පහසුවෙක් නොවෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**''මහණෙනි, ගිලන් මහණහට අකතමල්ලකය (දත් නොසිද කළ මල්ලකය) අනුදනිමි''** යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

10. එ සමයෙහි වනාහි ජරායෙන් දුර්වල වූ එක්තරා මහණෙක් නානුයේ තමාගේ ඇඟ උළා ගන්නට නො හැකි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**''මහණෙනි, රෙදි වැටියෙන් ඇඟ ඉළීම අනුදනිමි''** යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

11. එ සමයෙහි මහණහු පිට පිරියම් කරන්නට (එකක්හු අනෙකකු ලවා පිට උළවන්නට) කුකුස් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**'මහණෙනි, පුථුපාණිකාව (ඔවුනොවුන් අතින් පිට ඉළීම) අනුදනිමි'** යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

12-19. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ වල්ලිකං, ධාරෙන්ති -පෙ- පාමඞ්ගං ධාරෙන්ති, -පෙ- කණ්ඨසුත්තකං ධාරෙන්ති -පෙ- කටිසුත්තකං ධාරෙන්ති, -පෙ- ඔවට්ටිකං ධාරෙන්ති, -පෙ- කෙයූරං[1] ධාරෙන්ති, -පෙ- හත්ථාභරණං ධාරෙන්ති, -පෙ- අඞ්ගුලි-මුද්දිකං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ වල්ලිකං ධාරෙන්ති. පාමඞ්ගං ධාරෙන්ති -පෙ- කණ්ඨසුත්තකං ධාරෙන්ති.-පෙ-කටිසුත්තකං ධාරෙන්ති. ඔවට්ටිකං ධාරෙන්ති -පෙ-කෙයූරං ධාරෙන්ති -පෙ- හත්ථාභරණං ධාරෙන්ති. -පෙ- අඞ්ගුලිමුද්දිකං ධාරෙන්තී"ති. 'සච්චං භගවා'. -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

**"න භික්ඛවෙ වල්ලිකා ධාරෙතබ්බා, න පාමඞ්ගා ධාරෙතබ්බා, න කණ්ඨසුත්තකං ධාරෙතබ්බං න කටිසුත්තකං ධාරෙතබ්බං. න ඔවට්ටිකං ධාරෙතබ්බං. න කෙයූරං ධාරෙතබ්බං න හත්ථාභරණං ධාරෙතබ්බං. න අඞ්ගුලිමුද්දිකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සාති."**

20. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දීඝෙ කෙසෙ ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනොති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

**"න භික්ඛවෙ දීඝා කෙසා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ දුමාසිකං වා දුවඞ්ගුලකං වා"ති.**

21-25. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කොච්ඡෙන කෙසෙ ඔසණ්ඨෙන්ති. -පෙ- ඵණකෙන කෙසෙ ඔසණ්ඨෙන්ති. -පෙ- හත්ථඵණකෙන කෙසෙ ඔසණ්ඨෙන්ති. -පෙ- සිත්ථතෙලකෙන කෙසෙ ඔසණ්ඨෙන්ති. -පෙ- උදකතෙලකෙන කෙසෙ ඔසණ්ඨෙන්ති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

**"න භික්ඛවෙ කොච්ඡෙන කෙසා ඔසණ්ඨෙතබ්බා. න ඵණකෙන කෙසා ඔසණ්ඨෙතබ්බා. න හත්ථඵණකෙන කෙසා ඔසණ්ඨෙතබ්බා. න සිත්ථතෙලකෙන කෙසා ඔසණ්ඨෙතබ්බා. න උදකතෙලකෙන කෙසා ඔසණ්ඨෙතබ්බා. යො ඔසණ්ඨෙය්‍ය ආපත්ති දුක්කටස්සාති."**

---

1. කායූරං - මජසං

12-19. එ සමයෙහි ෂවාග්ගීය මහණහු වල්ලිකා (මුතුවැල් ආදි කර්ණාභරණ) දරත් ... පමූ (එල්බෙන නූල්) පළඳිත් ... ගෙල පළඳනා දරත් ... ඉණපළඳනා දරත් ... වළලු දරත්... අඟු පළඳනා දරත් ... හස්තාභරණ දරත් ... ඇඟිලි මුදු දරත්. මිනිස්සු 'කාමභොගී ගිහියන් බඳුහ'යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ලාමක කොට සිතන, නුගුණ කියන, දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ කථා භික්‍ෂූහු ඇසූහ. ඉක්බිති ඒ මහණහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. 'මහණෙනි, ෂවාග්ගීය මහණහු වල්ලිකා දරත් යනු සැබෑ ද ... පමූ දරත් යනු සැබෑ ද ... ගෙලපළඳනා දරත් යනු සැබෑ ද ... ඉණපළඳනා දරත් යනු සැබෑ ද ... වලලු දරත් යනු සැබෑ ද ... හස්තාභරණ දරත් යනු සැබෑ ද ... ඇඟිලිමුදු දරත් යනු සැබෑ ද''යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. 'සැබෑව භාග්‍යවතුන් වහන්සැ යි ඒ මහණහු කීහ. ... භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කරුණින් ගරහා, මහණුන් බණවා,

**''මහණෙනි, වල්ලිකා නො දැරියයුතු, පමූ නො දැරියයුතු, ගෙල පළඳනා නො දැරියයුතු, ඉණපළඳනා නො දැරියයුතු, වළලු නො දැරියයුතු ... හස්තාභරණ නො දැරියයුතු, ඇඟිලි මුදු නො දැරියයුතු, යමෙක් දැරුයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදාළ සේක.

20. එ සමයෙහි ෂවාග්ගීය මහණහු දික් කෙහෙ දරත්. 'කාමභොගී ගිහියන් බඳුහ'යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ ...

**''මහණෙනි, දික් කෙස් නො දැරියයුතු. යමෙක් දැරුයේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, දෙමසක් වූ හෝ දැඟුලක් දික් වූ හෝ කෙහෙ දරනුවට අනුදනිමි''** යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. *

21-25. එ සමයෙහි ෂවාග්ගීය මහණහු කොස්සෙන් (බුරුසුවෙන්) කෙස් පීරත් ... පණායෙන් කෙස් පීරත් ... අත් පණායෙන් කෙස් පීරත් ... ඉටිතෙලින් කෙස් මටසිලුටු කොට තබත් ... දිය මුසු තෙලින් කෙස් මටසිලිටි කෙරෙත් 'කාමභොගී ගිහියන් මෙනැ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ....

**''මහණෙනි, කොස්සෙන් කෙහෙ නො පීරියයුතු, පණායෙන් හිස නො පීරියයුතු, අත් පණායෙන් හිස නො පීරියයුතු. ඉටිතෙලෙන් හිස කෙහෙ මට සිලිටි නො කළ යුතු, දිය මුසු තෙලින් හිස කෙහෙ මට සිලිටි නො කළයුතු. යමෙක් මට සිලිටි කෙළේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදාළ සේක.

---

* කාල වශයෙන් කෙහෙ නොබා දෙමසක් නො ඉක්මියැ යුතු. ඒ දෙමස තුළ ද දැඟුලක් දිගට කෙහේ වැඩී ඇත් නම් බෑවිය යුතු. දැඟුලට වඩා දිගට වැවෙන්නට ඉඩ නො දිය යුතු.

26. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ආදාසෙ'පි උදකපත්තෙ'පි මුඛනිමිත්තං ඔලොකෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ආදාසෙ වා උදකපත්තෙ වා මුඛනිමිත්තං ඔලොකෙතබ්බං. යො ඔලොකෙය්‍ය ආපත්ති දුක්කටස්සා'ති.

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මුඛෙ වණො හොති. සො භික්ඛූ පුච්ඡි 'කීදිසො මෙ ආවුසො වණො'ති. භික්ඛූ එවමාහංසු 'ඊදිසො තෙ ආවුසො වණො'ති. සො න සද්දහති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා ආදාසෙ වා උදකපත්තෙ වා මුඛනිමිත්තං ඔලොකෙතුන්ති."

28. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මුඛං ආලිම්පන්ති, මුඛං උම්මද්දෙන්ති, මුඛං චුණ්ණෙන්ති, මනොසිලිකාය මුඛං ලඤ්ඡෙන්ති, අඞ්ගරාගං කරොන්ති, මුඛරාගං කරොන්ති, අඞ්ගරාගමුඛරාගං කරොන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

"න භික්ඛවෙ මුඛං ආලිම්පිතබ්බං, න මුඛං උම්මද්දිතබ්බං, න මුඛං චුණ්ණෙතබ්බං, න මනොසිලිකාය මුඛං ලඤ්ඡිතබ්බං, න අඞ්ගරාගො කාතබ්බො, න මුඛරාගො කාතබ්බො, න අඞ්ගරාගමුඛරාගො කාතබ්බො. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො චක්ඛු-රොගාබාධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා මුඛං ආලිම්පිතුන්ති."

30. තෙන ඛො පන සමයෙන රාජගහෙ ගිරග්ගසමජ්ජො හොති. ඡබ්බග්ගියා භික්ඛූ ගිරග්ගසමජ්ජං දස්සනාය අගමංසු. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම සමණා සක්‍යපුත්තියා නච්චම්පි ගීතම්පි වාදිතම්පි දස්සනාය ගච්ඡිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

"න භික්ඛවෙ නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගන්තබ්බං. යො ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

26. එ සමයෙහි වනාහි සවග මහණහු කැටපතෙහි ද දිය බඳුනෙහි ද මුහුණු සටහන බලත්. මිනිස්සු 'කාමභෝගී ගිහියන් බඳුහ' යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ...

**"මහණෙනි, කැට පතෙහි හෝ දිය බඳුනෙහි හෝ මුහුණු සටහන නො බැලිය යුතු. යමෙක් බැලුයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

27. එ සමයෙහි වනාහි එක්තරා මහණකු ගේ මුහුණෙහි වණයෙක් වෙයි. 'ඇවැත්නි, මගේ වණය කෙබඳු එකෙක් ද' යි මහණුන් විචාළේ ය. ඇවැත්නි, තොපගේ වණය මෙ බඳු එකෙකැ යි ඒ මහණහු කීහ. හේ එය නො අදහයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

**"මහණෙනි, ආබාධ ප්‍රත්‍යයෙන්** (ආබාධයක් ඇති කල්හි) **කැටපතෙහි හෝ දියබඳුනෙහි හෝ මුහුණු සටහන බලන්නට අනුදනිමි''**යි භාග්‍යවතුන් වහන්සේ අනුදත් සේක.

28. එ සමයෙහි වනාහි සවග මහණහු මුහුණ ආලිප්ත කෙරෙත් (අලෙවු දෙත්), මුහුණ උන්මාර්ජනය කරත් (දියමුසු පිටි මුහුණු උළත්.) ඇඟ පැහැ ගන්වත්. මුහුණ චන්සුණුයෙන් තවරත් මනොසිලායෙන් (තිලක දීම ආදි විසින්) මුහුණ ලකුණු කෙරෙත්, ඇඟ පැහැ ගන්වත්, මුහුණ පැහැ ගන්වත්, ඇඟ ද මුහුණ ද පැහැ ගන්වත්. ''මොහු කාමභොගී ගිහීන් බඳුහ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ...

"මහණෙනි, මුහුණ ආලිප්ත නො කළයුතු. මුහුණ උන්මාර්ජිත නො කළයුතු, මුහුණ **චන්සුණුයෙන්** නො තැවරියයුතු, මනොසිලායෙන් මුහුණ ලකුණු නො කළයුතු, ඇඟ පැහැ නො ගැන්වියයුතු, මුහුණ පැහැ නො ගැන්වියයුතු, ඇඟ ද මුහුණ ද පැහැ නො ගැන්වියයුතු, යමෙක් එය කෙළේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

29. එක් සමයෙක්හි එක්තරා මහණකුට ඇසැ ලෙඩෙක් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

**"මහණෙනි, ආබාධප්‍රත්‍යයෙන්** (ලෙඩක් ඇති කලැ එයට පිළියම් වශයෙන්) **මුහුණ ආලිප්ත කරන්නට** (මුහුණු බෙත් ගාන්නට) **අනුදනිමි''** යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

30. එ සමයෙහි රජගහ නුවර ගිරග්‍රසමජ්ජය (හෙල් මුදුන්හි පැවැත්වෙන උළෙලෙක්) වෙයි. සවග මහණහු ගිරග්‍රසමජ්ජය දකිනු පිණිස ගියාහ. "ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ කාමභොගී ගිහියන් සේ කෙසේ නම නැටුම් ද ගැයුම් ද වැයුම් ද දක්නා පිණිස යන්නාහු ද'' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ....

**"මහණෙනි, නැටුම් හෝ ගැයුම් හෝ වැයුම් හෝ දක්නා පිණිස නො යායුතු. යමෙක් යන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

31. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'යථෙව මයං ගායාම එවමෙවිමෙ සමණා සක්‍යපුත්තියා ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්තී'ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායිස්සන්තී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ -පෙ- සච්චං භගවාති -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

''පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්තස්ස: අත්තනා පි[1] තස්මිං සරෙ සාරජ්ජති, පරෙ පි තස්මිං සරෙ සාරජ්ජන්ති, ගහපතිකා පි උජ්ඣායන්ති, සරකුත්තිම්පි නිකාමයමානස්ස සමාධිස්ස භඞ්ගො හොති. පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්තස්ස. න භික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො ගායිතබ්බො. යො ගායෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ සරභඤ්ඤෙ කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ සරභඤ්ඤන්ති.''

32. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ බාහිරලොමිං උණ්ණිං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

''න භික්ඛවෙ බාහිරලොමී උණ්ණී ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

33. තෙන ඛො පන සමයෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස ආරාමෙ අම්බා ඵලිනො හොන්ති. රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන අනුඤ්ඤාතං හොති 'යථාසුඛං අය්‍යා අම්බං පරිභුඤ්ජන්තූ'ති. ඡබ්බග්ගියා භික්ඛූ තරුණඤ්ඤෙව අම්බං පාතාපෙත්වා පරිභුඤ්ජිංසු. රඤ්ඤො ච මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස අම්බෙන අත්ථො හොති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො මනුස්සෙ ආණාපෙසි 'ගච්ඡථ භණෙ ආරාමං, ගන්ත්වා අම්බං ආහරථා'ති. 'එවං දෙවා'ති ඛො තෙ මනුස්සා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා ආරාමං ගන්ත්වා ආරාමපාලෙ එතදවොචුං 'දෙවස්ස භණෙ අම්බෙන අත්ථො අම්බං දෙථා'ති. 'නත්ථය්‍යා අම්බං. තරුණංයෙව අම්බං පාතාපෙත්වා භික්ඛූ පරිභුඤ්ජිංසූ'ති.

---

1. අත්තනා පි - මජ්ඣං.

31. එ සමයෙහි වනාහි සවග මහණහු දික් වූ ගී හඬින් දහම් ගයත්. "යම්සේ අපි ගයමෝ ද, එසේ ම මේ ශාක්‍යපුත්‍රික ශ්‍රමණයෝ දික් වූ ගී හඬින් දහම් ගයති"යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ලාමක කොට සිතන, නුගුණ කියන, දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ වචනය භික්‍ෂූහු ඇසූහ. අල්පෙච්ඡ වූ, ලත් පමණින් සතුටු වූ, ලජ්ජා ඇති, කුකුස් කරන ශික්‍ෂාකාමී වූ, යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු 'කෙසේ නම් සවග මහණහු දික් වූ ගීහඬින් දහම් ගයන්නාහු ද' යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. ... මහණෙනි, සැබෑ ද' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. "සැබැව වහන්සැ'' යි ඔහු කීහ. ... භාග්‍යවතුන් වහන්සේ විවිධ කාරණයෙන් ගරහා, දැහැමි කතා කොට, භික්‍ෂූන් බණවා,

"මහණෙනි, දික් වූ ගීහඬින් දහම් ගයන්නහුගේ (ඒ ගැයීමෙහි) මේ ආදීනව පසෙකි: තෙමේත් ඒ හඬෙහි ඇලෙයි, අන්හු ද ඒ හඬෙහි ඇලෙත්, ගැහැවියෝ ද ලාමක කොට සිතත්, ස්වර ක්‍රියාව (හඬ නැංවීම) පතන මහණහුගේ චිත්ත සමාධිය බිඳී යෙයි, පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණෙයි. මහණෙනි, දික් වූ ගීහඬින් දහම් නො ගැයියයුතු. යමෙක් ගයන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදාළ සේක.

එ සමයෙහි වනාහි මහණහු සරභඤ්ඤයෙහි (තරංගවෘත්තාදි වෘත්තවලට අනුව කීමෙහි) කුකුස් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ස්වරභණ්‍යය අනුදනිමි" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

32. එසමයෙහි වනාහි සවග මහණහු ලොම් පිටතට ඇති පොරෝනාවක් දරත්. 'කාමභොගී ගිහියන් බඳුහ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ලොම් පිටතට ඇති පොරෝනා නො දැරියයුතු. යමෙක් දරන්නේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

33. එ සමයෙහි වනාහි මගධෙශ්වර වූ සේනික බිම්බිසාර රජුගේ අඹ රුක්හු පල දරන්නෝ වෙත්. මගධෙශ්වර වූ සේනික බිම්බිසාර රජු විසින් "පහසු සේ ආර්යයෝ අඹ වළඳත්වා'' යි අනුදන්නා ලද්දේ වෙයි. සවග මහණහු ළා අඹ (අඹ ගැට) ද නෙළවා කෑහ. මගධාධිපති සේනික බිම්බිසාර රජුට ද අඹ වුවමනා වෙයි. එ කල්හි මගධෙශ්වර සේනික බිම්බිසාර රජ මිනිසුන් බණවා "සගයෙනි, අරමට යවු. ගොස් අඹ ගෙනෙවු'' යැ යි ඇණැවී ය. "දේවයන් වහන්ස, එසේ යැ"යි කියා ඒ මිනිස්සු මගධාධිපති සේනික බිම්බිසාර රජුට පිළිවදන් දී අරමට ගොස්, අරම්පල්ලන් බණවා "සගයෙනි, දේවයන් වහන්සේට අඹ වුවමනා යැ. අඹ දෙවු යැ'' යි කීහ. "ආර්යයෙනි, අඹ නැත. භික්‍ෂූහු ළා වූ ම අඹ නෙළවා වැළඳූහ'' යි අරම්-පල්ලෝ කීහ.

අථ ඛො තෙ මනුස්සා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතමත්ථං ආරොචෙසුං. 'සුපරිභුත්තං භන්තෙ අය්‍යෙහි අම්බං. අපි ච භගවතා මත්තා වණ්ණිතා'ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා රඤ්ඤො අම්බං පරිභුඤ්ජිස්සන්ති'ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

**"න භික්ඛවෙ අම්බං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

34. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝභත්තං හොති. සූපෙ අම්බපෙසිකායො පක්ඛිත්තා හොන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා න පටිගණ්හන්ති.

**'පටිගණ්හාථ භික්ඛවෙ පරිභුඤ්ජථ. අනුජානාමි භික්ඛවෙ අම්බපෙසිකන්ති."**

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝභත්තං හොති. තෙ න පරියාපුණිංසු අම්බපෙසිකං කාතුං. භත්තග්ගෙ සකලෙහෙව අම්බෙහි චරන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා න පටිගණ්හන්ති.

**"පටිගණ්හාථ භික්ඛවෙ පරිභුඤ්ජථ. අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං, අග්ගිපරිචිතං, සත්ථපරිචිතං, නඛපරිචිතං, අබීජං, නිබ්බට්ටබීජඤ්ඤෙව පඤ්චමං. අනුජානාමි භික්ඛවෙ ඉමෙහි පඤ්චහි සමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතුන්ති."**

35. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො කාලකතො[1] හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. නහ නූන සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරි. සචෙ හි සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, න හි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං කරෙය්‍ය. කතමානි චත්තාරි අහිරාජකුලානි: විරූපක්ඛං අහිරාජකුලං, එරාපථං අහිරාජකුලං, ඡබ්‍යාපුත්තං අහිරාජකුලං, කණ්හාගොතමකං අහිරාජකුලං, නහ[2] නූන සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරි. සචෙ හි සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, න හි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං කරෙය්‍ය. අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරිතුං, අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තං කාතුං. එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බං:

1. කාලංකතො - මජසං.
2. නහි නූන - මජසං.

ඉක්බිති ඒ මිනිස්සු මගධාධිපති සේනිය බිම්බිසාර රජුට මෙ පවත් සැලකළාහ. "සගයෙනි, ආර්යයන් විසින් අඹ මොනවට වළඳන ලද්දේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ විසින් පමණ දැනීම වර්‍ණනා ලද්දේ යැ" යි රජ කී ය. මිනිස්සු "කෙසේ නම් ශාක්‍යපුත්‍රික ශ්‍රමණයෝ පමණ නො දැන රජුගේ අඹ වළඳන්නාහු ද" යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භික්‍ෂූහු ලාමක කොට සිතන, නුගුණ කියන, දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ වචන ඇසූහ. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, අඹ නො වැළඳියයුතු. යමෙක් වළඳන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

34. එ සමයෙහි වනාහි එක්තරා මුළුවෙක (සමූහයකගේ) සඟ බතෙක් වෙයි. සූපයෙහි (හොද්දෙහි) අඹ පෙති දමන ලදුයේ වෙයි. භික්‍ෂූහු කුකුස් කරන්නාහු නො පිළිගනිත්.

**"මහණෙනි,පිළිගනිවු, වළඳවු, මහණෙනි, අඹ පෙති අනුදනිමි"** යි වදාළ සේක.

එ සමයෙහි වනාහි එක්තරා මුළුවෙක සඟබතෙක් වෙයි. ඔහු අඹ පෙති කරන්නට පුහුණු නො කළාහ. බොජුන් හලෙහි සම්පූර්ණ වූ අඹ වලින් යුක්ත වැ (අඹ) අතින් ගෙන හැසිරෙත්. භික්‍ෂූහු කුකුස් කරන්නාහු නොපිළිගනිත්.

"මහණෙනි, පිළිගනිවු, වළඳවු. මහණුනට කැප වූ කරුණු පසෙකින් ඵල වළඳන්නට අනුදනිමි. අග්නි පරිචිතය (ගින්නෙන් රත් කරන ලද) ශස්ත්‍ර පරිචිතය (ආයුධයෙකින් කපන ලද), නඛපරිචිතය (නියෙන් සිදින ලද), අබීජය (බීජ නැති ඵලය), පස්වනු නිබ්බට්ට බීජය (ඉවත් කරන ලද ඇට ඇති ඵලය) යනු ඒ පස් වැදෑරුම් කැප ඵල ය. මහණෙනි, කැප වූ මේ පස් කරුණින් මහණුනට කැප වූ ඵල වළඳන්නට අනුදනිමි" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

35. එ සමයෙහි වනාහි එක්තරා මහණෙක් සර්පයකු විසින් ඩසිනා ලද්දේ කලුරිය කෙළේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, ඒ මහණ මේ සතර සර්ප රාජකුලයන් මෙත් සිතින් නො ම පැතිර වි ය. මහණෙනි, ඉදින් ඒ මහණ තෙම මේ සතර සර්පරාජකුලයන් මෙත් සිතින් පැතිර වූයේ වී නම්, මහණෙනි, ඒ මහණ සර්පයකු විසින් ඩසින ලදු ව කලුරිය නො කරන්නේ ම ය. කවර සතර සර්පරාජ කුලයෝ ද යත්: විරූපාක්‍ෂ සර්පරාජ කුලය, ඒරාපථ සර්පරාජ කුලය, ඡබ්‍යාපුත්ත සර්පරාජ කුලය, කණ්හාගොතමක සර්පරාජ කුලය යන සතර ය. මහණෙනි, ඒ මහණ මේ සතර සර්පරාජ කුලයන් මෙත් සිතින් නො ම පැතිර වි ය. මහණෙනි, ඉදින් ඒ මහණ මේ සතර සර්පරාජ කුලයන් මෙත් සිතින් පැතිරවූයේ වී නම්, සර්පයකු විසින් ඩසින ලදු ව නො ම කලුරිය කරන්නේ ය. මහණෙනි, ආත්මගුප්තිය පිණිස, ආත්මාරක්‍ෂාව පිණිස, තමාට ආරක්‍ෂාව සලසාගන්නට මේ සතර සර්පරාජ කුලයන් මෙත් සිතින් පතුරු වන්නට (සතර සර්පරාජකුලයනට මෙත් වඩන්නට) අනුදනිමි. මහණෙනි, එය වූ කලී මෙසේ කළයුතු:

"විරූපක්ඛෙහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහි මෙ
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං මෙත්තං කණ්හාගොතමකෙහි ච

අපාදකෙහි මෙ මෙත්තං මෙත්තං දිපාදකෙහි මෙ
චතුප්පදෙහි මෙ මෙත්තං මෙත්තං බහුප්පදෙහි මෙ

මා මං අපාදකො හිංසි මා මං හිංසි දිපාදකො
මා මං චතුප්පදෙ හිංසි මා මං හිංසි බහුප්පදෙ

සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා ච කෙවලා
සබ්බෙ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාපමාගමා

අප්පමාණො බුද්ධො
අප්පමාණො ධම්මො අප්පමාණො සඞ්ඝො

පමාණවන්තානි සිරිංසපානි[1]
අහි විච්ඡිකා සතපදී උණ්ණානාභි

සරබූ මූසිකා කතා මෙ රක්ඛා
කතා මෙ පරිත්තා පටික්කමන්තු භූතානි

සො'හං නමො භගවතො
නමො සත්තන්නං සම්මාසම්බුද්ධානන්ති."

36. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අනභිරතියා පීළිතො අත්තනො අඞ්ගජාතං ඡින්දි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අඤ්ඤම්හි සො භික්ඛවෙ මොඝපුරිසො ඡෙත්තබ්බම්හි අඤ්ඤං ඡින්දි.

න භික්ඛවෙ අත්තනො අඞ්ගජාතං ඡෙත්තබ්බං. යො ඡින්දෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්සාති."

1. සරිසපානි – මජසං.

“විරූපාක්‍ෂ කුලයට අයත් සර්පයන් හා මගේ මෙත් සිත වේවා. ඒරාපථ කුලයට අයත් සර්පයන් හා මගේ මෙත් සිත වේවා. ඡබ්‍යාපුත්ත කුලයට අයත් සර්පයන් හා මගේ මෙත් සිත වේවා. කණ්හාගොතමක කුලයට අයත් සර්පයන් හා මගේ මෙත් සිත වේවා.

අපා සතුන් හා මගේ මෙත් සිත වේවා, දෙපා සතුන් හා මගේ මෙත් සිත වේවා, සිවුපා සතුන් හා මගේ මෙත් සිත වේවා, බුහුපා සතුන් හා මගේ මෙත් සිත වේවා.

අපා සතෙක් මා නො පෙළාවා, දෙපා සතෙක් මා නො පෙළාවා, සිවුපා සතෙක් මා නො පෙළාවා, බුහුපා සතෙක් මා නො පෙළාවා.

සිතලු සත්තු, සියලු පණ ඇත්තෝ, සියලු භූතයෝ, මේ සියල්ලෝ යහපත් දෑ ම දකිත්වා. කිසිවකු ද කරා දුකෙක් නො ඒවා.

බුදුරජ තෙම අප්‍රමාණය (පමණ කළ නො හැකි ගුණ ඇත්තේ ය), ධර්‍මය අප්‍රමාණ ය (පමණ කළ නො හැකි ගුණ ඇත්තේ ය), සඞ්‍ඝයා අප්‍රමාණ ය (පමණ කළ නො හැකි ගුණ ඇත්තේ ය), සරීසෘපයෝ (සර්පයෝ) ප්‍රමාණවත්හ.

සර්පයෝ ය, ගෝනුසුවෝ ය, පත්තෑයෝ ය, දිවිමකුළුවෝ ය, සිකනල්ලු ය, සුහුනෝ ය, මීයෝ ය යන මොහු ප්‍රමාණවත්හ.

මා විසින් ආරක්‍ෂාව කරන ලද්දේ ය, මා විසින් පරිත්‍රාණය කරන ලද්දේ ය. භූතයෝ පෙරළා යෙත්වා.

ඒ මම භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමි, (විපස්සී ආදී) සත් සම්මාසම්බුදුරදුනට නමස්කාර කරමි” යනු යි.

36. එ සමයෙහි වනාහි එක් මහණෙක් අනභිරතියෙන් (මහණ දම් පිරීමෙහි නො ඇල්මෙන්) පෙළුණේ තමාගේ පුරුෂ නිමිත්තය සිඳැලී ය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. “මහණෙනි, ඒ හිස් පුරුෂයා අනෙකක් සින්ද යුතු කල්හි වෙන එකක් ම සින්දේ ය.

මහණෙනි, තමාගේ පුරුෂ නිමිත්ත නො සින්දයුතු. යමෙක් සින්දේ වී නම්, ඔහුට තුලැසි ඇවැත් වන්නේ යැ”යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

37. තෙන ඛො පන සමයෙන රාජගහකස්ස සෙට්ඨිස්ස මහග්ඝස්ස චන්දනසාරස්ස චන්දනගණ්ඨි උප්පන්නා හොති. අථ ඛො රාජගහකස්ස සෙට්ඨිස්ස එතදහොසි: 'යන්නූනාහං ඉමාය චන්දනගණ්ඨියා පත්තං ලිඛාපෙය්‍යං, ලෙඛඤ්ච මෙ පරිභොගං භවිස්සති, පත්තං ච දානං, දස්සාමී'ති. අථ ඛො රාජගහකො සෙට්ඨි තාය චන්දනගණ්ඨියා පත්තං ලිඛාපෙත්වා සික්කාය උඩ්ඩිත්වා වෙළග්ගෙ ආලග්ගෙත්වා වෙළුපරම්පරාය බන්ධිත්වා එවමාහ: 'යො සමණො වා බ්‍රාහ්මණො වා අරහා චෙව ඉද්ධිමා ච දින්නං යෙව පත්තං ඔහරතූ'ති.

අථ ඛො පූරණො කස්සපො යෙන රාජගහකො සෙට්ඨි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජගහකං සෙට්ඨිං එතදවොච: 'අහං හි ගහපති, අරහා චෙව ඉද්ධිමා ච දෙහි මෙ පත්තන්ති' 'සචෙ භන්තෙ ආයස්මා අරහා චෙව ඉද්ධිමා ච දින්නං යෙව පත්තං ඔහරතූ'ති.

අථ ඛො මක්ඛලිගොසාලො අජිතො කෙසකම්බලො පකුධො කච්චායනො සඤ්ජයො බෙලට්ඨිපුත්තො නිගණ්ඨො නාතපුත්තො යෙන රාජගහකො සෙට්ඨි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජගහකං සෙට්ඨිං එතදවොච: 'අහං හි ගහපති අරහා චෙව ඉද්ධිමා ච, දෙහි මෙ පත්තන්ති'. 'සචෙ භන්තෙ, ආයස්මා අරහා චෙව ඉද්ධිමා ච දින්නං යෙව පත්තං, ඔහරතූ'ති.

තෙන ඛො පන සමයෙන ආයස්මා ච මහාමොග්ගල්ලානො ආයස්මා ච පිණ්ඩොලභාරද්වාජො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පවිසිංසු. අථ ඛො ආයස්මා පිණ්ඩොලභාරද්වාජො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: 'ආයස්මා ඛො මහාමොග්ගල්ලානො අරහා චෙව ඉද්ධිමා ච ගච්ඡාවුසො මොග්ගල්ලාන, එතං පත්තං ඔහර, තුය්හෙසො පත්තො'ති. 'ආයස්මාපි ඛො පිණ්ඩොලභාරද්වාජො අරහා චෙව ඉද්ධිමා ච. ගච්ඡාවුසො භාරද්වාජ, එතං පත්තං ඔහර. තුය්හෙසො පත්තො'ති. අථ ඛො ආයස්මා පිණ්ඩොලභාරද්වාජො වෙහාසං අබ්භුග්ගන්ත්වා තං පත්තං ගහෙත්වා තික්ඛත්තුං රාජගහං අනුපරියායි.

37. එ සමයෙහි වනාහි රජගහ නුවර සිටුහට මහඟු සඳුන් හරයෙකින් නිපන් සඳුන් ගැටයෙක් ලැබුණේ වෙයි. ඉක්බිති රජගහ නුවර සිටුහට ''මේ සඳුන් ගැටයෙන් පාත්‍රයක් ලියැවීම නම් ඉතා යෙහෙක. ලියැවීමෙ දී නිපන් සඳුන් සුණු ද මගේ පරිභොග වස්තුවෙක් වන්නේ ය. පාත්‍රය ද දන වස්තුවක් කොට දෙන්නෙමි'යි මේ සිත විය. ඉක්බිති රජගහ නුවර සිටු තෙම ඒ සඳුන් ගැටයෙන් පාත්‍රයක් ලියවා, සාල්ලෙක තබා හුණ ගසෙක අගැ එල්වා එය හුණ දඩු පරපුරෙක (හුණගසෙන් හුණගස බඳ කොට හුණගස් කිහිපයක් එකට ඈඳා තැනූ ගසෙක) බැඳ යමෙක් රහත් ද සෘද්ධිමත් ද වේ නම් ඔහුට මේ පාත්‍රය දෙන ලද්දේ ය. හේ මෙය ගෙන බසී වා'යි මෙසේ කීය.

එ කල්හි පූරණකාශ්‍යප රජගහ නුවර සිටුහු කරා එළඹියේ ය. එළඹැ රජගහ නුවර සිටුහු බණවා, ''ගෘහපතිය, මම රහත් ද සෘද්ධිමත් ද වෙමි. මට පාත්‍රය දෙව'යි කීය. ''වහන්ස, ඉදින් ආයුෂ්මතුන් වහන්සේ රහත් ද සෘද්ධිමත් ද වූ සේක් නම් ඔබට පාත්‍රය දෙන ලද්දේ ම ය. එය ගෙන බස්නා සේක් වා'' යි සිටු කී ය.

ඉක්බිත්තෙන් මක්ඛලිගොසාල ද කේසකම්බලී අජිත ද, පකුධ කච්චායන ද සංජය බෙල්ලට්ඨිපුත්ත ද නිගණ්ඨ නාතපුත්ත ද යන මොහු එකෙක් වෙන වෙනම රජගහ නුවර සිටු කරා එළඹි-යහ. එළඹැ ''ගෘහපතිය, මම වූ කලි රහත් ද සෘද්ධිමත් ද වෙමි. පාත්‍රය මට දෙව' යි කී ය. ''වහන්ස, ඉදින් ආයුෂ්මතුන් වහන්සේ රහත්ද සෘද්ධිමත්ද වූ සේක් නම්, ඔබට පාත්‍රය දෙන ලද්දේ ම ය. එය ගෙන බස්නා සේක් වා'' යි සිටු කී ය.

එ සමයෙහි වූ කලි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ද ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවෝ ද යන දෙනම පෙරවරු යෙහි හැඳ පෙරවැ පා සිවුරු ගෙන රජගහ නුවරට පිඩු පිණිස පිවිසියාහ. එ කල්හි ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරුනට ''ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ රහත් ද සෘද්ධිමත් ද වෙති. ඇවැත් මහමුගලන් තෙරුනි, වඩිනු මැනැව, තෙල පාත්‍රය ගෙන බසිනු මැනැව තෙල පාත්‍රය ඔබ ගේ යැ''යි කීහ. ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවෝත් රහත් ද සෘද්ධිමත් ද වෙති. ඇවැත් භාරද්වාජයෙනි, වඩින්න, තෙල පාත්‍රය ගෙන බසින්න, තෙල පාත්‍රය ඔබ ගේ යැ''යි මහමුගලන් තෙරණුවෝ වදළාහ. එකල්හි ආයුෂ්මත් පිණ්ඩොල භාරද්වාජ තෙරණුවෝ අහස් නැග ඒ පාත්‍රය ගෙන තුන් වරක් රජගහ නුවර සිසාරා වැඩියාහ.

තෙන ඛො පන සමයෙන රාජගහකො සෙට්ඨි සපුත්තදාරො සකෙ නිවෙසනෙ ඨිතො හොති පඤ්ජලිකො නමස්සමානො. 'ඉධෙව භන්තෙ අය්‍යො භාරද්වාජො අම්හාකං නිවෙසනෙ පතිට්ඨාතූ'ති. අථ ඛො ආයස්මා පිණ්ඩොලභාරද්වාජො රාජගහකස්ස සෙට්ඨිස්ස නිවෙසනෙ පතිට්ඨාසි. අථ ඛො රාජගහකො සෙට්ඨි ආයස්මතො පිණ්ඩොලභාරද්වාජස්ස හත්ථතො පත්තං ගහෙත්වා මහග්ඝස්ස ඛාදනීයස්ස පූරෙත්වා ආයස්මතො පිණ්ඩොලභාරද්වාජස්ස පාදාසි. අථ ඛො ආයස්මා පිණ්ඩොලභාරද්වාජො තං පත්තං ගහෙත්වා ආරාමං අගමාසි. අස්සොසුං ඛො මනුස්සා 'අය්‍යෙන කිර පිණ්ඩොලභාරද්වාජෙන රාජගහකස්ස සෙට්ඨිස්ස පත්තො ඔහාරිතො'ති. තෙ ච මනුස්සා උච්චාසද්දා මහාසද්දා ආයස්මන්තං පිණ්ඩොලභාරද්වාජං පිට්ඨිතො අනුබන්ධිංසු. අස්සොසි ඛො භගවා උච්චාසද්දං, මහාසද්දං, සුත්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: කින්නු ඛො සො ආනන්ද, උච්චාසද්දා මහාසද්දා'ති.

'ආයස්මතා භන්තෙ, පිණ්ඩොලභාරද්වාජෙන රාජගහකස්ස සෙට්ඨිස්ස පත්තො ඔහාරිතො, අස්සොසුං ඛො භන්තෙ, මනුස්සා අය්‍යෙන කිර පිණ්ඩොලභාරද්වාජෙන රාජගහකස්ස සෙට්ඨිස්ස පත්තො ඔහාරිතොති. තෙ ච භන්තෙ මනුස්සා උච්චාසද්දා මහාසද්දා ආයස්මන්තං පිණ්ඩොලභාරද්වාජං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා, සො එසො භන්තෙ, භගවා, උච්චාසද්දො මහාසද්දො'ති.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා ආයස්මන්තං පිණ්ඩොලභාරද්වාජං පටිපුච්ඡි 'සච්චං කිර තයා භාරද්වාජ, රාජගහකස්ස සෙට්ඨිස්ස පත්තො ඔහාරිතො'ති.

'සච්චං භගවා.'

විගරහි බුද්ධො භගවා, 'අනනුච්ඡවිකං භාරද්වාජ අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං කථං හි නාම ත්වං භාරද්වාජ, ඡවස්ස දාරුපත්තස්ස කාරණා ගිහීනං උත්තරිමනුස්සධම්මං ඉද්ධිපාටිහාරියං දස්සෙස්සසි. සෙය්‍යථාපි භාරද්වාජ, මාතුගාමො ඡවස්ස මාසකරූපස්ස කාරණා කොපීනං දස්සෙති, එවමෙව ඛො තයා භාරද්වාජ, ඡවස්ස දාරුපත්තස්ස කාරණා ගිහීනං උත්තරිමනුස්සධම්මං ඉද්ධිපාටිහාරියං දස්සිතං. නෙතං භාරද්වාජ, අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං භාරද්වාජ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානං ච එකච්චානං අඤ්ඤථත්තායා'ති.

එ සමයෙහි වනාහි රජගහ නුවර සිටු තෙම අඹුදරුවන් සහිත වැ "වහන්ස, ආයසී වූ භාරද්වාජයන් වහන්සේ මෙහි ම අප ගේ නිවෙසෙහි පිහිටන සේක්වා"යි කියමින් දෙහොත් මුදුන් දී නමස්කාර කරනුයේ සිය ගෙහි සිටියේ වෙයි. ඉක්බිත්තෙන් ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවෝ රජගහ නුවර සිටුහු ගේ ගෙහි පිහිටියාහ. එ කල්හි රජගහ නුවර සිටු තෙම ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරුන් ගේ අතින් ඒ පාත්‍රය ගෙන මහඟු ඛාද්‍යයෙන් පුරා, උන් වහන්සේට ම එය පිළිගැන්වී ය. ඉක්බිති ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවෝ ඒ පාත්‍රය ගෙන ආරාම-යට වැඩි සේක. "ආයසී වූ පිණ්ඩොලභාරද්වාජයන් වහන්සේ විසින් රජගහ නුවර සිටුහු ගේ පාත්‍රය ගෙන බස්නා ලද සේක් ලු"යි මිනිස්සු ඇසූහ. ඒ මිනිස්සු ද උස්හඬ ඇත්තාහු, මහහඬ ඇත්තාහු, ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරුන් පිටුපසින් ඔබ අනුව ගියාහ. භාග්‍යවතුන් වහන්සේ (ඔවුන්ගේ) උස්හඬ මහහඬ ඇසූ සේක. අසා ආයුෂ්මත් අනඳ තෙරුන් බණවා, 'අනඳයෙනි, ඒ උස් හඬ මහහඬ කවරේ දැ' යි අසා වදළ සේක.

වහන්ස ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරුන් විසින් රජගහ නුවර සිටුහු ගේ පාත්‍රය ගෙන බස්නා ලද්දේ ය. වහන්ස, මිනිස්සු ආයසී වූ පිණ්ඩොලභාරද්වාජයන් වහන්සේ විසින් රජගහ නුවර සිටුහු ගේ පාත්‍රය ගෙන බස්නා ලද්දේ ල යි මිනිස්සු ඇසූහ. වහන්ස, ඒ මිනිස්සු ද උස්හඬ ඇත්තාහු, මහහඬ ඇත්තාහු, ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජයන් පසු පස්සෙන් ආවාහු වෙත්. භාග්‍යවතුන් වහන්ස, මේ ඒ උස්හඬ ය මහහඬ යැයි අනඳ තෙරණුවෝ සැලකළාහ.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි, මේ කාරණ යෙහි බික්සඟන රැස් කොට, ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරුන් බණවා "භාරද්වාජයෙනි, තොප විසින් රජගහ නුවර සිටුහු ගේ පාත්‍රය බාගෙනෙන ලද්දේ ල, ඒ සැබෑ දැ"යි අසා වදළ සේක.

"සැබව, භාග්‍යවතුන් වහන්සැ"යි තෙරණුවෝ උත්තර දුන්හ.

"භාරද්වාජයෙනි, නොනිසි දෑයෙක, නොඅනුලොම් දෑයෙක, නො සුදුසු දෑයෙක, මහණුනට නො ගැළැපෙන දෑයෙක, නො කැප දෑයෙක, නොකටයුතු දෑයෙක, භාරද්වාජයෙනි, කෙසේ නම් නොවටනා ලී පාත්‍රයෙක කරුණින් ලී පාත්‍රයක් නිසා ගිහියනට උතුරු මිනිස් දමක් වූ ඉදුපෙළහර දක්වුහු ද භාරද්වාජයෙනි, මාගමක් නොවටනා මස්සක් පමණවූ මිලයක් නිසා යම්සේ සවකීය කෞපීනය දක්-වන්නී ද, භාරද්වාජයෙනි, එ පරිද්දෙන් ම තොප විසින් නොවටනා ලී පාත්‍රයෙක කරුණින් ගිහියනට උතුරුමිනිස්දහමක් වූ ඉදු පෙළහර දක්වන ලද්දේ ය. භාරද්වාජයෙනි, මෙය නොපහන් අය ගේ පැහැදීම පිණිස ද පහන් අයගේ (පැහැදීම) බොහෝ වීම පිණිස ද නො වේ. භාරද්වාජයෙනි, වැලිදු මෙය නොපහන් අයගේ නො පැහැදීම පිණිස ද පහන් වූ ඇතැම් කෙනකු ගේ වෙනස් බව පිණිස ද වේ' යැයි භාග්‍යවතුන් වහන්සේ විවිධ කරුණු දක්වා ගැරහූ සේක.

විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

“න භික්ඛවෙ, ගිහීනං උත්තරිමනුස්සධම්මං ඉද්ධිපාටිහාරියං දස්සෙතබ්බං. යො දස්සෙය්‍ය ආපත්ති දුක්කටස්ස. භින්දථෙතං භික්ඛවෙ, දරුපත්තං. සකලිකං සකලිකං කත්වා භික්ඛූනං අඤ්ජනූපපිංසනං දෙථ. න ච භික්ඛවෙ දරුපත්තො ධාරෙතබ්බො යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති.

38. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචෙ පත්තෙ ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති, ‘සෙය්‍යථාපි ගිහී කාමභොගිනො’ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

“න භික්ඛවෙ, සොවණ්ණමයො පත්තො ධාරෙතබ්බො, න රූපියමයො පත්තො ධාරෙතබ්බො, න වෙළුරියමයො පත්තො ධාරෙතබ්බො, න ඵලිකමයො පත්තො ධාරෙතබ්බො, න කංසමයො පත්තො ධාරෙතබ්බො, න කාචමයො පත්තො ධාරෙතබ්බො, න තිපුමයො පත්තො ධාරෙතබ්බො, න සීසමයො පත්තො ධාරෙතබ්බො, න තම්බලොහමයො පත්තො ධාරෙතබ්බො, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ද්වෙ පත්තෙ අයොපත්තං, මත්තිකාපත්තං”ති.

39. තෙන ඛො පන සමයෙන පත්තමූලං ඝංසියති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

‘අනුජානාමි භික්ඛවෙ, පත්තමණ්ඩලන්ති.’

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචානි පත්තමණ්ඩලානි ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති: ‘සෙය්‍යථාපි ගිහී කාමභොගිනො’ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

“න භික්ඛවෙ, උච්චාවචානි පත්තමණ්ඩලානි ධාරෙතබ්බානි. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, ද්වෙ පත්තමණ්ඩලානි තිපුමයං සීසමයං”ති.

බහලානි මණ්ඩලානි නාච්ඡුපියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“අනුජානාමි භික්ඛවෙ, ලිඛිතු”න්ති.

වලී හොන්ති -පෙ-

“අනුජානාමි භික්ඛවෙ, මකරදන්තකං ඡින්දිතු”න්ති.

විවිධ කරුණින් ගරහා දැහැමි කතා කොට මහණුන් බණවා,

''මහණෙනි, ගිහීනට උතුරු මිනිස් දහමක් වූ ඉද්ධිපෙළහර නො දැක්වියයුතු, යමෙක් දැක්වූයේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, තෙල ලී පාත්‍රය බිඳිවු, කැබැලි කැබැලි කොටැ භික්ෂූනට අඳුන් ගටනු පිණිස දෙවු. මහණෙනි, ලීමුවා පාත්‍රය නො දැරියයුතු යමෙක් දරන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ''යැ යි වදළ සේක.

38. එ සමයෙහි වනාහි සවග මහණහු රන්මුවා ද රිදී මුවා ද ලොකු කුඩා (නොයෙක් ප්‍රමාණයේ) පාත්‍ර දරත්. 'කාමභොගී ගිහියන් බඳුහ'යි මිනිස්සු ලාමක කොට සිතත්, ගරහත්, නො ගුණ පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ...

''මහණෙනි, රන්මුවා පාත්‍රය නො දැරියයුතු, රිදී මුවා පාත්‍රය නො දැරියයුතු, මිණිමුවා පාත්‍රය නො දැරියයුතු, වෙරළුමිණිමුවා පාත්‍රය නො දැරියයුතු, පළිඟුමුවා පාත්‍රය නො දැරියයුතු, කස්ලොහො මුවා පාත්‍රය නො දැරියයුතු, විදුරුමුවා පාත්‍රය නො දැරියයුතු, කළුර්යමමුවා පාත්‍රය නො දැරියයුතු, සුදුර්යමමුවා පාත්‍රය නො දැරියයුතු, තඹලොහොමුවා පාත්‍රය නො දැරියයුතු, යමෙක් දැරුයේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, යමුවා පාත්‍රය ද මැටිමුවා පාත්‍රය ද යන පාත්‍රදෙක අනුදනිමි'' යි වදළසේක.

39. එ සමයෙහි පාත්‍රයේ මුල ගැටෙයි. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ.

'මහණෙනි, පාමඩුල්ලක් (පාත්‍ර අඩියක්) අනුදනිමි'යි වදළසේක.

එ සමයෙහි සවග මහණහු රන්මුවා වූ ද රිදීමුවා වූ ද යි උස් පහත් (නානාවිධ) පාමඩුලු දරත්, 'කාමභොගී ගිහියන් බඳුහ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ...

'මහණෙනි උස්පහත් පාමඩුලු නො දැරියයුතු. යමෙක් දරන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ර්යමමුවාද සුදු ර්යමමුවා දැයි පාමඩුලු දෙකක් අනුදනිමි' යි වදළසේක.

ඝන වූ පාමඩුලු පාත්‍රයෙහි වැදගෙන නො සිටී. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

'මහණෙනි, (තුනීබව ගන්වනු පිණිස) මඩුල්ල ලියන්නට අනුදනිමි'යි වදළසේක.

රැලි ගැසෙත් (ඇකිලෙත්)...

'මහණෙනි මුවර දැති කපන්නට අනුදනිමි'යි වදළසේක.

40. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ චිත්‍රානි පත්තමණ්ඩලානි ධාරෙන්ති රූපකාකිණ්ණානි භිත්තිකම්මකතානි. තානි රථිකායපි දස්සෙන්තා ආහිණ්ඩන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති'. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

"න භික්ඛවෙ, චිත්‍රානි පත්තමණ්ඩලානි ධාරෙතබ්බානි රූපකාකිණ්ණානි භිත්තිකම්මකතානි. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, පකතිමණ්ඩල"න්ති.

41. තෙන ඛො පන සමයෙන භික්ඛූ සඋදකං පත්තං පටිසාමෙන්ති. පත්තො දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ, සොදකො පත්තො පටිසාමෙතබ්බො. යො පටිසාමෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, ඔතාපෙත්වා පත්තං පාටිසාමෙතු"න්ති.

42. තෙන ඛො පන සමයෙන භික්ඛූ සොදකං පත්තං ඔතාපෙන්ති, පත්තො දුග්ගන්ධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ, සොදකො පත්තො ඔතාපෙතබ්බො. යො ඔතාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, වොදකං කත්වා ඔතාපෙත්වා පත්තං පටිසාමෙතු"න්ති.

43. තෙන ඛො පන සමයෙන භික්ඛූ උණ්හෙ පත්තං නිදහන්ති පත්තස්ස වණ්ණො දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ, උණ්හෙ පත්තො නිදහිතබ්බො. යො නිදහෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, මුහුත්තං උණ්හෙ ඔතාපෙත්වා පත්තං පටිසාමෙතු"න්ති.

44. තෙන ඛො පන සමයෙන සම්බහුලා පත්තා අජ්ඣොකාසෙ අනාධාරා නික්ඛිත්තා හොන්ති. වාතමණ්ඩලිකාය ආවට්ටිත්වා පත්තා භිජ්ජිංසු. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ, පත්තාධාරක"න්ති.

45. තෙන ඛො පන සමයෙන භික්ඛූ මීඪන්තෙ පත්තං නික්ඛිපන්ති. පරිපතිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ, මීඪන්තෙ පත්තො නික්ඛිපිතබ්බො. යො නික්ඛිපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

40. එ සමයෙහි සවග මහණහු විසිතුරු වූ භිත්තිකර්ම කළ රූපවලින් ගැවැසී ගත් සිතුවම් කරන ලද පාමඩුලු දරත්. වීථියෙහි ද ඒවා පෙන්වමින් ඇවිදිත්. 'කාමභොගී ගිහියන් බඳුහ'යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ...

**"මහණෙනි, භිත්තිකර්ම කළ රූපයෙන් ගැවැසීගත් විසිතුරු පාමඩුලු නො දැරියයුතු. යමෙක් දරන්නේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, පියෙවි පාමඩුලු අනුදනිමි"යි** වදළ සේක.

41. එ සමයෙහි මහණහු දිය සහිත පාත්‍රය තැන්පත් කොට තබත්. පාත්‍රය දූෂ්‍ය වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, දිය සහිත පාත්‍රය තැන්පත් කොට නො තැබිය යුතු. යමෙක් තබන්නේ නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, තවා (රත් කොට) පාත්‍රය තැන්පත් කොට තබන්නට අනුදනිමි"යි** වදළ සේක.

42. එ සමයෙහි මහණහු දිය සහිත පාත්‍රය තවත් (රත් කරත්). පාත්‍රය දුගඳ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, දිය සහිත පාත්‍රය නො තැවියයුතු. යමෙක් තවන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, දිය රහිත කොට තවා පාත්‍රය සුරැකි කොට තබන්නට අනුදනිමි"යි** වදළ සේක.

43. එ සමයෙහි වනාහි මහණහු පාත්‍රය උෂ්ණයෙහි තබත්. පාත්‍රයේ පැහැය දූෂ්‍ය වෙයි, භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, උෂ්ණයෙහි පාත්‍රය නො තැබියයුතු. යමෙක් තැබුයේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, මොහොතක් උෂ්ණයෙහි තවා පාත්‍රය සුරැකි කොට තබන්නට අනුදනිමි" යි** වදළ සේක.

44. එ සමයෙහි වනාහි බොහෝ පාත්‍රයෝ එළිමහනෙහි ආධාරකයක් නැති ව තබන ලද්දහු වෙත්. පාත්‍රයෝ සුළි සුළඟෙකින් පෙරළී බුන්හ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, පාත්‍රාධාරකයක් අනුදනිමි"යි වදළ සේක.

45. එ සමයෙහි වනාහි භික්ෂූහු මීඩාන්තයෙහි (පිල් කෙළවර) පාත්‍ර තබත්. පාත්‍රය ඇදවැටී බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, පිළ කෙළවර පාත්‍රය නො තැබියයුතු. යමෙක් තැබුයේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි** වදළ සේක.

46. තෙන ඛො පන සමයෙන භික්ඛූ පරිභණ්ඩකතෙ පත්තං නික්ඛිපන්ති. පරිපතිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, පරිභණ්ඩකතෙ පත්තො නික්ඛිපිතබ්බො. යො නික්ඛිපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

47. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඡමාය පත්තං නික්කුජ්ජන්ති. ඔට්ඨො ඝංසීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ, තිණසන්ථාරක"න්ති.**

තිණසන්ථාරකො උපචිකාහි ඛජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ, චොළක"න්ති.**

චොළකං උපචිකාහි ඛජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ, පත්තමාලකන්ති."** පත්තමාලකා පරිපතිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ, පත්තකණ්ඩොලික"න්ති.**

පත්තකණ්ඩොලිකාය පත්තො ඝංසීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ, පත්තත්ථවික"න්ති.**

අංසබද්ධකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ, අංසබද්ධකං බන්ධනසුත්තක"න්ති.**

48. තෙන ඛො පන සමයෙන භික්ඛූ භිත්තිඛිලෙපි නාගදන්තකෙපි පත්තං ලග්ගෙන්ති. පරිපතිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, පත්තො ලග්ගෙතබ්බො. යො ලග්ගෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

46. එ සමයෙහි මහණහු පරිභණ්ඩය කෙළවර (පිළට පිටත වූ කුඩා පිළ෴ තුළැ) පාත්‍රය තබත්. පාත්‍රය ඇදවැටී බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට එය සැලකළහ.

''මහණෙනි, පරිභණ්ඩය කෙළවර (පිළට පිටතින් වූ කුඩා පිළ තුළැ) පාත්‍රය නො තැබියයුතු. යමෙක් තැබූයේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේයැ'' යි වදාළ සේක.

47. එ සමයෙහි වනාහි මහණහු පාත්‍රය බිමැ මුනින් නමා තබත්. පාත්‍රයේ මුවවිට ගැටී ගෙවෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, තණ ඇතිරියක් අනුදනිමි'' යි වදාළ සේක.

තණ ඇතිරිය වෙයන් විසින් කනු ලැබෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, (පාත්‍රය තැබීමට) රෙදිකඩක් අනුදනිමි'' යි වදාළ සේක.

රෙදිකඩ වෙයන් විසින් කනු ලැබෙ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ

''මහණෙනි, පාත්‍රමාලකයක් (පාත්‍රය තබන්නට පිළක්) අනු-දනිමි'' යි වදාළ සේක.

පාත්‍රමාලකයෙන් ගිලිහී වැටී පාත්‍රය බිඳෙයි. භාග්‍යවතුන් වහන්-සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, පාත්‍රකණ්ඩොලිකාවක් (පාත්‍රය තබන කුඩයක්) අනුදනිමි'' යි වදාළ සේක.

පාත්‍රකණ්ඩාලිකායෙහි පාත්‍රය ගැටී ගෙවෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, (පාත්‍රය බහාලන්නට) ථවිකයක් (පසුම්බියක්) අනුදනිමි'' යි වදාළ සේක.

එල්ලා ගන්නට අංසබන්ධකයෙක් (උරේ හිසේ එල්වන පටියෙක්) නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

''මහණෙනි, අංසබන්ධකයක් (උරබඳනාවක්) ද බඳනා හුයක් ද අනුදනිමි'' යි වදාළ සේක.

48. එ සමයෙහි මහණහු භිත්තිඛිලයෙහි (බිත්තියෙහි ගසන ලද උලෙක) ද නාගදන්තකයෙහි ද (බිත්තියෙහි සවි කළ ඇත්දතෙහි) ද පාත්‍රය එල්ලත්. ඇදවැටී පාත්‍රය බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, පාත්‍රය නො එල්ලියයුතු. යමෙක් එල්ලන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ යැ'' යි වදාළ සේක.

49. තෙන ඛො පන සමයෙන භික්ඛූ මඤ්චෙ පත්තං නික්ඛිපන්ති. සතිසම්මොසා නිසීදන්තා ඔත්ථරිත්වා පත්තං භින්දන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, මඤ්චෙ පත්තො නික්ඛිපිතබ්බො. යො නික්ඛිපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

50. තෙන ඛො පන සමයෙන භික්ඛූ පීඨෙ පත්තං නික්ඛිපන්ති. සතිසම්මොසා නිසීදන්තා ඔත්ථරිත්වා පත්තං භින්දන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, පීඨෙ පත්තො නික්ඛිපිතබ්බො. යො නික්ඛිපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

51. තෙන ඛො පන සමයෙන භික්ඛූ අඞ්කෙ පත්තං නික්ඛිපන්ති. සතිසම්මොසා වුට්ඨහන්ති. පරිපතිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, අඞ්කෙ පත්තො නික්ඛිපිතබ්බො. යො නික්ඛිපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

52. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඡත්තෙ පත්තං නික්ඛිපන්ති. වාතමණ්ඩලිකාය ඡත්තං උක්ඛිපියති. පරිපතිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, ඡත්තෙ පත්තො නික්ඛිපිතබ්බො. යො නික්ඛිපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

53. තෙන ඛො පන සමයෙන භික්ඛූ පත්තහත්ථා කවාටං පණාමෙන්ති. කවාටො ආවට්ටිත්වා පත්තො භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, පත්තහත්ථෙන කවාටො පණාමෙතබ්බො. යො පණාමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

54. තෙන ඛො පන සමයෙන භික්ඛූ තුම්බකටාහෙ පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි තිත්ථියා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ, තුම්බකටාහෙ පිණ්ඩාය චරිතබ්බං, යො චරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

49. එ සමයෙහි වනාහි මහණහු ඇඳෙහි පාත්‍රය තබත්. සිහි මුළාවෙන් ඉඳගන්නාහු වැතිර පාත්‍රය බිඳිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, ඇඳෙහි පාත්‍රය නො තැබියයුතු. යමෙක් තබන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළ සේක.

50. එ සමයෙහි මහණහු පුටුවෙහි පාත්‍රය තබත්. සිහි මුළාවෙන් ඉඳගන්නාහු වැතිර පාත්‍රය බිඳිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, පුටුවෙහි පාත්‍රය නො තැබියයුතු. යමෙක් තබන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළ සේක.

51. එ සමයෙහි මහණහු ඇකයෙහි පාත්‍රය තබත්. සිහි නැති ව නැඟී සිටීත්. පාත්‍රය වැටී බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි ඇකයෙහි පාත්‍රය නො තැබියයුතු. යමෙක් තබන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළ සේක.

52. එ සමයෙහි මහණහු ඡත්‍රයෙහි පාත්‍රය තබත්. සුළි හුළඟින් ඡත්‍රය එසැවෙයි. පාත්‍රය වැටී බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, ඡත්‍රයෙහි පාත්‍රය නො තැබියයුතු. යමෙක් තබන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළ සේක.

53. එ සමයෙහි මහණහු පාත්‍රය ගත් අතැත්තාහු කවුළුව අරිත්. කවුළුව පෙරළී ඊමෙන් පාත්‍රය බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

**"මහණෙනි, පාත්‍රය ගත් අතැතියහු විසින් කවුළුව නො ඇරිය යුතු. යමෙක් අරින්නේ ද ඔහුට දුකුළා ඇවැත් වේ"** යැ යි වදාළ සේක.

54. එ සමයෙහි මහණහු ලබු කබලෙන් (ලබු කබලක් අතැති වැ) පිඩු පිණිස හැසිරෙත්. මිනිස්සු 'තීර්ථකයන් බඳුහ'යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, ලබුකබලෙන් පිඩුසිගා නො හැසිරිය යුතු. යමෙක් හැසිරෙන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"**යි වදාළ සේක

55. තෙන ඛො පන සමයෙන භික්ඛූ සටිකටාහෙ පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ,සෙය්‍යථාපි තිත්ථියා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

''න භික්ඛවෙ, සටිකටාහෙ පිණ්ඩාය චරිතබ්බං, යො චරෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

56. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සබ්බපංසු-කුලිකො හොති. සො ඡවසීසස්ස පත්තං ධාරෙති, අඤ්ඤතරා ඉත්ථී පස්සිත්වා භීතා විස්සරමකාසි 'අබ්භුං මෙ, පිසාචො වතායන්ති'. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, 'කථං හි නාම සමණා සක්‍යපුත්තියා ඡවසීසස්ස පත්තං ධාරෙස්සන්ති, සෙය්‍යථාපි පිසාචිල්ලි-කා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

''න භික්ඛවෙ, ඡවසීසස්ස පත්තො ධාරෙතබ්බො. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, සබ්බපංසුකුලිකෙන භවිතබ්බං. යො භවෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

57. තෙන ඛො පන සමයෙන භික්ඛූ චලකානිපි අට්ඨිකානිපි උච්චිට්ඨොදකම්පි පත්තෙන නීහරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'යස්මිං යෙවිමෙ සමණා සක්‍යපුත්තියා භුඤ්ජන්ති සොව නෙසං පටිග්ගහොති' භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

''න භික්ඛවෙ, චලකානි වා අට්ඨිකානි වා උච්චිට්ඨොදකං වා පත්තෙන නීහරිතබ්බං. යො නීහරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, පටිග්ගහ''න්ති.

58. තෙන ඛො පන සමයෙන භික්ඛූ හත්ථෙන විපාටෙත්වා චීවරං සිබ්බෙන්ති. චීවරං විලොමං හොති. භගවතො එතමත්ථං ආරො-චෙසුං.

''අනුජානාමි භික්ඛවෙ, සත්ථකං නමතක''න්ති.

59. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස දණ්ඩසත්ථකං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ, දණ්ඩසත්ථක''න්ති.

55. එ සමයෙහි මහණහු සවිකටාහයෙන් (කළ කබලක් ගෙන) පිඩු පිණිස හැසිරෙත්. 'තීර්ථකයන් බඳුහ'යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ...

**''මහණෙනි, සවිකටාහයෙන්** (කළ කබලෙහි) **පිඩු පිණිස නො හැසිරියයුතු. යමෙක් හැසිරෙන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදළ සේක.

56. එ සමයෙහි වනාහි එක්තරා මහණෙක් හැම පිරිකරින් ම පාංශුකූලික වෙයි. (හැම පිරිකරක් ම පාංශුකූල වශයෙන් සොයා ගත් දැයින් සකස් කොට ගෙන දරන්නේ වෙයි.) හෙතෙම මිනීහිස් කබලකින් කළ පාත්‍රයක් දරයි. එක්තරා ස්ත්‍රියක් ඔහු දැක බිය පත් වූවා, 'මට විපතෙක, ඒකාන්තයෙන් මේ පිශාචයෙකැ'යි කෑගැසූ ය. 'කෙසේ නම් ශාක්‍යපුත්‍රික ශ්‍රමණයෝ පිසස් පැටියන් සේ මිනීහිසින් කළ පාත්‍රයක් දරත් දැ'යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ...

''මහණෙනි, **මිනීහිසින් කළ පාත්‍රයක් නො දැරියයුතු. යමෙක් දරන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''**යි වදළ සේක.

57. එ සමයෙහි වනාහි මහණහු (විකා දමූ) සප ද ඇට කටු ද ඉඳුල්දිය ද පාත්‍රයෙන් ගෙන ගොස් ඉවත ලත්. 'මේ ශාක්‍යපුත්‍රික මහණහු යම් පාත්‍රයෙක ම වළඳත් ද එය ම ඔවුන් කුණු දමන බඳුන වේ යැ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ...

''මහණෙනි, **සප හෝ ඇට හෝ ඉඳුල්දිය හෝ පාත්‍රයෙන් ඉවතට ගෙන නො යායුතු. යමෙක් ගෙන යන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, කුණු දමන්නට බඳුනක් අනුදනිමි''** යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

58. එ සමයෙහි මහණහු අතින් ඉරා සිවුරු මසත්. සිවුරු විලොම් (විසම) වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**''මහණෙනි, පිහියක් ද පිහියට වැස්මක් ද අනුදනිමි''** යි භාග්‍ය-වතුන් වහන්සේ වදළ සේක.

59. එ සමයෙහි වනාහි සංඝයාට දණ්ඩශස්ත්‍රකයෙක් (මිට සහිත පිහියක්) උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කළහ.

**''මහණෙනි, දණ්ඩශස්ත්‍රකය** (මිට සහිත පිහිය) **අනුදනිමි''** යි **භාග්‍යවතුන්** වහන්සේ වදළ සේක.

60. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචෙ සත්ථකදණ්ඩෙ ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

**"න භික්ඛවෙ, උච්චාවචා සත්ථකදණ්ඩා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමයන්ති."**

61. තෙන ඛො පන සමයෙන භික්ඛූ කුක්කුටපත්තෙන පි වෙළුපෙසිකාය පි චීවරං සිබ්බෙන්ති චීවරං දුස්සිබ්බිතං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ සූචි"න්ති.**

සූචියො කණ්ණකිතායො හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ සූචිනාළික"න්ති.**

සූචිනාළිකායපි කණ්ණකිතායො හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ කිණ්ණෙන පූරෙතු"න්ති.**

කිණ්ණෙපි කණ්ණකිතායො හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ සත්තුයා පූරෙතු"න්ති.**

සත්තුයාපි කණ්ණකිතායො හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ සරිතක"න්ති.**

සරිතකෙනපි කණ්ණකිතායො හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ මධුසිත්ථකෙන සාරෙතු"න්ති.**

සාරිතකං පරිභිජ්ජති.

**"අනුජානාමි භික්ඛවෙ සාරිතසිපාටික"න්ති.**

62. තෙන ඛො පන සමයෙන භික්ඛූ තත්ථ තත්ථ ඛිලං නිඛනිත්වා සම්බන්ධිත්වා චීවරං සිබ්බන්ති. චීවරං විකණ්ණං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"අනුජානාමි භික්ඛවෙ කඨිනං, කඨිනරජ්ජුං. තත්ථ තත්ථ ඔබන්ධිත්වා චීවරං සිබ්බෙතු"න්ති".**

60. එ සමයෙහි ෂවග මහණහු රන්මුවා ද රිදීමුවා ද කුදු මහත් පිහියා මිටි දරත්. 'කාමභොගී ගිහියන් මෙනැ'යි මිනිස්සු ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**''මහණෙනි, කුදු මහත් පිහියා මිටි නො දැරියයුතු. යමෙක් දරන්නේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඇටමුවා, දත්මුවා, අංමුවා, බටදඬුමුවා, හුණදඬුමුවා, දඬුමුවා, ලහමුවා, පලමුවා, ලොහොමුවා, සක්නැබමුවා පිහියාමිටි අනුදනිමි''** යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

61. එ සමයෙහි වනාහි මහණහු කුකුළු පිහාටුයෙන් ද උන පතුරෙන් කළ කුරෙන් ද සිවුරු මසත්. සිවුරු නොමනා ව මැසුණේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, හිදිකටුව අනුදනිමි''යි (භාග්‍යවතුන් වහන්සේ) වදළසේක. හිදිකටු මල බැඳුණේ වෙයි.

''මහණෙනි, හිදිකටුකුලාව අනුදනිමි''යි වදළ සේක. හිදිකටුකුලායෙහි (බහාලන ලද්දහු) ද මලබැඳුණාහු වෙත්.

''මහණෙනි, රාබිජු සුණුයෙන් පුරවන්නට අනුදනිමි''යි වදළ සේක.

රාබිජු සුණුයෙන් පුරවන ලද්දහු ද මල බැඳුණාහු වෙත්.

''මහණෙනි, කහමුසු විළඳ සුණුයෙන් පුරවන්නට අනුදනිමි''යි වදළ සේක.

කහමුසු විළඳ සුණුයෙන් (පුරාලන ලද්දහු) ද මල බැඳුණාහු වෙත්.

''මහණෙනි, ගල් කුඩුවලින් පුරවන්නට අනුදනිමි''යි වදළ සේක. ගල්කුඩුවලින් පුරවන ලද්දහු ද මල බැඳුණාහු වෙත්.

''මීඉටියෙන් (තවරන්නට) අනුදනිමි''යි වදළසේක. තවරන ලද මීඉටි ගැළැවී වැටෙයි.

''මහණෙනි, මීඉටි ගෑ රෙදි කඩක් අනුදනිමි''යි වදළසේක.

62. එ සමයෙහි මහණහු ඒ ඒ තැන හුල් සිටුවා සම්බන්ධ කොට සිවුරු මසත්. සිවුරු විකර්ණ (සම නොවූ) කොන් ඇත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, කඨිනය (සිවුරුහිණ) ද කඨින රැහැන (සිවුරුහිණෙහි බඳනා රැහැන) ද යන දෙකත් ඒවායේ ඒ ඒ තැනැ සිවුර නමා බැඳ මසන්නට අනුදනිමි''යි වදළසේක.

විසමෙ කඨිනං පත්ථරන්ති. කඨිනං පරිභිජ්ජති.

**"න භික්ඛවෙ විසමෙ කඨිනං පත්ථරිතබ්බං. යො පත්ථරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

ඡමාය කඨිනං පත්ථරන්ති. කඨිනං පංසුකිතං හොති.

**"අනුජානාමි භික්ඛවෙ තිණසන්ථාරකන්ති".**

කඨිනස්ස අන්තො ජීරති.

**"අනුජානාමි භික්ඛවෙ අනුවාතං පරිභණ්ඩං ආරොපෙතුන්ති".**

කඨිනං **නප්පහොති.**

**"අනුජානාමි භික්ඛවෙ දණ්ඩකඨිනං විදලකං සලාකං විනන්ධනරජ්ජුං විනන්ධනසුත්තකං විනන්ධිත්වා චීවරං සිබ්බෙතුන්ති".**

සුත්තන්තරිකායො විසමා හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ කලිම්බකන්ති".**

සුත්තා වඞ්කා හොන්ති.

**"අනුජානාමි භික්ඛවෙ මොඝසුත්තකන්ති."**

63. තෙන ඛො පන සමයෙන භික්ඛූ අධොතෙහි පාදෙහි කඨිනං අක්කමන්ති. කඨිනං දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ අධොතෙහි පාදෙහි කඨිනං අක්කමිතබ්බං. යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සාති".**

64. තෙන ඛො පන සමයෙන භික්ඛූ අල්ලෙහි පාදෙහි කඨිනං අක්කමන්ති. කඨිනං දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ අල්ලෙහි පාදෙහි කඨිනං අක්කමිතබ්බං. යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

65. තෙන ඛො පන සමයෙන භික්ඛූ සඋපාහනා කඨිනං අක්කමන්ති. කඨිනං දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ සඋපාහනෙන කඨිනං අක්කමිතබ්බං. යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

නො සම තන්හි සිවුරුහිණ තබත්. එය බිඳී වැටෙයි.

"මහණෙනි, නො සමවූ තැන සිවුරුහිණ නො තැබියයුතු. යමෙක් තබන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදාළ සේක.

සිවුරුහිණ බිමැ තබත්. එය දූලියෙන් බැඳුණේ වෙයි.

''මහණෙනි, තණඇතිරිය අනුදනිමි''යි වදාළ සේක.

කඨිනයේ කොන් දිරයි.

''මහණෙනි, වාටියක් යොද පිරිබඩ නංවන්නට අනුදනිමි''යි වදාළ සේක.

සිවුරුහිණ නො පොහොනේ වෙයි (මඳ වෙයි).

''මහණෙනි, දණ්ඩකඨිනය ද සිවුරුහිණැ මැදට බඳනා දණ්ඩ ද විදලකය ද (දණ්ඩකඨිනයේ ප්‍රමාණය අනුව) කළාලයේ කොන් දෙක අකුළා දෙපට කිරීම ද,

සලාකාව ද (දෙපට සිවුර මැදට දමන කූර ද) විනන්ධන රජ්ජුව ද,

මහ සිවුරුහිණ හා කුඩා සිවුරුහිණ බඳනා රැහැන ද කුඩා සිවුරුහිණෙහි සිවුර බඳනා හුය ද එසේ බැඳ සිවුර මහන්නට ද අනුදනිමි''යි වදාළ සේක.

සූත්‍රාන්තරිකාවෝ (හූ අතරැ පෙදෙස්හු) විසම වෙත්. (සමාන ව නො සිටිත්).

''මහණෙනි, (අතර ප්‍රමාණය හඟවන) කිළිඹුවක් (තල්කොළ කැබැලි ආදී මිම්මක්) අනුදනිමි''යි වදාළ සේක.

හූ ඉරි ඇද වේ.

''(සිවුර මසා අවසන් වූ පසු ගළවා දමන) බොරු හූ ගැසීම අනුදනිමි''යි වදාළසේක.

63. එ සමයෙහි මහණහු නො දෙවූ පයින් සිවුරුහිණ ඇක්මෙත්. සිවුරුහිණ දූෂ්‍ය වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, නොදෙවූ පයින් යුතු ව සිවුරුහිණ නො ඇක්මියයුතු. යමෙක් ඇක්මෙන්නේ නම් (පා ගාන්නේ නම් දුකුළා ඇවැත් වන්නේය''.

64. එ සමයෙහි මහණහු තෙත් පයින් සිවුරුහිණ ඇක්මෙත්. සිවුරුහිණ දූෂ්‍ය වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, තෙත් පයින් සිවුරුහිණ නො ඇක්මියයුතු (පා නො ගැසිය යුතු). යමෙක් ඇක්මෙන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය".

65. එ සමයෙහි මහණහු පාවහන් ඇත්තාහු සිවුරුහිණ ඇක්මෙත් (පාගත්). සිවුරුහිණ දූෂ්‍ය වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, පාවහන් සහිත වූවහු විසින් සිවුරුහිණ නො ඇක්මියැයුතු. යමෙක් ඇක්මෙන්නේ ද දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදාළ සේක.

66. තෙන ඛො පන සමයෙන භික්ඛූ චීවරං සිබ්බන්තා අඞ්ගුලියා පටිග්ගණ්හන්ති, අඞ්ගුලියො දුක්ඛා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පටිග්ගහන්ති"

67. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචෙ පටිග්ගහෙ ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ උච්චාවචා පටිග්ගහා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමයන්ති".

68. තෙන ඛො පන සමයෙන සූචියොපි සත්ථකාපි පටිග්ගහාපි නස්සන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආවෙසනවිත්ථකන්ති".

ආවෙසනවිත්ථකෙ සමාකුලා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පටිග්ගහන්ති".

අංසබද්ධකො න හොති.

"අනුජානාමි භික්ඛවෙ අංසබද්ධකං බන්ධනසුත්තකන්ති".

69. තෙන ඛො පන සමයෙන භික්ඛූ අබ්භොකාසෙ චීවරං සිබ්බන්තා සීතෙනපි උණ්හෙනපි කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ කඨිනසාලං කඨිනමණ්ඩපන්ති".

කඨිනසාලා නීචවත්ථුකා හොති. උදකෙන ඔත්ථරීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති".

චයො පරිපතති.

"අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති".

ආරොහන්තා විහඤ්ඤන්ති.

"අනුජානාමි භික්ඛවෙ තයො සොපානෙ ඉට්ඨකාසොපානං සිලාසොපානං දරුසොපානන්ති".

ආරොහන්තා පරිපතන්ති.

"අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති".

66. එ සමයෙහි මහණහු සිවුරු මහන්නාහු හිදිමුව ඇඟිල්ලෙන් පිළිගනිත්. (ඉදිකටු මුණත ඇඟිල්ලෙන් ගෙන අදිත්) ඇඟිල්ලෝ රිදුම් ඇත්තෝ වෙත් (ඇඟිලි රිදේ). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, පිළිගාව (දිදුලය) අනුදනිමි''යි වදළසේක.

67. එ සමයෙහි සවග මහණහු රන්මුවා වූ ද රිදීමුවා වූ ද කුඩු මහත් පිළිගාවන් (දිදුල) දරත්. මිනිස්සු ''මොහු කාමභොගී ගිහීන් බඳුවහ''යි ලාමක කොට සිතත්, නො ගුණ කියත්, දෙස් කතා පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, (රන්රිදීමුවා) කුඩු මහත් පිළිගා (දිදුල) නො දැරිය යුතු. යමෙක් දරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඇටින් කරන ලද, ඇත්දළ ඇ දළින් කරන ලද, අඟින් කරන ලද, ගෙඩිවල ලෙල්ලෙන් කරන ලද, ලොහයෙන් කරන ලද සක්නැබින් කරන ලද පිළිගාව (දිදුලය) අනුදනිමි''යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

68. එ සමයෙහි හිදිකටු ද පිහියා ද පිළිගාවෝ (දිදුල) ද නැසෙත් (නැති වෙත්). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි; ඇව්සුම් වීතක් (ඉදිකටු කුලා ආදිය තබන කුඩා පෙට්ටියක් හෝ කොපුවක්) අනුදනිමි''යි වදළසේක.

ඇව්සුම්විතෙහි ඒ හිදිකුලා ආදීහු එකට අවුල්වූවාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, පිළිගාවට (දිදුලයට) පසුම්බියක් අනුදනිමි''යි වදළසේක.

පිළිගා පසුම්බියට උරබඳනාවෙක් (උරේ එල්ලා ගැනීමට පටියෙක්) නො වෙයි.

''මහණෙනි, උරබඳනාව ද බඳනා හුය ද අනුදනිමි''යි වදළසේක.

69. එ සමයෙහි මහණහු එළිමහනෙහි (හිඳ සිවුරු මහන්නාහු ශීතයෙන් ද උෂ්ණයෙන් ද පෙළෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, සිවුරුහිණ තබන්නට ශාලාවක් සිවුරුහිණට මඩුවක් අනුදනිමි''යි වදළසේක.

සිවුරුහිණිහල (කඨින ශාලාව) මිටි බිමක් ඇත්තේ වෙයි. දියෙන් වැසෙයි (දියට යට වෙයි.) භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, සිවුරුහිණිහල උස් බිම් ඇතියක් කරන්නට (එහි බිම උස් කොට නංවන්නට) අනුදනිමි''යි වදළසේක.

උස් කොට නඟන ලද බිමැ පස් ඇදහැළෙයි.

''මහණෙනි, ගඩොළුයෙන් කළ බැඳුම ද ගලින් කළ බැඳුම ද ලීයෙන් කළ බැඳුම ද යි බැඳුම් තුනක් අනුදනිමි''යි වදාළසේක.

උස් කොට බඳනා ලද බිමට නඟින්නාහු වෙහෙසෙත්.

''මහණෙනි, ගඩොළු හිණ (තරප්පුව) ගල්මුවා හිණ (තරප්පුව) දඬුමුවා හිණ (තරප්පුව) ද යනු තුන් හිණ අනුදනිමි''යි වදාළසේක.

හිණෙහි නඟින්නාහු ඇද වැටෙත්.

''ගරාදි වැටක් අනුදනිමි'යි වදාළ සේක.

කඨිනසාලාය තිණචුණ්ණං පරිපතති. "අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති".

70. තෙන ඛො. පන සමයෙන භික්ඛූ චීවරං සිබ්බෙත්වා තත්ථෙව කඨිනං උජ්ඣිත්වා පක්කමන්ති. උන්දූරෙහි පි උපචිකාහි පි ඛජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ කඨිනං සඞ්ඝරිතුන්ති".

කඨිනං පරිභිජ්ජති. "අනුජානාමි භික්ඛවෙ ගොඝංසිකාය කඨිනං සඞ්ඝරිතුන්ති".

කඨිනං විනිවෙඨියති. "අනුජානාමි භික්ඛවෙ බන්ධනරජ්ජුන්ති".

71. තෙන ඛො පන සමයෙන භික්ඛූ කුඩ්ඩෙ පි ථම්භෙ පි කඨිනං උස්සාපෙත්වා පක්කමන්ති. පරිපතිත්වා කඨිනං භිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ භිත්තිඛිලෙ වා නාගදන්තෙ වා ලග්ගෙතුන්ති".

72. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන වෙසාලි තෙන චාරිකං පක්කාමි. තෙන ඛො පන සමයෙන භික්ඛූ සූචිකම්පි සත්ථකම්පි භෙසජ්ජම්පි පත්තෙන ආදාය ගච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ භෙසජ්ජත්ථවිකන්ති".

අංසබද්ධකො න හොති.

"අනුජානාමි භික්ඛවෙ අංසබද්ධකං බන්ධනසුත්තකන්ති".

73. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු උපාහනායො කායබන්ධනෙන බන්ධිත්වා ගාමං පිණ්ඩාය පාවිසි. අඤ්ඤතරො උපාසකො තං භික්ඛුං අභිවාදෙන්තො උපාහනායො සීසෙන ඝට්ටෙසි. සො භික්ඛු මඞ්කු අහොසි. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ උපාහනත්ථවිකන්ති".

අංසබද්ධකො න හොති. "අනුජානාමි භික්ඛවෙ අංසබද්ධකං බන්ධනසුත්තකන්ති".

74. තෙන ඛො පන සමයෙන අන්තරාමග්ගෙ උදකං අකප්පියං හොති. පරිස්සාවනං න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පරිස්සාවනන්ති".

චොළකං නප්පහොති.

"අනුජානාමි භික්ඛවෙ කටච්ඡුපරිස්සාවනන්ති". චොළකං නප්පහොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ධම්මකරකන්ති".

කඨින ශාලායෙහි තණරොඩු වැටෙයි. "මහණෙනි, සණ දඩු අතුරා පියස්ස තනා ඇතුළතත් පිටතත් සුදු පැහැ වූ හෝ කළු පැහැ වූ හෝ බදම ආලේප කරන්නට ගුරු පැහැයෙන් පිරියම් හෝ කරන්නට, මාලාකම් ලතාකම් කරන්නට මෝර දති හෝ අඳින්නට දැහිඟුල් ඇ පස් පැහැයෙන් වණ්වත් කරන්නට ද අනුදනිමි. සිවුරු වනා තබන්නට දණ්ඩක් ද සිවුරු වනන්නට රැහැනක් ද අනුදනිමි" යි වදළසේක.

70. එ සමයෙහි මහණහු සිවුරු මසා සිවුරුහිණ එහි ම හැරදමා පිටත් වැ යෙත්. මීයන් විසින් ද වේයන් විසින් ද සිවුරුහිණ කනු ලැබෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, සිවුරුහිණ අකුළා තබන්නට අනුදනිමි"යි වදළසේක: සිවුරුහිණ බිඳීයයි. "මහණෙනි, දණ්ඩක් ඇතුළැ බහා තද කොට සිවුරුහිණ අකුළා තබන්නට අනුදනිමි"යි වදළසේක.

සිවුරුහිණ ලිහෙයි. "මහණෙනි, බඳිනා රැහැනක් අනුදනිමි"යි වදළ සේක.

71. එ සමයෙහි මහණහු බිත්තියෙක ද කණුවෙක ද සිවුරුහිණ ඔසොවා තබා නික්ම යෙත්. ඇද වැටී සිවුරුහිණ බිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, බිත්තියෙහි ගසන ලද හුලෙක හෝ ඇත් දතක් සේ බිත්තියෙහි සවි කළ උපකරණයෙක හෝ සිවුරුහිණ එල්ලා තබන්නට අනුදනිමි"යි වදළසේක.

72. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කැමැති තාක් කල් වැස විසල්මහනුවරට සැරිසරා වැඩි සේක. එ සමයෙහි මහණහු හිඳිකටුව ද පිහිය ද බෙහෙත් ද පාත්‍රයෙන් ගෙන යෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, බෙහෙත් පසුම්බිය අනුදනිමි"යි වදළසේක. උරබඳනාවෙක් නො වෙයි. "මහණෙනි, උරබඳනාව ද බඳනාහුය ද අනුදනිමි"යි වදළසේක.

73. එ සමයෙහි එක්තරා මහණෙක් පාවහන් කාබහනින් (පටියෙන්) බැඳ එල්ලා ගෙන ගමට පිඩු පිණිස පිවිසියේය. එක්තරා උපාසකයෙක් එ මහණහට වඳිනුයේ පාවහන් හිසින් ගැටී ය. ඒ මහණ නිස්තෙජස්ක වීය. ඉක්බිති ඒ මහණ අරම් ගොස්, මහණුනට මෙ පවත් සැලකෙළේ ය. මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, උපාහනථවිකයක්, අනුදනිමි"යි වදළසේක. උරබඳනායෙක් නො වෙයි. "මහණෙනි, උරබඳනාවක් ද බඳනා හුයක් ද අනුදනිමි"යි වදළසේක.

74. එ සමයෙහි වනාහි අතර මහ ජලය (පෙරා නැති බැවින්) නො කැප වෙයි. පෙරහනෙක් නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, පෙරහන්කඩ අනුදනිමි"යි වදළ සේක.

රෙදි කඩ නො පොහොනේ වෙයි. (මදි වෙයි). "මහණෙනි, කිණිසි පෙරහන අනුදනිමි"යි වදළ සේක. එයට ද රෙදි කඩ මදවෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, ධමකරණ අනුදනිමි"යි වදළසේක.

75. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛූ කොසලෙසු ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. එකො භික්ඛු අනාචාරං ආචරති. දුතියො භික්ඛු තං භික්ඛුං එතදවොච, 'මා ආවුසො එවරූපං අකාසි. නෙතං කප්පතී'ති. සො තස්මිං උපනන්ධි[1]. අථ ඛො සො භික්ඛු පිපාසාය පීළිතො උපනද්ධං භික්ඛුං එතදවොච 'දෙහි මෙ ආවුසො පරිස්සාවනං පානීයං පිවිස්සාමී'ති උපනද්ධො භික්ඛු න අදාසි. සො භික්ඛු පිපාසාය පීළිතො කාලමකාසි. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. "කිම්පන ත්වං ආවුසො පරිස්සාවනං යාචියමානො න අදාසී"ති. 'එවමාවුසො'ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, 'කථං හි නාම භික්ඛු පරිස්සාවනං යාචියමානො න දස්සතී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා තං භික්ඛුං පටිපුච්ඡි 'සච්චං කිර ත්වං භික්ඛු පරිස්සාවනං යාචියමානො න අදාසී'ති· 'සච්චං භගවා'. විගරහි බුද්ධො භගවා, 'අනනුච්ඡවිකං මොඝපුරිස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං, කථං හි නාම ත්වං මොඝපුරිස, පරිස්සාවනං යාචියමානො න දස්සසි? නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං මොඝපුරිස අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා'ති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "න භික්ඛවෙ අද්ධානමග්ගපටිපන්නෙන භික්ඛුනා පරිස්සාවනං යාචියමානෙන න දාතබ්බං යො න දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස, න ච භික්ඛවෙ අපරිස්සාවනකෙන අද්ධානමග්ගො පටිපජ්ජිතබ්බො. යො පටිපජ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. සචෙ න හොති පරිස්සාවනං වා ධම්මකරකො වා සඞ්ඝාටිකණ්ණොපි අධිට්ඨාතබ්බො ඉමිනා පරිස්සාවෙත්වා පිවිස්සාමී"ති.

76. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන වෙසාලී තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ. කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන භික්ඛූ නවකම්මං කරොන්ති. පරිස්සාවනං න සම්මති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

---

1. උපනන්ධි - සීමු.

75. එ සමයෙහි දෙමහණහු කෙනෙක් කොසොල් රටැ දික්මඟට පිළිපන්නාහු වෙත්. එක් මහණෙක් අනාචාර කෙරෙයි. (නො මනා ලෙස හැසිරෙයි). දෙවෙනි මහණ එකී මහණහට ''ඇවැත්නි, මෙ බඳු දෑ නො කරන්න. මෙය කැප නො වේ යැ''යි කී ය. එ මහණ, වෛර බැන්දේ ය. එ කල්හි ඒ (පළමු) මහණ පවසින් පෙළුණේ වෙර බැඳි මහණහු බණවා, ''ඇවැත්නි, ඔබගෙ පෙරහන දෙන්න, පැන් බොනු කැමැත්තෙමි''යි කී ය. වෙරබැඳි මහණ එය නො දුන්නේ ය. ඒ පළමු මහණ පවසින් පෙළුණේ කලුරිය කෙළේය. එයින් පසු එ (දෙවෙනි) මහණ අරම් ගොස් මහණුනට මෙ පවත් සැලකෙළේය. ''කිමෙක් ද ඇවැත්නි, තෙපි පෙරහණ ඉල්ලනු ලබන්නහු නො දුන්නු ද?''යි භික්‍ෂූහු ඇසූහ. ''එසේ ය, ඇවැත්නි''යි හේ කී ය. අල්පෙච්ඡ වූ සන්තුෂ්ට වූ ලජ්ජී වූ සුළු වරදෙහි පවා කුකුස් කරන්නාවූ ශික්‍ෂාකාමී වූ යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු ''කෙසේ නම් මහණෙක් පෙරහන ඉල්ලනු ලබනුයේ නො දෙන්නේ ද?''යි ලාමක කොට සිතත්, අගුණ බෙණෙත්, නොගුණ පතුරුවත්. ඉක්බිති ඒ මහණහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළාහ.

එකලැ භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කරුණෙහි බික්සඟන රැස් කරවා, ''සැබෑ ද, මහණ තෝ පෙරහන ඉල්ලනු ලබනුයෙහි නො දුන්නෙහි ද?'' යි ඒ මහණහු පුළුවුත්සේක. ''භාග්‍යවතුන් වහන්ස සැබවැ''යි එ මහණ පිළිවදන් දුන. ''හිස් පුරුෂය, මෙය නොනිසි ය. (මහණහට) නො ගැළැපෙන්නෙකි. නො සුදුස්සෙකි. මහණ කමට නො වටනා එකෙකි. නොකැප එකෙකි. නො කටයුත් තෙකි. කෙසේ නම්, හිස් මිනිස, තෝ පෙරහන ඉල්ලනු ලබනුයෙහි නො දුන්නෙහි ද?. හිස් මිනිස, මෙය (සස්නැ) නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස ද පහන් වූවන්ගේ ප්‍රසාද වැඩීම ද පිණිස නොවේ. වැලි, හිස් මිනිස, මෙය නො පහනුන්ගේ නො පැහැදීම පිණිස ද පැහැදුණු ඇතැම් කෙනකුන්ගේ වෙනස් වීම පිණිස ද වේ යැ''යි භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගැරැහූ සේක. ගරහා, දැහැමි කථා කොට, මහණුන් බණවා ''මහණෙනි, දිග්මඟ පිළිපන් මහණක්හු විසින් පෙරහන ඉල්ලනු ලබන්නහු විසින් එය නොදියැ යුතු නො වේ. යමෙක් නො දෙන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, මහණහු පෙරහනක් නැතිව දික්මඟ නො යෑ යුතු. යමෙක් එසේ යන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. ඉදින් පෙරහනෙක් හෝ ඩබරාවෙක් හෝ නැති නම්, 'මෙයින් පෙරහා බොන්නෙමි'යි සඟළසිවුරු කොන වුව ද ඉටා ගතයුතු''යැ යි වදළ සේක.

76. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් සැරි සරා වඩනාසේක්, විසල් මහපුරට බටසේක. එහි වූ කලි මහ වෙනෙහි කුළාරහලෙහි වැඩ වසන සේක. එ සමයෙහි වූ කලි මහණහු නව කම් (අළුත්වැඩියා කැරුම්) කෙරෙත් පෙරහන ප්‍රමාණ නො වෙයි (මදි වෙයි). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"අනුජානාමි භික්ඛවෙ දණ්ඩපරිස්සාවනන්ති". දණ්ඩපරිස්සාවනං න සම්මති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ඔත්ථරකන්ති".

77. තෙන ඛො පන සමයෙන භික්ඛූ මකසෙහි උබ්බාළ්හා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ මකසකුටිකන්ති".

78. තෙන ඛො පන සමයෙන වෙසාලියං පණීතානං භත්තානං භත්තපටිපාටි අධිට්ඨිතා හොති. භික්ඛූ පණීතානි භොජනානි භුඤ්ජිත්වා අභිසන්නකායා හොන්ති බහ්වාබාධා. අථ ඛො ජීවකො කොමාරභච්චො වෙසාලිං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අද්දසා ඛො ජීවකො කොමාරභච්චො භික්ඛූ අභිසන්නකායෙ බහ්වාබාධෙ. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: එතරහි භන්තෙ භික්ඛූ අභිසන්නකායා බහ්වාබාධා. සාධු භන්තෙ භගවා භික්ඛූනං චඞ්කමඤ්ච ජන්තාඝරඤ්ච අනුජානාතු එවං භික්ඛූ අප්පාබාධා භවිස්සන්තීති.

අථ ඛො භගවා ජීවකං කොමාරභච්චං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ චඞ්කමඤ්ච ජන්තාඝරඤ්චාති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ විසමෙ චඞ්කමෙ චඞ්කමන්ති. පාදා දුක්ඛා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ සමං කාතුන්ති." චඞ්කමො නීචවත්ථුකො හොති. උදකෙන ඔත්ථරීයති. "අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති." චයො පරිපතති. "අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දාරුචයන්ති."

"මහණෙනි, දඬුපෙරහන අනුදනිමි"යි වදළසේක. දඬුපෙරහන ද ප්‍රමාණ නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි අවස්තරකය (ළිඳ තුළැ බහා දිය පෙරා ගන්නා පෙරහනය) අනුදනිමි"යි වදළසේක.

77. එ සමයෙහි වනාහි මහණහු මදුරුවන් ගෙන් පෙළුණෝ වූහ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දන්වූහ. "මහණෙනි, සිවුරු කිළියක් අනුදනිමි"යි වදළසේක.

78. එ සමයෙහි විසල් මහනුවරැ ප්‍රණීත බත් සම්බන්ධ බත් පිළිවෙළෙක් ඉටන ලද්දේ (නියම කැරැ ගන්නා ලද්දේ) වෙයි. මහණහු ප්‍රණීත බොජුන් වළඳා වැඩුණු සිරුරු ඇත්තාහු බොහෝ ආබාධ ඇත්තෝ වෙත්. එ කල්හි කොමාරභච්ච ජීවක තෙම කිසි කටයුත්තෙකින් විසල් මහනුවරට ගියේ ය. කොමාරභච්ච ජීවක තෙම වැඩීගිය සිරුරු ඇති බොහෝ ආබාධ ඇති මහණුන් දිටී ය. දැක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් කොමාරභච්ච ජීවක තෙම "වහන්ස, දන් භික්ෂූහු වැඩුණු සිරුරු ඇත්තාහු බොහෝ ආබාධ ඇත්තෝ වෙත්. වහන්ස, අයදිමි. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට සක්මන් මළුව ද ගිනිහල් ගෙය ද අනුදන්නා සේක් වා. මෙසේ භික්ෂූහු අල්පාබාධ වන්නාහ"යි මෙ බස් පැවසීය.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ කොමාරභච්ච ජීවකයාට දැහැමි කතාවෙන් කරුණු දක්වා වදළ සේක. එය ගැන්වූ සේක. එ උනන්දු කළ සේක. සතුටු කළ සේක. ඉක්බිත්තෙන් කොමාරභච්ච ජීවක තෙම භාග්‍ය-වතුන් වහන්සේ විසින් දැහැමි කතායෙන් කරුණු දක්වන ලද්දේ, එය ගන්වන ලද්දේ, උනන්දු කරන ලද්දේ, සතුටු කරන ලද්දේ, හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට පිටත් වැ ගියේ ය.

එයට පසු භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මෙ කරුණෙහි දැහැමි කතා කොට මහණුන් බණවා, "මහණෙනි, සක්මන් මළුව ද ගිනිහල් ගෙය ද අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි වනාහි මහණහු තැන තැන උස් මිටි විෂම වූ සක්මන් මළුයෙහි සක්මන් කරත්. (ඔවුන්ගේ) පාදයෝ පීඩා සහිත වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි සක්මන් මළුව සම කරන්නට අනුදනිමි"යි වදළසේක. සක්මන් මළුව පහත් බිමක් ඇත්තේ (පහත්බිමෙහි කරන ලද්දේ) වෙයි. ජලයෙන් වැහිර ගනු ලැබේ. (වතුරට යට වේ). "මහණෙනි, සක්මන්මළුව උස්බිමක් ඇතියක් කරන්නට (පස් ආදිය ගොඩ ගසා උස් කරන්නට) අනුදනිමි"යි වදළ සේක. පස් ගොඩ ඇදී වැටෙයි. "මහණෙනි, ගඩොළුයෙන් කළ බැම්ම ද ගල් බැම්ම ද ලී රැසින් කළ බැම්ම ද යන තුන් බැඳුම් අනුදනිමි"යි වදළ සේක.

ආරොහන්තා විහඤ්ඤන්ති. “අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දරුසොපාණන්ති.”

ආරොහන්තා පරිපතන්ති. අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති.

79. තෙන ඛො පන සමයෙන භික්ඛූ චඞ්කමෙ චඞ්කමන්තා පරිපතන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ චඞ්කමණවෙදිකන්ති.”

80. තෙන ඛො පන සමයෙන භික්ඛූ අජ්ඣොකාසෙ චඞ්කමන්තා සීතෙනපි උණ්හෙනපි කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ චඞ්කමණසාලා”ති.

චඞ්කමණසාලායං[1] තිණචුණ්ණං පරිපතති. “අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා[2] උල්ලිත්තාවලිත්තං කාතුං: සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති.”

81. ජන්තාඝරං නීචවත්ථුකං හොති. උදකෙන ඔත්ථරීයති. “අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති.” චයො පරිපතති. “අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති.”

ආරොහන්තා විහඤ්ඤන්ති. “අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දරුසොපාණන්ති”.

ආරොහන්තා පරිපතන්ති. “අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති”.

ජන්තාඝරස්ස කවාටං න හොති. “අනුජානාමි භික්ඛවෙ කවාටං පිට්ඨසඞ්ඝාටං උදුක්ඛලිකං උත්තරපාසකං අග්ගලවට්ටිකං කපිසීසකං සූචිකං ඝටිකං තාලච්ඡිද්දං ආවිඤ්ඡනච්ඡිද්දං ආවිඤ්ඡනරජ්ජුන්ති”.

1. චඞ්කමණසාලාය - සීමු.
2. ඔගුම්ඵෙත්වා - මජසං.

සක්මනට නඟින්නාහු වෙහෙසෙත්. ''මහණෙනි, ගඩොළු හිණ, ගල්හිණ, ලීහිණ, යැ යි හිණි (පඩිපෙළ) තුනක් අනුදනිමි''යි වදළ සේක.

හිණට නැඟෙන්නාහු ඇද වැටෙත්. ''මහණෙනි, අත්වැල (හෝ ගරාදි වැට) අනුදනිමි''යි වදළසේක.

79. එ සමයෙහි මහණහු සක්මන් මළුවෙ සක්මන් කරන්නාහු ඇද වැටෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. ''මහණෙනි, සක්මන් පිළක් අනුදනිමි''යි වදළ සේක.

80. එ සමයෙහි මහණහු එළිමහනෙහි සක්මන් කරන්නාහු ශීත යෙන් ද, උෂ්ණයෙන් ද පෙළෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. ''මහණෙනි, සක්මන්හල අනුදනිමි''යි වදළ සේක.

සක්මන්හලෙහි තණසුණු වැටෙයි. ''මහණෙනි, ඝන දඬු අතුරා පියස්ස තනා ඇතුළතත් පිටතත් සුදු පැහැ වූ හෝ කළු පැහැ වූ හෝ බදම ආලේප කරන්නට, ගුරු පැහැයෙන් පිරියම් හෝ කරන්නට, මාලාකම් ලතාකම් කරන්නට මෝරදත් හෝ අදින්නට, දැහිඟුල් ඇ පස් පැහැයෙන් චණ්චත් කරන්නට ද අනු-දනිමි. එහි සිවුරු වනා තබන්නට දණ්ඩක් ද සිවුරු වනන්නට රැහැනක් ද අනුදනිමි''යි වදළසේක.

81. ගිනිහල් ගෙය පහත් බිමක ඇත්තේ වෙයි. දියෙන් වැතිරේ (යට වෙ). ''මහණෙනි, උස් බිමක් ඇතියක් කරන්නට අනුදනිමි''යි වදළ සේක. බිම උස් කරන්නට ගොඩ ගසන ලද පස් රැස කැඩී වැටෙයි. ''මහණෙනි, ගඩොළුයෙන් කළ බැම්ම ද ගලින් කළ බැම්ම ද ලීයෙන් කළ බැම්ම ද යි බැඳුම් තුනක් රැස් කොට බඳින්නට අනුදනිමි''යි වදළ සේක.

එය නඟින්නාහු වෙහෙසෙත්. ''මහණෙනි, ගඩොළු හිණ, ගල් හිණ, දඬු හිණ යන හිණි (පඩිපෙළ) තුන අනුදනිමි''යි වදළ සේක.

හිණෙහි නැඟෙන්නාහු ඇද වැටෙත්. ''මහණෙනි, අත්වැල (ගරාදිවැට) අනුදනිමි''යි වදළසේක.

ගිනිහල්ගෙට කවුළුවෙක් නො වෙයි. ''මහණෙනි, කවුළුව ද දොරබාව ද උදුක්ඛලිකාව ද උත්තරපාසකය ද අගුළුවැටිය ද කපිසීසකය ද සූචිකාව ද ඝටිකාව ද කෙසියිදුර ද අදිනා ලනුව බහාලන සිදුර ද අදිනා ලනුව ද අනුදනිමි''යි වදළ සේක.

82. ජන්තාඝරස්ස .කුඩ්ඩපාදෙ ජීරති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ මණ්ඩලිකං කාතුන්ති."

ජන්තාඝරස්ස ධූමනෙත්තං න හොති. "අනුජානාමි භික්ඛවෙ ධූමනෙත්තන්ති."

83. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඛුද්දකෙ ජන්තාඝරෙ මජ්ඣෙ අග්ගිට්ඨානං කරොන්ති. උපචාරො න හොති. "අනුජානාමි භික්ඛවෙ ඛුද්දකෙ ජන්තාඝරෙ එකමන්තං අග්ගිට්ඨානං කාතුං, මහල්ලකෙ මජ්ඣෙ"ති.

ජන්තාඝරෙ අග්ගි මුඛං ඩහති. "අනුජානාමි භික්ඛවෙ මුඛමත්තිකන්ති."

හත්ථෙ[1] මත්තිකං තෙමෙන්ති. "අනුජානාමි භික්ඛවෙ මත්තිකාදොණිකන්ති."

මත්තිකා දුග්ගන්ධා හොති. "අනුජානාමි භික්ඛවෙ වාසෙතුන්ති."

ජන්තාඝරෙ අග්ගි කායං ඩහති. "අනුජානාමි භික්ඛවෙ උදකං අතිහරිතුන්ති." පාතියාපි පත්තෙනපි උදකං අතිහරන්ති. "අනුජානාමි භික්ඛවෙ උදකාධානං උදකසරාවකන්ති".

84. ජන්තාඝරං තිණච්ඡදනං සාදෙති[2]. "අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා[3] උල්ලිත්තාවලිත්තං කාතුන්ති."

ජන්තාඝරං චික්ඛල්ලං හොති. "අනුජානාමි භික්ඛවෙ සන්ථරිතුං තයො සන්ථරෙ[4]: ඉට්ඨකාසන්ථරං සිලාසන්ථරං දරුසන්ථරන්ති." චික්ඛල්ලඤ්ඤෙව හොති. "අනුජානාමි භික්ඛවෙ ධොවිතුන්ති."

උදකං සන්තිට්ඨති, "අනුජානාමි භික්ඛවෙ උදකනිද්ධමනන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ ජන්තාඝරෙ ඡමාය නිසීදන්ති. ගත්තානි කණ්ඩූවන්ති. "අනුජානාමි භික්ඛවෙ ජන්තාඝරපීඨන්ති".

---

1. හත්ථෙන - සිමු.
2. තිණච්ඡදනං න සෙදෙති - PTS.
3. ඔගුම්ඵෙත්වා - මජසං.
4. සන්ථාරෙ - මජසං.

82. ගිනිහල් ගෙයි බිතුපා දිරයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, මණ්ඩලිකාවක් කරන්නට අනුදනිමි"යි වදාළසේක.

ගිනිහල් ගෙට දුම් පිට වන සිදුරෙක් නැත. "මහණෙනි, දුම් පිට වන සිදුරක් (තනන්නට) අනුදනිමි"යි වදාළසේක.

83. එ සමයෙහි වූ කලි මහණහු කුඩා ගිනිහලෙහි මැද උදුන තනත්, එයට උපචාරයෙක් (වටා ඉඩෙක්) නො වෙයි. "මහණෙනි, කුඩා ගිනිහල්ගෙහි එක් පසෙකත් මහත් ගිනිහල් ගෙහි මැදත් උදුන තනන්නට අනුදනිමි"යි වදාළසේක.

ගිනිහල් ගෙහි ගින්න මුහුණ දවයි. "මහණෙනි, මුහුණැ අල-වන මැටි අනුදනිමි"යි වදාළසේක.

අතෙහි මැටි තෙමත්. "මහණෙනි, මැටි ඔරුවක් අනුදනිමි"යි වදාළසේක.

මැටි දුගඳ වේ. "මහණෙනි, මැටිටෙහි සුවඳ කවන්නට අනු-දනිමි"යි වදාළසේක.

ගිනිහල් ගෙහි ගින්න කය දවයි. "මහණෙනි, ගිනිහල් ගෙය තුළට තලිය ගෙනයන්නට අනුදනිමි"යි වදාළසේක.

තලියෙන් ද පාත්‍රයෙන් ද දිය (ගිනිහල් ගෙයැ) ඇතුළට ගෙන යෙත්, "දිය තබන බඳුනක් ද (දියමලාවක් නැබිලියක් ද) අනුදනිමි"යි වදාළසේක.

84. තණපියස්ස (පිදුරුපියස්ස) ගිනිහල් ගෙය තණකොළ විසුරුවා ලීමෙන් හැඩි කෙරෙයි. (තණපියස්සේ තණකොළ (පිදුරු) වැටීමෙන් ගිනිහල් ගෙයැ බිම හැඩි වෙයි.) "මහණෙනි, සන දඬු අතුරා පියස්ස තනා ඇතුළත පිටත බදම ආලේප කරන්නට අනුදනිමි"යි වදාළසේක.

ගිනිහල් ගෙය මඩ සහිත වෙයි. "ගඩොළු ඇතුරුම ගල් ඇතුරුම දඬු ඇතුරුම යන ඇතුරුම් තුන අනුදනිමි"යි වදාළ සේක. (එහෙත්) මඩ සහිත ම වේ. "මහණෙනි, (බිම) සෝදන්නට අනුදනිමි"යි වදාළසේක.

දිය රැඳී සිටී. "මහණෙනි, දිය පිටව යන්නට සොරොව්වක් අනුදනිමි"යි වදාළසේක.

එ සමයෙහි මහණහු ගිනිහල් ගෙහි බිමැ හිඳිත්. ගාත්‍රයෝ (ශාරීරාවයවයෝ) කසත්. "මහණෙනි ගිනිහල් පුටුවක් අනුදනිමි"යි වදාළසේක.

85. තෙන ඛො පන සමයෙන ජන්තාඝරං අපරික්ඛිත්තං හොති. ‘‘අනුජානාමි භික්ඛවෙ පරික්ඛිපිතුං, තයො පාකාරෙ ඉට්ඨකාපාකාරං සිලාපාකාරං දරුපාකාරන්ති.’’

කොට්ඨකො න හොති. ‘‘අනුජානාමි භික්ඛවෙ කොට්ඨකන්ති.’’

කොට්ඨකො නීචවත්ථුකො හොති, උදකෙන ඔත්ථරීයති. ‘‘අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති.’’

චයො පරිපතති ‘‘අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති.’’

ආරොහන්තා විහඤ්ඤන්ති. ‘‘අනුජානාමි භික්ඛවෙ තයො සොපානෙ ඉට්ඨකාසොපානං සිලාසොපානං දරුසොපානන්ති.’’

ආරොහන්තා පරිපතන්ති. ‘‘අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති.’’

කොට්ඨකස්ස කවාටං න හොති. ‘‘අනුජානාමි භික්ඛවෙ කවාටං පිට්ඨසඞ්ඝාටං උදුක්ඛලිකං උත්තරපාසකං අග්ගලවට්ටිකං කපිසීසකං සූචිකං ඝටිකං තාලච්ඡිද්දං ආවිඤ්ජනච්ඡිද්දං ආවිඤ්ජනරජ්ජුන්ති.’’

කොට්ඨකෙ තිණචුණ්ණං පරිපතති. ‘‘අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකන්ති.

පරිවෙණං චික්ඛල්ලං හොති. ‘‘අනුජානාමි භික්ඛවෙ මරුම්බං උපකිරිතුන්ති.’’

න පරියාපුණන්ති. ‘‘අනුජානාමි භික්ඛවෙ පදරසිලං නික්ඛිපිතුන්ති.’’ උදකං සන්තිට්ඨති. ‘‘අනුජානාමි භික්ඛවෙ උදකනිද්ධමනන්ති.’’

85. එ සමයෙහි ගිනිහල් ගෙය (කිසිවෙකිනුත්) වටින් නො අවුරන ලද්දේ වෙයි. "මහණෙනි, ගඩොළු පවුර, ගල්පවුර, දඬු පවුර (ලීවැට) යන තුන් පවුරු වටා ලන්නට අනුදනිමි"යි වදළ සේක.

දොර කොටුවෙක් නො වෙයි. "මහණෙනි, කොටුවක් අනුදනිමි"යි වදළ සේක.

කොටුව පහත් බිමක් ඇත්තේ වෙයි. දියෙන් යට වෙයි. "මහණෙනි, උස් බිම් ඇතියක් කරන්නට අනුදනිමි"යි වදළ සේක.

බිම උස් කරන්නට ගොඩ ගැසූ පස ගිලිහී වැටෙයි. "මහණෙනි, ගඩොළු බැම්ම, ගල්බැම්ම, දඬුබැම්ම යන තුන් බැඳුම් ගොඩවල් අනුදනිමි"යි වදළ සේක.

(දොර කොටුවට) නඟින්නාහු වෙහෙසෙත්, "ගඩොළු හිණ ගල් හිණ දඬුහිණ යන හිණි තුන අනුදනිමි"යි වදළ සේක.

(දොර කොටුවට) නඟින්නාහු වැටෙත්. "මහණෙනි, අත්වැල අනුදනිමි"යි වදළ සේක.

දොර කොටුවට කවුළුවෙක් නො වෙයි. "මහණෙනි, කවුළුව, දොරබාව, වටෙවුලීය, උතුරුලීය දොරපොල්ල, අගුළුකණුව, යතුරු ලීය, තරංකය, කෙසි සිදුර, අදිනා ලනුව බහාලන සිදුර, අදනා ලනුව අනුදනිමි"යි වදළ සේක.

කොටුවෙහි තණසුණු (පිදුරුරොඩු) ගිලිහී වැටෙයි "මහණෙනි, සණ ලී අතුරා සුදුපැහැති හෝ කළු පැහැති හෝ බදම ආලේප කරන්නට ගුරුපිරියම් කරන්නට, (එහි) මාලාකම් ලතාකම් මකරදන්තක (මුවරදූති සටහන්) පඤ්චපටිකා (දැහිඟුල් ඈ පස්වණක්පැහැ) කරන්නට ද අනුදනිමි"යි වදළ සේක.

(ගිනිගල් ගෙය වටා ලූ පවුරෙන්) ඇතුළත බිම මඩ සහිත වෙයි. කුඩා ගල් කැබැලි (බොරළු) ඉසිරුවන්නට අනුදනිමි"යි වදළ සේක.

ගල් කැබැලි නො සැහෙයි, "මහණෙනි, ගල්පුවරු බහා ලන්නට අනුදනිමි"යි වදළ සේක. (එහෙත්) දිය රැඳී සිටී. "මහණෙනි, සොරොව්වක් අනුදනිමි"යි වදළ සේක.

86. තෙන ඛො පන සමයෙන භික්ඛූ නග්ගා නග්ගං අභිවාදෙන්ති. නග්ගා නග්ගං අභිවාදපෙන්ති. නග්ගා නග්ගස්ස පරිකම්මං කරොන්ති. නග්ගා නග්ගස්ස පරිකම්මං කාරාපෙන්ති[1]. නග්ගා නග්ගස්ස දෙන්ති. නග්ගා පටිගණ්හන්ති[2]. නග්ගා ඛාදන්ති. නග්ගා භුඤ්ජන්ති. නග්ගා සායන්ති. නග්ගා පිවන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ නග්ගෙන නග්ගො අභිවාදෙතබ්බො. යො අභිවාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස, න නග්ගෙන නග්ගො අභිවාදපෙතබ්බො -පෙ- න නග්ගෙන අභිවාදෙතබ්බං -පෙ- න නග්ගෙන අභිවාදපෙතබ්බං -පෙ- න නග්ගෙන නග්ගස්ස පරිකම්මං කාතබ්බං -පෙ- න නග්ගෙන නග්ගස්ස පරිකම්මං කාරාපෙතබ්බං -පෙ- න නග්ගෙන නග්ගස්ස දාතබ්බං -පෙ- න නග්ගෙන පටිග්ගහෙතබ්බං -පෙ- න නග්ගෙන ඛාදිතබ්බං -පෙ- න නග්ගෙන භුඤ්ජිතබ්බං -පෙ- න නග්ගෙන සායිතබ්බං -පෙ- න නග්ගෙන පාතබ්බං යො පිවෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.

87. තෙන ඛො පන සමයෙන භික්ඛූ ජන්තාඝරෙ ඡමාය චීවරං නික්ඛිපන්ති. චීවරං පංසුකිතං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ජන්තාඝරෙ චීවරවංසං චීවර-රජ්ජුන්ති."

දෙවෙ වස්සන්තෙ චීවරං ඔවස්සති. "අනුජානාමි භික්ඛවෙ ජන්තාඝරසාලන්ති"

ජන්තාඝරසාලා නීචවත්ථුකා හොති. උදකෙන ඔත්ථරීයති. "අනු-ජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති."

චයො පරිපතති. අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ -පෙ- ආරොහන්තා විහඤ්ඤන්ති -පෙ- ආරොහන්තා පරිපතන්ති. "අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති."

ජන්තාඝරසාලාය තිණචුණ්ණං පරිපතති. "අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං -පෙ- චීවරවංසං චීවරරජ්ජුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ නග්ගා ජන්තාඝරෙපි උදකෙපි පරිකම්මං කාතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ තිස්සො පටිච්ඡාදියො ජන්තාඝරපටිච්ඡාදිං උදකපටිච්ඡාදිං වත්ථපටිච්ඡාදින්ති."

---

1. කාරෙන්ති - සීමු.
2. පටිග්ගණ්හන්ති - සීමු.

86. එ සමයෙහි මහණහු තුමූ නග්න වූවාහු නග්න මහණක්හු වදිත්. නග්නවූවාහු අනෙකකු ලවා නග්න මහණකුට වන්දවත්. නග්න වූවාහු නග්න මහණකුට සිරුරු පිරියම් කරත්. නග්න වූවාහු නග්නමහණකුට සිරුරු පිරියම් කරවත්. නග්න වූවාහු නග්න මහණකුට (ආහාරාදිය) දෙත්. නග්න වූවාහු පිළිගනිත්. නග්න වූවාහු කත්, නග්න වූවාහු බුදිත්. නග්න වූවාහු රස විඳිත්. නග්න වූවාහු බොත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, නග්න වැ නග්නයෙක් නො වැන්ද යුතු. නග්න වැ නග්නයකු වඳිනේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. නග්නයෙක් නග්නයකු ලවා නො වැන්දවියැ යුතු ... තමා නග්න වැ කවරෙක් හෝ නො වැන්දූ යුතු ... නග්නයකු ලවා නො වැන්දූවියයුතු ... නග්න වූවහු විසින් නග්නයකුහට පිරියම් නො කටයුතු ... නග්න වූවහු විසින් නග්නයකුට පිරියම් නො කැරැවියයුතු ... නග්න වූවහු විසින් නග්න යක්හට (කිසිත්) නො දියැයුතු ... නග්න වැ නො පිළිගතයුතු ... නග්න වැ නො කැයුතු ... නග්න වැ නො බුදියයුතු ... නග්න වැ රස නො වින්ද යුතු ... නග්න වැ නො පියැ යුතු. යමෙක් බොන්නේ නම්, දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළ සේක.

87. එ සමයෙහි වනාහි මහණහු ගිනිහල්ගෙහි බිමැ සිවුරු තබත්. සිවුරු පස් තැවරුණේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, ගිනිහල්ගෙහි සිවුරු එල්ලා තබන්නට ලියක්ද සිවුරු රැහැනක් ද අනුදනිමි"යි වදළ සේක.

වැසි වස්නා කල්හි සිවුරු තෙමෙයි. "මහණෙනි, ගිනි-හල් ගෙට සිවුරු තබන්නට ශාලාවක් අනුදනිමි"යි වදළ සේක.

ගිනිහල්ගෙයි සිවුරු තබන ශාලාව පහත් බිමක් ඇතියේ වෙයි. වතුරට යට වෙයි. "මහණෙනි, උස් බිමක් ඇතියක් කරන්-නට අනුදනිමි"යි වදළ සේක.

බිම උස්කරන්නට ගොඩ ගැසූ පස් ගිලිහී වැටීයෙයි. "මහණෙනි.... තුන් බැඳුම් බඳින්නට අනුදනිමි"යි වදළ සේක... නගින්නාහු වෙහෙසෙත්... නගින්නාහු වැටෙත්. "මහණෙනි, අත්-වැල අනුදනිමි"යි වදළ සේක.

ගිනිහල් ගෙහි සිවුරු තබන ශාලායෙහි තණරොඩු ගිලිහී වැටෙයි "මහණෙනි, පියස්ස සන ලී යොද තනා, සුදුපැහැති කොට, කළු පැහැති කොට, ගුරු පිරියම් ඇති කොට හෝ ඇතුළත පිටත බදම ආලිප්ත කරන්නට, එහි මාලාකම්, ලතාකම්, මකරදන්තක චිත්‍ර පඤ්චපට්කා හෝ කරන්නට අනුදනිමි... සිවුරු එල්ලන ලියක් ද සිවුරු එල්ලන රැහැනක් ද අනුදනිමි"යි වදළ සේක.

එ සමයෙහි මහණහු නග්න වැ ගිනිහල් ගෙහි ද දියෙහි ද (සිරුරු) පිරියම් කරන්නට කුකුස් කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, ගිනිහල්ගෙට පිවිසීම නමැති වැස්ම ද දියට බැසීම නමැති වැස්ම ද වස්ත්‍රයෙන් ඇඟ වසාගැන්ම නමැති වැස්ම දැ යි තුන් වැසුම් අනුදනිමියි" වදළ සේක.

88. තෙන ඛො පන සමයෙන ජන්තාඝරෙ උදකං න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ උදපානන්ති.’’

උදපානස්ස කූලං ලුජ්ජති. ‘‘අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දාරුචයන්ති.’’

උදපානො නීචවත්ථුකො හොති. උදකෙන ඔත්ථරීයති. ‘‘අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති.’’

චයො පරිපතති -පෙ- ආරොහන්තා විහඤ්ඤන්ති -පෙ- ආරොහන්තා පරිපතන්ති. ‘‘අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති’’.

89. තෙන ඛො පන සමයෙන භික්ඛූ වල්ලියාපි කායබන්ධනෙනපි උදකං වාහෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං ‘‘අනුජානාමි භික්ඛවෙ උදකවාහනරජ්ජුන්ති.’’

හත්ථා දුක්ඛා හොන්ති. ‘‘අනුජානාමි භික්ඛවෙ තුලං කරකටකං චක්කවට්ටකන්ති.’’

භාජනා බහූ භිජ්ජන්ති. ‘‘අනුජානාමි භික්ඛවෙ තයො වාරකෙ ලොහවාරකං දාරුවාරකං චම්මඛණ්ඩන්ති.’’

90. තෙන ඛො පන සමයෙන භික්ඛූ අජ්ඣොකාසෙ උදකං වාහෙන්තා සීතෙනපි උණ්හෙනපි කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ උදපානසාලන්ති.’’

උදපානසාලාය තිණචුණ්ණං පරිපතති. ‘‘අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති.’’

උදපානො අපාරුතො හොති. තිණචුණ්ණෙහිපි පංසුකෙහිපි ඔකිරියති. ‘‘අනුජානාමි භික්ඛවෙ අපිධානන්ති.’’

උදකභාජනං න සංවිජ්ජති. ‘‘අනුජානාමි භික්ඛවෙ උදකදොණිං උදකකටාහන්ති.’’

88. එ සමයෙහි ගිනිහල්ගෙහි ජලය නැත. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, ළිඳක් අනුදනිමි"යි වදළ සේක.

ළිඳේ ඉවුර කැඩී වැටෙයි. "මහණෙනි, ගඩොළු බැම්ම, ගල් බැම්ම, දඬුබැම්ම, යන බැඳුම් තුන අනුදනිමි"යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

ළිඳ පහත් බිමක් ඇතියේ වෙයි. දියෙන් වැසෙයි. "මහණෙනි, උස් බිම් ඇතියක් කරන්නට (පස් ආදිය ගොඩ ගසා බිම උස්සන්නට) අනුදනිමි" යි වදළ සේක.

ගොඩ ගැසූ පස් රැස ඇද හැලෙයි ... එයට නඟින්නාහු වෙහෙසෙත් ... නඟින්නාහු වැටෙත්. "මහණෙනි, අත්වැල (ගරාදිවැට) අනුදනිමි" යි වදළ සේක.

89. එ සමයෙහි මහණහු වැලින් ද කාබහනින් ද (කයැබඳනා පටියෙන් ද) දිය අදිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, දිය අදනා කඹයක් අනුදනිමි" යි වදළ සේක.

අත් පෙළෙන්නෝ වෙ. "මහණෙනි, තුලාව (ආඩියා) ද කරකටකය ද (අතින් හෝ ගවයන් ලවා හෝ ඇතට ඇදගෙන යැමෙන් දිය අදනා යන්ත්‍රය ද) චක්‍රවර්තය (සවී යන්ත්‍රය) ද අනුදනිමි" යි වදළ සේක.

බොහෝ බඳුන් බිඳේ. "මහණෙනි, ලොහොමුවා කළය ද දඬුමුවා කළය ද සම් කඩින් කළ භාජනය ද යන තුන් කළ අනුදනිමි" යි වදළ සේක.

90. එ සමයෙහි මහණහු එළිමහන් බිමෙහි දිය අදනාහු (ශීත ඍතුයෙහි) ශීතයෙන් ද (උෂ්ණ ඍතුයෙහි) උෂ්ණයෙන් ද පෙළෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, ළින් හලක් අනුදනිමි" යි වදළ සේක.

ළින්හලෙහි තණරොඩු වැටෙයි. "මහණෙනි, ඝන දඬු අතුරා පියස්ස තනා ඇතුළතත් පිටතත් බදම ආලේප කරන්නට, සුදු පැහැ කළු පැහැ කරන්නට, ගුරු පිරියම් කරන්නට, මල්කම් ලියකම් කරන්නට, මුවරදත් හෝ සිතියම් කරන්නට, දැහිඟුල් ආදියෙන් පස් වණක් පැහැ කරන්නට" අනුදනිමි. සිවුරු වනන දණ්ඩ ද සිවුරු වනන ලනුව ද අනුදනිමි" යි වදළ සේක.

ළිඳ නො වසන ලද්දේ වෙ. තණරොඩු වලින්ද දූවිල්ලෙන් ද වැසෙයි. "මහණෙනි, (ළිඳ වසා තබන්නට) වැස්මක් (පියනක්) අනුදනිමි" යි වදළ සේක.

ළින්හලෙහි දියබඳුනෙක් නැත. "මහණෙනි, දියඔරුව ද දිය කටාරම ද අනුදනිමි" යි වදළ සේක.

91. තෙන ඛො පන සමයෙන භික්ඛූ ආරාමෙ තහං තහං නහායන්ති. ආරාමො චික්ඛල්ලො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ චන්දනිකන්ති.”

චන්දනිකා අපාරුතා[1] හොති. භික්ඛූ හිරියන්ති නහායිතුං. “අනුජානාමි භික්ඛවෙ පරික්ඛිතුං තයො පාකාරෙ ඉට්ඨකාපාකාරං සිලාපාකාරං දරුපාකාරන්ති.”

චන්දනිකා චික්ඛල්ලා හොති. “අනුජානාමි භික්ඛවෙ සන්ථරිතුං තයො සන්ථරෙ[2] ඉට්ඨකාසන්ථරං සිලාසන්ථරං දරුසන්ථරන්ති.”

උදකං සන්තිට්ඨති. “අනුජානාමි භික්ඛවෙ උදකනිද්ධමනන්ති.”

92. තෙන ඛො පන සමයෙන භික්ඛූනං ගත්තානි සීතිකානි හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ උදකපුඤ්ඡචොලකෙන පි පච්චුද්ධරිතුන්ති.”

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො සඞ්ඝස්ස අත්ථාය පොක්ඛරණිං කාරෙතුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ පොක්ඛරණින්ති.”

පොක්ඛරණියා කුලං ලුජ්ජති. “අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති.”

ආරොහන්තා විහඤ්ඤන්ති. “අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දරුසොපාණන්ති.”

ආරොහන්තා පරිපතන්ති. “අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති.”

පොක්ඛරණියා උදකං පුරාණං හොති. “අනුජානාමි භික්ඛවෙ උදකමාතිකං උදකනිද්ධමනන්ති.”

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස අත්ථාය නිල්ලෙඛං ජන්තාඝරං කාතුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ නිල්ලෙඛං ජන්තාඝරන්ති.”

---

1. පාකටා – සීමු.
2. සන්ථාරෙ – සීමු.

91. එ සමයෙහි මහණහු අරමෙහි ඒ ඒ තැන නාත්. අරම මඩ සහිත වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, (නාන පිණිස) වළක් අනුදනිමි" යි වදළ සේක.

නාන වළ වටින් නො හැවුරුණේ වෙයි. මහණහු නාන්නට ලජ්ජිත වෙත්. "මහණෙනි, ගඩොළු පවුර, ගල් පවුර, දඬුපවුර, යන පවුරු තුන අනුදනිමි" යි වදළ සේක.

නාන වළ මඩ සහිත වෙයි. "මහණෙනි, ගඩොළු ඇතුරුම, ගල් ඇතුරුම, ලී ඇතුරුම යන තුන් ඇතුරුම් අනුදනිමි" යි වදළ සේක.

දිය ගලා නො ගොස් රැඳෙයි. "මහණෙනි, දිය ගලා යනු පිණිස සොරොව්වක් (තනන්නට) අනුදනිමි" යි වදළ සේක.

92. එ සමයෙහි භික්‍ෂූන්ගේ සිරුරු ශීතල වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, දිය පිසිනා රෙදි කඩෙකින් පිස දිය ඉවත් කරන්නට අනුදනිමි" යි වදළ සේක.

එ සමයෙහි එක්තරා උවසුවෙක් සඞ්ඝයා සඳහා පොකුණක් කරවනු කැමැත්තේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, පොකුණක් අනුදනිමි" යි වදළ සේක.

පොකුණේ ඉවුර කැඩී වැටෙයි. "මහණෙනි, ගඩොළු බැම්ම, ගල් බැම්ම, දඬු බැම්ම යන තුන් බැඳුම් අනුදනිමි" යි වදළ සේක.

නඟින්නාහු වෙහෙසෙත්. "මහණෙනි, ගඩොළුහිණ ද ගල් හිණ ද දඬුහිණ ද යන හිණ තුන අනුදනිමි" යි වදළ සේක.

නඟින්නාහු වැටෙත්. "මහණෙනි, ඇත්වැලක් (ගරාදි වැටක්) අනුදනිමි" යි වදළ සේක.

පොකුණෙහි දිය පරණ වෙයි. "මහණෙනි, (පිටතින්) දිය ගලා ඊමට ඇළක් ද දිය පිට වීමට සොරොව්වක් ද අනුදනිමි" යි වදළ සේක.

එ සමයෙහි එක්තරා මහණෙක් සඞ්ඝයාගේ ප්‍රයෝජනය පිණිස කැණිමඬල වටා සතරැස් පුවරු ආදිය සවිකොට කළ පියයි සහිත ගිනිහල් ගෙයක් කරන්නට කැමැති වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. "මහණෙනි, කැණිමඬලවටා සතරැස් පුවරු ආදිය තබා කළ පියැයි සහිත ගිනිහල්ගෙය අනුදනිමි" යි වදළ සේක.

93. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ චාතුමාසං නිසීදනෙන විප්පවසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං "න භික්ඛවෙ චාතුමාසං නිසීදනෙන විප්පවසිතබ්බං. යො විප්පවසෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

94. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පුප්ඵාභිකිණ්ණෙසු සයනෙසු සයන්ති මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ පුප්ඵාභිකිණ්ණෙසු සයනෙසු සයිතබ්බං. යො සයෙය්‍ය ආපත්ති දුක්කටස්සා."ති

තෙන ඛො පන සමයෙන මනුස්සා ගන්ධම්පි මාලම්පි ආදාය ආරාමං ආගච්ඡන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා න පටිග්ගණ්හන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං "අනුජානාමි භික්ඛවෙ ගන්ධං ගහෙත්වා කවාටෙ පඤ්චඞ්ගුලිකං දාතුං, පුප්ඵං ගහෙත්වා විහාරෙ එකමන්තං නික්ඛිපිතුන්ති."

95. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස නමතකං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ නමතකන්ති."

අථ ඛො භික්ඛූනං එතදහොසි: 'නමතකං අධිට්ඨාතබ්බං නු ඛො උදාහු විකප්පෙතබ්බන්ති.' "න භික්ඛවෙ නමතකං අධිට්ඨාතබ්බං, න විකප්පෙතබ්බන්ති."

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ආසිත්තකූපධානෙ භුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ආසිත්තකූපධානෙ භුඤ්ජිතබ්බං. යො භුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති

96. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. සො භුඤ්ජමානො න සක්කොති හත්ථෙන පත්තං සන්ධාරෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං "අනුජානාමි භික්ඛවෙ මළොරිකන්ති."

93. එ සමයෙහි ඡවග මහණහු සාරමසක් හිඳිනා කඩෙන් වෙන් වැ වෙසෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. "මහණෙනි, සාරමසක් හිඳින කඩින් වෙන් වැ නො විසියැ යුතු. යමෙක් (එසේ) එයින් වෙන් වැ වසන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළ සේක.

94. එ සමයෙහි ඡවග මහණහු මල් විසුළ යහන්හි වැදහෙත්. මිනිස්සු විහාර චාරිකායෙහි ඇවිදුනාහු එය දැක 'කාමභෝගී ගිහියන් බඳුහ' යි ලාමක කොට සිතත්, නින්ද කෙරෙත්, අගුණ කතා පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, මල් විසුළ යහන්හි නො සැතැපියැ යුතු. යමෙක් එහි සැතැපෙන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළ සේක.

එ සමයෙහි මිනිස්සු සුවඳ දැ ද මල් ද ගෙන ආරාමයට එත්. මහණහු කුකුස් කරන්නාහු නො පිළිගනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණනි, සුවඳ දැ පිළිගෙන කවුළුයෙහි (දෙර පළුවෙහි) පසඟුල් දෙන්නට ද මල් පිළිගෙන වෙහෙරෙහි එක් පැත්තෙක තබන්නට ද අනුදනිමි" යි වදළ සේක.

95. එ සමයෙහි සඞ්ඝයාට නමතකයෙක් (එළුලොමින් කළ නො වියන ලද ඇතිරියක් හෝ සම්කඩක් සේ පරිභෝග කළ යුතු උපකරණයෙක්) උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ බවත් සැලකළහ. "මහණෙනි, නමතකය අනුදනිමි" යි වදළ සේක.

එ කල්හි මහණුනට 'නමතකය ඉටියැ යුතු ද නොහොත් විකැපිය යුතු දැ' යි මේ සිත විය. "මහණෙනි, නමතකය නො ඉටියැ යුතු. නො ද විකැපියැ යුතු යැ" යි වදළ සේක.

එ සමයෙහි ඡවග මහණහු තඹෙන් හෝ රිදියෙන් කළ පේළායෙහි (පෙට්ටියක් වැනි උපකරණයෙක්හි) වළඳත්. මිනිස්සු "මොහු කාමභෝගී ගිහියන් බඳුවහ" යි ලාමක කොට සිතත්, නින්ද කෙරෙත්, අගුණ පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. මහණෙනි, තඹින් හෝ රිදියෙන් කළ පේළායෙහි නො වැළඳියැ යුතු යැ" යි වදළ සේක.

96. එ සමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. හේ වළඳනුයේ අතින් පාත්‍රය දරා ගන්නට නො හැකි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, දණ්ඩාධාරකයක් (ලීයෙන් කළ පාත්‍රාධාරකයක්) අනුදනිමි" යි වදළ සේක.

97. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ එකභාජනෙ පි භුඤ්ජන්ති. එකථාලකෙ පි පිවන්ති. එකමඤ්චෙ පි තුවට්ටෙන්ති. එකත්ථරණා[1] පි තුවට්ටෙන්ති. එකපාපුරණා[2] පි තුවට්ටෙන්ති. එකත්ථරණපාපුරණා පි තුවට්ටෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං, "න භික්ඛවෙ එකභාජනෙ භුඤ්ජිතබ්බං. න එකථාලකෙ පාතබ්බං. න එකමඤ්චෙ තුවට්ටිතබ්බං. න එකත්ථරණෙ තුවට්ටිතබ්බං එක-පාපුරණෙපි තුවට්ටිතබ්බං. න එකත්ථරණපාපුරණෙපි තුවට්ටිතබ්බං. යො තුවට්ටෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති

98. තෙන ඛො පන සමයෙන වඩ්ඪො ලිච්ඡවි මෙත්තියභුම්මජකානං භික්ඛූනං සහායො හොති. අථ ඛො වඩ්ඪො ලිච්ඡවි යෙන මෙත්තියභුම්මජකා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: 'වන්දාමි අය්‍යා'ති. එවං වුත්තෙ මෙත්තියභුම්මජකා භික්ඛූ නාලපිංසු. දුතියම්පි ඛො වඩ්ඪො ලිච්ඡවි මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච. 'වන්දාමි අය්‍යා'ති. දුතියම්පි ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ නාලපිංසු. තතියම්පි ඛො වඩ්ඪො ලිච්ඡවි මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: 'වන්දාමි අය්‍යා'ති. තතියම්පි ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ නාලපිංසු. "ක්‍යාහං අය්‍යානං අපරජ්ඣාමි? කිස්ස මං අය්‍යා නාලපන්තී"ති "තථා හි පන ත්වං ආවුසො වඩ්ඪ අම්හෙ දබ්බෙන මල්ලපුත්තෙන විහෙඨියමානෙ අජ්ඣුපෙක්ඛසී?ති"

'ක්‍යාහං අය්‍යා කරොමී?'ති.

'සචෙ ඛො ත්වං ආවුසො වඩ්ඪ ඉච්ඡෙය්‍යාසි, අජ්ජෙව භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං නාසාපෙය්‍යා'ති.

'ක්‍යාහං අය්‍යා කරොමි? කිං මයා සක්කා කාතුන්ති'

'එහි ත්වං ආවුසො වඩ්ඪ, යෙන භගවා තෙනුපසඞ්කම, උප-සඞ්කමිත්වා භගවන්තං එවං වදෙහි: "ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං යායං භන්තෙ දිසා අභයා අනීතිකා අනුපද්දවා, සායං දිසා සභයා සඊතිකා සඋපද්දවා. යතො නිවාතං, තතො පවාතං උදකං මඤ්ඤෙ ආදිත්තං. අය්‍යෙන මෙ දබ්බෙන මල්ලපුත්තෙන පජාපතී දූසිතා"ති.

---

1. එකත්ථරණෙ - මජසං.
2. එකපාපුරණෙ - මජසං.

97. එ සමයෙහි සවග මහණහු එක් බඳුනෙහි වැළඳීම ද කරත්, එක් තලුතැටියෙහි පැන් පීම ද කෙරෙත්, එක් ඇඳෙහි වැද හෝනාහු ද වෙත්, එක් ඇතිරියක් ඇත්තාහු ද (එක් ඇතිරියෙහි ද) වැදහෙත්, (සැතපෙත්) එක් පොරෝනාවක් ඇත්තාහු ද වැදහෙත් (සැතපෙත්). 'කාමභෝගී ගිහියන් බඳුවහ' යි මිනිස්සු ලාමක කොට සිතත්, නින්ද කෙරෙත්, අගුණ පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. "මහණෙනි, එක් බඳුනෙහි නො වැළඳියැ යුතු, එක් තලු තැටියෙහි නො පියැ යුතු, එක් ඇඳෙහි නො වැදැහියැයුතු, එක් ඇතිරියක් ඇත්තවුන් වැ නො වැදැ හියැ-යුතු, එක් පොරෝනාවක් ඇත්තවුන් වැ නො වැදැහියැ යුතු, එක් ඇතිරියක් එක් පොරෝනාවක් ඇත්තවුන් වැ නො වැදැ හියැ යුතු. යමෙක් එසේ වැදහෙන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළ සේක.

98. එ සමයෙහි වඩ්ඪ නම් ලිච්ඡවී තෙම මෙත්තිය භුම්මජක යන භික්‍ෂුදෙනමගේ යහළුවෙක් වෙයි. එ කලැ වඩ්ඪ ලිච්ඡවී තෙම මෙත්තිය භුම්මජක දෙ නම කරා එළැඹියේ ය. එළඹ, 'ආර්යයෙනි, වඳිමි' යි කීය. මෙසේ කී කල මෙත්තිය භුම්මජක දෙ නම කිසිත් නො කීහ. දෙවෙනි වර ද වඩ්ඪ ලිච්ඡවී තෙම 'ආර්යයෙනි, වඳිමි' යි කී ය. දෙවෙනි වර ද මෙත්තිය භුම්මජක දෙ නම කිසිත් නො කීහ. තෙවෙනි වර ද වඩ්ඪ ලිච්ඡවී තෙම ආර්යයෙනි, වඳිමි' යි කී ය. තෙවෙනි වර ද ඔහු නිහඬ වූහ. 'ආර්යයනට මම් කවර වරදක් කෙරෙම් ද? කුමට ආර්යයෝ මට නො දොඩත් ද?' යි හේ ඇසී ය. "එසේ ම ය, ඇවැත් වඩ්ඪයිනි, මල්ලරාජපුත්‍ර දබ්බයා විසින් පෙළනු ලබන අප නො තකා උදසීන වහු" යැ යි ඔහු කීහු.

'ආර්යයෙනි, මම් කුමක් කරන්නෙම් දැ?' යි වඩ්ඪ පුළුවුත.

'ඉදින් වඩ්ඪයෙනි, තෙපි කැමැති වන්නහු නම්, අද ම භාග්‍යවතුන් වහන්සේ මල්ලපුත්‍ර දබ්බයා මෙ සස්නෙන් පලවා හරින්නේ යැ' යි ඔහු කීහ.

'ආර්යයෙනි, මම් කුමක් කරන්නෙම් ද? කුමක් මා විසින් කරන්නට හැකි දැ?' යි වඩ්ඪ පුළුවුත.

"ඇවැත් වඩ්ඪයිනි, තෙපි මෙහි එවු. භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹැ, 'වහන්ස, යම් දිසාවක් බිය නැති, පීඩා නැති, උවදුරු නැති වියැ යුතු ද. ඒ මේ දිශාව බිය සහිත ද පීඩා සහිත ද උවදුරු සහිත ද වෙයි. යම් දෙසෙක මඳකුත් සුළං නැත් ද එයින් සුළං හැමී ය. ජලය ගිනි ගත්තා බඳු ය. මල්ල පුත්‍ර දබ්බයන් වහන්සේ විසින් මගේ භාර්යාව දූෂිත විය. වහන්ස, මෙය නො නිසි ය, මෙය නො සුදුසු යැ' යි කියන්නැ" යි ඔහු කීහු.

‘එවං අය්‍යා’ති ඛො වඩ්ඪො ලිච්ඡවි මෙත්තියභුම්මජකානං භික්ඛූනං පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වඩ්ඪො ලිච්ඡවි භගවන්තං එතදවොච: “ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං, යායං භන්තෙ දිසා අභයා අනීතිකා අනුපද්දවා සායං දිසා සභයා සඊතිකා සඋපද්දවා, යතො නිවාතං තතො පවාතං උදකං මඤ්ඤෙ ආදිත්තං. අය්‍යෙන මෙ දබ්බෙන මල්ලපුත්තෙන පජාපති දූසිතා”ති.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං පටිපුච්ඡි: “සරසි ත්වං දබ්බ එවරූපං කත්තා යථායං වඩ්ඪො ආහා?”ති.

“යථා මං භන්තෙ භගවා ජානාතී”ති.

දුතියම්පි ඛො භගවා –පෙ– තතියම්පි ඛො භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: “සරසි ත්වං දබ්බ එවරූපං කත්තා යථායං වඩ්ඪො ආහා”ති.

යථා මං භන්තෙ භගවා ජානාතී”ති.

“න ඛො දබ්බ දබ්බා එවං නිබ්බෙඨෙන්ති. සචෙ තයා කතං කතන්ති වදෙහි. සචෙ අකතං අකතන්ති වදෙහී”ති.

“යතොහං භන්තෙ ජාතො, නාභිජානාමි සුපිනන්තෙන’පි මෙථුනං ධම්මං පටිසෙවිතා, පගෙව ජාගරො”ති.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: “තෙන හි භික්ඛවෙ සඞ්ඝො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තං නික්කුජ්ජතු අසම්භොගං සඞ්ඝෙන කරොතු. අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස පත්තො නික්කුජ්ජිතබ්බො: භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති, භික්ඛූනං ආවාසාය පරිසක්කති. භික්ඛූ අක්කොසති පරිභාසති. භික්ඛූ භික්ඛූහි භෙදෙති. බුද්ධස්ස අවණ්ණං භාසති. ධම්මස්ස අවණ්ණං භාසති. සඞ්ඝස්ස අවණ්ණං භාසති. අනුජානාමි භික්ඛවෙ ඉමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස පත්තං නික්කුජ්ජිතුං.

'එසේ යැ ආර්යයෙනි' යි කියා වඩ්ඪ ලිච්ඡවී තෙම මෙත්තිය භුම්මජක මහණුනට පිළිවදන් අස්වා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ ඔබ වැඳ පසෙක ඉඳ ගත්තේ ය. පසෙක හුන්නේ ම "වහන්ස, යම් දිශාවක් බිය නැති, පීඩා නැති, උවදුරු නැති වියැ යුතු ද ඒ මේ දිශාව බිය සහිත ද පීඩා සහිත ද උවදුරු සහිත ද වෙයි. යම් දෙසෙක මඳකුත් හුළං නැද්ද, එයින් සුළං හැමී ය. ජලය ගිනි ගත්තා බඳු ය. මල්ලපුත්‍ර දබ්බයන් වහන්සේ විසින් මගේ භාර්යාව දූෂිත විය. වහන්ස, මෙය නො නිසි යැ මෙය නො සුදුසු යැ" යි භාග්‍යවතුන් වහන්සේට කීය.

එ කලැ භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මෙ කරුණෙහි භික්ෂු සඞ්ඝයා රැස් කරවා, ආයුෂ්මත් දබ්බ තෙරුන් බණවා, "දබ්බයිනි, මේ වඩ්ඪ ලිච්ඡවීන් කියන සේ වූ දැයක් තෙපි සිහි කරවු ද?" යි පුළුවුත් සේක.

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් සේ මා දන්නා සේක් ද මම එබඳුයෙමි" යි ආයුෂ්මත් දබ්බ තෙරණුවෝ වදළාහ.

භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වර ද ... තෙවෙනි වර ද "දබ්බයිනි, මේ වඩ්ඪ ලිච්ඡවීන් කියන සේ වූ දැයක් කළා තෙපි සිහි කරවු ද?" යි පුළුවුත් සේක.

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් සේ මා දන්නා සේක් ද මම එසේ වෙමි" යි දබ්බ තෙරණුවෝ වදළාහ.

"දබ්බයෙනි, නුවණැත්තෝ මෙසේ අවුල් නිරවුල් නො කරත්. ඉදින් තොප විසින් කරන ලද්දේ නම් 'කරන ලද' යි කියවු. ඉදින් නො කරන ලද්දේ නම්, 'නො කරන ලද' යි කියවු". යැයි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

"වහන්ස, මම යම් දිනෙක (ආර්ය ජාතියෙහි) උපන්නෙම් ද, එ තැන් සිට ස්වප්නාන්තයෙනු දු මෛථුන්දම් සෙවියෙකිමි යි නො දනිමි. නින්දෙන් පිබිද සිටින්නෙම් (එබන්දක් කෙළෙම් යැ) යනු කියනුම කවරේ ද" යි තෙරණුවෝ වදළාහ.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදළ සේක: "මහණෙනි, එසේ වී නම්, සඞ්ඝ තෙමේ වඩ්ඪ ලිච්ඡවී හට පත්තනික්කුජ්ජනය (පාත්‍රය යැටිකුරු කිරීම-ඔහුගේ ගෙයින් භික්ෂාව නො පිළිගැන්මෙ සම්මතිය) කෙරේවා, ඔහු සංඝයා හා සම්භොග නැත්තකු කෙරේවා (ඔහු දුන් දැයක් සංඝයා විසින් නො පිළිගත යුතු සේ වූ කෙනකු ලෙස සම්මත කෙරේවා). මහණෙනි, අඞ්ග අටෙකින් සමන්විත උපාසකයාට පත්තනික්කුජ්ජනය කළයුතු. (කවර අටකින් ද යත්:) භික්ෂූනට අලාභය පිණිස (ලැබෙන දෑ වළක්වන්නට) උත්සාහ කෙරෙයි ද, භික්ෂූනට අනර්ථ පිණිස උත්සාහ කෙරෙයි ද, භික්ෂූනට ඔවුන් (වසනා තැන) නො විසීම පිණිස ප්‍රයොග කෙරෙයි ද, භික්ෂූනට ආක්‍රොශ පරිභව කෙරෙයි ද, භික්ෂූන් භික්ෂූන් කෙරෙන් බිඳුවයි ද, බුදුනට දෙස් නගයි ද, ධර්මයට දෙස් නගයි ද, සඞ්ඝයාට දෙස් නගයි ද මේ අඞ්ග අට ය. මහණෙනි, මේ අඞ්ග අටින් සමන්විත උපාසකයාට පත්තනික්කුජ්ජනය කෙරේවා.

එවඤ්ච පන භික්ඛවෙ නික්කුජ්ජිතබ්බො: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: වඩ්ඪො ලිච්ඡවි ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තං නික්කුජ්ජෙය්‍ය අසම්භොගං සඞ්ඝෙන කරෙය්‍ය". එසා ඤත්ති.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: වඩ්ඪො ලිච්ඡවි ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙති. සඞ්ඝො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තං නික්කුජ්ජති. අසම්භොගං සඞ්ඝෙන කරොති. යස්සායස්මතො ඛමති වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තස්ස නික්කුජ්ජනා අසම්භොගං සඞ්ඝෙන කරණං, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. නික්කුජ්ජිතො සඞ්ඝෙන වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තො අසම්භොගො සඞ්ඝෙන, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

99. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන වඩ්ඪස්ස ලිච්ඡවිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වඩ්ඪං ලිච්ඡවිං එතදවොච: "සඞ්ඝෙන තෙ ආවුසො වඩ්ඪ පත්තො නික්කුජ්ජිතො. අසම්භොගො'සි සඞ්ඝෙනා"ති. අථ ඛො වඩ්ඪො ලිච්ඡවි "සඞ්ඝෙන කිර මෙ පත්තො නික්කුජ්ජිතො අසම්භොගො'මහි කිර සඞ්ඝෙනා"ති තත්ථෙව මුච්ඡිතො පපති. අථ ඛො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා වඩ්ඪං ලිච්ඡවිං එතදවොචුං: "අලං ආවුසො වඩ්ඪ, මා සොචි, මා පරිදෙවි, මයං භගවන්තං පසාදෙස්සාම භික්ඛුසඞ්ඝඤ්චා"ති.

අථ ඛො වඩ්ඪො ලිච්ඡවි සපුත්තදාරො සමිත්තාමච්චො සඤාතිසාලොහිතො අල්ලවත්ථො අල්ලකෙසො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: "අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යොහං අය්‍යං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙසිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පටිග්ගණ්හාතු ආයතිං සංවරායා"ති.

තවද මහණෙනි, මෙ මතු කියන පරිද්දෙන් පත්තනික්කුජ්ජනය කළ යුතු: ව්‍යක්ත වූ ප්‍රතිබල වූ භික්‍ෂු නමක් විසින් සඞ්ඝ තෙමෙ මෙසේ දැන්විය යුතු:

"සඞ්ඝයා මගේ වචනය අසාවා. වඩ්ඪ ලිච්ඡවි තෙමෙ ආයුෂ්මත් මල්ලපුත්‍ර දබ්බ තෙරුනට අමූලක වූ ශීලවිපත්තියෙන් චෝදනා කෙරෙයි. ඉදින් සඞ්ඝයාට සුදුසු කල් වී නම්, සඞ්ඝ තෙමෙ වඩ්ඪ ලිච්ඡවීහට පත්තනික්කුජ්ජනය කරන්නේ ය සඞ්ඝයා හා සම්භොග නැත්තකු කරන්නේ ය." මේ ඥප්තිය (දැනුම්දීම) යැ.

"වහන්ස, සඞ්ඝ තෙමෙ මගේ වචනය අසාවා. වඩ්ඪ ලිච්ඡවී තෙමෙ ආයුෂ්මත් මල්ලපුත්‍ර දබ්බ තෙරුනට අමූලක ශීලවිපත්ති-යෙන් චොදනා කෙරෙයි. සඞ්ඝ තෙමෙ වඩ්ඪ ලිච්ඡවීහට පත්තනික්කුජ්ජනය කෙරෙයි. ඔහු සඞ්ඝයා හා සම්භොග රහිතයක්හු කරයි. වඩ්ඪ ලිච්ඡවියාට පත්තනික්කුජ්ජනය කිරීම, ඔහු සඞ්ඝයා හා සම්භොගය නැත්තක්හු කිරීම යම් ආයුෂ්මතකුට රිසියෙන්නේ නම් හේ නිහඬවේවා. යමකුහට නො රිසියෙන්නේ නම් හේ කියාවා. සඞ්ඝයා විසින් වඩ්ඪ ලිච්ඡවීහට සඞ්ඝයා හා සම්භොගය නැති පත්තනික්කුජ්ජනය කරන ලද්දේ වෙයි. එය සඞ්ඝයාට රිසියෙයි, එහෙයින් නිහඬ වෙයි. මෙසේ මෙය දරමි (පිළිගනිමි)" යනු යැ.

99. එ කල්හි වනාහි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පෙර-වරු සෙමෙහි හැද පෙරෙව ගෙන පාසිවුරු ගෙන වඩ්ඪ ලිච්ඡවීහුගේ ගෙය වෙත එළැඹුණාහ. එළැඹ වඩ්ඪ ලිච්ඡවියා බණවා, "ඇවැත් වඩ්ඪයිනි, සඞ්ඝයා විසින් ඔබට පත්තනික්කුජ්ජනය කරන ලදි. ඔබ සඞ්ඝයා හා සම්භොග නැත්තෙක් කරන ලදහ" යි වදළාහ. එ කල්හි වඩ්ඪ ලිච්ඡවි තෙම "සඞ්ඝයා විසින් මට පත්තනික්කුජ්ජන කර්මය කරන ලද්දේ ල, සඞ්ඝයා හා සම්භොග නැතියෙකිම් වෙමි" යි කියා එහි ම මුසපත් වැ වැටිණ. ඉක්බිති වඩ්ඪ ලිච්ඡවීහුගේ මිත්‍රාමාත්‍යයෝ ද නැසහලේ නෑයෝ ද වඩ්ඪ ලිච්ඡවියා බණවා, "ඇවැත් වඩ්ඪයිනි, ශෝක නො කරන්න, නො හඬන්න. අපි භාග්‍යවතුන් වහන්සේ ද භික්‍ෂුසඞ්ඝයා ද පහදවන්නම්හ" යි කීහ.

ඉක්බිත්තෙන් වඩ්ඪ ලිච්ඡවී තෙම අඹුදරුවන් සහිත වැ, මිත්‍රාමාත්‍යයන් සහිත වැ, නැසහළේ නෑයන් සහිත වැ තෙත් වස්ත්‍ර ඇතියේ තෙත් කෙහෙ ඇතියේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළඹැ ඔබ පාමුල හිසින් වැටී වැද, භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, යම්බඳු වූ මම ආර්ය වූ මල්ලපුත්‍ර දබ්බ තෙරුන් වහන්සේට අමූලක වූ ශීලවිපත්තියෙන් චොදනා කෙළෙම් ද, එසේ චොදනා කළ හැකි පමණට ම මහත් අඥානයකු වූ බැවින්, එ පමණට ම මහත් සේ මුළා වූවකු බැවින්, එ පමණට ම කෞශල්‍ය නැත්තකු වූ බැවින් වරද මා ඉක්මැ ගියේ ය. (මම එ බඳු වරදකට යට වීමි). භාග්‍යවතුන් වහන්සේ ඒ මාගේ වරද මතු එබඳු දැයින් වළකිනු පිණිස වරද වශයෙන් පිළිගන්නා සේක්වා (එය මාගේ වරද යැ යි මා කියන වචනය පිළිගන්නා සේක්වා)" යි මේ වචන කී ය.

“තග්ඝ ත්වං ආවුසො වඩ්ඪ අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යං ත්වං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙසි. යතො ච ඛො ත්වං ආවුසො වඩ්ඪ අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තං තෙ මයං පටිග්ගණ්හාම. වුද්ධි හෙසා ආවුසො වඩ්ඪ අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතී''ති.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ සඞ්ඝො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තං උක්කුජ්ජතු සම්භොගං සඞ්ඝෙන කරොතු. අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස පත්තො උක්කුජ්ජිතබ්බො: න භික්ඛූනං අලාභාය පරිසක්කති. න භික්ඛූනං අනත්ථාය පරිසක්කති. න භික්ඛූනං ආවාසාය පරිසක්කති. න භික්ඛූ අක්කොසති න පරිභාසති, න භික්ඛූ භික්ඛූහි භෙදෙති. න බුද්ධස්ස අවණ්ණං භාසති. න ධම්මස්ස අවණ්ණං භාසති, න සඞ්ඝස්ස අවණ්ණං භාසති. අනුජානාමි භික්ඛවෙ ඉමෙහි අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස පත්තං උක්කුජ්ජිතුං.

එවඤ්ච පන භික්ඛවෙ උක්කුජ්ජිතබ්බො. තෙන භික්ඛවෙ වඩ්ඪෙන ලිච්ඡවිනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: සඞ්ඝෙන මෙ භන්තෙ පත්තො නික්කුජ්ජිතො අසම්භොගො'ම්හි සඞ්ඝෙන, සො'හං භන්තෙ සම්මා වත්තාමි ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. සඞ්ඝං පත්තුක්කුජ්ජනං යාචාමීති දුතියම්පි යාචිතබ්බො. තතියම්පි යාචිතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝෙන වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තො නික්කුජ්ජිතො අසම්භොගො සඞ්ඝෙන. සො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. සඞ්ඝං පත්තුක්කුජ්ජනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තං උක්කුජ්ජෙය්‍ය සම්භොගං සඞ්ඝෙන කරෙය්‍ය. එසා ඤත්ති.

"ඇවැත් වඩ්ඪයිනි, යම් බඳු වූ තෙපි යම් හෙයෙකින් මල්ලපුත්‍ර දබ්බයනට අමූලක ශීලවිපත්තියෙන් චෝදනා කළහු ද, එහෙයින් ම ඒ වරද එසේ කිරීමට තරම් ම අඥාන වූ මුළා වූ කෞශල්‍ය රහිත වූ තොප ඉක්මැ ගියේ ය. ඇවැත් වඩ්ඪයිනි, යම් හෙයෙකින් ම තෙපි වරද වරද වශයෙන් දැක ධර්මය වූ පරිදි (එයට) ප්‍රතිකර්ම කරවූ ද එහෙයින් අපි තොපගේ ඒ (වරද පිළිගැන්මේ) වචනය පිළිගනිමු. වඩ්ඪයිනි, යමෙක් (තමා කළ) වරද වරද වශයෙන් දැක ධර්මය වූ පරිදි එයට පිළියම් කරන්නේ නම්, මත්තෙහි සංවරයට පැමිණෙන්නේ නම්, මෙය ආර්ය විනයයෙහි වැඩීමෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක: "මහණෙනි, එසේ වී නම් සඞ්ඝ තෙමේ වඩ්ඪ ලිච්ඡවී හට පත්තඋක්කුජ්ජනය කෙරේවා (පත්තනික්කුජ්ජන කර්මය අවලංගු කෙරේවා) ඔහු සඞ්ඝයා සමෙභාගය ඇත්තකු කෙරේවා. මහණෙනි, අංග අටෙකින් සමන්විත උපාසකයාට පත්තඋක්කුජ්ජන කර්මය කළයුතු. (කවර අඞ්ග අටෙකින් සමන්විතයාට ද යත්:) භික්ෂූනට අලාභය පිණිස තැත් නො කෙරේ ද, භික්ෂූනට අවැඩ පිණිස ප්‍රයෝග නො කෙරේ ද, භික්ෂූන් වසන තැනින් නෙරපීම පිණිස ප්‍රයොග නො කෙරේ ද, භික්ෂූනට ආක්‍රොශ නො කෙරේ ද පරිභව නො කෙරේ ද, භික්ෂූන් භික්ෂූන් කෙරෙන් නො බිඳුවා ද, බුදුනට දෙස් නො නඟා ද, දහමට දෙස් නො නඟා ද, සඟනට දෙස් නො නඟා ද, මහණෙනි, මේ අඞ්ග අටින් යුත් උපාසකයාට පත්තඋක්කුජ්ජනය කරන්නට (පත්තනික්කුජ්ජන කර්මයෙන් ඔහු නිදහස් කරන්නට) අනුදනිමි" යනු යි.

මහණෙනි, පත්ත උක්කුජ්ජනය වනාහි මෙසේ කළයුතු: මහණෙනි, ඒ වඩ්ඪ ලිච්ඡවීන් විසින් සඞ්ඝයා කරා එළඹ, උතුරු සළුව සකස් කොට භික්ෂූන්ගේ පා වැඳ උක්කුටුක වැ හිඳ දෙහොත් මුදුන් තබා ගෙන "වහන්ස, මට සඞ්ඝ තෙමේ පත්තනික්කුජ්ජනය කෙළේ යැ. සඞ්ඝයා හා සමෙභාග නැත්තෙක් (කරන ලද්දෙමි) වෙමි. වහන්ස, ඒ මම් මනාව පවතිමි. ලොම් හෙළමි (යටත් පහත් ව පවතිමි). නිස්තරණය පිණිස (මට පැනවූ දඬුවමින් මිදෙනු පිණිස) කළයුතු දෑ කරමි. සඞ්ඝයාගෙන් පත්තඋක්කුජ්ජනය ඉල්ලමි"යි මෙසේ කියයුතු වන්නේ ය. දෙවෙනි වර ද තෙවෙනි වර ද මෙසේ ම යාච්ඤා කළයුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සංඝ තෙමේ මෙසේ දැන්වියයුතු:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා ගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් වඩ්ඪ ලිච්ඡවීහට පත්තනික්කුජ්ජනය කරන ලද්දේ ය, සඞ්ඝයා හා සමෙභාග නැතියෙක් කරන ලද්දේ ය. හේ මනා වැ පවතී. අනුලොම් වැ (යටත් පහත් වැ-වචනයට අවනත වැ) පවතී: නිස්තරණය පිණිස (පැනැවූ දඬුවමින් මිදෙනු පිණිස) කළ යුතු දෑ කෙරෙයි. පත්තඋක්කුජ්ජනය සඞ්ඝයාගෙන් ඉල්ලයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ වී නම්, සඞ්ඝ තෙමේ වඩ්ඪ ලිච්ඡවිහට පත්තඋක්කුජ්ජනය කෙරේවා, ඔහු සඞ්ඝයා හා සමෙභාග ඇතියකු කෙරේවා". මේ ඥප්තිය යැ.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝෙන වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තො නික්කුජ්ජිතො අසම්භොගො සඞ්ඝෙන. සො සම්මා වත්තති ලොමං පාතෙති නෙත්ථාරං වත්තති. සඞ්ඝං පත්තුක්කුජ්ජනං යාචති. සඞ්ඝො වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තං උක්කුජ්ජති. සම්භොගං සඞ්ඝෙන කරොති. යස්සායස්මතො ඛමති වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තස්ස උක්කුජ්ජනං, සම්භොගං සඞ්ඝෙන කරණං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

උක්කුජ්ජිතො සඞ්ඝෙන වඩ්ඪස්ස ලිච්ඡවිස්ස පත්තො සම්භොගො සඞ්ඝෙන. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

## දුතිය භාණවාරං.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් වඩ්ඪ ලිච්ඡවීහට පත්තනිකුජ්ජනය කරන ලද්දේ ය, හේ සඞ්ඝයා හා සමෙහාගය නැත්තෙක් කරන ලද්දේ ය. හෙ තෙම මනා වැ පවතී. යටත් පහත් වැ පවතී. නිස්තරණය පිණිස පවතී. සඞ්ඝයාගෙන් පත්තඋක්කුජ්ජනය . ඉල්ලයි. සඞ්ඝ තෙමේ වඩ්ඪ ලිච්ඡවීහට පත්ත උක්කුජ්ජනය කෙරෙයි. ඔහු සඞ්ඝයා හා සමෙහාග ඇතියකු කෙරෙයි. වඩ්ඪ ලිච්ඡවීහට පත්තුක්කුජ්ජනය කිරීම යම් ආයුෂ්මතක්හට රිසියෙන්නේ නම් හේ නිහඬ වේවා. යමක්හට නො රිසියෙන්නේ නම් හේ කියාවා.

සඞ්ඝයා විසින් වඩ්ඪ ලිච්ඡවීහට පත්තුක්කුජ්ජනය කරන ලද්දේ ය, සඞ්ඝයා හා සමෙහාගය ඇත්තෙක් කරන ලද්දේ ය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එ හෙයින් නිහඬ ය. මෙ කරුණ මෙසේ දරමි (සලකමි)'' යනු යි.

## දෙවෙනි බණවර නිමියේ ය.

## තතිය භාණවාරං

100. අථ ඛො භගවා වෙසාලියං යථාභිරන්තං විහරිත්වා යෙන භග්ගා තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන භග්ගා තදවසරි. තත්‍ර සුදං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ.

තෙන ඛො පන සමයෙන බොධිස්ස රාජකුමාරස්ස කොකනදෙ නාම පාසාදෙ අචිරකාරිතො හොති අනජ්ඣාවුත්ථො සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන.

අථ ඛො බොධිරාජකුමාරො සඤ්ජිකාපුත්තං මාණවං ආමන්තෙසි: එහි ත්වං සම්ම සඤ්ජිකාපුත්ත, යෙන භගවා තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ 'බොධි භන්තෙ රාජකුමාරො භගවතො පාදෙ සිරසා වන්දති අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී'ති. එවඤ්ච වදෙහි: 'අධිවාසෙතු කිර භන්තෙ භගවා බොධිස්ස රාජකුමාරස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති.

'එවං භො'ති ඛො සඤ්ජිකාපුත්තො මාණවො බොධිස්ස රාජකුමාරස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සඤ්ජිකාපුත්තො මාණවො භගවන්තං එතදවොච: බොධි ඛො රාජකුමාරො භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති 'අධිවාසෙතු කිර භන්තෙ භගවා බොධිස්ස රාජකුමාරස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො සඤ්ජිකාපුත්තො මාණවො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා යෙන බොධිරාජකුමාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බොධිං රාජකුමාරං එතදවොච: ''අවොචුම්හ ඛො මයං භොතො වචනෙන තං භගවන්තං ගොතමං 'බොධි ඛො රාජකුමාරො භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති: අධිවාසෙතු කිර භන්තෙ භගවා බොධිස්ස රාජකුමාරස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවුත්ථඤ්ච පන සමණෙන ගොතමෙනා''ති.

# තුන්වන බණවර

100. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ විසල්පුර කැමැති තාක් වැස, භග්‍ග රට බලා සැරි සරා වඩින්නට පිටත් වූ සේක. පිළිවෙළින් සැරිසරා වඩනා සේක්, භග්‍ග රටට බට සේක. එ කල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භග්‍ග රටැ සුංසුමාරගිර නුවරට නො දුරු නො ළං තන්හි වූ භෙසකලා වනයෙහි වැඩ වසන සේක.

එ කලැ වනාහි බොධි රාජකුමාරයා විසින් කොකනද නම් පහයෙක් කරවන ලද නොබෝ කල් ඇත්තේ, මහණක්හු හෝ බමුණක්හු හෝ මනුෂ්‍ය වූ කිසිවක්හු විසින් වාසය නො කරන ලද වෙයි.

ඉක්බිති බොධි රාජකුමාර තෙම සඤ්ජිකාපුත්‍ර මාණවකයා බණවා, "සගය, සඤ්ජිකාපුත්‍රය, මෙහි එව. භාග්‍යවතුන් වහන්සේ වෙත යා. ගොස් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පා හිස නමා වඳුව, ආබාධ නැති බව, නීරොග බව, හැල්ලු සිරුර ඇති බව, ශරීර ශක්තිය ඇති බව, සැප විහරණ ඇති බව විචාරව. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟන හා සෙට දවසට බොධි රාජකුමාරයාගේ බත ඉවසන සේක් වා' යි මෙසේත් කියව" යි කීයේ ය.

සඤ්ජිකාපුත්‍ර මාණවක 'එසේ ය පින්වතැ' යි කියා බොධි රාජකුමාරයාට පිළිවදන් දී, භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ, භාග්‍යවතුන් වහන්සේ හා සතුටු විය, සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ යුතු වූ කථාව නිමවා, එක් පසෙක හිඳ ගත්තේ ය. සඤ්ජිකා පුත්‍ර මාණවක තෙම මෙසේ එක් පසෙක හුන්නේ ම, "බොධි රාජකුමාර තෙම භවත් ගෞතමයන්ගේ පා හිස නමා වඳී. නිරාබාධ බව, නො ලෙඩ බව, හැල්ලු සිරුර ඇති බව, සිරුරු බල ඇති බව, සැප විහරණ ඇති බව විචාරයි. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟුන් හා සෙට දවසට බොධි රාජ කුමාරයාගේ බත ඉවසන සේක්වා' යි මෙසේත් කියා" යැ යි මෙ වචන කී ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවැසූ සේක:

ඉක්බිත්තෙන් සඤ්ජිකාපුත්‍ර මාණවක තෙම භාග්‍යවතුන් වහන්සේ ඒ නිමන්ත්‍රණය ඉවැසූ නියාව දැන, හුනස්නෙන් නැඟී බොධි රාජ කුමාරයා කරා ගියේ ය. ගොස්, "බොධි රාජකුමාර තෙම භවත් ගෞතමයන්ගේ පා හිස නමා වඳී, නිරාබාධ බව, නො ලෙඩ බව, හැල්ලු සිරුර ඇති බව, ශරීර ශක්තිය ඇති බව, සැප විහරණ ඇති බව විචාරයි. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟන හා සෙට දවසට බොධි රාජකුමාරයාගේ බත ඉවසන සේක්වා' යි මෙසේත් කියා යැ යි, අපි භවත්හුගේ වචනයෙන් ඒ භවත් ගෞතමයනට මෙසේත් කීම්හ" යි බොධි රාජකුමාරයාට මෙ බස් පැවසී ය.

101. අථ ඛො බොධිරාජකුමාරො තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා කොකනදඤ්ච පාසාදං ඔදාතෙහි දුස්සෙහි සන්ථරාපෙත්වා යාව පච්ඡිමා සොපාණකළෙබරා සඤ්ජිකාපුත්තං මාණවං ආමන්තෙසි: එහි ත්වං සම්ම සඤ්ජිකාපුත්ත, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා භගවතො කාලං ආරොචෙහි 'කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති' 'එවම්භො'ති ඛො සඤ්ජිකාපුත්තො මාණවො බොධිස්ස රාජකුමාරස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො කාලං ආරොචෙසි 'කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති'.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන බොධිස්ස රාජකුමාරස්ස නිවෙසනං තෙනුපසඞ්කමි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. තෙන ඛො පන සමයෙන බොධිරාජකුමාරො බහිද්වාරකොට්ඨකෙ ඨිතො හොති භගවන්තං ආගමයමානො. අද්දසා ඛො බොධිරාජකුමාරො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන තතො පච්චුග්ගන්ත්වා භගවන්තං අභිවාදෙත්වා පුරක්ඛත්වා යෙන කොකනදො පාසාදො තෙනුපසඞ්කමි.

අථ ඛො භගවා පච්ඡිමං සොපාණකළෙබරං නිස්සාය අට්ඨාසි. අථ ඛො බොධිරාජකුමාරො භගවන්තං එතදවොච; 'අක්කමතු භන්තෙ භගවා දුස්සානි, අක්කමතු සුගතො දුස්සානි, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො බොධිරාජකුමාරො භගවන්තං එතදවොච: 'අක්කමතු භන්තෙ භගවා දුස්සානි, අක්කමතු සුගතො දුස්සානි, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං අපලොකෙසි. අථ ඛො ආයස්මා ආනන්දො බොධිං රාජකුමාරං එතදවොච: 'සංහරතු රාජකුමාර දුස්සානි, න භගවා චෙලපත්තිකං[1] අක්කමිස්සති. පච්ඡිමං ජනතං තථාගතො අනුකම්පතී'ති.

අථ ඛො බොධිරාජකුමාරො දුස්සානි [සංහරාපෙත්වා උපරි කොකනදෙ පාසාදෙ ආසනං පඤ්ඤපෙසි. අථ ඛො භගවා කොකනදං පාසාදං අභිරුහිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො බොධිරාජකුමාරො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි.

---

1. චෙලපටිකං - මජ්ඣං.

101. ඉක්බිති බොධි රාජකුමාර තෙම ඒ රැය ඇවෑමෙන් ප්‍රණීත ඛාද්‍ය භොජ්‍ය පිළියෙළ කරවා, පැසිමි හිණිපෙත තෙක් කොකනද පහය (බිම) සුදුවතින් වස්වා, සඤ්ජිකාපුත්‍ර මාණවකයා බණවා, "යහළු සඤ්ජිකාපුත්‍රය, එන්න, භාග්‍යවතුන් වහන්සේ කරා යව, ගොස් 'වහන්ස, බත පිළියෙළ කොට නිමියේ ය, වඩින්නට කාලය යැ' යි භාග්‍යවතුන් වහන්සේට කාලය දන්වව" යි කී ය. 'එසේ ය, පින්වතැ' යි කියා සඤ්ජිකාපුත්‍ර මාණවක තෙම බොධි රාජකුමාරයාට පිළිවදන් අස්වා, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළැඹ, 'භවත් ගෞතමයිනි, දන් වඩින්නට කල් වේ. බත පිළියෙළ කොට නිමියේ යැ' යි භාග්‍යවතුන් වහන්සේට කාලය දන්වී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ පෙරවරු සමයෙහි හැඳ පෙරව, පාසිවුරු ගෙන බික් සඟන කැටුව බොධි රාජකුමාරයාගේ නිවෙස කරා වැඩිසේක. එ වේලෙහි වනාහි බොධි රාජකුමාර තෙම භාග්‍යවතුන් වහන්සේ වඩිනු බලාපොරොත්තු වනුයේ බිහිදෙරටුවෙයෙහි සිටියේ වේ. බොධි රාජකුමාර තෙම දුරින් ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක එතැනින් පෙර ගමන් කොට භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ පෙරටු කොට ගෙන කොකනද පහය වෙත එළැඹියේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පැසිමි හිණිපෙත ළඟ වැඩසිටි සේක. එ කල්හි බොධි රාජකුමාර තෙම 'වහන්ස, යම් හෙයකින් මෙය මට දික් කලක් හිත වැඩ පිණිස වන්නේ ද එහෙයින් භාග්‍යවතුන් වහන්සේ (මේ) වස්ත්‍රයන් ඇක්මෙනසේක් වා, සුගතයන් වහන්සේ (මේ) වස්ත්‍රයන් ඇක්මෙනසේක් වා' යි කී ය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිහඬ වූ සේක. දෙවනු ද ... තෙවනු ද බොධි රාජකුමාර තෙම, 'යම් හෙයකින් මෙය මට දික් කලක් හිත වැඩ පිණිස වන්නේ ද එ හෙයින් භාග්‍යවතුන් වහන්සේ (මේ) වස්ත්‍රයන් ඇක්මෙන (පාගා වඩිනා) සේක් වා' යි කීයේ ය. එ විට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් දෙස හැරී බැලූසේක. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ බොධි රාජකුමාරයාට 'රාජකුමාරය, වස්ත්‍රයන් හකුළාවා, භාග්‍ය-වතුන් වහන්සේ රෙදි පියවිල්ල නො ඇක්මෙන (නො පාගන) සේක. තථාගතයන් වහන්සේ පශ්චිම ජනතාවට අනුකම්පා කරන සේකැ' යි කීහ.

එකල්හි බොධි රාජකුමාර තෙම වස්ත්‍ර හකුළවා කොකනද පහයේ උඩු මහල් තලයෙහි අසුන් පැනැවී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කොකනද පහය නැඟ පනවන ලද අසුන්හි බික් සඟන හා වැඩහුන්සේක. ඒ වේලෙහි බොධි රාජකුමාර තෙම බුදුපාමොක් සඟන ප්‍රණීත ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් පතප්වා මොනවට පවරවා (පෙරැත්ත කොට කොට බොජුන් වළඳවා), බොජුන් වළඳ අවසන් කළ, පාත්‍රයෙන් ඉවතට ගත් ඇතැති භාග්‍යවතුන් වහන්සේ සමීපයේ එක් පසෙකැ හිඳ ගත්තේ ය.

එකමන්තං නිසින්නං ඛො බොධිං රාජකුමාරං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "න භික්ඛවෙ චෙලපත්තිකා අක්කමිතබ්බා. යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

102. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී අපගතගබ්භා භික්ඛූ නිමන්තෙත්වා දුස්සං පඤ්ඤපෙත්වා එතදවොච "අක්කමථ භන්තෙ දුස්සන්ති''. භික්ඛූ කුක්කුච්චායන්තා න අක්කමන්ති.

"අක්කමථ භන්තෙ දුස්සං මඞ්ගලත්ථායා''ති. භික්ඛූ කුක්කුච්චායන්තා න අක්කමිංසු.

අථ ඛො සා ඉත්ථී උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම අය්‍යා මඞ්ගලත්ථාය යාචියමානා චෙලපත්තිකං නාක්කමිස්සන්තී''ති. අස්සොසුං ඛො භික්ඛූ තස්සා ඉත්ථියා උජ්ඣායන්තියා ඛීයන්තියා විපාචෙන්තියා. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "ගිහී භික්ඛවෙ මඞ්ගලිකා. අනුජානාමි භික්ඛවෙ ගිහීනං මඞ්ගලත්ථාය යාචියමානෙන චෙලපත්තිකං අක්කමිතුන්ති''.

තෙන ඛො පන සමයෙන භික්ඛූ ධොතපාදකං අක්කමිතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ ධොතපාදකං අක්කමිතුන්ති''.

103. අථ ඛො භගවා භග්ගෙසු යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො විසාඛා මිගාරමාතා ඝටකඤ්ච කතකඤ්ච සම්මජ්ජනිඤ්ච ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො විසාඛා මිගාරමාතා භගවන්තං එතදවොච: "පටිග්ගණ්හාතු මෙ භන්තෙ භගවා ඝටකඤ්ච කතකඤ්ච සම්මජ්ජනිඤ්ච යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායා''ති. පටිග්ගහෙසි භගවා ඝටකඤ්ච සම්මජ්ජනිඤ්ච. න භගවා කතකං පටිග්ගහෙසි.

එසේ එක් පසෙක හුන් බෝධි රාජකුමාරයාට භාග්‍යවතුන් වහන්සේ ධර්මකථායෙන් කරුණු දක්වා, එය මොනොවට ගන්වා, ඒ ගැන්ම තියුණු කොට, එහි ඵල දක්වීමෙන් සතුටු කොට, හුනස්නෙන් නැගී නික්ම වැඩිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කාරණයෙහි දැහැමි කථා කොට භික්ෂූන් බණවා, "වස්ත්‍රයෙන් කළ පියවිල්ල (පාවාඩය) නො ඇක්මිය යුතු ය, යම් මහණෙක් ඇක්මෙන්නේ නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේයැ" යි වදළ සේක.

102. එ සමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් පහ වූ දරුගබ ඇත්තී, භික්ෂූන් නිමතා වස්ත්‍ර පනවා (බිමට රෙදි එළා) "වහන්ස, වස්ත්‍රය ඇක්මුන මැනැවැ" යි කීවා ය. භික්ෂුහු කුකුස් කරන්නාහු නො ඇක්මෙත්.

"වහන්ස, මංගල පිණිස වස්ත්‍රය ඇක්මෙන්නැ" යි ඕ කීවා ය. භික්ෂුහු කුකුස් කරන්නාහු නො ඇක්මුණාහ.

එකල්හි ඒ ස්ත්‍රී "කෙසේ නම් ආර්යයෝ මංගල පිණිස ඉල්ලනු ලබන්නාහු රෙදි පියැවිල්ල නො ඇක්මෙන්නාහු දැ" යි අවඥා කෙරෙයි, නුගුණ කියයි, දෙස් කතා පතුරුවයි. භික්ෂුහු අවඥා කරන, නොගුණ කියන, දෙස් කතා පතුරුවන ඒ ස්ත්‍රියගේ වචන ඇසූහ. ඉක්බිති ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ ... "මහණෙනි, ගෘහස්ථයෝ මාංගලිකයහ මහණෙනි, මංගල පිණිස ගිහියන් විසින් ඉල්ලනු ලබන මහණහු විසින් රෙදි පියැවිල්ල ඇක්මෙන්නට අනුදනිමි" යි වදළ සේක.

එ සමයෙහි මහණහු දෙවූ පා ඇතියහු විසින් පා තැබිය යුතු කොට එලා ඇති රෙදි ඇතිරිය ඇක්මෙන්නට කුකුස් කෙරෙත් ... "මහණෙනි, දෙවූ පා ඇත්තහු සඳහා එළා ඇති ඇතිරිය ඇක්මෙන්නට අනුදනිමි" යි වදළ සේක.

103. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භග්ග රට කැමති තාක් වැස සැවැත් නුවර බලා සැරිසරා වඩනට නික්මුණු සේක. පිළිවෙළින් සැරි සරා වඩනාසේක්, සැවැත්නුවරට පැමිණිසේක. එ සමයෙහි වූ කලි භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජෙතවන නම් වූ අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි මිගාරමාතෘ නම් වූ විශාඛා උපාසිකා තොමෝ අතළයක් ද (කටු මතු කොට මැටියෙන් තනන ලද) පාගටනාවක් ද [illegible]ස්නක් ද ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියා ය. එළැඹ වැඳ පසෙක හුන්නා ය. පසෙක හිඳ "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මගේ මේ අතළය ද පාගටනාව ද මුස්න ද පිළිගන්නා සේක් වා. එය මට [illegible]ස කාලයක් වැඩ පිණිස සුව පිණිස වන්නේ යැ" යි කීවා ය. භාග්‍යවතුන් වහන්සේ අතළය ද මුස්න ද පිළිගත් සේක. පාගටනාව නො පිළිගත්සේක.

අථ ඛො භගවා විසාඛං මිගාරමාතරං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො විසාඛා මිගාරමාතා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ඝටකඤ්ච සම්මජ්ජනිඤ්ච. න භික්ඛවෙ කතකං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ තිස්සො පාදඝංසනියො සක්ඛරං කථලං සමුද්දඵෙණකන්ති."

104. අථ ඛො විසාඛා මිගාරමාතා විධූපනඤ්ච තාලවණ්ටඤ්ච ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො විසාඛා මිගාරමාතා භගවන්තං එතදවොච: "පටිග්ගණ්හාතු මෙ භන්තෙ භගවා විධූපනඤ්ච තාලවණ්ටඤ්ච යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

පටිග්ගහෙසි භගවා විධූපනඤ්ච තාලවණ්ටඤ්ච. අථ ඛො භගවා විසාඛං මිගාරමාතරං ධම්මියා කථාය සන්දස්සෙසි -පෙ- අථ ඛො විසාඛා මිගාරමාතා -පෙ- පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ විධූපනඤ්ච තාලවණ්ටඤ්චා"ති.

105. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස මකසබීජනී උප්පන්නා හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ මකසබීජනින්ති".

චමරිබීජනී[1] උප්පන්නා හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ චමරිබීජනී ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ තිස්සො බීජනියො: වාකමයං උසීරමයං මොරපිඤ්ඡමයන්ති.

1. චාමරිබීජනී - මජ්ඣං.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මිගාරමාතෘ නම් වූ විශාඛාවට ධර්මනිඃශ්‍රිත කථායෙන් කරුණු දක්වාවදළසේක, ඒ කරුණු ගැන්වූ සේක, එහි උනන්දු කළසේක, එහි ලා සතුටු කළ සේක. එයට පසු, විශාඛා මිගාරමාතෘ තොමෝ භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දැහැමි කතායෙන් කරුණු දක්වන ලද්දී, කරුණු ගන්වන ලද්දී, එහි උනන්දු කරන ලද්දී, එහි සතුටු කරන ලද්දී, හුනස්නෙන් නැගී සිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියා ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි, මෙ කරුණෙහි දැහැමි කථා කොට භික්ෂුසඞ්ඝයා බණවා, "මහණෙනි, අතළය ද මුස්න ද අනුදනිමි. මහණෙනි, පාගටනාව පරිභොග නො කළයුතු. යමෙක් පරිභොග කරන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, (පා ගටනු පිණිස) ගල ද කැබැලිති ද මුහුදු පෙණ ද යන තුන් පා ගටනා අනුදනිමි'' යි වදළ සේක.

104. නැවත (එක් දිනක්) මිගාරමාතෘ නම් වූ විශාඛා තොමෝ විජිනිපතක් ද තල්වටක් ද ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියා ය. එළැඹ වැඳ පසෙක හිඳ ගත්තා ය. පසෙක හිඳ, "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ විජිනිපත ද තල්වට ද පිළිගන්නාසේක්වා. එය මට දික් කලක් වැඩ පිණිස සුව පිණිස වන්නේ යැ'' යි කීවා ය.

භාග්‍යවතුන් වහන්සේ විජිනිපත ද තල්වට[1] ද පිළිගත් සේක. ඉක්බිති මිගාරමාතෘ නම් වූ විශාඛාවට දැහැමි කථාවෙන් කරුණු දක්වා වදළසේක... එකල්හි මිගාරමාතෘ නම් වූ විශාඛා තොමෝ... පැදකුණු කොට ගියාය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තෙල නිදානයෙහි, තෙල කරුණෙහි දැහැමිකථා වදරා භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, විජිනිපත ද තල්වැට ද අනුදනිමි''යි.

105. එ සමයෙහි විනාහි සඞ්ඝයාට මදුරුවිදූනාවෙක්[2] උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළාහ. "මහණෙනි, මදුරුවිදූනාව අනුදනිමි'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

සෙමෙර විදූනාවෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළාහ. "මහණෙනි, සෙමෙරවිදූනාව නො දැරිය යුතු. යමෙක් දරන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, වැහැරිමුවා විදූනාව ද, සුවඳහොට මුවා විදූනාවද, මොනර පිල්මුවා විදූනාව ද යන තුන් විජිනිපත් අනුදනිමි'' යි වදළ සේක.

---

1. මෙහි තල්වැට යනු නවුවත් සමග ම තල අත්ත ගෙන කවාකාර කොට තනන ලද අවාන් විශෙෂය යි. තාලවණ්ටන්ති සභාවණ්ටන කතං තාලං තාල වණ්ටං (පාචිත්තාදි අත්ථයොජනා). තාලපත්තාදීහි කතං මණ්ඩලික විජනිං (සාරත්ථදීපනීටීකා).

2. මදුරුවන් පලවා හරින්නට පවත් සලන විජිනි පතක්.

196. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ඡත්තං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ඡත්තන්ති."

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඡත්තපග්ගහිතා ආහිණ්ඩන්ති. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො සම්බහුලෙහි ආජීවකසාවකෙහි සද්ධිං උය්‍යානං අගමාසි. අද්දසංසු[1] ඛො තෙ ආජීවකසාවකා ඡබ්බග්ගියෙ භික්ඛූ දූරතොව ඡත්තපග්ගහිතෙ ආගච්ඡන්තෙ. දිස්වාන තං උපාසකං එතදවොචුං: "එතෙ ඛො අය්‍යා, තුම්හාකං භදන්තා ඡත්තපග්ගහිතා ආගච්ඡන්ති සෙය්‍යථාපි ගණකමහාමත්තා"ති.

"නාය්‍යා එතෙ භික්ඛූ පරිබ්බාජකා"ති.

"භික්ඛූ න භික්ඛූ"ති අබ්භුතං අකංසු. අථ ඛො සො උපාසකො උපගතෙ සඤ්ඤාපෙත්වා උජ්ඣායති ඛිය්‍යති විපාචෙති "කථං හි නාම භදන්තා ඡත්තපග්ගහිතා ආහිණ්ඩිස්සන්තී"ති.

අස්සොසුං ඛො භික්ඛූ තස්ස උපාසකස්ස උජ්ඣායන්තස්ස ඛිය්‍යන්තස්ස විපාචෙන්තස්ස. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ -පෙ- සච්චං භගවා."

විගරහි බුද්ධො භගවා. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ ඡත්තං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

197. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති, තස්ස විනා ඡත්තෙන න ඵාසු හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස ඡත්තන්ති.[2]"

තෙන ඛො පන සමයෙන භික්ඛූ 'ගිලානස්සෙව භගවතා ඡත්තං අනුඤ්ඤාතං නො අගිලානස්සා'ති ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධාරෙතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසු. "අනුජානාමි භික්ඛවෙ අගිලානෙනපි ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධාරෙතුන්ති."

1. අද්දසාසුං - මජසං.
2. ඡත්තං ධාරෙතුන්ති - මජසං.

106. එ සමයෙහි සඞ්ඝයාට ඡත්‍රයෙක් (කුඩයෙක්) උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි ඡත්‍රය (කුඩය) අනුදනිමි" යි වදාළ සේක.

එ සමයෙහි සවැගි මහණහු ඔසොවා ගත් කුඩ ඇත්තාහු (කුඩ ඉසැ ලා ගෙන) ඇවිදිත්. එ කල එක්තරා උපාසකයෙක් බොහෝ සිය ගණන් ආජීවික ශ්‍රාවකයන් හා උයනට ගියේ ය. ඒ ආජීවික ශ්‍රාවකයෝ කුඩ ඉසලා ගෙන එන සවැගි මහණුන් දුරින් ම දුටුයේ ය. දැක, ඒ උපාසකයා බණවා "ආර්යය තෙල ඔබ පැවිදි පින්වත්හු ගණක මහාමාත්‍යයන් සේ කුඩ ඉසලා ගත්තාහු එන්නාහ" යි කීහ.

"ආර්යයෙනි, තෙල භික්ෂූහු නො වෙත්, පිරිවැජියෝයැ" යි උපාසක තෙම කී ය.

"භික්ෂූහු ද? භික්ෂූහු නො වෙත් ද?" යි ඕවුවු ඇල්ලූහ. එයින් පසු ඒ උපාසක තෙම ළඟට ආවුන් හැඳින "කෙසේ නම් පින්වත්හු කුඩ ඉසලා ගෙන හැවිදින්නාහු ද" යි අවඥා කෙරෙයි, නොගුණ කියයි, දෙස් පතුරුවයි.

භික්ෂූහු අවඥා කරන, නොගුණ කියන, දෙස් පතුරුවන ඒ උපාසකයා ගේ වචන ඇසූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, ... සැබෑ ද?" යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. 'සැබව වහන්සැ' යි ඔහු කීහ.

භාග්‍යවතුන් වහන්සේ ගැරැහූ සේක. ගරහා ධර්ම කථා කොට "මහණෙනි, කුඩය නො දැරිය යුතු, යමෙක් දැරුයේ වී නම්, දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදාළ සේක.

107. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. ඔහුට කුඩයක් නැති ව අපහසු වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, ගිලන් මහණහට කුඩය අනුදනිමි" යි වදාළ සේක.

එ සමයෙහි මහණහු 'භාග්‍යවතුන් වහන්සේ විසින් ගිලනාට ම කුඩය අනුදැනිණ, නොගිලනාට නො අනුදැනිණැ' යි කියා ආරාමයෙහි ද, ආරාමොපචාරයෙහි ද කුඩ දරන්නට කුකුස් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. "මහණෙනි, නොගිලනහු විසින් ද ආරාමයෙහිත් ආරාමොපචාරයෙහිත් කුඩය දරන්නට අනුදනිමි" යි වදාළ සේක.

108. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සික්කාය පත්තං උඩ්ඩෙත්වා[1] දණ්ඩෙ ආලග්ගිත්වා විකාලෙ අඤ්ඤතරෙන ගාමද්වාරෙන අතික්කමති. මනුස්සා "එසය්‍යා[2] චොරො ගච්ඡති. අසි'ස්ස විජ්ජොතලතී"ති අනුපතිත්වා ගහෙත්වා සඤ්ජානිත්වා මුඤ්චිංසු. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.

"කිං පන ත්වං ආවුසො දණ්ඩසික්කං ධාරෙසී"ති.

"එවමාවුසො"ති.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු දණ්ඩසික්කං ධාරෙස්සතී"ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර ත්වං භික්ඛු දණ්ඩසික්කං ධාරෙසී'ති"

"සච්චං භගවා"

විගරහි බුද්ධො භගවා. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ දණ්ඩසික්කා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

109. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. න සක්කොති විනා දණ්ඩෙන[3] ආහිණ්ඩිතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො දණ්ඩසම්මතිං[4] දාතුං. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො:

"අහං භන්තෙ ගිලානො න සක්කොමි විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං. සො'හං භන්තෙ සඞ්ඝං දණ්ඩසම්මතිං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බා. තතියම්පි යාචිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

---

1. උච්චිත්වා - මජසං, PTS.
උඩ්ඩිත්වා - සයා.
2. එසය්‍යො - සීමු.
3. දණ්ඩකෙන - සීමු.
4. දණ්ඩසම්මුතිං - මජසං.

108. එ සමයෙහි එක්තරා මහණෙක් සාල්ලෙක නංවා දණ්ඩෙක එල්ලාගෙන නො කල්හි එක්තරා ගම්දොරෙකින් ඉක්මයෙයි. මිනිස්සු 'ආර්යයෙනි, මේ සොරෙක් යෙයි, ඔහුගේ කඩුව දිලිසේ' යැ යි කියා ලුහුබැඳ අල්ලාගෙන හැඳින මුද හළහ. එ කල්හි ඒ මහණ ආරාමයට ගොස් භික්‍ෂූනට මෙ පවත් සැල කෙළේ ය.

''ඇවැත්නි, තෙපි දණ්ඩසික්කාවක් (දණ්ඩෙක බඳනා ලද සාල්-ලක්)දරවු දැ?'' යි භික්ෂූහු ඇසූහ. ''එසේය ඇවැත්නි'' යි හේ කී ය.

යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ ද ලද පමණෙහි සතුටු වෙත් ද ලජ්ජීහු ද සුළු වරදෙහිත් කුකුස් කෙරෙත් ද් ශික්‍ෂා කැමත්තෝ ද, ඔහු ''කෙසේ නම් මහණ තෙමේ දණ්ඩසික්කා-වක් දරන්නේ දැ'' යි අවඥා කෙරෙත්, අගුණ කියත්, දොස් පතුරුවත්.

ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

''මහණ සැබෑ ද? තෝ දණ්ඩසික්කාවක් දරහි දැ?'' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

''එසේ ය, වහන්සැ'' යි එ මහණ කී ය.

භාග්‍යවතුන් වහන්සේ ගැරැහූසේක. ගරහා දහැමි කතා කොට භික්‍ෂූන් අමතා, ''මහණෙනි, දණ්ඩසික්කාව නො දැරිය යුතු. යමෙක් දරුයේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ'' යි වදළ සේක.

109. එ සමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. දණ්ඩක් නැති වැ ඇවිදින්නට නො හැකි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. ''මහණෙනි, ගිලන් මහණහට දණ්ඩ සම්මතිය දෙන්නට අනුදනිමි. එය වනාහි මෙසේ දියැ යුතු: ඒ ගිලන් මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට වැඩිමහලු මහණුන් පා වැඳ, උත්කුටුක වැ හිඳ, දෙහොත් මුදුන්හි තබාගෙන,

''වහන්ස මම ගිලන්මි, දණ්ඩක් නැති වැ ඇවිදින්නට නො හැක්කෙමි. වහන්ස, ඒ මම සඞ්ඝයාගෙන් දණ්ඩ සම්මතිය ඉල්ලමි'' යි මෙසේ කියැ යුතු වන්නේ ය. දෙවෙනි වර ද ඉල්ලිය යුතු තෙවෙනි වරද ඉල්ලියයුතු. ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් මෙසේ සඞ්ඝ තෙමේ දන්වියයුතු ය.

‘‘සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථනාමො භික්ඛු ගිලානො, න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං. සො සඞ්ඝං දණ්ඩසම්මතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථනාමස්ස භික්ඛුනො දණ්ඩසම්මතිං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථනාමො භික්ඛු ගිලානො න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං. සො සඞ්ඝං දණ්ඩසම්මතිං යාචති. සඞ්ඝො ඉත්ථනාමස්ස භික්ඛුනො දණ්ඩසම්මතිං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථනාමස්ස භික්ඛුනො දණ්ඩසම්මතියා දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දින්නා සඞ්ඝෙන ඉත්ථනාමස්ස භික්ඛුනො දණ්ඩසම්මති, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී’’ති.

110. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

‘‘අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො සික්කාසම්මතිං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො ‘‘අහං භන්තෙ ගිලානො න සක්කොමි විනා සික්කාය පත්තං පරිහරිතුං. සො’හං භන්තෙ සඞ්ඝං සික්කාසම්මතිං යාචාමී’’ති. දුතියම්පි යාචිතබ්බා. තතියම්පි යාචිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.’’

‘‘සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථනාමො භික්ඛු ගිලානො න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං. සො සඞ්ඝං සික්කාසම්මතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථනාමස්ස භික්ඛුනො සික්කාසම්මතිං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං ඉත්ථනාමො භික්ඛු ගිලානො න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං. සො සඞ්ඝං සික්කාසම්මතිං යාචති. සඞ්ඝො ඉත්ථනාමස්ස භික්ඛුනො සික්කාසම්මතිං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථනාමස්ස භික්ඛුනො සික්කාසම්මතියා දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථනාමස්ස භික්ඛුනො සික්කාසම්මති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී’’ති.

"වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ මෙ නම් මහණ ගිලන් යැ. දණ්ඩක් නැති වැ ඇවිදියැ නො හැක්ක. හෙතෙම සඞ්ඝයා ගෙන් දණ්ඩසම්මතිය ඉල්ලයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ වී නම් මෙ නම් මහණහට දණ්ඩ සම්මතිය දෙන්නේ ය. මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. මේ මෙනම් මහණ තෙම ගිලන් ය. දණ්ඩක් නැතිවැ ඇවිදින්නට නො හැකි වෙයි. හේ සඞ්ඝයාගෙන් දණ්ඩසම්මතිය ඉල්ලයි. සඞ්ඝ තෙමේ මෙනම් මහණහට දණ්ඩසම්මතිය දෙයි. මෙනම් මහණහට දණ්ඩ සම්මතිය දීම යම් ආයුෂ්මතක්හට රිසියෙන්නේ නම්, හේ නිහඬ වේවා. යමක්හට නො රිසියෙන්නේ නම් හේ කියාවා.

"සඞ්ඝයා විසින් මෙනම් මහණහට දණ්ඩසම්මතිය දෙන ලදී. සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි (සිතමි)" යනු යැ.

110. තවද එසමයෙහි එක්තරා මහණෙක් ගිලන්වෙයි. සහල්ලක් නැති වැ පාත්‍රය පරිහරණ කරන්නට නො හැකි වෙයි. තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේට දන්වාලූහ.

"මහණෙනි, ගිලන් මහණහට සික්කාසම්මතිය දෙන්නට අනුදනිමි. තවද මහණෙනි, මෙසේ දිය යුතුය: ඒ ගිලන් මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට වැඩිමහලු වහන්දෑගේ පා වැඳ උක්කුටික ව හිඳ ඇඳිලි බැඳ මෙසේ කියැ යුතු වෙයි. "වහන්ස මම ගිලන්මි. සහල්ලක් නැතිව පාත්‍රය පරිහරණ කරන්නට නො හැකි වෙමි. වහන්ස, ඒ මම සඞ්ඝයා (වෙතින්) සික්කාසම්මතිය යදිමි"යි. දෙවන වට දු යාච්ඤා කළයුතු ය. තෙවන වට දු යාච්ඤා කළයුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඟහු දැන්වියයුත්තාහ.

"වහන්ස, සඞ්ඝයා මබස් අසන සේක්වා. මේ මෙනම් මහණ ගිලන් වෙයි. සහල්ලක් නැතිවැ පාත්‍රය පරිහරණ කරන්නට නො හැක්ක. හේ සඞ්ඝයා (වෙත) සික්කාසම්මතිය යදියි. ඉදින් සඟනට පැමිණි කල් වී නම් සඞ්ඝයා මෙනම් මහණහට සික්කාසම්මතිය දෙන්නේය. තෙල ඤත්ති යැ.

"වහන්ස, සඞ්ඝයා මාගේ වචනය අසත්වා. මේ මෙනම් ඇති මහණ ගිලන් වෙයි. සහල්ලකින් වෙන් වැ පාත්‍රය පරිහරණ කරන්නට නො හැක්ක. හේ සඞ්ඝයා (වෙත) සික්කාසම්මතිය යදී, සඞ්ඝයා මෙනම් මහණහට සික්කාසම්මතිය දෙති. යම් ආයුෂ්මත් කෙනකුන්ට තෙල මහණහට සික්කාසම්මති දීම රිසි වේ නම් හේ නිහඬ වන්නේය. යමකුට නො රුස්නේ නම් හේ බණන්නේය. සඞ්ඝයා විසින් මෙනම් මහණහට සික්කාසම්මතිය දෙන ලදු. සඞ්ඝයාට (එය) රුස්නේය. එහෙයින් තුෂ්ණිම්භාවය වෙයි. තෙල මෙසේ දරමි"යි.

111. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති, න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං. න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො දණ්ඩසික්කාසම්මතිං දතුං. එවඤ්ච පන භික්ඛවෙ දතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: “අහං භන්තෙ ගිලානො, න සක්කොමි විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං, න සක්කොමි විනා සික්කාය පත්තං පරිහරිතුං. සො'හං භන්තෙ සඞ්ඝං දණ්ඩසික්කාසම්මතිං යාචාමී''ති. දුතියම්පි යාචිතබ්බා. තතියම්පි යාචිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො. න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං. න සක්කොති විනා සික්කාය පත්තං එරිහරිතුං. සො සඞ්ඝං දණ්ඩසික්කාසම්මතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො දණ්ඩසික්කාසම්මතිං දදෙය්‍ය'' එසා ඤත්ති.

“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො. න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං, න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං. සො සඞ්ඝං දණ්ඩසික්කාසම්මතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො දණ්ඩසික්කාසම්මතිං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො දණ්ඩසික්කාසම්මතියා දනං. සො තුණ්හ'ස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො දණ්ඩසික්කාසම්මති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

112. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රොමන්ථකො[1] හොති[2] සො රොමන්ථීත්වා රොමන්ථීත්වා[3] අජ්ඣොහරති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “විකාලෙ'යං භික්ඛු භොජනං භුඤ්ජතී''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“එසො භික්ඛවෙ භික්ඛු අචිරං ගොයොනියා චුතො. අනුජානාමි භික්ඛවෙ රොමන්ථකස්ස රොමන්ථනං. න ච භික්ඛවෙ බහි මුඛවාරං නීහරිත්වා අජ්ඣොහරිතබ්බං. යො අජ්ඣොහරෙය්‍ය යථා ධම්මො කාරෙතබ්බො''ති.

1. රොමච්ඡකො – මජසං, සයා.
2. අහොසි – සයා.
3. රොමච්ඡීත්වා – මජසං, සයා.

111. එ සමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. දණ්ඩක් නැතිව ඇවිදින්නට නො හැකි වෙයි, සාල්ලක් නැති ව පාත්‍රය පරිහරණය කරන්නට නො හැකි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

“මහණෙනි, ගිලන් මහණහට දණ්ඩසික්කාසම්මතිය දෙන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ එය දියැ යුතු: ඒ ගිලන් මහණ සඞ්ඝයා කරා එළැඹ උතුරුසඟ එකස් කොට, වැඩිමහලු භික්ෂූන්ගේ පා වැඳ උත්කුටුක වැ හිඳ දොහොත් මුදුනැ තබා, “වහන්ස, මම ගිලන්මි. දණ්ඩෙන් තොර වැ හැවිදින්නට නොහැක්කෙමි, සාල්ලක් නැති ව පාත්‍රය පරිහරණය කරන්නට නො හැක්කෙමි. වහන්ස, ඒ මම සඞ්ඝයාගෙන් දණ්ඩසික්කා සම්මතිය ඉල්ලමි” යි මෙසේ කියැයුතු වන්නේ ය. දෙවෙනි වර ද ඉල්ලියැ යුතු. තෙවෙනි වර ද ඉල්ලියැ යුතු. ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියැ යුතු:

“වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ මෙනම් මහණ තෙම ගිලන් යැ. දංඩක් නැති වැ හැවිදින්නට නො හැකි ය, සාල්ලක් නැති ව පාත්‍රය පරිහරණය කරන්නට නො හැකි ය. හේ සඞ්ඝයා ගෙන් දණ්ඩසික්කාසම්මතිය ඉල්ලයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇතියේ වී නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහට දණ්ඩසික්කා සම්මතිය දෙන්නේ ය”. මේ ඥප්තිය (දැන්වීම යැ).

“වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ මෙනම් මහණ තෙමේ ගිලන් යැ. දණ්ඩක් නැති ව ඇවිදින්නට නො හැකි යැ. සාල්ලක් නැති ව පාත්‍රය පරිහරණය කරන්නට නො හැකිය. හේ සඞ්ඝයාගෙන් දණ්ඩසික්කාසම්මතිය ඉල්ලයි. සඞ්ඝ තෙමේ මෙනම් මහණහට දණ්ඩසික්කාසම්මතිය දෙයි. මෙනම් මහණහට දණ්ඩසික්කාසම්මතිය දීම යම් ආයුෂ්මතක්හට රිසියේ ද හේ නිහඬ වේවා. යමකුහට නො රිසියේ නම් හේ කියාවා. සඞ්ඝයා විසින් මෙනම් මහණහට දණ්ඩසික්කාසම්මතිය දෙන ලද්දී. එය සඞ්ඝයාට රිසියෙයි, එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සිතමි)” යනු යැ.

112. එ සමයෙහි වනාහි එක්තරා මහණෙක් වැළැඳූ බොජුන් වමාරන්නේ වෙයි. හේ වමාර වමාරා ගිලියි. “මේ මහණ විකාලයෙහි බොජුන් වළඳා”යැ යි භික්ෂූහු ඔහුට අවඥා කෙරෙත්; අගුණ කියත්; දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

“මහණෙනි, මේ මහණ නොබෝ කල්හි (මෑතදී) ගවයොනි-යෙන් චුත විය. මහණෙනි, (පියෙවියෙන්) වමාරන්නාහට ඒ වැමෑ-රීම අනුදනිමි. මහණෙනි, එතෙකුදු වුවත් මුවදොරින් (උගුරෙන්) පිටත, නික්මවා නැවැත නොගිලියැයුතු. යමෙක් එසේ ගිලින්නේ නම් ඔහුට ධර්‍මය වූ පරිදි (විකාල භොජනය වැළැඳීමට කළයුතු පරිදි) ඔහුට කළයුතු යැ”යි වදළ සේක.

---

1. ඉබ්බධාරත්ති කණ්ණනාළිං (වජිරබුද්ධිටීකා) ඉබ්බදවාරත්ති ගලනාළිකා (සාරත්ථදීපනී)

113. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝභත්තං හොති. භත්තග්ගෙ බහූ සිත්ථානි විප්පකිරියිංසු[1]. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා ඔදනෙ දීයමානෙ න සක්කච්චං පටිග්ගහෙස්සන්ති. එකමෙකං සිත්ථං කම්මසතෙන නිට්ඨායතී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ යං දීයමානං පතති තං සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං. පරිච්චත්තං තං භික්ඛවෙ දයකෙහී"ති.

114. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දීඝෙහි නඛෙහි පිණ්ඩාය චරති. අඤ්ඤතරා ඉත්ථී පස්සිත්වා තං භික්ඛුං එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති.

"අලං භගිනි, නෙතං කප්පතී"ති.

"සචෙ ඛො ත්වං භන්තෙ න පටිසෙවිස්සසි, ඉදානාහං අත්තනො නඛෙහි ගත්තානි විලිඛිත්වා කුප්පං කරිස්සාමි 'අයං මං භික්ඛු විප්පකරොතී'ති.

"පජානාසි ත්වං භගිනී"ති.

අථ ඛො සා ඉත්ථී අත්තනො නඛෙහි ගත්තානි විලිඛිත්වා කුප්පං අකාසි: "අයං මං භික්ඛු විප්පකරොතී"ති.

මනුස්සා උපධාවිත්වා තං භික්ඛුං අග්ගහෙසුං. අද්දසාසුං ඛො තෙ මනුස්සා තස්සා ඉත්ථියා නඛෙසු ඡවිම්පි ලොහිතම්පි. දිස්වාන 'ඉමිස්සායෙව ඉත්ථියා ඉදං කම්මං, අකාරකො භික්ඛූ'ති තං භික්ඛුං මුඤ්චිංසු.

අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.

"කිං පන ත්වං ආවුසො දීඝෙ නඛෙ ධාරෙසී"ති.

"එවමාවුසො"ති.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු දීඝෙ නඛෙ ධාරෙස්සතී"ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ දීඝා නඛා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

---

1. පරිකිරිංසු - ස්‍යා.
පකිරියිංසු - PTS.

113. එ සමයෙහි එක්තරා සමූහයකගේ සඟබතෙක් වෙයි. බොජුන් හලෙහි බොහෝ බත්තුළු විසිරිණ. "කෙසේ නම් ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ බත් දෙනු ලබන කල්හි සකසා නොපිළිගන්නාහු ද, එකී එකී බත්හුළෙක් කම් සියයෙකින් නිමවේ[1]"යැයි මිනිස්සු අවඥ කරත්, නොගුණ කියත්, දෙස් පතුරුවත්. අවඥ කරන, නොගුණ කියන, දෙස් පතුරුවන ඒ මිනිසුන් ගේ කථාව භික්ෂූහු ඇසූහ. ඉක්බිත්තෙන් භික්‍ෂූහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ) "මහණෙනි, දෙනු ලබන යමක් වැටෙන්නේ නම්, එය තමන් ම ගෙන පරිභොග කරන්නට අනුදනිමි. එය දයකයන් විසින් පරිත්‍යක්ත එකෙකැ"යි වදළසේක.

114. එ සමයෙහි එක්තරා මහණෙක් දික් නියවලින් යුතු ව පිඩු පිණිස හැසිරෙයි. එක්තරා ස්ත්‍රියක් එ මහණ දක "වහන්ස, එන්න, මෙවුන් දම් සෙවිනු මැනැවැ"යි කිවා ය. මහණ තෙම "බිහිනිය, කම් නැත. එය (අපට) කැප නො වේ" යැ යි කිය.

"වහන්ස, ඉදින් ඔබ මෙවුන් දම් නො සෙවින්නාහු නම්, දන් මම සිය නියවලින් සිරුරැ අවයව සූරාගෙන මේ මහණ මට හිරිහැර කෙරේ' යැ යි හඬ නඟන්නෙමි"යි ඕ කීවාය.

"බිහිනිය, තෝ ම එය දන ගන්නෙහි"යැ යි මහණ කීය.

එවිට ඒ ස්ත්‍රී තමාගේ නියවලින් ශරීරාවයව සූරා ගෙන "මේ මහණ මට හිරිහැර කෙරේ යැ" යි හඬ නැඟුවාය.

මිනිස්සු එ තැනට දිවගොස් ඒ මහණ අල්ලා ගත්හ. ඒ මිනිස්සු ඒ ස්ත්‍රියගේ නියවලැ සිවිය ද ලේ ද දුටුවාහ. දක, "මෙය මේ ස්ත්‍රියගේ ම ක්‍රියාවෙක, මේ මහණ වරදකරු නොවේ"යැ යි කියා එ මහණහු මුදලූහ.

එකල්හි ඒ මහණ අරමට ගොස් භික්ෂූනට මෙ පවත් දන්වීය.

"කිමෙක් ද ආයුෂ්මත්නි, තෙපි දික් නිය දරහු ද?"යි එ මහණහු පුළුවුත්හ.

"එසේ ය, ඇවැත්නි"යි ඒ මහණ කී ය.

යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ ද ලද පමණින් සතුටු වන්නෝ ද, ලජ්ජීහු ද, කුකුස් කරන්නෝද, ශික්‍ෂාකාමීහු ද, ඔහු "කෙසේ නම් මහණහු දික් නිය දරන්නාහු ද"යි අවඥ කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්.

ඉක්බිත්තෙන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, දික් නිය නො දරියැ යුතු. යමෙක් එය දරන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

---

1. එක් බත්හුළුවක් උපදවා ගන්නට කුඹුර වැපිරීමේ පවත් වැඩ, සියයක් පමණ කළ යුතු වෙයි: කී නියා යි:

115. තෙන ඛො පන සමයෙන භික්ඛූ නඛෙනපි නඛං ඡින්දන්ති, මුඛෙනපි නඛං ඡින්දන්ති කුඩ්ඩෙපි නඛං සංඝසන්ති. අඞ්ගුලියො දුක්ඛා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ නඛච්ඡෙදනන්ති".

සලොහිතකං නඛං ඡින්දන්ති. අඞ්ගුලියො දුක්ඛා හොන්ති.

"අනුජානාමි භික්ඛවෙ මංසප්පමාණෙන නඛං ඡින්දිතුන්ති."

116. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ වීසතිමට්ටං කාරාපෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ වීසතිමට්ටං කාරාපෙතබ්බං. යො කාරාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ මලමත්තං අපකඩ්ඪිතුන්ති".

117. තෙන ඛො පන සමයෙන භික්ඛූනං කෙසා දීඝා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"උස්සහන්ති පන භික්ඛවෙ භික්ඛූ අඤ්ඤමඤ්ඤං කෙසෙ ඔරොපෙතුන්ති?".

"උස්සහන්ති භගවා"ති.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ඛුරං ඛුරසිලං ඛුරසිපාටිකං නමතකං සබ්බං ඛුරභණ්ඩන්ති."

118. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මස්සුං කප්පාපෙන්ති, මස්සුං වඩ්ඪාපෙන්ති, ගොලොමිකං කාරාපෙන්ති. චතුරස්සකං කාරාපෙන්ති, පරිමුඛං කාරාපෙන්ති, අඩ්ඪුරකං කාරාපෙන්ති, දාඨිකං ඨපෙන්ති, සම්බාධෙ ලොමං සංහරාපෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ මස්සු කප්පාපෙතබ්බං, න මස්සු වඩ්ඪාපෙතබ්බං, න ගොලොමිකං කාරාපෙතබ්බං, න චතුරස්සකං කාරාපෙතබ්බං, න පරිමුඛං කාරාපෙතබ්බං, න අඩ්ඪුරකං කාරාපෙතබ්බං, න දාඨිකා ඨපෙතබ්බා න සම්බාධෙ ලොමං සංහරාපෙතබ්බං. යො සංහරාපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

115. එ සමයෙහි ෂඩ්වර්ගීය මහණහු නියෙන් ද නිය සිඳිත්, මුවින් ද නිය සිඳිත්, බිත්තියෙහි ද නිය මදිත්. ඇඟිලි රිදුම සහිත වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, නියසිඳනාව අනුදනිමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ලේ සහිත කොට නිය සිඳිත්. ඇඟිලි රිදේ.

"මහණෙනි, මාංශප්‍රමාණයෙන් (නියළඟ මස ඉම් කොට) නිය සිඳින්නට අනුදනිමි"යි වදාළසේක.

116. එ සමයෙහි සවැගි මහණහු විසි නිය ඔප මට්ටම් කරවත්. "කාමභොගී ගිහියන් බඳුහ"යි මිනිස්සු අවඥා කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, විසි නිය ඔප මට්ටම් නො කැරැවිය යුතු. යමෙක් එය කරවන්නේ නම්, දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, (නිය තුළ වූ) මල පමණක් බැහැර කරන්නට අනුදනිමි"යි වදාළසේක.

117. එ සමයෙහි මහණුන්ගේ කෙහෙ දික් වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, භික්ෂූහු උනුන් කෙහෙ බාන්නට හැකි වෙත් ද?"යි අසා වදාළ සේක.

"හැකි වෙත් වහන්සැ"යි භික්ෂූහු කීහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ නිදනයෙහි මේ කරුණෙහි ලා දහැමි කතා කොට භික්ෂූන් බණවා, "මහණෙනි, කරකැත්ත ද කරගල ද කරකොපුව ද කරකැත්ත ඔතන රෙදි කඩ ද සියලු කර බඩු (ඉසකේ රවුළු බෑමට ඇවැසි සෙසු උපකරණ) ද අනුදනිමි"යි වදාළසේක.

118. එ සමයෙහි සවැගි මහණහු (කතුරෙන්) රවුළ (අන්දම් තබා) කපවත්, රවුළ වඩවත්, (එළුරවුළ සේ) දිගු කොට කපවත්, (උඩින් නලළ දෙ කෙළවර ද යැටින් හනු දෙපැත්තේ දූයී සතර කොන් ඉතිරි ව සිටුනා සේ) රවුළ සතරැස් කොට කපවත්, පපුවෙහි ලොම් බාවත්, බඩෙහි ලොම්වැටිය තබා සෙසු තන්හි ලොම් බාවත්, දළි රවුළ තබත්. සම්බාධ ස්ථානයෙහි, පුරිස්නිමිති පෙදෙස දෙකිසිලි යන තන්හි) ලොම් බාවත්. "කාමභොගී ගිහියන් බඳුහ"යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්; දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, රවුළ (අන්දම් තබා) නො කැප්විය යුතු. රවුළ නො වැඩිය යුතු, රවුළ (එළුරවුළු සේ) දික් කොට නො කැප්පිය යුතු; රවුළු සතරැස් කොට නො කැප්වියයුතු, පපුවේ ලොම් නො බැවියයුතු, බඩෙහි ලොම් වැටිය තබා සෙසු තන්හි ලොම් නොබැවියයුතු. දළි රවුළු නො තැබියයුතු. සම්බාධ ස්ථානයෙහි ලොම් නො බැවියයුතු. යමෙක් එසේ කෙළේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය." යනු යැ.

* නඛතකානි සජ්ඣකවෙධනකං පිලොතික විය. (සමන්තපාසාදිකා)

119. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො සම්බාධෙ වණො හොති. භෙසජ්ජං න සන්තිට්ඨති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා සම්බාධෙ ලොමං සං-හරාපෙතුන්ති.''

120. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කත්තරිකාය කෙසෙ ඡෙදාපෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ කත්තරිකාය කෙසා ඡෙදාපෙතබ්බා. යො ඡෙදාපෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

121. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො සීසෙ වණො හොති. න සක්කොති ඛුරෙන කෙසෙ ඔරොපෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා කත්තරිකාය කෙසෙ ඡෙදාපෙතුන්ති.''

122. තෙන ඛො පන සමයෙන භික්ඛූ දීඝානි නාසිකාලොමානි ධාරෙන්ති, මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි පිසාචිල්ලිකා'ති, භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ දීඝං නාසිකාලොමං ධාරෙතබ්බං, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

123. තෙන ඛො පන සමයෙන භික්ඛූ සක්ඛරිකායපි මධුසිත්ථ-කෙනපි නාසිකාලොමං ගාහාපෙන්ති. නාසිකා දුක්ඛා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ සණ්ඩාසකන්ති.''

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පලිතං ගාහාපෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ පලිතං ගාහාපෙතබ්බං. යො ගාහාපෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

119. එ සමයෙහි එක්තරා මහණකුට සම්බාධස්ථානයෙක වණයෙක් වෙයි. බෙහෙත් එහි නො සිටී (නොරැඳෙයි.) භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, ආබාධ ප්‍රත්‍යයයෙන් එ තන්හි ලෙඩක් ඇති කල්හි සම්බාධස්ථානයෙහි ලොම් බාවන්නට අනුදනිමි''යි වදළ සේක.

120. එ සමයෙහි සවැගි මහණහු කතුරෙන් කෙස් සිඳුවත්. ''කාමභොගී ගිහියන් බඳුහ''යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

''මහණෙනි, කතුරෙන් කෙස් නො සිඳැවිය යුතු. යමෙක් සිඳුවී නම් දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළ සේක.

121. එ සමයෙහි එක්තරා මහණක්හුගේ හිසෙහි වණයෙක් වේ. කරකැත්තෙන් කෙස් බහවන්නට නො හැක්කේය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, ආබාධ ප්‍රත්‍යයයෙන් කතුරෙන් කෙහෙ සිඳුවන්නට අනුදනිමි''යි වදළ සේක.

122. එ සමයෙහි මහණහු දික් නාසිකා ලෝම දරත්. ''පිශාච දරුවන් බඳුහ''යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, නැහැයෙහි දික් ලොම් නො දැරියයුතු. යමෙක් දරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේය''යි වදළසේක.

123. එ සමයෙහි මහණහු ගල්කැටින් ද මී ඉටියෙන් ද නැහැ ලොම් ගන්වත් (ගළවවත්.) නාසිකාවෝ රිදෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, අඬුව අනුදනිමි''යි වදළසේක.

එ සමයෙහි සවැගි මහණහු නරකෙස් ගන්වත් (උදුරවත්) ''කාමභෝගී ගිහියන් බඳුවහ'යි මිනිස්සු අවමන් කරත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

''මහණෙනි, නරකෙස් නො ගැන්වියයුතු (නො ඉදිරැවියයුතු) යමෙක් ගන්වන්නේ නම් (උදුරවන්නේ නම්) දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළසේක.

124. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කණ්ණගූථකෙහි කණ්ණා ථකිතා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ කණ්ණමලහරණින්ති".

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචා කණ්ණමලහරණියො ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ උච්චාවචා කණ්ණමලහරණියො ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමයන්ති."

125. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ බහුං ලොහභණ්ඩ – කංසභණ්ඩ – සන්නිචයං කරොන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා බහුං ලොහභණ්ඩ – කංසභණ්ඩ – සන්නිචයං කරිස්සන්ති සෙය්‍යථාපි කංසපත්ථරිකා"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ලොහභණ්ඩ – කංසභණ්ඩ – සන්නිචයො කාතබ්බො. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ අඤ්ජනිම්පි අඤ්ජනිසලාකම්පි කණ්ණමලහරණිම්පි බන්ධනමත්තම්පි කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ අඤ්ජනිං අඤ්ජනිසලාකං කණ්ණමලහරණිං බන්ධනමත්තන්ති."

126. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝාටි-පල්ලත්ථිකාය නිසීදන්ති. සඞ්ඝාටියා පත්තා ලුජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ සඞ්ඝාටිපල්ලත්ථිකාය නිසීදිතබ්බං. යො නිසීදෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තස්ස විනා ආයොගා[1] න ඵාසු හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආයොගන්ති."

---

1. ආයොගෙන – මජ්ඣං.

124. එක් සමයෙක එක්තරා මහණකුගේ කන් කන්මලින් වැසුණේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, කන්මල හරනාව (කන්හැන්ද) අනුදනිමි"යි වදළ සේක.

එ සමයෙහි සවැගි මහණහු රන්මුවා ද රිදීමුවාද කුදු මහත් කන්හැඳි දරත්. "කාමභෝගී ගිහියන් බඳුවහ"යි මිනිස්සු අවමන් කරත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, රන්මුවා ආදි කුදුමහත් කන්හැඳි නො දැරියයුතු. යමෙක් දරන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, "ඇටමුවා දත්මුවා අංමුවා නළමුවා හුනමුවා ලීමුවා ලහමුවා පලමුවා ලොහොමුවා සක්නැබමුවා කන්හැඳි දරන්නට අනුදනිමි"යි වදළසේක.

125. එ සමයෙහි සවැගි මහණහු බොහෝ ලොහො බඩු කස් බඩු (ඊයම් හා තඹ මිශ්‍ර කොට තැනූ) ලෝහයෙන් කළ (බඩු) රැස් කරති. මිනිස්සු විහාරචාරිකාව කරන්නාහු ඒ දැක, ශාක්‍යපුත්‍රිය ශ්‍රමණයෝ ලොහො බඩු වෙළෙන්දන් සේ කෙසේ නම් ලොහො බඩු කස්බඩු රැස් කෙරෙත් ද?යි අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ලොහොබඩු කස්බඩු නො රැස් කළයුතු. යමෙක් කරන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළ සේක.

එ සමයෙහි මහණහු අඳුන්නළ ද අඳුන් කූරු ද කන්හැඳි ද (වැ ආදියෙ) මිටු ද දැරීමෙහි කුකුස් කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, අඳුන් නළය ද අඳුන් කූර ද කන්හැන්ද ද වැ ආදියට මිට ද අනුදනිමි"යි වදළසේක.

126. එ සමයෙහි සවැගි මහණහු චීවර පල්ලත්ථිකායෙන් හිඳිත්. සඟළසිවුරේ පත් (වාටි) පලුදු වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ.

"මහණෙනි, සංඝාටි පල්ලත්ථිකායෙන් නො හින්දයුතු යමෙක් එසේ ඉඳින්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළ සේක.

එ සමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. ඔහුට ආයොග-පට නැති වැ පහසු නොවේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ආයොගපට අනුදනිමි"යි වදළසේක.

අථ ඛො භික්ඛූනං එතදහොසි: 'කථන්නු ඛො ආයොගො වෙතබ්බො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ තන්තකං වෙමකං වට්ටං[1] සලාකං සබ්බං තන්තභණ්ඩකන්ති.''

127. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අකායබන්ධනො ගාමං පිණ්ඩාය පාවිසි. තස්ස රථිකාය අන්තරවාසකො භස්සිත්ථ[2]. මනුස්සා උක්කුට්ඨිං අකංසු. සො භික්ඛු මඞ්කු අහොසි. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ අකායබන්ධනෙන ගාමො පවිසිතබ්බො. යො පවිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ කායබන්ධනන්ති.''

128. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචානි කායබන්ධනානි ධාරෙන්ති: කලාබුකං දෙඩ්ඩුභකං මුරජං මද්දවීණං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ උච්චාවචානි කායබන්ධනානි ධාරෙතබ්බානි: කලාබුකං දෙඩ්ඩුභකං මුරජං මද්දවීණං. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ද්වෙ කායබන්ධනානි පට්ටිකං සූකරන්තකන්ති.

කායබන්ධනස්ස දසා ජීරන්ති. ''අනුජානාමි භික්ඛවෙ මුරජං මද්දවීණන්ති.''

කායබන්ධනස්ස අන්තො ජීරති. ''අනුජානාමි භික්ඛවෙ සොභකං ගුණකන්ති.''

කායබන්ධනස්ස පවනන්තො ජීරති. ''අනුජානාමි භික්ඛවෙ විධන්ති.''

---

1. වෙධං, වධං.
2. පභස්සිත්ථ - මජසං.

එ කල්හි මහණුනට 'ආයොගපට කෙසේ නම් වියයුතු ද?' යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, හූ ඔතන දණ්ඩ ද වියන දණ්ඩ ද වට ලිය ද නඩාව ද සියලු වියන උපකරණ ද අනුදනිමි"යි වදළ සේක.

127. එ සමයෙහි එක්තරා මහණෙක් කාබහන නැති ව ගමට පිඩු පිණිස පිවිසියේ ය. වීදියේදී ඔහුගේ හඳනය ගිලිහී වැටුණේ ය. මිනිස්සු ඔල්වර හඬ දුන්හ. ඒ මහණ නිසොජසක විය. ඉක්බිති එ මහණ අරම් ගොස් මහණුනට මෙ පවත් සැලකළහ. මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, කාබහන නැති ව ගමට නො පිවිසියයුතු. යමෙක් පිවිසෙන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, කාබහන අනුදනිමි"යි වදළ සේක.

128. එ සමයෙහි සවැගි මහණහු බොහෝ රැහැන් ඇති කාබහන දියබරණ හිසක් බඳු සටහන් ඇති කාබහන මීහිඟු බෙර වැටියක් කොට වෙළු සේ කාබහන හවඩියක් බඳු කොට ගෙතූ කාබහන දූයි කුදු මහත් කාබහන් දරත්. කාමභෝගී ගිහියන් බඳුවහ'යි මිනිස්සු අවමන් කරත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, බොහෝ රැහැන් ඇති කාබහන ද දියබරණ හිස් බඳු සටහන් ඇති කොට වියූ කාබහන ද මීහිඟු බෙරවැටියක් සේ කොට වෙළා සෑදූ කාබහන ද හවඩියක් බඳු කාබහන ද යි යන කුදු මහත් කාබහන් නො දරියයුතු. යමෙක් දරන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, පටිකාව ද සූකරන්තකය ද යන කාබහන දෙක අනුදනිමි"යි වදළ සේක.

කාබහනේ දහවලු දිරයි.

"මහණෙනි, මීහිඟු බෙර වැටියක් සේ වෙළා සෑදූ කාබහන ද හවඩියක් වැනි පටිය ද අනුදනිමි"යි වදළ සේක.

කාබහනේ කෙළවර දිරයි. "මහණෙනි, වෙළා මුවවිට මැඩීම ද මීහිඟුබෙර වැටියෙක සටහනින් විවීම ද අනුදනිමි" යි වදළ සේක. කාබහනේ පාසය කෙළවර දිරයි. "මහණෙනි, විධය අනුදනිමි"යි වදළ සේක.

129. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචෙ වීයෙ ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ උච්චාවචා වීයා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමයං සුත්තමයන්ති."

130. තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො ලහුකා සඞ්ඝාටියො පාරුපිත්වා ගාමං පිණ්ඩාය පාවිසි. වාතමණ්ඩලිකාය සඞ්ඝාටියො උක්ඛිපියිංසු[1]. අථ ඛො ආයස්මා ආනන්දො ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකං පාසකන්ති."

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචා ගණ්ඨිකායො ධාරෙන්ති සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ උච්චාවචා ගණ්ඨිකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමයං සුත්තමයන්ති."

131. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගණ්ඨිකම්පි පාසකම්පි චීවරෙ අප්පෙන්ති. චීවරං ජීරති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකඵලකං පාසකඵලකන්ති."

ගණ්ඨිකඵලකම්පි පාසකඵලකම්පි අන්තෙ අප්පෙන්ති. කොණො විවරීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකඵලකං අන්තෙ අප්පෙතුං පාසකඵලකං සත්තඞ්ගුලං වා අට්ඨඞ්ගුලං වා ඔගාහෙත්වා අප්පෙතුන්ති."

---

1. උක්ඛිපිංසු - සීමු.

129. එ සමයෙහි සවැගි මහණහු රන්මුවා රිදීමුවා කුදුමහත් වීයයන් දරත්. මිනිස්සු 'කාමභොගී ගිහීන් බඳුවහ'යි අවමන් කරත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, කුදු මහත් වීය නො දැරිය යුතු. යමෙක් දරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඇටවලින් කරන ලද, දත්වලින් කරන ලද, අංවලින් කරන ලද, බටයෙන් කරන ලද, හුනයෙන් කරන ලද, ලීයෙන් කරන ලද, ලාකඩින් කරන ලද, ඵලයෙන් කරන ලද, ලොහොයෙන් කරන ලද, සක්නැබින් කරන ලද, හුයෙන් කරන ලද, වීය අනුදනිමි"යි වදළසේක.

130. එ සමයෙහි අනද තෙරණුවෝ හැල්ලු සඟළසිවුරු පොරොවා ගමට පිඩු පිණිස පිවිසියාහ. සුළි සුළඟින් සිවුරු එසැවුණාහ. එ කල්හි අනද තෙරණුවෝ අරම් වැඩ මහණුනට මෙ පවත් සැලකළහ. මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දන්වූහ.

"මහණෙනි, ගණ්ඨිකාව ද පාසකය ද අනුදනිමි"යි වදළ සේක.

එ කල්හි සවැගි මහණෝ රන්මුවා ද රිදිමුවා ද ගණ්ඨිකාවන් දරත්. 'කාමභෝගී ගිහින් බඳුවහ'යි මිනිස්සු අවමන් කරත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, රන්මුවා රිදීමුවා කුදුමහත් ගණ්ඨිකා නො දැරිය යුතු. යමෙක් දරන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඇටමුවා දත්මුවා අංමුවා නළමුවා හුනමුවා ලීමුවා ලහමුවා පලමුවා ලොහොමුවා සක්නැබමුවා හූමුවා ගණ්ඨිකා අනුදනිමි'යි වදළසේක.

131. එ සමයෙහි මහණහු ගණ්ඨිකාව ද පාසකය ද සිවුරෙහි පිහිටුවත්. සිවුරු දිරයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දන්වූහ.

"මහණෙනි, ගණ්ඨිකාඵලකය (ගණ්ඨිය යොදන්නට රෙදි කැබැල්ලක්) ද, පාසකඵලකය (පාසකය තනන්නට රෙදි කැබැල්ලක්) ද අනුදනිමි"යි වදළසේක.

ගණ්ඨිකාඵලකය ද පාසකඵලකය ද සිවුර කෙළවර පිහිටුවත්. සිවුරු කොණ විවෘත වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ගණ්ඨිකාඵලකය සිවුර කෙළවර පිහිටුවන්නට ද පාසකඵලකය සතඟුලක් හෝ අටඟුලක් හෝ සිවුර අද්දරින් පහතට බස්වා පිහිටුවන්නට අනුදනිමි"යි වදළසේක.

132. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිහිනිවත්ථං නිවාසෙන්ති: හත්ථිසොණ්ඩකං මච්ඡවාළකං චතුකණ්ණකං තාලවණ්ටකං සතවලිකං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ගිහිනිවත්ථං නිවාසෙතබ්බං: හත්ථිසොණ්ඩකං මච්ඡවාළකං චතුකණ්ණකං තාලවණ්ටකං සතවලිකං. යො නිවාසෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

133. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සංවෙල්ලියං නිවාසෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි රඤ්ඤො මුණ්ඩවට්ටී'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ, සංවෙල්ලියං නිවාසෙතබ්බං. යො නිවාසෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිහිපාරුතං පාරුපන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාම-භොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ගිහිපාරුතං පාරුපිතබ්බං. යො පාරුපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

134. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උභතො කාජං හරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි රඤ්ඤො මුණ්ඩවට්ටී'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ උභතො කාජං හරිතබ්බං. යො හරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ එකතො කාජං අන්තරාකාජං සීසභාරං ඛන්ධභාරං කටිභාරං ඔලම්බකන්ති".

132. එ සමයෙහි සවැගි මහණහු හත්ථිසොණ්ඩිකාව ද (නැබ මුල සිට ඇත්සොඬක් මෙන් පහතට එල්බෙන සේ හඳනා හැඳීම) ද මච්ඡවාළකය (දසාන්ත පාසනාතයන් දෙපසට එල්බෙන සේ හැඳීම) ද චතුකණ්ණය (උඩට හා යටට කොන් සිටින සේ හැඳීම) ද තාලවණ්ටකය (තල්වැටක් මෙන් අඳනය එල්බෙන සේ හැඳීම) ද සතවලලිකාව (අඳනය රැළිගන්වා හැඳීම) ද යන ගිහිහැඳුම් හඳිත්. කාමභොගී ගිහීන් බඳුවහ'යි මිනිස්සු අවමන් කරත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, හත්ථිසොණ්ඩිකා මච්ඡවාළක චතුකණ්ණක තාල-වණ්ටක සතවල්ලික, යන ගිහිහැඳුම් නො හැන්දයුතු. යමෙක්, හඳින්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

133. එ සමයෙහි සවැගි මහණහු (කම්කරුවන් සේ) කැස බඳිත් (පිට පට ගසත්). 'රජුගේ මුඩුවැටියන් බඳුවහ'යි මිනිස්සු අවමන් කරත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, පිට පට ගසා නො හැන්දයුතු. යමෙක් හඳින්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

එ සමයෙහි සවැගි මහණහු ගිහීන් සේ සිවුර පොරොවත්. 'කාමභොගී ගිහීන් බඳුවහ'යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ගිහි පෙරවුම නො පෙරෙවියයුතු යමෙක් පොරොවන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

134. එ සමයෙහි සවැගි මහණහු දෙකොන් කද ගෙනයත්, 'රජුගේ වහලුන් මෙනැ'යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, දෙකොන් කද නො ගෙන යායුතු. යමෙක් ගෙනයන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, එක් කොන් කද ද තඩ ද හිසින් බර ගෙන යෑම ද උරහිසින් බර ගෙනයෑම ද කටියෙන් බර ගෙනයෑම ද බර අතින් එල්ලාගෙන යෑම ද අනුදනිමි"යි වදළසේක.

135. තෙන ඛො පන සමයෙන භික්ඛූ දන්තකට්ඨං න ඛාදන්ති. මුඛං දුග්ගන්ධං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"පඤ්චිමෙ භික්ඛවෙ, ආදීනවා දන්තකට්ඨස්ස අඛාදනෙ: අචක්ඛුස්සං, මුඛං දුග්ගන්ධං හොති, රසහරණියො න විසුජ්ඣන්ති, පිත්තං සෙම්හං භත්තං පරියොනන්ධන්ති, භත්තමස්ස නච්ඡාදෙති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා දන්තකට්ඨස්ස අඛාදනෙ.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා දන්තකට්ඨස්ස ඛාදනෙ: චක්ඛුස්සං, මුඛං න දුග්ගන්ධං හොති, රසහරණියො විසුජ්ඣන්ති, පිත්තං සෙම්හං භත්තං න පරියොනන්ධන්ති, භත්තමස්ස ඡාදෙති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා දන්තකට්ඨස්ස ඛාදනෙ. අනුජානාමි භික්ඛවෙ දන්තකට්ඨන්ති''.

136. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දීඝානි දන්තකට්ඨානි ඛාදන්ති. තෙහෙව සාමණෙරෙ ආකොටෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ, දීඝං දන්තකට්ඨං ඛාදිතබ්බං. යො ඛාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අට්ඨඞ්ගුලපරමං දන්තකට්ඨං, න ච තෙන සාමණෙරො ආකොටෙතබ්බො. යො ආකොටෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

137. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අතිමටාහකං දන්තකට්ඨං ඛාදන්තස්ස කණ්ඨෙ විලග්ගං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ අතිමටාහකං දන්තකට්ඨං ඛාදිතබ්බං. යො ඛාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ චතුරඞ්ගුලපච්ඡිමං දන්තකට්ඨන්ති''.

138. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දයං ආලිම්පෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි දවඩාහකා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''න භික්ඛවෙ දයො ආලිම්පෙතබ්බො. යො ආලිම්පෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

තෙන ඛො පන සමයෙන විහාරා තිණගහණා හොන්ති. දවඩාහෙ ඩය්හමානෙ විහාරා ඩය්හන්ති. භික්ඛූ කුක්කුච්චායන්ති පටග්ගිං දතුං පරිත්තං කාතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ දවඩාහෙ ඩය්හමානෙ පටග්ගිං දතුං පරිත්තං කාතුන්ති''.

135. එ සමයෙහි මහණහු දැහැටි නො කත්. මුව දුගඳ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළසේක.

"මහණෙනි, දැහැටි නො කෑමෙහි මේ දෙස් පසෙකි: ඇස් පෙනීම දුබල කෙරෙයි, මුව දුගඳ වේ, රස නහර පිරිසිදු නො වේ, පිත ද සෙම ද බත වෙලාගනී, ඔහුට බත රුචි නො වේ. මහණෙනි, මොහු දැහැටි නො කෑමේ දෙස් පස යි.

මහණෙනි, දැහැටි කෑමෙහි මේ අනුසස් පසෙකි: ඇසට හිත වේ, මුව දුගඳ නො වේ, රස නහර පිරිසිදු වෙයි, පිතත් සෙමත් බත වෙළා නො ගනී, ඔහුට බත රුචි වේ. මහණෙනි, මොහු දැහැටි කෑමෙහි අනුසස් පස'' යි.

136. එ සමයෙහි සවැගි මහණහු දික් දැහැටි වළඳත්. එයින් ම හෙරණුනට තළත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්නූහ.

"මහණෙනි, දික් දැහැටි නො කැයුතු. යමෙක් කන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, අටඟුලක් පරම කොට ඇති දැහැටි අනුදනිමි. එයින් හෙරණ ද නො ම තැළියයුතු. යමෙක් එසේ තළන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළසේක.

137. එ සමයෙහි ඉතා කෙටි දැහැටටක් කන මහණක්හුගේ උගුරෙහි ලැගුණේ (හිර වූයේ) වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ඉතා කෙටි දැහැටට නො කැයුතු. යමෙක් කන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, යටත් පිරිසෙයින් අඟල් සතරක් වූ (අඟල්සතරකට නො අඩු) දැහැටට අනුදනිමි''යි වදළසේක.

138. එ සමයෙහි සවැගි මහණහු කැලෑ ගිනිලත්. 'කැලෑ දවන්නන් බඳුවහ'යි මිනිස්සු අවමන් කෙරෙත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, කැලෑ නො ගිනිලියයුතු. යමෙක් ගිනි ලන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළසේක.

එ සමයෙහි විහාරයෝ තණහඩුයෙන් යුක්ත වෙත්. ලැව්ගිනි ඇවිළෙන කල්හි විහාරයෝ දැවෙත්. පිළිගිනි (ප්‍රතිවිරුද්ධ ගින්නක්) දෙන්නට, ආරක්‍ෂාව කරන්නට භික්ෂූහු කුකුස් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ලැව්ගිනි ඇවිළෙන කල්හි පිළිගිනි දෙන්නට එයින් ආරක්‍ෂාව කරන්නට අනුදනිමි''යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

139. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ රුක්ඛං අභිරුහන්ති. රුක්ඛා රුක්ඛං සඞ්කමන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි මක්කටා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ රුක්ඛො අභිරුහිතබ්බො. යො අභිරුහෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තස්ස අන්තරාමග්ගෙ හත්ථී පරියුට්ඨාසි. අථ ඛො සො භික්ඛු රුක්ඛමූලං උපධාවිත්වා කුක්කුච්චායන්තො රුක්ඛං න අභිරුහි. සො හත්ථී අඤ්ඤෙන මග්ගෙන අගමාසි. අථ ඛො සො භික්ඛු සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ සති කරණීයෙ පොරිසං රුක්ඛං අභිරුහිතුං ආපදාසු යාවදත්ථන්ති''.

140. තෙන ඛො පන සමයෙන යමෙළුතෙකුලා නාම භික්ඛූ දෙව භාතිකා හොන්ති බ්‍රාහ්මණජාතිකා කල්‍යාණවාචා කල්‍යාණවාක්කරණා. තෙ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "එතරහි භන්තෙ භික්ඛූ නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා. තෙ සකාය නිරුත්තියා බුද්ධවචනං දූසෙන්ති. හන්ද මයං භන්තෙ බුද්ධවචනං ඡන්දසො ආරොපෙමා''ති. විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා එවං වක්ඛථ 'හන්ද මයං භන්තෙ බුද්ධවචනං ඡන්දසො ආරොපෙමා'ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා''ති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"න භික්ඛවෙ බුද්ධවචනං ඡන්දසො ආරොපෙතබ්බං. යො ආරොපෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුන්ති''.

141. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ලොකායතං පරියාපුණන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

139. එ සමයෙහි සවැගි මහණහු රුක් නගිත්. රුකින් රුකට යෙත්. ''වඳුරන් බඳුහ''යි මිනිස්සු අවමන් කෙරෙත්, නොගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

''මහණෙනි, රුකට නො නැගිය යුතු. යමෙක් නගින්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදාළසේක.

එ සමයෙහි මහණකු කොසොල්රටැ සැවැත් නුවරට යද්දී අතර මඟ දී ඇතෙක් ලුහුබැන්දේ ය. එ කල්හි එ මහණ රුක්මුලක් කරා දිවැ කුකුස් කරන්නේ රුකට නො නැංගේ ය. ඒ ඇතා අන් මඟෙකින් ගියේ ය. ඉක්බිති ඒ මහණ සැවැතට ගොස් මහණුනට මෙ පවත් සැලකෙළේ ය. මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, කටයුත්තක් ඇති කල්හි බඹයක් ඉහළට ගස නැඟෙන්නට ද, ආපදවන්හි දී වුව මනා පමණ ඉහළ නගින්නට ද අනුදනිමි''යි වදාළසේක.

140. එ සමයෙහි මිහිරි වචන ඇති මිහිරි හඬ ඇති බ්‍රාහ්මණ ජාතික වූ යමෙළු ද තෙකුල ද යන නම් ඇති දෙ බෑ මහණ කෙනෙක් වෙත්. ඔහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණාහ. එළැඹ ඔබ වැඳ පසෙක ඉඳගත්හ. පසෙක උන්නාහු ම ''වහන්ස, දැන් භික්ෂූහු නානාවිධ නම් ඇත්තාහු, නානාගොත්‍රයෙන් නානා ජාතියෙන් නානා කුලයෙන් නික්මැ පැවිදිවූවාහු වෙත්. ඔහු ස්වකීය ව්‍යවහාරයෙන් බුද්ධවචනය දූෂිත කෙරෙත්. වහන්ස, එබැවින් අපි බුද්ධවචනය වෛදික භාෂාමය වාචනාමාර්ගයට නඟන්නම්හ''යි කීහ. එ විට භාග්‍යවතුන් වහන්සේ, ''හිස් පුරුෂයෙනි, තෙපි 'වහන්ස, අපි බුද්ධවචනය වෛදික භාෂාමය වාචනාමාර්ගයට නඟම්හ'යි කෙසේ නම් මෙබන්දක් කියවූ ද, හිස් පුරුෂයිනි, මෙය නොපහන් වූවන් ගේ පැහැදීම පිණිස ද පැහැදුණවුන් ගේ වැඩීම පිණිස ද නො වේ. වැලිදු මහණෙනි, මෙය නො පැහැදුණවුන් ගේ නොපැහැදීම පිණිස ද පැහැදුණු ඇතැම් කෙනෙකුන් ගේ වෙනස් වීම පිණිස ද වෙයැ''යි වෙසෙසින් ගැරැහු සේක. ගරහා දැහැමි කතා කොට,

''මහණෙනි, බුදුවදන ඡන්දසට (වෛදිකභාෂාවට) නො නැඟිය යුතු. යමෙක් නඟන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේය. මහණෙනි, මාගධික නිරුක්තියෙන් බුද්ධවචනය පිරිවහන්නට අනුදැනිමි''යි වදාළසේක.

141. එ සමයෙහි සවැගි මහණහු ලොකායතශාස්ත්‍රය පිරිවහත්. 'කාමභොගී ගිහියන් බඳුහ'යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. එසේ අවමන් කරන, නුගුණ කියන, දෙස් පතුරුවන මිනිසුන් ගේ කථාව භික්ෂූහු ඇසූහ. ඉක්බිත්තෙන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"අපි නු ඛො භික්ඛවෙ ලොකායතෙ සාරදස්සාවී ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යා"ති.

"නොහෙතං භන්තෙ".

"ඉමස්මිං වා පන ධම්මවිනයෙ සාරදස්සාවී ලොකායතං පරියාපුණෙය්‍යා"ති.

"නොහෙතං භන්තෙ".

"න භික්ඛවෙ ලොකායතං පරියාපුණිතබ්බං. යො පරියාපුණෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ලොකායතං වාචෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ලොකායතං වාචෙතබ්බං. යො වාචෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තිරච්ඡානවිජ්ජං පරියාපුණන්ති -පෙ- භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ තිරච්ඡානවිජ්ජා පරියාපුණිතබ්බා යො පරියාපුණෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තිරච්ඡානවිජ්ජං වාචෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ තිරච්ඡානවිජ්ජා වාචෙතබ්බා. යො වාචෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

142. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො ඛිපි. භික්ඛූ "ජීවතු භන්තෙ භගවා ජීවතු සුගතො"ති උච්චාසද්දං මහාසද්දං අකංසු. තෙන සද්දෙන ධම්මකථා අන්තරා අහොසි. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. "අපි නු ඛො භික්ඛවෙ ඛිපිතෙ ජීවාති වුත්තො තප්පච්චයා ජීවෙය්‍ය වා මරෙය්‍ය වා"ති.

“මහණෙනි, ලොකායත ශාස්ත්‍රයෙහි සාරයක් දක්නාසුලු තැනැත්තේ මෙ සස්නෙහි වැඩීමට නැඟීමට මහත්බවට පැමිණියැ හෙන්නේ ද.?”යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක.

“වහන්ස, මෙය නොවන්නේ ම යැ”යි භික්ෂූහු පිළිවදන් දුන්හ.

“මහණෙනි, මෙ සස්නෙහි සාරය දක්නාසුලු තැනැත්තේ ලොකායත ශාස්ත්‍රය පිරිවහන්නේ දැ”යි අසා වදළසේක.

“මෙය නො වේ ම ය, වහන්සැ”යි මහණහු පිළිවදන් දුන්හ.

“මහණෙනි, ලොකායත ශාස්ත්‍රය නො පිරිවැහියැයුතු. යමෙක් පිරිවහන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ”යි වදළසේක.

එ සමයෙහි සවැගි මහණහු තිරශ්චීනවිද්‍යාව කියවත්...භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

“මහණෙනි, තිරශ්චීනවිද්‍යාව නො කියවිය යුතු. යමෙක් කියවා නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ”යි වදළසේක.

එසමයෙහි වනාහි සවග මහණහු තිරශ්චීන විද්‍යාව පිරිවහති ... භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකළාහ.

“මහණෙනි, තිරශ්චීනවිද්‍යාව නො පිරිවැහියැයුතු. යමෙක් පිරිවහා නම් දුකුළා ඇවැත් වන්නේ යැ”යි වදළසේක.

එ සමයෙහි වනාහි සවැගි මහණහු තිරශ්චීනවිද්‍යාව කියවත්. මිනිස්සු ‘කාමභොගී ගිහියන් වැනියහ’යී අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

“මහණෙනි, තිරශචීනවිද්‍යාව නො කියැවියයුතු. යමෙක් කියවන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ”යි වදළසේක.

142. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහපිරිසකින් පිරිවැරුණුසේක්, දම් දෙසනසේක්, කිවිසුමක් පහළ කළසේක. “වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ජීවත් වන සේක්වා, සුගතයන් වහන්සේ ජීවත් වන සේක්වා”යි භික්ෂූහු උස්හඬ මහහඬ කළහ. එ හඬින් ධර්මකථාව අතරක් ඇත්තේ* විය (හෙවත් නැඟුණු හඬින් ධර්මකථා හඬ යටපත් ව වැසීගියේ ය.) එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් බණවා, “මහණෙනි, කිවිසි කල්හි ජීවත් වන්නැයි කී කලැ ඒ කරුණින් ජීවත් වන්නේ ද, නැතහොත් (එය නොකී කල්හි එ කරුණින්) මැරෙන්නේ හෝ වේ දැ”යි අසාවදළසේක.

---

* අන්තරා අහෝසීති එත්ථ අන්තරාසද්දෝ ව්‍යවධානත්ථෝති ආහ, අන්තරිකා අහොසි පවිච්ඡින්නාති විනය අත්ථයොජනා

"නොහෙතං භන්තෙ".

"න භික්ඛවෙ ඛිපිතෙ ජීවාති වත්තබ්බං. යො වදෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන මනුස්සා භික්ඛූනං ඛිපිතෙ 'ජීවථ භන්තෙ'ති වදන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාලපන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'කථං හි නාම සමණා සක්‍යපුත්තියා ජීවථ භන්තෙති වුච්චමානා නාලපිස්සන්ති'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"ගිහී භික්ඛවෙ මඞ්ගලිකා. අනුජානාමි භික්ඛවෙ ගිහීනං ජීවථ භන්තෙති වුච්චමානෙන චිරං ජීවාති වත්තුන්ති".

143. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො නිසින්නො හොති. අඤ්ඤතරෙන භික්ඛුනා ලසුනං ඛායිතං හොති. සො 'මා භික්ඛූ ව්‍යාබාධියිංසූ'ති එකමන්තං නිසීදි. අද්දසා ඛො භගවා තං භික්ඛුං එකමන්තං නිසින්නං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි. "කින්නු ඛො සො භික්ඛවෙ භික්ඛු එකමන්තං නිසින්නො"ති.

"එතෙන භන්තෙ භික්ඛුනා ලසුනං ඛායිතං. 'සො මා භික්ඛූ ව්‍යාබාධියිංසූ'ති එකමන්තං නිසින්නො"ති.

"අපි නු ඛො භික්ඛවෙ තං ඛාදිතබ්බං යං ඛාදිත්වා එවරූපාය ධම්මකථාය පරිබාහිරො[1] අස්සා"ති.

"නොහෙතං භන්තෙ".

"න භික්ඛවෙ ලසුනං ඛාදිතබ්බං. යො ඛාදෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන ආයස්මතො සාරිපුත්තස්ස උදරවාතාබාධො හොති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "පුබ්බෙ තෙ ආවුසො සාරිපුත්ත උදරවාතාබාධො කෙන ඵාසු හොතී"ති.

"ලසුනෙන මෙ ආවුසො"ති.

භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා ලසුනං ඛාදිතුං"ති.

---

1. පරිබාහිරයො – මජසං.

"මෙය නො වන්නේ ම ය, වහන්සැ"යි මහණහු කීහ.

"මහණෙනි, 'කිවිසි කලැ ජීවත් වන්නැ'යි නො කියැ යුතු. යමෙක් කියන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

එ සමයෙහි මිනිස්සු මහණුනට කිවිසි කල්හි, 'වහන්ස, ජීවත් වන්නැ'යි කියත්, භික්ෂූහු, කුකුස් කරන්නාහු කිසිත් නො කියත්, "ශාක්‍යපුත්‍රීය මහණහු 'වහන්ස, ජීවත්වන්නැ'යි කියනු ලබන්නාහු කෙසේ නම් කිසිත් නො කියන්නාහු දැ"යි මිනිස්සු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ගිහියෝ මංගලයනට ගරු කරන්නෝ වෙත්. 'වහන්ස, ජීවත් වන්නැ'යි කියනු ලබන මහණහු විසින් 'බොහෝ කල් ජීවත් වන්නැ'යි කියන්නට අනුදනිමි"යි වදළසේක.

143. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහපිරිසෙන් පිරිවැරුණුසේක් දම් දෙසමින් වැඩහුන්සේක. මෙහි එක්තරා මහණෙක් ලුහුනු කන ලද්දේ වෙයි. හේ 'මහණහු (මෙහි ගඳින්) නො පෙළෙත් වා'යි සිතා එක් පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ එක් පසෙක හුන් මහණහු දුටුසේක. දැක, "මහණෙනි, කවර හෙයින් තෙල මහණ එක් පසෙක හුන්නේ වේ දැ" යි අසාවදළසේක.

"වහන්ස, තෙල මහණ විසින් ලුහුනු කන ලද්දේ ය. හේ 'භික්ෂූහු (ලුහුනු ගඳින්) නො පෙළෙත් වා'යි එක් පසෙක හුන්නේ වේ" යැ යි කීහ.

"මහණෙනි, යමක් කැමෙන් මෙ බඳු ධර්ම කථායෙන් බැහැර ව ඉන්නේ නම් එබඳු දැ කැ යුතු දැ"යි ඇසූසේක.

"වහන්ස, මෙය (කැයුතු) නො වන්නේ"යැ යි භික්ෂූහු කීහ.

"මහණෙනි, ලුහුනු නො කැයුතු. යමෙක් කන්නේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

එ සමයෙහි සැරියුත් මහතෙරුනට බඩ රුජාවෙක් වෙයි. එ කලැ මහමුගලන් තෙරණුවෝ සැරියුත් තෙරුන් කරා එළැඹියහ. එළැඹ 'ඇවැත් ශාරීපුත්‍රයිනි, පෙරැ ඔබේ බඩරිදුම කිමෙකින් පහසුවේ දැ'යි ඇසූහ.

"ඇවැත්නි, ලුහුනෙනැ"යි සැරියුත් තෙරණුවෝ වදළහ.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, ආබාධප්‍රත්‍යයෙන් (ආබාධයකට ප්‍රතිකාර වශයෙන්) ලුහුනු වළඳන්නට අනුදනිමි"යි වදළසේක.

144. තෙන ඛො පන සමයෙන භික්ඛූ ආරාමෙ තහං තහං පස්සාවං කරොන්ති. ආරාමො දූස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ, එකමන්තං පස්සාවං කාතුන්ති".

ආරාමො දුග්ගන්ධො හොති. "අනුජානාමි භික්ඛවෙ, පස්සාව-කුම්භින්ති".

දුක්ඛං නිසින්නා පස්සාවං කරොන්ති.

"අනුජානාමි භික්ඛවෙ, පස්සාවපාදුකන්ති" පස්සාවපාදුකා පාකටා හොන්ති. භික්ඛූ හිරීයන්ති පස්සාවං කාතුං.

"අනුජානාමි භික්ඛවෙ, පරික්ඛිපිතුං තයො පාකාරෙ: ඉට්ඨකාපාකාරං සිලාපාකාරං දරුපාකාරන්ති".

පස්සාවකුම්භි අපාරුතා දුග්ගන්ධා හොති. "අනුජානාමි භික්ඛවෙ අපිධානන්ති".

145. තෙන ඛො පන සමයෙන භික්ඛූ ආරාමෙ තහං තහං වච්චං කරොන්ති. ආරාමො දූස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ, එකමන්තං වච්චං කාතුන්ති".

ආරාමො දුග්ගන්ධො හොති. "අනුජානාමි භික්ඛවෙ, වච්චකූපන්ති".

වච්චකූපස්ස කූලං ලුජ්ජති, "අනුජානාමි භික්ඛවෙ, චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති".

වච්චකූපො නීචවත්ථුකො හොති. උදකෙන ඔත්ථරීයති.

"අනුජානාමි භික්ඛවෙ, උච්චවත්ථුකං කාතුන්ති".

චයො පරිපතති. "අනුජානාමි භික්ඛවෙ, චිනිතුං, තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති".

ආරොහන්තා විහඤ්ඤන්ති.

144. එ සමයෙහි මහණහු අරමෙහි (ආවාස වත්තෙහි) ඒ ඒ තැන මූත්‍ර පහකරත්. අරම දූෂ්‍ය වේ. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකළාහ.

"මහණෙනි, එක් පැත්තෙක මූත්‍ර පහකරන්නට අනුදනිමි"යි වදළසේක.

ආරාමය දුගඳ වෙයි. "මහණෙනි, වටන්දෙණ අනුදනිමි"යි වදළසේක.

දුක්සේ හුන්නාහු (දුකසේ හිඳ) මූත්‍ර පහකෙරෙත්.

"මහණෙනි, ප්‍රස්‍රාවපාදුකාව[1] අනුදනිමි"යි වදළසේක. ප්‍රස්‍රාවපාදුකාව ප්‍රකට වෙයි (පිටතට පෙනෙයි). මහණහු එහි හිඳ මූත්‍ර පහකරන්නට ලජ්ජිත වෙත්.

"මහණෙනි, ගඩොළු පවුර ද ගල්පවුර ද, දඬුපවුර ද තුන් පවුරු (බිත්ති තුන) අනුදනිමි"යි වදළසේක.

වටන්දෙණ නො වසන ලද්දේ දුගඳ වෙයි. "මහණෙනි, පියනක් අනුදනිමි"යි වදළසේක.

145. එසමයෙහි මහණහු අරමෙහි ඒ ඒ තැන මල පහ කෙරෙත්. අරම දූෂ්‍ය වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, එක් පසෙක මල පහකරන්නට අනුදනිමි"යි වදළසේක.

අරම දුගඳ වේ. "මහණෙනි, වසුරුවළක් (මල පහකරන්නට වළක්) අනුදනිමි"යි වදළසේක.

වසුරුවළෑ ගැටිය කැඩී වැටෙයි. "මහණෙනි, ගඩොළුබැම්ම, ගල්බැම්ම, ලීබැම්ම යන තුන් බැඳුම් අනුදනිමි" යි වදළසේක.

වසුරුවළ මිටිබිමක් ඇත්තේ වේ. දියෙන් යටකැරේ–දියට යට වේ.

"මහණෙනි, එය උස්බිමක් ඇතියක් කරන්නට (බිම පස් ආදිය අතුරා උසට නංවන්නට) අනුදනිමි"යි වදළසේක.

බැම්ම කැඩී හැලෙයි. "මහණෙනි, ගඩොළු බැම්ම ද ගල් බැම්ම ද දඬුබැම්ම ද යන තුන් බැඳුම් අනුදනිමි"යි වදළසේක.

එයට නඟින්නාහු වෙහෙසෙත්.

---

1. මූත්‍රකටාහය දෙපස පා තබන ආධාරකය.

"අනුජානාමි භික්ඛවෙ, තයො සොපානෙ, ඉට්ඨකාසොපානං සිලාසොපානං දාරුසොපානන්ති".

ආරොහන්තා පරිපතන්ති. "අනුජානාමි භික්ඛවෙ, ආලම්බනබාහන්ති". අන්තෙ නිසින්නා වච්චං කරොන්තා පරිපතන්ති.

"අනුජානාමි භික්ඛවෙ සන්ථරිත්වා මජ්ඣෙ ඡිද්දං කත්වා වච්චං කාතුන්ති".

දුක්ඛං නිසින්නා වච්චං කරොන්ති.

"අනුජානාමි භික්ඛවෙ වච්චපාදුකන්ති".

බහිද්ධා පස්සාවං කරොන්ති.

"අනුජානාමි භික්ඛවෙ පස්සාවදොණිකන්ති".

අවලෙඛනකට්ඨං න හොති.

"අනුජානාමි භික්ඛවෙ අවලෙඛනකට්ඨන්ති".

අවලෙඛනපිඨරො න හොති.

"අනුජානාමි භික්ඛවෙ අවලෙඛනපිඨරන්ති".

වච්චකූපො අපාරුතො දුග්ගන්ධො හොති. "අනුජානාමි භික්ඛවෙ අපිධානන්ති".

අජ්ඣොකාසෙ වච්චං කරොන්තා සීතෙනපි උණ්හෙනපි කිලමන්ති. "අනුජානාමි භික්ඛවෙ වච්චකුටින්ති".

වච්චකුටියා කවාටං න හොති.

"අනුජානාමි භික්ඛවෙ, කවාටං, පිට්ඨිසඞ්ඝාටං[1], උදුක්ඛලිකං, උත්තරපාසකං, අග්ගලවට්ටිං, කපිසීසකං, සූචිකං, ඝටිකං, තාලච්ඡිද්දං, ආවිඤ්ඡනච්ඡිද්දං, ආවිඤ්ඡනරජ්ජුන්ති".

වච්චකුටියා තිණචුණ්ණං පරිපතති.

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං, සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති".

1. පිට්ඨසඞ්ඝාටං - මජසං.

"මහණෙනි, ගඩොළු හිණ ගල්හිණ දඬුහිණ යන තුන් හිණ අනුදනිමි' යි වදළසේක.

එයට නගින්නාහු වැටෙත්. "මහණෙනි, (එල්බැ යන්නට) අත්වැල අනුදනිමි"යි වදළසේක. කෙළවරැ හිඳ මල පහකරනුවෝ වැටෙත්.

"මහණෙනි, ලෑලි ආදියක් අතුරා මැද සිදුරක් කොට මල පහකරන්නට අනුදනිමි"යි වදළසේක.

දුකසේ හුන්නාහු මල පහකෙරෙත්.

"මහණෙනි, වර්චස්පාදුකාව (වළ දෙපස පා තබන ආධාරකය) අනුදනිමි"යි වදළසේක.

වළෙන් පිටත මූත්‍ර පහකෙරෙති.

"මහණෙනි, වටන් දෙණක් අනුදනිමි"යි වදළසේක.

පුසන් දණ්ඩක් නො වෙයි.

"මහණෙනි, පුසන් දණ්ඩ අනුදනිමි"යි වදළසේක.

පුසන්දඬු තබන බඳුනෙක් නො වෙයි.

"මහණෙනි, පුසන් දඬු තබන බඳුනක් අනුදනිමි"යි වදළසේක.

වසුරුවළ නො වසන ලද්දේ දුගඳ වෙයි. "මහණෙනි, පියනක් අනුදනිමි"යි වදළසේක.

එළිමහනෙහි (වටා ආවරණ නැති තන්හි තැනූ වසුරු වළෙහි) මල පහකරන්නාහු ශීතයෙනුත් උෂ්ණයෙනුත් පෙළෙත්. "මහණෙනි, වැසිකිළියක් අනුදනිමි"යි වදළ සේක.

වැසිකිළියට දෙර පොහොරුවෙක් නො වෙයි.

"මහණෙනි, දෙරපොහොරුව ද දෙරබාව ද වටෙවුලිය ද උතුරු ලිය ද දෙරපොල්ල ද අගුළුකණුව ද යතුරුදණ්ඩ ද තරංකය ද කෙසිසිදුර ද රැහැන බහාලන සිදුර ද අදින රැහැන ද අනුදනිමි"යි වදළසේක.

වැසිකිළියෙහි තණරොඩු වැටෙයි.

"මහණෙනි, සන දඬු අතුරා පියස්ස තනා ඇතුළත පිටත බදම ආලිප්ත කරන්නට, සුදුපැහැය කළුපැහැය ගුරුපිරියම මාලා කම් ලතාකම් මුවරදත් සිතියම් (දැහිගුල් ඈ විසින්) පස්වනක් පැහැ කරන්නට ද සිවුරු වනන දණ්ඩ ද සිවුරු වනන රැහැන ද අනුදනිමි"යි වදළසේක.

146. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ජරාදුබ්බලො වච්චං කත්වා වුට්ඨහන්තො පරිපති[1] භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ, ඔලම්බනකන්ති".

වච්චකුටි අපරික්ඛිත්තා හොති.

"අනුජානාමි භික්ඛවෙ, පරික්ඛිපිතුං තයො පාකාරෙ: ඉට්ඨකාපාකාරං සිලාපාකාරං දරුපාකාරන්ති".

කොට්ඨකො න හොති.

"අනුජානාමි භික්ඛවෙ, කොට්ඨකන්ති".

කොට්ඨකො නීචවත්ථුකො හොති -පෙ- අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති. චයො පරිපතති -පෙ- ආරොහන්තා විහඤ්ඤන්ති -පෙ- අනුජානාමි භික්ඛවෙ, තයො සොපානෙති -පෙ- අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති.

කොට්ඨකස්ස කවාටං න හොති.

"අනුජානාමි භික්ඛවෙ, කවාටං පිට්ඨිසඞ්ඝාටං[2] උදුක්ඛලිකං උත්තරපාසකං අග්ගලවට්ටිං කපිසීසකං සූචිකං ඝටිකං තාලච්ඡිද්දං ආවිඤ්ඡනච්ඡිද්දං ආවිඤ්ඡනරජ්ජුන්ති".

කොට්ඨකෙ තිණචුණ්ණං පරිපතති.

"අනුජානාමි භික්ඛවෙ, ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං: සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකන්ති.

පරිවෙණං චික්ඛල්ලං හොති.

"අනුජානාමි භික්ඛවෙ, මරුම්බං උපකිරිතුන්ති".

න පරියාපුණන්ති.

"අනුජානාමි භික්ඛවෙ, පදරසිලං නික්ඛිපිතුන්ති".

උදකං සන්තිට්ඨති.

"අනුජානාමි භික්ඛවෙ, උදකනිද්ධමනන්ති".

ආචමනකුම්භී න හොති.

"අනුජානාමි භික්ඛවෙ, ආචමනකුම්භින්ති".

ආචමනසරාවකො න හොති. "අනුජානාමි භික්ඛවෙ, ආචමනසරාවකන්ති".

දුක්ඛං නිසින්නා ආචමෙන්ති.

"අනුජානාමි භික්ඛවෙ, ආචමනපාදුකන්ති".

1. පරිපතති - මජසං.
2. පිට්ඨසඞ්ඝාටකං - මජසං.

146. එ සමයෙහි එක් මහණෙක් ජරායෙන් අබල වූයේ මල පහකොට නැගී සිටින්නේ ඇදී වැටුණේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, එල්බැගන්නට රැහැනක් අනුදනිමි" යි වදළසේක.

වැසිකිළිය වටින් නො වසන ලද්දයේ වෙයි.

"මහණෙනි, ගඩොළු බිත්තිය ද ගල් බිත්තිය ද දඬු බිත්තිය ද යන තුන් පවුරු අනුදනිමි" යි වදළසේක.

දෙර කොටුවෙක් නො වෙයි.

"මහණෙනි, . දෙරකොටුවක් අනුදනිමි" යි වදළසේක.

කොටුව මිටි බිමක් ඇත්තේ වෙයි ... "මහණෙනි, උස්බිමක් ඇතියක් කරන්නට අනුදනිමි" යි වදළසේක. බැම්ම කැඩී යයි. ... නැඟෙන්නාහු වෙහෙසෙත්. ... "මහණෙනි, සෝපාන තුනක් ... අනුදනිමි" යි වදළසේක. "මහණෙනි, එල්බගන්නට රැහැනක් අනුදනිමි" යි වදළසේක.

දෙර කොටුවට දෙර පළුවෙක් නොවෙයි.

"මහණෙනි, දෙරපළුව ද දෙරබාව ද වටෙවුලිය ද උතුරුලිය ද දෙර පොල්ල ද අගුළුකණුව ද යතුරුදණ්ඩ ද තරංකය ද කෙසිසිදුර ද අදින රැහැන බහන සිදුර ද, අදනා රැහැන ද අනුදනිමි" යි වදළසේක.

දෙරටුවෙහි තණරොඩු වැගිරෙයි.

"මහණෙනි, සන දඬුවලින් පියස්ස තනා ඇතුළත පිටත බදම අලවන්නට ද සුදුපැහැ කළු පැහැ ගුරුපිරියම් මාලාකම් ලතාකම් මෝරුදත් පස්වනක් පැහැය ගන්වන්නට ද අනුදනිමි" යි වදළසේක.

වැසිකිළිය වටා පවුර ඇතුළත වූ බිම මඩ සහිත වේ.

"මහණෙනි, වැලි ඉස වසාලන්නට අනුදනිමි" යි වදළසේක.

වැලි ප්‍රමාණවත් නො වේ.

"මහණෙනි, ගල්පුවරු අතුරන්නට අනුදනිමි" යි වදළසේක.

දිය රැඳී සිටී.

"මහණෙනි, දිය සොරොව්වක් කරන්නට අනුදනිමි" යි වදළසේක.

දෙවුනා ජලය පිණිස බඳුනෙක් නො වෙයි.

"මහණෙනි, මලධොවනයට දිය බඳුනෙක් අනුදනිමි" යි වදළසේක.

දෙවුනා දිය ගන්නට සරාවෙක් නො වෙයි. "මහණෙනි, (මලධොවනයට දිය බඳුනෙන්) දිය ගන්නා සරාවක් අනුදනිමි" යි වදළසේක.

දුක්සෙ හිඳුනාහු මල දෙවිත්.

"මහණෙනි, මල දෝනට හිඳිනු පිණිස පාදුකා අනුදනිමි" යි වදළසේක.

ආචමනපාදුකා පාකටා හොන්ති. භික්ඛූ හිරීයන්ති ආචමෙතුං.

''අනුජානාමි භික්ඛවෙ පරික්ඛිපිතුං තයො පාකාරෙ: ඉට්ඨකාපාකාරං සිලාපාකාරං දරුපාකාරන්ති''.

ආචමනකුම්භී අපාරුතා හොති. තිණචුණ්ණෙහි පි පංසුකෙහි පි ඔකිරීයති.

''අනුජානාමි භික්ඛවෙ අපිධානන්ති''.

147. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ එවරූපං අනාචාරං ආචරන්ති: මාලාවච්ඡං රොපෙන්තිපි රොපාපෙන්තිපි, සිඤ්චන්තිපි සිඤ්චාපෙන්තිපි, ඔචිනන්තිපි ඔචිනාපෙන්තිපි, ගන්ථෙන්තිපි ගන්ථාපෙන්තිපි, එකතො වණ්ටිකමාලං කරොන්තිපි කාරාපෙන්තිපි, උභතොවණ්ටිකමාලං කරොන්තිපි කාරාපෙන්තිපි, මඤ්ජරිකං කරොන්තිපි කාරාපෙන්තිපි, විධූතිකං කරොන්තිපි කාරාපෙන්තිපි, වටංසකං කරොන්තිපි කාරාපෙන්තිපි, ආවෙළකං කරොන්තිපි කාරාපෙන්තිපි, උරච්ඡදං කරොන්තිපි කාරාපෙන්තිපි.

තෙ කුලිත්ථීනං කුලධීතානං කුලකුමාරීනං කුලසුණ්හානං කුලදාසීනං එකතො වණ්ටිකමාලං හරන්තිපි හරාපෙන්තිපි, උභතො වණ්ටිකමාලං හරන්තිපි හාරාපෙන්තිපි, මඤ්ජරිකං හරන්තිපි, හාරාපෙන්තිපි, විධූතිකං හරන්තිපි හාරාපෙන්තිපි, වටංසකං හරන්තිපි හාරාපෙන්තිපි, ආවෙළකං හරන්තිපි හාරාපෙන්තිපි, උරච්ඡදං හරන්තිපි හාරාපෙන්තිපි.

තෙ කුලිත්ථීහි කුලධීතාහි කුලකුමාරීහි කුලසුණ්හාහි කුලදාසීහි සද්ධිං එකභාජනෙපි භුඤ්ජන්ති, එකථාලකෙපි පිවන්ති, එකාසනෙපි නිසීදන්ති, එකමඤ්චෙපි තුවට්ටෙන්ති, එකත්ථරණාපි තුවට්ටෙන්ති, එකපාවුරණාපි තුවට්ටෙන්ති, එකත්ථරණපාවුරණාපි තුවට්ටෙන්ති, විකාලෙපි භුඤ්ජන්ති, මජ්ජම්පි පිවන්ති, මාලාගන්ධවිලෙපනම්පි ධාරෙන්ති, නච්චන්තිපි ගායන්තිපි වාදෙන්තිපි ලාසෙන්තිපි, නච්චන්තියාපි නච්චන්ති, නච්චන්තියාපි ගායන්ති, නච්චන්තියාපි වාදෙන්ති, නච්චන්තියාපි ලාසෙන්ති, ගායන්තියාපි නච්චන්ති ... ගායන්ති ... ලාසෙන්ති වාදෙන්තියාපි නච්චන්ති ... ගායන්ති ... වාදෙන්ති ... ලාසෙන්ති, ලාසෙන්තියාපි නච්චන්ති, ලාසෙන්තියාපි ගායන්ති, ලාසෙන්තියාපි වාදෙන්ති, ලාසෙන්තියාපි ලාසෙන්ති. අට්ඨපදෙපි කීළන්ති, දසපදෙපි කීළන්ති, ආකාසෙපි කීළන්ති, පරිහාරපථෙපි කීළන්ති,

ආචමනපාදුකාවෝ (මලදෙවනට හිඳිනා පාදුකාවෝ) පිටතට පෙනෙත්, මහණහු මලදෝනට ලජ්ජිත වෙත්.

"මහණෙනි, ගඩොළුපවුර ද ගල්පවුර ද දඬුපවුර ද යන තුන් පවුරු වටා ලන්නට අනුදනිමි".

මලදෝනා දිය තබන සැළ නො වැසුණේ වේ. තණ රොඩු-යෙන් ද දූවිලියෙන් ද එය වැසෙයි.

"මහණෙනි, පියනක් අනුදනිමි" යි වදාළසේක.

147. එ සමයෙහි සවැගි මහණහු මෙසේ වූ අනාචාර කරත්: මල් පැල සිටුවත්, සිටුවවත්. ඒවාට දිය ඉසිත්, දිය ඉස්වත්. මල්කඩත්, කඩවත්. මල්දම් ගොතත්, ගොතවත්. එක් පසකට නටුව ඇතිසේ මල්දම් තනත්, තනවත්. දෙපසට නටු සිටිනා සේ වූ මල්දම් ද තනත් තනවත්, මල්කැන් ද කරත්, කරවත්. හිද්දෙක අමුනා තනන මල්දම් ද කරත්, කරවත්. කනමතැ පලඳනා මල්දම් ද තනත්, තනවත්. හිසෙහි පලඳනා මල්දම් ද තනත්, තනවත්. මල්හර ද කරත්, කරවත්.

කුලවමියනට කුල දූනට කුල කුමරියනට කුල යෙහෙළියනට කුල-දසීනට එක් පසකට නටු සිටුනා සේ තැනූ මල්දම් ගෙනයත්, යවත්. දෙපසට නටු ඇති මල්දම් ද ගෙන යත්, යවත්. මල් කැන් ද ගෙන යත්, යවත්. හිද්දෙන් අමුනා කළ මල් දම් ගෙනයත්, යවත්. කන මතැ පලඳනා මල්දම් ද ගෙනයත් යවත්, මුදුන් මල් කඩ ද ගෙනයත්, යවත් මල්හර ද ගෙනයත්, යවත්.

කුලවමියන් හා කුලදූන් හා කුල කුමරියන් හා කුලයෙහෙළියන් හා කුලදසීන් හා එක් බඳුනෙහි වැළඳීම ද කරත්, එක් මලාවෙන් දිය පීම ද කෙරෙත්, එක් අස්නෙහි හිඳීම ද කරත්, එක් ඇඳෙහි නිදීම ද කරත්, එක් ඇතිරියක් ඇත්තෝ ව ද නිදත්, එක් පොරෝනාවක් ඇත්තෝ ව ද නිදත්, එක් ඇතිරියක් එක් පොරෝනාවක් ඇත්තාහු ද නිදත්. විකාලයේ ද බොජුන් වළඳත්, මත්පැන් ද බොත්, මල් ගඳ විලෙවුන් දැරීම ද කරත්, නැටීම ද කරත්, ගැයීම ද කරත්, වැයීම ද කරත්, ලාස්‍ය නැටීම ද කරත්, නටන්නියට ද නටත්, නටන්නියට ද ගයත්, නටන්නියට ද වයත්, නටන්නියට ද ලාස්‍ය නැටීම කරත්, ගයන්නියට ද නටත්, ගයන්නියට ද ගයත්, ගයන්නියට ද වයත්, ගයන්නියට ද ලාස්‍ය නෘත්‍යය කරත්, වයන්නියට ද නටත්, වයන්නියට ද ගයත්, වයන්නියට ද වයත්, ලාස්‍ය නෘත්‍යය කරන්නියට ද ලාස්‍ය නෘත්‍යය කරත්, නටත් ... ගයත් .. වයත්, අට පා පුවරුවෙහි ද දූ කෙළිත්, දසපාපුවරුවෙහි ද දූ කෙළිත්, ආකාශයෙහි (දූ පුවරු සිතින් සිතා ගෙන) ද දූ කෙළිත්, කව්වී පැනුම් ක්‍රීඩාව ද කරත්,

සන්තිකායපි කීළන්ති, ඛලිකායපි කීළන්ති, ඝටිකායපි කීළන්ති, සලාකහත්ථෙනපි කීළන්ති, අක්ඛෙනපි කීළන්ති, පඞ්ගචීරෙනපි කීළන්ති, වඞ්කකෙනපි කීළන්ති, මොක්ඛචිකායපි කීළන්ති, චිඞ්ගුලකෙනපි කීළන්ති, පත්තාළ්හකෙනපි කීළන්ති, රථකෙනපි කීළන්ති, ධනුකෙනපි කීළන්ති, අක්ඛරිකායපි කීළන්ති, මනෙසිකායපි කීළන්ති, යථාවජ්ජෙනපි කීළන්ති, හත්ථිස්මිම්පි සික්ඛන්ති, අස්සස්මිම්පි සික්ඛන්ති, රථස්මිම්පි සික්ඛන්ති, ධනුස්මිම්පි සික්ඛන්ති, ථරුස්මිම්පි සික්ඛන්ති, හත්ථිස්සපි පුරතො ධාවන්ති, අස්සස්සපි පුරතො ධාවන්ති, රථස්සපි පුරතො ධාවන්ති. ධාවන්තිපි ආධාවන්තිපි, උස්සොළ්හෙන්තිපි[1], අප්ඵොටෙන්තිපි, නිබ්බුජ්ඣන්තිපි මුට්ඨීහිපි යුජ්ඣන්ති, රඞ්ගමජ්ඣෙපි සංඝාටිං පත්ථරිත්වා නච්චන්තිං[2] එවං වදෙන්ති 'ඉධ භගිනි නච්චස්සූ'ති නලාටිකම්පි දෙන්ති, විවිධම්පි අනාචාරං ආචරන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "න භික්ඛවෙ විවිධං අනාචාරං ආචරිතබ්බං. යො ආචරෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො"ති.

148. තෙන ඛො පන සමයෙන ආයස්මතො උරුවෙලකස්සපස්ස පබ්බජිතෙ සඞ්ඝස්ස බහුං ලොහභණ්ඩං දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං උප්පන්නං හොති. අථ ඛො භික්ඛූනං එතදහොසි "කිං නු ඛො භගවතා ලොහභණ්ඩං අනුඤ්ඤාතං කිං අනනුඤ්ඤාතං, කිං දාරුභණ්ඩං අනුඤ්ඤාතං, කිං අනනුඤ්ඤාතං, කිං මත්තිකාභණ්ඩං අනුඤ්ඤාතං, කිං අනනුඤ්ඤාතන්ති".

භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

"අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා පහරණිං සබ්බං ලොහභණ්ඩං, ඨපෙත්වා ආසන්දිං පල්ලඞ්කං දාරුපත්තං දාරුපාදුකං සබ්බං දාරුභණ්ඩං, ඨපෙත්වා කතකං ච කුම්භකාරිකඤ්ච සබ්බං මත්තිකාභණ්ඩන්ති".

ඛුද්දකවත්ථුක්ඛන්ධකං පඤ්චමං.[3]

1. උස්සොළෙහන්තිපි - මජසං.
2. නච්චකිං - මජසං.
3. ඛුද්දකවත්ථුක්ඛන්ධකො පඤ්චමො - මජසං.

සත්තිකායෙන් ද කෙළිත්, බලිකායෙන් ද කෙළිත්, සටිකායෙන් ද කෙළිත්, ශලාකහස්ත ක්‍රීඩායෙන් ද කෙළිත්, ගුඩයෙන් (පත්දුවෙන්) ද කෙළිත්, කොළනලා පිඹීමෙන් ද කෙළිත්, කුඩානගුලෙන් ද කෙළිත්, කරනම් පැනීමෙන් ද කෙළිත්, (වාතයෙන් භ්‍රමණය වන) හුළං පතින් ද කෙළිත්, කොළනැළියෙන් මිනීමෙන් ද ... කුඩාරියෙන් ද ... කුඩාදූත්තෙන් ද ... අහසැ අකුරු ඇඳ කියැවීමෙන් ද ... සිතූ දැ කීමෙන් ද ... අංගවිකලයන් සේ ඉරියව් පැවැත්වීමෙන් ද කෙළිත්, හස්තිශිල්පයෙහි ද පුහුණු වෙත්, අශ්වශිල්පයෙහි ද ... රථශිල්පයෙහි ද ... ධනුශ්ශිල්පයෙහි ද ... කඩුසිප්හි ද පුහුණු වෙත්, ඇතුට පෙරටු ව ද දිවෙත්, අසුට පෙරටු ව ද ... රියට පෙරටු ව ද දුවත්, ඉදිරියට ද ආපසු ද දුවත්. සීරුසත් දීම ද ... අත්පොළසත් දීම ද ... මල්ල පොර බැදීම ද ... මිටුයෙන් පහර දීම ද කරත්, නැටුම් පොළෙහි සඟළ සිවුර එළා නටන්නියට "නැඟණියනි, මෙහි නටන්නැ" යි ද කියත්. සිය නලළැ ඇඟිල්ල තබා නටන්නිය ගේ නලළැ ද ඇඟිල්ල තබත්. නානාවිධ අනාචාර කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. ... "මහණෙනි, නානාවිධ අනාචාර නො කළයුතු. යමෙක් කරන්නේ වී නම් විනයදහම්හි වූ පරිදි පිළියම් කැරැවියයුතු යැ" යි වදාළසේක.

148. එ සමයෙහි ආයුෂ්මත් උරුවෙල් කසුප් තෙරුන් පැවිදි වූ කල්හි සඞ්ඝයාට බොහෝ ලොහොමුවා බඩු ද දඬුමුවා බඩු ද මැටිමුවා බඩු ද උපන්නේ වෙයි. කවර නම් ලොහො බඩුවෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද්දේ ද? කවරෙක් නො අනුදන්නා ලද්දේ ද? කවර දඬුමුවා බඩුවෙක් අනුදන්නා ලද්දේ ද? කවර බඩුවෙක් නො අනුදන්නා ලද්දේ ද? කවර නම් මැටි බඩුවෙක් අනුදන්නා ලද්දේ ද? කවර බඩුවෙක් නො අනුදන්නා ලද්දේ ද" යි භික්ෂූනට මේ සිත විය.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි, මෙ කරුණෙහි දැහැමි කතා කොට භික්ෂූන් අමතා මෙසේ වදාළසේක.

"ආයුධ හැර, සියලු ලොහොබඩු ද, දික්සඟළා පුටුවත් ව්‍යාඝ්‍රරූපාදිය ඇති පුටුවත් ලීයෙන් කළ පාත්‍රයත් ලීයෙන් කළ මරවැඩිත් හැර සියලු ලිමුවා බඩු ද, පියුම් කෙමියක් මෙන් උඩට නෙරා සිටුනා සේ කළ මැටි පාපිස්නාව ද සියල්ල මැටියෙන් කළ කුටිය ද හැර සෙසු සියලු මැටි බඩු ද අනුදැනිමි" (යි වදාළ සේක).

**පස්වනු ඛුද්දකවත්ථුක්ඛන්ධක යි.**

තස්සුද්දානං :

1. රුක්ඛෙ ථම්භෙ ච කුට්ටෙ ච අට්ටානෙ ගන්ධබ්බහත්ථියා
විග්ගය්හ මල්ලකො කච්ඡු ජරා ච පුථුපාණිකා.

2. වල්ලිකාපි ච පාමඞ්ගං කණ්ඨසුත්තං න ධාරයෙ
කටි ඔවට්ටි කෙයූරං හත්ථාභරණ මුද්දිකා.

3. දිඝෙ කොච්ඡෙ ඵණෙ හත්ථෙ සිත්ථා උදකතෙලකෙ
ආදාසුද පත්තවණ්ණා ආලෙප මද්ද චුණ්ණනා

4. ලඤ්ජන්ති අඞ්ගරාගඤ්ච මුඛරාගං තදූභයං
චක්ඛුරොගං ගිරග්ගඤ්ච ආයතං සරබාහිරං

5. අම්බපෙසි සකලෙහි අහි ඡින්දි ච චන්දනං
උච්චාවචා පත්තමූලං සුවණ්ණො බහලා වලී

6. චිත්‍රා දුස්සන්ති දුග්ගන්ධා උණ්හ භිජ්ජිංසු මිඩ්ඪියා
පරිභණ්ඩං තිණං චොළං මාලං කණ්ඩාලිකාය ච
ථවිකඤ්ච අංසබද්ධකං තථා බන්ධනසුත්තකා

7. ඛීලෙ මඤ්චෙ ච පීඨෙ ච අංකෙ ජන්තා පණ්ණමනා
තුම්බකටී ඡවසීසං චලකානි පටිග්ගහො.

8. විප්ඵාලි දණ්ඩ සොවණ්ණං පත්ත පෙසි ච නාළිකා
කිණ්ණං සත්තු සරිතඤ්ච මධුසිත්ථං සිපාටිකං.

මේ එහි උද්දානය යැ:

1. රුකෙහි කය ඉලීම, වැඹෙහි කය ඉලීම, බිත්තියෙහි කය ඉලීම, නො තන්හි නෑම, දුවමුවා අතින් සිරුර ඉලීම, කිරිදි හුයින් ඇඟ ඉලීම, උනුන් සිරුර ගටා පිරියම් කැරවීම, මල්ලකයෙන් සිරුර ඉලීම, කැසීම් රොගයට මල්ලකය අනුදැනීම, ජරායෙන් පෙළුණාහට උක්කාසිකාව අනුදැනීම, පුථුපාණිකාව අනුදැනීම,

2. මුතුවැල් ආදිය ද, පමුව ද ගෙල පලඳනා ද, ඉඟපලඳනා ද, වලලු ද, අඟුපලඳනා ද හස්තාභරණ ද මුදු ද නො දැරිය යුතු ය යන්න ද,

3. දික් කෙස් දැරීම ද, කොස්සෙන්, පනායෙන් අත්පනායෙන්, ඉටිතෙලින්, දියමුසු තෙලින් කෙස් පිරීම, කැටපතෙහි ද දිය බඳුනෙහි ද මුහුණ බැලීම, මුඛයේ වණයක් ඇති කල්හි කැටපත් ඈති මූණ බැලීම, මුහුණු අලෙවූ දීම, මුව පිරිමැදීම, මුවැ චත්සුණු තැවැරීම, යන කරුණු ද,

4. මහණහු මුවැ සලකුණු තබත්, ඇඟැ පැහැ ගැල්වීම, මුහුණු පැහැ ගැල්වීම ද ඒ දෙක ම ද කරත්. ඇසැ රොගයට මුඛාලෙපය අනුදැනීම, ගිරග්ගසමජ්ජය දක්නට යෑම, ආයතක ස්වරයෙන් බණ කීම, ස්වරභාණ්‍යය, පිටතට ලොම් සිවුනා සේ කළ පොරොනා දැරීම යන කරුණු ද,

5. රජුගේ උයනෙහි අඹ වැළඳීම, සූපයෙහි ලූ අඹපෙති වැළඳීම, දයකයන් සියලු අඹ අතින් ගෙන බොජුන් හලැ හැසිරීම, සපුනට මෙත් වැඩීම, අභද සිඳීම, හඳුන් පා පිළිබඳ වත, කුදුමහත් පාත්‍ර දැරීම, පාත්‍රමූලය පිළිබඳ පැනැවීම, රන්මුවා ඈ පාමඩුලු දැරීම, පාමඩුලු හැකිලීම යන කරුණු ද,

6. විසිතුරු පාමඩුලු දැරීම, දිය සහිත පාත්‍ර දුෂ්‍ය වේ යන්න, පාත්‍ර දුගඳ වීම, පාත්‍ර උෂ්ණයෙහි තැබීම, සුළිහුළඟින් පාත්‍ර බිඳී ගියේ ය යන්න, පිල් කෙළවර පාත්‍රා තැබීම, පටු පිල් කෙළවර පාත්‍ර තැබීම, පාත්‍ර සඳහා තණ ඇතිරිය, රෙදි ඇතිරිය, පාත්‍රමාලකය, පාත්‍ර කණේඩාලිකාව හා පාත්‍ර ථවිකය, අංසබන්ධකය, පාත්‍ර බඳනා හුය යන මෙතෙක් දෑ ද,

7. බිතුහුලෙහි පාත්‍රය ලැග්වීම, ඇඳෙහි ද පුටුවෙහි ද ඇකයෙහි ද ඡත්‍රයෙහි ද පාත්‍රය තැබීම, පාත්‍රය අතැති ව කවුළුව ඇරීම, ලබුකබල් ද කළගෙඩි ද පාත්‍ර වශයෙන් දැරීම, මිනී හිස් පාත්‍ර දැරීම සපා ඉවත් කළ දෑ පාත්‍රයෙන් ගෙන යෑම, පඩික්කම අනුදැනීම යන කරුණු ද,

8. අතින් සිවුරු ඉරා මැහීම, පිහිය රන්මුවා පිහියා මිටි ආදිය, කුකුළු පිහාටුයෙන් මැහීම, උණ පතුරෙන් මැහීම, හිදි කටු ගුලාව, රාබිජ්ජුණු, පිටිකුඩු ගල්කුඩු, මීඉටි, මීඉටි ගැල්වූ රෙදිකඩ යන කරුණු ද,

9. විකිණ්ණං බන්ධි විසමං ජමා පීර පහොති ච
කලිම්බං මොඝසුත්තඤ්ච අධොතල්ලං උපාහනා

10. අඞ්ගුලි පටිග්ගහඤ්ච විත්ථකං අංසබන්ධකා
අජ්ඣොකාසෙ නීචවත්ථු චයො චාපි විහඤ්ඤරෙ.

11. පරිපතති තිණචුණ්ණං උල්ලිත්තාවලිත්තකං
සෙතං කාළකවණ්ණඤ්ච පරිකම්මඤ්ච ගෙරුකං

12. මාලාකම්මං ලතාකම්මං මකරදන්තක පටිකා
චීවරවංසං රජ්ජුඤ්ච අනුඤ්ඤාසි විනායකො

13. උජ්ඣිත්වා පක්කමන්ති ඛජ්ජති පරිභිජ්ජති.
විනිවෙධියති කුඩ්ඩපි පත්තෙනාදය ගච්ඡරෙ

14. ථවිකා බන්ධනසුත්තඤ්ච බන්ධිත්වා ච උපාහනා
උපාහනත්ථවිකඤ්ච අංසබන්ධන සුත්තකං

15. උදකාකප්පියං මග්ගෙ පරිස්සාවනචොළකං
ධම්මකරකං ද්වෙ භික්ඛූ වෙසාලිං අගමා මුනි

16. දණ්ඩං ඔත්ථරකං තත්ථ අනුඤ්ඤාසි පරිස්සාවනං
මකසෙහි පණීතෙන බව්හාබාධා ච ජීවකො

17. චඞ්කමනං ජන්තාඝරං විසමෙ නීචවත්ථුකා
තයො චයෙ විහඤ්ඤන්ති සොපාණාලම්බ වෙදිකං

18. අජ්ඣොකාසෙ තිණචුණ්ණං උල්ලිත්තාවලිත්තකං
සෙතකං කාළවණ්ණඤ්ච පරිකම්මඤ්ච ගෙරුකං

19. මාලාකම්මං ලතාකම්මං මකරදන්තකපටිකං
වංසං චීවරරජ්ජුඤ්ච උච්චං ච වත්ථුකං කරෙ

9. කොන් සම නැති සිවුරු, උල් සිටුවා සිවුරු බැඳීම, විසම තැන කඨිනය තැබීම, කඨිනය බිම තැබීම, කඨිනයේ කොන දිරීම, කඨිනය ප්‍රමාණවත් නොවෙයි ද එය, කලිම්බක (ලාපත) ය, බොරු හුය, නොසේදූ පයින් කඨිනය ඇක්මීම, තෙත් පයින් කඨිනය ඇක්මීම, මරවැඩි සහිත පයින් කඨිනය ඇක්මීම, යන කරුණු ද,

10. සිවුරු මැහීමේ දී ඇඟිල්ලෙන් හිදිකටුව ඇදීම, දිදලය අනුදැනීම, චිත්‍රකය (හෙප්පුව) අනුදැනීම, අංසබන්ධකය අනුදැනීම, එළිමහනෙහි සිවුරු මැහීම, කඨිනශාලාව පිහිටි බිම පහත් බව, බැම්මෙන් බිම උස් කිරීම, උස්බිමට නගින්නාහු පෙළෙත්,

11. උස්බිමට නගින්නාහු වැටෙත් (මේවා පිළිබඳ කළ අනු-දැනුම්), කෙළින්හලැ තණ සුණු වැටීම, පියස්සැ උඩ යට බදම ආලෙප කිරීම, එහි සුදු පැහැ කළු පැහැ ගුරු පිරියම් ද කිරීම යන කරුණු ද,

12. එහි මාලාකම් ලතාකම් මකරදන්තක පංචපටිකා සිතුවම් කිරීම ද, සිවුරු වනන උන දංඩ ද සිවුරු වනන ලනුව ද යන මෙ හැම බුදුරජුහු අනුදත්හ.

13. කඨිනය නොසැලකිලියේ දමා යත්, එයින් කඨිනය වේ ආදීන් විසින් කනු ලබයි, කැඩීබිඳී යෙයි. කඨිනය ලිහෙයි, කඨිනය බිත්තියෙහි ද නංවා යෙත්. හිදිකටු ආදිය පාත්‍රයෙන් ගෙන යත්.

14. ථවිකාවක් ද බඳනා හුයක් ද අනුදත්හ. මරවැඩි කාබ-හතින් බැඳ ගෙනයත්. උපාහනත්ථවිකාව ද අංශයෙහි බඳනා හුය ද අනුදත්හ.

15. මාර්ගයේ දී අකැප දිය ලැබේ, පෙරහන් කඩ ද ධබරාව ද අනුදත්හ. දික්මඟ පිළිපන් භික්ෂූහු දෙදෙනෙකි. (ඔවුන්ගේ පුවත ය). බුදුරජුහු විසල් පුර වැඩියාහ.

16. එහි දී දඬුපෙරහන ද ළිඳ තුළ ඔබා දිය පෙරන පෙරහන ද අනුදත්හ. මහණහු මදුරුවන් ගෙන් පෙළෙණාහ. (සිවුරු කිළිය අනුදත්හ) ප්‍රණීත භොජන හෙතුයෙන් මහණහු ගිලන් වූහ. ජීවක තෙම ආයාචනයක් කෙළේ ය.

17. සක්මන්මළුව ද ගිනිහල් ගෙය ද අනුදත්හ. විසම සක්මන්මළුවෙහි සක්මන් කරත්. සක්මන්මළුව මිටි බිමෙක වෙයි. බැඳුම් තුනක් අනුදත්හ. එයට නගින්නාහු වෙහෙසෙත්. පඩිපෙළ ද අත්වැල ද සක්මන්පිළ ද අනුදත්හ.

18. මහණහු එළිමහනැ සක්මන් කරත්. සක්මන්හලැ තණ රොඩු වැටෙයි. පියස්ස ඇතුළතින් පිටතින් බදම ආලෙප කිරීම අනුදත්හ. එය සුදුපැහැ කළුපැහැ ද කරන්නට ද ගුරු පිරියම් කරන්නට ද අනුදත්හ.

19. එහි මල්කම් ලියකම් මුවරදත් පස්වනින් පැහැපත් කිරීම යන මෙය අනුදත්හ. සිවුරු වනන වස්දංඩ ද රැහැන ද අනුදත්හ. ගිනිහල්ගෙහි බිම උස් කරන්නේ ය.

20. තයො සොපාණ බාහඤ්ච කවාටං පිට්ඨසඞ්ඝාටං
උදුක්ඛලුත්තරපාසකං වට්ටිඤ්ච කපිසීසකං

21. සූචි ඝටි තාලච්ඡිද්දං ආවිඤ්ඡනඤ්ච රජ්ජුකං
මණ්ඩලං ධූමනෙත්තඤ්ච මජ්ඣෙ ච මුඛමත්තිකං

22. මත්තිකාදොණි දුග්ගන්ධො ඩහති උදකාධානං
සරාවකං ච සෙදෙති චික්ඛල්ලං ධොවි නිද්ධමනං

23. පීඨඤ්ච කොට්ඨකෙ කම්මං මරුම්බසිලා නිද්ධමනං
නග්ගා ඡමායං වස්සන්තො පටිච්ඡාදි තයො තහිං

24. උදපානං ලුජ්ජති ච වල්ලියා කායබන්ධනං
තුලං කරකටකං චක්කං බහූ භිජ්ජන්ති භාජනා

25. ලොහදරු චම්මඛණ්ඩං සාලා තිණං පිධාති ච
දොණිං චන්දනි පාකාරං චික්ඛල්ලං නිද්ධමනෙන ච

26. සීතිගතං පොක්ඛරණිං පූරාණඤ්ච නිල්ලෙඛනං
චාතුමාසං සයන්ති ච නමතකඤ්ච නාධිට්ඨහෙ

27. ආසිත්තකං මළොරිකං භුඤ්ජනෙකං තුවට්ටිසුං
චඩ්ඩො බොධි න අක්කමි ඝටං කතකං සම්මජ්ජනි

20. තුන් පඩිපෙලවල් ද අත්වැල ද දොර ද දොර බාව ද මුසලපාසය ද උත්තරපාසය ද දොරපොල්ල ද අගුළුකණුව ද අනුදත්හ.

21. යතුරුලිය ද තරංකය ද කෙසිසිදුර ද අදනා රැහැන් ආදිය ද අනුදත්හ. මංඩලිකාව (කයියෝරුව) ද දුම් සිදුර ද ගිනිහල මැද උදුන ද මුහුණු තවරනා මැටි ද අනුදත්හ.

22. මැටි ඔරුව අනුදත්හ. මැටි දුගඳ වෙයි. සිරුර දැවෙයි. දිය බඳුනක් ද මලාවක් ද අනුදත්හ. පියස්ස විසිරෙයි. ගිනිහල මඩ සහිත වෙයි. සෝද හැරීම ද මොහොල (කානුවක්) තැනීම ද අනුදත්හ.

• 23. ගිනිහල් පුටුව ද දොරටුව ද එහි බිම උස් කිරීම් ඈ කටයුතු ද අවට බිමැ වැලි ඉසීම ද, මොහොලක් තැනීම ද අනුදත්හ. මහණහු නග්න ව වන්‍දනාදිය කරත්. (එය නොකළ යුතු යි වදළාහ.) ගිනිහලෙහි බිමැ සිවුරු තබත්. වයින කල සිවුරු තෙමෙයි. ගිනිහලෙහි ප්‍රතිච්ඡාදන තුනක් අනුදත්හ.

24. ළිඳක් අනුදත්හ, එය කැඩී යයි (එයට තුන් බැඳුම් අනුදත්හ.) වැලෙන් දිය බාත්, කාබහන ද එහි යොදත්. තුලා කරකටක චක්‍රවර්ත යන තුන අනුදත්හ. බොහෝ බඳුන් බිඳේ.

25. ලොහො කළය, ලී කළය, සම් පසුම්බිය අනුදත්හ. ළින් හල අනුදත්හ. එහි තණරොඩු වැටෙයි, පියනක් අනුදත්හ. දිය බහාලන ඔරුවක් ද නාන තැන වළක් ද වටා පවුරක් ද අනුදත්හ. එය මඩ සහිත වෙයි. කානුවෙන් දිය යවන්නට අනුදත්හ.

26. නාන්නහුගේ කය ශීතවත් වෙයි. (දිය පිසිනා රෙදිකඩ අනුදත්හ). පොකුණ අනුදත්හ. පොකුණැ දිය පරණ වෙයි. (දියනික්මවන ඇලක් ද කානුවක් ද අනුදත්හ. පියස්ස සහිත ගිනිහල අනුදත්හ. සිවුමසක් හිඳිනා කඩෙන් තොර ව හිඳිත්. (එය නොකටයුතු යැ යි වදළහ). මහණහු මල්යහන්හි වැදහෙත් (එය නොකටයුතු යි වදළාහ). නමතකය ඉටියයුතු නො වේ යැ යි ද වදළාහ.

27. ආසිත්තකය (තඹෙන් හෝ රිදියෙන් කළ පෙට්ටියක් වැනි බඳුන) පරිභොග කරත්. එය නොකටයුතු යැ යි වදළහ. පාත්‍රාධාරකය අනුදත්හ. සවැගියෝ එක් බඳුනෙන් වළඳත්, එක් හැඳෙහි වැදහෙත්. වඩස ලිච්ඡවීහු ගේ පුවත ද බොධි රාජකුමාරයා ගේ පුවත ද එයි. බුදුරජහු පාවාඩය නො ඇක්මියහ. කිරිගරුඩ කළය ද මැටිමුවා පාපිස්නාව ද මුස්නක් ද (විශාඛා) පිළිගැන්නුවා ය.

28. සක්ඛරං කථලඤ්චෙව ඵෙණකං පාදඝංසනිං
විධූපනං තාලවණ්ටං මකසං චාපි චාමරිං

29. ඡත්තං විනා ච ආරාමෙ තයො සික්කාය සම්මුති
රොම සිණ්ඩා නඛා දීඝා ඡින්නන්තඞ්ගුලිකා දුක්ඛා

30. සලොහිතං පමාණඤ්ච වීසති දීඝකෙසතා
ඛුරං සීලං සිපාටිකං නමතකං ඛුරභණ්ඩකං

31. මස්සුං කප්පෙන්ති වඩ්ඪෙන්ති ගොලොමි චතුරස්සකං
පරිමුඛං අඩ්ඪුරකඤ්ච දාඨි සම්බාධසංහරෙ

32. ආබාධා කත්තරි වණො දීඝං සක්ඛරිකාය
පලිතං ථකිතං උච්චා ලොහභණ්ඩඤ්ජනී වයා

33. පල්ලත්ථිකං ච ආයොගො වටං සලාකබන්ධනං
කලාබුකං දෙඩ්ඩුභකං මුරජං මද්දවීණකං

34. පට්ටිකං සූකරන්තඤ්ච දසා මුරජ වෙණිකා
අනන්තා සොභං ගණ්ඩඤ්චෙව පවනන්තොපි ජීරති

35. වීයෙ ගණ්ඨි ච පාසකං[1] ඵලකන්තඤ්ච ඔගහෙ
ගිහීනිවත්ථං හත්ථිසොණ්ඩං මච්ඡකං චතුකණ්ණකං

1. ගණ්ඨිකං උච්චාවචං ච - සී. මු.

28. ගල්කැටින් කළ පාපිස්නාව ද කැබිලිත්තියෙන් කළ පාපිස්නාව ද මුහුදුපෙණින් කළ පාපිස්නාව ද විජිනිපත ද තල්වැට ද මදුරුවිජිනිපත ද අනුදත්හ. සෙමෙර වල්විදුනාව නො අනුදත්හ.

29. මහණකුහට කුඩයක් නැතිව පහසු නො වේ. ආරාමයෙහි කුඩය දැරීමට අනුදත්හ. දණ්ඩසික්කාව පිළිබඳ පැනැවීම ද දණ්ඩසම්මතිය ද සික්කා සම්මතිය ද යන තුන ද වේ. ආහාර වැමැරීම ද බොජුන් හලැ බත්හුලු විසුරුවීම ද දික් නිය දැරීම ද පැනැවීම් වේ. නිය සිඳීමේ දී ඇඟිලි පෙළේ. එය පිළිබඳ ව ද සිකපද පැනැවූහ.

30. ලේ සහිත කොට නිය සිඳීම පිළිබඳ පැනවීම, මාංස-ප්‍රමාණයෙන් නිය සිඳින්නට අනුදැනීම, විසිනිය මට්ටම් කිරීම පිළිබඳ පැනවීම, දික් කෙස් ඇති බව ඇරැබ පැනවීම, දැළි පිහිය ද පිහියා මදින ගල ද පිහියා කොපුව පිහියා මදින සම ද සියලු කරබඩු ද අනුදැන්ම,

31. රවුළු කපවත්, රවුළු වඩත්, හනුවෙහි රවුළ ඉතිරි කිරීම, කොන්සතරක් සිටුනා සේ රවුළු කැපීම, පපුවෙහි ලොම් කැප්වීම, බඩෙහි රොමරාජිය තැබවීම, උඩුරවුළ තැබීම පිළිබඳ සිකපද පැනැවිණ. සම්බාධස්ථානයන්හි ලොම් ඉවත් කිරීමෙහි ද සිකපද පැනවිණ.

32. ආබාධප්‍රත්‍යයයෙන් ලොම් හැරැවීම, කතුරෙන් කෙස් සිඳුවීම, හිසෙහි වණයක් පිළිබඳ වත. දික් නැහැලොම් දැරීම, ගල්කැටින් නැහැලොම් ගැලවීම, පැසුණු කෙස් ගැලවීම, කන් කාඳුරුයෙන් වැසීයෑම, කුඩුමහත් කන්හැඳි දැරීම, ලොහොබඩු රැස්කිරීම, අඳුන්නලාදිය දැරීම, (පිළිබඳ ප්‍රඥප්තීහු වෙත්).

33. සංඝාටිපල්ලත්ථිකාව ද ආයොග පට, වටලීය නඩාව පිළිබඳ පැනැවීම් ද කාබහන දැරීම රැහැන් ඇති කාබහන, දියබරණ හිස වැනි මල ඇති කාබහන, මිහිඟු බෙර වැටි බඳු කාබහන, හවඩියත් වැනි කාබහන යන මේවා පිළිබඳ පැනවීම් ද ඇත.

34. හැඳ පට රටා පටිය, හූරු අතුනු බඳු පටිය දහවලු දිරීම, දහවලු මිහිඟුබෙරවැටි සේ වෙළු පටිය, හවඩිය බඳු පටිය, කාබහන කෙළවර දිරීම, මුවවිට වෙළා ගෙතීම, මිහිඟුබෙර වැටි සේ විවීම පිළිබඳ ද සික පැනැවූහ. දහවලු කෙළවර ද දිරයි. (එය පිළිබඳ පැනවීම් ද ඇත.)

35. පටි ඇට ද ගණ්ඨිය ද පාසකය ද පිළිබඳ සික පැනවූහ. ගණ්ඨියට අලවන රෙදි කැබල්ල සිවුර කෙළවරැ යොදන්නේ ය. ගිහියන් මෙන් සිවුරු හැඳීම, හත්ථිසොණ්ඩක මච්ඡවාළක චතුකණ්ණක යන ගිහිනිවාසන නො කළයුතු බව වදළහ.

36. තාලවණ්ටං සතවල්ලිං සාවෙල්ලිං ගිහිපාරුතං
උභතොකාජං[1] න හරෙය්‍ය දන්තකට්ඨං ආකොටනං

37. කණ්ඨෙ විලග්ගං දයඤ්ච පටග්ගි රුක්ඛ හත්ථිනා
යමෙළු ලොකායතකං පරියාපුණිංසු වාචයුං

38. තිරච්ඡවිජ්ජා වාචනා[2] ඛිපි මඞ්ගල ලසුණං ච[3]
වාතාබාධො දුස්සති ච දුග්ගන්ධො දුක්ඛපාදුකා

39. හිරීයන්ති අපාරු[4] දුග්ගන්ධො තහං තහං කරොන්ති ච
දුග්ගන්ධො කූපං ලුජ්ජති උච්චවත්ථු චයෙපි[5] ච

40. සොපාණාලම්බණ බාහා අනොත දුක්ඛඤ්ච පාදුකා
බහිද්ධා දෙණී කට්ඨඤ්ච පිඨරො ච අපාරුතො

41. වච්චකුටී කවාටඤ්ච පිට්ඨිසඞ්ඝාටමෙව ච
උදුක්ඛලුත්තරපාසො වට්ටිං ච කපිසීසකං

42. සූචි ඝටී තාලච්ඡිද්දං ආවිඤ්ඡනච්ඡිද්දමෙව ච
රජ්ජුං උල්ලිත්තාවලිත්තං සෙතවණ්ණඤ්ච කාළකං

43. මාලාකම්මං ලතාකම්මං මකරං පඤ්චපට්ටිකං
චීවරවංසං රජ්ජුං ච ජරා දුබ්බල පාකාරං

44. පරිවෙණෙ චාපි[6] තථෙව මරුම්බං පදරසිලා
සන්තිට්ඨන්ති නිද්ධමනං කුම්භිඤ්චාපි සරාවකං

45. දුක්ඛං හිරි අපිධානං අනාචාරඤ්ච ආචරුං
ලොහභණ්ඩං අනුඤ්ඤාසි ඨපයිත්වා පහරණිං

1. සංවෙල්ලි උභතො කාජං - සිමු.
2. තිරච්ඡාන කථා විජ්ජා - සිමු
3. බාදි ච. - සිමු.
4. පාරු - සිමු.
5. චයො ච - සිමු
6. කොට්ඨකෙ චාපි - සිමු.

36. තල්වැට සේ හැඳීම, සතවලලිකය යන ගිහිපෙරවුම නො කළයුතු. පිටපටගැසීම ද නානාවිධ ගිහි පෙරවුම් ද නොකළ යුතු. දෙපස කඳ නො ගෙනයායුතු. දවටු විකීම ද දවටුයෙන් තැළීම ද පිළිබඳ පැනැවීම් ද ඇත.

37. දහැටට උගුරේ රැඳිණ. (එය ඇරැබැ සික පැනැවූහ.) කැලැ දවීම, පිළිගිනි දීම, රුක් නැගීම, ඇතකු ලුහුබැඳීම ද යන කරුණු ද යමෙළුතෙකුල පැවිද්දන් ද ඇරැබැ සික පැනැවිණ. ලොකායත ශාස්ත්‍ර හදළාහ, කියැවූහ. එය පිළිබඳ ද සික පැනවිණ.

38. තිරශ්චීනවිද්‍යා හැදෑරීම, එය ඉගැන්වීම, කිවිසීමෙ දී ආසිරි පැතීම, ගිහීන් මංගලික බව, ලුහුණු කෑම, වාතාබාධයෙහි ලුහුණු කෑම යන කරුණු ඇරැබැ සික පැනැවිණ. ආරාමය දූෂ්‍ය වෙයි. දුගඳ ඉවයි, කෙසකිළියේ දුකයේ හිඳිත්, පස්සාව පාදුකාව අනුදැනිණ.

39. වැස්මක්නැති කෙසකිළියෙහි මූත්‍ර කරන්නට ලජ්ජිත වෙත්. කෙසකිළිය ආවරණ රහිත වෙයි. දුගඳ වෙයි (එය පිළිබඳ සික පැනැවිණ). ඒ ඒ තැන මල පහ කෙරෙත්. දුගඳ වෙයි. වර්චස්කූපයක් අනුදත්හ. වර්චස්කූපයේ ඉවුරු කැඩී වැටෙයි. බිම උස් කොට තනන්නට අනුදත්හ. ගඩොළු බැඳුම් ආදි බැඳුම් ද අනුදත්හ.

40. සොපාණ ආලම්බනබාහ ද අනුදත්හ. අද්දර හිඳ මල පහ කිරීම, දුකසේ හිඳ මල පහ කිරීම, වච්චපාදුකා ව පිටත මූත්‍ර පහ කිරීම, මූත්‍ර ඔරුව, පුසන් දඬු, පුසන් දඬු බඳුන (පිළිබඳ සික පැනැවිණ.) වළ නො වසන ලද්දේ ය. (එය පිළිබඳ ව ද සික පැනැවිණ.)

41. වැසිකිළියක් පැනැවීම, එයට දෙර, දෙරබාව, වටෙවූලිය, උතුරුලිය, අගුළුවැටිය, අගුළුකණුව යන දෑ අනුදත්හ.

42. යතුරුලිය, තරංකය, කෙසිසිදුර, අදනා රැහැන බහාලන සිදුර අදනා රැහැන වැසිකිළිදෙරටුවෙහි ඇතුළත පිටත බදම ඇලවීම, සුදුපැහැ කිරීම, කළු පැහැකිරීම.

43. මල්කම්, ලියකම්, මෝරදත් ඇඳීම, පස්පැහැ කිරීම චීවරවංසය, චීවරරජ්ජුය,ජරා දුබලා ප්‍රාකර (යන දෑ අනුදත්හ).

44. එහි ම පිරිවෙනෙහි ද වැලි ඇතිරීම ද පතුරුගල් ඇතිරීම ද අනුදත්හ. දිය රැඳී සිටී. කානුවක් ද සෝදන දිය බහාලන මහසැළක් ද සරාවක් ද අනුදත්හ.

45. දුකසේ දිය කිස කරත්. දිය කිසට ලජ්ජා ගනිත්. දිය සැළට පියනක් අනුදත්හ. (සවැගියෝ) නොමනා ව හැසුරුණාහ. අව් හැර ලොහොබඩු අනුදත්හ.

46. ඨපෙත්වා'සන්දිපල්ලඞ්කං දරුපත්තඤ්ච පාදුකං
සබ්බං දරුමයං භණ්ඩං අනුඤ්ඤාසි මහාමුනි

47. කතකං කුම්භකාරඤ්ච ඨපයිත්වා තථාගතො
සබ්බම්පි මත්තිකාභණ්ඩං අනුඤ්ඤාසි අනුකම්පකො

48. යස්ස වත්ථුස්ස නිද්දෙසො පුරිමෙන සමම්පි ච
තංපි සංඛිත්තමුද්දෙන නයතො තං විජානියා

49. එවං දසසතා වත්ථු විනයෙ ඛුද්දකවත්ථුකෙ
සද්ධම්මට්ඨිතියා චෙව පෙසලානං චනුග්ගහො

50. සුසික්ඛිතො විනයධරො හිතචිත්තො සුපෙසලො
පදීපකරණො[1] ධීරො පූජාරහො බහුස්සුතොති.

උද්දානං නිට්ඨිතං.

1. පදීපකාරකො-සිමු.

46. දික්සහළා පුටුව ද ව්‍යාලරූප ඇති පළඟ ද ලීමුවා පාත්‍රය ද ලී සෙරෙප්පු ද හැර සියලු ලීමුවා බඩු මහාමුනිහු අනුදත්හ.

47. මැටිපාපිස්ස ද සියල්ල මැටිමුවා ගෙය ද හැර ඉතිරි සියලු මැටි බඩු ආනුකම්පක තථාගතයන් වහන්සේ අනුදත් සේක.

48. යම් වස්තුවෙක නිර්දෙශය පළමු දක්වුණ දැ හා සම වන්නේ නම් එය ද සැකෙවින් උද්දනයෙහි දක්විණ. එය දුන් නය අනුව දන්නේ ය.

49. මෙසේ විනය පිටකයේ ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි දහසෙක් වස්තූහු වෙත්. ඔහු ශාසනයාගේ චිරස්ථිතිය පිණිස වන්නාහ. ඒවා පැනවීම ප්‍රියශීල පැවිද්දනට අනුග්‍රහයෙක් ද වන්නේ ය.

50. මනාව හික්මුණු, විනයධර වූ, ඉත සිත් ඇති, ප්‍රියශීල වූ, සස්නට එළිය කරන, නුවණැති, බොහෝ ඇසූ පිරූ තැන් ඇති මහණ තෙම පූජාර්හ වේ.

## උද්දනය නිමියේ යි.

# 6. සෙනාසනක්ඛන්ධකං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං සෙනාසනං අපඤ්ඤත්තං හොති. තෙ ච[1] භික්ඛූ තහං තහං[2] විහරන්ති අරඤ්ඤෙ රුක්ඛමූලෙ පබ්බතෙ කන්දරායං ගිරිගුහායං[3] සුසානෙ වනපත්ථෙ අබ්භොකාසෙ පලාලපුඤ්ජෙ. තෙ කාලස්සෙව තතො තතො උපනික්ඛමන්ති අරඤ්ඤා රුක්ඛමූලා පබ්බතා කන්දරා ගිරිගුහා සුසානා වනපත්ථා අබ්භොකාසා පලාලපුඤ්ජා, පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛූ ඉරියාපථසම්පන්නා.

2. තෙන ඛො පන සමයෙන රාජගහකො සෙට්ඨි කාලස්සෙව උය්‍යානං අගමාසි. අද්දසා ඛො රාජගහකො සෙට්ඨි තෙ භික්ඛූ කාලස්සෙව තතො තතො උපනික්ඛමන්තෙ අරඤ්ඤා රුක්ඛමූලා පබ්බතා කන්දරා ගිරිගුහා සුසානා වනපත්ථා අබ්භොකාසා පලාලපුඤ්ජා, පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛූ ඉරියාපථසම්පන්නෙ. දිස්වානස්ස චිත්තං පසීදි. අථ ඛො රාජගහකො සෙට්ඨි යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "සචාහං භන්තෙ විහාරෙ කාරාපෙය්‍යං වසෙය්‍යාථ මෙ විහාරෙසූති".

3. 'න ඛො ගහපති භගවතා විහාරා අනුඤ්ඤාතා'ති. 'තෙන හි භන්තෙ භගවන්තං පටිපුච්ඡිත්වා මම ආරොචෙය්‍යාථා'ති.

'එවං ගහපතී'ති ඛො තෙ භික්ඛූ රාජගහකස්ස සෙට්ඨිස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: 'රාජගහකො භන්තෙ සෙට්ඨි විහාරෙ කාරෙතුකාමො[4] කථන්නු ඛො භන්තෙ පටිපජ්ජිතබ්බන්ති'. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ පඤ්ච ලෙනානි විහාරං අඩ්ඪයොගං පාසාදං හම්මියං ගුහාති."

අථ ඛො තෙ භික්ඛූ යෙන රාජගහකො සෙට්ඨි තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා රාජගහකං සෙට්ඨිං එතදවොචුං: "අනුඤ්ඤාතා ඛො ගහපති භගවතා විහාරා යස්ස'දානි කාලං මඤ්ඤසී"ති. අථ ඛො රාජගහකො සෙට්ඨි එකාහෙනෙව සට්ඨි විහාරෙ පතිට්ඨාපෙසි.

---

1. තෙ ධ – මජ්ඣං
2. තහිං තහිං – ස්‍යා
3. කන්දරාය ගිරිගුහාය – සී
4. කාරාපෙතුකාමො – මජ්ඣං

# 6. සේනාසනඛන්ධකය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවරට නො දුරු (ලෙහෙණුනට අහර දුන් තැන වූ බැවින්) කලන්දකනිවාප නම් වූ වේළුවනයෙහි වැඩවසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් මහණුනට සෙනසුන් නො පනවන ලද්දේ වෙයි. ඒ මහණහු ද රුක්මුලෙහි ද පර්වතයෙහි ද කඳුරැළියෙහි ද ගල්ලෙන්හි ද සොහොනෙහි ද වනපෙතෙහි ද එළිමහනෙහි ද පිදුරුගොඩෙහි දැ යි ඒ ඒ තැන වෙසෙත්. ඔහු දුටුවන් පහදවන්නා වූ ඉදිරි බැලීමෙන් ද දෙපස බැලීමෙන් ද අත් පා නැමීමෙන් ද අත් පා දිගහැරීමෙන් ද උපලක්ෂිත වෑ බිමට හෙළූ ඇස් ඇත්තාහු මනා ඉරියව්වෙන් යුක්ත වූවාහු කල් තබා ම වනයෙන් ද රුක්මුලින් ද පර්වතයෙන් ද කඳුරෙන් ද ගල් ලෙනින් ද සොහොනින් ද වනපෙතින් ද එළිමහන් පෙදෙසින් ද පිදුරුගොඩින් ද යන ඒ ඒ තැනින් නික්මයෙත්.

2. එ සමයෙහි වනාහි රජගහ නුවර (ප්‍රධාන) සිටු තෙම කල් තබා ම (සිය) උයනට ගියේ ය. රජගහ නුවර සිටු තෙම දුටුවන් පහදවන ඉදිරි බැලීමෙන් දෙපස බැලීමෙන් අත්පා හැකිළැවීමෙන් අත්පා දිග හැරීමෙන් උපලක්ෂිත වැ බිමට හෙළූ ඇස් ඇති වැ මනා ඉරියව්වෙන් යුතු වැ කල් තබා ම වනයෙන් ද රුක්මුලින් ද පර්වතයෙන් ද කඳුරෙන් ද ගල්ලෙනින් ද සොහොනින් ද වනපෙතින් ද එළිමහනෙන් ද පිදුරුගොඩින් දැ යි ඒ ඒ තැනින් නික්මැ වඩනා මහණුන් දුටුයේ ම ය. දැකීමෙන් ඔහු ගේ සිත පැහැදිණ. එ කලැ රජගහ සිටු ඒ මහණුන් කරා එළැඹියේ ය. එළැඹැ "වහන්ස, මා විහාරයන් කැරැවූවොත් ඒ මගේ විහාරයන්හි වසන්නාහු දැ"යි මෙ බස් කී ය.

3. "ගැහැවිය, භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයෝ නො අනුදන්නා ලදුහ"යි (ඒ මහණහු කීහ ) "වහන්ස, එසේ වී නම් භාග්‍යවතුන් වහන්සේ පිළිවිස මට දන්වන්නැ"යි සිටු කී ය.

"එසේ ය, ගැහැවියැ"යි කියා ම ඒ මහණහු රජගහ සිටුහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළඹ භාග්‍ය වතුන් වහන්සේ වැද පසෙක උන්හ. පසෙක උන්නාවූ ම ඒ මහණහු "වහන්ස, රජගහසිටු තෙම විහාර කරවනු කැමැත්තේ ය. වහන්ස, (මෙහි) කෙසේ පිළිපැදියයුතු දැ" යි මෙය කීහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කතා කොට මහණුන් අමතා, "මහණෙනි, විහාරය ද ගුරුළු පියාපත් වැනි සෙවෙනි ඇති ගෙය ද දික් පහය ද සඳලු සහිත ගෙය ද ගුහාව ද යන ලෙන් පස අනුදනිමි"යි වදාළසේක.

ඉක්බිති ඒ මහණහු රජගහසිටු කරා එළැඹියාහ. එළඹ සිටුහු බණවා, "ගැහැවිය, භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයෝ අනුදන්නා ලදුහ. යමක් සඳහා අප විචාළෙහි ද, එයට දැන් කාලයැ යි දැනගන්නැ"යි කීහ. එකල්හි රජගහසිටු තෙම එක් දවසින් ම වෙහෙර සැටක් පිහිටුවී ය.

4. අථ ඛො රාජගහකො සෙට්ඨි තෙ සට්ඨි විහාරෙ පරියොසාපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජගහකො සෙට්ඨි භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො රාජගහකො සෙට්ඨි භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො රාජගහකො සෙට්ඨි තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි 'කාලො භන්තෙ නිට්ඨිතං භත්ත'න්ති'. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන රාජගහකස්ස සෙට්ඨිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො රාජගහකො සෙට්ඨි බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජගහකො සෙට්ඨි භගවන්තං එතදවොච: "එතෙ මෙ භන්තෙ සට්ඨිවිහාරා පුඤ්ඤත්ථිකෙන සග්ගත්ථිකෙන කාරාපිතා, කථාහං භන්තෙ තෙසු විහාරෙසු පටිපජ්ජාමී"ති.

"තෙන හි ත්වං ගහපති තෙ සට්ඨි විහාරෙ ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස පතිට්ඨාපෙහී"ති.

"එවං භන්තෙ"ති ඛො රාජගහකො සෙට්ඨි භගවතො පටිස්සුත්වා තෙ සට්ඨි විහාරෙ ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස පතිට්ඨාපෙසි.

5. අථ ඛො භගවා රාජගහකං සෙට්ඨිං ඉමාහි ගාථාහි අනුමොදි:

සීතං උණ්හං පටිහන්ති තතො වාළමිගානි ච
සිරිංසපෙ[1] ච මකසෙ සිසිරෙ චාපි වුට්ඨියො.

තතො වාතාතපො ඝොරො සඤ්ජාතො පටිහඤ්ඤති
ලෙනත්ථඤ්ච සුඛත්ථඤ්ච ඣායිතුං ච විපස්සිතුං.

---

1. සරිසපෙ - මජසං..

4. එ කල්හි රජගහසිටු ඒ සැට වෙහෙර නිමවා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හිඳගත්තේ ය. රජගහ සිටු පසෙක හුන්නේ ම "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඟන හා සෙට දවසට මගේ බත ඉවසන සේක්වා"යි භාග්‍යවතුන් වහන්සේට මෙ සේ කී ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬ බැවින් (එය) ඉවසූ සේක. ඉක්බිති රජගහසිටු තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගී ඔබ වැඳ පැදකුණු කොට නික්මියේ ය.

ඉක්බිති රජගහසිටු එ රැය ඇවෑමෙන් ප්‍රණීත ඛාද්‍ය භොජ්‍ය පිළියෙළ කරවා 'වහන්ස, දැන් වඩනට කාලය ය. බත පිළියෙළ කරවා නිමැවිණැ'යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වාලි ය. එ කලැ භාග්‍යවතුන් වහන්සේ (ඒ) පෙරවරු සෙමෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන රජගහසිටුහු ගෙය වෙත වැඩිසේක. වැඩ, පැනැවූණු අස්නෙහි භික්සඟන හා හුන්සේක. එ කලැ රජගහ සිටු බුදුපාමොක් භික්සඟන ප්‍රණීත ඛාද්‍ය භොජ්‍යයෙන් සියතින් සතපා පවරවා වළඳා අවසන් වූ පාත්‍රයෙන් ඉවතට ගත් අතැති භාග්‍යවතුන් වහන්සේට එක් පසෙක හිඳ ගත්තේ ය. (එසේ) එක් පසෙක හුන් රජගහ සිටු තෙම "වහන්ස, පින්කැමැති සගසුව පතන මා විසින් මෙ වෙහෙර සැටෙක් කැරැවිණ. වහන්ස, ඒ සැට වෙහෙරෙහි මම කෙසේ පිළිපදිම් දැ"යි භාග්‍යවතුන් වහන්සේට මෙ බස් කී ය.

"ගැහැවියෙනි, එසේ වී නම් තෙපි සැම වෙහෙර පැමිණි නොපැමිණි සිවුදිගැ වැසි සඟනට පිහිටුවවු (පිරිනමවු)"යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

"එසේ ය, වහන්සැ"යි රජගහ සිටු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ වෙහෙර සැට පැමිණි නොපැමිණි සතර දික් වැසි සඟනට පිරිනැමී ය.

5. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ සිටුහට මෙ ගාථාවලින් අනුමොදනා කැර වදළසේක.

(ගාථාවල අදහස:)

"විහාරය ශීතය ද උෂ්ණය ද නසයි. එයින් අන්‍ය වූ චණ්ඩ මෘගයන් ද බඩගා යන සතුන් ද මැසිමදුරුවන් ද ශීත සුළං ද වැසි ද බැහැර කෙරෙයි.

එයින් අන්‍ය වූ හටගත් නපුරු අවුසුළං ද දුරු වෙයි. සංඝයාට විහාර කරවා දීම එකලා වැ හිඳිනු පිණිස ද ධ්‍යාන කිරීමටත් විවසුන් වැඩීමටත් පහසුව පිණිස ද වූ අග්‍ර එකෙකැ යි බුදුරජුන් විසින් වැණින.

විහාරදානං සඞ්ඝස්ස අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො

විහාරෙ කාරයෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ
තෙසං අන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච

දදෙය්‍ය උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා
තෙ තස්ස ධම්මං දෙසෙන්ති සබ්බදුක්ඛාපනූදනං
යං සො ධම්මං ඉධඤ්ඤාය පරිනිබ්බාති අනාසවො ති.

අථ ඛො භගවා රාජගහකං සෙට්ඨිං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

6. අස්සොසුං ඛො මනුස්සා "භගවතා කිර විහාරා අනුඤ්ඤාතා"ති. සක්කච්චං විහාරෙ කාරාපෙන්ති. තෙ විහාරා අකවාටකා හොන්ති. අහිපි විච්ඡිකාපි සතපදියොපි පවිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ කවාටන්ති."

භිත්තිච්ඡිද්දං කරිත්වා වල්ලියා පි රජ්ජුයා පි කවාටං බන්ධන්ති. උන්දූරෙහිපි උපචිකාහිපි ඛජ්ජන්ති. ඛායිතබන්ධනානි කවාටානි පතන්ති[1]. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පිට්ඨසඞ්ඝාටං උදුක්ඛලිකං උත්තරපාසකන්ති."

කවාටා න ඵුස්සියන්ති[2] භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආවිඤ්ඡනරජ්ජුන්ති."

කවාටා න ථකියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ අග්ගලවට්ටිකං කපිසීසකං සූචිකං ඝටිකන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ න සක්කොන්ති කවාටං අවාපුරිතුං?[3] භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ තාලච්ඡිද්දං තීණි තාලානි ලොහතාලං කට්ඨතාලං විසාණතාලන්ති."

යෙ පි තෙ උග්ඝාටෙත්වා පවිසන්ති විහාරා අගුත්තා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ යන්තකං සූචිකන්ති."

---

1. පතන්ති – සීමු.
2. ඵුසියන්ති – මජ්ඣං.
3. අපාපුරිතුං – මජ්ඣං.

එහෙයින් ම නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ, සිත්කළු විහාරයන් කරවන්නේ ය, එහි ඇසූ පිරූතන් ඇති භික්ෂූන් වස්වන්නේ ය.

ඔවුනට නිසි වූ ආහාර ද පාන ද වස්ත්‍ර ශයනාසන ද සෘජුගුණ ඇති ඒ භික්ෂූන් විෂයයෙහි වෙසෙසින් පහන් සිතින් පිරිනමන්නේ ය.

හෙ තෙම මෙහි දී යම් දහමක් දැනගෙන ආශ්‍රව රහිත ව පිරිනිවෙන්නේ ද එසේ වූ සියලු දුක් දුරු ලන දහමක් ඒ භික්ෂූහු ඔහුට දෙසන්නාහ යනු යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහසිටුහට මේ ගාථා-වලින් අනුමෝදනා කොට හුනස්නෙන් නැඟී නික්මිසේක.

6. "භාග්‍යවතුන් වහන්සේ විසින් විහාර අනුදන්නා ලද්දේ ලු"යි මිනිස්සු ඇසූහ. ඔහු සකසා විහාර කරවත්. ඒ විහාරයෝ දොරපළු නැත්තාහු වෙත්. සර්පයෝ ද ගෝනුස්සෝ ද පත්තෑයෝ ද පිවිසෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, දොරපළුව අනුදනිමි"යි (භාග්‍යවතුන් වහන්සේ වදළසේක.)

බිත්තියෙහි සිදුරක් කොට වැලින් ද රැහැනින් ද දොර-පළුව බඳිත්. මීයන් විසින් ද වෙයන් විසින් ද වැලුත් රැහැනුත් කනු ලැබෙත්. කන ලද බැඳුම් ඇති දොරපළු වැටේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, දොරබාව ද වටෙවුලිය ද උතුරුලිය ද අනු-දනිමියි (භාග්‍යවතුන් වහන්සේ වදළසේක.)

කවුළු (දොරපළු) නො පැහැසෙති භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, අදිනා රැහැන ලන සිදුර ද අනුදනිමි"යි (වදළ සේක.)

දොරපළු නො වැසෙත් භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, අගුල් වැටිය (දොරපොල්ල) ද අගුල් කණුව ද යතුර ද තරංකය ද අනුදනිමි"යි. වදළසේක.

එ සමයෙහි මහණහු දොරපළුව අරින්නට නො හැකි වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, කෙසිසිදුර ද ලොහහාමුවා යතුර ද ලීමුවා යතුර ද අංමුවා යතුර ද යන යතුරු තුන ද අනුදනිමි යි (වදළ සේක.)

යම් විහාර විවෘත කොට පිවිසෙත් ද ඒ විහාරයෝ නො රැකුණාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, යතුරු ඉද්ද අනුදනිමි"යි (වදළසේක.)

තෙන ඛො පන සමයෙන විහාරා තිණච්ඡදනා හොන්ති. සීතකාලෙ සීතා උණ්හකාලෙ උණ්හා. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුන්ති."

8. තෙන ඛො පන සමයෙන විහාරා අවාතපානකා[1] හොන්ති අචක්ඛුස්සා දුග්ගන්ධා. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ තීණි වාතපානානි: වෙදිකාවාතපානං ජාලවාතපානං සලාකවාතපානන්ති.

වාතපානන්තරිකාය කාලකාපි වග්ගුලියොපි පවිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙංසු.

"අනුජානාමි භික්ඛවෙ වාතපානචක්කලිකන්ති."

චක්කලිකන්තරිකායපි කාලකාපි වග්ගුලියොපි පවිසන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ වාතපානකවාටකං වාතපානභිසිකන්ති".

9. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඡමාය සයන්ති. ගත්තානිපි චීවරානිපි පංසුකිතානි හොන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ තිණසන්ථාරකන්ති."

තිණසන්ථාරකො උන්දූරෙහිපි උපචිකාහිපි ඛජ්ජති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ මිඩ්ඩින්ති."

මිඩ්ඩියා ගත්තානි දුක්ඛා හොන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ බිදලමඤ්චකන්ති."

10. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සොසානිකො මසාරකො මඤ්චො උප්පන්නො හොති භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ මසාරකං මඤ්චන්ති."

මසාරකං පීඨං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ මසාරකං පීඨන්ති."

1. අවාතපානිකා - සීමු.

7. එසමයෙහි විහාරයෝ තණ සෙවෙණි ඇත්තෝ වූහ. ශීත කාලයෙහි ශීත ද උෂ්ණ කාලයෙහි උෂ්ණ ද වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, සත දඬු යොද ඇතුළත පිටත බදම ආලිප්ත කරන්නට අනුදනිමි"යි වදළසේක.

8. එසමයෙහි විහාරයෝ වාකවුළු නැත්තාහු ඇසට අහිත ද දුගඳ ද වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ස්තූපයන්හි සතරැස් කොටුව සෙයින් සිදුරු සිටින සේ ගඩොළින් කළ වාකවුළුව ද, දැල් වාකවුළුව ද කූරු වාකවුළුව ද යන තුන් වාකවුළු අනුදනිමි"යි වදළසේක.

වාකවුළු අතරින් ලෙහෙන්නු ද වවුලෝ ද පිවිසෙත් භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, රෙදි වෙළා කළ පාපිස්නක් (බඳින්නට) අනුදනිමි"යි වදළසේක.

රෙදි පාපිස්න අතුරෙන් ද ලෙහෙන්නුත් වවුලෝත් පිවිසෙත් ...

"මහණෙනි, වාකවුළු වසන්නට දෙරපළුවක් ද එහි බඳින්නට බිස්සක් ද අනුදනිමි"යි වදළසේක.

9. එ සමයෙහි මහණහු බිමැ නිදත්. සිරුරු ද සිවුරු ද පසින් වැකුණාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, තණඇතිරියක් අනුදනිමි"යි වදළසේක.

තණඇතිරිය මීයන් ද වෙයන් ද විසින් කනුලැබේ.

"මහණෙනි, පිළක් අනුදනිමි"යි වදළසේක.

පිළෙහි ගාත්‍රයෝ පෙළෙත්.

"මහණෙනි, බිදලමඤ්චකය (වෙවැල් ඇඳ) අනුදනිමි"යි වදළ සේක.

10. එසමයෙහි වනාහි සඞ්ඝයාට සොහොනෙක දමන ලද මසාරකයක් (පා විද අටනීන් පිවිස්වා කළ ඇඳෙක්) ලැබිණ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, මසාරක ඇඳපා විද එහි අටනි බහා කළ ඇඳ අනුදනිමි"යි වදළසේක.

මසාරක පුටුවෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකළාහ.

"මහණෙනි, මසාරක පුටුව අනුදනිමි"යි වදළසේක.

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සොසානිකො බුන්දිකාබද්ධො මඤ්චො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ බුන්දිකාබද්ධං මඤ්චන්ති."

බුන්දිකාබද්ධං පීඨං උප්පන්නං හොති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ බුන්දිකාබද්ධං පීඨන්ති."

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සොසානිකො කුළීරපාදකො මඤ්චො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ කුළීරපාදකං මඤ්චන්ති."

කුළීරපාදකං පීඨං උප්පන්නං හොති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ කුළීරපාදකං පීඨන්ති."

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සොසානිකො ආහච්චපාදකො මඤ්චො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආහච්චපාදකං මඤ්චන්ති."

ආහච්චපාදකං පීඨං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආහච්චපාදකං පීඨන්ති."

11. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ආසන්දිකො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආසන්දිකන්ති."

උච්චකො ආසන්දිකො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ උච්චකම්පි ආසන්දිකන්ති."

සත්තඞ්ගො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ සත්තඞ්ගන්ති."

උච්චකො සත්තඞ්ගො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ උච්චකම්පි සත්තඞ්ගන්ති."

භද්දපීඨං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ භද්දපීඨන්ති"

එ සමයෙහි සඞ්ඝයාට බුන්දිකාබද්ධ (විට්ටම විද එහි පා යොදා තනන ලද) ඇඳෙක් ලැබිණ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, බුන්දිකාබද්ධ ඇඳ අනුදනිමි''යි වදළසේක. බුන්දිකා-බද්ධ (විට්ටම විද එහි පා ඇතුල් කොට තනන ලද) පුටුවෙක් ලැබිණ....

''මහණෙනි, බුන්දිකාබද්ධ පුටුව අනුදනිමි''යි වදළසේක.

එ සමයෙහි සඞ්ඝයාට සොහොනෙක දමාපියන ලද කකුළු පා ඇඳෙක් (කකුළුවන්ගේ බඳු වක් පා ඇති ඇඳෙක්) ලැබුණේය. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ.

''මහණෙනි, කකුළු පා ඇඳ අනුදනිමි''යි වදළ සේක. කකුළු පා පුටුවෙක් උපන ...

''මහණෙනි, කකුළුපා පුටුව අනුදනිමි''යි වදළසේක.

එ සමයෙහි සඞ්ඝයාට සොහොනෙක දමාපියන ලද ආහච්චපාදක "අටනි විද එහි ඇඳපා බහා ඇණ ලා කළ ඇඳෙක් ලැබුණේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, ආහච්චපාදක ඇඳ අනුදනිමි''යි වදළසේක. ආහච්චපාදක අටනි විද එහි පුටුවක් උපන්නේ වේ....

''මහණෙනි, ආහච්චපාදක පුටුව අනුදනිමි''යි වදළසේක.

11. එ සමයෙහි සඞ්ඝයාට සතරැස් පුටුවෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, සතරැස් පුටුව අනුදනිමි''යි වදළසේක.

උස් වූ සතරැස් පුටුවෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, උස් සතරැස් පුටුව අනුදනිමි''යි වදළසේක.

සප්තාඞ්ගයෙක් (කවිච්චියෙක්) උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්-සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, කවිච්චිය අනුදනිමි''යි වදළසේක.

උස් කවිච්චියෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, උස් කවිච්චිය අනුදනිමි''යි වදළසේක.

භද්‍රපීඨයක් (වේ වැල් මුවා පුටුවෙක්) උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, වේවැල්මුවා පුටුව අනුදනිමි''යි වදළසේක.

පීඨිකා[1] උප්පන්නා හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පීඨිකන්ති."

එළකපාදකං පීඨං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ එළකපාදකං පීඨන්ති."

ආමලකවට්ටිකපීඨං[2] උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආමලකවට්ටිකං පීඨන්ති."

ඵලකං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඵලකන්ති."

කොච්ඡං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ කොච්ඡන්ති."

පලාලපීඨං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පලාලපීඨන්ති."

12. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චෙ මඤ්චෙ සයන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහීකාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ උච්චෙ මඤ්චෙ සයිතබ්බං යො සෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු නීචෙ මඤ්චෙ සයන්තො අහිනා දට්ඨො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ මඤ්චපටිපාදකන්ති."

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චෙ මඤ්චපටිපාදකෙ ධාරෙන්ති. සහ මඤ්චපටිපාදකෙහි පවෙධෙන්ති[3] -පෙ-

"න භික්ඛවෙ උච්චා පටිපාදකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අට්ඨඞ්ගුලපරමං මඤ්චපටිපාදකන්ති."

---

1. පීඨිකා - සීමු
2. ආමණ්ඩකවණ්ටික පීඨං - මජසං, සීමු.
3. පවෙධෙන්ති - මජසං, සයා

පීඨිකාවෙක් (රෙදිකඩක් බැඳි පුටුවෙක්) උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, රෙදිකඩ බන් පුටුව අනුදනිමි"යි වදළසේක.

පූවරුපා පුටුවෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, පුවරු පා පුටුව අනුදනිමි"යි වදළසේක.

ඇඹුල්වැටි පුටුවෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ඇඹුල්වැටි පුටුව අනුදනිමි"යි වදළසේක.

පුවරුවෙක් (බංකුවෙක්) උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, පුවරුව අනුදනිමි"යි වදළසේක.

කොස්සෙක් උපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, කොස්ස අනුදනිමි"යි වදළසේක.

පිදුරුවලින් තැනූ අස්නෙක් ලැබුණේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, පිදුරුපුටුව අනුදනිමි"යි වදළසේක.

12. එ සමයෙහි සවැගි මහණහු උස් ඇඳෙහි වැදහෙත්. මිනිස්සු විහාරචාරිකායෙහි ඇවිදුනාහු (ඔවුන්) දැක ලාමක කොට සිතත්, නො ගුණ කියත්, කාමභොගී ගිහියන් බඳුහ"යි දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, උස් ඇඳෙහි නො වැදහියයුතු. යමෙක් වැදහෙත්නේ නම් දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

එ සමයෙහි එක්තරා මහණෙක් මිටි හැඳෙක හෝනේ සපකු විසින් ඩස්නා ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ඇඳ පිළිපා අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි සැවැගි මහණහු උස්වූ ඇඳපිළිපා[1] පරිභොග කරත්. ඇඳපිළිපා සහිත ව පෙරළී වැටෙත්.......

"මහණෙනි, උස් ඇඳ පිළිපා නො දැරියයුතු. යමෙක් දරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, අටඟුලක් පරම කොටැති ඇඳපිළිපා අනුදනිමි"යි වදළසේක.

13. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සුත්තං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ මඤ්චං වෙතුන්ති."

අඞ්ගානි බහුං සුත්තං පරියාදියන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ අඞ්ගෙ විජ්ඣිත්වා අට්ඨපාදකං වෙතුන්ති."

චොළකං උප්පන්නං හොති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ චිලිමිකා[1] කාතුන්ති"

තූලිකා උප්පන්නා හොති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ විජටෙත්වා බිම්බොහනං කාතුං. තීණි තූලානි රුක්ඛතූලං ලතාතූලං පොටකිතූලන්ති."

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අඩ්ඪකායිකානි බිම්බොහනානි ධාරෙන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ අඩ්ඪකායිකානි බිම්බොහනානි ධාරෙතබ්බානි. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ සීසප්පමාණං බිම්බොහනන්ති.

14. තෙන ඛො පන සමයෙන රාජගහෙ ගිරග්ගසමජ්ජො හොති. මනුස්සා මහාමත්තානං අත්ථාය භිසියො පටියාදෙන්ති උණ්ණභිසිං චොළභිසිං වාකභිසිං තිණභිසිං පණ්ණභිසින්ති. තෙ විතිවත්තෙ සමජ්ජෙ ඡවිං උප්පාටෙත්වා හරන්ති. අද්දසාසුං ඛො භික්ඛූ සමජ්ජට්ඨානෙ බහුං උණ්ණම්පි චොළම්පි වාකම්පි තිණම්පි පණ්ණම්පි ඡඩ්ඩිතං. දිස්වාන භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චභිසියො උණ්ණභිසිං චොළභිසිං වාකභිසිං තිණභිසිං පණ්ණභිසින්ති."

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සෙනාසනපරික්ඛාරිකං දුස්සං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ භිසිං ඔනන්ධිතුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ මඤ්චභිසිං පීඨෙ සන්ථරන්ති, පීඨභිසිං මඤ්චෙ සන්ථරන්ති භිසියො පරිභිජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

1. චිමිලිකං - මජසං

13. එ සමයෙහි සඞ්ඝයාට තූල් ලැබුණේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ඇඳ වියන්නට අනුදනිමි"යි වදළසේක.

ඇඳ වියල්හු බොහෝ තූල් ගනිත්. (ඇඳවියල්වලට ම බොහෝ තූල් වියදම් වේ). ...

"මහණෙනි, වියල් විද අට පා දූ පුවරුවක් සේ වියන්නට අනුදනිමි"යි වදළසේක.

රෙදිකඩෙක් උපන්නේ වෙයි. ...

"මහණෙනි, බිමැ අතුරන ඇතිරියක් කරන්නට අනුදනිමි"යි වදළසේක.

පුලුන් උපන්නේ වේ.

"මහණෙනි, අවුල් හැර කොට්ටයක් කරන්නට අනුදනිමි. රුක් පුලුන් වැල් පුලුන් තණබට ආදියෙන් ලැබෙන පුලුන් යැ යි තුන් වගයෙකි"යි වදළසේක.

එ සමයෙහි සවැගි මහණෝ කයින් අඩක් පමණ දික් වූ කොට්ට දරත්. මිනිස්සු විහාරචාරිකාවේ ඇවිදුනාහු 'කාමභොගී ගිහියන් බන්දහ'යි එය දැක ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, අඩකයක් පමණ දික් වූ කොට්ට නො දැරියයුතු. යමෙක් දරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, හිසට සුදුසු පමණ වූ කොට්ටය අනුදනිමි"යි වදළසේක.

14. එ සමයෙහි රජගහනුවර ගිරග්ගසමජ්ජ උත්සවය වෙයි. මිනිස්සු මහඇමැතියන් සඳහා ලොම් මෙට්ට (ලොම් පුරවා කළ මෙට්ට), රෙදි මෙට්ට, වැහැරිමෙට්ට තණ මෙට්ට යන (බොහෝ) මෙට්ට පිළියෙළ කරත්. සමජ්ජය අවසන් වූ කල්හි උර ගලවා ගෙනයත්. මහණහු සමජ්ජස්ථානයෙහි (උළෙල පැවැති තැනැ) හැරදමන ලද බොහෝ ලොම් ද රෙදි ද වැහැරි ද තණ ද කොළ ද දුටුහ. දැක භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ලොම් මෙට්ටය, රෙදි මෙට්ටය වැහැරි මෙට්ටය, තණ මෙට්ටය කොළ මෙට්ටය යන මෙට්ට පස අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි සඞ්ඝයාට සෙනසුන් පිරිකර වශයෙන් වූ වස්ත්‍රයෙක් උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, මෙට්ටය වසාලන්නට (මෙට්ට උරයක් වශයෙන් යොදන්නට) අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි මහණහු ඇඳමෙට්ටය පුටුවෙහි අතුරත්. පුටු මෙට්ටය ඇඳෙහි අතුරත්, මෙට්ට බිඳියේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"අනුජානාමි භික්ඛවෙ ඔනද්ධමඤ්චං ඔනද්ධපීඨන්ති."

උල්ලොකං අකරිත්වා සන්ථරන්ති. හෙට්ඨතො නිප්පතන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ උල්ලොකං කත්වා සන්ථරිත්වා භිසිං ඔනන්ධිතුන්ති."

ඡවිං උප්පාටෙත්වා හරන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ චොසෙතුන්ති."

හරන්ති යෙව -පෙ-

"අනුජානාමි භික්ඛවෙ භත්තිකම්මන්ති."

හරන්ති යෙව -පෙ-

"අනුජානාමි භික්ඛවෙ හත්ථභත්තින්ති."

15. තෙන ඛො පන සමයෙන තිත්ථියානං සෙය්‍යා සෙතවණ්ණා හොන්ති කාළවණ්ණකතා භූමි ගෙරුකපරිකම්මකතා භිත්ති. බහූ මනුස්සා සෙය්‍යාපෙක්ඛකා ගච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ විහාරෙ සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මන්ති."

තෙන ඛො පන සමයෙන ඵරුසාය භිත්තියා සෙතවණ්ණො න නිපතති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ථුසපිණ්ඩං දත්වා පාණිකාය පටිබාහෙත්වා සෙතවණ්ණං නිපාතෙතුන්ති."

සෙතවණ්ණො අනිබන්ධනීයො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ සණ්හමත්තිකං දත්වා පාණිකාය පටිබාහෙත්වා සෙතවණ්ණං නිපාතෙතුන්ති."

සෙතවණ්ණො අනිබන්ධනීයො හොති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ඉක්කාසං පිට්ඨමද්දන්ති."

තෙන ඛො පන සමයෙන ඵරුසාය භිත්තියා ගෙරුකං න නිපතති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"මහණෙනි, මෙවට (ගුදිරි) යෙදූ ඇඳ ද මෙච්ට ලූ පුටුව ද අනුදනිමි"යි වදළසේක.

යවට රෙදි ඇතිරියක් නො දමා මෙච්ට එළත් යට පැත්තෙන් පැළෙත්....

"මහණෙනි, යවට රෙදි ඇතිරියක් ලා අතුරා මෙච්ටය වසන්නට අනුදනිමි"යි වදළසේක.

උරය ගලවාගෙන යෙත්....

"මහණෙනි, කහ ආදි පැහැයෙකින් බින්දු ඉසින්නට අනුදනිමි"යි වදළසේක.

ගෙනයෙත් ම ය....

"මහණෙනි, හත්‍ථිකම්මය (කසටින් ලකුණු කිරීම) අනුදනිමි"යි වදළ සේක.

ගෙනයෙත් ම ය....

"මහණෙනි, හස්තභක්තිය (පසඟුල් සලකුණ) අනුදනිමි"යි වදළ සේක.

15. එ සමයෙහි තොටුවන්ගේ යහන්හු සුදුපැහැ වෙත්. බිම කළු පැහැ කැරුණේ ය. බිත්ති ගුරු පිරියම් කැරුණේ ය. බොහෝ මිනිස්සු වැදහෝනා අපේක්‍ෂා ඇත්තෝ එහි යෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, වෙහෙරෙහි සුදුපැහැ කළුපැහැ ගුරුපැහැ පිරියම් කරන්නට අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි රළු බිත්තියෙහි සුදු පැහැ නො රැදෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, දහඩියා පිඩු දී අත්ලෙන් තුනී කොට සුදු පැහැ හෙළන්නට (රදවන්නට) අනුදනිමි"යි වදළසේක.

සුදු පැහැය එකට නොබැඳෙන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, සියුම් මැටි දී අත්ලෙන් තුනී කොට සුදුපැහැය හෙළන්නට අනුදනිමි"යි වදළසේක.

සුදුපැහැය එකට නො බැඳෙන්නේ වෙයි.

"මහණෙනි, මැලියම ද පිටිකැඳ ද අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි රළු බිත්තියෙහි ගුරු පිරියම් නො බැඳේ. භාග්‍ය-වතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"අනුජානාමි භික්ඛවෙ ථුසපිණ්ඩං දත්වා පාණිකාය පටිබාහෙත්වා ගෙරුකං නිපාතෙතුන්ති."

ගෙරුකං අනිබන්ධනීයං හොති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ කුණ්ඩකමත්තිකං දත්වා පාණිකාය පටිබාහෙත්වා ගෙරුකං නිපාතෙතුන්ති."

ගෙරුකං අනිබන්ධනීයං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ සාසපකුණ්ඩං සිත්ථතෙලකන්ති.

අච්චුස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ චොළකෙන පච්චුද්ධරිතුන්ති."

16. තෙන ඛො පන සමයෙන ඵරුසාය භූමියා කාළවණ්ණා න නිපතති -පෙ- අනුජානාමි භික්ඛවෙ ථුසපිණ්ඩං දත්වා පාණිකාය පටිබාහෙත්වා කාළවණ්ණං නිපාතෙතුන්ති.

කාළවණ්ණා අනිබන්ධනීයො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ගණ්ඩමත්තිකං දත්වා පාණිකාය පටිබාහෙත්වා කාළවණ්ණං නිපාතෙතුන්ති."

කාළවණ්ණො අනිබන්ධනීයො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඉක්කාසං කසාවන්ති."

17. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ විහාරෙ පටිභානචිත්තං කාරාපෙන්ති ඉත්ථිරූපකං පුරිසරූපකං. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ පටිභානචිත්තං කාරාපෙතබ්බං ඉත්ථිරූපකං පුරිසරූපකං. යො කාරාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

"අනුජානාමි භික්ඛවෙ මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකන්ති."

"මහණෙනි, දහවියා පිඩු දී අත්ලෙන් මැද ගුරු පැහැ හෙළන්නට අනුදනිමි"යි වදාළසේක.

ගුරු පැහැය එකට නො බැඳෙන්නේ වෙයි. ...

"මහණෙනි, කුඩු මුසු මැටි ගා අත්ලෙන් මැද ගුරු පැහැ හෙළන්නට අනුදනිමි"යි වදාළසේක.

ගුරු පැහැය එකට බැඳී නො සිටුනේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි අබ පිටි ද ඉටිතෙල (ඉටිදියර) ද අනුදනිමි"යි වදාළසේක.

(තැන තැන බින්දු වශයෙන්) උස්ව . නැගී සිටියේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, රෙදි කඩෙකින් පිස පසුදුරන්නට අනුදනිමි"යි වදාළ සේක.

16. එ සමයෙහි රළු බිමැ කළුපැහැ නො රැඳෙයි. ... "මහණෙනි, දහවියා පිඩු දී අත්ලෙන් තුනී කොට (මැද) කළු පැහැ හෙළන්නට අනුදනිමි"යි වදාළසේක.

කළුපැහැය එකට නො බැඳෙන්නේ වේ. භාග්‍යවතුන් වහන්-සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, ගැඩවිල් පස් දී අත්ලෙන් මැද කළු පැහැය හෙළන්නට අනුදනිමි"යි වදාළසේක.

කළුපැහැය එකට බැඳී සිටුනේ නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, මැලියම් ද (තෙල්ලි ආදියේ) කසට ද අනුදනිමි"යි වදාළසේක.

17. එ සමයෙහි සවැගි මහණෝ විහාරයෙහි ස්ත්‍රී රූප ද පුරුෂ රූප ද යන ප්‍රතිභාන චිත්‍ර කරවත්. මිනිස්සු විහාරචාරිකා-යෙහි ඇවිදුනාහු (ඒවා) දක කාමභොගී ගිහියන් බඳුවහ'යි පහත් කොට සිතත්, නො ගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ස්ත්‍රීරූප ද පුරුෂ රූප ද යන ප්‍රතිභානචිත්‍ර නො කැරවියයුතු. යමෙක් කරවන්නේ නම් දුකුළා ඇවැත් වන්නේය.

"මහණෙනි, මල්කම් ලියකම් මුවරදත් පස්වණක් පැහැකිරීම අනුදනිමි"යි වදාළසේක.

18. තෙන ඛො පන සමයෙන විහාරා නීචවත්ථුකා හොන්ති, උදකෙන ඔත්ථරියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති."

චයො පරිපතති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති."

ආරොහන්තා විහඤ්ඤන්ති. -පෙ- අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ: ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දරුසොපාණන්ති."

ආරොහන්තා පරිපතන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති."

19. තෙන ඛො පන සමයෙන විහාරා ආලකමන්දා හොන්ති. භික්ඛූ හිරියන්ති නිපජ්ජිතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං:

"අනුජානාමි භික්ඛවෙ තිරොකරණින්ති."

තිරොකරණිං උක්ඛිපිත්වා ඔලොකෙන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ අඩ්ඪකුඩ්ඩකන්ති."

අඩ්ඪකුඩ්ඩකා උපරිතො ඔලොකෙන්ති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ තයො ගබ්භෙ: සිවිකාගබ්භං නාළිකාගබ්භං හම්මියගබ්භන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ ඛුද්දකෙ විහාරෙ මජ්ඣෙ ගබ්භං කරොන්ති. උපචාරො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඛුද්දකෙ විහාරෙ එකමන්තං ගබ්භං කාතුං මහල්ලකෙ මජ්ඣෙ"ති.

20. තෙන ඛො පන සමයෙන විහාරස්ස කුඩ්ඩපාදෙ ජීරති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ කුලුඞ්කපාදකන්ති."

විහාරස්ස කුඩ්ඩො ඔවස්සති. -පෙ-

18. එ සමයෙහි වනාහි විහාරයෝ මිටි බිම් ඇත්තාහු වෙත්, (එහෙයින්) දියෙන් වැසියෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, උස්බිම ඇතියක් කරන්නට (පස් ආදිය ගොඩ ගසා බිම උස් කරන්නට) අනුදනිමි"යි වදළසේක.

පස්රැස (බැම්ම) බිඳී වැටෙයි....

"මහණෙනි, ගඩොල් බැම්ම ද ගල් බැම්ම ද දඬු බැම්ම දැ යි තුන්. බැඳුම් බඳින්නට අනුදනිමි"යි වදළසේක.

(විහාරයට) නඟින්නාහු පෙළෙත්....

"මහණෙනි, ගඩොළු හිණිපෙත ගල් හිණිපෙත දඬු හිණිපෙත යන තුන් හිණිපෙත අනුදනිමි"යි වදළසේක.

නඟින්නාහු ඇදීවැටෙත්....

"මහණෙනි, අත්වැලක් අනුදනිමි"යි වදළසේක.

19. එ සමයෙහි විහාරයෝ එකාඞ්ගන (දිගටම එළිමහන් ව මිනිසුන්ගෙන් පිරුණාහු) වෙත්. මහණහු වැදහෙන්නට ලජ්ජිත වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, තිරයක් අනුදනිමි"යි වදළසේක.

තිරය ඔසවා බලත්....

"මහණෙනි, අඩබිත්තිය අනුදනිමි"යි වදළසේක.

අඩබිත්තියට උඩින් බලත්....

"මහණෙනි, සිවිරැස්ගබ, නැළිගබ (පලලට වඩා දෙගුණයක් තුන්ගුණයක් දික් වූ ගබ), සඳලුගබ (උඩතට්ටුව කුළුගෙයක් බඳු හෝ මුදුන් පියස්සක් ඇති ගබ) යන ගබ් (කාමර) තුන අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි මහණහු කුඩා වෙහෙරේ මැද ගබ් තනත්. උප-වාරයෙක් (වටින් ඉඩෙක්) නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, කුඩා වෙහෙර එක් පසෙකැ ද මහ වෙහෙර මැද ද ගබ් (කාමර) තනන්නට අනුදනිමි"යි වදළසේක.

20. එ සමයෙහි විහාරයේ බිත්ති මුල දිරයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, කුලුඞ්ක පාදකය (ලී විද කණු සිටුවා කළ බිත්තිපාදය) අනුදනිමි"යි වදළසේක.

විහාරයේ බිත්තිය තෙමෙයි....

"අනුජානාමි භික්ඛවෙ පරිත්තාණකිටිකං උද්ධසුධන්ති."[1]

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො තිණච්ඡදනා අහි ඛන්ධෙ පපති, සො භීතො විස්සරමකාසි. භික්ඛූ උපධාවිත්වා තං භික්ඛුං එතදවොචුං. "කිස්ස ත්වං ආවුසො විස්සරමකාසී"ති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ විතානන්ති."

21. තෙන ඛො පන සමයෙන භික්ඛූ මඤ්චපාදෙපි පීඨපාදෙපි ථවිකායො ලග්ගෙන්ති. උන්දූරෙහිපි උපචිකාහිපි ඛජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ භිත්තිඛීලං නාගදන්තකන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ මඤ්චෙ'පි පීඨෙ'පි චීවරං නික්ඛිපන්ති. චීවරං පරිභිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ චීවරවංසං චීවරරජ්ජුන්ති."

තෙන ඛො පන සමයෙන විහාරා අනාලින්දකා හොන්ති අප්පටිස්සරණා. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ආලින්දං පඝනං පකුඩ්ඩං ඔසාරකන්ති."

ආලින්දා පාකටා හොන්ති. භික්ඛූ හිරීයන්ති නිපජ්ජිතුං –පෙ–

"අනුජානාමි භික්ඛවෙ සංසරණකිටිකං උග්ඝාටනකිටිකන්ති."

22. තෙන ඛො පන සමයෙන භික්ඛූ අජ්ඣොකාසෙ භත්තවිස්සග්ගං කරොන්තා සීතෙන'පි උණ්හෙන'පි කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ උපට්ඨානසාලන්ති."

උපට්ඨානසාලා නීචවත්ථුකා හොති. උදකෙන ඔත්ථරීයති. –පෙ–

1. උද්ධසුධන්ති – අවඨ්කරා.

''මහණෙනි, රකවල් පැලැල්ලක් ද (වසුගොම අළු මැටි එකට අනා තැනූ) බදම ද අනුදනිමි''යි වදාළසේක.

එ සමයෙහි තණපියස්සෙන් සර්පයෙක් එක්තරා මහණකුගේ උරහිස මත වැටුණේ ය. හේ බියපත් ව කෑගැසී ය. මහණහු වෙතට දිවැගොස් ඒ මහණහට ''ඇවැත්නි, තෙපි කවර හෙයින් කෑගැසුවෝ දැ''යි ඇසූහ. එවිට ඒ මහණ මහණුනට (තමාට වූ දැ) සැලකළේය. මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, උඩුවියනක් අනුදනිමි''යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

21. එ සමයෙහි මහණහු ඇඳපාහි ද පුටුපාහි ද ථවිකාවන් එල්ලත්. මීයන් විසින් ද වේයන් විසින් ද කනු ලැබෙත්. භාග්‍ය-වතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, භිත්තිඛීලය (බිත්තියෙහි ගසන ලදඋල) ද නාග-දන්තකය ද අනුදනිමි''යි වදාළසේක.

එ සමයෙහි මහණහු ඇඳෙහි ද පුටුවෙහි ද සිවුරු තබත්. සිවුර ඉරෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, වෙහෙරෙහි සිවුර වනන වස්දණ්ඩ ද සිවුර වනන ලනුව ද අනුදනිමි''යි වදාළසේක.

එ සමයෙහි විහාරයෝ පිල් නැත්තාහු (එහෙයින් ම) වටා යා හැකි ඉඩක් නැත්තාහු වෙත්.

''මහණෙනි, පිල ද (දොරට ඉදිරියෙන් දෙපස බිත්ති බැඳ කළ) ආලින්දය ද වට මාලය ද (පිලක් නැති විහාරයට) පිටතට පැන්නූ වහල ද අනුදනිමි''යි වදාළසේක.

පිල්හු ආවරණයක් නැත්තාහු වෙත්. මහණහු වැදහෝනට මැලි වෙත් ...

''මහණෙනි, අකුලන පැලැල්ලක් ද ඔසොවන පැලැල්ලක් ද අනුදනිමි''යි වදාළ සේක.

22. එ සමයෙහි මහණහු එළිමහනෙහි බත්කිස කරන්නාහු සීතයෙන් ද උෂ්ණයෙන් ද වෙහෙසෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, උවටන් හලක් අනුදනිමි''යි වදාළසේක.

උවටන්හල මිටි බිමක් ඇත්තේ වෙ. වතුරට යට වෙ ...

"අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති."

චයො පරිපතති.

"අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති."

ආරොහන්තා විහඤ්ඤන්ති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ: ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දරුසොපාණන්ති."

ආරොහන්තා පරිපතන්ති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති."

උපට්ඨානසාලාය තිණචුණ්ණං පරිපතති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං. සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ අජ්ඣොකාසෙ ඡමායං චීවරං පත්ථරන්ති. චීවරං පංසුකිතං හොති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ අජ්ඣොකාසෙ චීවරවංසං චීවර රජ්ජුන්ති."

පානීයං ඔතප්පති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ පානීයසාලං පානීයමණ්ඩපන්ති."

පානීයසාලා නීචවත්ථුකා හොති උදකෙන ඔත්ථරීයති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති."

චයො පරිපතති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ: ඉට්ඨකාචයං සිලාචයං දරුචයන්ති."

ආරොහන්තා විහඤ්ඤන්ති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ; ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දරුසොපාණන්ති."

ආරොහන්තා පරිපතන්ති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති."

පානීයසාලාය තිණචුණ්ණං පරිපතති. -පෙ-

''මහණෙනි, උවටන්හල උස්බිම් ඇතියක් කරන්නට අනුදනිමි''යි වදළසේක.

බැම්ම ඇදී වැටෙයි.

''මහණෙනි, ගඩොළු බැම්ම, ගල්බැම්ම දඬුබැම්ම යන තුන් බැඳුම් අනුදනිමි''යි වදළසේක.

නඟින්නාහු වෙහෙසෙත්....

''මහණෙනි, ගඩොළුහිණ, ගල්හිණ, දඬුහිණ යනු තුන් හිණිපෙත් අනුදනිමි''යි වදළසේක.

නඟින්නාහු ඇදී වැටෙත්...

''මහණෙනි, අත්වැල අනුදනිමි''යි වදළසේක.

උවටන් හලෙහි තණරොඩු වැටෙයි...

''මහණෙනි, ලී අතුරා ඇතුළත පිටත බදම ආලිප්ත කරන්නට සුදුපැහැ කළුපැහැ ගුරුපිරියම් මල්කම් ලියකම් මුවරදත් පස්වණක් පැහැකිරීම සිවුරු වනන හුණදණ්ඩ සිවුරු වනන රැහැන අනුදනිමි''යි වදළසේක.

එ සමයෙහි මහණහු එළිමහනෙහි බිමැ සිවුරු වනත්, සිවුරු පස් වැකුණේ වේ...

''මහණෙනි, එළිමහනෙහි සිවුරු වනන උණදණ්ඩ සිවුරු වනන ලණුව අනුදනිමි''යි වදළසේක.

පැන් අව්වෙන් තැවෙයි...

''මහණෙනි, පැන්හලක් ද පැන් තබන මඩුවක් ද අනුදනිමි''යි වදළසේක.

පැන්හල මිටි බිමක් ඇත්තේ වෙයි. වතුරෙන් යට වෙයි...

''මහණෙනි, (පැන්හල) උස්බිම ඇතියක් කරන්නට අනුදනිමි''යි වදළසේක.

බැම්ම කැඩී වැටෙයි....

මහණෙනි, ගඩොළු බැම්ම ගල්බැම්ම දඬුබැම්ම යන තුන් බැඳුම් අනුදනිමි''යි වදළසේක.

නැඟෙන්නාහු පෙළෙත්.

''මහණෙනි, ගඩොළුහිණ, ගල්හිණ, දඬුහිණ යන තුන් හිණි-පෙත් අනුදනිමි''යි වදළසේක.

නැඟෙන්නාහු ඇදවැටෙත්.

''මහණෙනි, අත්වැල අනුදනිමි''යි වදළ සේක.

පැන්හලෙහි තණ රොඩු වැටෙයි....

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති."

පානීයභාජනං න සංවිජ්ජති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ පානීයසඞ්ඛං පානීයසරාවකන්ති."

23. තෙන ඛො පන සමයෙන විහාරා අපරික්ඛිත්තා හොන්ති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ පරික්ඛිපිතුං තයො පාකාරෙ ඉට්ඨකාපාකාරං සිලාපාකාරං දරුපාකාරන්ති."

කොට්ඨකො න හොති.

"අනුජානාමි භික්ඛවෙ කොට්ඨකන්ති."

කොට්ඨකො නීචවත්ථුකො හොති. උදකෙන ඔත්ථරීයති -පෙ-

"අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති."

කොට්ඨකස්ස කවාටං න හොති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ කවාටං පිට්ඨසඞ්ඝාටං උදුක්ඛලිකං උත්තරපාසකං අග්ගළවට්ටිකං කපිසීසකං සූචිකං ඝටිකං තාලච්ඡිද්දං ආවිඤ්ඡනච්ඡිද්දං ආවිඤ්ඡනරජ්ජුන්ති."

කොට්ඨකෙ තිණචුණ්ණං පරිපතති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකන්ති."

24. තෙන ඛො පන සමයෙන පරිවෙනං චික්ඛල්ලං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ මරුම්බං උපකිරිතුන්ති."

න පරියාපුණන්ති.

"මහණෙනි, ලී අතුරා ඇතුළත පිටත බදම ගසා සුදුපැහැ කළු පැහැ ගුරුපිරියම් මල්කම් ලියකම් මුවරදත් පස්වනක් පැහැ කරන්නට අනුදනිමි. සිවුරු වනන හුණදණ්ඩ ද සිවුරු වනන ලනුව ද අනුදනිමි"යි වදාළසේක.

පැන් බඳුනෙක් නැත ...

"මහණෙනි, පැන්සක ද පැන්කොරහ ද අනුදනිමි"යි වදාළසේක.

23. එ සමයෙහි විහාරයෝ (පවුරු ආදියක්) වටා නො ලන ලද්දහු වෙත් ...

"මහණෙනි, ගඩොළුපවුර ගල්පවුර දඬුපවුර යන තුන් පවුරු අනුදනිමි"යි වදාළසේක.

(විහාරයට) කොටුවෙක් නො වෙයි.

"මහණෙනි, කොටුවක් අනුදනිමි"යි වදාළසේක.

කොටුව මිටිබිමැත්තේ වෙයි. වතුරෙන් යටවෙයි ...

"මහණෙනි, කොටුව උස්බිම ඇතියක් කරන්නට අනුදනිමි"යි වදාළසේක.

කොටුවට දොරපළුවෙක් නො වෙයි...

"මහණෙනි, දොරපළුව ද දොරබාව ද වටෙවුලීය ද උතුරුලිය ද දොරපොල්ල ද අගුළුකණුව ද යතුරුලිය ද තරංකය ද කෙසිසිදුර ද රැහැන බහාලන සිදුර ද අදනා රැහැන ද අනුදනිමි"යි වදාළ සේක.

කොටුවෙහි තණරොඩු වැටෙයි ...

"මහණෙනි, දඬු අතුරා ඇතුළත පිටත බදම ආලිප්ත කරන්නට (එහි) සුදුපැහැ කළුපැහැ ගුරුපිරියම් මල්කම් ලියකම් මුවරදත් පංචවර්ණය යන මෙයින් පැහැපත් කරන්නට අනුදනිමි"යි වදාළ සේක.

24. එ සමයෙහි පිරිවෙන (පවුරට ඇතුළත වෙහෙර අවට බිම් පෙදෙස) මඩ සහිත වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ ...

"මහණෙනි, බොරළු විසුරුවන්නට අනුදනිමි"යි වදාළසේක.

එය නො පිරිමැසේ.

"අනුජානාමි භික්ඛවෙ පදරසිලං නික්ඛිපිතුන්ති."

උදකං සන්තිට්ඨති. –පෙ–

"අනුජානාමි භික්ඛවෙ උදකනිද්ධමනන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ පරිවෙණෙ තහං තහං අග්ගිට්ඨානං කරොන්ති. පරිවෙණං උක්ලාපං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ එකමන්තං අග්ගිසාලං කාතුන්ති."

අග්ගිසාලා නීචවත්ථුකා හොති. උදකෙන ඔත්ථරීයති. –පෙ–

"අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුන්ති."

චයො පරිපතති. –පෙ–

"අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ ඉට්ඨකාචයං සිලාචයං දාරුචයන්ති."

ආරොහන්තා විහඤ්ඤන්ති. –පෙ–

"අනුජානාමි භික්ඛවෙ තයො සොපානෙ ඉට්ඨකාසොපානං සිලාසොපානං දාරුසොපානන්ති."

ආරොහන්තා පරිපතන්ති. –පෙ–

"අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහන්ති."

අග්ගිසාලාය කවාටං න හොති. –පෙ–

"අනුජානාමි භික්ඛවෙ කවාටං පිට්ඨසඞ්ඝාටං උදුක්ඛලිකං උත්තරපාසකං අග්ගළවට්ටිකං කපිසීසකං සූචිකං ඝටිකං තාළච්ඡිද්දං ආවිඤ්ඡනච්ඡිද්දං ආවිඤ්ඡනරජ්ජුන්ති."

අග්ගිසාලාය තිණචුණ්ණං පරිපතති, –පෙ–

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්ඵෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං චීවරවංසං චීවරරජ්ජුන්ති."

25. තෙන ඛො පන සමයෙන ආරාමො අපරික්ඛිත්තො හොති. අජකා'පි පසුකා'පි උපරොපෙ විහෙඨෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පරික්ඛිපිතුං තයො වටෙ[1] වෙළුවටං කණ්ටකිවටං[2] පරිඛන්ති."

කොට්ඨකො න හොති. තථෙව අජකා'පි පසුකා'පි උපරොපෙ විහෙඨෙන්ති –පෙ–

1. වාටෙ – සිමු
2. වෙළුවාටං කණ්ටකවාටං – සිමු කණ්ටකවච – ස්‍යා, මජසං

"මහණෙනි, ගල්පුවරු බහාලන්නට අනුදනිමි"යි වදාළසේක.

දිය රැඳී සිටී...

"මහණෙනි, සොරොව්වක් අනුදනිමි"යි වදාළසේක.

එ සමයෙහි මහණහු පිරිවෙනෙහි (පවුරටත් වෙහෙරටත් අතර බිම් පෙදෙසෙහි) ඒ ඒ තැන ලිප් තනත්. පිරිවෙන කසළ සහිත වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, එක් පසෙක ගිනිහලක් කරන්නට අනුදනිමි"යි වදාළසේක.

ගිනිහල පහත් බිමක් ඇත්තේ වෙයි. වතුරෙන් යටවෙයි...

"මහණෙනි, උස්බිම ඇතියක් කරන්නට අනුදනිමි"යි වදාළසේක.

බැම්ම කැඩී වැටෙයි...

"මහණෙනි, ගඩොළුබැම්ම ගල්බැම්ම දඬුබැම්ම යන තුන් බැඳුම් අනුදනිමි"යි වදාළසේක.

නැඟෙන්නාහු පෙළෙත්...

"මහණෙනි, ගඩොළුහිණ ගල්හිණ දඬුහිණ යන තුන් හිණිපෙත් අනුදනිමි"යි වදාළසේක.

නැඟෙන්නාහු ඇදීවැටෙත්...

"මහණෙනි, අත්වැල අනුදනිමි"යි වදාළසේක.

ගිනිහලට දෙරපළුවෙක් නැත...

"මහණෙනි, දෙරපළුව දෙරබාව වටෙවුලීය උතුරුලීය දෙරපොල්ල අගුළුකණුව යතුරුලීය තරංකය කෙයිසිදුර රැහැන්සිදුර අදනා රැහැන යන මේ දෑ අනුදනිමි"යි වදාළසේක.

ගිනිහලෙහි තණරොඩු වැටේ.

"මහණෙනි, සනදඬු යොද පියස්ස සාද ඇතුළත පිටත බදම ආලේප කරන්නට සුදුපැහැ කළුපැහැ ගුරුපිරියම මල්කම් ලියකම් මෝරුදත් සිතුවම් පස්පැහැති වර්ණ යෙදීම සිවුරු උණදණ්ඩ සිවුරුවතන ලනුව යන මේ දෑ අනුදනිමි"යි වදාළසේක.

25 එ සමයෙහි ආරාමය (විහාර වත්ත) නො පිරිකෙවුණේ (වටාවූ ආවරණයක් නැත්තේ) වෙයි. එළුවෝ ද ගවයෝ ද මල්පැල පෙළත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, හුණවැට ද වැටකේවැට ද අගල ද යන ඇවුරුම් තුන අනුදනිමි"යි වදාළසේක.

ආරාම කොටුවෙක් නො වෙයි. පළමු සේ ම එළුවෝ ද ගවයෝ ද මල්පැල පෙළත්...

"අනුජානාමි භික්ඛවෙ කොට්ඨකං ආපෙසිං යමකකවාටං තොරණං පලිඝන්ති."

කොට්ඨකෙ තිණචුණ්ණං පරිපතති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකන්ති."

ආරාමො චික්ඛල්ලො හොති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ මරුම්බං උපකිරිතුන්ති."

න පරියාපුණන්ති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ පදරසිලං නික්ඛිපිතුන්ති."

උදකං සන්තිට්ඨති. -පෙ-

"අනුජානාමි භික්ඛවෙ උදකනිද්ධමනන්ති."

26. තෙන ඛො පන සමයෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො සඞ්ඝස්ස අත්ථාය සුධාමත්තිකාලෙපනං පාසාදං කාරාපෙතුකාමො හොති. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කින්නු ඛො භගවතා ඡදනං අනුඤ්ඤාතං කිං අනනුඤ්ඤාතන්ති". භගවතො එතමත්ථං ආරොචෙසුං.

අනුජානාමි භික්ඛවෙ පඤ්ච ඡදනානි ඉට්ඨකාඡදනං සිලාඡදනං සුධාඡදනං තිණච්ඡදනං පණ්ණච්ඡදනන්ති."

පඨමභාණවාරං.

"මහණෙනි, කොටුව ද හිඳිකඩ ද දෙබෑ දෙරපළු ද තොරණ ද රෝද කඩුල්ල ද අනුදනිමි"යි වදළසේක.

දෙර කොටුවෙහි තණරොඩු වැටෙයි ...

"මහණෙනි, සනැඩු අතුරා ඇතුළත පිටත බදම ආලිප්ත කරන්නට ද එහි සුදුපැහැ කළුපැහැ ගුරුපිරියම් මල්කම් ලියකම් මුවරදත් සටහන් පස්වනක් පැහැ සිත්තම් කරන්නට ද අනුදනිමි"යි වදළසේක.

අරම මඩ සහිත වේ. ...

"මහණෙනි, බොරළු විසුරුවන්නට අනුදනිමි"යි වදළසේක.

එයින් තෘප්ත නො වෙත්...

"මහණෙනි, ගල්පුවරු අතුරන්නට අනුදනිමි"යි වදළසේක.

දිය රැඳෙයි. ...

"මහණෙනි, සොරොව්ව අනුදනිමි"යි වදළසේක.

26. එ සමයෙහි වනාහි මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙම සංඝයාගේ ප්‍රයෝජන පිණිස සුදුහුණු ද මැටි ද මිශ්‍ර කොට තැනූ බදම ආලේපය ඇති ප්‍රාසාදයක් කරවනු කැමැත්තේ වෙයි. එ කලැ මහණුනට "භාග්‍යවතුන් වහන්සේ විසින් කවර සෙවෙනි-යෙක් අනුදන්නා ලද ද, කවර සෙවෙනියෙක් නො අනුදන්නා ලද දැ"යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, උළුසෙවිල්ල ද ගල්පුවරු සෙවිල්ල ද හුණුබදම සෙවිල්ල ද තණසෙවිල්ල ද කොළසෙවිල්ල ද යන සෙවෙනි පස අනුදනිමි"යි වදළසේක.

## පළමු බණවර යි.

27. තෙන ඛො පන සමයෙන අනාථපිණ්ඩිකො ගහපති රාජගහකස්ස සෙට්ඨිස්ස භගිනිපතිකො හොති. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති රාජගහං අගමාසි කෙනචිදෙව කරණීයෙන. තෙන ඛො පන සමයෙන රාජගහකෙන සෙට්ඨිනා ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතො හොති. අථ ඛො රාජගහකො සෙට්ඨි දාසෙ ච කම්මකරෙ ච ආණාපෙසි “තෙන හි භණෙ කාලස්සෙව උට්ඨාය යාගුයො පචථ, භත්තානි පචථ, සූපානි සම්පාදෙථ, උත්තරිභඞ්ගානි සම්පාදෙථා”ති.

අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස එතදහොසි: “පුබ්බෙ ඛ්වායං ගහපති මයි ආගතෙ සබ්බකිච්චානි නික්ඛිපිත්වා මමඤ්ඤෙව සද්ධිං පටිසම්මොදති. සො'දානායං වික්ඛිත්තරූපො දාසෙ ච කම්මකරෙ ච ආණාපෙසි 'තෙන හි භණෙ කාලස්සෙව උට්ඨාය යාගුයො පචථ භත්තානි පචථ, සූපානි සම්පාදෙථ, උත්තරිභඞ්ගානි සම්පාදෙථා'ති. කින්නු ඛො ඉමස්ස ගහපතිස්ස ආවාහො වා භවිස්සති විවාහො වා භවිස්සති, මහායඤ්ඤො වා පච්චුපට්ඨිතො, රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙනා”ති

අථ ඛො රාජගහකො සෙට්ඨි දාසෙ ච කම්මකරෙ ච ආණාපෙත්වා යෙන අනාථපිණ්ඩිකො ගහපති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අනාථපිණ්ඩිකෙන ගහපතිනා සද්ධිං පටිසම්මොදිත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජගහකං සෙට්ඨිං අනාථපිණ්ඩිකො ගහපති එතදවොච: “පුබ්බෙ ඛො ත්වං ගහපති මයි ආගතෙ සබ්බකිච්චානි නික්ඛිපිත්වා මමඤ්ඤෙව සද්ධිං පටිසම්මොදසි. සො'දානි ත්වං වික්ඛිත්තරූපො දාසෙ ච කම්මකරෙ ච ආණාපෙසි 'තෙන හි භණෙ කාලස්සෙව උට්ඨාය යාගුයො පචථ, භත්තානි පචථ, සූපානි සම්පාදෙථ, උත්තරිභඞ්ගානි සම්පාදෙථා'ති. කින්නු ඛො තෙ ගහපති ආවාහො වා භවිස්සති, විවාහො වා භවිස්සති, මහායඤ්ඤො වා පච්චුපට්ඨිතො, රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙනා”ති.

“න මෙ ගහපති ආවාහො වා භවිස්සති විවාහො වා. න පි රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙන. අපි ච මෙ මහායඤ්ඤො පච්චුපට්ඨිතො. ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතො”ති.

27. එ සමයෙහි අනේපිඬු සිටු තෙම රජගහ නුවර සිටුහට සුහුරුබඩු වෙයි. එ කලැ කිසි කටයුත්තෙකින් රජගහ නුවර ගියේ ය. එ සෙමෙහි වූ කලි රජගහ සිටුහු විසින් සෙට දවසට බුදුපාමොක් මහසඟ නිමැතුණේ වෙයි. ඉක්බිති රජගහසිටු තෙම ''එසේ නම් සඟයෙනි, කලින් ම නැඟී සිට කැඳ පිසවු, බත් පිසවු, සූප පිළියෙල කරවු, අවුළුපත් පිළියෙල කරවු''ය යි දසයනට ද කම්කරුවනට ද අණ කෙළේය.

එ විට අනේපිඬු සිටුහට, ''පෙර දවස්හි වූ කලි මෙ ගැහැවි මා ආ විට සියලු කටයුතු තබා මා හා ම (පිය බස් බෙණෙමින්) සතුටු වෙයි. මෙ තෙම දූන් කලබල අයුරු ඇත්තේ දසයන් ද කම්කරුවන් ද බණවා, ''එසේ වී නම්, සඟයෙනි, කලින් ම නැඟී සිට කැඳ පිසවු, බත් පිසවු, සූප පිළියෙල කරවු, අවුළුපත් පිළියෙල කරවු''යැ යි ඇණැවී ය. කිමෙක් ද මේ ගැහැවිහුගේ ගෙට ආවාහයෙක් හෝ වන්නේ ද? (මෙ ගෙයින්) විවාහයෙක් හෝ වන්නේ ද? මහා යඥයෙක් හෝ එළැඹැ සිටියේ ද? බල සෙන් සහිත මගධෙශ්වර සෙනිය බිම්බිසාර රජ සෙට දවසට නිමතන ලදුයේ හෝ වේ දූ''යි මේ සිත විය.

ඉක්බිති රජගහ සිටු දසයන් ද කම්කරුවන් ද අණවා අනේපිඬු සිටු වෙත ආයේ ය. අවුත් අනේපිඬු සිටු හා සතුටු විය. සතුටු ව පසෙක ඉඳ ගත්තේ ය. (එසේ) පසෙක හිඳගත් රජගහ සිටුහට අනේපිඬු සිටු තෙම මෙ බස් පැවැසී ය: ගැහැවියනි, පෙර දවස්හි මා ආකල්හි තෙපි සියලු කටයුතු තබා මා හා ම (පිළිසඳර කතා කොට) සතුටු වහු. ඒ තෙපි දූන් කලබල වූ අයුරු ඇත්තහු දසයන් ද කම්කරුවන් ද බණවා ''එසේ වී නම් සඟයෙනි, කලින් ම නැඟී සිට කැඳ පිසවු, බත් පිසවු, සූප පිළියෙල කරවු· අවුළුපත් පිළියෙල කරවු යැ''යි අණ කළා හු ය. කිමෙක් ද ගැහැවියනි, තොපගේ ආවාහයෙක් හෝ වන්නේ ද? විවාහයෙක් හෝ වන්නේ ද? මහායඥයෙක් හෝ එළැඹැ සිටියේ ද? බලසෙන් සහිත මගධෙශ්වර සෙනිය බිම්බිසාර රජ සෙට දවසට නිමතන ලද්දේ හෝ වේද'' යනු ය.

''ගැහැවියෙනි, මගේ ගෙහි ආවාහයෙක් හෝ නො වන්නේ ය. විවාහයෙක් හෝ නො වන්නේ ය. බලසෙන් සහිත මගධෙශ්වර සෙනිය බිම්බිසාර රජ හෝ සෙට නිමතන ලද්දේ නො වෙයි. වැලි දූ මහායාගයෙක් එළැඹැ සිටියේ ය. සෙට දවසට බුද්ධප්‍රමුඛ සංඝ තෙමේ නිමතන ලද්දේ වේ'' යැ යි රජගහ සිටු කී ය.

28. "බුද්ධො'ති ත්වං ගහපති වදෙසී"ති.

"බුද්ධො' ත්‍යාහං ගහපති වදාමී"ති.

"බුද්ධො'ති ත්වං ගහපති වදෙසී"ති.

"බුද්ධො' ත්‍යාහං ගහපති වදාමී"ති.

"බුද්ධො'ති ත්වං ගහපති වදෙසී"ති.

"බුද්ධො' ත්‍යාහං ගහපති වදාමී"ති.

"ඝොසො පි ඛො එසො ගහපති දුල්ලභො ලොකස්මිං යදිදං 'බුද්ධො'ති. සක්කා නු ඛො ගහපති ඉමං කාලං තං භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං අරහන්තං සම්මාසම්බුද්ධන්ති".

"අකාලො ඛො ගහපති ඉමං කාලං තං භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං අරහන්තං සම්මාසම්බුද්ධං. ස්වෙ'දානි ත්වං කාලෙන තං භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සසි අරහන්තං සම්මා-සම්බුද්ධන්ති."

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති ස්වෙ'දානාහං කාලෙන තං භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සාමි අරහන්තං සම්මාසම්බුද්ධන්ති බුද්ධගතාය සතියා නිපජ්ජිත්වා රත්තියා සුදං තික්ඛත්තුං උට්ඨාසි පභාතං මඤ්ඤමානො. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන සීතවනද්වාරං[1] තෙනුපසඞ්කමි. අමනුස්සා ද්වාරං විවරිංසු. අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නගරම්හා නික්ඛන්තස්ස ආලොකො අන්තරධායි. අන්ධකාරො පාතුරහොසි. භයං ඡම්භිතත්තං ලොමහංසො උදපාදි. තතො ව පුන නිවත්තිතුකාමො අහොසි.

අථ ඛො සීවකො යක්ඛො අන්තරහිතො සද්දමනුස්සාවෙසි:

"සතං හත්ථි සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසි"න්ති.

අභික්කම ගහපති, අභික්කම ගහපති. අභික්කන්තං තෙ සෙය්‍යො නො පටික්කන්තන්ති.

අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස අන්ධකාරො අන්තරධායි, ආලොකො පාතුරහොසි, යං අහොසි භයං ඡම්භිතත්තං ලොම-හංසො සො පටිප්පස්සම්භි.

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස ආලොකො අන්තරධායි, අන්ධකාරො පාතුරහොසි. භයං ඡම්භිතත්තං ලොමහංසො උදපාදි. තතො'ව පුන නිවත්තිතුකාමො අහොසි. තතියම්පි ඛො සීවකො යක්ඛො අන්තරහිතො සද්දමනුස්සාවෙසි:

සතං හත්ථි -පෙ- සෙය්‍යො නො පටික්කන්තන්ති.

1. සීවකද්වාරං - සීමු.

28. "ගැහැවියනි, 'බුද්ධ' යැ'යි කියවු ද යි අනේපිඬු සිටු කී ය.

"එසේ ය, ගැහැවියනි, 'බුද්ධ' යැ යි කියමි"යි රජගහසිටු කීය.

"ගැහැවියනි, 'බුද්ධ'යැ යි කියවු ද"යි දෙවෙනි වරත් අනේ-පිඬු සිටු කී ය.

"එසේ ය, ගැහැවියනි, 'බුද්ධ'යැ යි කියමි"යි දෙවෙනි වරත් රජගහසිටු කී ය.

"ගැහැවියනි, 'බුද්ධ'යැ යි කියවු ද යි තෙවෙනි වර ද අනේපිඬු සිටු කී ය.

"එසේ ය ගැහැවියනි, 'බුද්ධ'යැ යි කියමි"යි තෙවෙනි වරත් රජගහසිටු කී ය.

"ගැහැවියනි, ලොවැ මේ 'බුද්ධ' යන ශබ්දය පවා දුර්ලභ ය. ගැහැවියනි, ඒ භගවත් අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දක්නට එළැඹෙන්නට මෙ වේලේ හැකි ද"යි අනේපිඬු සිටු කී ය.

"ගැහැවියනි, ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දකින්නට එළැඹෙන්නට මේ නො කල් ය. සෙට ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දක්නට සුදුසු කල්හි ඔබ උන්වහන්සේ කරා යන්නැ"යි රජගහසිටු කී ය.

ඉක්බිති අනේපිඬු සිටු සෙට මම ඒ භගවත් අර්හත් සම්‍යක්-සම්බුද්ධයන් වහන්සේ දකින්නට යන්නෙමි"යි බුදුරජුන් අරමුණු කොට පැවැති සිහියෙන් යුතු ව වැදහෙව රෑ තුන් යලක් ම පහන් වූයේ වනැ යි හඟිනුයේ නැගී සිටියේ ය. ඉක්බිති අනේපිඬු සිටු ශීතවනද්වාරය කරා එළැඹියේ ය. අමනුෂ්‍යයෝ දොර විවරකළහ. ඉක්බිති අනේපිඬු සිටු නුවරින් නික්මුණු වේලෙහි එළිය නැතිවිය. අඳුර පහළ විය. බිය ද තැතිගැන්ම ද ලොමුදහගැන්ම ද උපන. යළි එතැනින් ම පෙරළා යනු කැමැති විය. එ විට සීවක යක් තෙම නොපෙනී සිටියේ.

> "ඇත්තු සියදහසෙක් ද අස්සු සියදහසෙක් ද මහඟු අසුන් යෙදූ රිය සියදහසක් ද පළන් මිණි කොඬොල් ඇති කන්‍යාවෝ සිය දහසෙක් ද යන මොහු එක් පදව්‍යතිහාරයෙක (පිය වරෙක) සොළොස්වන කලාව ද නො අගිත් ය"යි.

"ගැහැවිය ඉදිරියට යන්න, ගැහැවිය, ඉදිරියට යන්න. ඉදිරියට යෑම උතුම්, පෙරළා යෑම උතුම් නො වේ" යැ යි හඬක් ඇස්වී ය,

එ කල අනේපිඬු සිටුහට අඳුර නැතිවිය, එළිය පහළ විය. යම් බියෙක් තැතිගැන්මෙක් ලොමුදහගැන්මෙක් වී ද එය සන්හිඳිණ.

දෙවෙනි වර ද... තෙවෙනි වර ද අනේපිඬු සිටුහට එළිය අතුරුදහන් විය. අඳුර ඇති විය. බිය ද තැතිගැන්ම ද ලොමුදහ ගැන්ම ද ඇති විය. යළි එතැනින් ම පෙරළා යනු කැමැති විය. තෙවෙනි වර ද සීවක යක් තෙම නොපෙනී සිටියේ "ඇත්තු සිය දහසක් ද... පෙරළා යෑම උතුම් නොවේ යැ"යි හඬ ඇස්වී ය.

තතියම්පි ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස අන්ධකාරො අන්තරධායි, ආලොකො පාතුරහොසි. යං හොසි භයං ඡම්භිතත්තං ලොමහංසො සො පටිප්පස්සම්භි. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන සීතවනං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය අජ්ඣොකාසෙ චඞ්කමති. අද්දසා ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන චඞ්කමා ඔරොහිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

29. නිසජ්ජ ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච 'එහි සුදත්තා'ති. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති 'නාමෙන මං භගවා ආලපතී'ති හට්ඨො උදග්ගො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච 'කච්චි භන්තෙ භගවා සුඛමසයිත්ථා'ති.

''සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො
යො න ලිප්පති කාමෙසු සීතිභූතො නිරූපධි.

සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො''ති.

අථ ඛො භගවා අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස ආනුපුබ්බිකථං[1] කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි අනාථපිණ්ඩිකං ගහපතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි 'දුක්ඛං සමුදයං නිරොධං මග්ගං.' සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය එවමෙව අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.'

1. අනුපුබ්බිකථං – මජසං,

තෙවෙනි වර ද අනේපිඬු සිටුහට අඳුර අතුරුදහන් විය. එළිය පහළ විය. යම් බියෙක් තැතිගැන්මෙක් ලොමුදහගැන්මෙක් වී ද එය සන්හිඳිණ. ඉක්බිති අනේපිඬු සිටු තෙම සීතවනය කරා ගියේ ය. එ සමයෙහි වූ කලී භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයමෙහි නැඟී සිට එළිමහනේ සක්මන් කරන සේක. භාග්‍යවතුන් වහන්සේ දුරින් ම එන අනේපිඬු සිටුහු දුටුසේක. දැක සක්මන් මළුවෙන් බැස පැනැවුණු අස්නෙහි වැඩහුන්සේක.

29. භාග්‍යවතුන් වහන්සේ අස්නැ වැඩ හිඳ 'සුදත්තය, මෙහි එව'යි අනේපිඬු සිටුහට අඬගා වදළසේක. එවිට අනේපිඬු සිටු තෙම 'භාග්‍යවතුන් වහන්සේ නමින් (නම කියා) මා අමතන සේකැ'යි තුටුපහටු වූයේ ඔද වැඩීගිය සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ ඔබ පාමුලැ වැටී හිස නමා වැඳ, "වහන්ස, කිමෙක් ද, භාග්‍යවතුන් වහන්සේ සුවසේ සැතැපුණු සේක් දෝ''යි කී ය.

"යමෙක් කාමයන්හි නො ඇලෙයි ද කෙලෙස් තැවුම් නැති-යෙන් සිසිල් වූයේ වේ ද, කෙලශොපධි රහිත වේ ද කෙලෙස් පිරිනිවනින් පිරිනිවි ඒ බාහිතපාපී පුද්ගල තෙමේ හැම කල්හි එකාන්තයෙන් සුවසේ ශයනය කෙරෙයි.

හෙ තෙම සියලු ආසක්තීන් (තෘෂ්ණාවන්) සිඳ සිතෙහි කෙලෙස් රිදුම් පහකොට සන්සුන් වූයේ සිතේ සන්සිඳීමට පැමිණ සුවසේ සැතැපේ''යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටුහට 'දනකථා, ශීලකථා ස්වර්ගකථා කාමයන්ගේ ආදීනව, කාමයන්ගේ ලාමක බව, කාමයන්ගේ කිලිටි බව, කාමයන්ගෙන් නික්මීමේ අනුසස් ද යන අනුපූර්වී කථාව (දනාදී පිළිවෙළින් කියන ධර්මකථාව) පැවැසූ සේක. යම් විටෙක භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටුහු (කෙලෙස් යටපත් වීමෙන්) නීරෝග සිතැත්තහු, මොලොක් සිතැත්තහු කාමච්ඡන්දදි නීවරණ යටපත්ව ගිය සිතැත්තහු ඔදවැඩි සිතැත්තහු, පහන් සිතැත්තහු දත්සේක් ද, එ කල්හි දුක ද දුඃඛසමුදය ද නිරොධය ද මාර්ගය ද යන බුදුවරුන්ගේ යම් සාමුක්කංසික දෙශනාවෙක් වේ ද එය පැවැසූසේක. පහ වූ කළු බව ඇති පිරිසිදු වස්ත්‍රයෙක් යම්සේ මනාකොට ම රඳන් උරා ගන්නේ ද, එසේ ම අනේපිඬු සිටුහට එ අස්නෙහි දී ම 'යම් කිසිවෙක් ප්‍රත්‍යයෙන් හටගන්නාසුලු ද ඒ සියල්ල නැසෙන සුලුයැ'යි කෙලෙස් රජසින් තොර, පහවූ කෙලෙස් මලැති දහම් ඇස (සොවන් මඟ නුවණ) පහළ විය.

30. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: ‘‘අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතු ච මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා’’ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අස්සොසි ඛො රාජගහකො සෙට්ඨි අනාථපිණ්ඩිකෙන කිර ගහපතිනා ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතොති. අථ ඛො රාජගහකො සෙට්ඨි අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: ‘‘තයා කිර ගහපති ස්වාතනාය බුද්ධපමුඛො[1] සඞ්ඝො නිමන්තිතො. ත්වඤ්චාසි ආගන්තුකො. දෙමි තෙ ගහපති වෙය්‍යායිකං යෙන ත්වං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස භත්තං කරෙය්‍යාසී’’ති. ‘‘අලං ගහපති. අත්ථි මෙ වෙය්‍යායිකං යෙනාහං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස භත්තං කරිස්සාමී’’ති.

31. අස්සොසි ඛො රාජගහකො නෙගමො ‘‘අනාථපිණ්ඩිකෙන කිර ගහපතිනා ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතො’’ති. අථ ඛො රාජගහකො නෙගමො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච ‘‘තයා කිර ගහපති ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතො. ත්වඤ්චාසි ආගන්තුකො. දෙමි තෙ ගහපති වෙය්‍යායිකං යෙන ත්වං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස භත්තං කරෙය්‍යාසී’’ති. ‘‘අලං අය්‍යො, අත්ථි මෙ වෙය්‍යායිකං යෙනාහං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස භත්තං කරිස්සාමී’’ති.

අස්සොසි ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ‘‘අනාථපිණ්ඩිකෙන කිර ගහපතිනා ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතො’’ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච ‘‘තයා කිර ගහපති ස්වාතනාය බුද්ධපමුඛො සඞ්ඝො නිමන්තිතො. ත්වඤ්චාසි ආගන්තුකො, දෙමි තෙ ගහපති වෙය්‍යායිකං යෙන ත්වං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස භත්තං කරෙය්‍යාසී’’ති. ‘‘අලං දෙව, අත්ථි මෙ වෙය්‍යායිකං යෙනාහං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස භත්තං කරිස්සාමී’’ති.

1. බුද්ධප්පමුඛො – මජසං

30. ඉක්බිත්තෙන් අනේපිඩු සිටු තෙම දුටු ආයඝීසත්‍යධර්ම ඇත්තේ නුවණින් පැමිණි ආයඝීසත්‍යධර්ම ඇත්තේ, දන්නා ලද ආයඝීසත්‍ය ධර්ම ඇත්තේ නුවණින් බැසගත් ආයඝීසත්‍ය ධර්ම ඇත්තේ, තරණය කළ සැක ඇත්තේ, පහවූ කථංකථා (සැක) ඇත්තේ, ශාස්තෘ ශාසනයෙහි විශාරද බවට පැමිණියේ පරප්‍රත්‍යය නැත්තෙක් වූයේ භාග්‍යවතුන් වහන්සේට මෙ බස් පැවැසී ය: "වහන්ස, අභිකාන්ත ය. වහන්ස, අභිකාන්තය. වහන්ස, යටිකුරු කොට තබන ලද්දක් යම්සේ උඩුකුරු කරන්නේ ද වැසුණු දෙයක් විවෘත කරන්නේ ද මංමුළාවූවකුට මඟ කියන්නේ ද ඇසැතියන් රූප දකිති යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ ද එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පවසන ලද්දේ ය. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද සංඝයා ද සරණ යමි. අදින් ඉදිරියට මා දිවිහිම් කොට සරණ ගිය උවසකු කොට භාග්‍යවතුන් වහන්සේ මා සලකනසේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෙට දවසට සංඝයා සහිත ව මාගේ බත ඉවසන සේක්වා" යනු ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවසූසේක. ඉක්බිති අනේපිඩු සිටු තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මැගියේ ය.

රජගහ සිටු තෙම අනේපිඩු සිටුහු විසින් සෙට දවසට බුදුපාමොක් සංඝයා නිමතන ලද්දේ ලැයි ඇසී ය. ඉක්බිති රජගහ සිටු "ගැහැවියනි, ඔබ විසින් සෙට දිනට බුදුපාමොක් සඟ නිමැතිණි ල.' ඔබ අමුත්තෝ වෙති. ගැහැවියනි, ඔබ බුදුපාමොක් සඟනට බත් පිළියෙළ කරන්නාහු ද, එසේ වූ වියදම ඔබට දෙමි"යි අනේපිඩු සිටුහට කී ය. "කම් නැත, ගැහැවියනි, යමෙකින් බුදුපාමොක් සඟනට බත් කරන්නෙම් ද, එයට වියදම මට ඇතැ"යි අනේපිඩු සිටු කී ය.

31. රජගහපුර නියම්ගම් දෙටු තෙමේ ද "අනේපිඩු සිටුහු විසින් සෙට දවසට බුදුපාමොක් සඟ නිමැතිණැ"යි ඇසූයේ ම ය. ඉක්බිති රජගහපුර නිගමාධිපති තෙම අනේපිඩු සිටුහට "ගැහැවියනි, ඔබ විසින් සෙට දවසට බුදුපාමොක් සඟ නිමතන ලද්දේ ල. ඔබ අමුත්තෝ වෙති. ගැහැවියනි, බුදුපාමොක් සඟනට බත පිළියෙළ කරනුවට වියදම ඔබට දෙමි"යි කී ය. "ආයඝීයෙනි, අනාවශ්‍යක ය. බුදුපාමොක් සඟනට බත පිළියෙළ කරවන්නට මට වියදම ඇතැ"යි අනේපිඩු සිටු කී ය.

මගධෙශ්වර සෙනිය බිම්බිසාර රජ ද "අනේපිඩු සිටුහු විසින් සෙට දවසට බුදුපාමොක් සඟ නිමතන ලද්දේ ල"යි ඇසී ය. ඉක්බිති මගධෙශ්වර සෙනිය බිම්බිසාර රජ "ගැහැවියනි, තොප විසින් සෙට දවසට බුදුපාමොක් මහසඟ නිමතන ලද්දේ ල. තෙපි අමුත්තෝ වෙති. බුදුපාමොක් සඟනට බත් පිළියෙළ කරනුවට යන වියදම තොපට දෙමි"යි අනේපිඩු සිටුහට කී ය. "දේවයිනි, ආවශ්‍යක නො වේ. බුදුපාමොක් සඟනට බත් පිළියෙළ කරනුවට වියදම මට ඇතැ"යි අනේපිඩු සිටු කී ය.

32. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති තස්සා රත්තියා අච්චයෙන රාජගහකස්ස සෙට්ඨිස්ස නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි "කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත"න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන රාජගහකස්ස සෙට්ඨිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවන්තං එතදවොච "අධිවාසෙතු මෙ භන්තෙ භගවා සාවත්ථියං වස්සාවාසං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති.

"සුඤ්ඤාගාරෙ ඛො ගහපති තථාගතා අභිරමන්ති"ති.

"අඤ්ඤාතං භගවා අඤ්ඤාතං සුගතා"ති.

අථ ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

33. තෙන ඛො පන සමයෙන අනාථපිණ්ඩිකො ගහපති බහුමිත්තො හොති බහුසහායො ආදෙය්‍යවචො.[1] අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති රාජගහෙ තං කරණීයං තීරෙත්වා යෙන සාවත්ථි තෙන පක්කාමි. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති අන්තරාමග්ගෙ මනුස්සෙ ආණාපෙසි "ආරාමෙ අය්‍යා කරොථ විහාරෙ පතිට්ඨාපෙථ. දානානි පට්ඨපෙථ. බුද්ධො ලොකෙ උප්පන්නො. සො ච මයා භගවා නිමන්තිතො ඉමිනා මග්ගෙන ආගච්ඡිස්සතී"ති. අථ ඛො තෙ මනුස්සා අනාථපිණ්ඩිකෙන ගහපතිනා උය්‍යොජිතා ආරාමෙ අකංසු, විහාරෙ පතිට්ඨාපෙසුං, දානානි පට්ඨපෙසුං.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති සාවත්ථිං ගන්ත්වා සමන්තා සාවත්ථිං අනුවිලොකෙසි. 'කත්ථ නු ඛො භගවා විහරෙය්‍ය යං අස්ස ගාමතො නාතිදූරෙ[2] නාච්චාසන්නෙ ගමනාගමනසම්පන්නං අත්ථිකානං අත්ථිකානං මනුස්සානං අභික්කමනීයං දිවා අප්පාකිණ්ණං[3] රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං විජනවාතං මනුස්සරාහසෙය්‍යකං පටිසල්ලානසාරුප්පන්ති'.

1. ආදෙය්‍යවාචො - සිමු.
2. නෙව අවිදූරෙ - සිමු.
3. අප්පකිණ්ණං - සිමු

32. ඉන් පසු අනේපිඩු සිටු තෙම ඒ රැය ඇවෑමෙන් රජගහ සිටුහුගේ ගෙහි ප්‍රණීත ඛාද්‍ය භොජ්‍ය පිළියෙළ කරවා "වහන්ස, දන් කාලය ය. බත් පිළියෙළ කොට නිමැවිණැ"යි භාග්‍යවතුන් වහන්සේට කාලය දන්වා යැවී ය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ පෙරවරු සෙමෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන රජගහ සිටු-හුගේ ගෙය කරා එළැඹි සේක. එළැඹ ප්‍රඥප්ත අස්නෙහි බික් සඟන හා වැඩහුන් සේක.

ඉක්බිති අනේපිඩු සිටු බුදුපාමොක් බික්සඟන ප්‍රණීත ඛාද්‍ය භොජ්‍යයෙන් සියතින් සතපා පවරවා භාග්‍යවතුන් වහන්සේ බොජුන් වැළැඳූ පාත්‍රයෙන් ඉවතට ගත් අතැති නියාව සලකා භාග්‍යවතුන් වහන්සේට එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නාවූ ම අනේපිඩුසිටු තෙම "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟන හා සැවැත්නුවර වස්වසනුවට මා කරන අයැදුම ඉවසන සේක්වා"යි කීයේ ය.

"ගැහැවියනි, තථාගතවරු ශුන්‍යාගාරයෙහි විසීම රිසි කෙරෙත්" යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

"භාග්‍යවතුන් වහන්ස, මට වැටහිණ. සුගතයන් වහන්ස, මට දැනිණැ"යි සිටු කී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනේපිඩු සිටුහට දැහැමි කථා-යෙන් කරුණු දක්වා කරුණු ගන්වා එහි උත්සාහවත් කොට එයින් සතුටු කොට හුනස්නෙන් නැඟී වැඩි සේක.

33. එ සමයෙහි වූකලි අනේපිඩු සිටු බොහෝ මිතුරන් ඇත්තේ බොහෝ යහළුවන් ඇත්තේ සෙස්සන් විසින් පිළිගතයුතු වචන ඇත්තේ වෙයි. එකල්හි අනේපිඩු සිටු රජගහනුවර ඒ කටයුතු නිමවා සැවැත්නුවර බලා නික්මිණ. ඉක්බිති අනේපිඩු සිටු මඟ අතර (ගම් නියම් ගම්හි වූ) මිනිසුන් බණවා "ආයර්‍යයෙනි, ආරාම කරවු. විහාර පිහිටුවවු. දන් පිළියෙළ කරවු. බුදුරජුහු ලොව උපන්හ. ඒ භගවත්හු මා විසින් නිමැතුණාහු මෙ මඟින් වඩනාහ"යි කී ය.

ඉක්බිති අනේපිඩු සිටු සැවැත් ගොස්, 'යමක් ගමට ඉතාදුරත් ඉතා ළඟත් නොවන්නේ ද යෑමට ඊමට පහසු ද (බුදුන් වඳනට බණ අසනුවට ය.) කැමැති මිනිසුන් විසින් එළැඹියැ හැකි වේ ද දහවල් ජනාකීර්ණ නො වේ ද, රෑ නිහඬ ද (නුවර හැසිරෙන රථ ආදියේ හඬ නො ඇසෙනුයෙන්) ඝොෂ රහිත ද ගැවැසෙන ජනයාගේ ශරීරවාතයෙන් විරහිත ද, මිනිසුන් හුදෙකලා කරන භාවනාදි ක්‍රියාවනට සුදුසු ද විවෙකයට යොග්‍ය ද එසේ වූ කවර නම් තැනෙක භාග්‍යවතුන් වහන්සේ විසියයුතු වන්නේ ද'යි සැවැත් නුවර හාත්පස පිරික්සා බැලී ය.

අද්දසා ඛො අනාථපිණ්ඩිකො ගහපති ජෙතස්ස රාජකුමාරස්ස[1] උය්‍යානං ගාමතො නෙව අවිදූරෙ නාච්චාසන්නෙ ගමනාගමනසම්පන්නං අත්ථිකානං අත්ථිකානං මනුස්සානං අභික්කමනීයං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං විජනවාතං මනුස්සරාහසෙය්‍යකං පටිසල්ලානසාරුප්පං. දිස්වාන යෙන ජෙතො රාජකුමාරො[2] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ජෙතං රාජකුමාරං[3] එතදවොච: "දෙහි මෙ අය්‍යපුත්ත උය්‍යානං ආරාමං කාතුන්ති."

"අදෙය්‍යො ගහපති ආරාමො අපි කොටිසන්ථරෙනා"ති.

"ගහිතො අය්‍යපුත්ත ආරාමො"ති.

"න ගහපති ගහිතො ආරාමො"ති.

"ගහිතො න ගහිතො"ති වොහාරිකෙ මහාමත්තෙ පුච්ඡිංසු. මහාමත්තා එවමාහංසු "යතො තයා අය්‍යපුත්ත අග්ඝො කතො, ගහිතො ආරාමො"ති.

34. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති සකටෙහි හිරඤ්ඤං නිබ්බාහාපෙත්වා ජෙතවනං කොටිසන්ථරං සන්ථරාපෙසි. සකිං නීහටං හිරඤ්ඤං ථොකස්ස ඔකාසස්ස කොට්ඨකසාමන්තා නප්පහොති. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති මනුස්සෙ ආණාපෙසි "ගච්ඡථ භණෙ, හිරඤ්ඤං ආහරථ. ඉමං ඔකාසං සන්ථරිස්සාමී"ති.

අථ ඛො ජෙතස්ස කුමාරස්ස එතදහොසි "න ඛො ඉදං ඔරකං භවිස්සති, යත්‍රායං ගහපති තාව බහුං හිරඤ්ඤං පරිච්චජතී"ති. අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච "අලං ගහපති, මා තං ඔකාසං සන්ථරාපෙසි. දෙහි මෙ එතං ඔකාසං. මමෙතං දානං භවිස්සතී"ති.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති "අයං ඛො ජෙතො රාජකුමාරො අභිඤ්ඤාතො ඤාතමනුස්සො. මහත්ථිකො[4] ඛො පන එවරූපානං ඤාතමනුස්සානං ඉමස්මිං ධම්මවිනයෙ පසාදො"ති තං ඔකාසං ජෙතස්ස රාජකුමාරස්ස පාදාසි. අථ ඛො ජෙතො රාජකුමාරො තස්මිං ඔකාසෙ කොට්ඨකං මාපෙසි.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති ජෙතවනෙ විහාරෙ කාරාපෙසි, පරිවෙණානි කාරාපෙසි, කොට්ඨකෙ කාරාපෙසි, උපට්ඨානසාලායො කාරාපෙසි, අග්ගිසාලායො කාරාපෙසි, කප්පියකුටියො කාරාපෙසි, වච්චකුටියො කාරාපෙසි, පස්සාවකුටියො කාරාපෙසි, චඞ්කමෙ කාරාපෙසි, චඞ්කමනසාලායො කාරාපෙසි, උදපානෙ කාරාපෙසි, උදපානසාලායො කාරාපෙසි, ජන්තාඝරෙ කාරාපෙසි, ජන්තාඝරසාලායො කාරාපෙසි, පොක්ඛරණියො කාරාපෙසි, මණ්ඩපෙ කාරාපෙසි.

1. ජෙතස්ස කුමාරස්ස - මජ්ඣං.
2. ජෙතො කුමාරො - මජ්ඣං.
3. ජෙතං කුමාරං - මජ්ඣං.
4. මහිද්ධිකො - සිමු.

අනේපිඬු සිටු තෙම ගමට ඉතා දුර නොවූ ඉතා ළඟ ද නො වූ ගමනාගමනයට පහසු වූ: (බුදුරජුන් දකිම් ආදිය) කැමැති කැමැති මිනිසුන් විසින් එළැඹිය හැකි වූ දහවල් ජනාකීර්ණ නොවූ, රාත්‍රියෙහි නිහඬ වූ නගර ඝොෂ රහිත වූ, ජනවාත විරහිත වූ, මිනිසුන්ගේ හුදෙකලාව කරන ක්‍රියාවනට යොග්‍ය වූ විවේක වාසයට සුදුසු වූ ජෙතරාජකුමාරයාගේ උයන දුටුයේ ය. දැක ජෙතරාජකුමාරයා කරා එළැඹියේ ය. එළැඹ ආයර්‍ය්‍යයෙනි, ආරාමයක් කරන්නට උයන මට දුනමැනැවැයි කීයේ ය.

"කහවණු සුලසින් ඇතිරීමෙනුදු උයන නො දිය හැක්කැ''යි ජෙත රාජකුමාර කී ය.

"ආයර්‍ය්‍යපුත්‍රය, ආරාමය (මා විසින්) ගන්නා ලදැ''යි සිටු කී ය.

"ගැහැවියෙනි, ආරාමය නො ගන්නා ලදැ''යි කුමර කී ය.

"ආරාමය ගන්නා ලද ද?' නො ගන්නා ලද දැ යි විනිශ්චයකාර මහඇමැත්තන් විචාළාහ.

"ආයර්‍ය්‍යපුත්‍රයෙනි, යම් හෙයකින් ඔබ විසින් අගය නියම කොට කියන ලද ද, එහෙයින් (සිටුහු විසින්) ආරාමය ගන්නා ලද්දේ යැ''යි ඇමැත්තෝ කීහ.

34. එයින් පසු අනේපිඬු සිටු ගැල්වලින් මසුරන් අදවා ජෙත-වනය (මසුරන්) සුලසින් සුලස ඇතිරවී ය. එක් වරක් ගෙනෙන ලද මසුරන් දොරකොටුව සමීපයේ ස්වල්ප අවකාශයකට ප්‍රමාණ නො වෙයි. (මදවෙයි) එකල්හි අනේපිඬු සිටු මිනිසුන් බණවා "සගයෙනි, මසුරන් ගෙනෙවු. මේ අවකාශය අතුරා වසාලන්නෙමි''යි ඇණවී ය.

එවිට ජෙතරාජකුමාරයාට "යම්හෙයකින් මේ ගැහැවි තෙම ඒ සා මහත් මසුරන් රැසක් පරිත්‍යාග කරන්නේ ද එ හෙයින් මෙ සුළු කාරියෙක් නො වන්නේ යැ''යි මේ සිත විය. ඉක්බිති හෙතෙම අනේපිඬු සිටුහට "ගැහැවියනි, අවශ්‍ය නැත. ඒ අවකාශය නො අතුරවන්න. ඒ අවකාශය මට දෙන්න. එය මගේ දනය වන්නේයැ''යි කී ය.

එවිට අනේපිඬු "මේ ජෙතරාජකුමාර තෙම (මහ ජනයා විසින්) මෙසෙයින් දන්නා ලද ප්‍රකට මිනිසෙකි. මෙබඳු ප්‍රකට මිනිසුන් මෙ සස්නෙහි පැහැදීම මහත් වැඩ සිදුකරන්නේ වේ'' යැ යි සිතා ඒ අවකාශ ප්‍රදේශය ජෙත රාජකුමාරයාට දුන්නේ ය. එයින් පසු ජෙතරාජකුමාර තෙම එ ඉඩම් කැබැල්ලෙහි දොරටු පහයක් තැනැවී ය.

ඉක්බිත්තෙන් අනේපිඬු සිටු ජෙතවනයෙහි විහාරයන් කැරැවිය. පිරිවෙන් කැරැවිය, දොරටු කැරැවිය, උවටන්හල් කැරැවිය, ගිනිහල් කැරැවිය, කැපකිළි කැරැවිය. වැසිකිළි කැරැවිය, කෙසකිළි කැරැවිය. සක්මන්මළු කැරැවිය, සක්මන් හල් කැරැවිය. ළිඳ කැරැවිය, ළිඳහල් කැරැවිය, ජෙන්තාකගෘහ කැරැවිය, ජෙන්තාකගෘහශාලා කැරැවිය. පොකුණු කැරැවිය මඩු කැරැවිය.

35. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන වෙසාලි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන වෙසාලි තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන මනුස්සා සක්කච්චං නවකම්මං කරොන්ති. යෙපි භික්ඛූ නවකම්මං අධිට්ඨෙන්ති තෙපි සක්කච්චං උපට්ඨෙන්ති. චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරෙහි.

අථ ඛො අඤ්ඤතරස්ස දළිද්දස්ස තුන්නවායස්ස එතදහොසි "න ඛො පනෙදං ඔරකං භවිස්සති. යථා ඉමෙ මනුස්සා සක්කච්චං නවකම්මං කරොන්ති. යන්නූනාහම්පි නවකම්මං කරෙය්‍යන්ති".

අථ ඛො සො දළිද්දො තුන්නවායො සාමං චික්ඛල්ලං මද්දිත්වා ඉට්ඨකායො චිනිත්වා කුඩ්ඩං උට්ඨාපෙසි. තෙන අකුසලකෙන චිතා වඞ්කා භිත්ති පරිපති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො සො දළිද්දො තුන්නවායො සාමං චික්ඛල්ලං මද්දිත්වා ඉට්ඨකායො චිනිත්වා කුඩ්ඩං උට්ඨාපෙසි. තෙන අකුසලකෙන චිතා වඞ්කා භිත්ති පරිපති.

අථ ඛො සො දළිද්දො තුන්නවායො උජ්ඣායති ඛීයති විපාචෙති "යෙ ඉමෙසං සමණානං සක්‍යපුත්තියානං දෙන්ති චීවර පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං තෙ ඉමෙ ඔවදන්ති අනුසාසන්ති තෙසං ච නවකම්මං අධිට්ඨෙන්ති. අහං පනම්හි දළිද්දො. න මං කොචි ඔවදති වා අනුසාසති වා නවකම්මං වා අධිට්ඨාති"ති.

36. අස්සොසුං ඛො භික්ඛූ තස්ස දළිද්දස්ස තුන්නවායස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

"අනුජානාමි භික්ඛවෙ නවකම්මං දාතුං, නවකම්මිකො භික්ඛවෙ භික්ඛු උස්සුක්කං ආපජ්ජිස්සති "කින්ති නු ඛො විහාරො ඛිප්පං පරියොසානං ගච්ඡෙය්‍යා"ති ඛණ්ඩඵුල්ලං පටිසඞ්ඛරිස්සති. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බං: පඨමං භික්ඛු යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස ගහපතිනො විහාරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො නවකම්මං දදෙය්‍ය" එසා ඤත්ති.

35. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කැමැති තාක් කල් වැඩසිට විසල් මහනුවරට පිටත් වූසේක. පිළිවෙළින් සැරිසරා වඩනාසේක් විසල් පුරයට සම්ප්‍රාප්ත වූසේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසල් පුර මහවෙනෙහි කුළාරහල් වෙහෙර වසනසේක. එකලැ මිනිස්සු සකසා නවාම් කෙරෙත්. යම් මහණ කෙනෙක් නවාම් ඉවසත් නම් ඔවුනට ද සිවුරු පිඩුපා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සකසා උවටන් කෙරෙත්.

එ කලැ එක්තරා දිළිඳු රෙදිවියන්නකුට ''යම්සේ මේ මිනිස්සු සකසා නවාම් කෙරෙත් ද එහෙයින් මෙය සුළු කාරියෙක් නො වියයුතු. නවාමක් කළොත් යෙහෙකැ''යි මේ සිත විය.

එයින් පසු ඒ දිළිඳු රෙදිවියන්නා තෙමේ ම මැටි මැඩ ගඩොළු තනා බිත්තියක් නැංවිය. අදක්‍ෂ වූ ඔහු විසින් තනන ලද, වක් වූ බිත්තිය කැඩී වැටිණ. දෙවැනි වරද ... තුන්වැනි වරද ඒ දිළිඳු රෙදි වියන්නා තෙමේ ම මැටි මැඩ ගඩොළු තනා බිත්තියෙක් නැංවිය. අදක්‍ෂ වූ ඔහු විසින් තනන ලද වක් වූ බිත්තිය කැඩී වැටිණ.

එකලැ එ දිළිඳු රෙදිවියන්නා ''යම් කෙනෙක් මේ ශාක්‍යපුත්‍රීක මහණුනට සිවුරු පිඩුපා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර දෙත් ද ඔවුනට මොහු අවවාද කරත්, අනුශාසනා කරත්, ඔවුන්ගේ නවාම් ද ඉටත්. මම් වූ කලි දිළින්දෙක්මි. කිසිවෙක් මට අවවාද හෝ අනුශාසනා හෝ නො කෙරෙයි. නවාම් හෝ නො ඉටුයැ යි ලාමක කොට සිතයි. නින්ද කෙරෙයි. දෙස් පතුරුවයි.

36. භික්ෂූහු පහත් කොට සිතන නින්ද කරන දෙස් පතුරුවන ඒ දිළිඳු රෙදිවියන්නා ගේ කථාව ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. එ විට භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කරුණෙහි දැහැමි කථා කොට භික්ෂූන් අමතා මෙසේ වදළසේක.

''මහණෙනි, නවාම් දෙන්නට අනුදනිමි. මහණෙනි, නවකැමි මහණ තෙම කෙසේ නම් විහාරය වහා නිමාවට යන්නේ දැ''යි උත්සාහවත් බවට පැමිණෙන්නේ ය. කැඩුණු බිඳුණු තැන් ප්‍රකෘතිමත් කරන්නේ ය. මහණෙනි, මෙසේ දියයුතු ය. පළමු කොට මහණුන්ගෙන් (මහණෙක්) ඉල්ලියයුතු. පළමු කොට මහණුන් යැද ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සංඝයා මෙසේ දැන්වියයුතු:

''සංඝ තෙමේ මගේ වචනය අසාවා ඉදින් සංඝයාට සුදුසු කල් ඇති කර්මයෙක් වැ වැටහේ නම්, සංඝ තෙමේ මෙ නම් ගැහැවියාගේ විහාරය මෙ නාම් මහණහට නවකර්මය පිණිස දෙන්නේ ය'' මේ දැනුම් දීමයි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමස්ස ගහපතිනො විහාරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො නවකම්මං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස ගහපතිනො විහාරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො නවකම්මස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දින්නො සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස ගහපතිනො විහාරො ඉත්ථන්නාමස්ස භික්ඛුනො නවකම්මං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී එවමෙතං ධාරයාමී''ති.

37. අථ ඛො භගවා වෙසාලියං යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියානං භික්ඛූනං අන්තෙවාසිකා භික්ඛූ බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා විහාරෙ පරිග්ගණ්හන්ති, සෙය්‍යායො පරිග්ගණ්හන්ති ''ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති, ඉදං අම්හාකං ආචරියානං භවිස්සති, ඉදං අම්හාකං භවිස්සතී''ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා විහාරෙසු පරිග්ගහිතෙසු සෙය්‍යාසු පරිග්ගහිතාසු සෙය්‍යං අලභමානො අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි. අථ ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය උක්කාසි. ආයස්මාපි සාරිපුත්තො උක්කාසි. ''කො එත්ථා''ති. ''අහං භන්තෙ සාරිපුත්තො''ති.

''කිස්ස ත්වං සාරිපුත්ත ඉධ නිසින්නො''ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො භගවතො එතමත්ථං ආරොචෙසි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පරිපුච්ඡි ''සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියානං භික්ඛූනං අන්තෙවාසිකා භික්ඛූ බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා විහාරෙ පරිග්ගණ්හන්ති, සෙය්‍යායො පරිග්ගණ්හන්ති 'ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති, ඉදං අම්හාකං ආචරියානං භවිස්සති, ඉදං අම්හාකං භවිස්සතී''ති. ''සච්චං භගවා''ති.

වහන්ස, සඞ්ඝ තෙමේ මෙ නම් ගැහැවියාගේ විහාරය මෙ නම් මහණහට නවකර්මය පිණිස දෙයි. මෙනම් ගැහැවියාගේ විහාරය මෙ නම් මහණහුට නවකම් පිණිස දීම යම් ආයුෂ්මතකුහට රිසියෙන්නේ නම් හේ නිහඬ වේවා. යමකුට නො රිසියෙන්නේ නම් හේ කියාවා.

සංඝයා විසින් මෙ නම් ගැහැවියාගේ විහාරය මෙ නම් මහණහට නවකම් සඳහා දෙන ලද්දේ ය. සංඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ සලකමි'' යනු යි.

37. එකලැ භාග්‍යවතුන් වහන්සේ විසල්පුර කැමැති තාක් කල් වැස සැවැත් නුවර බලා සැරිසරා වැඩිසේක. එ සමයෙහි සවැගි මහණුන්ගේ අතැවැසි මහණහු බුදුපාමොක් සඟනට පෙරාතු ව පෙරාතු ව ගොස් ''මෙය අපේ උපාධ්‍යායනට වන්නේ ය. මෙය අපේ ඇදුරනට වන්නේ ය. මෙය අපට වන්නේ යැ''යි කියා විහාරයන් අත්කැර ගනිත්, යහන් අත් කැරගනිත්.

එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ බුදුපාමොක් සඟනට පිටුපසින් පිටුපසින් වැඩ (කලදී සවැගි මහණුන් විසින්) විහාරයන් අත්කැර ගන්නා ලද කල්හි යහන් අත්කැරගන්නා ලද කල්හි සැතපෙන්නට යහනක් නො ලබනුයේ එක්තරා රුක්මුලෙක වැඩහුන්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම්හි නැගීසිට කැස්ස සේක. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ ද කැස්සහ. ''මෙහි කවරෙක් දැ''යි භාග්‍යවතුන් වහන්සේ ඇසූසේක. ''වහන්ස, මම ශාරිපුත්‍රයෙමි''යි කීහ.

''ශාරිපුත්‍රයෙනි, තෙපි කවරහෙයින් මෙහි හුන්නු ද''යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත්සේක.

එකල්හි සැරියුත් තෙරණුවෝ මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කාරණයෙහි බික්සඟන රැස් කරවා, ''මහණෙනි, සවැගි මහණුන්ගේ අතැවැසි මහණහු පෙරාතු ව පෙරාතු ව ගොස් ''මෙය අප උපාධ්‍යායනට වන්නේය. මෙය අප ඇදුරනට වන්නේ ය. මෙය අපට වන්නේ යැ' යි විහාරයන් අත් කැර ගනිත් ල, යහන් අත් කැර ගනිත් ල. ඒ සැබෑ දැ''යි අසා වදළසේක. ''සැබැව භාග්‍යවතුන් වහන්සැ''යි භික්ෂූහු කීහ.

විගරහි බුද්ධො භගවා "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝ-පුරිසා බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා විහාරෙ පරිගණ්හිස්සන්ති, සෙය්‍යායො පරිගණ්හිස්සන්ති 'ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති, ඉදං අම්හාකං ආචරියානං භවිස්සති. ඉදං අම්හාකං භවිස්සතී'ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛො තං භික්ඛවෙ අප්පසන්නානඤ්චෙව අප්පසාදය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා"ති විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "කො භික්ඛවෙ අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති"

38. එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා ඛත්තියකුලා පබ්බජිතො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති"

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා බ්‍රාහ්මණකුලා පබ්බ-ජිතො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා ගහපතිකුලා පබ්බ-ජිතො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා සුත්තන්තිකො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා විනයධරො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා ධම්මකථිකො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා පඨමස්ස ඣානස්ස ලාභී සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා දුතියස්ස ඣානස්ස ලාභී –පෙ– "යො භගවා තතියස්ස ඣානස්ස ලාභීති –පෙ– "යො භගවා චතුත්ථස්ස ඣානස්ස ලාභී "සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති.''

"මහණෙනි, ඒ හිස් පුරුෂයෝ කෙසේ නම් බුදුපාමොක් සඟනට පෙරාතුව පෙරාතුව ගොස් 'මෙය අපේ උපාධ්‍යායනට වන්නේ ය. මෙය අපේ ඇදුරනට වන්නේ ය. මෙය අපට වන්නේ යැ'යි විහාරයන් අත්කැරගන්නාහු ද, යහන් අත්කැර ගන්නාහුද, මහණෙනි, තෙල නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස ද පහන් වූවන්ගේ බොහෝවීම පිණිස ද නො වන්නේ ය. වැලි දු මහණෙනි, එය නො පහන් වූවන්ගේ නො පහන් බව පිණිස ද පහන් වූ ඇතැම් ෙකනකුන්ගේ වෙනස් බව පිණිස ද වන්නේ යැ"යි භාග්‍යවතුන් වහන්සේ ගැරහූ සේක. ගරහා දැහැමි කථා කොට භික්ෂූන් බණවා "මහණෙනි, අග්‍රාසනය, අග්‍රෝදකය අග්‍රභොජනය (ස්ථවිර පිණ්ඩය) ලබන්නට කවරෙක් සුදුසු ද"යි අසා වදාළ සේක.

38. "භාග්‍යවතුන් වහන්ස, යමෙක් කැත් කුලයෙන් පැවිදි වූයේ ද, හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය (ස්ථවිර පිණ්ඩය) ලබනුවට සුදුසු වේ යැ"යි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් බමුණු කුලයෙන් පැවිදි වූයේ ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබන්නට සුදුසු වේ. යැ"යි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් ගැහැවි කුලයෙන් නික්ම පැවිදි වූයේ ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු වේ" යැයි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් සූත්‍රාන්තධර ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු වේ යැ"යි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් විනයධර ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු වේ යැ"යි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් ධම්මකථික ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රාභොජනය ලබනුවට සුදුසු යැ"යි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් ප්‍රථමධ්‍යානලාභී ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු යැ"යි සමහර මහණහු කීහ.

"භාග්‍යවතුන් වහන්ස, යමෙක් ද්විතීය ධ්‍යානලාභී ද ... තෘතීය ධ්‍යානලාභී ද ... චතුර්ථ ධ්‍යානලාභී ද, හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු යැ"යි සමහර මහණහු කීහ.

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා සොතාපන්නො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති.''

එකච්චෙ භික්ඛූ එවමාහංසු: -පෙ- "යො භගවා සකදගාමී" -පෙ- "යො භගවා අනාගාමී" -පෙ- "යො භගවා අරහා සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති.''

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා තෙවිජ්ජො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

එකච්චෙ භික්ඛූ එවමාහංසු: "යො භගවා ඡළභිඤ්ඤො සො අරහති අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති."

39. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ''භූතපුබ්බං භික්ඛවෙ හිමවන්තපස්සෙ මහානිග්‍රොධො අහොසි. තං තයො සහායා උපනිස්සාය විහරිංසු තිත්තිරො ච මක්කටො ච හත්ථිනාගො ච. තෙ අඤ්ඤමඤ්ඤං අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරන්ති. අථ ඛො භික්ඛවෙ තෙසං සහායකානං එතදහොසි: ''අහො නූන මයං ජානෙය්‍යාම. යො අම්හාකං ජාතියා මහන්තතරො, තං මයං සක්කරෙය්‍යාම ගරුකරෙය්‍යාම මානෙය්‍යාම පූජෙය්‍යාම තස්ස ච මයං ඔවාදෙ තිට්ඨෙය්‍යාමා''ති.

අථ ඛො භික්ඛවෙ තිත්තිරො ච මක්කටො ච හත්ථිනාගං පුච්ඡිංසු ''තුවං සම්ම කිං පොරාණං සරසී''ති.

''යදහං සම්මා ඡාපො හොමි, ඉමං නිග්‍රොධං අන්තරා සත්ථීනං[1] කරිත්වා අතික්කමාමි අග්ගඞ්කුරං මෙ උදරං ඡුපති. ඉමාහං සම්මා පොරාණං සරාමී''ති.

අථ ඛො භික්ඛවෙ තිත්තිරො ච හත්ථිනාගො ච මක්කටං පුච්ඡිංසු ''තුවං සම්ම කිං පොරාණං සරසී''ති.

යදහං සම්මා ඡාපො හොමි ඡමායං නිසීදිත්වා ඉමස්ස නිග්‍රොධස්ස අග්ගඞ්කුරං ඛාදමි. ඉමාහං සම්මා පොරාණං සරාමී''ති.

අථ ඛො භික්ඛවෙ මක්කටො ච හත්ථිනාගො ච තිත්තිරං පුච්ඡිංසු ''තුවං සම්ම කිං පොරාණං සරසී''ති.

අමුකස්මිං සම්මා ඔකාසෙ මහානිග්‍රොධො අහොසි. තතො අහං ඵලං භක්ඛිත්වා ඉමස්මිං ඔකාසෙ වච්චං අකාසිං. තස්සායං නිග්‍රොධො ජාතො. තදපහං සම්මා ජාතියා මහන්තතරො''ති.

1. අන්තරාසත්ථිකං - සිමු.

''භාග්‍යවතුන් වහන්ස, යමෙක් සොවාන් ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු යැ''යි සමහර මහණහු කීහ.

''භාග්‍යවතුන් වහන්ස, යමෙක් සකෘදගාමී ද... අනාගාමී ද... යමෙක් රහත් ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු යැ''යි සමහර මහණහු කීහ.

''භාග්‍යවතුන් වහන්ස, යමෙක් ත්‍රිවිද්‍යා ලාභී ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු යැ''යි සමහර මහණහු කීහ.

''භාග්‍යවතුන් වහන්ස, යමෙක් ෂඩභිඥ ද හේ අග්‍රාසනය අග්‍රෝදකය අග්‍රභොජනය ලබනුවට සුදුසු යැ''යි සමහර මහණහු කීහ.

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙය වදාළ සේක. ''මහණෙනි, පෙර වූවක් කියමි. මහණෙනි, පෙර හිමවත පාර්ශ්වයෙහි මහනුගරුකෙක් විය. වටුවෙක් ද වඳුරෙක් ද ඇතෙක් ද යන තුන් යහළු කෙනෙක් එය ඇසුරු කොට විසූහ. ඔහු උනුනට ගරුසරු නැති ව යටත් පැවතුම් නැති ව සභාග පැවැතුම් නැති ව වෙසෙත්. මහණෙනි, එකල්හි ඒ යහළුවනට ''අප අතුරෙන් යමෙක් උත්පත්තියෙන් ඉතා මහලු ද ඔහු දනගත හෙන්නමෝ නම්, ගරු කරන්නමෝ නම් බුහුමන් කරන්නමෝ නම් පුදන්නමෝ නම්, ඔහුගේ අවවාදයෙහිත් පිහිටන්නමෝ නම් ඉතා යෙහෙකැ''යි මේ සිත විය.

මහණෙනි, එයින් පසු වටුවා ද වඳුරා ද ඇතු බණවා ''යහළුව, තෙපි පැරැණි ම වූ කුමක් සිහි කරවු දැ''යි විචාළාහ.

''යහළුවනි, මම යම් කලෙක පැටියෙක් වීම් ද එ කල්හි මම මේ නුගරුක මාගේ කලවා අතුරෙහි කොට ඉක්මෙමි, මුදුන් දලුව මගේ බඩ ස්පර්ශ කෙරෙයි. යහළුවනි, මම මේ පැරැණි ම දය සිහි කරමි''යි ඇතා කීය.

''මහණෙනි, ඉක්බිති වටුවා ද ඇතා ද වඳුරා බණවා ''යහළුව, තෙපි පැරැණිම වූ කුමක් සිහි කරවු දැ'' යි ඇසූහ.

යහළුවනි, යම් කලෙක මම පැටියෙක් වීම් ද, එකලැ මම බිම හිඳ මේ නුගයේ මුදුන් දලුව කමි. යහළුවනි, මම මේ පැරැණි ම දය සිහි කරමි''යි වඳුරා කී ය.

මහණෙනි, ඉක්බිති වඳුරාත් ඇතාත් වටුවා බණවා ''යහළුව, තෙපි පැරැණි ම වූ කුමක් සිහි කරවු දැ''යි පුළුවුත්හ.

''යහළුවනි, අසෝ තන්හි මහනුගයෙක් විය. මම එයින් ගෙඩියක් කා මෙ තැන වසුරු පහකෙළෙමි. එයින් මේ නුගය ඇති විය. යහළුවනි, එදත් මම් උපතින් ඉතා වැඩුණෙක් ව උනිමි''යි වටුවා කී ය.

අථ ඛො භික්ඛවෙ මක්කටො ච හත්ථිනාගො ච තිත්තිරං එතදවොචුං: "ත්වං සම්ම අම්හාකං ජාතියා මහන්තතරො, තං මයං සක්කරිස්සාම ගරුකරිස්සාම මානෙස්සාම පූජෙස්සාම තුය්හඤ්ච මයං ඔවාදෙ පතිට්ඨිස්සාමා"ති.

අථ ඛො භික්ඛවෙ තිත්තිරො මක්කටඤ්ච හත්ථිනාගඤ්ච පඤ්චසු සීලෙසු සමාදපෙසි. අත්තනා ච පඤ්චසු සීලෙසු සමාදාය වත්තති. තෙ අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභාගවුත්තිකා විහරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිංසු. එතං ඛො භික්ඛවෙ තිත්තිරියං නාම බ්‍රහ්මචරියං අහොසි.

යෙ වුඩ්ඪමපචායන්ති නරා ධම්මස්ස කොවිද
දිට්ඨෙව ධම්මෙ පාසංසා සම්පරායෙ ච සුග්ගති.

තෙ හි නාම භික්ඛවෙ තිරච්ඡානගතා පාණා අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභාගවුත්තිකා විහරිස්සන්ති. ඉධ ඛො තං භික්ඛවෙ සොභෙථ යං තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා අඤ්ඤමඤ්ඤං අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරෙය්‍යාථ. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛො තං භික්ඛවෙ අප්පසන්නානඤ්චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා"ති විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං. න ච භික්ඛවෙ සඞ්ඝිකං යථාවුඩ්ඪං පටිබාහිතබ්බං. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

40. දස ඉමෙ භික්ඛවෙ අවන්දියා: පුරෙ උපසම්පන්නෙන පච්ඡා උපසම්පන්නො අවන්දියො, අනුපසම්පන්නො අවන්දියො, නානාසංවාසකො වුඩ්ඪතරො අධම්මවාදී අවන්දියො, මාතුගාමො අවන්දියො, පණ්ඩකො අවන්දියො, පාරිවාසිකො අවන්දියො, මූලාය පටිකස්සනාරහො අවන්දියො, මානත්තාරහො අවන්දියො, මානත්තචාරිකො අවන්දියො. අබ්භානාරහො අවන්දියො. ඉමෙ ඛො භික්ඛවෙ දස අවන්දියා.

මහණෙනි, එ කල්හි වඳුරා ද ඇතා ද වටුවා බණවා "යහළුව, තෙපි උපතින් අප දෙදෙනාට ම වඩා මහලු ය, අපි ඒ තොපට සත්කාර කරන්නමු, ගෞරව කරන්නමු, බුහුමන් කරන්නමු, පුදන්නමු. තොපගේ අවවාදයෙහි ද අපි පිහිටන්නමු''යි කීහ.

මහණෙනි, එයින් පසු වටුවා වඳුරා ද ඇතු ද පන්සිල්හි පිහිටුවිය. තෙමේ ද පන්සිල් ගෙන පවතියි. ඔහු උනුනට ගෞරව සහිත ව යටත් පැවැතුම් සහිත ව සභාග පැවැතුම් සහිත ව වැස කාබුන් මරණින් මතු සුවයට ස්ථාන වූ සගලොවට ගියාහ. මහණෙනි, මෙය තෛත්තිරිය බ්‍රහමචර්ය නම් විය.

දහම්හි දක්ෂ වූ (දහම් දන්නා) යම් කෙනෙක් වැඩිමහල්ලාට යටත් ව පවතිත් ද ඔහු මෙ අත්බව්හි පැසසුම් ලබන්නෝ ද පරලොව්හි සුගතිය ඇත්තෝ ද වෙති.

මහණෙනි, තිරිසන්ගිය ප්‍රාණීහු වූ ඔහු පවා උනුනට ගෞරව ඇත්තෝ ව යටත් පැවැතුම් ඇත්තෝ ව සභාග පැවැතුම් ඇත්තෝ ව වුසූහ. මහණෙනි, මෙසේ වූ ස්වාඛ්‍යාත ශාසනයෙහි පැවිදි වූ තෙපි උනුනට ගෞරව නැති ව යටත් පැවැතුම් නැති ව සභාග පැවැතුම් නැති ව වසන්නහු ය යන යමෙක් ඇද්ද, මෙහි ලා එය හොබනේ ද? මහණෙනි, මෙය නො පහන් අයගේ පැහැදීම පිණිස ද පහන් අයගේ බොහෝ වීම පිණිස ද නො වන්නේ ය. වැළිදු මහණෙනි, එය නො පහන් වූවන්ගේ නො පැහැදීම පිණිස ද පහන් වූ සමහර කෙනකුන්ගේ වෙනස් වීම පිණිස ද වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදරා (වැඩිමහලු තෙරුනට ගෞරව නො කිරීමට) ගරහා දැහැමි කතා කොට භික්ෂූන් බණවා, "මහණෙනි, මහලු පිළිවෙළින් වැඳීම, දැක හුනස්නෙන් නැගී සිටීම, ප්‍රිය වචන යෙන් කථාකිරීම ප්‍රථමාසනය ප්‍රථමඋදකය ප්‍රථම භෝජනය සංඝස්ථවිර තෙරහට පිරිනැමීම අනුදනිමි. එහෙත් සඟසතු කොට පිදූ දෑ වැඩිමහලු පිළිවෙළින් නො ඉසිලියැයුතු. යමෙක් උසුලන්නේ ද දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළසේක.

40. මහණෙනි, මේ දස දෙන නො වැන්දයුත්තෝ ය. පළමුවෙන් උපසපන් වූවහු විසින් පසුව උපසපන් වූයේ නො වැන්දයුතු; උපසපන් නො වූයේ ද උපසපන් වූවහු විසින් නො වැන්ද යුතු; වඩා මහලු වූ ද අධර්මවාදී නානාසංවාසක උපසපන් මහණ තෙමේ නො වැන්දයුතු; භික්ෂූහු විසින් මාගම නො වැන්දයුතු, පණ්ඩකයා නො වැන්දයුතු; පිරිවෙස් පුරන මහණ නො වැන්දයුතු; මූලායපටිකස්සනාවට සුදුසු ව සිටින මහණ නො වැන්දයුතු; මානතට සුදුසු ව සිටින මහණ නො වැන්දයුතු; මානත පුරන මහණ නො වැන්දයුතු; අබ්භානයට සුදුසු මහණ නො වැන්දයුතු. මහණෙනි, මේ දස දෙන උපසපනහු විසින් නො වැන්ද යුත්තෝ ය.

තයො මෙ භික්ඛවෙ වන්දියා: පච්ඡා උපසම්පන්නෙන පුරෙ උපසම්පන්නො වන්දියො, නානාසංවාසකො වුඩ්ඪතරො ධම්මවාදී වන්දියො, සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අරහං සම්මාසම්බුද්ධො වන්දියො. ඉමෙ ඛො භික්ඛවෙ තයො වන්දියාති.

41. තෙන ඛො පන සමයෙන මනුස්සා සඞ්ඝං උද්දිස්ස මණ්ඩපෙ පටියාදෙන්ති, සන්ථරෙ[1] පටියාදෙන්ති, ඔකාසෙ පටියාදෙන්ති. ඡබ්බග්ගියානං භික්ඛූනං අන්තෙවාසිකා භික්ඛූ සඞ්ඝිකඤ්ඤෙව 'භගවතා යථාවුඩ්ඪං අනුඤ්ඤාතං, නො උද්දිස්සකතන්ති' බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා මණ්ඩපෙපි පරිග්ගණ්හන්ති' සන්ථරෙපි පරිග්ගණ්හන්ති, ඔකාසෙ පරිග්ගණ්හන්ති 'ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති, ඉදං අම්හාකං ආචරියානං භවිස්සති, ඉදං අම්හාකං භවිස්සතී'ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා මණ්ඩපෙසු පරිග්ගහිතෙසු සන්ථරෙසු පරිග්ගහිතෙසු ඔකාසෙසු පරිග්ගහිතෙසු ඔකාසං අලභමානො අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි. අථ ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය උක්කාසි. ආයස්මාපි සාරිපුත්තො උක්කාසි. ''කො එත්ථාති.'' ''අහං භගවා සාරිපුත්තො''ති. ''කිස්ස ත්වං සාරිපුත්ත ඉධ නිසින්නො''ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො භගවතො එතමත්ථං ආරොචෙසි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: ''සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියානං භික්ඛූනං අන්තෙවාසිකා භික්ඛූ සඞ්ඝිකඤ්ඤෙව භගවතා යථාවුඩ්ඪං අනුඤ්ඤාතං නො උද්දිස්සකතන්ති බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස පුරතො පුරතො ගන්ත්වා මණ්ඩපෙ පරිග්ගණ්හන්ති, සන්ථරෙ පරිග්ගණ්හන්ති, ඔකාසෙ පරිග්ගණ්හන්ති: ඉදං අම්හාකං උපජ්ඣායානං භවිස්සති, ඉදං අම්හාකං ආචරියානං භවිස්සති, ඉදං අම්හාකං භවිස්සතී''ති. ''සච්චං භගවා'' -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: ''න භික්ඛවෙ උද්දිස්සකතම්පි යථාවුඩ්ඪං පටිබාහිතබ්බං. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

1. සන්ථාරෙ - සිමු.

මහණෙනි, මේ තිදෙන වැන්දයුත්තෝ ය: පසුව උපසපන් මහණහු විසින් තමාට පළමුවෙන් උපසපන් වූ මහණ වැන්දයුතු. නානාසංවාසක වූව ද උපසපුයෙන් වැඩි මහලු ධර්මවාදී මහණ තෙම වැන්දයුතු. මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව ඇති ලොවෙහි තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධ තෙමේ වැන්දයුතු ය. මහණෙනි, මොහු වැන්දයුතු තුන් දෙනා ය.

41. එ සමයෙහි මිනිස්සු සඞ්ඝයා උදෙසා මණ්ඩප පිළියෙළ කරත්, ඇතිරි පිළියෙළ කරදෙත්, අවකාශ ස්ථාන පිළියෙළ කරදෙත්, සවැගි මහණුන්ගේ අතැවැසි මහණෝ ''භාග්‍යවතුන් වහන්සේ විසින් සඟසතු කරන ලද දය ම මහලු පිළිවෙළින් පරිභොග කරන්නට අනුදන්නා ලදි. කෙනකු උදෙසා කරන ලද දය මහලු පිළිවෙළින් පරිභොග කරන්නට අනුදන්නා ලද්දේ නො වේ'' යැයි කියා බුදුපාමොක් සඟනට පෙරාතු ව පෙරාතු ව ගොස් 'මෙය අපේ උපාධ්‍යායනට වන්නේ ය. මෙය අපේ ආචාර්‍ය්‍යයනට වන්නේය, මෙය අපට වන්නේ යැ'යි කියා මණ්ඩප ද ඇතිරි ද අවකාශ ස්ථාන ද අත්කරගනිත්.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ බුදුපාමොක් සඟන පසු පස්සෙන් වැඩ, මණ්ඩපයන් ඇතිරි අවකාශස්ථාන (සවැගියන්ගේ අතැවැස්සන් විසින්) අත් කැරගන්නා ලද කල්හි ඉඩක් නො ලබන්නෝ එක්තරා රුක්මුලෙක හුන්නෝ ය. එකල භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම්හි නැඟීසිට කැස්සසේක. සැරියුත් තෙරණු-වෝ ද, කැස්සාහ. ''මෙහි කවරෙක් ද''යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක. ''භාග්‍යවතුන් වහන්ස, මම ශාරිපුත්‍ර යෙමි''යි තෙරණුවෝ වදළාහ. ''ශාරිපුත්‍රයෙනි, තෙපි කවර හෙයින් මෙහි හුන්නහු ද''යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත්සේක.

එ කල්හි සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙ නිදනයෙහි මෙ කරුණෙහි බික්සඟන රැස් කරවා ''මහණෙනි, සවැගි මහණුන්ගේ අතැවැසි මහණහු 'උදෙසා කරන ලද දෑ නො ව සඟ සතු කරන ලද දෑ ම වැඩිමහලු පිළිවෙළින් පරිභොග කරන්නට භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලදහ'යි කියා බුදුපාමොක් සඟනට පෙරාතු ව පෙරාතු ව ගොස් 'මෙය අප උපාධ්‍යායයන් වහන්සේට වන්නේ ය, මෙය අප ආචාර්‍ය්‍යයන් වහන්-සේට වන්නේ ය, මෙය අපට වන්නේ යැ'යි කියා මණ්ඩපයන් අත්කැර ගනිත් ල, ඇතිරි අත් කැර ගනිත් ල, අවකාශස්ථාන අත් කැර ගනිත් ල, එ සැබෑ ද'යි අසාවදළසේක. ''සැබැව, භාග්‍යවතුන් වහන්සැ''යි භික්ෂූහු කීහ. භාග්‍යවතුන් වහන්සේ ගරහා දහැමි කථා කොට භික්ෂූන් අමතා ''මහණෙනි, උදෙසා කරන ලද්ද ද වැඩිමහලු පිළිවෙළින් පරිභොග කිරීම ප්‍රතිබාහනය නො කළයුතු. යමෙක් ප්‍රතිබාහනය කරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළ සේක.

42. තෙන ඛො පන සමයෙන මනුස්සා භත්තග්ගෙ අන්තරඝරෙ උච්චාසයනමහාසයනානි පඤ්ඤපෙන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලඞ්කං ගොණකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං කොසෙය්‍යං කම්බලං කුත්තකං හත්ථත්ථරං[1] අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. භික්ඛූ කුක්කුච්චායන්තා නාභිනිසීදන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා තීණි ආසන්දිං පල්ලඞ්කං තූලිකං ගිහිවිකතං අභිනිසීදිතුං නත්වෙව අභිනිපජ්ජිතුන්ති".

තෙන ඛො පන සමයෙන මනුස්සා භත්තග්ගෙ අන්තරඝරෙ තූලොනද්ධං මඤ්චම්පි පීඨම්පි පඤ්ඤපෙන්ති. භික්ඛූ කුක්කුච්චායන්ති නාභිනිසීදන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ගිහිවිකතං අභිනිසීදිතුං නත්වෙව අභිනිපජ්ජිතුන්ති."

43. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි 'කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති.'

1. හත්ථිත්ථරං – මජ්ඣ.

42. එ සමයෙහි මිනිස්සු ඇතුළුගමැ බත්හලෙහි දික්සඟළා පුටුය, පළඟය කොඳුපලසය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් මුවා සුදු ඇතිරිය, පුළුන් ඇතිරිය, එළුලොම්මුවා ඝන පුප්ඇතිරිය, සිංහරූපාදියෙන් විසිතුරු එළුලොම්මුවා ඇතිරිය, එක් පිටෙහි ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, දෙපිටැ ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රන්කම් කොට තිහිරි හුයින් කළ පසතුරුණු, රන්කම් කළ තිහිරි පසතුරුණු, ලොම්මුවා පලස, නිළියන් සොළොස් දෙනකුන් හට නටන්නට තරම් ඉඩ ඇති එළුලොම්මුවා මහඇතිරිය, ඇතුන් පිට අතුරන ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රියතුළ අතුරන ඇතිරිය, අඳුන්දිවිසමින් කළ පසතුරුණු, කෙසෙල්මුවසමින් කළ මහඟු පසතුරුණු, රතු උඩුවියන් සහිත වූ යහනය, ඉස්දෙර පාමුල රතු කොට්ට ඇති යහනය යන මෙසේ වූ උසසුන් මහසුන් පනවත්. මහණහු කුකුස් කරන්නාහු එහි නො හිඳිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, දික්සඟළා පුටුව ද පළඟ ද පුළුන් ඇතිරිය ද- හැර සෙසු ගෘහි විකෘතයන්හි (ගිහියන් පැනැවූ අසුන්හි) වැදහෙන් නට නොව ඉඳගන්නට අනුදනිමි''යි වදළසේක.

එ සමයෙහි මිනිස්සු ඇතුළු ගම බොජුන් හලෙහි පුළුන් බහා යොදු පිළියෙළ කළ ඇඳන් ද පුටු ද පනවත්. මහණහු කුකුස් කෙරෙත්, එහි නො හිඳිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

''මහණෙනි, ගිහින් පිළියෙළ කළ ඇඳ පුටු ආදියේ වැදහෙන්- නට නොව ඉඳගන්නට අනුදනිමි''යි වදළසේක.

43. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගම් නියම්ගම් පිළිවෙළින් සැරිසරා වඩනාසේක්, සැවැත්නුවර ජෙතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමැ වසනසේක. එ කලැ (එක් දිනක්) අනේපිඬු සිටු තෙම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ ඔබ වැද පසෙකැ හිඳගත්තේ ය. හේ එකත් පසෙක හුන්නේ ''වහන්ස භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා සහිත ව සෙට දවසට මාගේ බත ඉවසනසේක්ව''යි කී ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬ බැවින් එය ඉවසූසේක.

ඉක්බිති අනේපිඬු සිටු තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැඟීසිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මැගියේ ය. ඉක්බිති අනේපිඬු සිටු එ රැය ඇවෑමෙන් ප්‍රණීත ඛාද්‍ය භොජ්‍ය පිළියෙළ කරවා ''වහන්ස, දන් වඩනට කාලය ය බත පිළියෙළ කොට නිමැවිණැ''යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වායැවීය.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවන්තං එතදවොච: "කථාහං භන්තෙ ජෙතවනෙ පටිපජ්ජාමී"ති.

"තෙන හි ත්වං ගහපති ජෙතවනං ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස පතිට්ඨාපෙහී"ති.

"එවං භන්තෙ"ති ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවතො පටිස්සුත්වා ජෙතවනං ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස පතිට්ඨාපෙසි.

අථ ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං ඉමාහි ගාථාහි අනුමොදි:

44. සීතං උණ්හං පටිහන්ති තතො වාළමිගානි ච
සිරිංසපෙ[1] ච මකසෙ සිසිරෙ චාපි වුට්ඨියො.

තතො වාතාතපො ඝොරො සඤ්ජාතො පටිහඤ්ඤති.
ලෙණත්ථඤ්ච සුඛත්ථඤ්ච ඣායිතුඤ්ච විපස්සිතුං

විහාරදානං සඞ්ඝස්ස අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො

විහාරෙ කාරයෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ.
තෙසං අන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච

දදෙය්‍ය උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.
තෙ තස්ස ධම්මං දෙසෙන්ති සබ්බදුක්ඛාපනූදනං
යං සො ධම්මං ඉධඤ්ඤාය පරිනිබ්බාති අනාසවොති.

අථ ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

---

1. සරීසපෙ - මජ්ඣං.

භාග්‍යවතුන් වහන්සේ ද ඒ පෙරවරු සෙමෙහි හැඳපෙරෙවැ පා සිවුරු ගෙන අනේපිඬු සිටුහුගේ ගෙය වෙතට එළැඹිසේක. එළැඹ පනවා තුබුණු අසුන්හි බික්සඟන හා වැඩැහුන්සේක. එ කල අනේපිඬු සිටු බුදුපාමොක් බික්සඟන ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භෝජ්‍ය-යෙන් සියතින් සතප්වා පවරවා භාග්‍යවතුන් වහන්සේ බොජුන් වළඳ නිමවා පාත්‍රයෙන් ඉවතට ගත් අතැති නියා දැක ඔබට එකත් පසැ හිඳගත්තේ ය. එසේ හුන්නේ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මම ජේතවනය පිළිබඳ වැ කෙසේ නම් පිළිපදිම් දැ"යි ඇසූයේ ය.

"එසේ වී නම් ගැහැවිය පැමිණි නො පැමිණි සිවුදිගට අයත් බික්සඟනට පිහිටුවන්නැ (පිරිනමන්නැ)"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

"එසේ ය, වහන්සැ"යි කියා අනේපිඬු සිටු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ජේතවනය සිවු දිගට අයත් එහි පැමිණි නො පැමිණි (සියලු) බික්සඟන සතු කොට පිරිනැමී ය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටුහට මේ ගාථා-වලින් අනුමෝදනා කළසේක.

44. විහාරය වූ කලි ශීතය ද උෂ්ණය ද එයින් අන්‍ය වූ චණ්ඩමෘග-යන් ද සර්පයන් ද මැසිමදුරුවන් ද සිසිල්සුළං ද වැසි ද වළකයි.

එයින් අන්‍ය වූ හටගත් දැඩි අව් සුළං ද (විහාරය කරණ කොට ගෙන) වැළැකෙයි. විවික්ත වැ විසීම පිණිස ද දෘෂ්ටධර්ම සුඛවිහරණය පිණිස ද ධ්‍යාන වඩනු පිණිස ද විවසුන් වඩනු පිණිස ද විහාරය (යොග්‍ය ස්ථාන වේ).

එහෙයින් සංඝයාට විහාර පිළියෙළ කොට දීම අග්‍ර පිනෙකැ යි හැම බුදුවරයක්හු විසින් වර්ණිත ය. එ බැවින් නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ,

සිත්කලු විහාරයන් කරන්නේ ය. එහි බොහෝ ඇසූ පිරූ තන් ඇති භික්ෂූන් වස්වන්නේ ය. ඍජු ගුණ ඇති ඔවුන් කෙරෙහි වෙසෙසින් පහන් වූ සිතින් යුතු ව ඒ භික්ෂූනට ආහාර ද පාන ද වස්ත්‍ර ද ශයනාසන ද දෙන්නේ ය.

ඒ (දායක) තෙම යම් දහමක් දැන ගෙන ආස්‍රව රහිත වූයේ මෙ අත්බවහිදී කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙන්නේ ද (රහත් බවට පැමිණෙන්නේ ද) එසේ වූ සියලු සසර දුක් දුරලන දහමක් ඒ භික්ෂූහු ඔහුට දෙසන්නාහ.

භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාවලින් අනේපිඬු සිටුහට අනුමෝදනා බණ වදරා හුනස්නෙන් නැගී නික්මවැඩිසේක.

**45.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස ආජීවකසාවකස්ස මහාමත්තස්ස සඞ්ඝභත්තං හොති. ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පච්ඡා ආගන්ත්වා විප්පකතභොජනං[1] ආනන්තරිකං භික්ඛුං වුට්ඨාපෙසි. භත්තග්ගං කොලාහලමහොසි. අථ ඛො සො මහාමත්තො උජ්ඣායති ඛීයති විපාචෙති: ‘‘කථං හි නාම සමණා සක්‍යපුත්තියා පච්ඡා ආගන්ත්වා විප්පකතභොජනෙ භික්ඛූ වුට්ඨාපෙස්සන්ති, භත්තග්ගං කොලාහලමහොසි. නනු නාම ලබ්භා අඤ්ඤත්‍රාපි නිසින්නෙන යාවදත්ථං භුඤ්ජිතුන්’’ ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස මහාමත්තස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ‘‘කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පච්ඡා ආගන්ත්වා විප්පකතභොජනං ආනන්තරිකං භික්ඛුං වුට්ඨාපෙස්සති. භත්තග්ගං කොලාහලං අහොසී’’ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

‘‘සච්චං කිර ත්වං උපනන්ද පච්ඡා ආගන්ත්වා විප්පකතභොජනං ආනන්තරිකං භික්ඛුං වුට්ඨාපෙසි භත්තග්ගං කොලාහලං අහොසී’’ති.

‘‘සච්චං භගවා.’’

විගරහි බුද්ධො භගවා: ‘‘කථං හි නාම ත්වං මොඝපුරිස පච්ඡා ආගන්ත්වා විප්පකතභොජනං ආනන්තරිකං භික්ඛුං වුට්ඨාපෙස්සසි. භත්තග්ගං කොලාහලං අහොසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

‘‘න භික්ඛවෙ විප්පකතභොජනො භික්ඛු වුට්ඨාපෙතබ්බො. යො වුට්ඨාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස. සචෙ වුට්ඨාපෙති පවාරිතො ච හොති. ‘ගච්ඡ උදකං ආහරා’ති වත්තබ්බො. එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ සාධුකං සිත්ථානි ගිලිත්වා වුඩ්ඪතරස්ස ආසනං දාතබ්බං. නත්වෙවාහං භික්ඛවෙ කෙනචි පරියායෙන වුඩ්ඪතරස්ස භික්ඛුනො ආසනං පටිබාහිතබ්බන්ති වදාමි. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්සා’’ති.

---

1. විප්පකතභොජනො – සිමු.

45. එ සමයෙහි වනාහි ආජීවක ශ්‍රාවක වූ එක්තරා මහඇමැත්තකුගේ සඞ්ඝයාට පිරිනැමෙන බතෙක් වෙයි. ආයුෂ්මත් ශාක්‍යපුත්‍ර උපනන්දයෝ හැමට පසු ව අවුත් සමීපයෙහි හුන් අඩාළ බොජුන් ඇති (වළඳ නො නිමි) භික්‍ෂු නමක් නැගිටුවූහ. බොජුන්හල කලබල සහිත විය. එකල්හි ඒ මහඇමැත්තා ''කෙසේ නම් ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ පසු වැ අවුත් බොජුන්වළඳා නොනිමි භික්ෂූන් නැගිටුවන්නාහු ද, එයින් බොජුන්හල කලබල සහිත විය. අන් තැනෙක හිඳ රිසිතාක් වළඳන්නට නො හැකි දැ''යි පහත් කොට සිතයි, දෙස් නඟයි, නුගුණ පතුරුවයි. භික්ෂූහු පහත් කොට සිතන දෙස් නගන නුගුණ පතුරුවන ඒ ඇමැත්තාගේ වචනය ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ ද... ඔහු (ද) ''කෙසේ නම් ආයුෂ්මත් ශාක්‍යපුත්‍ර උපනන්දයෝ පසු ව අවුත් බොජුන් වළඳ නො නිමි සමීපයෙහි හුන් භික්ෂූනමක් නැඟුටුවන්නෝ ද, එයින් බොජුන්හල කලබල සහිත වී''යැ යි පහත් කොට සිතත්, දෙස් කියත්, නුගුණ පතුරුවත්. එ කල ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''සැබෑද උපනන්දයෙනි, තෙපි පසුව අවුත් බොජුන් වළඳා නොනිමි මහණක්හු නඟාසිටුවූහු ද (එයින්) බොජුන්හල කලබල සහිත වී දැ''යි භාග්‍යවතුන් වහන්සේ අසාවදළසේක.

''සැබැව, වහන්සැ''යි (උපනන්ද තෙරණුවෝ කීහ.)

''හිස් පුරුෂය තෝ පසුව අවුත් සමීපයේ හුන් වළඳා නො නිමි (සමීපයෙහි වළඳමින් හුන්) මහණක්හු කෙසේ නැඟුටුවූයෙහි ද? බොජුන්හල (එයින්) කලබල සහිත වූයේ ය. හිස් පුරුෂය, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ ... නො වේ''ය යි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙසෙසින් ගැරැහූසේක. ගරහා දැහැමි කථා කොට,

''මහණෙනි, අඩාළ බොජුන් ඇති (වළඳ නොනිමි) මහණ නො නඟා සිටුවියැයුතු. යමෙක් ඔහු නඟා සිටුවන්නේ නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. ඉදින් (ඇවැත නොතකා) නඟා සිටුවන්නේ නම්, මෙ තෙම පවරන ලදුයේ ද වන්නේ ය. 'වඩින්න, පැන් ගෙනෙන්නැ'යි වැඩිමාලු මහණ තෙම කියැයුතු (වැඩිමහල් මහණහට කියැ යුතු). එසේත් මෙය ලබන්නේ නම් ඒ මැනැවි, ඉදින් නො ලබන්නේ නම් මනාසේ බත්කුළු ගිලැ වැඩිමහලු මහණහට අස්න දියැයුතු. මහණෙනි, මම් කිසි කරුණෙකිනුත් වැඩිමහලු මහණහට ආසනය ප්‍රතිබාහන කළයුතු යැයි නො කියමි. යමෙක් ප්‍රතිබාහනය කරන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''යි වදළසේක.

46. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිලානෙ භික්ඛූ වුට්ඨාපෙන්ති. ගිලානා එවං වදෙන්ති 'න මයං ආවුසො සක්කොම වුට්ඨාතුං ගිලානම්හා'ති. 'මයං ආයස්මන්තෙ වුට්ඨාපෙස්සාමා'ති පරිග්ගහෙත්වා වුට්ඨාපෙත්වා ඨිතකෙ මුඤ්චන්ති. ගිලානා මුච්ඡිතා පපතන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ගිලානො වුට්ඨාපෙතබ්බො. යො වුට්ඨාපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ 'ගිලානා මයම්හා අවුට්ඨාපනීයා'ති වරසෙය්‍යායො පළිබුද්ධෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස පතිරූපං සෙය්‍යං දාතුන්ති".

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ලෙසකප්පෙන සෙනාසනං පටිබාහන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ ලෙසකප්පෙන සෙනාසනං පටිබාහිතබ්බං. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

47. තෙන ඛො පන සමයෙන සත්තරසවග්ගියා භික්ඛූ අඤ්ඤතරං පච්චන්තිමං මහාවිහාරං පටිසඞ්ඛරොන්ති 'ඉධ මයං වස්සං වසිස්සාමා'ති. අද්දසංසු ඛො ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියෙ භික්ඛූ විහාරං පටිසඞ්ඛරොන්තෙ. දිස්වාන එවමාහංසු 'ඉමෙ ආවුසො සත්තරසවග්ගියා භික්ඛූ අඤ්ඤතරං විහාරං පටිසඞ්ඛරොන්ති, හන්ද නෙ වුට්ඨාපෙස්සාමා'ති. එකච්චෙ එවමාහංසු: 'ආගමෙථ ආවුසො යාව පටිසඞ්ඛරොන්ති, පටිසඞ්ඛතෙ වුට්ඨාපෙස්සාමා'ති අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියෙ භික්ඛූ එතදවොචුං: 'උට්ඨෙථාවුසො අම්හාකං විහාරො පාපුණාතී'ති.

"නනු ආවුසො පටිගච්චෙව ආචික්ඛිතබ්බං. මයඤ්ච අඤ්ඤං පටිසඞ්ඛරෙය්‍යාමා"ති.

"නනු ආවුසො සඞ්ඝිකො විහාරො?"ති.

"ආම ආවුසො, සඞ්ඝිකො විහාරොති".

"උට්ඨෙථාවුසො, අම්හාකං විහාරො පාපුණාතී"ති.

46. එ සමයෙහි සවැගි මහණහු ගිලන් භික්ෂූන් නගාසිටුවත්. "ඇවැත්නි, නැගී සිටින්නට නො හැක්කම්හ ගිලනුම්හ"යි ගිලන් මහණහු මෙසේ කියත්. 'අපි ආයුෂ්මතුන් නගාසිටුවම්හ'යි කියා ඔහු ගිලන් මහතුන් අල්ලා නගාසිටුවා (එසේ) නැගී සිටියවුන් අතහරිත්. ගිලන් මහණහු ක්ලාන්ත ව වැටෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ගිලනා නො නැගිටුවියයුතු. යමෙක් නැඟුටුවන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

එ සමයෙහි සවැගි මහණහු 'අපි ගිලනුම්හ, නො නගාසිටුවිය යුත්තම්හ'යි කියා (සුව පහසු දෙන) මනායහන් අවුරාගෙන සැතපෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, ගිලනාහට සුදුසු යහනක් දෙන්නට අනුදනිමි"යි වදළසේක.

එ සමයෙහි සවැගි මහණෝ ස්වල්පමාත්‍ර ආබාධයෙනුත් සෙනසුන් පිළිබහත් (අන්කෙනකුට එය පරිභොග කරන්නට නො දෙත්). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, අල්පමාත්‍ර ආබාධයෙකින් සෙනසුන් නො පිළිබැඳිය යුතු. යමෙක් පිළිබහන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

47. එ සමයෙහි සතොළොස්වැගි මහණෝ 'අපි මෙහි වස් වසන්නම්හ'යි කියා පිටිසරබද මහවෙහෙරක් පිළිසකර කෙරෙත්. සවැගි මහණෝ වෙහෙර පිළිසකර කරන සතොළොස්වැගි මහණුන් දුටුහ. දක, 'ඇවැත්නි, මේ සතොළොස්වැගි මහණහු එක්තරා වෙහෙරක් පිළිසකර කෙරෙත්. අපි දුන් උන් නගාසිටුවම්හ'යි කීහ. ඔවුන් අතුරෙන් සමහරු 'ඇවැත්නි, පිළිසකර කොට නිමවන තෙක් බලාපොරොත්තුවවු, පිළිසකර කොට නිමි කල්හි නගාසිටුවන්නම්හ'යි කීහ. එ කල්හි සවැගි මහණහු සතොළොස්වැගි මහණුන් බණවා 'ඇවැත්නි, නැගීසිටිවු (ඉවත්වවු) විහාරය අපට පැමිණේ යැ'යි කීහ.

"ඇවැත්නි, කල් තබා ම කියයුතු වූයේ නො වේ ද? (එසේ කියන ලද නම්) අපි අන් වෙහෙරක් පිළිසකර කරන්නමෝ වේ ද"යි ඔහු කීහ.

"ඇවැත්නි, විහාරය සඟසතු නො වේ ද?"යි සවැගියෝ ඇසූහ:

"එසේ ය ඇවැත්නි විහාරය සඟසතුයැ"යි ඔහු කීහ.

"ඇවැත්නි, නැගිටින්න (ඉවත්වන්න) විහාරය අපට පැමිණේයැ"යි සවැගියෝ කීහ.

"මහල්ලකො ආවුසො විහාරො. තුම්හෙ'පි වසථ මයම්පි වසිස්සාමා''ති. "උට්ඨෙථාවුසො අම්හාකං විහාරො පාපුණාතී''ති. කුපිතා අනත්තමනා ගීවායං ගහෙත්වා නික්කඩ්ඪන්ති. තෙ නික්කඩ්ඪියමානා රොදන්ති. භික්ඛූ එවමාහංසු "කිස්ස තුම්හෙ ආවුසො රොදථා''ති.

''ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා අම්හෙ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪන්තී''ති.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪිස්සන්තී''ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪන්තීති. සච්චං භගවා -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

''න භික්ඛවෙ කුපිතෙන අනත්තමනෙන භික්ඛූ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪිතබ්බා. යො නික්කඩ්ඪෙය්‍ය, යථාධම්මො කාරෙතබ්බො. අනුජානාමි භික්ඛවෙ සෙනාසනං ගාහෙතුන්ති.''

48. අථ ඛො භික්ඛූනං එතදහොසි: 'කෙන නු ඛො සෙනාසනං ගාහෙතබ්බන්ති?' භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං සෙනාසනගාහාපකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො:

පඨමං භික්ඛු යාචිතබ්බො, යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"ඇවැත්නි, විහාරය මහත් ය, තෙපිත් වසවු. අපිත් වසන්නමු"යි සතොලොස්වැගියෝ කීහ. එවිට සවැගි මහණෝ කුපිත ව නො සතුටු වැ, "ඇවැත්නි, නැගීසිටිවු"යැ යි කියා බෙල්ලෙන් අල්ලා නික්මවත් (පිටතට ඇද දමත්.) ඔහු නික්මවනු ලබන්නාහු හඬත්. "ඇවැත්නි, තෙපි කුමට හඬවු දැ"යි භික්ෂූහු අසත්.

"ඇවැත්නි, මෙ සවැගි මහණෝ කිපුණාහු නො සතුවු වූවාහු අප සඟසතු වෙහෙරින් නෙරපත්"යැ යි ඔහු කීහ.

"යම් මහණ කෙනෙක් අල්පෙච්ඡද... ඔහු සවැගි මහණහු කුපිත ව නො සතුටු ව කෙසේ නම් භික්ෂූන් සඟසතු වෙහෙරින් නෙරපත්නාහු දැ"යි ලාමක කොට සිතත්, දෙස් නගත්, අගුණ පතුරුවත්.

එ කල්හි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ ... "මහණෙනි, සවැගි මහණහු කුපිත ව නො සතුටු ව මහණුන් සඟසතු වෙහෙරින් නෙරපන්නාහු ද? ඒ සැබෑ ද?" භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක. "සැබැව භාග්‍යවතුන් වහන්සැ"යි මහණහු කීහ. ... භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගරහා දැහැමි කථා කොට භික්ෂූන් බණවා,

"මහණෙනි, මහණකු කිපි නො සතුටු ව මහණෙක් සඟ සතු වෙහෙරින් නො ම නෙරැපියැයුතු. යමෙක් නෙරැපත්තේ වී නම් ඔහුට ධර්‍මය වූ පරිදි (විනයනීතිය පරිදි) දඬුවම් කැරැවියැයුතුය. මහණෙනි, සෙනසුන් ගන්වන්නට අනුදනිමි"යි වදළසේක.

48. එ කල්හි මහණුනට 'කවරකු විසින් සෙනසුන් ගැන්විය යුතු දැ?'යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ වග දැන්වූහ.

"මහණෙනි, අඞ්ග පසෙකින් සමන්විත මහණක්හු සෙනසුන් ගන්වන්නකු කොට සම්මත කරන්නට අනුදනිමි. යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වෙෂයෙන් අගතියට නො යන්නේ ද බියෙන් අගතියට නො යන්නේ ද මුළායෙන් අගතියට නො යන්නේ ද ගත් නොගත් සෙනසුන් දන්නේ ද මේ ඒ අඞ්ග පස ය. මහණෙනි, ඒ මහණ මෙසේ සම්මත කටයුතු ය.

පළමු කොට (සෙනාසන ගාහාපක බව පිළිගනු පිණිස) මහණෙක් යැදියයුතු. යැද, වියත් ප්‍රබල මහණක්හු විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියැයුතු:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සෙනාසනගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සෙනාසනගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සෙනාසනගාහාපකස්ස සම්මුති. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු සෙනාසනගාහාපකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

අථ ඛො සෙනාසනගාහාපකානං භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො සෙනාසනං ගාහෙතබ්බන්ති." භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඨමං භික්ඛූ ගණෙතුං, භික්ඛූ ගණෙත්වා සෙය්‍යා ගණෙතුං, සෙය්‍යා ගණෙත්වා සෙය්‍යග්ගෙන ගාහෙතුන්ති."

සෙය්‍යග්ගෙන ගාහෙන්තා සෙය්‍යා උස්සාදයිංසු.

"අනුජානාමි භික්ඛවෙ විහාරග්ගෙන ගාහෙතුන්ති."

විහාරග්ගෙන ගාහෙන්තා විහාරං උස්සාදයිංසු -පෙ-

"අනුජානාමි භික්ඛවෙ පරිවෙනග්ගෙන ගාහෙතුන්ති."

පරිවෙනග්ගෙන ගාහෙන්තා පරිවෙනං උස්සාදයිංසු.

"අනුජානාමි භික්ඛවෙ අනුභාගම්පි දාතුං. ගහිතෙ අනුභාගෙ අඤ්ඤො භික්ඛු ආගච්ඡති න අකාමා දාතබ්බො"ති.

"වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ වී නම්, සඞ්ඝ තෙමේ මෙනම් මහණහු සෙනසුන් ගන්වන්නකු කොට සම්මත කෙරේවා. මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙනම් මහණහු සෙනසුන් ගන්වන්නකු කොට සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක්හට මෙ නම් මහණහට සෙනසුන් ගන්වන සම්මතිය (දීම) රිසියෙන්නේ නම් හේ නිහඬ වේවා. යමකුට නො රිසියෙන්නේ නම් හේ කියාවා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ සෙනසුන් ගන්වන්නකු කොට සම්මත විය. සඞ්ඝයාට (එය) රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය සලකමි'' යනු යැ.

එ කල්හි සෙනසුන් ගන්වන මහණුනට "කෙසේ නම් සෙන සුන් ගැන්වියැ යුතු දැ?''යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, පළමු කොට මහණුන් ගණන් කරන්නට, මහණුන් ගැණ යහන් ගණින්නට, යහන් ගැණ යහන් පිරිසෙයින් (යහන් ගණනට) යහන් ගන්වන්නට අනුදනිමි''යි වදළ සේක.

යහන් ගණනින් යහන් ගන්වන්නාහු යහන් ඉතිරි කළාහ.

"මහණෙනි, විහාර ගණනින් සෙනසුන් ගන්වන්නට අනුදනිමි'' යි වදළසේක.

විහාර ගණනින් සෙනසුන් ගන්වන්නාහු විහාරයක් ඉතිරි කළහ....

"මහණෙනි, පිරිවෙන් ගණනින් සෙනසුන් ගන්වන්නට අනුදනිමි''යි වදළසේක.

පිරිවෙන් ගණනින් සෙනසුන් ගන්වන්නාහු පිරිවෙනක් ඉතිරි කළාහ.

"මහණෙනි, නැවත තව කොටසක් ද දෙන්නට අනුදනිමි. එ අතිරෙක කොටස ගත් කලැ අන් මහණෙක් ආයේ වී නම් නො කැමැත්තෙන් (ඔහුට) ඒ අනුභාගය (සෙනසුන් කොටස) නොදියැ යුතු යැ'' වදළසේක.

49. තෙන ඛො පන සමයෙන භික්ඛූ නිස්සීමෙ ඨිතස්ස සෙනාසනං ගාහෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ නිස්සීමෙ ඨිතස්ස සෙනාසනං ගාහෙතබ්බං. යො ගාහෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ සෙනාසනං ගාහෙත්වා සබ්බකාලං පටිබාහන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ සෙනාසනං ගාහෙත්වා සබ්බකාලං පටිබාහිතබ්බං. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ වස්සානං තෙමාසං පටිබාහිතුං උතුකාලං න පටිබාහිතුන්ති."

අථ ඛො භික්ඛූනං එතදහොසි "කති නු ඛො සෙනාසනගාහා?"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"තයො මෙ භික්ඛවෙ සෙනාසනගාහා: පුරිමකො පච්ඡිමකො අන්තරාමුත්තකො. අපරජ්ජුගතාය ආසාළ්හියා පුරිමකො ගාහෙතබ්බො, මාසගතාය ආසාළ්හියා පච්ඡිමකො ගාහෙතබ්බො, අපරජ්ජුගතාය පවාරණාය ආයතිං වස්සාවාසත්ථාය අන්තරාමුත්තකො ගාහෙතබ්බො. ඉමෙ ඛො භික්ඛවෙ තයො සෙනාසනගාහා"ති.

දුතියභාණවාරං නිට්ඨිතං.

49. එ සමයෙහි වනාහි භික්ෂූහු උපචාර සීමායෙන් පිටත සිටියාහට සෙනසුන් ගන්වත් භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ

"මහණෙනි, උපචාර සීමාවෙන් පිටත සිටි මහණහට සෙනසුන් නො ගැන්වියයුතු. යමෙක් ගන්වන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ" ය.

එ සමයෙහි මහණහු සෙනසුන් ගන්වා සියලු කාලයෙහි අන් මහණුනට පිළිබහත් (එන්නට නො දෙත්). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ.

"මහණෙනි, සෙනසුන් ගන්වා (තමනට පවරවා ගෙන) සියලු කල්හි ප්‍රතිබාහනය (අන් මහණුනට එන්නට නො දී ඔවුන් බැහැර කිරීම සෙනස්න අත්නැර තමන් සතු කොටගෙන තැබීම) නො කළයුතු. යමෙක් ප්‍රතිබාහනය කරන්නේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, වස් තුන් මස තමා ඉන්නා සෙනස්න පිළිබහන්නට (අන් අයට අත් කරගන්නට නොදී තමා සතුව ම පවත්වන්නට ද සෘතු කාලයෙහි [සෙසු මාස්හි] නො පිළිබහන්නට [තමා සතු කොට ගෙන ම තබා නොගන්නට] අන් මහණුන් එය පරිහරණය කරන්නට ආවොත් ඔවුන් නො වළක්වන්නට) අනුදනිමි"යි වදළසේක.

එ කල්හි "සෙනසුන් ගැන්වීම් කීයෙක් ද?"යි භික්ෂූනට මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. (භාග්‍ය-වතුන් වහන්සේ මෙය වදළසේක:)

"මහණෙනි, පුරිමකය, පශ්චිමකය, අන්තරාමුක්තකයැ යි සෙනසුන් ගැන්වීම් තුනෙක, ඇසළ පුණුපසොළොස්වක ගියාට පසු දින පළමු සෙනසුන් ගැන්වීම කළයුතු. ඇසළ පුණුපසොළොස්වක ගතව මසක් ගිය කලැ පැසිම් සෙනසුන් ගැන්වීම කළයුතු. වස් පවාරණය ගත වූ කලැ (ඉතිරි අටමාසය යදහා ද) එයින් මතු වස් විසීම් පිණිස අන්තරාමුක්තක සෙනසුන් ගැන්වීම කළයුතු. මහණෙනි, මේ සෙනසුන් ගැන්වීම් තුන යැ".

## දෙවෙනි බණවර නිමියේ යි.

50. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සාවත්ථියං සෙනාසනං ගහෙත්වා අඤ්ඤතරං ගාමකාවාසං අගමාසි. තත්‍රාපි සෙනාසනං අග්ගහෙසි. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "අයං ඛො ආවුසො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භණ්ඩනකාරකො කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො. සචායං ඉධ වස්සං වසිස්සති සබ්බෙව මයං න ඵාසුං වසිස්සාම. හන්ද නං පුච්ඡාමා"ති.

අථ ඛො තෙ භික්ඛූ ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොචුං: "නනු තයා ආවුසො උපනන්ද සාවත්ථියං සෙනාසනං ගහිතන්ති."

"එවමාවුසො"ති.

"කිං පන ත්වං ආවුසො උපනන්ද එකො ද්වෙ පටිබාහසී"ති,

"ඉධ'දානාහං ආවුසො මුඤ්චාමි. තත්‍ර ගණ්හාමී"ති.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො එකො ද්වෙ පටිබාහිස්සතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා -පෙ- එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං පටිපුච්ඡි "සච්චං කිර ත්වං උපනන්ද එකො ද්වෙ පටිබාහසී"ති.

"සච්චං භගවා."

විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස එකො ද්වෙ පටිබාහිස්සසි, තත්‍ර තයා මොඝපුරිස ගහිතං ඉධ මුත්තං. ඉධ තයා ගහිතං තත්‍ර මුත්තං. එවං ඛො ත්වං මොඝපුරිස උභයත්ථ පරිබාහිරො. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛො තං අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා"ති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ එකෙන ද්වෙ පටිබාහිතබ්බා, යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

50. එ සමයෙහි ශාක්‍යපුත්‍ර වූ උපනන්ද තෙරණුවෝ සැවැත්හි සෙනසුන් ගෙන, එක්තරා කුඩා ගමෙක ආවාසයකට ගියේ ය. එහි ද සෙනස්නක් ලැබ ගත්තේ ය. එ කලැ ඒ මහණුනට, "ඇවැත්නි, මේ ශාක්‍යපුත්‍ර උපනන්ද තෙරණුවෝ අරගල කරන්නෙකි, කලහ කරන්නෙකි, විවාද කරන්නෙකි, කතාබහෙන් ආරාවුල් උපදවන්නෙකි, සඞ්ඝයා අතරැ නඩු ඇති කරන්නෙකි. මෙ තෙම මෙහි වස් වසන්නේ වී නම්, අපි හැම දෙනා ම පහසු සේ නො වසන්නමු. එබැවින් ඔහු විචාරමු" යි මෙ සිත විය.

ඉක්බිත්තෙන් ඒ මහණහු ශාක්‍යපුත්‍ර උපනන්ද තෙරුනට, "ඇවැත් උපනන්දයෙනි, ඔබ විසින් සැවැත්හි සෙනස්නෙක් ගන්නා ලද්දේ නොවේ දැ?" යි කීහ.

"එසේ ය ඇවැත්නි" යි උපනන්ද තෙරණුවෝ කීහ.

"ඇවැත් උපනන්දයෙනි, කිමෙක් ද? එක් කෙනෙක් ම වූ ඔබ සෙනසුන් දෙකක් පිළිබහන් කෙරෙත් ද (තමනට වෙන් කොට ගෙන සෙස්සන් එයින් වළක්වත් ද)?"

"ඇවැත්නි, දැන් මෙහි සෙනස්න මුදමි. (අත්හරිමි). එහි සෙනස්න ගනිමි" යි තෙරණුවෝ කීහ.

යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ ද ලද දැයින් සතුටු වන්නෝ ද ලජ්ජීහු ද, කුකුස් කරන්නෝ ද, ශික්ෂා රකිනුයෙහි කැමැත්තෝ ද, ඔහු "කෙසේ නම් ශාක්‍යපුත්‍ර උපනන්ද තෙරණුවෝ එක් කෙනෙක් වැ සෙනසුන් දෙකක් පිළිබහන්නෝ දැ" යි පහත් කොට සිතත්, දෙස් නගත්, නො ගුණ පතුරවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ... මේ නිදානයෙහි මෙ කරුණෙහි භික්සඝන රැස් කරවා, ශාක්‍ය පුත්‍ර උපනන්දයන් බණවා, "උපනන්දයෙනි, තෙපි එක් කෙනෙක් වැ සෙනසුන් දෙකක් පිළිබහවූ ද? සැබෑ දැ?" යි අසා වදාළසේක.

"සැබැව භාග්‍යවතුන් වහන්සැ" යි ඔබ කීහ.

"හිස් මිනිස, තෝ එකෙක් වැ කෙසේ නම් සෙනසුන් දෙකක් පිළිබහයි ද හිස්මිනිස, තා විසින් එහි (සෙනස්නක්) ගන්නා ලද්දේ මෙහි (සෙනස්න) මුදන ලද්දේ ය. මෙහි (සෙනස්න) ගන්නා ලද්දේ එහි (සෙනස්න) මුදන ලද්දේ ය. හිස්මිනිස, මෙසේ ම තෝ දෙ තන්හි ම පරිබාහිර වූයෙහි (සෙනස්නක් නැත්තෙක් වූයෙහි). හිස්මිනිස, මෙය සස්න කෙරෙහි පහන් නො වූවන්ගේ පැහැදීම පිණිස ද පහන් වූවන්ගේ වැඩීම පිණිස ද නො වේ. වැලි නො පහන් වූවන්ගේ නො පැහැදීම පිණිස ද පහන් වූ සමහර කෙනෙකුන්ගේ වෙනස් බව පිණිස ද වේ" යැ යි වෙසෙසින් ගැරැහූසේක. ගරහා දැහැමි කතා කොට, මහණුන් බණවා, "මහණෙනි, එක් මහණක්හු විසින් සෙනසුන් දෙකක් නො පිළිබැහියයුතු (තමාට වෙන් කොට නො ගතයුතු). යමෙක් පිළිබහන්නේ නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදාළසේක.

51. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූනං අනෙකපරියායෙන විනයකථං කථෙති. විනයස්ස වණ්ණං භාසති. විනයපරියත්තියා වණ්ණං භාසති. ආදිස්ස ආදිස්ස ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති. භික්ඛූනං එතදහොසි: "භගවා ඛො අනෙකපරියායෙන විනයකථං කථෙති, විනයස්ස වණ්ණං භාසති, විනයපරියත්තියා වණ්ණං භාසති, ආදිස්ස ආදිස්ස ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති. හන්ද මයං ආවුසො ආයස්මතො උපාලිස්ස සන්තිකෙ විනයං පරියාපුණාමා"ති. තෙ ච බහූ භික්ඛූ ථෙරා ච නවා ච මජ්ඣිමා ච ආයස්මතො උපාලිස්ස සන්තිකෙ විනයං පරියාපුණන්ති. ආයස්මා උපාලි ඨිතකො'ව උද්දිසති ථෙරානං භික්ඛූනං ගාරවෙන. ථෙරාපි භික්ඛූ ඨිතකා'ව උද්දිසාපෙන්ති ධම්මගාරවෙන. තත්ථ ථෙරා චෙව භික්ඛූ කිලමන්ති ආයස්මා ච උපාලි.

භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ නවකෙන භික්ඛුනා උද්දිසන්තෙන සමකෙ වා ආසනෙ නිසීදිතුං උච්චතරකෙ වා ධම්මගාරවෙන. ථෙරෙන භික්ඛුනා උද්දිසාපෙන්තෙන සමකෙ වා ආසනෙ නිසීදිතුං නීචතරකෙ වා ධම්මගාරවෙනා"ති.

තෙන ඛො පන සමයෙන බහූ භික්ඛූ ආයස්මතො උපාලිස්ස සන්තිකෙ ඨිතකා'ව උද්දෙසං පතිමානෙන්තා[1] කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ සමානාසනිකෙහි සහ නිසීදිතුන්ති."

අථ ඛො භික්ඛූනං එතදහොසි: "කිත්තාවතා නු ඛො සමානාසනිකො හොති?"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ තිවස්සන්තරෙන සහ නිසීදිතුන්ති".

තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ සමානාසනිකා එකමඤ්චෙ[2] නිසීදිත්වා මඤ්චං භින්දිංසු. එකපීඨෙ[3] නිසීදිත්වා පීඨං භින්දිංසු. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ තිවග්ගස්ස මඤ්චං, තිවග්ගස්ස පීඨන්ති." තිවග්ගො පි මඤ්චෙ නිසීදිත්වා මඤ්චං භින්දි, පීඨෙ නිසීදිත්වා පීඨං භින්දි.

1. පටිමානෙන්තා - සගා.
2. මඤ්චෙ - මජසං, සීමු.
3. පීඨෙ මජසං, සීමු.

51. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට නොයෙක් කරුණින් විනය කථාව වදරනසේක. විනයයේ ගුණ වණන සේක. විණය බණ ඉගැන්මෙහි ගුණ වදරනසේක. ආදර්ශ කොට උපාලි තෙරුන්ගේ ගුණ වදරනසේක: ''භාග්‍යවතුන් වහන්සේ වූ කලී නොයෙක් කරුණින් විනය කථාව වදරනසේක. විනයයේ ගුණ වදරනසේක. විනය බණ ඉගැන්මෙහි ගුණ වදරන සේක. ආදර්ශ කොට කොට උපාලි තෙරුන්ගේ ගුණ වදරන සේක. ඇවැත්නි, අපි උපාලි තෙරුන් වෙත විනය පුහුණු කරමහ'' යි භික්ෂූනට මේ සිත විය. ඒ බොහෝ ස්ථවිර භික්ෂූහු ද නවක භික්ෂූහු ද මධ්‍යම භික්ෂූහු ද උපාලි තෙරුන් වෙත විනය බණ උගනිත්. උපාලි තෙරණුවෝ තමනට වඩා මහලු තෙරුනට ගෞරවයෙන් සිටියාහු ම (සිට ගෙන ම) බණ උදෙසයි (උගන්වයි), ස්ථවිර (වැඩි මහලු) භික්ෂූහු ද සිටගත්තාහු ම ධර්මගෞරවයෙන් (විනය) උදෙසවාගනිත් (කියවා ගනිත්), එහි ස්ථවිර භික්ෂූහු ද උපාලි තෙරණුවෝ ද (බොහෝ වේලා) (සිටගත් වන ම සිටියාහු) වෙහෙසට පැමිණෙත්.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, උදෙසන (බණ උගන්වන) නවක මහණුහු විසින් ධර්මගෞරවයෙන් සමාන අස්නෙක හෝ වඩා උස් අස්නෙක හෝ ඉඳින්නට ද, උදෙස්වන (ඉගෙනගන්නා) ස්ථවිර භික්ෂූහු විසින් ධර්මගෞරවයෙන් සමාන අස්නෙක හෝ (උගන්වන තෙරුන්ගේ අස්නට) වඩා මිටි අස්නෙක හෝ හිඳින්නට ද අනුදනිමි'' යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

එ සමයෙහි වනාහි බොහෝ භික්ෂූහු උපාලි තෙරුන් සමීපයෙහි සිටගත්තාහු ම උදෙසීම බලාපොරොත්තු වන්නාහු වෙහෙසෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, සමානාසනිකයන් සමග හිඳගන්නට අනුදනිමි'' යි වදළසේක.

එ කල්හි භික්ෂූනට ''කොපමණෙකින් සමානාසනිකයෙක් වන්නේ ද?'' යි මෙ සිත විය. ඔහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, තුන් වසක් අතර ඇති (තමාට වඩා වස් එකක් හෝ දෙකක් වැඩි හෝ අඩු) මහණකු හා එක් අස්නෙහි ඉඳගන්නට අනුදනිමි'' යි වදළසේක.

එ සමයෙහි බොහෝ සමානාසනික මහණුහු එක් ඇඳෙක හිඳ ඇඳ බින්දහ. (කඩා දැමූහ). එක් පුටුවෙක හිඳ පුටුව කැඩූහ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, තුන් දෙනකුනට ඇඳ ද තුන් දෙනකුනට පුටුව ද අනුදනිමි'' යි වදළසේක. තුන්දෙනෙක් ද ඇඳෙක හිඳ එය කැඩූහ, පුටුවෙක හිඳ පුටුව කැඩූහ.

''අනුජානාමි භික්ඛවෙ දුවග්ගස්ස මඤ්චං දුවග්ගස්ස පීඨන්ති.''

තෙන ඛො පන සමයෙන භික්ඛූ අසමානාසනිකෙහි සහ දීඝාසනෙ නිසීදිතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා පණ්ඩකං මාතුගාමං උභතොබ්‍යඤ්ජනකං අසමානාසනිකෙහි සහ දීඝාසනෙ නිසීදිතුන්ති.''

අථ ඛො භික්ඛූනං එතදහොසි 'කිත්තකපච්ඡිමං නු ඛො දීඝාසනං හොති'ති –පෙ–

''අනුජානාමි භික්ඛවෙ යං තිණ්ණන්නං පහොති[1] එත්තකපච්ඡිමං දීඝාසනන්ති.''

52. තෙන ඛො පන සමයෙන විසාඛා මිගාරමාතා සඞ්ඝස්ස අත්ථාය සාලින්දං පාසාදං කාරාපෙතුකාමා හොති හත්ථිනඛකං, අථ ඛො භික්ඛූනං එතදහොසි ''කින්නු ඛො භගවතා පාසාදපරිභොගෙ අනුඤ්ඤාතො කිං අනනුඤ්ඤාතො?''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ සබ්බං පාසාදපරිභොගන්ති.''

තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අය්‍යකා කාලකතා හොති. තස්සා කාලකිරියාය සඞ්ඝස්ස බහුං අකප්පියභණ්ඩං උප්පන්නං හොති. සෙය්‍යථීදං: ආසන්දි පල්ලඞ්කො ගොණකො චිත්තකො පටිකා පටලිකා තූලිකං විකතිකං උද්දලොමිකං එකන්තලොමිකං කට්ටිස්සං කොසෙය්‍යං කුත්තකං කම්බලං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණි කාදලිමිගපවරපච්චත්ථරං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ ආසන්දියා පාදෙ ඡින්දිත්වා පරිභුඤ්ජිතුං, පල්ලඞ්කස්ස වාලෙ භින්දිත්වා පරිභුඤ්ජිතුං, තූලිකං විජටෙත්වා බිම්බොහනං කාතුං, අවසෙසං භුම්මත්ථරණං කාතුන්ති.''

1. තිණ්ණං නප්පහොති – සීමු, මජසං,

"මහණෙනි, දෙදෙනකුනට ඇඳ ද දෙදෙනකුනට පුටුව ද අනුදනිමි'' යි වදළසේක.

එ සමයෙහි භික්ෂූහු සමාසනික නොවන භික්ෂූන් හා දික් අස්නෙහි හිඳින්නට කුකුස් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, පණ්ඩකයා ද මාගම ද උභතොබ්‍යංජනකයා ද හැර, (සෙසු) අසමානාසනිකයන් හා එක් දීර්ඝාසනයෙහි ඉඳගන්නට අනුදනිමි'' යි වදළසේක.

එ කල්හි 'කොතෙකින් පැසිම් අස්න දීඝාසනයෙක් වේ ද?' යි භික්ෂූනට මේ සිත විය ...

"යම් අස්නෙක් තුන් දෙනකුනට සෑහෙයි ද. දීඝාසනය එ පමණින් පැසිම් අස්න යැ (තුන් දෙනකුහට පමණක් ඉඳිත හැකි අස්න අඩු ම ප්‍රමාණයේ වූ දික් අස්න යැ) යි වදළ සේක.

52. එ සමයෙහි මිගාර මාතෘ නම් වූ විශාඛා තොමෝ ආලින්දයක් (ඉස්තෝප්පුවක්) සහිත වූ ඇත්කුඹු සටහන් මත්තෙහි වැම් බැඳ තැනූ ප්‍රාසාදයක් සංඝයා උදෙසා කරවන්නට කැමැත්ති වූවාය. එ කලැ මහණුනට, "භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූනට කෙබඳු ප්‍රාසාද පරිභොගයෙක් අනුදන්නා ලද ද? කෙබඳු ප්‍රාසාද පරිභොගයෙක් නො අනුදන්නා ලද ද?'' යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, සියලු ප්‍රාසාද පරිභොගය අනුදනිමි'' යි වදළ සේක.

එ සමයෙහි පසේනදී කොසොල් රජුගේ මිත්තණියෝ කලුරිය කළාහ. ඇගේ කලුරියෙන්, දික්සඟළා පුටු ය, පළඟය, සතරඟුලට වඩා දික් ලොම් ඇති ඇතිරි ය, එළලොමින් කළ විසිතුරු ඇතිරි ය, එළලොම් මුවා සුදු ඇතිරි ය, පුළුනෙන් පිරූ ඇතිරි ය, ගනපුප් ඇති එළලොම් මුවා ඇතිරි ය, සිංහව්‍යාඝ්‍රාදි රූපයෙන් විසිතුරු එළලොම් මුවා ඇතිරි ය, එක් පැත්තෙක පමණක් ලොම් ඇති එළලොම්මුවා ඇතිරි ය, දෙ පැත්තේ ම ලොම් ඇති එළ ලොම්මුවා ඇතිරි ය, කිහිරිහුයින් වියූ රන්කසු කම් කළ පසතුරණ, ලොම්මුවා පලස, නිළියන් සොළොස් දෙනෙකුන්ට සිට රඟ පාන්නට තරම් දික් පුළුල ඇති මහ ඇතිරි ය, ඇතුන් පිට අතුරන ඇතිරි ය, අසුන් පිට අතුරන ඇතිරි ය, රියෙහි අතුරන ඇතිරි ය, අඳුන් දිවිසමින් කළ පසතුරුණ, දෙපසැ රතු කොට්ට තැබූ උඩු වියන් සහිත කෙසෙල් මුව සමින් කළ මහඟු පසතුරුණ යන මේ බොහෝ අකැප බඩු යන බොහෝ නොකැප බඩු සංඝයාට උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, දික් සඟළා පුටුවේ පා සිඳ පරිභොග කරන්නට ද, පළඟෙහි ව්‍යාල රූප බිඳදමා පරිභොග කරන්නට ද, පුළුන් මෙට්ටය මැහුම් ලිහා කොට්ට කරන්නට ද, ඉතිරි දෑ බුමුතුරුණු කරන්නට ද අනුදනිමි'' යි වදළසේක.

53. තෙන ඛො පන සමයෙන සාවත්ථියා අවිදූරෙ අඤ්ඤතරස්මිං ගාමකාවාසෙ ආවාසිකා භික්ඛූ උපද්දුතා හොන්ති ආගන්තුකගමිකානං භික්ඛූනං සෙනාසනං පඤ්ඤාපෙන්තා. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "එතරහි ඛො මයං ආවුසො උපද්දුතා ආගන්තුකගමිකානං භික්ඛූනං සෙනාසනං පඤ්ඤාපෙන්තා. හන්ද මයං ආවුසො සබ්බං සංඝිකං සෙනාසනං එකස්ස දෙම තස්ස සන්තකං පරිභුඤ්ජිස්සාමා"ති. තෙ සබ්බං සංඝිකං සෙනාසනං එකස්ස අදංසු. ආගන්තුකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං: 'අම්හාකං ආවුසො සෙනාසනං පඤ්ඤාපෙථා'ති.

"නත්ථාවුසො සඞ්ඝිකං සෙනාසනං සබ්බං අම්හෙහි එකස්ස දින්නන්ති." "කිං පන තුම්හෙ ආවුසො සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙථා"ති.

"එවමාවුසො"ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙස්සන්ති"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර භික්ඛවෙ භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙන්ති"ති?

"සච්චං භගවා."

විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ-" විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

පඤ්චිමානි භික්ඛවෙ අවිස්සජ්ජියානි න විස්සජ්ජෙතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතානිපි අවිස්සජ්ජිතානි හොන්ති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස. කතමානි පඤ්ච: ආරාමො ආරාමවත්ථු. ඉදං පඨමං අවිස්සජ්ජියං න විස්සජ්ජෙතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා විස්සජ්ජිතම්පි අවිස්සජ්ජිතං හොති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

විහාරො විහාරවත්ථු, ඉදං දුතියං අවිස්සජ්ජියං: න විස්සජ්ජෙතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතම්පි අවිස්සජ්ජිතං හොති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

53. එ සමයෙහි සැවැත් නුවරට නොදුරෙහි එක්තරා කුඩා ගමෙක ආවාසයෙක වසන භික්ෂූහු ආගන්තුක වූ ද ගමික වූ ද භික්ෂූනට සෙනසුන් පනවන්නාහු එයින් පීඩාවට පත් වූහ. එකලැ ඒ භික්ෂූනට මේ සිත විය. "ඇවැත්නි, දැන් වනාහි අපි ආගන්තුක වූ ද ගමික වූ ද මහණුනට සෙනසුන් පනවන්නමෝ පීඩාවට පැමිණියම්හ. ඇවැත්නි, එබැවින් අපි සියලු සඟසතු සෙනස්න එක් මහණකුට දෙමු. ඔහු සතු වූ එය පරිභොග කරන්නමු" යනු යි. ඔහු සියලු සඟසතු සෙනස්න එක් මහණකුට දුන්හ. ආගන්තුක මහණහු 'ඇවැත්නි, අපට සෙනසුන් පනවන්නැ' යි කීහ.

"ඇවැත්නි සඟ සතු සෙනස්නෙක් නැත. සියල්ල අප විසින් එක් මහණකුට දෙනලද්දැ"යි (නෙවාසික මහණහු) කීහ. "ඇවැත්නි, කිමෙක් ද? තෙපි සඟසතු සෙනස්න එක් කෙනකුට පවරා දුන්නාහු ද?" යි ඔහු ඇසූහ.

"එසේ ය, ඇවැත්නි" යි ඔහු කීහ. අල්පෙච්ඡ වූ ... යම් භික්ෂු කෙනෙක් වෙත් ද, ... ඔහු "කෙසේ නම් භික්ෂූහු සඟසතු සෙනසුන් එකකුට පවරා දෙන්නාහු ද" යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්. ඉක්බිති එ මහණහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

"මහණෙනි, මහණහු සඟසතු සෙනස්න (එක් මහණකුට) පවරාදුන්නාහු ද? සැබෑ ද?"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක.

"එසේ ය භාග්‍යවතුන් වහන්සැ" යි ඔහු කීහ.

"මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ සඟසතු සෙනස්න කෙනකුට පැවැරුවෝ ද? මෙය නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස ද ... නො වේ" යැ යි වෙසෙසින් ගැරැහූ සේක. ගරහා දැහැමි කථා කොට මහණුන් බණවා මෙය වදළසේක:

"මහණෙනි, මේ පස සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ අනෙකකුට (පෞද්ගලික අයිතියට) නො දිය යුතු ය, නො පැවරියයුතු ය. දෙන ලද්දේ ද නො දෙන ලද්දේ වේ. යමෙක් දෙන්නේ නම් තුලැසි ඇවැත් වන්නේ ය. කවර පසෙක් ද යත්: ආරාමය, ආරාම වත්ත, මේ පළමු වන නො දියයුතු දය ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ නො දියයුතු ය. දෙන ලද්දේ ද නො දෙන ලද්දේ වෙයි. යමෙක් දෙන්නේ නම් තුලැසි ඇවැත් වන්නේ ය.

විහාරය ද විහාර වත්ත ද දෙවෙනි අවිස්සජ්ජිය වස්තු ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් පුද්ගලයකු සතු කොට නො දියයුතු ය. දෙන ලද්දේ ද නො දෙන ලද්දේ වේ. යමෙක් දෙන්නේ ද තුලැසි ඇවැත් වන්නේ ය.

මඤ්චො පීඨං භිසි බිම්බොහනං ඉදං තතියං අවිස්සජ්ජියං: න විස්සජ්ජෙතබ්බං: සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතම්පි අවිස්සජ්ජිතං හොති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

ලොහකුම්භී ලොහභාණකං ලොහවාරකො ලොහකටාහං වාසි ඵරසු කුඨාරී කුදාලො නිඛාදනං ඉදං චතුත්ථං අවිස්සජ්ජියං. න විස්සජ්ජෙතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතම්පි අවිස්සජ්ජිතං හොති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

වල්ලි වෙළු මුඤ්ජං බබ්බජං තිණං මත්තිකා දරුභණ්ඩං මත්තිකාභණ්ඩං ඉදං පඤ්චමං අවිස්සජ්ජියං. න විස්සජ්ජෙතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතම්පි අවිස්සජ්ජිතං හොති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අවිස්සජ්ජියානි න විස්සජ්ජෙතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතානිපි අවිස්සජ්ජිතානි හොන්ති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්සා''ති.

54. අථ ඛො භගවා සාවත්ථියං යථාභිරන්තං විහරිත්වා යෙන කීටාගිරි තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච. අස්සොසුං ඛො අස්සජිපුනබ්බසුකා භික්ඛූ ''භගවා කිර කීටාගිරිං ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච''. ''හන්ද මයං ආවුසො සබ්බං සඞ්ඝිකං සෙනාසනං භාජෙම. පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතා. න මයං තෙසං සෙනාසනං පඤ්ඤපෙස්සාමා''ති. තෙ සබ්බං සඞ්ඝිකං සෙනාසනං භාජෙසුං.

අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කීටාගිරි තදවසරි. අථ ඛො භගවා සම්බහුලෙ භික්ඛූ ආමන්තෙසි ''ගච්ඡථ තුම්හෙ භික්ඛවෙ, අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ උපසඞ්කමිත්වා එවං වදෙථ: භගවා ආවුසො ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච. භගවතො ච ආවුසො සෙනාසනං පඤ්ඤපෙථ[1] භික්ඛුසඞ්ඝස්ස ච සාරිපුත්තමොග්ගල්ලානානඤ්චා''ති.

1. පඤ්ඤපෙථ - මජසං.

ඇඳ ද පුටුව ද බිස්ස ද කොට්ටය ද යන මේ තෙවෙනි අවිස්සජ්ජිය වස්තු ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ (පුද්ගලයකු සතු කොට) නො පැවරිය යුතු ය. එසේ දෙන ලද්දේ ද නො දෙන ලද්දේ ම වේ. යමෙක් දෙන්නේ ද, තුලැසි ඇවැත් වන්නේ ය.

ලොහො සැළි ය, ලොහො පැණ, ලොහො කළ ය, ලොහො කටාරම, වෑය, පොරොව, කෙටේරිය, උදැල්ල, නියන යන මේ සතර වන අවිස්සජ්ජිය වස්තු ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ පුඟුලකු සතු කොට නො දියයුතු ය. යමෙක් එසේ දෙන්නේ ද ඔහුට තුලැසි ඇවැත් වන්නේ ය.

වැල්, හුන, මුදුතණ, බබුස්තණ, සෙසු තෘණවර්ග, මැටි, ලිබඩු, මැටිබඩු, යන මේ පස්වන අවිස්සජ්ජිය වස්තු ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ (පුඟුල් සතු කොට) මහණකුට නො දියයුතු ය. දෙන ලදුයේ ද නො දෙන ලදුයේ වේ. යමෙක් දෙන්නේ ද ඔහුට තුලැසි ඇවැත් වන්නේ ය.

මහණෙනි, මොහු අවිස්සජ්ජිය (පුද්ගලයකු සතු කොට නො දිය යුතු) වස්තු පස් වගය ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ (පුඟුල් සතු කොට) නො දියයුතු ය. එසේ දෙන ලද ද නො දෙන ලද්දේ ම වේ. යමෙක් දෙන්නේ ද ඔහුට තුලැසි ඇවැත් වන්නේ ය.

54. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර කැමැති තාක් වැස සැරියුත් මුගලන් දෙනම ද භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් මහණ මුළුවක් ද හා කීටාගිරි දනව්වට සැරිසරා වැඩිසේක. අස්සජි පුනබ්බසුක යන මහණහු "භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් දෙනම ද පන්සියක් පමණ වූ මහත් මහණ මුළුවක් ද කැටුව කීටාගිරියට වඩිනසේකැ" යි ඇසූහ. "ඇවැත්නි, අපි දැන් සියලු සඟසතු දෑ බෙද ගනිමු. සැරියුත් මුගලන් දෙදෙනා ලාමක ආශා ඇත්තෝ ය, ලාමක ආශාවනට වශග වූවෝ ය. අපි ඔවුනට සෙනසුන් නො පනවමු" යි ඔහු කතිකා කැරගත්හ. ඔහු මෙසේ කතිකා කොට ගෙන සියලු සඟසතු දෑ බෙදූහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් සැරිසරා වඩනාසේක් කීටාගිරියට පැමිණ වදළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් බණවා "මහණෙනි, තෙපි යවු. අස්සජි පුනබ්බසුක මහණුන් කරා එළැඹ, "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ පන්සියක් පමණ වූ මහත් භික්ෂු සඞ්ඝයා ද සැරියුත් මුගලන් දෙ නම ද කැටුව වඩිනා සේක. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සඞ්ඝයාට ද සැරියුත් මුගලන් දෙනමට ද සෙනසුන් පනවවු යැ"යි මෙසේ කියවු" යැ යි වදළසේක.

"එවං භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අස්සජි පුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුං: "භගවා ආවුසො ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්ත මොග්ගල්ලානෙහි ච. භගවතො ච ආවුසො සෙනාසනං පඤ්ඤපෙථ භික්ඛුසඞ්ඝස්ස ච සාරිපුත්තමොග්ගල්ලානානඤ්චා"ති.

"නත්ථාවුසො සඞ්ඝිකං සෙනාසනං සබ්බං අම්හෙහි භාජිතං. ස්වාගතං ආවුසො භගවතො. යස්මිං විහාරෙ භගවා ඉච්ඡිස්සති තස්මිං විහාරෙ වසිස්සති. පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතා. න මයං තෙසං සෙනාසනං පඤ්ඤපෙස්සාමා"ති.

"කිං පන තුම්හෙ ආවුසො සඞ්ඝිකං සෙනාසනං භාජිත්ථා"ති?

"එවමාවුසො"ති.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අස්සජිපුනබ්බසුකා භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං භාජෙස්සන්තී"ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර භික්ඛවෙ -පෙ-" "සච්චං භගවා."

"කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සඞ්ඝිකං සෙනාසනං භාජෙස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ-" විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"පඤ්චිමානි භික්ඛවෙ අවෙභඞ්ගියානි න විභජිතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තානි පි අවිභත්තානි හොන්ති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

කතමානි පඤ්ච: ආරාමො ආරාමවත්ථු ඉදං පඨමං අවෙභඞ්ගියං[1]. න විභජිතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තම්පි අවිභත්තං හොති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

1. අවෙභඞ්ගිකං - සිමු

"එසේ ය වහන්සැ" යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී අස්සජි පුනබ්බසුක මහණුන් කරා එළැඹියාහ. එළැඹ අස්සජි පුනබ්බසුක මහණුන් බණවා, "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ පන්සියක් පමණ වූ මහත් භික්‍ෂු සඞ්ඝයා ද සැරියුත් මුගලන් දෙනම ද කැටුව වඩනා සේක. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට ද භික්‍ෂු සඞ්ඝයාට ද සැරියුත් මුගලන් දෙනමට ද සෙනසුන් පනවවු" යැ යි කීහ.

"ඇවැත්නි, සඟසතු සෙනසුනෙක් නැත. සියල්ල අප විසින් බෙදා ගන්නා ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම ස්වාගත ය (වැඩීසේ මැනව). භාග්‍යවතුන් වහන්සේ යම් විහාරයෙක වසන්නට කැමැති වනසේක් ද එහි වසනසේක්වා. සැරියුත් මුගලන් දෙ දෙනා ලාමක ආශා ඇත්තෝ ය. ලාමක ආශාවනට වශග වූවෝ ය. අපි ඔවුනට සෙනසුන් නො පනවන්නම්හ" යි අස්සජි පුනබ්බසුක දෙදෙනා කීහ.

"කිමෙක් ද ඇවැත්නි, තෙපි සඟසතු සෙනසුන් බෙදගත්තු දැ?" යි ඔහු විචාළාහ.

"එසේ ය, ඇවැත්නි" යි ඔහු කීහ.

යම් මහණ කෙණෙක් අල්පෙච්ඡ ද ... ඔහු 'කෙසේ නම් අස්සජි පුනබ්බසුක මහණහු සඟසතු සෙනසුන් (තමන් සතු කොට) බෙදා ගත්තාහු දැ' යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත්.

ඉක්බිති එ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, ... සැබෑ දැ?" යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක. "භාග්‍යවතුන් වහන්ස සැබෑ යැ" යි ඔහු කීහු.

"මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ සඟසතු සෙනසුන් බෙදා ගන්නාහු ද මහණෙනි, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ ... නො වේ" යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. මෙසේ ගරහා, දැහැමි කතා කොට, භික්‍ෂුන් බණවා මෙය වදළසේක:

"මහණෙනි, මේ වස්තු පස නො බෙදියැ හැකියැ, සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයකු විසින් හෝ නො බෙදියැයුතු ය. බෙදන ලදුයේ ද නො බෙදන ලද්දේ වේ. යමෙක් බෙදන්නේ නම් ථුලැසි ඇවැත් වන්නේ ය.

කවර පසෙක් ද යත්: ආරාමය ද ආරාම වත්ත ද යන මේ පළමු වන නො බෙදියැ යුතු දැ ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ නො බෙදියයුතු ය. බෙදන ලදුයේ ද නො බෙදන ලද්දේ වේ. යමෙක් බෙදූයේ වී නම් ථුලැසි ඇවැත් වන්නේ ය.

විහාරො විහාරවත්ථු ඉදං දුතියං අවෙභඞ්ගියං -පෙ-

මඤ්චො පීඨං භිසි බිම්බොහනං ඉදං තතියං අවෙභඞ්ගියං -පෙ-

ලොහකුම්භි ලොහභාණකං ලොහවාරකො ලොහකටාහං වාසි ඵරසු කුඨාරි කුද්දලො නිඛාදනං ඉදං චතුත්ථං අවෙභඞ්ගියං -පෙ-

වල්ලි වෙළු මුඤ්ජං බබ්බජං තිණං මත්තිකා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං ඉදං පඤ්චමං අවෙභඞ්ගියං න විභජිතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තම්පි අවිභත්තං හොති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස.

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අවෙභඞ්ගියානි න විභජිතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තානි පි අවිභත්තානි හොන්ති යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්සාති.

55. අථ ඛො භගවා කීටාගිරිස්මිං යථාභිරන්තං විහරිත්වා යෙන ආළවී තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ආළවී තදවසරි. තත්‍ර සුදං භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ.

තෙන ඛො පන සමයෙන ආළවිකා භික්ඛූ එවරූපානි නවකම්මානි දෙන්ති: පිණ්ඩනික්ඛෙපනමත්තෙනපි නවකම්මං දෙන්ති, කුඩ්ඩලෙපනමත්තෙනපි නවකම්මං දෙන්ති, ද්වාරට්ඨපනමත්තෙනපි නවකම්මං දෙන්ති, අග්ගළවට්ටිකරණමත්තෙනපි නවකම්මං දෙන්ති, ආලොකසන්ධිකරණමත්තෙනපි නවකම්මං දෙන්ති, සෙතවණ්ණකරණමත්තෙනපි නවකම්මං දෙන්ති, කාළවණ්ණකරණමත්තෙනපි නවකම්මං දෙන්ති, ගෙරුකපරිකම්මකරණමත්තෙනපි නවකම්මං දෙන්ති, ඡාදනමත්තෙනපි නවකම්මං දෙන්ති, බන්ධනමත්තෙනපි නවකම්මං දෙන්ති,

විහාරය, විහාර වත්ත යන මේ දෙවෙනි නො බෙදියැයුතු දෑ ය. සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයා විසින් හෝ නො බෙදියයුතු ය. බෙදන ලදුයේ ද නො බෙදනා ලදුයේ වේ. යමෙක් බෙදුයේ වී නම් තුලැසි ඇවැත් වන්නේ ය.

ඇඳ, පුටු, බිසි, කොට්ට යන මේ තෙවෙනි නො බෙදිය යුතු දෑ ය. ...

ලොහො සැලි, ලොහො පැණ, ලොහො කළ, ලොහො කටාරම්, වෑ පොරෝ කෙටේරි, උදලු නියන් යන මේ සිවුවන නො බෙදියැයුතු දෑ ය. ...

වැල්, හුන, මුදුතණ, බබුස්තණ, සෙසු තෘණ වර්ග, මැටි, ලිබඩු මැටිබඩු යන මේ හැම පස් වන නො බෙදියැයුතු දෑ ය. සඞ්ඝයා හෝ ගණයා හෝ පුද්ගලයා විසින් නො බෙදියැ යුතු ය. බෙදන ලදුයේ ද නො බෙදන ලද්දේ වේ. යමෙක් බෙදන්නේ ද තුලැසි ඇවැත් වන්නේ ය.

''මහණෙනි, මේ නොබෙදියැයුතු දෑ සඞ්ඝයා හෝ ගණයා හෝ පුද්ගලයා විසින් නො බෙදියැයුතු දෑ පස ය. බෙදන ලද්දහු ද නො බෙදන ලද්දහු ම වෙත්. යමෙක් බෙදන්නේ නම් තුලැසි ඇවැත් වන්නේ යැ'' (යනු යි).

55. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ කීටාගිරියෙහි රිසි තාක් වැස, අළවු නුවර බලා නික්ම වැඩි සේක. පිළිවෙළින් සැරි සරණසේක් අළවු නුවරට පැමිණිසේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ අළවු නුවර සමීපයේ අග්ගාළව චෛත්‍යස්ථානයේ වසන සේක.

එ සමයෙහි අළවු රටැ වැසි මහණහු මේ (මතු සඳහන් වන) පරිදි වූ නවාම් සම්මතිය දෙන්නාහ. මැටි පිඩක් තබන පමණිනුදු නවාම් සම්මතිය දෙත්, බිත්තියැ මැටි ආදියක් ගෑ පමණිනුත් නවාම් සම්මතිය දෙත්, දෙර තබන පමණිනුත් නවාම් සම්මති දෙත්, අගුල් වැටිය කරන (දෙරපොලු සවිකරන) පමණිනුත් නවාම් සම්මතිය දෙත්, කළු දෙර සවි කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, බිත්ති ආදිය සුදුපැහැ කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, කළුපැහැ කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, ගුරු පිරියම් කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, සෙවිලි කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, බඳනා පමණිනුත් නවාම් සම්මතිය දෙත්,

ගණ්ඩිකාධානමත්තෙනපි නවකම්මං දෙන්ති, ඛණ්ඩඵුල්ලපටිසංඛරණමත්තෙනපි නවකම්මං දෙන්ති, පරිභණ්ඩකරණමත්තෙනපි නවකම්මං දෙන්ති, වීසතිවස්සිකම්පි නවකම්මං දෙන්ති, තිංසවස්සිකම්පි නවකම්මං දෙන්ති, යාවජීවිකම්පි නවකම්මං දෙන්ති, ධූමකාලිකම්පි පරියොසිතං විහාරං නවකම්මං දෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ආළවිකා භික්ඛූ එවරූපානි නවකම්මානි දස්සන්ති. පිණ්ඩනික්ඛෙපනමත්තෙනපි නවකම්මං දස්සන්ති -පෙ- ධූමකාලිකම්පි පරියොසිතං විහාරං නවකම්මං දස්සන්ති''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''සච්චං කිර භික්ඛවෙ -පෙ-'' ''සච්චං භගවා.'' -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''න භික්ඛවෙ පිණ්ඩනික්ඛෙපනමත්තෙන නවකම්මං දාතබ්බං, න කුඩ්ඩලෙපනමත්තෙන නවකම්මං දාතබ්බං, න ද්වාරට්ඨපනමත්තෙන නවකම්මං දාතබ්බං, න අග්ගළවට්ටිකරණමත්තෙන නවකම්මං දාතබ්බං, න ආලොකසන්ධිකරණමත්තෙන නවකම්මං දාතබ්බං, න සෙතවණ්ණකරණමත්තෙන නවකම්මං දාතබ්බං, න කාළවණ්ණකරණමත්තෙන නවකම්මං දාතබ්බං, න ගෙරුකපරිකම්මකරණමත්තෙන නවකම්මං දාතබ්බං, න ඡාදනමත්තෙන නවකම්මං දාතබ්බං, න බන්ධනමත්තෙන නවකම්මං දාතබ්බං, න ගණ්ඩිකාධානමත්තෙන නවකම්මං දාතබ්බං, න ඛණ්ඩඵුල්ල පටිසංඛරණමත්තෙන නවකම්මං දාතබ්බං, න පරිභණ්ඩකරණමත්තෙන නවකම්මං දාතබ්බං, න වීසතිවස්සිකං නවකම්මං දාතබ්බං, න තිංසවස්සිකං නවකම්මං දාතබ්බං, න යාවජීවිකං නවකම්මං දාතබ්බං, න ධූමකාලිකංපි පරියොසිතං විහාරං නවකම්මං දාතබ්බං. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස.''

''අනුජානාමි භික්ඛවෙ අකතං වා විහාරං විප්පකතං වා නවකම්මං දාතුං. ඛුද්දකෙ විහාරෙ කම්මං ඔලොකෙත්වා ඡප්පඤ්චවස්සිකං නවකම්මං දාතුං. අඩ්ඪයොගෙ කම්මං ඔලොකෙත්වා සත්තට්ඨවස්සිකං නවකම්මං දාතුං. මහල්ලකෙ විහාරෙ පාසාදෙ වා කම්මං ඔලොකෙත්වා දසද්වාදසවස්සිකං නවකම්මං දාතුන්ති.''

ගණ්ඨිකාවක් තබන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, කැඩුම් බිඳුම් පිළිසකර කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, පිළක් කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්, විසි වසකට ද නවාම් සම්මතිය දෙත්, තිස් වසකට ද නවාම් සම්මතිය දෙත්, දිවි හිමි කොට ද නවාම් සම්මතිය දෙත්, දරසෑයෙහි දුම් නැගීම ඉම් කොට ද කොට නිමැවූ විහාරය සඳහා නවාම් සම්මතිය දෙත්, යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ ද ... ඔහු කෙසේ නම් අළවුරට වැසි මහණහු මෙසේ නවකම් සම්මතිය දෙන්නාහු ද මැටිපිඩක් තබන පමණිනුදු නවකම් සම්මතිය දෙන්නාහු ද ... දරසෑයේ දුම් නැගීම ඉම් කොට ද නිමැවූ විහාරය සඳහා නවකම් සම්මතිය දෙන්නාහු ද'' යි ලාමක කොට සිතත්, නුගුණ කියත්, දෙස් පතුරුවත් භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, සැබෑ ද ... ? යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක. ''එසේ ය, භාග්‍යවතුන් වහන්සැ'' යි මහණහු කීහ. භාග්‍යවතුන් වහන්සේ ... ගැරැහූසේක, ගරහා දැහැමි කතා කොට මහණුන් බණවා මෙය වදළසේක:

''මහණෙනි, මැටිපිඩු තබන පමණින් නවකම් සම්මතිය නො දියැයුතු. බිත්තියැ මැටි ආදිය ගානා පමණින් නවකම් සම්මතිය නො දියයුතු. දෙර තබන පමණින් නවකම් සම්මතිය නො දියැ යුතු, අගුල්වැටිය කරන පමණින් නවකම් නො දියැයුතු, කවුළු දෙර සවි කරන පමණින් නවකම් සම්මතිය නො දියයුතු, සුදුපැහැ කරන පමණින් නවකම් සම්මතිය නො දියැයුතු, කළුපැහැ කරන පමණින් නවකම් සම්මතිය නො දියයුතු, ගුරු පිරියම් කරන පමණින් නවකම් සම්මතිය නො දියැයුතු, සෙවිලි කරන පමණින් නවකම් සම්මතිය නො දියයුතු, බඳනා පමණින් නවකර්ම සම්මතිය නො දියයුතු, ගණ්ඩිකාවක් තබන පමණින් නවකර්ම සම්මතිය නො දියයුතු, කැඩුම් බිඳුම් පිළිසකර කරන පමණින් නවකම් සම්මතිය නො දියයුතු, පිළක් කරන පමණින් නවකම් සම්මතිය නො දියයුතු, විසි වසකට ද තිස් වසකට ද ... දිවි හිමි කොට නවකම් සම්මතිය නො දිය යුතු, දර සෑයෙහි දුම් නැගීම ඉම් කොට නිමැවූ විහාරය සඳහා නවකම් සම්මතිය නො දියැයුතු. යමෙක් දෙන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය.

මහණෙනි, නො කරන ලද්ද වූ අඩාල කළ වැඩ ඇත්තා වූ හෝ විහාරය සඳහා නවකර්මය දෙන්නට අනුදනිමි. කුඩා විහාරයෙහි හෝ (කළයුතු ව ඇති) වැඩ බලා සාවුරුද්දකට හෝ පස් හවුරුද්දකට හෝ සුදුසු වූ නවකම් සම්මතිය දෙන්නට ද, ගුරුළු පියාපත් බඳු සෙවෙණි ඇති වෙහෙරෙක වැඩ බලා වස් සතකට හෝ අටකට සුදුසු වන පරිදි වූ නවකම් සම්මතිය දෙන්නට ද මහත් වෙහෙරෙක හෝ ප්‍රාසාදයෙක හෝ වැඩ බලා වස් දශයක් දෙළොසක් කල් පවත්නා පරිදි වූ නවකම් සම්මතිය දෙන්නට ද අනුදනිමි'' (යනුයි.)

56. තෙන ඛො පන සමයෙන භික්ඛූ සබ්බං විහාරං නවකම්මං දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“න භික්ඛවෙ සබ්බො විහාරො නවකම්මං දාතබ්බො. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ එකස්ස ද්වෙ දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“න භික්ඛවෙ එකස්ස ද්වෙ දාතබ්බා. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ නවකම්මං ගහෙත්වා අඤ්ඤං වාසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“න භික්ඛවෙ නවකම්මං ගහෙත්වා අඤ්ඤො වාසෙතබ්බො. යො වාසෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ නවකම්මං ගහෙත්වා සඞ්ඝිකං පටිබාහන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“න භික්ඛවෙ නවකම්මං ගහෙත්වා සඞ්ඝිකං පටිබාහිතබ්බං. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ එකං වරසෙය්‍යං ගහෙතුන්ති.”

තෙන ඛො පන සමයෙන භික්ඛූ නිස්සීමෙ ඨිතස්ස නවකම්මං දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“න භික්ඛවෙ නිස්සීමෙ ඨිතස්ස නවකම්මං දාතබ්බං. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ නවකම්මං ගහෙත්වා සබ්බකාලං පටිබාහන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“න භික්ඛවෙ නවකම්මං ගහෙත්වා සබ්බකාලං පටිබාහිතබ්බං. යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ වස්සානං තෙමාසං පටිබාහිතුං උතුකාලං න පටිබාහිතුන්ති.”

58. එ සමයෙහි මහණහු සියලු ම විහාරය සඳහා නවකම් සම්මතිය දෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, සියලු විහාරය සඳහා නවකම් සම්මතිය නො දිය යුතු. යමෙක් දුන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

එ සමයෙහි මහණහු එක් මහණකුට නවකම් සම්මති දෙකක් දෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, එක් මහණකුට නවකම් සම්මති දෙකක් නො දිය යුතු ය. යමෙක් දුන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළසේක.

එ සමයෙහි මහණහු නවකම් සම්මතිය ගෙන අනෙක් මහණකු එහි වස්වත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, නවකම් ගෙන අනෙකෙක් නො වැස්වියයුතු. යමෙක් වස්වන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළ සේක.

එ සමයෙහි මහණහු නවකම් සම්මතිය ගෙන සඟසතු දෑ තමනට වෙන් කොට ගනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, නවකම් සම්මතිය ගෙන සඟසතු දෑ තමනට වෙන් නො කර ගතයුතු. යමෙක් වෙන් කර ගත්තේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ. මහණෙනි, එක් මනාප ශය්‍යාවක් (ශයන ස්ථානයක්) වෙන් කැර ගන්නට අනුදනිමි" යි වදළ සේක.

එ සමයෙහි මහණහු විහාර සීමායෙන් බැහැර සිටි මහණහට නවකම් සම්මතිය දෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, සීමායෙන් බැහැර සිටි මහණහට නවකම් සම්මතිය නො දියැයුතු. යමෙක් දුන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළසේක.

එ සමයෙහි මහණහු නවකම් සම්මතිය ලබා ගෙන සියලු කාලයෙහි තමනට වෙන් කර ගනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, නවකම් සම්මතිය ලැබ සියලු කාලයෙහි (ඒ වෙහෙර) තමාට වෙන් කර නො ගතයුතු. යමෙක් එසේ වෙන් කර ගත්තේ වී නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, වැසි තුන් මස මුළුල්ලෙහි (එය) තමනට වෙන් කර ගන්නට ද ඍතු කාලයෙහි (අතික් මාස නමයෙහි) (එය) තමාට වෙන් කර නො ගන්නට ද අනු දනිමි" යි වදළසේක.

57. තෙන ඛො පන සමයෙන භික්ඛූ නවකම්මං ගහෙත්වා පක්කමන්තිපි, විබ්භමන්තිපි, කාලම්පි කරොන්ති, සාමණෙරාපි පටිජානන්ති, සික්ඛං පච්චක්ඛාතකාපි පටිජානන්ති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකාපි පටිජානන්ති, උම්මත්තකාපි පටිජානන්ති, ඛිත්තචිත්තාපි පටිජානන්ති, වෙදනට්ටාපි පටිජානන්ති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකාපි පටිජානන්ති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකාපි පටිජානන්ති, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකාපි පටිජානන්ති, පණ්ඩකාපි පටිජානන්ති, ථෙය්‍යසංවාසකාපි පටිජානන්ති, තිත්ථියපක්කන්තකාපි පටිජානන්ති, තිරච්ඡානගතාපි පටිජානන්ති, මාතුඝාතකාපි පටිජානන්ති, පිතුඝාතකාපි පටිජානන්ති, අරහන්තඝාතකාපි පටිජානන්ති, භික්ඛුනිදූසකාපි පටිජානන්ති, සංඝභෙදකාපි පටිජානන්ති, ලොහිතුප්පාදකාපි පටිජානන්ති, උභතොබ්‍යඤ්ජනකාපි පටිජානන්ති.

භගවතො එතමත්ථං ආරොචෙසුං. –පෙ–

"ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා පක්කමති, මා සඞ්ඝස්ස හායීති අඤ්ඤස්ස දාතබ්බං. ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා විබ්භමති, කාලං කරොති, සාමණෙරො පටිජානාති, සික්ඛං පච්චක්ඛාතකො පටිජානාති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති, උම්මත්තකො පටිජානාති, ඛිත්තචිත්තො පටිජානාති, වෙදනට්ටො පටිජානාති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො පටිජානාති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො පටිජානාති පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො පටිජානාති, පණ්ඩකො පටිජානාති, ථෙය්‍යසංවාසකො පටිජානාති, තිත්ථියපක්කන්තකො පටිජානාති, තිරච්ඡානගතො පටිජානාති, මාතුඝාතකො පටිජානාති, පිතුඝාතකො පටිජානාති, අරහන්තඝාතකො පටිජානාති, භික්ඛුනිදූසකො පටිජානාති, සඞ්ඝභෙදකො පටිජානාති, ලොහිතුප්පාදකො පටිජානාති, උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, මා සඞ්ඝස්ස හායීති අඤ්ඤස්ස දාතබ්බං".

57. එ සමයෙහි මහණහු නවකම් සම්මතිය ගෙන (එයින්) නික්ම යන්නාහු ද සිවුරු හරින්නාහු ද වෙත්, කලුරිය කරන්නාහු ද වෙත්, 'හෙරණුම්හ' යි ප්‍රතිඥ ද කෙරෙත්, 'ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කළම්හ' යි ද පිළින කෙරෙත්, 'පරිජි ඇවැත් අවන්මහ' යි ද පිළින කෙරෙත්, 'උම්මත්තකයම්හ' යි ද පිළින කෙරෙත්, 'වික්ෂිප්ත සිතැත්තම්හ' යි ද පිළින කෙරෙත්, 'වෙදනායෙකින් පෙළුණම්හ' යි ද පිළින කෙරෙත්, 'ඇවැත නො දක්මෙහි උත්ක්ෂිප්තයම්හ' යි ද පිළින කෙරෙත්, 'ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්ෂිප්තයම්හ' යි ද පිළින කෙරෙත්, 'ලාමක දෘෂ්ටිය නො හැරීමෙහි උත්ක්ෂිප්ත-යම්හ' යි ද පිළින කෙරෙත්, 'පණ්ඩකයම්හ' යි ද පිළින කෙරෙත්, 'ථෙය්‍යසංවාසකයම්හ' යි ද පිළින කෙරෙත්, 'අන් තොටුවනට බැඳුණම්හ' යි ද පිළින කෙරෙත්, තිරිසන්ගියම්හ යි ද පිළින කෙරෙත්, මව නැසූවම්හ යි ද පිළින කෙරෙත්, පියා නැසූවම්හ යි ද පිළින කෙරෙත්, රහතුන් නැසූවම්හ යි ද පිළින කෙරෙත්, මෙහෙ-ණියක දූෂණ කළම්හ' යි ද පිළින කෙරෙත්, සඞ්ඝභෙදය කළම්හ යි ද පිළින කෙරෙත්, බුදුරජුන් ඇඟ ලෙහෙ සෙලැ-වූම්හ යි ද පිළින කෙරෙත්, උභතොබ්‍යංජනකයම්හ යි ද පිළින කෙරෙත්.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. ... භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළසේක:

"මහණෙනි, මෙහි යම් මහණෙක් නවාම් සම්මතිය ලබා ගෙන එයින් බැහැර ව යේ ද, 'සඟ සතු දෑ නො නැසේවා' යි සලකා (නවාම් සම්මතිය) අනෙකකුට දියැයුතු. මහණෙනි, මෙහි මහණෙක් නවාම් සම්මතිය ලැබගෙන සිවුරු හරී ද, කලුරිය කෙරේ ද, 'හෙරණෙමි' යි පිළින කෙරෙයි ද, පැවිදියික අත-හළෙකිමි යි පිළින කෙරෙයි ද, පරිජි ඇවැත් අවනෙකිමි යි පිළින කෙරෙයි ද, උමතුවෙකිමි යි පිළින කෙරෙයි ද, වික්ෂිප්ත සිතැත්-තෙමි' යි පිළින කෙරෙයි ද, වෙදනාවෙකින් පෙළිණිමි යි පිළින කෙරෙයි ද, ඇවැත නො දක්මෙහි උත්ක්ෂිප්තයෙමි යි පිළින කෙරෙයි ද, ඇවැතට පිළියම් නොකිරීමෙහි උත්ක්ෂිප්තයෙමි යි පිළින කෙරෙයි ද, ලමා දිට්ඨි නොහැරීමෙහි උත්ක්ෂිප්තයෙමි' යි පිළින කෙරෙයි ද, පණ්ඩකයෙමි' යි පිළින කෙරෙයි ද, ථෙය්‍ය සංවාසකයෙමි' යි පිළින කෙරෙයි ද, අන්තොටුවනට බැඳිණිමි යි පිළින කෙරෙයි ද, තිරිසන්ගියෙමි යි පිළින කෙරෙයි ද, මව නැසූයෙකිමි යි පිළින කෙරෙයි ද, පියා නැසූයෙකිමි යි පිළින කෙරෙයි ද, රහතුන් නැසූයෙකිමි යි පිළින කෙරෙයි ද, මෙහෙණියක දූෂණ කෙළෙකිමි යි පිළින කෙරෙයි ද, සඟබේ කළෙකිමි යි පිළින කෙරෙයි ද, බුදුරජුන් ඇඟ ලෙහෙ සෙලැවූයෙකිමි යි පිළින කෙරෙයි ද, උභතොබ්‍යංජනකයෙමි යි පිළින කෙරෙයි ද, (එසේ කැලැ) 'සඟ සතු දෑ නො නැසේව' යි සලකා නවාම් සම්මතිය අන් මහණකුට දියැයුතු'' යි.

ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා විප්පකතෙ පක්කමති. මා සඞ්ඝස්ස හායීති අඤ්ඤස්ස දාතබ්බං. ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා විප්පකතෙ විබ්භමති -පෙ- කාලං කරොති -පෙ- උභතොබ්‍යඤ්ජනකො පටිජානාති. මා සඞ්ඝස්ස හායීති අඤ්ඤස්ස දාතබ්බං.

ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා පරියොසිතෙ පක්කමති, තස්සෙව තං. ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා පරියොසිතෙ විබ්භමති -පෙ- කාලං කරොති සාමණෙරො පටිජානාති, සික්ඛං පච්චක්ඛාතකො පටිජානාති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති, සඞ්ඝො සාමී.

ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා පරියොසිතෙ උම්මත්තකො පටිජානාති, ඛිත්තචිත්තො පටිජානාති, වෙදනාට්ටො පටිජානාති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො පටිජානාති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො පටිජානාති, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො පටිජානාති, තස්සෙව තං.

ඉධ පන භික්ඛවෙ භික්ඛු නවකම්මං ගහෙත්වා පරියොසිතෙ පණ්ඩකො පටිජානාති, ථෙය්‍යසංවාසකො පටිජානාති, තිත්ථියපක්කන්තකො පටිජානාති, තිරච්ඡානගතො පටිජානාති, මාතුඝාතකො පටිජානාති, පිතුඝාතකො පටිජානාති, අරහන්තඝාතකො පටිජානාති, භික්ඛුනිදූසකො පටිජානාති, සඞ්ඝභෙදකො පටිජානාති, ලොහිතුප්පාදකො පටිජානාති, උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, සඞ්ඝො සාමී ති.

58. තෙන ඛො පන සමයෙන භික්ඛූ අඤ්ඤතරස්ස උපාසකස්ස විහාරපරිභොගං සෙනාසනං අඤ්ඤත්‍ර පරිභුඤ්ජන්ති. අථ ඛො සො උපාසකො උජ්ඣායති ඛීයති විපාචෙති: 'කථං හි නාම භදන්තා අඤ්ඤත්‍ර පරිභොගං අඤ්ඤත්‍ර පරිභුඤ්ජිස්සන්තී'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

මහණෙනි, මෙහි මහණෙක් නවාම සම්මතිය ලැබ ගෙන (කටයුතු දැ) අඩාල කල්හි එයින් බැහැර වැ යෙයි ද, 'සඟ සතු දෑ නො නැසේ වා' යි සලකා නවාම සම්මතිය අන් මහණකුට දියයුතු. මහණෙනි, මෙහි මහණෙක් නවාම සම්මතිය ලැබ ගෙන, කටයුතු අඩාළ කල්හි සිවුරු හැර යේ ද, ... කලුරිය කෙරෙයි ද ... උභතොබ්‍යඤ්ජනකයෙමි යි පිළිත කෙරෙයි ද සඟ සතු දෑ නො නැසේ වා යි අන් මහණකුට නවාම සම්මතිය දියැයුතු.

"මහණෙනි, මෙහි මහණෙක් නවාම සම්මතිය ලබාගෙන (කටයුතු) අවසන් වූ කල්හි බැහැර වැ යෙයි ද එය ඔහුට ම ය (නැවත අවුත් වස්වසනු කැමැත්තේ නම් එය සඳහා ඒ ආවාසය ඔහුට ම අයත් වෙයි). මහණෙනි, මෙහි මහණෙක් නවාම සම්මතිය ලබාගෙන (එහි වැඩ කටයුතු) අවසන් වූ කල්හි සිවුරු හරී ද ... කලුරිය කෙරෙයි ද, හෙරණෙමි යි පිළිත කෙරෙයි ද, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කළෙමි යි පිළිත කෙරෙයි ද, පරිජි අවන්මි යි පිළිත කෙරෙයි ද, සඞ්ඝයා ම එහි ස්වාමි වේ (ඒ ආවාසය සඟසතු වේ).

මහණෙනි, මෙහි මහණෙක් නවාම සම්මතිය ලබාගෙන (වැඩ කටයුතු) අවසන් වූ කල්හි උමතුවෙකිමි යි පිළිත කෙරෙයි ද වික්ෂිප්ත සිතැත්තෙමි යි පිළිත කෙරෙයි ද, වෙදනායෙන් පෙළෙණෙකිමි යි පිළිත කෙරෙයි ද, ඇවැත නොදක්මෙහි උඛෙවුනීකම් කරනු ලදුයෙමි යි පිළිත කෙරෙයි ද, ඇවැතට පිළියම් නො කිරීමෙහි උඛෙවුනී කම් කරනු ලදුයෙකිමි යි පිළිත කෙරෙයි ද, ලමුදිටු බැහැර නො කිරීමෙහි උඛෙවුනී කම් කරනු ලදුයෙමි යි පිළිත කෙරෙයි ද, ඒ ආවාසය ඔහුට ම ය.

මහණෙනි, මෙහි මහණෙක් නවාම සම්මතිය ලබාගෙන (වැඩ කටයුතු) අවසන් වූ කල්හි පණ්ඩකයෙමි යි පිළිත කෙරෙයි ද, ථෙය්‍යසංවාසකයෙමි යි පිළිත කෙරෙයි ද, අන්තොටුවනට බැඳුණෙමි යි පිළිත කෙරෙයි ද, තිරිසන් ගියෙකිමි යි පිළිත කෙරෙයි ද, මාතෘඝාතකයෙකිමි යි පිළිත කෙරෙයි ද, පිතෘඝාතකයෙකිමි යි පිළිත කෙරෙයි ද, අර්හද්ඝාතකයෙකිමි යි පිළිත කෙරෙයි ද, භික්ෂුණී දූෂකයෙකිමි යි පිළිත කෙරෙයි ද, සඞ්ඝභෙදකයෙකිමි යි පිළිත කෙරෙයි ද, ලොහිතුප්පාදකයෙකිමි යි පිළිත කෙරෙයි ද, උභතොබ්‍යඤ්ජනයෙකිමි යි පිළිත කෙරෙයි ද, සඞ්ඝයා ම ඒ ආවාසයට ස්වාමි යැ (එය සඟසතු යැ) යි (වදළසේක).

58. එ සමයෙහි වනාහි මහණහු එක්තරා උපාසකයකු සතු වූ විහාර වශයෙන් පරිභොග කටයුතු සෙනස්නක් අන් වෙහෙරෙක වෙසෙමින් පරිභොග කරත්. එ කල්හි ඒ උපාසක තෙම "කෙසේ නම් පින්වතුන් වහන්සේ අන්තැනෙක හිඳ පරිභොග කටයුතු සෙනස්න වෙන තැනෙක හිඳ පරිභොග කරන්නාහු ද" යි ලාමක කොට සිතයි, නින්ද කෙරෙයි, දෙස් පතුරුවයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"න භික්ඛවෙ අඤ්ඤත්‍ර පරිභොගො අඤ්ඤත්‍ර පරිභුඤ්ජිතබ්බො. යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ උපොසථග්ගම්පි සන්නිසජ්ජම්පි හරිතුං කුක්කුච්චායන්තා ඡමාය නිසීදන්ති. ගත්තානිපි චීවරානිපි පංසුකිතානි හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ තාවකාලිකං හරිතුන්ති."

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස මහාවිහාරො උද්‍රියති· භික්ඛූ කුක්කුච්චායන්තා සෙනාසනං නාභිහරන්ති[1] භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ගුත්තත්ථාය හරිතුන්ති."

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සෙනාසනපරික්ඛාරිකො මහග්ඝො කම්බලො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඵාතිකම්මත්ථාය පරිවත්තෙතුන්ති."

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සෙනාසනපරික්ඛාරිකං මහග්ඝං දුස්සං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ ඵාතිකම්මත්ථාය පරිවත්තෙතුන්ති."

59. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස අච්ඡචම්මං උප්පන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පාදපුඤ්ඡනිං කාතුන්ති."

චක්කලිකං[2] උප්පන්නං හොති.

"අනුජානාමි භික්ඛවෙ පාදපුඤ්ඡනිං කාතුන්ති."

චොළකං උප්පන්නං හොති.

"අනුජානාමි භික්ඛවෙ පාදපුඤ්ඡනිං කාතුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ අධොතෙහි පාදෙහි සෙනාසනං අක්කමන්ති. සෙනාසනං දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

---

1. නාභිහරන්ති - සීමු, PTS.
2. චක්කලි - සීමු.

"මහණෙනි, අන් තැනෙක හිඳ පරිභොග කටයුතු සෙනස්න වෙන තැනෙක හිඳ පරිභොග කටයුතු නො වේ. යමෙක් එසේ පරිභොග කරන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදාළසේක.

එ සමයෙහි මහණහු හිඳ ගන්නා පැදුරු මෙට්ට ආදිය පොහෝ ගෙට ද ගෙන යන්නට කුකුස් කරන්නාහු බිමැ හිඳ ගනිත්. ගාත්‍ර ද සිවුරු ද පස් වැකුණාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, තාවකාලික කොට (ඒ වේලාවේ ප්‍රයොජනයට පමණක්) ඒවා ගෙනයන්නට අනුදනිමි" යි වදාළසේක.

ඒ සමයෙහි වනාහි සඟසතු මහවෙහෙරෙක් දිරාපත් වෙයි. භික්ෂූහු කුකුස් කරන්නාහු, සෙනසුන් පිටතට නො ගෙන යත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ආරක්‍ෂාව පිණිස (අන් තැනකට) ගෙනයන්නට අනුදනිමි යි" යි වදාළසේක.

එ සමයෙහි වනාහි සඞ්ඝයාට සෙනසුන් පිරිකරට ඇතුළත් වැ මහඟු කම්බලයෙක් උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, වැඩීම පිණිස (සම වූ හෝ එයට වඩා ප්‍රයොජන-වත් වූ හෝ දෑයක්ම) එය මාරු කරන්නට අනුදනිමි" යි වදාළසේක.

එසමයෙහි වනාහි සඞ්ඝයාට සෙනසුන් පිරිකරට ඇතුළත්වැ වටිනා වස්ත්‍රයෙක් උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, වැඩීම පිණිස (සමවූ හෝ එයට වඩා ප්‍රයොජනවත් වූ හෝ දෑයක් ම) එය මාරු කරන්නට අනුදනිමි" යි වදාළසේක.

59. එ සමයෙහි වනාහි සඞ්ඝයාට වලස් සමෙක් උපන්නේ (ලැබුණේ) වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, පාපිස්නාවක් කරන්නට අනුදනිමි" යි වදාළසේක.

චක්කලිකාවෙක් උපන්නේ වෙයි.

"මහණෙනි, පාපිස්නාවක් කරන්නට අනුදනිමි" යි වදාළසේක.

රෙදි කඩෙක් උපන්නේ (ලැබුණේ) වෙයි.

"මහණෙනි, පාපිස්නාවක් කරන්නට අනුදනිමි" යි වදාළසේක.

එ සමයෙහි මහණහු නො සෙදූ පයින් සෙනසුන් ඇක්මෙත් (පාගත්). සෙනස්න කිලිටි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"න භික්ඛවෙ අධොතෙහි පාදෙහි සෙනාසනං අක්කමිතබ්බං යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ අල්ලෙහි පාදෙහි සෙනාසනං අක්කමන්ති. සෙනාසනං දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ අල්ලෙහි පාදෙහි සෙනාසනං අක්කමිතබ්බං. යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ සඋපාහනා සෙනාසනං අක්කමන්ති. සෙනාසනං දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ සඋපාහනෙන සෙනාසනං අක්කමිතබ්බං. යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

60. තෙන ඛො පන සමයෙන භික්ඛූ පරිකම්මකතාය භූමියා නිට්ඨුභන්ති[1]. වණ්ණො දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ පරිකම්මකතාය භූමියා නිට්ඨුභිතබ්බං. යො නිට්ඨුභෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ඛෙළමල්ලකන්ති."

තෙන ඛො පන සමයෙන මඤ්චපාදාපි පීඨපාදාපි පරිකම්මකතං භූමිං විලිඛන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ චොළකෙන පලිවෙඨෙතුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ පරිකම්මකතං භිත්තිං අපස්සෙන්ති. වණ්ණො දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"න භික්ඛවෙ පරිකම්මකතා භිත්ති අපස්සෙතබ්බා. යො අපස්සෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ අපස්සෙනඵලකන්ති."

අපස්සෙනඵලකං හෙට්ඨතො භූමිං විලිඛති උපරිතො භිත්තිං[2] භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ හෙට්ඨතො ච උපරිතො ච චොළකෙන පලිවෙඨෙතුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ ධොතපාදකා නිපජ්ජිතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පච්චත්ථරිත්වා නිපජ්ජිතුන්ති."

---

1. නුට්ඨුභන්ති - මජසං.
2. භිත්තිං-ඛණන්ති - සිමු.

"මහණෙනි, නො සේදූ පයින් සෙනසුන් නො ඇක්මියයුතු. යමෙක් ඇක්මෙන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළසේක.

එ සමයෙහි මහණහු තෙත් පයින් සෙනස්න ඇක්මෙත්. සෙනස්න කිලිටි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, තෙත් පයින් සෙනස්න නො ඇක්මිය යුතු(නො පෑගියයුතු), යමෙක් ඇක්මුයේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළසේක.

එ සමයෙහි මහණහු පාවහන් ඇති වැ සෙනසුන් ඇක්මෙත්. සෙනස්න කිලිටි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළාහ.

"මහණෙනි, පාවහන් ඇති වැ සෙනස්න නො ඇක්මියැ යුතු. යමෙක් ඇක්මෙන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ" යි වදළ සේක.

60. එ සමයෙහි වනාහි භික්ෂුහු පිරියම් කළ බිමැ කෙළ ගසත්. පැහැය කෙලෙසෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, පිරියම් කළ බිමැ කෙළ නො ගැසියැයුතු. යමෙක් කෙළ ගසන්නේ වී නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, කෙළමලාවක් (පඩික්කමක්) අනුදනිමි" යි වදළසේක.

එ සමයෙහි මැසි පා (ඇඳ කකුල්) ද, පුටු පා ද පිරියම් කළ බිම සූරත් (ඇඳ කකුල්වලිනුත් පුටුකකුල්වලිනුත් පිරියම් කළ බිම සීරෙයි). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, රෙදි කඩින් (ඇඳ පුටුවල පා) වෙළන්නට අනුදනිමි" යි වදළසේක.

එ සමයෙහි වනාහි භික්ෂුහු පිරියම් කළ බිත්තියට හේත්තු වෙත්. (එහි) පැහැය කෙලෙසෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, පිරියම් කළ බිත්තියට හේත්තු වියයුතු නො වෙ. යමෙක් හේත්තු වන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේය. මහණෙනි, හේත්තු වන්නට පුවරුවක් අනුදනිමි" යි වදළසේක.

හේත්තු වන පුවරුව යටින් බිම ද උඩින් බිත්තිය ද සූරයි. (හේත්තු වන පුවරුවෙන් යටින් බිමත් උඩින් බිත්තියත් සීරෙයි). භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, හේත්තු වන පුවරුව යටින් ද උඩින් ද රෙදි කඩින් වෙළන්නට අනුදනිමි" යි වදළසේක.

එ සමයෙහි මහණහු දෙවූ පා ඇත්තාහු (ඇඳැ) වැදැහෙන්නට කුකුස් කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, ඇතිරියක් එළා වැද හෝනට අනුදනිමි" යි වදළසේක.

61. අථ ඛො භගවා ආළවියං යථාභිරන්තං විහරිත්වා යෙන රාජගහං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි. තත්‍ර සුදං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ.

62. තෙන ඛො පන සමයෙන රාජගහං දුබ්භික්ඛං හොති. මනුස්සා න සක්කොන්ති සඞ්ඝභත්තං කාතුං. ඉච්ඡන්ති උද්දෙසභත්තං නිමන්තනං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං කාතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ සඞ්ඝභත්තං උද්දෙසභත්තං නිමන්තනං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකන්ති."

63. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අත්තනො වරභත්තානි ගහෙත්වා ලාමකානි භත්තානි භික්ඛූනං දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භත්තුද්දෙසකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය න මොහාගතිං ගච්ඡෙය්‍ය න භයාගතිං ගච්ඡෙය්‍ය උද්දිට්ඨානුද්දිට්ඨඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භත්තුද්දෙසකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භත්තුද්දෙසකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො භත්තුද්දෙසකස්ස සම්මති සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

61. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ අළුවුරටැ කැමැති තාක් කල් වැස රජගහ නුවර බලා නික්මුණුසේක. පිළිවෙළින් සැරිසරන සේක්, රජගහ නුවරට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ එහි රජගහ නුවර කලන්දක නිවාප නම් වූ උණුවෙනෙහි වැඩවසන සේක.

62. එ සමයෙහි රජගහ නුවර දුර්භික්‍ෂයෙක් (අහර හිගයෙක්) වෙයි. මිනිස්සු සියලු සඞ්ඝයාට බොජුන් පිළියෙළ කරන්නට නො හැකි වෙත්. උදෙසා දෙන බත, නිමැතුම් බත, සලා බත, පක්‍ෂයට වරක් දෙන බත, පොහෝදට දෙන බත, පැළවියට දෙන බත, යන බත් පිළියෙළ කරන්නට කැමැති වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, සඟබත ද, උදෙසා දෙන බත ද, නිමැතුම් බත ද, සලා බත ද, පක්‍ෂයකට වරක් දෙන බත ද, පොහෝ බත ද, පැළවි බත ද අනුදනිමි'' යි වදළසේක.

63. එ සමයෙහි සවැගි මහණහු අගනා ආහාර තමනට ගෙන නො අගනා ආහාර මහණුනට දෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වේෂයෙන් අගතියට නො යන්නේ ද, මොහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, උදෙසන ලද නො උදෙසන ලද දන්නේ ද, මෙකී අංගපසින් යුක්ත මහණක්හු භත්තුද්දෙශකයකු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ සම්මිතිය ද මෙසේ කළයුතු: පළමු කොට භත්තුද්දෙශක සම්මුතිය පිළිගන්නට මහණෙක් යැදියයුතු. (මහණකු-ගෙන් ඉල්ලීම කළයුතු). යැද ව්‍යක්ත වූ ප්‍රතිබල මහණක්හු ලවා මෙසේ සඞ්ඝයා දන්වියැයුතු:

'වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ පැමිණි කල් වී නම් මෙ නම් මහණහු භත්තුද්දෙශකයකු කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු භත්තුද්දෙශකයකු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහුට භත්තුද්දෙශක සම්මිතිය දීම යම් ආයුෂ්මතකුට රිසියෙයි ද, හේ නිහඬ වේවා. යම් ආයුෂ්මතකුට නො රිසි-යෙයි ද හේ කියාවා.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු භත්තුද්දෙසකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

අථ ඛො භත්තුද්දෙසකානං භික්ඛූනං එතදහොසි: 'කථන්නු ඛො භත්තං උද්දිසිතබ්බන්ති?' භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ සලාකාය වා පට්ටිකාය වා උපනිබන්ධිත්වා ඔපුඤ්ජිත්වා[1] ඔපුඤ්ජිත්වා උද්දිසිතුන්ති.''

64. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සෙනාසනපඤ්ඤාපකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං සෙනාසනපඤ්ඤාපකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, පඤ්ඤත්තාපඤ්ඤත්තඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සෙනාසනපඤ්ඤාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සෙනාසනපඤ්ඤාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සෙනාසනපඤ්ඤාපකස්ස සම්මති සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු සෙනාසනපඤ්ඤාපකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

---
1. ඔපුඤ්ජිත්වා උද්දිසිතුං - ස්‍යා.

මෙ නම් මහණ තෙම භත්තුද්දෙශකයකු කොට සඞ්ඝයා විසින් සම්මත වෙයි. සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි (සලකමි)'' යනු යැ.

ඉක්බිති භත්තුද්දෙශක භික්ෂූනට 'කෙසේ නම් බත් උදෙසිය යුතු ද?' යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, ඉරටුවෙක හෝ පතුරෙක හෝ නම ලියා ආලොලනය කොට කොට සොලොවා උදෙසන්නට අනුදැනිමි'' යි වදාළසේක.

64. එ සමයෙහි වනාහි සඞ්ඝයාට සෙනසුන් පනවන්නෙක් නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

''මහණෙනි, යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වෙෂයෙන් අගතියට නො යන්නේ ද, මොහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, පනවන ලද්දත් නො පනවන ලද්දත් දන්නේ ද, මෙ කී අංග පසින් සමන්විත වූ මහණක්හු සෙනසුන් පනවන්නකු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ සම්මතිය ද මෙසේ කළ යුතු ය: පළමු කොට මහණ තෙමේ යැදියයුතු. යැද ව්‍යක්ත වූ ප්‍රබල වූ මහණක්හු ලවා සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියැයුතු:

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වී නම් සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු සෙනසුන් පනවන්නකු කොට සම්මත කරන්නේ යැ, මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු සෙනසුන් පනවන්නකු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහු සෙනසුන් පනවන්නකු වශයෙන් සම්මත කිරීම යම් ආයුෂ්මතකුට රිසියේ නම් හේ නිහඬවේ වා. යම් ආයුෂ්මතකුහට නො රිසියේ නම් හේ කියාවා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ තෙම සෙනසුන් පනවන්නෙකැ යි සම්මත විය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එ බැවින් නිහ ඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)'' යනු යි.

64. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස භණ්ඩාගාරිකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භණ්ඩාගාරිකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය න මොහාගතිං ගච්ඡෙය්‍ය න භයාගතිං ගච්ඡෙය්‍ය, ගුත්තාගුත්තඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භණ්ඩාගාරිකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භණ්ඩාගාරිකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො භණ්ඩාගාරිකස්ස සම්මති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු භණ්ඩාගාරිකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

65. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස චීවරපටිග්ගාහකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නිතුං. යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය න භයාගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො.[1] සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො චීවරපටිග්ගාහකස්ස සම්මති සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු චීවරපටිග්ගාහකො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

1. සඞ්ඝො - වි. ඌනං.

64. එ සමයෙහි සඞ්ඝයාට භාණ්ඩාගාරිකයෙක් නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, යමෙක් ඡන්දාගතියට නො යන්නේ ද' දොෂාගතියට නො යන්නේ ද, මොහාගතියට නො යන්නේ ද, භයාගතියට නො යන්නේ ද, සුරක්ෂිත කොට තබන ලද නො තබන ලද දැයත් දන්නේ ද, මේ අංග පසින් සමන්විත මහණක්හු භාණ්ඩාගාරිකයකු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ සම්මතිය ද මෙසේ කළයුතු ය: පළමු කොට මහණෙක් යැදියැ යුතු. යැද ව්‍යක්ත ප්‍රබල මහණක්හු ලවා සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියැයුතු:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වී නම්, සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මහණ භාණ්ඩාගාරිකයකු කොට සම්මත කරන්නේ යැ, තෙලඤතති යැ.

සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු භාණ්ඩාගාරිකයක්හු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහු භාණ්ඩාගාරිකයකු කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියෙයි ද ඉහ් තිහඩ වේ වා. යම් ආයුෂ්මතක්හට නො රිසියෙයි ද හේ කියාවා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ තෙම භාණ්ඩාගාරිකයැ යි සම්මත ය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එ බැවින් තිහඩ ය, මෙසේ මෙ කරුණ සලකමි" යනු යි.

65. එ සමයෙහි සඞ්ඝයාට සිවුරු පිළිගන්නෙක් නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක:)

"මහණෙනි, යමෙක් ඡන්දගතියට නො යන්නේ ද, දොෂාගතියට නො යන්නේ ද, මොහාගතියට නො යන්නේ ද, භයාගතියට නො යන්නේ ද, පිළිගත් නොපිළිගත් දැයත් දන්නේ ද, මෙකී අඞ්ග පසින් සමන්විත මහණක්හු සිවුරු පිළිගන්නකු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ සම්මතිය ද මෙසේ කළ යුතු: පළමු කොට මහණෙක් යැදියැ යුතු. යැද ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු ලවා සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියැ යුතු:

"සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වී නම් සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු සිවුරු පිළිගන්නකු කොට සම්මත කරන්නේ ය මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙනම් මහණහු සිවුරු පිළිගන්නකු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහු සිවුරු පිළිගන්නකු කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියේ නම් හේ තිහඩ වේවා. යම් ආයුෂ්මතක්හට නො රිසියේ නම් හේ කියාවා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ තෙම සිවුරු පිළිගන්නකු කොට සම්මත ය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එ හෙයින් තිහඩ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)" යනු ය.

67. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස චීවරභාජකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං චීවරභාජකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- භාජිතාභාජිතඤ්ච ජානෙය්‍ය. එවං ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො;

පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරභාජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරභාජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො චීවරභාජකස්ස සම්මුති සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු චීවරභාජකො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

68. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස යාගුභාජකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං යාගුභාජකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- භාජිතාභාජිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා, -පෙ- සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු යාගුභාජකො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ඵලභාජකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං ඵලභාජකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- භාජිතාභාජිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො -පෙ- සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු ඵලභාජකො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

67. එ සමයෙහි වූ කලී සඞ්ඝයාට සිවුරු බෙදන්නෙක් නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:)

"මහණෙනි, යමෙක් ඡන්දගතියට නො යන්නේ ද ... බෙදූ නො බෙදූ දැත් දන්නේ ද, මෙ කී අඞ්ග පසින් සමන්විත මහණක්හු චීවර භාජකයකු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ම ඒ මහණ තෙම සම්මත කළයුතු ය.

පළමු කොට මහණෙක් යැදියයුතු. යැද ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු ලවා සඞ්ඝ තෙමේ මෙසේ දන්වියැයුතු:

වහන්ස, සඞ්ඝ තෙම මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වී නම් සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු සිවුරු බෙදන්නකු කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු සිවුරු බෙදන්නකු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහු සිවුරු බෙදන්නකු කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියෙයි නම් හේ නිහඬ වේවා. යම් ආයුෂ්මතක්හට නො රිසියෙයි නම් හේ කියාවා.

මෙ නම් මහණ තෙම සිවුරු බෙදන්නකු කොට සඞ්ඝයා විසින් සම්මත විය. එ හෙයින් නිහඬ ය. මෙසේ මේ කරුණ දරමි (සලකමි)" යනු යි.

68. එ සමයෙහි සඞ්ඝයාට කැඳ බෙදන්නෙක් (යාගුභාජක යෙක්) නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

"මහණෙනි, යමෙක් ඡන්දගතියට නො පැමිණෙන්නේ ද, ... බෙදූ නො බෙදූ දයත් දන්නේ ද, මෙකී අඞ්ග පසින් සමන්විත මහණහු යාගුභාජක කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ මහණ ද මෙසේ සම්මත කළයුතු. පළමු කොට මහණෙක් යැදියයුතු ... සඞ්ඝයා විසින් මෙ නම් මහණ තෙම යාගුභාජ-කයකු කොට සම්මත කරන ලද්දේ ය. සඞ්ඝයාට එය රිසියෙයි. එ හෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)" යනු යි.

එ සමයෙහි වනාහි සඞ්ඝයාට පලවැළ බෙදන්නෙක් නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:)

"මහණෙනි, යමෙක් ඡන්දගතියට නො යන්නේ ද ... බෙදන ලද නො බෙදන ලද දයත් දන්නේ ද, මෙ කී අඞ්ග පසින් සමන්විත මහණක්හු ඵලභාජක කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ම එ මහණ සම්මත කළයුතු ය. පළමු කොට මහණෙක් යැදියයුතු ය ... සඞ්ඝයා විසින් මෙ නම් මහණ ඵලභාජක යැ යි සම්මත ය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)" යනු යි.

69. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ඛජ්ජකභාජකො න හොති. ඛජ්ජකං අභාජියමානං නස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං ඛජ්ජකභාජකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං -පෙ- භාජිතාභාජිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං ඛජ්ජකභාජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං ඛජ්ජකභාජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො ඛජ්ජකභාජකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු ඛජ්ජකභාජකො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

70. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස භණ්ඩාගාරෙ අප්පමත්තකො පරික්ඛාරො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං අප්පමත්තකවිස්සජ්ජකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- විස්සජ්ජිතාවිස්සජ්ජිතං ච ජානෙය්‍ය.

එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං අප්පමත්තකවිස්සජ්ජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

69. එ සමයෙහි සඞ්ඝයාට ඛාද්‍ය (කැවිලි) බෙදන්නෙක් නො වෙයි. ඛාද්‍ය නො බෙදනු ලබන්නේ නැයි යෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:)

"මහණෙනි, යමෙක් ඡන්දාගතියට නො යන්නේ ද ... බෙදූ නො බෙදූ දය දන්නේ ද, මෙකී අඞ්ගපසින් සමන්විත මහණක්හු ඛාද්‍යභාජක කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ම එ මහණ සම්මත කළයුතු: පළමු කොට මහණ තෙම යැදියයුතු. යැද ව්‍යක්ත වූ ප්‍රතිබල මහණක්හු විසින් සඞ්ඝ තෙමේ මෙසේ දන්වියැයුතු:

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු ඛාද්‍යභාජක කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු ඛාද්‍යභාජක කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහු ඛාද්‍යභාජක කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියේ නම්, හේ නිහඬ වේවා. යම් ආයුෂ්මතක්හට නො රිසියේ නම් හේ කියාවා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ ඛාද්‍යභාජක කොට සම්මත ය. එය සඞ්ඝයාට රිසියෙයි. එ හෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)" යනු යි.

70. එ සමයෙහි වූ කලි සඞ්ඝයාගේ භාණ්ඩාගාරයෙහි අල්පමාත්‍ර වූ (කුඩා) පිරිකර උපන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. (භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:)

මහණෙනි, යමෙක් ඡන්දාගතියට නො යන්නේ ද, ... දුන් නොදුන් දයත් දන්නේ ද මෙසේ වූ අඞ්ග පසින් සමන්විත මහණක්හු අල්පමාත්‍ර පිරිකර දෙන තැනැත්තකු කොට සම්මත කරන්නට අනුදනිමි.

මහණෙනි, මෙසේ ම සම්මත කළයුතු: පළමු කොට මහණෙක් යැදියයුතු. යැද ව්‍යක්ත ප්‍රතිබල මහණකු ලවා සඞ්ඝ තෙමේ මෙසේ දන්වියයුතු:

වහන්ස සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ මෙනම් මහණහු අප්පමත්තවිස්සජ්ජකයකු කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යැ.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං අප්පමත්තකවිස්සජ්ජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො අප්පමත්තකවිස්සජ්ජකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු අප්පමත්තකවිස්සජ්ජකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

''තෙන අප්පමත්තකවිස්සජ්ජකෙන භික්ඛුනා එකෙකා සූචි දාතබ්බා. සත්ථකං දාතබ්බං. උපාහනා දාතබ්බා. කායබන්ධනං දාතබ්බං. අංසබන්ධකො දාතබ්බො. පරිස්සාවනං දාතබ්බං. ධම්මකරකො දාතබ්බො. කුසි දාතබ්බා. අඩ්ඪකුසි දාතබ්බා මණ්ඩලං දාතබ්බං. අඩ්ඪමණ්ඩලං දාතබ්බං. අනුවාතො දාතබ්බො. පරිභණ්ඩං දාතබ්බං. සචෙ හොති සඞ්ඝස්ස සප්පි වා තෙලං වා මධු වා ඵාණිතං වා සකිං පටිසායිතුං දාතබ්බං. සචෙ පුනපි අත්ථො හොති පුනපි දාතබ්බන්ති.''

71. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සාටියගාහාපකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං සාටියගාහාපකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සාටියගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසා වා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණ අප්පමත්තකවිස්සජ්ජකයකු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණ අප්පමත්තකවිස්සජ්ජකයකු කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියේ නම්, හේ නිහඬ වේවා. යමකුට නො රිසියෙයි නම් හේ කියා වා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ අප්පමත්තකවිස්සජ්ජක යැ යි සම්මත ය. සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)'' යනු යි.

''ඒ අල්පමාත්‍රක විසර්ජක මහණහු විසින් (දික් එකක් ද ලුහුඩු එකක් ද යි සඞ්ඝයා නො විචාරාම) එක් එක් හිදිකටුවක් දිය හැක්ක. එක් පිහියක් දියැ හැක්ක. එක් වහන් සඟළක් දිය හක්ක. එක් කාබානක් දියැ හැක්ක. එක් අංසබන්ධකයක් (අස් බඳනාවක්) දියැ හැක්ක. එක් පෙරහනක් දියැහැක්ක. එක් ධමරාවක් දියැ හැක්ක. කුසියක් (සිවුරෙහි දික් නුවාපතක්) දියැ හැක්ක. අඩ කුසියක් (ලුහුඩු නුවා පතක්) දියැ හැක්ක. මඩුල්ලක් (පස්කඩ සිවුරෙහි මහා මණ්ඩලයක්) දියැ හැක්ක. අඩමඩුල්ලක් ( කුඩා මණ්ඩලයක්) දියැ හැක්ක. නුවාවක් දියැහැක්ක. පරිභණ්ඩයක් (ඇතුළු නුවාවක්) දියැ හැක්ක. ඉදින් සඞ්ඝයාට ගිතෙල් හෝ තලතෙල් හෝ මී හෝ සකුරු හෝ වේ නම් එක් වරක් වළඳන්නට දියැහැකි ය. ඉදින් යළිත් වුව මනා වී නම් යළිත් දියැ හැකි යැ'' යි වදාළ සේක.

71. එ සමයෙහි සඞ්ඝයාට වැසිසළු ගන්වන්නෙක් නො වෙයි භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළාහ.

''මහණෙනි, යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ... ගත් නොගත් දූයත් දන්නේ ද, මෙකී අඞ්ග පසින් සමන්විත මහණක්හු සාටියගාහාපකයකු (වැසි සළු ගන්වන්නකු) කොට සම්මත කරන්නට අනුදනිමි. මෙසේ සම්මත ද කළයුතු ය: පළමු කොට මහණෙක් යැදියැයුතු ය. යැද ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සඞ්ඝයා මෙසේ දැන්වියයුතු ය:

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් වේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් මහණ සාටියගාහාපකයකු කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යැ.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සාටියගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සාටියගාහාපකස්ස සම්මති සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු සාටියගාහාපකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස පත්තගාහාපකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං පත්තගාහාපකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය.

එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො:

පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා -පෙ- ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

72. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ආරාමිකපෙසකො න හොති. ආරාමිකා අපෙසියමානා කම්මං න කරොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

''අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං ආරාමිකපෙසකං සම්මන්නිතුං. යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය -පෙ- පෙසිතාපෙසිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො. -පෙ- තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස සාමණෙරපෙසකො න හොති. සාමණෙරා අපෙසියමානා කම්මං න කරොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණ සාටියගාහාපකයකු කොට සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක්හට මෙ නම් මහණ සාටියගාහාපකයකු කොට සම්මත, කිරීම රිසියෙයි ද හේ නිහඬ වේවා. යමකුට නො රිසියේ නම් හේ කියාවා. සඞ්ඝයා විසින් මෙ නම් මහණ සාටියගාහාපක-යෙකියි සම්මත ය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)''යනු යි.

එ සමයෙහි වනාහි සඞ්ඝයාට පාත්‍ර ගන්වන්නෙක් නැත. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක:)

''මහණෙනි, යමෙක් ඡන්‍දගතියට නො යන්නේ ද ... ගත් නොගත් දැයත් දන්නේ ද, මෙකී අංග පසින් සමන්විත මහණහු පාත්‍ර ගන්වන්නකු කොට සම්මත කරන්නට අනුදනිමි.

මහණෙනි, මෙසේ ම හේ සම්මත කළයුතු:

පළමු කොට මහණෙක් යැදියයුතු ... සඞ්ඝයාට රිසියෙයි. මෙසේ මෙ කරුණ දරමි (සලකමි).'' යනු යි.

72. එසමයෙහි ආරාමික ප්‍රෙෂකයෙක් නැත. ආරාමිකයෝ නො මෙහෙයනු ලබන්නාහු වැඩපල නො කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක:

''මහණෙනි, යමෙක් ඡන්‍දගතියට නො යන්නේ ද ... මෙහෙයන ලද්දනුත් නො මෙහෙයන ලද්දනුත් දන්නේ ද, මෙකී අඞ්ග පසින් සමන්විත මහණක්හු ආරාමික ප්‍රෙෂකයකු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ම සම්මත කළයුතු ය. ... එ හෙයින් නිහඬ ය. මෙ කරුණ මෙසේ දරමි (සලකමි)'' යනු යි.

එ සමයෙහි සඞ්ඝයාට ශ්‍රාමණෙර ප්‍රෙෂකයෙක් (හෙරණුන් ඒ ඒ කටයුත්තෙහි මෙහෙයවන්නෙක්) නැත. හෙරණුහු නො මෙහෙයනු ලබන්නාහු කිසි කටයුත්තක් නො කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළාහ:)

"අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං සාමණෙරපෙසකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය න මොහාගතිං ගච්ඡෙය්‍ය න භයාගතිං ගච්ඡෙය්‍ය පෙසිතාපෙසිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සාමණෙරපෙසකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සාමණෙරපෙසකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සාමණෙරපෙසකස්ස සම්මති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු සාමණෙරපෙසකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

## තතියක-භාණවාරං.

## සෙනාසනක්ඛන්ධකො නිට්ඨිතො ඡට්ඨො[1].

තස්සුද්දානං:

1. විහාරො[2] බුද්ධසෙට්ඨෙන අපඤ්ඤත්තො තදා අහු
 තහං තහං නික්ඛමන්ති වාසා තෙ ජිනසාවකා.

2. තෙ සෙට්ඨි ගහපති දිස්වා භික්ඛූනං එතදබ්‍රවි
 කාරාපෙය්‍යං වසෙය්‍යාථ පටිපුච්ඡිංසු නායකං.

3. විහාරං අඩ්ඪයොගඤ්ච පාසාදං හම්මියං ගුහං
 පඤ්චලෙණං අනුඤ්ඤාසි විහාරෙ සට්ඨි කාරයි.

4. ජනා විහාරං කාරෙන්ති අකවාටං අසංවුතං
 කවාටං පිට්ඨිසඞ්ඝාටං උදුක්ඛලඤ්ච උත්තරි.

1. සෙනාසනක්ඛන්ධකං ඡට්ඨං - මජ්ඣං.
2. විහාරං - සීමු.

"මහණෙනි, යමෙක් ඡන්දාගතියට නො යන්නේ ද දොෂාගතියට නො යන්නේ ද, මොහාගතියට නො යන්නේ ද භයාගතියට නො යන්නේ ද, මෙහෙයන ලද්දහුත් නො මෙහෙයන ලද්දහුත් දන්නේ ද, මෙකී අංග පසින් සමන්විත මහණක්හු ශ්‍රාමණෙර ප්‍රෙෂකයක්හු කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ම සම්මත කළයුතු ය: පළමු කොට මහණෙක් යැදියැයුතු: යැද ව්‍යක්ත ප්‍රතිබල මහණකු ලවා සඞ්ඝ තෙමේ මෙසේ දන්වියැයුතු ය:

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු ශ්‍රාමණෙර ප්‍රෙෂකයකු කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් මහණහු ශ්‍රාමණෙර ප්‍රෙෂකයකු කොට සම්මත කෙරෙයි. මෙ නම් මහණහු ශ්‍රාමණෙර ප්‍රෙෂකයකු කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියේ නම් හේ නිහඬ වේවා. යමක්හට නො රිසියේ නම් හේ කියාවා.

සඞ්ඝයා විසින් මෙ නම් මහණ තෙම ශ්‍රාමණෙර ප්‍රෙෂක යැ යි සම්මත ය. (එය) සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි (සලකමි)" යනු යි.

## තෙවෙනි බණවර යි.

## සවැනි ශයනාසනස්කන්ධකය නිමියේ යි.

එහි උද්දානය කියැවේ:

1. එ ද බුදුරජුන් විසින් විහාරයෙක් නො පැනැවුණේ විය. ඒ බුදුසව්වෝ වසන තැනින් ඒ ඒ තැනට නික්ම යෙත්.
2. සිටු ගැහැවියෙක් ඔවුන් දක මහණුනට මෙය කී: වෙහෙරක් කරවන්නෙම් නම් එහි වසන්නහුද යි. ඇසී ය. (ඔහු බුදුරජුන් විචාළාහ.)
3. වෙහෙර ද ගුරුළු පියා පත් වැනි සෙවෙණි ඇති ගෙය ද දික් පහය ද සඳලු සහිත ගෙය ද ගුහාව ද යන වසන තැන් පසක් බුදුරජුන් අනුදත්හ. සිටු තෙම වෙහෙර සැටක් කැරවී ය.
4. ජනයා දොරපළු නැති විවෘත වූ විහාර කරවයි. දොරපළුව ද දොරබාව ද වටෙවු ලීය ද උතුරු ලීය ද,

5. ආවිඤ්ඡනච්ඡිද්දරජ්ජුං වට්ටිඤ්ච කපිසීසකං
සූචි ඝටී තාලච්ඡිද්දං ලොහකට්ඨවිසාණකං,

6. යන්තකං සූචිකඤ්ඤෙව ඡදනං උල්ලිත්තාවලිත්තකං
වෙදිජාලසලාකඤ්ච චක්කලී සණ්ඨරෙන ච.

7. මිඩ්ඪිං බිදලමඤ්චඤ්ච සොසානිකමසාරකො
බුන්දි කුළීරපාදඤ්ච ආහච්චාසන්දි උච්චකෙ.

8. සත්තඞ්ගො ච භද්දපීඨං පීඨිකාඑළකපාදකං
ආමලාඵලකා[1] කොච්ඡා පලාලපීඨමෙව ච

9. උච්චෙ ච අහිපාදනි අට්ඨඞ්ගුලකපාදකං
සුත්තං අට්ඨපදං චොළං තූලිකං අඩ්ඪකායිකං

10. ගිරග්ගෙ හිසියො චාපි දුස්සං සෙනාසනම්පි ච
ඔනද්ධං හෙට්ඨා පතන්ති උප්පාටෙත්වා හරන්ති ච.

11. භත්තිඤ්ච[2] හත්ථභත්තිඤ්ච අනුඤ්ඤාසි තථාගතො
සෙතකාළවිහාරෙපි ථුසං සණ්හඤ්ච මත්තිකං

12. ඉක්කාසං පාණිකං කුණ්ඩං සාසපං සිත්ථතෙලකං
උස්සන්නෙන පච්චුද්ධරිතුං ඵරුසං ගණ්ඩමත්තිකං

13. ඉක්කාසං පටිභානඤ්ච නීචා චයො ච ආරුහං
පරිපතන්ති ආළකං අඩ්ඪකුඩ්ඩං තයො පුන.

14. ඛුද්දකෙ කුඩ්ඩපාදෙ ච ඔවස්සති සරං ඛිලං
චීවරවංසං රජ්ජුඤ්ච ආළින්දං කිටිකෙන ච.

15. ආලම්බණං තිණචුණ්ණං හෙට්ඨාමග්ග නයං කරෙ
අජ්ඣොකාසෙ ඔතපති සාලං හෙට්ඨා ච භාජනං

1. ආමකාමලකා – වි ස.
2. භිත්තිඤ්ච - ම.

5. රුහැන් සිදුර ද අදිනා රුහැන ද අගුල් වැටිය ද අගුල් කණුව ද යතුර ද තරංකය ද කෙසි සිදුර ද ලොහොමුවා ලීමුවා අංමුවා යතුර ද,

6. යතුර ද හිද්ද ද ඇතුළත පිටත බදම ඇලැවි සෙවෙණිය ද පිල් වාබොනය ද දල්වාබොනය ද කුරුවාබොනය ද රෙදි පාපිස්න ද තණ ඇතිරිය ද,

7. මිඪය ද වෙවැල් ඇඳ ද සොහොනැ ලූ මසාරකය ද බුන්දිකාබද්ධ ඇඳ පුටු ද කුලීරපාදක (කකුළු පා) ඇඳ පුටු ද ආහච්චපාදක ඇඳ පුටු ද සිවුරැස් පුටුව ද උස් සිවුරැස් පුටුව ද,

8. කච්චච්චිය ද වෙවැල් පුටුව ද රෙදි බන් පුටුව ද පුවරු පා පුටුව ද ඇඹුල්වැටි පුටුව ද පුවරුවද කොස්ස ද පිදුරු පුටුව ද,

9. උස් යහනෙහි හිම ද සපකු ඩැසීම ද ඇඳ පිළිපා ද අටගුල් ඇඳ පිළිපා ද හුය ද අටපා වියුම ද රෙදිකඩ ද පුළුන් ද අඩකයක් දික් කොට්ට ද,

10. ගිරග්ගසමජ්ජය ද බිසි ද සෙනසුන් පිරිකර වූ වස්ත්‍රය ද මෙට්ට ලූ ඇඳ පුටු ද බිසි යටින් පැළී වැටෙනු ද, උර ගළවා ගෙන යත්' යන්න ද,

11. භක්ති කර්‍මය ද හස්තභක්ති කර්‍මය ද තථාගතයෝ අනුදත්හ. වෙහෙරෙහි ද සුදු පැහැ කළු පැහැ ගැන්වීම ද දසපිණ්ඩ දනය ද සණ්හමත්තිකා දනය ද,

12. මැලියම ද අත්ලෙන් තුනී කිරීම ද අබපිටි ද ඉටිතෙල් ද අනුදැනීම ද ඒවා වැඩි වූ කල්හි රෙදි කඩින් පසුදුරන්නට අවසරය ද, රළු බිමැ ගඩවිල් පස් දීම ද,

13. මැලියම් අනුදැන්ම ද ප්‍රතිභාන චිත්‍ර කිරීම ද මිටි බිම ද බැඳුම් ද නැඟෙන්නවුන් වෙහෙසට පත් වෙත් යනු ද ඇදී වැටෙත් ය යනු ද ඒකාඩගන වීමද අඩ භිත්තිය අනුදැන්ම ද ගබ් තුන ද,

14. කුඩා වෙහෙරෙහි බිතුපා දිරීම ද බිත්ති තෙමීම ද බිය පත් ව කැගැසීම ද භිත්තිවීලය අනුදැන්ම ද සිවුරු හෙලන වස් දංඩ ද සිවුරු හෙලන ලනුව ද පිළ අනුදැන්ම ද පැලැලි අනුදැන්ම ද,

15. ආලම්බන බාහානුජානනය ද තණ රොඩු වැටීම ද යට කිනය අනුව උල්ලෙපාවලෙපාදිය කළ යුතු ය යන්න ද එළිමහතැ චීවරවංස චීවරරජ්ජුන් තැබීම ද පැන් අව්වෙන් කැකැරෙයි යන්න ද පැන්හල අනුදැන්ම ද යටකී පරිදි පැන්හලෙහි පියස්සෙ උල්ලෙපාවලෙපාදිය ද පැන්බඳුන අනුදැනීම ද,

16. විහාරො කොට්ඨකො චෙව පරිවෙණග්ගිසාලකං
ආරාමෙ ච පුන කොට්ඨෙ හෙට්ඨෙසුධව නයං කරෙ.

17. සුදං අනාථපිණ්ඩි ච සද්ධා සීතවනං අගා
දිට්ඨධම්මො නිමන්තෙසි සහ සඞ්ඝෙන නායකං.

18. ආණාපෙසන්තරාමග්ගෙ ආරාමං කාරයි ගණො
වෙසාලියං නවකම්මං පුරතො ච පරිග්ගහං.

19. කො අරහති භත්තග්ගෙ තිත්තිරං ච අවන්දියා
පරිග්ගහිතනන්තරසරා තුලො සාවත්ථී ඔසරි.

20. පතිට්ඨාපෙසි ආරාමං භත්තග්ගෙ ච කොලාහලං,
ගිලානා වරසෙය්‍යා ච ලෙසා සත්තරසා තහිං.

21. කෙන නු ඛො කරන්තු ඛො විහාරග්ගෙන භාජයි
පරිවෙණානුභාගඤ්ච අකාමා භාගං නො දදෙ.

22. නිස්සීමං සබ්බකාලං ච ගාහා සෙනාසනෙ තයො
උපනන්දො ච වණ්ණෙසි ඨිතකා සමානාසනා.

23. සමානාසනිකා භින්දිංසු තිවග්ගා ච දුවග්ගිකං
අසමානාසනිකෙහි දීඝං සාළින්දං[1] පරිභුඤ්ජිතුං.

24. අය්‍යකා ච අවිදූරෙ භාජිතඤ්ච කීටාගිරෙ
ආළවි පිණ්ඩකකුඩ්ඩෙහි ද්වාරඅග්ගළවට්ටිකා.

---

1. ආළින්දං - සිමු. තංචිත්තං පරිභුංජිතුං - P.T.S.

16. විහාරය ද කොටුව ද පිරිවෙන ද ගිනිහල් ගෙය ද යළි කොටුව පිළිබඳ ව යට කී පරිදි ම උල්ලිත්තාවලිත්තාදිය යොදා දත යුත්තේ ය.

17. සුදත්ත නම් සැදැවත් අනේපිඩුසිටු තෙම සීතවනයට ගියේ ය. හේ දුටු නිවන් දහම් ඇත්තේ සඞ්ඝයා සහිත ලොකනායකයන් වහන්සේ නිමැති ය.

18. අතරමඟ අණ කෙළේ ය. ගණයා මඟ ආරාම කැරැවී ය. විසල් පුරැ මහණහු නවාම් කෙරෙත්. සවැගියන් අතැවැස්සෝ ඉදිරියෙන් ගොස් සෙනසුන් අත් කැරැ ගැන්ම කරත්.

19. බොජුන් හලැ අග්‍රපිණ්ඩාදියට කවරෙක් සුදුසු ද? වටුවාට ඉකිරිදෙදෙන බුහුමන් කළාහ. නො වැන්ද යුත්තෝ ද කියන ලදහ. සවැගියන් අතැවැස්සෝ මණ්ඩපයන් අත්-කැරැ ගැන්ම කළහ. ඇතුළු ගමැ පුළුන් පිරැවූ ඇඳ පුටු ආදිය පැනැවූහ. සැවැතට බුදුරජුහු වැඩියාහ.

20. දෙව්රම සඟනට පිරිනැමී ය. බොජුන්හල කලබල ඇතිවිය. ගිලන් මහණහු මුසපත් වෙත්. මහඟු යහන් අත්කර ගනිත්. ලෙසමාත්‍රාබාධයෙන් සෙනසුන් අත් පත් කරත්. සතළොස්වැගි මහණහු එහි වෙහෙරක් පිළිසකර කෙරෙත්.

21. කවරකු විසින් කෙසේ නම් සෙනසුන් ගැන්විය යුතු ද යන පැනය නැංගේ ය. විහාර ගණනින් සෙනසුන් ගැන්වීම බෙදී ය. පිරිවෙන් අනුභාගය දියයුතු ය. ඒ භාගය නො කැමැත්තෙන් නො දියයුතු.

22. සීමාවෙන් පිටත සිටියහුට සෙනසුන් නො ගැන්විය යුතු. හැම කල්හි සෙනසුන් ප්‍රතිබාහනය නො කළ යුතු. සෙනසුන් පිළිබඳ ගැන්වීම් තුනෙකි. උපනඳ තෙර සෙනසුන් දෙකක් ප්‍රතිබාහන කෙළේ ය. බුදුහු විනය වැණූහු. තෙරහු සිටගෙන විනය උදෙසැවූහ. කොතෙකින් සමානාසන ඇත්තෝ වෙත් ද?

23. සමානාසනිකයෝ ඇඳ කඩාදමූහ. තුන් දෙනෙක් ද හිඳ ඇඳ කඩාදමූහ. දෙදෙනකුට එකට ඇඳ පුටුවල හිඳ ගන්නට අනුදත් සේක. අසමානාසනිකයන් හා දික් අස්නැ හිඳීම අනුදත් සේක. ආළින්ද සහිත සියලු පහය අනුදත් සේක.

24. කොසොල් රජුගේ මුත්තණියෝ කලුරිය කළාහ. සැවතට නොදුරෙහි මහණුනට උවදුරු ඇති විය. කිටාගිරියෙහි දී සවැගිමහණුන් ගේ අතැවැස්සන් විසින් සෙනසුන් බෙදන ලදි. බුදුරජහු අළවු රටට වැඩියාහ. මැටිපිඩු තබන පමණිනුත් බිත්තිය මැටි ගෑ පමණිනුත් දෙර අගුල් වැටීය කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්.

25. ආලොක සෙත–කාළඤ්ච ගෙරු–ඡාදන බන්ධනා
ගණ්ඩි–ඛණ්ඩ–පරිභණ්ඩං වීස–තිංසා යාවජීවිකං.

26. ඔසිතෙ අකතං[1] බුද්ධෙ ඡ–පඤ්චවස්සිකංදදෙ
අඩ්ඪයොගෙ ච සත්තට්ඨ මහල්ලෙ දස–ද්වාදස.

27. සබ්බං විහාරං එකස්ස අඤ්ඤං වාසෙන්ති සඞ්ඝිකං
නිස්සීමං සබ්බකාලඤ්ච පක්කමන්ති විබ්භමන්ති ච.

28. කාලඤ්ච සාමණෙරඤ්ච සික්ඛාපච්චක්ඛකාන්තිමං
උම්මත්ත ඛිත්තචිත්තා ච වෙදනාපත්‍යාදස්සනා.

29. අප්පටිකම්මා දිට්ඨියා පණ්ඩකා ථෙය්‍යතිත්ථියා
තිරච්ඡාන මාතු පිතු අරහන්ත ඝාතක දූසකා.

30. භෙදකා ලොහිතුප්පාද උභතො චාපි ව්‍යඤ්ජනා
මා සඞ්ඝස්ස පරිහායි කම්මං අඤ්ඤස්ස දතවෙ.

31. විප්පකතෙ ච අඤ්ඤස්ස කතෙ තස්සෙව පක්කමෙ
විබ්භමති කාලකතො සාමණෙරො ච ජායති.

32. පච්චක්ඛාතො ච සික්ඛාය අන්තිමා පණ්ඩකො යදි
සඞ්ඝො ච සාමිකො හොති උම්මත්ත ඛිත්තවෙදනා.

1. අකතං සබ්බං – සිමු.

25. කවුළු දොර සවිකරන පමණිනුත් බිත්ති ආදිය සුදු කළු ගුරු පැහැ කරන පමණිනුත් සෙවිලි කරන පමණිනුත් පියස්ස බඳනා පමණිනුත් ගණ්ඨිකාවක් තැබීම් කැඩුම් බිඳුම් පිළිසකර පමණින් පිළක් කරන පමණිනුත් නවාම් සම්මතිය දෙත්. විසි වසකට තිස් වසකට ද දිවිහිම් කොට ද නවාම් සම්මතිය දෙත්.

26. කොට නිමැවූ වෙහෙර සඳහා ද නවාම් සම්මතිය දෙත්. නොකළ හෝ අඩාළ වූ හෝ වෙහෙර සඳහා නවාම් සම්මතිය අනුදත් සේක. නවාම් දෙත්. කුඩා වෙහෙරෙහි සවසකට හෝ පස්වසකට නවාම් දියයුතු. අඩළුයොග වෙහෙරෙහි කටයුතු බලා හත් අට වසකට ද මහ වෙහෙරෙක කටයුතු සඳහා දසදෙළොස් වසකට ද නවාම් සම්මතිය දියයුතු.

27. සියලු වෙහෙරට නවාම් දෙත්. එකකුට නවාම් දෙකක් දෙත්. නවාම් ගෙන අන් එකකු වස්වත්. සඟසතු දෑ තමනට වෙන් කෙරෙත්. සීමායෙන් පිටත සිටියාහට නවාම් දෙත්. ඔහු සියලු කාලයෙහි වෙහෙර තමනට වෙන් කර ගනිත්. නවාම් ගෙන පිටත් ව යෙත්, සිවුරු හැර ද යෙත්.

28. කලුරිය ද කෙරෙත්, හෙරණුම්හ යි ශික්‍ෂා ප්‍රතික්‍ෂෙප කළම්හ යි පරිජියට අවනුම්හ යි උමතුවම්හ යි කැළඹුණු සිතැත්තම්හ යි වෙදනායෙන් පෙළුණුම්හ යි, ඇවැත් නො දක්මෙන් ද,

29. ඇවැතට පිළියම් නො කිරීමෙන් ද දෘෂ්ටිය අත් නො හැරීමෙන් ද උත්ක්ෂිප්තයම්හ යි, පණ්ඩකයම්හයි, ථෙය්‍ය සංවාසකයම්හයි, අන් තොටුවනට බැඳුණුම්හ යි, තිරිසන්ගියම්හ යි මා පිය රහතුන් නැසුවම්හ යි භික්‍ෂුණී දූෂකයම්හ යි ද,

30. සඟබෙ කළම්හ යි ද ලොහිතුප්පාදකයම්හ යි ද උභතොබ්‍යඤ්ජනකයම්හ යි ද පිළිත කෙරෙත්. සඞ්ඝයාට පාඩු නො වේවා යි කටයුත්ත අන්හට දියයුතු.

31. කටයුත්ත අඩාළ කල්හි ද අනෙකකුට පැවරියයුතු. එය කොට නිමි කල්හි ඔහුට ම එය පැවරියයුතු. නික්ම යන්නේ ද සිවුරු හරනේ ද කලුරිය කෙළේ ද හෙරණ වෙමි යි හෝ,

32. ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය කෙළෙමි යි හෝ අන්තිම වස්තුවට පැමිණියෙමියි පණ්ඩකයෙමි යි ප්‍රතිඥා කෙරේ ද, සඞ්ඝයා ම එහි ස්වාමි වේ. උමතු වෙමි යි, වික්ෂිප්ත සිතැත්තෙමි යි, වෙදනායෙන් පෙළුණෙමි යි පිළිත කෙරේ ද,

33. අදස්සනාපත්තිකම්මෙ දිට්ඨි තථෙව හොති වා
පණ්ඩකො ථෙය්‍ය තිත්ථි ච තිරච්ඡාන මාතුපෙත්තිකං

34. සාතකො දුස්සකො චාපි හෙද ලොහිත ව්‍යඤ්ජනා
පටිජානාති යදි සො සඞ්ඝො ච හොති සාමිකො.

35. හරන්තඤ්ඤත්‍ර කුක්කුච්චං උද්දියන්ති ච කම්බලං
දුස්සං ච චම්ම චක්කලි චොළකං අක්කමන්ති ච.

36. අල්ලා උපාහනා තිට්ඨු ලිම්පන්ති අපස්සෙනන්ති ච.
අපස්සෙනං ලිම්පතෙ වා ධොතපච්චුද්ධරෙන ච.

37. රාජගහෙ න සක්කොන්ති ලාමකං හත්තුද්දෙසකං
කථං නු ඛො පඤ්ඤපකං හණ්ඩාගාරිකසම්මුතිං.

38. පටිග්ගහහාජකො චාපි යාගු ච ඵලහාජකො
ඛජ්ජකහාජකො චෙව අප්පමත්තකවිස්සජො.

39. සාටියගාහාපකො චෙව තථෙව පත්තගාහකො
ආරාමික සාමණෙර පෙසකස්ස ච සම්මුති.

40. සබ්බාහිභූ ලොකවිදූ හිතචිත්තො විනායකො
ලෙණත්ථං ච සුඛත්ථං ච ඣායිතුං ච විපස්සිතුන්ති.

33. ඇවැත් නො දක්මෙහි ඇවැතට පිළියම් නො කිරීමෙහි මිසදිටුව අත්නොහැරීමෙහි උක්ඛෙපනී කම් කරන ලදිම් යි පිළිත කෙරෙයි ද ඒ ආවාසය ඔහුට ම ය. පණ්ඩකයෙම් යි ථෙය්‍යසංවාසකයෙම් යි තිත්ථියපක්කන්තක යෙම් යි තිරිසන්ගතයෙම් යි මාතෘඝාතක පිතෘඝාතක යෙම් යි

34. අරහන්තඝාතකයෙම් යි භික්ඛුණීදූෂකයෙම් යි සඞ්ඝභෙදක-යෙම් යි ලොහිතුප්පාදකයෙම් යි උභතොබ්‍යඤ්ජනක-යෙම් යි ගේ පිළිත කෙරේ ද සඞ්ඝයා ම ඒ ආවාසයට ස්වාමි වේ.

35. විහාරපරිභොගය අන් තැනකට ගෙන යත්. පැදුරු ආදිය ගෙනයන්නට කුකුස් කෙරෙත්. වෙහෙරෙක් දිරාපත් වෙයි. සඞ්ඝයාට මාහැඟි කම්බලයෙක් උපන. මාහැඟි වස්ත්‍රයෙක් උපන. චර්මයෙක් උපන. චක්කලිකාවෙක් උපන. රෙදි කඩෙක් උපන. නොසෙදූ පයින් සෙනසුන් ඇක්මෙත්.

36. තෙත් පා ඇත්තාහු පාවහන් ඇත්තාහු සෙනස්න ඇක්මෙත්. පිරියම් කළ බිමැ කෙළ ගසත්. පිරියම් කළ බිත්තියට හේත්තු වෙත්. හේත්තුවන පුවරුව බිම සූරයි. සේදූ පයැත්තාහු පසතුරුණු එළා සැතපියයුතු.

37. රජගහ නුවර සඟබත් කරන්නට නො හැකි වෙත්. සැවැගියෝ ලාමක බත් භික්ෂූනට දෙති. භත්තුද්දෙසකයකු අනුදත් සේක. කෙසේ බත් උදෙසිය යුතු දැ යි ප්‍රශ්නයෙක් විය. සෙනසුන් පනවන්නකු අනුදත් සේක. භාණ්ඩාගාරික සම්මතිය අනුදත් සේක.

38. චීවරප්‍රතිග්‍රාහකයෙක් ද චීවරභාජකයෙක් ද යාගුභාජක-යෙක් ද ඵලභාජකයෙක් ද ඛජ්ජකභාජකයෙක් ද අප්පමත්තක-විස්සජ්ජකයෙක් ද,

39. සාටියගාහාපකයෙක් ද එසේ ම පත්තගාහාපකයෙක් ද අනුදන්නා ලදහ. ආරාමිකපෙසක සම්මතිය ද සාමණෙරපෙසක සම්මතිය ද අනුදන්නා ලදහ.

40. සියල්ල මැඩලූ ලොව තතු දන්නා ඉතසිත් ඇති විනායක-යන් වහන්සේ විවෙකවාසය පිණිස ද සුව පහසු පිණිස ද ධ්‍යාන වඩන්නට ද විවසුන් වඩන්නට ද සෙනසුන් අනුදත් සේක.

# 7

# සඞ්ඝභෙදකක්ඛන්ධකං

## පඨමභාණවාරං

### ඡසක්‍යපබ්බජ්ජා

1. තෙන සමයෙන බුද්ධො භගවා අනුපියායං විහරති අනුපියං නාම මල්ලානං නිගමො. තෙන ඛො පන සමයෙන අභිඤ්ඤාතා අභිඤ්ඤාතා සක්‍යකුමාරා භගවන්තං පබ්බජිතං අනුපබ්බජන්ති. තෙන ඛො පන සමයෙන මහානාමො ච සක්කො අනුරුද්ධො ච සක්කො ද්වෙ භාතිකා හොන්ති. අනුරුද්ධො සක්කො සුඛුමාලො හොති. තස්ස තයො පාසාදා හොන්ති එකො හෙමන්තිකො එකො ගිම්හිකො එකො වස්සිකො. සො වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො මාසෙ නිප්පුරිසෙහි තූරියෙහි පරිචාරියමානො න හෙට්ඨාපාසාදං ඔරොහති.

අථ ඛො මහානාමස්ස සක්කස්ස එතදහොසි: "එතරහි ඛො අභිඤ්ඤාතා අභිඤ්ඤාතා සක්‍යකුමාරා භගවන්තං පබ්බජිතං අනුපබ්බජන්ති. අම්හාකඤ්ච කුලා නත්ථි කොචි අගාරස්මා අනගාරියං පබ්බජිතො. යන්නූනාහං වා පබ්බජෙය්‍යං අනුරුද්ධො වා"ති. අථ ඛො මහානාමො සක්කො යෙන අනුරුද්ධො සක්කො තෙනුපසංකමි. උපසඞ්කමිත්වා අනුරුද්ධං සක්කං එතදවොච: "එතරහි තාත අනුරුද්ධ, අභිඤ්ඤාතා අභිඤ්ඤාතා සක්‍යකුමාරා භගවන්තං පබ්බජිතං අනුපබ්බජන්ති. අම්හාකඤ්ච කුලා නත්ථි කොචි අගාරස්මා අනගාරියං පබ්බජිතො. තෙන හි ත්වං වා පබ්බජ අහං වා පබ්බජිස්සාමී"ති.

"අහං ඛො සුඛුමාලො. නාහං සක්කොමි අගාරස්මා අනගාරියං පබ්බජිතුං. ත්වං පබ්බජාහී"ති.

"එහි ඛො තෙ තාත අනුරුද්ධ ඝරාවාසත්ථං අනුසාසිස්සාමි: පඨමං ඛෙත්තං කසාපෙතබ්බං, කසාපෙත්වා වපාපෙතබ්බං, වපාපෙත්වා උදකං අතිනෙතබ්බං, උදකං අතිනෙත්වා උදකං නින්නෙතබ්බං, උදකං නින්නෙත්වා නිඩ්ඩහෙතබ්බං[1] නිඩ්ඩහෙත්වා[2] ලවාපෙතබ්බං, ලවාපෙත්වා උබ්බාහාපෙතබ්බං. උබ්බාහාපෙත්වා පුඤ්ජං කාරාපෙතබ්බං. පුඤ්ජං කාරාපෙත්වා මද්දාපෙතබ්බං. මද්දාපෙත්වා පලාලානි උද්ධරාපෙතබ්බානි, පලාලානි උද්ධරාපෙත්වා භුසිකා උද්ධරාපෙතබ්බා. භුසිකං උද්ධරාපෙත්වා ඔපුනාපෙතබ්බං. ඔපුනාපෙත්වා අතිහරාපෙතබ්බං. අතිහරාපෙත්වා ආයතිම්පි වස්සං එවමෙව කාතබ්බන්ති."

---

1. නිද්ධාපෙතබ්බං - මජසං.
2. නිද්ධාපෙත්වා - මජසං.

# 7

# සඞ්ඝභෙදක ඛන්ධකය

## පළමු බණවර

### ශාක්‍යයන් සදෙනාගේ පැවිද්ද

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අනුපිය නම් නුවර සමීපයෙහි වැඩ වසන සේක. අනුපිය නම් මල්ලයන් ගේ නියම්ගමෙකි. එ සමයෙහි වනාහි ප්‍රකට වූ ශාක්‍ය කුමාරයෝ පැවිදි වූ භාග්‍යවතුන් වහන්සේ අනුව පැවිදි වෙත්. එ සමයෙහි මහානාම ශාක්‍ය ද අනුරුද්ධ ශාක්‍ය ද යන දෙදෙන සොහොයුරෝ වෙත්. අනුරුද්ධ ශාක්‍ය තෙම සියුමැලි වෙයි. ඔහුට ප්‍රාසාද තුනෙක් විය. එකෙක් ශීත ඍතුවෙ විසීම පිණිස ය. එකෙක් ග්‍රීෂ්ම ඍතුවේ විසීම පිණිස ය. එකෙක් වර්ෂාණ ඍතුවෙ විසීම පිණිස ය. හේ වර්ෂාණර්තුව සඳහා නැනැවුණු පහයෙහි වැසි සාරමස තුයභී වයන ස්ත්‍රීන් විසින් හසුරුවනු ලබන ඉන්ද්‍රියයන් ඇත්තේ (හෙවත් පස්කම්හි අලවනු ලබනුයේ) යට පහයට නො බසී.

එ කල්හි "දැන් වනාහි ප්‍රකට ප්‍රකට ශාක්‍ය කුමාරයෝ පැවිදි වූ භාග්‍යවතුන් වහන්සේ අනුව පැවිදි වෙත්. අප කුලයෙන් ද කිසිවෙක් ගිහිගෙය හැර සස්නට නො පැමිණියේ ය. (පැවිදි නොවී ය.) මා හෝ අනුරුද්ධයා හෝ පැවිදි වතොත් ඉතා යෙහෙකැ"යි මහානාම ශාක්‍යයාට මේ සිත විය. ඉක්බිති මහානාම ශාක්‍ය තෙම අනුරුද්ධ ශාක්‍යයා කරා එළැඹියේ ය. එළැඹ අනුරුද්ධ ශාක්‍යයා බණවා, "දරුව අනුරුද්ධය, දැන් ප්‍රකට ප්‍රකට ශාක්‍ය කුමරුවෝ පැවිදි වූ භාග්‍යවතුන් වහන්සේ අනුව පැවිදි වෙත්. අපගේ කුලයෙන් වූ කලී කිසිවෙකුත් ගිහි ගෙන් නික්ම පැවිදි නො වී ය. එබැවින් තෝ හෝ පැවිදි වව, මම් හෝ පැවිදි වන්නෙමි"යි මෙ බස් පැවැසීය.

"මම් වූකලී සියුමැලියෙමි. ගිහි ගෙන් නික්ම පැවිදි වන්නට නො හැක්කෙමි. ඔබ පැවිදි වන්නැ"යි අනුරුද්ධ කුමර කී ය.

"දරුව අනුරුද්ධය, එසේ වී නම් ගිහිගෙයි වසනු පිණිස උප-දෙස් දෙන්නෙමි. පළමු කොට කෙත් සැවවිය යුතු. සාවවා, වැපිරැවිය යුතු. වපුරවා ඇතුළට ජලය පැමිණැවිය යුතු ය. ඇතුළට ජලය පමුණුවා, ජලය සම කැරැවිය යුතු. ජලය සම කරවා, වල් නෙළීම කැරැවිය යුතු. වල් නෙළීම කරවා, කැප්විය යුතු. කප්වා ඇද්දිය යුතු. අදවා මිටි බැන්දවිය යුතු. මිටි බඳවා මැඩවිය යුතු. මඩවා පිදුරු බැහැර කැරැවිය යුතු. පිදුරු බැහැර කරවා කාටුව ඉවත් කැරැවිය යුතු. පොලවාලිය යුතු. පොලවාලා ගෙට ගෙන්වියැ යුතු. ගෙට ගෙන්වා එන වර්ෂයෙහි ද මෙසේ ම කළ යුතු යැ"යි (මහානාම කුමර කී ය.)

"න කම්මා ඛීයන්ති, න කම්මානං අන්තො පඤ්ඤායති. කදා කම්මා ඛීයිස්සන්ති? කදා කම්මානං අන්තො පඤ්ඤායිස්සති? කදා මයං අප්පොස්සුක්කා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරිස්සාමා"ති.

"න හි තාත අනුරුද්ධ කම්මා ඛීයන්ති, න කම්මානං අන්තො පඤ්ඤායති අඛීණෙයෙව කම්මෙ පිතරො ච පිතාමහා ච කාලකතා"ති.

"තෙන හි ත්වඤ්ඤෙව ඝරාවාසත්ථෙන උපජානාහි[1]. අහං අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමී"ති.

2. අථ ඛො අනුරුද්ධො සක්කො යෙන මාතා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මාතරං එතදවොච: "ඉච්ඡාමහං අම්ම අගාරස්මා අනගාරියං පබ්බජිතුං. අනුජානාහි මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. එවං වුත්තෙ අනුරුද්ධස්ස සක්කස්ස මාතා අනුරුද්ධං සක්කං එතදවොච: "තුම්හෙ ඛො මෙ තාත අනුරුද්ධ ද්වෙ පුත්තා පියා මනාපා අප්පටිකූලා මරණෙනපි වො අකාමකා විනා භවිස්සාමි. කිම්පනාහං තුම්හෙ ජීවන්තෙ අනුජානිස්සාමි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති".

දුතියම්පි ඛො අනුරුද්ධො සක්කො මාතරං එතදවොච: "ඉච්ඡාමහං අම්ම අගාරස්මා අනගාරියං පබ්බජිතුං. අනුජානාහි මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති.

"තුම්හෙ ඛො මෙ තාත අනුරුද්ධ ද්වෙ පුත්තා පියා මනාපා අප්පටිකූලා මරණෙනපි වො අකාමකා විනා භවිස්සාමි. කිං පනාහං තුම්හෙ ජීවන්තෙ අනුජානිස්සාමි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති.

තතියම්පි ඛො අනුරුද්ධො සක්කො මාතරං එතදවොච: "ඉච්ඡාමහං අම්ම අගාරස්මා අනගාරියං පබ්බජිතුං. අනුජානාහි මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති.

තෙන ඛො පන සමයෙන භද්දියො සක්යරාජා සක්යානං රජ්ජං කාරෙති. සො ච අනුරුද්ධස්ස සක්කස්ස සහායො හොති. අථ ඛො අනුරුද්ධස්ස සක්කස්ස මාතා "අයං ඛො භද්දියො සක්යරාජා සක්යානං රජ්ජං කාරෙති අනුරුද්ධස්ස සක්කස්ස සහායො. සො න උස්සහති අගාරස්මා අනගාරියං පබ්බජිතුන්ති" අනුරුද්ධං සක්කං එතදවොච: "සචෙ තාත අනුරුද්ධ භද්දියො සක්යරාජා අගාරස්මා අනගාරියං පබ්බජති එවං ත්වම්පි පබ්බජාහී"ති.

1. උපජාන - සිමු.

"කටයුතු නො නිම වෙයි. කටයුතුවල කෙළවරෙක් නො පැනෙයි. කවරද නම් කටයුතු නිම වන්නේ ද? කවර දක කටයුතුවල කෙළවරෙක් පැනෙන්නේ ද? කවර දක අපි අල්පොත්-සුක වැ පස් කම් ගුණයෙන් සමර්පිත වැ සමන්විත වැ සැප පහසු විඳින්නමෝ දැ''යි (අනුරුද්ධ කුමර කී ය.)

"දරුව අනුරුද්ධ, කටයුතු නිම නො වේ. කටයුතුවල කෙළවරක් ද නො පැනෙයි. කටයුතු නොනිමි කල්හි ම මාපියෝ ද මුත්තණු මිත්තණියෝ ද කලුරිය කළහ'' යි මහානාම කුමරුවෝ කී හ.

"එසේ වී නම් ඔබ ම ගිහිගෙහි විසීම දන ගනුව. මම ගිහි ගෙන් නික්ම පැවිදිබිමට පැමිණෙන්නෙමි''යි අනුරුද්ධ කුමර කී ය.

2. ඉක්බිත්තෙන් අනුරුද්ධ ශාක්‍ය තෙම මව කරා එළැඹියේ ය. එළැඹ, "මෑණියනි, මම් ගිහිගෙන් නික්ම සස්නැ පැවිදි වන්නට කැමැත්තෙමි. මට ගිහිගෙන් නික්ම සස්නැ පැවිදි වන්නට අනුදන්නැ''යි කී ය. මෙසේ කී කල්හි අනුරුද්ධ ශාක්‍යයාගේ මව අනුරුද්ධ ශාක්‍යයාට, "දරුව තෙපි වනාහි මගේ පිය වූ මනාප වූ නො පිළිකුල් වූ දරු දෙදෙනා ය. තොපගේ මරණයෙනුදු නොකැමැත්තෙන් ම වෙන් වන්නෙමි. එසේ කලැ, ජීවත් වන්නා වූ තොපට ගිහි ගෙන් නික්ම සසුන් වදින්නට කිමෙක් ද, අනුදන්නෙම් දැ''යි කීවා ය.

දෙවෙනි වර ද අනුරුද්ධ ශාක්‍ය තෙම "මෑණියනි, මම් ගිහි ගෙන් නික්ම සසුන් වදින්නට කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම සසුන් වදිනුවට මට අනුදන්නැ''යි කී ය.

"දරුව අනුරුද්ධය, තෙපි ප්‍රිය වූ මනාප වූ නොපිළිකුල් වූ මගේ දරු දෙදෙනා ය. තොප ගේ මරණයෙනුදු නො කැමැතිවැ ම වෙන් වන්නෙමි. කිමෙක් ද ජීවත් වන්නා වූ තොපට ගිහිගෙන් නික්ම සසුන් වදනට අනුදන්නෙම් දැ''යි (අනුරුත් කුමරුගේ මව කීවා ය.

තෙවෙනි වර ද අනුරුද්ධ ශාක්‍ය තෙම "මෑණියනි, මම් ගිහි ගෙන් නික්ම සසුන් වදිනු කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම සසුන් වදිනුවට මට අනුදන්නැ''යි කී ය.

එ සමයෙහි වනාහි භද්දිය ශාක්‍ය රජ ශාක්‍යයන් ගේ රජය කරවයි. හේ ද අනුරුද්ධ ශාක්‍යයා ගේ යහළුවෙක් වෙයි. එකල්හි අනුරුද්ධ ශාක්‍යයාගේ මවු "මෙ භද්දිය ශාක්‍ය රජ ශාක්‍යයන් ගේ රජය කරවයි. මෙ තෙම අනුරුද්ධ ශාක්‍යයාගේ යහළුවෙක. හේ ගිහිගෙන් නික්ම පැවිදිවන්නට උත්සාහ නො කෙරේ යැ'' යි සිතා, "දරුව අනුරුද්ධය, ඉදින් භද්දිය ශාක්‍ය රජ ගිහි ගෙයින් නික්ම සසුන් වදනේ නම්, එසේ කලැ තෙපිත් පැවිදි වන්නැ'' යි කීවා ය.

3. අථ ඛො අනුරුද්ධො සක්‍යො යෙන භද්දියො සක්‍යරාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භද්දියං සක්‍යරාජානං එතදවොච: "මමං ඛො සම්ම, පබ්බජ්ජා තව පටිබද්ධා"ති.

"සචෙ තෙ සම්ම පබ්බජ්ජා මම පටිබද්ධා වා අපටිබද්ධා වා[1] හොතු. අහං තයා...යථාසුඛං පබ්බජාහී"ති.

"එහි සම්ම උභො අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමා"ති.

"නාහං සම්ම සක්කොමි අගාරස්මා අනගාරියං පබ්බජිතුං. යං තෙ සක්‍යා අඤ්ඤං මයා කාතුං ත්‍යාහං කරිස්සාමි. ත්වං පබ්බජාහී"ති.

"මාතා ඛො මං සම්ම එවමාහ: 'සචෙ තාත අනුරුද්ධ භද්දියො සක්‍යරාජා අගාරස්මා අනගාරියං පබ්බජති එවං ත්වම්පි පබ්බජාහී'ති භාසිතා ඛො පන තෙ සම්ම එසා වාචා: 'සචෙ තෙ සම්ම පබ්බජ්ජා මම පටිබද්ධා වා අපටිබද්ධා වා සා හොතු. අහං තයා ... යථාසුඛං පබ්බජාහී'ති. එහි සම්ම උභො අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමා"ති.

තෙන ඛො පන සමයෙන මනුස්සා සච්චවාදිනො හොන්ති සච්චපටිඤ්ඤා. අථ ඛො භද්දියො සක්‍යරාජා අනුරුද්ධං සක්‍යං එතදවොච: "ආගමෙහි සම්ම සත්ත වස්සානි සත්තන්නං වස්සානං අච්චයෙන උභො අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමා"ති.

"අතිචිරං සම්ම සත්තවස්සානි. නාහං සක්කොමි සත්තවස්සානි ආගමෙතුන්ති".

"ආගමෙහි සම්ම ඡ වස්සානි -පෙ- පඤ්ච වස්සානි -පෙ- චත්තාරි වස්සානි -පෙ- තීණි වස්සානි -පෙ- ද්වෙ වස්සානි -පෙ- එකං වස්සං. එකස්ස වස්සස්ස අච්චයෙන උභො අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමා"ති.

"අතිචිරං සම්ම එකං වස්සං නාහං සක්කොමි එකං වස්සං ආගමෙතුන්ති".

"ආගමෙහි සම්ම සත්ත මාසෙ. සත්තන්නං මාසානං අච්චයෙන උභො අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමා"ති.

1. අපටිබද්ධා වා ස හොතු. - මජසං, සිමු.

3. ඉක්බිති අනුරුද්ධ ශාක්‍ය තෙම භද්දිය ශාක්‍ය රජුහු කරා එළැඹියේ ය. එළැඹ, භද්දිය ශාක්‍යරජුට "යහළුව මගේ පැවිද්ද ඔබ පිළිබඳ යැ" යි කී ය.

"යහළුව, තාගේ පැවිද්ද මා පිළිබඳ හෝ නො පිළිබඳ හෝ වේ ව යි මම් තා හා ... සුවසේ පැවිදි වන්නැ" යි (භද්දිය ශාක්‍ය රජ කී ය.)

"යහළුව, එන්නැ. අපි දෙ දෙනා ම ගිහිගෙන් නික්ම සසුන් වදින්නමෝ වා" යි අනුරුද්ධ ශාක්‍ය කී ය.

"යහළුව, ගිහිගෙන් නික්ම සසුන් වදින්නට මම් නො හැකියෙමි. මා විසින් තොපට අන් යමක් කළ හැකි නම්, එය තොපට කරන්නෙමි. තෙපි පැවිදි වන්නැ" යි භද්දියරජ කී ය.

"යහළුව, 'ඉදින් දරුව අනුරුද්ධය, භද්දිය ශාක්‍ය රජ ගිහිගෙන් නික්ම සසුන් වදනේ නම්, එසේ ඇති කල්හි තෙපිත් පැවිදි වවු' යි මව මට මෙසේ කීවා ය. 'යහළුව ඉදින් තොපගේ පැවිද්ද මා පිළිබඳ හෝ නො පිළිබඳ වේව යි මම් තොප හා ... සුවසේ පැවිදි වන්නැ' යි මේ වචනය ඔබ විසින් මට කියන ලද්දේ ය. යහළුව එන්න, දෙදෙනා ම ගිහිගෙන් නික්ම සසුන් වදිමෝව" යි (අනුරුද්ධ ශාක්‍ය කී ය).

එ සමයෙහි මිනිස්සු සත්‍ය ප්‍රතිඥා ඇති සත්‍යවාදීහු වෙති. ඉක්බිති භද්දිය ශාක්‍යරජ අනුරුද්ධ ශාක්‍යයාට "යහළුව, සත් හවුරුද්දක් ඉවසන්න (සාපෙක්‍ෂකවන්න) සත් හවුරුද්දක් ඇවෑමෙන් අපි දෙදෙනා ම ගිහිගෙන් නික්ම සසුන් වදින්නමු" යි කී ය.

"යහළුව, සත් හවුරුද්ද ඉතා බොහෝ කාලයෙකි. යහළුව, සත් හවුරුද්දක් බලාපොරොත්තු වන්නට මම නො හැක්කෙමි".

"යහළුව, සාවුරුද්දක් ඉවසන්න ... පස් අවුරුද්දක් ... සතර අවුරුද්දක් ... තුන් අවුරුද්දක් ... දෑවුරුද්දක් ... එක් හවුරුද්දක් ඉවසන්න. එක් හවුරුද්දක් ඇවෑමෙන් අපි දෙදෙනා ම ගිහිගෙන් නික්ම සසුන් වදින්නමෝවා" යි (භද්දියරජ කී ය).

"යහළුව එක් හවුරුද්දක් ඉතා බොහෝ කාලයකි. මම් එක් හවුරුද්දක් බලා පොරොත්තු වන්නට නො හැක්කෙමි" යි (අනුරුද්ධ ශාක්‍ය කී ය).

"යහළුව සත් මසක් ඉවසන්න. සත් මස ඇවෑමෙන් දෙදෙනා ම ගිහිගෙන් නික්ම සසුන් වදින්නමෝවා" යි (භද්දිය රජ කී ය).

"අතිචිරං සම්ම සත්ත මාසා. නාහං සක්කොමි සත්ත මාසෙ ආගමෙතුන්ති".

"ආගමෙහි සම්ම ඡ මාසෙ -පෙ- පඤ්ච මාසෙ -පෙ- චත්තාරො මාසෙ -පෙ- තයො මාසෙ -පෙ- ද්වෙ මාසෙ -පෙ- එකං මාසං -පෙ- අඩ්ඪමාසං. අඩ්ඪමාසස්ස අච්චයෙන උභො පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමා"ති

"අතිචිරං සම්ම අඩ්ඪමාසො. නාහං සක්කොමි අඩ්ඪමාසං ආගමෙතුන්ති".

"ආගමෙහි සම්ම, සත්තාහං යාවාහං පුත්තෙ ච භාතරෙ ච රජ්ජං නිය්‍යාදෙමී"ති.

"න චිරං සම්ම සත්තාහො ආගමෙස්සාමී"ති.

4. අථ ඛො භද්දියො ච සක්‍යරාජා අනුරුද්ධො ච ආනන්දො ච භගු ච කිම්බිලො ච දෙවදත්තො ච උපාලිකප්පකෙන සත්තමා යථා පුරෙ චතුරඞ්ගිනියා සෙනාය උය්‍යානභූමිං නිය්‍යන්ති එවමෙව චතුරඞ්ගිනියා සෙනාය නිය්‍යංසු. තෙ දූරං ගන්ත්වා සෙනං නිවත්තාපෙත්වා පරවිසයං ඔක්කමිත්වා ආභරණං ඔමුඤ්චිත්වා උත්තරාසඞ්ගෙන භණ්ඩිකං බන්ධිත්වා උපාලිං කප්පකං එතදවොචුං: "හන්ද භණෙ උපාලි නිවත්තස්සු. අලං තෙ එත්තකං ජීවිකායා"ති.

අථ ඛො උපාලිස්ස කප්පකස්ස නිවත්තන්තස්ස එතදහොසි: "චණ්ඩා ඛො සාකියා. ඉමිනා කුමාරා නිප්පාතිතාති ඝාතාපෙය්‍යුම්පි මං. ඉමෙ හි නාම සක්‍යකුමාරා අගාරස්මා අනගාරියං පබ්බජිස්සන්ති. කිමඞ්ග පනාහන්ති" සො භණ්ඩිකං මුඤ්චිත්වා තං භණ්ඩං රුක්ඛෙ ආලග්ගෙත්වා 'යො පස්සති දින්නඤ්ඤෙව හරතූ'ති වත්වා යෙන තෙ සක්‍යකුමාරා තෙනුපසඞ්කමි අද්දසාසුං ඛො තෙ සක්‍යකුමාරා උපාලිං කප්පකං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන උපාලිං කප්පකං එතදවොචුං: "කිස්ස භණෙ උපාලි නිවත්තොසී"ති.

"ඉධ මෙ අය්‍යපුත්තා නිවත්තන්තස්ස එතදහොසි: චණ්ඩා ඛො සාකියා ඉමිනා කුමාරා නිප්පාතිතාති ඝාතාපෙය්‍යුම්පි මං. ඉමෙ හි නාම සක්‍යකුමාරා අගාරස්මා අනගාරියං පබ්බජිස්සන්ති කිමඞ්ග-පනාහන්ති, සො ඛො අහං අය්‍යපුත්තා භණ්ඩිකං මුඤ්චිත්වා තං භණ්ඩං රුක්ඛෙ ආලග්ගෙත්වා 'යො පස්සති දින්නඤ්ඤෙව හරතූ'ති වත්වා තතොම්හි පටිනිවත්තො"ති.

"යහළුව සත් මස ඉතා බොහෝ කාලයෙකි. සත් මසක් බලාපොරොත්තු වන්නට මම නො හැක්කෙමි" යි (අනුරුද්ධ ශාක්‍ය කී ය).

"යහළුව, සමසක් ඉවසන්න ... පස් මසක් ... සිවු මසක් ... තුන් මසක් ... දෙ මසක් ... එක් මසක්... අඩ මසක් ඉවසන්න. අඩමස ඇවෑමෙන් දෙදෙනා ම පැවිදි වන්නමෝ වා" යි (භද්දිය රජ කී ය).

"යහළුව අඩමස ඉතා බොහෝ කලෙකි. අඩමසක් ඉවසන්නට මම නො හැකියෙමි" යි (අනුරුද්ධ ශාක්‍ය කී ය).

"යහළුව, පුතුනටත් සොහොයුරනටත් රජය පවරා දෙන තෙක් සතියක් ඉවසන්නැ" යි (භද්දියරජ කී ය).

"යහළුව සතිය බොහො කලෙක් නො වේ. එතෙක් බලා පොරොත්තු වන්නෙමි" යි (අනුරුද්ධ ශාක්‍ය කී ය).

4. ඉක්බිති භද්දිය ශාක්‍ය රජ ද අනුරුද්ධ ද ආනන්ද ද භෘගු ද කිංවිල ද දෙවදත්ත ද යන ශාක්‍යයෝ ස දෙනා උපාලි කපුවා සත්වනු කොටැත්තාහු පෙර උයන් බිමට සිවුරඟ සෙනඟින් උප ලක්ෂිත ව යම්සේ නික්ම යෙත් ද, එසේ ම සිවුරඟ සෙනඟින් උපලක්ෂිත වැ නික්මුණාහ. ඔහු දුරක් ගොස් සෙනඟ නවත්වා, පරවිෂ යට (අන් රජක්හු ගේ රටට) බැස, ආභරණ ගලවා උතුරු සළුවෙන් පොදියක් කොට බැඳ උපාලි කපුවා බණවා "සගය උපාලිය, පෙරළා යා. මෙය තට ජීවිකාවට ප්‍රමාණ වේ යැ" යි කීහ.

ඉක්බිති පෙරළා එන්නාවූ උපාලි කපුවාට "ශාක්‍යයෝ සැඩයහ. මොහු විසින් කුමරුවෝ නික්මවන ලදහ යි ඔවුන් මා මරවනු ද නො බැරි ය. මේ සාක්‍ය කුමාරවරු ද ගිහිගෙන් නික්ම පැවිදි වන්නාහ. මම කුමට ගිහිගෙයි රුඳෙන්නෙම් ද" යි මේ සිත විය. මෙසේ සිතා ආභරණ පොදිය ලිහා ඒ සියලු බඩු ගසෙක එල්ලා "යමෙක් මේවා දකින්නේ ද ඔහුට දෙන ලදුයේ ම ය. ගෙන යේවා" යි කියා ඒ ශාක්‍ය කුමාරයන් කරා ගියේ ය. ඒ ශාක්‍ය කුමාරයෝ දුරින් ම එන්නා වූ උපාලි කපුවා දුටුහ. දැක ඔහු බණවා, "සගය උපාලි, කවර හෙයින් පෙරළා එන්නෙහි ද" යි ඇසූහ.

"ආර්‍ය්‍ය පුත්‍රයිනි, මෙහි පෙරළා එන මට, 'ශාක්‍යයෝ ඒකාන්ත-යෙන් චණ්ඩය හ. මොහු විසින් කුමරුවෝ නික්මවන ලදහ' යි කියා මා මරවනුත් බැරි නැත. 'මේ ශාක්‍ය කුමාරයෝත් ගිහිගෙන් නික්ම පැවිදි වන්නාහ. මා ගැන කියනු ම කවරේ ද' යි මේ සිත විය. ආර්යපුත්‍රයෙනි, ඒ මම වනාහි බඩු පොදිය මුදා බඩු ගසෙක එල්ලා 'යමෙක් දක්නේ නම් ඔහුට මෙය දෙන ලද්දේ ම ය හේ මෙය ගෙන යේවා' යි කියා එතැනින් ම පෙරළා ආයෙමි" යි කී ය.

"සුට්ඨු භණෙ උපාලි, අකාසි යං නිවත්තො. චණ්ඩා ඛො සාකියා. ඉමිනා කුමාරා නිප්පාතිතාති ඝාතාපෙය්‍යුම්පි තන්ති".

5. අථ ඛො තෙ සක්‍යකුමාරා උපාලිං කප්පකං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ සක්‍යකුමාරා භගවන්තං එතදවොචුං: "මයං භන්තෙ සාකියා නාම මානස්සිනො. අයං භන්තෙ උපාලි කප්පකො අම්හාකං දීඝරත්තං පරිචාරිකො. ඉමං පඨමං පබ්බාජෙතු. ඉමස්ස මයං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරිස්සාම. එවං අම්හාකං සාකියානං සාකියමානො නිම්මානියිස්සතී"ති[1].

අථ ඛො භගවා උපාලිං කප්පකං පඨමං පබ්බාජෙසි, පච්ඡා තෙ සක්‍යකුමාරෙ. අථ ඛො ආයස්මා භද්දියො තෙනෙව අන්තරවස්සෙන තිස්සො විජ්ජා සච්ඡාකාසි. ආයස්මා අනුරුද්ධො දිබ්බචක්ඛුං උප්පාදෙසි. ආයස්මා ආනන්දො සොතාපත්තිඵලං සච්ඡාකාසි. දෙවදත්තො පොථුජ්ජනිකං ඉද්ධිං අභිනිප්ඵාදෙසි.

තෙන ඛො පන සමයෙන ආයස්මා භද්දියො අරඤ්ඤගතොපි රුක්ඛමූලගතොපි සුඤ්ඤාගාරගතොපි අභික්ඛණං උදානං උදානෙති 'අහො සුඛං අහො සුඛන්ති'. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ආයස්මා භන්තෙ භද්දියො අරඤ්ඤගතොපි රුක්ඛමූලගතොපි සුඤ්ඤාගාරගතොපි අභික්ඛණං උදානං උදානෙති 'අහො සුඛං අහො සුඛන්ති'. නිස්සංසයං ඛො භන්තෙ ආයස්මා භද්දියො අනභිරතො ච බ්‍රහ්මචරියං චරති. තදෙව වා පුරිමං රජ්ජසුඛං සමනුස්සරන්තො අරඤ්ඤගතොපි රුක්ඛමූලගතොපි සුඤ්ඤාගාරගතොපි අභික්ඛණං උදානං උදානෙති 'අහො සුඛං අහො සුඛන්ති'".

6. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: "එහි ත්වං භික්ඛු මම වචනෙන භද්දියං භික්ඛුං ආමන්තෙහි: සත්ථා තං ආවුසො භද්දිය ආමන්තෙතීති". "එවං භන්තෙ"ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා භද්දියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං භද්දියං එතදවොච: 'සත්ථා තං ආවුසො භද්දිය ආමන්තෙතී'ති.

1. නිම්මාදියිස්සති-සිමු.

"තෙල උපාලි, පෙරළා ආයේ ය යන යමක් ඇද්ද එය කළ සේ මැනැව්. ශාක්‍යයෝ චූකලි චණ්ඩයහ. 'මොහු විසින් කුමරුවෝ නික්මවන ලදහ' යි සිතා තා මරවනු ද නො බැරි යැ" (කුමරුවෝ කීහ).

5. ඉක්බිති ඒ ශාක්‍ය කුමාරයෝ උපාලි කපුවා ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හිඳගත්හ. ඒ ශාක්‍ය කුමරුවෝ පසෙක උන්නාහු ම "වහන්ස, ශාක්‍ය වූ අපි වනාහි මානනිඃශ්‍රිතයම්හ. වහන්ස, මේ උපාලි කපු තෙම දීර්ඝ කාලයක් අපේ සේවකයෙකි. භාග්‍යවතුන් වහන්සේ පළමු කොට මොහු පැවිදි කරනසේක්වා. අපි මොහුට වැඳීම, දක හුනස්නෙන් නැඟී සිටීම, දෙහොත් මුදුන් තබා නමස්කාරය, සාමීචිකර්මය (පවත් සැලිමාදී ආභිසමාචාරිකවත්) කරන්නෙමු. මෙසේ අපේ ශාක්‍යමානය නිර්මාණ බවට පමුණුවන ලබන්නේ යැ (දුරුවන්නේ යැ)" කීහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උපාලි කපුවා පළමු කොට ද එයට පසු ඒ කුමරුවන් ද පැවිදි කළ සේක. එයින් පසු ආයුෂ්මත් භද්දිය තෙම ඒ අතුරු වසෙහි දී ම ත්‍රිවිද්‍යාවන් සාක්ෂාත් කළේ ය. ආයුෂ්මත් අනුරුද්ධ තෙම දිවැස ඉපැදවී ය. ආයුෂ්මත් ආනන්ද තෙම සොවාන්ඵලය පසක් කෙළේ ය. දෙව්දත් තෙම පුහුදුන් ඍද්ධිය නිපැදවී ය.

එ සමයෙහි වනාහි ආයුෂ්මත් භද්දියයෝ අරනට ගියෝ ද, රුක්මුලට ගියෝ ද, ශුන්‍යාගාරයකට ගියෝ ද, 'අහෝ සැප ය, අහෝ සැප යැ' යි එක්වන් උදන් අනති. එකල්හි බොහෝ මහණහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක ඉඳගත්හ. එසේ මහණහු පසෙක උන්නාහු ම "වහන්ස, ආයුෂ්මත් භද්දිය තෙමේ අරනට ගියේ ද රුක් මුලට ගියේ ද ශුන්‍යාගාරයට ගියේ ද 'අහෝ සැප ය' අහෝ සැප යැ'යි උදන් අනයි. වහන්ස, ආයුෂ්මත් භද්දිය තෙම නිසැකින් ම නො ඇලුණේ බඹසර සරයි. ඒ පළමු රජ සුව ම හෝ සිහි කරනුයේ අරනට ගියේත් රුක්මුලට ගියේත් ශුන්‍යාගාරයට ගියේත් 'අහෝ, සුව ය අහෝ සුව යැ' යි එක්වන් උදන් අනා යැ" යි මෙ පවත් සැලකළාහ.

6. එවිට භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණක්හු බණවා, "මහණ, මෙහි එව, 'ඇවැත්නි, ශාස්තෘහු තොප කැඳවති'යි කියා මාගේ වචනයෙන් භද්දිය මහණහු කැඳවාගෙනෙව" යි වදළ සේක. "එසේ යැ වහන්සැ" යි කියා එ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ආයුෂ්මත් භද්දියයන් කරා එළැඹියේ ය. එළැඹ "ඇවැත්නි, භද්දියයෙනි, ශාස්තෘන් වහන්සේ තොප කැඳවන සේකැ" කීයේ ය.

“එවමාවුසො”ති ඛො ආයස්මා භද්දියො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං භද්දියං භගවා එතදවොච: “සච්චං කිර ත්වං භද්දිය අරඤ්ඤගතො පි රුක්ඛමූලගතො පි සුඤ්ඤාගාරගතො පි අභික්ඛණං උදානං උදානෙසි අහො සුඛං අහො සුඛන්ති.”

“එවං භන්තෙ”ති.

“කිං පන ත්වං භද්දිය අත්ථවසං සම්පස්සමානො අරඤ්ඤගතො පි රුක්ඛමූලගතො පි සුඤ්ඤාගාරගතො පි අභික්ඛණං උදානං උදානෙසි අහො සුඛං අහො සුඛන්ති.”

“පුබ්බෙ මෙ භන්තෙ රඤ්ඤො සතො අන්තොපි අන්තෙපුරෙ රක්ඛා සුසංවිහිතා හොති. බහිපි අන්තෙපුරෙ රක්ඛා සුසංවිහිතා හොති. අන්තොපි නගරෙ රක්ඛා සුසංවිහිතා හොති. බහිපි නගරෙ රක්ඛා සුසංවිහිතා හොති. අන්තොපි ජනපදෙ රක්ඛා සුසංවිහිතා හොති. බහිපි ජනපදෙ රක්ඛා සුසංවිහිතා හොති. සො ඛො අහං භන්තෙ එවං රක්ඛිතොපි ගොපිතොපි සන්තො භීතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රාසී විහරාමි. එතරහි ඛො පනාහං භන්තෙ එකො අරඤ්ඤගතො’ පි රුක්ඛමූලගතො’ පි සුඤ්ඤාගාරගතො’ පි අභීතො අනුබ්බිග්ගො අනුස්සඞ්කී අනුත්‍රාසී අප්පොස්සුක්කො පන්නලොමො පරදවුත්තො[1] මිගභූතෙන චෙතසා විහරාමි. ඉමම්පි[2] ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො අරඤ්ඤගතොපි රුක්ඛමූලගතොපි සුඤ්ඤාගාර-ගතොපි අභික්ඛණං උදානං උදානෙමි ‘අහො සුඛං අහො සුඛන්ති’”.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

යස්සන්තරතො න සන්ති කොපා
ඉති භවාභවතඤ්ච වීතිවත්තො
තං විගතභයං සුඛිං අසොකං
දෙවා නානුභවන්ති දස්සනායාති.

7. අථ ඛො භගවා අනුපියායං යථාභිරන්තං විහරිත්වා යෙන කොසම්බී තෙන චාරිකං චරමානො යෙන කොසම්බී තදවසරි. තත්‍ර සුදං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො දෙවදත්තස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: “කිං නු ඛො අහං පසාදෙය්‍යං යස්මිං මෙ පසන්නෙ බහු ලාභසක්කාරො උප්පජ්ජෙය්‍යා”ති.

---

1. පරදත්තවුත්තො – මජසං.
2. ඉමං ඛො – සා. ම.

''එසේ යැ ඇවැත්නි'' යි කියා ආයුෂ්මත් භද්දියයෝ එ මහණහට පිළිවදන් දී, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ ඔබ වැඳ පසෙක උන්හ. පසෙක හුන් ආයුෂ්මත් භද්දියයන් බණවා, භාග්‍යවතුන් වහන්සේ ''භද්දියයෙනි, තෙපි අරනට ගියෝත් රුක්මුලකට ගියෝත් ශූන්‍යාගාරයට ගියෝත් 'අහෝ සුව යැ, අහෝ සුව යැ'යි එක්වන් උදන් අනත්ල. ඒ සැබෑ ද'' යි අසා වදළසේක.

''වහන්ස, එසේ යැ''යි භද්දියයෝ පිළිවදන් දුන්හ.

භද්දියයෙනි, තෙපි අරනට ගියෝද රුක්මුලකට ගියෝද ශූන්‍යාගාරයට ගියෝද කුමක් අරුත් වශයෙන් බලන්නාහු (ම) එක්වන් සොම්නසින් 'අහෝ සුවයැ අහෝ සුවයැ'යි උදන් ඇනුඳ'' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක.

''වහන්ස, පෙර මා රජ වැ හුන් සමයෙහි ඇතොවුරෙහි ඇතුළත ද මොනොවට රකවල පිහිටුවන ලද්දේ වේ. ඇතොවුරින් පිටත ද මොනොවට රකවල පිහිටුවන ලද්දේ වේ. දනව්ව ඇතුළත ද මොනොවට රකවල පිහිටුවන ලදුයේ වේ. දනව්වෙන් පිටත ද මොනොවට රකවල පිහිටුවන ලදුයේ වේ. වහන්ස, ඒ මම් මෙසේ රක්ෂිත ගෝපිත වීම් නමුදු බියපත් ව උද්වේග ඇති වැ සැක ඇති වැ තැති ගත්තෙම් වෙසෙමි. වහන්ස, දුන් වූ කලි හුදෙකලා වූයෙම්, අරනට ගියෙම් ද රුක්මුලට ගියෙම් ද ශූන්‍යාගාරයට ගියෙම් ද අභීත වැ අනුද්විග්න වැ සැක නැති වැ තැති ගැනුම් නැති ව, අල්පොත්සුක වැ, මත් නැති ව, මෙරමා දුන් දූයින් යැපුණෙම් මෘගභූත (අපෙක්ෂා රහිත වූ) සිතින් යුතු වැ වෙසෙමි. වහන්ස, මම් මේ කරුණ ද දක්නෙම් වනයට ගියෙම් ද රුක්මුලට ගියෙම් ද ශූන්‍යාගාරයට ගියෙම් ද 'අහෝ සුවය අහෝ සුව යැ' එක්වන් උදන් අනමි'' යි ආයුෂ්මත් භද්දියයෝ කීහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මෙ උදන් ඇනූසේක:

''යමක්හු සිතෙහි අනාගාමි මගින් නැසූ බැවින් කෝපයෝ නො පහළ වෙත් ද, (සම්පත්ති විපත්ති වෘද්ධි හානි ශාශ්වතෝච්ඡෙද දෘෂ්ටි පුණ්‍යපාප දූ යි අනෙකප්‍රකාර වූ) භවවිභවතාවතුත් යමෙක් ඉක්මියේ ද පහ වූ බිය ඇති සුවපත් වූ ශෝක නැති ඒ තෙනැත්තහු දක්නට දෙවියෝ ද නො ලබත් (ඔහු දූක්ම දෙවියනට දුර්ලභ දූයෙකි)''

7. එකල්හි භාග්‍යවතුන් වහන්සේ අනුපියාමෙහි රිසි තාක් වැස, ඉන් තික්ම කොසොඹෑ නුවර බලා පිළිවෙළින් සැරිසරනසේක් කොසොඹෑ නුවරට පැමිණිසේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ කොසොඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වැඩ වසනසේක. එ කලැ එකලා වැ චිත්තවිවෙකයෙන් හුන් දෙවදත් තෙරුනට ''යමක්හු මට පැහැදුණු කල්හි මට බොහෝ ලාභසත්කාර උපදනෝ නම් එබඳු වූ කවරක්හු පහදවා ගනිම් දෝ'' යි මේ සිත විය.

අථ ඛො දෙවදත්තස්ස එතදහොසි: "අයං ඛො අජාතසත්තු කුමාරො තරුණො චෙව ආයතිං භද්දො ච, යන්නූනාහං අජාතසත්තුං කුමාරං පසාදෙය්‍යං. තස්මිං මෙ පසන්නෙ බහු ලාභසක්කාරො උප්පජ්ජිස්සතී"ති.

අථ ඛො දෙවදත්තො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන රාජගහං තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන රාජගහං තදවසරි. අථ ඛො දෙවදත්තො සකවණ්ණං පටිසංහරිත්වා කුමාරකවණ්ණං අභිනිම්මිනිත්වා අහිමෙඛලිකාය අජාතසත්තුස්ස කුමාරස්ස උච්ඡඞ්ගෙ පාතුරහොසි. අථ ඛො අජාතසත්තු කුමාරො භීතො අහොසි උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රස්තො. අථ ඛො දෙවදත්තො අජාතසත්තුං කුමාරං එතදවොච: "භායසි මං ත්වං කුමාරා"ති".

"ආම භායාමි. කොසි ත්වන්ති".

"අහං දෙවදත්තො"ති.

"සචෙ ඛො ත්වං භන්තෙ අය්‍යො දෙවදත්තො, ඉඞ්ඝ සකෙනෙව වණ්ණෙන පාතුභවස්සූ"ති.

8. අථ ඛො දෙවදත්තො කුමාරකවණ්ණං පටිසංහරිත්වා සඞ්ඝාටි-පත්තචීවරධරො අජාතසත්තුස්ස කුමාරස්ස පුරතො අට්ඨාසි. අථ ඛො අජාතසත්තු කුමාරො දෙවදත්තස්ස ඉමිනා ඉද්ධිපාටිහාරියෙන අභිප්පසන්නො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගච්ඡති. පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරීයති.

අථ ඛො දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකෙන අභිභූතස්ස පරියාදින්නචිත්තස්ස එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි 'අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී'ති. සහ චිත්තුප්පාද'ව දෙවදත්තො තස්සා ඉද්ධියා පරිහායි.

තෙන ඛො පන සමයෙන කකුධො නාම කොළියපුත්තො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස උපට්ඨාකො අධුනා කාලකතො. අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො. තස්ස එවරූපො අත්තභාවපටිලාභො හොති සෙය්‍යථාපි නාම ද්වෙ වා තීණි වා මාගධකානි ගාමක්ඛෙත්තානි. සො තෙන අත්තභාවපටිලාභෙන නෙව අත්තානං න පරං ව්‍යාබාධෙති.

ඉක්බිති දෙව්දත්තෙරහට "මේ අජාසත් කුමර තරුණ ද මත්තෙහි භාග්‍යසම්පත් ලබන්නෙක් ද වේ. අජාසත් කුමරු පහදවා ගත හොත් මැනැවි. මට ඔහු පැහැදුණු කල්හි බොහෝ ලාභසත්කාර උපදින්නේ යැ" යි මේ සිත විය.

ඉක්බිති දෙව්දත් තෙරණුවෝ සෙනසුන සුරැකි කොට තබා පාසිවුරු ගෙන රජගහ නුවර කරා එළැඹියාහ. එ කලැ දෙව්දත්හු (ඍද්ධියෙන්) සවකීය වේශය හකුළුවා කුඩා දරුවකුගේ වේශය මවා ගෙන (ඉනවටා සර්පයකු ද එකි එකී අතෙහි පයෙහි එක් එක් සර්පයකු ද ගෙලවටා සර්පයකු ද හිසවටා එකකු ද යි මෙසේ) සර්පමේඛලායෙන් සැදී, අජාසත් කුමරුගේ උකුලෙහි පහළ විය. එවිට අජාසත් කුමර බියපත් වූයේ, උද්වේගයට පැමිණියේ, නැගී ආ සැක ඇත්තේ, තැති ගත්තේ විය. එ කල්හි දෙව්දත් තෙරණුවෝ 'කුමාරය, මා දැක බිය පත් වෙහි දැ' යි පුළුවුත්හ.

"එසේ ය, බියපත් වෙමි. ඔබ කවුරු දැ" යි කුමර ඇසී ය.

"මම දෙව්දත් වෙමි" යි තෙරණුවෝ කීහ.

"වහන්ස, ඔබ අරි දෙව්දත් වෙත් නම්, තමන් ගේ පියෙවි වෙශයෙන් පෙනී සිටින්නැ" යි කුමර කී ය.

8. ඉක්බිති දෙව්දත් තෙරණුවෝ කුමාරක වේශය හකුළුවා සංඝාටි පාත්‍ර චීවරධර වූවෝ (සඟළ සිවුර හා පාත්‍රය හා සෙසු දෙසිවුර දරනුවෝ) අජාසත් කුමර ඉදිරියේ පෙනී සිටියාහ. එවිට අජාසත් කුමර දෙව්දතුන්ගේ මේ ඉද්ධි පෙළහරින් වෙසෙසින් පැහැදුණේ රිය පන්සියයෙකින් සැදී උදේ සවස උවටනට යෙයි. දිනපතා බත්තැළි පන්සියයක් වූ බොජුන් පිරිනැමීමෙක් ද කැරෙයි.

එ කල්හි ලාභසත්කාරයෙන් හා කීර්තියෙන් මැඩුණු, ක්ෂීණ වූ කුසල් සිත් ඇති දෙව්දත් තෙරණුවනට 'මම භික්ෂු සංඝයා පාලනය කරන්නෙමි' යි මෙ බඳු වූ ආශාවෙක් උපන. එ සිත උපන්නා හා ම දෙව්දත් තෙරණුවෝ ඒ ඍද්ධියෙන් පිරිහුණාහ.

එ සමයෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ගේ උපස්ථායක වූ කෝලිය පුත්‍ර වූ කකුධ නම් ක්ෂත්‍රියයෙක් එයට සමීප කාලයෙහි කළුරිය කෙළේ එක්තරා මනොමය දිව්‍යනිකායයෙක උපන්නේ වෙයි. ඔහුට මගධ රටැ ග්‍රාමක්ෂෙත්‍ර දෙකක් හෝ තුනක් තරම විශාල වූ මෙබඳු ආත්මභාව ප්‍රතිලාභයෙක් වෙයි. හේ ඒ ලත් අත් බැවින් තමා හෝ මෙරමා හෝ නො පෙළයි.

අථ ඛො කකුධො දෙවපුත්තො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතො ඛො කකුධො දෙවපුත්තො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: දෙවදත්තස්ස භන්තෙ ලාභසක්කාරසිලොකෙන අභිභූතස්ස පරියාදින්නචිත්තස්ස එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි 'අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී'ති. සහ චිත්තුප්පාදව භන්තෙ දෙවදත්තො තස්සා ඉද්ධියා පරිහීනො'ති. ඉදමවොච කකුධො දෙවපුත්තො. ඉදං වත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙව අන්තරධායි.

9. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං එතදවොච: කකුධො නාම භන්තෙ කොළියපුත්තො මම උපට්ඨාකො අධුනා කාලකතො අඤ්ඤතරං මනොමයං කායං උපපන්නො තස්ස එවරූපො අත්තභාවපටිලාභො සෙය්‍යථාපි නාම ද්වෙ වා තීණි වා මාගධකානි ගාමක්ඛෙත්තානි, සො තෙන අත්තභාවපටිලාභෙන නෙව අත්තානං න පරං ව්‍යාබාධෙති. අථ ඛො භන්තෙ කකුධො දෙවපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භන්තෙ කකුධො දෙවපුත්තො මං එතදවොච: දෙවදත්තස්ස භන්තෙ ලාභසක්කාරසිලොකෙන අභිභූතස්ස පරියාදින්නචිත්තස්ස එවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි: අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමීති. සහ චිත්තුප්පාදව භන්තෙ දෙවදත්තො තස්සා ඉද්ධියා පරිහීනොති. ඉදමවොච භන්තෙ කකුධො දෙවපුත්තො. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙව අන්තරධායීති.

"කිං පන තෙ මොග්ගල්ලාන කකුධො දෙවපුත්තො චෙතසා චෙතො පරිච්ච විදිතො යං කිඤ්චි කකුධො දෙවපුත්තො භාසති 'සබ්බන්තං තථෙව හොති නො අඤ්ඤථා'ති".

චෙතසා චෙතො පරිච්ච විදිතො ච මෙ භන්තෙ කකුධො දෙවපුත්තො යං කිඤ්චි කකුධො දෙවපුත්තො භාසති සබ්බන්තං තථෙව හොති නො අඤ්ඤථා''ති.

"රක්ඛස්සෙතං මොග්ගල්ලාන වාචං රක්ඛස්සෙතං මොග්ගල්ලාන වාචං. ඉදානි සො මොඝපුරිසො අත්තනා ව අත්තානං පාතුකරිස්සතී''ති.

ඉක්බිති කකුධ දෙව්පුත් ආයුෂ්මත් මහමුගලන් තෙරුන් කරා එළැඹියේ ය. එළඹ ඔබ වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ කකුධ දෙව්පුත් ආයුෂ්මත් මහමුගලන් තෙරුනට ''වහන්ස, ලාභ සත්කාර කීර්තියෙන් මඩනා ලද හාත්පසින් ගන්නා ලද සිතැති දෙව්දත් තෙරුනට 'මම භික්ෂු සඞ්ඝයා පරිහරණය කරන්නෙමි' යි මෙබඳු ආශාවෙක් උපන. වහන්ස, එ සිත උපන්නා හා ම දෙව්දත්හු ඒ ඍද්ධියෙන් පිරිහුණාහ''යි මෙ පවත් සැලකෙළේ ය. කකුධ දෙව්පුත් මෙබස් පැවැසී ය. මෙය පවසා, මහමුගලන් තෙරුන් වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් විය.

9. එකල්හි මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහ. එළඹ ඔබ වැඳ පසෙක උන්හ. (එසේ) පසෙක හුන් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාහ: ''වහන්ස, මට උපස්ථායක ව සිටි, නොබෝද කලුරිය කළ කකුධ නම් කොළිය පුත්‍ර තෙම එක්තරා මනොමය ආත්ම භාවයකට පැමිණියේ ය. ඔහුට මගධ රටැ ගම්කෙත්දෙකක් තුනක් පමණ වූ ආත්මභාවයෙක් ලැබී ඇත. හේ ඒ අත්බැවින් තමා නො ම පෙළයි, අනුන් ද නො ම පෙළයි. වහන්ස, ඉක්බිති කකුධ දෙව්පුත් මා වෙත එළැඹියේ ය. එළැඹ මා වැඳ පසෙක සිටියේ ය. වහන්ස, පසෙක සිටි ඒ කකුධ දෙව්පුත් ''වහන්ස, ලාභ සත්කාර කීර්තියෙන් මඩනා ලද දෙව්දතුනට 'මම භික්ෂු සඞ්ඝයා පරිහරණය කරන්නෙමි' යි මෙසේ වූ ආශාවෙක් උපන. වහන්ස, ඒ සිත උපන්නා හා ම දෙව්දත්හු ඍද්ධියෙන් පිරිහුණාහ. වහන්ස, කකුධ දෙව්පුත් මෙ බස් පැවැසී ය. මෙය පවසා මා වැඳ පැදකුණු කොට එතන්හි ම අතුරුදහන් වී ය'' යනු යි.

''කිමෙක් ද? මොද්ගල්‍යායනයෙනි, 'කකුධ දෙව්පුත් කියන සියල්ල එසේ ම ය. එහි වෙනස් සැටියෙක් නැතැ' යි ඔහුගේ සිත තොප සිතින් පිරිසිඳ දන්නා ලද දූ?'' යි භාග්‍යවතුන් වහන්සේ අසාවදාළසේක.

''වහන්ස, කකුධ දෙව්පුත් කියන ඒ සියල්ල එසේ ම ය, අන් සැටි නො වේ යැ යි ඔහු මා සිතින් ද පිරිසිඳ දන්නා ලද්දේ'' යැ යි මහමුගලන් තෙරණුවෝ වදාළාහ.

''මොද්ගල්‍යායනයෙනි, මේ වචනය රැක ගනිවු. මොද්ගල්‍යායනයෙනි, මේ වචනය රැක ගනිවු. දැන් ඒ හිස් පුරුෂ තෙම තමා ම හෙළිකරන්නේ යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

10. “පඤ්චිමෙ මොග්ගල්ලාන සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච;

ඉධ මොග්ගල්ලාන එකච්චො සත්ථා අපරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාති පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. තමෙනං සාවකා එවං ජානන්ති: අයං ඛො භවං සත්ථා අපරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. මයඤ්චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං කථං තං මයං තෙන සමුදාචරෙය්‍යාම සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමොව තෙන පඤ්ඤායිස්සතීති.

එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා සීලතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි සීලතො රක්ඛං පච්චාසිංසති.[2]

පුන ච පරං මොග්ගල්ලාන ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධාජීවො සමානො ‘පරිසුද්ධාජීවොම්හී’ති පටිජානාති ‘පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසඞ්කිලිට්ඨො’ති. තමෙනං සාවකා එවං ජානන්ති; අයං ඛො භවං සත්ථා අපරිසුද්ධාජීවො සමානො පරිසුද්ධාජීවොම්හීති පටිජානාති පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසඞ්කිලිට්ඨො’ති: මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම නාස්සස්ස මනාපං යං ඛො පනස්ස අමනාපං කථං තං මයං තෙන සමුදාචරෙය්‍යාම? සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමො ච තෙන පඤ්ඤායිස්සතීති.

එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා ආජීවතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ආජීවතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං මොග්ගල්ලාන ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධධම්මදෙසනො සමානො ‘පරිසුද්ධධම්මදෙසනොම්හී’ති පටිජානාති ‘පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා අසඞ්කිලිට්ඨා’ති. තමෙනං සාවකා එවං ජානන්ති: අයං ඛො භවං සත්ථා අපරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාති පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා. අසඞ්කිලිට්ඨා’ති. මයං චෙව ඛො පන ගිහීනං අරොචෙය්‍යාම නාස්සස්ස මනාපං,

---

1. තං – මජසං.
2. පච්චාසීසති – මජසං.
3. පජානාති – මජසං.

10. මෞද්ගල්‍යායනයෙනි, ලොවැ ශාස්තෘහු පස් දෙනෙක් විද්‍යමානයහ. කවර පස් දෙනෙක් ද? යත්:

"මෞද්ගල්‍යායනයෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් අපිරිසිදු වූ සිල් ඇත්තේ ම 'පිරිසිදු සිල් ඇත්තෙම් වෙමි. මාගේ ශීලය පිරිසිදු ය, හැම ලෙසින් ම ශුද්ධ ය, නො කිලිටි යැ' යි ප්‍රතිඥා කෙරෙයි. ඔහුගේ ශ්‍රාවකයෝ "මේ භවත් ශාස්තෘ තෙම වනාහි නො පිරිසිදු සිල් ඇත්තේ ම පිරිසිදු සිල් ඇත්තෙමි යි, මාගේ ශීලය පිරිසිදු ය, හැම ලෙසින් ම ශුද්ධ ය, නො කිලිටි යැ" යි ප්‍රතිඥා කෙරෙයි. අපි වූ කලී මෙය ගිහියනට දන්වන්නමෝ නම්, එය ඔහුට මනාප නො වන්නේ ය. යමක් අමනාප වේ නම්, අපි කෙසේ එයින් ඔහුට කියන්නමෝ ද? මහජන තෙමේ මොහුට සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සම්මාන කෙරෙයි. එ බැවින් තෙමේ යමක් කරන්නේ ද එයින් තෙමේ ම හෙළි වන්නේ යැ" යි මෙසේ ඔහු දනිත්.

මෞද්ගල්‍යායනයෙනි, ශ්‍රාවකයෝ මෙබඳු ශාස්තෘවරයා ශීලය අතින් රකිත්. මෙබඳු ශාස්තෘවරයා ශ්‍රාවකයන්ගෙන් ශීලය අතින් රැක ගැන්ම පතයි.

තවද මෞද්ගල්‍යායනයෙනි, මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් අපිරිසිදු ආජීවය ඇත්තේ ම 'පිරිසිදු ආජීවය ඇත්තෙම් වෙමි, මාගේ ආජීවය පිරිසිදු ය, හැම ලෙසින්ම ශුද්ධ ය, නො කිලිටි යැ' යි ප්‍රතිඥා කෙරෙයි. ඔහුගේ ශ්‍රාවකයෝ 'මේ භවත් ශාස්තෘ තෙම අපිරිසිදු ආජීවය ඇත්තේ ම පිරිසිදු ආජීවය ඇත්තෙමි, මාගේ ආජීවය පිරිසිදු ය, හැම ලෙසින් ශුද්ධ ය, නො කිලිටියැ යි ප්‍රතිඥා කෙරෙයි. අපිදු වනාහි මෙය ගිහියනට දන්වන්නමෝ නම්, එය ඔහුට මනාප නො වන්නේ ය. යමක් ඔහුට මනාප නො වන්නේ නම්, කෙසේ අපි එයින් ඔහුට කියන්නමෝ ද, ජන තෙමේ මොහුට සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සම්මාන කෙරෙයි. එබැවින් තෙමේ යමක් කරන්නේ ද එයින් තෙමේ ම හෙළි-වන්නේ යැ" යි මෙසේ ඔහු දනිත්.

මෞද්ගල්‍යායනයෙනි, ශ්‍රාවකයෝ මෙබඳු ශාස්තෘවරයා ආජීවය අතින් රකිත්. මෙබඳු ශාස්තෘ තෙමේ ද ආජීවය අතින් ශ්‍රාවකයන්ගෙන් ආරක්‍ෂාව පතයි.

තවද මෞද්ගල්‍යායනයෙනි, මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් නො පිරිසිදු දම්දෙසුම් ඇත්තේ ම පිරිසිදු දම්දෙසුම් ඇත්තෙමි යි මාගේ දහම් දෙසුම පිරිසිදු යැ යි හැම ලෙසින් ශුද්ධ යැ යි නො කිලිටි යැ යි ප්‍රතිඥා කෙරෙයි. ඔහුගේ ශ්‍රාවකයෝ 'මේ භවත් ශාස්තෘ තෙම නො පිරිසිදු දම්දෙසුම් ඇත්තේ ම පිරිසිදු දම්දෙසුම් ඇත්තෙමැ යි මාගේ ධර්මදෙශනා පිරිසිදු ය, හැම ලෙසින් ශුද්ධ ය, නො කිලිටි යැ' යි ප්‍රතිඥා කෙරෙයි. අපි වනාහි මෙබව ගිහියනට කියන්නමෝ නම්, එය ඔහුට මනාප නො වන්නේ ය.

යං ඛො පනස්ස අමනාපං කථං තං මයං තෙන සමුදචරෙය්‍යාම සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාරෙන යං තුමො කරිස්සති තුමො'ව තෙන පඤ්ඤායිස්සතී'ති.

එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා ධම්මදෙසනතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ධම්මදෙසනතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං මොග්ගල්ලාන ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධ-වෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාති පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදතං අසඞ්කිලිට්ඨන්ති. තමෙනං සාවකා එවං ජානන්ති: ''අයං ඛො භවං සත්ථා අපරිසුද්ධවෙය්‍යා-කරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාති පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදතං අසඞ්කිලිට්ඨන්ති. මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං කථං තං මයං තෙන සමුදචරෙය්‍යාම, සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමො'ව තෙන පඤ්ඤායිස්සතී''ති.

එවරූපං ඛො මොග්ගල්ලාන සත්ථාරං සාවකා වෙය්‍යාකරණතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි වෙය්‍යාකරණතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං මොග්ගල්ලාන ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධඤාණ-දස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාති පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදතං අසඞ්කිලිට්ඨන්ති. තමෙනං සාවකා එවං ජානන්ති: අයං ඛො භවං සත්ථා අපරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාති, පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදතං අසඞ්කිලිට්ඨන්ති. මයං චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං කථං තං මයං තෙන සමුදචරෙය්‍යාම, සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමො'ව තෙන පඤ්ඤායිස්සතී'ති.

එවරූපං ඛො පන මොග්ගල්ලාන සත්ථාරං සාවකා ඤාණදස්සනතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ඤාණදස්සනතො රක්ඛං පච්චාසිංසතීති.

යමක් ඔහුට මනාප නො වන්නේ නම්, අපි කෙසේ නම් එයින් ඔහුට කියන්නමෝ ද, ජන තෙමේ මොහුට චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකරින් සම්මාන කෙරෙයි. තෙමේ යමක් කරන්නේ ද තෙමේ ම එයින් පැනෙන්නේ යැ' යි දනිත්.

මෞද්ගල්‍යායනයෙනි, මෙබඳු ශාස්තෘවරයා වූකලි ශ්‍රාවකයෝ දම්දෙසුම් අතින් රකිත්. මෙබඳු ශාස්තෘ තෙමේ ද දම්දෙසුම් අතින් රැකගැන්ම ශ්‍රාවකයන්ගෙන් අපෙක්‍ෂා කෙරෙයි.

තව ද මෞද්ගල්‍යායනයෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් අපිරිසිදු විවරණ (ධර්මය මහළි පෙහෙළි කොට තෝරා දීම) ඇත්තේ ම පිරිසිදු විවරණ ඇත්තෙම් වෙමි යි, මාගේ විවරණය පිරිසිදු ය, පර්යවදාත ය, නො කිලිටි යැ' යි ප්‍රතිඥා කෙරෙයි. ඔහුගේ සවුවෝ ද, 'මේ භවත් ශාස්තෘ තෙමේ අපිරිසිදු දහම් විවරණ ඇත්තේ ම පිරිසිදු විවරණ ඇත්තෙම් වෙමි, මාගේ දහම් විවරණ පිරිසිදු ය, පර්යවදාත ය, නො කිලුටු යැ' යි ප්‍රතිඥා කෙරෙයි. අපිදු වූකලි ගිහියනට දන්වන්නමෝ නම්, එය ඔහුට මනාප නො වන්නේ ය. යමක් ඔහුට මනාප නො වන්නේ නම්, අපි කෙසේ නම් එයින් ඔහුට කියන්නමෝ ද, (මහ ජන තෙමේ) සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් ඔහුට සම්මාන කෙරේ ම ය. යමක් තෙමේ කරන්නේ ද තෙමේ ම එයින් පැනෙන්නේ යැ' යි ඔහු (ගැන) මෙසේ දනිත්.

මෞද්ගල්‍යායනය, මෙ බඳු ශාස්තෘහු වනාහි ශ්‍රාවකයෝ දහම් විවරණය කෙරෙන් රකිත්. මෙ බඳු ශාස්තෘ තෙමේ ද සිය සව්වන්ගෙන් දහම් විවරණ අතින් තමාගේ ආරක්‍ෂාව පතයි.

තවද මෞද්ගල්‍යායනය, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් අපිරිසිදු ඥානදර්ශන (නුවණින් දැක්ම) ඇත්තේ ම පිරිසිදු ඥාන-දර්ශනය ඇත්තෙම් වෙමි. මගේ ඥානදර්ශනය පිරිසිදු ය, පර්යවදාත ය, නො කිලිටි යැ' යි ප්‍රතිඥා කෙරෙයි. (ඔහුගේ) සවුවෝ ඔහු මෙසේ දැනගනිත්: 'මේ භවත් ශාස්තෘ තෙම නො පිරිසිදු ඥානදර්ශන ඇත්තේ ම පිරිසිදු ඥානදර්ශන ඇත්තෙමි යි, මාගේ ඥානදර්ශන පිරිසිදු ය, පර්යවදාත ය, නො කිලිටි යැ'' යි ප්‍රතිඥා කෙරෙයි. අපි වූකලි (මෙ පවත්) ගිහියනට දන්වන්නමෝ නම් එය ඔහුට මනාප නො වන්නේ ය. යමක් ඔහුට මනාප නො වන්නේ නම්, අපි කෙසේ නම් එයින් ඔහුට කියන්නමෝ ද, මහජන තෙමේ ඔහුට සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් සම්මාන කෙරෙයි. යමක් තෙමේ කරන්නේ ද එයින් තෙමේ ම පැනෙන්නේ යැ''යි මෙසේ දනිත්.

මෞද්ගල්‍යායනය, මෙබඳු ශාස්තෘහු වනාහි ශ්‍රාවකයෝ ඥානදර්ශ-නය අතින් රකිත්, මෙබඳු ශාස්තෘ තෙමේ ද ශ්‍රාවකයන්ගෙන් ඥානදර්ශනය අතින් රැක්ම අපෙක්‍ෂා කෙරෙත්.

ඉමෙ ඛො මොග්ගල්ලාන පඤ්ච සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

අහං ඛො පන මොග්ගල්ලාන පරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාමි පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. න ච මං සාවකා සීලතො රක්ඛන්ති. න චාහං සාවකෙහි සීලතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධාජීවො සමානො "පරිසුද්ධාජීවොම්හීති පටිජානාමි පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසඞ්කිලිට්ඨො"ති. න ච මං සාවකා ආජීවතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ආජීවතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාමි පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා අසඞ්කිලිට්ඨාති. න ච මං සාවකා ධම්මදෙසනාතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ධම්මදෙසනාතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධවෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාමි පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. න ච මං සාවකා වෙය්‍යාකරණතො රක්ඛන්ති. න චාහං සාවකෙහි වෙය්‍යාකරණතො රක්ඛං පච්චාසිංසාමි.

පරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති. පටිජානාමි පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදාතං අසඞ්කිලිට්ඨන්ති. න ච මං සාවකා ඤාණදස්සනතො රක්ඛන්ති, න 'චාහං සාවකෙහි' රක්ඛං පච්චාසිංසාමීති.

11. අථ ඛො භගවා කොසම්බියං යථාභිරන්තං විහරිත්වා යෙන රාජගහං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි.

තත්‍ර සුදං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "දෙවදත්තස්ස භන්තෙ අජාතසත්තු කුමාරො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගච්ඡති, පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරියන්ති"ති.

මෞද්ගල්‍යායනය, ලොවැ මේ ශාස්තෘහු පස් දෙන විද්‍යමාන වෙත්.

මෞද්ගල්‍යායනය, මම වූකලි පිරිසිදු සිල් ඇත්තෙම් ම "පිරිසිදු සිල් ඇත්තෙමි, මාගේ සිල් පිරිසිදු ය, පර්යවදත ය, නො කිලිටි යැ"යි ප්‍රතිඥා කෙරෙමි. (මා) සව්වෝ සිල් අතින් මා නො රක්නාහ. මම ද සව්වන්ගෙන් සිල් අතින් මා රැක ගැන්මක් නො පතමි.

පිරිසිදු ආජීවය ඇත්තෙම් ම "පිරිසිදු ආජීවය ඇත්තෙමි, මාගේ ආජීවය පිරිසිදු ය, පර්යවදත ය, නො කිලිටි යැ" යි ප්‍රතිඥා කරමි. සව්වෝ ආජීවය අතින් මා නො රක්නාහ. මම ද ආජීවය අතින් මා රැකගැන්මක් සව්වන්ගෙන් අපෙක්‍ෂා නො කරමි.

පිරිසිදු දම් දෙසුම් ඇත්තෙම් ම "පිරිසිදු දම් දෙසුම් ඇත්තෙමි, මාගේ දම් දෙසුම පිරිසිදු ය, පර්යවදත ය, නො කිලිටි යැ" යි ප්‍රතිඥා කෙරෙමි. සව්වෝ දම් දෙසුම් අතින් මා නො රක්නාහ. මම ද සව්වන් ගෙන් දම් දෙසුම් අතින් මා රැකගැන්මක් අපෙක්‍ෂා නො කරමි.

පිරිසිදු දහම් විවරණ ඇත්තෙම් ම "පිරිසිදු දහම් විවරණ ඇතියෙමි, මාගේ දහම් විවරණය පිරිසිදු ය, පර්යවදත ය, නො කිලිටි යැ" යි ප්‍රතිඥා කරමි. සව්වෝ දහම් විවරණ අතින් මා නො රක්නාහ. මම ද සව්වන්ගෙන් දහම් විවරණ අතින් මා රැක ගැන්මක් අපෙක්‍ෂා නො කරමි.

පිරිසිදු ඥානදර්ශන ඇතියෙම් ම "පිරිසිදු ඥානදර්ශන ඇත්තෙම් වෙමි, මාගේ ඥානදර්ශනය පිරිසිදු ය, පර්යවදත ය, නො කිලිටි යැ" යි ප්‍රතිඥා කෙරෙමි. සව්වෝ මා ඥානදර්ශනය අතින් නො රක්නාහ. මම ද සව්වන්ගෙන් ඥානදර්ශනය අතින් මා රැකගැන්මක් අපෙක්‍ෂා නො කරමි" යනු යි.

11. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවරෙහි කැමැති තාක් කල් වැස, රජගහ නුවර බලා චාරිකායෙහි නික්මුණු සේක. පිළිවෙළින් සැරි සරා වඩනා සේක්, රජගහ නුවරට වැඩිසේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවරට නොදුරු නොළං තන්හි වූ කලන්‍දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසනසේක.

එ සමයෙහි බොහෝ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියාහ. එළඹ ඔබ වැඳ පසෙක ඉඳගත්හ. එසේ හිඳගත්තා වූ ඒ මහණහු "වහන්ස, අජාසත් කුමර තෙමේ පන්සියක් රියෙන් සැඳී දෙවදත් තෙරුනට සවස ද උදේ ද උවටනට යයි, බත්සැළි පන්සියයක් වූ බත් පිරිනැමීමෙක් ද කැරේ" යැ යි මෙ පවත් සැලකළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:)

"මා භික්ඛවෙ දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකං පිහයිත්ථ, යාවකීවඤ්ච භික්ඛවෙ දෙවදත්තස්ස අජාතසත්තු කුමාරො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගමිස්සති, පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරියිස්සති. හානි යෙව භික්ඛවෙ දෙවදත්තස්ස පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි.

සෙය්‍යථාපි භික්ඛවෙ චණ්ඩස්ස කුක්කුරස්ස නාසාය පිත්තං භින්දෙය්‍යුං. එවං හි සො භික්ඛවෙ කුක්කුරො භිය්‍යොසොමත්තාය චණ්ඩතරො අස්ස. එවමෙව ඛො භික්ඛවෙ යාවකීවඤ්ච දෙවදත්තස්ස අජාතසත්තු කුමාරො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගමිස්සති, පඤ්ච ච ථාලිපාකසතානි භත්තාභිහාරො අභිහරියිස්සති, හානි යෙව භික්ඛවෙ දෙවදත්තස්ස පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි. අත්තවධාය භික්ඛවෙ දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි, පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි. සෙය්‍යථාපි භික්ඛවෙ කදලී අත්තවධාය ඵලං දෙති. පරාභවාය ඵලං දෙති. එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ වෙළු අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි, පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ නළො අත්තවධාය ඵලං දෙති, පරාභවාය ඵලං දෙති, එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි, පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි.

සෙය්‍යථාපි භික්ඛවෙ අස්සතරී අත්තවධාය ගබ්භං ගණ්හාති, පරාභවාය ගබ්භං ගණ්හාති. එවමෙව ඛො භික්ඛවෙ අත්තවධාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදි, පරාභවාය දෙවදත්තස්ස ලාභසක්කාරසිලොකො උදපාදී'ති.

ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා'ති.

## පඨමක භාණවාරං

"මහණෙනි, දෙව්දතුගේ ලාභසත්කාර කීර්තියට ඊර්ෂ්‍යා නො කරවු. මහණෙනි, යම් තාක් අජාසත් කුමර පන්සියක් රියෙ:¹ සැදී දෙව්දතුහට සවස උදේ උවටනට යන්නේ ද, බත් සැළි පන්සියක් වූ බත් එළවීම කරනු ලබන්නේ ද, ඒ තාක් ම දෙව්දතුට කුසල් දහම්හි හානියක් ම මිස වෘද්ධියක් අපෙක්‍ෂා නො කළ හැක්ක.

මහණෙනි, නපුරු බල්ලකුගේ නාසයෙහි මුවපිත (මිරිකා) බින්දු හෙළන්නාහු ද, එසේ කිරීමෙන් ඒ බලු තෙම වඩාත් බොහෝ සෙයින් චණ්ඩ වන්නේ ද, එසේ ම මහණෙනි, යම්තාක් අජාසත් කුමර පන්සියක් රියෙන් යුතු ව දෙව්දතුට උවටනට සවස උදේ යන්නේ ද, බත් සැළ පන්සියක් වූ බත් එළැවීම කරනු ලබන්නේ ද, ඒතාක් ම දෙව්දතුට කුසල් දහම්හි හානියක් ම මිස වෘද්ධියක් අපෙක්‍ෂා නො කළ හැක්ක. මහණෙනි, දෙව්දතුහට තමාගේ විනාශය පිණිස ලාභ සත්කාර කීර්ති පහළ විය. තමා ගේ පිරිහීම පිණිස දෙව්දතුහට ලාභ සත්කාර කීර්ති පහළ විය. මහණෙනි, යම්සේ කෙසෙල් ගස තමාගේ විනාශය පිණිස තමාගේ පිරිහීම පිණිස පලදෙන්නේද එසේම දෙව්දතුට ලාභසත්කාර කීර්ති පහළවිය.

මහණෙනි, යම්සේ හුණගස තමාගේ විනාශය පිණිස පල දෙන්නේ ද, තමාගේ පිරිහීම පිණිස පල දෙන්නේ ද, මහණෙනි, එසේ ම තමාගේ විනාශය පිණිස දෙව්දතුහට ලාභ සත්කාර කීර්ති පහළ විය, තමාගේ පිරිහීම පිණිස ලාභ සත්කාර කීර්ති පහළ විය.

මහණෙනි, යම්සේ බටගස තමාගේ විනාශය පිණිස පල දෙන්නේ ද, තමාගේ පිරිහීම පිණිස පල දෙන්නේ ද, මහණෙනි, එසේ ම දෙව්දතුට තමාගේ විනාශය පිණිස ලාභ සත්කාර කීර්ති පහළ විය, තමාගේ පිරිහීම පිණිස ලාභ සත්කාර කීර්ති පහළ විය.

මහණෙනි, යම්සේ කොටළුදෙන තමාගේ විනාශය පිණිස ගබ් ගන්නී ද, තමාගේ පිරිහීම පිණිස ගබ් ගන්නී ද, මහණෙනි, එසේ ම තමාගේ විනාශය පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්ති පහළ විය, තමා ගේ පිරිහීම පිණිස දෙව්දත්හට ලාභ සත්කාර කීර්ත්ති පහළ විය" යනු ය.

"යම්සේ ඒකාන්තයෙන් ඵලය කෙසෙල්ගස නසා ද, ඵලය හුණගස නසා ද, ඵලය බටගස නසා ද, දරුගබ කොටළු දෙන නසා ද, එසේ ම සත්කාරය ලාමක පුරුෂයා නසයි".

## පළමු බණවර

12. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො නිසින්නො හොති සරාජිකාය. අථ ඛො දෙවදත්තො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච:

'ජිණ්ණො'දානි භන්තෙ භගවා වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. අප්පොස්සුක්කො' දානි භන්තෙ භගවා දිට්ඨධම්ම-සුඛවිහාරං අනුයුත්තො විහරතු මමං භික්ඛුසඞ්ඝං නිස්සජ්ජතු, අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී''ති.

''අලං දෙවදත්ත, මා තෙ රුච්චි භික්ඛුසඞ්ඝං පරිහරිතුන්ති''

දුතියම්පි ඛො දෙවදත්තො -පෙ- තතියම්පි ඛො දෙවදත්තො භගවන්තං එතදවොච: ජිණ්ණො'දානි භන්තෙ භගවා වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. අප්පොස්සුක්කො'දානි භන්තෙ භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරතු, මමං භික්ඛුසඞ්ඝං නිස්සජ්ජතු, අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී''ති.

''සාරිපුත්ත මොග්ගල්ලානානම්පි ඛො අහං දෙවදත්ත භික්ඛුසඞ්ඝං න නිස්සජ්ජෙය්‍යං, කිම්පන තුය්හං ඡවස්ස ඛෙළාසකස්සා''ති.

අථ ඛො දෙවදත්තො ''සරාජිකාය මං භගවා පරිසාය, ඛෙළාසක-වාදෙන අපසාදෙති. සාරිපුත්තමොග්ගල්ලානෙ ව උක්කංසතී''ති කුපිතො අනත්තමනො භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අයං චරහි දෙවදත්තස්ස භගවති පඨමො ආඝාතො අහොසි.

12. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ රජු සහිත මහත් පිරිසක් විසින් පිරිවරන ලදුව දහම් දෙසමින් හුන්සේක. එ කල්හි දෙව්දත් තෙරණුවෝ හුනස්නෙන් නැඟී උතුරු සළු එකස් කොට පෙරෙවැ භාග්‍යවතුන් වහන්සේ දෙසට දෙහොත් නමා වැඳ, මෙසේ කීය.

''වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ ජීර්ණසේක. වෘද්ධ වූ සේක, මහලු වූ සේක, දීර්ඝ කාලයක් ගත කළසේක, පැසිමි වයසට පැමිණිසේක. භාග්‍යවතුන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ මන්දොත්සාහ වන සේක්වා, දෘෂ්ටධර්ම සුඛවිහරණයෙහි (ඵල සමාපත්ති සුවයෙහි) යෙදී වසනසේක්වා. භික්ෂු සඞ්ඝයා මට බාර දෙනසේක්වා. මම භික්ෂුසඞ්ඝයා පරිහරණය කරන්නෙමි (පාලනය කරන්නෙමි)''යි මෙ බස් කීහ.

''දෙව්දතුනි, කම් නැත. භික්ෂු සඞ්ඝයා පරිහරණය කරන්නට ඔබට රිසි නො වේවා''යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

දෙවෙනි වර ද ... තෙවෙනි වර ද දෙව්දත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට, ''වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ ජීර්ණ වූ සේක: වයොවෘද්ධ වූ සේක, මහලු වූ සේක, දීර්ඝ කාලයක් ගත කළසේක, පැසිමි වයසට පැමිණිසේක. භාග්‍යවතුන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ මන්දෝත්සාහ වනසේක්වා, දෘෂ්ටධර්මසුඛ විහරණයෙහි (පල සමවත් සුවෙහි) යෙදී වසනසේක්වා, භික්ෂු සඞ්ඝයා මට බාරදෙනසේක්වා, මම භික්ෂුසඞ්ඝයා පරිහරණය කරන්නෙමි (පාලනය කරන්නෙමි)''යි කීහ.

දෙව්දතුනි, මම සැරියුත් මුගලන් දෙදෙනාට ද භික්ෂුසංඝයා බාර නො දෙන්නෙමි. කිමෙක් ද? ළාමකවූකෙළ බුදින (මිථ්‍යා ජීවිකා යෙන් දිවි පවත්වන) ඔබට භික්ෂුසඞ්ඝයා බාර දෙම් ද? (බාර නො දෙම්) යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

එවිට දෙව්දත් තෙරණුවෝ ''භාග්‍යවතුන් වහන්සේ රජුන් සහිත පිරිසෙහි මට බෙළාසක වාදයෙන් (කෙළ බුදින්නෙකැ යි කීමෙන්) පිරිහෙළා කථා කෙරෙති, සැරියුත් මුගලනුන් උස්තන්හි තබති''යි කිපුණාහු නො සතුටු සිතැත්තාහු, භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියාහ.

මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දෙව්දතුන්ගේ පළමු වෛර බැඳීම විය.

13. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ සඞ්ඝො දෙවදත්තස්ස රාජගහෙ පකාසනීයකම්මං කරොතු: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි. ඉදානි අඤ්ඤා පකති. යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය' න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො. දෙවදත්තො 'ව තෙන දට්ඨබ්බොති.

"එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො දෙවදත්තස්ස රාජගහෙ පකාසනීයකම්මං කරෙය්‍ය: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි. ඉදානි අඤ්ඤා පකති. යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය, න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො. දෙවදත්තො'ව තෙන දට්ඨබ්බොති. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො දෙවදත්තස්ස රාජගහෙ පකාසනීය-කම්මං කරොති: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි. ඉදානි අඤ්ඤා පකති. යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො. දෙවදත්තො'ව තෙන දට්ඨබ්බොති. යස්සායස්මතො ඛමති දෙවදත්තස්ස රාජගහෙ පකාසනී-යස්ස කම්මස්ස කරණං පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි ඉදානි අඤ්ඤා පකති. යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො. දෙවදත්තො ව තෙන දට්ඨබ්බොති, සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන දෙවදත්තස්ස රාජගහෙ පකාසනීයකම්මං 'පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි. ඉදානි අඤ්ඤා පකති. යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය, න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො. දෙවදත්තො ව තෙන දට්ඨබ්බො'ති, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

14. අථ ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි: "තෙන හි ත්වං සාරිපුත්ත දෙවදත්තං රාජගහෙ පකාසෙහී"ති.

"පුබ්බෙ මයා භන්තෙ දෙවදත්තස්ස රාජගහෙ වණ්ණො භාසිතො මහිද්ධිකො ගොධිපුත්තො මහානුභාවො ගොධිපුත්තො"ති. කථාහං දෙවදත්තං රාජගහෙ පකාසෙමී?ති.

13. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා ''මහණෙනි, එසේ නම් සඞ්ඝ තෙමේ 'පෙර දෙව්දත් තෙරුන්ගේ අන් පියෙවියෙක් විය, දුන් අන් පියෙවියෙකි. යමක් දෙව්දත් තෙරණුවෝ කයින් හෝ වචනයෙන් හෝ කරන්නාහු නම්, එයින් බුදුහු හෝ දහම හෝ සංඝයා හෝ නො දත යුතු යැ (එයට බුදුහු හෝ දහම හෝ සංඝයා හෝ වග නො කියති) යි දෙව්දත්හු ම එයින් දතයුත්තාහ'යි රජගහ නුවර ප්‍රකාශනික කර්මය කෙරේ වා''යි වදාළසේක.

තව ද ''මහණෙනි, එය මෙසේ කළයුතු ය. ව්‍යක්ත ප්‍රබල මහණක්හු විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියයුතු ය:

''සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය, දැන් පියෙවිය අනෙකෙකි. දෙව්දත්හු කයින් වචසින් යමක් කරන්නාහු ද, එයින් බුදුහු හෝ ධර්මය හෝ සඞ්ඝයා හෝ නො දත යුතුවහ. දෙව්දත්හු ම එයින් දතයුතුහ'යි සඞ්ඝ තෙමේ දෙව්දතුන් පිළිබඳ ව රජගහනුවරෙහි ප්‍රකාශනක කර්මය කෙරෙයි.

පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය. දැන් පියෙවිය අනෙකෙකි. දෙව්දත්හු කයින් වචසින් යමක් කරන්නාහු ද, එයින් බුදුහු හෝ දහම හෝ සඞ්ඝයා හෝ නො දත යුතුහ. දෙව්දත්හු ම එයින් දතයුතුහ'යි දෙව්දතුන් පිළිබඳ වැ රජගහ නුවර ප්‍රකාශනක කර්මය කිරීම යම් ආයුෂ්මතක්හට රිසියෙන්නේ නම්, හේ නිහඬ වේ වා. යමකුට නො රිසියෙන්නේ නම් හේ කියාවා.

'පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය. දැන් පියෙවිය අනෙකෙකි. දෙව්දත්හු කයින් වචසින් යමක් කරන්නාහු ද එයින් බුදුහු හෝ දහම හෝ සඞ්ඝයා හෝ නො දතයුතුවහ. දෙව්දත්හු ම එයින් දත යුතුහ'යි රජගහනුවර දෙව්දතුන් පිළිබඳ ප්‍රකාශනක කර්මය කරන ලද්දේ ය. එය සඞ්ඝයාට රිසි ය. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි (නුවණින් සලකමි)'' යනු ය.

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැරියුත් තෙරණුවන් අමතා, 'එසේ වී නම් ශාරිපුත්‍රයෙනි, තෙපි රජගහනුවර දෙව්දතුන් පිළිබඳ ප්‍රකාශනක කර්මය කරවු' යැ යි වදාළසේක.

''වහන්ස, පෙර මා විසින් ගොධිපුත්‍ර දෙව්දත් තෙරණුවෝ මහත් සෘද්ධි ඇත්තෝ ය, ගොධිපුත්‍ර (දෙව්දත් තෙරණුවෝ) මහානුභාව ඇත්තෝ ය'යි රජගහනුවරෙහි දී දෙව්දත් තෙරුන්ගේ ගුණ කියන ලද්දේය. දැන් කෙසේ නම් දෙව්දත් තෙරුන් පිළිබඳ ප්‍රකාශනක කර්මය කරන්නෙම් ද?''යි සැරියුත් තෙරණුවෝ කීහ.

''නනු තයා සාරිපුත්ත, භූතොයෙව දෙවදත්තස්ස රාජගහෙ වණ්ණො භාසිතො මහිද්ධිකො ගොධිපුත්තො මහානුභාවො ගොධිපුත්තො''ති.

''එවං භන්තෙ''

''එවමෙව ඛො ත්වං සාරිපුත්ත භූතඤ්ඤෙව දෙවදත්තං රාජගහෙ පකාසෙහී''ති.

''එවං භන්තෙ''ති ඛො ආයස්මා සාරිපුත්තො භගවතො පච්චස්සොසි.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ සඞ්ඝො සාරිපුත්තං සම්මන්නතු දෙවදත්තං රාජගහෙ පකාසෙතුං: 'පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි. ඉදානි අඤ්ඤා පකති. යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො දෙවදත්තො ච තෙන දට්ඨබ්බො'ති එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං සාරිපුත්තො යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ආයස්මන්තං සාරිපුත්තං සම්මන්නෙය්‍ය දෙවදත්තං රාජගහෙ පකාසෙතුං: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති -පෙ- තෙන දට්ඨබ්බොති. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: සඞ්ඝො ආයස්මන්තං සාරිපුත්තං සම්මන්නති දෙවදත්තං රාජගහෙ පකාසෙතුං: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති -පෙ- තෙන දට්ඨබ්බොති. යස්සායස්මතො ඛමති ආයස්මතො සාරිපුත්තස්ස සම්මති දෙවදත්තං රාජගහෙ පකාසෙතුං: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති -පෙ- තෙන දට්ඨබ්බො'ති සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ආයස්මා සාරිපුත්තො දෙවදත්තං රාජගහෙ පකාසෙතුං: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි -පෙ- දෙවදත්තො ච තෙන දට්ඨබ්බො'ති. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී එවමෙතං ධාරයාමී''ති.

ශාරිපුත්‍රයෙනි, ගොධිපුත්‍රයෝ 'මහර්ධිමත්හ, ගොධිපුත්‍රයෝ මහානුභාව ඇත්තෝ යැ'යි තොප විසින් රජගහ නුවරෙහි දෙව්දතුන් ගේ ඇත්තාවූ ම ගුණය එද කියන ලද්දේ නො වේ දැ?''යි භාග්‍ය වතුන් වහන්සේ වදළසේක.

''එසේ ය, වහන්සැ''යි සැරියුත් තෙරණුවෝ වදළහ.

''ශාරිපුත්‍රයෙනි, එසේ ම දෙව්දතුන් පිළිබඳ දැන් ඇත්තාවූ ම තත්ත්වය රජගහ නුවරෙහි පවසවු''යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

''එසේ ය වහන්සැ''යි සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය පිළිගත්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන් අමතා මෙසේ වදළසේක: ''මහණෙනි, එසේ වී නම් පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය, දැන් පියෙවිය අනෙකෙකි. දෙව්දත්හු කයින් හෝ වචසින් හෝ යමක් කරන්නාහු නම්, එයින් බුදුහු හෝ දහම හෝ සඞ්ඝයා හෝ නො දතයුතුහ. දෙව්දත්හු ම එයින් දතයුතුහ'යි රජගහනුවරෙහි දෙව්දතුන් පිළිබඳ ප්‍රකාශනය කරන්නට සඞ්ඝ තෙමේ ශාරිපුත්‍ර තෙරුන් සම්මත කෙරේවා. මහණෙනි ඒ සම්මතිය ද මෙසේ කළ යුතු ය: පළමු කොට සැරි යුත්හු යැදිය යුත්තාහ. යැද, ව්‍යක්ත ප්‍රබල මහණක්හු විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්වියයුතු.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. පෙර දෙව්දතුන් පියෙවිය අනෙකෙක් විය... දතයුතුහ''යි දෙව්දතුන් පිළිබඳ ව රජගහ නුවරෙහි ප්‍රකාශනය කරන්නට සඞ්ඝ තෙමේ සැරියුත් තෙරුන් සම්මත කෙරේවා. මේ ඥප්තිය ය (දැන්වීමය).

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය ... එයින් දත යුතුහ'යි දෙව්දතුන් පිළිබඳ ව රජගහ නුවරෙහි ප්‍රකාශ කරන්නට සැරියුත් තෙරුන් සම්මත කෙරෙයි. පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය ... දෙව්දත්හු ම දතයුතු යැ යි රජගහනුවර ප්‍රකාශනය කරන්නට සැරියුත් තෙරුන් සම්මත කිරීම යම් ආයුෂ් මතක්හට රිසියෙන්නේ ද හේ නිහඬ වේවා. යමකුට නො රිසියෙන්නේ ද හේ කියාවා.

'පෙර දෙව්දතුන්ගේ පියෙවිය අනෙකෙක් විය... එයින් දෙව්දත් ම දතයුතුහ'යි දෙව්දතුන් පිළිබඳව රජගහ නුවර ප්‍රකාශනක කර්මය කරන්නට සැරියුත් තෙරණුවෝ සම්මතය හ. එය සඞ්ඝයාට රිසියෙයි. එ හෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි'' යනු යි.

සම්මතො ච ඛො ආයස්මා සාරිපුත්තො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං රාජගහං පවිසිත්වා දෙවදත්තං රාජගහෙ පකාසෙසි: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති -පෙ- තෙන දට්ඨබ්බො'ති. තත්‍ර යෙ තෙ මනුස්සා අස්සද්ධා අප්පසන්නා දුබ්බුද්ධිනො තෙ එවමාහංසු: උසූයකා ඉමෙ සමණා සක්‍යපුත්තියා දෙවදත්තස්ස ලාභසක්කාරං උසූයන්තීති. යෙ පන තෙ මනුස්සා සද්ධා පසන්නා පණ්ඩිතා බුද්ධිමන්තො තෙ එවමාහංසු: න ඛො ඉදං ඔරකං භවිස්සති–යථා භගවා දෙවදත්තං රාජගහෙ පකාසාපෙතීති.

15. අථ ඛො දෙවදත්තො යෙන අජාතසත්තු කුමාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අජාතසත්තුං කුමාරං එතදවොච "පුබ්බෙ ඛො කුමාර මනුස්සා දීඝායුකා' එතරහි අප්පායුකා. ඨානං ඛො පනෙතං විජ්ජති යං ත්වං කුමාරො'ව සමානො කාලං කරෙය්‍යාසි. තෙන හි ත්වං කුමාර, පිතරං හන්ත්වා රාජා හොහි. අහං භගවන්තං හන්ත්වා බුද්ධො භවිස්සාමීති.

අථ ඛො අජාතසත්තු කුමාරො අය්‍යො ඛො දෙවදත්තො මහිද්ධිකො මහානුභාවො. ජානෙය්‍යාපි අය්‍යො දෙවදත්තොති ඌරුයා පොත්ථනිකං[1] බන්ධිත්වා දිවාදිවස්ස භීතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රස්තො සහසා අන්තෙපුරං පාවිසි. අද්දසාසුං ඛො අන්තෙපුරෙ උපචාරකා මහාමත්තා අජාතසත්තුං කුමාරං දිවා දිවස්ස භීතං උබ්බිග්ගං උස්සඞ්කිං උත්‍රස්තං සහසා අන්තෙපුරං පවිසන්තං. දිස්වාන අග්ගහෙසුං, තෙ විචිනන්තා ඌරුයා පොත්ථනිකං බද්ධං දිස්වාන අජාතසත්තුං කුමාරං එතදවොචුං: 'කිං ත්වං කුමාර කත්තුකාමො'සී?ති.

"පිතරම්හි හන්තුකාමො"ති.

"කෙනාසි උස්සාහිතො?"ති.

"අය්‍යෙන දෙවදත්තෙනා"ති.

එකච්චෙ මහාමත්තා එවං මතිං අකංසු: "කුමාරො ච හන්තබ්බො දෙවදත්තො ච සබ්බෙ ච භික්ඛූ හන්තබ්බා"ති.

---

1. පොත්ථනියං - සීමු

මෙසේ සඞ්ඝයා විසින් සම්මත වූ සැරියුත් තෙරණුවෝ බොහෝ භික්ෂූන් හා රජගහනුවරට වැඩ 'පෙර දෙව්දත් තෙරුන්ගේ පියෙවිය අනෙකෙක් විය. දැන් පියෙවිය අනෙකෙක ... එයින් දෙව්දත් තෙරණුවෝ ම දතයුත්තාහ'යි රජගහනුවර දෙව්දත් තෙරුන් පිළිබඳ ප්‍රකාශනය කළහ. එහි යම් මනුෂ්‍ය කෙනෙක් ශ්‍රද්ධාව නැත්තෝ ද සස්නෙහි අප්‍රසන්න ද, නුවණ නැත්තෝ ද, ඔහු මේ ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ ඊෂ්‍යා කරන්නෝ ය දෙව්දතුන්ගේ ලාභ සත්කාර නො ඉවසන්නාහ'යි කීහ. යම් මනුෂ්‍ය කෙනෙක් සැදැහැ ඇත්තෝ ද, සස්නෙහි පහන් වූවෝ ද, පණ්ඩිත ද බුද්ධිමත් ද, ඔහු යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් තෙරුන් පිළිබඳ ව රජගහ නුවරෙහි ප්‍රකාශනය කරවන සේක් ද, එහෙයින් මෙය (දෙව්දතුන් කළ දැය) අල්ප ස්වල්ප වරදක් නො වියයුතු යැ'යි මෙසේ කීහ.

15. එ කලැ දෙව්දත්හු අජාසත් කුමරු වෙත එළැඹියහ. එළඹැ ඔහු අමතා, "කුමරුවනි, පෙර වූ කලි මිනිස්සු දීර්ඝායුෂ්ක වූහ. දැන් අල්පායුෂ්කයහ. තෙපි කුමාර ව හිඳ ම (රජ බවට පත් නොවී) කලුරිය කරන්නහුය යන මේ කාරණය ඇත (විය හැක්කෙකි). එ බැවින් කුමරුවනි, තෙපි පියා මරා රජ වවු. මම භාග්‍යවතුන් නසා බුදු වන්නෙමි"යි කීහ.

එවිට අජාසත් කුමර දෙව්දත් හිමියෝ වනාහි මහත් ඍද්ධි ඇත්තෝ ය මහානුභාව ඇත්තෝ ය. දෙව්දත් හිමියෝ කළයුත්ත දන්නෝත් වෙති යි සිතා කළවායෙහි සිරියක් බැඳගෙන මද්දහනෙහි බිය ඇත්තේ උද්වෙග ඇත්තේ, සැක ඇත්තේ වහා ඇතොවුරට පිවිසියේ ය. ඇතොවුරෙහි සෙවායෙහි යෙදුණු මහඇමැත්තෝ මද්දහනෙහි බිය පත් ව උද්වෙග ඇති ව සැක ඇති ව තැතිගැනුම් ඇති ව වහා ඇතොවුරට වදනා අජාසත් කුමරු දුටුවාහ. දැක ඔහු අල්ලාගත්හ. ඔහු පිරික්සන්නාහු කළවෙහි බැඳි සිරිය දැක, "කුමාරයෙනි, ඔබ කුමක් කරනු කැමැත්තහු දැ?යි විචාළාහ.

"පියාණන් නසනු කැමැත්තෙම් වෙමි"යි කුමර කී ය.

"කවරකු විසින් මෙහෙයන ලද්දහු ද? (කාගේ කීමකට දැ?)"යි ඔහු ඇසූහ.

"දෙව්දත් හිමියන් විසිනැ"යි කුමර කී ය.

සමහර මහඇමතියෝ "කුමරු ද නැසියයුතු ය, දෙව්දත් ද නැසියයුතු ය, සියලු මහණහු ද නැසියැයුතුහ"යි මතිය පහළ කළහ.

එකච්චෙ මහාමත්තා එවං මතිං අකංසු: "න භික්ඛූ හන්තබ්බා, න භික්ඛූ කිඤ්චි අපරජ්ඣන්ති. කුමාරො ච හන්තබ්බො දෙවදත්තො චා"ති.

එකච්චෙ මහාමත්තා එවං මතිං අකංසු: "න කුමාරො ච හන්තබ්බො න දෙවදත්තො, න භික්ඛූ හන්තබ්බා. රඤ්ඤො අරොචෙතබ්බං. යථා රාජා වක්ඛති තථා කරිස්සාමා"ති.

අථ ඛො තෙ මහාමත්තා අජාතසත්තුං කුමාරං ආදාය යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතමත්ථං ආරොචෙසුං.

"කථං භණෙ මහාමත්තෙහි මති කතා?"ති

"එකච්චෙ දෙව මහාමත්තා එවං මතිං අකංසු; කුමාරො ච හන්තබ්බො දෙවදත්තො ච සබ්බෙ ච භික්ඛූ හන්තබ්බාති. එකච්චෙ මහාමත්තා එවං මතිං අකංසු: න භික්ඛූ හන්තබ්බා න භික්ඛූ කිඤ්චි අපරජ්ඣන්ති. කුමාරො ච හන්තබ්බො දෙවදත්තො චාති. එකච්චෙ මහාමච්චා එවං මතිං අකංසු: න කුමාරො හන්තබ්බො න දෙවදත්තො න භික්ඛූ හන්තබ්බා. රඤ්ඤො ආරොචෙතබ්බං යථා රාජා වක්ඛති තථා කරිස්සාමා"ති.

"කිං භණෙ කරිස්සති බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා? නනු භගවතා පටිගච්චෙව දෙවදත්තො රාජගහෙ පකාසාපිතො: පුබ්බෙ දෙවදත්තස්ස අඤ්ඤා පකති අහොසි, ඉදානි අඤ්ඤා පකති, යං දෙවදත්තො කරෙය්‍ය කායෙන වාචාය න තෙන බුද්ධො වා ධම්මො වා සඞ්ඝො වා දට්ඨබ්බො, දෙවදත්තොව තෙන දට්ඨබ්බො"ති. තත්‍ර යෙ තෙ මහාමත්තා එවං මතිං අකංසු: "කුමාරො ච හන්තබ්බො දෙවදත්තො ච සබ්බෙ ච භික්ඛූ හන්තබ්බා"ති තෙ අභබ්බෙ අකාසි. යෙ තෙ මහාමත්තා එවං මතිං අකංසු: 'න භික්ඛූ හන්තබ්බා න භික්ඛූ කිඤ්චි අපරජ්ඣන්ති. කුමාරො ච හන්තබ්බො දෙවදත්තො චා'ති, තෙ නීචෙ ඨානෙ ඨපෙසි. යෙ තෙ මහාමත්තා එවං මතිං අකංසු: 'න කුමාරො ච හන්තබ්බො න දෙවදත්තො න භික්ඛූ හන්තබ්බා. රඤ්ඤො ආරොචෙතබ්බං, යථා රාජා වක්ඛති තථා කරිස්සාමා"ති තෙ උච්චෙ ඨානෙ ඨපෙසි.

අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො අජාතසත්තුං කුමාරං එතදවොච: "කිස්ස මං ත්වං කුමාර හන්තුකාමො'සී" ති "රජ්ජෙනම්හි දෙව අත්ථිකො"ති.

"සචෙ ඛො ත්වං කුමාර රජ්ජෙන අත්ථිකො එතං තෙ රජ්ජන්ති". අජාතසත්තුස්ස කුමාරස්ස රජ්ජං නිය්‍යාදෙසි.

සමහර මහ ඇමැත්තෝ "භික්ෂූහු නො නැසියයුත්තාහ, භික්ෂූහු කිසි වරදක් නො කළහ. කුමරුත් දෙව්දතුත් නැසියයුතු හ'යි මෙසේ අදහස් කළාහ.

සමහර මහඇමැත්තෝ "කුමරුත් නො නැසියයුතු, දෙව්දතුත් නො නැසියයුතු, භික්ෂූහුත් නො නැසියයුතු, රජුට දන්වියයුතු, රජු කියන සැටියක් කරන්නමු"යි කීහ.

ඉක්බිති ඒ මහඇමැත්තෝ අජාසත් කුමරු රැගෙන මගධෙශ්වර බිම්බිසාර රජු කරා එළැඹියහ. එළැඹ රජුට මෙ පවත් සැල කළාහ.

"සගයෙනි, මහඇමැතියන් විසින් කෙසේ මතියක් කරන ලද ද (කුමක් අදහස් කරන ලද ද)"යි රජ පුළුවුත.

"දෙවයිනි, සමහර මහඇමැත්තෝ කුමරු ද දෙව්දත් ද භික්ෂූහු ද නැසිය යුතුහ'යි අදහස් කළහ. සමහර මහඇමැත්තෝ 'භික්ෂූහු නො නැසිය යුතුහ, භික්ෂූන් කළ වරදෙක් නැත, කුමරුත් දෙව්දතුත් නැසිය යුතුහ'යි අදහස් කළහ. සමහර මහඇමැත්තෝ කුමරුත් නො නැසියයුතු, දෙව්දතුත් නො නැසියයුතු, භික්ෂූහුත් නො නැසියයුතු. රජුහට දන්වියයුතු, රජුහු කියන සැටියක් කළයුතු යැ'යි අදහස් කළහ"යි ඔහු කීහ.

"සගයෙනි, බුදුරජු හෝ ධර්මය හෝ සඞ්ඝයා කුමක් කරන්නේ ද? "පෙර දෙව්දත්හුගේ පියෙවිය අනෙකෙක් විය, දැන් අනෙකෙක. "දෙව්දතුන් කයින් වචසින් කරන කියන දෙයෙකින් බුදුහු හෝ දහම හෝ සඞ්ඝයා හෝ නො දක්කයුතුහ'යි දෙව්දත් ම එයින් දක්ක යුතු යැ" කලින් ම දෙව්දත් තෙම රජගහ නුවරෙහි පවස්වන ලදුයේ නො වේ ද (දෙව්දතු පිළිබඳ ප්‍රකාශනය කරවන ලද්දේ නො වේ ද?"යි රජ කී ය. (මෙසේ කියා) 'එහි යම් මහඇමති කෙනෙක් කුමරුත් දෙව්දතුත් භික්ෂූහුත් නැසියයුතු යැ' යි අදහස් කළෝ ද ඔවුන් අභව්‍යයන් කෙළේ ය (ඔවුන් දරූ ඇමැති ධුර යෙන් පහ කෙළේ ය. 'භික්ෂූහු නො නැසියයුතුහ. භික්ෂූහු කිසි වරදක් නො කෙරෙත්. කුමරු ද දෙව්දත් ද නැසියැයුතු ය'යි මෙසේ යම් මහඇමැති කෙනෙක් අදහස් කළෝ ද, ඔවුන් පහත් තන්හි තැබී ය. (තනතුරෙන් පහත හෙළී ය). කුමරු නො නැසියයුතු, දෙව්දත් ද නො නැසියයුතු, භික්ෂූහු ද නො නැසිය යුතුහ, රජුට දන්වියැයුතු, රජු කියන සැටියක් කරන්නමු"යි යම් මහඇමති කෙනෙක් කීහු ද ඔවුන් උස් තන්හි තැබී ය.

ඉක්බිති මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ අජාසත් කුමරු බණවා, 'කුමරුනි, තෝ කුමට මා නසනු කැමැති වීහි ද?"යි ඇසී ය. "දෙවයිනි, රජකමින් ප්‍රයොජන ඇත්තෙමි (මම රජ වනු කැමැත්තෙමි)"යි කුමර කී ය.

"කුමරුනි, තෝ රජකම් කැමැත්තෙහි නම්, මෙ රජකම තට ය (ගනුව) යි කියා අජාසත් කුමරුට රජය පැවැරී ය.

16. අථ ඛො දෙවදත්තො යෙන අජාතසත්තු කුමාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අජාතසත්තුං කුමාරං එතදවොච: පුරිසෙ මහාරාජ ආණාපෙහි: යෙ සමණං ගොතමං ජීවිතා වොරොපෙස්සන්තී''ති. අථ ඛො අජාතසත්තු කුමාරො මනුස්සෙ ආණාපෙසි: ''යථා භණෙ අය්යො දෙවදත්තො ආහ, තථා කරොථා''ති.

අථ ඛො දෙවදත්තො එකං පුරිසං ආණාපෙසි: ''ගච්ඡාවුසො අමුකස්මිං ඔකාසෙ සමණො ගොතමො විහරති. තං ජීවිතා වොරොපෙත්වා ඉමිනා මග්ගෙන ආගච්ඡා''ති. තස්මිං මග්ගෙ ද්වෙ පුරිසෙ ඨපෙසි: ''යො ඉමිනා මග්ගෙන එකො පුරිසො ආගච්ඡති, තං ජීවිතා වොරොපෙත්වා ඉමිනා මග්ගෙන ආගච්ඡථා''ති, තස්මිං මග්ගෙ චත්තාරො පුරිසෙ ඨපෙසි: ''යෙ ඉමිනා මග්ගෙන ද්වෙ පුරිසා ආගච්ඡන්ති, තෙ ජීවිතා වොරොපෙත්වා ඉමිනා මග්ගෙන ආගච්ඡථා''ති. තස්මිං මග්ගෙ අට්ඨ පුරිසෙ ඨපෙසි: ''යෙ ඉමිනා මග්ගෙන චත්තාරො පුරිසා ආගච්ඡන්ති, තෙ ජීවිතා වොරොපෙත්වා ඉමිනා මග්ගෙන ආගච්ඡථා''ති. තස්මිං මග්ගෙ සොළස පුරිසෙ ඨපෙසි: ''යෙ ඉමිනා මග්ගෙන අට්ඨ පුරිසා ආගච්ඡන්ති, තෙ ජීවිතා වොරොපෙත්වා ආගච්ඡථා''ති.

අථ ඛො සො එකො පුරිසො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො අවිදූරෙ තතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රස්තො පත්ථද්ධෙන කායෙන අට්ඨාසි. අද්දසා ඛො භගවා තං පුරිසං හීතං උබ්බිග්ගං උස්සඞ්කිං උත්‍රස්තං පත්ථද්ධෙන කායෙන ඨිතං. දිස්වාන තං පුරිසං එතදවොච: එහි ආවුසො මා භායීති.

අථ ඛො සො පුරිසො අසිචම්මං එකමන්තං කරිත්වා ධනුකලාපං නික්ඛිපිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: ''අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, ය්වාහං දුට්ඨචිත්තො වධකචිත්තො ඉධූපසඞ්කන්තො. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායා''ති.

''තග්ඝ ත්වං ආවුසො අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යං ත්වං දුට්ඨචිත්තො වධකචිත්තො ඉධූපසඞ්කන්තො. යතො ච ඛො ත්වං ආවුසො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තං තෙ මයං පතිගණ්හාම. වුද්ධි හෙසා ආවුසො අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතී''ති.

---

1. කරෙය්‍යාථාති - මජ්සං.
2. පටිග්ගණ්හාතු - මජ්සං.
3. අනුලුබ්බිකරං - මජ්සං.

16. එ කල්හි දෙව්දත් තෙර අජාසත් කුමරු කරා එළැඹියේ ය. එළැඹ, අජාසත් කුමරු බණවා ''ශ්‍රමණ ගෞතමයාගේ දිවි තොර කරනුවට පුරුෂයනට අණ කරන්නැ''යි කී ය. එවිට අජාසත් කුමර ''සගයෙනි, දෙව්දත් හිමිඳුන් කියන සැටියක් කරවු යැ''යි මිනිසුනට අණ කෙළේ ය.

එක්බිති දෙව්දත් එක් මිනිසකු බණවා ''ඇවැත්නි, යවු අසෝ තැන මහණ ගොයුම් වෙසෙයි. ඔහු දිවි තොර කොට මෙ නම් මගින් එවු'' යැ යි ඇණැවී ය. එ මඟෙහි ''මෙ මඟින් හුදෙකලා වැ එන මිනිසා දිවියෙන් තොර කොට මෙ නම් මඟින් එවු''යැ යි මිනිසුන් දෙදෙනකුන් තැබී ය. එ මඟෙහි ද ''මෙ මඟින් එන මිනිසුන් දෙදෙනා මරා මෙ නම් මඟින් එවු''යැ යි මිනිසුන් සතර දෙනකුන් සිටුවී ය. ඔවුන් එන මඟෙහි ද ''මෙ මඟින් එන පුරුෂයන් සතර දෙනා මරවු''යැ යි පුරුෂයන් අට දෙනකුන් සිටුවී ය. ඔවුන් එන මඟෙහි ද මෙ ''මඟින් එන පුරුෂයන් අට දෙනා මරා මෙ නම් මඟින් එවු යැ''යි මිනිසුන් සොළොස් දෙනකුන් සිටුවී ය.

එක්බිති ඒ හුදෙකලා පුරුෂ තෙම කඩු පලිස් දරා දුනුහියවුරු බැඳගෙන, භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේට නො දුරු තන්හි බිය පත් වූයේ, සිතින් කැලැඹුණේ, සැක ඇත්තේ, තැති ගත්තේ, දැඩි වූ (ගල්ගැසුණු) කයින් යුතු ව සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ බියපත් කැලැ-ඹුණු සැක ඇති, තැතිගත් දැඩිවගිය කයින් යුත් ඒ මිනිසා දුටුසේක. දැක ඔහු බණවා, ''ඇවැත්නි, මෙහි එවු, බිය නො ගනිවු''යි වදාළසේක.

එ විට ඒ පුරුෂ තෙම කඩුපලිස් එක් පසෙක තබා දුනුහියවුර ද බහා තබා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ ඔබ පාමුලැ හිස නමා වැදහෙවැ ''යම් බඳුවූ මම් අඥාන බැවින් මුළා වූ බැවින්, අකුශල බැවින් දුෂ්ට සිතැත්තෙම් වධ කරන සිතැත්තෙම් මෙහි පැමිණියෙම් ද ඒ මා වරද යට කොට ගත්තේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ මතු සංවරය පිණිස ඒ මාගේ වරද වරදවශයෙන් පිළිගන්නාසේක්වා''යි මෙ බස් පැවැසී ය.

''ඇවැත්නි, යම් බඳු වූ තෙපි අඥාන බැවින්, මුළා වූ බැවින්, අකුශල බැවින්, දුෂ්ට සිතැත්තෝ වධක චිත්තය ඇත්තෝ මෙහි පැමිණියෝ ද, වරද ඒ තොප යට කොටගෙන ගියේ ය. ඇවැත්නි, වරද වරද සේ දැක ධර්මය වූ පරිදි පිළියම් කරවු ද තොපගේ ඒ ආරොචනාව අපි පිළිගනිමු. ඇවැත්නි, යමෙක් වරද වරද සේ දැක දහම් වූ පරිදි පිළියම් කරන්නේ ද මතු සංවරයට පැමි-ණෙන්නේ ද මෙය ආර්‍ය්‍ය විනයයෙහි වැඩිදියුණුවෙකැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

අථ ඛො භගවා තස්ස පුරිසස්ස ආනුපුබ්බිකථං කථෙසි සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යද භගවා අඤ්ඤාසි තං පුරිසං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං- අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි, දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය එවමෙව තස්ස පුරිසස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

අථ ඛො සො පුරිසො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මං ච භික්ඛුසඞ්ඝං ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති. අථ ඛො භගවා තං පුරිසං එතදවොච: මා ඛො ත්වං ආවුසො ඉමිනා මග්ගෙන ගච්ඡ. ඉමිනා මග්ගෙන ගච්ඡාහීති අඤ්ඤෙන මග්ගෙන උය්‍යොජෙසි.

17. අථ ඛො තෙ ද්වෙ පුරිසා කින්නු ඛො සො එකො පුරිසො චිරෙන ආගච්ඡතීති පටිපථං ගච්ඡන්තා අද්දසංසු භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං, දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි -පෙ- අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙ''ති.

අථ ඛො භගවා තෙ පුරිසෙ එතදවොච: ''මා ඛො තුම්හෙ ආවුසො ඉමිනා මග්ගෙන ගච්ඡිත්ථ. ඉමිනා මග්ගෙන ගච්ඡථා''ති අඤ්ඤෙන මග්ගෙන උය්‍යොජෙසි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ පුරුෂයාට දානකථා ශීල කථා ස්වර්ගකථා කාමාදීනව කාමයන්ගේ ලාමක බව කාමයන් ගේ කිලිටි බව කාමයන්ගෙන් හික්මීමෙහි අනුසස් යන පිළිවෙළ කථාව වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ පුරුෂයා නීරොග සිතැති, මොළොක් සිතැති, නීවරණයන්ගෙන් පහ වූ සිතැති, ඔද වැඩිගිය සිතැති පහන් සිතැති එකක්හු කොට දත් කෙණෙහි බුදුවරුන්ගේ සාමුත්කර්ෂිකි දෙශනාව වූ දුඃඛ සමුදය නිරොධ මාර්ග යන චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක පහ වූ කිලිටි බව ඇති පිරිසිදු වස්ත්‍රයක් මොනොවට රඳන් පිළිගන්නා සේ ම ඒ පුරුෂයාට ඒ අස්නෙහි දී ම උපදනා සුලු සියල්ල නැසෙන සුලු ය'යි පහවූ කෙලෙස් රජස් ඇති පහවූ කෙලෙස් මල ඇති, දහම් ඇස (සෝවන් මඟ නුවණ) පහළ විය.

ඉක්බිති දුටු නිවන් දහම් ඇති, පැමිණි සොවත් පල දහම් ඇති, ප්‍රකට වූ සොවත් පල දහම් ඇති, හැම ලෙසින් බැසගත් සොවත් පල දහම් ඇති, තිණු සැක ඇති, පහවූ කථංකථා (සැක) ඇති, විශාරද බවට පැමිණි, ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූ ඒ පුරුෂ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙ බස් පැවැසී ය: ''වහන්ස, අභිකාන්ත ය, වහන්ස, අභිකාන්ත ය වහන්ස, යැටිහුරු කොට තබන ලද්දක් උඩුහුරු කරන්නා සේ ම, වැසුණු දෑයක් විවෘත කරන්නා සේ ම, මංමුළාවූවකුට මඟ කියන්නා සේ ම ඇස් ඇතියන් රූප දකිති යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නා සේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් මට ධර්මය පැවැසිණ. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්ම ය ද භික්ෂුසංඝයා ද සරණ කොට යෙමි. භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් කොට දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට සලකාවදරන සේක්වා'' යනු ය.

17. එකල්හි මඟ රැක සිටි පුරුෂයෝ දෙදෙන 'කවර හෙයින් ඒ හුදෙකලා මිනිසා එන්නට කල් යවා දැ යි මඟ ඉදිරියට යන්නාහු එක්තරා රුක්මුලෙක වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුහ. දැක උන්වහන්සේ වෙත එළැඹියාහ. එළැඹ වැඳ පසෙක හිඳගත්හ, ඔවුනට භාග්‍යවතුන් වහන්සේ... පිළිවෙළ කථාව වදාළ සේක... ඔහු... ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය නැති වැ (සෝවන් වැ) භාග්‍යවතුන් වහන්සේ ට ... වහන්ස, දේශනාව අභි-කාන්ත ය, වහන්ස, දේශනාව අභිකාන්ත ය... භාග්‍යවතුන් වහන්සේ අප අද සිට දිවිහිම් කොට සරණ ගිය උවසුවන් කොට සලකා වදරනසේක්වා'' යි කීහ.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ පුරුෂයන් බණවා ''ඇවැත්නි, තෙපි මේ මඟින් නො යවු. මෙ නම් මඟින් යවු''යි වදාළ සේක. (මෙසේ වදරා) අන් මඟෙකින් ඔවුන් යැවූසේක.

අථ ඛො තෙ චත්තාරො පුරිසා කින්නු ඛො තෙ ද්වෙ පුරිසා චිරෙන ආගච්ඡන්තීති පටිපථං ගච්ඡන්තා අද්දසංසු භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි -පෙ- අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතෙ"ති. අථ ඛො භගවා තෙ පුරිසෙ එතදවොච "මා ඛො තුම්හෙ ආවුසො ඉමිනා මග්ගෙන ගච්ඡිත්ථ. ඉමිනා මග්ගෙන ගච්ඡථා"ති අඤ්ඤෙන මග්ගෙන උය්යොජෙසි.

අථ ඛො තෙ අට්ඨපුරිසා කින්නු ඛො තෙ චත්තාරො පුරිසා චිරෙන ආගච්ඡන්තීති පටිපථං ගච්ඡන්තා අද්දසංසු භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි -පෙ- අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතෙ"ති. අථ ඛො භගවා තෙ පුරිසෙ එතදවොච: "මා ඛො තුම්හෙ ආවුසො ඉමිනා මග්ගෙන ගච්ඡිත්ථ. ඉමිනා මග්ගෙන ගච්ඡථාති අඤ්ඤෙන මග්ගෙන උය්යොජෙසි.

අථ ඛො තෙ සොළස පුරිසා "කින්නු ඛො තෙ අට්ඨ පුරිසා චිරෙන ආගච්ඡන්තී"ති පටිපථං ගච්ඡන්තා අද්දසංසු භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං. දිස්වාන යෙන භගවා තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි -පෙ- අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතෙ"ති.

අථ ඛො භගවා තෙ පුරිසෙ එතදවොච: "මා ඛො තුම්හෙ ආවුසො ඉමිනා මග්ගෙන ගච්ඡිත්ථ. ඉමිනා මග්ගෙන ගච්ඡථා"ති අඤ්ඤෙන මග්ගෙන උය්යොජෙසි.

අථ ඛො සො එකො පුරිසො යෙන දෙවදත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා දෙවදත්තං එතදවොච: "නාහම්භන්තෙ සක්කොමි තං භගවන්තං ජීවිතා වොරොපෙතුං. මහිද්ධිකො සො භගවා මහානුභාවො"ති.

"අලං ආවුසො මා ඛො ත්වං සමණං ගොතමං ජීවිතා වොරොපෙසි අහමෙව සමණං ගොතමං ජීවිතා වොරොපෙස්සාමී"

එ කලැ යථොක්ත පුරුෂයෝ සතර දෙන ඒ පුරුෂයෝ දෙදෙන කවර හෙයින් එන්නට කල් යවත් දැ''යි මාර්ගයේ ඉදිරියට යන්නාහු එක්තරා රුකක් මුලැ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුහ. දැක ඔබ වෙතට ගියාහ. ගොස් වැඳ පසෙක ඉඳගත්හ. ඔවුනට භාග්‍යවතුන් වහන්සේ ... පිළිවෙළ කථාව වදාළසේක. ඔහු ... ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යයය නැත්තාහු භාග්‍යවතුන් වහන්සේට වහන්ස, දෙශනාව අභිකාන්ත ය, වහන්ස, දෙශනාව අභිකාන්ත ය ... අප අද සිට දිවිහිම් කොට භාග්‍යවතුන් වහන්සේ සරණ ගිය උවසුවන් කොට සලකාවදරනසේක්වා''යි කීහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ පුරුෂයන් බණවා ''ඇවැත්නි, මෙ මඟින් නො යවු. මෙ නම් මඟින් යවු'' යි ඔවුන් අන් මඟෙකින් යැවූසේක.

එකල ඒ පුරුෂයෝ අට දෙන පුරුෂයෝ 'ඒ සතර කවර හෙයින් එන්නට කල් යවත් දැ' යි මඟැ ඉදිරියට යන්නාහු එක්තරා රුකක් මුලැ වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුහ. දැක එළැඹ වැඳ පසෙක හිඳගත්හ. ඔවුනට භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළ කථාව වදාළසේක. ... ඔහු ... ශාස්තෘශාසනයෙහි පර ප්‍රත්‍යය නැත්තාහු, 'වහන්ස, දෙශනාව අභිකාන්ත ය ... වහන්ස, අප අද සිට දිවිහිමියෙන් භාග්‍යවතුන් වහන්සේ සරණ ගිය උවසුවන් කොට සලකා වදරනසේක්වා' යි කීහ.

එකලැ යථොක්ත සොළොස් පුරුෂයෝ 'කවර හෙයින් ඒ පුරුෂයෝ අට දෙන එන්නට කල් යවත් දැ? යි මඟැ ඉදිරියට යන්නාහු එක්තරා රුක්මුලෙක හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුහ. දැක ඔබ වෙත ගියහ. ගොස් ඔබ වැඳ පසෙක ඉඳගත්හ. ඔවුනට භාග්‍යවතුන් වහන්සේ ... පිළිවෙළ කථාව වදාළසේක. ඔහු ... ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යයය නැත්තාහු ''වහන්ස, දෙශනාව අභිකාන්ත ය ... භාග්‍යවතුන් වහන්සේ අප අද සිට දිවි හිම් කොට සරණ ගිය උවසුවන් කොට සලකා වදරනසේක්වා යි'' කීහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන් බණවා, ඇවැත්නි, තෙපි මෙ මඟින් නො යවු. මෙ නම් මඟින් යවු'' යැ යි අන් මඟෙකින් යැවූසේක.

එ කල්හි යට කී හුදෙකලා පුරුෂයා දෙව්දතු කරා ගියේ ය. ගොස් 'වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේ දිවියෙන් තොර කරන්නට මම් නො හැක්කෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මහර්ධි ඇතිසේක, මහත් අනුභාව ඇති සේකැ'' යි කී ය.

''කම් නැත, ඇවැත්නි තෙපි මහණ ගොයුම්හා දිවියෙන් තොර නො කරවු. මම ම මහණ ගොයුම්හා දිවියෙන් තොර කරන්නෙමි'' යි දෙව්දත් තෙර කී ය.

18. තෙන ඛො පන සමයෙන භගවා ගිජ්ඣකූටස්ස පබ්බ-තස්ස පච්ඡායායං චඞ්කමති. අථ ඛො දෙවදත්තො ගිජ්ඣකූටං පබ්බතං අභිරුහිත්වා[1] මහතිං සිලං පවිජ්ඣි 'ඉමාය සමණං ගොතමං ජීවිතා වොරොපෙස්සාමී'ති. ද්වෙ පබ්බතකූටා සමාගන්ත්වා තං සිලං සම්පටිච්ඡිංසු. තතො පපටිකා උප්පතිත්වා භගවතො පාදෙ රුහිරං උප්පාදෙසි.

අථ ඛො භගවා උද්ධං උල්ලොකෙත්වා දෙවදත්තං එතදවොච: "බහුං තයා මොඝපුරිස අපුඤ්ඤං පසුතං යං ත්වං දුට්ඨචිත්තො වධකචිත්තො තථාගතස්ස රුහිරං උප්පාදෙසී"ති.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "ඉදං භික්ඛවෙ දෙවදත්තෙන පඨමං ආනන්තරියකම්මං උපචිතං යං දුට්ඨචිත්තෙන වධකචිත්තෙන තථාගතස්ස රුහිරං උප්පාදිතන්ති.

අස්සොසුං ඛො භික්ඛූ "දෙවදත්තෙන කිර භගවතො වධො පයුත්තො"ති. තෙ ච භික්ඛූ භගවතො විහාරස්ස පරිතො පරිතො චඞ්කමන්ති උච්චාසද්දා මහාසද්දා සජ්ඣායං කරොන්තා භගවතො රක්ඛාවරණගුත්තියා. අස්සොසි ඛො භගවා උච්චාසද්දං මහාසද්දං සජ්ඣායසද්දං. සුත්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: කින්නු ඛො සො ආනන්ද උච්චාසද්දො මහාසද්දො සජ්ඣායසද්දොති.

"අස්සොසුං ඛො භන්තෙ භික්ඛූ 'දෙවදත්තෙන කිර භගවතො වධො පයුත්තො'ති. තෙ'ධ භන්තෙ භික්ඛූ භගවතො විහාරස්ස පරිතො පරිතො චඞ්කමන්ති උච්චාසද්දා මහාසද්දා සජ්ඣායං කරොන්තා භගවතො රක්ඛාවරණගුත්තියා, සො එසො භගවා උච්චාසද්දො මහාසද්දො සජ්ඣායසද්දො"ති.

"තෙනහානන්ද මම වචනෙන තෙ භික්ඛූ ආමන්තෙහි: "සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී"ති.

"එවං භන්තෙ"ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී"ති.

"එවමාවුසො"ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච:

---

1. ආරුහිත්වා – මජසං

18 එසමයෙහි වූ කලි භාග්‍යවතුන් වහන්සේ ගිජ්ඣකූළ පව්වෙහි ප්‍රාක්ඡායායෙහි (ඉදිරි පසැ සෙවණෙහි) සක්මන් කරන සේක. එකලැ දෙව්දත් තෙර ගිජ්ඣකූළ පව්ව නැඟ 'මෙයින් මහණ ගොයුමා දිවියෙන් තොර කරන්නෙමි' යි මහගලක් පෙරළී ය. ගල්කුළු දෙකෙක් එක් වැ ඒ ගල පිළිගත්තේ ය. එයින් පතුරෙක් බිඳී වැටී භාග්‍යවතුන් වහන්සේගේ පයෙක ලෙහෙ මතු කෙළේ ය. (ලෙහෙ සැල්මෙක් විය).

එවිට භාග්‍යවතුන් වහන්සේ උඩ බලා 'හිස් පුරුෂය, යම් හෙයෙකින් තෝ නපුරු සිතැති ව වධකරන සිතැති ව තථාගතයන්ගේ සිරුරැ ලෙහෙ මතු කෙළෙහි ද, එයින් තා විසින් බොහෝ පව් රැස් කරන ලදැ'' යි වදාළසේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා ''මහණෙනි, යම් හෙයකින් නපුරු සිතැති ව වධ කරන සිතැති ව තථාගතයන්ගේ සිරුරැ ලේ සොලොවන ලදද, එයින් දෙව්දතු විසින් පළමුවන ආනන්තර්ය කර්මය රැස්කැරිණැ'' යි වදාළසේක.

''දෙව්දතු විසින් භාග්‍යවතුන් වහන්සේගේ දිවි තොර කරන්නට උපායෙක් යොදන ලද්දේ ය''යි භික්ෂූහු ඇසූහ. (භික්ෂූනට ආරංචි විය). ඒ භික්ෂූහු ද භාග්‍යවතුන් වහන්සේට ආරක්ෂාවරණය ගුප්තිය (රකවල) පිණිස උස්හඬ ඇති වැ මහහඬ ඇති වැ සජ්ඣායනය කරන්නාහු භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳුනා විහාරය හාත්පස සක්මන් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේ (ඒ භික්ෂූන්ගේ) උස්හඬ මහහඬ, සජ්ඣායනා හඬ ඇසූසේක. අසා, ආයුෂ්මත් අනඳ තෙරුනට අඩගාවදරා, ''ආනන්දයෙනි, ඒ උස්හඬ, මහහඬ, සජ්ඣායන හඬ කවර හෙයින් දැ?'' යි පුළුවුත්සේක.

''වහන්ස, දෙව්දත් තෙර විසින් භාග්‍යවතුන් වහන්සේගේ දිවි තොර කරන උපායෙක් යොදන ලද්දේ ල'' යි භික්ෂූහු ඇසූහු. වහන්ස, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ආරක්ෂාවරණ ගුප්තිය පිණිස උස්හඬ ඇත්තාහු මහහඬ ඇත්තාහු සජ්ඣායනය කරමින් භාග්‍යවතුන් වහන්සේගේ විහාරය හාත්පස සක්මන් කෙරෙත්. භාග්‍යවතුන් වහන්ස, මේ ඒ උස්හඬ ය, මහහඬ ය, සජ්ඣායනා හඬ යැ'' යි අනඳ තෙරණුවෝ සැලකළාහ.

''ආනන්දය, එසේ වී නම්, 'ශාස්තෘ තෙම ආයුෂ්මතුන් කැඳවා' යැ යි මගේ වචනයෙන් ඒ භික්ෂූන් අමතව'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

''එසේය වහන්සැ' යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ භික්ෂූන් වෙතට වැඩියාහ. වැඩ ශාස්තෘන් වහන්සේ ඔබ කැඳවන සේකැ'' යි සැලකළහ.

''එසේ ද ඇවැත්නි'' යි කියා ඒ මහණහු අනඳ තෙරුනට පිළිවදන් දී, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ, ඔබ වැඳ එකත්පස් වැ හුන් ඒ භික්ෂූන් බණවා භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

19. "අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං පරූපක්කමෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය, අනුපක්කමෙන භික්ඛවෙ තථාගතා පරිනිබ්බායන්ති."

"පඤ්චිමෙ භික්ඛවෙ සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච: ඉධ භික්ඛවෙ එකච්චො සත්ථා අපරිසුද්ධසීලො සමානො "පරිසුද්ධසීලොම්හී"ති පටිජානාති "පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසංකිලිට්ඨන්ති". තමෙනං සාවකා එවං ජානන්ති: "අයං ඛො භවං සත්ථා අපරිසුද්ධසීලො සමානො "පරිසුද්ධසීලොම්හී"ති පටිජානාති "පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසංකිලිට්ඨන්ති". මයඤ්චෙව ඛො පන ගිහීනං ආරොචෙය්‍යාම නාස්සස්ස මනාපං. යං ඛො පනස්ස අමනාපං, කථං තං මයං තෙන සමුදාචරෙය්‍යාම, සම්මන්නති ඛො පන චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙන. යං තුමො කරිස්සති තුමො'ව තෙන පඤ්ඤායිස්සතීති. එවරූපං ඛො භික්ඛවෙ සත්ථාරං සාවකා සීලතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි සීලතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධාජීවො සමානො පරිසුද්ධාජීවොම්හීති පටිජානාති -පෙ- එවරූපං ඛො භික්ඛවෙ සත්ථාරං සාවකා ආජීවතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ආජීවතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාති -පෙ- එවරූපං ඛො භික්ඛවෙ සත්ථාරං සාවකා ධම්මදෙසනතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ධම්මදෙසනතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධවෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාති -පෙ- එවරූපං ඛො භික්ඛවෙ සත්ථාරං සාවකා වෙය්‍යාකරණතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි වෙය්‍යාකරණතො රක්ඛං පච්චාසිංසති.

පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො සත්ථා අපරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාති -පෙ-. එවරූපං ඛො භික්ඛවෙ සත්ථාරං සාවකා ඤාණදස්සනතො රක්ඛන්ති. එවරූපො ච පන සත්ථා සාවකෙහි ඤාණදස්සනතො රක්ඛං පච්චාසිංසති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

**19.** මහණෙනි, පරොපක්‍රමයෙන් තථාගතයන් දිවියෙන් තොර කරන්නේ ය යන මෙය නො කරුණෙකි, වන්නට අවකාශ නැත්තෙකි. මහණෙනි, තථාගතවරු පරොපක්‍රම නැති ව ම පිරිනිවෙති.

''මහණෙනි, ලොවැ ඇති විද්‍යමාන මේ ශාස්තෘවරු පස් දෙනෙකි. කවර පස් දෙනෙක් ද යත්: මහණෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් නො පිරිසිදු සිල් ඇත්තේ ම ''පිරිසිදු සිල් ඇතියෙමි, මාගේ සිල් පිරිසිදුය, හැම ලෙසින් ම ශුද්ධ ය, නො කිලිටි යැ'' යි ප්‍රතිඥා කෙරෙයි. (ඔහුගේ) සව්වෝ ''මේ භවත් ශාස්තෘ තෙම වනාහි නො පිරිසිදු සිල් ඇත්තේ ම පිරිසිදු සිල් ඇත්තෙමි, මාගේ ශීලය පිරිසිදු ය, හැම ලෙසින් ම ශුද්ධ ය, නො කිලිටි යැ'' යි පිළින කෙරෙයි. 'අපි (ඇති තතු) ගිහියනට දන්වන්නමෝ නම් එය ඔහුට මනාප නො වන්නේ ය. යමක් ඔහුට මනාප නො වන්නේ නම්, එයින් ඔහුට කෙසේ කියන්නමෝ ද, (මහජන තෙමේ) සිවුරු පිඬුපා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් ඔහු පුදයි. යමක් තෙමේ කරන්නේ ද, තෙමේ ම එයින් පැනෙන්නේ යැ' යි ඔහු මෙසේ දනිත්. මහණෙනි, මෙබඳු ශාස්තෘහු සව්වෝ ශීලයෙන් රකිත්. මෙබඳු ශාස්තෘ තෙමේ ද ශීලයෙන් තමා රැකගැන්ම සව්වන් ගෙන් අපෙක්‍ෂා කෙරෙයි.

තව ද අනෙකෙකි. මහණෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් නො පිරිසිදු ආජීවය ඇත්තේ ම පිරිසිදු ආජීවය ඇත්තෙමි ... යි පිළින කෙරෙයි ... මහණෙනි, මෙබඳු ශාස්තෘහු ශ්‍රාවකයෝ ආජීවයෙන් රැකගනිත්. මෙබඳු ශාස්තෘ තෙමේ ද ආජීවයෙන් තමා රැකගැන් ම සව්වන්ගෙන් අපෙක්‍ෂා කෙරෙයි.

තවද මහණෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් නො පිරිසිදු දම්දෙසුම් ඇත්තේ ම පිරිසිදු දම් දෙසුම් ඇත්තෙමැ යි ... පිළින කෙරෙයි. මහණෙනි, මෙබඳු ශාස්තෘහු සව්වෝ ධර්මදෙශනා අතින් රැකගනිත්. මෙබඳු ශාස්තෘ තෙමේ ද දම් දෙසුම් අතින් තමා රැක ගැන්ම සව්වන්ගෙන් අපෙක්‍ෂා කෙරෙයි.

තව ද මහණෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් නො පිරිසිදු දහම්විවැරුම් ඇත්තේ ම පිරිසිදු දහම්විවැරුම් ඇතියෙමි යි ප්‍රතිඥා කෙරෙයි ... මහණෙනි, මෙබඳු ශාස්තෘහු වනාහි සව්වෝ දහම්විවැරුම් අතින් රැකගනිත්. මෙබඳු ශාස්තෘ ද සව්වන් ගෙන් ද දහම්විවැරුම් අතින් රැක්ම අපෙක්‍ෂා කෙරෙයි.

තවද මහණෙනි, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් අපිරිසිදු ඥානදර්ශන ඇත්තේ ම පිරිසිදු ඥානදර්ශන ඇත්තෙමි වෙමි යි ප්‍රතිඥා කෙරෙයි ... මහණෙනි, මෙබඳු ශාස්තෘහු වනාහි සව්වෝ ඥානදර්ශනය අතින් රැකගනිත්. මෙබඳු ශාස්තෘ ද ඥානදර්ශනය අතින් තමා රැකගැන්ම සව්වන්ගෙන් අපෙක්‍ෂා කෙරෙයි.

අහං ඛො පන භික්ඛවෙ පරිසුද්ධසීලො සමානො පරිසුද්ධසීලොම්හීති පටිජානාමි පරිසුද්ධං මෙ සීලං පරියොදාතං අසංකිලිට්ඨන්ති. න ච මං සාවකා සීලතො රක්ඛන්ති, නචාහං සාවකෙහි සීලතො රක්ඛං පච්චාසිංසාමි.

අහං ඛො පන භික්ඛවෙ පරිසුද්ධාජීවො සමානො පරිසුද්ධාජීවොම්හීති පටිජානාමි පරිසුද්ධො මෙ ආජීවො පරියොදාතො අසංකිලිට්ඨොති. න ච මං සාවකා ආජීවතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ආජීවතො රක්ඛං පච්චාසිංසාමි.

අහං ඛො පන භික්ඛවෙ පරිසුද්ධධම්මදෙසනො සමානො පරිසුද්ධධම්මදෙසනොම්හීති පටිජානාමි පරිසුද්ධා මෙ ධම්මදෙසනා පරියොදාතා අසංකිලිට්ඨාති. න ච මං සාවකා ධම්මදෙසනතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ධම්මදෙසනතො රක්ඛං පච්චාසිංසාමි.

අහං ඛො පන භික්ඛවෙ පරිසුද්ධවෙය්‍යාකරණො සමානො පරිසුද්ධවෙය්‍යාකරණොම්හීති පටිජානාමි පරිසුද්ධං මෙ වෙය්‍යාකරණං පරියොදාතං අසංකිලිට්ඨන්ති. න ච මං සාවකා වෙය්‍යාකරණතො රක්ඛන්ති. න චාහං සාවකෙහි වෙය්‍යාකරණතො රක්ඛං පච්චාසිංසාමි.

අහං ඛො පන භික්ඛවෙ පරිසුද්ධඤාණදස්සනො සමානො පරිසුද්ධඤාණදස්සනොම්හීති පටිජානාමි. පරිසුද්ධං මෙ ඤාණදස්සනං පරියොදාතං අසංකිලිට්ඨන්ති, න ච මං සාවකා ඤාණදස්සනතො රක්ඛන්ති. න චාහං සාවකෙහි ඤාණදස්සනතො රක්ඛං පච්චාසිංසාමි.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං පරූපක්කමෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය, අනුපක්කමෙන භික්ඛවෙ තථාගතා පරිනිබ්බායන්ති.

ගච්ඡථ තුම්හෙ භික්ඛවෙ යථාවිහාරං. අරක්ඛියා භික්ඛවෙ තථාගතා''ති,

මහණෙනි, මම වනාහි පිරිසිදු සිල් ඇත්තෙම් ම ''පිරිසිදු සිල් ඇත්තෙමි යි, මාගේ සිල් පිරිසිදු ය, හැම ලෙසින් ශුද්ධ ය, නො කිලිටි යැ'' යි ප්‍රතිඥා කරමි. සව්වෝ මා ශීලය අතින් නො රකිත්. මම ද ශීලය අතින් මා රැකගැන්මක් සව්වන්ගෙන් අපෙක්‍ෂා නො කරමි.

මහණෙනි, මම වනාහි පිරිසිදු ආජීවය ඇත්තෙම් ම ''පිරිසිදු ආජීවය ඇත්තෙම් වෙමි යි, මාගේ ආජීවය පිරිසිදු ය, හැම ලෙසින් ශුද්ධ ය, නො කිලිටි යැ'' යි ප්‍රතිඥා කෙරෙමි. සව්වෝ මා ආජීවය අතින් නො රකිත්. මම ද ආජීවය අතින් මා රැකගැන්මක් සව්වන්ගෙන් නො පතමි.

මහණෙනි, මම වනාහි පිරිසිදු දම්දෙසුම් ඇත්තෙම් ම ''පිරිසිදු දම්දෙසුම් ඇත්තෙම් වෙමි, මාගේ දම්දෙසුම් පිරිසිදු ය, හැම ලෙසින් ශුද්ධ ය, නො කිලිටි යැ'' යි පිළින කෙරෙමි. සව්වෝ මා දම්දෙසුම් අතින් නො රකිත්, මම ද දම්දෙසුම් අතින් මා රැකගැන්මක් සව්වන්ගෙන් අපෙක්‍ෂා නො කරමි.

මහණෙනි, මම වනාහි පිරිසිදු දහම් විවරණ ඇත්තෙම් ම ''පිරිසිදු දහම් විවරණ ඇතියෙම් වෙමි, මාගේ දහම් විවැරුම පිරිසිදු ය, හැම ලෙසින් ශුද්ධ ය, නො කිලිටි යැ'' යි පිළින කෙරෙමි. සව්වෝ මා දහම් විවරණ අතින් නො රකිත්. මම ද දහම්විවරණ අතින් මා රැකගැන්මක් සව්වන්ගෙන් නො පතමි.

මහණෙනි, මම වනාහි පිරිසිදු ඥානදර්ශන ඇත්තෙම් ම ''පිරිසිදු ඥානදර්ශන ඇතියෙම් වෙමි. මාගේ ඥානදර්ශනය පිරිසිදු ය. හැම ලෙසින් ශුද්ධ ය. නො කිලිටි යැ'' යි පිළින කෙරෙමි. සව්වෝ මා ඥානදර්ශන අතින් නො රකිත්. ඥානදර්ශන අතින් මා රැකගැන්මක් සව්වන්ගෙන් අපෙක්ෂා නො කරමි.

මහණෙනි, පරොපක්‍රමයෙන් තථාගතයන් දිවියෙන් තොර කරන්නේ ය යන මෙය නො කරුණෙකි. වන්නට අවකාශ නැත්තෙකි. මහණෙනි, පරොක්‍රම නැති ව මැ තථාගතවරු පිරිනිවෙත්.

මහණෙනි, තෙපි තම තමන්ගේ විහාරයට යවු. මහණෙනි, තථාගතවරු අනුන් විසින් නො රැක්ක යුත්තෝ ය යනු'' යි.

20. තෙන ඛො පන සමයෙන රාජගහෙ නාලාගිරි නාම හත්ථී චණ්ඩො හොති මනුස්සඝාතකො. අථ ඛො දෙවදත්තො රාජගහං පවිසිත්වා හත්ථිසාලං ගන්ත්වා හත්ථිභණ්ඩෙ එතදවොච: ‘‘මයං ඛො භණෙ රාජඤාතකා නාම පටිබලා නීචට්ඨානීයං උච්චට්ඨානෙ ඨපෙතුං, භත්තම්පි වෙතනම්පි වඩ්ඪාපෙතුං. තෙන හි භණෙ යද සමණො ගොතමො ඉමං රච්ඡං පටිපන්නො හොති තද ඉමං නාලාගිරිං හත්ථිං මුඤ්චිත්වා ඉමං රච්ඡං පටිපාදෙථා’’ති. ‘‘එවං භන්තෙ’’ති ඛො තෙ හත්ථීභණ්ඩා දෙවදත්තස්ස පච්චස්සොසුං.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං රාජගහං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවා තං රච්ඡං පටිපජ්ජි. අද්දසාසුං ඛො තෙ හත්ථිභණ්ඩා භගවන්තං තං රච්ඡං පටිපන්නං, දිස්වාන නාලාගිරිං හත්ථිං මුඤ්චිත්වා තං රච්ඡං පටිපාදෙසුං. අද්දසා ඛො නාලාගිරි හත්ථී භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං, දිස්වාන සොණ්ඩං උස්සාපෙත්වා පහට්ඨකණ්ණවාලො යෙන භගවා තෙන අභිධාවි. අද්දසාසුං ඛො තෙ භික්ඛූ නාලාගිරිං හත්ථිං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන භගවන්තං එතදවොචුං: ‘‘අයං භන්තෙ නාලාගිරි හත්ථී චණ්ඩො මනුස්සඝාතකො ඉමං රච්ඡං පටිපන්නො. පටික්කමතු භන්තෙ භගවා පටික්කමතු සුගතො’’ති. ‘‘ආගච්ඡථ භික්ඛවෙ, මා භායිත්ථ. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං පරූපක්කමෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය, අනුපක්කමෙන භික්ඛවෙ තථාගතා පරිනිබ්බායන්ති’’ති.

දුතියම්පි ඛො තෙ භික්ඛූ – පෙ – තතියම්පි ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ‘‘අයං භන්තෙ නාලාගිරි හත්ථී චණ්ඩො මනුස්සඝාතකො ඉමං රච්ඡං පටිපන්නො. පටික්කමතු භන්තෙ පටික්කමතු සුගතො’’ති.

‘‘ආගච්ඡථ භික්ඛවෙ, මා භායිත්ථ, අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං පරූපක්කමෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය. අනුපක්කමෙන භික්ඛවෙ තථාගතා පරිනිබ්බායන්ති’’ති

21. තෙන ඛො පන සමයෙන මනුස්සා පාසාදෙසුපි හම්මියෙසුපි ඡදනෙසුපි ආරූළ්හා අච්ඡන්ති. තත්ථ යෙ තෙ මනුස්සා අස්සද්ධා අප්පසන්නා දුබ්බුද්ධිනො තෙ එවමාහංසු: ‘‘අභිරූපො වත භො මහාසමණො නාගෙන විහෙඨියිස්සතී’’ති. යෙ පන මනුස්සා සද්ධා පසන්නා පණ්ඩිතා බුද්ධිමන්තො තෙ එවමාහංසු: ‘‘චිරස්සං වත භො නාගො නාගෙන සඞ්ගාමෙස්සතී’’ති.

20. එ සමයෙහි රජගහනුවර නාලාගිරි නම් ඇත් තෙම චණ්ඩ ද මිනිසුන් මරන්නේ ද වෙයි. එ කලැ දෙව්දත් තෙම රජගහ නුවරට වැද ඇත්හලට ගොස් ඇත් ගොව්වන් බණවා, "සගයෙනි, රජුට නෑ වූ අපි වූ කලී පහත් තනතුරෙහි සිටිනවුන් උස් තනතුරෙහි තබන්නට, බතුන් වැටුපුත් වඩාලන්නට හැකියම්හ. එබැවින් සගයෙනි, යම් විටෙක මහණ ගොයුම්හු මේ වීථියට පිළිපන්නෝ වෙත් ද, එ විටැ තම් නාලාගිරි ඇතු මුදා මේ වීථියට පමුණුවවූ" යැ යි කීය. "එසේ ය වහන්සැ"යි කියා ඒ ඇත්ගොව්වෝ දෙව්දතුට පිළිවදන් දුන්හ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සෙමෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන, බොහෝ භික්ෂූන් කැටුව රජගහ නුවරට පිඩු පිණිස පිවිසිසේක. එකලැ භාග්‍යවතුන් වහන්සේ ඒ වීථියට පිළිපන් සේක. ඒ ඇත්ගොව්වෝ භාග්‍යවතුන් වහන්සේ ඒ වීථියට පිළිපන්නවුන් දුටුහ. දැක නාලාගිරි ඇතු මුදා ඒ වීථියට පැමිණැවූහ. නාලාගිරි ඇත් තෙම දුරින් ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දිටී. දැක සොඬ ඔසොවා විදහු කන් හා වලග හා ඇත්තේ, භාග්‍යවතුන් වහන්සේ වෙතට දිවැගියේ ය. ඒ භික්ෂූහු දුරින් ම එන නාලාගිරි ඇතු දුටුහ. දැක, භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මිනිසුන් මරන නපුරු වූ මේ නාලාගිරි ඇත් මේ වීථියට බටුයේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පෙරළා වඩනාසේක්වා, සුගතයන් වහන්සේ පෙරළා වඩනාසේක්වා" යි කීහ. "මහණෙනි, එවූ, බිය නො ගනිවූ. පරොපක්‍රමයෙන් තථාගතයන් දිවියෙන් තොර කරන්නේය යන්න නො කරුණෙකි, එන්නට අවකාශ නැතියෙකි. තථාගතවරු පරොප-ක්‍රම නැති ව ම පිරිනිවෙති"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

දෙවෙනි වර ද ... තෙවෙනි වර ද භික්ෂූහු "වහන්ස, මිනිසුන් මරන නපුරු වූ මේ නාලාගිරි ඇතා මේ වීථියට බටුයේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පෙරළා වඩනාසේක්වා. සුගතයන් වහන්සේ පෙරළා වඩනාසේක්වා"යි කීහ.

"මහණෙනි, එවූ, බිය නො ගනිවූ. පරොපක්‍රමයෙන් තථාගතයන් දිවියෙන් තොර කරන්නේ ය යන්න නො කරුණෙකි, එන්නට ඉඩ නැත්තෙකි. පරොපක්‍රම නැති ව ම තථාගතවරු පිරිනිවෙති"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

21. එ සමයෙහි එනාහි මිනිස්සු ප්‍රාසාදයන්හි ද සඳලුවල ද පියැසි වල ද නැඟී හිඳිත්. සැදැහැ නැති සස්නෙහි නො පහන් අනුවණ මිනිස්සු "අහෝ! විශිෂ්ට රූපශොභා ඇති මහාශ්‍රමණයා ඇතු විසින් පෙළනු ලබන්නේ යැ"යි කීහ. සැදැහැවත් සස්නෙහි පහන් පණ්ඩිත බුද්ධිමත් මිනිස්සු "භවත්නි, කලකට පසු නාගයෙක් (ශ්‍රෙෂ්ඨයෙක්) නාගයකු (ශ්‍රෙෂ්ඨයකු) හා සටන් වදින්නේයැ"යි කීහ.

අථ ඛො භගවා නාලාගිරිං හත්ථිං මෙත්තෙන චිත්තෙන ඵරි. අථ ඛො නාලාගිරි හත්ථී භගවතා මෙත්තෙන චිත්තෙන ඵුට්ඨො සොණ්ඩං ඔරොපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පුරතො අට්ඨාසි. අථ ඛො භගවා දක්ඛිණෙන හත්ථෙන නාලාගිරිස්ස හත්ථිස්ස කුම්භං පරාමසන්තො නාලාගිරිං හත්ථිං ගාථාහි අජ්ඣභාසි:

"මා කුඤ්ජර නාගමාසදො දුක්ඛං හි කුඤ්ජර නාගමාසදො,
න හි නාගහතස්ස කුඤ්ජර සුගති හොති ඉතො පරං යතො.

මා ච මදො මා ච පමාදො න හි පමත්තා සුගතිං වජන්ති
තෙන ත්වඤ්ඤෙව තථා කරිස්සසි යෙන ත්වං සුගතිං ගමිස්සසී"ති.

අථ ඛො නාලාගිරි හත්ථී සොණ්ඩාය භගවතො පාදපංසූනි ගහෙත්වා උපරි මුද්ධනි ආකිරිත්වා පතිකුටිතො පටිසක්කි යාව භගවන්තං අද්දක්ඛි. අථ ඛො නාලාගිරි හත්ථී හත්ථිසාලං ගන්ත්වා සකෙ ඨානෙ අට්ඨාසි. තථා දන්තො ච පන නාලාගිරි හත්ථී අහොසි. තෙන ඛො පන සමයෙන මනුස්සා ඉමං ගාථං ගායන්ති.

දණ්ඩෙනෙකෙ දමයන්ති අංකුසෙහි කසාහි ච
අදණ්ඩෙන අසත්ථෙන නාගො දන්තො මහෙසිනාති.

මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "යාව පාපො අයං දෙවදත්තො අලක්ඛිකො යත්‍ර හි නාම සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වධාය පරක්කමිස්සතී"ති.

දෙවදත්තස්ස ලාභසක්කාරො පරිහායි. භගවතො ච ලාභසක්කාරො අභිවඩ්ඪි.

22. තෙන ඛො පන සමයෙන දෙවදත්තො පරිහීනලාභ-සක්කාරො සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති, කස්ස සම්පන්නං න මනාපං, කස්ස සාදු න රුච්චතී"ති

එ කලැ භාග්‍යවතුන් වහන්සේ නාලාගිරි ඇතු මෙත්සිතින් පැතිරගත්සේක. එවිට නාලාගිරි ඇත් තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මෙත්සිතින් පැතිරගන්නා ලද්දේ, සොඬ පහතට හෙළාගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සිටියේ ය. එ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ දකුණතින් නාලාගිරි ඇතුගේ කුම්භස්ථලය පිරිමදිමින් උහුට ගාථාවලින් මෙසේ වදළසේක.

''හස්තිය, යම් හෙයෙකින් බුද්ධනාගයා පෙළන්නහුට මෙයින් මතු සුගතියෙක් නො වන්නේ ද එහෙයින් හිංසක සිතින් බුද්ධ නාගයාට ළං නොවෙව. බුද්ධනාගයාට හිංසක සිතින් ළං වීම එකාන්තයෙන් දුකට කරුණු වේ.

මත් නොවෙව, පමා නොවෙව. පමා වූවෝ සුගතියට නො යෙත්. එබැවින් යමෙකින් තෝ සුගතියට යන්නෙහි ද තෝ ම එසේ කරව.''යි

එ කලැ නාලාගිරි ඇත් තෙම සොඬින් භාග්‍යවතුන් වහන්සේගේ පා දූවිලි ගෙන හිස මුදුනැ විසුරුවාගෙන භාග්‍යවතුන් වහන්සේ පෙනෙන තෙක් මානයේ පසුබැස ගියේ ය. එයින් පසු නාලාගිරි ඇත් තෙම ඇත්හලට ගොස් සිය තැනැ සිටියේ ය. නාලාගිරි ඇත් තෙම එසේ දැමුණේ ම විය. (එයින් පසු කිසි ම දිනෙක චණ්ඩ නො වී ය.) එ සමයෙහි මිනිස්සු මේ ගාථාව ගයත්:

''සමහරු හස්ත්‍යාදීන් දංඩෙන් හීලැ කෙරෙත්. සමහරු අකුසුවලින් ද සමහරු කසවලින් ද හීලැ කෙරෙත්. (එහෙත්) මහර්ෂිහු විසින් දණ්ඩක් අවියක් නැති ව ම ඇතා හීලැ කරන ලද්දේ ය'' යනුවෙනි.

''යමෙක් මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහානුභාව ඇති ශ්‍රමණ ගෞතමයන් වහන්සේට වධ කිරීම පිණිස උත්සාහ කරන්නේ ද, එසේ වූ මේ දෙව්දත් තෙම කොතරම් මහත් පව්ටෙක් ද කොතරම් මහත් කාලකණ්ණියෙක් ද''යි මිනිස්සු පහත් කොට සිතත්, දෙස් කියත්, අගුණ පතුරුවත්.

දෙව්දතුට ලාභ සත්කාර පිරිහිණ. භාග්‍යවතුන් වහන්සේට ලාභ සත්කාර වැඩිණ.

22. එ සමයෙහි දෙව්දත් පිරිහුණු ලාභසත්කාර ඇත්තේ සිය ශ්‍රාවක පිරිස සමග කුලයන් කරා ගොස් ඉල්ල ඉල්ලා වළඳයි. ''කෙසේ නම් ශාක්‍යපුත්‍රීය මහණහු කුලයන්හි ඉල්ල ඉල්ලා වළඳන්නාහු ද මොනොවට පිළියෙල කැරුණු බොජුන් කාට මනාප නො වේද, මිහිරි බොජුන් කාට නො රිසියේ ද ''යි මිනිස්සු පහත් කොට සිතත්' ගරහත්, දෙස් පතුරුවත්.

අපස්සාසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම දෙවදත්තො සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සතී"ති.

භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර ත්වං දෙවදත්ත, සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජසී?"ති.

"සච්චං භගවා".

විගරහි බුද්ධො භගවා. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

"තෙන හි භික්ඛවෙ භික්ඛූනං කුලෙසු තිකභොජනං පඤ්ඤාපෙස්සාමි තයො අත්ථවසෙ පටිච්ච දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, මා පාපිච්ඡා පක්ඛං නිස්සාය සඞ්ඝං භින්දෙය්‍යුං කුලානුද්දයාය ච. ගණභොජනෙ යථාධම්මො කාරෙතබ්බො"ති.

23. අථ ඛො දෙවදත්තො යෙන කොකාලිකො කටමොරකතිස්සො ඛණ්ඩදෙවියා පුත්තො සමුද්දදත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කොකාලිකං කටමොරකතිස්සං ඛණ්ඩදෙවියා පුත්තං සමුද්දදත්තං එතදවොච: "එථ මයං ආවුසො සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදං කරිස්සාම චක්කභෙදන්ති".

එවං වුත්තෙ කොකාලිකො දෙවදත්තං එතදවොච: "සමණො ඛො ආවුසො ගොතමො මහිද්ධිකො මහානුභාවො. කථං මයං සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදං කරිස්සාම චක්කභෙදන්ති".

"එථ, මයං ආවුසො සමණං ගොතමං උපසඞ්කමිත්වා පඤ්ච වත්ථූනි යාචිස්සාම: භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස

භික්ෂූහු එසේ පහත් කොට සිතන, ගරහන, දෙස් පතුරුවන මිනිසුන්ගේ වචන ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ වූ ලද පමණින් සතුටු වන්නා වූ පවට ලජ්ජා ඇති සුළු ඇවැතෙහි ද කුකුස් කරන ශික්ෂා කාමී වූ යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු ''කෙසේ නම් දෙව්දත් තෙම සිය සවුපිරිස සමග කුලයන් කරා ගොස් විනව විනවා වළඳන්නේ ද''යි පහත් කොට සිතත්, ගරහත් දෙස් පතුරුවත්.

භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''දෙව්දතුනි, තෙපි සිය පිරිස සමග කුලයන් කරා ගොස් ඉල්ල ඉල්ලා වළඳවු ද? මෙය සැබෑ ද?''යි භාග්‍යවතුන් වහන්සේ අයාවදළසේක.

''භාග්‍යවතුන් වහන්ස, සත්‍යයැ''යි දෙව්දත් කී ය.

භාග්‍යවතුන් වහන්සේ ගැරැහූසේක. ගරහා දැහැමි කථා කොට භික්ෂූන් අමතා:

''මහණෙනි, එසේ වී නම් දුසිල් පුඟුලනට නිගා පිණිස ද ප්‍රියශීල පුඟුලනට සැප විහරණ පිණිස ද ලාමක අදහස් ඇති මහණහු පක්ෂය නිසා සඞ්ඝයා භින්න නො කෙරෙත්වා යන අදහස් ඇති බැවින් කුලයන් කෙරෙහි දයාව නිසා ද යන මේ කරුණු තුන නිසා භික්ෂූනට කුලයන්හි ත්‍රිකභොජනය පනවන්නෙමි. ගණභොජනයෙහි දහම් වූ පරිදි කැරැවිය යුතු''යැ යි වදළසේක.

23. එයින් පසු දෙව්දත් තෙම ඛණ්ඩදෙවියගේ පුත් වූ කටමොරකතිස්ස ද සමුද්දත්ත ද යන නම් ඇති කොකාලික මහණහු කරා එළැඹියේ ය. එළැඹ ''එවු ඇවැත්නි, අපි මහණ ගොයුම්හු ගේ සඞ්ඝයා බිඳින්නමු, ආඥාභෙදය කරන්නමු''යි කී ය.

මෙසේ කී කල්හි කොකාලික තෙම දෙව්දතුට ''ඇවැත්නි, මහණ ගොයුම් වනාහි මහත් සෘද්ධි ඇත්තෙක, මහත් අනුභාව ඇත්තෙක. අපි කෙසේ මහණ ගොයුම්හුගේ සඞපිරිස බිඳින්නමු ද? ආඥාභෙදය කරන්නමු ද?''යි කී ය.

''ඇවැත්නි, එවු. අපි මහණ ගොයුම්හු කරා එළඹ, වස්තු පසක් ඉල්ලම්හ. (ඒ පස නම්: ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කරුණින් අල්පෙච්ඡ ගුණයේ යථාලාභ සන්තොෂයේ,[1] සල්ලෙඛ ගුණයේ[2] ධූතගුණයේ[3] ඇසූ දුටුවන් සිත් පහදවන පැවැත්මේ, යටත් පහත් බවේ, වැර වැඩීමේ

---

1. යථාලාභ සන්තොෂ යනු ලද දෑයෙකින් ලද පමණෙකින් සතුටු වීම ය.
2. සල්ලෙඛ යනු කෙලෙසුන් වියැලීම, කෙලෙසුන් සිඳ දැමීම ය.
3. ධූත යනු කෙලෙසුන් ධූනනය කිරීම, කෙලෙසුන් කම්පාකොට පලවා හැරීම ය. සල්ලෙඛ ධූත යන වචන දෙකින් ම සංවරය දක්වීණ.

වණ්ණවාදී, ඉමානි භන්තෙ පඤ්ච වත්ථූනි අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨියා සල්ලෙඛාය ධුතතාය පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තන්ති.

සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤිකා අස්සු. යො ගාමන්තං ඔසරෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං පිණ්ඩපාතිකා අස්සු. යො නිමන්තනං සාදියෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං පංසුකූලිකා අස්සු. යො ගහපතිචීවරං සාදියෙය්‍ය. වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං රුක්ඛමූලිකා අස්සු. යො ඡන්නං උපගච්ඡෙය්‍ය. වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං යො මච්ඡමංසං ඛාදෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍යා''ති.

''ඉමානි පඤ්ච වත්ථූනි සමණො ගොතමො නානුජානිස්සති. තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි ජනං සඤ්ඤාපෙස්සාමා''ති.

''සක්කා ඛො ආවුසො ඉමෙහි පඤ්චහි වත්ථූහි සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදෙ කාතුං චක්කභෙදෙ, ලූඛප්පසන්නා හි ආවුසො මනුස්සා''ති.

24. අථ ඛො දෙවදත්තො සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දෙවදත්තො භගවන්තං එතදවොච:

''භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී ඉමානි භන්තෙ පඤ්ච වත්ථූනි අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨියා සල්ලෙඛාය ධුතතාය පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තන්ති.

ගුණ වදරනසුලු කෙනෙක. වහන්ස, මේ පංච වස්තුහු නොයෙක් කරුණින් අල්පෙච්ඡ බව පිණිස පවතිත්. යථාලාභසන්තොෂය පිණිස, සල්ලෙඛය පිණිස, ධුතගුණය පිණිස, ප්‍රසාද එළවන බව පිණිස, යටත් පැවැතුම් ඇති වන බව පිණිස පවතිත්.

වහන්ස, භික්ෂූහු දිවි හිමි කොට අරණ්‍යවාසී වන්නාහු නම් මැනව. යමෙක් ග්‍රාමාන්තයට බස්නේ නම්, වරද ඔහු ස්පර්ශ කරන්නේ ය (ඔහු වරදක් කළා වන්නේ ය).

භික්ෂූහු දිවි හිමි කොට පිණ්ඩපාතික වන්නාහු නම් මැනැව. යමෙක් නිමන්ත්‍රණ (කැඳවා පිළිගන්වන බත) ඉවසන්නේ නම්, වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට පාංසුකූලික වන්නාහු නම් මැනැව. යමෙක් ගෘහපති චීවරය පිළිගන්නේ නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට වෘක්ෂමූලක වන්නාහු නම් මැනැව. යමෙක් සෙවෙණි ඇති තැනකට පැමිණෙන්නේ නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට දියමස් ගොඩමස් නො වළඳන්නාහු නම් මැනව. යමෙක් දියමස් ගොඩමස් වැළඳුයේ වී නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.'' යනු යි.

''මහණ ගොයුම් තෙම මේ වස්තු පස නො අනුදන්නේය. ඒ අපි මේ වස්තු පසින් ජනයාට හඟවන්නමු.''

''ඇවැත්නි, මේ කරුණු පසින් මහණ ගොයුම්හුගේ සංඝයා බිඳීම කරන්නට හැක්කේ ය, (මහණගොයුම්හුගේ) අණසක බිඳීම කරන්නට හැක්කේ ය. ඇවැත්නි, මිනිස්සු රූක්ෂ ප්‍රතිපත්තිය කෙරෙහි පැහැදුණෝ ය. එහෙයිනැ''යි කොකාලික කී ය.

24. ඉක්බිති දෙවදත් තෙම සිය පිරිස කැටුව භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ ඔබ වැඳ පසෙක ඉඳ ගත්තේ ය. පසෙක හුන්නේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය:

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කරුණින් අල්පෙච්ඡ බවේ යථාලාභ සන්තොෂයේ සල්ලෙඛයේ ධුතගුණයේ ප්‍රාසාදික බවේ යටත් පැවැත්මේ වීර්‍ය්‍යාරම්භයේ ගුණ වදරනසුලු කෙනෙක. වහන්ස, මේ පංච වස්තුහු නොයෙක් කරුණින් අල්පෙච්ඡතාව පිණිස යථාලාභ සන්තුෂ්ටිය පිණිස සල්ලෙඛය පිණිස ධුතගුණ පිණිස ප්‍රාසාදිකතාව පිණිස යටත් පැවැත්ම පිණිස වීර්‍ය්‍යාරම්භය පිණිස පවතිත්.

"සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤිකා[1] අස්සු, යො ගාමන්තං ඔසරෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං පිණ්ඩපාතිකා අස්සු, යො නිමන්තනං සාදියෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං පංසුකූලිකා අස්සු, යො ගහපතිචීවරං සාදියෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං රුක්ඛමූලිකා අස්සු, යො ඡන්නං උපගච්ඡෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං, යො මච්ඡමංසං ඛාදෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍යා''ති.

"අලං දෙවදත්ත. යො ඉච්ඡති ආරඤ්ඤිකො හොතු, යො ඉච්ඡති ගාමන්තෙ විහරතු"

යො ඉච්ඡති පිණ්ඩපාතිකො හොතු, යො ඉච්ඡති නිමන්තනං සාදියතු.

යො ඉච්ඡති පංසුකූලිකො හොතු, යො ඉච්ඡති ගහපතිචීවරං සාදියතු.

අට්ඨ මාසෙ ඛො මයා දෙවදත්ත රුක්ඛමූලසෙනාසනං අනුඤ්ඤාතං, අනුඤ්ඤාතං තිකොටිපරිසුද්ධං මච්ඡමංසං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතන්ති''.

25. අථ ඛො දෙවදත්තො 'න භගවා ඉමානි පඤ්ච වත්ථූනි අනුජානාතී'ති හට්ඨො උදග්ගො සපරිසො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො දෙවදත්තො සපරිසො රාජගහං පවිසිත්වා පඤ්චහි වත්ථූහි ජනං සඤ්ඤාපෙසි:

---

1. ආරඤ්ඤකො - සී.

"වහන්ස, භික්ෂූහු දිවි හිමි කොට ආරණ්‍යක වන්නාහු නම් මැනැව. යමෙක් ග්‍රාමාන්තයට බස්නේ වී නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට පිණ්ඩපාතික වන්නාහු නම් මැනව. යමෙක් නිමන්ත්‍රණ ඉවසූයේ වී නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට පාංශුකූලික වන්නාහු නම් මැනව. යමෙක් ගෘහපතිචීවරය ඉවසූයේ වී නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට වෘක්ෂමූලක වන්නාහු නම් මැනව. යමෙක් සෙවෙණියක් ඇති තැනකට පැමිණියේ වී නම්, වරද ඔහු ස්පර්ශ කරන්නේ ය.

භික්ෂූහු දිවි හිමි කොට දියමස් ගොඩමස් නො කන්නාහු නම් මැනව. යමෙක් දියමස් ගොඩමස් කෑයේ වී නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය." (මෙසේ කියා දෙව්දත් තෙම මේ පංච වස්තූන් පනවන ලෙස ඉල්ලී ය.)

"දෙවදත්තයෙනි, කම් නැත. යමෙක් කැමැත්තේ නම් හේ ආරණ්‍යක වේවා. යමෙක් කැමැත්තේ නම් ග්‍රාමාන්තයෙහි වෙසේවා.

යමෙක් කැමැත්තේ නම් හේ පිණ්ඩපාතික වේවා. යමෙක් කැමැත්තේ නම් හේ නිමන්ත්‍රණ ඉවසාවා.

යමෙක් කැමැත්තේ නම් හේ පාංශුකූලික වේවා. යමෙක් කැමැත්තේ නම් ගෘහපති චීවරය ඉවසාවා.

දෙවදත්තයෙනි, අට මසක් ම රුක්මුල් සෙනසන මා විසින් අනුදන්නා ලදී. තමා උදෙසා මරන ලද යි නො දුටු නො ඇසූ සැක නො කරන ලද (යන මේ) තුන් කෙළ පිරිසුදු වූ දියමස් ගොඩමස් මා විසින් අනුදන්නා ලදී"යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

25. එකල්හි දෙව්දත් තෙම 'භාග්‍යවතුන් වහන්සේ මේ පංච වස්තූන් නො අනුදන්නා සේකැ'යි තුටුපහටු වූයේ ඔදවැඩි සිතැත්-තේ උනස්නෙන් නැගී සිය පිරිස කැටුව භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මියේ ය. ඉක්බිති දෙව්දත්තෙම පිරිස කැටුව රජගහ නුවර වැද වස්තු පසින් මෙසේ ජනයා හැඟැවී ය:

''මයං ආවුසො සමණං ගොතමං උපසඞ්කමිත්වා පඤ්ච වත්ථූනි යාචිම්හ: භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස -පෙ- විරියාරම්භස්ස වණ්ණවාදී. ඉමානි භන්තෙ පඤ්ච වත්ථූනි අනෙකපරියායෙන අප්පිච්ඡතාය -පෙ- විරියාරම්භාය සංවත්තන්ති. සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤිකා අස්සු -පෙ- යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං. යො මච්ඡමංසං ඛාදෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍යාති. ඉමානි පඤ්ච වත්ථූනි සමණො ගොතමො නානුජානාති. තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි සමාදය වත්තාමා''ති.

තත්ථ යෙ තෙ මනුස්සා අස්සද්ධා අප්පසන්නා දුබ්බුද්ධිනො තෙ එවමාහංසු: ''ඉමෙ ඛො සමණා[1] ධුතා සල්ලෙඛවුත්තිනො. සමණො පන ගොතමො බාහුලිකො බාහුල්ලාය චෙතෙතී''ති. යෙ පන තෙ මනුස්සා සද්ධා පසන්නා පණ්ඩිතා බුද්ධිමන්තො තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම දෙවදත්තො භගවතො සඞ්ඝභෙදාය පරක්කමිස්සති චක්කභෙදායා''ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම දෙවදත්තො සඞ්ඝභෙදාය පරක්කමිස්සති චක්කභෙදායා''ති.

26. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. ''සච්චං කිර ත්වං දෙවදත්ත සඞ්ඝභෙදාය පරක්කමසි චක්කභෙදායා''ති.

''සච්චං භගවා''.

''අලං දෙවදත්ත. මා තෙ රුච්චි සඞ්ඝභෙදො. ගරුකො ඛො දෙවදත්ත සඞ්ඝභෙදො. යො ඛො දෙවදත්ත සමග්ගං සඞ්ඝං භින්දති, කප්පට්ඨිතිකං කිබ්බිසං පසවති, කප්පං නිරයම්හි පච්චති. යො ච ඛො දෙවදත්ත භින්නං සඞ්ඝං සමග්ගං කරොති, බ්‍රහ්මං පුඤ්ඤං පසවති, කප්පං සග්ගම්හි මොදති. අලං දෙවදත්ත. මා තෙ රුච්චි සඞ්ඝභෙදො. ගරුකො ඛො දෙවදත්ත සඞ්ඝභෙදො''ති.

1. සමණා සක්‍යපුත්තියා, - සිමු.

"ඇවැත්නි, අපි මහණ ගොයුම්හු කරා එළැඹ මෙසේ වස්තු පසක් ඉල්ලුමු: 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කරුණින් අල්පේච්ඡ බවේ... වීර්‍ය්‍යාරම්භයේ ගුණ වදරන සේක. වහන්ස, මේ පංච වස්තුහු නොයෙක් කරුණින් අල්පේච්ඡතාව පිණිස... වීර්‍ය්‍යාරම්භය පිණිස පවත්නාහ. වහන්ස, භික්ෂූහු දිවි හිම් කොට ආරණ්‍යක වන්නාහු නම් මැනව... දිවි හිම් කොට දියමස් ගොඩමස් නො කන්නාහු නම් මැනව. යමෙක් දියමස් ගොඩමස් කන්නේ වී නම්, වරද ඔහු ස්පර්ශ කරන්නේ යැ' යනුවෙනි. මහණ ගොයුම් තෙම මේ පංච වස්තූන් නො අනුදනී. (එහෙත්) ඒ අපි මේ පංච වස්තූන් සමාදන් කොට ගෙන පවතිමු" යි

ඔවුන් අතුරෙහි යම් මිනිස් කෙනෙක් සැදැ නැත්තෝ ද, සස්න කෙරෙහි නො පහන් වූවෝ ද දුර්බුද්ධීහු ද ඔහු "මේ මහණහු වනාහි ධූත ගුණ ඇත්තෝ ය, කෙලෙස් ලියාලන පැවැතුම් ඇත්තෝ ය. මහණ ගොයුම් වනාහි ප්‍රත්‍යය බහුල බව ඇත්තෙකි, ප්‍රත්‍යය බහුල බව පිණිස සිතා යැ" යි කීහ. යම් මිනිස් කෙනෙක් සැදූහැ ඇත්තෝ ද සස්නෙහි ප්‍රසන්න ද පණ්ඩිත ද බුද්ධිමත් ද ඔහු "කෙසේ නම් දෙව්දත් තෙම සංඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස උත්සාහ කරන්නේ දැ"යි ලාමක කොට සිතත්, ගරහත්, නුගුණ පතුරුවත්. භික්ෂූහු ඒ ලාමක කොට සිතන, ගරහන, නො ගුණ පතුරුවන මිනිසුන්ගේ කථා ඇසූවෝ ම ය. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ ද ... ඔහු "කෙසේ නම් දෙව්දත් සංඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස උත්සාහ කරන්නේ දැ"යි ලාමක කොට කියත්, ගරහත්, නොගුණ පතුරුවත්.

26. එ කල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ, "දෙවදත්තයෙනි, තෙපි සංඝ භෙදය පිණිස, චක්‍රභෙදය පිණිස තැත් කරහු ලු. ඒ සැබෑ දැ"යි අසාවදළහ.

"සැබෑ ය, භාග්‍යවතුන් වහන්සැ"යි දෙව්දත් කී ය.

"දේවදත්තයෙනි, එය නො සුදුසු ය. තොපට සංඝභේදය රිසි නො වේවා. දේවදත්තයෙනි, සංඝභේදය බර පවෙකි. දේවදත්තයෙනි, යමෙක් සමග සංඝයා බිඳලන්නේ නම් හේ කල්පස්ථායී පාපයක් රැස් කරයි. කල්පයක් නිරයෙහි පැසෙයි. දේවදත්තයෙනි, යමෙක් වනාහි භින්න වූ සංඝයා සමග කරන්නේ ද හේ මහත් පින් රැස් කෙරෙයි. කල්පයක් ස්වර්ගයෙහි සතුටු වෙයි. දේවදත්තයෙනි, නො සුදුසු ය. තොපට සංඝභේදය නො රිසියේවා. දේවදත්තයෙනි, සංඝ භෙදය ඒකාන්තයෙන් බර පවෙකි" යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො දෙවදත්තො ආයස්මන්තං ආනන්දං රාජගහෙ පිණ්ඩාය චරන්තං. දිස්වාන යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: "අජ්ජතග්ගෙ දනාහං ආවුසො ආනන්ද අඤ්ඤත්‍රෙව භගවතා අඤ්ඤත්‍රෙව භික්ඛුසඞ්ඝා උපොසථං කරිස්සාමි, සඞ්ඝකම්මං කරිස්සාමී"ති.

අථ ඛො ආයස්මා ආනන්දො රාජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසිං. අද්දසා ඛො මං භන්තෙ දෙවදත්තො රාජගහෙ පිණ්ඩාය චරන්තං. දිස්වාන යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච: "අජ්ජතග්ගෙ දනාහං ආවුසො ආනන්ද අඤ්ඤත්‍රෙව භගවතා අඤ්ඤත්‍රෙව භික්ඛුසඞ්ඝා උපොසථං කරිස්සාමි, සඞ්ඝකම්මං කරිස්සාමී"ති. අජ්ජ භන්තෙ දෙවදත්තො සඞ්ඝං භින්දිස්සතී"ති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

සුකරං සාධුනා සාධු සාධු පාපෙන දුක්කරං,<br>
පාපං පාපෙන සුකරං පාපමරියෙහි දුක්කරන්ති.

## දුතියං භාණවාරං

එකල්හි වනාහි ආනඳ තෙරණුවෝ පෙරවරු සමයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන රජගහ නුවරට පිඬුපිණිස පිවිසිය හ. දෙව්දත් තෙර රජගහ නුවර පිඬුපිණිස හැසිරෙන ආනඳ තෙරුන් දුටුයේ ය. දැක ඔබ වෙත එළැඹියේ ය. එළැඹ ආනඳ තෙරුන් බණවා, ''ඇවැත් ආනන්‍දයෙනි, අදින් මත්තෙහි මම් භාග්‍යවතුන් වහන්සේ ගෙන් වෙන් ව ම භික්ෂුසංඝයා ගෙන් වෙන් ව ම පොහෝ කරන්-නෙමි, සඞ්ඝකම් කරන්නෙමි''යි කී ය.

ඉක්බිති ආනඳ තෙරණුවෝ රජගහ නුවර පිඬු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා ඇක්මුණාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ ඔබ වැඳ පසෙක ඉඳගත්හ. පසෙක හුන්නාවූ ආනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, මෙහි මම් පෙර වරුයෙහි හැඳපෙරෙව, පාසිවුරුගෙන රජගහ නුවර පිඬුපිණිස පිවිසියෙමි. වහන්ස, දෙව්දත් තෙරණුවෝ රජගහ නුවර පිඬුපිණිස හැසිරෙන මා දුටහ. දැක මා කරා එළැඹියාහ. එළැඹ, මා අමතා 'ඇවැත් ආනන්‍දයෙනි, අදින් මත්තෙහි මම් භාග්‍යවතුන් වහන්සේගෙන් වෙන් ව ම භික්ෂුසඞ්ඝයාගෙන් වෙන් ව ම පොහොය කරන්නෙමි, සඞ්ඝකම් කරන්නෙමි'යි කීහ. වහන්ස, දෙව්දත් තෙරණුවෝ අද සඞ්ඝයා භෙද කරන්නාහ''යි සැලකළාහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණු දැක එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

''සත්පුරුෂයා විසින් හොඳ දැ ලෙහෙසියෙන් කළ හැක්ක. අසත්පුරුෂයා විසින් හොඳ දැ කරනු ලෙහෙසි නො වේ: පාපයා විසින් පාපය ලෙහෙසියෙන් කළ හැක්ක: ආය්‍ර්‍යයන් විසින් පාපය කළ නො හැක්කැයි.''

**දෙවෙනි බණවරයි.**

1. අථ ඛො දෙවදත්තො තදහුපොසථෙ උට්ඨායාසනා සලාකං ගාහෙසි: "මයං ආවුසො සමණං ගොතමං උපසඞ්කමිත්වා පඤ්ච වත්ථූනි යාචිම්හ:

භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී. ඉමානි භන්තෙ පඤ්ච වත්ථූනි අනෙකපරියායෙන අප්පිච්ඡතාය -පෙ- විරියාරම්භාය සංවත්තන්ති, සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤිකා අස්සු. යො ගාමන්තං ඔසරෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය -පෙ- යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං. යො මච්ඡමංසං ඛාදෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍යාති. ඉමානි පඤ්ච වත්ථූනි සමණො ගොතමො නානුජානාති. තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි සමාදාය වත්තාම. යස්සායස්මතො ඉමානි පඤ්ච වත්ථූනි ඛමන්ති[1] සො සලාකං ගණ්හාතූ"ති.

තෙන ඛො පන සමයෙන වෙසාලිකා වජ්ජිපුත්තකා පඤ්චමත්තානි භික්ඛුසතානි නවකා චෙව හොන්ති අප්පකතඤ්ඤුනො ච. තෙ 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති' සලාකං ගණ්හිංසු.

අථ ඛො දෙවදත්තො සඞ්ඝං භින්දිත්වා පඤ්චමත්තානි භික්ඛුසතානි ආදාය යෙන ගයාසීසං තෙන පක්කාමි.

අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: "දෙවදත්තො භන්තෙ සඞ්ඝං භින්දිත්වා පඤ්චමත්තානි භික්ඛුසතානි ආදාය යෙන ගයාසීසං තෙන පක්කන්තො"ති.

"න හි නාම තුම්හාකං සාරිපුත්තා තෙසු නවකෙසු භික්ඛූසු කාරුඤ්ඤම්පි භවිස්සති. ගච්ඡථ තුම්හෙ සාරිපුත්තා, පුරා තෙ භික්ඛූ අනයව්‍යසනං ආපජ්ජන්තී"ති. "එවං භන්තෙ"ති ඛො සාරිපුත්තමොග්ගල්ලානා භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ගයාසීසං තෙන පක්කමිංසු.

1. ඛමති - වි.

1. එකල්හි දෙව්දත් තෙම එ පොහෝ දිනෙහි අස්නෙන් නැඟීසිට සලාක ගැන්විය: "ඇවැත්නි, අපි මහණ ගොයුම්හු කරා එළැඹ (මෙහි මතු දැක්වෙන පරිදි) වස්තු පසක් ඉල්ලූමු:

'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කරුණින් අල්පේච්ඡ බවේ යථාලාභසන්තොෂයේ සල්ලෙඛයේ ධූතගුණයේ ප්‍රාසාදික බවේ යටත් පැවැත්මේ වීර්‍ය්‍ය වැඩීමේ ගුණ කියනසුලු කෙනෙක. වහන්ස, මේ මතු කියැවෙන පඤ්ච වස්තූහු නොයෙක් කරුණින් අල්පේච්ඡ බව පිණිස ...වීර්‍ය්‍යාරම්භය පිණිස 'පවතිත්'. වහන්ස, භික්ෂූහු දිවි හිමි කොට ආරණ්‍යක වන්නාහු නම් මැනව. යමෙක් ග්‍රාමාන්තයට බස්නේ නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය ... වහන්ස, දිවි හිමි කොට භික්ෂූහු දියමස් ගොඩමස් නො කන්නාහු නම් මැනව. යමෙක් දියමස් ගොඩමස් කැයේ වී නම් වරද ඔහු ස්පර්ශ කරන්නේ ය' යනු ය. මහණ ගොයුම් තෙම මේ වස්තු පස නො අනුදනී. (එහෙත්) ඒ අපි මේ වස්තු පස සමාදන් කොටගෙන පවතිමු. යම් ආයුෂ්මතක්හට මේ පඤ්ච වස්තූහු රිසියෙත් ද මෙහේ සලාකාව ගනී වා"යි කියා සලාකා ගැන්විය.

එ සමයෙහි විසල්පුර වැසි පන්සියක් පමණ වූ භික්ෂූහු නවක (අළුත පැවිදිවූවාහු) වූවාහු බුද්ධප්‍රඥප්ත ශික්ෂාපදයන්ගේ යථාතත්ත්වය නො දන්නාහු ද වෙත්. ඔහු 'මේ ධර්‍මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ'යි සිතා සලාකා ගත්හ.

ඉක්බිති දෙව්දත් තෙම මෙසේ සඞ්ඝභෙදය කොට පන්සියක් පමණ වූ (ඒ) භික්ෂූන් ගෙන ගයාශීර්ෂය බලා නික්මියේ ය.

එ කල්හි සැරියුත් මුගලන් දෙ නම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියාහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්හ. පසෙක හුන් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, දෙව්දත් තෙරණුවෝ සංඝයා බිඳ පන්සියක් පමණ භික්ෂූන් ගෙන ගයාශීර්ෂය කරා ගියාහ"යි සැලකළාහ.

"ශාරිපුත්‍රයෙනි, ඒ නවක භික්ෂූන් කෙරෙහි තොපගේ කරුණාවකුදු නො වියයුතු ද, ශාරිපුත්‍රයෙනි, ඒ භික්ෂූන් අනය-ව්‍යසනයට පැමිණෙන්නට පෙරාතුව තෙපි යවු"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. "එසේය, වහන්සැ"යි කියා සැරියුත් මුගලන් දෙ නම පිළිවදන් දී අස්නෙන් නැගී සිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගයාශීර්ෂය බලා නික්මුණාහ.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භගවතො අවිදූරෙ රොදමානො ඨිතො හොති. අථ ඛො භගවා තං භික්ඛුං එතදවොච: "කිස්ස ත්වං භික්ඛු රොදසී"ති.

"යෙපි තෙ භන්තෙ භගවතො අග්ගසාවකා සාරිපුත්ත මොග්ගල්ලානා තෙපි දෙවදත්තස්ස සන්තිකෙ ගච්ඡන්ති, දෙවදත්තස්ස ධම්මං රොචෙන්තා"ති.

"අට්ඨානමෙතං භික්ඛු අනවකාසො යං සාරිපුත්තමොග්ගල්ලානා දෙවදත්තස්ස ධම්මං රොචෙය්‍යුං. අපි ච තෙ ගතා භික්ඛූනං සඤ්ඤත්තියා"ති.

2. තෙන ඛො පන සමයෙන දෙවදත්තො මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො හොති. අද්දසා ඛො දෙවදත්තො සාරිපුත්ත මොග්ගල්ලානෙ දූරතො ව ආගච්ඡන්තෙ. දිස්වාන භික්ඛූ ආමන්තෙසි. "පස්සථ භික්ඛවෙ යාව ස්වාක්ඛාතො මයා ධම්මො, යෙපි තෙ සමණස්ස ගොතමස්ස අග්ගසාවකා සාරිපුත්තමොග්ගල්ලානා තෙපි මම සන්තිකෙ ආගච්ඡන්ති; මම ධම්මං රොචෙන්තා"ති. එවං වුත්තෙ කොකාලිකො දෙවදත්තං එතදවොච: "මා ආවුසො දෙවදත්ත සාරිපුත්තමොග්ගල්ලානෙ විස්සසි. පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසංගතා"ති.

"අලං ආවුසො. ස්වාගතං තෙසං යතො මෙ ධම්මං රොචෙන්තී"ති.

අථ ඛො දෙවදත්තො ආයස්මන්තං සාරිපුත්තං උපඩ්ඪාසනෙන නිමන්තෙසි: "එහාවුසො සාරිපුත්ත ඉධ නිසීදහී"ති.

"අලං ආවුසො"ති ඛො ආයස්මා සාරිපුත්තො අඤ්ඤතරං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. ආයස්මාපි ඛො මහාමොග්ගල්ලානො අඤ්ඤතරං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

අථ ඛො දෙවදත්තො බහුදෙවරත්තිං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා ආයස්මන්තං සාරිපුත්තං අජ්ඣෙසි: "විගතථීනමිද්ධො ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුසඞ්ඝො. පටිභාතු තං ආවුසො සාරිපුත්ත භික්ඛූනං ධම්මීකථා. පිට්ඨි මෙ ආගිලායති. තමහං ආයමිස්සාමී"ති. "එවමාවුසො"ති ඛො ආයස්මා සාරිපුත්තො දෙවදත්තස්ස පච්චස්සොසි.

අථ ඛො දෙවදත්තො චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සෙය්‍යං කප්පෙසි. තස්ස කිලමන්තස්ස මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස මුහුත්තෙනෙව[1] නිද්දා ඔක්කමි.

---

1. මුහුත්තකෙනෙව - මජසං

එසමයෙහි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි හඬමින් සිටියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'මහණ කවර හෙයින් තෝ හඬහි ද?'යි අසාවදාළසේක.

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ අගසවු වූ යම් සැරියුත් මුගලන් දෙනමෙක් වූහු ද, ඔබ දෙදෙනා ද දෙව්දතුගේ දහම රිසියෙන්නාහු ඔහු වෙත යෙති''යි හේ කී ය.

''මහණ, සැරියුත් මුගලන් දෙ දෙනා දෙව්දතුගේ දහම රිසි කරන්නාහ යන මෙය නො කරුණෙක, සිදුවන්නට අවකාශ නැත්තෙක. වැලි දු ඔහු භික්ෂූනට (යථා තත්ත්වය) හැඳින්වීම පිණිස ගියාහ''යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

2. එ සමයෙහි වනාහි දෙව්දත් තෙම මහත් පිරිසක් විසින් පිරිවැරුණේ දම් දෙසමින් හුන්නේ වෙයි. දෙව්දත් තෙම දුරින් ම එන්නා වූ සැරියුත් මුගලන් දෙ නම දිටී ය. දැක භික්ෂූන් බණවා, ''මහණෙනි, බලවු. මා විසින් ධර්මය කොතරම් මනා කොට කියන ලද්දේද, මහණ ගොයුම්හුගේ අගසවු වූ සැරියුත් මුගලන් දෙදෙනා ද මගේ ධර්මයට රුචි කරන්නාහු මා වෙත එත්''යැ යි කී ය. මෙසේ කී කල්හි කොකාලික මහණ තෙම දෙව්දතුට ''ඇවැත් දෙව්දතුනි, සැරියුත් මුගලනුන් නො අදහවු. සැරියුත් මුගලන් දෙදෙනා ලාමක ආශා ඇත්තෝය. ලාමකාශාවනට වශග වූවෝය''යිකීය.

''ඇවැත්නි, කම් නැත. මගේ දහම රිසියෙන හෙයින් ඔවුන්ගේ මනා පැමිණීමෙකි (ඔවුන් පිළිගනිමි)''යි දෙව්දත් කී ය.

ඉක්බිති දෙව්දත් තෙම ''ඇවැත් ශාරිපුත්‍රයෙනි, එවු, මෙහි වැඩ ඉඳිවු''යැ යි සැරියුත් තෙරුන් සිය අස්නෙන් අඩෙකින් නිමැතී ය. (තමා හුන් ආසනයෙන් අඩක් පෙන්වා 'මෙහි වැඩ ඉන්නැ'යි කැඳැවීය).

''කම් නැත, ඇවැත්නි''යි කියා සැරියුත් තෙරණුවෝ අන් එක්තරා අස්නක් ගෙන පසෙක හුන්හ. මහමුගලන් තෙරණුවෝ ද එක්තරා අස්නක් ගෙන පසෙක උන්හ.

එකල්හි දෙව්දත් භික්ෂූනට රෑ බොහෝ වේලා දහම් කථායෙන් කරුණු දක්වා එය ගන්වා, එහි උනන්දු කරවා, සතුටු කොට සැරියුත් තෙරුන් අමතා, ''ඇවැත් ශාරිපුත්‍රයෙනි, භික්ෂු සංඝ තෙම පහවූ ථීනමිද්ධය ඇත්තේ ය. ඇවැත් ශාරිපුත්‍රයෙනි, භික්ෂූනට (කළයුතු) ධර්මකථාවෙක් ඔබට වැටහේවා (භික්ෂූනට දම් දෙසන්න). මගේ පිට රිදෙයි. එය දිග හරින්නෙමි''යි කී ය. ''එසේ ය, ඇවැත්නි''යි සැරියුත් තෙරණුවෝ දෙව්දතුට පිළිවදන් දුන්හ.

ඉක්බිති දෙව්දත් තෙම සඟළසිවුර සතරපට කොට පනවා දකුණැලයෙන් වැදහොත්තේ ය. ක්ලාන්ත වූ සිහිමුළා වූ නුවණින් තොර වූ ඔහුට මොහොතින් ම නිද්‍රොපගමය විය.

අථ ඛො ආයස්මා සාරිපුත්තො ආදෙසනාපාටිහාරියානුසාසනියා භික්ඛූ ධම්මියා කථාය ඔවදි, අනුසාසි. ආයස්මා මහාමොග්ගල්ලානො ඉද්ධිපාටිහාරියානුසාසනියා භික්ඛූ ධම්මියා කථාය ඔවදි, අනුසාසි. අථ ඛො තෙසං භික්ඛූනං ආයස්මතා සාරිපුත්තෙන ආදෙසනාපාටිහාරියානුසාසනියා ආයස්මතා මහාමොග්ගල්ලානෙන ඉද්ධිපාටිහාරියානුසාසනියා ඔවදියමානානං අනුසාසියමානානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි "යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති".

අථ ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: "ගච්ඡාම මයං ආවුසො භගවතො සන්තිකෙ. යො තස්ස භගවතො ධම්මං රොචෙති සො ආගච්ඡතූ"ති. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා තානි පඤ්ච භික්ඛුසතානි ආදාය යෙන වෙළුවනං තෙනුපසඞ්කමිංසු. අථ ඛො කොකාලිකො දෙවදත්තං උට්ඨාපෙසි: උට්ඨෙහි ආවුසො දෙවදත්ත. නීතා තෙ භික්ඛූ සාරිපුත්තමොග්ගල්ලානෙහි. නනු ත්වං ආවුසො දෙවදත්ත මයා වුත්තො 'මා ආවුසො දෙවදත්ත, සාරිපුත්තමොග්ගල්ලානෙ විස්සසි. පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසංගතා'ති.? අථ ඛො දෙවදත්තස්ස තත්ථෙව උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි.

3. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: "සාධු භන්තෙ භෙදකානුවත්තකා භික්ඛූ පුන උපසම්පජ්ජෙය්‍යුන්ති".

"අලං සාරිපුත්ත. මා තෙ රුච්චි භෙදකානුවත්තකානං භික්ඛූනං පුන උපසම්පදා. තෙන හි ත්වං සාරිපුත්ත භෙදකානුවත්තකෙ භික්ඛූ ථුල්ලච්චයං දෙසාපෙහි".

"කථං පන තෙ සාරිපුත්ත දෙවදත්තො පටිපජ්ජී"ති.

"යථෙව භන්තෙ භගවා බහුදෙව රත්තිං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා මං අජ්ඣෙසති: "විගතථිනමිද්ධො ඛො සාරිපුත්ත භික්ඛුසඞ්ඝො, පටිභාතු තං සාරිපුත්ත භික්ඛූනං ධම්මී කථා. පිට්ඨි මෙ ආගිලායති. තමහං ආයමිස්සාමී'ති. එවමෙව ඛො මෙ භන්තෙ දෙවදත්තො පටිපජ්ජී"ති.

ඉක්බිති සැරියුත් තෙරණුවෝ ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍යයෙන් ද අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍යයෙන් ද යුක්ත කොට භික්ෂූනට දැහැමි කතායෙන් අනුශාසනා කළහ. මහමුගලන් තෙරණුවෝ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන් ද අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍යයෙන් ද යුක්ත කොට ධර්මකථායෙන් භික්ෂූනට අනුශාසනා කළහ. එකලැ සැරියුත් තෙරුන් විසින් ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය දෙකින් ද, මහමුගලන් තෙරුන් විසින් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය දෙකින් ද ඔවා දෙනු ලබන, අනුශාසන කරනු ලබන ඒ භික්ෂූනට ''උපදනාසුලු සියල්ල නැසෙනසුලු යැ''යි කෙලෙස් රජස් රහිත පහ වූ කෙලෙස් මල ඇති දහම් ඇස පහළ විය.

එයින් පසු සැරියුත් තෙරණුවෝ භික්ෂූන් අමතා ''ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත යමු. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය රිසි කරන තැනැත්තෝ (අප හා) ඒවා''යි වදළාහ. ඉක්බිති සැරියුත්මුගලන් දෙ නම ඒ පන්සියක් භික්ෂූන් ගෙන වෙළුවනය කරා එළැඹියාහ. එවිට කොකාලික මහණ තෙම ''ඇවැත් දෙව්දතුනි, නැගී සිටින්න, ඒ භික්ෂූහු සැරියුත්මුගලන් දෙදෙනා විසින් ගෙනයන ලදහ. 'ඇවැත් දෙව්දතුනි, සැරියුත් මුගලනුන් නො අදහවු. සැරියුත් මුගලන්හු ලාමක ආශා ඇත්තාහ. ලාමක ඊර්ෂ්‍යාවනට වශග වූවෝ යැ'යි මා විසින් ඔබ නො කියන ලද්දෝ ද ''යි කියා දෙව්දතු පුබුදුවා ලී ය. එවිට දෙව්දතුට එතන්හි මුවින් උණුලේ නික්මිණ.

3. ඉක්බිති සැරියුත් මුගලන් දෙ නම භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩියාහ. වැඩ ඔබ වැඳ පසෙක හිඳගත්හ. එක් පසෙක හුන්නාවූ සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, භෙදනුවර්තක (සංඝභෙදකයන් අනුව පැවැති) මහණහු යළිදු උපසපුව ලබන්නාහු නම් මැනැවැ''යි කීහ.

''කම් නැත, ශාරිපුත්‍රයෙනි. භෙදකානුවර්තක භික්ෂූන් යළිත් උපසපන් කිරීම තොපට නො රිසියේවා. එබැවින් ශාරිපුත්‍රයෙනි, තෙපි භෙදකානුවර්තක භික්ෂූන් ලවා තුලැසි ඇවැත දෙසවවූ'' යයි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

(ඉක්බිති) භාග්‍යවතුන් වහන්සේ සැරියුත් තෙරුන් අමතා, ''ශාරිපුත්‍රයෙනි, දෙව්දත් තෙරණුවෝ තොප කෙරෙහි කෙසේ පිළිපැද්දහු ද?''යි අසාවදළසේක.

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් දැහැමි කතායෙන් භික්ෂූනට කරුණු දක්වා කරුණු ගන්වා, එහි උනන්දු කරවා, එහි සතුටු කරවා ''ශාරිපුත්‍රයෙනි, භික්ෂුසංඝ තෙම විනාහි පහ වූ ථිනමිද්ධය ඇත්තේ ය. ශාරිපුත්‍රයෙනි, භික්ෂූනට (කැරෙන) ධර්මකථාව තොපට වැටහේවා. මා පිට රිදෙයි, මම් එය දිගහරින්නෙමි''යි වදරා යම්සේ දම් දෙසන්නට මට විධාන කරනසේක් ද, එසේ ම වහන්ස, ඕ කෙරෙහි පිළිපන්නේ යැ යි'' සැරියුත් තෙරණුවෝ වදළාහ.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ''භූතපුබ්බං භික්ඛවෙ අරඤ්ඤායතනෙ මහාසරසී. තං නාගා උපනිස්සාය විහරිංසු. තෙ තං සරසිං ඔගාහෙත්වා සොණ්ඩාය භිසමුළාලං අබ්බුහිත්වා සුවික්ඛාලිතං වික්ඛාලෙත්වා අකද්දමං සංඛාදිත්වා අජ්ඣොහරන්ති. තෙසං තං වණ්ණාය චෙව හොති බලාය ච, න ච තතො නිදානං මරණං වා නිගච්ඡන්ති මරණමත්තං වා දුක්ඛං. තෙසංයෙව ඛො පන භික්ඛවෙ, මහානාගානං අනුසික්ඛමානා තරුණා භිංකච්ඡාපා තෙ තං සරසිං ඔගාහෙත්වා සොණ්ඩාය භිසමුළාලං අබ්බුහිත්වා න සුවික්ඛාලිතං වික්ඛාලෙත්වා සකද්දමං සංඛාදිත්වා අජ්ඣොහරන්ති. තෙසං තං නෙව වණ්ණාය හොති න බලාය. තතො නිදානං මරණං වා නිගච්ඡන්ති මරණමත්තං වා දුක්ඛං. එවමෙව ඛො භික්ඛවෙ දෙවදත්තො මමානුකුබ්බං කපණො මරිස්සතීති.

මහාවරාහස්ස මහිං විකුබ්බතො
භිසං ඝසානස්ස[1] නදීසු ජග්ගතො,
භිංකොව පඞ්කං අභිභක්ඛයිත්වා
මමානුකුබ්බං කපණො මරිස්සතී''ති.

4. ''අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහති. කතමෙහි අට්ඨහි: ඉධ භික්ඛවෙ භික්ඛු සොතා ච හොති සාවෙතා ච උග්ගහෙතා ච ධාරෙතා ච විඤ්ඤාතා ච විඤ්ඤාපෙතා ච කුසලො ච සහිතාසහිතස්ස නො ච කලහකාරකො. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහති.

අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො සාරිපුත්තො දූතෙය්‍යං ගන්තුමරහති. කතමෙහි අට්ඨහි: ඉධ භික්ඛවෙ සාරිපුත්තො සොතා ච හොති සාවෙතා ච උග්ගහෙතා ච ධාරෙතා ච විඤ්ඤාතා ච විඤ්ඤාපෙතා ච කුසලො ච සහිතාසහිතස්ස නො ච කලහකාරකො. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතො සාරිපුත්තො දූතෙය්‍යං ගන්තුමරහතී''ති.

''යො වෙ න බ්‍යථති[2] පත්වා පරිසං උග්ගවාදිනිං
න ච හාපෙති වචනං න ච ඡාදෙති සාසනං.
අසන්දිද්ධො ච අක්ඛාති පුච්ඡිතො ච න කුප්පති
ස වෙ තාදිසකො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහතී''ති.

1. ඝසමානස්ස (කෙසුචි)
2. ව්‍යාධති (සීමු)

එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදළ සේක: මහණෙනි, පෙර වූවක් කියමි. වන පෙදෙසෙක මහවිලෙක් විය. ඇත්තු එය නිසා වුසූහ. ඔහු එ විලට බැස සොඬින් නෙළුම් දඬු උදුරා මොනොවට සෝද මඩ නැති කොට සපා ගිලිත්. එය ඔවුනට පැහැපත් බව පිණිස ද ශරීර ශක්තිය පිණිස ද වේ. එය හේතු කොට ගෙන මරණයට හෝ මරණමාත්‍ර දුකකට හෝ නො ද පැමිණෙත්. මහණෙනි, ඔවුන් අතුරෙන් ඒ මහඇතුන් අනුව හික්මෙන තරුණ වූ යම් ඇත් පැටවු වෙත් ද ඔහු ඒ විලට බැස සොඬින් නෙළුම්දඬු උදුරා මනා කොට නො සෝද මඩ සහිත ව විකා ගිලිත්. ඔවුනට එය පැහැපත් බව පිණිස ද ශක්තිය පිණිස ද නො වේ. එය හේතු කොට ගෙන ඔහු මරණයට හෝ මරණයට සමාන දුකකට හෝ පැමිණෙත්. මහණෙනි, එසේ ම මා අනුකරණය කරන දෙව්දත්හු කෘපණ වැ (අනාථ වැ) මියෙන්නාහ.

"මිහි පිටැ විකුර්ණය කරන නදීන්හි පිළිදගුම් කරන මහ ඇතක්හු අනුකරණය කොට මඩ කා මැරෙන ඇත්පොව්වා සෙයින් මා අනුකරණය කරන දෙව්දත් ද අනාථ ව මිය යන්නේ ය."

4. "මහණෙනි, අංග අටෙකින් සමන්විත මහණ තෙමේ දූත කාර්‍ය්‍යයෙහි යන්නට සුදුසු ය. කවර අටින් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම කියන බසට මොනොවට කන්යොමු කෙරේ ද, අස්වන්නේ (කියන්නේත්) වේ ද, ඉගෙනගන්නේ වේ ද, උගත් දෑ සිතෙහි දරන්නේ වේ ද, කරුණු නුවණින් දැනගන්නේ වේ ද, සෙස්සනට දන්වන්නේ වේ ද, අර්ථනිඃශ්‍රිත වූ ද අර්ථනිඃශ්‍රිත නො වූද දෑ දැනීමෙහි දක්‍ෂ වේ ද, කලහකාරී නො වේ ද, මහණෙනි, මෙ කී අංග අටින් සමන්විත මහණ තෙම දූතගමන යන්නට සුදුසු වේ.

මහණෙනි, අංග අටෙකින් සමන්විත ශාරීපුත්‍ර තෙමේ දූත ගමන යන්නට සුදුසු ය. කවර අංග අටෙකින් ද යත්: මහණෙනි, මෙහි ශාරිපුත්‍ර තෙම ඇහුම් කන් දෙන්නේ ද අස්වන්නේ ද උගන්නේ ද සිතින් දරන්නේ ද දන්නේද දන්වන්නේද අර්ථනිඃශ්‍රිත වූ නිඃශ්‍රිත නොවූ දෑ දැනීමෙහි දක්‍ෂ වේද කලහකාරී නො වේද, මහණෙනි, මේ අංග අටින් සමන්විත ශාරීපුත්‍ර තෙමේ දූතකාර්‍ය්‍යය පිණිස යන්නට සුදුසු වේ."

"යමෙක් උග්‍රවාද ඇති පිරිසක් කරා පැමිණ නො පෙළේ ද, කියැයුතු වචනය පැහැර නො හරී ද, හස්න නො ම වසාලයි ද, සැක නැති ව කියැයුතු වචනය කියයි ද, කරුණු විචාරන ලද්දේ නො කිපෙයි ද, ඒකාන්තයෙන් එබඳු මහණ තෙම දූතබව්හි යන්නට සුදුසු වේ."

"අට්ඨහි භික්ඛවෙ අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි අට්ඨහි: ලාභෙන භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. අලාභෙන භික්ඛවෙ -පෙ- යසෙන භික්ඛවෙ -පෙ- අයසෙන භික්ඛවෙ -පෙ- සක්කාරෙන භික්ඛවෙ -පෙ- අසක්කාරෙන භික්ඛවෙ -පෙ- පාපිච්ඡතාය භික්ඛවෙ -පෙ- පාපමිත්තතාය භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

සාධු භික්ඛවෙ භික්ඛු උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නංසක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං -පෙ- අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය.

කිං ච භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය. උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය භික්ඛවෙ උප්පන්නං ලාභං අනභිභුය්‍ය අනභිභුය්‍ය විහරතො උප්පජ්ජෙය්‍යුං විහරෙය්‍ය. යංහි'ස්ස ආසවා විඝාතපරිළාහා උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති.

යං හි'ස්ස භික්ඛවෙ උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අනභිභුය්‍ය අනභිභුය්‍ය විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති.

ඉදං ඛො භික්ඛවෙ භික්ඛු අත්ථවසං පටිච්ච උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය. උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය, තස්මාතිහ භික්ඛවෙ උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරිස්සාම - උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරිස්සාමා'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

"මහණෙනි, අසද්ධර්‍ම අටෙකින් මැඩුණු, එයින් දැඩි කොට ගන්නා ලද සිත් ඇති දෙව්දත් තෙම අපායගාමී වූයේ නිරයගාමී වූයේ කල්පයක් නිරයෙහි සිටින්නෙක් වනුයේ එය වළක්වාලන්නට කළහැකි පිළියමක් නැත්තෙක් වූයේ වෙයි. කවර අසද්ධර්‍ම අටින් ද යත්: මහණෙනි, දෙව්දත් තෙම ලාභයෙන් මැඩුණේ, දැඩි කොට ගන්නා ලද සිතැත්තේ, අපාය පිණිස පවත්නේ, නිරය පිණිස පවත්නේ, කපක් නිරයේ සිටින්නේ, එය නවතාලන පිළියම් නැත්තේ වෙයි. මහණෙනි, දෙව්දත් තෙම අලාභයෙන්... යසසින්... අයසසින් සත්කාරයෙන්... අසත්කාරයෙන්... ලාමක ඊර්ෂ්‍යා ඇති බැවින්... පවිටු මිතුරන් ඇති බැවින් මැඩුණේ, දැඩි ලෙස ගන්නා ලද සිතැත්තේ, අපාය පිණිස පවත්නේ, නිරය පිණිස පවත්නේ, කපක් නිරයෙහි සිටින්නෙක් වන්නේ, එය නවතාලන පිළියමක් නැත්තේ වෙයි. මහණෙනි, මේ අසද්ධර්‍ම අටින් මැඩුණු . දැඩිලෙස ගන්නා ලද සිතැති දෙව්දත් තෙමේ ආපායික වූයේ නෛරයික වූයේ කල්පයක් නිරයේ සිටුනේ පිළියම් නැත්තේ වෙයි.

මහණෙනි, මහණ තෙම උපන් ලාභය මැඩ ගෙන මැඩ ගෙන වසන්නේ නම් මැනැවි. උපන් අලාභය... උපන් යශස... උපන් අයශස... උපන් සත්කාරය... උපන් අසත්කාරය, උපන් පාපෙච්ඡතාව... උපන් පාපමිත්‍රතාව... මැඩ මැඩ වසන්නේ නම් මැනව.

මහණෙනි, යම් හෙයෙකින් උපන් ලාභය නො මැඩ නො මැඩ වසන ඔහුට ආශ්‍රවයෝ ද විඝාත පීඩාවෝ ද සිත් දැවිලි ද උපදනාහු ද, උපන් ලාභය මැඩ මැඩ වසන ඔහුට මෙසේ ඒ ආශ්‍රවයෝ, ඒ සිත් පෙළුම් හා සිත් දැවිලි නො වෙත්.

මහණෙනි, යම් හෙයෙකින් උපන් අලාභය... උපන් යශස... උපන් අයශස... උපන් සත්කාරය... උපන් අසත්කාරය... උපන් පාපෙච්ඡතාව... උපන් පාපමිත්‍රතාව නො මැඩ නො මැඩ වසන ඔහුට ආශ්‍රව කෙනෙක් විඝාතපරිදාහ කෙනෙක් උපදනාහු නම්, උපන් පාපමිත්‍රතාව මැඩ මැඩ වසන ඔහුට මෙසේ ඒ ආශ්‍රවයෝ විඝාත පරිදාහයෝ නො වෙත්.

මහණෙනි, මහණ තෙම මේ කරුණ නිසා උපන් ලාභය මැඩ මැඩ වසන්නේ ද උපන් අලාභය... උපන් යශස... උපන් අයශස... උපන් සත්කාරය... උපන් අසත්කාරය... උපන් පාපෙච්ඡතාව.. උපන් පාපමිත්‍රතාව මැඩ මැඩ වසන්නේ ය. මහණෙනි, එහෙයින් "උපන් ලාභය මැඩ මැඩ වසන්නමු, උපන් අලාභය... උපන් යශස... උපන් අයශස.. උපන් සත්කාරය... උපන් අයත්කාරය... උපන් පාපෙච්ඡතාව ... උපන් පාපමිත්‍රතාව මැඩ මැඩ වසන්නමු"යි මෙසේ ම තොප විසින් හික්මියැ යුතු.

5. "තීහි භික්ඛවෙ අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි තීහි: පාපිච්ඡතා පාපමිත්තතා ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරාවොසානං ආපාදි. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො''ති.

1. "මා ජාතු කොචි ලොකස්මිං පාපිච්ඡො උදපජ්ජථ,
තදමිනා'පි[1] විජානාථ[2] පාපිච්ඡානං යථා ගති.

2. පණ්ඩිතොති සමඤ්ඤාතො භාවිතත්තොති සම්මතො,
ජලං'ව යසසා අට්ඨා දෙවදත්තො'ති මෙ සුතං.

3. සො පමාදමනුචිණ්ණො[3] ආසජ්ජ නං තථාගතං,
අවීචිනිරයං පත්තො චතුද්වාරං භයානකං

4. අදුට්ඨස්ස හි යො දුබ්භෙ පාපකම්මං අකුබ්බතො
තමෙව පාපං ඵුසති දුට්ඨචිත්තං අනාදරං.

5. සමුද්දං විසකුම්භෙන යො මඤ්ඤෙය්‍ය පදූසිතුං.
න සො තෙන පදූසෙය්‍ය භිස්මා[4] හි උදධි මහා.

6. එවමෙව තථාගතං යො වාදෙනුපහිංසති
සම්මග්ගතං[5] සන්තචිත්තං වාදො තම්හි න රූහති,

7. තාදිසං මිත්තං කුබ්බෙථ තං ච සෙවෙථ පණ්ඩිතො
යස්ස මග්ගානුගො භික්ඛු ඛයං දුක්ඛස්ස පාපුණෙ''ති.

---

1. තදමිනා - සිමු.
2. ජානාථ - මජසං, සයා
3. පමාදං අනුචිණ්ණො - මජසං.
4. භෙස්මා - සිමු. භස්මා - මජසං
5. සම්මාගතං - සිමු.

5. ''මහණෙනි, අසත් ස්වභාව තුනෙකින් මැඩුණු හාත්පසින් ගන්නා ලද සිතැති දෙව්දත් තෙම ආපායිකයෙක් (අපාය උරුම කොටැත්තෙක්), නෙරයිකයෙක් (නිරයෙහි උපදනාට නියත වූයෙක්), කල්පයක් ම නිරයෙහි සිටුනෙක්, පිළියම් ලැබිය නො හැක්කෙක් විය. කවර අසත් සවභාව තුනෙකින් ද යත්: ලාමක ආශා ඇති බව, පාපමිත්‍රයන් ඇති බව, අල්පමාත්‍ර විශෙෂාධිගමයෙන් (ලෞකිකධ්‍යාන හා අභිඥා ලෙශයක් ලැබීමෙන්) අතර මඟදී (නිෂ්ඨාවට නො පැමිණ ම නිෂ්ඨාවට පැමිණියෙමි'යි) ව්‍යවසානයට (කෙළවරට–තෘප්තියට) පැමිණියේය යන බව යන අසත් ස්වභාව තුන ය. මහණෙනි, මේ අසත් සවභාව තුනින් මැඩුණු හාත්පසින් ගන්නා ලද සිතැති දෙව්දත් තෙම ආපායික ද නෙරයික ද කල්පස්ථ ද අතෙකිච්ඡ ද විය''.

1. ''ලොවැ කිසි ම කලෙක ලාමක ඊප්සා (ලාභාශා) ඇතියෙක් පහළ නො වේවා. ලාමක ඊප්සා ඇතියන්ගේ ගතිය යම් බඳු වේ ද, එය මේ දෙව්දතුගෙන් ද දැන ගනිවු.

2. දෙව්දත් තෙම පණ්ඩිතයෙකැ යි (ලොවැස්සා විසින්) පිළිගන්නා ලද්දේ ය. භාවිතාත්මය (වඩනා ලද සිතැත්තෙකැ) යී ද සම්මත විය. යශසින් බබළමින් ම සිටියේ යැ යි ද මා විසින් අසන ලදී.

3. එබඳු වූ හෙතෙම ප්‍රමාදයට අනුව හැසුරුණේ (එළැඹ සිටි සිහිය නැති බව අනුව පැවැත්තේ) ඒ තථාගතයන් වහන්සේ ආසාදනය කොට (ලොහිතුප්පාදය කොට) සතර දෙරක් ඇති භයානක වූ අවීචිනිරයට පැමිණියේ ය.

4. යමෙක් පව්කම් නො කරන, දුෂ්ට නො වූවකුට ද්‍රෝහ කරන්නේ ද, පාපය තෙමේ ආදර සිත් නැති දුෂ්ට වූ ඒ පුද්ගලයා ම ස්පර්ශ කෙරෙයි.

5. යමෙක් විෂ පිරුණු කළයෙකින් මුහුද දූෂිත කරන්නට සිතන්නේ ද, එයින් හේ එය දූෂිත කළ හැකි නො වන්නේ ය. මුහුද මහත් ය, බිය උපදවන තරම් විශාලය. එ හෙයිනි.

6. එ පරිද්දෙන් ම යමෙක් මාන මගින් ගිය සත්භූත් සිතැති තථාගතයන් වහන්සේට වාදයෙන් හිංසා කරන්නට තැත් කෙරෙයි ද, එහෙත් උන්වහන්සේ කෙරෙහි වාදය නො නැගෙයි (රුහණය නො වේ).

7. යමකු ගිය මඟ අනුව යන මහණ තෙම දුඃඛයාගේ විනාශයට පැමිණෙන්නේ ද (සියලු කෙලෙස් නසන්නේ ද), නුවණැත්තේ එබන්දකු මිතුරකු කැරගන්නේ ය, එබන්දකු ම සෙවුනේ ය.

6. අථ ඛො ආයස්මා උපාලි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච: "සඞ්ඝරාජි සඞ්ඝරාජී'ති භන්තෙ වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො. කිත්තාවතා ච පන සඞ්ඝරාජි චෙව හොති සඞ්ඝභෙදො චා''ති.

"එකතො උපාලි එකො හොති එකතො ද්වෙ. චතුත්ථො අනුසාවෙති[1] සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො.''

"එකතො උපාලි ද්වෙ හොන්ති එකතො ද්වෙ පඤ්චමො අනුසාවෙති සලාකං ගාහෙති, 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථු-සාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො.''

"එකතො උපාලි ද්වෙ හොන්ති එකතො තයො. ඡට්ඨො අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථු සාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො.''

"එකතො උපාලි තයො හොන්ති, එකතො තයො. සත්තමො අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථු සාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො.''

"එකතො උපාලි තයො හොන්ති එකතො චත්තාරො, අට්ඨමො අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථු සාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො.''

1. අනුස්සාවෙති - මජ්ඣං

6. එසමයෙහි උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ, ඔබ වැඳ පසෙක ඉඳගත්හ. පසෙක හුන් උපාලි තෙරණුවෝ "වහන්ස, සඞ්ඝරාජී ය සඞ්ඝරාජියැ යි කියනු ලැබේ. වහන්ස, කොතෙකින් සඞ්ඝරාජිය වේ ද? එහෙත් සඞ්ඝභෙදය නො වේ ද? කොතෙකින් ම සඞ්ඝරාජියත් සඞ්ඝභෙදයත් යන දෙක ම වේ ද?" යි විචාළහ.

"උපාලි, ධර්මවාදී එක් පක්‍ෂයෙකින් එකෙක් වෙයි ද, අධර්මවාදී පක්‍ෂයෙකින් දෙදෙනෙක් වෙත් ද, සතර වැන්නෙක් 'මෙය ධර්මය යැ, මෙය විනය යැ, මෙය ශාස්තෘශාසනය යැ, මෙය පිළිගනිවු, මෙයට සතුටු වවු (මෙයට රිසි කරවු) යැ' යි අනුශ්‍රාවණය (අනුනට ඇස්වීම) කෙරේ ද, සලාකා ගන්වාද, උපාලි, මෙසේ ම සඞ්ඝරාජිය වෙයි, එහෙත් සඞ්ඝභෙදය නො වෙයි".

"උපාලි, ධර්මවාදී එක් පක්‍ෂයෙකින් දෙදෙනෙක් වෙත් ද, අධර්මවාදී එක් පක්‍ෂයෙකින් දෙදෙනෙක් වෙත් ද, පස් වැන්නෙක් (අධර්මවාදී වැ) 'මේ ධර්ම යැ, මේ විනය යැ, මේ ශාස්තෘ ශාසනය යැ, මෙය ගනිවු, මෙය රිසි කරවු යැ' යි අනුශ්‍රාවණය කෙරෙයි ද, සලාකා ගන්වයි ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, වැලිදු සඞ්ඝභෙදය නො වෙයි."

"උපාලි එක් පසෙකින් දෙදෙනෙක් වෙත් ද අනික් පසින් තුන් දෙනෙක් වෙත් ද, සවැන්නෙක් 'මේ ධර්ම යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය ගනිවු, මෙය රිසි කරවු යැ' යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, වැලිදු සඞ්ඝභෙදය නො වෙයි."

"උපාලි, එක් පසෙකින් තිදෙනෙක් වෙත් ද, අනික් පසිනුත් තිදෙනෙක් වෙත් ද, සත් වැන්නෙක් 'මේ ධර්ම යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය පිළිගනිවු මෙය රිසි කරවු' යි අනුශ්‍රාවණය කෙරෙයි ද, සලාකා ගන්වයි ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වේ, වැලිදු සඞ්ඝභෙදය නො වේ".

"උපාලි, එක් පසෙකින් තිදෙනෙක් වෙත් ද, අනික් පසින් සතර දෙනෙක් වෙත් ද, අටවැන්නෙක් 'මේ දහම යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ, මෙය ගනිවු මෙය රිසි කරවු' යි අනුශ්‍රාවණය කෙරෙයි ද, සලාකා ගන්වයි ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, වැලිදු සඞ්ඝභෙදය නො වෙයි".

''එකතො උපාලි චත්තාරො හොන්ති එකතො චත්තාරො. නවමො අනුස්සාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති. එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි චෙව හොති සඞ්ඝභෙදො ච. නවන්නං වා උපාලි අතිරෙකනවන්නං වා සඞ්ඝරාජි චෙව හොති සඞ්ඝභෙදො ච.''

''න ඛො උපාලි භික්ඛුනී සඞ්ඝං භින්දති. අපි ච භෙදය පරක්කමති. න සික්ඛමානා සඞ්ඝං භින්දති. අපි ච භෙදය පරක්කමති. න සාමණෙරො සඞ්ඝං භින්දති. අපි ච භෙදය පරක්කමති. න සාමණෙරී සඞ්ඝං භින්දති. අපි ච භෙදය පරක්කමති. න උපාසකො සඞ්ඝං භින්දති. අපි ච භෙදය පරක්කමති. න උපාසිකා සඞ්ඝං භින්දති. අපි ච භෙදය පරක්කමති. භික්ඛු ඛො උපාලි පකතත්තො සමානසංවාසකො සමානසීමායං ඨිතො සඞ්ඝං භින්දෙ''ති.

'සඞ්ඝභෙදො සඞ්ඝභෙදො'ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝො භින්නො හොතී''ති.

''ඉධුපාලි භික්ඛූ අධම්මං ධම්මො'ති දීපෙන්ති, ධම්මං අධම්මො'ති දීපෙන්ති, අවිනයං විනයොති දීපෙන්ති, විනයං අවිනයොති දීපෙන්ති, අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති, අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති; ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාතතෙනාති දීපෙන්ති, අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, අනාපත්තිං ආපත්තීති දීපෙන්ති, ආපත්තිං අනාපත්තීති දීපෙන්ති, ලහුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙන්ති, ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්ති, සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති, අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්ති, දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති. තෙ ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි අපකස්සන්ති[1], විපකස්සන්ති[2], ආවෙණිං[3] උපොසථං කරොන්ති, ආවෙණිං පවාරණං කරොන්ති, ආවෙණිං සඞ්ඝකම්මං කරොන්ති. එත්තාවතා ඛො උපාලි සඞ්ඝො භින්නො හොතී''ති.

---

1. අපකාසෙන්ති - සිමු.
2. අවපකාසෙන්ති - සිමු.
3. ආවෙණි - සිමු.

''උපාලි, එක් පසෙකින් සතර දෙනෙක් වෙත් ද, අනික් පසින් සතර දෙනෙක් වෙත් ද, නවවැන්නෙක් 'මේ දහම යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය ගනිවු, මෙය රිසි කරවු' යි අනුශ්‍රාවණය කෙරෙයි ද, සලාකා ගන්වයි ද, උපාලි, මෙසේ ම සඞ්ඝරාජිය ද සඞ්ඝභෙදය ද වේ. උපාලි, නවදෙනකුගෙන් ද නව දෙනකුට වැඩි ගණනෙකින් ද සඞ්ඝ රාජියත් සඞ්ඝභෙදයත් දෙක ම වේ.''

''උපාලි, මෙහෙණක් සඞ්ඝභෙදය නො කෙරෙයි වැලිදු සඞ්ඝභෙදය පිණිස තැත් කෙරෙයි. ශික්ෂමාණාව ද සඞ්ඝභෙදය නො කෙරෙයි. වැලිදු එයට තැත් කෙරෙයි. හෙරණෙක් සඞ්ඝ භෙදය නො කෙරෙයි, වැලිදු එයට තැත් කෙරෙයි. හෙරණියක් සඞ්ඝභෙදය නො කෙරෙයි, වැලිදු එයට තැත් කෙරෙයි. උපාසක යෙක් සඞ්ඝභෙදය නො කෙරෙයි. වැලිදු එයට තැත් කෙරෙයි. උපාසිකාවක් සඞ්ඝ භෙදය නො කෙරෙයි: වැලිදු සඞ්ඝ භෙදයට වෑයම් කරයි. උපාලි, සමාන සංවාසක වූ පුවතත් (පියෙවි මහණ දම ඇති) මහණ තෙමේ ම සමානසංවාස සීමායෙහි සිටියේ සඞ්ඝභෙදය කෙරෙයි'' වදාළසේක.

7. ''වහන්ස, සඞ්ඝභෙද යැ, සඞ්ඝභෙද යැ යි කියනු ලැබෙ. වහන්ස, කොතෙකින් වනාහි සඞ්ඝයා බිඳුණේ නම් වේ දැ'' යි උපාලිතෙරණුවෝ පුළුවුත්හ.

''උපාලි, මෙසස්නෙහි මහණහු ධර්ම යැ යි කියා අධර්මය දක්වත් ද, අධර්ම යැ යි කියා ධර්මය දක්වත් ද, විනය යැ යි කියා අවිනය දක්වත් ද, අවිනය යැ යි කියා විනය දක්වත් ද, තථාගතයන් විසින් දෙසන ලදැ යි වදරන ලදැ යි තථාගතයන් විසින් නො දෙසන ලද්දක් නො වදරන ලද්දක් දක්වත් ද, තථාගතයන් විසින් නො දෙසන ලදැ යි නො වදරන ලදැ යි කියා තථාගතයන් විසින් දෙසන ලද්ද, වදරන ලද්ද දක්වත් ද, තථාගතයන් විසින් පුරුදු කරන ලදැ යි තථාගතයන් විසින් නො පුරුදුකරන ලද්දක් දක්වත් ද, තථාගතයන් විසින් නො පුරුදු කරන ලදැ යි තථාගතයන් විසින් පුරුදු කරන ලද්දක් දක්වත් ද, තථාගතයන් විසින් පනවන ලද්දෙකැ යි කියා තථාගතයන් විසින් නො පනවන ලද්දක් දක්වත් ද. තථාගතයන් විසින් නො පනවන ලද්දෙකැ යි කියා තථාගතයන් විසින් පනවන ලද්දක් දක්වත් ද, ඇවැතැ යි කියා නො ඇවැතක් දක්වත් ද, නො ඇවැතැ යි කියා ඇවැතක් දක්වත් ද, ගරු ඇවැතැ යි කියා ලුහු ඇවැතක් දක්වත් ද, ලුහු ඇවැතැ යි කියා ගරු ඇවැතක් දක්වත් ද, අනවශෙෂ (ඉතිරි බවක් නැති) ඇවැතකැ යි කියා සාවශෙෂ (ඉතිරි බවක් ඇති) ඇවතක් දක්වත් ද, සාවශෙෂ ඇවැතැ යි කියා අනවශෙෂ ඇවැත දක්වත් ද, නොදුළුල් ඇවැතැ යි කියා දුළුල් ඇවැතක් දක්වත් ද, දුළුල් ඇවැතකැ යි කියා නො දුළුල් ඇවතක් දක්වත් ද, මේ භෙදකර වස්තූන් අටළොසින් ඔහු (භික්ෂූන්) එක් පසකට අදිත්, අතිසයින් (යළි එකතු කළ නො හැකි වන පරිදි) එක් පසකට අදිත්, වෙන් ව පොහෝ කෙරෙත්, වෙන් ව පවුරුණු කෙරෙත්, වෙන් ව සඞ්ඝකර්ම කෙරෙත්. උපාලි, මෙ තෙකින් සඞ්ඝයා බිඳුණේ වේ'' යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

8. ''සඞ්ඝසාමග්ගි සඞ්ඝසාමග්ගී ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝො සමග්ගො, හොතී''ති.

''ඉධූපාලි භික්ඛූ අධම්මං අධම්මොති දීපෙන්ති, ධම්මං ධම්මොති දීපෙන්ති, අවිනයං අවිනයොති දීපෙන්ති, විනයං විනයොති දීපෙන්ති අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති, භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති, අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, ආචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, අනාපත්තිං අනාපත්තීති දීපෙන්ති, ආපත්තිං ආපත්තීති දීපෙන්ති, ලහුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්ති, ගරුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙන්ති, සාවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්ති, අනවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති, දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති. අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති, තෙ ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි න අපකස්සන්ති න විපකස්සන්ති න ආවෙණිකං උපොසථං කරොන්ති, න ආවෙණිකං පවාරණං කරොන්ති, න ආවෙණිකං සඞ්ඝකම්මං කරොන්ති, එත්තාවතා ඛො උපාලි සඞ්ඝො සමග්ගො හොතී''ති.

9. ''සමග්ගං පන භන්තෙ සංඝං භින්දිත්වා කිං සො පසවතී?''ති.

''සමග්ගං ඛො උපාලි සංඝං භින්දිත්වා කප්පට්ඨිතිකං කිබ්බිසං පසවති. කප්පං නිරයම්හි පච්චතී''ති.

ආපායිකො නෙරයිකො කප්පට්ඨො සඞ්ඝභෙදකො,
වග්ගරතො අධම්මට්ඨො යොගක්ඛෙමා පධංසති;
සඞ්ඝං සමග්ගං භින්දිත්වා කප්පං නිරයම්හි පච්චතී''ති.

''භින්නං පන භන්තෙ සඞ්ඝං සමග්ගං කත්වා කිං සො පසවතී?''ති

8. ''වහන්ස, සඞ්ඝ සාමග්‍රිය, සඞ්ඝ සාමග්‍රියැ' යි කියනු ලැබේ. වහන්ස කොතෙකින් සඞ්ඝයා සමග්‍ර (සමග) වේ ද?'' යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

''උපාලි, මෙහි මහණහු අධර්ම යැ යි කියා අධර්මය දක්වත් ද, ධර්ම යැ යි කියා ධර්මය දක්වත් ද, අවිනය යැ යි කියා අවිනය දක්වත් ද, විනය යැ යි කියා විනය දක්වත් ද, තථාගතයන් විසින් නො දෙසන ලද යි නොවදරන ලද යි කියා තථාගතයන් විසින් නො දෙසන ලද නො වදරන ලද දයක් දක්වත් ද, තථාගතයන් විසින් දෙසන ලද යි වදරන ලද යි කියා තථාගතයන් විසින් දෙසන ලද වදරන ලද දයක් දක්වත් ද, තථාගතයන් විසින් පුරුදු නො කරන ලද දයක් තථාගතයන් විසින් පුරුදු නො කරන ලද යි දක්වත් ද, තථාගතයන් විසින් පුරුදු කරන ලද්දක් තථාගතයන් විසින් පුරුදු කරන ලද යි දක්වත් ද, තථාගතයන් විසින් නො පනවන ලද්ද තථාගතයන් විසින් නො පනවන ලද යි දක්වත් ද, තථාගතයන් විසින් පනවන ලද්ද තථාගතයන් විසින් පනවන ලද යි දක්වත් ද, නො ඇවැතැ යි නො ඇවැත දක්වත් ද, ඇවැතැ යි ඇවැත දක්වත් ද, ලුහු ඇවැතැ යි ලුහු ඇවැත දක්වත් ද, ගරු ඇවැතැ යි ගරු ඇවැත දක්වත් ද, සාවශෙෂ ඇවැතැ යි සාවශෙෂ ඇවත දක්වත් ද, අනවශෙෂ ඇවැතැ යි අනවශෙෂ ඇවැත දක්වත් ද, දුළුල් ඇවැතැ යි දුළුල් ඇවැත දක්වත් ද, නො දුළුල් ඇවැතැ යි නො දුළුල් ඇවැත දක්වත් ද, ඔහු මේ (දහැමි) වස්තු අටළොසින් භික්ෂූන් පසකට නො අදිත් ද, අතිසයින් නො අදිත් ද, වෙන ම පොහෝ නො කෙරෙත් ද, වෙන ම පවුරුණු නො කෙරෙත් ද, වෙන ම සඞ්ඝකර්ම නො කෙරෙත් ද, උපාලි, මෙ තෙකින් වනාහි සඞ්ඝයා සමග්‍ර වූයේ නම් වේ'' යැ යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

9. ''වහන්ස, සමග්‍ර වූ සඞ්ඝයා බිඳ හේ කුමක් රැස් කෙරෙයි ද?''යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

''උපාලි, සමග්‍ර සඞ්ඝයා බිඳ කල්පස්ථායී පව් රැස් කෙරෙයි. කල්පයක් නිරයෙහි පැසේ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

''සඞ්ඝයා බිඳුණේ අපාය පිණිස පවත්නේ, නිරය පිණිස පවත්නේ, එහි කල්පයක් සිටුනේ වෙයි. ව්‍යග්‍රරත (අසමග වූවනට ඇලුණු), අධර්මස්ථ වූ හෙ තෙම යොගක්ෂෙමය ලැබීමෙන් වැළැකෙයි. සමග්‍ර සඞ්ඝයා බිඳ නිරයෙහි කපක් පැසෙයි''.

''වහන්ස, බෙදුණු සඞ්ඝයා සමග කොට හේ කුමක් රැස් කෙරේ ද?'' යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

"හිත්වා ඛො උපාලි සඞ්ඝං සමග්ගං කත්වා බ්‍රහ්මං පුඤ්ඤං පසවති. කප්පං සග්ගම්හි මොදතී"ති.

"සුඛා සඞ්ඝස්ස සාමග්ගි සමග්ගානං චානුග්ගහො,[1]
සමග්ගරතො ධම්මට්ඨො යොගක්ඛෙමා න ධංසති;
සඞ්ඝං සමග්ගං කත්වාන කප්පං සග්ගම්හි මොදතී"ති.

10. "සියා නු ඛො භන්තෙ සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො?"ති

"සියා උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො"ති.

"සියා පන භන්තෙ සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො?ති".

"සියා උපාලි සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො"ති.

"කතමො පන භන්තෙ සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො?"ති.

"ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති තස්මිං අධම්මදිට්ඨි භෙදෙ අධම්මදිට්ඨි විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුස්සාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථු සාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති. අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

1. ච අනුග්ගහො – සිමු.

"උපාලි, බෙදුණු සඞ්ඝයා සමග කොට මහත් පිනක් රැස් කෙරේ" යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

"සඞ්ඝයාගේ සමගිය සැප ගෙනදෙයි. සමග වූ සඞ්ඝයාට අනුබල දීම ද සැප ගෙනදෙයි. සමග වූවනට ඇලුණු, දහමෙහි පිහිටි තැනැත්තෙක් යොගක්‍ෂෙමයෙන් (නිවන් ලැබීමෙන්) නො වැළකෙ යි. සඞ්ඝයා සමග කොට හේ කපක් සගෙහි සතුටු වෙ".

10. "වහන්ස, සඞ්ඝයා බිඳුනා පුද්ගල තෙමේ අපාය පිණිස වූයේ, නිරය පිණිස වූයේ කපක් නිරයෙහි සිටුනේ, එයින් මුදලන පිළියමක් නැත්තේ වේ දැ?" යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

"උපාලි, සඞ්ඝයා බිඳුනා එක්තරා පුඟුලෙක් අපාය පිණිස පවත්නේ ද නිරය පිණිස පවත්නේ ද, කපක් නිරයේ සිටුනේ ද, එයින් මුදලන පිළියමක් නැත්තේ ද වන්නේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

"වහන්ස, සඞ්ඝයා බිඳුනා කිසියම් පුඟුලෙක් අපාය පිණිස නො පවත්නේ නිරය පිණිස නො පවත්නේ කපක් නිරයෙහි නො සිටුනේ පිළියම් නැත්තෙක් නො වන්නේත් වේ දැ?" යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

"උපාලි, සඞ්ඝයා බිඳුනා එක්තර පුඟුලෙක් ආපායික නො වූයේ නෙරයික නො වූයේ කපක් නිරයෙහි නො සිටුනේ පිළියම් නැත්තෙක් නො වූයේ වන්නේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

"වහන්ස, කවර නම් සඞ්ඝභෙදක තෙමේ ආපායික, නෙරයික, කල්පස්ථ අතෙකිච්ඡ නො වන්නේ දැ?" යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

"උපාලි, මෙහි මහණෙක් ධර්මය යැ යි කියා අධර්මය දක්වන්නේ ද, එහි අධර්ම දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝ භෙදයෙහි අධර්මදෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා ඉවසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, අනුශ්‍රාවණය කෙරේ ද (අනුනට කියා ද), "මේ ධර්මයය මේ විනය යැ, මෙය ශාස්තෘශාසනය යැ මෙය පිළිගනිවු, මෙයට කැමැති වවු" යි සලාකා ගන්වා ද උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද ආපායික ද නෙරයික ද කල්පස්ථ ද අතෙකිච්ඡ ද වේ.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති. තස්මිං අධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථු සාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති. තස්මිං අධම්මදිට්ඨි භෙදෙ වෙමතිකො විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුසාවෙති සලාකං ගාහෙති අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථාති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති තස්මිං ධම්මදිට්ඨි භෙදෙ අධම්මදිට්ඨි විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති තස්මිං ධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති තස්මිං ධම්මදිට්ඨි භෙදෙ වෙමතිකො විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං, අනුසාවෙති සලාකං ගාහෙති ''අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, තස්මිං වෙමතිකො, භෙදෙ අධම්මදිට්ඨි, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං, අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

තවද අනෙකක් කියමි. උපාලි, මහණෙක් ධර්‍මයැ යි අධර්‍මය දක්වා ද එහි අධර්‍ම යැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි ධර්‍ම දෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්‍ම යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය පිළිගනිවු, මෙයට කැමති වවු' යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද, ආපායිකත් නෙරයිකත් කල්පස්ථායීත් අතෙකිච්ඡත් වේ.

තවද උපාලි, මහණෙක් ධර්‍මයැ යි අධර්‍මය දක්වා ද, එහි අධර්‍මය යන දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි විමති ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්‍මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය ගනිවු, මෙයට කැමති වවු' යි අනුනට කියා ද සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද ආපායිකත් නෙරයිකත් කල්පස්ථායීත් අතෙකිච්ඡත් වේ.

තවද උපාලි, මහණෙක් ධර්‍මය යැ යි අධර්‍මය දක්වා ද, එහි ධර්‍මයැයි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි අධර්‍ම දෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, මේ ධර්‍මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ, මෙය ගනිවු, මෙයට කැමති වවු' යි අනුනට කියා ද, සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේත් ආපායිකත් නෙරයිකත් කල්පස්ථත් අතෙකිච්ඡත් වේ.

තවද උපාලි, මහණෙක් ධර්‍මයැ යි අධර්‍මය දක්වා ද, එහි ධර්‍මය යි දෘෂ්ටි ඇත්තේ, භෙදයෙහි ධර්‍ම දෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා 'මේ ධර්‍මය යැ, මේ විනය යැ මේ ශාස්තෘශාසනය යැ, මෙය ගනිවු, මෙයට රුචි කරවු යැ යි අනුශ්‍රාවණය කෙරේ ද සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද ආපායිකත් නෙරයිකත් කල්පස්ථත් අතෙකිච්ඡත් වේ.

තවද උපාලි, මහණෙක් ධර්‍මයැ යි අධර්‍මය දක්වා ද, එහි ධර්‍මයැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි විමති ඇත්තේ. දෘෂ්ටිය පිහිටුවා ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්‍මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ, මෙය ගනිවු, මෙයට කැමති වවු' යි අනුනට කියා ද සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද ආපායිකත් නෙරයිකත් කල්පස්ථත් අතෙකිච්ඡත් වේ.

තවද උපාලි, මහණෙක් ධර්‍මයැ යි අධර්‍මය දක්වා ද, එහි විමති ඇත්තේ, සඞ්ඝභෙදයෙහි අධර්‍ම දෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්‍මය යැ, 'මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය ගනිවු, මෙයට කැමති වවු' යි අනුනට කියා ද, සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද ආපායිකත් නෙරයිකත් කල්පස්ථත් අතෙකිච්ඡත් වේ.

11. පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, තස්මිං වෙමතිකො භෙදෙ ධම්මදිට්ඨි, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං. විනිධාය රුචිං, විනිධාය භාවං, අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, තස්මිං වෙමතිකො භෙදෙ වෙමතිකො, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුසාවෙති සලාකං ගාහෙති අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථාති. අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති, අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙති, අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, අනාපත්තිං ආපත්තීති දීපෙති, ආපත්තිං අනාපත්තීති දීපෙති, ලහුකං ආපත්තිං, ගරුකා ආපත්තීති දීපෙති, ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙති, සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙති, අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙති, දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, තස්මිං අධම්මදිට්ඨි, භෙදෙ අධම්මදිට්ඨි, විනිධාය දිට්ඨිං විනිධාය, ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං, අනුසාවෙති සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

පුනචපරං උපාලි භික්ඛු ධම්මං අධම්මොති දීපෙති -පෙ- අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, තස්මිං අධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි -පෙ-

11. තව ද, උපාලි, ධර්මයැ යි අධර්මයක් දක්වා ද, එහි විමති ඇත්තේ, සඞ්ඝභෙදයෙහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘ ශාසනය යැ, මෙය ගනිවු, මෙයට කැමති වවු' යි අනුනට කියා ද සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ද ආපායිකත් නෙරයිකත් කල්පස්ථත් අතෙකිච්ඡත් වේ.

තව ද උපාලි, මහණෙක් ධර්මයැ යි අධර්මය දක්වා ද එහි විමති ඇත්තේ, සඞ්ඝභෙදයෙහි විමති ඇත්තේ, දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ, මෙය ගනිවු, මෙයට කැමති වවු යැ' යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේත් ආපායික ද නෙරයික ද, කල්පස්ථ ද අතෙකිච්ඡ ද වේ.

තව ද උපාලි, මහණෙක් ධර්මයැ යි අධර්මය දක්වා ද, අධර්මය යැ යි ධර්මය දක්වා ද, විනය යැ යි අවිනයයක් දක්වා ද, අවිනය යැ යි විනය දක්වා ද, තථාගතයන් වහන්සේ විසින් වදරන ලද යි තථාගතයන් වහන්සේ විසින් නො වදරන ලද්දක් නො දෙසන ලද්දක් දක්වා ද, තථාගතයන් වහන්සේ විසින් නො වදරන ලද යි නො දෙසන ලද යි තථාගතයන් වහන්සේ විසින් වදරන ලද්දක් දෙසන ලද්දක් දක්වා ද, තථාගතයන් වහන්සේ විසින් ආචීර්ණ නොවූවක් තථාගතයන් වහන්සේ විසින් ආචීර්ණ යැ යි දක්වා ද, තථාගතයන් වහන්සේ විසින් පනවන ලද යි තථාගතයන් වහන්සේ විසින් නො පනවන ලද්දක් දක්වා ද, තථාගතයන් වහන්සේ විසින් නො පනවන ලද යි තථාගතයන් වහන්සේ විසින් පණවන ලද්දක් දක්වා ද, ඇවැතැයි නො ඇවැතක් දක්වා ද, නො ඇවැතැ යි ඇවැතක් දක්වා ද, ගරු ඇවැතැ යි ලුහු ඇවැතක් දක්වා ද, ලුහු ඇවතැ යි ගරු ඇවැතක් දක්වා ද, අනවශෙෂ ඇවැතැ යි සාවශෙෂ ඇවැතක් දක්වා ද සාවශෙෂ ඇවැතැ යි අනවශෙෂ ඇවැතක් දක්වා ද, නොදුළුල් ඇවැතැ යි දුළුල් ඇවැතක් දක්වා ද, දුළුල් ඇවැතැ යි නොදුළුල් ඇවතක් දක්වා ද, එහි අධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි අධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, ඒ දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා, රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ, මෙය ගනිවු, මෙයට කැමැති වවු යැ'' යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ආපායික ද නෙරයික ද, කල්පස්ථ ද අතෙකිච්ඡ ද වේ.

තව ද උපාලි, මහණෙක් අධර්මයැ යි ධර්මය දක්වා ද, ... දුළුල් ඇවැතැ යි නො දුළුල් ඇවැත දක්වා ද ... එහි අධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, ...

තස්මිං අධම්මදිට්ඨී භෙදෙ වෙමතිකො -පෙ-

තස්මිං ධම්මදිට්ඨි -පෙ- තස්මිං ධම්මදිට්ඨි භෙදෙ වෙමතිකො -පෙ-

තස්මිං වෙමතිකො භෙදෙ අධම්මදිට්ඨි -පෙ-

තස්මිං වෙමතිකො භෙදෙ ධම්මදිට්ඨි -පෙ-

තස්මිං වෙමතිකො භෙදෙ වෙමතිකො විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය භාවං අනුස්සාවෙති, සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡොති.

12. "කතමො පන භන්තෙ සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො"ති.

"ඉධූපාලි භික්ඛු අධම්මං අධම්මොති දීපෙති, තස්මිං ධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි අවිනිධාය දිට්ඨිං අවිනිධාය ඛන්තිං අවිනිධාය රුචිං අවිනිධාය භාවං අනුස්සාවෙති, සලාකං ගාහෙති 'අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො."

පුන ච පරං උපාලි භික්ඛු ධම්මං ධම්මොති දීපෙති තස්මිං ධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි -පෙ- අවිනයං අවිනයොති දීපෙති, -පෙ- විනයං විනයොති දීපෙති, අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති, භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති, අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙති. ආචිණ්ණං තථාගතෙන

එහි අධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ සඞ්ඝභෙදයෙහි වෙමතික වූයේ ...

... එහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ සඞ්ඝභෙදයෙහි වෙමතික වූයේ ...,

එහි වෙමතික වූයේ, සඞ්ඝභෙදයෙහි අධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ ...

එහි වෙමතික වූයේ, සඞ්ඝභෙදයෙහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ ...

එහි වෙමතික වූයේ, සඞ්ඝභෙදයෙහි වෙමතික වූයේ දෘෂ්ටිය පිහිටුවා, ඉවැසීම පිහිටුවා; රුචිය පිහිටුවා, අදහස පිහිටුවා, 'මේ ධර්මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ, මෙය ගනිවූ මෙයට කැමති වවූ' යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද, උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ අපායික ද නෙරයික ද කල්පස්ථ ද අතෙකිච්ඡ ද වේ.

12. "වහන්ස, සඞ්ඝභෙදය කරන කවරෙක් වනාහි ආපායික නො වේ ද? නෙරයික නො වේ ද? කල්පස්ථ නො වේ ද? අතෙකිච්ඡ නො වේ ද?'' යි උපාලි තෙරණුවෝ පුළුවුත්හ.

(භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:)

''උපාලි, මෙහි මහණ තෙම අධර්මයැ යි අධර්මය දක්වා ද, එහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, ඒ දෘෂ්ටිය නො පිහිටුවා, ඉවැසීම නො පිහිටුවා, රුචිය නො පිහිටුවා, අදහස නො පිහිටුවා, 'මේ ධර්මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසන යැ මෙය ගනිවූ, මෙයට කැමති වවූ යැ' යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද උපාලි, මේ සඞ්ඝභෙදක තෙමේ ආපායික නො වේ, නෙරයික නො වේ, කල්පස්ථ නො වේ, අතෙකිච්ඡ නො වේ.''

''තව ද උපාලි, මහණ තෙම ධර් යැ යි ධර්මය දක්වා ද, එහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, ... අවිනය යැ යි අවිනය දක්වා ද, ... විනයයැ යි විනය දක්වාද තථාගතයන් විසින් නො වදරන ලද්ද නො දෙසන ලද්ද තථාගතයන් විසින් නො වදරන ලද යි නො දෙසන ලද යි දක්වා ද තථාගතයන් විසින් වදරන ලද්ද දෙසන ලද්ද තථාගතයන් විසින් වදරන ලද්ද යි දෙසන ලද්ද යි දක්වා ද, තථාගතයන් විසින් අනාචීර්ණ දය තථාගතයන් විසින් අනාචීර්ණ දයෙකැ යි දක්වා ද, තථාගතයන් විසින් ආචීර්ණ දය තථාගතයන් විසින්

ආචිණ්ණං තථාගතෙනාති දීපෙති, අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, ආපත්තිං ආපත්තීති දීපෙති, අනාපත්තිං අනාපත්තීති දීපෙති, ගරුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙති, ලහුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙති, සාවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙති, අනවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙති, දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, තස්මිං ධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි අවිනිධාය දිට්ඨිං අවිනිධාය ඛන්තිං අවිනිධාය රුචිං අවිනිධාය භාවං අනුස්සාවෙති, සලාකං ගාහෙති: ''අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා'ති, අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡොති.

### තතිය භාණවාරං.

## සඞ්ඝභෙදකක්ඛන්ධකං සත්තමං.[1]

තස්සුද්දානං:

අනුපියෙ අභිඤ්ඤාතා සුඛුමාලො න ඉච්ඡති
කසා වපා[2] අභිනිනෙත්[3] නිඩ්ඩා ලාවෙ ච උබ්බහෙ
පුඤ්ජමද්දපලාලඤ්ච භුසඔපුනඅභිහරෙ

ආයතිම්පි න ඛීයන්ති පිතරො ච පිතාමහා
භද්දියො අනුරුද්ධො ච ආනන්දො භගු කිම්බිලො[4]
සක්‍යමානො ච කොසම්බිං පරිහායි කකුධෙන ච

පකාසෙසි පිතුනො ච පුරිසෙ සිලං නාළාගිරිං
තිකපඤ්ච ගරුකො භික්ඛු ථුල්ලච්චයෙන ච
තයො අට්ඨ පුන තීණි රාජි භෙදෙ සියා නු ඛො ති.

---

1. සඞ්ඝභෙදකක්ඛන්ධකො සත්තමො - මජ්ඣං.
2. වපා- මජ්ඣං.
3. නිනෙත- මජ්ඣං.
4. කිම්මිලො - ම.

ආචීර්ණ දූයෙකැ යි දක්වා ද, තථාගතයන් විසින් නො පනවන ලද්ද තථාගතයන් විසින් නො පනවන ලද්දකැ යි දක්වා ද, තථාගතයන් විසින් පනවන ලද්ද තථාගතයන් විසින් පනවන ලද්දැ යි දක්වා ද, ඇවැත ඇවැතැ යි දක්වා ද, නො ඇවැත නො ඇවැතැ යි දක්වා ද, ගරු ඇවත ගරු ඇවැතැ යි දක්වා ද, ලුහු ඇවත ලුහු ඇවැතැ යි දක්වා ද, සාවශෙෂ ඇවැත සාවශෙෂ ඇවැතැ යි දක්වා ද, අනවශෙෂ ඇවැත අනවශෙෂ ඇවැතැයි දක්වා ද, දුළුල් ඇවැත දුළුල් ඇවැතැ යි දක්වා ද, නො දුළුල් ඇවැත නො දුළුල් ඇවැතැ යි දක්වා ද, එහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, සඞ්ඝභෙදයෙහි ධර්මයැ යි දෘෂ්ටි ඇත්තේ, දෘෂ්ටිය නො පිහිටුවා, ඉවැසීම නො පිහිටුවා, රුචිය නො පිහිටුවා, අදහස නො පිහිටුවා, 'මේ ධර්මය යැ, මේ විනය යැ මේ ශාස්තෘ-ශාසනය යැ මෙය ගනිවු, මෙයට කැමති වවු' යැ යි අනුශ්‍රාවණය කෙරේ ද, සලාකා ගන්වා ද, උපාලිනි, මේ සඞ්ඝභෙදක තෙමේත් ආපායික නො වේ, නෛරයික නො වේ, කල්පස්ථායීත් නො වේ, අතෙකිච්ඡත් නො වේ'' යැ යි වදළසේක.

## තෙවෙනි බණවර යි.

## සත්වැනි සඞ්ඝභෙදකඛන්ධක යි.

මේ එහි උද්දානය යැ:

අනුපිය වෙනෙහි දී ප්‍රකට ශාක්‍ය කුමාර කෙනෙක් පැවිදි වූහ. ඔවුන්ගෙන් එකෙක් සියුමැලි වූයේ පැවිද්දට නො කැමැති විය. කෙත් සෑම ද වී වැපිරීම ද දිය ඇතුළට ගැන්ම ද දිය සම කොට පැතිරවීම ද, නෙළීම ද ගොයම් කැපීම ද ඒවා ගෙන්වීම ද මිටි බැඳීම ද ගොයම් මැඩීම ද පිදුරු වෙන් කිරීම ද කාවු හැරීම ද හුළං ගැස්වීම ද වී ඇතුළට ගෙන්වීම ද කරන්නේ ය. මතුවත්තෙහිත් මෙය කළයුතු ය. කර්මාන්තයෝ අවසන් නො වෙත්. කර්මාන්ත අවසන් නො වී තිබියැදී ම පියවරු ද මුතුන්මිත්තෝ ද කලුරිය කළාහ.

භද්දිය ද අනුරුද්ධ ද ආනන්ද ද භෘගු ද කිම්බිල ද යන මොහු නික්ම ගියාහ. ශාක්‍යමානය බිඳින ලද්දේ ය. කොසඹෑ නුවරට බුදුරජුහු වැඩියාහ. දෙවදත් ඍද්ධියෙන් පිරිහුණේ ය. කකුධ දෙව්පුතු විසින් එය පැවැසිණ. සඞ්ඝයා දෙවදතු පිළිබඳ ව ප්‍රකාශනීය කර්මය කෙළේ ය. අජාසත් රජුගේ පියාගේ මරණය විය. දෙවදත් බුදුරජුන් නසනුවට පුරුෂයන් යෙදවී ය. බුදුරජුන් මත්තෙහි ගලක් පෙරළී ය. නාළාගිරි ඇතු මෙහෙයැවී ය. ත්‍රික භොජනය පැනැවිණ. සඞ්ඝභෙදය ගරු අකුශලයෙකැ යි වදළහ. දෙවදත් සඞ්ඝයා බින්දේ ය. සඞ්ඝයා භෙදයට තැත් කරනුයේ තුලැයි ඇවැතින් බැඳේ. එක් පසෙක තිදෙනෙක් ද (අනිත් පසැ සිවු දෙනෙක් ද) අටවැන්නැ අනුශ්‍රාවණය කෙරෙයි. නැවැත මෙබඳු වාර තුනෙකි. සඞ්ඝරාජිය වන අයුරු දක්විණ. සඞ්ඝභෙදය වන්නේ දැ යි ප්‍රශ්න නැඟිණ, (බුදුරජුහු ඒ විසැඳූහ.)

# 8

# වත්තක්ඛන්ධකං

## ආගන්තුකවත්තං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආගන්තුකා භික්ඛූ සඋපාහනාපි ආරාමං පවිසන්ති, ඡත්තපග්ගහිතාපි ආරාමං පවිසන්ති, ඔගුණ්ඨිතාපි ආරාමං පවිසන්ති, සීසෙපි චීවරං කරිත්වා ආරාමං පවිසන්ති, පානීයෙන,පි පාදෙ ධොවන්ති, වුඩ්ඪතරෙ'පි ආවාසිකෙ භික්ඛූ න අභිවාදෙන්ති, න සෙනාසනං පුච්ඡන්ති.

අඤ්ඤතරොපි ආගන්තුකො භික්ඛු අනජ්ඣාවුත්ථං විහාරං ඝටිකං උග්ඝාටෙත්වා කවාටං පණාමෙත්වා සහසා පාවිසි තස්ස උපරිපිට්ඨිතො අහිබන්ධො පපති. සො භීතො විස්සරමකාසි. භික්ඛූ උපධාවිත්වා තං භික්ඛුං එතදවොචුං: 'කිස්ස ත්වං ආවුසො විස්සරමකාසී'ති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ආගන්තුකා භික්ඛූ සඋපාහනාපි ආරාමං පවිසිස්සන්ති. ඡත්තපග්ගහිතාපි ආරාමං පවිසිස්සන්ති -පෙ- න සෙනාසනං පුච්ඡිස්සන්තීති''

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර භික්ඛවෙ ආගන්තුකා භික්ඛූ සඋපාහනාපි ආරාමං පවිසන්ති -පෙ- න සෙනාසනං පුච්ඡිස්සන්ති''ති.

"සච්චං භගවා''.

විගරහි බුද්ධො භගවා: "කථං හි නාම භික්ඛවෙ ආගන්තුකා භික්ඛූ සඋපාහනාපි ආරාමං පවිසිස්සන්ති -පෙ- න සෙනාසනං පුච්ඡිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛො තං අප්පසන්නානඤ්චෙව අප්පසාදය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා''ති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

# 8

# වත්තක්ඛන්ධකය

## ආගන්තුක වත්

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජුහු සැවැත් නුවර නිසා දෙව්රම නම් වූ අනේපිඬුහු අරමෙහි වැඩවෙසෙති. එ සමයෙහි ආගන්තුක මහණහු වහන් සහිතව ද අරමට පිවිසෙත්, ඉස ලාගත් කුඩ ඇති ව ද අරමට පිවිසෙත්, හිස වසා පෙරවගෙන ද අරමට පිවිසෙත්, සිවුර හිසෙහි කොට ද අරමට පිවිසෙත්, බොන්නට තුබූ දියෙන් ද පා දෙවිත්, ආවාසයෙහි වූ වැඩි මාලු වහන්දෑ ද නො වඳිත්, සෙනසුන් නො විචාරත්.

එක්තරා ආගන්තුක මහණෙක් ද භික්‍ෂූන් විසින් නො වැස හරන ලද (පාළු වූ) වෙහෙරකට අගුල උගුළුවා දෙරපළුව විවර කොට වහා පිවිසියේ ය. උඩෙළිපත මත්තෙහි වූ සර්පයෙක් එ මහණහුගේ උරහිසෙහි වැටුණේ ය. හේ බියපත් වූයේ මුර ගෑයේ ය. මහණහු ඔහු වෙතට දිවැවිත්, 'ඇවැත්නි, තෙපි කුමට මුරගෑහු ද?'' යි විචාළාහ. එවිට එ මහණ මහණුනට මෙ පවත් සැලකෙළේ ය. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ ද ලද පමණින් තෘප්ත වන්නෝ ද ලජ්ජී ද ඉතා සුලු වරදෙහිත් කුකුස් කරන්නෝ ද, ශික්‍ෂාකාමීහු ද, ඔහු 'කෙසේ නම් ආගන්තුක මහණහු වහන් ඇතිව ද අරමට පිවිසෙත් ද ... සෙනසුන් නො විචාරත් ද'' යි ලාමක කොට සිතත්, අගුණ කියත්, දෙස් පතුරුවත්.

ඉක්බිත්තෙන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

''මහණෙනි, ආගන්තුක මහණහු වහන් ඇති ව ද අරමට පිවිසෙත් ල ... සෙනස්න නො විචාරත් ල ඒ සැබෑ ද?'' යි අසාවදළසේක.

''සැබව භාග්‍යවතුන් වහන්සැ'' යි ඔහු පිළිවදන් දුන්හ.

''මහණෙනි, කෙසේ නම් ආගන්තුක මහණහු වහන් සහිතවත් අරමට පිවිසෙත් ද! ... සෙනසුන් නො ම විචාරත් ද, මහණෙනි, නො පහන් වූවන්ගේ පහන් බව පිණිස ද පහන් වූවන්ගේ ප්‍රසාදය වැඩීමට ද කරුණු නො වේ. වැලිදු එය නො පහන් වූවන්ගේ නො පහන් බව පිණිස ද පහන් වූ ඇතැම් අයගේ වෙනස් බව පිණිස ද පවතී යැ'' යි වෙසෙසින් ගැරහූසේක. වෙසෙසින් ගරහා දැහැමි කථා කොට භික්‍ෂූන් ඇමතූසේක.

තෙන හි භික්ඛවෙ ආගන්තුකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි යථා ආගන්තුකෙහි භික්ඛූහි වත්තිතබ්බං, ආගන්තුකෙන භික්ඛවෙ භික්ඛුනා 'ඉදානි ආරාමං පවිසිස්සාමී'ති උපාහනා ඔමුඤ්චිත්වා නීචං කත්වා පප්ඵොටෙත්වා ගහෙත්වා ඡත්තං අපනාමෙත්වා සීසං විවරිත්වා සීසෙ චීවරං ඛන්ධෙ කරිත්වා සාධුකං අතරමානෙන ආරාමො පවිසිතබ්බො. ආරාමං පවිසන්තෙන සල්ලක්ඛෙතබ්බං "කත්ථ ආවාසිකා භික්ඛූ පටික්කමන්ති"ති. යත්ථ ආවාසිකා භික්ඛූ පටික්කමන්ති උපට්ඨානසාලාය වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා තත්ථ ගන්ත්වා එකමන්තං පත්තො නික්ඛිපිතබ්බො, එකමන්තං චීවරං නික්ඛිපිතබ්බං. පතිරූපං ආසනං ගහෙත්වා නිසීදිතබ්බං. පානීයං පුච්ඡිතබ්බං. පරිභොජනීයං පුච්ඡිතබ්බං, "කතමං පානීයං කතමං පරිභොජනීයන්ති". සචෙ පානීයෙන අත්ථො හොති පානීයං ගහෙත්වා පාතබ්බං. සචෙ පරිභොජනීයෙන අත්ථො හොති පරිභොජනීයං ගහෙත්වා පාදා ධොවිතබ්බා. පාදෙ ධොවන්තෙන එකෙන හත්ථෙන උදකං ආසිඤ්චිතබ්බං එකෙන හත්ථෙන පාදා ධොවිතබ්බා. න තෙනෙව හත්ථෙන උදකං ආසිඤ්චිතබ්බං. න තෙනෙව හත්ථෙන පාදා ධොවිතබ්බා.

උපාහනපුඤ්ඡනචොළකං පුච්ඡිත්වා උපාහනා පුඤ්ඡිතබ්බා. උපාහනා පුඤ්ඡන්තෙන පඨමං සුක්ඛෙන චොළකෙන පුඤ්ඡිතබ්බා පච්ඡා අල්ලෙන. උපාහනචොළකං ධොවිත්වා එකමන්තං විස්සජ්ජෙතබ්බං. සචෙ ආවාසිකො භික්ඛු වුඩ්ඪො හොති අභිවාදෙතබ්බො. සචෙ නවකො හොති අභිවාදාපෙතබ්බො.

සෙනාසනං පුච්ඡිතබ්බං 'කතමං මෙ සෙනාසනං පාපුණාතී'ති. අජ්ඣාවුත්ථං වා අනජ්ඣාවුත්ථං[1] වා පුච්ඡිතබ්බං. ගොචරො පුච්ඡිතබ්බො අගොචරො පුච්ඡිතබ්බො. සෙඛසම්මතානි කුලානි පුච්ඡිතබ්බානි. වච්චට්ඨානං පුච්ඡිතබ්බං. පස්සාවට්ඨානං පුච්ඡිතබ්බං. පානීයං පුච්ඡිතබ්බං. පරිභොජනීයං පුච්ඡිතබ්බං. කත්තරදණ්ඩො පුච්ඡිතබ්බො. සඞ්ඝස්ස කතිකසණ්ඨානං පුච්ඡිතබ්බං 'කං කාලං පවිසිතබ්බං කං කාලං නික්ඛමිතබ්බන්ති'.

2. සචෙ විහාරො අනජ්ඣාවුත්ථො හොති කවාටං ආකොටෙත්වා මුහුත්තං ආගමෙත්වා ඝටිකං උග්ඝාටෙත්වා කවාටං පණාමෙත්වා බහි ඨිතෙන නිල්ලොකෙතබ්බො[2]. සචෙ සො විහාරො උක්ලාපො හොති මඤ්චෙ වා මඤ්චො ආරොපිතො හොති, පීඨෙ වා පීඨං ආරොපිතං හොති, සෙනාසනං උපරිපුඤ්ජකතං හොති. සචෙ උස්සහති සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං භුම්මත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. භිසිබිබ්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං.

1. අජ්ඣාවුට්ඨං වා අනජ්ඣාවුට්ඨං වා - මජසං
2. උල්ලොකෙතබ්බො - සිමු.

"මහණෙනි, යම්සේ ආගන්තුක මහණුන් විසින් පැවැතියයුතු ද එසේ ඔවුනට වත් පනවන්නෙමි. මහණෙනි, ආගන්තුක මහණහු විසින් 'දැන් අරමට පිවිසෙන්නෙමි' යි සලකා වහන් මුදු, පහත් කොට ගසා දමා ගෙන කුඩය ඉවත් කොට හිස විවර කොට හිසෙහි වූ සිවුර උරහිසෙහි කොට, මනාකොට නො යුහු වැ අරම්පිවිසියැයුතු. අරමට පිවිසෙන්නහු විසින් 'ආවාසයෙහි නිවැසි මහණහු කොහි පෙරළා ඇක්මෙත් ද?' යි සැලකියයුතු. උවටන් හලෙහි හෝ මඩු වැ හෝ රුක්මුලැ හෝ ඒ යම් තැනකට ආවාසික මහණහු පෙරළා එත් ද, එහි ගොස් එක් පැත්තෙක පාත්‍රය තැබියැයුතු, එක් පැත්තෙක සිවුර තැබියැයුතු. සුදුසු අස්නක් ගෙන හිඳගතයුතු. බොන පැන් කවරේ ද? පරිභොග ජලය කවරේ ද?" යි පැන් ද පරිභොග ජලය ද විචාළයුතු. ඉදින් පැනින් ප්‍රයොජන වේ නම් පැන් ගෙන පියැයුතු. ඉදින් පරිභොග ජලයෙන් ප්‍රයොජන වේ නම් එය ගෙන පා දෙවියැයුතු. පා දෙවින්නහු විසින් එක් අතෙකින් දිය ඉස අනෙක් අතින් පා දෙවියැයුතු. එක ම අතින් පැන් ඉසීමත් පා දෙවීමත් නො කළයුතු.

වහන් පිසිනා රෙදි කඩ විචාරා, වහන් පිසදමියයුතු. වහන් පිසින්නහු විසින් පළමු කොට වියැළි රෙදි කඩින් ද පසු වැ තෙත් කඩින් ද පිසදමියැයුතු. වහන් පිසිනා රෙදි කඩ සෝද එක් පැත්තෙක වැතියයුතු. ආවාසික මහණ තෙම වැඩිමහලු වී නම්, වැන්දයුතු. නවක වේ නම් වැන්දවියැ යුතු.

'මට කවර සෙනස්නෙක් පැමිණේ ද?' යි සෙනස්න විචාළ යුතු. 'පළමු කිසිවකු වුසූ එකෙක් ද? නැත නො වුසූ එකෙක් ද?' යි විචාරා දතයුතු. ගොචරය (පිඩු සිඟා යායුතු තැන) අගොචරය (පිඩු සිඟා නො යායුතු තැන්) විචාරා දතයුතු. සෙඛසම්මත කුලයෝ (මහත් සැදැහැති එහෙත් දිළිඳු වූ ගෙවල්) විචාරා දත යුතු. වැසිකිළි කෙසකිළි පිහිටි තැන විචාරා දතයුතු. බොන පැන් ඇති තැන විචාළයුතු, සෙසු පරිභොගයට ගතයුතු ජලය ඇති තැන අසා දතයුතු. සැරයැටිය ඇති තැන අසා දතයුතු. 'කවර වේලාවෙක ගම් වැදියයුතු ද? කවර වේලාවෙක ගමින් නික්මියැයුතු ද?' යි සඞ්ඝයාගේ කතිකා නියමය විචාළයුතු.

2. ඉදින් විහාරය කිසිවකු නො වුසූ එකෙක් වේ නම්, දෙරපළුවට තට්ටු කොට මොහොතක් බලා සිට අගුළ උගුළුවා දෙරපළුව විවර කොට පිටතැ සිටියහු විසින් පිරික්සා බැලියැ යුතු. ඉදින් ඒ වෙහෙර කැලි කසළ සහිත වී නම්, ඇඳෙක ඇඳෙක් නංවන ලදුයේ හෝ පුටුවෙක පුටුවෙක් නංවනා ලදුයේ වේ ද, සෙනස්න මත (ඇඳ පුටු මත) ඇකිරිලි ආදිය ගොඩ ගසන ලදුයේ වී නම්, ඉදින් හැක්කේ නම් ශුඩ කළයුතු. විහාරය ශුඩ කරන්නහු විසින් පළමු කොට බුමුතුරුණු බැහැර කොට පසෙක තැබියැ යුතු. ඇඳ පා අලු බැහැර කොට පසෙක තැබිය යුතු. බිසි ද කොට්ට ද බැහැර කොට පසෙක තැබියැයුතු.

නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං මඤ්චො නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං.

සචෙ විහාරෙ සන්තානකං හොති උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ අකතා හොති භූමි උදකෙන පරිප්ඵොසිත්වා සම්මජ්ජිතබ්බා[1] 'මා විහාරො රජෙන උහඤ්ඤී'ති. සඞ්කාර විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං.

භුම්මත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන යථාඨානෙ පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන අතිහරිත්වා යථාඨානෙ පඤ්ඤපෙතබ්බං. කවාටපිට්ඨං අතිහරිත්වා යථාඨානෙ නික්ඛිපිතබ්බං. භිසිබිබ්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාඨානෙ පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාඨානෙ පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බං.

3. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනත්ථරිතාය[2] භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

1. පමජ්ජිතබ්බා – සිමු.
2. අනන්තරහිතාය – මජසං., සිමු.

හිඳිනා ඇතිරිය ද පසතුරුණ ද බැහැර කොට පසෙක තැබියැ යුතු. ඇඳ පහත් කොට (කිසිවෙක) නො ගාවා නො ගටා බැහැර කොට පසෙක තැබියැයුතු, පුටුව පහත් කොට කිසිවෙක නො ගාවමින් නො ගටමින් මනාව බැහැර කොට පසෙක තැබියැ යුතු. කවාට පෘෂ්ඨය (දෙරපළු පිට) බැහැර කොට එක් පසෙක තැබියයුතු. කෙළමලාව (පඩික්කම) බැහැර කොට පසෙක තැබියැ යුතු. අපාශ්‍රයන ඵලකය (හේත්තුවන පුවරුව) බැහැර කොට පසෙක තැබියයුතු.

ඉදින් විහාරයෙහි මකුළුදැල් වේ නම්, පළමුවෙන් ඉහළ සිට ඉවත් කළයුතු. ඇතුළත පිටත වාකවුළු ද ගැබ සතර කොන් ද පිසදැමියැයුතු. ඉදින් ගුරු පිරියම් කළ බිත්තිය කුණු වැකී ඇත් නම්, රෙදි කඩක් තෙමා මිරිකා එයින් පිස දැමියයුතු. ඉදින් කළුපැහැ කරන ලද බිත්තිය කුණු වැකී ඇත්තේ නම්, රෙදි කඩක් තෙමා මිරිකා පිසදැමියයුතු. ඉදින් බිම (ගුරු ආදි කිසිවෙකින්) පිරියම් නො කරන ලද නම්, 'මෙවෙහෙර දූවිල්ලෙන් නො වැකේවා' යි සිතා දිය ඉස බිම ඇමැද්දයුතු. කැලි කසළ එක් රැස් කොට පසෙක දැමියයුතු.

බුමුතුරුණ අව්වේ තවා (වියළා) ශුද්ධ කොට ගසාදමා ඇතුළට ගෙන ගොස් කලින් පනවා තුබුණු පරිදි ම පැනැවියයුතු. ඇඳ පාඅලු වියළා පිසදමා ඇතුළට ගෙනගොස් කලින් තුබුණු තන්හි තැබියැ යුතු. ඇඳ අව්වේ දමා ශුද්ධ කොට ගසාදමා පහත් කොට කිසිවෙක නො ගාවමින් නො ගටමින් මනාව ඇතුළට ගොස් කලින් තුබුණු තැන පැනැවියැයුතු. පුටුව අව්වේ ලා ශුද්ධ කොට ගසාහෙළා පහත් කොට කිසිවෙක නො ගාවමින් නොගටමින් ඇතුළට ගෙන ගොස් කලින් තුබුණු තැන පැනවියැයුතු. දෙරපළුපිට ඇතුළට ගෙනගොස් කලින් තුබුණු තැන ම තැබියැයුතු. බිසි ද කොට්ට ද අව්වේ ලා ශුද්ධ කොට ගසාදමා ඇතුළට ගෙන ගොස් කලින් තුබු තන්හි ම පැනැවියයුතු. ඉඳිනා ඇතිරි ද පසතුරුණු ද අව්වෙන් තවා ශුද්ධ කොට ගසා හෙළා ඇතුළට ගෙනගොස් කලින් තුබූ තැන පැනැවියයුතු. කෙළමලාව අව්වේ ලා තවා පිස දමා ඇතුළට ගෙනගොස් කලින් තුබුණු තැන තැබියැයුතු. හේත්තුවන පුවරුව අව්වේ ලා පිසදමා ඇතුළට ගෙනගොස් කලින් තුබුණු තැන ම තැබියැයුතු.

3. පා සිවුරු බහා තැබියයුතු. පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන එක් අතෙකින් ඇඳ යට හෝ පුටුව යට හෝ පරාමර්ශනය කොට (අත ගා) පාත්‍රය තැබියයුතු. (පැදුරු ඈ කිසිවක්) නො අතුළ බිමැ පාත්‍රය නො තැබියැයුතු. සිවුර තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන එක් අතෙකින් සිවුරුවස (සිවුර දමන උණ දණ්ඩ) හෝ සිවුරුරැහැන (සිවුර දමන රැහැන) හෝ පිසදමා සිවුරු කොන පිටතට ද සිවුරු නැමුම තමා දෙසට ද වැටෙන සේ කොට සිවුර තැබිය යුතු.

සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති දිවා වාතපානා ථකෙතබ්බා. රත්තිං විවරිතබ්බා.

සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති වච්චකුටි සම්මජ්ජිතබ්බා.

සචෙ පානීයං න හොති පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ ආගන්තුකානං භික්ඛූනං වත්තං යථා ආගන්තුකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.[1]

## ආවාසිකවත්තං

4. තෙන ඛො පන සමයෙන ආවාසිකා භික්ඛූ ආගන්තුකෙ භික්ඛූ දිස්වා නෙව ආසනං පඤ්ඤපෙන්ති න පාදොදකං න පාදපීඨං න පාදකඨලිකං[2] උපනික්ඛිපන්ති. න පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගණ්හන්ති. න පානීයෙන පුච්ඡන්ති. වුඩ්ඪතරෙ, පි ආගන්තුකෙ භික්ඛූ න අභිවාදෙන්ති න සෙනාසනං පඤ්ඤපෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ආවාසිකා භික්ඛූ ආගන්තුකෙ භික්ඛූ දිස්වා නෙව ආසනං පඤ්ඤපෙස්සන්ති -පෙ- න සෙනාසනං පඤ්ඤපෙස්සන්තීති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

1. සම්මා වත්තිතබ්බන්ති- මජසං. (එවං සබ්බත්ථ)
2. පාද කඨලිකං සිමු.

ඉදින් පෙර දිගට අයත් දූවිලි සහිත වාතයෝ හමත් නම්, පෙරදිගැ වූ වාකවුළු වසා දැමියයුතු. ඉදින් පැසිම් දිගට අයත් දූවිලි සහිත වාතයෝ හමත් නම්, පැසිම් දිගැ වාකවුළු වසාදැමියයුතු. ඉදින් උතුරු දිගට අයත් දූවිලි සහිත වාතයෝ හමත් නම්, උතුරු දිගැ වාකවුළු වසාලියැයුතු. ඉදින් දකුණු දිග දූවිලි සහිත වාතයෝ හමත් නම්, දකුණු දිගැ වාකවුළු වසා තැබියැයුතු ඉදින් ශීතකාලය වේ නම්, දහවල් වාකවුළු විවැරියැයුතු, රෑ වැසියැයුතු. ඉදින් උෂ්ණකාලය වේ නම්, දහවල් වාකවුළු වැසියයුතු, රෑ විවැරියැයුතු.

ඉදින් පිරිවෙන කැලි කසළ සහිත වේ නම්, පිරිවෙන හැමැන්ද යුතු, ඉදින් දෙරටුව (දොර කොටුව) කසළ සහිත වී නම්, එය හැමැන්දයුතු. ඉදින් උවටන් හල කසළ සහිත වී නම්, උවටන් හල හැමැන්දයුතු. ඉදින් ගිනිහල් ගෙය කසළ සහිත වී නම්, එය හැමැන්ද යුතු. ඉදින් වැසිකිළිය කැලි කසළ සහිත වී නම්, එය හැමැන්දයුතු.

ඉදින් බොන පැන් නො වේ නම්, එය එළවා තැබියැයුතු. ඉදින් පරිභොග පැන් නො වේ නම්, එය එළවා තැබියැයුතු. ඉදින් මල දෙවා හරනා දිය සඳහා ඇති කළයේ ජලය නො වේ නම්, එහි එය වත්කළයුතු.

මහණෙනි, යම් සේ ආගන්තුකයන් විසින් පැවැත්වියැයුතු ද, මේ ඒ ආගන්තුක භික්ෂූන්ගේ වත යි.

## ආවාසිකවත්

4. එ සමයෙහි වනාහි ආවාසික භික්ෂූහු ආගන්තුක භික්ෂූන් දැක අසුන් නො ම පනවත්, පාදෝනා දිය ද පාපුටුව ද පාද කඨලිකාව ද නො ම එළවාතබත්. පෙරගමන් කොට පාසිවුරු නො ම පිළිගනිත්. බොන පැනින් නො ම විචාරත්. වැඩිමහලු වූ ද ආගන්තුක භික්ෂූන් දැක නො ම වඳිත්, සෙනසුන් නො ම පනවත්. අල්පෙච්ඡ වූ ලද දෑයින් සතුටු වන, ලජ්ජි වූ, සුළු වරදෙහි ද කුකුස් කරන, ශික්ෂාකාමී යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු 'කෙසේ නම් ආවාසික මහණහු ආගන්තුක මහණුන් දැක අසුන් නො ම පනවත් ද ... සෙනසුන් නො ම පන-වත් ද'' යි ලාමක කොට කියත්, නින්ද කෙරෙත්, දෙස් පතුරුවත්.

ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ.

"සච්චං කිර භික්ඛවෙ -පෙ-"

'සච්චං භගවා" -පෙ-

විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"තෙන හි භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි යථා ආවාසිකෙහි වත්තිතබ්බං:

5. "ආවාසිකෙන භික්ඛවෙ භික්ඛුනා ආගන්තුකං භික්ඛුං වුඩ්ඪතරං දිස්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පානීයෙන පුච්ඡිතබ්බො. සචෙ උස්සහති උපාහනා පුඤ්ඡිතබ්බා. උපාහනා පුඤ්ඡන්තෙන පඨමං සුක්ඛෙන චොළකෙන පුඤ්ඡිතබ්බා, පච්ඡා අල්ලෙන උපාහනපුඤ්ඡනචොළකං ධොවිත්වා එකමන්තං විස්සජ්ජෙතබ්බං. ආගන්තුකො භික්ඛු වුඩ්ඪතරො අභිවාදෙතබ්බො. සෙනාසනං පඤ්ඤපෙතබ්බං එතං තෙ සෙනාසනං පාපුණාතීති. අජ්ඣාවුත්ථං වා අනජ්ඣාවුත්ථං වා ආචික්ඛිතබ්බං. ගොචරො ආචික්ඛිතබ්බො, අගොචරො ආචික්ඛිතබ්බො. සෙක්ඛසම්මතානි කුලානි ආචික්ඛිතබ්බානි. වච්චට්ඨානං ආචික්ඛිතබ්බං. පස්සාවට්ඨානං ආචික්ඛිතබ්බං, පානීයං ආචික්ඛිතබ්බං, පරිභොජනීයං ආචික්ඛිතබ්බං, කත්තරදණ්ඩො ආචික්ඛිතබ්බො. සඞ්ඝස්ස කතිකසණ්ඨානං ආචික්ඛිතබ්බං ඉමං කාලං පවිසිතබ්බං ඉමං කාලං නික්ඛමිතබ්බන්ති.

සචෙ නවකො හොති නිසින්නකෙන ආචික්ඛිතබ්බං: "අත්‍ර පත්තං නික්ඛිපාහි, අත්‍ර චීවරං නික්ඛිපාහි, ඉදං ආසනං, නිසීදාහී"ති. පානීයං ආචික්ඛිතබ්බං, පරිභොජනීයං ආචික්ඛිතබ්බං, උපාහනපුඤ්ඡන චොළකං ආචික්ඛිතබ්බං. ආගන්තුකෙන භික්ඛුනා අභිවාදාපෙතබ්බො. සෙනාසනං ආචික්ඛිතබ්බං 'එතං තෙ සෙනාසනං පාපුණාතී'ති, අජ්ඣාවුත්ථං වා අනජ්ඣාවුත්ථං වා ආචික්ඛිතබ්බං. ගොචරො ආචික්ඛිතබ්බො, අගොචරො ආචික්ඛිතබ්බො, සෙක්ඛසම්මතානි කුලානි ආචික්ඛිතබ්බානි, වච්චට්ඨානං ආචික්ඛිතබ්බං, පස්සාවට්ඨානං ආචික්ඛිතබ්බං, පානීයං ආචික්ඛිතබ්බං, පරිභොජනීයං ආචික්ඛිතබ්බං, කත්තරදණ්ඩො ආචික්ඛිතබ්බො. සඞ්ඝස්ස කතිකසණ්ඨානං ආචික්ඛිතබ්බං ඉමං කාලං පවිසිතබ්බං ඉමං කාලං නික්ඛමිතබ්බන්ති.

ඉදං ඛො භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං වත්තං යථා ආවාසිකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.

"මහණෙනි, සැබෑ ද ... යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළසේක.

"සත්‍යය, භාග්‍යවතුන් වහන්සැ" යි ඒ භික්ෂූහු කීහ...

භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දැහැමි කථා කොට, භික්ෂූන් ඇමතූසේක.

"මහණෙනි, එසේ වී නම් ආවාසික මහණුන් විසින් යමසේ පැවතියයුතු ද, එසේ ආවාසික භික්ෂූනට වත පනවන්නෙමි" යි වදරා මෙසේ වත් පැනැවූසේක.

5. "මහණෙනි, ආවාසික මහණහු විසින් වැඩිමහලු අංගන්තුක මහණක්හු දැක, අස්නක් පැනැවියයුතු. පාදෝනා දිය ද, පාපුටුව ද, පාදකඨලිකාව ද එළවාතැබියයුතු. පෙරගමන් කොට පාසිවුරු පිළිගතයුතු. පැනින් විචාළයුතු. හැකි වේ නම්, පාවහන් පිස දැමියැයුතු, පාවහන් පිසදමන්නහු විසින් පළමු කොට වියැළි රෙදි කඩෙකින් පිස දැමියයුතු, පසු වැ තෙත් රෙදි කඩින් පිස දැමියයුතු. පාවහන් පිස්නා රෙදි කඩ සෝද පසෙක (විස්සජෙජතබ්බං) වැතිය යුතු. ආගන්තුක මහණ තෙම වැඩිමහලු වී නම්, වැන්දයුතු, 'මේ සෙනස්න ඔබට පැමිණෙතැ' යි සෙනස්න පැනැවියැ යුතු. සෙනස්න අන්කෙනකු වුසූ හෝ නො වුසූ එකක් ද යන්න දන්විය යුතු. ගොචරස්ථාන දන්වියයුතු. අගොචර ස්ථාන ද දන්වියැයුතු. සෙඛසම්මත කුල (අසෝ නමැ යි) දන්වියැයුතු. වැසිකිළිය ඇති තැන කියයුතු, කැසිකිළිය ඇති තැන කියැයුතු. බොන පැන් ඇති තැන කියයුතු. පරිභොග ජලය ඇති තැන කියැයුතු. සැරයැටිය ඇති තැන කියයුතු. 'මේ වේලෙහි ගම පිවිසියැයුතු, මෙ වේලෙහි ගමින් නික්මි යැ යුතු යැ' යි සඞ්ඝයාගේ කතිකා නියමය කියයුතු.

ඉදින් ආගන්තුක මහණ නවක වී නම්, තමා හිඳ 'මෙහිම පාත්‍රය තබව, මෙහි සිවුර තබව, මේ අස්න ය, මෙහි හිඳගනුව" යි කියැයුතු. බොන පැන් ඇති තැන කියයුතු. පරිභොග ජලය ඇති තැන කියැයුතු. පාවහන් පිස්නා රෙදිකඩ පෙන්විය යුතු. නවක වූ ආගන්තුක මහණහු ලවා ආවාසික වූ තෙමේ වැන්දවියැයුතු. 'මේ සෙනස්න ඔබට පැමිණෙතැ' යි සෙනස්න පෙන්වියැයුතු. සෙනස්න එයින් පෙර කිසිවකු වුසූ හෝ නො වුසූ තැනෙක් ද යන්න කියැයුතු. ගොචර ස්ථාන ද අගොචර ස්ථාන ද දන්වියැයුතු. සෙඛසම්මත කුල දන්වියැයුතු. වැසිකිළිය පෙන්වියයුතු. කැසිකිළිය පෙන්වියැයුතු. බොන පැන් පෙන්වියැයුතු, පරිභොග ජලය පෙන්වියැයුතු. සැරයැටිය පෙන්වියයුතු, 'මේ පිවිසියැයුතු කාලය, මේ නික්මියැයුතු කාලයැ' යි සඞ්ඝයාගේ කතිකා නියමය කියැයුතු.

මහණෙනි, යම් සේ ආවාසික භික්ෂූන් විසින් පැවැතියැයුතු ද, මේ එසේ වූ ආවාසික භික්ෂූන් පිළිබඳ වත යි.

## ගමිකවත්තං

6. තෙන ඛො පන සමයෙන ගමිකා භික්ඛූ දරුභණ්ඩං මත්තිකාභණ්ඩං අපටිසාමෙත්වා ද්වාරවාතපානං විවරිත්වා සෙනාසනං අනාපුච්ඡා පක්කමන්ති. දරුභණ්ඩං මත්තිකාභණ්ඩං නස්සති. සෙනාසනං අගුත්තං හොති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ගමිකා භික්ඛූ දරුභණ්ඩං මත්තිකාභණ්ඩං අපටිසාමෙත්වා ද්වාරවාතපානං විවරිත්වා සෙනාසනං අනාපුච්ඡා පක්කමිස්සන්ති, දරුභණ්ඩං මත්තිකාභණ්ඩං නස්සති සෙනාසනං අගුත්තං හොතීති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

''සච්චං කිර භික්ඛවෙ –පෙ–''

''සච්චං භගවා'' –පෙ–

විගරහිත්වා ධම්මිංකථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''තෙන හි භික්ඛවෙ ගමිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි යථා ගමිකෙහි භික්ඛූහි වත්තිතබ්බං''

7. ගමිකෙන භික්ඛවෙ භික්ඛුනා දරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා සෙනාසනං ආපුච්ඡිත්වා පක්කමිතබ්බං. සචෙ භික්ඛු න හොති. සාමණෙරො ආපුච්ඡිතබ්බො. සචෙ සාමණෙරො න හොති. ආරාමිකො ආපුච්ඡිතබ්බො. සචෙ ආරාමිකො න හොති. උපාසකො ආපුච්ඡිතබ්බො. සචෙ න හොති භික්ඛු වා සාමණෙරො වා ආරාමිකො වා උපාසකො වා චතුසු පාසාණෙසු මඤ්චං පඤ්ඤපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරි පුඤ්ජං කරිත්වා දරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා පක්කමිතබ්බං.

සචෙ විහාරො ඔවස්සති සචෙ උස්සහති ඡාදෙතබ්බො. උස්සුක්කං වා කාතබ්බං කින්ති නු ඛො විහාරො ඡාදියෙථාති. එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ යො දෙසො අනොවස්සකො හොති, තත්ථ චතුසු පාසාණෙසු මඤ්චං පඤ්ඤපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරි පුඤ්ජං කරිත්වා දරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා පක්කමිතබ්බං.

## ගමික වත්

6. එ සමයෙහි ගමික (ගමන් යන) භික්ෂූහු ලිබඩු මැටිමුවා බඩු සුරක්ෂිත කොට නො තබා දෙරවල් ද වාකවුළු ද හැර දමා සෙනස්න කිසිවකුටත් නො පවරා නික්මයෙත්. ලී බඩු ද මැටිමුවා බඩු ද නැසෙයි. සෙනස්න නො රැකුණේ ද වෙයි. අල්පෙච්ඡ වූ ලජ්ජී වූ ශික්ෂාකාමී වූ කුකුස් කරන්නා වූ යම් භික්ෂු කෙනෙක් වෙත් ද, ඔහු "කෙසේ නම් ගමික භික්ෂූහු ලිබඩු මැටිමුවා බඩු සුරක්ෂිත කොට අහුරා නො තබා දෙරවල් ද වාකවුළු ද විවර කොට සෙනස්න රැක ගන්නට කිසිවකුටත් නො පවරා නික්ම යන්නාහු ද, ලිබඩු මැටිබඩු නස්නෝ ද, සෙනස්න නොරැකුණේ වේ ද" යි ලාමක කොට කියත්, නිඳා කෙරෙත්, දෙස් පතුරුවත්.

ඉක්බිති ඒ මහණහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළාහ.

"මහණෙනි, සැබෑ ද? ... යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

"භාග්‍යවතුන් වහන්ස, සැබැවැ යි භික්ෂූහු කීහ...

භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා, දැහැමි කථා කොට, භික්ෂූන් බණවා,

"මහණෙනි, එසේ වී නම්, යම්සේ ගමික භික්ෂූන් විසින් පැවැතියයුතු ද, එසේ ගමික භික්ෂූනට වත් පනවන්නෙමි" යි වදාරා ගමික වත පැනැවූසේක.

7. "මහණෙනි, ගමික මහණහු විසින් ලිබඩු ද මැටිමුවා බඩු ද සුරැකි කොට තැබියයුතු. දෙරවල් වාකවුළු වසා සෙනස්න රැක ගන්නට කෙනකුට දන්වා නික්මියැ යුතු. භික්ෂූනමක් (එහි) නො වී නම්, හෙරණ තෙම දැන්විය යුතු (හෙරණහට ඒවා රැක ගන්නට පැවැරියැයුතු), හෙරණෙක් නො සිටී නම්, ආරාමික තෙම (ආරාමිකයාට) දැන්වියයුතු. ආරාමිකයෙක් නො වී නම්, උපාසකයකුට දැන්වියැයුතු. මහණෙක් හෝ හෙරණෙක් හෝ ආරාමිකයෙක් හෝ උපාසකයෙක් හෝ නො වී නම්, ගල් සතරක් උඩ ඇඳ පනවා, ඇඳ මත තව ඇඳක් නංවා, පුටුවක් මත පුටුවක් නංවා, සෙනස්න මතුයෙහි ගොඩ ගසා ලීබඩු මැටිබඩු එහි සුරැකි කොට අහුරා තබා දෙරවල් වාකවුළු වසා තබා නික්මියැයුතු.

විහාරය තෙමේ නම්, හැකි නම් (උළු ආදියකින්) වැසිය යුතු. 'කෙසේ නම් විහාරය සෙවිලි කරනු ලබන්නේ ද' යි උත්සාහ හෝ කළයුතු. මෙසේත් මෙය ලබන්නේ නම්, (මෙය සිදු වන්නේ නම්) මෙසේ මෙය මැනැව. ඉදින් නො ලබන්නේ නම් යම් පැත්තෙක් නො තෙමෙන්නේ වේ නම්, එහි ගල් සතරක් මත ඇඳක් පනවා, ඒ ඇඳ මත තව ඇඳක් නංවා පුටුවක් උඩ පුටුවක් නංවා, සෙනස්න මත ලී බඩුත් මැටි බඩුත් ගොඩ ගසා සුරැකි කොට තබා දෙරවල් වාකවුළු වසා තබා නික්මියැ යුතු.

සචෙ සබ්බො විහාරො ඔවස්සති සචෙ උස්සහති සෙනාසනං ගාමං අතිහරිතබ්බං. උස්සුක්කං වා කාතබ්බං කින්ති නු ඛො සෙනාසනං ගාමං අතිහරියෙථාති. එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ අබ්භොකාසෙ චතූසු පාසාණෙසු මඤ්චං පඤ්ඤපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරි පුඤ්ජං කරිත්වා දරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා තිණෙන වා පණ්ණෙන වා පටිච්ඡාදෙත්වා පක්කමිතබ්බං අප්පෙවනාම අඞ්ගානිපි සෙසෙය්‍යුන්ති.

ඉදං ඛො භික්ඛවෙ ගමිකානං භික්ඛූනං වත්තං යථා ගමිකෙහි වත්තිතබ්බන්ති.

8. තෙන ඛො පන සමයෙන භික්ඛූ භත්තග්ගෙ න අනුමොදන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම සමණා සක්‍යපුත්තියා භත්තග්ගෙ න අනුමොදිස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

"අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අනුමොදිතුන්ති".

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි "කෙන නු ඛො භත්තග්ගෙ අනුමොදිතබ්බන්ති". භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"අනුජානාමි භික්ඛවෙ ථෙරෙන භික්ඛුනා භත්තග්ගෙ අනුමොදිතුන්ති".

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝභත්තං හොති. ආයස්මා සාරිපුත්තො සඞ්ඝත්ථෙරො හොති. භික්ඛූ 'භගවතා අනුඤ්ඤාතං ථෙරෙන භික්ඛුනා භත්තග්ගෙ අනුමොදිතුන්ති', ආයස්මන්තං සාරිපුත්තං එකකං ඔහාය පක්කමිංසු. අථ ඛො ආයස්මා සාරිපුත්තො තෙ මනුස්සෙ පටිසම්මොදිත්වා පච්ඡා එකකොව අගමාසි. අද්දසා ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "කච්චි සාරිපුත්ත භත්තං ඉද්ධං අහොසී"ති. "ඉද්ධං ඛො භන්තෙ භත්තං අහොසි. අපි ච මං භික්ඛූ එකකං ඔහාය පක්කන්තා"ති.

ඉදින් සියලු විහාරය තෙමේ නම්, හැක්කේ නම්, සෙනස්න ගමට ගෙන යායුතු. කෙසේ නම් සෙනස්න ගමට ගෙනයනු ලබන්නේ ද යි උත්සුක බව හෝ කළයුතු යි. ඉදින් මෙය මෙසේ ලබන්නේ නම් ඒ මැනැව. ඉදින් නො ලබන්නේ නම්, එලිමහනෙහි ගල් සතරක් උඩ ඇඳක් පනවා ඒ ඇඳෙහි ඇඳක් නංවා පුටුවෙක පුටුවක් නංවා සෙනස්න මත ලිබඩුත් මැටිබඩුත් එක්රැසක් කොට (එකට ගොඩගසා) සුරකි කොට 'යටත්පිරිසෙයින් ලිබඩුවල අවයවවත් ඉතිරි වන්නේ නම් මැනැවැ' යි තෘණයෙන් හෝ කොළවලින් හෝ වසා තබා නික්මැ යායුතු.

මහණෙනි, යම්සේ ගමිකයන් විසින් පැවැතියැයුතු ද මේ ඒ ගමික භික්ෂූන් පිළිබඳ වත යි''.

8. එසමයෙහි මහණහු බොජුන් ගන්නා තන්හි දී (බොජුන් හලේ දී) අනුමොදනා නො කෙරෙත්. ''කෙසේ නම් ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ බොජුන්හලෙහි දී අනුමොදනා නො කරන්නාහු ද'' යි මිනිස්සු ලාමක කොට සිතත්, නිඥා කෙරෙත්, නුගුණ කථා පතුරුවත්. භික්ෂූහු ලාමක කොට සිතන, නිඥා කරන, නුගුණ පතුරුවන ඒ මිනිසුන්ගේ වචන ඇසූහ. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කරුණෙහි දැහැමි කථා කොට භික්ෂූන් අමතා,

''මහණෙනි, බොජුන්හලෙහි දී අනුමොදනා බණ කියන්නට අනුදනිමි'' යි වදළසේක.

එකල්හි ඒ මහණුනට ''කවර නම් කෙනකුන් විසින් බොජුන් හලෙහි දී අනුමොදනා බණ කියැයුතු ද?'' යී මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකළාහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මෙ කරුණෙහි දැහැමි කථා කොට, භික්ෂූන් බණවා,

''මහණෙනි, ස්ථවිර මහණක්හු විසින් භක්තාග්‍රයෙහි අනුමොදනා කරන්නට අනුදනිමි'' යි වදළසේක.

එසමයෙහි වනාහි එක්තරා සමූහයකගේ සඟබතක් වෙයි. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ (එයට වැඩිය සඟ පිරිසේ) සඞ්ඝස්ථවිර වෙති. 'ස්ථවිර මහණහු විසින් භක්තාග්‍රයෙහි අනුමෝදනා කරන්නට අනුදනිමි' යි භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද'' යි කියා, භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් හුදෙකලා කොට හැර නික්මැගියාහ. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ ඒ මිනිසුනට භුක්තානුමොදනාව කොට, පසුව හුදෙකලාව ම වැඩියාහ. භාග්‍යවතුන් වහන්සේ දුරින් ම වඩනා ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් දුටුසේක. දැක ඔබ බණවා, ''කිමෙක් ද ශාරිපුත්‍රයෙනි, බත සමෘද්ධ වී ද'' යි අසාවදළසේක. ''වහන්ස, බත සමෘද්ධ විය. එහෙත් භික්ෂූහු මා හුදෙකලා කොට හැරදමා ගියාහු'' යැ යි සැලකළහ.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

‘‘අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ චතූහි පඤ්චහි ථෙරානුථෙරෙහි භික්ඛූහි ආගමෙතුන්ති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ථෙරො භත්තග්ගෙ වච්චිතො ආගමෙසි. සො වච්චං සන්ධාරෙන්තො අසක්කොන්තො මුච්ඡිතො පපති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

‘‘අනුජානාමි භික්ඛවෙ සතිකරණීයෙ ආනන්තරිකං භික්ඛුං ආපුච්ඡිත්වා ගන්තුන්ති.

## භත්තග්ගවත්තං

9. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා භත්තග්ගං ගච්ඡන්ති වොක්කම්මපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගච්ඡන්ති. ථෙරෙපි භික්ඛූ අනුපඛජ්ජ නිසීදන්ති. නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහන්ති. සඞ්ඝාටිම්පි ඔත්ථරිත්වා අන්තරඝරෙ නිසීදන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති ‘‘කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා භත්තග්ගං ගච්ඡිස්සන්ති වොක්කම්ම ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගච්ඡිස්සන්ති, ථෙරෙපි භික්ඛූ අනුපඛජ්ජ නිසීදිස්සන්ති, නවෙපි භික්ඛූ ආසනෙනපි පටිබාහිස්සන්ති, සඞ්ඝාටිම්පි ඔත්ථරිත්වා නිසීදිස්සන්තීති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

‘‘සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා භත්තග්ගං ගච්ඡන්ති-පෙ- සඞ්ඝාටිම්පි ඔත්ථරිත්වා නිසීදන්තී’’ති.

සච්චං භගවා.

විගරහි බුද්ධො භගවා. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

තෙන හි භික්ඛවෙ භික්ඛූනං භත්තග්ගෙ වත්තං පඤ්ඤපෙස්සාමි යථා භික්ඛූහි භත්තග්ගෙ වත්තිතබ්බං:

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ පවුරුණෙහි දැහැමි කථා කොට, භික්ෂූන් බණවා-

"මහණෙනි, භක්තාග්‍රයෙහි සතර පස් නමක් පෙර අනුපෙර භික්ෂූන් (භුත්තානුමෝදනාව අවසන් වන තෙක්) රැඳී බලා පොරොත්තු වියයුතු යැ" යි වදළසේක.

එ සමයෙහි එක්තරා ස්ථවිර නමක් භක්තාග්‍රයෙහි දී වර්චසින් මැඩුණේ රැඳී හුන්නේ ය. හේ වර්චස් වෙගය දරාගන්නට නො හැක්කේ මුසපත් වැ වැටුණේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

"මහණෙනි, කටයුත්තක් ඇති කල්හි තමාට අනතුරුව (තමා ළඟ ම) ඉන්නා මහණහට දන්වා යන්නට අනුදනිමි" යි වදළසේක.

## භක්තාග්‍ර වත

9. එසමයෙහි සවැගි මහණහු මනා කොට නො හැන්දහු, මනා කොට නො පෙරෙවියාහු, සුදුසු ආකල්ප (මනා ලෙස ඉරියවු පැවැත්වීම) නැත්තාහු, භොජන ශාලාවට යෙත්. ස්ථවිර භික්ෂූන් පසුබා ඉදිරි ඉදිරිවැ ද යෙත්. ස්ථවිර භික්ෂූන් මැදට පිවිස මහාතෙරුනට ඇලී හිඳගනිත්. නවක භික්ෂූන් ඔවුන් හුන් අස්නෙන් නෙරපත්. සඟළ සිවුර යට කොට ද ඇතුළුගෙහි හිඳිත්. අල්පෙච්ඡ වූ ලජ්ජී වූ සුළු වරදෙහිත් කුකුස් කරන්නාවූ ශික්ෂාකාමී වූ යම් මහණ කෙනෙක් වෙත් ද, ඔහු "කෙසේ නම් සැවැගි මහණහු නොමනා ව හැන්දහු, නොමනා ව පෙරෙවියාහු, මනා ආකල්ප නැත්තාහු බොජුන් හලට යන්නාහු ද ස්ථවිර භික්ෂූන් පසුබා තුමූ ඉදිරි ඉදිරි ව යන්නාහු ද, ස්ථවිර භික්ෂූන් මැදට වැද මහතෙරුනට ඇලී හිඳින්නාහු ද, නවක භික්ෂූන් ඔවුන් හුන් අසුන් වලින් නෙරනාහු ද, ගමෙහි දී සඟළ සිවුර ද යට කොට හිඳින්නාහු ද" යි ලාමක කොට සිතත්, නිඳා කෙරෙත්, නුගුණ කථා පතුරුවත්.

එ කලැ ඒ භික්ෂූහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළහ.

"මහණෙනි, සැවැගි මහණහු නො මනා කොට හැඳ ගත්තෝ වැ, නො මනා කොට පෙරෙව ගත්තෝ වැ මනා ආකල්ප නැත්තෝ වැ බොජුන් හලට යෙත් ල ... සඟළ සිවුර යට කොට ද ගමෙහි හිඳිත් ල ඒ සැබෑ ද?" යි අසාවදළසේක.

'ඒ සැබෑවැ' වහන්සැ යි මහණහු කීහ.

භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගැරැහූ සේක. වෙසෙසින් ගරහා, දැහැමි කථා කොට, භික්ෂූන් බණවා-

"මහණෙනි, එසේ වී නම්, යම් සේ භික්ෂූන් විසින් භක්තාග්‍රයෙහි පැවැතියයුතු ද එසේ වූ භක්තාග්‍ර වත භික්ෂූනට පනවන්නෙමි" යි වදළසේක. (මෙසේ වදරා මතු දක්වෙන වත පැනවූසේක):

10. "සචෙ ආරාමෙ කාලො ආරොචිතො හොති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො. න වොක්කම්ම ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගන්තබ්බං සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං, සුසංවුතෙන -පෙ- ඔක්ඛිත්තචක්ඛුනා -පෙ- න උක්ඛිත්තකාය -පෙ- න උජ්ජග්ඝිකාය -පෙ- අප්පසද්දෙන -පෙ- න කායප්පචාලකං -පෙ- න බාහුප්පචාලකං -පෙ- න සීසප්පචාලකං -පෙ- න ඛම්භකතෙන -පෙ- න ඔගුණ්ඨිතෙන -පෙ- න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං.

සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං. සුසංවුතෙන -පෙ- ඔක්ඛිත්තචක්ඛුනා - පෙ - න උක්ඛිත්තකාය -පෙ- න උජ්ජග්ඝිකාය -පෙ- අප්පසද්දෙන -පෙ- න කායප්පචාලකං -පෙ- න බාහුප්පචාලකං -පෙ- න සීසප්පචාලකං -පෙ- න ඛම්භකතෙන -පෙ- න ඔගුණ්ඨිතෙන -පෙ- න පල්ලත්ථිකාය -පෙ- න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහිතබ්බා. න සඞ්ඝාටිං ඔත්ථරිත්වා අන්තරඝරෙ නිසීදිතබ්බං.

11. උදකෙ දීයමානෙ උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා උදකං පටිග්ගහෙතබ්බං. නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන පත්තො ධොවිතබ්බො. සචෙ උදකපටිග්ගාහකො හොති නීචං කත්වා උදකපටිග්ගහෙ උදකං ආසිඤ්චිතබ්බං මා උදකපටිග්ගාහකො උදකෙන ඔසිඤ්චි, මා සාමන්තා භික්ඛූ උදකෙන ඔසිඤ්චිංසු, මා සඞ්ඝාටි උදකෙන ඔසිඤ්චී'ති.

සචෙ උදකපටිග්ගාහකො න හොති. නීචං කත්වා ඡමාය උදකං ආසිඤ්චිතබ්බං. මා සාමන්තා භික්ඛූ උදකෙන සිඤ්චිංසු, මා සඞ්ඝාටි උදකෙන ඔසිඤ්චී'ති.

ඔදනෙ දීයමානෙ උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා ඔදනො පටිග්ගහෙතබ්බො. සූපස්ස ඔකාසො කාතබ්බො. සචෙ හොති සප්පි වා තෙලං වා උත්තරිභඞ්ගං වා. ථෙරෙන වත්තබ්බො සබ්බෙසං සමකං සම්පාදෙහීති.

සක්කච්චං පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. පත්තසඤ්ඤිනා පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. සමසූපකො පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. සමතිත්තිකො පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. න තාව ථෙරෙන භුඤ්ජිතබ්බං. යාව න සබ්බෙසං ඔදනො සම්පත්තො හොති.

10. "ඉදින් ආරාමයෙහි කාලය දන්වන ලද්දේ වී නම්, තෙමඬුලු වසන්නහු විසින් පිරිමඬුලු කොට හැඳ කාබාන බැඳ සගුණ කොට සඟළසිවුර පෙරවැ ගැට වටු ගන්වා (ගණ්ඨිය අවුණා) පාත්‍රය දෙව අතින් ගෙන මනා කොට නො යුහුසුලු වැ ගමට පිවිසියැයුතු. ස්ථවිර භික්‍ෂූන් පසුබා ඉදිරි ඉදිරි වැ නො යා යුතු. සුපිළිසන් වැ ගමැ යායුතු. සුසංවෘත වැ ගමැ යායුතු. බිමට හෙළු ඇසැති වැ ... ඔසොවාගත් සිවුරු ඇති වැ නො යායුතු ... මහත් කොට සිනාසිසී නො යායුතු. නිහඬ වැ යායුතු. කය සොලොවමින් නො යායුතු. අත් වන වනා නො යායුතු. හිස සොලොවමින් නො යායුතු ඉඟැ අත් ගසා ගෙන ... හිස වසා පෙරෙවැ නො යායුතු. උත්කුටුක වැ ගමෙහි නො යායුතු.

ගමැ සුපිළිසන් වැ හින්දයුතු. මනා සංවර ඇති වැ ... යටට හෙලූ ඇස් ඇති වැ හින්දයුතු. ඔසවාගත් සිවුරු ඇති වැ ... මහත් කොට සිනා සිසී නො හින්දයුතු. නිහඬ වැ හින්ද යුතු. කය සොලොවමින් ... අත් සොලවමින් ... හිස සොලොවමින් ... ඉඟැ අත් ගසාගෙන ... ඉස වසා පෙරෙවැ ... පල්ලත්ථිකාවෙන් ... ස්ථවිර භික්‍ෂූනට ඇලී නො ඉන්දයුතු. නවක මහණහු අස්නෙන් නො ම නෙරපියැයුතු. ගමැ සඟළ සිවුර යට කොට නො හින්දයුතු.

11. පැන් දෙන කල්හි දැතින් පාත්‍රය පිළිගෙන එයින් පැන් පිළිගතයුතු. පහත් කොට මනාව කිසිවෙක නො ගහවා පාත්‍රය දෙවියැයුතු, ඉදින් දිය පිළිගන්නා බඳුනෙක් (පඩික්කමෙක්) වේ නම්, 'දිය පිළිගන්නා බඳුන දිය ඉහිරී නො තෙමේවා' යි ද, 'ළඟ ඉන්නා භික්‍ෂූහු දියෙන් නොතෙමෙත් වා' යි ද, සඟළ සිවුරු දියෙන් නො තෙමේවා' යි ද සලකා පහත් කොට දිය පිළිගන්නා බඳුනෙහි දිය වත්කළයුතු.

ඉදින් දිය පිළිගන්නා බඳුනෙක් (පඩික්කමෙක්) නො වී නම්, 'ළඟ ඉන්නා මහණහු දියෙන් නො තෙමෙත්වා' යි, 'සඟළ සිවුරු දියෙන් නො තෙමේවා' යි සලකා පහත් කොට බිමැ දිය වත්කළයුතු.

බත් දෙනු ලබන කල්හි දැතින් පාත්‍රය ගෙන එයින් බත් පිළිගතයුතු. සූපයට ඉඩ තැබියැයුතු. ගිතෙල් හෝ තලතෙල් හෝ අවුළපත් හෝ වේ නම්, 'සියලු දෙනාට ම සම ලෙස සපයන්නැ' යි තෙරහු විසින් කියැයුතු.

පිණ්ඩපාතය සකසා (සැලැකිලිමත් වැ) පිළිගතයුතු. පාත්‍රගත සංඥව ඇති ව පිණ්ඩපාතය පිළිගතයුතු. පිණ්ඩපාතය එයට සම වූ (බතින් සතරින් කොටස් පමණ වූ) සූපය ඇත්තේ පිළිගත යුතු. පිණ්ඩපාතය (පාත්‍රයේ) මුවවිට යටැ ඉර තෙක් පමණක් පුරවන ලද බත ඇත්තේ පිළිගතයුතු. යම් තාක් සියලු ම භික්‍ෂූනට බත් නො ලැබුණේ වේ ද ඒ තාක් තෙරහු විසින් නො වැළඳියයුතු.

සක්කච්චං පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. පත්තසඤ්ඤිනා පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. සපදානං පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. සමසූපකො පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. න ථූපතො. ඔමද්දිත්වා පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙතබ්බං භිය්‍යොකම්‍යතං උපාදය. න සූපං වා ඔදනං වා අගිලානෙන අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිතබ්බං.

12. න උජ්ඣානසඤ්ඤිනා පරෙසං පත්තො ඔලොකෙතබ්බො. නාතිමහන්තො කබලො කාතබ්බො. පරිමණ්ඩලො ආලොපො කාතබ්බො. න අනාහටෙ කබලෙ මුඛද්වාරං විවරිතබ්බං. න භුඤ්ජමානෙන සබ්බො හත්ථො මුඛෙ පක්ඛිපිතබ්බො. න සකබළෙන මුඛෙන ව්‍යාහරිතබ්බං. න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිතබ්බං. න කබලාවච්ඡෙදකං භුඤ්ජිතබ්බං. න අවගණ්ඩකාරකං භුඤ්ජිතබ්බං. න හත්ථනිද්ධුනකං භුඤ්ජිතබ්බං. න සිත්ථාවකාරකං භුඤ්ජිතබ්බං. න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිතබ්බං. න චපුචපුකාරකං භුඤ්ජිතබ්බං. න සුරුසුරුකාරකං භුඤ්ජිතබ්බං. න හත්ථනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. න පත්තනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. න ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. න සාමිසෙන හත්ථෙන පානීයථාලකො පටිග්ගහෙතබ්බො.

න තාව ථෙරෙන උදකං පටිග්ගහෙතබ්බං යාව න සබ්බෙ භුත්තාවිනො හොන්ති. උදකෙ දීයමානෙ උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා උදකං පටිග්ගහෙතබ්බං. නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන පත්තො ධොවිතබ්බො. සචෙ උදකපටිග්ගාහකො හොති නීචං කත්වා උදකපටිග්ගහෙ උදකං ආසිඤ්චිතබ්බං මා උදකපටිග්ගාහකො උදකෙන ඔසිඤ්චි. මා සාමන්තා භික්ඛූ උදකෙන ඔසිඤ්චිංසු මා සඞ්ඝාටි උදකෙන ඔසිඤ්චීති. සචෙ උදකපටිග්ගාහකො න හොති නීචං කත්වා ඡමාය උදකං ආසිඤ්චිතබ්බං මා සාමන්තා භික්ඛූ උදකෙන ඔසිඤ්චිංසු, මා සඞ්ඝාටි උදකෙන ඔසිඤ්චී ති. න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙතබ්බං.

නිවත්තන්තෙන, නවකෙහි භික්ඛූහි පඨමතරං නිවත්තිතබ්බං පච්ඡා ථෙරෙහි. සුප්පටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං සුසංවුතෙන–පෙ– ඔක්ඛිත්ත චක්ඛුනා–පෙ– න උක්ඛිත්තකාය –පෙ– න උජ්ජග්ඝිකාය –පෙ– අප්පසද්දෙන –පෙ– න කායප්පචාලකං –පෙ– න බාහුප්පචාලකං –පෙ– න සීසප්පචාලකං –පෙ– න ඛම්භකතෙන –පෙ– න ඔගුණ්ඨිතෙන –පෙ– න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං.

ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං භත්තග්ගෙ වත්තං යථා භික්ඛූහි භත්තග්ගෙ වත්තිතබ්බන්ති.

**පඨමං භාණවාරං.**

සකසා පිණ්ඩපාතය වැළඳියයුතු. පාත්‍රගත සංඥා ඇති ව පිණ්ඩපාතය වැළඳියයුතු. (තැනින් තැන නො ගෙන) එක් තැනෙකින් පටන්ගෙන පිළිවෙළින් පිණ්ඩපාතය වැළැඳියයුතු. පිණ්ඩපාතය එයට යොග්‍ය පමණට සූප ඇත්තේ වැළැඳියයුතු. බත් ගොඩ මැදින් මැඩ නො වැළැඳියයුතු. වැඩියෙන් ලබනු කැමැත්ත නිසා සූප හෝ ව්‍යංජන හෝ බතින් නො වැසියයුතු. නො ගිලන් මහණක්හු විසින් සූප හෝ බත් හෝ තමා සඳහා ඉල්ලා නො වැළැඳියයුතු.

12. අවඥා සහිත හැඟීම් ඇති ව අනුන්ගේ පාත්‍රය නො බැලියැ යුතු. ඉතා මහත් බත්පිඩු නො කළයුතු. බත්පිඩ පිරිමඬුලු (වට) කළයුතු. බත්පිඬුව මුවට ළං නො වන තෙක් මුව දොර නො විවැරියැයුතු. වළඳන්නහු විසින් සියලු අත මුවැ නො බහාලියැයුතු. බත්පිඩුව සහිත මුවින් නො බිණියැයුතු. මුව තුළට බත් ඉසිමින් (විසිකරමින්) නො වැළැඳියැයුතු. බත් පිඩු කඩ කඩ කෙරෙමින් නො වැළඳියැයුතු. වඳුරන් සේ බත්පිඩු හක්කේ රැස් කොට තබාගනිමින් නො වැළඳියැයුතු. අත ගසා දමමින් නො වැළැඳියයුතු. බත්තුළු විසුරුවමින් නො වැළැඳියැයුතු. දිව නෙරමින් නො වැළඳියයුතු. 'චපු චපු' යන හඬ කෙරෙමින් නො වැළැඳියැයුතු. 'සුරු සුරු' යන හඬ කෙරෙමින් නො වැළැඳියැයුතු. අත ලෙවමින් නො වැළැඳියැයුතු. පාත්‍රය ලෙවමින් නො වැළැඳියයුතු. තොල ලෙවමින් නො වැළැඳියැයුතු. ඉඳුල් සහිත අතින් පැන්තලුව (කෝප්පය) නො පිළිගතයුතු.

යම්තාක් සියලු මහණහු වළඳා නිම කෙරෙත් ද, ඒතාක් තෙරහු විසින් දිය නො පිළිගතයුතු. දිය දෙනු ලබන කලැ දැතින් පාත්‍රය ගෙන එයින් දිය පිළිගතයුතු. කිසිවෙක නො ගහමින් පහත් කොට පාත්‍රය මොනොවට අල්ලාගෙන දෙවියැ යුතු. දිය පිළිගන්නා බඳුනෙක් වේ නම්, 'දිය පිළිගන්නහු දියෙන් නො තෙමේව' යි 'ළඟ ඉන්නා මහණහු දියෙන් නො තෙමෙත්ව' යි, 'සඟළසිවුර දියෙන් නො තෙමේව' යි සලකා, දිය පිළිගන්නා බඳුන පහත් කොට එහි දිය වත්කළ යුතු. දිය පිළිගන්නා බඳුනෙක් නො වී නම්, 'ළඟ ඉන්නා මහණහු දියෙන් නො තෙමෙත්ව' යි 'සඟළසිවුර දියෙන් නො තෙමේව' යි සලකා, පහත් කොට බිමැ දිය වත්කළයුතු. පාත්‍ර දෙවූ බත්හුළු සහිත ජලය ගමෙහි (ගෙවල් අතුරෙ) නො දැමියැයුතු.

ඇතුළු ගමින් පෙරළා එන සඞ්ඝයා විසින් (මෙසේ පිළිපැදිය යුතු.) පළමු කොට නවක මහණුන් විසින් පෙරළා ඉයැයුතු, ස්ථවිර මහණුන් විසින් පසු ව ඉයැයුතු. සුපිළිසන්ව ගමැ යා යුතු. සුසංවෘත වැ ... යටට හෙළූ ඇස් ඇති වැ ගමැ යා යුතු. සිවුර ඔසොවාගෙන ... මහහඬින් සිනාසිසී ගමැ නො යායුතු. නිහඬ වැ ගමැ යායුතු. කය සොලවමින් ... අත් සොලවමින් ... හිස සොලොවමින් ... ඉඟැ අත ගසා ගෙන ... හිස වසා පෙරෙවැ ... උත්කුටුක වැ ගමැ නො යායුතු.

මහණෙනි, යම්සේ භික්‍ෂූන් විසින් බොජුන්හලැ පැවැතිය යුතු ද, මේ ඒ බොජුන්හලැ වත යැ'' යි වදාළසේක.

**පළමු බණවර යි.**

## පිණ්ඩචාරික වත්තං

1. තෙන ඛො පන සමයෙන පිණ්ඩචාරිකා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරන්ති. අසල්ලක්ඛෙත්වාපි නිවෙසනං පවිසන්ති අසල්ලක්ඛෙත්වාපි නික්ඛමන්ති. අතිසහසාපි පවිසන්ති. අතිසහසාපි නික්ඛමන්ති. අතිදූරෙපි තිට්ඨන්ති. අච්චාසන්නෙපි තිට්ඨන්ති. අතිචිරම්පි තිට්ඨන්ති. අතිලහුකම්පි නිවත්තන්ති.

අඤ්ඤතරොපි පිණ්ඩචාරිකො භික්ඛු අසල්ලක්ඛෙත්වා නිවෙසනං පාවිසි. සො ච ද්වාරං මඤ්ඤමානො අඤ්ඤතරං ඔවරකං පාවිසි. තස්මිං ච ඔවරකෙ ඉත්ථි නග්ගා උත්තානා නිපන්නා හොති. අද්දසා ඛො සො භික්ඛු තං ඉත්ථිං නග්ගං උත්තානං නිපන්නං. දිස්වාන 'නයිදං ද්වාරං, ඔවරකං ඉදං'ති තම්හා ඔවරකා නික්ඛමි. අද්දසා ඛො තස්සා ඉත්ථියා සාමිකො තං ඉත්ථිං නග්ගං උත්තානං නිපන්නං. දිස්වාන ඉමිනා මෙ භික්ඛුනා පජාපති දූසිතාති තං භික්ඛුං ගහෙත්වා ආකොටෙසි.

අථ ඛො සා ඉත්ථි තෙන සද්දෙන පටිබුජ්ඣිත්වා තං පුරිසං එතදවොච: "කිස්ස ත්වං අය්‍ය ඉමං භික්ඛුං ආකොටෙසී"ති.

"ඉමිනාසි ත්වං භික්ඛුනා දූසිතා"ති.

"නාහං අය්‍ය ඉමිනා භික්ඛුනා දූසිතා. අකාරකො සො භික්ඛූ"ති තං භික්ඛුං මුඤ්චාපෙසි.

අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම පිණ්ඩචාරිකා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරිස්සන්ති. අසල්ලක්ඛෙත්වාපි නිවෙසනං පවිසිස්සන්ති, අසල්ලක්ඛෙත්වාපි නික්ඛමිස්සන්ති, අතිසහසාපි පවිසිස්සන්ති, අතිසහසාපි නික්ඛමිස්සන්ති. අතිදූරෙපි තිට්ඨිස්සන්ති. අච්චාසන්නෙපි තිට්ඨිස්සන්ති. අතිචිරම්පි තිට්ඨිස්සන්ති. අතිලහුකම්පි නිවත්තිස්සන්තීති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර භික්ඛවෙ -පෙ-" "සච්චං භගවා."

## පිණ්ඩචාරික වත

1. එ සමයෙහි පිණ්ඩචාරික භික්ෂූහු නො සකසා හැන්දහු, නො සකසා පෙරවියාහු, භික්ෂු ආකල්පයෙන් යුක්ත නො වූවාහු පිඩු පිණිස හැසිරෙත්, නො සලකා ද ගෙට පිවිසෙත්, නො සලකා ද ගෙන් නික්මෙත්, ඉතා හදිසියෙන් ද ගෙට පිවිසෙත්, ඉතා හදිසියෙන් ද, නික්ම යෙත්, ඉතා ඈත්හි ද, සිටිත්, ඉතා ළඟ ද සිටිත්, ඉතා බොහෝ වේලා ද සිටිත්, ඉතා වහා ද පෙරළා යෙත්.

එක්තරා පිණ්ඩචාරික මහණෙක් ද නො සලකා ගෙයකට පිවිසියේ ය. හේ දොර යැ යි වරදවා සිතනුයේ, එක්තරා ඇතුළු ගෙයකට පිවිසියේ ය. ඒ ඇතුළුගෙහි ද ස්ත්‍රියක් නග්න වැ උඩුකුරු වැ වැද හොත්තී වේ. ඒ මහණ නග්න වැ උඩුකුරු වැ හොත් ඒ ස්ත්‍රිය දුටුයේ ම ය. දැක "මේ දොරකඩ නො වේ. මේ ඇතුළු ගෙයෙකැ" යි සිතා ඒ ඇතුළු ගෙයින් නික්මියේ ය. ඒ ස්ත්‍රියගේ සැමියා නග්න වැ උඩුකුරු වැ හෝනා ඒ ස්ත්‍රිය දැක 'මේ මහණහු විසින් මා බිරිය දූෂිත වූවා' යි සිතා ඒ මහණහු අල්ලාගෙන තැළී ය.

ඉක්බිති ඒ ස්ත්‍රී ඒ හඬින් පිබිද 'සවාමීනි, ඔබ මේ වහන්දැට කුමට තළත් ද' යි ඇසුවා ය.

'මේ මහණ විසින් තෝ දූෂිත වීහි' යි හේ කීව.

"ඕ 'සවාමීනි, මේ මහණ විසින් මම දූෂිත නො වීමි, හෙතෙම වරදක් නො කෙළෙකැ" යි කියා ඒ මහණහු මුදවාලූ ය.

ඉක්බිති ඒ මහණ අරම ගොස් භික්ෂූනට මෙ පවත් සැලකෙළේ ය. අල්පෙච්ඡ සන්තුෂ්ට ලජ්ජී සුළු වරදෙහි ද කුකුස් කරන යම් මහණ කෙනෙක් වෙත් ද, ඔහු "කෙසේ නම් පිණ්ඩ-චාරික භික්ෂූහු නො සකසා හැන්දහු, නො සකසා පෙරෙවියාහු, භික්ෂු ආකල්පයෙන් යුක්ත නො වූවාහු පිඩු පිණිස හැසිරෙන්නාහු ද, නො සලකා ගෙවලට පිවිසීමත් ගෙයින් නික්මීමත් කරන්නාහු ද, ඉතා වහා පිවිසෙන්නාහු ද, ඉතා වහා ගෙන් නික්මෙන්නාහු ද, ඉතා ඈත්හිත් සිටින්නාහු ද, ඉතා ළඟත් සිටින්නාහු ද, ඉතා බොහෝ වේලාත් සිටින්නාහු ද, ඉතා වහාත් නික්ම යන්නාහු දූ" යි ලාමක කොට සිතත්, නිඳු කෙරෙත්, නො ගුණ පතුරුවත්.

එ කලැ ඒ වහන්දැ මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළාහ.

"මහණෙනි, සැබෑ ද" ... යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක. "භාග්‍යවතුන් වහන්ස, සත්‍ය යැ" යි ඒ භික්ෂූහු කීහ.

විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "තෙන හි භික්ඛවෙ පිණ්ඩචාරිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි යථා පිණ්ඩචාරිකෙහි භික්ඛූහි වත්තිතබ්බං."

2. "පිණ්ඩචාරිකෙන භික්ඛවෙ භික්ඛුනා ඉදානි ගාමං පවිසිස්සාමීති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො. සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං. සුසංවුතෙන -පෙ- ඔක්ඛිත්තචක්ඛුනා -පෙ- න උක්ඛිත්තකාය -පෙ- න උජ්ජග්ඝිකාය -පෙ- අප්පසද්දෙන -පෙ- න කායප්පචාලකං -පෙ- න බාහුප්පචාලකං -පෙ- න සීසප්පචාලකං -පෙ- න ඛම්භකතෙන -පෙ- න ඔගුණ්ඨිතෙන -පෙ- න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං.

නිවෙසනං පවිසන්තෙන සල්ලක්ඛෙතබ්බං, 'ඉමිනා පවිසිස්සාමි ඉමිනා නික්ඛමිස්සාමී'ති. නාතිසහසා පවිසිතබ්බං. නාතිසහසා නික්ඛමිතබ්බං. නාතිදූරෙ ඨාතබ්බං. නාච්චාසන්නෙ ඨාතබ්බං. නාතිචිරං ඨාතබ්බං. නාතිලහුකං නිවත්තිතබ්බං. ඨිතකෙන සල්ලක්ඛෙතබ්බං භික්ඛං දාතුකාමා වා අදාතුකාමා වාති. සචෙ කම්මං වා නික්ඛිපති ආසනා වා වුට්ඨාති කටච්ඡුං වා පරාමසති භාජනං වා පරාමසති ඨපෙති වා දාතුකාමා වියාති ඨාතබ්බං. භික්ඛාය දීයමානාය වාමෙන හත්ථෙන සඞ්ඝාටිං උච්චාරෙත්වා දක්ඛිණෙන හත්ථෙන පත්තං පණාමෙත්වා උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා භික්ඛා පටිග්ගහෙතබ්බා, න ච භික්ඛාදායිකාය මුඛං උල්ලොකෙතබ්බං.

සල්ලක්ඛෙතබ්බං සූපං දාතුකාමා වා අදාතුකාමා වාති. සචෙ කටච්ඡුං වා පරාමසති භාජනං වා පරාමසති ඨපෙති වා 'දාතුකාමා-වියා'ති[1] ඨාතබ්බං. භික්ඛාය දින්නාය සඞ්ඝාටියා පත්තං පටිච්ඡාදෙත්වා සාධුකං අතරමානෙන නිවත්තිතබ්බං.

3. සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං. සුසංවුතෙන -පෙ- ඔක්ඛිත්තචක්ඛුනා -පෙ- න උක්ඛිත්තකාය -පෙ- න උජ්ජග්ඝිකාය -පෙ- අප්පසද්දෙන -පෙ- න කායප්පචාලකං -පෙ- න බාහුප්පචාලකං -පෙ- න සීසප්පචාලකං -පෙ- න ඛම්භකතෙන -පෙ- න ඔගුණ්ඨිතෙන -පෙ- න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං.

1. දාතුකාමස්සාති – ස්‍යා.

භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දහැමි කථා කොට, භික්ෂූන් බණවා, ''මහණෙනි, එසේ වී නම් පිණ්ඩචාරික භික්ෂූන් විසින් යම්සේ පැවතියයුතු ද එසේ පවතිනු පිණිස පිණ්ඩචාරික භික්ෂූනට වත් පනවන්නෙමි'' යි (වදරා පහත දක්වෙන වත් පැනැවූ සේක:)

2. ''මහණෙනි, පිණ්ඩචාරික මහණහු විසින් 'දැන් ගමට පිවි-සෙන්නෙමි' යි සලකා තෙමඩුලු වසා හැඳ කාබඳන බැඳ, සගුණ කොට සඟළසිවුරු පෙරෙව, ගැටය වටු වැ අවුණා, පාත්‍රය සෝද අතින් ගෙන, මනා කොට, නො යුහුසුලු වැ ගමට පිවිසියයුතු. සුපිළිසන් වැ ගමැ (ගෙවල් අතුරැ) යායුතු. සුසංවෘත වැ ... යටට හෙළූ ඇස් ඇති වැ, ... එසැවූ සිවුරෙන් නො යුතු වැ ... මහසිනා නැති වැ ... නිහඬ වැ ... කය නො සොලොවමින් ... අත් නො සොලොවමින් ... හිස නො සොලොවමින් ... අත් නො ගසා ගෙන ... හිස වසා නො පෙර වැ .. උත්කුටිකයෙන් තොර වැ ගමැ යායුතු.

ගෙයකට පිවිසෙන මහණහු විසින් 'මෙ මඟින් පිවිසෙන්නෙමි, මෙ මඟින් නික්මෙන්නෙමි' යි සැලකියයුතු. ඉතා වහා නො පිවිසියයුතු, ඉතා වහා නො නික්මියයුතු, ඉතා දුරැ නො සිටියයුතු, ඉතා ළඟැ නො සිටියයුතු, ඉතා බොහෝ වේලා නො සිටියයුතු, ඉතා වහා පෙරළා නො යායුතු. සිටියහු විසින් 'භික්ෂාව දෙනු කැමැත්තාහු ද, නො දෙනු කැමැත්-තාහු ද' යන්න සැලකියයුතු (විමැසුම් ඇති වැ සිටියයුතු), ඉදින් ගෙහි ඉන්නා ස්ත්‍රී හෝ පුරුෂයා තමා කරමින් තුබූ කාර්යය බහා තබයි ද (නවත්තයි ද), අස්නෙන් හෝ නැඟී සිටී ද, හැන්දක් හෝ අල්ලයි ද, බඳුනක් හෝ අල්ලයි ද, පසෙක තබයි ද, දෙනු කැමැත්තවුන් මෙනැ යි සලකා එතැනින් නො ගොස් සිටියයුතු. භික්ෂාව දෙනු ලබන කල්හි වම් අතින් සඟළ සිවුර ඔසවා දකුණතින් පාත්‍රය යොමු කොට දැතින් ම පාත්‍රය ගෙන භික්ෂාව පිළිගතයුතු. භික්ෂාව දෙන්නියගේ මුහුණ නො බැලියයුතු.

'සූපයක් දෙනු කැමැති ද නො කැමැති ද' යි යන්න සැලැකියයුතු. ඉදින් හැන්දක් හෝ අල්ලා ද, බඳුනක් හෝ අල්ලා ද, පසෙක හෝ තබා ද, 'දෙනු කැමැත්තී වනැ' යි එහි ම රැඳී සිටියයුතු. භික්ෂාව දුන් කල්හි සඟළ සිවුරින් පාත්‍රය වසා යුහුසුලු නො වී මනා ව පෙරළා යායුතු.

3. සුපිළිසන් වැ ඇතුළු ගමැ (ගෙවල් අතරැ) යායුතු සුසංවෘත වැ ... යටට හෙළූ ඇස් ඇති වැ ... සිවුර ඔසොවා නො ගෙන ... සිනා සීමෙන් තොර වැ ... නිහඬ වැ ... කය නො සොලොවමින් ... අත් නො සොලොවමින් ... හිස නො සොලොවමින් ... ඉහැ අත නො ගසා ගෙන ... හිස වසා නො පෙර වැ ... උත්කුටිකයෙන් තොර වැ ගමැ යායුතු.

යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති භුඤ්ජිතබ්බං ... යො පඨමතරං ගාමතො පිණ්ඩාය පටික්කමති තෙන ආසනං පඤ්ඤපෙතබ්බං, පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. අවක්කාරපාතිං ධොවිත්වා උපට්ඨාපෙතබ්බා. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති භුඤ්ජිතබ්බං. නො චෙ ආකඞ්ඛති අප්පහරිතෙ වා ඡඩ්ඩෙතබ්බං. අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙතබ්බං.

තෙන ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙතබ්බා. පානීයං පරිභොජනීයං පටිසාමෙතබ්බං. භත්තග්ගං සම්මජ්ජිතබ්බං. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං තෙන උපට්ඨාපෙතබ්බං. සචස්ස හොති අවිසය්හං හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙතබ්බං, න ච තප්පච්චයා වාචා භින්දිතබ්බා.

ඉදං ඛො භික්ඛවෙ පිණ්ඩචාරිකානං භික්ඛූනං වත්තං යථා පිණ්ඩචාරිකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.''

## ආරඤ්ඤිකවත්තං

4. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අරඤ්ඤෙ විහරන්ති. තෙ නෙව පානීයං උපට්ඨාපෙන්ති. න පරිභොජනීයං උපට්ඨාපෙන්ති. න අග්ගිං උපට්ඨාපෙන්ති. න අරණිසහිතං උපට්ඨා-පෙන්ති. න නක්ඛත්තපදානි ජානන්ති. න දිසාභාගං ජානන්ති. චොරා තත්ථ ගන්ත්වා තෙ භික්ඛූ එතදවොචුං: 'අත්ථි භන්තෙ පානීයන්ති.'

'නත්ථාවුසො'ති.

'අත්ථි භන්තෙ පරිභොජනීයන්ති.'

'නත්ථාවුසො'ති.

'අත්ථි භන්තෙ අග්ගීති.'

'නත්ථාවුසො'ති.

'අත්ථි භන්තෙ අරණිසහිතන්ති.'

යමෙක් වඩා පළමුවෙන් ගමෙන් පිණ්ඩපාතයෙන් පෙරළා එයි ද, ඔහු විසින් අසුන් පැනවියයුතු. පාදෝනා දිය, පාපුටුව, නො සේදූ පා තබන ලෑලි කඩ එළවා තැබියයුතු (ළං කොට තැබියැ යුතු). අතිරෙක ආහාර බහාලන බඳුන සෝද එළවියයුතු. පැන් ද පරිභොග ජලය ද එළවියයුතු. යමෙක් හැමට පසු ව ගමෙන් පිඩු සිඟා පෙරළා එයි ද, වළඳා ඉතිරි බොජුන් ඇත් නම්, කැමැත්තේ නම් වැළඳියයුතු. නො කැමැත්තේ නම්, නිල් තණ නැති තැනෙක දැමියයුතු. පණුවන් නැති දියෙහි හෝ පාකර හැරිය යුතු.

ඔහු විසින් අසුන් ඉදිරියයුතු. පා දෝනා දිය, පාපුටුව, නො දෙවූ පා තබන ලෑලිකඩ සුරැකි කොට තැබියයුතු බොජුන්හල ඇමැන්දයුතු. යමෙක් පැන් කළය හෝ පරිභොග දිය බහාලන කළය හෝ වැසිකිළියේ දිය තබන කළය හෝ දිය අවසන් ව, හිස් ව තුබුණා දක්නේ ද ඔහු විසින් එය එළවා තැබියයුතු. ඉදින් එය ඔහු විසින් තනි ව කළ නො හැකි වේ ද, හස්ත විකාරයෙන් (අත වැනීමෙන්) දෙවැන්නකු අමතා (දෙදෙනා ම එකතු ව) අත්වලින් ඔසොවා එළවා තැබියැ යුතු. එ කරුණින් වාග්භෙදය නො කළයුතු (කථා නො කළයුතු.)

මහණෙනි, යම්සේ පිණ්ඩචාරික භික්ෂූන් විසින් පැවැතියයුතු ද, මෙ ඒ පිණ්ඩචාරික භික්ෂූන්ගේ වත යි''.

## ආරණ්‍යක වත්

4. එ සමයෙහි වනාහි බොහෝ භික්ෂූහු වෙනෙහි වෙසෙත්. ඔහු පැන් නො ම එළවා තබත්. පරිභොග ජලය නො ම එළවා තබත්. ගිනි නො ම එළවා තබත්. උපකරණ සහිත ගිනිගානා දඬු එළවා නො තබත්. නකත්පද නො දනිත්. දිශාභාග නො දනිත්. සොරු එහි ගොස්, 'වහන්ස පැන් ඇත් දැ' යි විචාරත්.

ඒ භික්ෂූහු, 'ඇවැත්නි, නැතැ' යි කියත්.

'වහන්ස, පරිභොග ජලය ඇත් දැ' යි අසත්.

'නැත, ඇවැත්නි' යි භික්ෂූහු කියත්.

'වහන්ස, ගිනි ඇද්දැ' යි අසත්.

'ඇවැත්නි, නැතැ' යි භික්ෂූහු කියත්.

'උපකරණ සහිත ගිනිගානා දඬු ඇද්දැ' යි ඔහු අසත්.

'නත්ථාවුසොති.'

'අත්ථි භන්තෙ නක්ඛත්තපදානී'ති.

'න ජානාම ආවුසො'ති.

'අත්ථි භන්තෙ දිසාභාගන්ති.'

'න ජානාම ආවුසො'ති.

'කෙනජ්ජ භන්තෙ යුත්තන්ති.'

'න ඛො මයං ආවුසො ජානාමා'ති.

'කතමායං භන්තෙ දිසා'ති.

'න ඛො මයං ආවුසො ජානාමා'ති.

අථ ඛො තෙ චොරා "නෙවිමෙසං පානීයං අත්ථි, න පරිභොජනීයං අත්ථි, න අග්ගි අත්ථි, න අරණිසහිතං අත්ථි, න නක්ඛත්තපදානි ජානන්ති, න දිසාභාගං ජානන්ති. චොරා ඉමෙ නයිමෙ භික්ඛූ"ති ආකොසෙත්වා පක්කමිංසු. අථ ඛො තෙ භික්ඛූ භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "තෙන හි භික්ඛවෙ ආරඤ්ඤිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමී"ති යථා ආරඤ්ඤිකෙහි භික්ඛූහි වත්තිතබ්බං:

5. "ආරඤ්ඤිකෙන භික්ඛවෙ භික්ඛුනා කාලස්සෙව උට්ඨාය පත්තං ථවිකාය පක්ඛිපිත්වා අංසෙ ආලග්ගෙත්වා චීවරං ඛන්ධෙ කරිත්වා උපාහනා ආරොහිත්වා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා සෙනාසනා ඔතරිතබ්බං "ඉදානි ගාමං පවිසිස්සාමී"ති. උපාහනා ඔමුඤ්චිත්වා නීචං කත්වා පප්ඵොටෙත්වා ථවිකාය පක්ඛිපිත්වා අංසෙ ආලග්ගෙත්වා තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො. සුප්පටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං. සුසංවුතෙන -පෙ- ඔක්ඛිත්තචක්ඛුනා -පෙ- න උක්ඛිත්තකාය -පෙ- න උජ්ජග්ඝිකාය -පෙ- අප්පසද්දෙන අන්තරඝරෙ ගන්තබ්බං. න කායප්පචාලකං -පෙ- න බාහුප්පචාලකං -පෙ- න සීසප්පචාලකං -පෙ- න ඛම්භකතෙන -පෙ- න ඔගුණ්ඨිතෙන -පෙ- න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං.

'ඇවැත්නි, නැතැ' යි භික්ෂූහු කියත්.

'වහන්ස, නකත්පද ඇද්ද (දනිවු ද)' යි සොරු අසත්.

'නො දනිමු ඇවැත්නි' යි භික්ෂූහු කියත්.

'වහන්ස, දිශාභාග ඇද්ද (දනිවු ද)' යි සොරු අසත්.

'ඇවැත්නි, නො දනිමු' යි භික්ෂූහු කියත්.

'වහන්ස, අද කවර නැකතෙකින් යුක්ත ද' යි සොරු අසත්.

'ඇවැත්නි, අපි නො දනිමු' යි භික්ෂූහු කියත්.

'වහන්ස, මේ කවර නම් දිශාවෙක් ද' යි සොරු අසත්.

'ඇවැත්නි, අපි නො දනුමහ' යි භික්ෂූහු කියත්.

එ කල්හි සොරු, "මොවුන් වෙත පැන් නො මැත, පරිභොග දිය නො මැත, ගිනි නොමැත, උපකරණ සහිත ගිනිගානා දඬු නො මැත, නකත්පද නො දනිත්, දිශාභාගය නො දනිත්, මොහු භික්ෂූහු නො වෙත්, මොහු සොරුහ" යි ඒ භික්ෂූන් තළා පෙළා නික්මැ ගියාහ. ඉක්බිති ඒ මහණහු මහණුනට මෙ පවත් දැන්වූහ. ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කාරණයෙහි දැහැමි කථා කොට "මහණෙනි, එසේ වී නම් ආරණ්‍යක භික්ෂූන් විසින් පැවතියයුතු පරිදි ඔවුනට වත් පනවන්නෙමි" යි වදරා, මතු දැක්වෙන වත් පැනවූහ:

5. "මහණෙනි, ආරණ්‍යක භික්ෂූහු විසින් කලින් ම නැඟී සිට, පාත්‍රය පසුම්බියෙහි බහා, දසරුවෙහි එල්ලා ගෙන සිවුර කරෙහි කොට (කරට දමා ගෙන) පාවහන් නැඟ, දැව බඩු ද මැටි බඩු ද තැන්පත් කොට තබා දෙරවල් හා වාකවුළු වසා, දන් ගමට පිවිසෙන්නෙමි යි සිතා සෙනස්නෙන් බැස්සයුතු. පාවහන් මුද පහත් කොට ගසා දමා, ථවිකායෙහි බහා, දසරුවෙහි එල්ලා, තුන්මඩුලු වසා පිරිමඬුලු කොට හැඳ කාබහන බැඳ සඟළ කොට සඟළ සිවුරු පෙරෙව ගැටවවු ගන්වා, පාත්‍රය සෝද ගෙන මොනොවට ශුහුසුලු නො වැ ගමට පිවිසියයුතු. සුපිළිසන් වැ ඇතුළුගමැ යායුතු. සුසංවෘත වැ ... යටට හෙළූ ඇස් ඇති වැ ... සිවුර ඔසොවා නො ගෙන ... සිනාසීමෙන් තොර වැ ... නිහඬ වැ ගමෙහි යායුතු. කය සොලොවමින් නො යායුතු ... අත් සොලොවමින් ... හිස සොලොවමින් ... ඉඟැ අත් ගසා ගෙන ... හිස වසා පෙරෙ වැ ... උත්කුටිකායෙන් ගමැ නො යායුතු.

නිවෙසනං පවිසන්තෙන සල්ලක්ඛෙතබ්බං 'ඉමිනා පවිසිස්සාමි ඉමිනා නික්ඛමිස්සාමී'ති. නාතිසහසා පවිසිතබ්බං. නාතිසහසා නික්ඛමිතබ්බං. නාතිදූරෙ ඨාතබ්බං. න අච්චාසන්නෙ ඨාතබ්බං. නාතිචිරං ඨාතබ්බං. නාතිලහුං නිවත්තිතබ්බං. ඨිතකෙන සල්ලක්ඛෙතබ්බං 'භික්ඛං දාතුකාමා වා අදාතුකාමා වා'ති. සචෙ කම්මං වා නික්ඛිපති ආසනා වා වුට්ඨාති කටච්ඡුං වා පරාමසති භාජනං වා පරාමසති ඨපෙති වා දාතුකාමා වියාති ඨාතබ්බං. භික්ඛාය දීයමානාය වාමෙන හත්ථෙන සඞ්ඝාටිං උච්චාරෙත්වා දක්ඛිණෙන හත්ථෙන පත්තං පණාමෙත්වා උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා භික්ඛා පටිග්ගහෙතබ්බා. න ච භික්ඛාදායිකාය මුඛං උල්ලොකෙතබ්බං. සල්ලක්ඛෙතබ්බං සූපං දාතුකාමා වා අදාතුකාමා වාති. සචෙ කටච්ඡුං වා පරාමසති භාජනං වා පරාමසති ඨපෙති වා දාතුකාමා වියාති ඨාතබ්බං. භික්ඛාය දින්නාය සඞ්ඝාටියා පත්තං පටිච්ඡාදෙත්වා සාධුකං අතරමානෙන නිවත්තිතබ්බං. සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං –පෙ– න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං.

ගාමතො නික්ඛමිත්වා පත්තං ථවිකාය පක්ඛිපිත්වා අංසෙ ආලග්ගෙත්වා චීවරං සඞ්ඝරිත්වා සීසෙ කරිත්වා උපාහනං ආරොහිත්වා ගන්තබ්බං.

6. ආරඤ්ඤිකෙන භික්ඛවෙ භික්ඛුනා පානීයං උපට්ඨාපෙතබ්බං. පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. අග්ගි උපට්ඨාපෙතබ්බො. අරණිසහිතං උපට්ඨාපෙතබ්බං. කත්තරදණ්ඩො උපට්ඨාපෙතබ්බො. නක්ඛත්තපදානි උග්ගහෙතබ්බානි සකලානි වා එකදෙසානි වා. දිසාකුසලෙන භවිතබ්බං. ඉදං ඛො භික්ඛවෙ ආරඤ්ඤිකානං භික්ඛූනං වත්තං යථා ආරඤ්ඤිකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.''

## සෙනාසනවත්තං

7. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අජ්ඣොකාසෙ චීවරකම්මං කරොන්ති. ඡබ්බග්ගියා භික්ඛූ පටිවාතෙ පඞ්ගණෙ[1] සෙනාසනං පප්ඵොටෙසුං. භික්ඛූ රජෙන ඔකිරියිංසු. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ පටිවාතෙ පඞ්ගණෙ සෙනාසනං පප්ඵොටෙස්සන්ති භික්ඛූ රජෙන ඔකිරියිංසූති''.

1. අඞ්ගණෙ – මජසං

ගෙයකට පිවිසෙන්නහු විසින් 'මෙ තැනින් පිවිසෙන්නෙමි, මෙ තැනින් නික්මෙන්නෙමි' යි සැලකියයුතු, ඉතා යුහු වැ නො පිවිසියයුතු. ඉතා යුහු වැ නො නික්මියයුතු. ඉතා දුරු නො සිටියයුතු. ඉතා ළඟ නො සිටියයුතු. ඉතා බොහෝ වේලා නො සිටියයුතු. ඉතා වහා පෙරළා නො යායුතු. සිටැගත්තහු විසින් 'භික්‍ෂාව දෙනු කැමැත්තී ද දෙනු නො කැමැත්තී ද' යන්න සලකා බැලියයුතු. ඉදින් කරමින් තුබුණු කාර්යය නවතාලයි නම් හෝ අස්නෙන් නැඟී සිටී නම් හෝ සැන්දක් අත ගා නම් හෝ බඳුනක් අල්ලයි නම් හෝ තබයි නම් හෝ 'දෙනු කැමැත්තියක මෙනැ' යි සලකා රැඳී සිටියැ යුතු. භික්‍ෂාව දෙනු ලබන කලැ වමතින් සඟළ සිවුර ඔසොවා දකුණතින් පාත්‍රය ඉදිරියට යොමු කොට දැතින් ම පාත්‍රය ගෙන භික්‍ෂාව පිළිගතයුතු. භික්‍ෂාව දෙන්නියගේ මුහුණ නො බැලියැ යුතු. සූප දෙනු කැමැත්තී ද දෙනු නො කැමැත්තී ද යන්න සැලකියයුතු. ඉදින් සැන්දක් හෝ භාජනයක් හෝ අල්ලයි නම් හෝ තබයි නම් හෝ 'දෙනු කැමැත්තියක මෙනැ' යි සලකා රැඳී සිටියැයුතු. භික්‍ෂාව දුන් කල්හි සඟළ සිවුරින් පාත්‍රය වසා ගෙන මනා කොට නො යුහු ව පෙරළා යායුතු. සුපිළිසන් වැ ගම තුළැ යායුතු ... උත්කුටිකායෙන් ගමැ නො යායුතු.

ගමින් නික්මැ පාත්‍රය පසුම්බියෙහි බහා උරෙහි එල්ලාගෙන සිවුර හකුළා හිසෙහි කොට, වහන් නැඟ යායුතු.

6. මහණෙනි, ආරණ්‍යක මහණහු විසින් පැන් එළවියැයුතු. පරිභොග ජලය එළවියැයුතු. ගිනි එළවියැයුතු. උපකරණ සහිත ගිනිගාන දඬු එළවියැයුතු. සැරයටිය එළවා තැබියයුතු. සියලු ම හෝ එක් කොටසක් හෝ නකත්පද උගතයුතු. දිශා දැනීමෙහි දක්‍ෂ වියැයුතු. මහණෙනි, මේ වනාහි ආරණ්‍යක භික්‍ෂූන් විසින් පැවතියයුතු සේ වූ ආරණ්‍යක භික්‍ෂූන්ගේ වතැ'' යි වදළ සේක.

## සෙනසුන් වත්

7. එ සමයෙහි වනාහි බොහෝ භික්‍ෂූහු එළිමහනෙහි හිඳ සිවුරුවම් (සිවුරු මැසීම් ආදී කටයුතු) කෙරෙත්. සවැගි මහණහු ඉදිරි මිදුලෙහි උඩුසුළඟෙහි ඇඳ පුටු ගසා දමූහ. භික්‍ෂූහු දූහු-විල්ලෙන් වැකුණාහ. අල්පෙච්ඡ වූ සන්තුෂ්ට වූ ලජ්ජී වූ කුක්කුච්චක වූ ශික්‍ෂා කැමැති වූ යම් මහණ කෙනෙක් වෙත් ද, ඔහු ''කෙසේ නම් සවැගි මහණහු ඉදිරි මිදුලෙහි උඩුසුළඟෙහි ඇඳ පුටු ගසා දමත් ද භික්‍ෂූහු දූවිල්ලෙන් වැකුණාහු යි ලාමක කොට සිතත්, නින්‍දා කෙරෙත්. නො ගුණ පතුරුවත්.''

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ පටිවාතෙ පඞ්ගණෙ සෙනාසනං පප්ඵොටෙසුං භික්ඛූ රජෙන ඔකිරියිංසූති.

"සච්චං භගවා." ... විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "තෙන හි භික්ඛවෙ භික්ඛූනං සෙනාසනවත්තං පඤ්ඤපෙස්සාමි යථා භික්ඛූහි සෙනාසනෙ වත්තිතබ්බං."

8. "යස්මිං විහාරෙ විහරති සචෙ සො විහාරො උක්ලාපො හොති, සචෙ උස්සහති සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං භිසි බිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං මඤ්චො නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භුම්මත්ථරණං යථා පඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං.

සචෙ විහාරෙ සන්තානකං හොති උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා.[1] සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා හොති භූමි උදකෙන පරිප්ඵොසිත්වා පරිප්ඵොසිත්වා පමජ්ජිතබ්බං මා විහාරො රජෙන උහඤ්ඤීති. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං. න භික්ඛුසාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. න විහාරසාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං, න පානීයසාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. න පරිභොජනීයසාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. න පටිවාතෙ පඞ්ගණෙ[2] සෙනාසනං පප්ඵොටෙතබ්බං. අධොවාතෙ සෙනාසනං පප්ඵොටෙතබ්බං.

1. සම්මජ්ජිතබ්බා - මජ්ඣං.
2. අඞ්ගණෙ - මජ්ඣං.

ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. "මහණෙනි, සවැගි මහණහු ඉදිරි මිදුලෙහි උඩුසුළඟෙහි ඇඳපුටු ගසා දමූහු ල. භික්ෂූහු දූහුවිල්ලෙන් වැකුණාහු ල. ඒ සැබෑ ද"යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

"සැබැවැ භාග්‍යවතුන් වහන්සැ"යි භික්ෂූහු උත්තර දුන්හ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා, දැහැමි කතා කොට භික්ෂූන් බණවා, "මහණෙනි, එසේ වී නම් සෙනසුනෑ පැවැතිය යුතු පරිදි භික්ෂූනට සෙනසුන් වත පනවන්නෙමි"යි වදරා මතු දක්වෙන වත පැනවූ සේක.

8. "යම් වෙහෙරෙකැ වෙසේ ද, ඉදින් ඒ වෙහෙර කැලි කසළ සහිත වේ නම්, ඉදින් හැක්කේ නම් ශුද්ධ කළයුතු. වෙහෙර ශුද්ධ කරන්නහු විසින් පළමු කොට පාසිවුරු පිටත ගෙන ගොස් එක් පසෙක තැබියයුතු. නිසීදනය ද පසතුරුණ ද බැහැර කොට එක් පසෙක තැබියයුතු. බිස්ස ද කොට්ටය ද බැහැර කොට එක් පසෙක තැබියයුතු. ඇඳ පහත් කොට කවුළු පිටැ (දෙරපළු පිට) ද නො ගාවමින් නො ගටමින් මොනවට බැහැර කොට එක් පසෙකැ තැබියයුතු. පුටුව පහත් කොට කවුළුපිටැ නො ගාවමින් නො ගටමින් මොනවට බැහැර කොට එක් පසෙකැ තැබිය යුතු. ඇඳ පා අලු බැහැර කොට එක් පසෙකැ තැබියයුතු. කපාටපෘෂ්ඨය (දෙර පළු පිට) පහත් කොට මොනොවට කිසිවෙක ද නො ගාවමින් නො ගටමින් බැහැර කොට එක් පසෙකැ තැබියෑ යුතු. කෙළමලාව බැහැර කොට එක් පසෙක තැබියැයුතු. හේත්තු වන පුවරුව බැහැර කොට එක් පසෙකැ තැබියැයුතු. බුමුතුරුණ පනවා තුබුණු පරිදි සලකා බැහැර කොට එක් පසෙක තැබියැයුතු.

ඉදින් වෙහෙර මකුළු දැල් වේ ද, පළමුවෙන් ඉහළ සිට පහතට ඉවත් කළයුතු. ආලොකසන්ධි භාගයෝ ද (ඇතුළත පිටතැ වූ වාබොනයන්හි දෙරපළු ද) කර්ණභාගයෝ ද (කාමරයේ ඇතුළත සතර කොන් ද) පිස දැමියයුතු. ඉදින් ගුරු පිරියම් කැරුණු බිත්තිය කුණු වැකියේ වී නම්, රෙදි කඩක් තෙමා මිරිකා පිසදැමියැයුතු. ඉදින් බිම කළුපැහැ කරන ලද නම්, වෙහෙර දූවිල්ලෙන් නො වැකේවා යි (දූවිල්ලෙන් නොවැකෙනු පිණිස) දිය ඉස ඉස පිස දැමියයුතු. කසළ රැස්කොට එක් පසෙකැ දැමියැ යුතු. භික්ෂූන් සමීපයෙහි සෙනසුන් නො ගසාදැමියයුතු. වෙහෙර සමීපයෙහි සෙනසුන නො ගසාදැමියැයුතු. බොන දිය සමීපයෙහි සෙනසුන නොගසා දැමියැයුතු. පරිභොග ජලය සමීපයෙහි සෙනසුන නො ගසා දැමියැයුතු. ඉදිරි මිදුලෙහි උඩුසුළඟෙහි සෙනසුන නො ගසා දැමියැයුතු. යටි සුළඟෙහි සෙනස්න නොගසා දැමියැයුතු.

9. භුම්මත්ථරණං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා එකමන්තං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බා. මඤ්චො එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. භිසිං බිබ්බොහනං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො එකමන්තං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං එකමන්තං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බං.

පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

10. සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති දිවා වාතපානා ථකෙතබ්බා. රත්තිං විවරිතබ්බා.

සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පානීයං න හොති පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

9. බුමුතුරුණු එක් පසෙක අව්වේ වියලා ශුද්ධ කොට ගසා දමා ඇතුළට ගෙන ගොස් පනවා තුබූ පරිදි ම පැනවියැයුතු. ඇඳ පා අළු එක් පසෙක අව්වේ වියලා පිසදමා ඇතුළතට ගෙන ගොස් කලින් තුබුණු තැන තැබියැයුතු. ඇඳ එක් පසෙක අව්වේ වියලා ශුද්ධ කොට ගසා දමා පහත් කොට කපාට පෘෂ්ඨයෙහි නොගාවා නොගටා මනාකොට පනවාතුබුණු පරිදි මැනැවින් පැන-වියැයුතු. පුටුව එක් පසෙක අව්වේ වියලා ශුද්ධ කොට ගසා දමා පහත් කොට කපාටපෘෂ්ඨයේ නො ගාවා නොගටා ඇතුළට ගෙන ගොස් පනවාතුබුණු පරිදි මනා කොට පැනවියැයුතු. බිසි ද කොට්ට ද එක් පසෙක අව්වේ වියලා ශුද්ධ කොට ගසාදමා ඇතුළට ගෙනගොස් පනවා තුබුණු පරිදි ම පැනවියැයුතු. නිසී-දනය ද පසතුරුණු ද එක් පසෙක අව්වේ වියලා ශුද්ධ කොට ගසාදමා ඇතුළට ගෙනගොස් පනවා තුබුණු පරිදි ම පැනවියැ යුතු. කෙළමලාව එක්පසෙක අව්වේ වියලා පිසදමා ඇතුළට ගෙනගොස් තුබුණු තැන තැබියැයුතු. හේත්තුවන පුවරුව එක් පසෙක අව්වේ වියලා පිස දමා ඇතුළට ගෙනගොස් කලින් තුබුණු තැන තැබියැයුතු.

පාසිවුරු බහා තැබියයුතු. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන එක් අතෙකින් ඇඳ යට හෝ පුටු ව යට හෝ පරාමර්ශනය කොට (අතගා විමසා) පාත්‍රය බහා තැබියයුතු. කිසිවෙකින් නො අතුළ බිමැ පාත්‍රය නො තැබියැ යුතු. සිවුර බහා තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන අනෙක් අතින් සිවුරුවස (සිවුර එල්ලන උණලීය) හෝ සිවුරුරැහැන (සිවුර එල්ලන ලනුව) හෝ පිසදමා සිවුරේ කෙළවර එහා පැත්-තට ද සිවුරු නැමීම මෙහා පැත්තට ද කොට සිවුර තැබියයුතු.

10. ඉදින් පෙරදිගැ වූ දූලි සහිත වාතයෝ හමත් නම් පෙරදිගට අයත් වාබොන (ජනෙල්) වැසියැයුතු. ඉදින් පැසිම් දිගට අයත් දූලිසහිත වාතයෝ හමත් නම් පැසිම්දිගැ වූ වාබොනයෝ වැසියයුතුහ. ඉදින් උතුරුදිගට අයත් දූලි සහිත වාතයෝ හමත් නම්, උතුරුදිගැ වූ වාබොනයෝ වැසියයුතුහ. දකුණු දිගට අයත් දූවිලි සහිත සුළං හමා නම් දකුණුදිග වූ වාබොනයෝ වැසියයුතුහ. උෂ්ණකාලය වී නම් වාබොනයෝ දහවල් වසා තැබියැයුතු. රෑ විවෘත කළයුතු. ශීතකාලය වී නම් වාබොනයෝ රෑ වසා තැබියයුතු දහවල් විවෘත කළයුතු.

ඉදින් පිරිවෙන (විහාර ප්‍රාකාර අතර පෙදෙස) කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් දොරු කොටුව කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් උවටන්හල කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් ගිනිහල කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් වැසිකිළිය කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් පැන් නො වී නම් පැන් එළවා තැබියැයුතු. ඉදින් පරිභොගජලය නො වී නම් පරිභොගජලය එළවා තැබියැයුතු. ඉදින් ආචමනකුම්භියෙහි (වැසිකිළියේ ප්‍රයෝජනයට ගන්නා ජලය බහාලන භාජනයෙහි) ජලය නො වී නම්, එහි ජලය වත් කළයුතු.

සචෙ වුඩ්ඪෙන සද්ධිං එකවිහාරෙ විහරති න වුඩ්ඪං අනාපුච්ඡා උද්දෙසො දාතබ්බො න පරිපුච්ඡා දාතබ්බා. න සජ්ඣායො කාතබ්බො. න ධම්මො භාසිතබ්බො. න පදීපො කාතබ්බො. න පදීපො විජ්ඣාපෙතබ්බො. න වාතපානා විවරිතබ්බා. න වාතපානා ථකෙතබ්බා. සචෙ වුඩ්ඪෙන සද්ධිං එකචඞ්කමෙ චඞ්කමති යෙන වුඩ්ඪො තෙන පරිවත්තිතබ්බං. න ච වුඩ්ඪො සඞ්ඝාටිකණ්ණෙන ඝට්ටෙතබ්බො.

ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං සෙනාසනවත්තං යථා භික්ඛූහි සෙනාසනෙ වත්තිතබ්බන්ති''.

## ජන්තාඝරවත්තං

11. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදන්ති. භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතා පපතන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදිස්සන්ති. භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතා පපතන්ති''ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

''සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදන්ති. භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතා පපතන්තීති''

''සච්ච භගවා.'' ... විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

''න භික්ඛවෙ ජන්තාඝරෙ ථෙරෙන භික්ඛුනා නිවාරියමානෙන අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගි දාතබ්බො. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න භික්ඛවෙ ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදිතබ්බං. යො නිසීදෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

ඉදින් වැඩි මහලු තෙර කෙනකු හා එක් වෙහෙර වසන්නේ නම් ඒ වැඩිමාලු තෙරුන් නො විචාරා, උදෙසය නො දියයුතු (දෙශනා පෙළ නො ඉගැන්වියයුතු). අටුවාව නො කියයුතු, සජ්ඣායනය (හැදෑරීම) නො කළයුතු, බණ නො කියයුතු. පහන නො දල්වියයුතු, පහන නො නිවියයුතු. වාකවුළු නො විවරියයුතු. වාකවුළු නො වැසියයුතු. ඉදින් වැඩි මාලු තෙර නමක් හා එක් සක්මන් මළුයෙහි සක්මන් කෙරේ නම්, වෘද්ධ භික්ෂු නම යම් තැනෙක ද එ තැන දී පෙරළා ඉයයුතු. වැඩිමහලු මහණහු සඟළ සිවුරු කොනින් නො ගැටිය යුතු.

මහණෙනි, යම්සේ භික්ෂූන් විසින් සෙනස්නෙහි පැවතියයුතු ද මේ භික්ෂූන්ගේ ඒ සෙනසුන් වත''යි.

## ජන්තාඝර වත

11. එ සමයෙහි වනාහි සවැගි මහණහු ගිනිහල්ගෙහි දී ස්ථවිර භික්ෂූන් විසින් වළක්වනු ලබන්නාහු ආදරගෞරව නැති බැවින් බොහෝ දර නංවා (ගොඩ ගසා) ගිනි දල්වා දෙර වසා දෙර කඩැ හිඳිත්. භික්ෂූහු උෂ්ණයෙන් බොහෝ සෙයින් තැවුණාහු දෙර කඩ නො ලබන්නාහු මුසපත් වැ වැටෙත්. අල්පේච්ඡ වූ සන්තුෂ්ට වූ ලජ්ජී වූ කුකුස් කරන්නාවූ සික කැමැත්තා වූ යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු ''කෙසේ නම් සවැගි මහණහු ගිනිහල් ගෙහි ස්ථවිර භික්ෂූන් විසින් වළක්වනු ලබන්නාහු, අනාදර බව නිසා බොහෝ දර ගොඩ ගසා ගිනි දල්වා දෙර වසා දෙරකඩට වී ඉන්නාහු ද, භික්ෂූහු උෂ්ණයෙන් අධික වැ තැවුණාහු දෙරකඩ නො ලබන්නාහු මුසපත් වැ වැටෙතැ' යි ලාමක කොට සිතත්, නින්ද කෙරෙත්, නො ගුණ පතුරුවත්.

ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

''මහණෙනි, සවැගි මහණහු ගිනිහල්ගෙහි ස්ථවිර භික්ෂූන් විසින් වළක්වනු ලබන්නාහු අනාදර බව නිසා බොහෝ දර ගොඩගසා ගිනි දල්වා දෙර වසා දෙර හිඳිත් ල. භික්ෂූහු උෂ්ණයෙන් අධික වැ තැවුණාහු දෙර නො ලබන්නාහු (පිටත යෑමට දෙර නාරින බැවින්) මුසපත් වැ ඇදවැටෙත් ල. ඒ සැබෑ ද යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

''භාග්‍යවතුන් වහන්ස, සැබැවැ''යි ඔහු කීහ. ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා, දැහැමි කතා කොට, භික්ෂූන් බණවා,

''මහණෙනි, ගිනිහල්ගෙහි ස්ථවිර භික්ෂූන් විසින් වළක්වනු ලබන මහණහු විසින් අනාදර බව නිසා බොහෝ දර නංවා ගිනි නො දල්වියයුතු. යමෙක් ගිනි දල්වන්නේ නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, දෙර වසා දෙර නො හින්දයුතු. යමෙක් ඉඳින්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ'' යි වදළ සේක. (ඉක්බිති මෙසේ ද වදළ සේක):

12. "තෙන හි භික්ඛවෙ භික්ඛූනං ජන්තාඝරෙ වත්තං පඤ්ඤා-පෙස්සාමි යථා භික්ඛූහි ජන්තාඝරෙ වත්තිතබ්බං".

"යො පඨමං ජන්තාඝරං ගච්ඡති, සචෙ ඡාරිකා උස්සන්නා හොති ඡාරිකා ඡඩ්ඩෙතබ්බා. සචෙ ජන්තාඝරං උක්ලාපං හොති ජන්තාඝරං සම්මජ්ජිතබ්බං. සචෙ පරිභණ්ඩං උක්ලාපං හොති පරිභණ්ඩං සම්මජ්ජිතබ්බං. සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ ජන්තාඝරසාලා උක්ලාපා හොති ජන්තාඝරසාලා සම්මජ්ජිතබ්බා. චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. උදකදොණිකාය උදකං ආසිඤ්චිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරපීඨං ආදාය ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහිතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරෙ ථෙරානං භික්ඛූනං පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. සචෙ උස්සහති උදකෙපි ථෙරානං භික්ඛූනං පරිකම්මං කාතබ්බං. න ථෙරානං භික්ඛූනං පුරතො නහායිතබ්බං. න උපරිතො නහායිතබ්බං. නහාතෙන උත්තරන්තෙන ඔතරන්තානං මග්ගො දාතබ්බො. යො පච්ඡා ජන්තාඝරා නික්ඛමති සචෙ ජන්තාඝරං චික්ඛල්ලං හොති ධොවිතබ්බං. මත්තිකාදොණිකං ධොවිත්වා ජන්තාඝරපීඨං පටිසාමෙත්වා අග්ගිං විජ්ඣාපෙත්වා ද්වාරං ථකෙත්වා පක්කමිතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං ජන්තාඝරවත්තං යථා භික්ඛූහි ජන්තාඝරෙ වත්තිතබ්බන්ති".

## වච්චකුටිවත්තං

13. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු බ්‍රාහ්මණ-ජාතිකො වච්චං කත්වා න ඉච්ඡති ආචමෙතුං කො ඉමං වසලං දුග්ගන්ධං ආමසිස්සතීති. තස්ස වච්චමග්ගෙ කිමි සණ්ඨාසි. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.

"කිම්පන ත්වං ආවුසො වච්චං කත්වා න ආචමෙසී"ති.

"එවමාවුසො"ති.

12. "මහණෙනි, එසේ වී නම් භික්ෂූන් විසින් ගිනිහල්ගෙහි පැවතියයුතු පරිදි භික්ෂූනට ගිනිහල්ගෙහි වත පනවන්නෙමි".

"යමෙක් පළමු කොට ගිනිහල්ගෙට යන්නේ ද, ඉදින් අළු ගොඩගැසී ඇත් නම් අළු බැහැර දමාලියයුතු, ඉදින් ගිනිහල්ගෙය කැලිකසළ සහිත වේ නම් එය හැමැන්දයුතු. ඉදින් පිල්කඩ කැලි කසළ සහිත වේ නම් එය හැමැන්දයුතු. ඉදින් පිරිවෙන (ගිනි හලත් පවුරත් අතර පෙදෙස) කැලිකසළ සහිත වේ නම්, එය හැමැන්දයුතු. ඉදින් දොර කොටුව කැලිකසළ සහිත වේ නම්, එය හැමැන්දයුතු. ගිනිහල්ගෙහි ශාලාව කැලිකසළ සහිත වේ නම්, එය හැමැන්දයුතු. නානසුණු දියෙන් තෙමා ගුලි කළයුතු නාන මැටි තෙමියයුතු. දිය ඔරුවෙහි දිය වත් කළයුතු. ගිනිහල්ගෙට පිවිසෙන්නහු විසින් මැටියෙන් මුව වකා (මුහුණේ මැටි ආලේප කොට) ඉදිරි පසින් ද පිටු පසින් ද වසාගෙන ගිනිහල්පුටුව ගෙන ගිනිහල්ගෙට පිවිසියයුතු. ස්ථවිර භික්ෂූන් මැදට කඩා පැන නො හින්දයුතු. නවක භික්ෂූහු ඔවුන් හුන් අස්නෙන් නො ම නෙරපියයුතුහ. හැක්කේ නම්, ගිනිහල්ගෙහි දී ස්ථවිර භික්ෂූනට පිරියම් කලයුතු. ගිනිහල් ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල් පුටුව ගෙන ඉදිරි පසින් ද පිටු පසින් ද වසාගෙන ගිනිහල් ගෙයින් නික්මියයුතු. හැක්කේ නම්, දියෙහි ද ස්ථවිර භික්ෂූනට පිරියම් කළයුතු. ස්ථවිර භික්ෂූනට ඉදිරියේ (සිට) නො නායුතු. ස්ථවිර භික්ෂූනට මත්තෙහි (ඉහළින්) සිට නො නායුතු. නා ගොඩ නැගෙන්නහු විසින් දියට බස්නාවුනට මඟ හැරියයුතු. යමෙක් පසු වැ ගිනිහල්ගෙයින් නික්මේ ද ගිනිහල්ගෙය මඩ වී ඇතොත්, ඔහු විසින් එය සේදියයුතු. මැටි බහා ලන ඔරුව දෙවැ ගිනි හල් පුටුව තැන් පත් කොට තබා ගිනි නිවා දොර වසා නික්ම යායුතු.

මහණෙනි, භික්ෂූන් විසින් ගිනිහල්ගෙහි යම්සේ පැවතියයුතු ද, මේ ඒ භික්ෂූන්ගේ ගිනිහල්ගෙහි වත යි.

## වැසිකිළි වත

13. එ සමයෙහි එක්තරා බ්‍රාහමණ ජාතික මහණෙක් මල පහ කොට "කවරෙක් නම්, දුගඳ වූ මෙ අශුචි අල්ලන්නේ දැ"යි කියා මල දෙවන්නට නො කැමැති වෙයි. ඔහු ගේ මල මඟැ කෲමිදෙණය නැංගේ ය. එ කල ඒ මහණ (සෙසු) මහණුනට මෙ පවත් සැල කෙළේ ය.

"ඇවැත්නි, කිමෙක් ද? තෙපි මල පහ කොට නො සෝදවූ දැ"යි භික්ෂූහු විචාළහ.

"එසේ ය ඇවැත්නි" යි ඒ මහණ කී ය.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු වච්චං කත්වා න ආචමෙස්සතී"ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර ත්වං භික්ඛු වච්චං කත්වා න ආචමෙසී"ති.

"සච්චං භගවා". -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"න භික්ඛවෙ වච්චං කත්වා සති උදකෙ න ආචමෙතබ්බං. යො න ආචමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

14. තෙන ඛො පන සමයෙන භික්ඛූ වච්චකුටියා යථාවුඩ්ඪං වච්චං කරොන්ති. නවකා භික්ඛූ පඨමතරං ආගන්ත්වා වච්චිතා ආගමෙන්ති. තෙ වච්චං සන්ධාරෙන්තා මුච්ඡිතා පපතන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ" -පෙ-

"සච්චං භගවා". -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"න භික්ඛවෙ වච්චකුටියා යථාවුඩ්ඪං වච්චං කාතබ්බං. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ආගතපටිපාටියා වච්චං කාතුන්ති".

15. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අතිසහසාපි වච්චකුටිං පවිසන්ති. උබ්භජිත්වා පි පවිසන්ති. නිත්ථුනන්තාපි වච්චං කරොන්ති. දන්තකට්ඨං ඛාදන්තාපි වච්චං කරොන්ති. බහිද්ධාපි වච්චදොණිකාය වච්චං කරොන්ති. බහිද්ධාපි පස්සාවදොණිකාය පස්සාවං කරොන්ති. පස්සාවදොණිකාය ඛෙළං කරොන්ති. ඵරුසෙනපි කට්ඨෙන අවලෙඛන්ති අවලෙඛනකට්ඨම්පි වච්චකූපම්හි පාතෙන්ති. අතිසහසාපි නික්ඛමන්ති. උබ්භජිත්වාපි නික්ඛමන්ති. චපුචපුකාරකම්පි ආචමෙන්ති. ආචමනසරාවකෙ පි උදකං සෙසෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අතිසහසාපි වච්චකුටිං පවිසිස්සන්ති -පෙ- ආචමනසරාවකෙපි උදකං සෙසෙස්සන්තී"ති.

අල්පෙච්ඡ වූ ... යම් මහණ කෙනෙක් වෙත් ද, ඔහු "කෙසේ නම් මහණ තෙම මල පහකොට මලමඟ නො සෝදන්නේ ද" යි ලාමක කොට සිතත්, නින්ද කෙරෙත්, නො ගුණ පතුරුවත්.

ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

"මහණ, තෝ මල පහකොට (මල මඟ) නො සෝදහි ල. ඒ සැබෑ ද"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක.

"වහන්ස, සැබවැ"යි ඒ මහණ කී ය ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දැහැමි කථා කොට භික්ෂූන් අමතා,

"මහණෙනි, මල පහකොට දිය ඇති කලැ නො ම නො සේදියැයුතු. යමෙක් නො සෝදන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

14. එ සමයෙහි මහණහු වැසිකිළියෙහි වැඩිමහලු පිළිවෙළින් මල පහකෙරෙත්. නවක මහණහු වඩා පළමුවෙන් අවුත් වර්චසින් පීඩිත වැ (වාරය එන තුරු) බලාපොරොත්තු වෙත්. ඔහු වර්චස් වේගය උසුලන්නාහු මුසපත් වැ ඇදවැටෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි... සැබෑ ද" යි අසා වදළ සේක.

"සැබව, වහන්සැ"යි ඔහු කීහ ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දැහැමි කථා කොට භික්ෂූන් අමතා,

"මහණෙනි, වැසිකිළියෙහි නො ම මහලු පිළිවෙළින් මල පහකළයුතු. යමෙක් එසේ කරන්නේ ද, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ආ පිළිවෙළින් මල පහකරන්නට අනු-දනිමි"යි වදළසේක.

15. එ සමයෙහි සවැගි මහණහු ඉතා වහා ද වැසිකිළියට වදිත්. සිවුර ඔසොවා ගෙන ද පිවිසෙත්. තතනමින් ද මල පහ කෙරෙත්. දැහැටි කමින් ද මල පහකෙරෙත්. වැසිකිළි ඔරුවෙන් පිටත්හි ද මල පහකෙරෙත්. මූත්‍ර ඔරුවෙන් පිටත්හි ද මූත්‍ර කෙරෙත්. මූත්‍ර ඔරුවෙහි ද කෙළ ගසත්. රළු කෝටුවෙකින් ද මලමඟ පිසදමත්. පුසන්දඬු ද වැසිකිළි වළෙහි හෙළත්, ඉතා වහා ද නික්මෙත්. සිවුර ඔසොවා ද නික්මෙත්. 'චපු චපු' යන හඬ නිකුත් කෙරෙමින් ද මලමඟ සෝදත්. මල සෝදන්නට දිය ගන්නා බඳුනෙහි ද ජලය ඉතිරී කෙරෙත්. අල්පෙච්ඡ වූ සන්තුෂ්ට වූ ලජ්ජී වූ කුකුස් කරන්නා වූ ශික්ෂාකාමී යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු "කෙසේ නම් සවැගි මහණහු ඉතා ඉක්මනින් වැසිකිළියට වදින්නාහු ද ... මල සේදීමට දිය ගන්නා බඳුනෙහින් දිය ඉතිරි කරන්නාහු ද"යි ලාමක කොට සිතත් නින්ද කෙරෙත්, දෙස් පතුරුවත්:

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ-

"සච්චං කිර භික්ඛවෙ" -පෙ-

"සච්චං භගවා".-පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"තෙන හි භික්ඛවෙ භික්ඛූනං වච්චකුටිවත්තං පඤ්ඤපෙස්සාමි යථා භික්ඛූහි වච්චකුටියා වත්තිතබ්බං:

යො වච්චකුටිං ගච්ඡති තෙන බහි ඨිතෙන උක්කාසිතබ්බං. අන්තො නිසින්නෙනාපි උක්කාසිතබ්බං. චීවරවංසෙ වා චීවරරජ්ජුයා වා චීවරං නික්ඛිපිත්වා සාධුකං අතරමානෙන වච්චකුටි පවිසිතබ්බා. නාතිසහසා පවිසිතබ්බා. න උබ්භුජිත්වා පවිසිතබ්බා. වච්චපාදුකාය ඨිතෙන උබ්භුජිතබ්බං. න නිත්ථුනන්තෙන වච්චො කාතබ්බො. න දන්තකට්ඨං ඛාදන්තෙන වච්චො කාතබ්බො. න බහිද්ධා වච්චදොණිකාය වච්චො කාතබ්බො. න බහිද්ධා පස්සාවදොණිකාය පස්සාවො කාතබ්බො. න පස්සාවදොණිකාය ඛෙළො කාතබ්බො. න ඵරුසෙන කට්ඨෙන අවලෙඛිතබ්බං. න අවලෙඛනකට්ඨං වච්චකූපම්හි පාතෙතබ්බං. වච්චපාදුකාය ඨිතෙන පටිච්ඡාදෙතබ්බං. නාතිසහසා නික්ඛමිතබ්බං. න උබ්භුජිත්වා නික්ඛමිතබ්බං. ආචමනපාදුකාය ඨිතෙන උබ්භුජිතබ්බං. න චපුචපුකාරකෙන ආචමෙතබ්බං. න ආචමනසරාවකෙ උදකං සෙසෙතබ්බං. ආචමනපාදුකාය ඨිතෙන පටිච්ඡාදෙතබ්බං. සචෙ වච්චකුටි උහතා හොති ධොවිතබ්බා. සචෙ අවලෙඛන. පිඨරො පූරො හොති අවලෙඛනකට්ඨං ඡඩ්ඩෙතබ්බං. සචෙ වච්චකුටි උක්ලාපා හොති වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පරිභණ්ඩං උක්ලාපං හොති පරිභණ්ඩං සම්මජ්ජිතබ්බං. සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං වච්චකුටිවත්තං යථා භික්ඛූහි වච්චකුටියා වත්තිතබ්බන්ති."

ඉක්බිත්තෙන් ඒ මහණහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

"මහණෙනි,... සැබෑ දැ"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

"සැබව භාග්‍යවතුන් වහන්සැ"යි ඔහු කීහ ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දැහැමි කථා කොට, භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක.

"මහණෙනි, එසේ වී නම්, භික්ෂූන් වැසිකිළියෙහි පැවතියැ යුතු පරිදි වැසිකිළි වත පනවන්නෙමි:

යමෙක් වැසිකිළියට යන්නේ ද ඔහු විසින් පිටතැ සිටැ කැස්ස යුතු. ඇතුළතැ උන්නහු විසිනුදු කැස්සයුතු. සිවුරුවසැ හෝ සිවුරුරැහැනැ හෝ සිවුර තබා මොනොවට යුහුසුලු නො වැ වැසිකිළියට පිවිසියැයුතු. ඉතා වහා නො පිවිසියැයුතු. සිවුර ඔසොවාගෙන නො පිවිසියැයුතු. වැසිකිළි පාදුකායෙහි සිට සිවුර එසවියැයුතු. නො තතනමින් මල පහකළයුතු. දැහැටි කමින් මල නො පහකළයුතු. වර්චස් ඔරුවෙන් පිටතැ වසුරු නො පහකළයුතු. මූත්‍ර ඔරුවෙන් පිටතැ මූත්‍ර නො කළයුතු. මූත්‍ර ඔරුවෙහි කෙළ නො ගැසියැයුතු. රළු කෝටුවෙකින් මල නො සිරියයුතු. පුසන්දඬු වැසිකිළි වළෑ නො ම දැමියැයුතු. වැසිකිළි පාදුකායෙහි සිට ඇඟ වසාගතයුතු. ඉතා යුහු ව නො නික්මියයුතු. සිවුරු ඔසොවාගෙන නො නික්මියයුතු. මල සෝද හරින පාදුකායෙහි සිට කය සිවුරින් වසාගතයුතු. චපු චපු යන හඬ නිකුත් කරමින් මල නො සෝදියයුතු. මල සෝදනුවට දිය ගන්නා බඳුනෙහි ජලය ඉතිරි නො කළයුතු. ආචමනපාදුකායෙහි[1] සිට ගත්තහු විසින් ඇඟ වසාගතයුතු. ඉදින් වැසිකිළිය අපිරිසුදු කරන ලද නම් සෝදියයුතු. ඉදින් පුසන්කුරු දමන බඳුන පිරුණේ වී නම් පුසන්කුරු ඉවත ලියයුතු. වැසිකිළිය කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් පිල්කඩ කැලිකසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් පිරිවෙන (වැසිකිළිය වටා බිම) කැලි කසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් කොටුව කැලි කසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ආචමනකුම්භියෙහි[2] දිය නැත් නම් එහි දිය වත්කළයුතු.

මහණෙනි, මේ වනාහි භික්ෂූන් විසින් වැසිකිළියෙහි පැවතියැ යුතු පරිදි වූ භික්ෂූන්ගේ වැසිකිළි වත යි".

---

1. ආචමනපාදුකා යනු මල සෝද හැරීමට ඉඳගන්නා පාදුකාව යි. 2. ආචමනකුම්භි යනු වැසිකිළියේ පරිභොග ජලය තිබෙන සැළිය යි.

## උපජ්ඣායවත්තං

16. තෙන ඛො පන සමයෙන සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මාවත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මාවත්තිස්සන්තී"ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

"සච්චං කිර භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මාවත්තන්තී"ති.

"සච්චං භගවා".

විගරහි බුද්ධො භගවා: "කථං හි නාම භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මාවත්තිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛො තං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානං ච එකච්චානං අඤ්ඤථත්තායා"ති. විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"තෙන හි භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං පඤ්ඤාපෙස්සාමි යථා සද්ධිවිහාරිකෙහි උපජ්ඣායෙසු වත්තිතබ්බං".

"සද්ධිවිහාරිකෙන භික්ඛවෙ උපජ්ඣායම්හි සම්මාවත්තිතබ්බං. තත්‍රායං සම්මාවත්තනා:

කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤාපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගු පීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං. උපජ්ඣායම්හි උට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං.

සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා, ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. සචෙ උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං, න අච්චාසන්නෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං.

## උපාධ්‍යාය වත්

15. එ සමයෙහි සද්ධිවිහාරික මහණහු උපාධ්‍යාය තෙරුන් කෙරෙහි මනා වැ නො පවතිත්. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ ද... ඔහු "කෙසේ නම් සද්ධිවිහාරික මහණහු උපාධ්‍යායයන් කෙරෙහි මනා ව නො පවත්නාහු දැ"යි පහත් කොට සිතත්, දෙස් නගත්, අගුණ පතුරුවත්.

ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

"මහණෙනි, සද්ධිවිහාරික භික්ෂූහු උපාධ්‍යායයන් කෙරෙහි මනා කොට නො පවතිත් ල. ඒ සැබෑ දැ"යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

"සැබව භාග්‍යවතුන් වහන්සැ"යි භික්ෂූහු කීහ.

"මහණෙනි, සද්ධිවිහාරිකයෝ කෙසේ නම් උපාධ්‍යායයන් කෙරෙහි මනා කොට නො පිළිපදින්නාහු ද, මහණෙනි, මෙය නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස ද පහන්වූවන්ගේ පැහැදීම වැඩි වීම පිණිස ද නො වන්නේ ය. වැලි දු එය නො පහන්වූවන්ගේ නො පැහැදීම පිණිස ද පහන් වූ ද එක්තරා කෙනකුගේ වෙනස් බව පිණිස ද වන්නේ යැ"යි වෙසෙසින් ගැරැහූ සේක. වෙසෙසින් ගරහා දැහැමි කථා කොට භික්ෂූන් අමතා මෙසේ වදාළසේක:

"මහණෙනි, එසේ වී නම් යම්සේ සද්ධිවිහාරිකයන් විසින් උපාධ්‍යායයන් කෙරෙහි පැවතියයුතු ද එසේ සද්ධිවිහාරිකයනට උපාධ්‍යායයන් කෙරෙහි පවත්නා ලෙසට වත් පනවන්නෙමි".

"මහණෙනි, සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායයන් කෙරෙහි මනාව පැවතියැයුතු. මේ ඒ මනා පැවැත්ම යැ:

කලින් ම නැඟී සිට වහන් මුද තනිපට සිවුර එකස් කොට පෙරෙවගෙන උපාධ්‍යායයාට දැහැටි දියැයුතු. මුවදෝනා ජලය දියැයුතු. අසුන් පැනවියැයුතු. කැඳ ඇත් නම් කැඳ එළවියැයුතු. කැඳ පූවාහට පැන් දී බඳුන පිළිගෙන පහත් කොට කිසිවෙක දු නො ගටමින් දෙවැ තැන් පත් කළයුතු. උපාධ්‍යායයා නැගී සිටි කලැ අස්න ඉදිරියැයුතු.

ඒ තැන කැලිකුණු ගැසී ඇත් නම් හැමැන්දයුතු. උපාධ්‍යායයා ගම්වදිනු කැමැත්තේ වේ නම්, හඳනය දියැයුතු. පෙරළා දුන් හඳනය පිළිගතයුතු. කාබහන දියැයුතු. සඟුණ කොට සඟළ සිවුරු දියැයුතු. පාත්‍රය සෝද දිය සහිත ව (නො පිසදමා) දියැ යුතු. උපාධ්‍යාය තෙම පසුමහණකු කැමැත්තේ නම්, තිමඬුලු වසා පිරිමඬුලු කොට හැඳ කාබහන බැඳ සඟුණ කොට සඟළ සිවුරු පෙරෙවැ ගැට වටු ගන්වා, ඉක්බිති පාත්‍රය සෝද රැගෙන උපාධ්‍යායයාගේ පසුමහණකු වියැයුතු. ඉතා ඈත්හි නො යායුතු. ඉතා ළඟ නො යායුතු. පාත්‍රය ඇතුළත වූ දෑ පිළිගතයුතු.

න උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා. උපජ්ඣායො ආපත්තිසාමන්තා භණමානො නිවාරෙතබ්බො. නිවත්තන්තෙන පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං. නිවාසනං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාරෙත්වා[1] චීවරං සඞ්ඝරිතබ්බං, මා මජ්ඣෙ භඞ්ගො අහොසීති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

17. සචෙ පිණ්ඩපාතො හොති උපජ්ඣායො ච භුඤ්ජිතුකාමො හොති උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. උපජ්ඣායො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො.

චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

උපජ්ඣායම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො.

සචෙ උපජ්ඣායො නහායිතුකාමො හොති නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති උණ්හං පටියාදෙතබ්බං. සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය උපජ්ඣායස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං.

1. උස්සාදෙත්වා - සිමු

උපාධ්‍යායයා කථා කරද්දී අතරතුර කථා නො හෙළියයුතු. උපාධ්‍යාය තෙම ඇවතකට සමීප වැ කථා කරන්නේ වී නම්, එය වැළැක්වියයුතු. (ගමින්) පෙරළා එන්නාහු විසින් වඩා පළමු ව අවුත් අසුන් පැනවියයුතු. පාදෝනා දිය පාපුටුව පාදකඨලිකාව ළං කොට තැබියයුතු. පෙර ගමන් කොට පාසිවුරු පිළිගතයුතු. පෙරළු හඳනය දියයුතු. හඳනය පිළිගතයුතු. සිවුර (ඩහදියෙන්) තෙත් වී නම්, මොහොතක් අව්වේ වියලියයුතු. සිවුර (වැඩිවේලාවක්) අව්වේ දමා තිබියයුතු නො වේ. සිවුර හැකිළියයුතු. සිවුර හකුළන්නහු විසින් සිවුර මැද බිඳීමෙක් නො වේවා යි අදහස ඇති ව සිවුරු කොන අඟල් සතරක් උඩට ඇද හැකිළියයුතු. කාබන්ධන සිවුරු නැමුම තුළ තැබියයුතු.

17. ඉදින් පිණ්ඩභොජනය තිබේ ද උපාධ්‍යායයාත් වළඳනු කැමැති වේ ද, පැන් පිළිගන්වා පිණ්ඩභොජනය එළවියයුතු. උපාධ්‍යාය තෙම පැනින් විචාළයුතු. වළඳා අවසන් කළ උපාධ්‍යායයාට පැන් පිළිගන්වා පාත්‍රය පිළිගෙන පහත් කොට (කිසිවෙක ද) නො ගටමින් මොනොවට සෝද දිය පිස දමා මොහොතක් කල් උෂ්ණයෙහි (අව්වේ) රත් කළයුතු. උෂ්ණයෙහි පාත්‍රය (වැඩි වේලා) තැබියයුතු නො වේ. පාසිවුරු තැබියයුතු. පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන එක් අතෙකින් ඇඳයට හෝ පුටුව යට පිරිමැද පාත්‍රය තැබියයුතු. කිසිත් නො අතුළ බිමෙහි පාත්‍රය නො ම තැබියයුතු.

සිවුර තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන අනිත් අතින් සිවුර වනන උණලිය හෝ සිවුර වනන ලනුව පිස දමා සිවුරු කෙළවර එහා පැත්තට ද සිවුරුනැමුම මෙහා පැත්තට ද කොට සිවුර තැබියයුතු.

උපාධ්‍යායයා නැඟී සිටි කල්හි අස්න ඉදිරියයුතු. පා දෝනා දිය ද පා පුටුව ද පා තබන ලෑලි කඩ ද සුරකි කොට තැබියයුතු. ඒ පෙදෙස කුණු සහිත වේ නම් එය ඇමැද්දයුතු.

ඉදින් උපාධ්‍යාය තෙම නානු කැමැති වේ නම්, නාන දිය පිළියෙළ කළයුතු. සිසිල් දිය වුව මනා වී නම් සිසිල් දිය පිළියෙළ කළයුතු. උණු දිය වුව මනා වී නම් උණු දිය පිළියෙළ කළයුතු. උපාධ්‍යාය තෙම ගිනිහල් ගෙට පිවිසෙනු කැමැත්තේ නම්, (ඇඟ ගානා) සුණු සිනිඳු කළයුතු. ඇඟැ ගානා මැටි තෙමියයුතු. ගිනිහල් පුටුව ගෙන උපාධ්‍යායයා පිටුපසින් ගොස් ගිනිහල් පුටුව දී සිවුර පිළිගෙන එක් පසෙක තැබියයුතු. ඇඟ මදිනා සුණු දියැයුතු. ඇඟැ ගාන මැටි දියැයුතු. හැක්කේ නම් ගිනිහල් ගෙට පිවිසෙන්නහු විසින් මැටියෙන් මුහුණ වසා ඉදිරි පසින් ද පිටු පසින් ද කය වසා ගිනිහල් ගෙට පිවිසියයුතු.

න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහිතබ්බා. ජන්තාඝරෙ උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. උදකෙපි උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා උපජ්ඣායස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. උපජ්ඣායො පානීයෙන පුච්ඡිතබ්බො.

18. සචෙ උද්දිසාපෙතුකාමො හොති උද්දිසාපෙතබ්බො. සචෙ පරිපුච්ඡිතුකාමො හොති පරිපුච්ඡිතබ්බො. යස්මිං විහාරෙ උපජ්ඣායො විහරති සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ උස්සහති සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භිසිබිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චො නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො, පීඨං නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. කවාටපිට්ඨං නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භූමත්ථරණං යථාපඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං.

සචෙ විහාරෙ සන්තානකං හොති උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. අලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ අකතා හොති භූමි උදකෙන පරිප්ඵොසිත්වා පරිප්ඵොසිත්වා සම්මජ්ජිතබ්බා 'මා විහාරො රජෙන උහඤ්ඤී'ති. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං.

සථවිර භික්‍ෂූන් ගටා අතරට පැන නො හින්දයුතු. නවක මහණහු උනස්නෙන් බැහැර නො කළයුතුහ. ගිනිහල් ගෙහි දී උපාධ්‍යාය තෙරහට පිරියම් කළයුතු. ගිනිහල් ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල් පුටුව ගෙන ඉදිරියෙන් ද පිටුපසින් ද කය වසාගෙන ගිනිහල්ගෙන් නික්මියැයුතු. දියෙහි ද උපාධ්‍යයයාට පිරියම් කළයුතු. නැවහු විසින් වඩා පළමුවෙන් දියෙන් නැඟ තමාගේ සිරුර දිය ඉවත් කොට හැඳ පෙරෙව උපාධ්‍යායයාගේ සිරුරෙන් දිය පිස දැමියයුතු. හඳනය දියයුතු. සඟළ සිවුර දියැයුතු. ගිනිහල්පුටුව ගෙන වඩා පළමුවෙන් අවුත් අසුන් පැනැවියයුතු. පාදෝනා දිය ද පාපුටුව ද පාදකඨලිකාව ද ළං කොට තැබියයුතු. උපාධ්‍යයයා පැනින් විචාළයුතු.

18. ඉදින් උදෙසවනු කැමැති (හදරවනු කැමැති) වේ නම්, උදෙසැවියයුතු. ඉදින් පුන පුනා විචාළයුතු නම්, පුන පුනා විචාළයුතු. යම් වෙහෙරෙක උපාධ්‍යායයා වෙසේ ද ඉදින් ඒ වෙහෙර කැලි කසළ සහිත වේ නම්, ඉදින් හැකි නම් ශුද්ධ කළ යුතු. විහාරය ශුද්ධ කරන්නහු විසින් පළමු කොට පා සිවුරු මැත් කොට පසෙක තැබියැයුතු. නිසීදනය ද පසතුරුණු ද මැත් කොට පසෙක තැබියැයුතු. බිසි ද කොට්ට ද බැහැර කොට පසෙක තැබියයුතු. ඇඳ පහත් කොට කිසිවෙක නොගාවා නො ගටා බැහැර කොට පසෙක තැබියයුතු. පුටුව පහත් කොට කිසිවෙක නො ගාවා නො ගටා මොනොවට බැහැර කොට පසෙක තැබියැයුතු. කපාටපෘෂ්ඨය (දෙරපළු පිට) පහත් කොට කිසිවෙක නො ගාවා නො ගටා මොනොවට බැහැර කොට පසෙක තැබිය යුතු. ඇඳපා බැහැර කොට පසෙක තැබියැයුතු. කෙළමලාව බැහැර කොට පසෙක තැබියයුතු. හේත්තුවන පුවරුව බැහැර කොට පසෙක තැබියැයුතු. බුමුතුරුණ පනවන ලද පරිදි සලකා බැහැර කොට පසෙක තැබියැයුතු.

ඉදින් වෙහෙරෙහි මකුළු දැල් වේ ද, උඩ සිට පළමුවෙන් පහතට ඉවත් කළයුතු. වාබොනයන්හි කවුළු (දෙරපළු) ද, කර්ණභාගයෝ (ගැබෙහි මුලු සතර) ද පිස දැමියැයුතු. ඉදින් ගුරු පිරියම් කරන ලද බිත්තිය කුණින් වැකුණේ වේ නම් රෙදිකඩක් තෙමා මිරිකා මැද්ද යුතු. ඉදින් කළුපැහැ කරන ලද බිම කුණින් වැකුණේ වේ නම් රෙදි කඩක් තෙමා මිරිකා මැද්දයුතු. ඉදින් කිසිදු පිරියමක් නො කළ බිමෙක් වේ නම්, විහාරය දූලියෙන් නොවැකේව'යි සලකා දිය ඉස ඉස ඇමැද්දයුතු. කසළ රැස් කොට එක් පසෙකැ දැමියැ යුතු.

භුම්මත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන (කවාටපිට්ඨං) අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන (කවාටපිට්ඨං) අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. කවාටපිට්ඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බං. භිසිබිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බං.

19. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො, චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති දක්ඛිණා වාතපානා ථකෙතබ්බා.

සචෙ සීතකාලො හොති දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති දිවා වාතපානා ථකෙතබ්බා. රත්තිං විවරිතබ්බා.

සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති වච්චකුටි සම්මජ්ජිතබ්බා.

සචෙ පානීයං න හොති පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

බුමුතුරුණු වියලා ශුද්ධ කොට ගසා දමා ඇතුළට ගෙන ගොස් කලින් පනවා තුබුණු පරිදි ම පැනැවියයුතු. ඇඳ පා අලු වියලා පිස දමා ඇතුළට ගෙන ගොස් තුබුණු තන්හි ම තැබියැයුතු. ඇඳ වියලා ශුද්ධ කොට ගසාදමා පහත් කොට කිසිවෙක නො ගාවමින් නො ගටමින් මනාකොට ඇතුළට ගෙනගොස් පනවා තුබුණු පරිදි ම පැනැවියයුතු. පුටුව වියලා ශුද්ධ කොට පපොළා පහත් කොට කිසිවෙක නො ගාමින් නො ගටමින් මනාකොට ඇතුළට ගෙන ගොස් පනවා තුබුණු පරිදි ම පැනැවියයුතු. කපාටපෘෂ්ඨය (දෙර පළු පිට) වියලා ශුද්ධකොට පපොළා පහත් කොට කිසිවෙක නො ගාවමින් නො ගටමින් ඇතුළට ගෙන ගොස් තුබුණු තන්හි ම තැබියැයුතු. බියි ද කොට්ට ද වියලා ශුද්ධ කොට පපොළා ඇතුළට ගෙන ගොස් පනවා තුබුණු පරිදි ම පැනවියයුතු. නිසීදනය ද පසතුරුණු ද වියලා ශුද්ධ කොට පපොළා ඇතුළට ගෙන ගොස් පනවා තුබුණු පරිදි ම පැනවියැයුතු. කෙළමලාව වියලා පිස දමා ඇතුළට ගෙන ගොස් තුබුණු තන්හි ම තැබියයුතු. හේත්තු වන පුවරුව වියලා පිස දමා ඇතුළට ගෙන ගොස් තුබුණු තන්හි ම තැබියැයුතු.

19. පා සිවුරු බහා තැබියයුතු. පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන එක් අතෙකින් ඇඳ යට හෝ පුටුව යට හෝ පිරිමැද පාත්‍රය තැබියයුතු. කිසිත් නො අතුරන ලද බිමැ පාත්‍රය නො ම තැබියයුතු. සිවුර තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන එක් අතෙකින් සිවුර දමන උණලිය හෝ සිවුරු රැහැන පිසදමා සිවුර කෙළවර ඈත් කොට ද සිවුරු නැම්ම මැත් කොට ද සිවුර තැබියයුතු.

ඉදින් පෙරදිගට අයත් රජස් සහිත සුළං හමා නම් පෙර දිගැ වූ වාතපානයෝ වැසියයුත්තාහ. පැසිම් දිගට අයත් රජස් සහිත වාතයෝ හමත් නම්, පැසිම් දිගට අයත් වාතපානයෝ වැසියයුත්තාහ. උතුරුදිගට අයත් රජස් සහිත වාතයෝ හමත් නම්, උතුරුදිගැ වාතපානයෝ වැසියයුත්තාහ. දකුණු දිගට අයත් රජස් සහිත වාතයෝ හමත් නම් දකුණු දිග වාතපානයෝ වැසිය යුත්තාහ.

ඉදින් ශීත කාලය වේ නම්, දවල් වාතපානයෝ ඇර තැබිය යුත්තාහ. රාත්‍රියෙහි වසා තැබියයුත්තාහ. ඉදින් උෂ්ණ කාලය වේ නම්, වාතපානයෝ දහවල් වැසියයුත්තාහ. රාත්‍රියෙහි ඇර තැබිය යුත්තාහ.

ඉදින් පිරිවෙණ කුණු කසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් දෙරටුව කුණු කසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් උවටන් හල කුණු කසළ සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් ගිනිහල් ගෙය කුණුරොඩු සහිත වී නම් එය හැමැන්දයුතු. ඉදින් වැසිකිළිය කුණුරොඩු සහිත වී නම් එය හැමැන්දයුතු.

ඉදින් පැන් නො වී නම් පැන් එළවා තැබියයුතු. ඉදින් පරිභොග ජලය නො වේ නම් එය එළවා තැබියැයුතු. ඉදින් ආචමන කුම්භියෙහි ජලය නො වේ නම් එහි දිය වත්කළයුතු.

20. සචෙ උපජ්ඣායස්ස අනභිරති උප්පන්නා හොති, සද්ධිවිහාරිකෙන වූපකාසෙතබ්බා වූපකාසාපෙතබ්බා ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායස්ස කුක්කුච්චං උප්පන්නං හොති සද්ධිවිහාරිකෙන විනොදෙතබ්බං, විනොදාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායස්ස දිට්ඨිගතං උප්පන්නං හොති සද්ධිවිහාරිකෙන විවෙචෙතබ්බං, විවෙචාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස පරිවාසං දදෙය්‍යා'ති.

සචෙ උපජ්ඣායො මූලාය පටිකස්සනාරහො හොති සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායං මූලාය පටිකස්සෙය්‍යා'ති. සචෙ උපජ්ඣායො මානත්තාරහො හොති සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස මානත්තං දදෙය්‍යා'ති. සචෙ උපජ්ඣායො අබ්භානාරහො හොති සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායං අබ්භෙය්‍යා'ති. සචෙ සඞ්ඝො උපජ්ඣායස්ස කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස කම්මං න කරෙය්‍ය ලහුකාය වා පරිණාමෙය්‍යා'ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො උපජ්ඣායො සම්මා වත්තෙය්‍ය ලොමං පාතෙය්‍ය නෙත්ථාරං වත්තෙය්‍ය සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා'ති.

21. සචෙ උපජ්ඣායස්ස චීවරං ධොවිතබ්බං හොති, සද්ධිවිහාරිකෙන ධොවිතබ්බං උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං ධොවීයෙථා'ති. සචෙ උපජ්ඣායස්ස චීවරං කාතබ්බං හොති සද්ධිවිහාරිකෙන කාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං කරීයෙථා'ති. සචෙ උපජ්ඣායස්ස රජනං පචිතබ්බං හොති සද්ධිවිහාරිකෙන පචිතබ්බං, උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො උපජ්ඣායස්ස රජනං පචීයෙථා'ති. සචෙ උපජ්ඣායස්ස චීවරං රජිතබ්බං හොති සද්ධිවිහාරිකෙන රජිතබ්බං, උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං රජීයෙථා'ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජිතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං.

20. ඉදින් උපාධ්‍යායයාට පැවිද්දෙහි නො ඇල්මෙක් උපන්නේ නම්, සද්ධිවිහාරික මහණහු විසින් සන්හිඳුවියයුතු. අනුන් ලවා හෝ සන්හිඳුවවියයුතු. ඔහුට බණ හෝ කියයුතු. ඉදින් උපාධ්‍යායයාට කුකුසෙක් උපන්නේ වී නම්, එය සද්ධිවිහාරිකයා විසින් දුරු ලියයුතු, අනුන් ලවා හෝ දුරුලැවියයුතු. ඔහුට බණ කියයුතු හෝ වෙයි. ඉදින් උපාධ්‍යායයාට මිසදිටෙක් උපන්නේ නම් සද්ධිවිහාරිකයා විසින් එය බැහැරලියයුතු. අනුන් ලවා හෝ බැහැරු ලැවියයුතු. ඔහුට බණ කියයුතු හෝ වෙයි. ඉදින් උපාධ්‍යාය තෙම පිරිවෙසට සුදුසු ගරු ඇවතකට පැමිණියේ වී නම්, කෙසේ නම් සඞ්ඝ තෙමේ උපාධ්‍යායයාට පිරිවෙස දෙන්නේ දැ'යි (පිරිවෙස් දෙවීම පිණිස) සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කළයුතු වෙයි.

ඉදින් උපාධ්‍යායයා මූලායපටිකස්සනය ලබනුවට සුදුසු වේ නම්, 'කෙසේ නම් සංඝ තෙමේ උපාධ්‍යායයාට මූලායපටිකස්සනය කරන්නේ වේ දැ'යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කළයුතු වේ. ඉදින් උපාධ්‍යාය තෙම මානතට සුදුසු වේ නම්, 'කෙසේ නම් සංඝ තෙමේ උපාධ්‍යායයාට මානත දෙන්නේ දැ'යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කළයුතු. ඉදින් උපාධ්‍යාය තෙම අබ්භානයට සුදුසු වේ නම්, කෙසේ නම් සංඝ තෙමේ උපාධ්‍යායයා අබ්භානය කරන්නේ දැ'යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කළයුතු. ඉදින් සංඝයා උපාධ්‍යායයාට තජ්ජනීය කර්‍මය හෝ නියස්ස කර්‍මය හෝ පබ්බාජනීය කර්‍මය හෝ පටිසාරණීය කර්‍මය හෝ උක්ඛෙපනීය කර්‍මය හෝ කරනු කැමැත්තේ වී නම්, 'කෙසේ නම් සංඝ තෙමේ උපාධ්‍යායයාට ඒ කර්මය නො කරන්නේ හෝ ඒ කර්මය හැල්ලු බවට පෙරළන්නේ හෝ වේ දැ'යි සද්ධිවිහාරිකයා විසින් උත්සුක බවට පැමිණියයුතු. ඉදින් ඔහුට සංඝයා විසින් තජ්ජනීය කර්මය හෝ නියස්ස කර්මය හෝ පබ්බාජනීය කර්මය හෝ පටිසාරණීය කර්මය හෝ උක්ඛෙපනීය කර්ම හෝ කරන ලද්දේ වී නම්, 'කෙසේ නම් උපාධ්‍යාය තෙමේ (විනය නීති අනුව) මනා ව පවතින්නේ ද භික්‍ෂූනට අනුලොම් ව පවතින්නේ ද, නිස්තරණයට හේතු වූ වත්හි පවත්නේ ද, සංඝ තෙමේ ඒ කර්මය සන්හිඳුවන්නේ දැ'යි සද්ධිවිහාරික මහණහු විසින් උත්සුක බව කළයුතු.

21. ඉදින් උපාධ්‍යායයාගේ සිවුරු (සේදියැ යුතු වී නම් සද්ධිවිහාරිකයා විසින් එය සේදියයුතු වෙයි. 'කෙසේ නම් උපාධ්‍යායයාගේ සිවුරු සෝදනු ලබන්නේ දැ'යි උත්සාහ කළයුතු හෝ වෙයි. ඉදින් උපාධ්‍යායයාට සිවුරක් කළයුතු වී නම් සද්ධිවිහාරිකයා විසින් එය කළයුතු වෙයි. 'කෙසේ නම් උපාධ්‍යායයාට සිවුරු කරනු ලබන්නේ දැ'යි උත්සාහ හෝ කළයුතු. ඉදින් උපාධ්‍යායයාට රඳන් පිසියැයුතු (පඩු උණු කළයුතු) වී නම්, සද්ධිවිහාරිකයා විසින් එය පිසියයුතු. 'කෙසේ නම් උපාධ්‍යායයාට රඳන් පිසිනු ලබන්නේ දැ'යි උත්සාහ කළයුතු හෝ වෙයි. ඉදින් උපාධ්‍යායයාගේ සිවුරු පඩු පෙවියයුතු වී නම්, සද්ධිවිහාරිකයා විසින් එය කළ යුතු වෙයි. 'කෙසේ නම් උපාධ්‍යායයාගේ සිවුරු පඩු පොවනු ලබන්නේ දැ'යි උත්සාහ හෝ කළයුතු. සිවුරු පඩු පොවන්නහු විසින් මනා කොට පෙරළ පෙරළා පඩු පෙවියැයුතු. පඩු බින්දු නො සුන් කල්හි (සිවුර වියැලෙන්නට පෙර) ඉවත නො යායුතු.

න උපජ්ඣායං අනාපුච්ඡා එකච්චස්ස පත්තො දාතබ්බො, න එකච්චස්ස පත්තො පටිග්ගහෙතබ්බො, න එකච්චස්ස චීවරං දාතබ්බං, න එකච්චස්ස චීවරං පටිග්ගහෙතබ්බං, න එකච්චස්ස පරික්ඛාරො දාතබ්බො, න එකච්චස්ස පරික්ඛාරො පටිග්ගහෙතබ්බො, න එකච්චස්ස කෙසා ඡෙත්තබ්බා, න එකච්චෙන කෙසා ඡෙදාපෙතබ්බා, න එකච්චස්ස පරිකම්මං කාතබ්බං, න එකච්චෙන පරිකම්මං කාරාපෙතබ්බං, න එකච්චස්ස වෙය්‍යාවච්චො කාතබ්බො, න එකච්චෙන වෙය්‍යාවච්චො කාරාපෙතබ්බො, න එකච්චස්ස පච්ඡාසමණෙන හොතබ්බං, න එකච්චො පච්ඡාසමණො ආදාතබ්බො, න එකච්චස්ස පිණ්ඩපාතො නීහරිතබ්බො, න එකච්චෙන පිණ්ඩපාතො නීහරාපෙතබ්බො.

න උපජ්ඣායං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො, න සුසානං ගන්තබ්බං, න දිසා පක්කමිතබ්බා. සචෙ උපජ්ඣායො ගිලානො හොති යාවජීවං උපට්ඨාපෙතබ්බො, වුට්ඨානමස්ස ආගමෙතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං යථා සද්ධිවිහාරිකෙහි උපජ්ඣායෙසු වත්තිතබ්බන්ති.''

## සද්ධිවිහාරිකවත්තං

22. තෙන ඛො පන සමයෙන උපජ්ඣායා සද්ධිවිහාරිකෙසු න සම්මාවත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම උපජ්ඣායා සද්ධිවිහාරිකෙසු න සම්මා වත්තිස්සන්ති''ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. ''සච්චං කිර භික්ඛවෙ උපජ්ඣායා සද්ධිවිහාරිකෙසු න සම්මා වත්තන්ති''ති.

''සච්චං භගවා''. -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: ''තෙන හි භික්ඛවෙ උපජ්ඣායානං සද්ධිවිහාරිකෙසු වත්තං පඤ්ඤපෙස්සාමි යථා උපජ්ඣායෙහි සද්ධිවිහාරිකෙසු වත්තිතබ්බං''.

''උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා:

උපාධ්‍යායයා නො විචාරා අනෙකකුට පාත්‍රය නො දියැයුතු, අනෙකකුගේ පාත්‍රය නො පිළිගතයුතු, අනෙකකුට සිවුරක් නො දියැයුතු, අනෙකකුගේ සිවුරක් නො පිළිගතයුතු, අනෙකකුට පිරිකර නො දියැ යුතු, අනෙකකුගේ පිරිකරෙක් නො පිළිගතයුතු, අනෙකකුගේ කෙස් නොසිඳියැ යුතු, අනෙකකු ලවා තමාගේ කෙස් නො සින්ද වියැයුතු, අනෙකකුට (අත් පා මිරිකීම් ආදි) පිරියම් නො කළයුතු, අනෙකකු ලවා පිරියම් නො කරවා ගතයුතු, අනෙකකුට වතාවත් නො කළයුතු, අනෙකකු ලවා වතාවත් නො කරවාගත යුතු, අනෙකකුගේ පසු මහණකු නො වියැයුතු, අනෙකකු පසු මහණකු කොට නො ගතයුතු, අනෙකකුට පිණ්ඩපාතය නො ගෙන යායුතු, අනෙකකු ලවා පිණ්ඩපාතය නො ම ගෙන්වාගතයුතු වෙයි.

උපාධ්‍යායයා නො විචාරා ගම් නො වැදියැයුතු, සොහොනට නො යායුතු, දිසා (ඈතකට) නො යායුතු, උපාධ්‍යායයා ගිලන් වී නම්, දිවි ඇති තාක් උවටන් කළයුතු, ඔහු ගිලන් බැවින් නැඟී සිටීම අපෙක්‍ෂා කළයුතු.

මහණෙනි, මේ වනාහි උපාධ්‍යායයන් කෙරෙහි සද්ධිවිහාරිකයන් විසින් යම් සේ පැවතියැයුතු ද, ඒ උපාධ්‍යායයන් කෙරෙහි සද්ධිවිහාරිකයන්ගේ වත යි''.

## සද්ධිවිහාරික වත

22. එ සමයෙහි වනාහි උපාධ්‍යායයෝ සද්ධිවිහාරිකයන් කෙරෙහි මනා ව නො පවතිත්. අපිස් සතොස් ගුණ ඇති ලජ්ජී වූ මඳ වරදෙහි ද කුකුස් කරන, සිඛ කැමැති යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු ''කෙසේ නම් උපාධ්‍යායයෝ සද්ධිවිහාරික මහණුන් කෙරෙහි මනා ව නො පවතිත් ද''යි ලාමක කොට සිතත්, නින්ද කෙරෙත්, නො ගුණ පතුරුවත්.

ඉක්බිති එ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. ''මහණෙනි, උපාධ්‍යායයෝ සද්ධිවිහාරිකයන් කෙරෙහි මනා ව නො පවතිත් ල. ඒ සැබෑ ද''යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළසේක.

''සැබැවැ වහන්සැ,''යි භික්‍ෂූහු කීහ. භාග්‍යවතුන් වහන්සේ... වෙසෙසින් ගරහා දහැමි කථා කොට භික්‍ෂූන් අමතා ''මහණෙනි, එසේ වී නම්, උපාධ්‍යායයන් විසින් සද්ධිවිහාරිකයන් කෙරෙහි යම් සේ පැවතියැයුතු ද, එසේ උපාධ්‍යායනට සද්ධිවිහාරිකයන් කෙරෙහි වත් පනවන්නෙමි''.

''මහණෙනි, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයා කෙරෙහි මැනවින් පැවතියැයුතු. එහි මේ ඒ මනා පැවැත්ම ය:

උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකො සඞ්ගහෙතබ්බො, අනුග්ගහෙතබ්බො, උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා. සචෙ උපජ්ඣායස්ස පත්තො හොති, සද්ධිවිහාරිකස්ස පත්තො න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පත්තො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස පත්තො උප්පජ්ජෙය්‍යා'ති. සචෙ උපජ්ඣායස්ස චීවරං හොති, සද්ධිවිහාරිකස්ස චීවරං න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස චීවරං දාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං උප්පජ්ජෙය්‍යා'ති. සචෙ උපජ්ඣායස්ස පරික්ඛාරො හොති, සද්ධිවිහාරිකස්ස පරික්ඛාරො න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පරික්ඛාරො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස පරික්ඛාරො උප්පජ්ජෙය්‍යා'ති.

23. සචෙ සද්ධිවිහාරිකො ගිලානො හොති, කාලස්සෙව උට්ඨාය දන්තකට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුං පීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො.

සචෙ සද්ධිවිහාරිකො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. එත්තාවතා නිවත්තිස්සතීති. ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං. නිවාසනං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාරෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං, මා මජ්ඣෙ භඞ්ගො අහොසීති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

සචෙ පිණ්ඩපාතො හොති සද්ධිවිහාරිකො ච භුඤ්ජිතුකාමො හොති උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. සද්ධිවිහාරිකො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො.

මහණෙනි, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරික තෙම උදෙසීමෙන් (පෙළදහම්, කියැවීමෙන්) ද නැවත නැවත විචාරීමෙන් ද අවවාදයෙන් ද අනුශාසනයෙන් ද සංග්‍රහ කළයුතු අනුග්‍රහ කළ යුතු. ඉදින් උපාධ්‍යායයාගේ පාත්‍රයෙක් වේ ද, (ඒ අතර) සද්ධිවිහාරිකයාට පාත්‍රයෙක් නැද්ද, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයාට පාත්‍රය දියයුතු. 'කෙසේ නම් සද්ධිවිහාරිකයාට පාත්‍රයෙක් උපදනේ ද' යි උත්සුක බව හෝ කළයුතු. ඉදින් උපාධ්‍යායයාට සිවුරෙක් වේ ද, සද්ධිවිහාරිකයාට සිවුරෙක් නො වේ ද, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයාට සිවුර දියයුතු. 'කෙසේ නම් සද්ධිවිහාරිකයාට සිවුරක් උපදනේ ද' යි උත්සුක බව හෝ කළයුතු. ඉදින් උපාධ්‍යායයාට පිරිකරෙක් වේ ද, සද්ධිවිහාරිකයාට පිරිකරෙක් නො වේ ද, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයාට පිරිකර දියයුතු. 'කෙසේ නම් සද්ධිවිහාරිකයාට පිරිකර උපදනේ ද' යි උත්සුක බව හෝ කළයුතු.

23. ඉදින් සද්ධිවිහාරිකයා ගිලන් වේ නම්, කලින් ම නැඟී සිට දැවටු දියයුතු, මුව දෝනා පැන් දියයුතු, අසුන් පැනවියැ යුතු, ඉදින් කැඳ ඇත් නම් බඳුනක් දෙවැ කැඳ එළවියැයුතු, කැඳ පූවාහට පැන් දී බඳුන පිළිගෙන පහත් කොට මනාව කිසිවෙක නො ගාවමින් සෝද සුරැකි කොට තැබියැයුතු, සද්ධිවිහාරිකයා නැඟී සිටි කල්හි අස්න ඉදිරියැයුතු. ඉදින් ඒ පෙදෙස කුණුරොඩු සහිත වී නම් එය ඇමැන්දයුතු.

ඉදින් සද්ධිවිහාරිකයා ගමට යනු කැමැත්තේ වී නම් හඳනය දියයුතු. පිළිහඳනය (පෙරළු හඳනය) පිළිගතයුතු. කාබාන දියැ යුතු. සගුණ කොට සහළ සිවුරු දියයුතු. සෝද දිය සහිත පාත්‍රය දියයුතු. මෙතෙක් වේලාවෙකින් පෙරළා එන්නේ යැ යි සලකා අසුන් පැනවියැයුතු. පා දෝනා දිය, පාපුටුව, පාකටැලිය ළංකොට තැබියැයුතු. පෙර ගමන් කොට පාසිවුරු පිළිගතයුතු. පෙරළු හඳනය දියයුතු. හඳනය පිළිගතයුතු. ඉදින් සිවුර ඩහදිය වැකුණේ වී නම් මොහොතක් අව්වේ වියැලියැයුතු. සිවුර අව්වේ බොහෝ වේලා නො තැවියැයුතු. සිවුර හැකිළියැයුතු සිවුර හකුළන්නහු විසින් 'සිවුර මැද බිඳීමෙක් නො වේව' යි සලකා සිවුරු කෙළවර සතරඟුලක් උඩට ඇද සිවුර ඇකිළියැයුතු.

ඉදින් පිණ්ඩපාතය වේ නම්, සද්ධිවිහාරිකයාත් වළඳනු කැමැත්තේ වේ නම්, දිය පිළිගන්වා පිණ්ඩපාතය එළැවියැයුතු. සද්ධිවිහාරික තෙම පැනින් විචාළයුතු. වැළඳූවාහට දිය පිළිගන්වා පාත්‍රය පිළිගෙන පහත් කොට මනා කොට, කිසිවෙකත් නො ගාමින් සෝද, දිය සිඳුවා, මොහොතක් අව්වේ වියලියැයුතු. පාත්‍රය උෂ්ණයෙහි බොහෝ වේලා නො තැබියැයුතු. පාසිවුරු තැබියැ යුතු. පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන අනිත් අතින් ඇඳ යට හෝ පුටුව යට පිරිමැද පාත්‍රය තැබියැයුතු. කිසිත් නො අතුළ බිමැ පාත්‍රය නො ම තැබියයුතු.

චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො.

24. සචෙ සද්ධිවිහාරිකො නහායිතුකාමො හොති නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති උණ්හං පටියාදෙතබ්බං. සචෙ සද්ධිවිහාරිකො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝර පවිසිතබ්බං.

න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා. ජන්තාඝරෙ සද්ධිවිහාරිකස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. උදකෙපි සද්ධිවිහාරිකස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා සද්ධිවිහාරිකස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. සද්ධිවිහාරිකො පානියෙන පුච්ඡිතබ්බො.

යස්මිං විහාරෙ සද්ධිවිහාරිකො විහරති සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ උස්සහති සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං -පෙ- සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං. සචෙ සද්ධිවිහාරිකස්ස අනභිරති උප්පන්නා හොති උපජ්ඣායෙන වූපකාසෙතබ්බා. වූපකාසාපෙතබ්බා. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ සද්ධිවිහාරිකස්ස කුක්කුච්චං උප්පන්නං හොති උපජ්ඣායෙන විනොදෙතබ්බං. විනොදාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ සද්ධිවිහාරිකස්ස දිට්ඨිගතං උප්පන්නං හොති උපජ්ඣායෙන විවෙචෙතබ්බං. විවෙචාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා.

සිවුර තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන අනිත් අතින් සිවුරුවස හෝ සිවුරු රැහැන පිස දමා කෙළවර ඈතින් ද නැම්ම මැතින් ද කොට සිවුර තැබියයුතු. සද්ධිවිහාරිකයා නැඟී සිටි කල්හි අස්න ඉදිරියැයුතු. පාදෝනා දිය පාපුටුව පාකටැලිය සුරකි කොට තැබියයුතු. එ තැන හැඩි වී තිබේ නම් හැමැන්ද යුතු.

24. ඉදින් සද්ධිවිහාරික තෙම නානු කැමැත්තේ වී නම්, නාන දිය පිළියෙළ කැරැ දියැයුතු. ඉදින් සිසිල් දියෙන් වැඩෙක් වේ නම් සිසිල් දිය පිළියෙළ කළයුතු. උණු දියෙන් වැඩෙක් වේ නම් උණු දිය පිළියෙළ කළයුතු. සද්ධිවිහාරික තෙම ගිනිහල් ගෙට වදිනු කැමැති නම්, නාන සුණු ඈතියයුතු. මැටි තෙමියැයුතු. ගිනිහල් පුටුව ගෙන ගොස් දී සිවුරු පිළිගෙන පැත්තෙක තැබියැ යුතු. නාන සුණු දියැයුතු. මැටි දියැයුතු. හැක්කේ නම් ගිනිහලට පිවිසියැයුතු. ගිනිහලට වදනහු විසින් මැටියෙන් මුහුණ වකා (මැටි මුහුණේ තවරා) ඉදිරි පසින් ද පිටු පසින් ද වසා ගෙන ගිනිහල් ගෙට පිවිසියැයුතු.

ස්ථවිර භික්ෂූන් හා ගැටී නො හින්දයුතු. නවක මහණහු අස්නෙන් නො පිළිබැහියයුතු. ගිනිහල්ගෙහි දී සද්ධිවිහාරිකයාට පිරියම් කළයුතු. ගිනිහල්ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල් පුටුව ගෙන ඉදිරියෙන් ද පිටු පසින් ද වසා ගෙන එයින් නික්මියැ යුතු. දියෙහි ද සද්ධිවිහාරිකයාට පිරියම් කළයුතු. නැවහු විසින් වඩා පළමුවෙන් ගොඩ නැඟී සිය ගත දිය පිසදමා හඳනය හැඳ සද්ධිවිහාරිකයාගේ සිරුරින් දිය පිස දැමියැයුතු. හඳනය දියැයුතු. සඟළ සිවුර දියයුතු. ගිනිහල් පුටුව ගෙන වඩා පළමුවෙන් අවුත් අසුන් පැනවියැයුතු. පාදෝනා දිය පාපුටුව පාකටැලිය ළං කොට තැබියැයුතු. සද්ධිවිහාරිකයා පැනින් විචාළයුතු.

සද්ධිවිහාරිකයා යම් වෙහෙරෙකැ වෙසේ ද, ඒ වෙහෙර හැඩී වී තිබේ නම්, හැකි නම් ශුද්ධ කළයුතු. වෙහෙර ශුද්ධ කරන්නහු විසින් පළමු කොට පා සිවුරු බැහැර කොට එක් පැත්තෙක තැබියැයුතු ... ආචමනකුම්භියෙහි ජලය නැත් නම්, එහි ජලය එත්කළයුතු. සද්ධිවිහාරිකයාට පැවිද්දෙහි නො ඇල්මක් උපන්නේ වී නම්, උපාධ්‍යායයා විසින් එය සන්හිඳුවියැයුතු. අනුන් ලවා හෝ සන්හිඳුවියැයුතු. බණ හෝ කියැයුතු. ඉදින් සද්ධිවිහාරිකයාට කුකුසෙක් උපන්නේ වී නම්, උපාධ්‍යායයා විසින් එය දුරු ලියැ යුතු. දුරුලැවියැයුතු හෝ වෙයි. බණ හෝ කියැයුතු. සද්ධිවිහාරිකයාට මිසදිටෙක් උපන්නේ වී නම්, උපාධ්‍යායයා විසින් එය විවෙචනය කළයුතු, අනුන් ලවා හෝ විවෙචනය කැරැවියැයුතු, ඔහුට බණ හෝ කියැයුතු.

25. සචෙ සද්ධිවිහාරිකො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකස්ස පරිවාසං දදෙය්‍යා'ති. සචෙ සද්ධිවිහාරිකො මූලායපටිකස්සනාරහො හොති උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකං මූලායපටිකස්සෙය්‍යා'ති. සචෙ සද්ධිවිහාරිකො මානත්තාරහො හොති උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකස්ස මානත්තං දදෙය්‍යා'ති. සචෙ සද්ධිවිහාරිකො අබ්භානාරහො හොති උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකං අබ්භෙය්‍යා'ති.

සචෙ සඞ්ඝො සද්ධිවිහාරිකස්ස කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං, 'කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකස්ස කම්මං න කරෙය්‍ය ලහුකාය වා පරිණාමෙය්‍යා'ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං, 'කින්ති නු ඛො සද්ධිවිහාරිකො සම්මා වත්තෙය්‍ය ලොමං පාතෙය්‍ය නෙත්ථාරං වත්තෙය්‍ය සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා'ති.

සචෙ සද්ධිවිහාරිකස්ස චීවරං ධොවිතබ්බං හොති උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං 'එවං ධොවෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං ධොවියෙථා'ති. සචෙ සද්ධිවිහාරිකස්ස චීවරං කාතබ්බං හොති උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං 'එවං කරෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං කරියෙථා'ති. සචෙ සද්ධිවිහාරිකස්ස රජනං පචිතබ්බං හොති උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං 'එවං පචෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස රජනං පචියෙථා'ති. සචෙ සද්ධිවිහාරිකස්ස චීවරං රජිතබ්බං හොති උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං 'එවං රජෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං රජියෙථා'ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජිතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං. සචෙ සද්ධිවිහාරිකො ගිලානො හොති යාවජීවං උපට්ඨාපෙතබ්බො වුට්ඨානමස්ස ආගමෙතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ උපජ්ඣායානං සද්ධිවිහාරිකෙසු වත්තං යථා උපජ්ඣායෙහි සද්ධිවිහාරිකෙසු වත්තිතබ්බන්ති.

**දුතියභාණවාරං නිට්ඨිතං.**

25. ඉදින් සද්ධිවිහාරික තෙම ගරු ඇවැතකට පැමිණියේ පිරිවෙසට සුදුසු වේ නම්, 'කෙසේ නම් සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයාට පිරිවෙස දෙන්නේ දැ' යි උපාධ්‍යායයා විසින් උත්සාහ කළයුතු යි. ඉදින් සද්ධිවිහාරික තෙම මූලායපටිකස්සනයට සුදුසු වේ නම්, උපාධ්‍යයයා විසින් 'කෙසේ නම් සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයාට මූලායපටිකස්සනය කරන්නේ දැ' යි උත්සාහ කළයුතු. ඉදින් සද්ධිවිහාරික තෙම මානත ලබන්නට සුදුසු වී නම්, 'කෙසේ නම් සද්ධිවිහාරික තෙමේ මානත ලබන්නේ දැ' යි උපාධ්‍යායයා විසින් උත්සාහ කළයුතු. ඉදින් සද්ධිවිහාරික තෙම අබ්භානයට සුදුසු වී නම්, 'කෙසේ නම් සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයා අබ්භානය කරන්නේ දැ' යි උපාධ්‍යායයා විසින් උත්සාහ කළයුතු.

ඉදින් සඞ්ඝයා සද්ධිවිහාරිකයාට තර්ජනීය කර්මය හෝ නියස්ස කර්මය හෝ පබ්බාජනීය කර්මය හෝ පටිසාරණීය කර්මය හෝ උක්ඛෙපනීය කර්මය හෝ කරනු කැමති වී නම්, 'කෙසේ නම් සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයාට ඒ කර්මය නො කරන්නේ ද යි, ඒ කර්මය හැල්ලු බවට පිරිනමන්නේ දැ' යි උපාධ්‍යායයා විසින් උත්සාහ කළයුතු ය. ඉදින් ඔහුට තර්ජනීයකර්මය හෝ නියස්ස කර්මය හෝ පබ්බාජනීය කර්මය හෝ පටිසාරණීය කර්මය හෝ උක්ඛෙපනීය කර්මය හෝ කරන ලද්දේ වී නම්, 'කෙසේ නම් සද්ධිවිහාරික තෙම මනා ව පවත්නේ ද සඞ්ඝයාට අනුලොම් ව පවත්නේ ද නිස්තරණය පිණිස පවත්නේ ද සඞ්ඝ තෙමේ ඒ කර්මය සන්හිඳුවන්නේ දැ' යි උපාධ්‍යායයා විසින් උත්සාහ කළ යුතු.

ඉදින් සද්ධිවිහාරිකයාගේ සිවුර සේදියයුතු නම්, 'මෙසේ සෝදන්නැ' යි උපාධ්‍යායයා විසින් කියයුතු. කෙසේ නම් සද්ධි-විහාරිකයාගේ සිවුර සෝදනු ලබන්නේ දැ' යි උත්සාහ හෝ කළ යුතු. ඉදින් සද්ධිවිහාරිකයාට සිවුරක් කළයුතු නම්, 'මෙසේ කළ යුතු යැ' යි උපාධ්‍යායයා විසින් කියයුතු. 'කෙසේ නම් සද්ධි-විහාරිකයාට සිවුර කරනු ලබන්නේ දැ' යි උත්සාහ හෝ කළ යුතු. ඉදින් සද්ධිවිහාරිකයාට රදන් පිසියයුතු නම්, 'මෙසේ පිසන්නැ'යි උපාධ්‍යායයා විසින් කියයුතු. 'කෙසේ නම් සද්ධිවිහාරි-කයාට රදන් පිසිනු ලබන්නේ දැ' යි උපාධ්‍යායයා විසින් උත්සාහ කළයුතු හෝ වෙයි. ඉදින් සද්ධිවිහාරිකයාගේ සිවුර පඬු පෙවියැ යුතු නම්, 'මෙසේ පඬු පොවන්නැ' යි උපාධ්‍යායයා විසින් කිය යුතු. 'කෙසේ නම් සද්ධිවිහාරිකයාගේ සිවුර පඬු පොවනු ලබන්නේ දැ' යි උත්සාහ කළයුතු හෝ වෙයි. සිවුර පඬු පොවන්නහු විසින් පෙරළ පෙරළා මනා කොට සිවුර පඬු පෙවියයුතු. පඬු බින්දු නො සිඳුණු කල්හි නො ම නික්මියයුතු. ඉදින් සද්ධිවිහාරික තෙම ගිලන් වේ නම් යව දිව උවටන් කළයුතු. ඔහු ගිලන් බැවින් නැගී සිටීම බලාපොරොත්තු වියයුතු.

මහණෙනි, යම්සේ උපාධ්‍යායයන් විසින් සද්ධිවිහාරිකයන් කෙරෙහි පැවැතියයුතු ද මේ ඒ සද්ධිවිහාරිකයන් කෙරෙහි උපාධ්‍යායයන්ගේ වත යි.

**දෙවෙනි බණවර නිමියේ යි.**

## ආචරියවත්තං

26. තෙන ඛො පන සමයෙන අන්තෙවාසිකා ආචරියෙසු න සම්මා වත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'කථං හි නාම අන්තෙවාසිකා ආචරියෙසු න සම්මා වත්තිස්සන්තී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

''සච්චං කිර භික්ඛවෙ අන්තෙවාසිකා ආචරියෙසු න සම්මා වත්තන්තී''ති. සච්චං භගවා. -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: ''තෙනහි භික්ඛවෙ අන්තෙවාසිකානං ආචරියෙසු වත්තං පඤ්ඤපෙස්සාමි යථා අන්තෙවාසිකෙහි ආචරියෙසු වත්තිතබ්බං.''

''අන්තෙවාසිකෙන භික්ඛවෙ ආචරියම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා:

කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුපීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං. ආචරියම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං.

සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ ආචරියො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. සචෙ ආචරියො පච්ඡාසමණං ආකඞ්ඛති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා ආචරියස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං. නාච්චාසන්නෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං.

## ඇදුරුවත්

26. එ සමයෙහි වනාහි අතැවැසියෝ ඇදුරන් කෙරෙහි මනා වැ නො පවතිත්. අපිස් සතොස් ගුණ ඇති ලජ්ජී වූ කුකුස් කරන ශික්‍ෂාකාමී යම් මහණ කෙනෙක් වෙත් ද ඔහු 'කෙසේ නම් අතැවැසියෝ ඇදුරන් කෙරෙහි මනා ව නො පවත්නාහු ද' යි ලාමක කොට සිතත්, නිඳා කරත්, නො ගුණ පතුරුවත්. ඉක්බිත්තෙන් ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ.

''මහණෙනි, අතැවැසි මහණහු ඇදුරු මහණුන් කෙරෙහි මොනොවට නො පවතිත් ල. ඒ සැබෑ ද'' යි භාග්‍යවතුන් වහන්සේ අසාවදාළසේක. ''සැබැව, වහන්සැ'' යි භික්‍ෂූහු කීහ ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දැහැමි කතා කොට, භික්‍ෂූන් අමතා ''මහණෙනි, එසේ වී නම් අතැවැස්සන් විසින් ඇදුරන් කෙරෙහි යම්සේ පැවතියයුතු ද එසේ අතැවැස්සනට ඇදුරුවත පනවන්නෙමි'' යි වදරා පහත දැක්වෙන පරිදි ඇදුරුවත පැනවූසේක.

''මහණෙනි, අතැවැස්සා විසින් ඇදුරා කෙරෙහි මනාවැ පැවතියැ යුතු. එහි මෙ මනා පැවැත්ම යි:

කලින් ම නැඟී සිට වහන් මුදා උතුරුසඟ එකස් කොට ගෙන දැවටු දියැයුතු. මුවදෝනා ජලය දියැයුතු. අසුන් පැනවියැයුතු. ඉදින් හුළුකැන් ඇත් නම්, බඳුනක් දෙවැ හුළුකැන් එළවියැයුතු. හුළුකැන් පූවාහට පැන් පිළිගන්වා බඳුන පිළිගෙන පහත් කොට කිසිවෙක ද නො ගාවමින් මොනොවට දෙවැ සුරැකි කොට තැබියැයුතු. ඇදුරහු නැඟී සිටි කල්හි අස්න ඉදිරියැ යුතු.

ඉදින් එ පෙදෙස කුණු රොඩු සහිත වී නම් එ තැන හැමැද්ද යුතු. ඉදින් ඇදුරු තෙම ගම් වදිනු කැමති වී නම්, හඳනය දියැයුතු. පිළිහඳනය පිළිගතයුතු. කාබාන දියැයුතු. සඟළ සිවුරු සඟුණ කොට දියැයුතු. සෝද දිය සහිත පාත්‍රය දියැයුතු. ඉදින් ඇදුරු තෙම පසුමහණකු කැමැත්තේ නම් තිමඬුලු වසන්නහු විසින් පිරිමඬුලු කොට හැඳ කාබහන බැඳ සඟුණ කොට සඟළ සිවුරු පෙරෙවැ ගැට වටු ගන්වා පාත්‍රය සෝද අතට ගෙන ඇදුරහුගේ පසුමහණ වියැයුතු. ඉතා දුර නො යායුතු. ඉතා ළඟ නො යායුතු. පාත්‍රයට ලැබුණු දෑ පිළිගතයුතු.

27. න ආචරියස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා. ආචරියො ආපත්තිසාමන්තා භණමානො නිවාරෙතබ්බො. නිවත්තන්තෙන පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං නිවාසනං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාරෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං මා මජ්ඣෙ භඞ්ගො අහොසීති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

සචෙ පිණ්ඩපාතො හොති ආචරියො ච භුඤ්ජිතුකාමො හොති උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. ආචරියො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

ආචරියම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො.

සචෙ ආචරියො නහායිතුකාමො හොති නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති උණ්හං පටියාදෙතබ්බං. සචෙ ආචරියො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය ආචරියස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං.

27. ඇදුරහු කථා කරද්දී අතරතුර කථා නො හෙළියැයුතු. ඇදුරු ඇවැතකට අවදනට ළං ව බණනුයේ වැළැක්වියැයුතු. පෙරළා එන්නහු විසින් වඩා පළමුවෙන් අවුත් අස්නක් පැනවියැයුතු. පාදෝනා දිය ද පාපුටුව ද පාකටැලිය ද ළං කොට තැබියැ යුතු. පෙර ගමන් කොට පාසිවුරු පිළිගතයුතු. පිළිනිවස්න දියැ යුතු. නිවස්න පිළිගතයුතු. සිවුර ඩහදියෙන් තෙත් වූයේ වේ නම්, මොහොතක් අව්වේ වියලියැයුතු. අව්වේ බොහෝ වේලාවක් නො තැබියැයුතු. සිවුර හැකිළිය යුතු. සිවුර හකුළන්නහු විසින් 'සිවුරු මැද බිඳීමෙක් නොවේව' යි සිතා සිවුරු කොන සතරඟුලක් උඩට ඇද හැකිළියැයුතු. කාබන්ධන නමා චීවරභොගයෙහි (සිවුරේ නැමුම් පොට තුළට) ලියැයුතු.

ඉදින් පිණ්ඩපාත භොජනය තිබේ නම්, ඇදුරාත් වළඳනු කැමැත්තේ වී නම්, දිය පිළිගන්වා පිණ්ඩපාතය එළවියැයුතු. ඇදුරු තෙම පැනින් විචාළයුතු. වැළඳූවහුට දිය පිළිගන්වා පාත්‍රය පිළිගෙන කිසිවෙක නොගාවමින් පහත් කොට මොනොවට සෝද දිය රහිත කොට (තෙත මාත්තු කොට) මොහොතක් අව්වේ වියැලිය යුතු. පාත්‍රය වැඩිවේලාවක් අව්වේ දමා නො තැබියයුතු. පාසිවුරු තැබියැයුතු, පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන එක් අතෙකින් ඇඳ යට හෝ පුටුව යට හෝ පිරිමැද පාත්‍රය තැබියැයුතු. කිසිවක් නො අතුළ බිමැ පාත්‍රය නො තැබියයුතු. සිවුරු බහා තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන එක් අතෙකින් සිවුරු වස[1]. හෝ සිවුරු රැහැන පිරිමැද සිවුරු කොන පිටතට ද සිවුරු නැම්ම මැතට (තමා සිටින පැත්තට) ද කොට සිවුර තැබියයුතු.

ඇදුරහු නැඟී සිටි කල්හි අස්න ඉදිරියැයුතු. පා දෝනා දිය, පාපුටුව, පාකටැලිය සුරැකි කොට තැබියයුතු. ඉදින් එ තැන කුණු වැකී ඇත් නම් හැමැන්දයුතු.

ඉදින් ඇදුරු තෙම නානු කැමැත්තේ වී නම්, නාන දිය පිළියෙළ කළයුතු. ඉදින් සිසිල් දියෙන් ප්‍රයොජන වේ නම්, සිසිල් දිය පිළියෙළ කළයුතු. උණුදිය වුවමනා නම් උණුදිය පිළියෙල කළයුතු. ඉදින් ඇදුරු තෙම ගිනිහල් ගෙට පිවිසෙනු කැමත්තේ වී නම් නාන සුණු දියෙන් තෙමා ගුලි කළයුතු. මැටි තෙමියයුතු. ගිනිහල් පුටුව ගෙන ඇදුරු පිටුපසින් ගොස් එය දී සිවුරු පිළිගෙන එක් පසෙක තැබියැයුතු. නාන සුණු දියයුතු. මැටි දියයුතු. හැක්කේ වී නම් තමා ගිනිහල් ගෙට පිවිසියැයුතු. ගිනිහල් ගෙට වදනහු විසින් මැටියෙන් මුහුණ වකා (මැටි මූණේ ගා) ඉදිරි පසින් ද පිටු පසින් ද වසා ගෙන ගිනිහල් ගෙට පිවිසියැයුතු

1. සිවුර දමන හුණලිය හෝ එවැන්නක්.

28. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා, ජන්තාඝරෙ ආචරියස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. උදකෙපි ආචරියස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා ආචරියස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. ආචරියො පානීයෙන පුච්ඡිතබ්බො. සචෙ උද්දිසාපෙතුකාමො හොති උද්දිසාපෙතබ්බො. සචෙ පරිපුච්ඡිතුකාමො හොති පරිපුච්ඡිතබ්බො.

යස්මිං විහාරෙ ආචරියො විහරති සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ උස්සහති සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං: නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භිසි - බිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චො නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භුම්මත්ථරණං යථාපඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං.

සචෙ විහාරෙ සන්තානකං හොති උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා සම්මජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ අකතා හොති භූමි උදකෙන පරිප්ඵොසිත්වා සම්මජ්ජිතබ්බා 'මා විහාරො රජෙන උහඤ්ඤී'ති. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං.

29. භුම්මත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. භිසි බිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං.

28. සථවිර භික්ෂූන් ඇඟ ගැටී නො හින්දයුතු. නවක මහණුහු අස්නෙන් බැහැර නො කළයුතු. ගිනිහල් ගෙහි දී ඇදුරුහට පිරියම් කළ යුතු. ගිනිහල් ගෙන් නික්මෙන්නාහු විසින් ගිනිහල් පුටුව ගෙන ඉදිරියෙන් ද පිටුපසින් ද වසා ගිනිහල් ගෙන් නික්මියැයුතු. දියෙහි ද ඇදුරුහට පිරියම් කළයුතු. නැවහු විසින් වඩා පළමුවෙන් ගොඩ අවුත් සිය ගත දිය පිසදමා හැඳ ඇදුරහු ගතින් දිය පිස දැමියැයුතු. හඳනය දියැයුතු. සඟළ සිවුර දියැයුතු. ගිනිහල් පුටුව ගෙන වඩා පළමුවෙන් අවුත් අසුන් පැනවියැයුතු. පාදෝනා දිය ද පාපුටුව ද පාකටලිය ද එළවා තැබියයුතු. ඇදුරු තෙම පැනින් විචාළයුතු. උදෙස්වනු කැමැත්තේ වී නම් උදෙස්වියයුතු. ප්‍රශ්න විචාරනු කැමැත්තේ වී නම් විචාළයුතු.

යම් වෙහෙරෙක ඇදුරා වෙසේ ද ඉදින් ඒ වෙහෙර කුණු රොඩු වැකි ඇත්තේ ද, හැකිනම් ශුද්ධ කළ යුතු. වෙහෙර ශුද්ධ කරන්නහු විසින් පළමු කොට පාසිවුරු මැත් කොට පසෙක තැබිය යුතු. හිඳුනාකඩ ද පසතුරුණ ද මැත් කොට පසෙක තැබියයුතු. බිසි ද, කොට්ට ද මැත් කොට පසෙක තැබිය යුතු. ඇඳ පහත් කොට කිසිවෙක ද නො ගාවමින් නො ගටමින් මනා කොට කපාටපෘෂ්ඨ-යෙන් (දෙරපළු පිටෙන්) පිටතට ගෙන ගොස් තැබිය යුතු. පුටුව පහත් කොට කිසිවෙක නො ගාවමින් නො ගටමින් මනාව දෙරපළු පිටෙන් පිටතට ගෙන ගොස් තැබියයුතු. ඇඳ පා අළු පිටත ගෙන ගොස් පසෙක තැබියයුතු. කෙළමලාව පිටත ගෙන ගොස් පසෙක තැබියයුතු. හේත්තුවන පුවරුව පිටත ගෙන ගොස් පසෙක තැබියයුතු. බුමුතුරණ පනවා තුබුණු සැටි සලකා පිටත ගෙන ගොස් පසෙක තැබිය යුතු.

ඉදින් වෙහෙරෙහි මකුළුදැල් වේ නම්, පළමු කොට උඩ සිට පහතට ඉවත් කළයුතු. ආලොකසන්ධිභාගයෝ ද (ඇතුළත පිටත ජනෙල් දෙරවල් ද) කර්ණභාගයෝ ද (ගැබ සතර මුළු ද) හැමැන්දයුතු. ඉදින් ගුරු පිරියම් කරන ලද බිත්තිය කිලිටි වී තිබේ නම්, රෙදි කඩක් තෙමා මිරිකා මැද්දයුතු. ඉදින් බිම පිරියම් නො කරන ලද නම්, 'වෙහෙර දූවිල්ලෙන් කිලිටි නො වේ ව' යි සලකා දිය ඉස හැමැන්දයුතු. කසළ රැස්කොට පැත්තකට දැමියයුතු.

29. බුමුතුරුණ වියලා ශුද්ධ කොට ගසා දමා ඇතුළට ගෙන ගොස් කලින් පනවා තුබුණු පරිදිම පැනවියැයුතු. ඇඳ පා අළු අව්වේ තවා පිස දමා ඇතුළට ගෙන ගොස් කලින් තුබුණු තැන ම තැබියයුතු හ. ඇඳ අව්වේ තවා ශුද්ධ කොට ගසා දමා කවුළු පිටැ නො ගාමින් පහත් කොට මනාව ඇතුළට ගෙන ගොස් පනවා තුබුණු පරිදි ම පැනවියැයුතු. පුටුව අව්වේ තවා ශුද්ධ කොට ගසාහෙළා, කවුළු පිටැ නො ගාමින් නොගටමින් පහත් කොට මනාව ඇතුළට ගෙනගොස් පනවා තුබුණු පරිදි ම පැනවියැ යුතු. බිසි හා කොට්ට හා අව්වේ තවා ශුද්ධ කොට ගසාහෙළා ඇතුළට ගෙන ගොස් කලින් පනවා තුබූ පරිදි ම පැනවියැයුතු.

නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බං.

පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති දිවා වාතපානා විවරිතබ්බා, රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති දිවා වාතපානා ථකෙතබ්බා, රත්තිං විවරිතබ්බා. සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පානීයං න හොති පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

30. සචෙ ආචරියස්ස අනභිරති උප්පන්නා හොති අන්තෙවාසිකෙන වූපකාසෙතබ්බා, වූපකාසාපෙතබ්බා, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ ආචරියස්ස කුක්කුච්චං උප්පන්නං හොති, අන්තෙවාසිකෙන විනොදෙතබ්බං, විනොදාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ ආචරියස්ස දිට්ඨිගතං උප්පන්නං හොති අන්තෙවාසිකෙන විවෙචෙතබ්බං විවෙචාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ ආචරියො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො ආචරියස්ස පරිවාසං දදෙය්‍යා'ති.

හිඳුනා ඇතිරිය ද පසතුරුණ ද අව්වේ තවා ශුද්ධ කොට ගසාහෙළා ඇතුළට ගෙන ගොස් පනවා තුබුණු පරිදිම පැනවියැ යුතු. කෙළමලාව අව්වේ ලා තවා පිස දමා ඇතුළට ගෙන ගොස් තුබුණු තැන ම තැබියයුතු. හේත්තු වන පුවරුව අව්වේ තවා පිස දමා ඇතුළට ගෙන ගොස් කලින් තුබුණු තැන ම තැබිය යුතු.

පාසිවුරු තැබියයුතු. පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන අනෙක් අතින් ඇඳයට හෝ පුටුව යට හෝ පිරිමැද පාත්‍රය තැබිය යුතු. කිසිවක් නො අතුළ බිමැ පාත්‍රය නො ම තැබියයුතු. සිවුර තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන අනෙක් අතින් සිවුරු වස හෝ සිවුරුරැහැන හෝ පිරිමැද සිවුරු කොන පිටතට ද සිවුරු නැම්ම මැතට (තමා දෙසට) ද කොට සිවුර තැබියයුතු.

ඉදින් පෙරදිගට අයත් ධූලි සහිත වාතයෝ හමත් නම්, පෙර දිගැ වූ වාබොනයෝ වැසියැයුතුහ. ඉදින් පැසිම් දිගට අයත් ධූලි සහිත වාතයෝ හමත් නම්, පැසිම් දිගැ වූ වාබොනයෝ වැසියැයුත්තාහ. උතුරු දිගට අයත් ධූලි සහිත වාතයෝ හමත් නම්, උතුරු පැත්තේ වූ වාබොනයෝ වැසියැයුත්තාහ. දකුණු දිගට අයත් ධූලි සහිත වාතයෝ හමත් නම්, දකුණු දිගැ වූ වාබොනයෝ වැසියැයුත්තාහ. ඉදින් ශීත කාලය වේ නම්, වාබොනයෝ දහවල් විවැරියැයුත්තාහ. රෑ වැසියැයුත්තාහ. ඉදින් උෂ්ණ කාලය වේ නම්, වාබොනයෝ දහවල් වැසියැ යුත්තාහ, රෑ විවැරියැයුත්තාහ. ඉදින් පිරිවෙන කුණුරොඩු සහිත වී නම්, හැමැන්දයුතු. ඉදින් දෙරැ කොටුව කුණුරොඩු සහිත වී නම්, එය හැමැන්දයුතු. ඉදින් උවටන් හල කුණුරොඩු සහිත වීනම්, එය හැමැන්දයුතු. ඉදින් ගිනිහල කුණුරොඩු සහිත වී නම්, එය හැමැන්ද යුතු. වැසිකිළිය කුණු රොඩු සහිත වී නම්, එය හැමැන්දයුතු. පැන් නැත් නම් පැන් එළවා තැබියැයුතු. පරිභොග ජලය නැත් නම්, පරිභොග ජලය එළවා තැබියයුතු. ඉදින් ආචමනකුම්භියෙහි ජලය නැත් නම්, එහි දිය වත් කළයුතු.

30. ඉදින් ඇදුරුහට පැවිද්දෙහි නො ඇල්මෙක් උපන්නේ වේ නම්, අතැවැස්සහු විසින් එය ඉවත් කළයුතු, ඉවත් කැරැවිය යුතු, ඔහුට බණ කියයුතු හෝ වේ. ඉදින් ඇදුරුහට කුකුසෙක් උපන්නේ නම්, අතැවැස්සහු විසින් එය දුරැ ලියැයුතු, දුරැ ලැවිය යුතු, ඔහුට බණ හෝ කියැ යුතු. ඉදින් ඇදුරුහට මිසදිටුවෙක් උපන්නේ නම්, අතැවැස්සා විසින් විවිසියැයුතු, විවිසැවියැයුතු ඔහුට බණ හෝ කියැ යුතු. ඉදින් ඇදුරු ගරු ඇවතකට අවන්නේ පිරිවෙස් වසන්නට සුදුසු වී නම්, කෙසේ නම් සඞ්ඝ තෙමේ ඇදුරුහට පිරිවෙස දෙන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව කළයුතු.

සචෙ ආචරියො මූලාය පටිකස්සනාරහො හොති අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං ‘කින්ති නු ඛො සඞ්ඝො ආචරියං මූලාය පටිකස්සෙය්‍යා’ති. සචෙ ආචරියො මානත්තාරහො හොති අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං ‘කින්ති නු ඛො සඞ්ඝො ආචරියස්ස මානත්තං දදෙය්‍යා’ති. සචෙ ආචරියො අබ්භානාරහො හොති අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං ‘කින්ති නු ඛො සඞ්ඝො ආචරියං අබ්භෙය්‍යා’ති. සචෙ සඞ්ඝො ආචරියස්ස කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං ‘කින්ති නු ඛො සඞ්ඝො ආචරියස්ස කම්මං න කරෙය්‍ය ලහුකාය වා පරිණාමෙය්‍යා’ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං ‘කින්ති නු ඛො ආචරියො සම්මාවත්තෙය්‍ය, ලොමං පාතෙය්‍ය, නෙත්ථාරං වත්තෙය්‍ය, සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා’ති.

සචෙ ආචරියස්ස චීවරං ධොවිතබ්බං හොති අන්තෙවාසිකෙන ධොවිතබ්බං උස්සුක්කං වා කාතබ්බං ‘කින්ති නු ඛො ආචරියස්ස චීවරං ධොවියෙථා’ති. සචෙ ආචරියස්ස චීවරං කාතබ්බං හොති, අන්තෙවාසිකෙන කාතබ්බං, උස්සුක්කං වා කාතබ්බං ‘කින්ති නු ඛො ආචරියස්ස චීවරං කරීයෙථා’ති. සචෙ ආචරියස්ස රජනං පචිතබ්බං හොති, අන්තෙවාසිකෙන පචිතබ්බං, උස්සුක්කං වා කාතබ්බං ‘කින්ති නු ඛො ආචරියස්ස රජනං පචීයෙථා’ති. සචෙ ආචරියස්ස චීවරං රජිතබ්බං හොති, අන්තෙවාසිකෙන රජිතබ්බං. උස්සුක්කං වා කාතබ්බං ‘කින්ති නු ඛො ආචරියස්ස චීවරං රජීයෙථා’ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජිතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං.

න ආචරියං අනාපුච්ඡා එකච්චස්ස පත්තො දාතබ්බො. න එකච්චස්ස පත්තො පටිග්ගහෙතබ්බො. න එකච්චස්ස චීවරං දාතබ්බං. න එකච්චස්ස චීවරං පටිග්ගහෙතබ්බං. න එකච්චස්ස පරික්ඛාරො දාතබ්බො. න එකච්චස්ස පරික්ඛාරො පටිග්ගහෙතබ්බො. න එකච්චස්ස කෙසා ඡෙත්තබ්බා. න එකච්චෙන කෙසා ඡෙදාපෙතබ්බා. න එකච්චස්ස පරිකම්මං කාතබ්බං. න එකච්චෙන පරිකම්මං කාරාපෙතබ්බං. න එකච්චස්ස වෙය්‍යාවච්චො කාතබ්බො. න එකච්චෙන වෙය්‍යාවච්චො කාරාපෙතබ්බො. න එකච්චස්ස පච්ඡාසමණෙන හොතබ්බං. න එකච්චො පච්ඡාසමණො ආදාතබ්බො. න එකච්චස්ස පිණ්ඩපාතො නීහරිතබ්බො. න එකච්චෙන පිණ්ඩපාතො නීහරාපෙතබ්බො.

ඉදින් ඇදුරු තෙම මූලායපටිකස්සනයට සුදුසු වී නම් 'කෙසේ නම් සංඝ තෙමේ ඇදුරුහට මූලායපටිකස්සනය කරන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක වියයුතු. ඉදින් ඇදුරු තෙම මානතට සුදුසු වී නම්, 'කෙසේ නම් සංඝ තෙමේ ඇදුරුහට මානත දෙන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව කළයුතු (උනන්දු වියයුතු). ඉදින් ඇදුරු තෙම අබ්භානයට සුදුසු වී නම්, 'කෙසේ නම් සංඝ තෙමේ ඇදුරහු අබ්භානය කරන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව කළයුතු. ඉදින් සංඝ තෙමේ ඇදුරුහට තජ්ජනීය කර්මය හෝ නියස්ස කර්මය හෝ පබ්බාජනීය කර්මය හෝ පටිසාරණීය කර්මය හෝ උක්ඛෙපණීය කර්මය හෝ කරනු කැමැති වේ නම්, 'කෙසේ නම් සංඝ තෙමේ ඇදුරුහට (ඒ) කර්මය නො කරන්නේ ද, එය හැල්ලු බවට හෝ පෙරළන්නේ දැ'' යි අතැවැස්සා විසින් උත්සුක බව කළයුතු. ඔහුට සංඝයා විසින් තජ්ජනීය හෝ නියස්ස හෝ පබ්බාජනීය හෝ පටිසාරණීය හෝ උක්ඛෙපණීය කර්මය කරන ලද්දේ වී නම්, 'කෙසේ නම් ඇදුරු තෙමේ මනා වැ පවත්නේ ද, ලොම් හෙළන්නේ ද (සංඝයාට අවනත වන්නේ ද), නිස්තරණය පිණිස පවත්නේ ද, සංඝ තෙමේ ඒ කර්මය සන්සිඳු වන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව කළයුතු.

ඉදින් ඇදුරාගේ සිවුරු සෝදියයුතු වේ නම්, අතැවැස්සා විසින් සෝදියයුතු. 'කෙසේ නම් ඇදුරහුගේ සිවුරු සෝදනු ලබන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව හෝ කළයුතු. ඉදින් ඇදුරුහට සිවුරෙක් කළයුතු වේ නම්, අතැවැස්සා විසින් එය කළයුතු, ''කෙසේ නම්, ඇදුරාගේ සිවුර කැරෙන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව හෝ කළයුතු. ඉදින් ඇදුරුහට රඳන් පිසියයුතු (පඬු උණු කළයුතු) වේ නම්, අතැවැස්සහු විසින් පිසියයුතු, 'කෙසේ නම් ඇදුරුහට රඳන් පිසෙන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව හෝ කළයුතු. ඉදින් ඇදුරුහුගේ සිවුර පඬුපෙවියැ යුතු වේ නම්, අතැවැස්සා විසින් පඬුපෙවියැ යුතු, 'කෙසේ නම් ඇදුරුහුගේ සිවුරු පඬු පොවනු ලබන්නේ දැ' යි අතැවැස්සා විසින් උත්සුක බව හෝ කළයුතු. සිවුර පඬු පොවන්නහු විසින් පෙරළ පෙරළා මොනොවට පඬුපෙවියැයුතු. පඬු බිඳු නො සුන් කල්හි නො ම නික් මැ යායුතු.

ඇදුරහු නො විචාරා එකක්හට පාත්‍රය නො දියැයුතු. එකකුගේ පාත්‍රය නො ම පිළිගතයුතු. එකකුට සිවුර නො දියැයුතු, එකකුගේ සිවුරු නො පිළිගත යුතු. එකකුට පිරිකර නො දියැ යුතු. එකකුගේ පිරිකර නො ම පිළිගතයුතු. එකකුගේ කෙස් නො සින්දැ යුතු. එකක්හු ලවා තමා කෙස් නො ම සින්දැවියැ යුතු. එකකුට පිරියම් නො කළයුතු. එකක්හු ලවා පිරියම් නො ම කරවාගතයුතු. එකක්හට වතාවත් නො කළයුතු. එකක්හු ලවා වතාවත් නො ම කරවාගතයුතු. එකක්හට පසු මහණකු නො වියැයුතු. එකෙක් පසු මහණකු කොට නො ම ගතයුතු. එකක්හට පිණ්ඩපාතය නො ම ගෙනයා යුතු. එකක්හු ලවා පිණ්ඩපාතය නො ම ගෙන්වාගතයුතු.

න ආචරියං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො. න සුසානං ගන්තබ්බං න දිසා පක්කමිතබ්බා. සචෙ ආචරියො ගිලානො හොති යාවජීවං උපට්ඨාපෙතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ අන්තෙවාසිකානං ආචරියෙසු වත්තං යථා අන්තෙවාසිකෙහි ආචරියෙසු වත්තිතබ්බන්ති''.

31. තෙන ඛො පන සමයෙන ආචරියා අන්තෙවාසිකෙසු න සම්මා වත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ආචරියා අන්තෙවාසිකෙසු න සම්මා වත්තිස්සන්ති''ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: ''සච්චං කිර භික්ඛවෙ ආචරියා අන්තෙවාසිකෙසු න සම්මා වත්තන්ති''ති. ''සච්චං භගවා''. -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. ''තෙන හි භික්ඛවෙ, ආචරියානං අන්තෙවාසිකෙසු වත්තං පඤ්ඤපෙස්සාමි යථා ආචරියෙහි අන්තෙවාසිකෙසු වත්තිතබ්බං''.

''ආචරියෙන භික්ඛවෙ අන්තෙවාසිකම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා:

ආචරියෙන භික්ඛවෙ, අන්තෙවාසිකො සඞ්ගහෙතබ්බො. අනුග්ගහෙතබ්බො උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා. සචෙ ආචරියස්ස පත්තො හොති, අන්තෙවාසිකස්ස පත්තො න හොති, ආචරියෙන අන්තෙවාසිකස්ස පත්තො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස පත්තො උප්පජ්ජෙය්‍යා'ති.

සචෙ ආචරියස්ස චීවරං හොති අන්තෙවාසිකස්ස චීවරං න හොති ආචරියෙන අන්තෙවාසිකස්ස චීවරං දාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං උප්පජ්ජෙය්‍යා'ති.

සචෙ ආචරියස්ස පරික්ඛාරො හොති අන්තෙවාසිකස්ස පරික්ඛාරො න හොති. ආචරියෙන අන්තෙවාසිකස්ස පරික්ඛාරො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස පරික්ඛාරො උප්පජ්ජෙය්‍යා'ති.

ඇදුරා නො ම විචාරා ගම් නො වැදියයුතු. සොහොනට නො යායුතු. දිසාවන්හි නො යායුතු. ඉදින් ඇදුරා ගිලන් වේ නම්, යාවජ්ජීව උවටැන් කළයුතු. ඔහුගේ රෝගයෙන් නැඟී සිටීම (සුවය) බලා පොරොත්තු වියයුතු.

මහණෙනි, මේ වනාහි යම්සේ අතැවැස්සන් විසින් ඇදුරන් කෙරෙහි පැවතියයුතු ද, මේ අතැවැස්සන් විසින් ඇදුරන් කෙරෙහි පැවතියයුතු ඒ වත යැ''.

31. එ සමයෙහි ඇදුරෝ ඇතැවැසියන් කෙරෙහි මනා ව නො පවතිත්. අල්පෙච්ඡ වූ, ලද පමණින් සතුටු වන, ලජ්ජී වූ, මඳ කරුණෙහි ද කුකුස් කරන, ශික්ෂාකාමී වූ යම් මහණ කෙනෙක් ඇද් ද ඔහු ''කෙසේ නම් ඇදුරෝ අතැවැසියන් කෙරෙහි මනාව නො පවත්නාහු දැ''යි පහත් කොට සලකත්, නිගා කෙරෙත්, දෙස් පතුරුවත්. එ කල්හි එ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

එ විට භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මෙ කරුණෙහි බික්සඟන රැස් කරවා භික්ෂූන් බණවා ''මහණෙනි, සැබෑ ද, ඇදුරෝ අතැවැසියන් කෙරෙහි මනා ව නො පවතිත් දැ''යි අසා වදළසේක. ''සැබැව වහන්සැ''යි එ මහණහු කීහ... වෙසෙසින් ගරහා දැහැමි කථා කොට, ''මහණෙනි, එසේ වී නම්, අතැ-වැස්සන් කෙරෙහි ඇදුරන් විසින් යම්සේ පැවතියයුතු ද, එසේ අතැවැස්සන් කෙරෙහි ඇදුරන්ගේ වත පනවන්නෙමි''යි (අමතා) මෙසේ වදළසේක:

''මහණෙනි, ඇදුරා විසින් ඇතැවැසියා කෙරෙහි මනා වැ පැවතියයුතු. එහි ලා මේ මනා පැවැත්ම යි.

මහණෙනි, ඇදුරා විසින් උදෙසීමෙන්, පරිපුච්ඡායෙන් (යළි යළි විචාරීමෙන්), අවවාදයෙන්, අනුශාසනායෙන් සංග්‍රහ කළයුතු අනුග්‍රහ කළයුතු. ඉදින් ඇදුරුහට පාත්‍රයෙක් වේ ද, අතැවැසියාට පාත්‍රයෙක් නො වේ ද, ඇදුරා විසින් අතැවැස්සාට පාත්‍රය දියයුතු. 'කෙසේ නම් අතැවැසියාට පාත්‍රයෙක් උපදනේ දැ'යි උත්සුක බව හෝ කළයුතු.

ඉදින් ඇදුරුහට සිවුරෙක් වේ ද, අතැවැසියාට සිවුරෙක් නො වේ ද, ඇදුරා විසින් අතැවැස්සාට සිවුර දියයුතු. 'කෙසේ නම් අතැවැසියාට සිවුරෙක් උපදනේ දෝ'යි උත්සුක බව හෝ කළයුතු.

ඉදින් ඇදුරුහට පිරිකරෙක් වේ ද, අතැවැසිහට පිරිකරෙක් නො වේ ද, 'කෙසේ නම් අතැවැසිහට පිරිකරෙක් උපදනේ දැ'යි උත්සුක බව හෝ කළයුතු.

32. සචෙ අන්තෙවාසිකො ගිලානො හොති කාලස්සෙව උට්ඨාය දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුපීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිසංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං. අන්තෙවාසිකම්හි උට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො.

සචෙ අන්තෙවාසිකො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. 'එත්තාවතා නිවත්තිස්සතී'ති ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං. නිවාසනං පටිග්ගහෙතබ්බං.

සචෙ චීවරං සින්නං හොති මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාරෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං මා මජ්ඣෙ භඞ්ගො අහොසීති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

33. සචෙ පිණ්ඩපාතො හොති අන්තෙවාසිකො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. අන්තෙවාසිකො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිසංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං. අන්තෙවාසිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං.

සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ අන්තෙවාසිකො නහායිතුකාමො හොති නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති උණ්හං පටියාදෙතබ්බං. සචෙ අන්තෙවාසිකො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං.

32. ඉදින් අතැවැසි තෙම ගිලන් වේ ද, ඇදුරහු විසින් කලින් ම නැඟී සිට දැහැටි දියයුතු. මුව දෝනා දිය දියයුතු. අස්නක් පැනවියැ යුතු. හුළුකැන් වේ නම්, බඳුනක් දෙවැ හුළුකැන් එළවියැයුතු. හුළුකැන් පූවාහට දිය පිළිගන්වා බඳුන පිළිගෙන, පහත් කොට කිසිවෙක නො ගාමින් දෙවැ සුරැකි කොට තැබියැයුතු. අතැවැස්සා නැඟී සිටි කල්හි අස්න ඉදිරියැයුතු. ඉදින් එ තැන කුණුරොඩු සහිත වේ නම්, එය හැමැන්දයුතු.

ඉදින් අතැවැසි තෙම ගම් වදිනු කැමැත්තේ වී නම්, හඳනා සිවුර දියයුතු. පිළිහඳනය පිළිගතයුතු. කාබහන දියැයුතු. සහළ සිවුරු සඟුණ කොට දියයුතු. සෝද දිය සහිත පාත්‍රය දියයුතු. 'මෙ තෙකින් පෙරළා එන්නේ යැ'යි සලකා අස්නක් පැනවියැයුතු. පාදෝනා දිය, පාපුටුව, පාකටැලිය ඉදිරිපත් කොට තැබියැයුතු. පෙර ගමන් කොට පාසිවුරු පිළිගත යුතු. පිළිහඳනය දියැ යුතු. හඳනය පිළිගතයුතු.

ඉදින් සිවුර ඩහදියෙන් තෙත් වී නම් මොහොතක් අව්වේ වියැලිය යුතු. සිවුර අව්වේ තිබෙන්නට නො හැරියැ යුතු. සිවුර හැකිළිය යුතු. සිවුර හකුළන්නහු විසින් 'සිවුර මැද බිඳුමෙක් නො වේවා'යි සලකා සිවුරු කොන සතරඟුලක් උඩට ඇද නැමියැ යුතු. සිවුරු නැම්මෙහි කාබහන තැබියයුතු.

33. ඉදින් පිණ්ඩපාතය ඇත් නම්, අතැවැසියා ද වළඳනු කැමැත්තේ වේ නම්, පැන් පිළිගන්වා පිණ්ඩපාතය එළවියැයුතු. අතැවැසි තෙම පැනින් පිළිවිසියයුතු. වැළැඳූවහුට දිය පිළිගන්වා පාත්‍රය පිළිගෙන පහත් කොට කිසිවෙක නො ගටමින් මනා කොට සෝද දිය රැඟා කොට මොහොතක් අව්වේ වියැලියැ යුතු. පාත්‍රය අව්වේ තිබෙන්නට හැරැ නො යා යුතු. පා සිවුරු තැබිය යුතු. පාත්‍රය තබන්නහු විසින් එක් අතෙකින් පාත්‍රය ගෙන අනිත් අතින් ඇඳ යට හෝ පුටුව යට හෝ පිරිමැද පාත්‍රය තැබිය යුතු. කිසිවෙකින් නො අතුරන ලද බිමැ පාත්‍රය නො තැබිය යුතු. සිවුර තබන්නහු විසින් එක් අතෙකින් සිවුර ගෙන අනිත් අතින් සිවුරු වස හෝ සිවුරු රැහැන පිරිමැද සිවුර කෙළවර ඔබ්බෙහි ද සිවුරු නැම්ම මොබ්බෙහි ද කොට සිවුර තැබියයුතු. අතැවැසියා නැගිසිටි කල්හි අස්න ඉදිරියැයුතු. පාදෝනා දිය ද පාපුටුව ද පාකටැලිය ද සුරැකි කොට තැබියයුතු.

ඉදින් එ තැන කුණුරොඩු සහිත වී නම්, හැමැන්දයුතු. ඉදින් අතැවැසියා නානු කැමැති වේ නම්, නාන දිය පිළියෙල කැරැ දියැයුතු. ඉදින් සිසිල් දියෙන් ප්‍රයොජන වේ නම්, සිසිල් දිය පිළියෙල කැරැ දියැයුතු. ඉදින් උණු දියෙන් ප්‍රයෝජන වේ නම්, උණු දිය පිළියෙල කැරැ දියැයුතු. ඉදින් අතැවැස්සා ගිනිහල්ගෙට පිවිසෙනු කැමැති නම්, නාන සුණු තෙමා ගුලි කළයුතු. මැටි තෙමියැයුතු. ගිනිහල් පුටුව ගෙන ගොස් දී සිවුර පිළිගෙන එක් පසෙක තැබියයුතු. නාන සුණු දියැයුතු. මැටි දියැයුතු. හැක්කේ නම්, ගිනිහල්ගෙට පිවිසියැයුතු. ගිනිහල් ගෙට පිවිසෙන්නහු විසින් මැටියෙන් මුහුණ වකා ඉදිරියෙන් ද පිටුපසින් ද වසා ගිනිහල් ගෙට පිවිසියැයුතු.

න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා. ජන්තාඝරෙ අන්තෙවාසිකස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. උදකෙපි අන්තෙවාසිකස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා අන්තෙවාසිකස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. අන්තෙවාසිකො පානීයෙන පුච්ඡිතබ්බො. යස්මිං විහාරෙ අන්තෙවාසිකො විහරති සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ උස්සහති සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං —පෙ— සචෙ ආචමනකුම්භියා උදකං න හොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

34. සචෙ අන්තෙවාසිකස්ස අනභිරති උප්පන්නා හොති ආචරියෙන වූපකාසෙතබ්බො, වූපකාසාපෙතබ්බො. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ අන්තෙවාසිකස්ස කුක්කුච්චං උප්පන්නං හොති ආචරියෙන විනොදෙතබ්බං, විනොදාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ අන්තෙවාසිකස්ස දිට්ඨිගතං උප්පන්නං හොති ආචරියෙන විවෙචෙතබ්බං, විවෙචාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා.

සචෙ අන්තෙවාසිකො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො, ආචරියෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකස්ස පරිවාසං දදෙය්‍යා'ති. සචෙ අන්තෙවාසිකො මූලාය-පටිකස්සනාරහො හොති ආචරියෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකං මූලාය පටිකස්සෙය්‍යා'ති. සචෙ අන්තෙවාසිකො මානත්තාරහො හොති ආචරියෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකස්ස මානත්තං දදෙය්‍යා'ති. සචෙ අන්තෙවාසිකො අබ්භානාරහො හොති ආචරියෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකං අබ්භෙය්‍යා'ති.

සචෙ සඞ්ඝො අන්තෙවාසිකස්ස කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා ආචරියෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකස්ස කම්මං න කරෙය්‍ය ලහුකාය වා පරිණාමෙය්‍යා'ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා ආචරියෙන උස්සුක්කං කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකො සම්මා වත්තෙය්‍ය ලොමං පාතෙය්‍ය නෙත්ථාරං වත්තෙය්‍ය සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා'ති.

ස්ථවිර භික්ෂූන් මැදට වැද ගැටී නො හින්ද යුතු. නවක භික්ෂූහු අස්නෙන් නො පිළිබැහියැයුතු. ගිනිහල් ගෙහි අතැවැසියාට පිරියම් කළයුතු. ගිනිහල් ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල් පුටුව ගෙන ඉදිරියෙන් ද පිටුපසින් ද වසා ගෙන නික්මියැයුතු. දියෙහි ද අතැවැස්සාට පිරියම් කළයුතු. නෑවහු විසින් වඩා පළමු වෙන් ගොඩ නැග සිය ගතැ දිය පිසදමා හැඳ අතැවැසියාගේ ගතින් දිය පිසදැමියැයුතු. හඳනය දියයුතු. සඟළ සිවුර දියැ යුතු. ගිනිහල් පුටුව ගෙන වඩා පළමුවෙන් අවුත් අස්නක් පැනවියැ යුතු. පාදෝනා දිය පාපුටුව පාකටැලිය එළවා තැබිය යුතු. අතැවැසියා පැනින් විචාළයුතු. යම් වෙහෙරෙක අතැවැස්සා වසන්නේ නම්, ඉදින් ඒ වෙහෙර කුණුරොඩු සහිත වී නම්, ඉදින් හැක්කේ නම්, ශුද්ධ කළයුතු. විහාරය ශුද්ධ කරන්නහු විසින් පළමු කොට පාසිවුරු බැහැර කොට පසෙක තැබියැයුතු... ඉදින් ආචමනකුම්භියෙහි[1] ජලය නො වේ නම්, එහි දිය වත්කළයුතු.

34. ඉදින් අතැවැසියාට පැවිද්දෙහි නො ඇල්මෙක් උපන්නේ වී නම්, ඇදුරා විසින් සන්හිඳුවියැයුතු. සන්හිඳුවාලියැයුතු. ඔහුට ධම්කථා හෝ කළයුතු. ඉදින් අතැවැසියාට කුකුසෙක් උපන්නේ වී නම්, ඇදුරහු විසින් දුරු කළයුතු. දුරුකැරැවියයුතු හෝ වෙයි, ඔහුට ධම්කථා හෝ කළයුතු වෙයි. ඉදින් අතැවැස්සාට මිසදිටෙක් උපන්නේ නම්, ඇදුරා විසින් විවෙචනය කළයුතු, විවෙචනය කැරැවියයුතු හෝ වෙයි, ඔහුට බණ කියැයුතු හෝ වෙයි.

ඉදින් අතැවැසියා ගරු ඇවැතකට පැමිණියේ පිරිවෙසට සුදුසු වී නම්, 'කෙසේ නම් සංඝ තෙමේ අතැවැස්සාට පිරිවෙස් දෙන්නේ දැ'යි ඇදුරහු විසින් උත්සුක බව කළයුතු. ඉදින් අතැවැසි තෙම මූලායපටිකස්සනයට සුදුසු වේ නම්, 'කෙසේ නම සංඝ තෙමේ අතැවැසියාට මූලාය පටිකස්සනය කරන්නේ දැ'යි උත්සුක බව කළයුතු. ඉදින් අතැවැසි තෙම මානතට සුදුසු වේ නම්, 'කෙසේ සංඝ තෙමේ අතැවැස්සාට මානත දෙන්නේ දැ'යි ඇදුරහු විසින් උත්සුක බව කළයුතු. ඉදින් අතැවැසි තෙම අබ්භානයට සුදුසු වේ නම්, 'කෙසේ සංඝ තෙමේ අතැවැසියා අබ්භාන කරන්නේ දෝ'යි ඇදුරා විසින් උත්සුක බව කළයුතු.

ඉදින් සංඝ තෙමේ අතැවැස්සාට තජ්ජනීය කර්‍මය හෝ නියස්ස කර්‍මය හෝ පබ්බාජනීය කර්‍මය හෝ පටිසාරණීය කර්‍මය හෝ උක්ඛෙපනීය කර්‍මය හෝ කරනු කැමැති වේ නම්, 'සංඝ තෙමේ කෙසේ නම් අතැවැස්සාට කර්‍මය නො කරන්නේ ද, කර්මය ලුහු බවට හෝ පෙරළන්නේ දැ'යි ඇදුරා විසින් උත්සුක බව කළයුතු. සංඝයා විසින් ඔහුට තජ්ජනීය කර්‍මය හෝ නියස්ස කර්මය හෝ පබ්බාජනීය කර්මය හෝ පටිසාරණීය කර්මය හෝ උක්ඛෙපනීය කර්මය හෝ කරන ලදුයේ වී නම්, 'කෙසේ නම් අතැවැසි තෙමේ මනාව පවත්නේ ද, අවනත වන්නේ ද, කර්මනිස්තරණය පිණිස පවත්නේ ද, සංඝ තෙමේ ඒ කර්මය සන්හිඳුවන්නේ දැ'යි ඇදුරහු විසින් උත්සුක බව කළයුතු.

1. වැසිකිළියෙහි මල සෝද හරින ජලය වක්කර තබන බඳුන.

සචෙ අන්තෙවාසිකස්ස චීවරං ධොවිතබ්බං හොති ආචරියෙන ආචික්ඛිතබ්බං 'එවං ධොවෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං ධොවීයෙථා'ති. සචෙ අන්තෙවාසිකස්ස චීවරං කාතබ්බං හොති ආචරියෙන ආචික්ඛිතබ්බං 'එවං කරෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං කරීයෙථා'ති. සචෙ අන්තෙවාසිකස්ස රජනං පචිතබ්බං හොති. ආචරියෙන ආචික්ඛිතබ්බං 'එවං පචෙය්‍යාසී'ති, උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස රජනං පචීයෙථා'ති.

සචෙ අන්තෙවාසිකස්ස චීවරං රජිතබ්බං හොති ආචරියෙන ආචික්ඛිතබ්බං 'එවං රජෙය්‍යාසී'ති. උස්සුක්කං වා කාතබ්බං 'කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං රජීයෙථා'ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජිතබ්බං, න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං. සචෙ අන්තෙවාසිකො ගිලානො හොති යාවජීවං උපට්ඨාපෙතබ්බො, වුට්ඨානමස්ස ආගමෙතබ්බං.

ඉදං ඛො භික්ඛවෙ ආචරියානං අන්තෙවාසිකෙසු වත්තං යථා ආචරියෙහි අන්තෙවාසිකෙසු වත්තිතබ්බන්ති''.

## වත්තක්ඛන්ධකං අට්ඨමං.[1]

## ඉමම්හි ඛන්ධකෙ වත්ථුපඤ්චපණ්ණාස

තස්සුද්දානං:

1. ස උපාහනා ඡත්තා ච ඔගුණ්ඨිසීසං පානීයං
නාභිවාදෙ න පුච්ඡන්ති අහි උජ්ඣායන්ති පෙසලා

2. ඔමුඤ්චි ඡත්තං ඛන්ධෙ ච අතරඤ්ච පටික්කමං
පත්තචීවරං නික්ඛිපි පතිරූපඤ්ච පුච්ඡිතා

3. ආසිඤ්චෙය්‍ය ධොවිතෙන සුක්ඛනල්ලෙනුපාහනා
වුඩ්ඪො නවකො පුච්ඡෙය්‍ය අජ්ඣාවුත්ථං ච ගොචරා.

---

1. වත්තක්ඛන්ධකො අට්ඨමො - මජසං.

ඉදින් අතැවැසියා ගේ සිවුර සෝදිය යුතු වේ නම්, මෙසේ සෝදව යි ඇදුරා විසින් කියැ යුතු ය. 'කෙසේ නම් අතැවැස්සාගේ සිවුර සෝදනු ලබන්නේ දැ'යි උත්සුක බව හෝ කළයුතු. ඉදින් අතැවැස්සාට සිවුරක් කළ යුතු වේ නම්, 'මෙසේ කරව'යි ඇදුරා විසින් කියැයුතු. 'කෙසේ නම් අතැවැස්සාට සිවුරෙක් කරනු ලබන්නේ දැ'යි උත්සුක බව හෝ කළයුතු. ඉදින් අතැවැස්සාට රඳන් පිසියැයුතු වේ නම්, 'මෙසේ පිසව'යි ඇදුරා විසින් කියැ යුතු. 'කෙසේ නම් අතැවැසියාට රඳන් පිසනු ලබන්නේ දැ'යි උත්සුක බව හෝ කළයුතු.

ඉදින් අතැවැසියාගේ සිවුරු පඬු පෙවියැයුතු වේ නම්, 'මෙසේ පඬු පෙවියැයුතු යැ'යි ඇදුරහු විසින් කියැ යුතු. 'කෙසේ නම් අතැවැසියාගේ සිවුරු පඬු පොවනු ලබන්නේ දැ'යි උත්සුක බව හෝ කළයුතු. සිවුර පඬු පොවන්නහු විසින් මනා කොට පෙරළ පෙරළා පඬු පෙවියැයුතු. පඬු බින්දු නො සුන් කල්හි එය හැර දමා නො යායුතු. ඉදින් අතැවැස්සා ගිලන් වේ නම්, යවිදිවි උවටැන් කළයුතු. ඔහුගේ නැඟීසිටීම අපේක්‍ෂා කළයුතු.

මහණෙනි, මේ වනාහි යම්සේ ඇදුරන් විසින් අතැවැස්සන් කෙරෙහි පැවතියැයුතු ද, ඒ අතැවැසියන් කෙරෙහි ඇදුරන් පැවතියැයුතු වත'' යි.

## අටවැනි වත්තක්ඛන්ධකය

### මේ ඛන්ධකයෙහි වස්තූහු පස්පනසෙකි.

**එහි උද්දානය මෙසේ ය:**

1. වහන් සහිතය, කුඩ සහිතය, හිස වසා පෙරවීමය, හිසෙහි සිවුර යෙදීමය, පියයුතු දියෙන් පා දෙවීමය, (වෘද්ධ භික්ෂූන්) නො වැඳීමය, (සෙනසුන්) නො පිළිවිසීමය, සර්පයකු ඇඟට වැටීමය, ප්‍රියශීලී භික්ෂූන් දෙස්නැගීමය,

2. වහන් මුදලීම, කුඩය හැකිළීම, සිවුර කරෙහි තබාගැනීම, ඉක්මන් නො වීම, ආරාමික භික්ෂූන් රැස්වන තැන පාසිවුරු එකත්පසෙක තැබීම, සුදුසු අසුනකැ හිඳීම, දිය පිළිවිසීම,

3. දිය ඉසීම, (පා) සේදීම, වියලි කඩින් පිසීම, තෙත් කඩින් පිසීම, වහන් පිස්නා කඩ සේදීම, වෘද්ධයන් වැඳීම, නවකයන් ලවා වැන්දවීම, සෙනසුන- පාවිච්චිකළබව- අලුත්බව- ගොදුරු ගම.

4. සෙඛා වච්චා පානී පරි කත්තරං කත්තිකං තතො
කාලං මුහුත්තං උකලාපො භුම්මත්ථරණ නීහරෙ

5. පටිපාදෙ භිසිබිම්බො මඤ්චපීඨං ච මල්ලකං
අපස්සෙනුල්ලොක කණ්ණා ගෙරුකා කාළ අකතා

6. සඞ්කාරං ච භුම්මත්ථරං පටිපාදකං මඤ්චපීඨකං
භිසිබිම්බො නිසීදනං මල්ලකං අපස්සෙන ච.

7. පත්තචීවරං භූමි ච පාරන්තං ඔරතො භොගං
පුරත්ථිමා පච්ඡිමා ච උත්තරා අථ දක්ඛිණා

8. සීතුණ්හෙ ච දිවා රත්තිං පරිවෙණං ච කොට්ඨකො
උපට්ඨානග්ගිසාලා ච වත්තං වච්චකුටීසු ච.

9. පානිපරිභොජනිකා කුම්භි ආචමනෙසු ච
අනොපමෙන පඤ්ඤත්තං වත්තං ආගන්තුකෙහි මෙ.

10. නෙවාසනං න උදකං න පච්චු න ච පානියං
නාභිවාදෙ න පඤ්ඤපෙ උජ්ඣායන්ති ච පෙසලා.

11. වුඩ්ඪාසනං ච උදකං පච්චුග්ගන්ත්වා ච පානියං
උපාහනෙ එකමන්තං අභිවාදෙ ච පඤ්ඤපෙ.

12. වුත්ථං ගොචර සෙඛො ච ඨානං පානීය භොජනං
කත්තරං කත්තිකං කාලං නවකස්ස නිසින්නකෙ.

13. අභිවාදයෙ ආචික්ඛ යථා හෙට්ඨා තථා නයෙ
නිද්දිට්ඨං සත්ථවාහෙන වත්තං ආවාසිකෙහිමෙ.

14. ගමිකා දරු මත්ති ච විවරිත්වා න පුච්ඡිය
නස්සන්ති ච අගුත්තං ච උජ්ඣායන්ති ච පෙසලා.

15. පටිසාමෙත්වා ථකෙත්වා ආපුච්ඡිත්වා ච පක්කමෙ
භික්ඛු වා සාමණෙරො වා ආරාමිකො උපාසකො

4. සෙඛසම්මත කුල- වස්-පස්කිළි- පියයුතු- පරිභොගකළයුතු දිය- සැරයටිය- සඞ්ඝයාගේ කතිකාවත්- ගම් වැදියයුතු කාලය යන මේ දෑ පිළිවිසීම, කසළ සහිත විහාරය පිරිසුදුකිරීම, බුමුතුරුණු බැහැරකිරීම,

5. ඇඳ පාඅලු- බිසිබිම්බොහන- ඇඳපුටු- පඩික්කම- හේත්තුවන ලෑල්ල- යන දෑ බැහැර කොට තැබීම, වියන- කවුළු- ගුරු පිරියම් කළ බිත්ති කළුවන් කළ නො කළ බිත්ති පිසදැමීම,

6. කසළ ඉවත්කිරීම, බුමුතුරුණු ඇඳ පාඅලු- ඇඳපුටු- බිසි බිම්බොහන- නිසීදනය- පඩික්කම- හේත්තුවන ලෑල්ල යන දෑ වියලා සුදුසු පරිදි තැබීම,

7. පාසිවුරු තැබීම, භූමිය, සිවුරු කොන පිටපැත්තට හා නැමම ඇතුළුපැත්තට දැමීම, පෙර- පැසුළු- උතුරු- දකුණු දිගින් හමන වාතය,

8. සිහිල්- උණුසුම්වාතය, දිවා රෑ කවුළු වැසීම, (කිලුටුවූ) පිරිවෙන- කොටුව- උවටැන්හල- ගිනිහල- වස්කිළිය යන තැන් ඇමදීම,

9. පානීය- පරිභොජනීය- හා සෝදන ජලය එළවා තැබීම යන මේ කරුණු ආගන්තුක වතැයි බුදුන් විසින් පනවනලදී.

10. (නෙවාසික භික්ෂූන්) අසුන් නො පැනවීම, පා දෝනා දිය නො එළවීම, පෙරගමන් නො කිරීම, පැන් නො පිළිවිසීම, නො වැඳීම, අසුන් නො පැනවීම, ප්‍රියශීලී භික්ෂූන් දෙස් නැගීම,

11. වැඩිමහලු භික්ෂූන් දැක අසුන් පැනවීම, දිය එළවීම, පෙර ගමන, පැන්එළවීම, වහන් පසෙක තැබීම, වැඳීම, අසුන් පැනවීම,

12. විසූ නො විසූ විහාරයක් බව, ගොදුරුගම, සෙඛකුල, වස්-පස්තැන්, පැන්, පිරිබෝදිය, සැරයටිය, කතිකා (ගම්වදින) කාලය (කියයුතු බව) නවකයාහට හුන්නහු විසින් කියයුතු බව,

13. වැන්දවීම, පාසිවුරු තබන තැන් කීම (ආදිය) යට කී නයින් ගතයුතුය. සාර්ථවාහයන් (බුදුන්) වහන්සේ විසින් මෙ ආවාසික වත දක්වනලද්දේය.

14. ගමික භික්ෂූන් දෙර කවුළු හැරදමා නො පිළිවිස යෑම, දැවබඩු, මැටිබඩු සෙනසුන නැසීම, නො රක්නාලදබව, පෙසල මහණුන් දෙස් නැගීම,

15. ගමික මහණ විසින් දැවබඩු මැටිබඩු සකස්කොට තබා දෙර කවුළු වසා මහණකු හෝ හෙරණකු හෝ ආරාමිකයකු හෝ උවසුවකු හෝ වෙත පවරා යායුතු බව,

16. පාසාණකෙසු ච පුඤ්ජං පටිසාමෙ ඨපෙය්‍ය ච
උස්සහති උස්සුක්කං වා අනොවස්සෙ තථෙව ච.

17. සබ්බෙ ඔවස්සති ගාමං අජ්ඣොකාසෙ තථෙව ච
අප්පෙවඩ්ඪානි සෙසෙය්‍යුං වත්තං ගමිකභික්ඛුනා.

18. නානුමොදන්ති ථෙරෙන ඔහාය චතු පඤ්චහි
වච්චතො මුච්ඡිතො ආසි වත්තානුමොදනෙසු මෙ

19. ඡබ්බග්ගියා දුන්නිවත්ථා අථො පි ච දුපාරුතා
අනාකප්පා ච වොක්කම්ම ථෙරෙ අනුපඛජ්ජනෙ

20. නවෙ භික්ඛූ ච සඞ්ඝාටි උජ්ඣායන්ති ච පෙසලා
තිමණ්ඩලං නිවාසෙත්වා කාය සගුණ ගණ්ඨිකා

21. න වොක්කම්ම පටිච්ඡන්නං සුසංවුතොක්ඛිත්තචක්ඛුනා
උක්ඛිත්තොජ්ජග්ඝිකා සද්දෙ තයො චෙව පචාලනා.

22. ඛම්භොගුණ්ඨී උක්කුටිකා පටිච්ඡන්නං සුසංවුතො
ඔක්ඛිත්තචිත්තා උජ්ජග්ඝි අප්පසද්දා තයො චලා.

23. ඛම්භොගුණ්ඨී පල්ලත්ථි අනුපඛජ්ජනාසනෙ
ඔත්ථරිත්වාන උදකෙ නීචං කත්වා න සිඤ්චියා.

24. පටිසාමෙන්ත සඞ්ඝාටි ඔදනෙ ච පටිග්ගහෙ
සූපං උත්තරිභඞ්ගෙන සබ්බෙසං සමතිත්ති ච.

25. සක්කච්චං පත්තසඤ්ඤී ච සපදානඤ්ච සූපකං
න ථූපතො පටිච්ඡාදෙ විඤ්ඤත්තුජ්ඣානසඤ්ඤිනා

26. මහන්තං මණ්ඩල ද්වාරං සබ්බහත්ථො න බ්‍යාහරි
උක්ඛෙපො ඡෙදනා ගණ්ඩ ධූනං සිත්ථාවකාරකං

27. ජිව්හානිච්ඡාරකඤ්චෙව චපු සුරු සුරෙන ච
හත්ථපත්තොට්ඨනිල්ලෙහං සාමිසෙන පටිග්ගහෙ

16. ගල් මතුයෙහි රැස්කොට තැන්පත් ව තබා දෙරකවුළු වසා යායුතු බව, හැකි නම් ආරාමය නො තෙමෙන පරිදි සෙවෙනි කිරීම හෝ කරවීම, නො තෙමෙන තැනක තැන්පත් කරවීම,

17. සියලු අරම තෙමේ නම් ආරාමික බඩු ගමෙහි තැන්පත් කිරීම, නැතහොත් 'කොටසක් හෝ ඉතිරි වේව'යි සිතා එළිමහනෙහි තබා වසා යෑම ගමික මහණගේ වතයි.

18. අනුමොදනා නො කිරීම, ස්ථවිර භික්ෂුව විසින් අනුමොදනා කළයුතු බව, එකලා ව හැර යෑම, සතර පස් නමක් නතර වියයුතු බව, වස්බරින් පෙළීම, මුසපත්වීම යන මේ කරුණු අනුමෙවෙනි වඬෙහි ඇතුළති.

19. සවග මහණුන් නො සකස් ව හැඳ පෙරෙව නො සරුප් ලෙසින් බත්හලට යෑම ඊම, දෙවු මහණුන් නො තකා හිඳීම,

20. නවක මහණුන් වැළහීම, සඟළ සිවුර යටකොට හිඳීම, පෙසල මහණුන් දෙස් නැඟීම, තෙමඩුලු වසා හැඳ කාබහන් බැඳ සගුණකොට සඟළසිවුර පොරොවා ගැටවටු ගන්වා (යෑම.)

21. නො ඉක්මවා යෑම, සුපිළිසන්වීම, මනා සංවර බව, යට බලා හෙළනලද ඇස් ඇති බව, ඔසොවනලද සිවුරු නැති බව, මහසිනා නැතිබව, අල්පශබ්දබව කය අත් හිස නො සැලීම,

22. උකුලෙහි අත් තැබීම, හිසවසා පෙරවීම, විළුඹ එසවීම (යන මෙයින්) යුතුව ඇතුළුගම නො යායුතු බව, පටිච්ඡන්න සුසංවුත, ඔක්ඛිත්තචක්ඛු, උජ්ජග්ඝි, අප්පසද්ද, චලනත්‍රය,

23. ඛම්භකත, ඔගුණ්ඨිසිය, පල්ලත්ථික, අනුපඛජ්ජ, ආසනපටිබාහන, සඞ්ඝාටිඔත්ථරන, (යන මොහු ද) දිය පිළිගැනීම, පහත්කොට (පාත්‍රය) සේදීම, සේදූ දිය වැක්කිරීම,

24. අසළ සිවුනා මහණුන් හා සඟළසිවුර නො තෙමීම ද, බත් පිළිගැනීමෙහි සූපයට ඉඩ තැබීම, අවුළුපත් සියල්ලන්ට සම සේ බෙදීම ද,

25. සකස්බව, පත්තසඤ්ඤ ඇතිබව, සපදන, සමසූපක, මුදුනෙන් හනා නො ගැනීම, බතින් නො වැසීම, නො ඉල්වීම, ඊෂ්‍ර්‍යා-වෙන් නො බැලීම,

26. නාතිමහන්තය, පරිමණ්ඩලය, මුඛද්වාරය, සබ්බහත්ථය, ඛ්‍යාහ-රණය, පිණ්ඩුක්ඛෙපය, අවච්ඡෙදනය, අවගණ්ඩකාරකය, අත් සෙලවීමය, සිත්ථාවකාරකය,

27. දිව නෙරීම, චපුචපුකාරකය, සුරුසුරුකාරකය, අත- පාත්‍රය- තොල්- ලෙවීමය, සාමිසපටිග්ගහනය,

28. යාව න සබ්බෙ උදෙක නීචං කත්වාන සිඤ්චිය
පටිසාමන්තං සඞ්ඝාටි නීචං කත්වා ජමාය ච.

29. සසිත්ථකං නිවත්තෙන්ත සුපටිච්ඡන්නමුක්කුටි
ධම්මරාජෙන පඤ්ඤත්තං ඉදං භත්තග්ගවත්තනං

30. දුන්නිවත්ථා අනාකප්පා අසල්ලෙක්ඛිත්වා ච සහසා[1]
දූරෙ අච්ච චිරං ලහුං තථෙව පිණ්ඩචාරිකො.

31. පටිච්ඡන්නෙන ගච්ඡෙය්‍ය සුසංවුතොක්ඛිත්තචක්ඛුනා
උක්ඛිත්තොජ්ජග්ඝිකා සද්දෙ තයො චෙව පචාලනා

32. ඛම්භොගුණ්ඨි උක්කුටිකා සල්ලෙක්ඛිත්වා ච සහසා[1]
දූරෙ අච්ච චිරං ලහුං ආමසනං කටච්ඡුකා.

33. භාජනං වා ඨපෙති ච උච්චාරෙත්වා පණාමෙත්වා
පටිග්ගහෙ න උල්ලොකෙ සූපෙසු පි තථෙව තං

34. භික්ඛු සඞ්ඝාටියා ජාදෙ පටිච්ඡන්නොව ගච්ඡිය
සුසංවුතොක්ඛිත්තචක්ඛු උක්ඛිත්තොජ්ජග්ඝිකාය ච

35. අප්පසද්දො තයො චාලා ඛම්භොගුණ්ඨික උක්කුටි
පඨමාසනවක්කාරං පානීයං පරිභොජනිං
පච්ඡාකඩ්ඪිත්ති භුඤ්ජෙය්‍ය ඔපිලාපෙය්‍ය උද්ධරෙ.

36. පටිසාමෙය්‍ය සම්මජ්ජෙ රිත්තං තුච්ඡං උපට්ඨපෙ
හත්ථවිකාරෙ භින්දෙය්‍ය වත්තඤ්ච පිණ්ඩපාතිකෙ.

37. පාණීපරි අග්ග්‍යාරණී නක්ඛත්තං දිසා චොරා ච
සබ්බං නත්ථීති කොටෙත්වා පත්තංසෙ චීවරං තතො

38. ඉදනි අංසෙ ලග්ගෙත්වා තිමණ්ඩලං පරිමණ්ඩලං
යථා පිණ්ඩචාරිවත්තං නයො ආරඤ්ඤිකෙසු පි.

39. පත්තංසෙ චීවරං සීසෙ ආරොපෙත්වා ච පානියං
පරිභොජනිකා අග්ගි අරණී චාපි කත්තරී

40. නක්ඛත්තං සබ්බදෙසං වා දිසාසු කුසලො භවෙ
සත්ථුත්තමෙන පඤ්ඤත්තං වත්තං ආරඤ්ඤිකෙසුමෙ

41. අජ්ඣොකාසෙ ඔකිරිංසු උජ්ඣායන්ති ච පෙසලා
සචෙ විහාරො උක්ලාපො පඨමං පත්තචීවරං

42. භිසිබිම්බොහනං මඤ්චං පීඨඤ්ච ඛෙළමල්ලකං
අපස්සෙනාලොකකණ්ණහා ගෙරුකං කාළවාකතං

1. සාහසා – මජසං.
2. අග්ගිඅරණී – මජසං.

28. හැම දෙනා වැළඳූබව, දිය පිළිගැනීම, (පාත්‍රය) පහත් කොට සේදීම, සෙවනය, උදකපටිග්ගාහකය, සාමනාහභික්ඛුය, සහළය, පහත්කොට පොළොවෙහි (දැමීමය),

29. සයිත්ථකය, නිවත්තනය, සුපටිච්ඡන්නය, උක්කුටිකය, යන මේ හත්තාංග වත ධර්මරාජයන් වහන්සේ විසින් පනවනලදී,

30. දුන්නිවත්ථ, අනාකප්ප, නො සැලකීම, යුහුව පිවිසීම. අතිදූර, අච්චාසන්න, චිරං ලහුං සහ පිණ්ඩචාරික ද,

31. පටිච්ඡන්න, සුසංවුත, ඔක්ඛිත්තචක්ඛු, උක්ඛිත්තකාය, උජ්ජග්ඝික, සද්ද හා පචාලන තුන ද,

32. ඛම්භකත, ඔගුණ්ඨිත, උක්කුටික, සල්ලකෙඛතබ්බ, සහසා, දූර, අච්චාසන්න, චිරං, ලහුං, (යන) කරුණු ද, කටච්ඡු (හා)

33. භාජන පරාමසන, ඨපන, (සඞ්ඝාටි) උච්චාරනා, පණාමන, පටිග්ගහන, (මුඛං) න ඔලොකන යන මොහු සූපයෙහි ද එසේ ම වෙත්,

34. මහණ සහළසිවුරෙන් (පාත්‍රය) වසන්නේය. සුපටිච්ඡන්න, සුසංවුත, ඔක්ඛිත්තචක්ඛු, උක්ඛිත්තකාය, උජ්ජග්ඝිකා,

35. අප්පසද්ද, නෙවැදෑරුම් පචාලන, ඛම්භ, ඔගුණ්ඨික, උක්කුටික, යන මොහු ද, පඨම (පටික්කමන), ආසන, අවක්කාරපාති, පානීය, පරිභොජනීය, පච්ඡා ආකඞ්ඛන භුඤ්ජන, ඔපිලාපන, (ආසන) උද්ධරන,

36. පටිසාමන, සම්මජ්ජන, (හිස් භාජන) පසෙක තැබීම, අතින් සන්කිරීම, වචීභෙද නො කිරීම (යන මේ කරුණු) පිණ්ඩ-පාතිකවත යි.

37. පානීය, පරිභොජනීය (උදක), අග්ගි, අරණි, නක්ඛත්ත, දිසා, (මේ) සියල්ල නැතැයි සොරු තළා යෑම, පත්තංස, චීවර,

38. අංසලග්ගන, තිමණ්ඩල, පරිමණ්ඩල, (ආදිය) පිණ්ඩචාරික වතෙහි මෙන් ආරඤ්ඤකයන් කෙරෙහි ද වේ.

39. පත්තංස, සීසෙ චීවර ආරොපණ, පානීය පරිභොජනීය (උදක) අග්ගි, අරණි කත්තරදණ්ඩ,

40. සියලු හෝ එකදෙශ වූ හෝ නැකැත් පද ඉගෙනීම හා දිශාකුශලවීම ද ආරඤ්ඤක වතැයි බුදුන් වහන්සේ විසින් පනවනලද්දේය.

41. (ඡබ්බග්ගිය භික්ෂූහු) අභ්‍යවකාශයෙහි රජස් හෙළූහ. පෙසල මහණහු දෙස් නඟත්. ඉදින් විහාරය කසළ සහිත වේ නම් පළමුව පාසිවුරු ද,

42. (ඉක්බිති) භිසි, බිම්බොහන, ඇඳ, පුටු, බෙළමල්ල, අපස්සෙන එලක ද (එකත්පසෙක තැබීම,) ආලොකකණ්ණ, ගෙරුක, කාලවර්ණ කළ නො කළ (බිත්ති පිරිසුදු කිරීම.)

43. සඞ්කාර භික්ඛු සාමන්තා සෙනා විහාරපානීයං
පරිභොජන සාමන්තා පටිවාතෙ ච පඞ්ගණෙ.

44. අධොවාතෙ අපාරණං පටිපාදක මක්ඛකං
පීඨං භිසි නිසීදනං මල්ලකං අපසෙසන ච.

45. පත්ත චීවරං භූමි ච පාරන්තං ඔරභොගතො
පුරත්ථිමා ච පච්ඡිමා උත්තරා අථ දක්ඛිණා.

46. සීතුණ්හෙ ච දිවා රත්තිං පරිවෙනඤ්ච කොට්ඨකො
උපට්ඨානග්ගිසාලා ච වච්චකුටී ච පානීයං.

47. ආචමකුම්භී වුඩ්ඪෙ ච උද්දෙස පරිපුච්ඡනා සජ්ඣා
ධම්මො පදීපං විජ්ඣාපෙ න විවරෙ නාපි ථකෙ

48. යෙන වුඩ්ඪෙ පරිවත්ති කණ්ණෙනාපි න ඝට්ටයෙ
පඤ්ඤපෙසි මහාවීරො වත්තං සෙනාසනෙසු තං.

49. නිවාරියමානා ද්වාරං මුච්චිතුජ්ඣන්ති පෙසලා
ඡාරිකං ඡඩ්ඩයෙ ජන්තා පරිභණ්ඩං තථෙව ච

50. පරිවෙණං කොට්ඨකො සාලා චුණ්ණං මත්තික දොණිකා
මුඛං පුරතො න ථෙරෙ න නවෙ උස්සහති සචෙ

51. පුරතො උපරිමග්ගො චික්ඛල්ලං මත්ති පීඨකං
විජ්ඣාපෙත්වා පක්කමෙ වත්තං ජන්තාඝරෙසුමෙ

52. නාචමෙති යථාවුඩ්ඪං පටිපාටි ච සහසා
උබ්භුජ්ජ නිත්ථුනො කට්ඨං වච්චං පස්සාව ඛෙළකං

53. ඵරුසා කූප සහසා උබ්භුජ්ජි චපු සෙසෙන
බහි අන්තො ච උක්කාසෙ රජ්ජු අතරමානඤ්ච

54. සහසා උබ්භුජ්ජිත්වාන නිත්ථුනෙ කට්ඨවච්චකං.
පස්සාව ඛෙළ ඵරුසා කූපඤ්ච වච්චපාදුකෙ.

55. නාතිසහසා උබ්භුජ්ජි පාදුකාය චපුචපු
න සෙසයෙ පටිච්ඡාදෙ ඌහත පිඨරෙන ච.

56. වච්චකුටී පරිභණ්ඩං පරිවෙණඤ්ච කොට්ඨකො
ආචමනෙ ච උදකං වත්තං වච්චකුටීසුමෙ.

57. උපාහනා දන්තකට්ඨං මුඛොදකඤ්ච ආසනං
යාගු උදකං ධොවිත්වා උද්ධරුක්ලාප ගාම ච.

58. නිවාසනං කායබන්ධං[1]. සගුණං පත්තසොදකං
පච්ඡා තිමණ්ඩලො චෙව පරිමණ්ඩලබන්ධනං

59. සගුණං ධොවිත්වා පච්ඡා නාතිදූරෙ පටිග්ගහෙ
භණමානස්ස ආපත්ති පඨමං ගන්ත්වාන ආසනං.

1. නිවාසනා කායබන්ධනං – මජසං.

43. කසළ (බැහැර දැමීම) භික්ඛු - සෙනාසන - විහාර - පානීය-පරිභොජනීය (ජලය) අසළ ද, පටිවාත, පඬගණ (යන තැන්හි සෙනසුන් ගසා නොදැමීම ද,

44. අධොවාත, අත්ථරණ, පටිපාදක, මඤ්ච, පීඨ, භිසි, නිසීදන, (බෙළ) මල්ලක, අපස්සෙන ද,

45. පත්ත, චීවර, භූමි, පාරත්ත, ඔරභොග ද, පුරත්ථිම, පච්ඡිම, උත්තර, දක්ඛිණ වාත ද,

46. සීත, උණ්හ, දිවා, රත්ති, පරිවෙණ, කොට්ඨක, උපට්ඨාන-සාලා, අග්ගිසාලා, වච්චකුටි, පානීය ද,

47. ආචමනකුම්භි, වුඩ්ඪ, උද්දෙස, පරිපුච්ඡනා, සජ්ඣායනා, ධම්ම, පදීප, න විජ්ඣාපන, න විවරණ, න ථකන ද,

48. වැඩිමහලු කෙනකුන් (සක්මන් කරන තැනින්) ආපසු හැරීම, සිවුරු කොනින් හෝ නො ගැටීම ද සෙනසුන්වතැයි මහා වීරයන් වහන්සේ පැනවූසේක.

49. වළකනුලබන්නාහු දෙර (වසත්) භික්ෂූහු මූර්ජිත වෙත්. පෙසල මහණෝ දෙස්නගත්, ජාරිකා, ජන්තාඝර, පරිභණ්ඩ ද එසේම-

50. පරිවෙණ, කොට්ඨක, සාලා, චුණ්ණ, මත්තිකා, දෙණි, මුඛ, පුරතො, න ථෙරෙ, න නවෙ, සවෙ උස්සහති (යනු ද,)

51. පුරතො, උපරි, මග්ග, චික්ඛල්ල, මත්තිකා, පීඨ, (දීප) විජ්ඣාපන, පක්කමන යන මොහු ජන්තාඝරවතයි.

52. ආචමන, යථාබුඩ්ඪ, පටිපාටි, සහසා (පවෙසන) උබ්භුජ්ජ, නිද්ධූනන, දන්තකට්ඨ, වච්ච, පස්සාව, බෙල (යන මොහු ද,)

53. එරුසකට්ඨ, වච්චකූප, සහසා, උබ්භුජ්ජ, චපුචපුකාරක, උදක-සෙස ද, බහි - අන්තො උක්කාසන, රජ්ජු හා අතරමාන ද,

54. සහසා, උබ්භුජ්, නිද්ධූනන, (දන්ත) කට්ඨ, වච්ච, පස්සාව, බෙළ, එරුසකට්ඨ, වච්චකූප, වච්චපාදුකා,

55. නාතිසහසා, උබ්භුජ්, පාදුකා, චපුචපු, න උදකසෙස, පටිච්ඡාදන, ඌහන, පියර යන මෙයින් ද,

56. වච්චකුටි, පරිභණ්ඩ, පරිවෙණ, කොට්ඨක, ආචමන උදක යන මෙයින් ද වච්චකුටිවත වේ.

57. උපාහන, දන්තකට්ඨ, මුඛොදක, ආසන, යාගු, උදක, ධොවන, උද්ධරන, උක්ලාප, ගාම යනු ද,

58. නිවාසන, කායබන්ධන, සගුණ, සොදකපත්ත, පච්ඡා (සමණ) තිමණ්ඩල, පරිමණ්ඩල, කායබන්ධන,

59. සගුණ; ධොවන, පච්ඡා (සමණ) නාතිදූර, පටිග්ගහණ යන මොහු ද, භණමාන, ආපත්ති, පළමුව ගොස් අසුන් පැනවීම,

60. උදකං පීඨ කථලි පච්චුග්ගන්ත්වා නිවාසනං
ඔතාපෙ නිදහි භණ්ඩො ඔභොගෙ භුඤ්ජිතුන්තමෙ.

61. පානීයං උදකං නීචං මුහුත්තං න ච නිදහෙ
පත්තචීවර භූමි ච පාරන්තං ඔරභොගතො.

62. උද්ධරෙ පටිසාමෙ ච උක්ලාපො ච නහායිතුං
සීතං උණ්හං ජන්තාඝරං චුණ්ණං මත්තිකපිට්ඨිතො

63. පීඨඤ්ච චීවරං චුණ්ණං මත්තිකුස්සහති මුඛං
පුරතො ථෙරෙ නවෙ ච පරිකම්මඤ්ච නික්ඛමෙ.

64. පුරතො උදකෙ නහාතෙ නිවාසෙත්වා උපජ්ඣායං
නිවාසනඤ්ච සඞ්ඝාටි පීඨකං ආසනෙන ච.

65. පාදෙ පීඨං කථලිඤ්ච පානීයුද්දෙසපුච්ඡනා
උක්ලාපං සුසොධෙය්‍ය පඨමං පත්තචීවරං.

66. නිසීදනපච්චත්ථරණං භිසිබිම්බොහනානි ච
මඤ්චො පීඨං පටිපාදං මල්ලකං අපසෙසන ච.

67. භුම්ම සන්තාන ආලොක ගෙරුකා කාළ අකතා
භුම්මත්ථර පටිපාද මඤ්චො පීඨං බිම්බොහනං

68. නිසීදනත්ථරණං ඛෙළ අපසෙස පත්තචීවරං
පුරත්ථිමා පච්ඡිමා චෙව උත්තරා අථ දක්ඛිණා.

69. සීතුණ්හඤ්ච දිවා රත්තිං පරිවෙණඤ්ච කොට්ඨකො
උපට්ඨානග්ගිසාලා ච වච්ච පානීය භොජනි.

70. ආචමං අනභිරති කුක්කුච්චං දිට්ඨි ච ගරු
මූලමානත්ත අබ්භානං තජ්ජනීයං නියස්සකං

71. පබ්බජා පටිසාරණී උක්ඛෙපඤ්ච කතං යදි
ධොවෙ කාතබ්බං රජඤ්ච රජෙ සම්පරිවත්තකං.

72. පත්තඤ්ච චීවරං චාපි පරික්ඛාරඤ්ච ඡෙදනං
පරිකම්මං වෙය්‍යාවච්චං පච්ඡා පිණ්ඩං පවිසනං

73. න සුසානං දිසා චෙව යාවජීවං උපට්ඨහෙ
සද්ධිවිහාරිකෙනෙතං වත්තුපජ්ඣායකෙසුමෙ[1]

74. ඔවාද සාසනුද්දෙසා පුච්ඡා පත්තඤ්ච චීවරං
පරික්ඛාර ගිලානො ච න පච්ඡාසමණො භවෙ.

75. උපජ්ඣායෙසු යෙ වත්තා එවං ආචරියෙසුපි
සද්ධිවිහාරිකෙ වත්තා තථෙව අන්තෙවාසිකෙ.

1. වත්තුපජ්ඣායකෙහිමෙ - මජසං.

60. උදක, පීඨ, කඨලි, පච්චුග්ගමන, නිවාසන, ඔතාප, නිදහන භඞ්ග, ඔභොග, භුඤ්ජිතුකාම, උපනාමන,

61. පානීය, උදක, නීච, මුහුත්ත, න නිදහන, පත්ත, චීවර, භූමි, පාරත්ත, ඔරභොග ද,

62. උද්ධරන, උක්ලාප, නහායිතුකාම, සීත, උණ්හ, ජන්තාඝර, චුණ්ණ, මත්තිකා, පිට්ඨිතොගමන ද,

63. පීඨ, චීවර, චුණ්ණ, මත්තිකා, සචෙ උස්සහති, මුඛ, පුරතො, ථෙර, නවක, පරිකම්ම, නික්ඛමන ද,

64. පුරතො, උදක, නහාන, නිවාසන, උපජ්ඣාය, නිවාසන, සඞ්ඝාටි, පීඨක, ආසනයෙන් ද,

65. පාදොදක, පාදපීඨ, පාදකඨලික, පානීය, උද්දෙස, පුච්ඡනා උක්ලාප (විහාර) සොධන, පත්තචීවර ද,

66. නිසීදන, පච්චත්ථරණ, භිසි, බිම්බොහන, මඤ්ච. පීඨ, පටිපාද, මල්ලක, අපස්සෙන ද,

67. භූම්මි, සන්තාන, ආලොක, ගෙරුක, කාළවණ්ණකත හා අකත ද, භුම්මත්ථරණ, පටිපාද, මඤ්ච, පීඨ, බිම්බොහන ද,

68. නිසීදන, අත්ථරණ, ඛෙළමල්ල, අපස්සෙන, පත්තචීවර ද, පුරත්ථිම, පච්ඡිම, උත්තර දක්ඛිණ වාත ද,

69. සීත, උණ්හ, දිවා, රත්ති, පරිවෙණ, කොට්ඨක, උපට්ඨාන - අග්ගි සාලා ද, වච්ච, පානීය, පරිභොජනීය ද,

70. ආචමන, අනභිරති, කුක්කුච්ච, දිට්ඨි, ගරුධම්ම, මූලායපටිකස්සන, මානත්ත, අබ්භාන ද, තජ්ජනීය, නියස්ස,

71. පබ්බජා, පටිසාරණීය, උක්ඛෙපනීය කම් ද, චීවර ධොවන, සම්පරිවත්තක රජන ද,

72. පත්ත, චීවර, පරික්ඛාර, ඡෙදන, පරිකම්ම, වෙයාවච්ච, පච්ඡාසමණ, පිණ්ඩපාත, ගාමප්පවෙසන ද,

73. න සුසාන ගමන, න දිසාපක්කමන ද, යාවජීව උපට්ඨහන ද සද්ධිවිහාරික විසින් උපාධ්‍යායයන් කෙරෙහි පිළිපැදියයුතු වතයි.

74. ඔවාද, අනුසාසන, උද්දෙස, පරිපුච්ඡා, පත්ත, චීවර, පරික්ඛාර, ගිලාන, න පච්ඡාසමණ වීම ද,

75. උපාධ්‍යායයන් කෙරෙහි යම් වතක් කියනලද ද, ආචාය්‍ය්‍යයන් කෙරෙහි ද එසේ මැ යි. සද්ධිවිහාරික කෙරෙහි කියනලද්ද අන්තෙවාසික කෙරෙහි ද එසේ ම වේ.

76. ආගන්තුකෙසු යෙ වත්තා පුන ආවාසිකෙසු ච
ගමිකානුමොදනිකා භත්තග්ගෙ පිණ්ඩපාතිකෙ.

77. ආරඤ්ඤිකෙසු යං වත්තං යඤ්ච සෙනාසනෙසු පි
ජන්තාඝරෙ වච්චකුටී උපජ්ඣා සද්ධිවිහාරිකෙ.

78. ආචරියෙසු යං වත්තං තථෙව අන්තෙවාසිකෙ
එකූනවීසති වත්ථූ වුත්තා සොළසඛන්ධකෙ[1]

79. වත්තං අපරිපූරෙන්තො න සීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො චිත්තෙකග්ගං න වින්දති.

80. වික්ඛිත්තචිත්තො නෙකග්ගො සම්මා ධම්මං න පස්සති.
අපස්සමානො සද්ධම්මං දුක්ඛා න පරිමුච්චති.

81. යං වත්තං පරිපූරෙන්තො සීලම්පි පරිපූරති
විසුද්ධසීලො සප්පඤ්ඤො චිත්තෙකග්ගම්පි වින්දති.

82. අවික්ඛිත්තචිත්තො එකග්ගො සම්මා ධම්මං විපස්සති
සම්පස්සමානො සද්ධම්මං දුක්ඛා සො පරිමුච්චති.

83. තස්මා හි වත්තං පූරෙය්‍ය ජිනපුත්තො විචක්ඛණො
ඔවාදං බුද්ධසෙට්ඨස්ස තතො නිබ්බානමෙහිති.

1. චුද්දස ඛන්ධකෙ - මජසං.

76. ආගන්තුකයන් කෙරෙහි ද යළි ආවාසිකයන් කෙරෙහි ද යම් වතක් කියනලද ද ගමික, අනුමොදනික, භත්තග්ග, පිණ්ඩපාතික (යන වත් ද,)

77. ආරඤ්ඤිකයන් කෙරෙහි හා සෙනසුන පිළිබඳ යම් වතක් කියනලද ද ජන්තාඝර, වච්චකුටි, උපජ්ඣාය, සද්ධිවිහාරික,

78. ආචරිය, අන්තෙවාසික (යන විෂය පිළිබඳව) යම් වතක් කියනලද ද (මෙහි) එකුන්විසි වස්තුවෙකි. ඛන්ධකයෙහි වත් සොළසෙක් කියනලදහ.

79. වත් නො පුරන්නේ සිල් පිරීම නො කරයි. අපිරිසුදු සිල් ඇති නුනුවණින් යුත් තෙනැත්තේ සිතෙහි එකඟබව නො විඳියි.

80. එකඟ නො වූ විසුරුණු සිත් ඇත්තේ මොනොවට දහම් නො දකී. සදහම් නො දක්නේ දුකින් නො මිදෙයි.

81. යම්හෙයකින් වත් පුරන්නේ සීලයත් පුරා ද, පිරිසුදු සිල් ඇති මනා නුවණැත්තේ සිත් එකඟබව ද විඳියි.

82. නො විසුරුණු සිල් ඇත්තේ එකඟබව ඇත්තේ මොනොවට ධර්මය දකී. සදහම් දක්නා හෙතෙම දුකින් මිදෙයි.

83. එහෙයින් විචක්ෂණ වූ ජිනපුත්‍ර තෙම වත් පුරන්නේය. (මෙ) ශ්‍රෙෂ්ඨ බුදුන්ගේ අවවාදයයි. ඒ හේතුවෙන් නිවනට පැමිණෙන්නේය.

# 9. පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකං.

## පඨමභාණවාරං

### පාතිමොක්ඛුද්දෙසයාචන

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ භික්ඛුසඞ්ඝපරිවුතො නිසින්නො හොති.

අථ ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පඨමෙ යාමෙ උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "අභික්කන්තා භන්තෙ රත්ති නික්ඛන්තො පඨමො යාමො චිරනිසින්නො භික්ඛුසඞ්ඝො උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි.

දුතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "අභික්කන්තා භන්තෙ රත්ති නික්ඛන්තො මජ්ඣිමො යාමො චිරනිසින්නො භික්ඛු-සඞ්ඝො උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති". දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි.

තතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධස්තෙ අරුණෙ නන්දිමුඛියා රත්තියා උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො පච්ඡිමො යාමො, උද්ධස්තං අරුණං, නන්දිමුඛී රත්ති, චිරනිසින්නො භික්ඛුසඞ්ඝො. උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති".

"අපරිසුද්ධා ආනන්ද පරිසා"ති.

# 9. පාතිමොක්ඛට්ඨපන ඛන්ධකය.

## පළමු බණවර

### පාමොක් උදෙසුම් යැදුම

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර මිගාරමාතු පාසාද නම් වූ පූර්වාරාමයෙහි වැඩ වසන සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ඒ පොහෝ දිනයෙහි භික්සඟහ විසින් පිරිවරන ලදු ව වැඩහුන් සේක.

එකලැ ඇවත් අනඳ තෙරණුවෝ රෑ බොහෝ ඉක්මැ ගිය කලැ රෑ පළමු යම ඉක්මී කලැ හුනස්නෙන් නැඟී සිට උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ දිසාවට ඇඳිලිබැඳ වැද "වහන්ස, රැය බොහෝ ඉක්මැ ගියේ ය. පළමු යම ඉක්මියේ ය. භික්ෂුසංඝ තෙමේ වැඩ හුන් බොහෝ වේලා ඇත්තේ වේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට පාමොක් උදෙසන සේක්වා"යි කීහ. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිහඬව හුන් සේක.

දෙවෙනි වර ද ඇවත් අනඳ තෙරණුවෝ රෑ බොහෝ ඉක්මී කල්හි මැදුම් යම ඉක්මී කල්හි හුනස්නෙන් නැගී උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ දිසාවට ඇඳිලි බැඳ වැද භාග්‍යවතුන් වහන්සේට, "වහන්ස, රෑ බොහෝ ඉක්මැ ගියේ ය. මැදුම් යම ඉක්මියේ ය. භික්ෂුසංඝ තෙමේ වැඩහුන් බොහෝ වේලා ඇත්තේ වේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට පාමොක් උදෙසන සේක්වා"යි කීහ. දෙවනුව ද භාග්‍යවතුන් වහන්සේ නිහඬව හුන්සේක.

තෙවෙනි වර ද ඇවත් අනඳ තෙරණුවෝ රැය ඉක්මී කල්හි පැසිම් යම ගෙවී අරුණු නැංග කල්හි රැය (පහන්වීමට ආසන්න බැවින්) නන්දිමුඛී නම් වේලාවෙහි හුනස්නෙන් නැගී උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ දිසාවට ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට, "වහන්ස, රෑ බොහෝ ඉක්මිණ. පැසිම් යම ගෙවිණ, අරුණු නැඟිණ, රෑ නන්දිමුඛී නම් වේලාවය. බික්සඟ වැඩහුන් බොහෝ වේලා ඇත්තේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට පාමොක් උදෙසාවා"යි කීහ.

"අනඳයෙනි, පිරිස අපිරිසුදු යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

2. අථ ඛො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස එතදහොසි: "කං නු ඛො භගවා පුග්ගලං සන්ධාය එවමාහ: අපරිසුද්ධා ආනන්ද පරිසා"ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සබ්බාවන්තං භික්ඛුසඞ්ඝං චෙතසා චෙතො පරිච්ච මනසාකාසි. අද්දසා ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං දුස්සීලං පාපධම්මං අසුචිසංකස්සරසමාචාරං පටිච්ඡන්නකම්මන්තං අස්සමණං සමණපටිඤ්ඤං අබ්‍රහ්මචාරිං බ්‍රහ්මචාරිපටිඤ්ඤං අන්තොපූතිං අවස්සුතං කසම්බුජාතං මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නං.

දිස්වාන යෙන සො පුග්ගලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං පුග්ගලං එතදවොච: "උට්ඨෙහි ආවුසො, දිට්ඨොසි භගවතා. නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසො"ති. එවං වුත්තෙ සො පුග්ගලො තුණ්හී අහොසි.

දුතියම්පි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං එතදවොච: "උට්ඨෙහි ආවුසො, දිට්ඨොසි. භගවතා. නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසො"ති. දුතියම්පි ඛො සො පුග්ගලො තුණ්හී අහොසි.

තතියම්පි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං එතදවොච: "උට්ඨෙහි ආවුසො, දිට්ඨොසි භගවතා. නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසො"ති. තතියම්පි ඛො සො පුග්ගලො තුණ්හී අහොසි.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං බාහායං ගහෙත්වා බහිද්වාරකොට්ඨකා නික්ඛාමෙත්වා සූචිඝටිකං දත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "නික්ඛාමිතො සො භන්තෙ පුග්ගලො මයා. පරිසුද්ධා පරිසා. උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති".

"අච්ඡරියං මොග්ගල්ලාන, අබ්භුතං මොග්ගල්ලාන, යාව බාහාගහණාපි නාම සො මොඝපුරිසො ආගමෙස්සතී"ති.

## මහාසමුද්දෙ අට්ඨ අච්ඡරියා

3. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: අට්ඨිමෙ භික්ඛවෙ මහාසමුද්දෙ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති. කතමෙ අට්ඨ?

2. එවිට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවනට, "භාග්‍යවතුන් වහන්සේ කවර නම් පුද්ගලයකු සඳහා, අනඳය, පිරිස අපිරිසුදු යැ යි වදළ සේක් දෝ"යි මෙ සිත විය. එ කලැ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මුළු මහත් භික්ෂුසඝයා තමන් සිතින් ඔවුන් සිත් පිරිසිඳැ මෙනෙහි කළහ. ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවෝ සිල් නැති, ලාමක සබා ඇති, අපිරිසුදු වූ, සැකයෙන් සිහි කළ යුතු හැසුරුම් ඇති, වැසුණු ක්‍රියා ඇති, අශ්‍රමණ වැ ශ්‍රමණ ප්‍රතිඥාව කරන, බඹසැරිමියි පිළින කරන නමුත් බඹසරක් නැති, සිතතුළ කුණු ගැසුණු, කෙලෙසින් තෙත් වූ, හටගත් කෙලෙස් කසළ ඇති, භික්ෂුසඝයා මැද හුන් ඒ පුද්ගලයා දුටුසේක.

දැක ඒ පුද්ගලයා කරා එළඹියහ. එළැඹ ඔහු බණවා, "ආයුෂ්මත නැඟී සිටුව, භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දේ වෙහි. භික්ෂූන් හා එක් වැ විසීමෙක් තට නැතැ"යි වදළහ. මෙසේ කී කල්හි ඒ පුද්ගල් තෙම නිහඬ විය.

දෙවෙනි වර ද ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ඒ පුද්ගලයා බණවා, "ආයුෂ්මත, නැඟී සිටු, භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහි. භික්ෂූන් හා එක් වැ විසීමෙක් තට නැතැ"යි වදළහ. දෙවෙනි වර ද ඒ පුද්ගල් තෙම නිහඬ විය.

තෙවෙනි වර ද ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ඒ පුද්ගලයා බණවා, "ආයුෂ්මත නැඟී සිටු, භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහි. භික්ෂූන් හා එක් වැ විසීමෙක් තට නැතැ"යි වදළ සේක. තෙවෙනි වර ද ඒ පුද්ගලයා නිහඬ වැ හුන්නේ ය.

ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ඒ පුද්ගලයා අතින් අල්ලා ගෙන දොරටුයෙන් පිටතට නික්මවා සුචිඝටිකාව දී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියාහ. එළැඹ, භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මා විසින් ඒ පුද්ගලයා නික්මැවිණ. පිරිස පිරිසුදු ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට පාමොක් උදෙසන සේක්වා"යි වදළහ.

"මෞද්ගල්‍යායනයෙනි, ආශ්චර්ය්‍ය ය, මෞද්ගල්‍යායනයෙනි, අද්භූතය. ඒ හිස් පුරුෂ තෙමේ අත්ලා ගන්නා තෙක් ම බලාපොරොත්තු වූයේ වේ ද"යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

## මුහුදේ ආශ්චර්ය ධර්ම අට

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් බණවා මෙය වදළ සේක: "මහණෙනි, යමක් දැක දැක අසුරයෝ මුහුදෙහි ඇලෙත් ද මුහුදෙහි වූ ඒ ආශ්චර්ය ධර්ම අට දෙනෙකි. කවර අට දෙනෙක් ද යත්:

මහාසමුද්දො භික්ඛවෙ අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. යම්පි භික්ඛවෙ මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. අයං භික්ඛවෙ මහාසමුද්දෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

පුන ච පරං භික්ඛවෙ මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති. යම්පි භික්ඛවෙ මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති, අයං භික්ඛවෙ මහාසමුද්දෙ දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

පුන ච පරං භික්ඛවෙ මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති. යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පඤ්ඤෙව තීරං වාහෙති. ථලං වා උස්සාදෙති. යම්පි භික්ඛවෙ මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති. යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පඤ්ඤෙව තීරං වාහෙති. ථලං වා උස්සාදෙති. අයං භික්ඛවෙ මහාසමුද්දෙ තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො.

පුන ච පරං භික්ඛවෙ යා කාචි මහානදියො සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී තා මහාසමුද්දං පත්තා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. යම්පි භික්ඛවෙ යා කාචි මහානදියො ගඞ්ගා -පෙ- මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති අයං භික්ඛවෙ මහාසමුද්දෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො -පෙ-

පුන ච පරං භික්ඛවෙ යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. යම්පි භික්ඛවෙ යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. අයං භික්ඛවෙ මහාසමුද්දෙ පඤ්චමො අච්ඡරියො අබ්භුතො ධම්මො -පෙ-

පුන ච පරං භික්ඛවෙ මහාසමුද්දො එකරසො ලොණරසො. යම්පි භික්ඛවෙ මහාසමුද්දො එකරසො ලොණරසො. අයං භික්ඛවෙ මහාසමුද්දෙ ඡට්ඨො අච්ඡරියො අබ්භුතො ධම්මො -පෙ-

මහණෙනි, මහමුහුද පිළිවෙළින් මිටි වූයේ පිළිවෙළින් නැඹුරු වූයේ පිළිවෙළින් ඉදිරියට නැමුණේ දිගට ම බෑවුම් ඇත්තේ නො වේ. මහණෙනි, මහමුහුද පිළිවෙළින් මිටි වූයේ ය. පිළි-වෙළින් නැඹුරු වූයේ ය, පිළිවෙළින් ඉදිරියට නැමුණේ ය, දිගට ම බෑවුම් ඇත්තේ නො වේ ය යන යමෙක් ඇද්ද, මහණෙනි, යමක් දක දක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් මේ ඒ පළමු ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

තව ද අනෙකෙකි. මහණෙනි, මහමුහුද සිටි සබා ඇත්තේ ඉවුර ඉක්මැ නො යයි. මහණෙනි, මහමුහුද සිටි සබා ඇත්තේ ඉවුර ඉක්මැ නොයේ යන යමෙක් ඇද්ද, මෙය යමක් දක දක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් ඒ මහමුහුදු වූ දෙවෙනි ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

තව ද අනෙකෙකි. මහණෙනි, මහමුහුද මළකුණක් හා එක් වැ නො වෙසෙයි. මහමුහුදු යම් මළ කුණක් වේ ද එය වහා ම මුහුදු තෙරට පමුණුවයි, ගොඩට හෝ බායි. මහණෙනි, මහ මුහුද මළ කුණක් හා එක් ව නො වෙසෙයි, මහමුහුදු යම් මළ කුණෙක් වී නම් එය වහා ම මුහුදු තෙරට පමුණුවයි. ගොඩට බායි යන යමෙක් ඇද්ද, මහණෙනි, යමක් දක දක අසුරයෝ මහමුහුදු ඇලෙත් නම් මේ ඒ මහමුහුදු වූ තෙවෙනි ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

තව ද අනෙකෙකි. මහණෙනි, ගංගා යමුනා අචිරවතී සරයූ මහී යන මහා නදීහු වෙත් ද, ඔහු මුහුදට පැමිණියාහු පළමු නම් ගොත් හැරදමත්. මහමුහුද යැ යි ම ව්‍යවහාරයට යෙත්. මහණෙනි,...යම් මහානදී කෙනෙක්...මහමුහුද යැ යි ම ව්‍යවහාරයට යෙත් යන යමෙක් ඇද්ද, මහණෙනි, යමක්... මේ මහමුහුදු වූ සතර වන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

තව ද අනෙකෙකි. ලොවැ යම් ඇළ දෙළ නදී කෙනෙක් මුහුදට වදිත් ද, අහසින් යම් වැසි දහර කෙනෙකුත් වැටෙත් ද එයින් මුහුදේ අඩු බවෙක් හෝ වැඩි බවෙක් හෝ නො පැණෙයි. මහණෙනි, ලොවැ යම් ඇළ දෙළ නදී කෙනෙක් මුහුදට වදිත් නම්, අහසින් වැසිදහර කෙනෙකුන් වැටෙත් නම්, එයින් මුහුදේ අඩු බවෙක් හෝ වැඩි බවෙක් හෝ නො පැනේය යන යමෙක්වේ ද මහණෙනි, යමක්... මෙය මහමුහුදේ පස් වන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

තව ද අනෙකක් කියමි. මහණෙනි, මහමුහුද එක ම රසයක් ඇත්තේ ය, ලුණුරස ඇත්තේ ය. මහමුහුද එක ම රසයක් ඇත්තේ ය, ලුණු රස ඇත්තේය යන යමෙක් ඇද්ද මහණෙනි, යමක්... මෙය ද මහ මුහුදෙහි වූ සවන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

පුන ච පරං භික්ඛවෙ මහාසමුද්දො බහුරතනො අනෙකරතනො. තත්‍රිමානි රතනානි, සෙය්‍යථීදං: මුත්තා මණි වෙළුරියො සඞ්ඛො සිලා පවාළං රජතං ජාතරූපං ලොහිතංකො මසාරගල්ලං. යම්පි භික්ඛවෙ මහාසමුද්දො බහුරතනො අනෙකරතනො: තත්‍රිමානි රතනානි -පෙ- අයං භික්ඛවෙ මහාසමුද්දෙ සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො -පෙ-

පුන ච පරං භික්ඛවෙ මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමි තිමිඞ්ගලො තිමිරපිඞ්ගලො අසුරා නාගා ගන්ධබ්බා. සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා ද්වියොජනසතිකාපි අත්තභාවා තියොජනසතිකාපි අත්තභාවා චතුයොජනසතිකාපි අත්තභාවා පඤ්චයොජනසතිකාපි අත්තභාවා. යම්පි භික්ඛවෙ මහාසමුද්දො මහතං භූතානං ආවාසො, තත්‍රිමෙ භූතා: තිමි -පෙ- සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා -පෙ- පඤ්චයොජනසතිකාපි අත්තභාවා-අයං භික්ඛවෙ මහාසමුද්දෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති. ඉමෙ ඛො භික්ඛවෙ මහාසමුද්දෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

4. එවමෙව ඛො භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති. කතමෙ අට්ඨ?

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. එවමෙව ඛො භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා න ආයතකෙනෙව අඤ්ඤාපටිවෙධො. යම්පි භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනු-පුබ්බපටිපදා න ආයතකෙනෙව අඤ්ඤාපටිවෙධො. අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති, එවමෙව ඛො භික්ඛවෙ යං මයා මම සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති. යම්පි භික්ඛවෙ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති. අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො -පෙ-.

තව ද අනෙකක් කියමි. මහණෙනි, මහමුහුද බොහෝ රුවන් ඇත්තේ ය, නොයෙක් වැදැරුම් රුවන් ඇත්තේ ය. එහි මුතු ය, මැණික් ය, වෙරළුමිණි ය, සක් ය, ශිලා යැ, පබුළු යැ, රිදී යැ, රන් යැ, රත්මිණි යැ, මැසිරිගල් ය යන මේ රත්නයෝ වෙත්. මහණෙනි, මහමුහුද බොහෝ රුවන් ඇත්තේ ය, නොයෙක් රුවන් ඇත්තේ ය එහි ... මේ රුවන් ඇත්තේ ය යන මෙය මහමුහුදෙහි සත්වන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

තව ද අනෙකක් කියමි. මහණෙනි, මහමුහුද මහාභූතයනට වාසස්ථාන යැ. එහි තිමි යැ, තිමිංගල යැ, තිමිරපිංගල යැ, අසුර යැ, නාග යැ, ගන්ධර්ව යැ යන මේ සත්ත්වයෝ වෙත්. මහ මුහුදෙහි යොදුන් සියයක් වූ ආත්මභාවයෝ ද යොදුන් දෙසියයක් වූ ආත්මභාවයෝ ද යොදුන් තුන්සියයක් වූ ආත්මභාවයෝ ද යොදුන් පන්සියයක් වූ ආත්මභාවයෝ ද වෙත්. මහාසමුද්‍රය මහත් සත්ත්වයනට වාසස්ථාන වේ ද, එහි තිමි ය...මේ භූතයෝ වෙත්, මහාසමුද්‍රයේ යොදුන් සියයක් වූ ආත්මභාවයෝ වෙත් ද...යොදුන් පන්සියයක් වූ ආත්මභාවයෝ වෙත් ද, මහණෙනි, යමක් දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම්, මේ ඒ අටවන ආශ්චර්ය අද්භූත ධර්මය යැ. යමක් දැක දැක අසුරයෝ මහමුහුදෙහි ඇලෙත් නම් මේ ඒ ආශ්චර්ය අද්භූත ධර්ම අට යැ.

4. මහණෙනි, එසේ ම යමක් දැක දැක භික්ෂුහු මේ ධර්ම විනයෙහි (මෙසස්නෙහි) ඇලෙත් ද, එසේ වූ මේ ආශ්චර්ය අද්භූත ධර්මයෝ අට දෙනෙක් වෙත්. කවර අට දෙනෙක් ද යත්:

මහණෙනි, යම්සේ මහ මුහුද පිළිවෙළින් නැඹුරු වූයේ පිළිවෙළින් මිටි වූයේ පිළිවෙළින් ඉදිරියට නැමුණේ දිගට ම බෑවුම් නැත්තේ වේ ද, මහණෙනි, එසේ ම මෙ සස්සෙහි අනුපූර්ව හික්මීම, අනුපූර්ව ක්‍රියා පද්ධතිය, අනුපූර්ව පිළිවෙත වෙයි, කෙළින් ම එකැවර රහත්බව පිළිවිදීමෙක් නො වේ. මහණෙනි, මේ සස්නෙහි අනුපූර්ව හික්මීම ය, අනුපූර්ව ක්‍රියා පද්ධතිය, අනුපූර්වප්‍රතිපත්තිය, කෙළින් ම එකැවර රහත්බව් නො පිළිවිදුනාබව යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය භික්ෂූන් දැක දැක මෙහි ඇලෙන මෙ සස්නෙහි පළමු වන ආශ්චර්ය අද්භූත ධර්මය යි.

මහණෙනි, යම්සේ මුහුද ස්ථිතධර්ම වූයේ ඉවුර නො ඉක්මවා ද, එසේ ම මා විසින් මාගේ සව්වනට යම් සිකපදයෙක් පනවන ලද ද මා සව්වෝ දිවි යතත් ඒවා නො ඉක්මෙත්, මහණෙනි, මා සව්වෝ මා පැනැ වූ සික පද දිවියතත් නො ඉක්මෙත් යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය ...මෙ සස්නෙහි ආශ්චර්ය අද්භූත දෙවෙනි දහම ය.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති, යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පඤ්ඤෙව තීරං වාහෙති, ථලං වා උස්සාදෙති. එවමෙව ඛො භික්ඛවෙ යො සො පුග්ගලො දුස්සීලො පාපධම්මො අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො, න තෙන සඞ්ඝො සංවසති ඛිප්පඤ්ඤෙව තං සන්නිපතිත්වා උක්ඛිපති. කිඤ්චාපි සො හොති මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නො. අථ ඛො සො ආරකාව සඞ්ඝම්හා, සඞ්ඝො ච තෙන. යම්පි භික්ඛවෙ යො සො පුග්ගලො දුස්සීලො පාපධම්මො -පෙ- න තෙන සඞ්ඝො සංවසති ඛිප්පඤ්ඤෙව නං සන්නිපතිත්වා උක්ඛිපති, කිඤ්චාපි සො හොති මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නො, අථ ඛො සො ආරකාව සඞ්ඝම්හා, සඞ්ඝො ච තෙන. අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො යං -පෙ-

සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, තා මහාසමුද්දං පත්තා ජහන්ති පුරිමානි නාමගොත්තානි මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. එවමෙව ඛො භික්ඛවෙ චත්තාරොමෙ වණ්ණා ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා, තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතා ජහන්ති පුරිමානි නාමගොත්තානි, සමණා සක්‍යපුත්තියාත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. යම්පි භික්ඛවෙ චත්තාරොමෙ වණ්ණා ඛත්තියා -පෙ- සමණා සක්‍යපුත්තියාත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො යං -පෙ-.

සෙය්‍යථාපි භික්ඛවෙ යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති, යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති, එවමෙව ඛො භික්ඛවෙ බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති, න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. යම්පි භික්ඛවෙ බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ පඤ්චමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං -පෙ-

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො එකරසො ලොණරසො, එවමෙව ඛො භික්ඛවෙ අයං ධම්මවිනයො එකරසො විමුත්තිරසො. යම්පි භික්ඛවෙ අයං ධම්මවිනයො එකරසො විමුත්තිරසො. අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ ඡට්ඨො අච්ඡරියො අබ්භුතො ධම්මො යං -පෙ-.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො බහුරතනො අනෙකරතනො, තත්‍රිමානි රතනානි, සෙය්‍යථීදං: මුත්තා මණි වෙළුරියො සඞ්ඛො සිලා පවාළං රජතං ජාතරූපං ලොහිතඞ්කො මසාරගල්ලං, එවමෙව ඛො භික්ඛවෙ අයං ධම්මවිනයො බහුරතනො අනෙකරතනො තත්‍රිමානි රතනානි, සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. යම්පි භික්ඛවෙ අයං ධම්මවිනයො බහුරතනො අනෙකරතනො තත්‍රිමානි රතනානි සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා චත්තාරො -පෙ- අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං -පෙ-.

මහණෙනි, මහමුහුද යම්සේ මළකුණු හා එක්ව නො වෙසේ ද, මහමුහුදෙහි යම් මළකුණෙක් වේ නම්, එය වහා තීරයට පමුණු-වා ද, ගොඩට ඔසොවා දමා ද, මහණෙනි, එසේ ම පාප ස්වභාව ඇති, අපිරිසිදු වූ සැකයෙන් සිහි කටයුතු හැසුරුම් ඇති, සැඟැ-වුණු ක්‍රියා ඇති මහණෙමි යි පිළින කරන නො මහණෙක් වූ, ඇතුළත කුණු වූ, කෙලෙසුන්ගෙන් තෙත් වූ හටගත් කෙලෙස් කසළ ඇති, යම් දුසිලෙක් වේ ද, සඞ්ඝයා ඔහු හා එක් ව නො වසයි. ඔහු සඟමැද උන්නත් සඞ්ඝයා රැස් ව වහා ම ඔහු ඔසොවාදමයි. වැලිදු හේ සඞ්ඝයාගෙන් ඈත්හි ම වේ. සඞ්ඝයා ද ඔහු ගෙන් ඈත්හි වේ... මහණෙනි, මේ ...මෙ සස්නෙහි තුන් වන ආශ්චර්ය අද්භූත ධර්මය වේ.

මහණෙනි, යම්සේ ගංගා යමුනා අචිරවතී සරයූ මහී යන යම් මහානදී කෙනෙක් ඇද්ද, ඔහු මහමුහුදට පැමිණියාහු පළමු නම්ගොත් හරිත් ද මහමුහුද යැ යි ම සංඛ්‍යාවට (ව්‍යව-හාරයට) පැමිණෙත් ද, මහණෙනි, එසේ ම මේ ක්‍ෂත්‍රිය බ්‍රාහමණ වෛශ්‍ය ශුද්‍ර යැ යි සතර වර්ණ කෙනෙක් වෙත් ද, ඔහු තථා-ගතයන් විසින් දූන පවසන ලද ශාසනයෙහි පැවිදිවූවාහු පළමු නම්ගොත් හරිත්, ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ යැ යි ම සංඛ්‍යාවට පැමිණෙත්. මහණෙනි, මෙය...මේ සස්නෙහි සතර වන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

මහණෙනි, යම්සේ යම් ජලධාරා කෙනෙක් මහමුහුදට වදිත් ද, අහසින් යම් වැසිදහර කෙනෙක් වැටෙත් ද, එයින් මහමුහුදේ අඩු බවෙක් හෝ පිරුණු බවෙක් හෝ නො පැනේ ද, මහණෙනි, එසේ ම බොහෝ භික්ෂූහු ද අනුපාදිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවෙත් ද, එයින් නිර්වාණධාතුවගේ ඌනා බවෙක් හෝ පිරුණු බවෙක් හෝ නො පැනේ. මහණෙනි, බොහෝ වූ ද භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවෙත් ද, එයින් නිර්වාණ ධාතුහුගේ ඌනත්වයෙක් හෝ පූර්ණත්වයෙක් නො පැනේ යන යමක් ඇද්ද, මෙය...මෙ සස්නෙහි පස් වන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

මහණෙනි, යම්සේ මහමුහුද ලුණුරස ඇත්තේ එක් මැ රසයක් ඇත්තේ වේ ද, එසේ ම මේ ශාසනය ද විමුක්ති රසය ඇත්තේ එක් ම රසයක් ඇත්තේ වෙයි. මහණෙනි, මෙය... මෙ සස්නෙහි සවන ආශ්චර්ය අද්භූත ධර්මය වේ.

මහණෙනි, යම්සේ මහමුහුද බොහෝ රත්න ඇත්තේ, අනේක රත්න ඇත්තේ ද, ...එහි මුතු මැණික් වෙරළුමිණි, සක් ගල්, පබළු, රිදී, රත්රන්, රතුකැට, මැසිරිගල් යන මේ රත්නයෝ වෙත්... එසේ ම මහණෙනි, මේ ශාසනය සතර සීවටන් යැ, සතර සම්‍යක් ප්‍රධන් යැ, සතර ඉදුපා යැ, පස් ඉඳුරෝ යැ, පස් බල යැ, සත් බොජ්ඣ යැ, අරි අටැඟි මඟ යැ යන මේ රත්නයෝ වෙත්. මහණෙනි, මේ ශාසනය බොහෝ රත්න ඇත්තේ නොයෙක් රත්න ඇත්තේ වේ යන යමෙක් ඇද්ද, මහණෙනි, මෙය මෙ සස්නැ සත්වන ආශ්චර්ය අද්භූත ධර්මය යැ.

සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමි තිමිඞ්ගලො තිමිරපිඞ්ගලො අසුරා නාගා ගන්ධබ්බා. සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා ද්වියොජනසතිකාපි අත්තභාවා තියොජනසතිකාපි අත්තභාවා චතුයොජනසතිකාපි අත්තභාවා පඤ්චයොජනසතිකාපි අත්තභාවා. එවමෙව ඛො භික්ඛවෙ අයං ධම්මවිනයො මහතං භූතානං ආවාසො තත්‍රිමෙ භූතා: සොතාපන්නො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො සකදාගාමී සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අනාගාමී අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො අරහා අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නො. යම්පි භික්ඛවෙ අයං ධම්මවිනයො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: සොතාපන්නො -පෙ- අයං භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති. ඉමෙ ඛො භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්තීති.

අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

'ඡන්නමතිවස්සති විවටං නාතිවස්සති
තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සතී'ති.

5. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: න දානාහං භික්ඛවෙ ඉතො පරං උපොසථං කරිස්සාමි පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තුම්හෙ'ව දානි භික්ඛවෙ ඉතො පරං උපොසථං කරෙය්‍යාථ පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථ. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං තථාගතො අපරිසුද්ධාය පරිසාය උපොසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍ය. න ච භික්ඛවෙ සාපත්තිකෙන පාතිමොක්ඛං සොතබ්බං. යො සුණෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ යො සාපත්තිකො පාතිමොක්ඛං සුණාති තස්ස පාතිමොක්ඛං ඨපෙතුං.

එවඤ්ච පන භික්ඛවෙ ඨපෙතබ්බං තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරිතබ්බං: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො පුග්ගලො සාපත්තිකො තස්ස පාතිමොක්ඛං ඨපෙමි. තස්මිං සම්මුඛීභූතෙ න පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති. ඨපිතං හොති පාතිමොක්ඛන්ති.

මහණෙනි, යම්සේ මහසයුර මහත් සතුනට වාසස්ථාන වේ ද, එහි තිමි ය තිමිංගලය, තිමිරපිංගල ය, අසුර ය, නාග ය, ගන්ධර්ව ය යන මේ සත්තු වෙත්. මහණෙනි, මහමුහුදේ යොදුන් සියක් වූ අත්බව්හු ද යොදුන් දෙසියයක් වූ අත්බව්හු ද යොදුන් තුන්සියක් වූ අත්-බව් ද යොදුන් සාරසියක් වූ අත්බව් ද යොදුන් පන්සියක් වූ අත්බව් ද ඇත්හ. එසේ ම මහණෙනි, මේ ශාසනය මහාභූතයනට වාසස්ථාන වේ. එහි සෝවන් ය, සෝවන්පල පසක් කරනුවට පිළිපන්නෝ ය, සෙදගැමි ය, සෙදගැමිපල පසක් කරනුවට පිළිපන්නෝ යැ, අනගැමි ය, අනගැමිපල පසක් කරනුවට පිළිපන්නෝ ය, රහත් ය, රහත්පල පසක් කරනුවට පිළිපන්නෝ ය යන මේ මහා සත්ත්වයෝ වෙත්. මහණෙනි, සස්න සෝවන් ... යන භූතයනට වාසස්ථාන වේ ද, මහණෙනි, මෙය යමක් දක දක භික්ෂූහු මෙ සස්නෙහි ඇලෙත් ද මේ ඒ අට වැනි ආශ්චර්ය අද්භුත ධර්මය යැ. මහණෙනි, මොහු වනාහි යම් දෑ දක දක භික්ෂූහු මෙ සස්නෙහි ඇලෙත් ද මේ මෙ සස්නෙහි වූ ඒ ආශ්චර්ය අද්භුත ධර්ම අට යැ.''

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණු නුවණින් සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක.

''මොනොවට වසාගන්නාලදුයේ ඉතා වසී (අවන් ඇවැත් සඟවනුයේ තව තවත් ඇවැත්නට පැමිණේ). වැසුම් හළේ ඉතා නො වසී (අවන් ඇවැත විවෘත කරනුයේ අන් ඇවැතකට නො පැමිණෙයි). එ හෙයින් වසන ලද ඇවැත විවෘත කරන්නේ ය (කළයුතු ය). මෙසේ එය ඉතා නො වසී යයි.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහණුන් බණවා, ''මහණෙනි, දන් මෙයින් මතු මම් පොහෝ නො කරන්නෙමි, පාමොක් නො උදෙසන්නෙමි. මහණෙනි, තෙපි ම මෙයින් මතු පොහෝ කරදු, පාමොක් උදෙසවු. මහණෙනි, තථාගත තෙම නො පිරිසිදු පිරිසෙහි පොහෝ කරන්නේ ය, පාමොක් උදෙසන්නේ ය යන යමෙක් ඇද්ද, මෙය නො කරුණෙකි, වන්නට ඉඩක් නැති එකෙකි. මහණෙනි, ඇවැත් සහිතයා විසින් පාමොක් නො ම ඇසියයුතු, යමෙක් අසන්නේ ද දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඇවැත් ඇති වැ යමෙක් පාමොක් අසන්නේ ද ඔහුට පාමොක් තබන්නට (නො දෙසා නවතන්නට) අනුදනිමි.

මහණෙනි, මෙසේ පාමොක් තැබියයුතු: තුදුස්වක් වූ හෝ පසළොස්වක් වූ එ පොහෝ දිනෙහි ඒ පුහුලා හමු වූ කල්හි සඟ මැදදී (මෙසේ) ඉදිරිපත් කළයුතු: ''සංඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් පුද්ගල තෙමේ ආපත්ති සහිත ය. ඔහුට පාමොක් තබමි. ඔහු හමු වූ කල්හි පාමොක් නො උදෙසියයුතු. මෙසේ පාමොක් තබන ලද්දේ වෙයි.

තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ 'නාම්හෙ කොචි ජානාතී'ති සාපත්තිකාව පාතිමොක්ඛං සුණන්ති, ථෙරා භික්ඛූ පරචිත්තවිදුනො භික්ඛූනං ආරොචෙන්ති: "ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ නාම්හෙ කොචි ජානාතීති සාපත්තිකාව පාතිමොක්ඛං සුණන්තී"ති. අස්සොසුං ඛො ඡබ්බග්ගියා භික්ඛූ 'ථෙරා කිර භික්ඛූ පරචිත්තවිදුනො අම්හෙ භික්ඛූනං ආරොචෙන්ති ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ නාම්හෙ කොචි ජානාතීති සාපත්තිකාව පාතිමොක්ඛං සුණන්තී'ති. තෙ 'පුරම්හාකං පෙසලා භික්ඛූ පාතිමොක්ඛං ඨපෙන්තී'ති පටිගච්චෙව සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ පාතිමොක්ඛං ඨපෙන්ති.

යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ පාතිමොක්ඛං ඨපෙස්සන්තී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං:

'සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ පාතිමොක්ඛං ඨපෙන්තී'ති. 'සච්චං භගවා'. -පෙ-

විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ පාතිමොක්ඛං ඨපෙතබ්බං. යො ඨපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස".

6. එකං භික්ඛවෙ අධම්මිකං පාතිමොක්ඛට්ඨපනං එකං ධම්මිකං.

ද්වෙ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි ද්වෙ ධම්මිකානි.

තීණි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි තීණි ධම්මිකානි.

චත්තාරි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි චත්තාරි ධම්මිකානි.

පඤ්ච අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි පඤ්ච ධම්මිකානි.

එසමයෙහි ඡනාහි සවැගි මහණෝ 'කිසිවකු අප නො දනිතැ'යි සාපත්තිකව ම පාමොක් අසත්. පරසිත් දන්නා ස්ථවිර භික්ෂූහු "ඇවැත්නි, මෙ නමැති මෙ නමැති සවැගි මහණහු 'කිසිවකු අප නො දනිති'යි සිතා සාපත්තික ව ම පාමොක් අසත් යැ"යි භික්ෂූනට සැලකෙරෙත්. පරසිත් දන්නා ස්ථවිර භික්ෂූහු "මෙ නමැත්තේ ද මෙ නමැත්තේ ද යන සවැගි මහණහු කිසිවකු අප නො දනිතැ යි සාපත්තික ව පාමොක් අසති"යි අප (ගැන) භික්ෂූනට කියත් යැ යි සවැගි මහණෝ ඇසූහ. 'ප්‍රියශීල භික්ෂූන් අපට පාමොක් තබන්නට (නවතන්නට) පෙර අපි ඔවුන්ගේ පාමොක් තබම්හ'යි කියා කල් තබා ම පිරිසුදු අනාපත්තික භික්ෂූනට අවස්තුයෙහි අකාරණයෙහි ඔහු පාමොක් තබත්.

යම් භික්ෂු කෙනෙක් අල්පෙච්ඡ ද සනතුෂ්ට ද ලජ්ජී ද කුකුස් කරන්නෝ ද ශික්ෂාකාමී ද ඔහු 'කෙසේ නම් සවැගි මහණහු අනාපත්තික පිරිසුදු මහණුනට අවස්තුයෙහි අකාරණයෙහි පාමොක් තබන්නාහු ද'යි ලාමක කොට සිතත්, නිඳා කෙරෙත්, දෙස් පතුරුවත්. එකල ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"මහණෙනි, සවැගි මහණෝ අනාපත්තික පිරිසුදු මහණුනට අවස්තුයෙහි අකාරණයෙහි පාමොක් තබත්ල. සැබෑ ද"යි භාග්‍යවතුන් වහන්සේ අසාවදළසේක.

"සැබැව භාග්‍යවතුන් වහන්සැ"යි ඔහු කීහ... භාග්‍යවතුන් වහන්සේ වෙසෙසින් ගරහා දැහැමි කතා කොට, භික්ෂූන් බණවා, "මහණෙනි, අනාපත්තික වූ ශුද්ධ භික්ෂූනට අවස්තුයෙහි අකාරණයෙහි පාමොක් නො තැබියැයුතු. යමෙක් තබන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

6. "මහණෙනි, නොදැහැමි පාමොක් තබනු එකෙක. දැහැමි පාමොක් තබනු එකෙක.

නොදැහැමි පාමොක් තබනු දෙකෙක, දැහැමි පාමොක් තබනු ද දෙකෙක.

නොදැහැමි පාමොක් තබනු තුනෙක, දැහැමි පාමොක් තබනු ද තුනෙක.

නොදැහැමි පාමොක් තබනු සතරෙක, දැහැමි පාමොක් තබනු ද සතරෙක.

නොදැහැමි පාමොක් තබනු පසෙක දැහැමි පාමොක් තබනු ද පසෙක.

ඡ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි ඡ ධම්මිකානි.

සත්ත අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි සත්ත ධම්මිකානි.

අට්ඨ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි අට්ඨ ධම්මිකානි.

නව අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි නව ධම්මිකානි.

දස අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි දස ධම්මිකානි.

7. කතමං එකං අධම්මිකං පාතිමොක්ඛට්ඨපනං: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. ඉදං එකං අධම්මිකං පාතිමොක්ඛට්ඨපනං. කතමං එකං ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං: සමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති, ඉදං එකං ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

කතමානි ද්වෙ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. අමූලිකාය ආචාරවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. ඉමානි ද්වෙ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි ද්වෙ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකාය සීල විපත්තියා පාතිමොක්ඛං ඨපෙති· සමූලිකාය ආචාරවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. ඉමානි ද්වෙ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

කතමානි තීණි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අමූලිකාය දිට්ඨිවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති, ඉමානි තීණි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි තීණි ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- සමූලිකාය දිට්ඨිවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. ඉමානි තීණි ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

කතමානි චත්තාරි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අමූලිකාය ආජීවවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. ඉමානි චත්තාරි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි චත්තාරි ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකාය සීලවිපත්තියා -පෙ- සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- සමූලිකාය ආජීවවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති. ඉමානි චත්තාරි ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

කතමානි පඤ්ච අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකෙන පාරාජිකෙන පාතිමොක්ඛං ඨපෙති, අමූලිකෙන සඞ්ඝාදිසෙසෙන -පෙ- අමූලිකෙන පාචිත්තියෙන -පෙ- අමූලිකෙන පාටිදෙසනීයෙන -පෙ- අමූලිකෙන දුක්කටෙන පාතිමොක්ඛං ඨපෙති. ඉමානි පඤ්ච අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි පඤ්ච ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකෙන පාරාජිකෙන -පෙ- සමූලිකෙන සඞ්ඝාදිසෙසෙන -පෙ- සමූලිකෙන පාචිත්තියෙන -පෙ- සමූලිකෙන පාටිදෙසනීයෙන -පෙ- සමූලිකෙන දුක්කටෙන පාතිමොක්ඛං ඨපෙති, ඉමානි පඤ්ච ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

නොදැහැමි පාමොක් තබනු සයෙක, දැහැමි පාමොක් තබනු ද සයෙක.

නොදැහැමි පාමොක් තබනු සතෙක, දැහැමි පාමොක් තබනු ද සතෙක.

නොදැහැමි පාමොක් තබනු අටෙක, දැහැමි පාමොක් තබනු ද අටෙක.

නොදැහැමි පාමොක් තබනු නවයෙක, දැහැමි පාමොක් තබනු ද නවයෙක.

නොදැහැමි පාමොක් තබනු දසයෙක, දැහැමි පාමොක් තබනු ද දසයෙක.

7. මහණෙනි, එක් නොදැහැමි පාමොක් තබනු කවර යැ: අමූලක ශීලවිපත්ති පාමොක් තබන්නේ නම් මේ එක් නොදැහැමි පාමොක් තබනු යැ. එක් දැහැමි පාමොක් තබනු කවර යැ: සමූලක සිල්විපත්ති පාමොක් තබන්නේ නම්, මේ එක් දැහැමි පාමොක් තබනු යැ.

නොදැහැමි පාමොක් තබනු දෙක කවර යැ: අමූලක ශීලවිපත්ති පාමොක් තබන්නේ ද, අමූලක ආචාර විපත්ති පාමොක් තබන්නේ ද, මේ නොදැහැමි පාමොක් තබනු දෙක යැ. දැහැමි පාමොක් තබනු දෙක කවර යැ: සමූලක ශීලවිපත්ති පමොක් තබන්නේ ද සමූලක ආචාර විපත්ති පාමොක් තබන්නේ ද, මේ දැහැමි පාමොක් තබනු දෙක යැ.

තුන් නොදැහැමි පාමොක් තබනු කවර යැ: අමූලක ශීල-විපත්ති... අමූලක ආචාර විපත්ති... අමූලක දෘෂ්ටිවිපත්ති පාමොක් තබන්නේ ද, මේ තුන් නොදැහැමි පාමොක් තබනු යැ. තුන් දැහැමි පාමොක් තබනු කවර යැ: සමූලක ශීලවිපත්ති.. සමූලක ආචාර විපත්ති... සමූලක දෘෂ්ටි විපත්ති පාමොක් තබන්නේ ද, මේ තුන් දැහැමි පාමොක් තබනු යැ.

සතර නොදැහැමි පාමොක් තබනු කවර යැ: අමූලක ශීල-විපත්ති... අමූලක ආචාර විපත්ති... අමූලක දෘෂ්ටි විපත්ති අමූලක ආජීව විපත්ති පාමොක් තබන්නේ ද, මේ සතර නොදැහැමි පාමොක් තබනු යැ. සතර දැහැමි පාමොක් තබනු කවර යැ: සමූලක සිල්විපත්ති... සමූලක ආචාර විපත්ති... සමූලක දෘෂ්ටි විපත්ති... සමූලක ආජීව විපත්ති පාමොක් තබන්නේ ද, මේ සතර දැහැමි පාමොක් තබනු යැ.

පස් නොදැහැමි පාමොක් තබනු කවර යැ: අමූලක පරිජි ඇවැතින් පාමොක් තබා ද, අමූලක සඟවෙසෙස් ඇවැතින්... අමූලක පචිති ඇවැතින්... අමූලක පාටිදෙසනීය ඇවැතින්... අමූලක දුකුලා ඇවැතින් පාමොක් තබන්නේ ද, මේ පස් නොදැහැමි පාමොක් තබනු යැ. පස් දැහැමි පාමොක් තබනු කවර යැ: සමූලක පරිජි ඇවැතින්... සමූලක සඟවෙසෙස් ඇවැතින්... සමූලක පචිති ඇවැතින්... සමූලක පාටිදෙසනීය ඇවැතින්.. සමූලක දුකුළා ඇවැතින් පාමොක් තබන්නේ ද මේ පස් දැහැමි පාමොක් තබනු යැ.

කතමානි ඡ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති අකතාය, අමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති කතාය, ඉමානි ඡ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි ඡ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති අකතාය, සමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අකතාය; සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අකතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති කතාය, ඉමානි ඡ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

කතමානි සත්ත අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකෙන පාරාජිකෙන පාතිමොක්ඛං ඨපෙති, අමූලිකෙන සඞ්ඝාදිසෙසෙන -පෙ- අමූලිකෙන ථුල්ලච්චයෙන -පෙ- අමූලිකෙන පාචිත්තියෙන -පෙ- අමූලිකෙන පාටිදෙසනීයෙන -පෙ- අමූලිකෙන දුක්කටෙන -පෙ- අමූලිකෙන දුබ්භාසිතෙන පාතිමොක්ඛං ඨපෙති, ඉමානි සත්ත අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි සත්ත ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකෙන පාරාජිකෙන පාතිමොක්ඛං ඨපෙති, සමූලිකෙන සඞ්ඝාදිසෙසෙන -පෙ- සමූලිකෙන ථුල්ලච්චයෙන -පෙ- සමූලිකෙන පාචිත්තියෙන -පෙ- සමූලිකෙන පාටිදෙසනීයෙන -පෙ- සමූලිකෙන දුක්කටෙන -පෙ- සමූලිකෙන දුබ්භාසිතෙන පාතිමොක්ඛං ඨපෙති. ඉමානි සත්ත ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

කතමානි අට්ඨ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති අකතාය, අමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය ආජීවවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය ආජීවවිපත්තියා -පෙ- කතාය. ඉමානි අට්ඨ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි අට්ඨ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති අකතාය, සමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අකතාය, සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අකතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය ආජීවවිපත්තියා -පෙ- අකතාය, සමූලිකාය ආජීවවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති කතාය, ඉමානි අට්ඨ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

නොදැහැමි පාමොක් තබනු සය කවර යැ: නො කරන ලද්දෙහි අමූලක සිල්විපත්තින්... කරන ලද්දෙහි අමූලක ශීල විපත්හි... නො කරන ලද්දෙහි අමූලක ආචාර විපත්හි... කරන ලද්දෙහි අමූලක ආචාර විපත්හි පාමොක් තබන්නේ ද මේ සය නොදැහැමි පාමොක් තබනු යැ. දැහැමි පාමොක් තබනු සය කවර යැ: නොකරන ලද්දෙහි සමූලක සිල්විපත්හි... කරන ලද්දෙහි සමූලක සිල් විපත්හි... නොකරන ලද්දෙහි සමූලක ආචාර විපත්හි... කරන ලද්දෙහි සමූලක ආචාර විපත්හි... නොකරන ලද්දෙහි සමූලක දෘෂ්ටි විපත්හි... කරන ලද්දෙහි සමූලක දෘෂ්ටි විපත්හි පාමොක් තබන්නේ ද, මේ සය දැහැමි පාමොක් තබනු යැ.

සත් නො දැහැමි පාමොක් තබනු කවර යැ: අමූලක පරිජි ඇවැතින්... අමූලක සඟවෙසෙස් ඇවැතින්... අමූලක තුලැසි ඇවැතින්... අමූලක පචිති ඇවැතින්... අමූලක පාටිදෙසනීය ඇවැතින්... අමූලක දුකුළා ඇවැතින්... අමූලක දුබැසි ඇවැතින් පාමොක් තබන්නේ ද, මේ සත් නොදැහැමි පාමොක් තබනු යැ. සත් දැහැමි පාමොක් තබනු කවර යැ: සමූලක පරිජි ඇවැතින්... සමූලක සඟවෙසෙස් ඇවැතින්... සමූලක තුලැසි ඇවැතින්... සමූලක පචිති ඇවැතින්... සමූලක පාටිදෙසනීය ඇවැතින්... සමූලක දුකුළා ඇවැතින්... සමූලක දුබැසි ඇවැතින් පාමොක් තබන්නේ ද, මේ සත් දැහැමි පාමොක් තබනු ය.

අට නො දැහැමි පාමොක් තබනු කවර යැ: නොකරන ලද්දෙහි අමූලක සිල් විපත්හි... කරන ලද්දෙහි අමූලක සිල් විපත්හි... නොකරන ලද්දෙහි අමූලක ආචාර විපත්හි... කරන ලද්දෙහි අමූලක ආචාර විපත්හි... නො කරන ලද්දෙහි අමූලක දෘෂ්ටි විපත්හි... කරන ලද්දෙහි අමූලක දෘෂ්ටි විපත්හි... නො කරන ලද්දෙහි අමූලක ආජීව විපත්හි... කරන ලද්දෙහි අමූලක ආජීව විපත්හි පාමොක් තබන්නේ ද, මේ අට නො දැහැමි පාමොක් තබනු යැ. අට දැහැමි පාමොක් තබනු කවර යැ: නොකරන ලද්දෙහි සමූලක සිල්විපත්හි... කරන ලද්දෙහි සමූලක සිල්විපත්හි... නොකරන ලද්දෙහි සමූලක ආචාර විපත්හි... කරන ලද්දෙහි සමූලක ආචාර විපත්හි... නොකරන ලද්දෙහි සමූලක දෘෂ්ටි විපත්හි... කරන ලද්දෙහි සමූලක දෘෂ්ටිවිපත්හි... නොකරන ලද්දෙහි සමූලක ආජීවවිපත්හි... කරන ලද්දෙහි සමූලක ආජීව විපත්හි පාමොක් තබන්නේ ද, මේ අට දැහැමි පාමොක් තබනු යැ.

කතමානි නව අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: අමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති අකතාය, අමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාකතාය, අමූලිකාය අචාරවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාය. අමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාකතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අකතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- කතාය, අමූලිකාය දිට්ඨිවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති කතාකතාය, ඉමානි නව අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි නව ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: සමූලිකාය සීලවිපත්තියා පාතිමොක්ඛං ඨපෙති අකතාය, සමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය සීලවිපත්තියා -පෙ- කතාකතාය, සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- අකතාය, සමූලිකාය ආචාරවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය අචාරවිපත්තියා -පෙ- කතාකතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- අකතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- කතාය, සමූලිකාය දිට්ඨිවිපත්තියා -පෙ- කතාකතාය. ඉමානි නව ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

කතමානි දස අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි: න පාරාජිකො තස්සං පරිසායං නිසින්නො හොති, න පාරාජිකකථා විප්පකතා හොති, න සික්ඛං පච්චක්ඛාතකො තස්සං පරිසායං නිසින්නො හොති, න සික්ඛං පච්චක්ඛාතකථා විප්පකතා හොති, ධම්මිකං සාමග්ගිං උපෙති, න ධම්මිකං සාමග්ගිං පච්චාදියති, න ධම්මිකාය සාමග්ගියා පච්චාදානකථා විප්පකතා හොති, න සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති, න ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති, න දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති ඉමානි දස අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. කතමානි දස ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි? පාරාජිකො තස්සං පරිසායං නිසින්නො හොති, පාරාජිකකථා විප්පකතා හොති, සික්ඛං පච්චක්ඛාතකො තස්සං පරිසායං නිසින්නො හොති; සික්ඛං පච්චක්ඛාතකථා විප්පකතා හොති, ධම්මිකං සාමග්ගිං න උපෙති, ධම්මිකං සාමග්ගිං පච්චාදියති, ධම්මිකාය සාමග්ගියා පච්චාදානකථා විප්පකතා හොති, සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති, ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති, දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති. ඉමානි දස ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

8. කථං පාරාජිකො තස්සං පරිසායං නිසින්නො හොති: ඉධ භික්ඛවෙ යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි පාරාජිකස්ස ධම්මස්ස අජ්ඣාපත්ති හොති, තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තං. නාහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තං. අපි ච අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති 'ඉත්ථන්නාමො ආවුසො භික්ඛු පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'ති.

නව නොදැහැමි පාමොක් තබනු කවර යැ? නොකරන ලද්දෙහි අමූලක සිල්විපත්හි පාමොක් තබන්නේ ද, කරන ලද අමූලික සිල් විපත්හි .. කරන ලද නොකරන ලද අමූලක සිල් විපත්හි... නොකරන ලද අමූලක ආචාර විපත්හි... කරන ලද අමූලක ආචාර විපත්හි... කරන ලද නො කරන ලද අමූලක ආචාර විපත්හි... නො කරන ලද අමූලක දෘෂ්ටි විපත්හි... කරන ලද අමූලක දෘෂ්ටි විපත්හි... කරන ලද නොකරන ලද අමූලක දෘෂ්ටි විපත්හි පාමොක් තබන්නේ ද, මේ නව නොදැහැමි පාමොක් තබනු යැ. නව දැහැමි පාමොක් තබනු කවර යැ? නොකරන ලද්දෙහි සමූලක සිල්විපත්හි පාමොක් තබන්නේ ද, කරන ලද්දෙහි සමූලක සිල්විපත්හි පාමොක් තබන්නේ ද, කරන ලද්දෙහිත් නොකරන ලද්දෙහිත් සමූලක සිල්විපත්හි පාමොක් තබන්නේ ද, කරන ලද්දෙහි සමූලක ආචාර විපත්හි — නොකරන ලද්දෙහි සමූලක ආචාර විපත්හි... කරන ලද්දෙහිත් නො කරන ලද්දෙහිත් සමූලක ආචාර විපත්හි, කරන ලද්දෙහි සමූලක දෘෂ්ටි විපත්හි... නොකරන ලද්දෙහි සමූලක දෘෂ්ටි විපත්හි... කරන ලද්දෙහිත් නො කරන ලද්දෙහිත් සමූලක දෘෂ්ටි විපත්හි පාමොක් තබන්නේ ද, මේ නව දැහැමි පාමොක් තබනු යැ.

දස නොදැහැමි පාමොක් තබනු කවර යැ? පරිජි ඇවැත් අවන්නෙක් එ පිරිසෙහි නො හුන්නේ වේ ද, පරිජිය පිළිබඳ කථාවෙක් නො අඩාළ වේ ද, ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කළෙක් එ පිරිසෙහි නො හුන්නේ වේ ද, සික ප්‍රත්‍යාඛ්‍යාන කළක්හු පිළිබඳ කථාවෙක් අඩාළ නො වේ ද, දැහැමි සමගියකට නො එළැඹේ ද, දැහැමි සමගියක් නො පිළිගනී ද, දැහැමි සමගියක් පිළිගැන්ම පිළිබඳ කථාවෙක් අඩාළ නො වේ ද, සිල්විපත්හි දුටුයෙක් ඇසූයෙක් සැක කළෙක් නො වේ ද, ආචාර විපත්හි දුටු ඇසූ සැකකළෙක් නො වේ ද, දෘෂ්ටි විපත්හි දුටු ඇසූ සැකකළෙක් නො වේ ද, මේ දස නොදැහැමි පාමොක් තබනු යැ. දස දැහැමි පාමොක් තබනු කවර යැ? පරිජි අවන්නෙක් එ පිරිසෙහි උන්නේ වේ ද, පරිජි අවන්නක්හු පිළිබඳ කථාවෙක් අඩාළ වේ ද, සික ප්‍රත්‍යාඛ්‍යාන කළෙක් එ පිරිසෙහි උන්නේ වේ ද, සික ප්‍රත්‍යාඛ්‍යාන කළක්හු පිළිබඳ කථාව අඩාළ වේ ද, දැහැමි සමගියට නො එළැඹේ ද, දැහැමි සමගිය නො පිළිගනී ද, දැහැමි සමගිය පිළිගැන්ම ගැන කථාව අඩාළ වේ ද, සිල්විපත්හි දුටු ඇසූ සැකකළෙක් වේ ද, ආචාර විපත්හි දුටු ඇසූ සැක කළෙක් වේ ද, දිටුවිපත්හි දුටු ඇසූ සැක කළෙක් වේ ද, මේ දසය දැහැමි පාමොක් තබනු යැ.

8. කෙසේ නම් පැරැදියෙක් එ පිරිසෙහි හුන්නේ වෙයි ද? මහණෙනි, මෙහි යම් ආකාරවලින් යම් ලකුණුවලින් යම් නිමිති වලින් පරිජි ඇවැතට පැමිණීමෙක් වේ ද, ඒ ආකාර ලක්‍ෂණ නිමිත්ත වලින් මහණෙක් පරිජි ඇවැතට අවදනා මහණක්හු දකී. එ මහණහු පරිජි ඇවැතට අවදින්නහු තෙමේ නො දකී. එහෙත් මහණෙක් මහණකුට 'මෙ නම් මහණ පරිජි ඇවැතට අවනැ'යි කියයි. මහණ තෙම මහණකු පරිජි ඇවැතට අවදින්නහු නො ම දකී. අන් මහණෙකුත් 'මෙ නම් මහණ පරිජි ඇවැතට අවන්නේය'යි මහණකුට සැල කරයි.

නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තං. නාපි අඤ්ඤෙ භික්ඛූ භික්ඛුස්ස ආරොචෙන්ති 'ඉත්ථන්නාමො ආවුසො භික්ඛු පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'ති. අපි ච සො'ව භික්ඛු භික්ඛුස්ස ආරොචෙති 'අහං ආවුසො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'ති.

ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො පුග්ගලො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති". ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

භික්ඛුස්ස පාතිමොක්ඛෙ ඨපිතෙ පරිසා වුට්ඨාති දසන්නං අන්තරායානං අඤ්ඤතරෙන: රාජන්තරායෙන වා චොරන්තරායෙන වා අග්‍යන්තරායෙන වා උදකන්තරායෙන වා මනුස්සන්තරායෙන වා අමනුස්සන්තරායෙන වා වාළන්තරායෙන වා සිරිංසපන්තරායෙන[1] වා ජීවිතන්තරායෙන වා බ්‍රහ්මචරියන්තරායෙන වා, ආකඞ්ඛමානො භික්ඛවෙ, භික්ඛු තස්මිං වා ආවාසෙ අඤ්ඤස්මිං වා ආවාසෙ තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමස්ස පුග්ගලස්ස පාරාජිකකථා විප්පකතා. තං වත්ථුං අවිනිච්ඡිතං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො තං වත්ථුං විනිච්ඡිනෙය්‍යාති".

එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරිතබ්බං:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමස්ස පුග්ගලස්ස පාරාජිකකථා විප්පකතා. තං වත්ථු අවිනිච්ඡිතං. තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති":

ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

---

1. සරීසපන්තරායෙන - මජසං.

මහණෙක් මහණකු නො ම දකී. අන් මහණෙකුත් මහණකුට 'මෙ නම් මහණ; පරිජි ඇවැත් අවතැ'යි නො ද කියයි. වැලි දු ඒ මහණ ම 'ඇවැත, මම් පරිජි ඇවැත් අවන්මි'යි කියයි.

මහණෙනි, මහණ තෙම කැමැත්තේ නම් ඒ දුටු දැයින්, ඒ ඇසූ දැයින්, ඒ සැකයෙන් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් පොහෝ දිනෙහි ඒ පුඟුලා හමු වූ කල්හි සඟමැද දී මෙසේ ඉදිරිපත් කරන්නේ ය (කළයුතු):

''වහන්ස, සඞ්ඝ තෙමෙ මා කියන්නක් අසාවා. මෙ නම් මහණ පරිජි ඇවැත් අවන. ඔහුට පාමොක් තබමි (වළක්වමි). ඔහු හමු වූ කලැ පාමොක් නො උදෙසියැයුතු'' යැ යි. (මේ) දැහැමි පාමොක් තැබීමෙකි.

මහණකුට පාමොක් තැබූ කල්හි, රජුන්ගෙන් වූ උවදුරෙකින් හෝ සොරුන්ගෙන් වූ උවදුරෙකින් හෝ ගින්නෙන් වූ උවදුරෙකින් හෝ දියෙන් වූ උවදුරෙකින් හෝ මිනිසුන්ගෙන් වූ උවදුරෙකින් හෝ අමනුෂ්‍ය උවදුරෙකින් හෝ චණ්ඩ මෘගයන්ගෙන් වූ උවදුරෙකින් හෝ සර්පයන්ගෙන් වූ උවදුරෙකින් හෝ ජීවිතයට වියැහැකි උවදුරෙකින් හෝ මහණදමට වියැහැකි උවදුරෙකින් හෝ මේ දස උවදුරු අතුරෙන් එක්තරා උවදුරෙකින් පිරිස නැගී සිටී ද, මහණෙනි, මහණ තෙම කැමැති වන්නේ වී නම් ඒ ආවාසයෙහි හෝ අන් ආවාසයෙක්හි හෝ ඒ පුද්ගලයා හමු වූ කල්හි සඟමැද දී මෙසේ ඉදිරිපත් කරන්නේ ය (කළයුතු):

''වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ බස් අසාවා. මෙ නම් පුඟුලා පිළිබඳ වැ පරිජි කතාව අඩාළ විය. ඒ වස්තුව අවිනිශ්චිත ය. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වී නම් ඒ වස්තුව විනිශ්චය කරන්නේ ය (විනිශ්චය කෙරේවා)''.

මෙය මෙසේ ලබන්නේ නම් ඒ මැනැව. ඉදින් නො ලබන්නේ නම් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් දවසැ ඒ පුඟුලහු හමු වූ කලැ සඟමැද දී (මෙසේ) ඉදිරිපත් කළයුතු:

''වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් පුඟුලා පිළිබඳ පරිජි කථාව අඩාළ ව ඇත. ඒ වස්තුව අවිනිශ්චිත ය. ඔහුට පාමොක් තබමි. ඔහු හමු වූ කල්හි පාමොක් නො උදෙසියැයුතු'' යනුවෙනි.

මේ දැහැමි පාමොක් තැබීම යි.

9. කථං සික්ඛං පච්චක්ඛාතකො තස්සං පරිසායං නිසින්නො හොති: ඉධ පන භික්ඛවෙ භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි සික්ඛං පච්චක්ඛාතා හොති, තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති සික්ඛං පච්චක්ඛන්තං, නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති සික්ඛං පච්චක්ඛන්තං, අපි ච අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති 'ඉත්ථන්නාමෙන ආවුසො භික්ඛුනා සික්ඛා පච්චක්ඛාතා'ති, නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති සික්ඛං පච්චක්ඛන්තං, නාපි අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති 'ඉත්ථන්නාමෙන ආවුසො භික්ඛුනා සික්ඛා පච්චක්ඛාතා'ති, අපි ච සො'ච භික්ඛු භික්ඛුස්ස ආරොචෙති මයා ආවුසො සික්ඛා පච්චක්ඛාතා'ති, ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදහරෙය්‍ය:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, ඉත්ථන්නාමෙන පුග්ගලෙන සික්ඛා පච්චක්ඛාතා තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති'' ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

භික්ඛුස්ස පාතිමොක්ඛෙ ඨපිතෙ පරිසා වුට්ඨාති දසන්නං අන්තරායානං අඤ්ඤතරෙන රාජන්තරායෙන වා -පෙ- බ්‍රහ්මචරියන්තරායෙන වා, ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තස්මිං වා ආවාසෙ අඤ්ඤස්මිං වා ආවාසෙ තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදහරෙය්‍ය:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමස්ස පුග්ගලස්ස සික්ඛං පච්චක්ඛාතකථා විප්පකතා, තං වත්ථු අවිනිච්ඡිතං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො තං වත්ථුං විනිච්ඡිනෙය්‍යා''ති. එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං, නො චෙ ලභෙථ තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදහරිතබ්බං. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. ඉත්ථන්නාමස්ස පුග්ගලස්ස සික්ඛං පච්චක්ඛාතකථා විප්පකතා තං වත්ථුං අවිනිච්ඡිතං. තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති''. ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

10. කථං ධම්මිකං සාමග්ගිං න උපෙති: ඉධ පන භික්ඛවෙ භික්ඛුනො යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි ධම්මිකාය සාමග්ගියා අනුපගමනං හොති, තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති ධම්මිකං සාමග්ගිං න උපෙන්තං. නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති ධම්මිකං සාමග්ගිං න උපෙන්තං. අපි ච අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති ඉත්ථන්නාමො ආවුසො භික්ඛු ධම්මිකං සාමග්ගිං න උපෙතීති.

9. කෙසේ නම් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කෙළෙක් ඒ පිරිසෙහි හුන්නේ වෙයි: මහණෙනි, මෙහි මහණෙක් යම් ආකාර ලිංග නිමිත්තවලින් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කෙරෙයි ද, ඒ ආකාර ලිංග නිමිත්තවලින් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කරන මහණහු මහණෙක් දක්නේ ද, වැලිදු මහණ තමා ම ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කරන්නහු නො දකී ද, එහෙත් අන් මහණෙක් මහණකුට 'මෙනම් මහණ විසින් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාත යැ යි සැලකෙරෙයි ද, එහෙත් තෙමේ එ මහණහු ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කරන්නහු නො දක්නේ ද, අන් මහණෙකුත් එ මහණහට "ඇවැත, මෙ නම් මහණ විසින් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාත යැ යි නො කියන්නේ ද, වැලිදු ඒ මහණ ම "ඇවැත මා විසින් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාත යැ යි මහණකුට සැල කරන්නේ ද, මහණෙනි, ඉදින් ඒ මහණ තෙමේ කැමැති වන්නේ නම් ඒ දුටු ඇසූ සැකකළ දැයින් ඒ තුදුස්වක් හෝ පස-ළොස්වක් හෝ පොහෝ දිනැ ඒ පුඟුලා හමු වූ කල්හි සඟමැද දී මෙසේ ඉදිරිපත් කරන්නේ ය;

"සඞ්ඝ තෙමේ මා කියන බස් අසාවා. මෙනම් පුඟුලා විසින් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාත ය. ඔහුට පාමොක් තබමි. ඔහු හමු වූ කලැ පාමොක් න උදෙසියැයුතු" යනුවෙනි. (මෙසේ වූ) පාමොක් තැබීම දැහැමි ය.

මහණක්හට පාමොක් තැබූ කල්හි රාජ චොර ... බ්‍රහ්මචර්‍ය්‍යා අන්තරාය යන දස උවදුරින් යම් එකෙකින් පිරිස නැඟී සිටී ද, මහණෙනි, ඒ මහණ කැමැති වන්නේ නම් ඒ ආවාසයෙහි හෝ අන් ආවාසයෙක දී හෝ ඒ පුඟුලා හමු වූ කලැ සඟ මැද දී මෙසේ ඉදිරිපත් කරන්නේ ය:

සඞ්ඝ තෙමේ මබස් අසාවා. මෙනම් පුඟුලා ශික්ෂාව ප්‍රත්‍යා-ඛ්‍යාන කළ කථාව අඩාළ විය, ඒ වස්තුව අවිනිශ්චිත ය. ඉදින් සඞ්ඝ තෙමේ සුදුසු කල් වී නම්, ඒ වස්තුව විනිශ්චය කරන්නේ ය" යනුවෙනි. මෙසේ වූ පාමොක් තැබීම දැහැමි ය.

10. කෙසේ නම් දැහැමි සමගියකට නො පැමිණේ ද යත්: මහණෙනි, මෙහි වනාහි මහණකුගේ යම් ආකාර ලිංග නිමිති වලින් දැහැමි සමගියකට නො එළැඹීමෙක් වේ ද, ඒ ආකාර ලිංග නිමිතිවලින් යුත්, දැහැමි සමගියකට නො එළැඹෙන මහණක්හු මහණෙක් දකී. වැලිදු දැහැමි සමගියට එ මහණහු නො එළැ-ඹෙන්නා නො ම දකී. එහෙත් අන් මහණෙක් 'මෙ නම් මහණ දැහැමි සමගියට නො පැමිණේ යැ යි මහණකුට කියයි.

නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති ධම්මිකං සාමග්ගිං න උපෙන්තං, නාපි අඤ්ඤෙ භික්ඛූ භික්ඛුස්ස ආරොචෙන්ති 'ඉත්ථන්නාමො ආවුසො භික්ඛු ධම්මිකං සාමග්ගිං න උපෙතී'ති. අපි ච සො'ව භික්ඛු භික්ඛුස්ස ආරොචෙති 'අහං ආවුසො ධම්මිකං සාමග්ගිං න උපෙමී'ති. ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදහරෙය්‍ය:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො පුග්ගලො ධම්මිකං සාමග්ගිං න උපෙති. තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති'': ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

කථං ධම්මිකං සාමග්ගිං පච්චාදියති: ඉධ පන භික්ඛවෙ භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි ධම්මිකාය සාමග්ගියා පච්චාදනං හොති. තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති ධම්මිකං සාමග්ගිං පච්චාදියන්තං. නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති ධම්මිකං සාමග්ගිං පච්චාදියන්තං. අපි ච අඤ්ඤෙ භික්ඛූ භික්ඛුස්ස ආරොචෙන්ති: ඉත්ථන්නාමො ආවුසො භික්ඛු ධම්මිකං සාමග්ගිං පච්චාදියතීති. නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති ධම්මිකං සාමග්ගිං පච්චාදියන්තං. නාපි අඤ්ඤෙ භික්ඛූ භික්ඛුස්ස ආරොචෙන්ති ඉත්ථන්නාමො ආවුසො භික්ඛු ධම්මිකං සාමග්ගිං පච්චාදියතීති. අපි ච සො'ව භික්ඛු භික්ඛුස්ස ආරොචෙති ''අහං ආවුසො ධම්මිකං සාමග්ගිං පච්චාදියාමී''ති. ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදහරෙය්‍ය: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමො පුග්ගලො ධම්මිකං සාමග්ගිං පච්චාදියති, තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති. ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

භික්ඛුස්ස පාතිමොක්ඛෙ ඨපිතෙ පරිසා වුට්ඨාති දසන්නං අන්තරායානං අඤ්ඤතරෙන රාජන්තරායෙන වා -පෙ- බ්‍රහ්මචරියන්තරායෙන වා. ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තස්මිං වා ආවාසෙ අඤ්ඤස්මිං වා ආවාසෙ තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදහරෙය්‍ය:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමස්ස පුග්ගලස්ස ධම්මිකාය සාමග්ගියා පච්චාදනකථා විප්පකතා තං වත්ථු අවිනිච්ඡිතං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො තං වත්ථුං විනිච්ඡිනෙය්‍යා''ති

මහණ තෙම දැහැමි සමගියට නො පැමිණෙන මහණහු ද නො ම දකී, අන් මහණෙකුත් මෙනම් මහණ, දැහැමි සමගියට නො පැමිණේ යැ යි මහණකුට නො ද කියයි. වැලිදු ඒ මහණ ම 'ඇවැත, මම දැහැමි සමගියට නො පැමිණෙමි'යි කියයි. මහණෙනි, මහණ තෙම කැමැති වනුයේ ඒ දුටු දැයින් ඒ ඇසූ දැයින් ඒ සැක කළ දැයින් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් හෝ පොහෝ දවසෙහි ඒ පුඟුලා හමු වූ කල්හි සඟමැදදී මෙසේ ඉදිරිපත් කරන්නේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මබස් අසාවා. මෙනම් පුඟුලා දැහැමි සමගියට නො පැමිණෙයි. ඔහුට පාමොක් තබමි. ඔහු හමු ව සිටි කල්හි පාමොක් නො උදෙසියැයුතු" යනුවෙනි. මෙසේ වූ පාමොක් තැබීම දැහැමි යි.

කෙසේ දැහැමි සමගිය (යළි කර්‍මය කළයුතු ය යි) නැවත ගන්නේ වේ ද: මහණෙනි, මෙහි මහණ, යම් ආකාර ලිඞ්ග නිමිතිවලින් යුතු වූයේ දැහැමි සමගිය නැවත කළයුතු යැ යි ගන්නේ වේ ද එබඳු ආකාර ලිඞ්ග නිමිතිවලින් යුත් දැහැමි සමගිය නැවත කළයුතු යැ යි ගන්නා මහණකු දකී ද, වැලි දු මහණෙක් දැහැමි සමගිය නැවත කළයුතු යැ යි ගන්නා මහණකු නො ම දක්නේ ද, එහෙත් අන් මහණෙක් මහණක්හට "ඇවැත්නි, මෙ නම් මහණ දැහැමි සමගිය යළි කළයුතු යැ යි ගනී යි දක්වා ද, වැලිදු මහණ දැහැමි සමගිය යළි කළයුතු යැ යි ගන්නා මහණකු නො ම දක්නේ හෝ අන් මහණෙක් මහණක්හට "ඇවැත්නි, මෙ නම් මහණ දැහැමි සමගිය යළි කළයුතු යැ යි ගනී යි නො ම දන්වන්නේ හෝ වේ ද, එහෙත් ඒ මහණ මැ "ඇවැත්නි, මම දැහැමි සමගිය යළි කළයුතු යැ යි ගනිමැ යි මහණක්හට දන්වා ද, මහණෙනි, ඉදින් මහණ තෙමේ කැමැති වන්නේ නම් ඒ දුටු ඒ ඇසූ ඒ සැකකළ දැයින් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් හෝ පොහෝ දිනයෙහි ඒ පුඟුලා හමු වූ කල්හි සඟමැද දී මෙසේ ඉදිරිපත් කරන්නේ ය. "වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් පුඟුලා දැහැමි සමගිය යළි කළයුතු යැ යි ගනී. ඔහුට පාමොක් තබමි. ඔහු හමුවූ කල්හි පාමොක් නො උදෙසියයුතු" යි. මෙසේ වූ පාමොක් තැබීම දැහැමි යි.

මහණක්හට පාමොක් බහා තැබූ කල්හි රාජ... බ්‍රහ්මචර්‍යා අන්තරාය යන දස උවදුරු අතුරෙන් එකෙකින් පිරිස නැඟීසිටී ද මහණෙනි, (ඉදින් ඒ මහණ කැමතිවන්නේ නම් ඒ ආවාසයෙහි හෝ අන් ආවාසයක දී හෝ ඒ පුඟුලා හමුවූ කලැ සඟමැද දී මෙසේ ඉදිරිපත් කරන්නේ ය.

"වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් පුද්ගලයාගේ දැහැමි සමගිය නැවත කිරීම පිළිබඳ කථාව අඩාළ විය. ඒ වස්තුව අවිනිශ්චිත ය. ඉදින් සඞ්ඝයාට සුදුසු කල් ඇත්තේ නම් සඞ්ඝයා ඒ වස්තුව විනිශ්චය කරන්නේ ය යි.

එවංඤාතං ලභෙථ ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරිතබ්බං: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමස්ස පුග්ගලස්ස ධම්මිකාය සාමග්ගියා පච්චාදානකථා විප්පකතා, තං වත්ථු අවිනිච්ඡිතං. තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති". ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

11. කථං සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති: ඉධ පන භික්ඛවෙ භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති, තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. අපි ච අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති "ඉත්ථන්නාමො ආවුසො භික්ඛු සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො"ති. නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං නාපි අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති "ඉත්ථන්නාමො ආවුසො භික්ඛු සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො"ති. අපි ච සොව භික්ඛු භික්ඛුස්ස ආරොචෙති "අහං ආවුසො සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොම්හී"ති.

ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො පුග්ගලො සීලවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති. ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

12. කථං ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති, ඉධ භික්ඛවෙ භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති. තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. න හෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං අපි ච අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති ඉත්ථන්නාමො ආවුසො භික්ඛු ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොති. න හෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. නාපි අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති ඉත්ථන්නාමො ආවුසො භික්ඛු ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොති. අපි ච සොව භික්ඛු භික්ඛුස්ස ආරොචෙති. අහං ආවුසො ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොම්හීති.

මෙසේත් මෙය ලැබෙන්නේ නම් ඒ මැනව. ඉදින් නො ලබන්නේ නම් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් හෝ පොහෝ දවසැ ඒ පුඟුලා හමු වූ කලැ සහමැද දී මෙසේ ඉදිරිපත් කළයුතු. ''වහන්ස, සඞ්ඝයා මබස් අසාවා, මෙනම් පුඟුලාගේ දැහැමි සමගිය නැවත කිරීම පිළිබඳ කථාව අඩාළ විය. ඒ වස්තුව අවිනිශ්චිත ය. ඔහට පාමොක් තබමි. ඔහු හමු වූ කල්හි පාමොක් නො උදෙසියයුතු ය''යි. මේ දැහැමි පාමොක් තැබීමෙකි.

11. කෙසේ නම් සීලවිපත්තියෙහි දුටු ඇසූ සැක කරන ලද්දෙක් වේ ද, මහණෙනි, මෙහි මහණ යම් ආකාර ලිඞ්ග නිමිති වලින් සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක් වේ ද, ඒ ආකාර ලිඞ්ග නිමිතිවලින් යුක්ත වූ සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු දකී ද, නැතහොත් මහණ සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු නො දක්නේ නමුදු අන් මහණෙක් මහණක්හට ''ඇවත මෙනම් මහණ සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකැ''යි දන්වයි. නැතහොත් මහණ සීලවිපත්ති යෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු නො දන්නේත් වෙයි. අන් මහණෙක් මහණක්හට 'ඇවත මෙනම් මහණ සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකැ'යි නො දන්වන්නේත් වෙයි. වැලිදු ඒ මහණ ම ''ඇවත මම සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙමැ''යි මහණක්හට දන්වයි.

මහණෙනි, ඉදින් මහණ කැමති වන්නේ නම් ඒ දුටු ඇසූ සැක කළ දැයින් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් හෝ පොහෝ දිනයෙහි ඒ පුඟුලා හමු වූ කල්හි සහමැද (මෙසේ) ඉදිරිපත් කරන්නේ ය. ''වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් පුඟුලා සීලවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකි. ඔහට පාමොක් තබමි. ඔහු ඉදිරියෙහි ඇති කල්හි පාමොක් නො උදෙසියයුතු''යි. (මේ) දැහැමි පාමොක් තැබීමෙකි.

12. කෙසේ නම් ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක් වේ ද: මහණෙනි, මෙහි මහණ යම්බඳු ආකාර ලිඞ්ග නිමිතිවලින් ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක් වේ ද එබඳු ආකාර ලිඞ්ග නිමිතිවලින් ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු දකී ද, වැලි දු මහණ ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු නො දක්නේ වුව ද අන් මහණෙක් මහණහට ''ඇවැත, මෙනම් මහණ ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකැ''යි දන්වා ද, නැතහොත් මහණ ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු නො දක්නේත් වේ ද, අන් මහණෙකුත් ''ඇවත, මෙනම් මහණ ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකැ''යි නො දන්වා ද, වැලිදු ඒ මහණ ම ''ඇවැත, මම ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක්මි'යි මහණහට දන්වා ද,

ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො පුග්ගලො ආචාරවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො. තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති. ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං.

13. කථං දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති: ඉධ පන භික්ඛවෙ භික්ඛු යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො හොති. තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි භික්ඛු භික්ඛුං පස්සති දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. න හෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. අපි ච අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති. ඉත්ථන්නාමො ආවුසො භික්ඛු දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොති. නහෙව ඛො භික්ඛු භික්ඛුං පස්සති දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතං. නාපි අඤ්ඤො භික්ඛු භික්ඛුස්ස ආරොචෙති ඉත්ථන්නාමො ආවුසො භික්ඛු දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොති. අපි ච සොව භික්ඛු භික්ඛුස්ස ආරොචෙති: අහං ආවුසො දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතොම්හීති.

ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු තෙන දිට්ඨෙන තෙන සුතෙන තාය පරිසඞ්කාය තදහුපොසථෙ චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමො පුග්ගලො දිට්ඨිවිපත්තියා දිට්ඨසුතපරිසඞ්කිතො: තස්ස පාතිමොක්ඛං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති. ධම්මිකං පාතිමොක්ඛට්ඨපනං. ඉමානි දස ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානීති.

**පඨමං භාණවාරං.**

මහණෙනි, ඉදින් මහණ කැමති වන්නේ නම් ඒ දුටු ඇසූ සැක කළ දැයින් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් පොහෝදිනයෙහි ඒ පුඟුලා හමු වූ කල්හි සඟමැද (මෙසේ) ඉදිරිපත් කළයුතු ය. "වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් පුඟුලා ආචාරවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකි. ඔහට පාමොක් තබමි. ඔහු අභිමුඛ ව ඇති කල්හි පාමොක් නො උදෙසියයුතු"යි. (මේ) දැහැමි පාමොක් තැබීමෙකි.

13. කෙසේ නම් දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක් වේ ද, මහණෙනි, මෙහි මහණ යම්බඳු ආකාර ලිඞ්ග නිමිතිවලින් දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක් වේ ද, එබඳු ආකාර ලිඞ්ග නිමිතිවලින් දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු දකී ද, වැලි දු මහණ දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු නො දක්නේ වුව ද, අන් මහණෙක් මහණහට "ඇවත මෙනම් මහණ දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකැ'යි දන්වා ද, නැතහොත් මහණ දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇති මහණකු නො දක්නේත් වේ ද, අන් මහණෙකුත් "ඇවත මෙනම් මහණ දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකැ'යි නො දන්වා ද, වැලිදු ඒ මහණ ම "ඇවත, මම දිට්ඨිවිපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙක්මි"යි මහණහට දන්වා ද,

මහණෙනි, ඉදින් මහණ කැමැති වන්නේ නම් ඒ දුටු ඇසූ සැක කළ දැයින් ඒ තුදුස්වක් හෝ පසළොස්වක් පොහෝ දිනයෙහි ඒ පුඟුලා හමු වූ කල්හි සඟමැද මෙසේ ඉදිරිපත් කළ යුතු ය. "වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් පුඟුලා දිට්ඨි-විපත්තියෙහි දුටු ඇසූ කළ සැක ඇත්තෙකි. ඔහට පාමොක් තබමි. ඔහු අභිමුඛ ව ඇති කල්හි පාමොක් නො උදෙසියයුතු"යි. මේ දැහැමි පාමොක් තැබීමෙකි. මේ දැහැමි පාමොක් තැබීම් දසය යි.

## පළමු බණවර යි.

14. අථ ඛො ආයස්මා උපාලි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච: අත්තාදනං ආදතුකාමෙන භන්තෙ භික්ඛුනා කතමඞ්ගසමන්නාගතං[1] අත්තාදනං ආදතබ්බන්ති.

අත්තාදනං ආදතුකාමෙන උපාලි භික්ඛුනා පඤ්චඞ්ග සමන්නාගතං අත්තාදනං ආදතබ්බං. අත්තාදනං ආදතුකාමෙන උපාලි භික්ඛුනා එවං පච්චවෙක්ඛිතබ්බං: යං ඛො අහං ඉමං අත්තාදනං ආදතුකාමො කාලො නු ඛො ඉමං අත්තාදනං ආදතුං උදහු නොති. සචෙ උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අකාලො ඉමං අත්තාදනං ආදතුං නො කාලොති. න තං උපාලි අත්තාදනං ආදතබ්බං.

සචෙ පන උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: කාලො ඉමං අත්තාදනං ආදතුං නො අකාලොති. තෙන උපාලි භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං. යං ඛො අහං ඉමං අත්තාදනං ආදතුකාමො භූතං නු ඛො ඉදං අත්තාදනං උදහු නොති. සචෙ උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභූතං ඉදං අත්තාදනං නො භූතන්ති. න තං උපාලි අත්තාදනං ආදතබ්බං.

සචෙ පන උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති භූතං ඉදං අත්තාදනං නො අභූතන්ති. තෙනුපාලි භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං යං ඛො අහං ඉමං අත්තාදනං ආදතුකාමො අත්ථසංහිතං නු ඛො ඉදං අත්තාදනං උදහු නොති. සචෙ උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අනත්ථසංහිතං ඉදං අත්තාදනං නො අත්ථසංහිතන්ති. න තං උපාලි අත්තාදනං ආදතබ්බං.

සචෙ පන උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අත්ථසංහිතං ඉදං අත්තාදනං නො අනත්ථසංහිතන්ති, තෙනුපාලි භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං: ඉමං ඛො අහං අත්තාදනං ආදියමානො ලභිස්සාමි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ ධම්මතො විනයතො පක්ඛෙ උදහු නොති, සචෙ පන උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ඉමං ඛො අහං අත්තාදනං ආදියමානො න ලභිස්සාමි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ ධම්මතො විනයතො පක්ඛෙති න තං උපාලි අත්තාදනං ආදතබ්බං.

1. කතඞ්ගසමන්නාගතං-මජසං

14. ඉක්බිති ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් උපාලි ආයුෂ්මතුන් වහන්සේ "ස්වාමීනි, අත්තාදාන නම් අධිකරණය (ශාසන ශොධනය කරනු කැමති භික්ෂූහු විසින් නැවත චොදනා කරනු පිණිස ගනු ලබන අධිකරණය) ගනු කැමති භික්ෂූහු විසින් කවර අඞ්ගයන්ගෙන් යුක්ත වූ අත්තාදානය ගතයුතු දැ" යි භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

උපාලි, අත්තාදානය ගනු කැමැති භික්ෂූහු විසින් අඞ්ග පසකින් යුක්ත වූ අත්තාදානය ගතයුතු ය. උපාලි, අත්තාදානය ගනු කැමැති මහණ විසින් මෙසේ සලකා බැලියයුතු යි, මම යම් මේ අත්තාදානය ගනු කැමැත්තෙම් ද මේ අත්තාදානය ගැනීමට සුදුසු කාලය ද නොහොත් නො සුදුසු කාලය දැ යි. උපාලි, ඉදින් මෙසේ සලකා බලන මහණ "මේ අත්තාදානය ගැනීමට නො කල් ය සුදුසු කාලය නො වේ"යි දැන ගනී ද, උපාලි, ඒ අත්තාදානය නො ගතයුතු යි.

ඉදින් උපාලි, මෙසේ සලකා බලන මහණ "මේ අත්තාදානය ගැනීමට කල් වෙයි, නො කල් නො වේ" යි දනී ද, උපාලි ඒ මහණ විසින් මත්තෙහි දු මෙසේ සලකා බැලියයුතු යි. "මම යම් මේ අත්තාදානයක් ගනු කැමැත්තෙම් ද, මෙය සත්‍ය වූවක් ද නොහොත් සත්‍ය නො වූවක් දැ" යි. ඉදින් උපාලි, මෙසේ සලකා බලන මහණ 'මේ අත්තාදානය අභූතයකි. සත්‍ය නො වේ' යි දනී ද, උපාලි, ඒ අත්තාදානය නො ගතයුතු යි.

ඉදින් උපාලි, මෙසේ සලකා බලන මහණ මේ අත්තාදානය සත්‍යයකි, අභූතයක් නො වේ යි දනී ද උපාලි ඒ මහණ විසින් මත්තෙහි දු මෙසේ සලකා බැලියයුතු යි. මම යම් මේ අත්තාදානයක් ගනු කැමැත්තෙම් ද, මේ අත්තාදානය වැඩ සහිත වූවක් ද නැතහොත් නො වේ දැ' යි, ඉදින් උපාලි, මෙසේ සලකා බලන මහණ 'මේ අත්තාදානය අවැඩ සහිත ය, වැඩ සහිත නො වේ' යි දනී ද, උපාලි, ඒ අත්තාදානය නො ගතයුතු යි.

ඉදින් උපාලි, මෙසේ සලකා බලන මහණ "මේ අත්තාදානය වැඩ සහිත ය, අවැඩ සහිත නො වේ" යි දනී ද, උපාලි, ඒ මහණ විසින් මත්තෙහි දු (මෙසේ) සලකා බැලියයුතු යි. "මම මේ අත්තාදානය ගන්නෙම් ධර්මයෙන් (ධර්ම හෙතුවෙන්) විනයෙන් (විනයහෙතුවෙන්) පක්ෂ වූ සන්දෘෂ්ට (දැඩි විශ්වාසයක් නැති) සම්භක්ත (දැඩි විශ්වාසය ඇති) භික්ෂූන් ලබන්නෙම් ද නැතහොත් නො ලබන්නෙම් දැ' යි. ඉදින් උපාලි, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ "මම මේ අත්තාදානය ගන්නෙම් ධර්මයෙන් විනයෙන් පක්ෂ වූ දැඩි විශ්වාසය නැත්තා වූ ද, දැඩි විශ්වාසය ඇත්තාවූ ද භික්ෂූන් නො ලබන්නෙමි" යි මෙසේ දනී ද උපාලි ඒ අත්තාදානය නො ගතයුතු යි.

සචෙ පන උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති ඉමං ඛො අහං අත්තාදානං ආදියමානො ලභිස්සාමි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ ධම්මතො විනයතො පක්ඛෙ'ති. තෙනුපාලි භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං. ඉමං ඛො මෙ අත්තාදානං ආදියතො භවිස්සති සඞ්ඝස්ස තතො නිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජි සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණං උදාහු නොති. සචෙ උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති ඉමං ඛො මෙ අත්තාදානං ආදියතො භවිස්සති සඞ්ඝස්ස තතො නිදානං භණ්ඩනං -පෙ- සඞ්ඝනානාකරණන්ති. න තං උපාලි අත්තාදානං ආදාතබ්බං.

සචෙ පන උපාලි භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ඉමං ඛො මෙ අත්තාදානං ආදියතො න භවිස්සති සඞ්ඝස්ස තතො නිදානං භණ්ඩනං -පෙ- සඞ්ඝනානාකරණන්ති. ආදාතබ්බං තං උපාලි අත්තාදානං. එවං පඤ්චඞ්ගසමන්නාගතං ඛො උපාලි අත්තාදානං ආදින්නං පච්ඡාපි අවිප්පටිසාරකරං[1] භවිස්සතීති.

15. චොදකෙන භන්තෙ භික්ඛුනා පරං චොදෙතුකාමෙන කති ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පරො චොදෙතබ්බොති.

චොදකෙන උපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පරො චොදෙතබ්බො. චොදකෙන උපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: පරිසුද්ධකායසමාචාරො නු ඛොම්හි පරිසුද්ධෙනම්හි කායසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන[2]. සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති. නො චෙ උපාලි භික්ඛු පරිසුද්ධකායසමාචාරො හොති පරිසුද්ධෙන කායසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන. තස්ස භවන්ති වත්තාරො: ඉඞ්ඝ තාව ආයස්මා කායිකං සික්ඛස්සූති. ඉතිස්ස භවන්ති වත්තාරො.

පුන ච පරං උපාලි චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: පරිසුද්ධවචීසමාචාරො නු ඛොම්හි පරිසුද්ධෙනම්හි වචීසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන. සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති. නො චෙ උපාලි භික්ඛු පරිසුද්ධවචීසමාචාරො හොති පරිසුද්ධෙන වචීසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන තස්ස භවන්ති වත්තාරො: ඉඞ්ඝ තාව ආයස්මා වාචසිකං සික්ඛස්සූති. ඉතිස්ස භවන්ති වත්තාරො.

---

1. අවිප්පටිසාරකං - මජසං
2. අප්පටිමංසකෙන - මජසං,

ඉදින් උපාලි, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ "මේ අත්තාදනය ගන්නා මම ධර්මයෙන් විනයෙන් පක්ෂ වූ සන්දෘෂ්ට සම්භක්ත භික්ෂූන් ලබන්නෙමි' යි මෙසේ දනී ද, උපාලි ඒ මහණ විසින් මත්තෙහි ද (මෙසේ) ප්‍රත්‍යවෙක්ෂා කළයුතු යි. "මා මේ අත්තාදනය ගත් කල්හි ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ අරගලයක්, කලහයක්, සටනක්, විරුද්ධවාදයක්, සඞ්ඝභෙදයක්, සඞ්ඝරාජියක්, සඞ්ඝයාගේ වෙන් වූ කතිකාවතක්, සඞ්ඝයාගේ වෙන්වීමක් වන්නේ ද නැතහොත් නො වන්නේ ද' යි. ඉදින් උපාලි, ප්‍රත්‍යවෙක්ෂාකරන මහණ "මා මේ අත්තාදනය ගත් කල්හි ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ අරගලයක් ... සඞ්ඝයාගේ වෙන් වීමක් වන්නේ යැ යි දනී ද, උපාලි, ඒ අත්තාදනය නො ගතයුතු යි. ඉදින් උපාලි ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ "මේ අත්තාදනය මා ගත් කල්හි ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ අරගලයක් ... සඞ්ඝයාගේ වෙන් වීමක් නො වන්නේ යැ යි දනී ද, උපාලි, ඒ අත්තාදනය ගතයුතු යි. උපාලි, මෙසේ අඞ්ග පසින් යුතුව ගන්නා ලද අත්තාදනය පසුව ද විපිළිසරකාරී නො වන්නේ ය යි.

15. ස්වාමීනි, පරහට චොදනා කරනු කැමති චොදක භික්ෂුව විසින් කෙතෙක් කරුණු තමා කෙරෙහි සලකා බලා අන්‍යයා චොදනා කළයුතු ද' යි.

උපාලි, පරහට චොදනා කරනු කැමැති චොදක භික්ෂුහු විසින් තමා කෙරෙහි කරුණු පසක් සලකා බලා අන්‍යයා චොදනා කළයුතු.

උපාලි, පරහට චොදනා කරනු කැමති චොදක මහණහු විසින් මෙසේ සලකා බැලියයුතු යි: "මම පිරිසුදු කායසමාචාර ඇත්තෙම් ද පිරිසුදු වූ සිදුරු රහිත වූ විමසා බැලීමට කරුණු නැති කායසමාචාරයෙන් යුක්ත වෙම් ද, මේ ධර්මය මා තුළ පවතී ද නැතහොත් නො පවතී ද යි. උපාලි, ඉදින් මහණ පිරිසුදු කායසමාචාර නැත්තේ වේ ද පිරිසුදු වූ සිදුරු රහිත වූ විමසා බැලීමට කරුණු නැති කායසමාචාරයෙන් යුක්ත නො වේ ද ඔහට "ආයුෂ්මත් තෙම පළමුව කායසමාචාරයෙහි හික්මෙව" යි මෙසේ කියන්නෝ වෙති. මෙසේ අවවාද කරන්නෝ වෙත්.

වැලිදු උපාලි පරහට චොදනා කරනු කැමැති චොදක මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කළයුතු: "මම පිරිසුදු වචීසමාචාර ඇත්තෙම් ද පිරිසුදු වූ සිදුරු රහිත වූ විමසා බැලීමට කරුණු නැති වචීසමාචාරයෙන් යුක්ත වෙම් ද මේ ධර්මය මා තුළ පවතී ද නැතහොත් නො පවතී ද යි. උපාලි, ඉදින් මහණ පිරිසුදු වචීසමාචාර නැත්තේ වේ ද, පිරිසුදු වූ සිදුරු රහිත වූ විමසා බැලීමට කරුණු නැති වාක්සමාචාරයෙන් යුක්ත නො වේ ද, ඔහට "ආයුෂ්මත් තෙම පළමු ව වචීසමාචාරයෙහි හික්මෙව" යි මෙසේ කියන්නෝ වෙති. මෙසේ අවවාද කරන්නෝ වෙත්.

පුනචපරං උපාලි, චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: මෙත්තං නු ඛො මෙ චිත්තං පච්චුපට්ඨිතං සබ්‍රහ්මචාරීසු අනාඝාති[1], සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති? නො චෙ උපාලි භික්ඛුනො මෙත්තං චිත්තං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු අනාඝාති, තස්ස භවන්ති වත්තාරො: ඉඞ්ඝ තාව ආයස්මා සබ්‍රහ්මචාරීසු මෙත්තං චිත්තං උපට්ඨාපෙහීති.[2] ඉතිස්ස භවන්ති වත්තාරො.

පුනචපරං උපාලි චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: බහුස්සුතො නු ඛොම්හි සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපා මෙ ධම්මා බහුස්සුතා හොන්ති ධතා[3] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති. නො චෙ උපාලි භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා න බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. තස්ස භවන්ති වත්තාරො ඉඞ්ඝ තාව ආයස්මා ආගමං පරියාපුණස්සූති: ඉතිස්ස භවන්ති වත්තාරො.

පුනචපරං උපාලි චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: උභයානි ඛො මෙ පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීති සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති? නො චෙ උපාලි භික්ඛුනො උභයානි පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො- ඉදං පනාවුසො කත්ථ වුත්තං භගවතාති ඉති පුට්ඨො න සම්පායති. තස්ස භවන්ති වත්තාරො ඉඞ්ඝ තාව ආයස්මා විනයං පරියාපුණස්සූති. ඉතිස්ස භවන්ති වත්තාරො.

චොදකෙන උපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පරො චොදෙතබ්බොති.

1. අනාඝාතං - මජසං.
2. උපට්ඨාපෙහීති - සීමු, මජසං
3. ධාතා - මජසං

වැලිදු උපාලි පරහට චෝදනා කරනු කැමැති චෝදක භික්ෂුහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කළයුතු: මා තුළ සබ්‍රහ්මසරුන් කෙරෙහි ආඝාත රහිත වූ මෙත් සිත එළඹ සිටියේ ද මේ ධර්මය මා තුළ පවතී ද නැතහොත් නො පවතී ද' යි. ඉදින් උපාලි, සබ්‍රහ්මසරුන් කෙරෙහි ආඝාත රහිත වූ මෙත් සිත මහණහට එළඹ නො සිටියේ ද ඔහට, "ආයුෂ්මත් තෙම පළමු ව සබ්‍රහ්මසරුන් කෙරෙහි ආඝාත රහිත වූ මෙත් සිත එළඹ සිටුවා ගනුව' යි කියන්නෝ වෙති. ඔහට මෙසේ අවවාද කරන්නෝ වෙත්.

වැලිදු උපාලි, පරහට චෝදනා කරනු කැමැති චෝදක භික්ෂුහු විසින් මෙසේ ප්‍රත්‍යාවේක්ෂා කළයුතු: 'මම සූතධර වූ සූතසන්නිචය (උගත් දය නො නැසිය දී රක්නා) වූ බහුශ්‍රැතයෙක් වෙම් ද, මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ යම් ඒ ධර්ම කෙනෙක් අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ හාත්පසින් පිරිපුන් වූ පිරිසුදු වූ බඹසර ප්‍රකාශ කෙරෙත් ද, එබඳු ධර්මයෝ මා විසින් බෙහෙවින් අසන ලද්දහු දරන ලද්දහු වචනයෙන් පුරුදු කරන ලද්දහු සිතින් සලකා බලන ලද්දහු දෘෂ්ටියෙන් මනාව අවබොධ කරන ලද්දහු වෙත් ද, මේ ධර්මය මා තුළ විද්‍යමාන වේ ද නැතහොත් නො වේ ද' යි, උපාලි, ඉදින් මහණ සූතධර වූ සූතසන්නිචය වූ බහුශ්‍රැතයෙක් නො වේ ද, මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ යම් ඒ ධර්ම කෙනෙක් අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ හාත්පසින් පිරිපුන් වූ පිරිසුදු වූ බඹසර ප්‍රකාශ කෙරෙත් ද එබඳු ධර්මයෝ ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු දරන ලද්දහු වචනයෙන් පුරුදු කරන ලද්දහු සිතින් සලකා බලන ලද්දහු දෘෂ්ටියෙන් මනාව අවබොධ කරන ලද්දහු නො වෙත් ද, ඔහට "ආයුෂ්මත් තෙමේ පළමු ව ආගම ධර්මය පිරිවහන්නැ' යි කියන්නෝ වෙති. මෙසේ ඔහට අවවාද කරන්නෝ වෙත්.

වැලිදු උපාලි, පරහට චෝදනා කරනු කැමති චෝදක භික්ෂුහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කළයුතු: "මා විසින් පෙළ වශයෙන් ද අනුව්‍යඤ්ජන වශයෙන් ද උභය ප්‍රාතිමොක්ෂය විස්තර වශයෙන් මනාකොට ප්‍රගුණ කරන ලද ද මනාව විභාග කොට දනගන්නා ලද ද මනාව (දරීම වශයෙන්) පවත්වන ලද ද, මනා ලෙස විනිශ්චය කොට දන ගන්නා ලද ද, මේ ධර්මය මා තුළ විද්‍යමාන වේ ද නැතහොත් නො වේ ද' යි. උපාලි, ඉදින් මහණහු විසින් පෙළ වශයෙන් ද අනුව්‍යඤ්ජන වශයෙන් ද උභය ප්‍රාතිමොක්ෂය විස්තර වශයෙන් මනා කොට ප්‍රගුණ කරන ලද්දේ මනාව විභාග කොට දනගන්නා ලද්දේ මනාව (දරීම වශයෙන්) පවත්වන ලද්දේ මනා ලෙස විනිශ්චය කොට දනගන්නා ලද්දේ නො වේ ද, ඇවත, මෙය, භාග්‍යවතුන් වහන්සේ විසින් කොහි දී දෙසන ලද ද' යි පුළුවුස්නා ලද්දේ සිහි කොට නො කියහෙයි ද, ඔහට 'ආයුෂ්මත් තෙම පළමුව විනය පිරිවහන්නැ' යි කියන්නෝ වෙති. ඔහට මෙසේ අවවාද කරන්නෝ වෙත්.

උපාලි, පරහට චෝදනා කරනු කැමති චෝදක භික්ෂුහු විසින් මේ කරුණු පස තමා කෙරෙහි සලකා බලා අන්‍යයා චෝදනා කළයුත්තේ යි.

16. චොදකෙන භන්තෙ භික්ඛුනා පරං චොදෙතුකාමෙන කති ධම්මෙ අජ්ඣත්තං උපට්ඨාපෙත්වා පරො චොදෙතබ්බොති?

චොදකෙන උපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨාපෙත්වා පරො චොදෙතබ්බො: කාලෙන වක්ඛාමි නො අකාලෙන: භූතෙන වක්ඛාමි නො අභූතෙන සණ්හෙන වක්ඛාමි නො එරුසෙන. අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථ සංහිතෙන. මෙත්තචිත්තො වක්ඛාමි නො දොසන්තරොති. චොදකෙනුපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨාපෙත්වා පරො චොදෙතබ්බොති.

17. අධම්මචොදකස්ස භන්තෙ භික්ඛුනො කතිහාකාරෙහි විප්පටිසාරො උපදහාතබ්බොති?

අධම්මචොදකස්ස උපාලි භික්ඛුනො පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහාතබ්බො: අකාලෙන ආයස්මා චොදෙසි නො කාලෙන අලං තෙ විප්පටිසාරාය, අභූතෙනායස්මා චොදෙසි නො භූතෙන අලං තෙ විප්පටිසාරාය, එරුසෙනායස්මා චොදෙසි නො සණ්හෙන අලං තෙ විප්පටිසාරාය, අනත්ථසංහිතෙනායස්මා චොදෙසි නො අත්ථසංහිතෙන අලං තෙ විප්පටිසාරාය, දොසන්තරො ආයස්මා චොදෙසි නො මෙත්තචිත්තො. අලං තෙ විප්පටිසාරායාති. අධම්මචොදකස්ස උපාලි භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහාතබ්බො: තං කිස්ස හෙතු? යථා න අඤ්ඤොපි භික්ඛු අභූතෙන චොදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

18. අධම්මචුදිතකස්ස[1] පන භන්තෙ භික්ඛුනො කතිහාකාරෙහි අවිප්පටිසාරො උපදහාතබ්බොති?

අධම්මචුදිතකස්ස[1] උපාලි භික්ඛුනො පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහාතබ්බො, අකාලෙනායස්මා චුදිතො නො කාලෙන, අලං තෙ අවිප්පටිසාරාය,[2] අභූතෙනායස්මා චුදිතො නො භූතෙන, අලං තෙ අවිප්පටිසාරාය. එරුසෙනායස්මා චුදිතො නො සණ්හෙන, අලං තෙ අවිප්පටිසාරාය[3]. අනත්ථසංහිතෙනායස්මා චුදිතො නො අත්ථසංහිතෙන, අලං තෙ අවිප්පටිසාරාය.[3] දොසන්තරෙනායස්මා චුදිතො නො මෙත්තචිත්තෙන, අලං තෙ අවිප්පටිසාරායාති. අධම්මචුදිතකස්ස[1] උපාලි භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහාතබ්බොති.

1. අධම්මචුදිතස්ස - මජසං
2. විප්පටිසාරාය - මජසං
3. අලං තෙ අවිප්පටිසාරාය - මජසං, ඌනං

වහන්ස, පරහට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් කෙතෙක් ධර්ම තමා තුළ එළවා (පිහිටුවා ගෙන) අන්‍යයා චෝදනා කළයුතු ද? යි.

උපාලි, පරහට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් කරුණු පසක් තමා තුළ එළවා අන්‍යයා චෝදනා කළයුතු: (එනම්) නො කල්හි නොව සුදුසු කල්හි කියන්නෙමි, අසත්‍යයෙන් නොව සත්‍යයෙන් කියන්නෙමි. රළු වචනයෙන් නොව මොළොක් වදනින් කියන්නෙමි. කරුණු ඇසුරු නො කිරීමෙන් නොව කරුණු ඇසුරු කිරීමෙන් කියන්නෙමි, දුෂ්ට සිතින් නොව මෙත් සිත් ඇති ව කියන්-නෙමි යි, උපාලි පරහට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් මේ කරුණු පස තමා තුළ එළවා අන්‍යයා චෝදනා කළයුතු යි.

17. වහන්ස, අධර්මයෙන් චෝදනා කරන මහණහට කෙතෙක් අයුරෙකින් විපිළිසර ඉපදවියයුතු ද? යි.

උපාලි, අධර්මයෙන් චෝදනා කරන මහණහට පස් අයුරෙකින් විපිළිසර ඉපදවියයුතු: (එනම්) ආයුෂ්මත් තෙම නො කල්හි චෝදනා කෙළේ ය. සුදුසු කල්හි නො වේ. (එය) තොපට විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම අභූතයෙන් චෝදනා කෙළේ ය. සත්‍යයෙන් නො වේ. (එය) තොපට විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම රළු වදනින් චෝදනා කෙළේ ය. මොළොක් වදනින් නො වේ. (එය) තොපට විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම කරුණු ඇසුරු නො කොට චෝදනා කෙළේ ය. කරුණු ඇසුරු කොට නො වේ. (එය) තොපට විපිළිසර පිණිස පමණි, දුෂ්ට සිත් ඇති ව ආයුෂ්මත් තෙම චෝදනා කෙළේ ය. මෙත් සිත් ඇති ව නො වේ. (එය) තොපට විපිළිසර පිණිස පමණි (යනුයි). උපාලි, අධර්මයෙන් චෝදනා කරන මහණහට මේ පස් අයුරින් විපිළිසර ඉපදවියයුතු. ඒ කවර හෙයින යත්: යම්සේ අන් මහණෙකුදු අභූතයෙන් චෝදනා කළයුතු ය' යි නො හඟින්නේ ද (එහෙයිනි).

18. වහන්ස, අධර්මයෙන් චෝදනා කරනු ලැබූ මහණහට කෙතෙක් අයුරෙකින් නො විපිළිසර ඉපදවියයුතු ද? යි.

උපාලි, අධර්මයෙන් චෝදනා කරනු ලැබූ මහණහට පස් අයුරෙකින් නො විපිළිසර ඉපදවියයුතු: ආයුෂ්මත් තෙම අකාලයෙහි චෝදනා කරනු ලැබී ය. සුදුසු කාලයෙහි නො වේ. (එය) තොපට නො විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම අභූතයෙන් චෝදනා කරනු ලැබී ය. සත්‍යයෙන් නො වේ. (එය) තොපට නො විපිළිසර පිණිස පමණි. රළු වදනින් ආයුෂ්මත් තෙම චෝදනා කරනු ලැබී ය, මොළොක් වදනින් නො වේ. (එය) තොපට නො විපිළිසර පිණිස පමණි. කරුණු ඇසුරු නො කොට ආයුෂ්මත් තෙම චෝදනා කරනු ලැබී ය. කරුණු ඇසුරු කොට නො වේ (එය) තොපට නො විපිළිසර පිණිස පමණි. දුෂ්ට සිතින් ආයුෂ්මත් තෙම චෝදනා කරනු ලැබී ය. මෙත් සිතින් නො වේ. (එය) තොපට නො විපිළිසර පිණිස පමණ වේ යැ යි. උපාලි, අධර්මයෙන් චූදිත වූ මහණහට මේ පස් අයුරින් නො විපිළිසර ඉපදවියයුතු යි.

19. ධම්මචොදකස්ස භන්තෙ භික්ඛුනො කතිහාකාරෙහි අවිප්පටිසාරො උපදහාතබ්බොති?

ධම්මචොදකස්ස උපාලි භික්ඛුනො පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහාතබ්බො: කාලෙනායස්මා චොදෙසි නො අකාලෙන, අලං තෙ අවිප්පටිසාරාය. භූතෙනායස්මා චොදෙසි නො අභූතෙන. අලං තෙ අවිප්පටිසාරාය. සණ්හෙනායස්මා චොදෙසි නො ඵරුසෙන, අලං තෙ අවිප්පටිසාරාය. අත්ථසංහිතෙනායස්මා චොදෙසි නො අනත්ථසංහිතෙන, අලං තෙ අවිප්පටිසාරාය. මෙත්තචිත්තො ආයස්මා චොදෙසි නො දොසන්තරො. අලං තෙ අවිප්පටිසාරායාති. ධම්මචොදකස්ස උපාලි භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි අවිප්පටිසාරො උපදහාතබ්බො. තං කිස්ස හෙතු? යථා අඤ්ඤෙපි භික්ඛු භූතෙන චොදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

20. ධම්මචුදිතකස්ස[1] පන භන්තෙ භික්ඛුනො කතිහාකාරෙහි විප්පටිසාරො උපදහාතබ්බොති?

ධම්මචුදිතකස්ස උපාලි භික්ඛුනො පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහාතබ්බො: කාලෙනායස්මා චුදිතො නො අකාලෙන, අලං තෙ විප්පටිසාරාය. භූතෙනායස්මා චුදිතො නො අභූතෙන, අලං තෙ විප්පටිසාරාය, සණ්හෙනායස්මා චුදිතො නො ඵරුසෙන, අලං තෙ විප්පටිසාරාය. අත්ථසංහිතෙනායස්මා චුදිතො නො අනත්ථසංහිතෙන, අලං තෙ විප්පටිසාරාය. මෙත්තචිත්තෙනායස්මා චුදිතො නො දොසන්තරෙන, අලං තෙ විප්පටිසාරායාති. ධම්මචුදිතකස්ස[1] උපාලි භික්ඛුනො ඉමෙහි පඤ්චහාකාරෙහි විප්පටිසාරො උපදහාතබ්බොති.

21. චොදකෙන භන්තෙ භික්ඛුනා පරං චොදෙතුකාමෙන කතිධම්මෙ අජ්ඣත්තං මනසිකරිත්වා පරො චොදෙතබ්බොති?

චොදකෙනුපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං මනසිකරිත්වා පරො චොදෙතබ්බො: කාරුඤ්ඤතා හිතෙසිතා අනුකම්පතා[2] ආපත්තිවුට්ඨානතා විනයපුරෙක්ඛාරතාති. චොදකෙන උපාලි භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං මනසිකරිත්වා පරො චොදෙතබ්බොති.

---

1. ධම්මචුදිතස්ස – මජසං.
2. අනුකම්පිතා – මජසං.

19. වහන්ස, ධර්මයෙන් චෝදනා කරන මහණහට කෙතෙක් අයුරෙකින් නොවිපිළිසර ඉපදවියයුතු ද? යි.

උපාලි, ධර්මයෙන් චෝදනා කරන මහණහට පස් අයුරෙකින් නො විපිළිසර ඉපදවියයුතු: ආයුෂ්මත් තෙම සුදුසු කාලයෙහි චෝදනා කෙළේ ය, නො කල්හි නො වේ, (එය) තොපට නොවිපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම සත්‍යයෙන් චෝදනා කෙළේ ය, අසත්‍යයෙන් නො වේ, (එය) තොපට නො විපිළිසර පිණිස පමණි. මොළොක් වදනින් ආයුෂ්මත් තෙම චෝදනා කෙළේ ය රළු වදනින් නො වේ, (එය) තොපට නො විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම කරුණු ඇසුරු කොට චෝදනා කෙළේ ය, කරුණු නො ඇසුරු කොට නො වේ, (එය) තොපට නොවිපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම මෙත්සිතින් චෝදනා කෙළේ ය, දුෂ්ටසිතින් නො වේ, (එය) තොපට නො විපිළිසර පිණිස පමණ වේ යි. උපාලි, ධර්මයෙන් චෝදනා කරන මහණහට මේ පස් අයුරෙන් නො විපිළිසර ඉපදවියයුතු. ඒ කවර හෙයින් ද, යම්සේ අතික් මහණෙකුදු භූතයෙන් චෝදනා කළයුතු යැ' යි සිතන්නේ ද එහෙයිනි.

20. වහන්ස, ධර්මයෙන් චූදිත මහණහට කෙතෙක් අයුරෙකින් විපිළිසර ඉපදවියයුතු ද? යි.

උපාලි, ධර්මයෙන් චූදිත මහණහට පස් අයුරෙකින් විපිළිසර ඉපදවියයුතු: ආයුෂ්මත් තෙම සුදුසු කාලයෙහි චෝදනා කරන ලද අකාලයෙහි නො වේ, (එය) තොපට විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම සත්‍යයෙන් චෝදනා කරන ලද, අසත්‍යයෙන් නො වේ, (එය) තොපට විපිළිසර පිණිස පමණි. ආයුෂ්මත් තෙම මොළොක් වදනින් චෝදනා කරන ලද, රළු වදනින් නො වේ, (එය) තොපට විපිළිසර පිණිස පමණි. කරුණු ඇසුරු කොට ආයුෂ්මත් තෙම චෝදනා කරන ලද, කරුණු නො ඇසුරු කොට නො වේ, (එය) තොපට විපිළිසර. පිණිස පමණි. මෙත්සිතින් ආයුෂ්මත් තෙම චෝදනා කරන ලද, දුෂ්ට සිතින් නො වේ. (එය) තොපට විපිළිසර පිණිස පමණි යි. උපාලි, ධර්මයෙන් චූදිත මහණහට මේ පස් අයුරින් විපිළිසර ඉපදවියයුතු යි.

21. වහන්ස, පරහට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් කෙතෙක් ධර්ම තමා තුළ මෙනෙහි කොට අන්‍යයා චෝදනා කළයුතු ද? යි.

උපාලි පරහට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් කරුණු පසක් තමා තුළ මෙනෙහි කොට අන්‍යයා චෝදනා කළ යුතු: කරුණාවත් බව, හිත කැමැති බව, අනුකම්පා ඇති බව, ඇවතින් නඟා සිටුවන බව, විනය පෙරටු කොට ඇති බව (යන පස යි.) උපාලි පරහට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් මේ කරුණු පස තමා තුළ මෙනෙහි කොට අන්‍යයා චෝදනා කළයුතු යි.

චූදිතකෙන[1] පන භන්තෙ භික්ඛුනා කතිසු ධම්මෙසු පතිට්ඨාතබ්බන්ති?

චූදිතකෙනුපාලි භික්ඛුනා ද්විසු ධම්මෙසු පතිට්ඨාතබ්බං: සච්චෙ ච අකුප්පෙ චාති.

### දුතිය භාණවාරං.

## පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකං නවමං.

ඉමම්හි ඛන්ධකෙ වත්ථු තිංස,

තස්සුද්දානං:

1. උපොසථො යාවතිකං පාපභික්ඛු න නික්ඛමි
මොග්ගල්ලානෙන නිච්ඡුද්ධො අච්ඡරියං ජිනසාසනෙ

2. නින්නානුපුබ්බසික්ඛා ච ඨිතධම්මා නාතික්කම[2]
කුණපුක්ඛිපති සඞ්ඝො සවන්තියො ජහන්ති ච.

3. සවන්ති පරිනිබ්බන්ති එකරස විමුත්ති ච
බහු ධම්මවිනයොපි භූතට්ඨාරියපුග්ගලා.

4. සමුද්දං උපමං කත්වා වාචෙසි සාසනෙ ගුණං
උපොසථෙ පාතිමොක්ඛං න අම්හෙ කොචි ජානාති.

5. පටිගච්චෙව උජ්ඣන්ති එකො ද්වෙ තීණි චත්තාරි
පඤ්ච ඡ සත්ත ච අට්ඨ නව ච දසමානි ච.

6. සීල ආචාර දිට්ඨී ච ආජීවං චතුභාගිකෙ[3]
පාරාජිකං ච සඞ්ඝාදි පාචිත්ති පාටිදෙසනි.

7. දුක්කටං පඤ්චභාගෙසු සීලාචාර විපත්ති ච
අකතාය කතාය ච ඡ භාගෙසු යථාවිධි.

8. පාරාජිකඤ්ච සඞ්ඝාදි ථුල්ල පාචිත්තියෙන ච
පාටිදෙසනීයඤ්චෙව දුක්කටං ච දුබ්භාසිතං.

9. සීලාචාරවිපත්ති ච දිට්ඨි ආජීව විපත්ති
යා ච අට්ඨා කතාකතෙ තෙනෙතා සීලාචාර දිට්ඨියා

10. අකතාය කතාය පි කතාකතාය මෙව ච
එවං නවවිධා වුත්තා යථාභූතෙන ඤායතො.[4]

11. පාරාජිකො විප්පකතො පච්චක්ඛාතො තථෙව ච
උපෙති පච්චාදියති පච්ච දනකථා ච යා.

---

1. චූදිතෙන - මජසං
2. නාතික්කමෙ - මජසං
3. චතුසාවකෙ - සතා.
4. ජානතා - සතා.

වහන්ස, චොදනා කරන ලද මහණහු විසින් කෙතෙක් ධර්මයන්හි පිහිටියයුතු ද? යි

උපාලි, චොදනා කරන ලද මහණහු විසින් සත්‍යය, නො කිපෙනසුලු බව යන දෙකරුණෙහි පිහිටියයුතු යි.

# දෙවැනි බණවර

## නවවැනි පාතිමොක්ඛට්ඨපන ඛන්ධක යි.

මේ ඛන්ධකයෙහි වස්තු තිසකි.

**එහි උද්දානය:**

1. උපොසථය, බාහුවෙන් ගෙන බැහැර කරන තෙක් පවිටු මහණ නො නික්මීම, මුගලන් තෙරුන් විසින් බැහැර කිරීම. ජින ශාසනයෙහි ආශ්වර්‍ය්‍යධර්ම,
2. අනුපුබ්බනින්න, අනුපුබ්බසික්ඛා, ඨිතධම්ම, නාතික්කමන, සඞ්ඝයා කුණපයන් (දුශ්ශීල භික්ෂූන්) බැහැර කිරීම, මහානදීන් (ස්වකීය නම්ගොත්) අත්හැරීම,
3. මහමුහුදට ගංගා ගැලීම නිසා (අඩුවැඩි බවක් නොවීම) භික්ෂූන් පිරිනිවීම, විමුක්තිරස නම් වූ එකරසය ධර්මවිනයෙහි බහුල බව, මහාභූත අෂ්ටාර්‍ය්‍යපුද්ගල,
4. සමුද්‍ර උපමා කොට සාසනයෙහි ගුණ ප්‍රකාශ කිරීම, උපොසථයෙහි පාමොක් උදෙසීම, අප කිසිවකු නො දනිති යි සිතීම,
5. පෙරාතුව මැ හෙළා දකීම, එකේ පටන් දහය තෙක් දහැමි නො දහැමි පාමොක් තැබීම,
6. සීල, ආචාර, දිට්ඨි, ආජීව යන විපත්ති සතර (අමූලික) පාරාජිකා සඞ්ඝාදිසෙස, පාචිත්තිය, පාටිදෙසනීය,
7. දුක්කට යන පඤ්චභාගය, අකත, කත වශයෙන් පිළිවෙළින් සවැදෑරුම් වූ සීල, ආචාර, දිට්ඨි විපත්ති,
8. පාරාජිකා, සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට දුබ්භාසිත ද,
9. අකත, කත වශයෙන් අට වැදෑරුම් වූ සීල, ආචාර, දිට්ඨි, ආජීව විපත්ති, එසේ ම ඒ සීල, ආචාර, දිට්ඨි විපත්ති,
10. කත, අකත, කතාකත වශයෙන් න්‍යායානුකූල ව නවවිධ වීම ද,
11. පාරාජික, විප්පකත පච්චක්ඛාත, එසේම උපෙතුය (සමගියට පැමිණීම), පච්චාදන කථා ය,

12. සීලාචාර විපත්ති ච යථා දිට්ඨිවිපත්තියා
දිට්ඨසුතපරිසඞ්කි දසධා තං විජානථ.[1]

13. භික්ඛු විපස්සති භික්ඛුං අඤ්ඤො චාරො චායතනං[2]
සුද්ධො ච තස්ස අක්ඛාති පාතිමොක්ඛං ඨපෙති සො.

14. වුට්ඨාති අන්තරායෙන රාජචොරග්ගුදකා ච,
මනුස්ස අමනුස්සා ච වාළ සිරිංසපජීවබ්‍රහ්මං[3]

15. දසන්නමඤ්ඤතරෙන තස්මිං අඤ්ඤතරෙසු වා
ධම්මිකාධම්මිකා චෙව යථා මග්ගෙන ජානථ.[4]

16. කාලභූතත්ථසංහිතං ලභිස්සාමි භවිස්සති
කායවාචසිකා මෙත්තා බාහුසච්චං උභයානි.

17. කාලභූතෙන සණ්හෙන අත්ථමෙත්තෙන චොදයෙ
විප්පටිසාරධම්මෙන තථා වාචා විනොදයෙ.

18. ධම්මචොද චුදිතස්ස විනොදෙති විප්පටිසාරො
කරුණා හිතානුකම්පී වුට්ඨානපුරෙක්ඛාරතා.

19. චොදකස්ස පටිපත්ති සම්බුද්ධෙන පකාසිතා
සච්ච චෙව අකුප්ප ච චුදිතස්ස ච ධම්මතාති.

1. විජානාථ - මජසං.
2. චයන්තිං - මජසං
3. සරිසපාජීවිබ්‍රහ්මං - මජසං
4. ජානාථ - මජසං

12. සීල, ආචාර, දිට්ඨි, විපත්තින්ගේ දිට්ඨ සුත පරිසඞ්කිත වශයෙන් ඒ දසාකාරය දැනගනිවු,

13. මහණ, පාරාජිකාවට පැමිණි මහණකු දැකීම, අනිකකු හෝ ආරොචනය කිරීම, ඔහු හෝ තමා ම දන්වීම ඇති කල්හි පාමොක් උදෙසීම බහා තැබීම වේ.

14. රාජ, චොර, අග්ගි, උදක, මනුස්ස, අමනුස්ස, වාළ, සිරිංසප, ජීවිතබ්‍රහ්මචරිය යන දස අන්තරායන් ඇති කල්හි සඞ්ඝයා නැගී සිටීම,

15. දසවිධ අන්තරාය ඇති කල්හි ඒ ආවාසයෙහි හෝ අන් ආවාසයක හෝ (විනිශ්චය කිරීම) දැහැමි, නො දැහැමි පාමොක් තැබීම් ද ක්‍රමයෙන් දන්නේ ය.

16. කාල, භූත, අත්ථසංහිත, (පක්ෂ භික්ෂූන්) ලැබීම. (දෙස් කියන්නන්) ඇතිවීම, කායසමාචාර, වචීසමාචාර, මෛත්‍රචිත්ත, බහුශ්‍රුත බව, උභයප්‍රාතිමොක්ෂය ප්‍රගුණ බව,

17. කාල, භූත, සණ්හ, මෛත්‍රචිත්ත යන කරුණු අනුව චොදනා කිරීම, දැහැමි නො දැහැමි වශයෙන් විපිළිසර ඇතිවීම, එසේ ම වචනයෙන් විපිළිසර දුරු කිරීම,

18. දැහැමි චොදක චුදිතයන්ගේ විපිළිසර දුරු කිරීම, කරුණාව, හිතෛෂී බව, ඇවතින් නගා සිටුවීම පෙරටු කොට ඇති බව (යන කරුණු)

19. චොදකගේ පිළිවෙත් බව ද, සත්‍යය හා නො කිපීම චුදිතගේ ධර්මතා බව ද සම්බුදුන් විසින් වදරන ලද්දේ යි.

# 10. භික්ඛුනීක්ඛන්ධකං

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහාපජාපති ගොතමී යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: "සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති."

"අලං ගොතමී, මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජා"ති.

දුතියම්පි ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: "සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො -පෙ- පබ්බජ්ජන්ති".

"අලං ගොතමී, මා තෙ රුච්චි මාතුගාමස්ස -පෙ- පබ්බජ්ජා"ති.

තතියම්පි ඛො මහාපජාපති ගොතමී භගවන්තං එතදවොච: "සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති".

"අලං ගොතමී, මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජා"ති.

අථ ඛො මහාපජාපති ගොතමී "න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති" දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා කපිලවත්ථුස්මිං යථාභිරන්තං විහරිත්වා යෙන වෙසාලි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන වෙසාලි තදවසරි, තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.

# 10. භික්ඛුනී ඛන්ධකය.

1. එ සමයෙහි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශාක්‍ය රටෙහි කිඹුල්වත් නුවර අසල නුගඅරමෙහි වැඩ වසනසේක. එ කලැ මහාප්‍රජාවතී ගෞතමී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියා ය. එළඹ ඔබ වැඳ එක් පසෙක සිටියා ය. එක් පසෙක සිටියා වූ මහාප්‍රජාවතී ගෞතමී තොමෝ ''වහන්ස, තථාගතයන් වහන්සේ දැන වදළ දහම් විනය ඇති සස්නෙහි මාගම ද ගිහිගෙන් නික්ම පැවිද්ද ලබන්නී නම් මැනවැ''යි. භාග්‍යවතුන් වහන්සේට මෙ බස් පැවැසුවා ය.

''ගෞතමීනි, කම් නැත. තථාගතයන් දැන හෙළි කළ සස්නෙහි ගිහිගෙන් නික්ම මාගමක්හු පැවිදි වනු ඔබට රිසි නො වේවා''යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

දෙවෙනි වරද මහාප්‍රජාවතී ගෞතමී තොමෝ ... වහන්ස, මාගම ... පැවිද්ද ලබන්නී නම් මැනැවැ''යි කීවා ය.

''ගෞතමීනි, කම් නැත ... මාගමක්හු පැවිදි වනු ඔබට රිසි නො වේවා''යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

තෙවෙනි වරද මහාප්‍රජාවතී ගෞතමී තොමෝ වහන්ස, මාගම පැවිද්ද ලබන්නී නම් මැනැවැ''යි කීවා ය.

''ගෞතමීනි, කම් නැත. තථාගතයන් දැන හෙළි පෙහෙළි කළ සස්නෙහි මාගමක පැවිදිවනු ඔබට රිසි නො වේවා'' යි. භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

ඉක්බිති මහාප්‍රජාවතී ගෞතමී ''මාගමට ගිහිගෙන් නික්ම තථාගත ප්‍රවිදිත සස්නෙහි පැවිද්ද භාග්‍යවතුන් වහන්සේ නො අනුදන්නාසේකැ''යි දුක් ඇත්තී, දොම්නස් ඇත්තී, කඳුළුපිරි මුහුණ ඇත්තී හඬමින් භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මගියා ය. එයට පසු භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්හි කැමැති තාක් වැස විසල්පුර බලා නික්මැ සැරිසරා වැඩිසේක. පිළිවෙළින් සැරිසරා වඩනාසේක්, විසල් පුරට පැමිණවදළසේක. එ කලැ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසල්පුර මහවෙනෙහි කූළාරහල්හි වැඩ වසනාසේක.

අථ ඛො මහාපජාපති ගොතමී කෙසෙ ඡෙදාපෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා සම්බහුලාහි සාකියානීහි සද්ධිං යෙන වෙසාලි තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන වෙසාලි මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමි. අථ ඛො මහාපජාපති ගොතමී සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා බහිද්වාරකොට්ඨකෙ අට්ඨාසි අද්දසා ඛො ආයස්මා ආනන්දො මහාපජාපතිං ගොතමිං සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛිං දුම්මනං අස්සුමුඛිං රුදමානං බහිද්වාරකොට්ඨකෙ ඨිතං, දිස්වාන මහාපජාපතිං ගොතමිං එතදවොච: "කිස්ස ත්වං ගොතමී සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා බහිද්වාරකොට්ඨකෙ ඨිතා''ති. "තථා හි පන භන්තෙ ආනන්ද න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.''

2. තෙන හි ත්වං ගොතමී මුහුත්තං ඉධෙව තාව හොහි, යාවාහං භගවන්තං යාචාමි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: එසා භන්තෙ මහාපජාපති ගොතමී සූනෙහි පාදෙහි රජො කිණ්ණෙන ගත්තෙන දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා බහිද්වාරකොට්ඨකෙ ඨිතා "න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති'', සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

"අලං ආනන්ද. මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජා''ති.

දුතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො -පෙ- පබ්බජ්ජන්ති.

"අලං ආනන්ද මා තෙ රුච්චි මාතුගාමස්ස -පෙ- පබ්බජ්ජා''ති.

තතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො -පෙ- පබ්බජ්ජන්ති.

අලං ආනන්ද මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජා''ති.

එ කලැ මහාප්‍රජාපතී ගෞතමී කෙහෙ සිඳුවා කසාවත් හැඳ බොහෝ ශාක්‍යස්ත්‍රීන් කැටුව විසල්පුර බලා නික්මියා ය. පිළිවෙළින් ගොස් විසල්පුර මහවෙනෙහි කූළාරහලට එළැඹියා ය. එක්බිති මහාප්‍රජාපතී ගෞතමී ඉදිමුණු පයින් දූහුවිලී වැකි ගතින් යුතු වැ දුක් ඇත්තී දෙමනස් ඇත්තී කඳුළු පිරි මුහුණ ඇත්තී හඬමින් බිහිදෙරකොටුයෙහි සිටියා ය. එසේ සිටුනා ප්‍රජාපතී ගෞතමිය ආනන්ද තෙරණුවෝ දුටුවාහ. දැක "ගෞතමීනි, කවර හෙයින් තෙපි ඉදිමැගිය පයින් දූහුලි වැකි ගතින් යුතුව දුක් ඇත්තෝ, දෙමනස් ඇත්තෝ, කඳුළු පිරි මුහුණැත්තෝ හඬන්නෝ මේ බිහි දෙරකොටුයෙහි සිටිවූ දැ?"යි විචාළාහ. "ආනන්දයන් වහන්ස,එසේ මැ යැ. භාග්‍යවතුන් වහන්සේ මාගමට ගිහිගෙන් නික්ම තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිදි වන්නට නො අනුදන්නා සේකැ''යි ඕ කීවා ය.

2. එසේ වී නම් ගෞතමීනි, මා මාගමට ගිහිගෙන් නික්මැ තථාගතප්‍රවිදිත සස්නෙහි පැවිද්දට භාග්‍යවතුන් වහන්සේට යාච්ඤා කොට එන තෙක් තව මොහොතක් මෙහි ම පොරොත්තු වන්නැ''යි අනඳ තෙරණුවෝ වදළහ.

එක්බිති ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා වැඩියාහ. වැඩ ඔබ වැඳ පසෙක උන්හ. පසෙක හුන් ආනන්ද තෙරණුවෝ "වහන්ස මේ මහාප්‍රජාපතී ගෞතමී ඉදිමුණු පයින් දූලි වැකි ගතින් යුතුවැ ''භාග්‍යවතුන් වහන්සේ මාගමට තථාගතප්‍රවිදිත ශාසනයෙහි ගිහිගෙන් නික්ම පැවිද්දට නො අනුදන්නාසේකැ''යි දුක් ඇත්තී දෙමනස් ඇත්තී, කඳුළුපිරි මුහුණ ඇත්තී හඬමින් සිටියා වෙයි. වහන්ස, මාගම තථාගතප්‍රවිදිත ශාසනයෙහි ගිහිගෙන් නික්ම පැවිද්ද ලබන්නී නම් මැනැවැ''යි වදළහ.

''කම් නැත අනඳයෙනි, මාගමට ගිහිගෙන් නික්මැ තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිද්ද තොපට රිසි නො වේවා''යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

දෙවෙනි වර ද අනඳ තෙරණුවෝ ''වහන්ස, මාගම පැවිද්ද ... ලබන්නී නම් මැනැවැ'' යි වදළහ.

''අනඳයිනි, මාගමට ... පැවිද්ද තොපට රිසි නො වේවා''යි වදළ සේක.

තෙවෙනි වරද ආනන්ද තෙරණුවෝ ''වහන්ස, මාගම ... පැවිද්ද ලබන්නී නම් මැනැවැ"යි වදළහ.

''ආනන්දයිනි, මාගමට ... පැවිද්ද තොපට රිසි නො වේවා"යි (තෙවෙනි වරද) භාග්‍යවතුන් වහන්සේ වදළහ.

අථ ඛො ආයස්මා ආනන්දො "න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජං යන්නූනාහං අඤ්ඤෙනපි පරියායෙන භගවන්තං යාචෙය්‍යං මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති". අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "භබ්බො නු ඛො භන්තෙ මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකාතුන්ති"?

"භබ්බො ආනන්ද මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා සොතාපත්තිඵලම්පි සකදාගාමිඵලම්පි අනාගාමිඵලම්පි අරහත්තම්පි සච්ඡිකාතුන්ති".

"සචෙ භන්තෙ භබ්බො මාතුගාමො -පෙ- අරහත්තම්පි සච්ඡිකාතුං බහූපකාරා භන්තෙ මහාපජාපතී ගොතමී භගවතො මාතුච්ඡා ආපාදිකා පොසිකා ඛීරස්ස දායිකා භගවන්තං ජනෙත්තියා කාලකතාය ථඤ්ඤං පායෙසි. සාධු භන්තෙ ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති".

3. "සචෙ ආනන්ද මහාපජාපතී ගොතමී අට්ඨ ගරුධම්මෙ පටිග්ගණ්හාති සාවස්සා හොතු උපසම්පදා.

වස්සසතූපසම්පන්නාය භික්ඛුනියා තදහූපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං, අයම්පි ධම්මො-පෙ-යාවජීවං අනතික්කමනීයො.

අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා: උපොසථපුච්ඡකඤ්ච ඔවාදූපසඞ්කමනඤ්ච. අයම්පි ධම්මො -පෙ- යාවජීවං අනතික්කමනීයො.

වස්සං වුත්ථාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං: දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. අයම්පි ධම්මො -පෙ-යාව ජීවං අනතික්කමනීයො.

ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං, අයම්පි ධම්මො -පෙ- යාවජීවං අනතික්කමනීයො.

ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය උභතො සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා, අයම්පි ධම්මො -පෙ- යාවජීවං අනතික්කමනීයො.

එකල ආනන්ද තෙරණුවෝ "භාග්‍යවතුන් වහන්සේ මාගමට ගිහිගෙන් නික්මැ තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිද්ද නො අනුදන්නාසේක. අන් වටා මහෙකිනුත් මාගමට ගිහිගෙන් නික්මැ තථාගතප්‍රවිදිත සස්නෙහි පැවිද්ද යදනෙම් නම් මැනැවැ"යි සිතූහ. ඉක්බිති අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගෙන් "වහන්ස, මාගම ගිහිගෙන් නික්ම තථාගතප්‍රවිදිත සස්නෙහි පැවිදි වැ සොවත්පල හෝ සෙදගැමිපල හෝ අනගැමිපල හෝ රහත්පල හෝ පසක් කරන්නට භව්‍ය දැ"? (හැකි දැ?) යි විචාළහ.

"අනදයෙනි, මාගම ගිහිගෙන් නික්මැ තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිදි වැ සොවත්පල සෙදගැමිපල අනගැමිපල රහත්පල පසක් කරන්නට භව්‍ය යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

"වහන්ස, මාගම ... රහත්පල පසක් කරන්නට භව්‍ය වේ නම් ... වහන්ස මහාප්‍රජාවතී ගෞතමී භාග්‍යවතුන් වහන්සේට (කළ) බොහෝ උපකාර ඇත්තී ය, කුඩා මෑණියෝ ය, ආපාදිකා යැ, වැඩූ යැ, පොෂණය කළ තැනැත්තී ය, කිරි දුන් තැනැත්තී ය, මව කලුරිය කළ කල්හි සිය තනයෙන් කිරි පෙවූවා ය. වහන්ස, මාගම ගිහිගෙන් නික්ම තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිද්ද ලබන්නී නම් යෙහෙකැ"යි අනද තෙරණුවෝ වදළහ.

3. "අනදයෙනි, මහාප්‍රජාවතී ගෞතමී ගරු දහම් අටක් පිළිගන්නී නම්, එය ම ඇයගේ උපසම්පත්ති වේවා. මේ ඒ ගරු දහම් අට ය:

උපසපන් වැ සියක් වස් වූ මෙහෙණ විසින් එදවස් උපසපන් වූ මහණහට වැඳුම දැක හුනස්නෙන් නැඟී සිටීම දෙහොත් මුදුන් තබා නැමදීම සාමීචි කර්මය නිසිවත් කළයුතු. මේ දහම ද සකසා ගුරු කොට බුහුමන් කොට පුද යවදිව් නො ඉක්මැ රැක්කයුතු.

මෙහෙණ විසින් භික්ෂූන් නැති ගමෙකැ වූ ආවාසයෙකැ වස් නො විසියැයුතු. මේ දහම ද ... යවදිව් නො ඉක්මියැයුතු.

අඩමසක් පාසා මෙහෙණ විසින් බික්සඟන කෙරෙන් පොහෝ විචාරීම ද ඔවා ලබනුවස් එළැඹීම ද යන දෙ දහම් අපෙක්ෂා කළ යුතු. මේ දහම ද ... යවදිව් නො ඉක්මියැයුතු.

වස් වුසූ මෙහෙණ විසින් භික්ෂු භික්ෂුණී යන දෙසඟ පිරිස්හි ම දුටු දැයින් ඇසූ දැයින් සැකකළ දැයින් යන තුන් දැයින් පැවැරියයුතු. මේ දහම ද ... යවදිව් නො ඉක්මියැයුතු.

ගරු ඇවැත් අවන් මෙහෙණ විසින් දෙ සඟන කෙරෙහි පක්ෂ මානත පිරියැයුතු. මේ දහම ද ... යවදිව් නො ඉක්මියැයුතු.

දෙ හවුරුද්දක් දහම් සයෙක්හි හික්මුණු සිව් ඇති හික්මෙන්නිය විසින් දෙ සඟන වෙතැ උපසපුව සෙවියැයුතු. මේ දහමුදු ... යවදිව් නො ඉක්මියැයුතු.

න භික්ඛුනියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බො පරිභාසිතබ්බො, අයම්පි ධම්මො - පෙ- අනතික්කමනීයො.

අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො, අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො, අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

සචෙ ආනන්ද මහාපජාපතී ගොතමී ඉමෙ අට්ඨ ගරුධම්මෙ පතිගණ්හාති සා'වස්සා හොතු උපසම්පදා''ති.

අථ ඛො ආයස්මා ආනන්දො භගවතො සන්තිකෙ අට්ඨ ගරුධම්මෙ උග්ගහෙත්වා යෙන මහාපජාපතී ගොතමී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මහාපජාපතිං ගොතමිං එතදවොච: ''සචෙ ඛො ත්වං ගොතමි අට්ඨ ගරුධම්මෙ පටිගණ්හෙය්‍යාසි සා'ව තෙ භවිස්සති උපසම්පදා.

වස්සසතුපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං -පෙ- අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො., අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො''.

සචෙ ඛො ත්වං ගොතමී ඉමෙ අට්ඨ ගරුධම්මෙ පටිගණ්හෙය්‍යාසි ''සාව තෙ භවිස්සති උපසම්පදා''ති.

''සෙය්‍යථාපි භන්තෙ ආනන්ද ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං නහාතො උප්පලමාලං වා වස්සිකමාලං වා අතිමුත්තකමාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨාපෙය්‍ය, එවමෙව ඛො අහං භන්තෙ ආනන්ද ඉමෙ අට්ඨ ගරුධම්මෙ පටිගණ්හාමි යාවජීවං අනතික්කමනීයෙ''ති.

4. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: පටිග්ගහිතා භන්තෙ මහාපජාපතියා ගොතමියා අට්ඨ ගරුධම්මා උපසම්පන්නා භගවතො මාතුච්ඡා''ති.

මෙහෙණ විසින් කිසිදු කරුණෙකින් මහණ තෙම ආක්‍රොශ පරිභව නො කළයුතු. මේ දහම ද .. යවදිව නො ඉක්මියැයුතු.

අද සිට ඉදිරියට මෙහෙණනට මහණුන් විසාහි (මෙසේ යව, මේ දැ කරව ඈ විසින්) අණ දෙනු විසින් කථා මහ හවුරන ලදුයේ ය, මෙහෙණන් විසාහි මහණුනට කථා මහ නො හැවුරුණේ ය. මේ දහම ද සකසා ගුරු කොට බුහුමන් කොට පුදු යවදිව නො ඉක්මියැයුතු ය.

අනදයෙනි, මහාප්‍රජාපතී ගෞතමී මේ ගුරු දහම් අට පිළිගනී නම් එය මැ ඇගේ උපසපුව වන්නේ යැ''යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

එකලැ අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙතැ මේ අට ගුරු දහම් ඉගෙනැ මහාප්‍රජාපතී ගෞතමීන් කරා එළැඹ, ''ගෞතමීනි, ඉදින් තෙපි මේ ගුරු දහම් අට පිළිගන්නහු නම් එය ම තොපට උපසපුව වන්නේ ය:

''උපසපුවෙන් සිය වස් වූ ද මෙහෙණ විසින් එදවස් උපසපන් වූ මහණහට වැඳීම දක හුනස්නෙන් නැඟී සිටීම, දෙහොත් මුදුන් තබා නැමැදීම, සාමීචි කර්මය කළයුතු ... අද සිට ඉදිරියට මෙහෙණනට මහණුන් විසාහි (මෙසේ යව, මේ දැ කරව ආදීන්) අණ දෙනු විසින් කතාමහ හවුරන ලද්දේ ය. මෙහෙණන් විසාහි මහණුනට කතාමහ නො හැවුරුණේ ය. මේ දහම ද සකසා ගුරු කොට බුහුමන් කොට පුදු යවදිව නො ඉක්මියැයුතු ය.

ගෞතමීනි, ඔබ මේ ගුරු දහම් අට පිළිගන්නාහු නම්, එය ම තොපට උපසපුව වන්නේ යැ''යි වදළහ.

''ආනන්‍දයන් වහන්ස, කය සරසන සුලු තරුණ යොවුන් වියෙහි සිටි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඉස සොද නැයේ උපුල් මල්දමක් හෝ වස්සික (සමන්)මල්දමක් හෝ අතිමුත්තක (යොහොඹු) මල්දමක් හෝ ලැබ දෙහොතින් පිළිගෙන උත්තමාඞ්ග වූ හිසෙහි පිහිටුවන්නේ ද ආනන්‍දයන් වහන්ස, එසේ ම මම මේ යවදිව නො ඉක්මියැයුතු ගුරු දහම් අට පිළිගනිමි''යි ප්‍රජාපතී ගෞතමී කීවා ය.

4. ඉක්බිති අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ වැඳ පසෙක ඉඳගත්හ. පසෙක හුන් අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, මහාප්‍රජාපතී ගෞතමීන් විසින් ගුරුදහම් අට පිළිගැනිණ. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළුමෑණියන් දැ උපසපුව ලැබූහ''යි කීහ.

''සචෙ ආනන්ද නාලභිස්ස මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජං, චිරට්ඨිතිකං ආනන්ද බ්‍රහ්මචරියං අභවිස්ස වස්සසහස්සං සද්ධම්මො තිට්ඨෙය්‍ය. යතො ච ඛො ආනන්ද මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො න'දානි ආනන්ද බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං භවිස්සති. පඤ්චෙව'දානි ආනන්ද වස්සසතානි සද්ධම්මො ඨස්සති.

සෙය්‍යථාපි ආනන්ද යානි කානිචි කුලානි බහුඉත්ථිකානි[1] අප්පපුරිසකානි තානි සුප්පධංසියානි හොන්ති චොරෙහි කුම්භත්ථෙනකෙහි, එවමෙව ඛො ආනන්ද යස්මිං ධම්මවිනයෙ ලභති මාතුගාමො අගාරස්මා අනගාරියං පබ්බජ්ජං, න තං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං හොති.

සෙය්‍යථාපි ආනන්ද සම්පන්නෙ සාලික්ඛෙත්තෙ සෙතට්ඨිකා නාම රොගජාති නිපතති, එවං තං සාලික්ඛෙත්තං න චිරට්ඨිතිකං හොති. එවමෙව ඛො ආනන්ද යස්මිං ධම්මවිනයෙ ලභති මාතුගාමො අගාරස්මා අනගාරියං පබ්බජ්ජං, න තං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං හොති. සෙය්‍යථාපි ආනන්ද සම්පන්නෙ උච්ඡුක්ඛෙත්තෙ මඤ්ජෙට්ඨිකා නාම රොගජාති නිපතති එවං තං උච්ඡුක්ඛෙත්තං න චිරට්ඨිතිකං හොති, එවමෙව ඛො ආනන්ද යස්මිං ධම්මවිනයෙ ලභති මාතුගාමො අගාරස්මා අනගාරියං පබ්බජ්ජං න තං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං හොති.

සෙය්‍යථාපි ආනන්ද පුරිසො මහතො තළාකස්ස පටිගච්චෙව[2] ආළිං බන්ධෙය්‍ය, යාවදෙව උදකස්ස අනතික්කමනාය, එවමෙව ඛො ආනන්ද මයා පටිගච්චෙව භික්ඛුනීනං අට්ඨ ගරුධම්මා[3] පඤ්ඤත්තා යාවජීවං අනතික්කමනීයා''ති.

### භික්ඛුනීනං අට්ඨ ගරුධම්මා.

5. අථ ඛො මහාපජාපතී ගොතමී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: ''කථාහං භන්තෙ ඉමාසු සාකියානීසු පටිපජ්ජාමී''ති.

අථ ඛො භගවා මහාපජාපතිං ගොතමිං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො මහාපජාපතී ගොතමී භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: ''අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනියො උපසම්පාදෙතුන්ති''.

---

1. බහුත්ථිකානි - මජසං
2. පටිකච්චෙව - මජසං
3. අට්ඨගරුධම්මෙ - ත. මජසං

"ආනන්දයෙනි, මාගම ගිහිගෙන් නික්මැ තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිද්ද නො ලද නම්, මේ සසුන් බඹසර චිරස්ථිතික වන්නේ ය. මේ ශාසන සද්ධර්මය හවුරුදු දහසක් සිටුනේ ය. ආනන්දයෙනි, යම් හෙයෙකින් මාගම ගිහිගෙන් නික්ම තථාගතප්‍රවිදිත ශාසනයෙහි පැවිදි වූ ද එහෙයින් දැන් මේ සසුන් බඹසර චිරස්ථිතික නො වන්නේ ය. දැන් මෙතැන් සිට පන්සිය වසක් ම ශාසන සද්ධර්මය සිටුනේ ය.

ආනන්දයෙනි, යම්සේ බොහෝ ස්ත්‍රීන් ඇති ගණනින් අල්ප පිරිමින් ඇති යම්කිසි කුල කෙනෙක් වෙත් ද ඒ කුලයෝ කළය තුළැ දල් වූ පහන් එළියෙන් බඩු සොරා ගන්නා සොරුන් විසින් පහසුවෙන් මැඩලිය හෙත් ද ආනන්දයෙනි, එසේම යම් සස්නෙක මාගම ගිහිගෙන් නික්මැ පැවිද්ද ලබා ද එ සස්න චිරස්ථිතික නො වන්නේ ය.

ආනන්දයෙනි, සම්පූර්ණ වූ හැල් කෙතෙක සෙතට්ඨිකා නම් රොග විශේෂය වැදගනී නම් මෙසේ කල ඒ හැල් කෙත බොහෝ කල් නො පවතී ද, ආනන්දයෙනි, එසේ ම යම් සස්නෙක මාගම ගිහිගෙන් නික්මැ සසුන් පැවිද්ද ලබා ද ඒ සස්න (මාර්ගබ්‍රහ්මචර්යාව) චිරස්ථිතික නො වේ. ආනන්දයෙනි, ... උක් වත්තෙක මංජෙට්ඨිකා නම් (කඳ තුළ රත් පැහැ ගන්වන) රොග විශෙෂය වැදගනී නම් මෙසේ ඒ උක්වත්ත චිරස්ථිතික නො වේ ද, ආනන්දයෙනි, එ පරිදිම යම් සස්නෙක මාගම ගිහිගෙන් නික්මැ සසුන් පැවිද්ද ලබා ද ඒ සස්න (මාර්ගබ්‍රහ්මචර්යාව) චිරස්ථිතික නො වෙයි.

ආනන්දයෙනි, පුරුෂයෙක් මහවැවක දිය එය ඉක්මැ පිටත ගැලීම වළක්වනු පිණිස කල් තබා ම මියරක් බඳනේ ද එසේ ම ආනන්දයෙනි, මා විසින් යවදිව නො ඉක්මියයුතු (කඩ නො කළ යුතු) ගරුධර්ම අටෙක් කල් තබා ම මෙහෙණනට පනවන ලදැ'' යි.

**මෙහෙණන් සඳහා පනවන ලද ගරු දහම්.**

5. ඉක්බිත්තෙන් මහාපජාපතී ගොතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියා ය. එළැඹ ඔබ වැඳ පසෙක සිටියා ය. පසෙක සිටි මහාපජාපතී ගොතමී "වහන්ස මම මේ ශාක්‍යානීන් කෙරෙහි කෙසේ නම් පිළිපදිම් දැ?''යි භාග්‍යවතුන් වහන්සේට මෙ බස පැවැසුවා ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහාපජාපතී ගොතමියට දහැමි කථායෙන් කරුණු දක්වූසේක, කරුණු ගැන්වූසේක. එහි උනන්දු කළසේක, සතුටු කළසේක. ඉක්බිති මහාපජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කථායෙන් කරුණු දක්වන ලදු වැ කරුණු ගන්වන ලදුවැ, උත්සාහවත් කරන ලදුවැ සතුටු කරන ලදුවැ, ඔබ වැඳ පැදකුණු කොට නික්මියා ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කරුණෙහි දහැමි කථා කොට භික්ෂූන් බණවා, "මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණන් උපසපන් කරන්නට අනුදනිමි''යි වදළසේක.

6. අථ ඛො තා භික්ඛුනියො මහාපජාපතිං ගොතමිං එතද වොචුං. “අය්‍යා අනුපසම්පන්නා මයම්හා උපසම්පන්නා. එවං හි භග වතා පඤ්ඤත්තං: “භික්ඛූහි භික්ඛුනියො උපසම්පාදෙතබ්බා”ති.

අථ ඛො මහාපජාපතී ගොතමී යෙනායස්මා ආනන්දො තෙනු සඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී ආයස්මන්තං ආනන්දං එතදවොච: “ඉමා මං භන්තෙ ආනන්ද භික්ඛුනියො එවමාහංසු “අය්‍යා අනුපසම්පන්නා මයම්හා[1] උපසම්පන්නා එවං හි භගවතා පඤ්ඤත්තං භික්ඛූහි භික්ඛුනියො උපසම්පාදෙතබ්බා’ති.

7. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: “මහා පජාපතී භන්තෙ ගොතමී එවමාහ “ඉමා මං භන්තෙ ආනන්ද භික්ඛුනියො එවමාහංසු: අය්‍යා අනුපසම්පන්නා මයම්හා[1] උපසම්පන්නා, එවං හි භගවතා පඤ්ඤත්තං භික්ඛූහි භික්ඛුනියො උපසම්පාදෙ තබ්බා’ති.

“යදග්ගෙන ආනන්ද මහාපජාපතියා ගොතමියා අට්ඨ ගරුධම්මා පටිග්ගහිතා තදෙව සා උපසම්පන්නා”ති.

8. අථ ඛො මහාපජාපතී ගොතමී යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී ආයස්මන්තං ආනන්දං එතදවොච. “එකාහං භන්තෙ භගවන්තං වරං යාචාමි. සාධු භන්තෙ භගවා අනුජානෙය්‍ය භික්ඛූනඤ්ච භික්ඛුනී නඤ්ච යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචි කම්ම”න්ති.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: “මහා පජාපතී භන්තෙ ගොතමී එවමාහ ‘එකාහං භන්තෙ ආනන්ද භගවන්තං වරං යාචාමි. සාධු භන්තෙ භගවා අනුජානෙය්‍ය භික්ඛූනඤ්ච භික්ඛුනීනඤ්ච යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්ම’න්ති’.

1. මයං චම්හා – මජසං

6. එ කලැ ඒ මෙහෙණහු මහාපජාපතී ගොතමියට "ආර්‍යා තොමෝ නො උපසපන. අපි උපසපනුම්හ මෙසේ "භික්ෂූන් විසින් මෙහෙණහු උපසපන් කළයුත්තාහ යි භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද"යි මෙ බස් තෙපලූහ.

එ කලැ මහපජාපතී ගොතමී අනඳ තෙරුන් කරා ගියා ය. ගොස් ආයුෂ්මත් අනඳ තෙරුන් වැඳ පසෙක සිටියා ය. පසෙක සිටි මහා පජාපතී ගොතමී අනඳ තෙරුනට "ආනන්‍දයන් වහන්ස, "ආර්යාව නො උපසපන් ය, අපි උපසපනුම්හ, මෙසේ භික්ෂූන් විසින් මෙහෙණහු උපසපන් කළයුතුහ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද"යි මේ භික්ෂුණිහු මට කියති''යි සැලකළා ය.

7. එ කලැ අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළඹැ භාග්‍යවතුන් වැඳ පසෙක උන්හ. පසෙක හුන් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ. වහන්ස, "ආර්යාව අනුපසම්පන්න ය, අපි උපසපන්වූම්හ. මෙසේ භික්ෂූන් විසින් මෙහෙණහු උපසපන් කළයුතුහ''යි භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද''යි මෙ මෙහෙණහු මෙසේ කියති'යි මහාපජාපතී ගොතමී මෙසේ මට කිවූ යයි භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

"අනඳයෙනි. යම් මොහොතෙක මහාපජාපතී ගොතමිය විසින් ගුරුදහම් අට පිළිගන්නා ලද ද එ කෙණෙහි ම ඕ උපසපන් වූවා''යි (භාග්‍යවතුන් වහන්සේ වදළ සේක).

8. ඉක්බිති මහාපජාපතී ගොතමී අනඳ තෙරුන් වෙත එළැඹුණි ය. එළැඹ ඔබ වැඳ එකත් පසෙක සිටියා ය. එකත් පසෙක සිට අනඳ තෙරුනට "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගෙන් එක් වරයක් ඉල්ලමි. භික්‍ෂූනටත් භික්‍ෂුණීනටත් වැඩිමහලු පිළිවෙළින් වැඳීම දක හුනස්නෙන් නැඟී සිටීම ඇඳිලි බැඳීම, සාමීචිකර්මය යන මේ දැ භාග්‍යවතුන් වහන්සේ අනුදන්නා සේක් නම් මැනැවැ''යි කීවා ය.

එ කලැ අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ වැඳ පසෙක ඉඳගත්හ. ඉඳගෙන "වහන්ස භික්‍ෂූනට ද භික්‍ෂුණීනට ද වැඩිමහලු පිළිවෙළින් වැඳීම, දක හුනස්නෙන් නැඟීම, ඇඳිලි බැඳීම, සාමීචිකර්මය යන මේ දැ භාග්‍යවතුන් වහන්සේ පනවනසේක් නම් මැනැවැ යි මහාපජාපතී ගොතමී මෙසේ කියා''යි භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

"අට්ඨානමෙතං ආනන්ද අනවකාසො යං තථාගතො අනුජා-නෙය්‍ය මාතුගාමස්ස අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචි-කම්මං. ඉමෙ හි නාම ආනන්ද අඤ්ඤතිත්ථියා දුරක්ඛාතධම්මා මාතු ගාමස්ස අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං න කරිස්සන්ති. කිමඞ්ග පන තථාගතො අනුජානිස්සති මාතුගාමස්ස අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මන්ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ මාතුගාමස්ස අභිවාදනං පච්චු-ට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති:

9. අථ ඛො මහාපජාපතී ගොතමී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එක-මන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: "යානි තානි භන්තෙ භික්ඛුනීනං සික්ඛාපදානි භික්ඛූහි සාධාරණානි –කථං මයං භන්තෙ තෙසු සික්ඛාපදෙසු පටිපජ්ජාමා"ති.

"යානි තානි ගොතමී භික්ඛුනීනං සික්ඛාපදානි භික්ඛූහි සාධාරණානි යථා භික්ඛූ සික්ඛන්ති තථා තෙසු සික්ඛාපදෙසු සික්ඛථා"ති.

"යානි පන තානි භන්තෙ භික්ඛුනීනං සික්ඛාපදානි භික්ඛූහි අසාධාරණානි, කථං මයං භන්තෙ එතෙසු සික්ඛාපදෙසු පටිපජ්ජාමා"ති.

"යානි තානි ගොතමී භික්ඛුනීනං සික්ඛාපදානි භික්ඛූහි අසාධාරණානි යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සික්ඛථාති."

10. අථ ඛො මහාපජාපතී ගොතමී යෙන භගවා තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: "සාධු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යාහං ධම්මං[1] සුත්වා එකා වූපකට්ඨා අප්පමත්තා ආතාපිනී පහිතත්තා විහරෙය්‍යන්ති"

1. යමහං භගවතො ධම්මං – සීමු.

''අනදයෙනි මාගමට (භික්ෂූහු විසින්) වැඳීම දැක හුනස්නෙන් නැඟීම ඇඳිලි බැඳීම සාමීචිකර්මය යන මේ දැ තථාගත කෙනෙක් අනුදනිති යන යමක් ඇද්ද මෙය අකාරණයෙකි අනවකාශයෙකි (නො වන්නෙකි). අනදයෙනි නො මනා ලෙස දෙසූ දහම් ඇති මේ අන්තොටුවෝ පවා මාගමට අභිවාදන ප්‍රත්‍යුත්ථාන අංජලිකර්ම සාමීචිකර්ම නො කරන්නාහ. තථාගත කෙනෙක් (මහණකු විසින්) මාගමකට අභිවාදන ප්‍රත්‍යුත්ථාන අංජලිකර්ම සාමීචිකර්ම (කළයුතු යැ යි) අනුදන්නේ යැ යන්න කියනුම කවරේ ද? (නො අනු-දන්නේ ම ය.) යි වදාළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි, මෙ කරුණෙහි දැහැමි කතා කොට, භික්ෂූන් අමතා, **''මහණෙනි, මාගමට වැඳීම දැක හුනස්නෙන් නැඟී සිටීම, ඇඳිලි බැඳීම සාමීචිකර්මය භික්ෂූහු විසින් නො කළයුතු. යමෙක් කෙළේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ''** යි වදාළ සේක.

9. ඉක්බිති මහාපජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියා ය. එළැඹ වැඳ එක් පසෙක සිටියා ය. එසේ සිට ඕ ''වහන්ස, මෙහෙණනට පනවන ලද භික්ෂූනටත් සාධාරණ වූ යම් සිකපද කෙනෙක් වෙත් ද අපි ඒ සිකපදයන්හි කෙසේ නම් පිළිපදුමෝ ද?''යි විචාළා ය.

''ගොයුම්යනි, භික්ෂූනට සාධාරණ වූ යම් සිකපද කෙනෙක් මෙහෙණනට ඇද්ද, එහි ලා යම්සේ භික්ෂූහු පිළිපදිද්ද, එසේ ම තෙපි ද පිළිපදිවු (හික්මෙවු) යැ''යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

''වහන්ස භික්ෂූනට සාධාරණ නො වූ යම් සිකපද කෙනෙක් ප්‍රඥප්ත වැ ඇද්ද, අපි කෙසේ ඒ සිකපදන්හි පිළිපදිමුදැ?'' යි (විචාළා ය).

''ගොයුම්නි, භික්ෂූනට සාධාරණ නො වූ මෙහෙණනට පැනැ වූ යම් සිකපද කෙනෙක් වෙත් ද, පනවන ලද පරිදි ම පිළිපදිවු''යැ යි (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

10. එ කලැ මහාපජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියා ය. එළැඹ වැඳ එකත්පස් වැ සිටියා ය. එකත්පස් වැ සිටියා ''වහන්ස, මම යම් දහමක් අසා එකලා වැ ගණයාගෙන් වෙන් වූයෙම් පමා නො වූයෙම්, කෙලෙස් තවන වැර ඇතියෙම් නිවන කරා මෙහෙයූ සිතැතියෙම් වසන්නෙම් ද එසේවූ දහමක් මට සැකෙවින් වදාරනසේක්වා''යි කීවා ය. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:)

"යෙ ච ඛො[1] ත්වං ගොතමි, ධම්මෙ ජානෙය්‍යාසි ඉමෙ ධම්මා සරාගාය සංවත්තන්ති නො විරාගාය, සංයොගාය සංවත්තන්ති නො විසංයොගාය. ආචයාය සංවත්තන්ති නො අපචයාය. මහිච්ඡතාය සංවත්තන්ති නො අප්පිච්ඡතාය. අසන්තුට්ඨියා සංවත්තන්ති නො සන්තුට්ඨියා සඞ්ගණිකාය සංවත්තන්ති නො පවිවෙකාය කොසජ්ජාය සංවත්තන්ති නො විරියාරම්භාය. දුභරතාය[2] සංවත්තන්ති නො සුභරතාය. එකංසෙන ගොතමි, ධාරෙය්‍යාසි නෙසො ධම්මො නෙසො විනයො නෙතං සත්ථුසාසනන්ති.

"යෙ ච ඛො ත්වං ගොතමි ධම්මෙ ජානෙය්‍යාසි ඉමෙ ධම්මා විරාගාය සංවත්තන්ති නො සරාගාය. විසංයොගාය සංවත්තන්ති නො සංයොගාය අපචයාය සංවත්තන්ති නො ආචයාය. අප්පිච්ඡතාය සංවත්තන්ති නො මහිච්ඡතාය. සන්තුට්ඨියා සංවත්තන්ති නො අසන්තුට්ඨියා. පවිවෙකාය සංවත්තන්ති නො සඞ්ගණිකාය. විරියාරම්භාය සංවත්තන්ති නො කොසජ්ජාය. සුභරතාය සංවත්තන්ති නො දුභරතාය. එකංසෙන ගොතමි, ධාරෙය්‍යාසි එසො ධම්මො එසො විනයො එතං සත්ථුසාසනන්ති."

11. තෙන ඛො පන සමයෙන භික්ඛුනීනං පාතිමොක්ඛං න උද්දිසීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"අනුජානාමි භික්ඛවෙ භික්ඛුනීනං පාතිමොක්ඛං උද්දිසිතුන්ති."

අථ ඛො භික්ඛූනං එතදහොසි: කෙන නු ඛො භික්ඛුනීනං පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං:

"අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං පාතිමොක්ඛං උද්දිසිතුන්ති."

තෙන ඛො පන සමයෙන භික්ඛූ භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනීනං පාතිමොක්ඛං උද්දිසන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "ජායායො ඉමා ඉමෙසං ජාරියො ඉමා ඉමෙසං ඉදානි ඉමෙ ඉමාහි සද්ධිං අභිරමිස්සන්තී"ති.

1. යෙ ඛො. - සී. මු.
2. දුබ්භරතාය - මජසං

''ගෞතමිය, තෙපි මේ දහම්හු රාග සහිත බව පිණිස පවතිත්. රාගයෙන් පහවීම පිණිස නො පවතිත්. සසර හා බැඳීම පිණිස පවතිත්. සසරින් වෙන් වීම පිණිස නො පවතිත්. කෙලෙස් රැස් වීම පිණිස පවතිත්. කෙලෙස් දුරු වීම පිණිස නො පවතිත්. මහත් ආශා ඇති බව පිණිස පවතිත්. ආශා නැති බව පිණිස නො පවතිත්. ලද පමණින් සතුටු නො වීම පිණිස පවතිත්. ලද පමණින් සතුටු වීම පිණිස නො පවතිත්. ගණයා කෙරෙහි ඇලී විසීම පිණිස පවතිත්, ගණයා කෙරෙන් වෙන් වැ විසීම පිණිස නො පවතිත්. කුසීත බව පිණිස පවතිත්. වීර්යාරම්භය පිණිස නො පවතිත්. දුකසේ පොෂණය කළ යුතු බව පිණිස පවතිත්, සුවසේ පොෂණය කළ හැකි බව පිණිස නො පවතිත්''යැයි දැන ගන්නහු ද, එසේවූ මේ දැ දහම් නො වේ විනය නො වේ ශාස්තෲශාසනය නො වේ''යයි සලකන්න.

ගෞතමිය, 'මේ දහම්හු විරාගය පිණිස පවතිත් සරාගය පිණිස නො පවතිත්, මේ දහම්හු විසංයොගය පිණිස පවතිත්, සංයොගය පිණිස (සසර බැඳීම පිණිස) නො පවතිත්, කෙලෙස් දුරැලීම පිණිස පවතිත්. කෙලෙස් රැස් කිරීම පිණිස නො පවතිත්, අල්පෙච්ඡ බව පිණිස පවතිත්, මහෙච්ඡ බව පිණිස නො පවතිත්, සතුට පිණිස පවතිත්, නො සතුට පිණිස නො පවතිත්, ප්‍රවිවෙකය පිණිස පවතිත් ගණසංගණිකාව පිණිස නො පවතිත් වීර්යාරම්භය පිණිස පවතිත්, කුසීත බව පිණිස නො පවතිත්, සුපොෂ්‍ය බව පිණිස පවතිත්, දුෂ්පොෂ්‍ය බව පිණිස නො පවතිත්''යයි යම් දහම් කෙනෙකුන් දැනගන්නහු ද, ගෞතමිය, මේ ධර්මය යැ මේ විනය යැ, මේ ශාස්තෲශාසනය යැ''යි ඒ ධර්මයන් දරන්නැ (සලකා ගන්නැ)''යි වදාළසේක.

11. එ සමයෙහි වනාහි මෙහෙණන්ට පාමොක් නො උදෙසනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ.

**''මහණෙනි, භික්ෂුණීනට පාමොක් උදෙසන්නට අනුදනිමි''යි වදාළසේක.**

එ කල්හි කවරකු විසින් භික්ෂුණීනට පාමොක් උදෙසියයුතු දැ''යි භික්ෂූනට මෙ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

**''මහණෙනි, භික්ෂූන් විසින් භික්ෂුණීනට පාමොක් උදෙසන්නට අනුදනිමි''යි වදාළසේක.**

එ සමයෙහි භික්ෂූහු මෙහෙණවරට එළැඹ මෙහෙණනට පාමොක් උදෙසත්. ''මිනිස්සු මේ මෙහෙණහු මේ භික්ෂූන් ගේ බිරියෝ යැ. මොහු මේ භික්ෂූන් ගේ සොර අඹුවෝ යැ'' දැන් මොවුන් සමග අභිරමණය කරන්නාහ යි ලාමක කොට කියත්, නිඳ කෙරෙත් අගුණ පතුරුවත්.

අස්සොසුං ඛො භික්ඛූ තාසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, භික්ඛුනීහි භික්ඛුනීනං පාතිමොක්ඛං උද්දිසිතුන්ති."

භික්ඛුනියො න ජානන්ති එවං පාතිමොක්ඛං උද්දිසිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, භික්ඛූහි භික්ඛුනීනං ආචික්ඛිතුං. එවං පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථා"ති.

12. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ආපත්තිං න පටිකරොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා ආපත්ති න පටිකාතබ්බා. යා න පටිකරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

භික්ඛුනියො න ජානන්ති: එවං ආපත්ති පටිකාතබ්බා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, භික්ඛූහි භික්ඛුනීනං ආචික්ඛිතුං එවං ආපත්තිං පටිකරෙය්‍යාථා'ති."

අථ ඛො භික්ඛූනං එතදහොසි: කෙන නු ඛො භික්ඛුනීනං ආපත්ති පටිග්ගහෙතබ්බා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, භික්ඛූහි භික්ඛුනීනං ආපත්තිං පටිග්ගහෙතු'න්ති."

13. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො රථිකායපි[1] ව්‍යූහෙ'පි සිඞ්ඝාටකෙපි භික්ඛුං පස්සිත්වා පත්තං භූමියං නික්ඛිපිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා ආපත්තිං පටිකරොන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'ජායායො ඉමා ඉමෙසං, ජාරියො ඉමා ඉමෙසං. රත්තිං විමානෙත්වා ඉදානි ඛමාපෙන්තී''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං ආපත්ති පටිග්ගහෙතබ්බා. යො පටිග්ගණ්හෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ භික්ඛුනීහි භික්ඛුනීනං ආපත්තිං පටිග්ගහෙතුන්ති."

භික්ඛුනියො න ජානන්ති: එවං ආපත්ති පටිග්ගහෙතබ්බා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං ආචික්ඛිතුං එවං ආපත්තිං පටිග්ගණ්හෙය්‍යාථාති."

1. රථියාපි - මජසං

භික්ෂූහු ලාමක කොට කියන, නින්දා කරන අගුණ පතුරුවන ඒ මිනිසුන්ගේ කථා ඇසූහ. ඉක්බිති ඔහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. "මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණනට පාමොක් නො උදෙසියයුතු. යමෙක් උදෙසන්නේ වී නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. භික්ෂුණීන් විසින් භික්ෂුණීනට පාමොක් උදෙසන්නට අනුදනිමි"යි වදළසේක.

"මෙසේ පාමොක් උදෙසියයුතු යැ"යි මෙහෙණහු නො දනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, මෙසේ පාමොක් උදෙසියයුතු යැ යි භික්ෂූන් විසින් මෙහෙණනට කියන්නට අනුදනිමි"යි වදළසේක.

12. එ සමයෙහි මෙහෙණහු ඇවැතට පිළියම් නො කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, මෙහෙණක විසින් ඇවැතට පිළියම් නො කළයුතු නො වේ. යම් මෙහෙණක් පිළියම් නො කරන්නී ද දුකුළා ඇවැත් වන්නේ යැ"යි වදළසේක.

මෙසේ ඇවැතට පිළියම් කටයුතු යැ යි මෙහෙණහු නො දනිත්, භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ. "මහණෙනි, මහණුන් විසින් මෙසේ ඇවැතට පිළියම් කරව යි මෙහෙණනට කියන්නට අනුදනිමි"යි වදළසේක.

එ කලැ 'කවරක්හු විසින් මෙහෙණන්ගේ ඇවැත් පිළිගත යුතු දෑ?'යි භික්ෂූනට මෙ සිත විය. "මහණෙනි, මහණුන් විසින් මෙහෙණන්ගේ ඇවැත් පිළිගන්නට අනුදනිමි"යි වදළසේක.

13. එ සමයෙහි වූ කලි මෙහෙණහු වීථියෙහි දී ද, පිරිස් රැස්වන තැනදී ද, මංසන්දියේ දී ද මහණක්හු දැක, පාත්‍රය බිමැ තබා තනිපට සිවුර එකස් කොට උත්කුටුක වැ හිඳ දෙහොත් මුදුන් තබා ඇවැතට පිළියම් කෙරෙත්. (ඇවැත් දෙසත්) මිනිස්සු "මොහු මොවුන් ගේ බිරියෝ ය, මොහු මොවුන්ගේ සොරබිරියෝ ය. රෑ අවමන් කොට දැන් කමවති"යි ලාමක කොට කියත් නින්දා කරත් දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, භික්ෂූන් විසින් භික්ෂුණීන්ගේ ඇවැත් නො පිළිගතයුතු, යමෙක් පිළිගන්නේ ද ඒ මහණහට දුකුළා ඇවැත් වන්නේ ය. මෙහෙණන් විසින් මෙහෙණන්ගේ ඇවැත් පිළිගන්නට අනුදනිමි"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

මෙසේ ඇවැත් පිළිගතයුතුයැ'යි මෙහෙණහු නො දත්හ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, මහණුන් විසින් "මෙසේ ඇවැත් පිළිගනිවු යැ"යි මෙහෙණනට කියා දෙන්නට අනුදනිමි"යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

14. තෙන ඛො පන සමයෙන භික්ඛුනීනං කම්මං න කරීයති. එතමත්ථං ආරොචෙසුං **"අනුජානාමි භික්ඛවෙ භික්ඛුනීනං කම්මං කාතුන්ති."**

අථ ඛො භික්ඛූනං එතදහොසි. "කෙන නු ඛො භික්ඛුනීනං කම්මං කාතබ්බන්ති?. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං කම්මං කාතුන්ති."**

15. තෙන ඛො පන සමයෙන කතකම්මා භික්ඛුනියො රථිකායපි[1] ව්‍යූහෙපි සිංඝාටකෙපි භික්ඛුං පස්සිත්වා පත්තං භූමියං නික්ඛිපිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා ඛමාපෙන්ති එවං නූන කාතබ්බන්ති මඤ්ඤමානා. මනුස්සා තථෙව උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'ජායායො ඉමා ඉමෙසං. ජාරියො ඉමා ඉමෙසං. රත්තිං විමානෙත්වා ඉදානි ඛමාපෙන්තී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

**"න භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං කම්මං කාතබ්බං. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං කම්මං කාතුන්ති."**

භික්ඛුනියො න ජානන්ති: 'එවං කම්මං කාතබ්බන්ති'. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං ආචික්ඛිතුං 'එවං කම්මං කරෙය්‍යාථා'ති.**

16. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො සඞ්ඝමජ්ඣෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්ති[2] විහරන්ති. න සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං අධිකරණං වූපසමෙතුන්ති."**

17. තෙන ඛො පන සමයෙන භික්ඛූ භික්ඛුනීනං අධිකරණං වූපසමෙන්ති. තස්මිං ඛො පන අධිකරණෙ විනිච්ඡියමානෙ දිස්සන්ති භික්ඛුනියො කම්මප්පත්තායො'පි ආපත්තිගාමිනියොපි. භික්ඛුනියො එවමාහංසු: "සාධු භන්තෙ අය්‍යාව භික්ඛුනීනං කම්මං කරොන්තු අය්‍යාව භික්ඛුනීනං ආපත්තිං පටිග්ගණ්හන්තු. එවං හි භගවතා පඤ්ඤත්තං "භික්ඛූහි භික්ඛුනීනං අධිකරණං වූපසමෙතබ්බන්ති.' භගවතො එතමත්ථං ආරොචෙසුං.

1. රථිකායපි. - මජසං.
2. විතුදන්තා - සිමු.

14. එ සමයෙහි වනාහි "මෙහෙණනට විනයකර්ම නො කරනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, මෙහෙණනට විනයකර්ම කරන්නට අනුදනිමි"යි** භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

එ කලැ කවරකු විසින් මෙහෙණනට විනයකර්ම කළයුතු දැ?"යි භික්ෂූනට මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ. **"මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණනට විනයකර්ම කරන්නට අනුදනිමි"යි** භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

15. එ සමයෙහි වනාහි කරන ලද විනයකර්ම ඇති මෙහෙණහු වීථියෙහි දු ද පිරිසෙහි ද මංසන්දියෙහි ද මහණකු දැක, පාත්‍රය බිමැ තබා, තනිපට සිවුර එකස් කොට උත්කුටුක වැ හිඳ, දෙහොත් මුදුන් තබා, 'මෙසේ කළයුතු වනැ' යි සලකන්නෝ කමවත්. මිනිස්සු පළමු සේ ම "මොහු මොවුන්ගේ බිරියෝ ය, මොහු මොවුන්ගේ සොරබිරියෝ ය, රාත්‍රියෙහි අවමන් කොට දැන් කමවති" යි ලාමක කොට කියත්, නිඳා කෙරෙත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ.

**"මහණෙනි, මහණුන් විසින් මෙහෙණනට විනයකර්ම නො කළයුතු. යමෙක් කරන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, මෙහෙණන් විසින් මෙහෙණනට විනයකර්ම කරන්නට අනුදනිමි"** යි වදළසේක.

විනයකර්ම මෙසේ කළයුතු යැ" යි මෙහෙණහු නො දත්හ. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ. **"මහණෙනි, මෙසේ කර්ම කරව යි භික්ෂූන් විසින් මෙහෙණනට කියා දෙන්නට අනුදනිමි"** යි වදළසේක.

16. එ සමයෙහි වනාහි මෙහෙණහු සහමැද හටගත් භණ්ඩන ඇත්තෝ, හටගත් කලහ ඇත්තෝ, විවාදයට බටුවෝ, උනුන් මුඛ නැමති අඩයටියෙන් උනුන් විදුමින් වෙසෙත්. ඒ අධිකරණය සන්හිඳුවන්නට නො හැකි වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණන්ගේ අධිකරණය සන්හිඳුවන්නට අනුදනිමි"** යි (භාග්‍යවතුන් වහන්සේ) වදළසේක.

17. එ සමයෙහි මහණහු මෙහෙණන් ගේ අධිකරණ සන්හිඳුවත්, ඒ අධිකරණ විනිසනු ලබන කල්හි කර්මයට පැමිණියා වූ ද, ඇවැතට පැමිණියා වූ ද මෙහෙණහු දක්නා ලැබෙත්. මෙහෙණහු මෙසේ කීහ: "වහන්ස, යාචඤා කරම්හ. ආය්‍ය්‍යයෝ ම මෙහෙණන්ගේ ඇවැත් පිළිගනිත්වා. "මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණන්ගේ අධිකරණය සන්හිඳුවිය යුතු' යැ යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ යැ" යි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

"අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං කම්මං ආරොපෙත්වා භික්ඛුනීනං නියාදෙතුං, භික්ඛුනීහි භික්ඛුනීනං කම්මං කාතුං. භික්ඛූහි භික්ඛුනීනං ආපත්තිං ආරොපෙත්වා භික්ඛුනීනං නියාදෙතුං, භික්ඛුනීහි භික්ඛුනීනං ආපත්තිං පටිග්ගහෙතුන්ති".

18. තෙන ඛො පන සමයෙන උප්පලවණ්ණාය භික්ඛුනියා අන්තෙවාසිනී භික්ඛුනී සත්ත වස්සානි භගවන්තං අනුබද්ධා හොති විනයං පරියාපුණන්තී. තස්සා මුට්ඨස්සතිනියා ගහිතො ගහිතො මුස්සති. අස්සොසි ඛො සා භික්ඛුනී භගවා කිර සාවත්ථිං ගන්තුකාමො'ති. අථ තස්සා භික්ඛුනියා එතදහොසි: අහං ඛො සත්ත වස්සානි භගවන්තං අනුබන්ධිං විනයං පරියාපුණන්තී. තස්සා මෙ මුට්ඨස්සතිනියා ගහිතො ගහිතො මුස්සති. දුක්කරං ඛො පන මාතුගාමෙන යාවජීවං සත්ථාරං අනුබන්ධිතුං. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බන්ති?. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ භික්ඛූහි භික්ඛුනීනං විනයං වාචෙතුන්ති."

පඨම භාණවාරං.

**"මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණනට විනයකර්මය නංවා මෙහෙණන් විසින් මෙහෙණන්ගේ විනයකර්මය කරන්නට මෙහෙණනට පවරන්නට ද භික්ෂූන් විසින් මෙහෙණනට ඇවැත් නංවා මෙහෙණන් විසින් මෙහෙණන්ගේ ඇවැත් පිළිගන්නට මෙහෙණනට පවරන්නට ද අනුදනිමි"** යි වදළසේක.

18. එසමයෙහි වනාහි උප්පල්වන් මෙහෙණගේ අතැවැසි මෙහෙණක් විනය පුහුණු කරන්නී සත් වසක් භාග්‍යවතුන් වහන්සේ පසුපස ගියා ය. නටුවා වූ සිහි ඇති ඇය විසින් උගත් උගත් දෑ නැසෙයි (සිහි නැති ව යෙයි) භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරට වඩිනු කැමැතිසේකැ යි ඕ ඇසුවා ය. (ඇයට අසන්නට ලැබිණ). එවිට එ මෙහෙණට මෙ සිත විය. "මම් වූ කලි විනය උගන්නිම් සත් වසක් භාග්‍යවතුන් වහන්සේ පසුපස ගියෙමි. නටුවා වූ සිහි ඇති ඒ මා උගත් උගත් දෑ නැසෙයි (සිහි නැති ව යෙයි). මාගමක විසින් යවදිව ශාස්තෲන් වහන්සේ පසුපස යනු දුෂ්කර ය. කෙසේ නම් මා විසින් පිළිපැද්දයුතු දෑ" යි ඉක්බිති ඒ මෙහෙණ මෙහෙණනට මෙ පවත් සැලකළා ය, මෙහෙණහු මහණුනට එ පවත් සැලකළහ. මහණහු භාග්‍යවතුන් වහන්සේට එ පවත් දන්නූහ. **"මහණෙනි, භික්ෂූන් විසින් මෙහෙණනට විනය කියවන්නට (උගන්වන්නට) අනුදනිමි"** යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

**පළමු බණවර යි.**

19. අථ බො භගවා වෙසාලියං යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

20. තෙන බො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනියො කද්දමොදකෙන ඔසිඤ්චන්ති 'අප්පෙවනාම අම්හෙසු සාරජ්ජෙය්‍යුන්ති.' භගවතො එතමත්ථං ආරොචෙසුං. **''න භික්ඛවෙ භික්ඛුනා භික්ඛුනියො කද්දමොදකෙන ඔසිඤ්චිතබ්බා. යො ඔසිඤ්චෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි. භික්ඛවෙ තස්ස භික්ඛුනො දණ්ඩකම්මං කාතුන්ති.''**

අථ බො භික්ඛූනං එතදහොසි: 'කින්නු බො දණ්ඩකම්මං කාතබ්බන්ති.' භගවතො එතමත්ථං ආරොචෙසුං. **''අවන්දියො සො භික්ඛවෙ භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන කාතබ්බො''ති.**

21. තෙන බො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා භික්ඛුනීනං දස්සෙන්ති, ඌරුං විවරිත්වා භික්ඛුනීනං දස්සෙන්ති, අඞ්ගජාතං විවරිත්වා භික්ඛුනීනං දස්සෙන්ති, භික්ඛුනියො ඔභාසන්ති, භික්ඛුනීහි සද්ධිං සම්පයොජෙන්ති 'අප්පෙවනාම අම්හෙසු සාරජ්ජෙය්‍යුන්ති.' භගවතො එතමත්ථං ආරොචෙසුං.

**''න භික්ඛවෙ භික්ඛුනා කායො විවරිත්වා භික්ඛුනීනං දස්සෙතබ්බො. න ඌරුං විවරිත්වා භික්ඛුනීනං දස්සෙතබ්බො. න අඞ්ගජාතං විවරිත්වා භික්ඛුනීනං දස්සෙතබ්බං. න භික්ඛුනියො ඔභාසෙතබ්බා. න භික්ඛුනීහි සද්ධිං සම්පයොජෙතබ්බං යො සම්පයොජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ තස්ස භික්ඛුනො දණ්ඩකම්මං කාතුන්ති.''**

අථ බො භික්ඛූනං එතදහොසි කින්නු බො දණ්ඩකම්මං කාතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **''අවන්දියො සො භික්ඛවෙ භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන කාතබ්බොති.''**

19. එ කලැ භාග්‍යවතුන් වහන්සේ විසල් පුර කැමැති තාක් වැසැ සැවැත් නුවර බලා සැරි සරා වැඩිසේක. පිළිවෙළින් සැරි සරා වඩනාසේක්. සැවැත්නුවරට පැමිණ වදළසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ සැවැත් නුවර දෙව්රම නම වූ අනේපිඬු සිටුහුගේ අරමැ වැඩ වසනසේක.

20. එ සමයෙහි වනාහි සවැගි මහණහු "අප කෙරෙහි මොවුන් ඇලෙතොත් මැනැවැ" යි සිතා මෙහෙණනට මඩදිය ඉසිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, මහණහු විසින් මෙහෙණනට මඩදිය ආදිය නො ඉස්සැයුතු. යමෙක් ඉස්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඒ මහණහට දඬුවම් කරන්නට අනුදනිමි"** යි වදළසේක.

එ කලැ මහණුනට මේ සිත විය: 'කිනම් දඬුවමක් කළයුතු දැ?' යි භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, ඒ මහණහු භික්ෂුණී සංඝයා විසින් නො වැන්දයුත්තෙක් කළයුතු යැ"** යි වදළසේක.

21. එ සමයෙහි සවැගි මහණහු 'මොවුන් අප කෙරෙහි ඇලුණොත් මැනැවැ' යි සිතා සිය කය විවෘත කොට මෙහෙණනට දක්වත්, කළවය විවෘත කොට මෙහෙණනට දක්වත්, අංගජාතය විවෘත කොට මෙහෙණනට දක්වත්, මෙහෙණනට මෛථුනධර්ම නිඃශ්‍රිත වචන කියත්, මෙහෙණන් හා සමඟ (පුරුෂයන් අසද්ධර්මයෙන්) යොදවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ.

**"මහණෙනි, මහණහු විසින් කය විවර කොට මෙහෙණනට නො දක්වියයුතු, කළව විවර කොට මෙහෙණනට නො දක්වියැයුතු, අඞගජාතය විවර කොට මෙහෙණනට නො දක්වියැයුතු, මෙහෙණනට මෙවුන්දම් නිසි බස් නො කියැයුතු, මෙහෙණන් හා අනුන් නො යෙදවියැයුතු, යමෙක් එසේ යොදවන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ. මහණෙනි, ඒ මහණහට දඬුවම් කරන්නට අනුදනිමි"** යි වදළසේක.

"කවර නම් දඬුවමක් කළයුතු දැ?" යි **භික්‍ෂූනට** මේ සිත **විය.** භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, ඒ මහණ භික්ෂුණී සංඝයා විසින් නො වැන්දයුත්තෙක් කළ යුතු යැ යි** භාග්‍යවතුන් වහන්සේ වදළසේක:

22. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො භික්ඛු කද්දමොදකෙන ඔසිඤ්චන්ති 'අප්පෙවනාම අම්හෙසු සාරජ්ජෙය්‍යුන්ති.' භගවතො එතමත්ථං ආරොචෙසුං. න භික්ඛවෙ භික්ඛුනියා භික්ඛු කද්දමොදකෙන ඔසිඤ්චිතබ්බො. යා ඔසිඤ්චෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ තස්සා භික්ඛුනියා දණ්ඩකම්මං කාතුන්ති.''

අථ ඛො භික්ඛූනං එතදහොසි ''කින්නු ඛො දණ්ඩකම්මං කාතබ්බන්ති.'' භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ ආවරණං කාතුන්ති.''

ආවරණෙ කතෙ න ආදියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ ඔවාදං ඨපෙතුන්ති.''

23. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො කායං විවරිත්වා භික්ඛූනං දස්සෙන්ති. ථනං විවරිත්වා භික්ඛූනං දස්සෙන්ති. ඌරුං විවරිත්වා භික්ඛූනං දස්සෙන්ති. අඞ්ගජාතං විවරිත්වා භික්ඛූනං දස්සෙන්ති. භික්ඛූ ඔභාසෙන්ති. භික්ඛූහි සද්ධිං සම්පයොජෙන්ති. ''අප්පෙවනාම අම්හෙසු සාරජ්ජෙය්‍යුන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''න භික්ඛවෙ භික්ඛුනියා කායො විවරිත්වා භික්ඛූනං දස්සෙතබ්බො, න ථනං විවරිත්වා භික්ඛූනං දස්සෙතබ්බං, න ඌරුං විවරිත්වා භික්ඛූනං දස්සෙතබ්බො, න අඞ්ගජාතං විවරිත්වා භික්ඛූනං දස්සෙතබ්බං, න භික්ඛූ ඔභාසිතබ්බා, න භික්ඛූහි සද්ධිං සම්පයොජෙතබ්බං. යා සම්පයොජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ තස්සා භික්ඛුනියා දණ්ඩකම්මං කාතුන්ති.

අථ ඛො භික්ඛූනං එතදහොසි 'කින්නු ඛො දණ්ඩකම්මං කාතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ ආවරණං කාතුන්ති. ආවරණෙ කතෙ න ආදියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං ''අනුජානාමි භික්ඛවෙ ඔවාදං ඨපෙතුන්ති.''

අථ ඛො භික්ඛූනං එතදහොසි 'කප්පති නු ඛො ඔවාදට්ඨපිතාය භික්ඛුනියා සද්ධිං උපොසථො කාතුං න නු ඛො කප්පතී''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''න භික්ඛවෙ ඔවාදට්ඨපිතාය භික්ඛුනියා සද්ධිං උපොසථො කාතබ්බො යාව න තං අධිකරණං වූපසන්තං හොතී''ති.

22. එ සමයෙහි ඡබ්බග්ගිය මෙහෙණෝ "මොවුන් අප කෙරෙහි ඇලෙනොත් මැනැවැ' යි සිතා මහණුනට මඩදිය ඉසිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, මෙහෙණක විසින් මහණෙක් මඩදියෙන් නො ඉස්සැයුතු, යම් මෙහෙණක් ඉස්නී ද ඇයට දුකුළා ඇවැත් වන්නේ ය, මහණෙනි, ඇයට දඬුවම් කළයුතු යැ** යි වදළසේක.

'කිනම් දඬුවමක් කළයුතු ද?' යි භික්ෂූනට මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, ආවරණ කරන්නට (වෙහෙරට පිවිසීම වළක්වන්නට) අනුදනිමි"** යි වදළසේක.

ආවරණය කළ කලැ එය නො ගනිත් (නො සලකත්). භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ. **"මහණෙනි, අවවාදය තබන්නට (අවවාද කිරීම අත්හරනට) අනුදනිමි"** යි වදළසේක.

23. එ සමයෙහි ඡබ්බග්ගිය මෙහෙණහු මොවුන් අප කෙරෙහි ඇලෙනොත් මැනවැ යි 'මොහු අප කෙරෙහි ඇලෙන්නාහු නම් මැනැවැ'යි සිතා මහණුනට කය විවර කොට දක්වත්, මහණුනට තන විවරා දක්වත්, මහණුනට කළව විවර කොට දක්වත්, මහණුනට අඞ්ගජාතය විවර කොට දක්වත්, මහණුනට මෛථුනධර්ම නිශ්‍රිත වචන කියත්, මෙහෙණන් මහණුන් හා යොදවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, මෙහෙණ විසින් භික්ෂූනට කය විවරකොට නො දක්වියැයුතු, තන විවර කොට නො දක්වියැයුතු, කළව විවර කොට භික්ෂූනට නො දක්වියැයුතු, අඞ්ගජාතය විවර කොට නො දක්වියැයුතු, භික්ෂූනට මෙවුන් දම් නිසි බස් නො බිණියැයුතු ස්ත්‍රීන් මහණුන් හා නො ගැළපියැයුතු. යම් මෙහෙණක් ස්ත්‍රීන් මහණුන් හා ගළපන්නී නම් ඇයට දුකුළා ඇවැත් වන්නේ ය. මහණෙනි, ඒ මෙහෙණට දඬුවම් කරන්නට අනුදනිමි"** යි වදළසේක.

එ කල 'කවර නම් දඬුවමක් කළයුතු ද?' යි මහණුනට මෙ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, ආවරණ කරන්ට අනුදනිමි"** යි වදළසේක. ආවරණ කළ කල්හි නො පිළිගනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, අවවාද තබන්නට** (ඔවා දීම අත්හරින්ට) **අනුදනිමි"** වදළසේක.

එ කලැ **"තබන ලද අවවාද ඇති මෙහෙණ හා පොහෝ** කරන්නට කැප වේ ද නො වේ ද?" යි භික්ෂූනට මෙ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. **"මහණෙනි, ඒ අධිකරණය සන්හිඳෙන තෙක් තබන ලද අවවාද ඇති මෙහෙණක හා පොහෝ නො කළයුතු යැ"** යි වදළසේක.

24. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී ඔවාදං ඨපෙත්වා චාරිකං පක්කාමි. භික්ඛුනියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම අය්යො උදායී ඔවාදං ඨපෙත්වා චාරිකං පක්කමිස්සතී?ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ඔවාදං ඨපෙත්වා චාරිකා පක්කමිතබ්බා යො පක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

25. තෙන ඛො පන සමයෙන බාලා අව්‍යත්තා ඔවාදං ඨපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ බාලෙන අව්‍යත්තෙන ඔවාදො ඨපෙතබ්බො. යො ඨපෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.

26. තෙන ඛො පන සමයෙන භික්ඛූ අවත්ථුස්මිං අකාරණෙ ඔවාදං ඨපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අවත්ථුස්මිං අකාරණෙ ඔවාදො ඨපෙතබ්බො. යො ඨපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

27. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඔවාදං ඨපෙත්වා විනිච්ඡයං න දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ඔවාදං ඨපෙත්වා විනිච්ඡයො න දාතබ්බො. යො න දදෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

28. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ඔවාදං න ගච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ භික්ඛුනියා ඔවාදො න ගන්තබ්බො. යා න ගච්ඡෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො"ති.

29. තෙන ඛො පන සමයෙන සබ්බො භික්ඛුනීසඞ්ඝො ඔවාදං ගච්ඡති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "ජායායො ඉමා ඉමෙසං, ජාරියො ඉමා ඉමෙසං, ඉදානි ඉමා ඉමෙහි සද්ධිං අභිරමිස්සන්තී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ සබ්බෙන භික්ඛුනීසඞ්ඝෙන ඔවාදො ගන්තබ්බො. ගච්ඡෙය්‍ය චෙ ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ චතූහි පඤ්චහි භික්ඛුනීහි ඔවාදං ගන්තුන්ති.

24. එ සමයෙහි වූ කලි උදයී තෙරණුවෝ අවවාද තබා සැරිසරා වැඩියහ. "කෙසේ නම් උදයී ආයුෂ්මතුන් වහන්සේ අවවාද තබා සැරිසරා වඩනාසේක් දැ?" යි මෙහෙණහු ලාමක කොට කියත්, දෙස් නඟත්, අගුණ පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ **"මහණෙනි, අවවාද තබා චාරිකා නො කළයුතු. යමෙක් සැරිසරා යන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළසේක.

25. එ සමයෙහි අඥාන වූ අව්‍යක්ත වූ මහණහු (මෙහෙණනට) අවවාද තබත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, අඥාන වූ අව්‍යක්ත වූ මහණහු විසින් (මෙහෙණනට) අවවාද නො තැබියැයුතු. යමෙක් තබන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළසේක.

26. එ සමයෙහි මහණහු අවස්තුයෙහි අකාරණයෙහි (මෙහෙණනට) අවවාද තබත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. **"මහණෙනි, අවස්තුවෙහි අකාරණයෙහි අවවාද නො තැබියැයුතු වේ. යමෙක් එසේ අවවාද තබන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළසේක.

27. එ සමයෙහි මහණහු (මෙහෙණනට) අවවාද තබා, විනිශ්චය නො දෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. **"මහණෙනි, අවවාද තබා විනිශ්චය නො දියැයුතු නො වේ. යමෙක් විනිශ්චය නො දෙන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ යැ"** යි වදාළසේක.

28. එ සමයෙහි වනාහි මෙහෙණහු අවවාද ලබනු සඳහා නො යෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. **"මහණෙනි, මෙහෙණ විසින් අවවාද ලබනු (පිණිස) නො ම නො යැයුතු. යම් මෙහෙණක් නො යන්නී ද ඇයට ධර්මය වූ පරිදි දඬුවම් කළයුතු"** යැ යි වදාළසේක.

29. එ සමයෙහි සියලු **භික්ෂුණී** සංඝ තෙම අවවාද ලබනුවට යෙයි. මිනිස්සු "මොහු මොවුන්ගේ බිරියෝ ය, මොහු මොවුන්ගේ සොර බිරියෝ ය දැන් මොහු මොවුන් හා කාමාස්වාදයෙහි ඇලෙන්නාහ" යි ලාමක කොට කියත්, නිඳා කෙරෙත්, නුගුණ පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. **"මහණෙනි, සියලු භික්ෂුණී සංඝයා අවවාද ලබනුව නො යැයුතු, ඉදින් යන්නේ නම් දුකුළා ඇවැත් වන්නේ ය, මහණෙනි, සතර නමක් හෝ පස් නමක් මෙහෙණන් විසින් අවවාද ලබනුවට යන්නට අනුදනිමි"** යි වදාළසේක.

30. තෙන ඛො පන සමයෙන චතස්සො පඤ්ච භික්ඛුනියො ඔවාදං ගච්ඡන්ති. මනුස්සා තථෙව උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ‘ජායායො ඉමා ඉමෙසං, ජාරියො ඉමා ඉමෙසං ඉදානි ඉමා ඉමෙහි සද්ධිං අභිරමිස්සන්තී’ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ චතූහි පඤ්චහි භික්ඛුනීහි ඔවාදො ගන්තබ්බො. ගච්ඡෙය්‍යුං චෙ ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ද්වෙ තිස්සො භික්ඛුනියො ඔවාදං ගන්තුං. එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො භික්ඛුනීසඞ්ඝො අය්‍ය, භික්ඛුසඞ්ඝස්ස පාදෙ වන්දති ඔවාදූපසඞ්කමනඤ්ච යාචති. ලභතු කිර අය්‍ය, භික්ඛුනී සඞ්ඝො ඔවාදූපසඞ්කමනන්ති.

තෙන භික්ඛුනා පාතිමොක්ඛුද්දෙසකො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘භික්ඛුනී සඞ්ඝො භන්තෙ භික්ඛුසඞ්ඝස්ස පාදෙ වන්දති ඔවාදූපසඞ්කමනඤ්ච යාචති. ලභතු කිර භන්තෙ භික්ඛුනී සඞ්ඝො ඔවාදූපසඞ්කමනන්ති.’ පාතිමොක්ඛුද්දෙසකෙන වත්තබ්බො. “අත්ථි කොචි භික්ඛු භික්ඛුනොවාදකො සම්මතො”ති. සචෙ හොති කොචි භික්ඛු භික්ඛුනොවාදකො සම්මතො පාතිමොක්ඛුද්දෙසකෙන වත්තබ්බො: “ඉත්ථන්නාමො භික්ඛු භික්ඛුනොවාදකො සම්මතො. තං භික්ඛුනීසඞ්ඝො උපසඞ්කමතූ”ති. සචෙ න හොති කොචි භික්ඛු භික්ඛුනොවාදකො සම්මතො පාතිමොක්ඛුද්දෙසකෙන වත්තබ්බො; කො ආයස්මා උස්සහති භික්ඛුනියො ඔවදිතුන්ති?

සචෙ කොචි උස්සහති භික්ඛුනියො ඔවදිතුං, සො ච හොති අට්ඨහඞ්ගෙහි සමන්නාගතො සම්මන්නිත්වා වත්තබ්බො: “ඉත්ථන්නාමො භික්ඛු භික්ඛුනොවාදකො සම්මතො. තං භික්ඛුනීසඞ්ඝො උපසඞ්කමතූ’ති. සචෙ න කොචි උස්සහති භික්ඛුනියො ඔවදිතුං පාතිමොක්ඛුද්දෙසකෙන වත්තබ්බො: නත්ථි කොචි භික්ඛු භික්ඛුනොවාදකො සම්මතො. පාසාදිකෙන භික්ඛුනී සඞ්ඝො සම්පාදෙතූ”ති.

31. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඔවාදං න ගණ්හන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘න භික්ඛවෙ ඔවාදො න ගහෙතබ්බො යො න ගණ්හෙය්‍ය ආපත්ති දුක්කටස්සා’ති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු බාලො හොති තං භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං: ඔවාදං අය්‍ය ගණ්හා’ති.

30. එ සමයෙහි මෙහෙණහු සතර දෙනෙක් පස් දෙනෙක් අවවාද ලබනු පිණිස යෙත්. මිනිස්සු "මොහු මේ මහණුන්ගේ බිරියෝ ය, මොහු මේ මහණුන්ගේ සොර අඹුවෝ ය, දැන් මොහු මේ මහණුන් හා කාමාස්වාදයෙහි ඇලෙන්නෝ යැ" යි පළමු සේ ම ලාමක කොට කියත්, නිඳා කෙරෙත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. "මහණෙනි, මෙහෙණන් සතර දෙනකුන් පස් දෙනකුන් අවවාද ලබනුවට නො යා යුතු. එසේ යන්නාහු වෙත් නම් ඔවුනට දුකුළා ඇවැත් වන්නේ ය. මෙහෙණන් දෙ නමක් තුන් නමක් අවවාද පිණිස යන්නට අනුදනිමි. එක් මහණකු කරා එළැඹ, තනිපට සිවුර එකස් කොට (පෙරෙවැ) පා වැඳ, උත්කුටුක වැ හිඳ, දෙහොත් මුඳුන් තබා, "ආයුෂ්මත් වහන්ස, භික්ෂුණී සංඝ තෙම භික්ෂු සංඝයාගේ පා වඳී. අවවාද ලබනුවට එළැඹීම ද යදී. ආයුෂ්මත් වහන්ස, භික්ෂුණීසංඝ තෙම අවවාද ලබනු සඳහා එළැඹීම ලබාවා" යි මෙසේ කියයුතු වන්නේ ය. ඒ මහණහු විසින් පාමොක් උදෙසන මහණකු කරා එළැඹ "වහන්ස, භික්ෂුණී සංඝ තෙම සඞ්ඝයාගේ පා වඳී. අවවාද සඳහා එළැඹීම ද යදී. වහන්ස, භික්ෂුණීසඞ්ඝ තෙම අවවාද පිණිස එළැඹීම ද ලබාවා" යි මෙසේ කියයුතු.

පාමොක් උදෙසුවා විසින් "මෙහෙණනට අවවාද කරන්නකු වශයෙන් සඞ්ඝ සම්මත වූ මහණෙක් ඇද්ද?" යි පිළිවිසියැයුතු. ඉදින් මෙහෙණනට අවවාද කරන්නකු වශයෙන් සම්මත කිසියම් මහණෙක් වී නම්, පාමොක් උදෙසුවා විසින් "මෙ නම් මහණ භික්ඛුනොවාදක විසින් සම්මත යැ. ඔහු කරා භික්ෂුණීසඞ්ඝයා එළැඹේවා" යි කියයුතු. ඉදින් භික්ඛුනොවාදක සම්මතිය ලත් කිසිදු මහණෙක් නො වී නම් පාමොක් උදෙසුවා විසින් "කවර නම් ආයුෂ්මත් කෙනෙක් මෙහෙණනට අවවාද කරන්නට සමත් වෙත් ද?" යි විචාළයුතු.

ඉදින් කිසි මහණෙක් මෙහෙණනට ඔවා දෙන්නට සමත් වන්නේ නම් හේ අටහින් සමන්විත වී නම්, ඔහු සම්මත කොට, "මෙනම් මහණ භික්ඛුනොවාදක විසින් සම්මත යැ. ඔබ කරා භික්ෂුණීසඞ්ඝ තෙමේ එළැඹේවා" යි කියැයුතු. ඉදින් කිසි දු මහණෙක් මෙහෙණනට ඔවා දෙන්නට සමත් නො වී නම්, 'භික්ඛුනොවාදක' යැ යි සම්මත කිසි දු මහණෙක් මෙහි නැත, භික්ෂුණීසඞ්ඝ තෙමේ ප්‍රසාද එළවන ගුණයෙන් එය සම්පාදනය කෙරේවා" යි කියැයුතු.

31. එ සමයෙහි මහණහු භික්ඛුනොවාදක සම්මති නො පිළිගනිත්. භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළහ. "මහණෙනි, අවවාදක සම්මතිය නො පිළිගතයුතු නො වේ. යමෙක් නො පිළිගන්නේ ද ඔහුට දුකුළා ඇවැත් වන්නේ" යැ යි වදාළසේක.

එ සමයෙහි එක්තරා අව්‍යක්ත මහණෙක් වෙයි. ඔහු කරා මෙහෙණහු එළැඹ "ආයුෂ්මත් වහන්ස, භික්ඛුනොවාදය පිළිගත මැනැවැ" යි කීහ.

"අහං හි භගිනි, බාලො. කථාහං ඔවාදං ගණ්හාමී"ති. ගණ්හාහය්‍ය ඔවාදං. එවං හි භගවතා පඤ්ඤත්තං 'භික්ඛූහි භික්ඛුනීනං ඔවාදො ගහෙතබ්බො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා බාලං අවසෙසෙහි ඔවාදං ගහෙතුන්ති".**

32. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං "ඔවාදං අය්‍ය ගණ්හාහී"ති. "අහං හි භගිනි ගිලානො. කථාහං ඔවාදං ගණ්හාමී"ති. "ගණ්හාහය්‍ය ඔවාදං. එවං හි භගවතා පඤ්ඤත්තං: ඨපෙත්වා බාලං අවසෙසෙහි ඔවාදො ගහෙතබ්බො"ති.

භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා බාලං ඨපෙත්වා ගිලානං අවසෙසෙහි ඔවාදං ගහෙතුන්ති".**

33. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගමිකො හොති. තං භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං: "ඔවාදං අය්‍ය ගණ්හාහී"ති. "අහං හි භගිනි, ගමිකො. කථාහං ඔවාදං ගණ්හාමී"ති "ගණ්හාහය්‍ය ඔවාදං. එවං හි භගවතා පඤ්ඤත්තං: ඨපෙත්වා බාලං ඨපෙත්වා ගිලානං අවසෙසෙහි ඔවාදො ගහෙතබ්බො"ති.

භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා බාලං ඨපෙත්වා ගිලානං ඨපෙත්වා ගමිකං අවසෙසෙහි ඔවාදං ගහෙතුන්ති".**

34. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අරඤ්ඤෙ විහරති. තං භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං "ඔවාදං අය්‍ය, ගණ්හාහී"ති. "අහං හි භගිනි, අරඤ්ඤෙ විහරාමි කථාහං ඔවාදං ගණ්හාමී"ති. "ගණ්හාහය්‍ය ඔවාදං එවං හි භගවතා පඤ්ඤත්තං: ඨපෙත්වා බාලං ඨපෙත්වා ගිලානං ඨපෙත්වා ගමිකං අවසෙසෙහි ඔවාදො ගහෙතබ්බො"ති.

භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ ආරඤ්ඤකෙන භික්ඛුනා ඔවාදං ගහෙතුං සඞ්කෙතඤ්ච කාතුං අත්‍ර පටිහරිස්සාමී"ති.**

''බිහිනිය, මම නොදන්නෙකිමි, මම කෙසේ නම් අවවාදක සම්මතිය පිළිගනිම් ද?'' යි කී ය. ''ආයුෂ්මත් වහන්ස, අවවාදක සම්මතිය පිළිගන්න. භික්ෂූන් විසින් මෙහෙණනට අවවාද කිරීමේ සම්මතිය පිළිගතයුතු යැ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද'' යි ඕ කීවා ය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ''මහණෙනි, අව්‍යක්තයා හැර සෙසු භික්ෂූන් විසින් භික්ඛුනොවාදක සම්මතිය පිළිගන්නට අනුදනිමි'' යි වදළසේක.

32. එ සමයෙහි එක්තරා මහණෙක් ගිලන් වේ. මෙහෙණහු ඔහු කරා එළඹ, ''ආයුෂ්මයන් වහන්ස, භික්ඛුනොවාදක සම්මතිය පිළිගන්නැ'' යි කීහ. ''බිහිනියෙනි, මම ගිලන්මි. කෙසේ මම අවවාදක සම්මතිය පිළිගනිම් ද?'' යි හේ කිව, ''ආයුෂ්මත් වහන්ස, අවවාදක සම්මතිය පිළිගන්න. 'අව්‍යක්තයා හැර සෙස්සවුන් විසින් අවවාදක සම්මතිය පිළිගතයුතු යැ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද'' යි කීහ.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළාහ. ''මහණෙනි, අව්‍යක්තයා ද ගිලනා ද හැර සෙස්සන් විසින් අවවාද සම්මතිය පිළිගන්නට අනුදනිමි'' යි වදළසේක.

33. එසමයෙහි එක්තරා මහණෙක් ගමනෙක යෙදුණේ විය: මෙහෙණහු ඔහු වෙත එළැඹ, ''ආයුෂ්මත් වහන්ස, භික්ඛුනොවාද සම්මතිය පිළිගන්නැ'' යි කීහ. ''නැගැණියනි, මම ගමිකයෙමි. එ හෙයින් කෙසේ නම්, මෙහෙණනට අවවාද කිරීමේ කාර්‍ය්‍යය බාරගනිම් ද?'' හේ කී ය. ''ආයුෂ්මයන් වහන්ස, අවවාදක සම්මතිය පිළිගත මැනැව, අව්‍යක්තයා ද ගිලනා ද හැර සෙස්සන් විසින් අවවාදක සම්මතිය පිළිගතයුතු යැ''යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් පනවනලද'' යි කීහ.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ''මහණෙනි, අව්‍යක්තයා ද ගිලනා ද ගමිකයා ද හැර සෙස්සන් විසින් අවවාදක සම්මතිය පිළිගතයුතු යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

34. එ සමයෙහි එක්තරා මහණෙක් වෙනෙහි වෙසෙයි. මෙහෙණහු ඔහු කරා එළඹ, ''ආයුෂ්මත් වහන්ස, අවවාදක සම්මතිය පිළිගන්නැ'' යි කීහ. ''බුහුනැණියනි, මම වෙනෙහි වෙසෙමි. කෙසේ නම් අවවාදක සම්මතිය පිළිගනිම් ද?'' යි හේ කිව. ''ආයුෂ්මයන් වහන්ස, අවවාදක සම්මතිය පිළිගන්නැ. 'අව්‍යක්තයා ද ගිලනා ද ගමිකයා ද හැර සෙස්සන් විසින් අවවාදක සම්මතිය පිළිගතයුතු' යැ යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද''යි මෙහෙණහු කීහ.

භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැලකළහ. ''මහණෙනි, වනවැසි මහණ විසින් භික්ඛුනොවාදක සම්මතිය පිළිගන්නට ද අසෝ තැන දී අවවාද කරන්නෙමි යි මෙ තැන දී අවවාද කරන්නෙමි යි අවවාද කරන තැන පිළිබඳ සංකෙතයක් කරන්නට ද අනුදනිමි'' යි වදළසේක.

35. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඔවාදං ගහෙත්වා න ආරොචෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ඔවාදො න ආරොචෙතබ්බො. යො න ආරොචෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

36. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඔවාදං ගහෙත්වා න පච්චාහරන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ඔවාදො න පච්චාහරිතබ්බො. යො න පච්චාහරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

37. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො සංකෙතං න ගච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා සංකෙතං න ගන්තබ්බං. යා න ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

38. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො දීඝානි කායබන්ධනානි ධාරෙන්ති. තෙහෙව ඵාසුකෙ නමෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා දීඝං කායබන්ධනං ධාරෙතබ්බං. යා ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා එකපරියාකතං කායබන්ධනං. න ච තෙන ඵාසුකා නමෙතබ්බා. යා නමෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

39. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො විලීවෙන පට්ටෙන ඵාසුකෙ නමෙන්ති, චම්මපට්ටෙන ඵාසුකෙ නමෙන්ති, දුස්සපට්ටෙන ඵාසුකෙ නමෙන්ති, දුස්සවෙණියා ඵාසුකෙ නමෙන්ති, දුස්සවට්ටියා ඵාසුකෙ නමෙන්ති, චොළපට්ටෙන ඵාසුකෙ නමෙන්ති, චොළවෙණියා ඵාසුකෙ නමෙන්ති, චොළවට්ටියා ඵාසුකෙ නමෙන්ති, සුත්තවෙණියා ඵාසුකෙ නමෙන්ති, සුත්තවට්ටියා ඵාසුකෙ නමෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා විලීවෙන පට්ටෙන ඵාසුකා නමෙතබ්බා, න චම්මපට්ටෙන ඵාසුකා නමෙතබ්බා, න දුස්සපට්ටෙන ඵාසුකා නමෙතබ්බා, න දුස්සවෙණියා ඵාසුකා නමෙතබ්බා, න දුස්සවට්ටියා ඵාසුකා නමෙතබ්බා, න චොළපට්ටෙන ඵාසුකා නමෙතබ්බා, න චොළවෙණියා ඵාසුකා නමෙතබ්බා, න චොළවට්ටියා ඵාසුකා නමෙතබ්බා, න සුත්තවෙණියා ඵාසුකා නමෙතබ්බා, න සුත්තවට්ටියා ඵාසුකා නමෙතබ්බා. යා නමෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.

35. එසමයෙහි භික්ෂූහු අවවාදක සම්මතිය පිළිගෙන ආරොචනය නො කරත් (නො දන්වත්). භාග්‍යවතුන් වහන්සේට මේ පවත සැලකළහ. **''මහණෙනි, අවවාදක සම්මතිය පිළිගෙන ආරොචනය නො කොට නො සිටියයුතු ය. යමෙක් ආරොචනය නො කරන්නේ වී නම්, ඔහුට දුකුළා ඇවැත් වේ''** යැ යි වදළසේක.

36. එ සමයෙහි මහණහු අවවාදක සම්මතිය පිළිගෙන ඒ බව පෙරළා නො සැල කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ. **''මහණෙනි, අවවාදක සම්මතිය පිළිගත් බව පෙරළා නො ම නො දැන්වියයුතු. යමෙක් නො දන්වා නම් ඔහුට දුකුළා ඇවැත් වේ''** යැ යි වදළසේක.

37. එ සමයෙහි මෙහෙණෝ සලකුණු කළ තැනට නො යෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ. **''මහණෙනි, භික්ෂුණිය විසින් සලකුණු කළ තැනට නො යෑම නො කළයුතු යි. යම් මෙහෙණක් නො යන්නී නම් (ඇයට) දුකුළා ඇවැත් වේ'' යි** වදළසේක.

38. එ කල්හි මෙහෙණෝ දිග කාබහන් දරත්, එයින් ම ඉළ ඇට නමත්, 'කාමභොගී ගැහැණුන් මෙනැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්, භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ. **''මහණෙනි, මෙහෙණ විසින් දිගු කාබහන් නො දැරියයුතු. යම් මෙහෙණක් දරා ද (ඇයට) දුකුළා ඇවැත් වේ. මහණෙනි, මෙහෙණට එක් වෙළුම් පටෙකින් යුත් කාබහන අනුදනිමි. එයින් ඉළ ඇට නො නැමියයුතු. යම් මෙහෙණක් නමා ද (ඇයට) දුකුළා ඇවත් වේ''** යි වදළසේක.

39. එ සමයෙහි මෙහෙණෝ මොළොක් උණපතුරෙන් කළ පටියෙන් ඉළඇට නමති, සම්පටින් ඉළඇට නමති, සුදුරෙදි වෙණියෙන් ඉළඇට නමති, සුදුරෙදි වැටියෙන් ඉළඇට නමති, කසාවන් රෙදිපටින් ඉළඇට නමති, කසාවන් රෙදිවෙණියෙන් ඉළඇට නමැ්, කසාවන් රෙදිවැටින් ඉළඇට නමති, හුවෙණියෙන් ඉළඇට නමති, හුවැටින් ඉළඇට නමත්. 'ගිහී කාමභොගිනීන් මෙනැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියත්, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. **''මහණෙනි, මෙහෙණ විසින් මොළොක් උණපතුරෙන් කළ පටියෙන් ඉළඇට නො නැමියයුතු, සම්පටින් ඉළඇට නො නැමියයුතු, සුදුරෙදි පටින් ඉළඇට නො නැමියයුතු, සුදුරෙදි වෙණියෙන් ඉළඇට නො නැමියයුතු, සුදුරෙදි වැටින් ඉළඇට නො නැමියයුතු, කසාවන් රෙදිපටින් ඉළඇට නො නැමියයුතු, කසාවන් රෙදි වෙණියෙන් ඉළඇට නො නැමියයුතු, කසාවන් රෙදි වැටින් ඉළඇට නො නැමියයුතු, හුවෙණියෙන් ඉළඇට නො නැමියයුතු, හුවැටින් ඉළඇට නො නැමියයුතු. යම් මෙහෙණක් නමා ද (ඇයට) දුකුළා ඇවැත් වේ''** යි වදළසේක.

40. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අට්ඨිල්ලෙන ජඝනං සංඝාපෙන්ති, ගොහනුකෙන ජඝනං කොට්ටාපෙන්ති, හත්ථං කොට්ටාපෙන්ති, හත්ථකොච්ඡං කොට්ටාපෙන්ති පාදං කොට්ටාපෙන්ති. පාදකොච්ඡං කොට්ටාපෙන්ති, ඌරුං කොට්ටාපෙන්ති. මුඛං කොට්ටාපෙන්ති, දන්තමංසං කොට්ටාපෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"න භික්ඛවෙ භික්ඛුනියා අට්ඨිල්ලෙන ජඝනං සංඝාපෙතබ්බං -පෙ- න දන්තමංසං කොට්ටාපෙතබ්බං. යා කොට්ටාපෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

41. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො මුඛං ආලිම්පෙන්ති, මුඛං උම්මද්දෙන්ති, මුඛං චුණ්ණෙන්ති, මනොසිලිකාය මුඛං ලඤ්ජෙන්ති, අඞ්ගරාගං කරොන්ති, මුඛරාගං කරොන්ති, අඞ්ගරාගමුඛරාගං කරොන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"න භික්ඛවෙ භික්ඛුනියා මුඛං ආලිම්පිතබ්බං, න මුඛං උම්මද්දෙතබ්බං, න මුඛං චුණ්ණෙතබ්බං, න මනොසිලිකාය මුඛං ලඤ්ජෙතබ්බං, න අඞ්ගරාගො කාතබ්බො, න මුඛරාගො කාතබ්බො, න අඞ්ගරාගමුඛරාගො කාතබ්බො, යා කරෙය්‍ය[1] ආපත්ති දුක්කටස්සා"ති.**

42. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො අවඞ්ගං කරොන්ති, විසෙසකං කරොන්ති, ඔලොකනකෙන ඔලොකෙන්ති, සාලොකෙ තිට්ඨන්ති, නච්චං[2] කාරාපෙන්ති, වෙසිං වුට්ඨාපෙන්ති, පානාගාරං ඨපෙන්ති, සූනං ඨපෙන්ති. ආපණං පසාරෙන්ති. වඩ්ඪිං පයොජෙන්ති, වාණිජ්ජං පයොජෙන්ති, දාසං උපට්ඨාපෙන්ති, දාසිං උපට්ඨාපෙන්ති. කම්මකාරං උපට්ඨාපෙන්ති කම්මකාරිං උපට්ඨාපෙන්ති, තිරච්ඡානගතං උපට්ඨාපෙන්ති, හරීතකපක්කිකං පකිණන්ති, නමතකං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: සෙය්‍යථාපි ගිහීකාමභොගිනියොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"න භික්ඛවෙ භික්ඛුනියා අවඞ්ගං කාතබ්බං. -පෙ- න නමතකං ධාරෙතබ්බං. යා ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.**

---

1. කාරෙය්‍ය - මජසං.
2. සනච්චං - මජසං.

40. එ සමයෙහි මෙහෙණෝ ගවයන්ගේ කෙණ්ඩා ඇටයෙන් කටි පෙදෙස (තුනටිය පෙදෙස) අතුල්ලති, ගවයන්ගේ හනු ඇටයෙන් කටිපෙදෙස කොටවති, අතෙහි (සිතුවම්) කොටවති, පිටි අත කොටවති. පයෙහි කෙණ්ඩා කොටවති, පිටිපතුල කොටවති, කළවා කොටවති. මුව කොටවති, දත්මස කොටවත්. ගිහී කාම-භොගිනීන් මෙනැ යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළාහ. **''මහණෙනි, මෙහෙණ විසින් ගවයන්ගේ කෙණ්ඩාඇටයෙන් කටි පෙදෙස නො ඇතිල්ලිය යුතු ... දත් මස නො කෙටවිය යුතු. යම් මෙහෙණක් කොටවා නම් දුකුළා ඇවැත් වේ''** යි වදළසේක.

41. එ සමයෙහි සවග මෙහෙණෝ මුව ආලෙප කරති, මුව සිනිඳු කරති, මුව වත්සුණුයෙන් තවරති, මනොසිල (කල්ක) යෙන් මුව ලකුණු කරති, අඞ්ගරාග (ඇඟ පාට කිරීම) කරති, මුඛරාගය (මුහුණ පාටකිරීම) කරති, අඞ්ගරාගමුඛරාග (දෙක ම) කරත්. 'ගිහිකාමභොගිනීන් මෙනැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැල කළහ. **''මහණෙනි, මෙහෙණ විසින් මුව ආලෙපකිරීම නො කළ යුතු, මුව සිනිඳු කිරීම නො කළයුතු, මුව සුණු තැවරීම නො කළයුතු, මනොසිල කල්කයෙන් මුව ලකුණු කිරීම නො කළයුතු, අඞ්ගරාගය නො කළයුතු, මුඛරාගය නො කළයුතු, අඞ්ගරාග-මුඛරාග නො කළයුතු. යම් මෙහෙණක් කෙරේ නම් දුකුළා ඇවැත් වේ''** යි වදළසේක.

42. එ සමයෙහි සවග මෙහෙණෝ අවඞ්ගය (ඇසෙහි අඳුන් ගානා විට ඇස් කෙළවර යටිකුරු වූ විසිතුරු රේඛා ඇඳීම) කෙරෙති, කම්මුලෙහි විසෙසකය (කම්මුලෙහි විසිතුරු පත්‍ර ලෙඛා) කෙරෙති, කවුළුවෙන් (වීථිය දෙස) බලති, ආලොක සහිත තැන (දෙර හැර සිරුරින් අඩක් දක්වමින්) සිටිති, නෘත්‍ය කරවති, වෙසඟනන් එළවා සිටුවති, සුරාසැල් තබති, මස් වෙළඳ සැල් තබති (මස් විකුණති), වෙළඳසැල් විවෘත කෙරෙති, පොලී කිරීමෙහි යෙදෙති, වෙළඳාමෙහි යෙදෙති, දසයන් එළවා සිටුවති, දසීන් එළවා සිටුවති, කම්කරුවන් එළවා සිටුවති, කම්කරු ස්ත්‍රීන් එළවා සිටුවති, තිරිසනුන් එළවා සිටුවති, මිශ්‍ර පළතුරුහල් (අරළු ඈ ගෙඩිවර්ග විකුණන අවන්හල්) විවෘත කෙරෙති, ඉළඇට නමන බැඳුම් දරත්. 'ගිහී කාමභොගිනීන් මෙනැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. **''මහණෙනි, මෙහෙණ විසින් අවඞ්ගය නො කළයුතු ... නමකකය නො දැරියයුතු. යම් මෙහෙණක් දරා නම් දුකුළා ඇවැත් වේ''** යි (වදළසේක).

43. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො සබ්බනීලකානි චීවරානි ධාරෙන්ති, සබ්බපීතකානි චීවරානි ධාරෙන්ති, සබ්බලොහිතකානි චීවරානි ධාරෙන්ති, සබ්බමඤ්ජෙට්ඨිකානි චීවරානි ධාරෙන්ති, සබ්බකණ්හානි චීවරානි ධාරෙන්ති, සබ්බමහාරඞ්ගරත්තානි චීවරානි ධාරෙන්ති, සබ්බමහානාමරත්තානි චීවරානි ධාරෙන්ති, අච්ඡින්නදසානි චීවරානි ධාරෙන්ති, දීඝදසානි චීවරානි ධාරෙන්ති, පුප්ඵදසානි චීවරානි ධාරෙන්ති, ඵණදසානි චීවරානි ධාරෙන්ති, කඤ්චුකං ධාරෙන්ති, තිරීටකං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනියො'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා සබ්බනීලකානි චීවරානි ධාරෙතබ්බානි -පෙ- න තිරීටකං ධාරෙතබ්බං. යා ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

44. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී කාලං කරොන්තී එවමාහ: 'මමච්චයෙන මය්හං පරික්ඛාරො සඞ්ඝස්ස හොතූ'ති. තත්ථ භික්ඛූ ච භික්ඛුනියො ච විවදන්ති 'අම්හාකං හොති, අම්හාකං හොතී'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "භික්ඛුනී චෙ භික්ඛවෙ කාලං කරොන්තී එවං වදෙය්‍ය 'මමච්චයෙන මය්හං පරික්ඛාරො සඞ්ඝස්ස හො'තූති. අනිස්සරො තත්ථ භික්ඛුසඞ්ඝො භික්ඛුනී සඞ්ඝස්සෙවෙතං. සික්ඛමානා චෙ භික්ඛවෙ -පෙ- සාමණෙරී චෙ භික්ඛවෙ කාලං කරොන්තී එවං වදෙය්‍ය: 'මමච්චයෙන මය්හං පරික්ඛාරොසඞ්ඝස්ස හොතූ'ති. අනිස්සරො තත්ථ භික්ඛු සඞ්ඝො භික්ඛුනීසඞ්ඝස්සෙවෙතං. භික්ඛු චෙ භික්ඛවෙ කාලං කරොන්තො එවං වදෙය්‍ය: 'මමච්චයෙන මය්හං පරික්ඛාරො සඞ්ඝස්ස හොතූ'ති. අනිස්සරො තත්ථ භික්ඛුනීසඞ්ඝො භික්ඛුසඞ්ඝස්සෙවෙතං. සාමණෙරො චෙ භික්ඛවෙ -පෙ- උපාසකො චෙ භික්ඛවෙ -පෙ- උපාසිකා චෙ භික්ඛවෙ -පෙ- අඤ්ඤො චෙ භික්ඛවෙ කොචි කාලං කරොන්තො එවං වදෙය්‍ය: 'මමච්චයෙන මය්හං පරික්ඛාරො සඞ්ඝස්ස හොතූ'ති. අනිස්සරො තත්ථ භික්ඛුනීසඞ්ඝො භික්ඛුසඞ්ඝස්සෙවෙතන්ති".

45. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා පුරාණමල්ලී භික්ඛුනීසු පබ්බජිතා හොති. සා රථිකාය දුබ්බලකං භික්ඛුං පස්සිත්වා අංසකූටෙන පහාරං දත්වා පවට්ටෙසි.[1] භික්ඛූ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: 'කථං හි නාම භික්ඛුනී භික්ඛුස්ස පහාරං දස්සතී'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා භික්ඛුස්ස පහාරො දාතබ්බො. යා දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා භික්ඛුං පස්සිත්වා දූරතොව ඔක්කමිත්වා මග්ගං දාතුන්ති."

1. පාතෙසි - මජසං.

43. එ සමයෙහි සවග මෙහෙණෝ සියල්ල නිල්වන් වූ සිවුරු දරති, සියල්ල පීතවර්ණ වූ සිවුරු දරති, සියල්ල ලේවන් වූ සිවුරු දරති, සියල්ල මදටවන් වූ සිවුරු දරති, සියල්ල කළුවන් වූ සිවුරු දරති, සියල්ල රත්වෑයන්ගේ පිටෙහි පැහැ වැනි පැහැයෙන් රඳනලද සිවුරු දරති, සියල්ල පියුම්පෙති වැනි පැහැයෙන් රඳනලද සිවුරු දරති, නො සිඳින ලද දහවලු කොන් ඇති සිවුරු දරති, දිගු දහවලු කොන් ඇති සිවුරු දරති, මලින් යුත් දහවලු ඇති සිවුරු දරති, පෙණ වැනි දහවලු ඇති සිවුරු දරති, සැට්ට දරති, රුක්සුඹුළු දරත්. 'ගිහී කාමභොගිනීන් මෙනැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකළෝ ය. **"මහණෙනි, මෙහෙණ විසින් සියල්ල නිල්වන් වූ සිවුරු නො දැරියයුතු ... රුක්සුඹුළු නො දැරියයුතු. යම් මෙහෙණක් දරා නම් දුකුළා ඇවැත් වේ"** යි වදාළසේක.

44. එ සමයෙහි එක් මෙහෙණක් කලුරිය කරන්නී 'මා ඇවෑමෙන් මාගේ පිරිකර සඞ්ඝයාට අයිති වේව' යි කිවූ ය. එහි මහණෝ ද මෙහෙණෝ ද 'අපට අයිති යැ අපට අයිති යැ' යි විවාද කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දන්වූහ. **"මහණෙනි, ඉදින් මෙහෙණක් කලුරිය කරන්නී 'මා ඇවෑමෙන් මාගේ පිරිකර සඞ්ඝයාට වේව' යි කියන්නී නම් එහි භික්ෂු සඞ්ඝයා හිමිකරු නො වේ. මෙය භික්ෂුණී සඞ්ඝයාට ම ය. මහණෙනි, ඉදින් සික්ඛමානාවක් ... මහණෙනි, ඉදින් සාමණෙරියක් කලුරිය කරන්නී 'මා ඇවෑමෙන් මාගේ පිරිකර සඞ්ඝයාට වේව' යි කියන්නී නම් එහි භික්ෂු සඞ්ඝයා හිමිකරු නො වේ. මෙය භික්ෂුණී සඞ්ඝයාට ම ය. මහණෙනි, ඉදින් මහණෙක් කලුරිය කරන්නේ 'මා ඇවෑමෙන් මාගේ පිරිකර සඞ්ඝයාට වේව' යි කියන්නේ නම් එහි භික්ෂුණී සඞ්ඝයා හිමිකරු නො වේ. මෙය භික්ෂුසඞ්ඝයාට ම ය. මහණෙනි, ඉදින් සාමණෙරයෙක් ... මහණෙනි, ඉදින් උපාසකයෙක් ... මහණෙනි, ඉදින් උපාසිකාවක් ... මහණෙනි, ඉදින් අන් කිසිවෙක් කලුරිය කරන්නේ 'මා ඇවෑමෙන් මාගේ පිරිකර සඞ්ඝයාට වේව' යි කියන්නේ නම් එහි භික්ෂුණීසඞ්ඝයා හිමිකරු නො වේ. මෙය භික්ෂුසඞ්ඝයාට ම"** යැ යි (වදාළසේක.)

45. එ සමයෙහි ගිහිකල මල්ලයකුගේ බිරියක් වූ ස්ත්‍රියක් මෙහෙණන් වෙත පැවිදිවූ ය. ඕ වීථියෙහි දී දුබල මහණකු දක දසරුවෙන් පහර දී පෙරළුවා ය. 'කෙසේ නම් මෙහෙණක් මහණකුට පහර දෙන්නී ද, යි භික්ෂු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දන්වූහ. **"මහණෙනි, මෙහෙණ විසින් මහණහට පහර නො දියයුතු. යම් මෙහෙණක් පහර දෙන්නී නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, මෙහෙණ විසින් මහණකු දක දුර දී ම ඉවත්වී මහ (ඉඩ) දෙන්නට අනුදනිමි යි"** (වදාළසේක.)

46. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී පවුත්ථපතිකා ජාරෙන ගබ්භිනී හොති. සා ගබ්භං පාතෙත්වා කුලූපිකං භික්ඛුනිං එතදවොච: 'හන්දය්‍යෙ ඉමං ගබ්භං පත්තෙන නීහරා'ති. අථ ඛො සා භික්ඛුනී තං ගබ්භං පත්තෙ පක්ඛිපිත්වා සඞ්ඝාටියා පටිච්ඡාදෙත්වා අගමාසි. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන පිණ්ඩචාරිකෙන භික්ඛුනා සමාදානං කතං හොති 'යමහං පඨමං භික්ඛං ලභිස්සාමි න තං අදත්වා භික්ඛුස්ස වා භික්ඛුනියා වා පරිභුඤ්ජිස්සාමී'ති.

අථ ඛො සො භික්ඛු තං භික්ඛුනිං පස්සිත්වා එතදවොච: 'හන්ද භගිනි භික්ඛං පතිගණ්හා'ති[1]. 'අලං අය්‍යා'ති. දුතියම්පි ඛො සො භික්ඛු තං භික්ඛුනිං එතදවොච: 'හන්ද භගිනි භික්ඛං පතිගණ්හා'ති. 'අලං අය්‍යා'ති. තතියම්පි ඛො සො භික්ඛු තං භික්ඛුනිං එතදවොච: 'හන්ද භගිනි භික්ඛං පතිගණ්හා'ති 'අලං අය්‍යා'ති. 'මයා ඛො භගිනි සමාදානං කතං යමහං පඨමං භික්ඛං ලභිස්සාමි න තං අදත්වා භික්ඛුස්ස වා භික්ඛුනියා වා පරිභුඤ්ජිස්සාමීති. හන්ද භගිනි භික්ඛං පතිගණ්හා'ති.

අථ ඛො සා භික්ඛුනී තෙන භික්ඛුනා නිප්පීළියමානා නීහරිත්වා පත්තං දස්සෙසි: 'පස්ස අය්‍ය – පත්තෙ ගබ්භං. මා ච කස්සචි ආරොචෙසී'ති. අථ ඛො සො භික්ඛු උජ්ඣායති, ඛීයති, විපාචෙති: 'කථං හි නාම භික්ඛුනී පත්තෙන ගබ්භං නීහරිස්සතී'ති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති, විපාචෙන්ති: 'කථං හි නාම භික්ඛුනී පත්තෙන ගබ්භං නීහරිස්සතී'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා පත්තෙන ගබ්භො නීහරිතබ්බො. යා නීහරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා භික්ඛුං පස්සිත්වා නීහරිත්වා පත්තං දස්සෙතුන්ති".

47. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො භික්ඛුං පස්සිත්වා පරිවත්තෙත්වා පත්තමූලං දස්සෙන්ති. භික්ඛූ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: 'කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො භික්ඛුං පස්සිත්වා පරිවත්තෙත්වා පත්තමූලං දස්සෙස්සන්තී'ති. අථ ඛො භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා භික්ඛුං පස්සිත්වා පරිවත්තෙත්වා පත්තමූලං දස්සෙතබ්බං. යා දස්සෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා භික්ඛුං පස්සිත්වා උක්කුජ්ජිත්වා පත්තං දස්සෙතුං. යඤ්ච පත්තෙ ආමිසං හොති තෙන ච භික්ඛු නිමන්තෙතබ්බොති".

1. පටිග්ගණ්හාති - මජසං.

46. එ සමයෙහි බැහැර වෙසෙන හිමියා ඇති එක්තරා ස්ත්‍රියක් සොර සැමියකු නිසා ගැබිනි වූය. ඕ ගැබ හෙළා කුලූපග මෙහෙණකට මෙසේ කිවූ ය. 'ආර්‍ය්‍යාවෙනි, මේ ගැබ පාත්‍රයෙන් බැහැර ගෙන යනු මැනවැ' යි. ඉක්බිති ඒ මෙහෙණ ඒ ගැබ පාත්‍රයෙහි බහා සඟළ සිවුරින් වසාගෙන ගියා ය. එසමයෙහි එක්තරා පිණ්ඩචාරික මහණකු විසින් 'මම පළමු යම් භික්‍ෂාවක් ලබන්නෙම් ද එය මහණකුට හෝ මෙහෙණකට හෝ නො දී නො වළඳන්නෙමැ' යි සමාදන්වීමක් කරන ලද්දේ වෙයි.

ඉක්බිති ඒ මහණ ඒ මෙහෙණ දක 'සොහොවුරියනි, භික්‍ෂාව පිළිගනුව' යි කී ය. 'ආර්‍ය්‍යයෙනි, කම් නැත' යී (කිවූය) දෙවැනි වරද ඒ මහණ 'සොහොවුරියනි, භික්‍ෂාව පිළිගනුව' යි ඒ මෙහෙණට කී ය. 'ආර්‍ය්‍යයෙනි, කම්නැතැ' යි කිවූ ය. තෙවැනි වර ද ඒ මහණ 'සොහොවුරියනි, භික්‍ෂාව පිළිගනුව'' යි ඒ මෙහෙණට කී ය. 'ආර්‍ය්‍යයෙනි, කම්නැතැ' යි කිවූ ය. 'සොහොයුරියනි, මා විසින් 'මම පළමු යම් භික්‍ෂාවක් ලබන්නෙම් ද එය මහණකුට හෝ මෙහෙණකට නො දී නො වළඳන්නෙමැ' යි සමාදන්වීමක් කරන ලද්දේ වෙයි. එහෙයින් සොහොවුරියනි භික්‍ෂාව පිළිගනුව' යි කී ය.

ඉක්බිති ඒ මෙහෙණ ඒ මහණ විසින් පෙළනු ලබන්නී පාත්‍රය බැහැර කොට 'ආර්‍ය්‍යයන් වහන්ස, පාත්‍රයෙහි ගැබ බැලුව මැනවි, කිසිවකුට ද නො දන්වූව මැනවැ' යි කියා (පාත්‍රය) පෙන්වූ ය. ඉක්බිති ඒ මහණ 'කෙසේ නම් මෙහෙණක් පාත්‍රයෙන් ගැබක් බැහැරට ගෙන යා ද' යි ලමු කොට සිතයි, නුගුණ කියයි, දෙස් පතුරුවයි. වැලි ඒ මහණ මෙ කරුණ භික්‍ෂූන්ට සැලකෙළේ ය. අල්පෙච්ඡ වූ ලද දෙයින් සතුටු වන්නා වූ පවට ලජ්ජා ඇති (පව් කිරීමෙහි) කුකුස් ඇති හික්මෙනු කැමති යම් ඒ මහණ කෙනෙක් වෙත් ද ඔවුහු 'කෙසේ නම් මෙහෙණක් පාත්‍රයෙන් ගැබක් බැහැරට ගෙන යන්නී ද' යි ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැල කළහ. **''මහණෙනි, මෙහෙණක විසින් පාත්‍රයෙන් ගැබක් බැහැරට නො ගෙන යායුතු. යම් මෙහෙණක් ගෙනයන්නී ද දුකුළා ඇවැත් වේ. මහණෙනි, මෙහෙණ විසින් මහණකු දක පාත්‍රය බැහැර කොට දක්වීමට අනුදනිමි''** යි (වදාළසේක).

47. එසමයෙහි සවග මෙහෙණෝ මහණකු දක පාත්‍රය පෙරළා පාත්‍රමූලය (පාත්‍රයෙහි අඩිය) පෙන්වති. 'කෙසේ නම් සවග මෙහෙණෝ මහණකු දක පාත්‍රය පෙරළා පාත්‍රමූලය පෙන්වත් ද' යි මහණෝ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් ඉක්බිති ඒ මහණෝ මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. **''මහණෙනි, මෙහෙණ විසින් මහණකු දක පාත්‍රය පෙරළා පාත්‍ර මූලය නො දක්වියයුතු. යම් මෙහෙණක් දක්වා නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, මෙහෙණ විසින් මහණකු දක උඩුකුරු කොට පාත්‍රය දක්වන්නට අනුදනිමි. පාත්‍රයෙහි යම් ආමිසයක් වෙයි නම් එයින් ද ඒ මහණ පැවරියයුතු''** යි වදාළසේක.

48. තෙන ඛො පන සමයෙන සාවත්ථියං රථියාය පුරිස-ව්‍යඤ්ජනං ඡඩ්ඩිතං හොති. තං භික්ඛුනියො සක්කච්චං උපනිජ්ඣායිංසු. මනුස්සා උක්කුට්ඨිං අකංසු. තා භික්ඛුනියො මංකූ අහෙසුං. අථ ඛො තා භික්ඛුනියො උපස්සයං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං. යා තා භික්ඛුනියො අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනියො කුක්කුච්චිකා සික්ඛාකාමා තා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: 'කථං හි නාම භික්ඛුනියො පුරිසව්‍යඤ්ජනං උපනිජ්ඣායිස්සන්තීති: අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. **''න භික්ඛවෙ භික්ඛුනියා පුරිස-ව්‍යඤ්ජනං උපනිජ්ඣායිතබ්බං. යා උපනිජ්ඣායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.''**

49. තෙන ඛො පන සමයෙන මනුස්සා භික්ඛූනං ආමිසං දෙන්ති. භික්ඛූ භික්ඛුනීනං දෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: 'කථං හි නාම භදන්තා අත්තනො පරිභොගත්ථාය දින්නං අඤ්ඤෙසං දස්සන්ති. මයම්පි න ජානාම දානං දාතුන්ති'. භගවතො එතමත්ථං ආරොචෙසුං. **''න භික්ඛවෙ අත්තනො පරිභොගත්ථාය දින්නං අඤ්ඤෙසං දාතබ්බං. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්සාති''.**

50. තෙන ඛො පන සමයෙන භික්ඛූනං ආමිසං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **''අනුජානාමි භික්ඛවෙ සඞ්ඝස්ස දාතුන්ති.''** බාළ්හතරං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **''අනුජානාමි භික්ඛවෙ පුග්ගලිකම්පි දාතුන්ති.''** තෙන ඛො පන සමයෙන භික්ඛූනං සන්නිධිකතං ආමිසං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **''අනුජානාමි භික්ඛවෙ භික්ඛූනං සන්නිධිං භික්ඛුනීහි භික්ඛූහි[1] පටිග්ගහාපෙත්වා පරිභුඤ්ජිතුන්ති.''**

51. තෙන ඛො පන සමයෙන මනුස්සා භික්ඛුනීනං ආමිසං දෙන්ති. භික්ඛුනියො භික්ඛූනං දෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: 'කථං හි නාම භික්ඛුනියො අත්තනො පරිභොගත්ථාය දින්නං අඤ්ඤෙසං දස්සන්ති. මයම්පි න ජානාම දානං දාතුන්ති'. භගවතො එතමත්ථං ආරොචෙසුං. **''න භික්ඛවෙ භික්ඛුනියා අත්තනො පරිභොගත්ථාය දින්නං අඤ්ඤෙසං දාතබ්බං. යා දදෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.''**

---

1. භික්ඛූහි - මජසං ඌනං

48. එ සමයෙහි සැවැත්නුවර වීථියෙක පුරුෂ නිමිත්තක් දමන ලද්දේ වෙයි. මෙහෙණෝ එය මැනැවින් සිත් එළවා බැලූහු. මිනිස්සු ඔල්වර හඬ නැඟූහ. ඒ මෙහෙණෝ (ලජ්ජාවෙන්) මකු වූහ. ඉක්බිති ඒ මෙහෙණෝ මෙහෙණවරට ගොස් මෙහෙණන්ට මෙ කරුණ සැලකළහ. අල්පෙච්ඡ වූ ලද දෑයින් සතුටු වන්නා වූ ලජ්ජී වූ (පවෙහි) කුකුස් ඇත්තා වූ ශික්ෂාකාමී වූ යම් ඒ මෙහෙණකෙනෙක් ( ) ද ඔවුහු 'කෙසේ නම් මෙහෙණෝ පුරුෂනිමිත්ත සිත් එළවා බැලූහු දැ' යි ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. වැලි ඒ මෙහෙණෝ මෙ කරුණ මහණුන්ට දැන්වූහ. මහණෝ මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. **''මහණෙනි, මෙහෙණ විසින් පුරුෂනිමිත්ත සිත් එළවා නො බැලියයුතු. යම් මෙහෙණක් සිත් එළවා බලා නම් දුකුළා ඇවැත් වේ''.**

49. එ සමයෙහි මිනිස්සු භික්ෂූන්ට ආමිසය දෙත්. භික්ෂූහු භික්ෂුණීන්ට දෙත්, 'කෙසේ නම් වහන්දෑ තමන්ට පරිභොග පිණිස දුන් දය අන්‍යයන්ට දෙන්නෝ ද. අපි ද දන් දෙන්නට නො දනිමු දැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. **''මහණෙනි, තමන්ට පරිභොග පිණිස දුන් දය අන්‍යයන්ට නො දියයුතු. යමෙක් දේ නම් දුකුළා ඇවැත් වේ'' යි** (වදාළ සේක.)

50. එ සමයෙහි භික්ෂූන්ට ආමිසය බොහෝ වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දැන්වූහ **''මහණෙනි, සඞ්ඝයාට දීමට අනුදනිමි'' යි** (වදාළසේක.) ඉතා බෙහෙවින් රැස් වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, පෞද්ගලික ලෙස ද දීමට අනුදනිමි'' යි** (වදාළ සේක.) එසමයෙහි භික්ෂූන්ට රැස් කළ ආමිසය බොහෝ වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, භික්ෂූන්ගේ සන්නිධි (වශයෙන් රැස් කළ) ආමිසය භික්ෂුණීන් විසින් ද භික්ෂූන් විසින් ද පිළිගන්වාගෙන වළඳන්නට අනුදනිමි'' යි** (වදාළසේක.)

51. **එසමයෙහි මිනිස්සු භික්ෂුණීන්ට** ආමිසය දෙත්, **භික්ෂුණීහු භික්ෂූන්ට** දෙත්, 'කෙසේ නම් **භික්ෂුණීහු** තමන්ට පරිභොග **පිණිස** දෙන ලද්ද අන්‍යයන්ට දෙන්නාහු ද, අපි ද දන් දෙන්නට නො දනුමෝ දැ' යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, මෙහෙණ විසින් තමන්ගේ පරිභොග පිණිස දෙන ලද්ද අන්‍යයන්ට නො දියයුතු, යම් මෙහෙණක් දේ නම් දුකුළ ඇවැත් වේ''** යි වදාළසේක.

52. තෙන ඛො පන සමයෙන භික්ඛුනීනං ආමිසං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ සඞ්ඝස්ස දාතුන්ති"**. බාළ්හතරං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ පුග්ගලිකම්පි දාතුන්ති"**. තෙන ඛො පන සමයෙන භික්ඛුනීනං සන්නිධිකතං ආමිසං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ භික්ඛුනීනං සන්නිධිං භික්ඛූහි භික්ඛුනීහි[1] පටිග්ගහාපෙත්වා[2] පරිභුඤ්ජි-තුන්ති"**.

53. තෙන ඛො පන සමයෙන භික්ඛූනං සෙනාසනං උස්සන්නං හොති. භික්ඛුනීනං න හොති. භික්ඛුනියො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසුං: 'සාධු භන්තෙ අය්‍යා අම්හාකං සෙනාසනං දෙන්තු තාවකාලිකන්ති'. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ භික්ඛුනීනං සෙනාසනං දාතුං තාවකාලිකන්ති"**.

54. තෙන ඛො පන සමයෙන උතුනියො භික්ඛුනියො ඔනද්ධමඤ්චං ඔනද්ධපීඨං අභිනිසීදන්තිපි අභිනිපජ්ජන්තිපි. සෙනාසනං ලොහිතෙන මක්ඛීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"න භික්ඛවෙ උතුනියා[3] භික්ඛුනියා ඔනද්ධමඤ්චං ඔනද්ධපීඨං අභිනිසීදිතබ්බං. අභිනිපජ්ජිතබ්බං. යා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ආවසථචීවරන්ති"**

ආවසථචීවරං[4] ලොහිතෙන මක්ඛීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ ආණිචොළකන්ති"**. චොළකං නිපතති[5]. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ සුත්තකෙන බන්ධිත්වා ඌරුයා බන්ධිතුන්ති"**. සුත්තකං ඡිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං. **"අනුජානාමි භික්ඛවෙ සංවෙල්ලියං කටිසුත්තකන්ති"**.

55. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො සබ්බකාලං කටිසුත්තකං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති. 'සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති'. භගවතො එතමත්ථං ආරොචෙසුං: **"න භික්ඛවෙ භික්ඛුනියා සබ්බකාලං කටිසුත්තකං ධාරෙතබ්බං. යා ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ උතුනියා කටිසුත්තකන්ති"**.

**දුතිය භාණවාරං.**

---

1. භික්ඛුනීහි - මජසං. උනං.
2. පටිග්ගාහාපෙත්වා - මජසං.
3. උතුනියා - මජසං. උනං.
4. ආවසථචීවරං - මජසං.
5. නිපතති - මජසං.

52. එසමයෙහි මෙහෙණන්ට ආමිසය බොහෝ වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, සඞ්ඝයාට දෙන්නට අනුදනිමි''** යි. ඉතා බෙහෙවින් රැස්වූයේ වෙයි. භාග්‍යවතුන් වහසේට මේ කරුණ දන්වූහ. **''මහණෙනි, පෞද්ගලිකව ද දීමට අනුදනිමි යි.** එසමයෙහි **භික්ෂුණීන්ගේ** සන්නිධි කළ ආමිසය බොහෝ වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, මෙහෙණන්ගේ සන්නිධි කළ ආමිසය භික්ෂූන් විසින් ද භික්ෂුණීන් විසින් ද පිළිගන්වාගෙන පරිභොග කරන්නට අනුදනිමි''** යි (වදළසේක.)

53. එසමයෙහි **භික්ෂූන්ට** සෙනසුන් බොහෝ වූයේ වෙයි. **භික්ෂුණීන්ට** නො වෙයි. 'වහන්ස, ආයුෂ්‍යන් වහන්සේ අපට තාවකාලික ව සෙනසුන් දෙන්නාහු නම් මැනවැ' යි **භික්ෂූන්** සමීපයට දූතයකු යැවූහ. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැල කළහ. **''මහණෙනි, භික්ෂුණීන්ට තාවකාලික ව සෙනසුන් දෙන්නට අනුදනිමි''** යි වදළසේක.

54. එ සමයෙහි **ඔසප් වූ මෙහෙණෝ** බඳනා ලද මෙට්ට සහිත ඇඳෙහි බඳනා ලද මෙට්ට සහිත පුටුවෙහි හිඳිත්, හොවිත්, සෙනසුන ලෙයින් තැවරෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **මහණෙනි, ඔසප් වූ මෙහෙණ විසින් බඳනා ලද මෙට්ට සහිත ඇඳෙහි බඳනා ලද මෙට්ට සහිත පුටුවෙහි නො හිඳියයුතු, නො හෙවියයුතු. යම් මෙහෙණක් හිඳී නම් හෝ හොවී නම් හෝ දුකුළා ඇවැත් වේ. මහණෙනි, ආවසථචීවරය** (ආවාසයෙහි දී පරිභොග කරන සිවුර) **අනුදනිමි''** යි වදළසේක.

ආවසථචීවරය ලෙයින් වැකෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, ආණිචොලකය** (රෙදිවලින් කළ මූඩියක් වැනි වැස්මක්) **අනුදනිමි''යි.** ආණිචොලකය ගිලිහෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **මහණෙනි, හුයෙකින් බැඳ කළවායෙහි බඳින්නට අනුදනිමි''** යි. හුය සිඳෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. **''මහණෙනි, කැසපට ද කටිහුය ද අනුදනිමි''** යි (වදළහ.)

55. එ සමයෙහි සවග මෙහෙණෝ හැමකල්හි කටිහුය දරත්. **'ගිහී කාමභොගිනීන් මෙනැ'යි** මිනිස්සු ලමු කොට සිනති, **නුගුණ කියති, දෙස් පතුරුවත්.** මෙකරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. **''මහණෙනි, මෙහෙණ විසින් හැමකල්හි කටිහුය නො දරියයුතු. යම් මෙහෙණක් දරා නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, ඔසප් වූ මෙහෙණට කටිහුය අනුදනිමි''** යි වදළහ.

**දෙවැනි බණවර යි.**

56. තෙන ඛො පන සමයෙන උපසම්පන්නායො දිස්සන්ති අනිමිත්තාපි නිමිත්තමත්තාපි අලොහිතාපි[1] ධුවලොහිතාපි පග්ඝරන්තීපි සිඛරිණීපි[2] ඉත්ථිපණ්ඩකාපි වෙපුරිසිකාපි සම්භින්නාපි උභතොබ්‍යඤ්ජනකාපි[3]. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ උපසම්පාදෙන්තියා චතුවීසති අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුං. එවඤ්ච පන භික්ඛවෙ පුච්ඡිතබ්බා: ''නසි අනිමිත්තා, නසි නිමිත්තමත්තා, නසි අලොහිතා, නසි ධුවලොහිතා, නසි ධුවචොළා, නසි පග්ඝරන්ති, නසි සිඛරිණී, නසි ඉත්ථිපණ්ඩකා, නසි වෙපුරිසිකා, නසි සම්භින්නා, නසි උභතොබ්‍යඤ්ජනකා. සන්ති තෙ එවරූපා ආබාධා: කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො. මනුස්සාසි, ඉත්ථීසි, භුජිස්සාසි, අනණාසි, නසි රාජභටී, අනුඤ්ඤාතාසි මාතාපිතූහි සාමිකෙන, පරිපුණ්ණවීසතිවස්සාසි, පරිපුණ්ණං තෙ පත්තචීවරං, කිංනාමාසි, කා නාමා තෙ පවත්තිනී''ති.

57. තෙන ඛො පන සමයෙන භික්ඛූ භික්ඛුනීනං අන්තරායිකෙ ධම්මෙ පුච්ඡන්ති. උපසම්පදාපෙඛායො[4] විත්ථායන්ති මඞ්කූ හොන්ති න සක්කොන්ති විස්සජ්ජෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ එකතොඋපසම්පන්නාය භික්ඛුනිසඞ්ඝෙ විසුද්ධාය භික්ඛුසඞ්ඝෙ උපසම්පදෙතුන්ති[5]''.

58. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අනනුසිට්ඨා උපසම්පදාපෙඛායො අන්තරායිකෙ ධම්මෙ පුච්ඡන්ති. උපසම්පදාපෙඛායො විත්ථායන්ති. මඞ්කූ හොන්ති. න සක්කොන්ති විස්සජ්ජෙතුං භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ පඨමං අනුසාසිත්වා පච්ඡා අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුන්ති''. තත්ථෙව සඞ්ඝමජ්ඣෙ අනුසාසන්ති, උපසම්පදාපෙඛායො තථෙව විත්ථායන්ති. මඞ්කූ හොන්ති. න සක්කොන්ති විස්සජ්ජෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ එකමන්තං අනුසාසිත්වා සඞ්ඝමජ්ඣෙ අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුං''.

1. ආලොහිතා - සිමු.
2. සිඛරණීපි - මජසං,
3. උභතොබ්‍යඤ්ජනාපි - මජසං.
4. උපසම්පදාපෙක්ඛායො - මජසං.
5. උපසම්පාදෙතුන්ති - මජසං.

56. එ සමයෙහි ස්ත්‍රී නිමිත්ත නැත්තා වූද, නිමිත්තමාත්‍රයක් ඇත්තා වූද, මදක් ලේ වැගිරීම් ඇත්තා වූද, නිතර ලේ වැගිරීම් ඇත්තා වූ ද, නිතර වැසුම් කඩ දරන්නා වූ ද වැගිරෙන්නී වූ ද, පිටත නික්මුණු මස්රො ද ඇත්තා වූ ද, ස්ත්‍රී පණ්ඩක වූ ද, විකෘත පුරුෂස්වභාව ඇත්තා වූ ද, මිශ්‍ර වූ වසමග පසමග ඇත්තා වූ ද, උභතොබ්‍යඤ්ජනක වූ ද උපසපන් මෙහෙණිහු දක්නා ලැබෙත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. මහණෙනි, උපසම්පද කරන්නිය විසින් සූවිසි අන්තරායකරධර්ම පිළිවිසින්නට අනුදනිමි. මහණෙනි, මෙසේ පිළිවිසියයුතු. අනිමිත්තා නො වෙහි ද, නිමිත්තමාත්‍ර ඇත්තී නො වෙහි ද, අලොහිතා නො වෙහි ද, ධුවලොහිතා නො වෙහි ද, ධුවචොළා නො වෙහි ද, නිතර ලේ වැගිරීම් ඇත්තී නො වෙහි ද, සිඛරිණී නො වෙහි ද, ස්ත්‍රීපණ්ඩක නො වෙහි ද, විකෘත පුරුෂස්වභාව ඇත්තී නො වෙහි ද, සම්භින්නා නො වෙහි ද, උභතොබ්‍යඤ්ජනක නො වෙහි ද, කුෂ්ට-රොගය, ගෙඩිය, කිලාසය (එනම් කුෂ්ටරොගය) ක්‍ෂය රොගය, වස්මරය යන මෙබඳු ආබාධයෝ තොපට වෙත් ද, මනුෂ්‍ය වෙහි ද, ස්ත්‍රියක් වෙහි ද, අදසියක් වෙහි ද, ණය නැත්තියක් වෙහි ද, රජසෙබළියක් නො වෙහි ද, මවුපියන් විසින් හා හිමියා විසින් අනුදන්නාලද ද, පිරිපුන් විසිවයස් ඇත්තී ද, තොපගේ පාසිවුරු පිරිපුන් ද, කිනම් වෙහි ද, තොපගේ උපාධ්‍යායා තොමෝ කිනම් ඇත්තී ද යි.

57. එසමයෙහි භික්ෂූහු භික්ෂුණීන්ගේ අන්තරායකරධර්ම පිළිවිසිත්. උපසම්පදපෙක්ෂිකාවෝ ගොළුගැසී සිටිත්, මකු වෙති. විසඳන්නට නො හැකි වෙත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූ භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි උපසපන් වූ මෙහෙණහට භික්ෂුසඞ්ඝයා කෙරෙහි උපසම්පද වීම අනුදනිමි"යි වදළසේක.

58. එසමයෙහි භික්ෂුණීහු අනුශාසනා නො කළ උපසම්පද-පෙක්ෂිකාවන් අන්තරායික ධර්ම පිළිවිසිත්, උපසම්පදපෙක්ෂිකාවෝ ගොළුගැසී සිටිත්, මකු වෙත්, විසඳන්නට නො හැකි වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, පළමු අනුශාසනා කොට පසුව අන්තරායික ධර්ම පිළිවිසින්නට අනුදනිමි"යි. එහි සඟ මැද ම අනුශාසනා කරත්. උපසම්පද-පෙක්ෂිකාවෝ එසේ ම ගොළුගැසී සිටිති. මකු වෙති. විසඳන්නට නො හැකි වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, එකත්පසෙක අනුශාසනා කොට සඟ මැද අන්තරායික ධර්ම පිළිවිසින්නට අනුදනිමි"යි.

එවඤ්ච පන භික්ඛවෙ අනුසාසිතබ්බා: පඨමං උපජ්ඣං ගාහාපෙතබ්බා. උපජ්ඣං ගාහාපෙත්වා පත්තචීවරං ආචික්ඛිතබ්බං: අයං තෙ පත්තො, අයං සඞ්ඝාටී, අයං උත්තරාසඞ්ගො, අයං අන්තරවාසකො, ඉදං සඞ්කච්චිකං, අයං උදකසාටිකා. ගච්ඡ අමුම්හි ඔකාසෙ තිට්ඨාහීති. බාලා අව්‍යත්තා අනුසාසන්ති. දුරනුසිට්ඨා උපසම්පදාපෙක්ඛායො විත්ථායන්ති මඞ්කූ හොන්ති. න සක්කොන්ති විස්සජ්ජෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ බාලාය අව්‍යත්තාය අනුසාසිතබ්බා. යා අනුසාසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය අනුසාසිතුන්ති". අසම්මතා අනුසාසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අසම්මතාය අනුසාසිතබ්බා. යා අනුසාසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ සම්මතාය අනුසාසිතුං".

එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා: අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං. පරාය වා පරා සම්මන්නිතබ්බා. කථඤ්ච අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං? ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො: ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්ථන්නාමා ඉත්ථන්නාමං අනුසාසෙය්‍යන්ති". එවං අත්තනාව අත්තානං සම්මන්නිතබ්බං. කථඤ්ච පරාය පරා සම්මන්නිතබ්බා? ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො. ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං ඉත්ථන්නාමා ඉත්ථන්නාමං අනුසාසෙය්‍යාති". එවං පරාය වා පරා සම්මන්නිතබ්බා.

තාය සම්මතාය භික්ඛුනියා උපසම්පදාපෙක්ඛං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයා: "සුණසි ඉත්ථන්නාමෙ අයං තෙ සච්චකාලො භූතකාලො යං ජාතං තං සඞ්ඝමජ්ඣෙ පුච්ඡන්තෙ සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං. මා ඛො විත්ථායි[1] මා ඛො මඞ්කු අහොසි. එවං තං පුච්ඡිස්සන්ති; නසි අනිමිත්තා, නසි නිමිත්තමත්තා, නසි අලොහිතා[2], නසි ධුවලොහිතා, නසි ධුවචොළා, නසි පග්ඝරන්ති, නසි සිඛරිණී[3], නසි ඉත්ථිපණ්ඩකා, නසි වෙපුරිසිකා, නසි සම්භින්නා,

1. විත්ථාසි - මජසං.
2. ආලොහිතා - සී.
3. සිඛරණී - මජසං.

මහණෙනි, මෙසේ අනුශාසනා කළයුතු. පළමුව උපාධ්‍යායයක ගැන්වියයුතු. උපාධ්‍යායයක ගන්වා පාසිවුරු කියාදියයුතු: මේ තොපගේ පාත්‍ර ය, මේ සඟළ සිවුර ය, මේ කනිපට සිවුර ය, මේ අඳනය ය, මේ තනවැස්ම ය, මේ දියසළුව ය. යව තෙල අවකාශයෙහි සිටුව යි. බාල වූ අව්‍යක්ත වූ (මෙහෙණිහු) අනුශාසනා කෙරෙත්. වැරදි ලෙස අනුශාසනා කරනලද උපසම්පදාපෙක්ෂිකාවෝ ගොළුගැසී සිටිති, මකු වෙති, විසඳන්නට නො හැකි වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, බාල අව්‍යක්ත මෙහෙණ විසින් අනුශාසනා නො කළයුතු. යම් මෙහෙණක් අනුශාසනා - කෙරේ නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක විසින් අනුශාසනා කරන්නට අනුදනිමි"යි, සම්මත නො කරනලද මෙහෙණිහු අනුශාසනා කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැල කළහ. "මහණෙනි, සම්මත නො කළ මෙහෙණක විසින් අනුශාසනා නො කළයුතු. යම් මෙහෙණක් අනුශාසනා කෙරේ නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, සම්මත කරනලද මෙහෙණක විසින් අනුශාසනා කරන්නට අනුදනිමි".

මහණෙනි, මෙසේ සම්මත කළයුතු. තමා විසින් හෝ තමා සම්මත කළයුතු. තමා විසින් හෝ තමා සම්මත කළයුත්තේ කෙසේ ද? ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක විසින් සඞ්ඝයා මෙසේ දන්වියයුතු: "ආයඝාවෙනි, සඞ්ඝයා මාගේ වචනය අසාවා. මෙනම් ඇත්ති මෙනම් ආයඝාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් මෙනම් ඇති මම මෙනම් ඇත්තිය අනුශාසනා කරන්නෙමි"යි. මෙසේ තමා වි සින් ම තමා සම්මත කළයුතු. කෙසේ අන් මෙහෙණක විසින් අන් මෙහෙණක් සම්මත කළයුත්තී ද? ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුණියක විසින් සඞ්ඝයා (මෙසේ) දන්වියයුතු: "ආයඝාවෙනි, සඞ්ඝයා මාගේ වචනය අසාවා. මෙනම් ඇත්ති මෙනම් ආයඝාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය අනුශාසනා කරන්නී ය" යි. මෙසේ අන් මෙහෙණක විසින් හෝ අන් මෙහෙණක් සම්මත කළයුතු.

ඒ සම්මත කරනලද මෙහෙණ විසින් උපසම්පදාපෙක්ෂිකාව වෙත එළඹ මෙසේ කියයුත්තී ය: "මෙනම් ඇත්තිය, මෙය අසව. මේ තොපගේ සත්‍ය කාල ය, භූතකාල යයි, යමක් වූයේ ද එය සඟමැද පුළුවුස්නා කල්හි ඇතිදය ඇතැ'යි කියයුතු, නැතිදය නැතැ'යි කියයුතු, ගොළුවකු මෙන් නො වව, මකු නො වව, මෙසේ තොප පිළිවිසින්නෝ ය. අනිමිත්තා නො වෙහි ද, යම්තම් නිමිති ඇත්තක් නො වෙහි ද, අලොහිතා නො වෙහි ද, ධුවලොහිතා නො වෙහි ද, ධුවචොළා නො වෙහි ද, වැගිරෙන ස්වභාව ඇත්තී නො වෙහි ද, සිඛරිණී නො වෙහි ද, ස්ත්‍රීපණ්ඩක නො වෙහි ද, විකෘත පුරුෂ ස්වභාව ඇත්තක් නො වෙහි ද, මිශ්‍ර වූ මාර්ග ඇත්තක් නො වෙහි ද,

නසි උභතොබ්‍යඤ්ජනකා[1], සන්ති තෙ එවරූපා ආබාධා–කුට්ඨං, ගණ්ඩො, කිලාසො, සොසො, අපමාරො. මනුස්සාසි, ඉත්ථීසි, භුජිස්සාසි, අනණාසි, නසි රාජභටී, අනුඤ්ඤාතාසි මාතාපිතූහි සාමිකෙන, පරිපුණ්ණවීසතිවස්සාසි, පරිපුණ්ණං තෙ පත්තචීවරං, කිං නාමාසි, කා නාමා තෙ පවත්තිනී''ති.

59. එකතො ආගච්ඡන්ති. න එකතො ආගන්තබ්බං. අනුසාසිකාය පඨමතරං ආගන්ත්වා සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො. ඉත්ථන්නාමා[2] ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. අනුසිට්ඨා සා මයා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං ඉත්ථන්නාමා ආගච්ඡෙය්‍යාති. ආගච්ඡාහීති වත්තබ්බා. එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛුනීනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා උපසම්පදං යාචාපෙතබ්බා: සඞ්ඝං අය්‍යෙ උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං අය්‍යෙ සඞ්ඝො අනුකම්පං උපාදය. දුතියම්පි අය්‍යෙ සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං අය්‍යෙ සඞ්ඝො අනුකම්පං උපාදය. තතියම්පි අය්‍යෙ සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං අය්‍යෙ සඞ්ඝො අනුකම්පං උපාදයාති.

බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්ථන්නාමං අන්තරායිකෙ ධම්මෙ පුච්ඡෙය්‍යං. සුණසි ඉත්ථන්නාමෙ, අයං තෙ සච්චකාලො භූතකාලො. යං ජාතං තං පුච්ඡාමි. සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං, නසි අනිමිත්තා. නසි නිමිත්තමත්තා –පෙ– කිං නාමාසි? කා නාමා තෙ පවත්තිනීති.

බ්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. පරිසුද්ධා අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්සා පත්තචීවරං. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. එසා ඤත්ති.

1. උභතොබ්‍යඤ්ජනා – මජසං.
2. ඉත්ථන්නාමෙ – මජසං.
3. වත්තබ්බො – මජසං.

උභතොබ්‍යඤ්ජනක නො වෙහි ද, කුෂ්ට ය, (කල්පවතින) ගෙඩි ය කිලාස ය, ක්‍ෂයරොග ය, වස්මර ය යන මෙබඳු ආබාධයෝ තොපට වෙත් ද, මනුෂ්‍ය වෙහි ද, ස්ත්‍රී වෙහි ද, දසියක් නො වෙහි ද, ණය නැත්තෙහි ද, රජසෙබළියක් නො වෙහි ද, මවු පියන් හා හිමියා විසින් අනුදන්නා ලද ද, පිරිපුන් විසිවයස් ඇත්තී ද, තොපගේ පාසිවුරු පිරිපුන් ද, කිනම් වෙහි ද, තොපගේ පවත්තිනී (උපාධ්‍යායා) කිනම් වේ ද''යි.

59. (අනුශාසනා කරන්තිය හා උපසම්පදාපෙක්ෂිකා) එක් ව පැමිණෙත්. (එසේ) එක්ව නො පැමිණියයුතු, අනුශාසිකාව පළමු ව පැමිණ සඞ්ඝයා (මෙසේ) දැන්වියයුතු, ආයඞාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් ඇත්තී මෙනම් ආයඞාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. ඕ මා විසින් අනුශාසනා කරන ලදු. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මෙනම් ඇත්තී එන්නී යැ යි. 'එව'යි කියයුත්තී ය. (ඈ පැමිණි විට) තනිපට සිවුර එකාංශ කරවා භික්ෂුණීන්ගේ පා වන්දවා උක්කුටික ව හිඳුවා ඇඳිලි බඳවා උපසම්පදාව ඉල්ලුම් කරවිය යුත්තී ය. ආයඞාවෙනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්වමි. ආයඞාවෙනි, සඞ්ඝයා අනුකම්පා කොට මං (හෙරණ බැවින්) නහා ලනසේක්වා. දෙවනු ද ආයඞාවෙනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්වමි. ආයඞාවෙනි, සඞ්ඝයා අනුකම්පා කොට මා (හෙරණ බැවින්) නහාලනසේක්වා තෙවනු ද ආයඞාවෙනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්වමි. ආයඞාවෙනි, සඞ්ඝයා අනුකම්පා කොට මා (හෙරණ බැවින්) නහාලනසේක්වා යි.

ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක විසින් සඞ්ඝයා (මෙසේ) දැන්විය යුතු. ආයඞාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. මේ මෙනම් ඇත්තී මෙනම් ආයඞාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම මෙනම් ඇත්තිය අන්තරායිකධර්ම පිළිවිසින්නෙමි. මෙනම් තැනැත්තිය අසව, මෙ තොපගේ සත්‍යකාල ය, භූතකාල යයි. යමක් වූයේ නම් එය පුළුවුස්මි. ඇති දැය ඇතැ යි කියයුතු, නැති දැය නැතැ යි කියයුතු, අනිමිත්තා නො වෙහි ද, ස්වල්පමාත්‍ර නිමිති ඇත්තී නො වෙහි ද, ... කිනම් වෙහි ද, තොපගේ පවත්තිනී (උපාධ්‍යායා) කිනම් වේ ද යි.

ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක විසින් සඞ්ඝයා (මෙසේ) දැන්විය යුතු. ආයඞාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. මේ මෙනම් ඇත්තී මෙනම් ඇති ආයඞාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. (ඕ) අන්තරායික ධර්මයන්ගෙන් පිරිසුදු ය. ඇගේ පාසිවුරු පිරිපුන් ය. මෙනම් ඇත්තී මෙනම් ආයඞාව ප්‍රවර්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්වයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් සඞ්ඝයා මෙනම් ආර්යාව ප්‍රවර්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පදා කරන්නේ ය. මේ ඤප්ති යි.

''සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. පරිසුද්ධා අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්සා පත්තචීවරං. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය උපසම්පද ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. සා තුණ්හස්ස. යස්සා නක්ඛමති සා භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදමි -පෙ- තතියම්පි එතමත්ථං වදමි. සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. පරිසුද්ධා අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්සා පත්තචීවරං. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය උපසම්පද ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. සා තුණ්හස්ස. යස්සා නක්ඛමති සා භාසෙය්‍ය.

උපසම්පන්නා සඞ්ඝෙන ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය පවත්තිනියා. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

තාවදෙව තං ආදය භික්ඛුසඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා උපසම්පදං යාචාපෙතබ්බා. ''අහං අය්‍යා ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා. එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා, සඞ්ඝං අය්‍යා උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං අය්‍යා සඞ්ඝො අනුකම්පං උපාදය. අහං අය්‍යා ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා, දුතියම්පි අය්‍යා සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං අය්‍යා සඞ්ඝො අනුකම්පං උපාදය. අහං අය්‍යා ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා, තතියම්පි අය්‍යා සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං අය්‍යා සඞ්ඝො අනුකම්පං උපාදයා''ති.

''ආයඖාවෙණි, සඞ්ඝයා මබස් අසාවා. මේ මෙනම් ඇත්තී මෙනම් ආයඖාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. අන්තරායික ධර්මයන් ගෙන් පිරිසුදු ය, ඇගේ පාසිවුරු පිරිපුන් ය. මෙනම් ඇත්තී මෙනම් ආයඖාව ප්‍රවර්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදාව යදියි. මෙ නම් ආයඖාව ප්‍රවර්තිනිය කොට සඞ්ඝයා මෙනම් ඇත්තිය උපසම්පද කරයි. මෙනම් ආයඖාව ප්‍රවර්තිනිය කොට මෙනම් ඇත්තියගේ උපසම්පදාව යම් ආයඖාවකට රුචිවේ නම් ඕ නිහඬ වන්නී ය. යම් ආයඖාවකට නො රුස්නේ නම් ඕ කියන්නී ය.

දෙවැනි වර ද මේ කරුණ කියමි. ... තෙවැනි වර ද මේ කරුණ කියමි. ආයඖාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. මේ මෙනම් ඇත්තී මෙනම් ආයඖාවගේ උපසම්පදාපෙක්ෂිකාවකි. අන්තරායික ධර්මයන්ගෙන් පිරිසුදු ය. ඇගේ පාසිවුරු පිරිපුන් ය. මෙනම් ඇත්තී මෙනම් ආයඖාව ප්‍රවර්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදාව යදියි. මෙනම් ආයඖාව ප්‍රවර්තිනිය කොට සඞ්ඝයා මෙනම් ඇත්තිය උපසම්පද කරයි. මෙනම් ආයඖාව ප්‍රවර්තිනිය කොට මෙනම් ඇත්තියගේ උපසම්පදාව යම් ආයඖාවකට රුචිවේ නම් ඕ නිහඬ වන්නී ය. යම් ආයඖාවකට නො රුස්නේ නම් ඕ කියන්නී ය.

සඞ්ඝයා විසින් මෙනම් ආයඖාව ප්‍රවර්තිනිය කොට මෙනම් ඇත්තී උපසම්පද කරනලද්දී ය. එය සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මේ කරුණ මෙසේ දරමි''යි.

එකෙණෙහි ඇය රැගෙන (කැඳවාගෙන) භික්ෂුසඞ්ඝයා වෙත එළඹ තනිපටසිවුර එකාංශ කරවා භික්ෂූන්ගේ පා වන්දවා උත්කුටුක ව හිඳුවා ඇඳිලි බඳවා උපසම්පදාව ඉල්වියයුත්තී ය. ''ආයඖයෙනි, මෙනම් ඇති මම මෙනම් ආයඖාවගේ උපසම්පදාපෙක්ෂිකාවක් වූවා භික්ෂුණීසඞ්ඝයා වෙත පිරිසුදු වූවා එක් පක්ෂයෙකින් (භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි) උපසපන් වූමු. ආයඖයෙනි, (දැන් භික්ෂු) සඞ්ඝයාගෙන් උපසම්පදාව යදිමි. ආයඖයෙනි, සඞ්ඝයා අනුකම්පා කොට මා (හෙරණ බැවින්) නගාසිටුවන සේක්වා. ආයඖයෙනි, මෙනම් ඇති මම මෙනම් ආයඖාවගේ උපසම්පදාපෙක්ෂිකාවක් වූවා භික්ෂුණීසඞ්ඝයා වෙත පිරිසුදු වූවා එක් පක්ෂයකින් උපසපන් වූමු. ආයඖයෙනි, දෙවනු ද සඞ්ඝයාගෙන් උපසම්පදාව යදිමි. ආයඖයෙනි, සඞ්ඝයා අනුකම්පා කොට මා (හෙරණ බැවින්) නගාසිටුවනසේක්වා. ආයඖයෙනි, මෙනම් ඇති මම මෙනම් ආයඖාවගේ උපසම්පදාපෙක්ෂිකාවක් වූවා භික්ෂුණී සඞ්ඝයා වෙත පිරිසුදු වූවා එක් පක්ෂයකින් උපසපන් වූමු. ආයඖයෙනි, තෙවනු ද සඞ්ඝයාගෙන් උපසම්පදාව යදිමි. ආයඖයෙනි, සඞ්ඝයා අනුකම්පා කොට මා (හෙරණ බැවින්) නගා සිටුවනසේක්වා'' යී.

ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය පවත්තිනියා ච. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය ඉත්ථන්නාමාය පවත්තිනියා. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය පවත්තිනියා. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමාය පවත්තිනියා. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමාය උපසම්පදා ඉත්ථන්නාමාය පවත්තිනියා. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය පවත්තිනියා. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමාය පවත්තිනියා. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමාය උපසම්පදා ඉත්ථන්නාමාය පවත්තිනියා. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

උපසම්පන්නා සඞ්ඝෙන ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය පවත්තිනියා. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

තාවදෙව ඡායා මෙතබ්බා. උතුප්පමාණං ආචික්ඛිතබ්බං. දිවසභාගො ආචික්ඛිතබ්බො, සංගීති ආචික්ඛිතබ්බා, භික්ඛුනියො වත්තබ්බා ඉමිස්සා තයො ච නිස්සයෙ අට්ඨ ච අකරණීයානි ආචික්ඛෙය්‍යාථාති.

60. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භත්තග්ගෙ ආසනං සඞ්කසායන්තියො[1] කාලං වීතිනාමෙසුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ අට්ඨන්නං භික්ඛුනීනං යථාවුඩ්ඪං අවසෙසානං යථාගතිකන්ති".

1. සඞ්කායන්තියො-සිමු.

ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සඞ්ඝයා (මෙසේ) දන්විය යුතු ය: වහන්ස, සඞ්ඝයා මබස් අසාවා, මෙනම් ඇත්තියගේ උපසම්පදපෙක්ෂිකා වූ මෝ මෙනම් ඇත්ති භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය ද පවත්තිනී කොට සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් සඞ්ඝයා මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පද කරන්නේ ය. මේ ඥප්ති යි.

වහන්ස, සඞ්ඝයා මබස් සාවා. මෙනම් ඇත්තියගේ උපසම්පද-පෙක්ෂිකා වූ මෝ මෙනම් ඇත්ති භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය පවත්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. සඞ්ඝයා මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පද කරයි. මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තියගේ උපසම්පදව යම් ආයුෂ්මත් කෙනකුට රුචි වේ නම් උන්වහන්සේ නිහඬ වෙත්වා. යමකුට රුචි නො වේ නම් උන්වහන්සේ බෙණෙත්වා.

දෙවනු ද මෙ කරුණ කියමි. ... තෙවනු ද මෙ කරුණ කියමි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් ඇත්තියගේ උපසම්පද-පෙක්ෂිකා වූ මෝ මෙනම් ඇත්ති භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය පවත්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. සඞ්ඝයා මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පද කරයි. මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තියගේ උපසම්පදව යම් ආයුෂ්මත් කෙනකුට රුචි වේ නම් උන්වහන්සේ නිහඬ වෙත්වා. යමකුට රුචි නො වේ නම් උන්වහන්සේ බෙණෙත්වා.

මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්ති සඞ්ඝයා විසින් උපසම්පද කරනලද්දී ය. (එය) සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙ කරුණ මෙසේ දරමි යි.

එකෙණෙහි සෙවනැල්ල මිනියයුතු. ඍතුප්‍රමාණය කියයුතු. දිවසභාගය කියයුතු. සියල්ල එක්කොට සංගීතිය කියයුතු. මැයට නිඃසය තුන ද, නො කළයුතු කරුණු අට ද කියව යි භික්ෂුණීන්ට කියයුතු.

56. එසමයෙහි භික්ෂුණීහු බත්හලෙහි අසුන් ගැන අවිනිශ්චිත වූවාහු (වළඳන) කාලය ඉක්මවූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ දන්වූහ. "මහණෙනි, මෙහෙණන් අට නමකට වැඩි මහලු පිළිවෙළත් සෙස්සන්ට පැමිණි පිළිවෙළත් අනුදනිමි"යි (වදළසේක.)

61. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භගවතා අනුඤ්ඤාතං අට්ඨන්නං භික්ඛුනීනං යථාවුඩ්ඪං අවසෙසානං යථාගතිකන්ති සබ්බත්ථ අට්ඨාව[1]. භික්ඛුනියො යථාවුඩ්ඪං පටිබාහන්ති අවසෙසායො යථාගතිකං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අට්ඨන්නං භික්ඛුනීනං යථාවුඩ්ඪං අවසෙසානං යථාගතිකං. අඤ්ඤත්ථ සබ්බත්ථ යථාවුඩ්ඪං න පටිබාහිතබ්බං. යා පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්සාති".

62. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො න පවාරෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා න පවාරෙතබ්බං. යා න පවාරෙය්‍ය යථාධම්මො කාරෙතබ්බොති". තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අත්තනා පවාරෙත්වා භික්ඛුසඞ්ඝං න පවාරෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා අත්තනා පවාරෙත්වා භික්ඛුසඞ්ඝො න පවාරෙතබ්බො. යා න පවාරෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො"ති.

63. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භික්ඛූහි සද්ධිං එකතො පවාරෙන්තියො කොලාහලං අකංසු. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා භික්ඛූහි සද්ධිං එකතො පවාරෙතබ්බං. යා පවාරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පුරෙභත්තං පවාරෙන්තියො කාලං වීතිනාමෙසුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පච්ඡාභත්තං පවාරෙතුන්ති". පච්ඡාභත්තං පවාරෙන්තියො විකාලෙ අහෙසුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ අජ්ජතනා භික්ඛුනීසඞ්ඝං පවාරෙත්වා අපරජ්ජු භික්ඛුසඞ්ඝං පවාරෙතුන්ති".

64. තෙන ඛො පන සමයෙන සබ්බො භික්ඛුනීසඞ්ඝො පවාරෙන්තො කොලාහලං අකාසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ එකං භික්ඛුනිං වියත්තං පටිබලං සම්මන්නිතුං භික්ඛුනීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා: පඨමං භික්ඛුනී යාචිතබ්බා. යාචිත්වා ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සම්මන්නෙය්‍ය භික්ඛුනීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං". එසා ඤත්ති.

1. අට්ඨෙව - මජ්සං.

61. එසමයෙහි භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂුණීන් අට නමකට වැඩිමහලු පිළිවෙළත් සෙස්සනට පැමිණි පිළිවෙළත් අනුදන්නාලද යි සියලු තැන්හි භික්ෂුණීන් අටනමක් වී වැඩිමහලු පිළිවෙළින් ද සෙස්සෝ පැමිණි පිළිවෙළින් ද (අසුන්) වෙන් කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, බත්හලෙහි භික්ෂුණීන් අට නමකට වැඩිමහලු පිළිවෙළින් හා සෙස්සන්ට පැමිණි පිළිවෙළින් (අසුන් වෙන් කිරීම) අනුදනිමි. අන් සැම තැන්හි වැඩිමහලු පිළිවෙළ අත් නො හළ යුතු යි. යම් මෙහෙණක් අත්හරින්නී නම් දුකුළා ඇවැත් වේ'' යි.

62. එසමයෙහි භික්ෂුණීහු පවාරණය නො කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, මෙහෙණ විසින් නො පැවරියයුතු නො වේ. යම් මෙහෙණක් නො පවරා නම් දහම් වූ පරිදි කරවියයුතු'' යි, එසමයෙහි භික්ෂුණීහු තමන් පවරා භික්ෂුසඞ්ඝයා නො පවරත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, මෙහෙණ විසින් තමා පවරා භික්ෂුසඞ්ඝයා නො පැවරියයුතු නො වේ. යම් මෙහෙණක් නො පවරා නම් දහම් වූ පරිදි කරවියයුතු''යි.

63. එසමයෙහි භික්ෂුණීහු භික්ෂූන් සමග එකට පවාරණය කරන්නාහු කොලාහල කළහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුණිය භික්ෂූන් සමග එකට පවාරණය නො කළයුතු. යම් මෙහෙණක් පවරා නම් දුකුළා ඇවැත් වේ'' යි.

එසමයෙහි භික්ෂුණීහු පෙරබත් වේලායෙහි පවරන්නාහු කාලය ඉක්මවූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, පසුබත් වේලායෙහි පවරන්නට අනුදනිමි''යි. පසුබත් වේලායෙහි පවරන්නාහු විකාලයෙහි වූහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, අද දින භික්ෂුණීසඞ්ඝයා පවරා පසු දින භික්ෂුසඞ්ඝයා පවරන්නට අනුදනිමි''යි.

64. එසමයෙහි සියලු භික්ෂුණීසඞ්ඝයා පවරන්නේ කොලාහල කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුණීසඞ්ඝයා සඳහා භික්ෂුසඞ්ඝයා පවරන්නට එක් ව්‍යක්ත ප්‍රතිබල වූ භික්ෂුණියක් සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ සම්මත කළයුතු. පළමුව මෙහෙණගේ කැමැත්ත ඉල්លුම් කළයුතු ය. ඉල්លුම් කොට ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුණියක විසින් සඞ්ඝයා (මෙසේ) දැන්වියයුතු ය. ආර්‍ය්‍යාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් භික්ෂුණීසඞ්ඝයා සඳහා භික්ෂුසඞ්ඝයා පැවරීමට මෙනම් භික්ෂුණිය සම්මත කරන්නේය''. මේ ඥප්තිය යි.

"සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සම්මන්නති භික්ඛුනීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුනියා සම්මුති භික්ඛුනීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. සා තුණ්හස්ස. යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. සම්මතා සඞ්ඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී භික්ඛුනීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

තාය සම්මතාය භික්ඛුනියා භික්ඛුනීසඞ්ඝං ආදය භික්ඛුසඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො භික්ඛුනීසඞ්ඝො අය්‍යා භික්ඛුසඞ්ඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු අය්‍යා භික්ඛුසඞ්ඝො භික්ඛුනීසඞ්ඝං අනුකම්පං උපාදය. පස්සන්තා පටිකරිස්සති. දුතියම්පි අය්‍යා භික්ඛුනීසඞ්ඝො භික්ඛුසඞ්ඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු අය්‍යා භික්ඛුසඞ්ඝො භික්ඛුනීසඞ්ඝං අනුකම්පං උපාදය පස්සන්තා පටිකරිස්සති. තතියම්පි අය්‍යා භික්ඛුනීසඞ්ඝො භික්ඛුසඞ්ඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු අය්‍යා භික්ඛුසඞ්ඝො භික්ඛුනීසඞ්ඝං අනුකම්පං උපාදය. පස්සන්තා පටිකරිස්සතීති.

65. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො භික්ඛූනං උපොසථං ඨපෙන්ති, පවාරණං ඨපෙන්ති. සවචනීයං කරොන්ති, අනුවාදං පට්ඨපෙන්ති, ඔකාසං කාරෙන්ති, චොදෙන්ති, සාරෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා භික්ඛුස්ස උපොසථො ඨපෙතබ්බො, ඨපිතොපි අට්ඨපිතො, ඨපෙන්තියා ආපත්ති දුක්කටස්ස. න පවාරණා ඨපෙතබ්බා, ඨපිතාපි අට්ඨපිතා, ඨපෙන්තියා ආපත්ති දුක්කටස්ස. න සවචනීයං කාතබ්බං, කතම්පි අකතං, කරොන්තියා ආපත්ති දුක්කටස්ස. න අනුවාදො පට්ඨපෙතබ්බො, පට්ඨපිතොපි අපට්ඨපිතො, පට්ඨපෙන්තියා ආපත්ති දුක්කටස්ස. න ඔකාසො කාරෙතබ්බො, කාරිතොපි අකාරිතො, කාරෙන්තියා ආපත්ති දුක්කටස්ස. න චොදෙතබ්බො, චොදිතොපි අචොදිතො, චොදෙන්තියා ආපත්ති දුක්කටස්ස. න සාරෙතබ්බො, සාරිතොපි අසාරිතො, සාරෙන්තියා ආපත්ති දුක්කටස්සා"ති.

"ආයුෂ්මාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. භික්ෂුණීසඞ්ඝයා සඳහා භික්ෂුසඞ්ඝයා පැවරීමට මෙනම් භික්ෂුණිය සඞ්ඝයා සම්මත කරන්නේ ය. භික්ෂුණීසඞ්ඝයා සඳහා භික්ෂුසඞ්ඝයා පැවරීමට මෙනම් භික්ෂුණිය සම්මත කිරීම යම් ආයුෂ්මාවකට රුචි වේ නම් ඕ නිහඬ වන්නී ය. යම් ආයුෂ්මාවකට අරුචි වේ නම් ඕ කියන්නී ය. භික්ෂුණීසඞ්ඝයා සඳහා භික්ෂුසඞ්ඝයා පැවරීමට සඞ්ඝයා විසින් මෙනම් ඇත්තී සම්මත ය. සඞ්ඝයාට (එය) රුචි වෙයි. එහෙයින් නිහඬ වෙයි. මෙය මෙසේ දරමි''යි.

ඒ සම්මත කළ මෙහෙණ විසින් භික්ෂුණී සඞ්ඝයා රැගෙන භික්ෂුසඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට භික්ෂූන්ගේ පා වැඳ උක්කුටික ව හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය. ආයුෂ්මයෙනි, භික්ෂුණීසඞ්ඝයා දුටු කරුණින් හෝ ඇසූ කරුණින් හෝ සැක කළ කරුණින් හෝ භික්ෂුසඞ්ඝයා පවාරණය කරයි. ආයුෂ්මයෙනි, භික්ෂුසඞ්ඝයා භික්ෂුණීසඞ්ඝයාට අනුකම්පා කොට (වරදක් ඇතොත්) කියනසේක්වා. (ඒ වරද) දැක පිළියම් කරන්නේ ය. දෙවනු ද ආයුෂ්මයෙනි, භික්ෂුණීසඞ්ඝයා දුටු කරුණින් හෝ ඇසූ කරුණින් හෝ සැක කළ කරුණින් හෝ භික්ෂුසඞ්ඝයා පවාරණය කරයි. ආයුෂ්මයෙනි, භික්ෂුසඞ්ඝයා භික්ෂුණීසඞ්ඝයාට අනුකම්පා කොට (වරදක් ඇතොත්) කියනසේක්වා. (ඒ වරද) දැක පිළියම් කරන්නේ ය. තෙවනු ද ආයුෂ්මයෙනි, භික්ෂුණීසඞ්ඝයා දුටු කරුණින් හෝ ඇසූ කරුණින් හෝ සැක කළ කරුණින් හෝ භික්ෂුසඞ්ඝයා පවාරණය කරයි. ආයුෂ්මයෙනි, භික්ෂුසඞ්ඝයා භික්ෂුණී සඞ්ඝයාට අනුකම්පා කොට (වරදක් ඇතොත් කියනසේක්වා. (ඒ වරද) දැක පිළියම් කරන්නේ යි.

65. එසමයෙහි භික්ෂුණීහු භික්ෂූන්ගේ උපොසථය තබත්, (පොහොය කිරීම වළකත්.) පවාරණය වළකත්, සවචනීයබව කෙරෙත්, (ඔවුන් කෙරෙහි) ආධිපත්‍යය පිහිටුවාගනිත්. (වරද දැක්වීමට) අවකාශ කරවත්, චොදනා කෙරෙත්, (වරද) සිහි කරවත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුණිය විසින් භික්ෂුහුගේ උපොසථය නො වැළකියයුතු, වළකන ලද ද නො වැළැක්වූයේ වෙයි, වළක්වන්නියට දුකුළා ඇවැත් වෙයි. පවාරණය නො වැළකියයුතු, වළකනලද ද නො වැළැක්වූයේ වෙයි, වළක්වන්නියට දුකුළා ඇවැත් වෙයි. සවචනීය නො කළයුතු, (එසේ) කරනලද ද නො කරනලද්දේ වෙයි, (එසේ) කරන්නියට දුකුළා ඇවැත් වෙයි. ආධිපත්‍යය නො පිහිටු විය යුතු, පිහිටුවනලද ද නො පිහිටුවනලද්දේ වෙයි. පිහිටුවන්නියට දුකුළා ඇවැත් වෙයි. (වරද දැක්වීමට) අවකාශ නො කරවියයුතු, (එසේ) කරවන ලද ද නො කරවනලද්දේ වෙයි, (එසේ) කරවන්නියට දුකුළා ඇවැත් වෙයි. චොදනා නො කළයුතු, චොදනා කරන ලද ද නො කරනලද්දේ වෙයි, චොදනා කරන්නියට දුකුළා ඇවැත් වෙයි. (වරද) සිහි නො කරවියයුතු, සිහි කරවුව ද සිහි නො කරවනලද්දේ වෙයි, සිහිකරවන්නියට දුකුළා ඇවැත් වේ'' යි.

66. තෙන ඛො පන සමයෙන භික්ඛූ භික්ඛුනීනං උපොසථං ඨපෙන්ති, පවාරණං ඨපෙන්ති, සවචනීයං කරොන්ති, අනුවාදං පට්ඨපෙන්ති, ඔකාසං කාරෙන්ති, චොදෙන්ති, සාරෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ භික්ඛුනා භික්ඛුනීනං[1] උපොසථං ඨපෙතුං, ඨපිතොපි සුට්ඨපිතො, ඨපෙන්තස්ස අනාපත්ති. පවාරණං ඨපෙතුං, ඨපිතාපි සුට්ඨපිතා, ඨපෙන්තස්ස අනාපත්ති, සවචනීයං කාතුං, කතම්පි සුකතං, කරොන්තස්ස අනාපත්ති. අනුවාදං පට්ඨපෙතුං, පට්ඨපිතොපි සුපට්ඨපිතො[2]. පට්ඨපෙන්තස්ස අනාපත්ති. ඔකාසං කාරෙතුං. කාරිතොපි සුකාරිතො, කාරෙන්තස්ස අනාපත්ති. චොදෙතුං, චොදිතාපි සුචොදිතා, චොදෙන්තස්ස අනාපත්ති. සාරෙතුං. සාරිතාපි සුසාරිතා, සාරෙන්තස්ස අනාපත්ති"ති.

67. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛුනියො යානෙන යායන්ති ඉත්ථියුත්තෙනපි පුරිසන්තරෙන පුරිසයුත්තෙනපි ඉත්ථන්තරෙන. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: සෙය්‍යථාපි ගඞ්ගා මහියාති.[3] භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා යානෙන යායිතබ්බං. යා යායෙය්‍ය යථා ධම්මො කාරෙතබ්බො"ති. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ගිලානා හොති. න සක්කොති පදසා ගන්තුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ගිලානාය යානන්ති". අථ ඛො භික්ඛුනීනං එතදහොසි: ඉත්ථි-යුත්තන්නු ඛො පුරිසයුත්තන්නු ඛොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ඉත්ථියුත්තං පුරිසයුත්තං හත්ථවට්ටකන්ති". තෙන ඛො පන සමයෙන අඤ්ඤතරාය[4] භික්ඛුනියා යානුග්ඝාතෙන බාළ්හතරං අඵාසු අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ සිවිකං පාටඞ්කින්ති".

68. තෙන ඛො පන සමයෙන අඩ්ඪකාසී ගණිකා භික්ඛුනීසු පබ්බජිතා හොති. සා සාවත්ථිං ගන්තුකාමා හොති භගවතො සන්තිකෙ උපසම්පජ්ජිස්සාමීති. අස්සොසුං ඛො ධුත්තා 'අඩ්ඪකාසි කිර ගණිකා සාවත්ථිං ගන්තුකාමා'ති. තෙ මග්ගෙ පරියුට්ඨිංසු. අස්සොසි ඛො අඩ්ඪකාසී ගණිකා 'ධුත්තා කිර මග්ගෙ පරියුට්ඨිතා'ති. භගවතො සන්තිකෙ දූතං පාහෙසි. අහං හි උපසම්පජ්ජිතුකාමා කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බන්ති.

1. භික්ඛුනියා - මජසං.
2. සුපට්ඨපිතො - මජසං.
3. ගඞ්ගාමහියායාති - මජසං.
4. අඤ්ඤතරිස්සා - මජසං.

66. එසමයෙහි භික්‍ෂූහු භික්‍ෂුණීන්ගේ උපෝසථය වළක්වත්, පවාරණය වළක්වත්, සවචනීය කෙරෙත්, ආධිපත්‍යය පිහිටුවත්, (වරද දක්වීමට) අවකාශ කරවත්, චොදනා කෙරෙත්, (වරද) සිහි කරවත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. ''මහණෙනි, භික්‍ෂුව විසින් භික්‍ෂුණීන්ගේ උපෝසථය වළකන්නට අනුදනිමි. වළකනලද ද මොනොවට වළකන ලද්දේ වෙයි. වළකන්නහුට ඇවැත් නො වේ. පවාරණය වළකන්නට (අනුදනිමි.) වළකනලද ද මොනොවට වළකනලද වෙයි. වළකන්නහුට ඇවැත් නො වේ සවචනීය කරන්නට (අනුදනිමි.) කරනලද ද මනාකොට කරනලද්දේ ය. කරන්නාහට ඇවැත් නො වේ. ආධිපත්‍යය පිහිටුවන්නට (අනුදනිමි.) පිහිටුවනලද ද මනාලෙස පිහිටුවනලද්දේ ය. පිහිටුවන්නාහට ඇවැත් නො වේ. අවකාශ කරවීමට (අනුදනිමි.) කරවනලද ද මනාලෙස කරවනලද්දේ ය. කරවන්නාහට ඇවැත් නො වේ. චොදනා කරන්නට (අනුදනිමි.) චොදනා කරනලද ද මනාලෙස චොදනා කරනලද්දේ ය. චොදනා කරන්නාහට ඇවැත් නො වේ. සිහි කරවන්නට (අනුදනිමි.) සිහි කරවනලද ද මනාලෙස සිහි කරවන ලද්දී ය. සිහි කරවන්නාහට ඇවැත් නො වේ.''

67. එසමයෙහි සවග මෙහෙණහු පුරුෂයකු පදවන්නකු කොට ඇති ස්ත්‍රීන් (දෙනුන්) යොදන ලද්ද වූ ද, ස්ත්‍රියක පදවන්නිය කොට ඇති පුරුෂයන් (ගොනුන්) යොදන ලද්ද වූ ද යානයෙන් යෙති. ගඞ්ගා-ක්‍රීඩාවෙහි මෙනැ යි මිනිස්සු ලමු කොට සිනති, නුගුණ කියති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් යානයෙන් නො යායුතු. යම් මෙහෙණක් යන්නී නම් දහම් වූ පරිදි කරවියයුතු'' යි. එසමයෙහි එක්තරා මෙහෙණක් ගිලන් වූවා පයින් යන්නට නො හැකි වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. ''මහණෙනි, ගිලන් මෙහෙණට යානය අනුදනිමි''යි. ඉක්බිති භික්‍ෂුණීන්ට 'ස්ත්‍රීන් යොදන ලද යානය ද පුරුෂයන් යොදනලද යානය දැ'යි මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. ''මහණෙනි, ස්ත්‍රීන් (දෙනුන්) යොදනලද යානය, පුරුෂයන් (ගොනුන්) යොදනලද යානය හා අත්වටුගැල ද අනුදනිමි''යි. එසමයෙහි එක්තරා මෙහෙ-ණකට යානයෙහි ගැස්සීමෙන් ඉතා දැඩි වූ අපහසුවක් විය. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. ''මහණෙනි, සිවිකාව (පුටුසිවිකාව) ද පල්ලැක්කිය (හිදෙලුව) ද අනුදනිමි''යි.

68. එසමයෙහි අඩ්ඪකාසි නම් ගණිකාව මෙහෙණන් වෙත පැවිදි වූවා වෙයි. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි උපසම්පද වන්නෙමැ යි ඕ සැවැත් නුවරට යනු කැමැත්තී වෙයි. 'අඩ්ඪකාසි ගණිකාව සැවැත් නුවරට යනු කැමැත්තීලැ'යි ධූර්තයෝ ඇසූහ. ඔවුහු මග රැකසිටියහ. 'ධූර්තයෝ මග රැක සිටිත්ලැ'යි අඩ්ඪකාසි ගණිකාව ඇසූ ය. (ඉක්බිති ඕ) මම උපසම්පදවනු කැමැත්තෙමි. මා කෙසේ පිළිපැදියයුතු දැ යි (කියා) භාග්‍යවතුන් වහන්සේ වෙත දූතයකු යැවූ ය.

අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ දූතෙනපි උපසම්පාදෙතුන්ති". භික්ඛුදූතෙන උපසම්පාදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුදූතෙන උපසම්පාදෙතබ්බා. යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්සාති." සික්ඛමානදූතෙන උපසම්පාදෙන්ති -පෙ- සාමණෙරදූතෙන උපසම්පාදෙන්ති -පෙ- සාමණෙරීදූතෙන උපසම්පාදෙන්ති -පෙ- බාලාය අව්‍යත්තාය දූතෙන උපසම්පාදෙන්ති. "න භික්ඛවෙ බාලාය අව්‍යත්තාය දූතෙන උපසම්පාදෙතබ්බා යා[1] උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය දූතෙන උපසම්පාදෙතුං. තාය දූතාය භික්ඛුනියා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො:

ඉත්ථන්නාමා අය්‍යා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙඛා[2] එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. සා කෙනචිදෙව අන්තරායෙන නාගච්ඡති. ඉත්ථන්නාමා අය්‍යා සඞ්ඝං උපසම්පදං යාචති. උල්ලුම්පතු තං අය්‍යා සඞ්ඝො අනුකම්පං උපාදය.

ඉත්ථන්නාමා අය්‍යා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. සා කෙනචිදෙව අන්තරායෙන නාගච්ඡති. දුතියම්පි අය්‍යා ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති. උල්ලුම්පතු තං අය්‍යා සඞ්ඝො අනුකම්පං උපාදය.

ඉත්ථන්නාමා අය්‍යා ඉත්ථන්නාමාය අය්‍යාය උපසම්පදාපෙඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. සා කෙනචිදෙව අන්තරායෙන නාගච්ඡති. තතියම්පි අය්‍යා ඉත්ථන්නාමා සංඝං උපසම්පදං යාචති. උල්ලුම්පතු තං අය්‍යා සඞ්ඝො අනුකම්පං උපාදයාති.

ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය උපසම්පදාපෙඛා එකතො උපසම්පන්නා භික්ඛුනීසඞ්ඝෙ විසුද්ධා. සා කෙනචිදෙව අන්තරායෙන නාගච්ඡති. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය පවත්තිනියා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය ඉත්ථන්නාමාය පවත්තිනියා". **එසා ඤත්ති.**

---

1. යො - මජසං.
2. උපසම්පදාපෙක්ඛා - සීමු. මජසං.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි ලා දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, දූතයකු ලවා ද උපසම්පද කරන්නට අනුදනිමි"යි (වදළහ.) භික්ෂුදූතයකු ලවා උපසම්පද කරවත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුදූතයකු ලවා උපසම්පද නො කරවියයුත්තාහ. යමෙක් උපසම්පද කරවා නම් දුකුළා ඇවැත් වේ"යි. සික්ඛමාන දූතයකු ලවා උපසම්පද කරවත් ... සාමණෙරදූතයකු ලවා උපසම්පද කරවත් ... සාමණෙරිදූතයකු ලවා උපසම්පද කරවත් ... බාල අව්‍යක්ත මෙහෙණක වූ දූතයකු ලවා උපසම්පද කරවත්, "මහණෙනි, බාල අව්‍යක්ත මෙහෙණක වූ දූතයකු ලවා උපසම්පද නො කරවිය යුතු ය. යම් මෙහෙණක් (එසේ) උපසම්පද කරවා නම් දුකුළා ඇවැත් වේ. 'මහණෙනි, ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක වූ දූතයකු ලවා උපසම්පද කරවන්නට අනුදනිමි: ඒ දූත වූ මෙහෙණ විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට භික්ෂූන්ගේ පා වැඳ උක්කුටික ව හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය:

"ආයර්‍ය්‍යයෙනි, මෙනම් ආයර්‍ය්‍යාවගේ උපසම්පදපෙක්ෂිකා වූ මෙනම් ඇත්ති භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. ඕ කිසියම් අනතුරක් නිසා නො පැමිණෙයි. ආයර්‍ය්‍යයෙනි, මෙනම් ඇත්ති සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. ආයර්‍ය්‍යයෙනි, සඞ්ඝයා අනුකම්පා කොට ඇය හෙරණ බැවින් නඟාසිටුවන සේක්වා.

ආයර්‍ය්‍යයෙනි, මෙනම් ආයර්‍ය්‍යාවගේ උපසම්පදපෙක්ෂිකා වූ මෙනම් ඇත්ති භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. ඕ කිසියම් අනතුරක් නිසා නො පැමිණෙයි. ආයර්‍ය්‍යයෙනි, මෙනම් ඇත්ති දෙවනු ද සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. ආයර්‍ය්‍යයෙනි, සඞ්ඝයා අනුකම්පා කොට ඇය හෙරණ බැවින් නඟාසිටුවනසේක්වා.

ආයර්‍ය්‍යයෙනි, මෙනම් ආයර්‍ය්‍යාවගේ උපසම්පදපෙක්ෂිකා වූ මෙනම් ඇත්ති භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි පිරිසිදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. ඕ කිසියම් අනතුරක් නිසා නො පැමිණෙයි. ආයර්‍ය්‍යයෙනි, මෙනම් ඇත්ති තෙවනු ද සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. ආයර්‍ය්‍යයෙනි, සඞ්ඝයා අනුකම්පා කොට ඇය හෙරණ බැවින් නඟාසිටුවනසේක්වා" යි.

ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුවක්හු විසින් (මෙසේ) දන්වියයුතු. "වහන්ස, සඞ්ඝයා ම බස් අසාවා. මෙනම් ඇත්තියගේ උපසම්පදපෙක්ෂිකා වූ මෙනම් ඇත්ති භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්‍ෂයෙකින් උපසපන් වූ ය. ඕ කිසියම් අනතුරක් නිසා නො පැමිණෙයි. මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය පවත්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදව යදියි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් සඞ්ඝයා මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පද කරන්නේ ය". මේ ඥප්ති යි.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනිසඞ්ඝෙ විසුද්ධා. සා කෙනචිදෙව අන්තරායෙන නාගච්ඡති. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය පවත්තිනියා. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමාය පවත්තිනියා. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමාය උපසම්පදා ඉත්ථන්නාමාය පවත්තිනියා. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය උපසම්පදාපෙක්ඛා එකතො උපසම්පන්නා භික්ඛුනිසඞ්ඝෙ විසුද්ධා. සා කෙනචිදෙව අන්තරායෙන නාගච්ඡති. ඉත්ථන්නාමා සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමාය පවත්තිනියා. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමාය පවත්තිනියා. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමාය උපසම්පදා ඉත්ථන්නාමාය පවත්තිනියා. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

උපසම්පන්නා සඞ්ඝෙන ඉත්ථන්නාමා ඉත්ථන්නාමාය පවත්තිනියා. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

තාවදෙව ඡායා මෙතබ්බා, උතුපමාණං ආචික්ඛිතබ්බං. දිවසභාගො ආචික්ඛිතබ්බො. සංගීති ආචික්ඛිතබ්බා. භික්ඛුනියො වත්තබ්බා තස්සා තයො ච නිස්සයෙ අට්ඨ ච අකරණීයානි ආචික්ඛෙය්‍යාථාති.

69. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අරඤ්ඤෙ විහරන්ති. ධුත්තා දූසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා අරඤ්ඤෙ වත්ථබ්බං, යා වසෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති" තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන උපාසකෙන භික්ඛුනී සඞ්ඝස්ස උද්‍දොසිතො දින්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ උද්‍දොසිතන්ති". උද්‍දොසිතො න සම්මති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ උපස්සයන්ති". උපස්සයො න සම්මති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ නවකම්මන්ති". නවකම්මං න සම්මති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පුග්ගලිකම්පි කාතුන්ති".

"වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් ඇත්තියගේ උපසම්පදාපෙක්ඛිකා වූ මෙනම් ඇත්ති භික්ෂුණීසඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්ෂයෙකින් උපසපන් වූ ය. ඕ කිසියම් අනතුරක් නිසා නො පැමිණෙයි. මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය පවත්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදාව යදියි. සඞ්ඝයා මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පදා කරයි. මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තියගේ උපසම්පදාව යම් ආයුෂ්මත් කෙනකුට රුචි වේ නම් උන්වහන්සේ නිහඬ වන්නාහ. යම් කෙනකුට රුචි නො වේ නම් උන්වහන්සේ කථා කරන්නාහ.

දෙවනු ද මේ කරුණ කියමි ... තෙවනු ද මේ කරුණ කියමි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් ඇත්තියගේ උපසම්පදාපෙක්ඛිකා වූ මෙනම් ඇත්ති භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි පිරිසුදු වූවා එක් පක්ෂයෙකින් උපසපන් වූ ය. ඕ කිසියම් අනතුරක් නිසා නො පැමිණෙයි. මෙනම් ඇත්ති මෙනම් ඇත්තිය පවත්තිනිය කොට සඞ්ඝයාගෙන් උපසම්පදාව යදියි. සඞ්ඝයා මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තිය උපසම්පදා කරයි. මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්තියගේ උපසම්පදාව යම් ආයුෂ්මත් කෙනකුට රුචි වේ නම් උන්වහන්සේ නිහඬ වන්නාහ. යම් කෙනකුට රුචි නො වේ නම් උන්වහන්සේ කථා කරන්නාහ.

"මෙනම් ඇත්තිය පවත්තිනිය කොට මෙනම් ඇත්ති සඞ්ඝයා විසින් උපසපන් කරන ලද. (එය) සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් නිහඬ වෙයි. මෙසේ මෙය දරමි"යි.

එකෙණෙහි ම සෙවනැල්ල මිනියයුතු. ඍතුප්‍රමාණය කියයුතු. දිවසභාගය කියයුතු. ඒ හැම එක් කොට සංගීතිය කියයුතු. ඇයට 'නිස්සය තුන ද අකරණීය අට ද කියාදෙව' යි භික්ෂුණීන්ට කියයුතු යි.

69. එසමයෙහි භික්ෂුණීහු අරණ්‍යයෙහි වෙසෙත්. ධූර්තයෝ (ඔවුන්) දූෂණය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, මෙහෙණ විසින් අරණ්‍යයෙහි නො විසිය යුතු යම් මෙහෙණක් වෙසේ නම්, දුකුළා ඇවැත් වේ" යි. එසමයෙහි එක්තරා උවසුවකු විසින් භික්ෂුණීසඞ්ඝයාට භාණ්ඩශාලාවක් දෙන ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. "මහණෙනි, භාණ්ඩශාලාව අනුදනිමි" යි (වදළහ). භාණ්ඩශාලාව නො සෑහෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, මෙහෙණවර අනුදනිමි" යි. මෙහෙණවර නො පොහොනේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, නවකම් අනුදනිමි" යි. නවකර්මය නො පොහොනේ වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, පෞද්ගලික ගෙයක් කරන්නට අනුදනිමි" යි.

70. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී සන්නිසින්නගබ්භා භික්ඛුනීසු පබ්බජිතා හොති. තස්සා පබ්බජිතාය ගබ්භො වුට්ඨාසි. අථ ඛො තස්සා භික්ඛුනියා එතදහොසි: කථන්නු ඛො මයා ඉමස්මිං දරකෙ පටිපජ්ජිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පොසෙතුං යාව සො දරකො විඤ්ඤුතං පාපුණාතී"ති.

අථ ඛො තස්සා භික්ඛුනියා එතදහොසි: මයා ච න ලබ්භා එකිකාය වත්ථුං, අඤ්ඤාය ච භික්ඛුනියා න ලබ්භා දරකෙන සහ වත්ථුං, කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ එකං භික්ඛුනිං සම්මන්නිත්වා තස්සා භික්ඛුනියා දුතියං දතුං. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා: පඨමං භික්ඛුනී යාචිතබ්බා. යාචිත්වා ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සම්මන්නෙය්‍ය ඉත්ථන්නාමාය භික්ඛුනියා දුතියං. එසා ඤත්ති.

සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සම්මන්නති ඉත්ථන්නාමාය භික්ඛුනියා දුතියං. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුනියා සම්මුති ඉත්ථන්නාමාය භික්ඛුනියා දුතියාය. සා තුණ්හස්ස. යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. සම්මතා සඞ්ඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී ඉත්ථන්නාමාය භික්ඛුනියා දුතියා. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

අථ ඛො තස්සා දුතියිකාය භික්ඛුනියා එතදහොසි: කථන්නු ඛො මයා ඉමස්මිං දරකෙ පටිපජ්ජිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා සාගාරං යථා අඤ්ඤස්මිං පුරිසෙ පටිපජ්ජන්ති එවං තස්මිං දරකෙ පටිපජ්ජිතුන්ති".

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ගරුධම්මං අජ්ඣාපන්නා හොති මානත්තචාරිනී. අථ ඛො තස්සා භික්ඛුනියා එතදහොසි: මයා ච න ලබ්භා එකිකාය වත්ථුං. අඤ්ඤාය ච භික්ඛුනියා න ලබ්භා සහ මයා වත්ථුං. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ එකං භික්ඛුනිං සම්මන්නිත්වා තස්සා භික්ඛුනියා දුතියං දතුං. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා. පඨමං භික්ඛුනී යාචිතබ්බා. යාචිත්වා ව්‍යත්තාය භික්ඛුනියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සම්මන්නෙය්‍ය ඉත්ථන්නාමාය භික්ඛුනියා දුතියං. එසා ඤත්ති.

70. එ සමයෙහි එක්තරා ස්ත්‍රියක් අප්‍රකට ව පිහිටි ගැබ ඇත්තී භික්ෂුණීන් වෙත පැවිදිවූ ය. ඇය පැවිදි වූ කල ගැබ නැඟී සිටියේ ය. (බිහි විය) ඉක්බිති ඒ භික්ෂුණියට මේ සිත විය: මේ දරුවා කෙරෙහි මා කෙසේ පිළිපැදියයුතු ද යි. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. "මහණෙනි, ඒ දරුවා නුවණැති බවට පැමිණෙන තුරු පොෂණය කරන්නට අනුදනිමි" යි (වදාළසේක).

ඉක්බිති ඒ භික්ෂුණියට මේ අදහස විය: මා විසින් තනි ව වසන්ට ද නො හැකි ය. අනිත් භික්ෂුණියකට ද (පිරිමි) දරුවකු සමග වසන්ට නො හැකි ය. මා කෙසේ පිළිපැදියයුතු ද යි. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, එක් මෙහෙණක් සම්මත කොට ඇය ඒ මෙහෙණට සහාය කොට දෙන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ සම්මත කළයුතු. පළමු ව ඒ මෙහෙණගෙන් (කැමත්ත) ඉල්වියයුතු. ඉල්වා ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක විසින් සඞ්ඝයා (මෙසේ) දැන්වියයුතු. ආයඝාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් වේ නම් මෙනම් භික්ෂුණිය මෙනම් භික්ෂුණියගේ දෙවැන්නක (සහායිකා) කොට සම්මත කරන්නේ ය. මේ ඥප්ති යි.

ආයඝාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. මෙනම් භික්ෂුණිය මෙනම් භික්ෂුණියගේ දෙවැන්න (සහායිකා) කොට සඞ්ඝයා සම්මත කරයි. මෙනම් භික්ෂුණියගේ දෙවැන්න (සහායිකා) කොට මෙනම් භික්ෂුණියගේ සම්මුතිය යම් ආයඝාවකට රුචි වේ නම් ඕ නිහඬ වන්නී ය. යම් ආයඝාවකට රුචි නො වේ නම්, ඕ කියන්නී ය. මෙනම් භික්ෂුණී මෙනම් භික්ෂුණියගේ දෙවැන්න (සහායිකා) කොට සඞ්ඝයා විසින් සම්මත කරන ලද්දී ය. සඞ්ඝයාට (එය) රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙය මෙසේ දරමි" යි.

ඉක්බිති ඒ සහායක භික්ෂුණියට මේ අදහස විය. මේ දරුවා කෙරෙහි මා කෙසේ පිළිපැදියයුතු ද යි. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, එකගෙහි නිදීම (සමග නිදීම) හැර අන් පුරුෂයකු කෙරෙහි යම්සේ පිළිපදිත් ද එසේ ඒ දරුවා කෙරෙහි ද පිළිපදින්නට අනුදනිමි" යි (වදාළහ.)

එසමයෙහි එක් භික්ෂුණියක් ගරු ඇවතකට පැමිණියා මානතෙහි හැසිරෙන්නී වෙයි. ඉක්බිති ඒ භික්ෂුණියට මේ අදහස විය. 'මට තනි ව වසන්ට ද නො හැකි ය. අනිත් භික්ෂුණියකට ද මා සමග වසන්ට නො හැකි ය. මා කෙසේ පිළිපැදියයුතු ද' යි. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. "මහණෙනි, එක් භික්ෂුණියක් සම්මත කොට ඒ භික්ෂුණියට සහාය (දෙවැන්නක) ලෙස දෙන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ සම්මත කළයුතු. පළමුව (ඒ) භික්ෂුණියගේ කැමැත්ත ඉල්වියයුතු. ඉල්වා ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුණියක විසින් සඞ්ඝයා මෙසේ දැන්වියයුතු. ආයඝාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් වේ නම් සඞ්ඝයා මෙනම් භික්ෂුණිය මෙනම් භික්ෂුණියගේ දෙවැන්න (සහායිකා) ලෙස සම්මත කරන්නේ ය. මේ ඥප්ති යි.

"සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුනිං සම්මන්නති ඉත්ථන්නාමාය භික්ඛුනියා දූතියං. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුනියා සම්මුති ඉත්ථන්නාමාය භික්ඛුනියා දූතියං. සා තුණ්හස්ස, යස්සා නක්ඛමති සා භාසෙය්‍ය. සම්මතා සඞ්ඝෙන ඉත්ථන්නාමා භික්ඛුනී ඉත්ථන්නාමාය භික්ඛුනියා දූතියා. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති".

71. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී සික්ඛං පච්චක්ඛාය විබ්භමි. සා පුන පච්චාගන්ත්වා භික්ඛුනියො උපසම්පදං යාචි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න[1] භික්ඛවෙ භික්ඛුනියා සික්ඛාපච්චක්ඛානං යදෙව සා විබ්භන්තා තදෙව සා අභික්ඛුනී"ති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී සකාසාවා[2] තිත්ථායතනං සඞ්කමි. සා පුන පච්චාගන්ත්වා භික්ඛුනියො උපසම්පදං යාචි. භගවතො එතමත්ථං ආරොචෙසුං. යා "සා භික්ඛවෙ භික්ඛුනී සකාසාවා තිත්ථායතනං සඞ්කන්තා සා පුන ආගතා න උපසම්පාදෙතබ්බා"ති.

72. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පුරිසෙහි අභිවාදනං කෙසච්ඡෙදනං නඛච්ඡෙදනං වණපටිකම්මං කුක්කුච්චායන්තා න සාදියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ සාදිතුන්ති".

තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පල්ලඞ්කෙන නිසීදන්ති. පණ්හිසම්ඵස්සං සාදියන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා පල්ලඞ්කෙන නිසීදිතබ්බං. යා නිසීදෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති".

73. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී ගිලානා හොති. තස්සා විනා පල්ලඞ්කෙන න ඵාසු හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා අඩ්ඪපල්ලඞ්කන්ති".

තෙන ඛො පන සමයෙන භික්ඛුනියො වච්චකුටියා වච්චං කරොන්ති. ඡබ්බග්ගියා භික්ඛුනියො තත්ථෙව ගබ්භං පාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා වච්චකුටියා වච්චො කාතබ්බො. යා කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ හෙට්ඨා විවටෙ උපරි පටිච්ඡන්නෙ වච්චං කාතුන්ති".

---

1. නත්ථි භික්ඛවෙ - සී.
2. සකාවාසා - මජසං.

"ආයර්‍යාවෙනි, සඞ්ඝයා මබස් අසාවා. සඞ්ඝයා මෙනම් භික්ෂුණිය මෙනම් භික්ෂුණියගේ දෙවැන්න (සහායිකා) ලෙස සම්මත කරයි. මෙනම් භික්ෂුණියගේ දෙවැන්න ලෙස මෙනම් භික්ෂුණිය සම්මත කිරීම යම් ආයර්‍යාවකට රුචි වේ නම් ඕ නිහඬ වන්නී ය. යම් ආයර්‍යාවකට රුචි නො වේ නම් ඕ කියන්නී ය. මෙනම් භික්ෂුණී මෙනම් භික්ෂුණියගේ දෙවැන්න ලෙස සඞ්ඝයා විසින් සම්මත කරන ලද්දී ය. (එය) සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙය මෙසේ දරමි" යි.

71. එසමයෙහි එක්තරා භික්ෂුණියක් ශික්ෂාව ප්‍රතික්ෂෙප කොට සිවුරු හැර ගියා ය. ඕ නැවත පෙරළා අවුත් භික්ෂුණීන්ගෙන් උපසම්පදාව ඉල්ලූ ය. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැල කළහ. "මහණෙනි, මෙහෙණකගේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයක් නැත. යම් විටෙක ඕ සිවුරු හළවා ද එවිට ම ඕ අභික්ෂුණියක් වූවා" යි.

එසමයෙහි එක්තරා භික්ෂුණියක් කාෂාය වස්ත්‍ර සහිතව තීර්ථායතනයකට ගියා ය. ඕ නැවත පෙරළා අවුත් භික්ෂුණීන්ගෙන් උපසම්පදාව ඉල්ලූ ය. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැල කළහ. "මහණෙනි, යම් මෙහෙණක් සිවුරු සහිත ව තීර්ථායතනයකට ගියා ද නැවත පැමිණි ඕ උපසපන් නො කළ යුත්තී ය" යි වදළහ.

72. එසමයෙහි භික්ෂුණීහු කුකුස් කරන්නාහු පුරුෂයන්ගෙන් වැඳීම, කෙස් සිඳීම, නිය සිඳීම, වණ පිළියම් නො ඉවසත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, ඉවසන්නට අනුදනිමි" යි (වදළහ.)

එසමයෙහි භික්ෂුණීහු පර්‍ය්‍යඞ්කයෙන් හිඳිත්, විළුඹ ගැටීම, ඉවසත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, මෙහෙණ විසින් පර්‍ය්‍යඞ්කයෙන් නො හිඳියයුතු. යම් මෙහෙණක් හිඳී නම් දුකුළා ඇවැත් වේ" යි (වදළහ.)

73. එසමයෙහි එක්තරා භික්ෂුණියක් ගිලන් වූ ය. ඇයට පර්‍ය්‍යඞ්කයෙන් හිඳීම හැර පහසු නො වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුණියට අර්ධ පර්‍ය්‍යඞ්කය අනුදනිමි" යි.

එසමයෙහි භික්ෂුණීහු වැසිකිළියෙහි අස්පස්කිස කෙරෙත්. සවග මෙහෙණෝ එහි ම ගැබ් හෙළත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. "මහණෙනි, භික්ෂුණිය විසින් වැසිකිළියෙහි අස්පස්කිස නො කළයුතු. යම් මෙහෙණක් කෙරේ නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, යට විවර වූ මත්තෙහි වසන ලද (ස්ථානයෙහි) අස්පස්කිස කරන්නට අනුදනිමි" යි.

74. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො චුණ්ණෙන නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති[1]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා චුණ්ණෙන නහායිතබ්බං. යා නහායෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ කුක්කුසං මත්තිකන්ති".

තෙන ඛො පන සමයෙන භික්ඛුනියො වාසිතකාය මත්තිකාය නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා වාසිතකාය මත්තිකාය නහායිතබ්බං. යා නහායෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ පකතිමත්තිකන්ති".

75. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො ජන්තාඝරෙ නහායන්තියො කොලාහලං අකංසු. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා ජන්තාඝරෙ නහායිතබ්බං. යා නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති".

තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පටිසොතෙ නහායන්ති ධාරාසම්ඵස්සං සාදියන්තා. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා පටිසොතෙ නහායිතබ්බං. යා නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති".

තෙන ඛො පන සමයෙන භික්ඛුනියො අතිත්ථෙ නහායන්ති. ධුත්තා දූසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා අතිත්ථෙ නහායිතබ්බං. යා නහායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති".

76. තෙන ඛො පන සමයෙන භික්ඛුනියො පුරිසතිත්ථෙ නහායන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනියොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ භික්ඛුනියා පුරිසතිත්ථෙ නහායිතබ්බං. යා නහායෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ මහිලාතිත්ථෙ නහායිතුන්ති".

### තතිය භාණවාරං.

## භික්ඛුනීක්ඛන්ධකං දසමං.

ඉමම්හි ඛන්ධකෙ වත්ථු එකසතං ඡ[2]

තස්සුද්දානං:-

1. පබ්බජ්ජං ගොතමී යාචි නානුඤ්ඤාසි තථාගතො
   කපිලවත්ථු වෙසාලිං අගමාසි විනායකො.

---

1. ගිහිනී කාමභොගිනියොති - මජසං.
2. එකසතං - මජසං.

74. එසමයෙහි භික්ෂුණීහු සුණුයෙන් (ඇඟ සුවඳ කුඩු තවරමින්) නහත්. ගිහි කාමභොගිනීන් මෙනැ යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් සුණුයෙන් නො නැයුතු. යම් මෙහෙණක් නහන්නී නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, කුඩු හා මැටි ද අනුදනිමි'' යි.

එසමයෙහි භික්ෂුණීහු සුවඳ කවන ලද මැටියෙන් නහත්. ගිහි කාමභොගිනීන් මෙනැ යි මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් සුවඳ කවන ලද මැටියෙන් නො නැයුතු. යම් මෙහෙණක් නහන්නී නම් දුකුළා ඇවත් වේ. මහණෙනි, පියවි මැටි අනුදනිමි'' යී.

75. එසමයෙහි භික්ෂුණීහු ගිනිහල්ගෙහි නහන්නාහු කොලාහල කළහ. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් ගිනිහල්ගෙහි නො නැයුතු. යම් මෙහෙණක් නහන්නී නම් දුකුළා ඇවැත් වේ'' යී.

එසමයෙහි භික්ෂුණීහු ධාරා ස්පර්ශය ඉවසමින් ප්‍රතිස්‍රොතස්හි ස්නාන කෙරෙත්, භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් උඩුහොය නො නැයුතු. යම් මෙහෙණක් නහන්නී නම් දුකුළා ඇවැත් වේ'' යී.

එසමයෙහි භික්ෂුණීහු නොතොටෙහි නහත්. ධූර්තයෝ දූෂණය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් නොතොටෙහි නො නැයුතු. යම් මෙහෙණක් නහන්නී නම් දුකුළා ඇවැත් වේ'' යී.

76. එසමයෙහි භික්ෂුණීහු පුරුෂයන්ගේ තොටෙහි නහත්. ගිහි කාමභොගිනීන් මෙනැ යි මිනිස්සු ලමු කොට සිතති. නුගුණ කියති, දෙස් පතුරුවත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. ''මහණෙනි, මෙහෙණ විසින් පුරුෂයන්ගේ තොටෙහි නො නැයුතු. යම් මෙහෙණක් නහන්නී නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, මෙහෙලියන්ගේ තොටෙහි නහන්නට අනුදනිමි'' යි (වදළසේක.)

## තෙවැනි බණවරයි.

## දසවැනි භික්ඛුනීඛන්ධක යි.

මෙ ඛන්ධකයෙහි වස්තු එක්සිය සයෙකි.

**එහි උද්දානය මෙසේ යි:-**

1. ගොතමී පැවිද්ද ඉල්වූ ය. තථාගතයන් වහන්සේ නො අනුදත්හ. විනායකයන් වහන්සේ කිඹුල්වතින් විසාලාවට වැඩිසේක.

2. රජොකිණ්ණෙන කොට්ඨකෙ ආනන්දස්ස පවෙදයි
භබ්බාති නයතො යාචි මාතාති පොසිකාති ච.

3. වස්සසතං තදහු ච අභික්ඛු පච්චාසිංසනා
පවාරණා ගරුධම්මා ද්වෙ වස්සා අනක්කොසනා.

4. ඔවටො ච අට්ඨ ධම්මා යාවජීවානුවත්තනා
ගරුධම්මපටිග්ගාහො සාවස්සා උපසම්පද.

5. වස්සසහස්සං පඤ්චෙව කුම්භථෙනක සෙතට්ඨි
මඤ්ජෙට්ඨික උපමාහි එවං සද්ධම්මහිංසනා.

6. ආලිං බන්ධෙය්‍යුපමාහි[1] පුන සද්ධම්මසණ්ඨිති
උපසම්පාදෙතුං අය්‍යා යථා වුඩ්ඪාභිවාදනා.

7. න කරිස්සන්ති කිමෙව සාධාරණාසාධාරණං
ඔවාදං පාතිමොක්ඛඤ්ච කෙන නු ඛො උපස්සයං.

8. න ජානන්ති ච ආවික්ඛි න කරොන්ති ච භික්ඛුහි
පටිග්ගහෙතුං භික්ඛූහි භික්ඛුනීහි පටිග්ගහො.

9. ආවික්ඛි කම්මං භික්ඛූහි උජ්ඣායන්ති භික්ඛුනීහි වා
ආවික්ඛං භණ්ඩනඤ්ච රොපෙත්වා උපලාය ච.

10. සාවජ්ජීයා කද්දමොද අවන්දිකාය ඌරු ච
අඞ්ගජාතඤ්ච ඔභාසං සම්පයොජෙන්ති වග්ගිකා

11. අවන්දියො දණ්ඩකම්මං භික්ඛුනියො තථා පුන
ආවරණඤ්ච ඔවාදං කප්පති නු ඛො පක්කමි.

12. බාලා වත්ථු විනිච්ඡයො ඔවාදං සඞ්ඝො පඤ්චහි
ද්වෙ තිස්සො න ගණ්හන්ති බාලා ගිලාන ගමිකා.

13. ආරඤ්ඤිකා නරොචෙන්ති න පච්චාගච්ඡන්ති ච.
දීඝං විලීව චම්මඤ්ච දුස්සා ච වෙණි වට්ටි ච;
චොළවෙණි ච වට්ටි ච සුත්තවෙණි ච වට්ටිකා.

14. අට්ඨිල්ලං ගොහනුකෙන හත්ථකොච්ඡං පාදං තථා
ඌරුං මුඛං දන්තමංසං ආලිම්පො මද්ද චුණ්ණනා.

15. ලඤ්ජෙන්ති අඞ්ගරාගඤ්ච මුඛරාගං තථා ද්වෙ
අවඞ්ගවිසෙසොලොකෙ සාලොකෙ සනච්චන ච.

16. වෙසී පානාගාරං සූනං ආපණං වඩ්ඪී වාණිජා
දසං දසිං කම්මකරං කම්මකාරි උපට්ඨහං.

1. බන්ධෙය්‍ය පාළිව - මජසං.

2. රජස් වැකුණු සිරුරින් දෙරකොටුවෙහි දී ආනන්ද හිමියන්ට දන්වී ය. මවය පොෂණය කළ තැනැත්තිය යි කියමින් පැවිද්දට සුදුසු යැ යි නය වශයෙන් යැදී ය.

3. වස්සසත, තදහුපසම්පන්න, අභික්ඛුක ආවාස, පච්චාසිංසන, පවාරණ, ගරුධම්ම, දෙවධම්මා, අනතික්කාසන,

4. ඔවට යන අෂ්ට ධර්මයෝ යාවජීවයෙන් පැවැත්විය යුත්තාහ. ඒ ගරුධම්ම පිළිගැනීම ම ඇයගේ උපසම්පදාව වීය.

5. වස්සසහස්ස, පඤ්චසතවස්ස ද, කුම්භථෙණ, සෙතට්ඨි, මඤ්ජෙට්ඨික, යන උපමාවලින් සද්ධර්මය පිරිහීම දැක්වීම ද,

6. ආලිබන්ධන උපමාංගවන් යළි සද්ධර්මයෙහි සංස්ථිතිය දැක්වීම ද, උපසම්පද කිරීම, වැඩිමහලු පිළිවෙළින් වැඳීම,

7. නො කිරීම ද, කුමකට පනවම් දැ යි දෙසීම ද, සාධාරණ අසාධාරණ ශික්ෂාපද ද, අවවාද දීම, ප්‍රාතිමොක්ෂය, කවරකු භික්ෂුණී ආරාමයට එළඹියයුතු ද (යන කරුණු ද,)

8. (පාමොක් උදෙසීම) නො දනිත්, (භික්ෂුණීන්ට) නො කියත්. ඇවතට පිළියම් නො කෙරෙත්, භික්ෂූන් විසින් ඇවැත් පිළිගැනීම. ඇවැත් පිළිගැනීම භික්ෂූන් විසින් භික්ෂුණීන්ට කියාදීම.

9. ආවිකම්මනය, භික්ෂූන් විසින් සඞ්ඝකර්ම කිරීම, මිනිසුන්ගේ දෙස් කීම, භික්ෂුණීන් විසින් කර්ම කිරීම, භික්ෂූන් විසින් කියාදීම, කලහ කිරීම, කර්ම ආරොපණය කිරීම හා උප්පලවණ්ණා පුවත ද,

10. සාවත්ථියෙහි, මඩවතුර ඉසීම, අවන්දිය බව, ඡබ්බග්ගිය භික්ෂූන් ඌරු, අඞ්ගජාත දැක්වීම, ඔභාසනය, එකට ගැටීසිටීම,

11. අවන්දිය, දණ්ඩකර්මය, භික්ෂුණීන් ද එසේ කිරීම, ආවරණය අවවාද නැවැත්වීම, කැප දැ යි සිතීම, චාරිකාවෙහි නික්මීම,

12. බාලා ය, වත්‍රු ය, විනිවජය ය, ඔවාද ය, සියලු සඞ්ඝයා ය, සතර පස්නම ය, දෙතුන්නම ය, අවවාද නො ගැනීම ය. බාලා, ගිලාන, ගමික,

13. ආරඤ්ඤික යන මොහු ද, න රොචන න පච්චාගමන දීඝ, විලීව, චම්ම, දුස්ස, වෙණී, වට්ටි, චොළවෙණී, චොළවට්ටි, සුත්තවෙණී, සුත්තවට්ටිකා,

14. අට්ඨිල්ල, ගොහනුක, හත්ථකොච්ඡ, පාද, පාදකොච්ඡ, ඌරු, මුඛ, දන්තමංස, ආලිම්පන, මද්දන, චුණ්ණන,

15. මුඛලඤ්ජන, අඞ්ගරාග, මුඛරාග, අඞ්ගමුඛරාග, අවඞ්ග, විසෙසක, ඕලොකනක, සාලොක, සනච්ච,

16. වෙසී, පානාගාර, සූන, ආපණ, වඩ්ඪි, වාණිජ (යන මේවා යෙදීම ද,) දස, දසී, කම්මකර, කම්මකාරී,

17. තිරච්ඡාන හරිතකී සණ්ඨාරයන්ති නමතකං
නීලං පීතං ලොහිතකං මඤ්ජෙට්ඨ කණ්හ චීවරා.

18. මහාරඞ්ග මහානාම අච්ඡින්නා දීසමෙව ච
පුප්ඵ ඵල කංචුකඤ්ච තිරීටකඤ්ච ධාරයුං.

19. භික්ඛුනී සික්ඛමානාය සාමණෙරාය අච්චයෙ
නීයාදිතෙ පරික්ඛාරෙ භික්ඛුනී චෙව ඉස්සරා.

20. භික්ඛුස්ස සාමණෙරස්ස උපාසකස්සුපාසිකා
අඤ්ඤෙසඤ්ච පරික්ඛාරෙ නීයන්තෙ භික්ඛු ඉස්සරා

21. මල්ලිගබ්භං පත්තමූලං බ්‍යඤ්ජනං ආමිසෙන ච
උස්සන්නඤ්ච බාළ්හතරං සන්නිධිකත මාමිසං

22. භික්ඛූනං යාදිසං හෙට්ඨා භික්ඛුනීනං තථා කරෙ
සෙනාසනං උතුනියො මක්ඛියන්ති පට්ටානි ච.

23. ඡිජ්ජන්ති සබ්බකාලඤ්ච අනිමිත්තාදි දිස්සරෙ
නිමිත්තා ලොහිතා චෙව තථෙව ධුවලොහිතා.

24. ධුවචොළ පග්ඝරණී සිඛරිණිත්ථී පණ්ඩකා
වෙපුරිසී ච සම්භින්නා උභතොබ්‍යඤ්ජනා පි ච.

25. අනිමිත්තාදිතො කත්වා යා ච උභතොබ්‍යඤ්ජනා
එතං පෙය්‍යාලතො හෙට්ඨා කුට්ඨං ගණ්ඩො කිලාසි.

26. සොසාපමාරො මානුසි ඉත්ථීසි භුජිස්සාසි ච
අණණා න රාජභටී අනුඤ්ඤාතා ච වීසති.

27. පරිපුණ්ණා ච කින්නාමා කා නාමා තෙ පවත්තිනී
චතුවීසන්තරායානං පුච්ඡිත්වා උපසම්පදා.

28. විජානන්ති අනනුසිට්ඨා සඞ්ඝමජ්ඣෙ තථෙව ච
උපජ්ඣා ගාහ සංඝාටී උත්තරන්තරවාසකො.

29. සංකච්චුදකසාටී ච ආචික්ඛිත්වාන පෙසයෙ
බාලා අසම්මතෙකතො යා වෙ පුච්ඡන්තරායිකා.

30. එකතො උපසම්පන්නා භික්ඛුසංඝෙ තථා පුන
ඡායා උතු දිවසඤ්ච සංගීති තයො නිස්සයෙ

31. අට්ඨ අකරණීයානි කාලං සබ්බත්ථ අට්ඨධා
න පවාරෙන්ති භික්ඛුනියො භික්ඛුසංඝං තථෙව ච.

17. තිරච්ඡාන-යන මොවුන්ට උච්චැන් කිරීම ද, හරිතකී, නමතක දැරීම, නීල, පීත, ලෝහිත, මඤ්ජෙට්ඨ, කණ්හ චීවර ද,

18. මහාරඞ්ග, මහානාම, අච්ඡින්න, දීඝ, පුප්ඵ, ඵල කඤ්චුක තිරීටක යන සිවුරු දැරීම ද කළහ.

19. භික්ඛුනී, සික්ඛමානා, සාමණේරා යන අයගේ අභාවයෙහි පිරිකර පවරනු ලැබූ කල්හි භික්ෂුණී හිමිකාරිය වේ.

20. භික්ෂු, සාමණේර, උපාසක උපාසිකා සහ වෙනත් අයගේ පිරිකර පවරනු ලැබූ කල්හි භික්ෂූහු හිමියෝ වෙත්.

21. පුරාණමල්ලී, ගර්භය, පාත්‍රමූලය, පුරුෂබ්‍යඤ්ජනය, ආමිසය, අධික ආමිසය, ඉතා අධික ආමිසය, සන්නිධිකත ආමිසය ද,

22. යට කියන ලද පරිදි භික්ෂූන්ට යම්සේ ද භික්ෂුණීන්ට ද එසේම කරන්නේ ය. සෙනාසනය ද, උතුනී ද, වස්ත්‍ර ලෙයින් තැවරීම ද,

23. හුය සිදීම ද, සබ්බකාල ද, අනිමිත්තාදිය ද දක්නා ලැබෙත්, නිමිත්තා, ලෝහිතා. එසේ ම ධුවලෝහිතා ද,

24. ධුවචොළා, පගඝරිණී, සිඛරිණී, ඉත්ථිපණ්ඩකා, වෙපුරිසී, සම්භින්නා, උභතොබ්‍යඤ්ජනා ද යි,

25. අනිමිත්තා ආදිකොට උභතොබ්‍යඤ්ජනකා තෙක් ඇති මෙය පෙය්‍යාල වශයෙන් යට කියන ලදී. කුෂ්ට ය, ගණ්ඩ ය, කිලාසී ය,

26. සොස ය, අපමාර ය, මානුසී ය, ඉත්ථී ය, භුජිස්සා ය, අණනා ය, න රාජභටී ය, අනුඤ්ඤාතා ය, වීසතිවස්සා ය,

27. පරිපුණ්ණ ය, කිංනාමා ය, පවත්තිනී, කිං නාමා ය යන සුවිසි අන්තරායික ධර්මයන් විමසා උපසම්පද කිරීම වේ.

28. අනුශාසනා නො කරන ලද්දහු සභාමැද ගොළුගැසී සිටිත්, උපජ්ඣායගාහන, සඞ්ඝාටි, උත්තරාසඞ්ග, අන්තර-වාසක,

29. සංකච්චිකා, උදකසාටිකා ද කියා දී යවන්නේ ය. බාලා ය, අසම්මතා ය, එකතොගමනය, අන්තරායිකධර්ම පිළිවිසීම ය.

30. එකතො උපසම්පන්නා ය, එසේම භික්ෂුසඞ්ඝයා කෙරෙහි උපසපන් වීම ය, ඡායා, උතු, දිවස, සංගීති, නිස්සය තුන,

31. අකරණීය අට, (යන මෙවා කියාදීම ද,) කාලය ඉක්මවීම, හැමතැන අටනම බැගින් හිඳීම, භික්ෂුණීන් නො පැවරීම, භික්ෂූන් නො පැවරීම,

32. කොලාහලං පුරෙභත්තං විකාලෙ ච කොලාහලං
උපොසථං පවාරණං සවචනීයානුවාදනං.

33. ඔකාසං චොදෙ සාරෙන්ති පටික්ඛිත්තං මහෙසිනා
තථෙව භික්ඛු භික්ඛුනී අනුඤ්ඤාතං මහෙසිනා.

34. යානං ගිලානයුත්තඤ්ච යානුගසාතඩ්ඪකාසිකා
භික්ඛු සික්ඛා සාමණෙරා සාමණෙරී ච බාලකා.

35. අරඤ්ඤෙ උපාසකෙන උද්දෙසිතො උපස්සයං
න සම්මන්ති නවකම්මං නිසින්නගබ්භා එකිකා.

36. සාගාරඤ්ච ගරුධම්මං පච්චක්ඛාය ච සඩ්ඝාමී
අභිවාදන කෙසා ච නඛා වණකම්මනා.

37. පල්ලඞ්කෙන ගිලානා ච වච්චං චුණ්ණෙන වාසිතං
ජන්තාඝරෙ පටිසොතෙ අතිත්ථෙ පුරිසෙන ච.

38. මහාගොතමී ආයාචි ආනන්දො චාපි යොනිසො
පරිසා චතස්සො හොන්ති පබ්බජ්ජා[1] ජිනසාසනෙ.

39. සංවෙගජනනත්ථාය සද්ධම්මස්ස ච වුද්ධියා
ආතුරස්සෙව භෙසජ්ජං එවං බුද්ධෙන දෙසිතං

40. එවං විනීතා සද්ධම්මෙ මාතුගාමාපි ඉත්තරා[2]
තා යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙති.

---

1. පබ්බජං – මජසං.
2. ඉතරා – සි.

32. කොලාහල ය, පුරෙභත්ත ය, විකාලයෙහි කොලාහල ය, උපොසථ ය, පවාරණ ය, සවචනීය බව ය, අනුවාදන ය,

33. ඔකාස, චොදන, සාරන යන මෙවා මහර්ෂීන් වහන්සේ විසින් ප්‍රතික්ෂිප්ත ය, එසේ ම භික්ෂුණීන් විෂයෙහි භික්ෂූන්ට උන්වහන්සේ විසින් අනුඥාත ය.

34. යානය, ගිලානය, (ඉත්ථි-පුරිස) යුක්ත යානය, යානුග්ඝාත ය, අඩ්ඪකාසී ය, භික්ඛු-සික්ඛමානා-සාමණෙර-සාමණෙරී- බාල යන දූතයෝ ය,

35. අරඤ්ඤවාස ය, උපාසකයකු විසින් භාණ්ඩශාලාවක් දීම ය, උපස්සය ය, නො සෑහීම ය, නවකම්ම ය, යන මේවා ද නිසින්නගබ්භා, එකිකා,

36. සාගාර ය, ගරුධම්ම ය, පච්චක්ඛාන ය, සංක්‍රමණ ය, අභිවාදන ය, කෙස-නඛ ඡේදන ය, වණ පිළියම් ය,

37. පල්ලඞ්ක ය, ගිලාන ය, වච්ච ය, චුණ්ණ ය, වාසිත ය, ජන්තාඝර ය, පටිසොත ය, අභිඝාට ය, පුරිසාභිඝාට ය (යන මේ කරුණු, වලින් භික්ඛුනීඛන්ධකය වේ.)

38. මහාගොතමී ජිනසසුනෙහි පැවිද්ද යැදූ. අනඳ තෙරුන් වහන්සේ ද නුවණින් යැදී ය (සසුනෙහි) සිවු පිරිසක් වෙත්.

39. සංවෙග ඉපදවීම පිණිස ද සද්ධර්මයාගේ වැඩීම පිණිස ද ගිලනකුට බෙහෙතක් මෙන් බුදුන් විසින් මෙසේ දෙසන ලදී.

40. මෙසේ සද්ධර්මයෙහි විනීත වූ ඒ බොළඳ මාගම්හු පවා යම් තැනකට ගොස් ශොක නො කෙරෙත් ද ඒ නොමියන තැනට (නිවනට) යෙත්.

# 11. පඤ්චසතිකක්ඛන්ධකං

## සංගීති නිදානං

1. අථ ඛො ආයස්මා මහාකස්සපො භික්ඛූ ආමන්තෙසි: එකමිදහං ආවුසො සමයං පාවාය කුසිනාරං අද්ධාන මග්ගපටිපන්නො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. අථඛ්වාහං ආවුසො මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදිං. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ආජීවකො කුසිනාරාය[1] මන්දාරවපුප්ඵං ගහෙත්වා පාවං අද්ධානමග්ගපටිපන්නො හොති. අද්දසං ඛො අහං ආවුසො තං ආජීවකං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන තං ආජීවකං එතදවොචං: ''අපාවුසො අම්හාකං සත්ථාරං ජානාසී''ති? ''ආමාවුසො ජානාමි. අජ්ජ සත්තාහපරිනිබ්බුතො සමණො ගොතමො. තතො මෙ ඉදං මන්දාරවපුප්ඵං ගහිතන්''.

2. තත්‍රාවුසො යෙ තෙ භික්ඛූ අවීතරාගා, අප්පෙකච්චෙ බාහා පග්ගය්හ කන්දන්ති. ඡින්නපපාතං[2] පපතන්ති, ආවට්ටන්ති, විවට්ටන්ති, අතිඛිප්පං භගවා පරිනිබ්බුතො, අතිඛිප්පං සුගතො පරිනිබ්බුතො, අතිඛිප්පං චක්ඛුං[3] ලොකෙ අන්තරහිතන්ති. යෙ පන තෙ භික්ඛූ වීතරාගා තෙ සතා සම්පජානා අධිවාසෙන්ති ''අනිච්චා සංඛාරා තං කුතෙත්ථ ලබ්භා''ති. අථඛ්වාහං ආවුසො තෙ භික්ඛූ එතදවොචං: ''අලං ආවුසො මා සොචිත්ථ. මා පරිදෙවිත්ථ. නනෙවතං ආවුසො භගවතා පටිගච්චෙව[4] අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො? තං කුතෙත්ථ ආවුසො ලබ්භා යන්තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජතීති''.

3. තෙන ඛො පනාවුසො සමයෙන සුභද්දො නාම වුඩ්ඪපබ්බජිතො තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො ආවුසො සුභද්දො වුඩ්ඪපබ්බජිතො තෙ භික්ඛූ එතදවොච: ''අලං ආවුසො. මා සොචිත්ථ. මා පරිදෙවිත්ථ. සුමුත්තා මයං තෙන මහාසමණෙන. උපද්දුතා ච මයං හොම 'ඉදං වො කප්පති, ඉදං වො න කප්පතී'ති. ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම, යං න ඉච්ඡස්සාම න තං කරිස්සාමාති''.

---

1. කුසිනාරායං - සී.
2. ඡින්නපාතං - මජසං.
3. චක්ඛු - මජසං.
4. පටිකච්චෙව - මජසං.

# 11. පඤ්චසතිකක්ඛන්ධකය

## සංගීති නිදානය

1. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. ඇවැත්නි, මම එක් සමයෙක පන්සියයක් පමණ භික්ෂූන් ඇති මහත් භික්ෂු සඞ්ඝයා සමග පාවා නුවරින් කුසිනාරා නුවර කරා දීර්ඝ මාර්ගයට පිළිපන්නෙමි. ඇවැත්නි, ඉක්බිති මම මඟින් ඉවත් ව එක්තරා රුක් මුලෙක හුන්නෙමි. එසමයෙහි එක්තරා ආජීවකයෙක් මඳාරා මලක් ගෙන කුසිනාරා නුවර සිට පාවා නුවර කරා දීඝ මාර්ගයට පිළිපන්නේ ය. ඇවැත්නි, මම එන්නා වූ ඒ ආජීවකයා දුරදී ම දුටිමි. දැක ඒ ආජීවකයාට මෙය කීමි. ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ දන්නෙහි දැ යි. එසේ ය ඇවැත්නි, දනිමි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිරිනිවී අදට සත් දවසෙකි. මා විසින් මේ මඳාරාමල එතැනින් ගන්නා ලදැ යි.

2. ඇවැත්නි, එහි යම් ඒ භික්ෂු කෙනෙක් අවීතරාග වූහු ද ඔවුනතුරෙන් ඇතැමෙක් ''ඉතා ඉක්මනින් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑසේක. ඉතා ඉක්මනින් සුගතයන් වහන්සේ පිරිනිවන් පෑසේක. ඉතා ඉක්මනින් ලෝකයෙහි ඇස අතුරුදහන් වී යැ''යි (කියමින්) හිසෙහි අත් බැඳ හඬත්. සිඳින ලද්දක් (බිම) වැටෙන්නා සේ වැටෙත්. ඉදිරියට පෙරළෙත්, පසු පසට පෙරළෙත්. යම් භික්ෂු කෙනෙක් වීතරාග වූහු ද ඔවුහු සංස්කාරයෝ අනිත්‍යයහ. ඔවුන්ගේ නො බිඳ පැවැත්මක් කොයින් ලැබියහැකි දැ'යි (සලකා) සිහි ඇත්තාහු මනා නුවණින් යුක්ත වූවාහු ඉවසත්. ඇවැත්නි, අනතුරු ව මම ඒ භික්ෂූන්ට මෙය කීමි. ''ඇවැත්නි, කම් නැත. ශොක නො කරවු, නො වැළපෙවු, ඇවැත්නි, ප්‍රිය වූ මනාප වූ සියල්ලෙන් ම වෙනස් වීම වෙන් වීම, අනිත් ආකාරයෙකින් වීම වන්නේ ය යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් කැල ම ප්‍රකාශකරන ලද්දේ නො වේ ද? ඇවැත්නි, ඒ යමක් උපන්නේ ද, හටගත්තේ ද සඞ්ඛත වූයේ ද නැසෙනසුලු වේ ද එය ඒකාන්තයෙන් නො නැසේවා'යි යන මේ කරුණ කොයින් ලැබේ ද? මේ කරුණ විද්‍යමාන නො වේ යි.

3. ඇවැත්නි, එසමයෙහි සුභද්‍ර නම් මහලු ව පැවිදි වූවෙක් ඒ පිරිසෙහි හුන්නේ වෙයි. ඇවැත්නි, ඉක්බිති ඒ සුභද්‍ර නම් මහලු පැවිද්ද ඒ භික්ෂූන්ට මෙය කී ය. ''ඇවැත්නි, කම් නැත. ශොක නො කරවු. නො වැළපෙවු. අපි ඒ මහාශ්‍රමණයාගෙන් මොනොවට මිදුණෝ වෙමු. මෙය තොපට කැප ය, මෙය තොපට නො කැප ය යි කීමෙන් උපද්‍රවයට ද පත්කරන ලද්දෝ වෙමු. දැන් අපි යමක් කැමැති නම් එය කරන්නෙමු. යමක් නො කැමැත්තෙමු නම් එය නො කරන්නෙමු'යි.

හන්ද මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායාම පුරෙ අධම්මො දිප්පති ධම්මො පටිබාහියති. පුරෙ අවිනයො දිප්පති විනයො පටිබාහියති. පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති. ධම්මවාදිනො දුබ්බලා හොන්ති. පුරෙ අවිනයවාදිනො බලවන්තො හොන්ති. විනයවාදිනො දුබ්බලා හොන්තීති.

තෙන හි භන්තෙ ථෙරො භික්ඛූ උච්චිනතූති අථ ඛො ආයස්මා මහාකස්සපො එකෙනූනානි පඤ්ච අරහන්තසතානි[1] උච්චිනි. භික්ඛූ ආයස්මන්තං මහාකස්සපං එතදවොචුං: අයං භන්තෙ ආයස්මා ආනන්දො කිඤ්චාපි සෙඛො අභබ්බො ඡන්දා දොසා මොහා භයා අගතිං ගන්තුං. බහු ච අනෙන භගවතො සන්තිකෙ ධම්මො ච විනයො ච පරියත්තො. තෙන හි භන්තෙ ථෙරො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනතූති.

4. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනි. අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: කත්ථ නු ඛො මයං ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාමාති. අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: රාජගහං ඛො මහාගොචරං පහූතසෙනාසනං. යන්නූන මයං රාජගහෙ වස්සං වසන්තා[2] ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාම. න අඤ්ඤෙ භික්ඛූ රාජගහෙ වස්සං උපගච්ඡෙය්‍යුන්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ ආවුසො සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉමානි පඤ්ච භික්ඛුසතානි සම්මන්නෙය්‍ය රාජගහෙ වස්සං වසන්තා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිතුං. න අඤ්ඤෙහි භික්ඛූහි රාජගහෙ වස්සං වසිතබ්බන්ති. එසා ඤත්ති.

සුණාතු මෙ ආවුසො සඞ්ඝො. සඞ්ඝො ඉමානි පඤ්චභික්ඛුසතානි සම්මන්නති රාජගහෙ වස්සං වසන්තා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිතුං. න අඤ්ඤෙහි භික්ඛූහි රාජගහෙ වස්සං වසිතබ්බන්ති. යස්සායස්මතො ඛමති ඉමෙසං පඤ්චන්නං භික්ඛුසතානං සම්මුති රාජගහෙ වස්සං වසන්තානං ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිතුං. න අඤ්ඤෙහි භික්ඛූහි රාජගහෙ වස්සං වසිතබ්බන්ති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතානි සඞ්ඝෙන ඉමානි පඤ්චභික්ඛුසතානි රාජගහෙ වස්සං වසන්තා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිතුං. න අඤ්ඤෙහි භික්ඛූහි රාජගහෙ වස්සං වසිතබ්බන්ති. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

---

1. එකෙනූන පඤ්ච අරහන්තසතානි – මජ්ඣං.
2. වසන්තානි – මජ්ඣං.

එහෙයින් ඇවැත්නි, අපි අධර්මය බැබළීමටත් ධර්මය බැහැර කරනු ලැබීමටත් පෙර, අවිනය බැබළීමටත් විනය බැහැර කරනු ලැබීමටත් පෙර, අධර්මවාදීන් බලවත්වීමටත් ධර්මවාදීන් දුබලවීමටත් පෙර, අවිනයවාදීන් බලවත්වීමටත් විනයවාදීන් දුබලවීමටත් පෙර, ධර්මය ද විනය ද සඞ්ගායනා කරම්හ'යි. (මහාකාශ්‍යප තෙරුන් වහන්සේ වදළහ.)

වහන්ස, එසේ නම් තෙරුන් (ඔබ) වහන්සේ භික්ෂූන් තෝරා ගන්නාසේක්වා'යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එක් නමක් උනු වූ පන්සියයක් රහතුන් වහන්සේ තෝරාගත්සේක. භික්ෂූහු ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. "වහන්ස, මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ශෛක්ෂ්‍ය වූවත් ඡන්දයෙන් ද්වේෂයෙන් මෝහයෙන් භයින් අගතියට යැමට නො සුදුසු ය. මුන් වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බොහෝ ධර්මය ද විනය ද උගන්නා ලද්දේ ය. වහන්ස, එහෙයින් (ඔබ) තෙරුන් වහන්සේ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ ද තෝරාගන්නා සේක්වා'යි.

4. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද තෝරාගත්හ. ඉක්බිති "අපි කොතැන්හි දී ධර්මය ද විනය ද සඞ්ගායනා කරමෝ දැ යි ස්ථවිර භික්ෂූන්ට මේ අදහස විය. "රජගහනුවර වනාහි මහා ගොදුරුගම් ඇත්තේ ය. බොහෝ සෙනසුන් ඇත්තේ ය. අපි රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සඞ්ගායනා කරන්නෙමු නම් ඉතා මැනව. අනිත් භික්ෂු කෙනෙක් රජගහ නුවර වස් නො එළඹෙන්නාහු නම් යෙහෙකැ'යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සඞ්ඝයාට (මෙසේ දැන්වූහ.) "ඇවැත්නි, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සඞ්ගායනා කිරීමට සඞ්ඝයා මේ පන්සියයක් භික්ෂූන් සම්මත කරන්නේ ය. අනිත් භික්ෂූන් විසින් රජගහ නුවර වස් නො විසියයුතු'ය. මේ ඥප්ති යි.

ඇවැත්නි, සඞ්ඝයා මබස් අසාවා. රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සඞ්ගායනා කිරීමට සඞ්ඝයා මේ පන්සියයක් භික්ෂූන් සම්මත කරයි. අනිත් භික්ෂූන් විසින් රජගහ නුවර වස් නො විසියයුතු ය. යම් ආයුෂ්මත් කෙනකුහට 'අනිත් භික්ෂූන් විසින් රජගහ නුවර වස් නො විසියයුතු ය. මේ පන්සියයක් භික්ෂූන් රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සඞ්ගායනා කිරීමට සම්මත කිරීම' රුචි වේ නම් උන් වහන්සේ නිහඬ වන්නාහ. යම් කෙනකුට රුචි නො වේ නම් උන් වහන්සේ කියන්නාහ.

මේ පන්සියයක් භික්ෂූන් රජගහ නුවර වස් වසමින් ධර්මය ද විනය ද සඞ්ගායනා කිරීමට සඞ්ඝයා විසින් සම්මත කරන ලද්දේ ය. අනිත් භික්ෂූන් රජගහ නුවර වස් නො විසියයුතු ය. (මෙය) සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙය මෙසේ දරමි යි.

5. අථ ඛො ථෙරා භික්ඛූ රාජගහං අගමංසු ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිතුං. අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: භගවතා ඛො ආවුසො ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං වණ්ණිතං. හන්ද මයං ආවුසො පඨමං මාසං ඛණ්ඩඵුල්ලං පටිසඞ්ඛරොම. මජ්ඣිමං මාසං සන්නිපතිත්වා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිස්සාමාති. අථ ඛො ථෙරා භික්ඛූ පඨමං මාසං ඛණ්ඩඵුල්ලං පටිසඞ්ඛරිංසු. අථ ඛො ආයස්මා ආනන්දො ස්වෙ සන්නිපාතො, න ඛො මෙතං පතිරූපං යොහං සෙඛො[1] සමානො සන්නිපාතං ගච්ඡෙය්‍යන්ති බහුදෙව රත්තිං කායගතාය සතියා වීතිනාමෙත්වා රත්තියා පච්චූසසමයං නිපජ්ජිස්සාමීති කායං ආවජ්ජෙසි. අප්පත්තං ච සීසං බිම්බොහනං, භූමිතො ච පාදා මුත්තා, එතස්මිං අන්තරෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි. අථ ඛො ආයස්මා ආනන්දො අරහා සමානො සන්නිපාතං අගමාසි.

6. අථ ඛො ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ ආවුසො සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යන්ති. ආයස්මාපි උපාලි සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යන්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං උපාලිං එතදවොච: පඨමං ආවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති. වෙසාලියං භන්තෙති. කං ආරබ්භාති. සුදින්නං කලන්දපුත්තං ආරබ්භාති. කිස්මිං වත්ථුස්මින්ති. මෙථුනධම්මෙති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං උපාලිං පඨමස්ස පාරාජිකස්ස වත්ථුම්පි පුච්ඡි, නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි, පඤ්ඤත්තිම්පි පුච්ඡි, අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි, ආපත්තිම්පි පුච්ඡි, අනාපත්තිම්පි පුච්ඡි.

7. දුතියම්පනාවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති. රාජගහෙ භන්තෙති. කං ආරබ්භාති. ධනියං කුම්භකාරපුත්තං ආරබ්භාති. කිස්මිං වත්ථුස්මින්ති. අදින්නාදානෙති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං උපාලිං දුතියස්ස පාරාජිකස්ස වත්ථුම්පි පුච්ඡි, නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි, පඤ්ඤත්තිම්පි පුච්ඡි, අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි, ආපත්තිම්පි පුච්ඡි, අනාපත්තිම්පි පුච්ඡි.

1. සෙඛො - මජසං.

5. ඉක්බිති ස්ථවිර භික්ෂූහු ධර්මය ද විනය ද සඞ්ගායනා කිරීමට රජගහ නුවරට වැඩියාහ. ඉක්බිති ස්ථවිර භික්ෂූන්ට මේ අදහස විය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් බිඳුණු පැලුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලද්දේ ය. එහෙයින් ඇවැත්නි, අපි පළමු මාසය බිඳුණු පැලුණු තැන් පිළිසකර කරමු මධ්‍යම මාසයෙහි රැස්ව ධර්මය ද විනය ද සඞ්ගායනා කරන්නෙමු'යි. ඉක්බිති ස්ථවිර භික්ෂූහු පළමු මාසය බිඳුණු පැලුණු තැන් පිළිසකර කරවූහ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හෙට රැස්වීම ය. මම සෙඛ වූයේ ම (රහත් නො වූයේ) රැස්වීමට යන්නෙම් නම් එය මට නිසි නො වේ යී (සලකා) රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතාසිහියෙන් ගත කොට රාත්‍රිය පහන් වන වේලාවෙහි හෝනෙමි යි (සිතා) කය හැරවූහ. හිස ද කොට්ටයට නො පැමිණියේ ය. පාදයෝ ද පොළොවෙන් මිදුණාහ. මේ අතරෙහි සිත උපාදාන නො කොට ආශ්‍රවයන්ගෙන් මිදුණේ ය. ඉන්පසු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ රහත් වූවාහු ම රැස්වීමට වැඩිසේක.

6. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. ඇවැත්නි සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් විනය පිළි විසින්නෙමි යී. ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ ද සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. 'වහන්ස සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් විනය පුළුවුස්නාලද්දෙම් විසඳන්නෙමි'යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. ඇවැත උපාලි, පළමු පාරාජිකාව කොහි දී පනවනලද ද යි. වහන්ස, වෙසාලියෙහි දී යැ යි. කවරකු ඇරබැ දැයි. සුදින්න කලන්දපුත්‍ර ඇරබැ යයි. කිනම් වස්තුවෙක ද යි. මෛථුනධර්මයෙහි යයි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් උපාලිගෙන් ප්‍රථම පාරාජිකාවෙහි වස්තුව ද පිළිවිසූහ. නිදානය ද පිළිවිසූහ. පුද්ගලයා ද පිළිවිසූහ. ප්‍රඥප්තිය ද පිළිවිසූහ. අනුප්‍රඥප්තිය ද පිළිවිසූහ. ආපත්තිය ද පිළිවිසූහ. අනාපත්තිය ද පිළිවිසූහ.

7. ඇවත උපාලි, දෙවැනි පාරාජිකාව කොහි දී පනවන ලද දැයි. වහන්ස, රජගහනුවර දීය යි. කවරකු ඇරබ ද යි. ධනිය කුම්භකාර පුත්‍ර ඇරබ යැ යි. කවර වස්තුවක ද යි. නො දුන් දෙය ගැනීමෙහි යැ යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේගෙන් දෙවැනි පාරාජිකාවෙහි වස්තුව ද ඇසූහ. නිදානය ද ඇසූහ. පුද්ගලයා ද ඇසූහ. ප්‍රඥප්තිය ද ඇසූහ. අනුප්‍රඥප්තිය ද ඇසූහ. ආපත්තිය ද ඇසූහ. අනාපත්තිය ද ඇසූහ.

තතියම්පනාවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති. වෙසාලියං භන්තෙති. කං ආරබ්භාති. සම්බහුලෙ භික්ඛූ ආරබ්භාති. කිස්මිං වත්ථුස්මින්ති. මනුස්සවිග්ගහෙති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං උපාලිං තතියස්ස පාරාජිකස්ස වත්ථුම්පි පුච්ඡි, නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි, පඤ්ඤත්තිම්පි පුච්ඡි, අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි, ආපත්තිම්පි පුච්ඡි, අනාපත්තිම්පි පුච්ඡි.

චතුත්ථම්පනාවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති. වෙසාලියං භන්තෙති. කං ආරබ්භාති. වග්ගුමුදතීරියෙ භික්ඛූ ආරබ්භාති. කිස්මිං වත්ථුස්මින්ති. උත්තරිමනුස්සධම්මෙති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං උපාලිං චතුත්ථස්ස පාරාජිකස්ස වත්ථුම්පි පුච්ඡි, නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි, පඤ්ඤත්තිම්පි පුච්ඡි, අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි, ආපත්තිම්පි පුච්ඡි, අනාපත්තිම්පි පුච්ඡි, එතෙනෙව උපායෙන උභතො විභඞ්ගෙ[1] පුච්ඡි, පුට්ඨො පුට්ඨො ආයස්මා උපාලි විස්සජ්ජෙසි.

8. අථ ඛො ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ ආවුසො සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යන්ති. අථ ඛො ආයස්මා ආනන්දො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො[2] විස්සජ්ජෙය්‍යන්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං එතදවොච: බ්‍රහ්මජාලං ආවුසො ආනන්ද කත්ථ භාසිතන්ති. අන්තරා ච භන්තෙ රාජගහං අන්තරා ච නාලන්දං රාජාගාරකෙ අම්බලට්ඨිකායන්ති. කං ආරබ්භාති. සුප්පියඤ්ච පරිබ්බාජකං බ්‍රහ්මදත්තඤ්ච මාණවන්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං බ්‍රහ්මජාලස්ස නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි.

සාමඤ්ඤඵලං පනාවුසො ආනන්ද කත්ථ භාසිතන්ති. රාජගහෙ භන්තෙ ජීවකම්බවනෙති. කෙන සද්ධින්ති. අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන සද්ධින්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං සාමඤ්ඤඵලස්ස නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි, එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි, පුට්ඨො පුට්ඨො ආයස්මා ආනන්දො විස්සජ්ජෙසි.

1. විනයෙ - සී.
2. පුට්ඨො පුට්ඨො - මජසං.

ඇවත උපාලි, තුන්වැනි පාරාජිකාව කොහි දී පනවනලද ද යි. වහන්ස, වෙසාලියෙහි දී යැ යි. කවරකු ඇරබ ද යි. බොහෝ භික්ෂූන් ඇරබ යැ යි. කවර වස්තුවෙක ද යි. මනුෂ්‍ය විග්‍රහයෙහි යැ යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේගෙන් තුන්වැනි පාරාජිකාවෙහි වස්තුව ද ඇසූහ. නිදනය ද ඇසූහ. පුද්ගලයාද ඇසූහ. ප්‍රඥප්තිය ද ඇසූහ. අනුප්‍රඥප්තිය ද ඇසූහ. ආපත්තිය ද ඇසූහ. අනාපත්තිය ද ඇසූහ.

ඇවත උපාලි, සිවුවැනි පාරාජිකාව කොහි දී පනවනලද ද යි. වහන්ස, වෙසාලියෙහි දී යැ යි. කවරකු ඇරබ ද යි. වග්ගුමුදතීරිය භික්ෂූන් ඇරබ යැ යි. කවර වස්තුවෙක ද යි. උත්තරිමනුස්ස ධර්මයෙහි යැ යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන්ගෙන් සිවුවැනි පාරාජිකාවෙහි වස්තුව ද ඇසූහ. නිදනය ද ඇසූහ. පුද්ගලයා ද ඇසූහ. ප්‍රඥප්තිය ද ඇසූහ. අනුප්‍රඥප්තිය ද ඇසූහ. ආපත්තිය ද ඇසූහ. අනාපත්තිය ද ඇසූහ. මේ ක්‍රමයෙන් ම උභය විභඞ්ගය ඇසූහ. ඇසූ ඇසූ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ විසඳූහ.

8. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. ඇවැත්නි, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගෙන් ධර්මය පිළිවිසින්නෙමි යි ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් ධර්මය පිළිවිසින ලද්දෙම් විසඳන්නෙමි' යී. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. ඇවත, ආනන්දයෙනි, බ්‍රහ්මජාලය කොහිදී දෙසන ලද ද යි. වහන්ස, රාජගහ-නාළන්ද දෙනුවර අතර අම්බලට්ඨිකා නම් උයනෙහි රජු පිණිස කරවන ලද ගෙහි දී ය යි. කවරකු ඇරබ ද යි. සුප්පිය පරිබ්‍රාජකයා ද බ්‍රහ්මදත්ත මාණවකයා ද ඇරබයැ යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආනන්ද ස්ථවිරයන්ගෙන් බ්‍රහ්මජාලයෙහි නිදනය ද ඇසූහ. පුද්ගලයා ද ඇසූහ.

ඇවත ආනන්දයෙනි, සාමඤ්ඤඵල (සූත්‍රය) ය කොතැන දී දෙසනලද ද යි. වහන්ස, රජගහ නුවර ජීවකගේ අඹ වෙනෙහි දී යයි. කවරකු සමග ද යි. වේදෙහිපුත්‍ර වූ අජාතසත්තු රජු සමග යයි. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් සාමඤ්ඤඵල සූත්‍රයෙහි නිදනය ද ඇසූහ. පුද්ගලයා ද ඇසූහ. මේ ක්‍රමයෙන් ම නිකාය පස ම ඇසූහ. ඇසූ ඇසූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසඳූහ.

## ඛුද්දානුඛුද්දකසික්ඛාපදකථා

9. අථ ඛො ආයස්මා ආනන්දො ථෙරෙ භික්ඛූ එතදවොච: භගවා මං භන්තෙ පරිනිබ්බානකාලෙ එවමාහ: ආකඞ්ඛමානො ආනන්ද සඞ්ඝො මමච්චයෙන ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනෙය්‍යාති. පුච්ඡිත්ථ පන ත්වං ආවුසො ආනන්ද භගවන්තං කතමානි පන භන්තෙ ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. න ඛො අහං භන්තෙ භගවන්තං පුච්ඡිං, කතමානි පන භන්තෙ ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති.

එකච්චෙ ථෙරා එවමාහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. එකච්චෙ ථෙරා එවමාහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. එකච්චෙ ථෙරා එවමාහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ ඨපෙත්වා ද්වෙ අනියතෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. එකච්චෙ ථෙරා එවමාහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ ඨපෙත්වා ද්වෙ අනියතෙ ඨපෙත්වා තිංස නිස්සග්ගියෙ පාචිත්තියෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. එකච්චෙ ථෙරා එවමාහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ ඨපෙත්වා ද්වෙ අනියතෙ ඨපෙත්වා තිංස නිස්සග්ගියෙ පාචිත්තියෙ ඨපෙත්වා ද්වෙනවුති පාචිත්තියෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. එකච්චෙ ථෙරා එවමාහංසු: චත්තාරි පාරාජිකානි ඨපෙත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ ඨපෙත්වා ද්වෙ අනියතෙ ඨපෙත්වා තිංස නිස්සග්ගියෙ පාචිත්තියෙ ඨපෙත්වා ද්වෙනවුති පාචිත්තියෙ ඨපෙත්වා චත්තාරො පාටිදෙසනීයෙ ඨපෙත්වා අවසෙසානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති.

10 අථ ඛො ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ ආවුසො සඞ්ඝො. සන්තම්හාකං සික්ඛාපදානි ගිහිගතානි ගිහිනොපි ජානන්ති–ඉදං වො සමණානං සක්‍යපුත්තියානං කප්පති, ඉදං වො න කප්පතීති. සචෙ මයං ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනිස්සාම භවිස්සන්ති වත්තාරො: ධූමකාලිකං සමණෙන ගොතමෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං. යාවිමෙසං සත්ථා අට්ඨාසි තාවිමෙ සික්ඛාපදෙසු සික්ඛිංසු. යතො ඉමෙසං සත්ථා පරිනිබ්බුතො න දානිමෙ සික්ඛාපදෙසු සික්ඛන්තීති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො අප්පඤ්ඤත්තං න පඤ්ඤාපෙය්‍ය. පඤ්ඤත්තං න සමුච්ඡින්දෙය්‍ය. යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තෙය්‍ය. එසා ඤත්ති.

## බුද්ධානුබුද්දක සික්ඛාපද කථාව

9. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ස්ථවිර භික්ෂූන්ට මෙය කීහ. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන කාලයෙහි මට මෙසේ වදාළසේක. ආනන්දය, සඞ්ඝයා කැමැති වන්නේ නම් මා ඇවෑමෙන් බුද්ධානුබුද්දක ශික්ෂාපද සමූහනය කරන්නේ ය යි. ඇවත ආනන්දය, "වහන්ස, බුද්ධානුබුද්දක ශික්ෂාපද කවරේ ද"යි තෙපි භාග්‍යවතුන් වහන්සේ පිළිවිසූහු ද යි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගෙන් "වහන්ස, බුද්ධානුබුද්දක ශික්ෂාපද කවරහු ද"යි නො පිළිවිසීමි යි.

ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහු: සතර පරිජී තබා සෙස්සෝ බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙතැ'යි. ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහු: සතර පරිජී තබා තෙළෙස් සඟවෙසෙස් තබා සෙස්සෝ බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙතැ'යි. ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහු: සතර පරිජී තබා තෙළෙස් සඟවෙසෙස් තබා අනියත දෙක තබා සෙස්සෝ බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙතැ'යි. ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහු: සතර පරිජී තබා තෙළෙස් සඟවෙසෙස් තබා අනියත දෙක තබා තිස් නිසගි පචිති තබා සෙස්සෝ බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙතැ'යි. ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහු: සතර පරිජී තබා තෙළෙස් සඟවෙසෙස් තබා අනියත දෙක තබා තිස් නිසගි පචිති තබා දෙයානූ පචිති තබා සෙස්සෝ බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙතැ යි. ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහු: සතර පරිජී තබා තෙළෙස් සඟවෙසෙස් තබා අනියත දෙක තබා තිස් නිසගි පචිති තබා දෙයානූ පචිති තබා සිවු පාටිදෙසනීය තබා සෙස්සෝ බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙතැ යි.

10. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සඞ්ඝයාට මෙසේ දන්වූහ. ඇවැත්නි, සඞ්ඝයා මබස් අසාවා. ගිහියන් පිළිබඳ වූ ශික්ෂාපද අපට ඇත. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට මෙය කැපය, මෙය අකැප ය යි ගිහියෝ ද දනිති. ඉදින් අපි බුද්ධානුබුද්දක ශික්ෂාපද සමූහනය කරන්නෙමු නම් "ශ්‍රමණ ගෞතමයන් විසින් ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවනලද්දේ (උන්වහන්සේගේ) චිතකයෙහි දුම් ඇති තෙක් පමණි. යම්තාක් මොවුන්ගේ ශාස්තෲන් වහන්සේ සිටිසේක් ද ඒතාක් මොවුහු ශික්ෂාපදයන්හි හික්මුණෝ ය. යම් හෙයෙකින් මොවුන්ගේ ශාස්තෲන් වහන්සේ පිරිනිවිසේක් ද (එහෙයින්) දැන් මොවුහු ශික්ෂාපදයන්හි නො හික්මෙතැ යි කියන්නෝ වන්නාහ. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් සඞ්ඝයා නො පනවන ලද්දක් නො පනවන්නේ ය. පනවනලද්ද නොසිඳින්නේ ය. පනවන ලද ශික්ෂාපදයන්හි ඇති පරිද්දෙන් සමාදන් ව පවත්නේ ය. මේ ඥප්ති යි.

සුණාතු මෙ ආවුසො සඞ්ඝො. සන්තම්හාකං සික්ඛාපදානි ගිහිගතානි ගිහීනොපි ජානන්ති– ඉදං වො සමණානං සක්‍යපුත්තියානං කප්පති. ඉදං වො න කප්පතීති. සචෙ මයං ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනිස්සාම, භවිස්සන්ති වත්තාරො: ධූමකාලිකං සමණෙන ගොතමෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං. යාවිමෙසං සත්ථා අට්ඨාසි තාවිමෙ සික්ඛාපදෙසු සික්ඛිංසු. යතො ඉමෙසං සත්ථා පරිනිබ්බුතො න දානිමෙ සික්ඛාපදෙසු සික්ඛන්තීති. සඞ්ඝො අප්පඤ්ඤත්තං න පඤ්ඤපෙති. පඤ්ඤත්තං න සමුච්ඡින්දති. යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදය වත්තති. යස්සායස්මතො ඛමති අප්පඤ්ඤත්තස්ස අප්පඤ්ඤපනා[1] පඤ්ඤත්තස්ස අසමුච්ඡෙදො, යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදය වත්තනා, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සඞ්ඝො අප්පඤ්ඤත්තං න පඤ්ඤපෙති පඤ්ඤත්තං න සමුච්ඡින්දති, යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදය වත්තති. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

11. අථ ඛො ථෙරා භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං: ඉදං තෙ ආවුසො ආනන්ද දුක්කටං යං ත්වං භගවන්තං න පුච්ඡි- කතමානි පන භන්තෙ ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. දෙසෙහි තං දුක්කටන්ති.

අහං ඛො භන්තෙ අසතියා[2] භගවන්තං න පුච්ඡිං කතමානි පන භන්තෙ ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානීති. නාහන්තං දුක්කටං පස්සාමි. අපිචායස්මන්තානං සද්ධාය දෙසෙමි තං දුක්කටන්ති.

ඉදම්පි තෙ ආවුසො ආනන්ද දුක්කටං යං ත්වං භගවතො වස්සිකසාටිකං අක්කමිත්වා සිබ්බෙසි. දෙසෙහි තං දුක්කටන්ති.

නාහං ඛො භන්තෙ අගාරවෙන භගවතො වස්සිකසාටිකං අක්කමිත්වා සිබ්බෙසිං. නාහන්තං දුක්කටං පස්සාමි. අපිචායස්මන්තානං සද්ධාය දෙසෙමි තං දුක්කටන්ති.

ඉදම්පි තෙ ආවුසො ආනන්ද දුක්කටං යං ත්වං මාතුගාමෙහි භගවතො සරීරං පඨමං වන්දාපෙසි. තාසං රොදන්තීනං භගවතො සරීරං අස්සුකෙන මක්ඛිතං. දෙසෙහි තං දුක්කටන්ති.

---

1. අප්පඤ්ඤත්තස්ස අප්පඤ්ඤපනා – මජසං.
2. අස්සතියා – මජසං.

ඇවැත්නි, සඞ්ඝයා මබස් අසාවා. ගිහියන් පිළිබඳ වූ ශික්ෂාපද අපට ඇත. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට මෙය කැප ය, මෙය අකැප ය, යි ගිහියෝ ද දනිති. ඉදින් අපි ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සමූහනය කරන්නෙමු නම් ශ්‍රමණ ගෞතමයන් විසින් ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවනලද්දේ (උන් වහන්සේගේ) චිතකයෙහි දුම් ඇති තෙක් පමණි. යම්තාක් මොවුන්ගේ ශාස්තෲන් වහන්සේ සිටිසේක් ද ඒතාක් මොවුහු ශික්ෂාපදයන්හි හික්මුණෝ ය. යම්හෙයෙකින් මොවුන්ගේ ශාස්තෲන් වහන්සේ පිරිනිවිසේක් ද (එහෙයින්) දැන් මොවුහු ශික්ෂාපදයන්හි නො හික්මෙතැ යි කියන්නෝ වන්නාහ. සඞ්ඝයා නො පනවන ලද්දක් නො පනවයි. පනවනලද්ද නො සිඳියි. පනවනලද ශික්ෂාපදයන්හි ඇති පරිද්දෙන් සමාදන් ව පවතියි. යම් ආයුෂ්මත් කෙනකුහට නො පනවනලද්ද නො පැනවීම, පනවනලද්ද නො සිඳීම, පනවනලද ශික්ෂාපදයන්හි ඇති පරිද්දෙන් සමාදන් ව පැවැත්ම, රුචි වේ නම් උන්වහන්සේ නිහඬවන්නාහ, යම් කෙනකුහට රුචි නො වේ නම් උන්වහන්සේ කියන්නාහ.

සඞ්ඝයා නො පනවනලද්ද නො පනවයි. පනවනලද්ද නො සිඳියි. පනවනලද ශික්ෂාපදයන්හි ඇති පරිද්දෙන් සමාදන් ව පවතියි. සඞ්ඝයාට (මෙය) රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙය මෙසේ දරමි යි.

11. ඉක්බිති ස්ථවිර භික්ෂූහු ආනන්ද ආයුෂ්මත්හට මෙය කීහු: ඇවැත් ආනන්දයෙනි, යම්හෙයෙකින් තෙපි 'වහන්ස, ඛුද්දානුඛුද්දක ශික්ෂාපද කවරහු දැ යි භාග්‍යවතුන් වහන්සේ නො විචාළහු ද මෙය තොප වරදවා කරන ලද්දකි, ඒ වරදවා කරනලද්ද ප්‍රකාශ කරව යි.

වහන්ස, මම නොසිහියෙන් (යුතු වූයෙම්) වහන්ස, ඛුද්දානුඛුද්දක ශික්ෂාපද කවරහු දැ යි භාග්‍යවතුන් වහන්සේ නො විචාළෙමි. මම එය වරදවා කරනලද්දකැ යි නො දකිමි. එහෙත් ආයුෂ්මතුන් වහන්සේගේ බස ඇදහීමෙන් එය වරදවා කරන ලදැ යි ප්‍රකාශ කරමි.

ඇවැත්, ආනන්දයෙනි, යම් හෙයෙකින් තෙපි භාග්‍යවතුන් වහන්සේගේ වැසි සළුව පයින් මැඩ ගෙන මැසුවහු ද මෙය ද තොප වරදවා කරන ලද්දකි. ඒ වරදවා කරනලද්ද ප්‍රකාශ කරව යි.

වහන්ස, මම අගෞරවයෙන් භාග්‍යවතුන් වහන්සේගේ වැසි සළුව පයින් මැඩගෙන නො මැසූයෙමි. මම එය වරදවා කරන ලද්දකැ යි නොදකිමි. එහෙත් ආයුෂ්මතුන් වහන්සේගේ බස ඇදහීමෙන් එය වරදවා කරන ලදැ යි ප්‍රකාශ කරමි.

ඇවැත් ආනන්දයෙනි, යම් හෙයෙකින් තෙපි මාගමුන් ලවා භාග්‍යවතුන් වහන්සේගේ සිරුර පළමුව වැන්දවූහු ද හඬන්නා වූ ඔවුන්ගේ කඳුළින් භාග්‍යවතුන් වහන්සේගේ සිරුර ගැල්විණි ද මෙය ද තොපගේ දුෂ්කෘතයෙකි. ඒ දුෂ්කෘතය ප්‍රකාශ කරව යි.

අහං ඛො භන්තෙ මායිමා[1] විකාලෙ අහෙසුන්ති මාතුගාමෙහි භගවතො සරීරං පඨමං වන්දාපෙසිං. නාහං තං දුක්කටං පස්සාමි. අපිචායස්මන්තානං සද්ධාය දෙසෙමි තං දුක්කටන්ති.

ඉදම්පි තෙ ආවුසො ආනන්ද දුක්කටං යං ත්වං භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ න භගවන්තං යාචි–තිට්ඨතු භගවා කප්පං. තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. දෙසෙහි තං දුක්කටන්ති.

අහං ඛො භන්තෙ මාරෙන පරියුට්ඨිතචිත්තො න භගවන්තං යාචිං තිට්ඨතු භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. නාහං තං දුක්කටං පස්සාමි. අපිචායස්මන්තානං සද්ධාය දෙසෙමි තං දුක්කටන්ති.

ඉදම්පි තෙ ආවුසො ආනන්ද දුක්කටං–යං ත්වං මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පබ්බජ්ජං උස්සුක්කං අකාසි. දෙසෙහි තං දුක්කටන්ති.

අහං ඛො භන්තෙ අයං මහාපජාපති ගොතමී භගවතො මාතුච්ඡා ආපාදිකා පොසිකා ඛීරස්ස දායිකා භගවන්තං ජනෙත්තියා කාලඞ්කතාය[2] ථඤ්ඤං පායෙසීති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පබ්බජ්ජං උස්සුක්කං අකාසිං. නාහං තං දුක්කටං පස්සාමි. අපිචායස්මන්තානං සද්ධාය දෙසෙමි තං දුක්කටන්ති.

12. තෙන ඛො පන සමයෙන ආයස්මා පුරාණො දක්ඛිණාගිරිස්මිං චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. අථ ඛො ආයස්මා පුරාණො ථෙරෙහි භික්ඛූහි ධම්මෙ ච විනයෙ ච සංගීතෙ දක්ඛිණාගිරිස්මිං යථාභිරන්තං විහරිත්වා යෙන රාජගහං යෙන වෙළුවනං කලන්දකනිවාපො යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථෙරෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං පුරාණං ථෙරා භික්ඛූ එතදවොචුං: ථෙරෙහි ආවුසො පුරාණ, ධම්මො ච විනයො ච සංගීතො. උපෙහි තං සංගීතින්ති. සුසංගීතාවුසො ථෙරෙහි ධම්මො ච විනයො ච. අපි ච යථෙව මයා භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං තථෙවාහං ධාරෙස්සාමීති.

---

1. මායිමායං – මජසං
2. කාලං කතාය – මජසං.

වහන්ස, මම "මොවුහු විකාලයෙහි (හැසිරෙන්නෝ) නො වෙත්වා" යි මාගමුන් ලවා භාග්‍යවතුන් වහන්සේගේ සිරුර පළමුව වැන්දවීමි. මම එය දුෂ්කෘතයකැ'යි නො දකිමි. එහෙත් ආයුෂ්මතුන් වහන්සේගේ බස ඇදහීමෙන් එය දුෂ්කෘතයකැ'යි ප්‍රකාශ කරමි.

ඇවැත් ආනන්දයෙනි, යම් හෙයෙකින් තෙපි භාග්‍යවතුන් වහන්සේ විසින් ඔළාරික වූ නිමිති කරනුලබන කල්හි ඔළාරික වූ ආලොකය කරනුලබන කල්හි, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස භාග්‍යවතුන් වහන්සේ (ආයුෂ් කල්පයක්) වැඩ සිටින සේක්වා, සුගතයන් වහන්සේ කල්පයක් වැඩ සිටින සේක්වා යි භාග්‍යවතුන් වහන්සේ නො යැදූහු ද මෙය ද තොපගේ දුෂ්කෘතයෙකි. ඒ දුෂ්කෘතය ප්‍රකාශ කරව යි.

වහන්ස, මම වනාහි මාරයා විසින් හාත්පසින් මඩනා ලද සිත් ඇත්තෙම්, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස භාග්‍යවතුන් වහන්සේ කල්පයක් වැඩ සිටින සේක්වා, සුගතයන් වහන්සේ කල්පයක් වැඩ සිටින සේක්වා යි නො යැදීමි. මම එය දුෂ්කෘතයකැ'යි නො දකිමි. එහෙත් ආයුෂ්මතුන් වහන්සේගේ බස ඇදහීමෙන් එය දුෂ්කෘතයකැ'යි ප්‍රකාශ කරමි.

ඇවැත් ආනන්දයෙනි, යම්හෙයෙකින් තෙපි තථාගතයන් වහන්සේ විසින් මනාව ප්‍රකාශ කරනලද ධම්විනයෙහි (ශාසනයෙහි) මාගමගේ පැවිද්දට උත්සාහවත් කළහු ය. මෙය ද තොපගේ දුෂ්කෘතයෙකි. ඒ දුෂ්කෘතය ප්‍රකාශ කරවයි.

වහන්ස, මම වනාහි මේ මහාප්‍රජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේගේ මවගේ සොහොවුරි ය, (උන්වහන්සේ) හද වඩා ගත්තී ය, පොෂණය කළා ය, කිරි දුන්නී ය. මව කලුරිය කළ කල්හි කිරි පෙව්වාය යි සලකා තථාගතයන් වහන්සේ විසින් මනාව ප්‍රකාශ කරන ලද ධම්විනයෙහි මාගමගේ පැවිද්දට උත්සාහවත් කෙළෙමි. මම එය දුෂ්කෘතයෙකැ යි නො දකිමි. එහෙත් ආයුෂ්මතුන් වහන්සේලාගේ බස ඇදහීමෙන් එය දුෂ්කෘතයෙකැ යි ප්‍රකාශ කරමි යි.

12. එසමයෙහි ආයුෂ්මත් පුරාණ තෙරණුවෝ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සමූහයක් සමග දක්ෂිණාගිරියෙහි චාරිකාවෙහි හැසිරෙති. ඉක්බිති ස්ථවිර භික්ෂූන් විසින් ධම්ය ද විනය ද සඞ්ගායනා කළ කල්හි ආයුෂ්මත් පුරාණ තෙරණුවෝ දක්ෂිණාගිරියෙහි කැමැති තාක් කල් වැස රජගහ නුවර යම් තැනෙක ද, කලන්දක නිවාප නම් වූ වේළුවනය යම් තැනෙක ද, ස්ථවිර භික්ෂූහු යම් තැනෙක ද එතැනට එළැඹියහ. එළඹ ස්ථවිර භික්ෂූන් සමග පිළිසඳර කථා කොට එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නා වූ පුරාණ ආයුෂ්මතුන්ට ස්ථවිර භික්ෂූහු මෙසේ කීහ. ඇවැත් පුරාණයෙනි, ස්ථවිරවරුන් විසින් ධම්ය ද විනය ද සඞ්ගායනා කරනලද්දේ ය. ඒ සංගීතිය ට එළඹෙනු මැනවැ'යි. (පිළිගනු මැනවැයි) ඇවැත්නි, ස්ථවිරවරුන් විසින් ධම්ය ද විනය ද මොනොවට සංගායනා කරනලද්දේ ය. වැළිදු මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි යම්සේ අසන ලද ද යම්සේ පිළිගන්නා ලද ද එසෙයින් ම මම දරන්නෙමි'යි කීහ.

## බ්‍රහ්මදණ්ඩකථා

13. අථ ඛො ආයස්මා ආනන්දො ථෙරෙ භික්ඛූ එතදවොච: භගවා මං භන්තෙ පරිනිබ්බානකාලෙ එවමාහ: තෙනහානන්ද සඞ්ඝො මමච්චයෙන ඡන්නස්ස භික්ඛුනො බ්‍රහ්මදණ්ඩං ආණාපෙතූති. පුච්ඡි පන ත්වං ආවුසො ආනන්ද භගවන්තං කතමො ච පන භන්තෙ බ්‍රහ්මදණ්ඩොති. පුච්ඡිං ඛො අහං භන්තෙ භගවන්තං කතමො පන භන්තෙ බ්‍රහ්මදණ්ඩොති. ඡන්නො ආනන්ද භික්ඛු යං ඉච්ඡෙය්‍ය තං වදෙය්‍ය. භික්ඛූහි ඡන්නො භික්ඛු නෙව වත්තබ්බො. න ඔවදිතබ්බො. නානුසාසිතබ්බොති. තෙනහාවුසො ආනන්ද ත්වඤ්ඤෙව ඡන්නස්ස භික්ඛුනො බ්‍රහ්මදණ්ඩං ආණාපෙහීති.

කථාහං භන්තෙ ඡන්නස්ස භික්ඛුනො බ්‍රහ්මදණ්ඩං ආණාපෙමි? චණ්ඩො සො භික්ඛු ඵරුසොති. තෙනහාවුසො ආනන්ද බහුකෙහි භික්ඛූහි සද්ධිං ගච්ඡාහීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො ථෙරානං භික්ඛූනං පටිස්සුත්වා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි නාවාය කොසම්බිං උජ්ජවි[1]. නාවාය පච්චොරොහිත්වා රඤ්ඤො උදෙනස්ස උය්‍යානස්ස අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

14. තෙන ඛො පන සමයෙන රාජා උදෙනො උය්‍යානෙ පරිචාරෙති සද්ධිං ඔරොධෙන. අස්සොසි ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො අම්හාකං කිර ආචරියො අය්‍යො ආනන්දො උය්‍යානස්ස අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නොති. අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො රාජානං උදෙනං එතදවොච: අම්හාකං කිර දෙව ආචරියො අය්‍යො ආනන්දො උය්‍යානස්ස අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නො. ඉච්ඡාම මයං දෙව අය්‍යං ආනන්දං පස්සිතුන්ති. තෙන හි තුම්හෙ සමණං ආනන්දං පස්සථාති.

අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධං ආයස්මා ආනන්දො ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි. අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො ආයස්මතා ආනන්දෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො ආයස්මතො ආනන්දස්ස පඤ්චඋත්තරාසඞ්ගසතානි පාදසි. අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන රාජා උදෙනො තෙනුපසඞ්කමි.

1. නාවාය උජ්ජවනිකාය කොසම්බිං උජ්ජවි - මජ්ඣං.

## බ්‍රහ්මදණ්ඩ කථාව

13. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ස්ථවිර භික්ෂූන්ට මෙය කීහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණ කාලයෙහි මට මෙසේ වදාළසේක: ආනන්ද, එසේ වී නම් මා ඇවෑමෙන් සඞ්ඝයා ඡන්න භික්ෂුහට බ්‍රහ්මදණ්ඩය අණ කෙරේවා'යි. ඇවැත් ආනන්දයෙනි, "වහන්ස බ්‍රහ්මදණ්ඩය නම් කවරේ ද"යි තෙපි භාග්‍යවතුන් වහන්සේ විචාළහු ද යි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගෙන්, "වහන්ස, බ්‍රහමදණ්ඩය නම් කවරේ ද" යි විචාළෙමි. ආනන්ද, ඡන්න භික්ෂු තෙම යමක් කැමැති නම් එය කියන්නේ ය. භික්ෂූන් විසින් ඡන්න භික්ෂුතෙම නො ම බිණියයුතු ය. ඔවදන් නොකළයුතු ය. අනුශාසනය නො කළයුතු යි. ඇවත් ආනන්දයෙනි, එසේ වී නම් තෙපි ම ඡන්න භික්ෂුවට බ්‍රහමදණ්ඩය අණ කරව'යි.

වහන්ස, මම කෙසේ ඡන්න භික්ෂුවට බ්‍රහමදණ්ඩය අණ කෙරෙම් ද? ඒ මහණ චණ්ඩ ය, පරුෂ යයි. ඇවැත් ආනන්දයෙනි, එසේ වී නම් බොහෝ භික්ෂූන් සමග යව'යි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ස්ථවිර භික්ෂූන්ට එසේ ය වහන්සැ' යි පිළිවදන් දී පන්සියක් පමණ වූ මහත් භික්ෂුපිරිසක් සමග නැවෙන් කොසඹෑ නුවර වෙත උඩුගංබලා ගියහ. නැවෙන් බැස උදෙන රජුගේ උයනට නුදුරෙහි එක්තරා රුක්මුලෙක වැඩහුන්හ.

14. එසමයෙහි උදෙන රජ අන්තඃපුර ජනයා සමග උයනෙහි හැසිරෙයි. උදෙන රජුගේ අන්තඃපුර ජනයා "අපගේ ආචාර්ය්‍ය වූ ආනන්ද ආර්ය්‍යයන් වහන්සේ උයනට නුදුරෙහි එක්තරා රුක්මුලෙක හුන්සේකැ'යි ඇසී ය. ඉක්බිති උදෙන රජුගේ අන්තඃපුර ජනයා උදෙනරජහට මෙසේ කී ය: "දේවයන් වහන්ස, අපගේ ආචාර්ය්‍ය වූ ආනන්ද ආර්ය්‍යයන් වහන්සේ උයනට නුදුරෙහි එක්තරා රුක් මුලෙක හුන්සේක. දෙවයන් වහන්ස, අපි ආනන්ද ආර්ය්‍යයන් වහන්සේ දක්නට කැමැත්තම්හ"යි. එසේ නම් තෙපි ආනන්ද ශ්‍රමණයා දකිවු යි.

ඉක්බිති උදෙන රජුගේ අන්තඃපුර ජනයා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නා වූ උදෙන රජුගේ අන්තඃපුර ජනයාට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දහැම් කථාවෙන් මොනොවට කරුණු දැක්වූහ. සමාදන් කරවූහ. තෙදගැන්වූහ. සතුටු කරවූහ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් දහැම් කථාවෙන් මොනාවට කරුණු දක්වන ලද, සමාදන් කරවනලද, තෙදගන්වන ලද, සතුටු කරවන ලද උදෙන රජුගේ අන්තඃපුර ජනයා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට උතුරුසළු පන්සියයක් ප්‍රදනය කෙළේ ය. ඉක්බිති උදෙන රජුගේ අන්තඃපුර ජනයා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ භාෂිතයට සතුටු වී අනුමෝදන් වී හුනස්නෙන් නැඟී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැඳ පැදකුණු කොට උදෙනරජ යම් තැනක ද එතැනට එළඹියේ ය.

අද්දසා ඛො රාජා උදෙනො ඔරොධං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ඔරොධං එතදවොච: අපි නු තුම්හෙ සමණං ආනන්දං පස්සිත්ථාති. අපස්සිම්හා ඛො මයං දෙව අය්‍යං ආනන්දන්ති. අපි නු තුම්හෙ සමණස්ස ආනන්දස්ස කිඤ්චි අදත්ථාති. අදම්හා ඛො මයං දෙව අය්‍යස්ස ආනන්දස්ස පඤ්චඋත්තරාසඞ්ගසතානීති. රාජා උදෙනො උජ්ඣායති ඛීයති විපාචෙති: කථං හි නාම සමණො ආනන්දො තාව බහුං චීවරං පටිග්ගහෙස්සති. දුස්සවණිජ්ජං වා සමණො ආනන්දො කරිස්සති පග්ගාහිකසාලං වා පසාරෙස්සතීති.

15. අථ ඛො රාජා උදෙනො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා උදෙනො ආයස්මන්තං ආනන්දං එතදවොච: ආගමා නු ඛොධ[2] භො ආනන්ද අම්හාකං ඔරොධොති.

''ආගමා ඛො තෙධ[3] මහාරාජ ඔරොධොති''.

''අපි පන භොතො ආනන්දස්ස කිඤ්චි අදසීති''.

''අදසි ඛො මෙ මහාරාජ පඤ්චඋත්තරාසඞ්ගසතානී''ති.

''කිම්පන භවං ආනන්දො තාව බහුං චීවරං කරිස්සතී''ති.

යෙ පන තෙ මහාරාජ භික්ඛූ දුබ්බලචීවරා තෙහි සද්ධිං සංවිභජිස්සාමීති.

යානි ඛො පන භො ආනන්ද පොරාණකානි දුබ්බලචීවරානි තානි කථං කරිස්සථාති.

තානි මහාරාජ උත්තරත්ථරණං කරිස්සාමාති.

යානි පන භො ආනන්ද පොරාණකානි උත්තරත්ථරණානි තානි කථං කරිස්සථාති.

තානි මහාරාජ භිසිච්ඡවියො කරිස්සාමාති.

යානි පන[4] භො ආනන්ද පොරාණකා භිසිච්ඡවියො තා කථං කරිස්සථාති.

තා මහාරාජ භුම්මත්ථරණං කරිස්සාමාති.

යානි පන භො ආනන්ද පොරාණකානි භුම්මත්ථරණානි තානි කථං කරිස්සථාති.

තානි මහාරාජ පාදපුඤ්ඡනියො කරිස්සාමාති.

යා පන භො ආනන්ද පොරාණකා පාදපුඤ්ඡනියො තා කථං කරිස්සථාති.

---

1. සාරණීයං – මජ්ඣං.
2. ආගතානුඛොධ – මජ්ඣං.
3. ආගමාසි ඛො තෙ ඉධ – මජ්ඣං.
4. යා පන – මජ්ඣං.

උදෙන රජ එන්නා වූ අන්තඃපුර ජනයා දුරදී ම දුටුවේ ය. දැක අන්තඃපුර ජනයාට මෙය කී ය: "තෙපි ශ්‍රමණ ආනන්ද දුටු දැ"යි. "දෙවයිනි, අපි ආනන්ද ආයර්‍ය්‍යයන් දුටුම්හ යි". තෙපි ශ්‍රමණ ආනන්දට කිසිවක් දුන්නු දැ යි. දෙවයිනි, අපි ආනන්ද ආයර්‍ය්‍යයන් වහන්සේට උතුරුසළු පන්සියයක් දුනුම්හ'යි. කෙසේ නම් ශ්‍රමණ ආනන්ද තෙම එපමණ බොහෝ සිවුරු පිළිගත්තේ ද. ශ්‍රමණ ආනන්ද තෙම රෙදි වෙළඳාම හෝ කරන්නේ ද, රෙදි වෙළඳ හලක් හෝ විවෘත කරන්නේ ද යි. උදෙනරජ එය ලමු කොට සිතයි. නුගුණ කියයි. දෙස් පතුරුවයි.

15. ඉක්බිති උදෙන රජ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් උදෙනරජ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට "භවත් ආනන්දයෙනි, අපගේ අන්තඃපුර ජනයා මෙහි ආයේ දැ"යි මෙය කී ය.

මහරජ තොපගේ අන්තඃපුර ජනයා මෙහි ආයේ යැ'යි.

භවත් ආනන්දහට කිසිවක් දුන්නේ දැ'යි.

මහරජ මට උතුරුසළු පන්සියක් දුන්නේ යැ'යි,

භවත් ආනන්ද තෙම එපමණ බොහෝ සිවුරු කුමක් කරන්නේ දැ'යි.

මහරජ, යම් භික්ෂු කෙනෙක් දුබල සිවුරු ඇත්තාහු ද ඔවුන් සමග බෙදගන්නෙමි'යි.

භවත් ආනන්දයෙනි, යම් පැරණි දුබල සිවුරු වෙත් ද ඒවා කෙසේ කරන්නහු දැ'යි.

මහරජ, ඒවා ඇතිරිලි කරන්නෙමු'යි.

භවත් ආනන්දයෙනි, යම් පැරණි ඇතිරිලි වෙත් ද ඒවා කෙසේ කරන්නහු දැ'යි.

මහරජ, ඒවා බිසිඋර (බිසිවලට දමන උර) කරන්නෙමු'යි.

භවත් ආනන්දයෙනි, යම් පැරණි බිසිඋර වෙත් ද ඒවා කෙසේ කරන්නහු දැ'යි.

මහරජ, ඒවා බුමුතුරුණු කරන්නෙමු'යි.

භවත් ආනන්දයෙනි, යම් පැරණි බුමුතුරුණු වෙත් ද ඒවා කෙසේ කරන්නහු දැ'යි.

මහරජ ඒවා පාපිසි කරන්නෙමු'යි.

භවත් ආනන්දයෙනි, යම් පැරණි පාපිසි වෙත් ද, ඒවා කෙසේ කරන්නහු දැ'යි.

තා මහාරාජ රජොහරණං කරිස්සාමාති.

යානි පන භො ආනන්ද පොරාණකානි රජොහරණානි තානි කථං කරිස්සථාති.

තානි මහාරාජ කොට්ටෙත්වා චික්ඛල්ලෙන මද්දිත්වා පරිභණ්ඩං ලිම්පිස්සාමාති.

අථ ඛො රාජා උදෙනො සබ්බෙවිමෙ සමණා සක්‍යපුත්තියා යොනිසො උපනෙන්ති. න කුලවං[1] ගමෙන්තීති ආයස්මතො ආනන්දස්ස අඤ්ඤානිපි පඤ්ච දුස්සසතානි පාදසි. අයං චරහි ආයස්මතො ආනන්දස්ස පඨමං චීවරභික්ඛා උප්පජ්ජි චීවරසහස්සං.

16. අථ ඛො ආයස්මා ආනන්දො යෙන ඝොසිතාරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ආයස්මා ඡන්නො යෙන ආයස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ඡන්නං ආයස්මා ආනන්දො එතදවොච: සඞ්ඝෙන තෙ ආවුසො ඡන්න බ්‍රහ්මදණ්ඩො ආණත්තොති.[2] කතමො පන භන්තෙ ආනන්ද බ්‍රහ්මදණ්ඩොති.[3]

ත්වං ආවුසො ඡන්න භික්ඛූ[4] යං ඉච්ඡෙය්‍යාසි තං වදෙය්‍යාසි. භික්ඛූහි ත්වං නෙව වත්තබ්බො න ඔවදිතබ්බො නානුසාසිතබ්බොති. නන්වාහං භන්තෙ ආනන්ද හතො එත්තාවතා යතොහං භික්ඛූහි නෙව වත්තබ්බො න ඔවදිතබ්බො නානුසාසිතබ්බොති- තත්ථෙව මුච්ඡිතො පපති.[5]

17. අථ ඛො ආයස්මා ඡන්නො බ්‍රහ්මදණ්ඩෙන අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා ඡන්නො අරහතං අහොසි.

---

1. කුලාවං - ස.
2. ආණාපිතොති - මජසං.
3. බ්‍රහ්මදණ්ඩො ආණාපිතොති - මජසං.
4. භික්ඛූනං - මජසං.
5. පපතො - මජසං.

මහරජ, ඒවා රජස් හරණ කඩ කරන්නෙමු'යි.

භවත් ආනන්දයෙනි, යම් පැරණි රජස් හරණ කඩ වෙත් ද ඒවා කෙසේ කරන්නහු දැ යි.

මහරජ, ඒවා කොටා මැටි සමග අනා පිරිබඩ ආලෙප කරන්නෙමු'යි.

ඉක්බිති උදෙන රජ ''මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ සියල්ල ම නුවණින් යොදවත්, ගබඩාවට නො යවතැ යි (සලකා) ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට අනිත් වස්ත්‍රපන්සියක් ද ප්‍රදානය කෙළේ ය. මේ වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට සිවුරු දහසෙක් වූ පළමු චීවර භික්ෂාව උපන.

16. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඝොෂිතාරාමය යම් තැනෙක ද එතැනට එළඹීසේක. එළඹ පැනවූ අස්නෙහි හුන්සේක. ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශකළ සේක. ''ඇවත් ඡන්නයෙනි, සඞ්ඝයා විසින් තොපට බ්‍රහ්මදණ්ඩය පණවන ලදැ'යි. වහන්ස ආනන්දයෙනි, බ්‍රහ්මදණ්ඩය නම් කවරේ දැ'යි, ඇවැත් ඡන්නයෙනි තෙපි යමක් කැමැති නම් එය භික්ෂූන්ට කියන්නහු ය. (එහෙත්) භික්ෂූන් විසින් තෙපි නො බිණියයුත්තහු ය අවවාද නො කළයුත්තහු ය අනුසාසනා නො කළයුත්තහු ය යි.

වහන්ස ආනන්දයෙනි, යම් හෙයෙකින් මම භික්ෂූන් විසින් නො බිණිය යුත්තෙම් ද, අවවාද නො කළයුත්තෙම් ද, අනුසාසනා නො කළ-යුත්තෙම් ද, මෙපමණකින් මම නටුයේ නො වෙම් දැ'යි (කියා) මූර්ජිත ව එහි ම වැටුණේ ය.

17. ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ බ්‍රහ්මදණ්ඩයෙන් පෙළෙනු ලබන්නේ ලජ්ජා කරනුලබන්නේ පිළිකුල් කරනු ලබන්නේ එකලා වූයේ ගණයා කෙරෙන් වෙන් වූයේ නො පමා වූයේ කෙලෙස් තවන වැර ඇත්තේ කෙලෙස් තැවීමෙහි යොදන ලද සිත් ඇති ව වෙසෙන්නේ නො බෝ කලෙකින් ම යමක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම අනගාරික වූ ශාසනයෙහි පැවිදි වෙත් ද අනුත්තර වූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොට ඇති ඒ ධර්‍මය ඉහාත්මයෙහි දී ම තමා ම දැන සාක්ෂාත් කොට එයට පැමිණ විසූහ. ඉපදීම ක්‍ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. මේ භවයෙන් මතු අනිත් භවයෙක් නැතැ යි වෙසෙයින් ම දත්හ. ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ රහතුන් අතුරෙන් එක් නමක් වූහ.

අථ ඛො ආයස්මා ඡන්නො අරහත්තං පත්තො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: පටිප්පස්සම්භෙහි දානි මෙ භන්තෙ ආනන්ද බ්‍රහ්මදණ්ඩන්ති. යදග්ගෙන තයා ආවුසො ඡන්න අරහත්තං සච්ඡිකතං තදග්ගෙන තෙ බ්‍රහ්මදණ්ඩො පටිප්පස්සද්ධොති.

ඉමාය ඛො පන විනයසඞ්ගීතියා පඤ්ච භික්ඛුසතානි අනූනානි අනධිකානි අහෙසුං. තස්මා අයං විනයසඞ්ගීති පඤ්චසතිකාති වුච්චතීති.

## පඤ්චසතිකක්ඛන්ධකං එකාදසමං.[1]

### ඉමම්හි ඛන්ධකෙ වත්ථු තෙවීසති

**තස්සුද්දානං:-**

1. පරිනිබ්බුතම්හි සම්බුද්ධෙ ථෙරො කස්සපසව්හයො
ආමන්තයි භික්ඛුගණං සද්ධම්මමනුපාලකො.

2. පාවායද්ධානමග්ගම්හි සුභද්දෙන පවෙදිතං
සඞ්ගායිස්සාම සද්ධම්මං අධම්මො පුරෙ දිප්පති.

3. එකෙනූනපඤ්චසතං ආනන්දම්පි ච උච්චිනි
ධම්මවිනයසඞ්ගීතිං වසන්තො ගුහමුත්තමෙ.

4. උපාලිං විනයං පුච්ඡි සුත්තන්තානානන්දපණ්ඩිතං
පිටකං තීණි සඞ්ගීතිං අකංසු ජිනසාවකා.

5. බුද්ධානුබුද්ධකා නානා යථා පඤ්ඤත්ති වත්තනා
න පුච්ඡි අක්කමිත්වා ච වන්දාපෙසි න යාචි ච
පබ්බජ්ජං මාතුගාමස්ස සද්ධාය දුක්කටානිමෙ.

6. පුරාණො බ්‍රහ්මදණ්ඩං ච ඔරොධා උදෙනෙන සහ
තාව බහූ දුබ්බලං ච උත්තරත්ථරණා භිසි.

7. භුම්මත්ථරණා පුඤ්ඡනියො රජො චික්ඛල්ලමද්දනා
සහස්සචීවරුප්පජ්ජි පඨමානන්දසව්හයා.

8. තජ්ජිතො බ්‍රහ්මදණ්ඩෙන චතුසච්චං අපාපුණි
වසීභූතා පඤ්චසතා තස්මා පඤ්චසතී ඉති.

1. පඤ්චසතිකක්ඛන්ධකො එකාදසමො - මජසං.

ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ රහත්බවට පැමිණියේක් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය කීහ: වහන්ස, ආනන්දයෙනි දැන් මාගේ බ්‍රහ්මදණ්ඩය සන්සිඳුවනු මැනවැ'යි. ඇවැත් ඡන්නයෙනි, යම් කලෙක තොප විසින් රහත්බව සාක්ෂාත් කරනලද ද එකල තොපගේ බ්‍රහ්මදණ්ඩය සන්හිඳුණේ යි.

මේ විනය සංගීතියට අඩු වැඩි නො වූ පන්සියක් භික්ෂූහු වූහ. එහෙයින් මේ විනය සංගීතිය පඤ්චසතිකා යි කියනු ලැබේ යි.

## එකොළොස්වැනි පඤ්චසතිකක්ඛන්ධක යි.

### මේ ඛන්ධකයෙහි වස්තු තෙවිස්සෙකි.

එහි උද්දානය:

1. සම්බුදුන් පිරිනිවි කල්හි සද්ධර්මයෙහි අනුපාලක වූ කාශ්‍යප නම් තෙරුන් වහන්සේ භික්ෂු සමූහයා ඇමතූසේක.
2. පාවා නුවරට යන දීර්ඝ මාර්ගයෙහි සුභද්‍ර විසින් ප්‍රකාශ කරන ලද්දේ ය. අධර්මය බැබළීමට පෙර සද්ධර්මය සංගායනා කරම්හ. (යනු ද.)
3. එක් නමක් අඩු පන්සියක් ද ආනන්ද තෙරුන් ද තෝරා ගත්හ. උතුම් ගුහායෙහි වෙසෙමින් ධර්මවිනය සංගායනා කිරීම ද,
4. උපාලි තෙරුන් විනය ද පණ්ඩිත ආනන්ද තෙරුන් සූත්‍රාන්තය ද විචාළහ. ජිනශ්‍රාවකයන් වහන්සේලා තුන් පිටකය සංගායනා කළහ.
5. ඛුද්දානුඛුද්දක ශික්ෂාපද පිළිබඳ විවිධ මත, පැනවීම අනුව පැවැත් වීම, (ඛුද්දානුඛුද්දක කවරේ ද යි) නො ඇසීම, ඇක්මීම, වැන්දවීම, නො යැදීම, මාගම් පැවිද්ද යන මේවා (තෙරවරුන්ගේ වචනය) ඇදහීම නිසා දුෂ්කෘත යැ'යි කීම,
6. පුරාණ තෙර ය, බ්‍රහ්මදණ්ඩ ය, උදෙන රජු සහ අන්තඃපුර ජනයා ය, බොහෝ සිවුරු ය, දුබල සිවුරු ය, ඇතිරිලි ය, බිසි ය,
7. බුමුතුරුණු ය, පාපිස්නා ය, රජස් හරණ ය, මැටි සමග මැඩීම ය, අනද තෙරුන්ට පළමුවරට දහසක් සිවුරු ඇතිවීම ය.
8. බ්‍රහ්මදණ්ඩයෙන් තර්ජනය කිරීම ය. චතුසත්‍ය ය අවබෝධ කිරීම, පන්සියක් රහතුන් වූ හෙයින් පඤ්චසති යැ'යි ව්‍යවහාර කිරීම ද වේ.

# 12. සත්තසතිකක්ඛන්ධකං

## පඨම භාණවාරං

1. තෙන ඛො පන සමයෙන වස්සසතපරිනිබ්බුතෙ භගවති වෙසාලිකාවජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං දසවත්ථූනි දීපෙන්ති: කප්පති සිඞ්ගිලොණකප්පො. කප්පති ද්වඞ්ගුලකප්පො. කප්පති ගාමන්තරකප්පො. කප්පති ආවාසකප්පො. කප්පති අනුමතිකප්පො. කප්පති ආචිණ්ණකප්පො. කප්පති අමථිතකප්පො. කප්පති ජලොගිපාතුං,[1] කප්පති අදසකං නිසීදනං. කප්පති ජාතරූපරජතන්ති.

2. තෙන ඛො පන සමයෙන ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වජ්ජීසු චාරිකං චරමානො යෙන වෙසාලි තදවසරි. තත්‍ර සුදං ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ තදහුපොසථෙ කංසපාතිං උදකෙන පූරෙත්වා මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස ඨපෙත්වා ආගතාගතෙ වෙසාලිකෙ උපාසකෙ එවං වදෙන්ති:[2] දෙථාවුසො සඞ්ඝස්ස කහාපණම්පි අඩ්ඪම්පි පාදම්පි මාසකරූපම්පි. භවිස්සති සඞ්ඝස්ස පරික්ඛාරෙන කරණීයන්ති. එවං වුත්තෙ ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වෙසාලිකෙ උපාසකෙ එතදවොච: මාවුසො අදත්ථ සඞ්ඝස්ස කහාපණම්පි අඩ්ඪම්පි පාදම්පි මාසකරූපම්පි. න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං. න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. න පටිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා, අපෙතජාතරූපරජතාති.

එවම්පි ඛො වෙසාලිකා උපාසකා ආයස්මතා යසෙන කාකණ්ඩකපුත්තෙන වුච්චමානා අදංසු යෙව සඞ්ඝස්ස කහාපණම්පි අඩ්ඪම්පි පාදම්පි මාසකරූපම්පි. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ තස්සා රත්තියා අච්චයෙන තං හිරඤ්ඤං භික්ඛග්ගෙන පටිවිංසං[3] ඨපෙත්වා භාජෙසුං.

3. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ ආයස්මන්තං යසං කාකණ්ඩකපුත්තං එතදවොචුං: එසො තෙ ආවුසො යස හිරඤ්ඤස්ස පටිවිංසොති. නත්ථි මෙ ආවුසො හිරඤ්ඤස්ස පටිවිංසො නාහං හිරඤ්ඤං සාදියාමීති.

1. ජලොගිං පාතුං - මජසං.
2. වදන්ති - මජසං.
3. පටිවීසං - මජසං.

# 12. සත්තසතිකක්ඛන්ධකය

## පළමු බණවර

1. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී සියක් අවුරුදු ගත වූ කල්හි විශාලා වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු විශාලා නුවර දශවස්තුවක් ප්‍රකාශ කෙරෙත්. එනම් සිඞ්ගිලෝණකප්පය (අඟෙහි තබා ගත් ලුණු යාවකාලික වස්තු සමග වැළඳීම) කැප ය, ද්වංගුලකප්පය (ඉර හැරුණු පසු ඡායාව ඇඟුල් දෙක් ඉක්මෙන තෙක් දන් වැළඳීම) කැප ය, ගාමන්තර කප්පය (වළඳා පැවැරූ භික්ෂුව විසින් අන් ගමකට යමැ යි අනතිරික්ත භොජනය වැළඳීම) කැප ය, ආවාසකප්ප ය (එක් සීමාවක් ඇතුළත නොයෙක් ආවාසයන්හි වෙන වෙන ම පොහෝ පවුරුණු කිරීම) කැප ය, අනුමතිකප්පය (අත්පසට නො පැමිණි සීමාව ඇතුළත සිටි භික්ෂූන්ගේ ඡන්දය පසුව ගන්නෙමුයි කියා පොහෝ පවුරුණු ආදිය කිරීම) කැප ය, ආචිණ්ණකප්පය (ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් විසින් පුරුදු කරන ලද සියල්ල එසේ කිරීම) කැප ය, අමථිතකප්පය (භොජන පවාරණය කොට නො කළඹන ලද දී වැළඳීම) කැප ය, නො පැසුණු සුරා පානය කැප ය, දවලු නැති නිසීදනය කැප ය, රන්රිදී කැප ය යන මොහු යි.

2. එසමයෙහි කාකණ්ඩක පුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ වජ්ජි ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙන්නාහු විශාලා නුවර යම් තැනෙක ද එහි පැමිණියාහ. එහි කාකණ්ඩක පුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ විශාලා නුවර මහාවනයෙහි කූටාගාරශාලාවෙහි වෙසෙති. එකල්හි විශාලා නුවර වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු ඒ පොහෝ දිනයෙහි රන්බඳුනක් ජලයෙන් පුරවා භික්ෂුසඞ්ඝයා මැද තබා එහි පැමිණි පැමිණි විශාලා නුවර වැසි උපාසකයන්ට මෙසේ කියත්: ''ඇවත්නි, සඞ්ඝයාට කහවණුවක් හෝ අඩකහවණුවක් හෝ කහවණු පාදයක් හෝ රන්මස්සක් හෝ දෙවූ. සඞ්ඝයාට පිරිකරින් කටයුතු ඇතැ''යි. මෙසේ කී කල්හී කාකණ්ඩකපුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ විශාලා වැසි උපාසකයන්ට මෙය කීහ. ''ඇවැත්නි, සඞ්ඝයාට කහවණුවක් හෝ අඩ කහවණුවක් හෝ කහවණු පාදයක් හෝ රන්මස්සක් හෝ නො දෙවූ. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන් රිදී කැප නො වේ. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බහා තැබූ මිණි හා රන් ඇත්තාහු ය. රන්රිදීයෙන් වෙන් වූවාහු ය යි.

කාකණ්ඩක පුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ විසින් මෙසේ ද කියනු ලබන්නා වූ විශාලා වැසි උපාසකයෝ සඞ්ඝයාට කහවණු ද අඩකහවණු ද කහවණු පාද ද රන්මසු ද දුන්නාහු ම ය. ඉක්බිති විශාලා වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු ඒ රාත්‍රිය ඇවෑමෙන් ඒ රන් භික්ෂු වශයෙන් කොටස් තබා බෙදූහ.

3. ඉක්බිති විශාලා වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු කාකණ්ඩකපුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේට මෙය කීහූ: ''ඇවැත් යස ස්ථවිරයෙනි, මෙල තොපගේ රන් කොටස යැ'යි. ඇවත්නි, මගේ රන් කොටසෙක් නැත. මම රන් නො ඉවසමි යි.

අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ අයං ආවුසො යසො කාකණ්ඩකපුත්තො උපාසකෙ සද්ධෙ පසන්නෙ අක්කොසති, පරිභාසති, අප්පසාදං කරොති. හන්දස්ස මයං පටිසාරණීයකම්මං කරොමාති, තෙ තස්ස පටිසාරණීයකම්මං අකංසු. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වෙසාලිකෙ වජ්ජිපුත්තකෙ භික්ඛූ එතදවොච: භගවතා ආවුසො පඤ්ඤත්තං පටිසාරණීයකම්මකතස්ස භික්ඛුනො අනුදූතො දතබ්බොති. දෙථ මෙ ආවුසො අනුදූතං භික්ඛුන්ති. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ එකං භික්ඛුං සම්මන්නිත්වා ආයස්මතො යසස්ස කාකණ්ඩකපුත්තස්ස අනුදූතං අදංසු.

4. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො අනුදූතෙන භික්ඛුනා සද්ධිං වෙසාලිං පවිසිත්වා වෙසාලිකෙ උපාසකෙ එතදවොච: අහං කිරායස්මන්තෙ උපාසකෙ සද්ධෙ පසන්නෙ අක්කොසාමි, පරිභාසාමි, අප්පසාදං කරොමි. යොහං අධම්මං අධම්මොති වදමි. ධම්මං ධම්මොති වදමි. අවිනයං අවිනයොති වදමි. විනයං විනයොති වදමි.

එකමිදං ආවුසො සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො ආවුසො භගවා භික්ඛූ ආමන්තෙසි: චත්තාරො මෙ භික්ඛවෙ චන්දිමසූරියානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා චන්දිමසූරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. කතමෙ චත්තාරො? අබ්භං භික්ඛවෙ චන්දිමසූරියානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසූරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. මහිකා භික්ඛවෙ චන්දිමසූරියානං උපක්කිලෙසො -පෙ- ධූමරජො භික්ඛවෙ චන්දිමසූරියානං උපක්කිලෙසො -පෙ- රාහු භික්ඛවෙ අසුරින්දො චන්දිමසූරියානං උපක්කිලෙසො -පෙ- ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො චන්දිමසූරියානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා චන්දිමසූරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති.

එවමෙව ඛො භික්ඛවෙ චත්තාරොමෙ සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. කතමෙ චත්තාරො? සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සුරං පිවන්ති. මෙරයං පිවන්ති. සුරාමෙරයපානා අප්පටිවිරතා. අයං භික්ඛවෙ පඨමො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති. න භාසන්ති. න විරොචන්ති. පුන ච පරං භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා මෙථුනං ධම්මං පතිසෙවන්ති මෙථුනධම්මා අප්පටිවිරතා. අයං භික්ඛවෙ දුතියො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො

ඉක්බිති විශාලා වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු, ''ඇවැත්නි, කාකණ්ඩක පුත්‍ර වූ මේ යස (ස්ථවිර) තෙම සැදැහැති, පැහැදුණු, උපාසකයන්ට ආක්‍රොශ කරයි, පිරිහෙළා බෙණෙයි, නො පැහැදීම ඇති කරයි. එහෙයින් අපි මොහුට පටිසාරණීය කර්මය කරම්හ''යි කියා ඔව්හු උන්වහන්සේට පටිසාරණීය කර්මය කළහ. ඉක්බිති කාකණ්ඩකපුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ විශාලා වැසි වජ්ජිපුත්‍රක භික්ෂූන්ට මෙය කීහ. ''ඇවැත්නි, පටිසාරණීය කර්මය කරනලද භික්ෂුවට අනුදූතයෙක් දිය යුත්තේ යැ යි භාග්‍යවතුන් වහන්සේ විසින් පනවනලද්දේ ය, ඇවැත්නි මට අනුදූත වූ භික්ෂුවක් දෙව යි. ඉක්බිති විශාලා වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු එක් භික්ෂුවක් සම්මත කොට කාකණ්ඩකපුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන්ට අනුදූතයකු කොට දුන්හ.

4. ඉක්බිති කාකණ්ඩකපුත්‍ර වූ ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ අනුදූත භික්ෂුව සමග වෙසාලියට පිවිස විශාලා නුවර වැසි උපසකයන්ට මෙය කීහ. ''යම්බඳු වූ මම අධර්මය අධර්ම යැ යි කියම් ද, ධර්මය ධර්ම යැයි කියම් ද අවිනය අවිනයැ යි කියම් ද විනය විනයැ යි කියම් ද ඒ මම සැදැහැති පැහැදුණු ආයුෂ්මත් උපාසකයන්ට ආක්‍රොශ කෙරෙම් ල පිරිහෙළා බෙණෙම් ල, නො පැහැදීම ඇති කෙරෙම් ල.

ඇවැත්නි, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වෙසෙන සේක. ඇවැත්නි, එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, යම් උපක්ලෙශයන්ගෙන් කෙලෙසීමට පත් වූ සඳහිරු දෙදෙනා නො දිලෙත් ද පැහැ නො විහිදුවත් ද නො බබළත් ද සඳ හිරු දෙදෙනාට එබඳු උපක්ලෙශයෝ සතරෙක් වෙත්. කවර සතරෙක් ද යත්: මහණෙනි, යම් උපක්ලෙශයෙකින් කෙලෙසීමට පත්වූ සඳහිරු දෙදෙනා නො දිලෙත් ද, පැහැ නො විහිදුවත් ද, නො බබළත් ද වලාකුළ සඳහිරු දෙදෙනාට (එබඳු) උපක්ලෙශයෙකි, මහණෙනි,...මීදුම සඳහිරු දෙදෙනාට එබඳු උපක්ලෙශයෙකි. මහණෙනි,... දූමරජස (දුම් හා දූවිලි) සඳහිරු දෙදෙනාට එබඳු උපක්ලෙශයෙකි, මහණෙනි, ... රාහු අසුරිඳු සඳහිරු දෙදෙනාට එබඳු උපක්ලෙශයෙකි, මහණෙනි, යම් උපක්ලෙශයෙකින් කෙලෙසීමට පත් වූ සඳහිරු දෙදෙනා නො දිලෙත් ද, පැහැ නො විහිදුවත් ද, නො බබළත් ද මේ සතර සඳහිරු දෙදෙනාට උපක්ලෙශයෝ වෙත්.

මහණෙනි, මෙපරිද්දෙන් ම යම් උපක්ලෙශයෙකින් කෙලෙසීමට පත් වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහමණ කෙනෙක් නො දිලෙත් ද, පැහැ නො විහිදුවත් ද නො බබළත් ද, ශ්‍රමණ බ්‍රාහමණයන්ට එබඳු මේ උපකෙලශ සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහමණ කෙනෙක් සුරා බොති. මෙරය බොති. සුරාමෙරය පානයෙන් නො වැළකුණාහු වෙත්. මහණෙනි, යම් උපක්ලෙශයෙකින් කෙලෙසීමට පත්වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහමණ කෙනෙක් නො දිලෙත් ද, පැහැ නො විහිදුවත් ද, නො බබළත් ද, ශ්‍රමණ බ්‍රාහමණයන්ට මේ පළමු උපක්ලෙශ යයි. මහණෙනි, වැළි දු (අතිකක් කියමි.) ... ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් මෛථුන්දම් සෙවනය කෙරෙත්. මෛථුන් දමින් නො වැළකුණාහු වෙත්. මහණෙනි, ශ්‍රමණ බ්‍රාහමණයන්ට මේ දෙවැනි උපක්ලෙශය යි. මහණෙනි, වැළි දු අතිකක් (කියමි.)

-පෙ- පුන ච පරං භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා ජාතරූපරජතං සාදියන්ති ජාතරූපරජතපටිග්ගහණා අප්පටිවිරතා. අයං භික්ඛවෙ තතියො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො -පෙ- පුන ච පරං භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති මිච්ඡාජීවා අප්පටිවිරතා. අයං භික්ඛවෙ චතුත්ථො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසො -පෙ- ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සමණබ්‍රාහ්මණානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්තීති. ඉදමවොචාවුසො භගවා. ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා:

රාගදොසපරික්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා
අවිජ්ජා නිවුතා පොසා පියරූපාභිනන්දිනො,

සුරං පිවන්ති මෙරයං පටිසෙවන්ති මෙථුනං
රජතං ජාතරූපඤ්ච සාදියන්ති අවිද්දසූ.

මිච්ඡාජීවෙන ජීවන්ති එකෙ සමණබ්‍රාහ්මණා
එතෙ උපක්කිලෙසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා එකෙ සමණබ්‍රාහ්මණා
න තපන්ති න භාසන්ති න විරොචන්ති[1] අසුද්ධා සරජා මගා.

අන්ධකාරෙන ඔනද්ධා තණ්හාදසා සනෙත්තිකා
වඩ්ඪෙන්ති කටසිං ඝොරං ආදියන්ති පුනබ්භවන්ති.

එවංවාදී කිරාහං ආයස්මන්තෙ උපාසකෙ සද්ධෙ පසන්නෙ අක්කොසාමි, පරිභාසාමි, අප්පසාදං කරොමි. සොහං[2] අධම්මං අධම්මොති වදමි. ධම්මං ධම්මොති වදමි. අවිනයං අවිනයොති වදමි. විනයං විනයොති වදමි.

5. එකමිදං ආවුසො සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පනාවුසො සමයෙන[3] රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං. සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. පටිග්ගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතන්ති. තෙන ඛො පනාවුසො සමයෙන මණිචූළකො ගාමණි තස්සං පරිසායං නිසින්නො හොති.

1. න විරොචන්ති - මජසං. ඌනං.
2. සොහං - මජසං.
3. තෙන ඛො පන සමයෙන - මජසං.

... ඇතැම් ශ්‍රමණ බ්‍රාහමණ කෙනෙක් රන්රිදී ඉවසත්. රන්රිදී පිළිගැනීමෙන් නො වැළකුණාහු වෙත්. මහණෙනි, ශ්‍රමණබ්‍රාහමණයන්ට මේ තෙවැනි උපක්ලෙශ යයි. මහණෙනි, වැළි ද අනිකක් (කියමි.) ... ඇතැම් ශ්‍රමණබ්‍රාහමණ කෙනෙක් මිථ්‍යා ආජීවයෙන් ජීවිකාව කෙරෙත්. මිථ්‍යා ආජීවයෙන් නොවැළකුණාහු වෙත්. මහණෙනි, ශ්‍රමණ බ්‍රාහමණයන්ට මේ සිවුවැනි උපක්ලෙශය යි. මහණෙනි, සම් උපක්ලෙශයෙකින් කෙලෙසීමට පත්වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහමණ කෙනෙක් නො දිලෙත් ද, පැහැ නො විහිදුවත් ද, නො බබළත් ද, ශ්‍රමණබ්‍රාහමණයන්ට මේ (එබඳු) උපක්ලෙශ සතර වෙතැ'යි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. සුගතයන් වහන්සේ මෙය වදරා ඉක්බිති වැළිදු ශාස්තෘන් වහන්සේ මෙය වදළසේක.

ඇතැම් මහණබමුණෝ රාගයෙන් හා ද්වෙෂයෙන් හාත්පසින් කිලුටු වූවාහු අවිද්‍යාවෙන් වැසුණාහු ප්‍රියරූපයන්හි සතුටුවීම් වශයෙන් ඇලෙන පුරුෂයෝ වූවාහු,

හොඳුවණින් යුක්ත වූවාහු, සුරා ද මෙරය ද බොති. මෙවුන්දම් සෙවිති. රිදී හා රන් ද ඉවසත්.

ඇතැම් මහණබමුණෝ මිථ්‍යා ආජීවයෙන් ජීවත් වෙත්. ආදිත්‍යබන්ධු වූ බුදුන් විසින් මොහු උපක්ලෙශයෝ යි වදරන ලදහ.

අපිරිසුදු වූ (කෙලෙස්) රජස් සහිත වූ නොසුදුසු පැවතුම් ඇත්තා වූ ඇතැම් මහණබමුණෝ යම් උපක්ලෙශයන්ගෙන් කිලුටු වූවාහු නො දිලෙත් ද, පැහැ නො විහිදුවත් ද, නො බබළත් ද,

අවිද්‍යා නමැති අන්ධකාරයෙන් වැළඳගන්නා ලද්ද වූ තෘෂ්ණාවට දස වූ සංසාරයට පමුණුවන තෘෂ්ණාව සහිත වූ (ඔවුහු) පොළොව වඩත්, ඝොර වූ පුනර්භවය වැළඳගනිත්.

මෙසේ කියන්නා වූ මම ශ්‍රද්ධාවත් පැහැදුණු ආයුෂ්මත් උපාසකයන් ආක්‍රොශ කෙරෙම් ල, පිරිහෙළා බෙණෙම් ල, අප්‍රසාදය (ඇති) කෙරෙම් ල. ඒ මම අධර්මය අධර්ම ය යි කියමි. ධර්මය ධර්ම ය යි කියමි. අවිනය අවිනය යි කියමි. විනය විනය යි කියමි.

5. ඇවැත්නි, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි වූ කලන්දකනිවාප නම් වූ වෙළුවනයෙහි වෙසෙන සේක. ඇවැත්නි, එ සමයෙහි රජුගේ අන්තඃපුරයෙහි රජපිරිසෙහි රැස්ව හුන්නවුන්ගේ මේ අතුරු කථාවෙක් උපන්නේ ය. (එනම්) ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී පිළිගනිත් යනු යි. ඇවැත්නි, එසමයෙහි මණිචූළක ගාමණී ඒ පිරිසෙහි හුන්නේ වෙයි.

අථ ඛො ආවුසො මණිචූළකො ගාමණි තං පරිසං එතදවොච: මා අය්‍යා[1] එවං අවචුත්ථ. න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං. න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. න පටිග්ගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. අසක්ඛි ඛො ආවුසො මණිචූළකො ගාමණි තං පරිසං සඤ්ඤාපෙතුං.

6. අථ ඛො ආවුසො මණිචූළකො ගාමණි තං පරිසං සඤ්ඤාපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආවුසො මණිචූළකො ගාමණි භගවන්තං එතදවොච: ඉධ භන්තෙ රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා[2] කථා උදපාදි: කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං. සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. පටිග්ගණ්හන්ති[3] සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතන්ති. එවං වුත්තෙ අහං තං භන්තෙ පරිසං එතදවොචං: මා අය්‍යා එවං අවචුත්ථ. න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං. න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. න පටිග්ගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. අසක්ඛිං ඛො අහං භන්තෙ තං පරිසං සඤ්ඤාපෙතුං. කච්චාහං භන්තෙ එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව භගවතො හොමි. න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛාමි. ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොමි. න ච කොචි සහධම්මිකො වාදනුපාතො ගාරය්හං ඨානං ආගච්ඡතීති?

තග්ඝ ත්වං ගාමණි එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව මෙ අහොසි. න ච මං අභූතෙන අබ්භාචික්ඛසි. ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොසි. න ච කොචි සහධම්මිකො වාදනුපාතො ගාරය්හං ඨානං ආගච්ඡති. න හි ගාමණි කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං. න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. න පටිග්ගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. යස්ස ඛො ගාමණි ජාතරූපරජතං කප්පති, පඤ්චපි තස්ස කාමගුණා කප්පන්ති. යස්ස පඤ්ච කාමගුණා කප්පන්ති, එකංසෙනෙතං ගාමණි ධාරෙය්‍යාසි අස්සමණධම්මො අසක්‍යපුත්තියධම්මොති. අපිචාහං ගාමණි එවං වදමි: තිණං තිණත්ථිකෙන පරියෙසිතබ්බං. දරුං දරුත්ථිකෙන පරියෙසිතබ්බං. සකටං සකටත්ථිකෙන පරියෙසිතබ්බං. පුරිසො පුරිසත්ථිකෙන පරියෙසිතබ්බො. නත්වෙවාහං ගාමණි කෙනචි පරියායෙන ජාතරූපරජතං සාදිතබ්බං පරියෙසිතබ්බන්ති වදමීති. එවංවාදී කිරාහං ආයස්මන්තෙ උපාසකෙ සද්ධෙ පසන්නෙ අක්කොසාමි පරිභාසාමි අප්පසාදං කරොමි. සොහං අධම්මං අධම්මොති වදමි. ධම්මං ධම්මොති වදමි. අවිනයං අවිනයොති වදමි. විනයං විනයොති වදමි.

---

1. අය්‍යා - මජසං.
2. අයමන්තර - මජසං.
3. පරිගණ්හන්ති - මජසං.

ඇවැත්නි, ඉක්බිති මණිචූළක ගාමණී ඒ පිරිසට මෙය කී ය: "ආයුෂ්මයෙනි, මෙසේ නො කියවු. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයන්ට රන්රිදී නො කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ බහා තැබූ මිණි හා රන් ඇත්තාහ. රන් රිදීයෙන් වැළකුණාහ යි''. ඇවැත්නි, මණිචූළ ගාමණී ඒ පිරිසට (කාරණය) පිළිගන්වන්නට හැකි වූයේ ය.

6. ඇවැත්නි, ඉක්බිති මණිචූළක ගාමණී ඒ පිරිසට (කාරණය) පිළිගන්වා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය. ඇවැත්නි, එකත්පසෙක හුන් මණිචූළක ගාමණී භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස මෙහි රජුගේ අන්තඃපුරයෙහි රජපිරිසෙහි රැස්ව හුන්නවුන්ගේ මේ අතුරු කථාවෙක් උපන්නේ ය. (එනම්) ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයන්ට රන්රිදී කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී පිළිගනිත්. (යනුයි.) මෙසේ කී කල්හි වහන්ස, ඒ පිරිසට මම මෙය කීමි. ආයුෂ්මයෙනි, මෙසේ නො කියවු. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයන්ට රන්රිදී නො කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ බහා තැබූ මිණි හා රන් ඇත්තාහ. රන්රිදීයෙන් වැළකුණාහ යි. වහන්ස, මම ඒ පිරිසට (කරුණු) පිළිගැන්වීමට හැකි වීමි. වහන්ස, කිමෙක් ද? මෙසේ විවරණය කරන්නා වූ මම භාග්‍යවතුන් වහන්සේ දෙසූ ධර්මය කියන්නෙකුත් වෙම් ද? භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් දෙස් කියන්නෙකුත් නො වෙම් ද? ධර්මයට අනුකූල වූ ධර්මයක් ප්‍රකාශ කෙරෙම් ද? කිසියම් සහධාර්මික වූ වාදයට බැසගැන්මක් ගැරහිය යුතු තැනට නො පැමිණේ ද'යි.

ගාමණී, මෙසේ විවරණය කරන්නා වූ නුඹ එකාන්තයෙන් මා දෙසූ ධර්මය කියන්නෙක් ද වූවෙහි. මට අභූතයෙන් දෙෂාරොපණය ද නො කරන්නෙහි, ධර්මයට අනුකූල වූ ධර්මයක් ම ප්‍රකාශ කරන්නෙහි. කිසියම් සහධාර්මික වූ වාදයට බැසගැන්මක් ගැරහියයුතු තැනට ද නො පැමිණෙයි. ගාමණී, ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයන්ට රන්රිදී කැප නො වෙයි. ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍ය-පුත්‍රීයයෝ බහා තැබූ මිණි හා රන් ඇත්තාහ. රන් රිදීයෙන් වැළකුණාහ යි. ගාමණී, යමකුට රන්රිදී කැප වෙයි ද, ඔහට පඤ්චකාම ගුණයෝ ද කැප වෙත්. ගාමණී යමකුට පඤ්චකාමගුණයෝ කැප වෙත් ද, හේ මහණදම් නැත්තෙකි. ශාක්‍යපුත්‍රීය දහම් නැත්තෙකැ'යි මෙය එකාන්තයෙන් දරන්නෙහි. තව ද ගාමණී මම මෙසේ කියමි. තණ කැමැත්තකු විසින් තණ සෙවියයුතු. දව කැමැත්තකු විසින් දව සෙවියයුතු. ගැල් කැමැත්තකු විසින් ගැල් සෙවියයුතු. පුරුෂයන් කැමැත්තකු විසින් පුරුෂයා සෙවියයුතු. ගාමණී මම කිසිදු ක්‍රමයකින් රන්රිදී ඉවසියයුතු ය. සෙවියයුතු යැ'යි නො කියමි'යි මෙසේ කියන්නා වූ මම ශ්‍රද්ධාව ඇති පැහැදුණු ආයුෂ්මත් උපාසකයන් ආක්‍රොශ කෙරෙම් ල, පිරිහෙළා බෙණෙම් ල, අප්‍රසාදය කෙරෙම් ල. ඒ මම අධර්මය අධර්ම ය යි කියමි. ධර්මය ධර්ම යයි කියමි. අවිනය අවිනය යි කියමි. විනය විනය යි කියමි.

7. එකමිදං ආවුසො සමයං භගවා තත්ථෙව[1] රාජගහෙ ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ ජාතරූපරජතං පටික්ඛිපි සික්ඛාපදං ච පඤ්ඤපෙසි. එවංවාදී කිරාහං ආයස්මන්තෙ උපාසකෙ සද්ධෙ පසන්නෙ අක්කොසාමි, පරිභාසාමි, අප්පසාදං කරොමි යොහං අධම්මං අධම්මොති වදාමි. ධම්මං ධම්මොති වදාමි. අවිනයං අවිනයොති වදාමි. විනයං විනයොති වදාමීති. එවං වුත්තෙ වෙසාලිකා උපාසකා ආයස්මන්තං යසං කාකණ්ඩකපුත්තං එතදවොචුං: එකොව භන්තෙ අය්‍යො යසො කාකණ්ඩකපුත්තො සමණො සක්‍යපුත්තියො. සබ්බෙවිමෙ අස්සමණා අසක්‍යපුත්තියා. වසතු භන්තෙ අය්‍යො යසො කාකණ්ඩකපුත්තො වෙසාලියං. මයං අය්‍යස්ස යසස්ස කාකණ්ඩකපුත්තස්ස උස්සුක්කං කරිස්සාම චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වෙසාලිකෙ උපාසකෙ සඤ්ඤාපෙත්වා අනුදූතෙන භික්ඛුනා සද්ධිං ආරාමං අගමාසි.

8. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ අනුදූතං භික්ඛුං පුච්ඡිංසු: ඛමාපිතා ආවුසො යසෙන කාකණ්ඩකපුත්තෙන වෙසාලිකා උපාසකාති? උපාසකෙහි පාපිකා නො ආවුසො කතා.[2] එකොව යසො කාකණ්ඩකපුත්තො සමණො සක්‍යපුත්තියො කතො. සබ්බෙව මයං අස්සමණා අසක්‍යපුත්තියා කතාති.

අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ අයං ආවුසො යසො කාකණ්ඩකපුත්තො අම්හෙහි අසම්මතො ගිහීනං පකාසෙසි. හන්දස්ස මයං උක්ඛෙපනීයකම්මං කරොමාති. තෙ තස්ස උක්ඛෙපනීයකම්මං කත්තුකාමා සන්නිපතිංසු. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වෙහාසං අබ්භුග්ගන්ත්වා කොසම්බියං පච්චුට්ඨාසි. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො පාවෙය්‍යකානඤ්ච අවන්තිදක්ඛිණාපථකානඤ්ච භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: ආගච්ඡන්තු ආයස්මන්තා ඉමං අධිකරණං ආදියිස්සාම, පුරෙ අධම්මො දිප්පති ධම්මො පටිබාහීයති, අවිනයො දිප්පති විනයො පටිබාහීයති, පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති ධම්මවාදිනො දුබ්බලා හොන්ති. අවිනයවාදිනො බලවන්තො හොන්ති විනයවාදිනො දුබ්බලා හොන්තීති. තෙන ඛො පන සමයෙන ආයස්මා සම්භූතො සාණවාසී අහොගඞ්ගෙ පබ්බතෙ පටිවසති. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො යෙන අහොගඞ්ගො පබ්බතො යෙනායස්මා සම්භූතො සාණවාසී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සම්භූතං සාණවාසිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො ආයස්මන්තං සම්භූතං සාණවාසිං එතදවොච:

---

1. තත්ථෙව - මජසං. උනං.
2. පාපිකං නො ආවුසො කතං - මජසං.

7. ඇවැත්නි, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඒ වෙහෙරෙහි දී ම ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා ඇරබ රන්රිදී ප්‍රතික්ෂෙප කළසේක. ශික්ෂාපදයක් ද පැනවූසේක. මෙසේ කියන්නාවූ මම ශ්‍රද්ධාව ඇති පැහැදුණු ආයුෂ්මත් උපාසකයන් ආක්‍රොශ කෙරෙමි ල, පිරිහෙළා බෙණෙමි ල, අප්‍රසාදය කෙරෙමි ල, ඒ මම අධර්මය අධර්ම යයි කියමි, ධර්මය ධර්ම ය යි කියමි, අවිනය අවිනය යි කියමි, විනය විනය යි කියමි යි. මෙසේ කී කල්හි විශාලා වැසි උවසුවෝ කාකණ්ඩකපුත්‍ර නම් වූ යස ආයුෂ්මතුන් වහන්සේට මෙය කීහ. වහන්ස, කාකණ්ඩකපුත්‍ර වූ යස ආයාීයන් වහන්සේ එක ම ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන් වහන්සේ ය, මේ සියල්ලෝ ම ශ්‍රමණයෝ නො වෙති. ශාක්‍යපුත්‍රයෝ නො වෙති. වහන්ස, යස කාකණ්ඩකපුත්‍ර ආයාීයන් වහන්සේ වෙසාලියෙහි වසනසේක්වා, අපි යස කාකණ්ඩකපුත්‍ර ආයාීයන් වහන්සේට චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර සඳහා උත්සාහ කරන්නෙමු'යි. ඉක්බිති ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විශාලා වැසි උපාසකයන්ට කරුණු දන්වා අනුදූත භික්ෂුව සමග අරමට වැඩියහ.

8. ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු "ඇවැත්නි, කාකණ්ඩක පුත්‍ර යස විසින් විශාලාවැසි උවසුවෝ ක්ෂමාකරවන ලද්දහු"ද යි අනුදූත භික්ෂුව විචාළහ. ඇවැත්නි, උවසුවන් ලවා අපි පව්ටෝ කරන ලද්දම්හ. යස කාකණ්ඩකපුත්‍ර තෙම එක ම ශ්‍රමණ ශාක්‍ය-පුත්‍රයා කරන ලද්දේ ය. අපි සියල්ලෝ ම අශ්‍රමණයෝ අශාක්‍යපුත්‍රයෝ කරන ලද්දම්හ' යි.

ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු "ඇවැත්නි, මේ යස කාකණ්ඩකපුත්‍ර තෙම අප විසින් සම්මත නො කරන ලද්දේ ගිහියන්ට (භික්ෂූන්ගේ දෙස්) ප්‍රකාශ කෙළේ ය. එහෙයින් අපි මොහුට උක්ඛෙපනීය කර්මය කරම්හ'යි (කියා) ඔව්හු උන්වහන්සේට උක්ඛෙපනීය කර්මය කරනු කැමැති ව රැස්වූහ. ඉක්බිති ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අහසට නැගී කොසඹෑ නුවරෙහි පහළ වූසේක. ඉක්බිති ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පාවා නුවරවාසී වූ ද, අවන්ති දක්ෂිණාපථ වාසී වූ ද, භික්ෂූන් සමීපයට දූතයකු යැවූහ. "අධර්මය බැබළීමට ද ධර්මය බැහැර කරනු ලැබීමට ද අවිනය බැබළීමට ද විනය බැහැර කරනු ලැබීමට ද පෙර අධර්මවාදීන් බලවත් වීමට ද ධර්මවාදීන් දුබලවීමට ද, අවිනයවාදීන් බලවත්වීමට ද විනයවාදීන් දුබලවීමට ද පෙර ආයුෂ්මත්හු පැමිණෙත්වා, මේ අධිකරණය ඉදිරියට ගන්නෙමු (කියා)යි. එසමයෙහි සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේ අහොගඞ්ග පර්වතයෙහි වෙසෙනසේක. ඉක්බිති ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අහොගඞ්ග පර්වතය යම් තැනෙක ද සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹිසේක. එළඹ සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්සේක. එකත්පසෙක හුන් ආයුෂ්මත් යසකාකණ්ඩක පුත්‍ර ස්ථවිරයන් වහන්සේ සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේට මෙය කීහ.

ඉමෙ භන්තෙ වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං දසවත්ථූනි දීපෙන්ති–කප්පති සිඞ්ගිලොණකප්පො. කප්පති ද්වඞ්ගුලකප්පො. කප්පති ගාමන්තරකප්පො. කප්පති ආවාසකප්පො. කප්පති අනුමතිකප්පො. කප්පති ආචිණ්ණකප්පො. කප්පති අමථිතකප්පො. කප්පති ජලොගිපාතුං[1]. කප්පති අදසකං නිසීදනං. කප්පති ජාතරූපරජතන්ති. හන්ද මයං භන්තෙ ඉමං අධිකරණං ආදියිස්සාම. පුරෙ අධම්මො දිප්පති ධම්මො පටිබාහියති. අවිනයො දිප්පති විනයො පටිබාහියති. පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති ධම්මවාදිනො දුබ්බලා හොන්ති අවිනයවාදිනො බලවන්තො හොන්ති විනයවාදිනො දුබ්බලා හොන්තීති. එවමාවුසොති ඛො ආයස්මා සම්භූතො සාණවාසී ආයස්මතො යසස්ස කාකණ්ඩකපුත්තස්ස පච්චස්සොසි.

9. අථ ඛො සට්ඨිමත්තා පාවෙය්‍යකා භික්ඛූ සබ්බෙ ආරඤ්ඤිකා, සබ්බෙ පිණ්ඩපාතිකා, සබ්බෙ පංසුකූලිකා, සබ්බෙ තෙචීවරිකා, සබ්බෙව අරහන්තො අහොගඞ්ගෙ පබ්බතෙ සන්නිපතිංසු. අට්ඨාසීතිමත්තා අවන්ති දක්ඛිණාපථකා භික්ඛූ අප්පෙකච්චෙ ආරඤ්ඤිකා, අප්පෙකච්චෙ පිණ්ඩපාතිකා, අප්පෙකච්චෙ පංසුකූලිකා, අප්පෙකච්චෙ තෙචීවරිකා සබ්බෙව අරහන්තො අහොගඞ්ගෙ පබ්බතෙ සන්නිපතිංසු.

අථ ඛො ථෙරානං භික්ඛූනං මන්තයමානානං එතදහොසි: ඉදං ඛො අධිකරණං කක්ඛළඤ්ච වාළඤ්ච. කථං නු ඛො මයං පක්ඛං ලභෙය්‍යාම යෙන මයං ඉමස්මිං අධිකරණෙ බලවන්තතරා අස්සාමාති. තෙන ඛො පන සමයෙන ආයස්මා රෙවතො සොරෙය්‍යෙ පටිවසති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: අයං ඛො ආයස්මා රෙවතො සොරෙය්‍යෙ පටිවසති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො සචෙ මයං ආයස්මන්තං රෙවතං පක්ඛං ලභිස්සාම එවං මයං ඉමස්මිං අධිකරණෙ බලවන්තතරා අස්සාමාති.

අස්සොසි ඛො ආයස්මා රෙවතො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය ථෙරානං භික්ඛූනං මන්තයමානානං සුත්වානස්ස එතදහොසි: ඉදං ඛො අධිකරණං කක්ඛළඤ්ච වාළඤ්ච. න ඛො මෙතං පතිරූපං යොහං එවරූපෙ අධිකරණෙ ඔසක්කෙය්‍යං. ඉදානි ච පන තෙ භික්ඛූ ආගච්ඡිස්සන්ති. සොහං තෙහි ආකිණ්ණො න ඵාසුං[2] ගමිස්සාමි. යන්නූනාහං පටිගච්චෙව ගච්ඡෙය්‍යන්ති. අථ ඛො ආයස්මා රෙවතො සොරෙය්‍යා සඞ්කස්සං අගමාසි.

1. ජලොගිං පාතුං –, මජසං.
2. ඵාසු – මජසං.

"වහන්ස, විශාලාවැසි මේ වජ්ජිපුත්‍රක භික්ෂූහු විශාලාවෙහි දශවස්තුවක් දක්වත්. (එනම්) සිඞ්ගිලොණකප්පය කැප ය. ද්වඞ්ගුල කප්පය කැප ය, ගාමන්තරකප්පය කැප ය, ආවාසකප්පය කැප ය, අනුමතිකප්පය කැප ය, ආචිණ්ණකප්පය කැප ය, අමථිත කප්පය කැප ය, නො පැසුණු සුරා බොන්නට කැප ය, දහවලු නැති නිසීදනය කැප ය, රන්රිදී කැප ය (යනුයි). වහන්ස, අධර්මය බැබළීමට ද ධර්මය බැහැර කරනු ලැබීමට ද, අවිනය බැබළීමට ද, විනය බැහැර කරනු ලැබීමට ද පෙර අධර්මවාදීන් බලවත්වීමට ද, ධර්මවාදීන් දුබල වීමට ද, අවිනයවාදීන් බලවත්වීමට ද විනය වාදීන් දුබලවීමට ද පෙර අපි මේ අධිකරණය ගන්නෙමු' යී. ඇවැත්නි, එසේ යැ යි සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ.

9. ඉක්බිති සියල්ලෝ ම ආරණ්‍යක වූ සියල්ලෝ ම පිණ්ඩපාතික වූ සියල්ලෝ ම පංසුකූලික වූ සියල්ලෝ ම තෙචීවරික වූ සියල්ලෝ ම රහත් වූ පාවා නුවර වැසි සැටක් පමණ භික්ෂූහු අහොගඞ්ග පර්වතයෙහි රැස්වූහ. ඇතැමෙක් ආරණ්‍යක වූ ඇතැමෙක් පිණ්ඩපාතික වූ ඇතැමෙක් පංසුකූලික වූ ඇතැමෙක් තෙචීවරික වූ සියල්ලෝ ම රහත් වූ අවන්ති දක්ෂිණාපථවාසී වූ අටාසූවක් පමණ භික්ෂූහු අහොගඞ්ග පර්වතයෙහි රැස්වූහ.

ඉක්බිති මන්ත්‍රණය කරන ස්ථවිර භික්ෂූන්ට මේ අදහස විය: මේ අධිකරණය වනාහි කර්කශ ද චණ්ඩ ද වෙයි. යමක් හෙතු කොට ගෙන අපි මේ අධිකරණයෙහි අතිශයින් බලවත් වන්නෙමු ද එබඳු වූ පක්ෂයක් අපි කෙසේ නම් ලබන්නෙමු ද'යි. එසමයෙහි වනාහි බහුශ්‍රුත වූ අවබොධ කළ ආගම ඇති ධර්මධර වූ විනයධර වූ මාතෘකා (මාතෘකා ස්වරූප අභිධර්මය) ධර වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැත්තා වූ ලජ්ජී වූ වරදෙහි කුකුස් කරන්නා වූ ශික්ෂාකාමී වූ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ සොරෙය්‍ය නගරයෙහි වැඩවෙසෙති. ඉක්බිති ස්ථවිර භික්ෂූන්ට මේ අදහස විය: බහුශ්‍රුත වූ අවබොධ කළ ආගම ඇති ධර්මධර වූ විනයධර වූ මාතෘකා (මාතෘකාස්වරූප අභිධර්මය) ධර වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැත්තා වූ ලජ්ජී වූ වරදෙහි කුකුස් කරන්නා වූ ශික්ෂාකාමී වූ මේ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ සොරෙය්‍ය නගරයෙහි වැඩවෙසෙති. ඉදින් අපි ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ (අපට) පක්ෂ කොට ලබන්නෙමු නම් මෙසේ අපි මේ අධිකරණයෙහි අතිශයින් බලවත් වන්නෙමු යි.

මන්ත්‍රණය කරන ස්ථවිර භික්ෂූන්ගේ (කථාව) ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ මිනිස්බව ඉක්ම වූ විසුද්ධ වූ දිව්‍ය ශ්‍රොතයින් (දිවකනින්) ඇසූහ. අසා උන්වහන්සේට මේ අදහස විය. මේ අධිකරණය වනාහි කර්කශ ද චණ්ඩ ද වෙයි. යම්බඳු වූ මම මෙවැනි අධිකරණයෙහි (හැකියාව යටපත් කරන්නෙම්) පසු බසින්නෙම් නම් මෙය මට සුදුසු නො වෙයි. දැනුදු ඒ භික්ෂූහු එන්නාහු ය. ඒ මම ඒ භික්ෂූන් සමග ආකීර්ණ වූයෙම් (නම්) පහසුව යන්නට නො හැක්කෙමි. මම පෙරටුව ම යන්නෙම් නම් ඉතා යෙහෙකැ'යි. ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ සොරෙය්‍ය නුවරින් සඞ්කස්ස නුවරට වැඩියහ.

10. අථ ඛො ථෙරා භික්ඛූ සොරෙය්‍යං ගන්ත්වා පුච්ඡිංසු කහං ආයස්මා රෙවතොති. තෙ එවමාහංසු: එසායස්මා රෙවතො සඞ්කස්සං ගතොති. අථ ඛො ආයස්මා රෙවතො සඞ්කස්සා කණ්ණකුජ්ජං අගමාසි. අථ ඛො ථෙරා භික්ඛූ සඞ්කස්සං ගන්ත්වා පුච්ඡිංසු කහං ආයස්මා රෙවතොති. තෙ එවමාහංසු: එසායස්මා රෙවතො කණ්ණකුජ්ජං ගතොති. අථ ඛො ආයස්මා රෙවතො කණ්ණකුජ්ජා උදුම්බරං අගමාසි. අථ ඛො ථෙරා භික්ඛූ කණ්ණකුජ්ජං ගන්ත්වා පුච්ඡිංසු කහං ආයස්මා රෙවතොති. තෙ එවමාහංසු: එසායස්මා රෙවතො උදුම්බරං ගතොති. අථ ඛො ආයස්මා රෙවතො උදුම්බරා අග්ගළපුරං අගමාසි. අථ ඛො ථෙරා භික්ඛූ උදුම්බරං ගන්ත්වා පුච්ඡිංසු කහං ආයස්මා රෙවතොති. තෙ එවමාහංසු: එසායස්මා රෙවතො අග්ගළපුරං ගතොති. අථ ඛො ආයස්මා රෙවතො අග්ගළපුරා සහජාතිං අගමාසි. අථ ඛො ථෙරා භික්ඛූ අග්ගළපුරං ගන්ත්වා පුච්ඡිංසු කහං ආයස්මා රෙවතොති. තෙ එවමාහංසු: එසායස්මා රෙවතො සහජාතිං ගතොති. අථ ඛො ථෙරා භික්ඛූ ආයස්මන්තං රෙවතං සහජාතියා සම්භාවෙසුං.

11. අථ ඛො ආයස්මා සම්භූතො සාණවාසී ආයස්මන්තං යසං කාකණ්ඩකපුත්තං එතදවොච: අයං ආවුසො ආයස්මා රෙවතො බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො සචෙ මයං ආයස්මන්තං රෙවතං පඤ්හං පුච්ඡිස්සාම පටිබලො ආයස්මා රෙවතො එකෙනෙව පඤ්හෙන සකලම්පි රත්තිං වීතිනාමෙතුං. ඉදානි ච පනායස්මා රෙවතො අන්තෙවාසිකං සරභාණකං භික්ඛුං අජ්ඣෙසිස්සති. සො ත්වං තස්ස භික්ඛුනො සරභඤ්ඤපරියොසානෙ ආයස්මන්තං රෙවතං උපසඞ්කමිත්වා ඉමානි දසවත්ථූනි පුච්ඡෙය්‍යාසීති.

එවම්භන්තෙති ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො ආයස්මතො සම්භූතස්ස සාණවාසිස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා රෙවතො අන්තෙවාසිකං සරභාණකං භික්ඛුං අජ්ඣෙසි. අථ ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො තස්ස භික්ඛුනො සරභඤ්ඤපරියොසානෙ යෙනායස්මා රෙවතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං රෙවතං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා යසො කාකණ්ඩකපුත්තො ආයස්මන්තං රෙවතං එතදවොච:

12. 1. කප්පති භන්තෙ සිඞ්ගිලොණකප්පොති. කො සො ආවුසො සිඞ්ගිලොණකප්පොති. කප්පති භන්තෙ සිඞ්ගිනා ලොණං පරිහරිතුං, යත්ථ අලොණකං භවිස්සති–තත්ථ පරිභුඤ්ජිස්සාමීති. නාවුසො කප්පතීති.

10. ඉක්බිති ස්ථවිර භික්ෂූහු සොරෙය්‍ය නුවරට ගොස් ආයුෂ්මත් ''රෙවත තෙරුන් වහන්සේ කොහි ද යි ඇසූහ. තෙලෙ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ සඞ්කස්සයට වැඩියහ'යි ඔහු කීහ. ඉක්බිති ආයුෂ්මත් රෙවත තෙරුන් වහන්සේ සඞ්කස්සයෙන් කණ්ණකුජ්ජ නුවරට වැඩියහ. ඉක්බිති ස්ථවිර භික්ෂූහු සඞ්කස්ස නුවරට ගොස් ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ කොහි ද යි ඇසූහ. තෙලෙ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ කණ්ණකුජ්ජයට වැඩියහ යි ඔහු කීහ. ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ කණ්ණකුජ්ජ නුවරින් උදුම්බර නුවරට වැඩියහ. ඉක්බිති ස්ථවිර භික්ෂූහු කණ්ණකුජ්ජයට ගොස් ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ කොහි ද යි ඇසූහ. තෙලෙ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ උදුම්බර නුවරට වැඩිසේකැ'යි ඔහු කීහ. ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ උදුම්බර නුවරින් අග්ගළපුරයට වැඩියහ. ඉක්බිති ස්ථවිර භික්ෂූහු උදුම්බර නුවරට ගොස් ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ කොහි ද යි ඇසූහ. තෙලෙ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ අග්ගළපුරයට වැඩිසේකැ යි ඔහු කීහ. ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ අග්ගළ පුරයෙන් සහජාති පුරයට වැඩියහ. ඉක්බිති ස්ථවිර භික්ෂූහු අග්ගළ පුරයට ගොස් ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ කොහි ද යි ඇසූහ. තෙලෙ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ සහජාති පුරයට වැඩිසේකැ'යි ඔහු කීහ. ඉක්බිති ස්ථවිර භික්ෂූහු සහජාති පුරයෙහි දී ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ සම්භාවනය කළහ. (හමු වූහ.)

11. ඉක්බිති සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. 'ඇවැත්නි, මේ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ බහුශ්‍රැතයහ. අවබොධ කළ ආගම ඇත්තාහ, ධර්මධරයහ, විනයධරයහ, මාතිකාධරයහ, පණ්ඩිතයහ, ව්‍යක්තයහ, නුවණැත්තහ, ලජ්ජීහ, වරදෙහි කුකුස් කරන සුල්ලහ, ශික්ෂාකාමීහ. ඉදින් අපි ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේගෙන් ප්‍රශ්නයක් අසන්නෙමු නම් එකප්‍රශ්නයකින් ම සියලු රැය ඉක්මවන්නට ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ ප්‍රතිබලයහ. දැන් වනාහි ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ අතැවැසි සරභාණක (මිහිරි ස්වරයෙන් දෙශනාකරන) භික්ෂුනමක් අධ්‍යෙෂණය කරවන්නාහ. ඒ භික්ෂුනමගේ මිහිරිස්වරයෙන් බිණීම අවසානයෙහි තුඹ වහන්සේ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වෙත එළඹ මේ දසවස්තූන් අසන්නහු නම් මැනවැ'යි.

එසේ ය වහන්සැ යි (කියා) ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සාණවාසී සම්භූත ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ අතැවැසි ස්වරභාණක භික්ෂුනම අධ්‍යෙෂණය කළහ. ඉක්බිති ඒ භික්ෂුනමගේ ස්වරභාණය අවසානයෙහි ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ වැද එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් යස කාකණ්ඩකපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේට මෙය කීහ:

12-1. වහන්ස, සිඞ්ගිලොණකප්පය කැප වේ ද'යි. ඇවැත්නි, ඒ සිඞ්ගිලොණ කප්පය නම් කවරේ ද'යි. වහන්ස, යම් තැනෙක ලුණු නැති භොජනයක් වේ නම් එහි දී වළඳන්නෙමි'යි අඟකින් ලුණු පරිහරණය කිරීමට කැප වෙයි ද, ඇවැත්නි නො කැප වෙයි.

2. කප්පති භන්තෙ ද්වඞ්ගුලකප්පොති. කො සො ආවුසො ද්වඞ්ගුලකප්පොති. කප්පති භන්තෙ ද්වඞ්ගුලාය ඡායාය වීතිවත්තාය විකාලෙ භොජනං භුඤ්ජිතුන්ති. නාවුසො කප්පතීති.

3. කප්පති භන්තෙ ගාමන්තරකප්පොති. කො සො ආවුසො ගාමන්තරකප්පොති. කප්පති භන්තෙ ඉදානි ගාමන්තරං ගමිස්සාමීති භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං භොජනං භුඤ්ජිතුන්ති. නාවුසො කප්පතීති.

4. කප්පති භන්තෙ ආවාසකප්පොති. කො සො ආවුසො ආවාසකප්පොති. කප්පති භන්තෙ සම්බහුලා ආවාසා සමානසීමා නානුපොසථං කාතුන්ති. නාවුසො කප්පතීති.

5. කප්පති භන්තෙ අනුමතිකප්පොති. කො සො ආවුසො අනුමතිකප්පොති? කප්පති භන්තෙ වග්ගෙන සඞ්ඝෙන කම්මං කාතුං ආගතෙ භික්ඛූ අනුජානිස්සාමාති.[1] නාවුසො කප්පතීති.

6. කප්පති භන්තෙ ආචිණ්ණකප්පොති? කො සො ආවුසො ආචිණ්ණකප්පොති. කප්පති භන්තෙ ඉදං මෙ උපජ්ඣායෙන අජ්ඣාචිණ්ණං ඉදං මෙ ආචරියෙන අජ්ඣාචිණ්ණන්ති තං අජ්ඣාචරිතුන්ති. ආචිණ්ණකප්පො ඛො ආවුසො එකච්චො කප්පති එකච්චො න කප්පතීති.

7. කප්පති භන්තෙ අමථිතකප්පොති. කො සො ආවුසො අමථිතකප්පොති. කප්පති භන්තෙ යං තං ඛීරං ඛීරභාවං විජහිතං අසම්පත්තං දධිභාවං තං භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං පාතුන්ති, නාවුසො කප්පතීති.

8. කප්පති භන්තෙ ජලොගිපාතුන්ති. කො සො ආවුසො ජලොගීති[3]. කප්පති භන්තෙ යා සා සුරා අසුත්තා[4] අසම්පත්තා මජ්ජභාවං. තං පාතුන්ති. නාවුසො කප්පතීති.

9. කප්පති භන්තෙ අදසකං නිසීදනන්ති. නාවුසො කප්පතීති.

10. කප්පති භන්තෙ ජාතරූපරජතන්ති. නාවුසො කප්පතීති.

ඉමෙ ඛො භන්තෙ වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං ඉමානි දසවත්ථූනි දීපෙන්ති. හන්ද මයං භන්තෙ ඉමං අධිකරණං ආදියාම[5], පුරෙ අධම්මො දිප්පති ධම්මො පටිබාහීයති. අවිනයො දිප්පති විනයො පටිබාහීයති. පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති ධම්මවාදිනො දුබ්බලා හොන්ති. අවිනයවාදිනො බලවන්තො හොන්ති. විනයවාදිනො දුබ්බලා හොන්තීති. එවමාවුසොති ඛො ආයස්මා රෙවතො ආයස්මතො යසස්ස කාකණ්ඩකපුත්තස්ස පච්චස්සොසි.

## පඨමභාණවාරං නිට්ඨිතං.

1. අනුමානෙස්සාමාති - මජසං.
2. ජලොගිං පාතුන්ති - මජසං.
3. කා සා ආවුසො ජලොගීති - මජසං.
4. ආසුතා - මජසං.
5. ආදියිස්සාම - මජසං.

2. වහන්ස, අඞ්ගුලකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ අඞ්ගුල කප්පය නම් කවරේ ද'යි. වහන්ස, සෙවණැල්ල අඟල් දෙකක් ඉක්ම ගිය කල්හි විකාලයෙහි භොජනය වැළඳීමට කැප වෙයි ද? ඇවැත්නි, නො කැප වෙයි.

3. වහන්ස, ගාමන්තරකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ ගාමන්තරකප්පය නම් කවරේ ද යි. වහන්ස, දැන් අනිත් ගමකට යන්නෙමි යි (සලකා) වළඳා අවසන් ව පවාරණය කළ භික්ෂුව විසින් අයිරිත් නො කළ භොජනය වළඳන්ට කැප වෙයි ද යි. ඇවැත්නි, නො කැප වෙයි.

4. වහන්ස, ආවාසකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ ආවාස–කප්පය නම් කවරේ ද යි. වහන්ස, සමාන සීමාවක් ඇති බොහෝ ආවාසයෝ වෙත් (නම් එහි) නානා උපොසථය කිරීමට කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වෙයි.

5. වහන්ස, අනුමතිකප්පය කැප වේ ද' යි. ඇවැත්නි ඒ අනුමතිකප්පය නම් කවරේ ද'යි. වහන්ස, පැමිණි කල්හි භික්ෂූන් අනුදන්නෙමු'යි වර්ග වූ සඞ්ඝයා විසින් (සඞ්ඝ) කර්මයක් කිරීමට කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වෙයි.

6. වහන්ස, ආචිණ්ණකප්පය කැප වේ ද'යි. ඇවැත්නි, ඒ ආචිණ්ණකප්පය නම් කවරේ ද යි. වහන්ස මෙය මාගේ උපාධ්‍යායයන් වහන්සේ විසින් පුරුදු කරනලදැය මෙය මාගේ ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් පුරුදු කරන ලද යැ'යි (සලකා) එය පුරුදු කොට හැසිරෙන්නට කැප වේ ද'යි. ඇවැත්නි, ඇතැම් ආචිණ්ණකප්පයක් කැප වෙයි. ඇතැම් ආචිණ්ණකප්පයක් නො කැප වෙයි.

7. වහන්ස, අමථිතකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ අමථිත-කප්පය නම් කවරේ ද යි. වහන්ස, යම් ඒ කිරක් කිරිබව අත්හළේ ද දීබවට නො පැමිණියේ ද, වළඳා අවසන් ව පවාරණය කළ භික්ෂුව විසින් අයිරිත් නො කළ ඒ කිරි බොන්නට කැප වේ ද'යි. ඇවැත්නි, නො කැප වෙයි.

8. වහන්ස, ජලොගිය බොන්නට කැප වේ ද යි. ඇවැත්නි, ඒ ජලොගිය නම් කවරේ ද යි. වහන්ස, යම් ඒ සුරාවක් නො පැසුණි ද මද්‍යබවට නො පැමිණියා ද එය බොන්නට කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වෙයි.

9. වහන්ස, දහවලු රහිත නිසීදනය කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වෙයි.

10. වහන්ස, රන්රිදී කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වෙයි.

වහන්ස, විශාලාවැසි මේ වජ්ජිපුත්‍රක භික්ෂූහු විශාලානුවර මේ දශ වස්තුව ප්‍රකාශ කෙරෙත්. වහන්ස, අධර්මය බැබළීමට ද ධර්මය බැහැර කරනුලැබීමට ද අවිනය බැබළීමට ද විනය බැහැර කරනු ලැබීමට ද පෙර අධර්මවාදීන් බලවත් වීමට ද ධර්මවාදීන් දුබල වීමට ද අවිනයවාදීන් බලවත් වීමට ද විනයවාදීන් දුබල වීමට ද පෙර අපි මේ අධිකරණය ඉදිරියට ගන්නෙමු යි. ඇවැත්නි. එසේ යැ'යි කියා ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් කාකණ්ඩකපුත්‍ර යස ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ.

පළමු බණවර නිමි.

## දුතියභාණවාරං

13. අස්සොසුං ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ යසො කිර කාකණ්ඩකපුත්තො ඉමං[1] අධිකරණං ආදියිතුකාමො පක්ඛං පරියෙසති. ලභති ච කිර පක්ඛන්ති. අථ ඛො වෙසාලිකානං වජ්ජිපුත්තකානං භික්ඛූනං එතදහොසි: ඉදං ඛො අධිකරණං කක්ඛළඤ්ච වාළඤ්ච. කන්නු ඛො[2] මයං පක්ඛං ලභෙය්‍යාම යෙන මයං ඉමස්මිං අධිකරණෙ බලවන්තතරා අස්සාමාති. අථ ඛො වෙසාලිකානං වජ්ජිපුත්තකානං භික්ඛූනං එතදහොසි: අයං ඛො ආයස්මා රෙවතො බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. සචෙ මයං ආයස්මන්තං රෙවතං පක්ඛං ලභෙය්‍යාම එවං මයං ඉමස්මිං අධිකරණෙ බලවන්තතරා අස්සාමාති.

අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ පහූතං සාමණකං පරික්ඛාරං පටියාදෙසුං පත්තම්පි චීවරම්පි නිසීදනම්පි සූචිඝරම්පි කායබන්ධනම්පි පරිස්සාවනම්පි ධම්මකරකම්පි. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ තං සාමණකං පරික්ඛාරං ආදය නාවාය සහජාතිං උජ්ජවිංසු. නාවාය පච්චොරොහිත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ භත්තවිස්සග්ගං කරොන්ති.

14. අථ ඛො ආයස්මතො සාළ්හස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි, කො නු ඛො ධම්මවාදිනො පාචීනකා වා භික්ඛූ පාවෙය්‍යකා වාති. අථ ඛො ආයස්මතො සාළ්හස්ස ධම්මඤ්ච විනයඤ්ච[3] පච්චවෙක්ඛන්තස්ස එතදහොසි: අධම්මවාදිනො පාචීනකා භික්ඛූ ධම්මවාදිනො පාවෙය්‍යකා භික්ඛූති. අථ ඛො අඤ්ඤතරා සුද්ධාවාසකායිකා දෙවතා ආයස්මතො සාළ්හස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා ආයස්මතො සාළ්හස්ස පමුඛෙ[4] පාතුරහොසි. අථ ඛො සා දෙවතා ආයස්මන්තං සාළ්හං එතදවොච: සාධු සාධු[5] භන්තෙ සාළ්හ, අධම්මවාදිනො[6] පාචීනකා භික්ඛූ ධම්මවාදිනො[7] පාවෙය්‍යකා භික්ඛූ. තෙන හි භන්තෙ සාළ්හ, යථා ධම්මො තථා තිට්ඨාහීති. පුබ්බෙපි චාහං දෙවතෙ එතරහි ච යථා ධම්මො තථා ඨිතො. අපි චාහං න තාව දිට්ඨිං ආවිකරොමි. අප්පෙවනාම මං ඉමස්මිං අධිකරණෙ සම්මන්නෙය්‍යාති.

---

1. ඉදං – මජසං.
2. කිං නු ඛො – මජසං.
3. විනයඤ්ච චෙතසා පච්චවෙක්ඛන්තස්ස – මජසං.
4. සම්මුඛෙ – මජසං.
5. සාධු – මජසං.
6. අධම්මවාදී – මජසං. ලෙනං.
7. ධම්මවාදී – මජසං.

## දෙවැනි බණවර

13. කාකණ්ඩකපුත්‍ර වූ යස (ස්ථවිරයන් වහන්සේ,) මේ අධිකරණය ඉදිරියට ගනු කැමැත්තාහු පක්‍ෂයක් සොයත් ල, පක්‍ෂයක් ලබත් ලැ'යි විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූහු ඇසූහ. ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූන්ට මේ අදහස විය. මේ අධිකරණය වනාහි කර්කශ ද චණ්ඩ ද වෙයි. යමකු නිසා අපි මේ අධිකරණයෙහි අතිශයින් බලවත් වන්නෙමු ද එබඳු කවරකු අපි පක්‍ෂ කොට ලබන්නෙමු ද'යි. ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූන්ට මේ අදහස විය. මේ ආයුෂ්මත් රේවත ස්ථවිරයන් වහන්සේ වනාහි බහුශ්‍රැතයහ. අවබොධ කළ ආගම ඇතියහ. ධර්මධරයහ, විනයධරයහ, මාතිකාධරයහ, පණ්ඩිතයහ, ව්‍යක්තයහ, නුවණැත්තහ, ලජ්ජීහ, වරදෙහි කුකුස් කරනසුල්ලහ, ශික්‍ෂාකාමීහ. ඉදින් අපි ආයුෂ්මත් රේවත ස්ථවිරයන් පක්‍ෂ කොට ලබන්නෙමු නම් මෙසේ අපි මේ අධිකරණයෙහි අතිශයින් බලවත් වන්නෙමු'යි.

ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූහු පාත්‍ර ද, සිවුරු ද, නිසීදන ද, ඉදිකටුගුළා ද, කාබහන් ද, පෙරහන් (කඩ) ද, ධබරා ද යන බොහෝ වූ මහණුන්ට සුදුසු වූ පිරිකර පිළියෙළ කළහ. ඉක්බිති වජ්ජිපුත්‍රක භික්‍ෂූහු ඒ මහණුන්ට සුදුසු පිරිකර රැගෙන නැවෙන් සහජාති තුවර වෙත උඩුගංබලා ගියහ. නැවෙන් බැස එක්තරා රුක්මුලෙක අහර වැළඳීම කෙරෙත්.

14. එවේලෙහි රහොගත වූ එකලා වූ ආයුෂ්මත් සාළ්හ ස්ථවිරයන් වහන්සේට මෙසේ සිතෙහි පරිවිතර්කයක් පහළ විය. ධර්මවාදීහු කවරහු ද? පෙරදිගවැසි භික්‍ෂූහු ද, නැතහොත් පාවෙය්‍යක භික්‍ෂූහු ද'යි. ඉක්බිති ධර්මය ද විනය ද ප්‍රත්‍යවෙක්‍ෂා කරන ආයුෂ්මත් සාළ්හ ස්ථවිරයන් වහන්සේට 'පෙරදිග වැසි භික්‍ෂූහු අධර්මවාදීහු ය. පාවෙය්‍යක භික්ෂූහු ධර්මවාදීහු ය'යි මේ අදහස විය. ඉක්බිති ශුද්ධාවාසවාසී වූ දෙවියෙක් (තමාගේ) සිතින් ආයුෂ්මත් සාළ්හ ස්ථවිරයන් වහන්සේගේ සිතෙහි වූ පරිවිතර්කය දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත හෝ දිගු කෙරෙයි ද, දිගු කළ අත හෝ හකුළුවයි ද මෙ පරිද්දෙන් ම ශුද්ධාවාස දෙවියන් කෙරෙහි අතුරුදහන් ව ආයුෂ්මත් සාළ්හ ස්ථවිරයන් ඉදිරියෙහි පහළ විය. ඉක්බිති ඒ දෙවියා ආයුෂ්මත් සාළ්හ ස්ථවිරයන් වහන්සේට මෙය කීය. සාළ්හයන් වහන්ස, යහපත යහපත, පෙරදිග වැසි භික්‍ෂූහු අධම්මවාදීහු ය, පාවෙය්‍යක භික්‍ෂූහු ධම්මවාදීහු ය, සාළ්හයන් වහන්ස, එහෙයින් ම ධර්මය යම්සේ ද එසේ සිටිනු මැනවැ'යි. දෙවතාවෙනි, මම පෙර ද දැන් ද ධර්මය යම්සේ නම් එසේ සිටියේ වෙමි. එහෙත් මේ අධිකරණයෙහි (විසඳීමට) මා සම්මත කරන්නෝ නම් ඉතා යෙහෙකි. එතෙක් මම දෘෂ්ටිය හෙළි නො කෙරෙමි යි.

15. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ තං සාමණකං පරික්ඛාරං ආදය යෙනායස්මා රෙවතො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං රෙවතං එතදවොචුං: පටිගණ්හාතු භන්තෙ ථෙරො සාමණකං පරික්ඛාරං පත්තම්පි චීවරම්පි නිසීදනම්පි සූචිඝරම්පි කායබන්ධනම්පි පරිස්සාවනම්පි ධම්මකරකම්පීති. අලං ආවුසො, පරිපුණ්ණං මෙ පත්තචීවරන්ති. න ඉච්ඡි පටිග්ගහෙතුං.

තෙන ඛො පන සමයෙන උත්තරො නාම භික්ඛු වීසති වස්සො ආයස්මතො රෙවතස්ස උපට්ඨාකො හොති. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ යෙනායස්මා උත්තරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං උත්තරං එතදවොචුං. පටිගණ්හාතු ආයස්මා උත්තරො සාමණකං පරික්ඛාරං පත්තම්පි චීවරම්පි නිසීදනම්පි සූචිඝරම්පි කායබන්ධනම්පි පරිස්සාවනම්පි ධම්මකරකම්පීති. අලං ආවුසො පරිපුණ්ණං මෙ පත්තචීවරන්ති. න ඉච්ඡි පටිග්ගහෙතුං.

මනුස්සා ඛො ආවුසො උත්තර, භගවතො සාමණකං පරික්ඛාරං උපනාමෙන්ති. සචෙ භගවා පටිගණ්හාති තෙනෙව තෙ අත්තමනා හොන්ති. නො චෙ භගවා පටිගණ්හාති ආයස්මතො ආනන්දස්ස උපනාමෙන්ති. පටිගණ්හාතු භන්තෙ ථෙරො සාමණකං පරික්ඛාරං, යථා භගවතා පටිග්ගහිතො එවමෙව සො භවිස්සතීති, පටිගණ්හාතු ආයස්මා උත්තරො සාමණකං පරික්ඛාරං. යථා ථෙරෙන පටිග්ගහිතො එවමෙව සො භවිස්සතීති.

16. අථ ඛො ආයස්මා උත්තරො වෙසාලිකෙහි වජ්ජිපුත්තකෙහි භික්ඛූහි නිප්පීළියමානො එකං චීවරං අග්ගහෙසි. වදෙය්‍යාථාවුසො යෙනත්ථොති. එත්තකං ආයස්මා උත්තරො ථෙරං වදෙතු: එත්තකං භන්තෙ ථෙරො සඞ්ඝමජ්ඣෙ වදෙතු. පුරත්ථිමෙසු ජනපදෙසු බුද්ධා භගවන්තො උප්පජ්ජන්ති. ධම්මවාදිනො පාචීනකා භික්ඛූ අධම්මවාදිනො පාවෙය්‍යකා භික්ඛූති. එවමාවුසොති ඛො ආයස්මා උත්තරො වෙසාලිකානං වජ්ජිපුත්තකානං භික්ඛූනං පටිස්සුත්වා යෙනායස්මා රෙවතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං රෙවතං එතදවොච: එත්තකං භන්තෙ ථෙරො සඞ්ඝමජ්ඣෙ වදෙතු. පුරත්ථිමෙසු ජනපදෙසු බුද්ධා භගවන්තො උප්පජ්ජන්ති. ධම්මවාදිනො පාචීනකා භික්ඛූ අධම්මවාදිනො පාවෙය්‍යකා භික්ඛූති.

15. ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූහු මහණුන්ට සුදුසු වූ ඒ පිරිකර ගෙන ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන්ට මෙය කීහ. වහන්ස, පාත්‍ර ද, සිවුරු ද, නිසීදන ද, ඉදිකටුගුළා ද, කාබහන් ද, පෙරහන් (කඩ) ද, ධබරා ද යන මහණුන්ට සුදුසු වූ පිරිකර තෙරුන් වහන්සේ පිළිගනිත්වා'යි. ඇවැත්නි, කම් නැත. මාගේ පාසිවුරු පිරිපුන් ය යි පිළිගන්නට නො කැමති වූහ.

එසමයෙහි විසි වස් ඇති උත්තර නම් භික්‍ෂුනම ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේගේ උපස්ථායක වෙති. ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූහු උත්තර (තෙර) යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් උත්තර ස්ථවිරයන්ට මෙය කීහ. පාත්‍ර ද, සිවුරු ද, නිසීදන ද, ඉදිකටු ගුළා ද, කාබහන් ද, පෙරහන් (කඩ) ද, ධබරා ද යන මහණුන්ට සුදුසු වූ පිරිකර ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ පිළිගනිත්වායි. ඇවැත්නි, කම් නැත. මාගේ පාසිවුරු පිරිපුන් යැ' යි (කියා) පිළිගන්නට නො කැමති වූහ.

ඇවැත් උත්තරයෙනි, මිනිස්සු මහණුන්ට සුදුසු පිරිකර භාග්‍යවතුන් වහන්සේට එළවත්. ඉදින් භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක් නම් එයින් ම ඔහු සතුටු සිත් ඇත්තෝ වෙත්. ඉදින් භාග්‍යවතුන් වහන්සේ නො පිළිගන්නා සේක් නම් ''වහන්ස, ස්ථවිරයන් වහන්සේ මහණුන්ට සුදුසු පිරිකර පිළිගන්නාසේක්වා. යම්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් පිළිගන්නා ලද්දේ ද එපරිද්දෙන් ම එය වන්නේය යි (කියා) ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට එළවත්. උත්තර ආයුෂ්මතුන් වහන්සේ මහණුන්ට සුදුසු පිරිකර පිළිගනිත්වා. එය යම්සේ තෙරුන් වහන්සේ විසින් පිළිගන්නා ලද්දේ ද එපරිද්දෙන් ම වන්නේ ය යි.

16. ඉක්බිති ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ විශාලාවැසි වජ්ජි පුත්‍රක භික්‍ෂූන් විසින් පෙළතුලබන්නේ 'ඇවැත්නි, යමකින් ප්‍රයෝජනයක් වේ ද එය කියව' යි (කියා) එක් සිවුරක් ගත්හ. ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ තෙරුන් වහන්සේට මෙ පමණක් කියනු මැනව. (එනම්) වහන්ස, භාග්‍යවත් බුද්ධවරු පෙරදිග ජනපදයන්හි පහළ වෙත්. පෙරදිගවැසි භික්‍ෂූහු ධර්මවාදීහු ය. පාවා නුවර වැසි භික්‍ෂූහු අධර්මවාදීහු ය යන මෙපමණක් තෙරුන් වහන්සේ සඟමැද කියන සේක්වා යනු යි. ඇවැත්නි, එසේ යැ යි ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූන්ට පිළිවදන් දී ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. වහන්ස, භාග්‍යවත් බුද්ධවරු පෙරදිග ජනපදයන්හි පහළ වෙත්, පෙරදිගවැසි භික්‍ෂූහු ධර්මවාදීහු ය. පාවානුවරවැසි භික්‍ෂූහු අධර්මවාදීහු ය යන මෙපමණක් තෙරුන් වහන්සේ සඟමැද කියන සේක්වා යි.

අධම්මෙ මං ත්වං භික්ඛු නියොජෙසීති ථෙරො ආයස්මන්තං උත්තරං පණාමෙසි. අථ ඛො වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ ආයස්මන්තං උත්තරං එතදවොචුං: කිං ආවුසො උත්තර ථෙරො ආහාති. පාපිකං භො ආවුසො කතං. අධම්මෙ මං ත්වං භික්ඛු නියොජෙසීති ථෙරො මං පණාමෙසීති.

නනු ත්වං ආවුසො වුඩ්ඪො වීසතිවස්සොසීති, ආමාවුසොති. අපි ච මයං ගරුනිස්සයං ගණ්හාමාති.

17. අථ ඛො සඞ්ඝො තං අධිකරණං විනිච්ඡිනිතුකාමො සන්නිපති. අථ ඛො ආයස්මා රෙවතො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ ආවුසො සඞ්ඝො. සචෙ මයං ඉමං අධිකරණං ඉධ වූපසමෙය්‍යාම[1] සියාපි මූලදායකා භික්ඛූ පුන කම්මාය උක්කොටෙය්‍යුං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං යත්ථෙවිමං අධිකරණං සමුප්පන්නං. සඞ්ඝො තත්ථෙවිමං අධිකරණං වූපසමෙය්‍යාති. අථ ඛො ථෙරා භික්ඛූ වෙසාලිං අගමංසු තං අධිකරණං විනිච්ඡිනිතුකාමා.

18. තෙන ඛො පන සමයෙන සබ්බකාමී නාම පථව්‍යා සඞ්ඝත්ථෙරො වීසංවස්සසතිකො[2] උපසම්පදාය ආයස්මතො ආනන්දස්ස සද්ධිවිහාරිකො වෙසාලියං පටිවසති. අථ ඛො ආයස්මා රෙවතො ආයස්මන්තං සම්භූතං සාණවාසිං එතදවොච: අහං ආවුසො යස්මිං විහාරෙ සබ්බකාමී ථෙරො විහරති තං විහාරං උපගච්ඡාමි. සො ත්වං කාලස්සෙව ආයස්මන්තං සබ්බකාමිං උපසඞ්කමිත්වා ඉමානි දසවත්ථූනි පුච්ඡෙය්‍යාසීති. එවම්භන්තෙති ඛො ආයස්මා සම්භූතො සාණවාසි ආයස්මතො රෙවතස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා රෙවතො යස්මිං විහාරෙ සබ්බකාමී ථෙරො විහරති තං විහාරං උපගඤ්ඡි.

ගබ්භෙ ආයස්මතො සබ්බකාමිස්ස සෙනාසනං පඤ්ඤත්තං හොති ගබ්භපමුඛෙ ආයස්මතො රෙවතස්ස. අථ ඛො ආයස්මා රෙවතො අයං ථෙරො මහල්ලකො න නිපජ්ජතීති න සෙය්‍යං කප්පෙසි. ආයස්මා සබ්බකාමී අයං භික්ඛු ආගන්තුකො කිලන්තො න නිපජ්ජතීති න සෙය්‍යං කප්පෙසි.

1. වූපසමෙස්සාම – මජසං
2. වීසවස්සසතිකො – මජසං

මහණ, තෝ මා අධර්මයෙහි යොදවන්නෙහි යැ යි (කියා) තෙරුන් වහන්සේ ආයුෂ්මත් උත්තර ස්ථවිරයන් වහන්සේ ඉවත් කළහ. ඉක්බිති විශාලාවැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු ආයුෂ්මත් උත්තර ස්ථවිරයන්ට මෙය කීහ. ඇවැත් උත්තරයෙනි, තෙරුන් වහන්සේ කුමක් කීසේක් ද යි. ඇවැත්නි, අප විසින් ලාමකක්‍රියාවක් කරන ලදී. මහණ තෝ මා අධර්මයෙහි යොදවන්නෙහියැ යි කියා තෙරුන් වහන්සේ මා ඉවත්කළ සේකැ යි.

ඇවැත්නි, නුඹ වහන්සේ විසිවස් වූ වෘද්ධයෙක් නො වේ ද යි. ඇවැත්නි, එසේ යැ යි. එහෙත් අපි ගුරුවරයා වෙත නිශ්‍රය ගනුම්හ යි.

17. ඉක්බිති සඞ්ඝයා ඒ අධිකරණය විනිශ්චය කරනු කැමැත්තේ රැස් විය. ඉක්බිති ආයුෂ්මත් රේවත ස්ථවිරයන් වහන්සේ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. ඇවැත්නි, සඞ්ඝයා මාගේ වචනය අසාවා. ඉදින් අපි මේ අධිකරණය මෙහි දී සන්හිඳුවන්නෙමු නම් මූලදායක (කරුණට මුල් වූ) භික්ෂූන් නැවත කර්මය (කිරීම) පිණිස උක්කෝටනය කිරීම වන්නේ ය. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් යම් තැනෙක මේ අධිකරණය හටගත්තේ ද එතැන දී ම සඞ්ඝයා මේ අධිකරණය සන්හිඳුවන්නේ නම් මැනවැයි. ඉක්බිති ඒ අධිකරණය විනිශ්චය කරනු කැමති වූ ස්ථවිර භික්ෂූහු විශාලා නුවරට ගියහ.

18. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ සද්ධිවිහාරික වූ උප-සම්පදාවෙන් එක්සියවිසි වස් ඇති (මුළු) පෘථිවියෙහි ම සඞ්ඝස්ථවිර වූ සබ්බකාමී නම් තෙරුන් වහන්සේ වෙසාලියෙහි වැඩ වෙසෙති. ඉක්බිති ආයුෂ්මත් රේවත ස්ථවිරයන් වහන්සේ සාණවාසී ආයුෂ්මත් සම්භූත ස්ථවිරයන් වහන්සේට මෙය කීහ. 'ඇවැත්නි, යම් වෙහෙරෙක සබ්බකාමී තෙරුන් වහන්සේ වෙසෙත් ද මම ඒ වෙහෙරට එළඹෙමි. නුඹ වහන්සේ උදසනක් සේ ම ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවන් වෙත එළඹ මේ දශවස්තූන් විචාරන්නේ නම් මැනවැ' යි. එසේ ය වහන්සැ යි (කියා) සාණවාසී ආයුෂ්මත් සම්භූත තෙරණුවෝ ආයුෂ්මත් රේවත තෙරණුවන්ට පිළිවදන් දුන්හ. ඉක්බිති ආයුෂ්මත් රේවත තෙරණුවෝ යම් වෙහෙරෙක සබ්බකාමී තෙරුන් වහන්සේ වෙසෙත් ද ඒ වෙහෙරට පැමිණියහ.

ඇතුළුගෙහි ආයුෂ්මත් සබ්බකාමී තෙරුන් වහන්සේට ද ඇතුළුගෙය ඉදිරිපස ආයුෂ්මත් රේවත තෙරණුවන්ට ද සෙනසුන් පනවන ලද්දේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් රේවත තෙරණුවෝ "මේ තෙරුන් වහන්සේ මහලු ය. නො නිදනසේකැ'යි (සලකා) ශයනය නො කළහ. 'මේ භික්ෂු තෙම ආගන්තුකයෙකි. වෙහෙසට පත් වූයේ නො නිදන්නේ ය'යි (සලකා) ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවෝ ශයනය නො කළහ.

අථ ඛො ආයස්මා සබ්බකාමී රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය ආයස්මන්තං රෙවතං එතදවොච: කතමෙන ත්වං භුම්මි විහාරෙන එතරහි බහුලං විහරසීති. මෙත්තාවිහාරෙන ඛො අහං භන්තෙ එතරහි බහුලං විහරාමීති. කුල්ලකවිහාරෙන කිර ත්වං භුම්මි එතරහි බහුලං විහරසි' කුල්ලකවිහාරො එසො භුම්මි යදිදං මෙත්තාති.

පුබ්බෙපි මෙ භන්තෙ ගිහිභූතස්ස ආචිණ්ණා මෙත්තා. තෙනාහං එතරහිපි මෙත්තාවිහාරෙන බහුලං විහරාමි. අපි ච ඛො මයා චිරපත්තං අරහත්තං. ථෙරො පන භන්තෙ කතමෙන විහාරෙන එතරහි බහුලං විහරතීති. සුඤ්ඤතා විහාරෙන ඛො අහං භුම්මි එතරහි බහුලං විහරාමීති?

මහාපුරිසවිහාරෙන කිර භන්තෙ ථෙරො එතරහි බහුලං විහරති. මහාපුරිසවිහාරො එසො භන්තෙ යදිදං සුඤ්ඤතාති. පුබ්බෙපි මෙ භුම්මි ගිහිභූතස්ස ආචිණ්ණා සුඤ්ඤතා. තෙනාහං එතරහිපි සුඤ්ඤතා-
විහාරෙන බහුලං විහරාමි. අපි ච මයා චිරපත්තං අරහත්තන්ති. අයඤ්චරහි ථෙරානං භික්ඛූනං අන්තරා කථා විප්පකතා.

19. අථායස්මා සම්භූතො සාණවාසී තස්මිං අනුප්පත්තො හොති. අථ ඛො ආයස්මා සම්භූතො සාණවාසී යෙනායස්මා සබ්බකාමී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සබ්බකාමිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සම්භූතො සාණවාසී ආයස්මන්තං සබ්බකාමිං එතදවොච: ඉමෙ භන්තෙ වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං දසවත්ථූනි දීපෙන්ති: කප්පති සිඞ්ගිලොණ-
කප්පො. කප්පති ද්වඞ්ගුලකප්පො. කප්පති ගාමන්තරකප්පො. කප්පති ආවාසකප්පො. කප්පති අනුමතිකප්පො. කප්පති ආචිණ්ණකප්පො. කප්පති අමථිතකප්පො. කප්පති ජලොගි පාතුං. කප්පති අදසකං-
නිසීදනං. කප්පති ජාතරූපරජතන්ති. ථෙරෙන භන්තෙ උපජ්ඣායස්ස-
මූලෙ බහු ධම්මා ච විනයො ච පරියත්තො. ථෙරස්ස භන්තෙ
ධම්මඤ්ච විනයඤ්ච පච්චවෙක්ඛන්තස්ස කථං හොති කෙ නු ඛො ධම්මවාදිනො පාචීනකා වා භික්ඛූ පාවෙය්‍යකා වාති.

ඉක්බිති ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවෝ රාත්‍රිය පහන්වන වේලායෙහි නැඟිට ආයුෂ්මත් රේවත තෙරුන්ට මෙය කීහ. ප්‍රිය තෙනැත්ත, තෙපි කවර විහරණයෙකින් යුක්ත ව දැන් බෙහෙවින් වෙසෙන්නහු ද'යි. වහන්ස, මම මෛත්‍රීවිහරණයෙන් යුක්ත ව දැන් බෙහෙවින් වෙසෙමි යි. ප්‍රිය තෙනැත්ත, තෙපි වනාහි ඉතා ප්‍රකට විහරණයෙකින් යුක්ත ව දැන් බෙහෙවින් වෙසෙන්නහු ය. ප්‍රිය තෙනැත්ත, යම් මේ මෛත්‍රියක් වේ ද තෙලෙ ඉතා ප්‍රකට විහරණයෙකි යි.

වහන්ස, පෙර ද ගිහි වූ මා විසින් මෛත්‍රිය පුරුදු කරන ලදි. එහෙයින් දැනුදු මම මෛත්‍රීවිහරණයෙන් යුක්ත ව බෙහෙවින් වෙසෙමි. තව ද මා විසින් රහත්බවට පැමිණ බොහෝ කල් ය. වහන්ස, (ඔබ) තෙරුන් වහන්සේ කවර විහරණයෙකින් යුක්ත ව දැන් බෙහෙවින් වෙසෙනසේක් ද යි. ප්‍රිය තෙනැත්ත, මම ශූන්‍යතාවිහරණයෙන් යුක්ත ව දැන් බෙහෙවින් වෙසෙමි'යි.

වහන්ස, තෙරුන් වහන්සේ වනාහි මහාපුරුෂ විහරණයෙකින් යුක්ත ව දැන් බෙහෙවින් වෙසෙනසේක. වහන්ස, යම් මේ ශූන්‍යතාවිහරණයෙක් වේ ද තෙලෙ මහාපුරුෂ විහරණයෙකැ යි. ප්‍රිය තෙනැත්ත, පෙර ද ගිහි වූ මා විසින් ශූන්‍යතාව පුරුදු කරන ලද. එහෙයින් දැනුදු මම ශූන්‍යතාවිහරණයෙන් යුක්ත ව බෙහෙවින් වෙසෙමි. තවද මා විසින් රහත්බවට පැමිණ බොහෝ කල් වේ යැ යි. ස්ථවිර භික්ෂූන් (දෙනම) අතර වූ මේ කථාව අඩාළ කරන ලද්දේ ය.

19. එකල්හි සාණවාසී ආයුෂ්මත් සම්භූත තෙරුන් වහන්සේ එහි පැමිණියහ. ඉක්බිති සාණවාසී ආයුෂ්මත් සම්භූත තෙරුන් වහන්සේ ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවෝ යම් තැනෙක ද එතැනට එළඹියහ. එළඹ ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවන් වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් සාණවාසී ආයුෂ්මත් සම්භූත තෙරහු ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවනට මෙය කීහ. වහන්ස, විශාලාවැසි මේ වජ්ජිපුත්‍රක භික්ෂූහු වෙසාලියෙහි දශවස්තුවක් දක්වති. (එනම්) සිඞ්ගිලොණකප්පය කැප ය, ද්වඞ්ගුලකප්පය කැප ය, ගාමන්තරකප්පය කැප ය, ආවාසකප්පය කැප ය, අනුමතිකප්පය කැප ය, ආචිණ්ණකප්පය කැප ය, අමථිතකප්පය කැප ය, නො පැසුණු සුරා බීමට කැප ය, දහවලු රහිත නිසීදනය කැප ය, රන්රිදී කැප ය යනු යි. වහන්ස, (ඔබ) තෙරුන් වහන්සේ විසින් උපාධ්‍යායයන් වහන්සේ (ආනන්ද තෙරුන්වහන්සේ) වෙත බොහෝ ධර්මය ද විනය ද පුහුණු කරන ලද්දේ ය. වහන්ස, ධර්මය ද විනය ද ප්‍රත්‍යවේක්ෂා කරන තෙරුන් (ඔබ) වහන්සේට කෙසේ අදහස් වෙයි ද? ධර්මවාදීහු කවරහු ද? ප්‍රාචීනක භික්ෂූහු හෝ පාවෙය්‍යක භික්ෂූහු හෝ ධර්මවාදීහු වෙත් ද'යි.

තයාපි ඛො ආවුසො උපජ්ඣායස්ස මූලෙ බහු ධම්මො ච විනයො ච පරියත්තො. තුය්හං පනාවුසො ධම්මඤ්ච විනයඤ්ච පච්චවෙක්ඛන්තස්ස කථං හොති, කෙ නු ඛො ධම්මවාදිනො පාචීනකා වා භික්ඛූ පාවෙය්‍යකා වාති. මය්හං ඛො භන්තෙ ධම්මඤ්ච විනයඤ්ච පච්චවෙක්ඛන්තස්ස එවං හොති: අධම්මවාදිනො පාචීනකා භික්ඛූ ධම්මවාදිනො පාවෙය්‍යකා භික්ඛූති. අපිචාහං න තාව දිට්ඨිං ආවීකරොමි අපෙපච නාම මං ඉමස්මිං අධිකරණෙ සම්මන්නෙය්‍යාති.

මය්හම්පි ඛො ආවුසො ධම්මඤ්ච විනයඤ්ච පච්චවෙක්ඛන්තස්ස එවං හොති: අධම්මවාදිනො පාචීනකා භික්ඛූ ධම්මවාදිනො පාවෙය්‍යකා භික්ඛූති. අපිචාහං න තාව දිට්ඨිං ආවීකරොමි අපෙපච නාම මං ඉමස්මිං අධිකරණෙ සම්මන්නෙය්‍යාති.

20. අථ ඛො සඞ්ඝො තං අධිකරණං විනිච්ඡිනිතුකාමො සන්නිපති. තස්මිං ඛො පන අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති. න චෙකස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති. අථ ඛො ආයස්මා රෙවතො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං ඉමස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති න චෙකස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉමං අධිකරණං උබ්බාහිකාය වූපසමෙය්‍ය. සඞ්ඝො චත්තාරො පාචීනකෙ භික්ඛූ චත්තාරො පාවෙය්‍යකෙ භික්ඛූ උච්චිනි. පාචීනකානං භික්ඛූනං ආයස්මන්තඤ්ච සබ්බකාමිං ආයස්මන්තඤ්ච සාළ්හං ආයස්මන්තඤ්ච ඛුජ්ජසොභිතං ආයස්මන්තඤ්ච වාසභගාමිකං. පාවෙය්‍යකානං භික්ඛූනං ආයස්මන්තඤ්ච රෙවතං. ආයස්මන්තඤ්ච සම්භූතං සාණවාසිං. ආයස්මන්තඤ්ච යසං කාකණ්ඩකපුත්තං. ආයස්මන්තඤ්ච සුමනං. අථ ඛො ආයස්මා රෙවතො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං ඉමස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති න චෙකස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො චත්තාරො පාචීනකෙ භික්ඛූ චත්තාරො පාවෙය්‍යකෙ භික්ඛූ සම්මන්නෙය්‍ය උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං ඉමස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති න චෙකස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති. සඞ්ඝො චත්තාරො පාචීනකෙ භික්ඛූ චත්තාරො පාවෙය්‍යකෙ භික්ඛූ සම්මන්නති උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. යස්සායස්මතො ඛමති චතුන්නං පාචීනකානං භික්ඛූනං චතුන්නං පාවෙය්‍යකානං භික්ඛූනං සම්මුති උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

ඇවත්ති, තොප විසින් ද උපාධ්‍යායයන් වහන්සේ වෙත බොහෝ ධර්මය ද විනය ද පුහුණු කරන ලද්දේ ය. ඇවැත්නි, ධර්මය ද විනය ද ප්‍රත්‍යවෙක්‍ෂා කරන තොපට කෙසේ අදහස් වේ ද, ප්‍රාචීනක භික්‍ෂූහු හෝ පාවෙය්‍යක භික්‍ෂූහු හෝ ධර්මවාදීහු කවරහු වෙත් ද'යි. වහන්ස, ධර්මය ද විනය ද ප්‍රත්‍යවෙක්‍ෂා කරන මට මෙසේ අදහස් වෙයි. (එනම්) ප්‍රාචීනක භික්‍ෂූහු අධර්මවාදීහු වෙති. පාවෙය්‍යක භික්‍ෂූහු ධර්මවාදීහු වෙතැ'යි. එහෙත් මේ අධිකරණයෙහි මා සම්මත කරන්නේ නම් ඉතා යෙහෙකි. එතෙක් දෘෂ්ටිය (මගේ අදහස) හෙළි නො කෙරෙමි යි (කීහ.)

ඇවැත්නි, ධර්මය ද විනය ද ප්‍රත්‍යවෙක්‍ෂා කරන මට ද මේ අදහස වෙයි. (එනම්) ප්‍රාචීනක භික්‍ෂූහු අධර්මවාදීහු ය. පාවෙය්‍යක භික්‍ෂූහු ධර්මවාදීහු වෙතැ යි. එහෙත්, මා මේ අධිකරණයෙහි සම්මත කරන්නේ නම් ඉතා යෙහෙක. එතෙක් මම දෘෂ්ටිය (මගේ අදහස) හෙළි නො කෙරෙමි යි කීහ.

20. ඉක්බිති සඞ්ඝයා ඒ අධිකරණය විනිශ්චය කරනු කැමැත්තේ රැස් විය. ඒ අධිකරණය විනිශ්චය කරනු ලබන කල්හි කෙළවරක් නැති කථා උපදිත්. කියන ලද එකකවත් අර්ථය නො දැනෙයි. ඉක්බිති ආයුෂ්මත් රේවත තෙරණුවෝ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. අප විසින් මේ අධිකරණය විනිශ්චය කරනු ලබන කල්හි කෙළවරක් නැති කථා ද උපදිත්. කියන ලද එකක හෝ අර්ථය නො දැනෙයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් සඞ්ඝයා මේ අධිකරණය උබ්බාහිකාවෙන් (සම්මත භික්‍ෂූන් පමණක් බිණීම හා අසම්මත භික්‍ෂූන් නො බිණීම යන ක්‍රමයෙන්) සන්හිඳුවන්නේ ය. (යනුයි.) පෙරදිග වැසි භික්‍ෂූන් අතුරෙන් ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවෝ ද ආයුෂ්මත් සාළහ තෙරණුවෝ ද, ආයුෂ්මත් ඛුජ්ජසොභිත තෙරණුවෝ ද ආයුෂ්මත් වාසභගාමික තෙරණුවෝ ද (යන සතරනම හා) පාවාතුවරවැසි භික්‍ෂූන් අතුරෙන් ආයුෂ්මත් රේවත තෙරණුවෝ ද සාණවාසී ආයුෂ්මත් සම්භූත තෙරණුවෝ ද, ආයුෂ්මත් කාකණ්ඩකපුත්‍ර යස තෙරණුවෝ ද ආයුෂ්මත් සුමන තෙරණුවෝ ද (යන සතරනම ද යි) ප්‍රාචීනක භික්‍ෂූන් සතරනමක් ද, පාවෙය්‍යක භික්‍ෂූන් සතරනමක් ද සඞ්ඝයා තෝරාගත්තේ ය. ඉක්බිති ආයුෂ්මත් රේවත තෙරණුවෝ සඞ්ඝයාට මෙසේ දැන්වූහ. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. අප විසින් මේ අධිකරණය විනිශ්චය කරනු ලබන කල්හි කෙළවරක් නැති කථා ද උපදිත්. කියනලද එකක හෝ අර්ථය නො දැනෙයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මේ අධිකරණය උබ්බාහිකා-වෙන් සන්හිඳුවන්නට සඞ්ඝයා ප්‍රාචීනක භික්‍ෂූන් සතරනම ද පාවෙය්‍යක භික්ෂූන් සතරනම ද සම්මත කරන්නේ ය. මේ ඥප්ති යි.

වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. අප විසින් මේ අධිකරණය විනිශ්චය කරනු ලබන කල්හි කෙළවරක් නැති කථා ද උපදිත්. කියන ලද එකක හෝ අර්ථය නො දැනෙයි. මේ අධිකරණය උබ්බාහිකාවෙන් සන්හිඳුවන්නට සඞ්ඝයා ප්‍රාචීනක භික්‍ෂූන් සතරනම ද පාවෙය්‍යක භික්‍ෂූන් සතරනම ද සම්මත කරයි. උබ්බාහිකාවෙන් මේ අධිකරණය සන්හිඳුවන්නට ප්‍රාචීනක භික්‍ෂූන් සතරනම හා පාවෙය්‍යක භික්‍ෂූන් සතරනමගේ සම්මුතිය යම් ආයුෂ්මතක්හට රුචි වේ නම් හේ නිහඬ වන්නේ ය. යමකුට රුචි නොවේ නම් හේ කියන්නේ ය.

සම්මතා සඞ්ඝෙන චත්තාරො පාචීනකා භික්ඛූ චත්තාරො පාවෙය්‍යකා භික්ඛූ උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති

21. තෙන ඛො පන සමයෙන අජිතො නාම භික්ඛු දසවස්සො සඞ්ඝස්ස පාතිමොක්ඛුද්දෙසකො හොති. අථ ඛො සඞ්ඝො ආයස්මන්තම්පි අජිතං සම්මන්නි ථෙරානං භික්ඛූනං ආසනපඤ්ඤාපකං. අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: කත්ථ නු ඛො මයං ඉමං අධිකරණං වූපසමෙය්‍යාමාති. අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: අයං ඛො වාලිකාරාමො රමණීයො අප්පසද්දො අප්පනිග්ඝොසො. යන්නූන මයං වාලිකාරාමෙ ඉමං අධිකරණං වූපසමෙය්‍යාමාති. අථ ඛො ථෙරා භික්ඛූ වාලිකාරාමං අගමංසු තං අධිකරණං විනිච්ඡිනිතුකාමා. අථ ඛො ආයස්මා රෙවතො සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං සබ්බකාමිං විනයං පුච්ඡෙය්‍යන්ති. ආයස්මා සබ්බකාමී සඞ්ඝං ඤාපෙසි: සුණාතු මෙ ආවුසො සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං රෙවතෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යන්ති. අථ ඛො ආයස්මා රෙවතො ආයස්මන්තං සබ්බකාමිං එතදවොච.

1. කප්පති භන්තෙ සිඞ්ගිලොණකප්පොති. කො සො ආවුසො සිඞ්ගිලොණකප්පොති. කප්පති භන්තෙ සිඞ්ගිනා ලොණං පරිහරිතුං යත්ථ අලොණකං භවිස්සති තත්ථ පරිභුඤ්ජිස්සාමීති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. සාවත්ථියා සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. සන්නිධිකාරකභොජනෙ පාචිත්තියන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං පඨමං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං පඨමං සලාකං නික්ඛිපාමි.

2. කප්පති භන්තෙ ද්වඞ්ගුලකප්පොති. කො සො ආවුසො ද්වඞ්ගුලකප්පොති. කප්පති භන්තෙ ද්වඞ්ගුලාය ඡායාය වීතිවත්තාය විකාලෙ භොජනං භුඤ්ජිතුන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති රාජගහෙ සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. විකාලභොජනෙ පාචිත්තියන්ති සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉදං දුතියං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං· ඉදං දුතියං සලාකං නික්ඛිපාමි.

උබ්බාහිකාවෙන් මේ අධිකරණය සන්හිඳුවන්නට ප්‍රාචීනක භික්‍ෂූන් සතරනම ද පාවෙය්‍යක භික්‍ෂූන් සතරනම ද සඞ්ඝයා විසින් සම්මත කරන ලදහ. සඞ්ඝයාට (එය) රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙය මෙසේ දරමි'යි.

21. එ සමයෙහි සඞ්ඝයාගේ පාමොක් උදෙසන්නෙක් වූ දසවස් ඇති අජිත නම් භික්‍ෂුනමක් වෙයි. ඉක්බිති සඞ්ඝයා ආයුෂ්මත් අජිත ස්ථවිර භික්‍ෂූන්ට අසුන් පනවන්නකු කොට සම්මත කෙළේ ය. ඉක්බිති "කොතැන දී අපි මේ අධිකරණය සන්හිඳුවමෝ දැ"යි ස්ථවිර භික්‍ෂූන්ට මේ අදහස විය. "මේ වාලිකාරාමය වනාහි සිත්කලු ය. අල්පශබ්ද ඇත්තේ ය. අල්පඝොෂ ඇත්තේ ය. අපි මේ අධිකරණය වාලිකාරාමයේ දී සන්හිඳුවමෝ නම් ඉතා යෙහෙකැ"යි. ඉක්බිති ස්ථවිර භික්‍ෂූහු ඒ අධිකරණය විනිශ්චය කරනු කැමැත්තාහු වාලිකා-රාමයට වැඩියාහ. ඉක්බිති ආයුෂ්මත් රේවත තෙරණුවෝ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. "වහන්ස, සංඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවන්ගෙන් විනය විචාරන්නෙමි." ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවෝ සඞ්ඝයාට (මෙසේ) දැන්වූහ. "ඇවැත්නි, සඞ්ඝයා මබස් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම් මම ආයුෂ්මත් රේවත තෙරුන් විසින් විනය විචාරන ලද්දෙම් විසඳන්නෙමි"යි. ඉන්පසු ආයුෂ්මත් රේවත තෙරණුවෝ ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවනට මෙය කීහ:

1. වහන්ස, සිඞ්ගිලොණකප්පය කැප වේ දැ'යි. ඇවැත්නි, ඒ සිඞ්ගිලොණකප්පය නම් කවරේ ද යි. වහන්ස, යම් තැනෙක ලුණු නැති භොජනයක් වන්නේ නම් එහි දී පරිභොග කරන්නෙමි'යි (සලකා) අඟෙකින් ලුණු පරිහරණය කරන්නට කැප වේ දැ'යි. ඇවැත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්‍ෂෙප කරන ලද ද යි. සැවැත්නුවර දී ය. සූත්‍රවිභඞ්ගයෙහි යැ යි. කවර ඇවතකට පැමිණේ දැයි. සන්නිධිකාරක භොජනයෙහි පචිති ඇවැතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ පළමු වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරනලදි. මෙසේ ද මේ වස්තුව ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෘශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ පළමු සලාකය බහාතබමි.

2. වහන්ස, අඞ්ගුලකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ අඞ්ගුලකප්පය නම් කවරේ ද යි. වහන්ස, සෙවණැල්ල දැඟුලක් ඉක්මගිය කල්හි විකාලයෙහි භොජනය වළඳන්නට කැප වේ දැ'යි. ඇවත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්‍ෂෙප කරන ලද ද යි. රජගහ නුවර දී ය. සූත්‍රවිභඞ්ගයෙහි යැ'යි. කවර ඇවතකට පැමිණේ ද යි. විකාලභොජන යෙහි පචිති ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා, මේ දෙවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදි. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෘ ශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ දෙවැනි සලාකය බහාතබමි.

3. කප්පති භන්තෙ ගාමන්තරකප්පොති. කො සො ආවුසො ගාමන්තරකප්පොති. කප්පති භන්තෙ ඉදානි ගාමන්තරං ගමිස්සාමීති භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං භොජනං භුඤ්ජිතුන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. සාවත්ථියා සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. අනතිරිත්තභොජනෙ පාචිත්තියන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං තතියං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං තතියං සලාකං නික්ඛිපාමි.

4. කප්පති භන්තෙ ආවාසකප්පොති. කො සො ආවුසො ආවාසකප්පොති. කප්පති භන්තෙ සම්බහුලා ආවාසා සමානසීමා නානුපොසථං කාතුන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. රාජගහෙ උපොසථසංයුත්තෙති. කිං ආපජ්ජතීති. විනයාතිසාරෙ දුක්කටන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං චතුත්ථං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං ඉදං චතුත්ථං සලාකං නික්ඛිපාමි.

5. කප්පති භන්තෙ අනුමතිකප්පොති. කො සො ආවුසො අනුමතිකප්පොති. කප්පති භන්තෙ වග්ගෙන සඞ්ඝෙන කම්මං කාතුං ආගතෙ භික්ඛූ අනුජානිස්සාමාති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. චම්පෙය්‍යකෙ විනයවත්ථුස්මින්ති. කිං ආපජ්ජතීති. විනයාතිසාරෙ දුක්කටන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං පඤ්චමං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං පඤ්චමං සලාකං නික්ඛිපාමි.

6. කප්පති භන්තෙ ආචිණ්ණකප්පොති. කො සො ආවුසො ආචිණ්ණකප්පොති. කප්පති භන්තෙ ඉදං මෙ උපජ්ඣායෙන අජ්ඣාචිණ්ණං ඉදං මෙ ආචරියෙන අජ්ඣාචිණ්ණං තං අජ්ඣාචරිතුන්ති. ආචිණ්ණකප්පො ඛො ආවුසො එකච්චො කප්පති එකච්චො න කප්පතීති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං ඡට්ඨං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං ඡට්ඨං සලාකං නික්ඛිපාමි.

3. වහන්ස, ගාමන්තරකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ ගාමන්තර කප්පය නම් කවරේ ද යි. වහන්ස, දැන් අතිත් ගමකට යන්නෙමි යි (සලකා) වළඳා අවසන් වූ පවාරණය කළ භික්ෂුව විසින් අයිරිත් නො කළ භොජනය වළඳන්නට කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වේ යයි. කොතැන දී ප්‍රතික්ෂෙපකරන ලද ද යි. සැවැත්නුවර දී ය. සුත්තවිභඞ්ගයෙහි යැ යි. කවර ඇවැතකට පැමිණේ ද යි. අනතිරිත්තභොජනයෙහි පචිති ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ තෙවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙහි බැහැර කරන ලද්දකි. ශාස්තෘශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින් මේ) තෙවැනි සලාකය බහා තබමි.

4. වහන්ස, ආවාසකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ ආවාසකප්පය නම් කවරේ ද යි. වහන්ස, සමාන සීමාවක් ඇති බොහෝ වූ ආවාසයන්හි වෙන් වෙන් ව පොහොය කිරීම කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්ෂෙප කරන ලද ද යි. රජගහ නුවර දී ය. උපොසථසංයුත්තයෙහි යැ යි. කවර ඇවැතකට පැමිණේ ද යි. විනය ඉක්මවීමෙහි දුකුළා ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ සිවුවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෘශාසනයෙන් ඉවත්කරන ලද්දකි. (එහෙයින්) මේ සිවුවැනි සලාකය බහාතබමි.

5. වහන්ස, අනුමතිකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ අනුමතිකප්පය නම් කවරේ ද යි. වහන්ස, භික්ෂූන් පැමිණි කල්හි අනුදන්නෙමු'යි (සලකා) වර්ග වූ සඞ්ඝයා විසින් කර්මයක් කිරීමට කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්ෂෙප කරනලද ද යි. චම්පානුවර දී ය. (චම්පෙය්‍යක්ඛන්ධකයෙහි) විනය වස්තුවෙහි යැ යි. කවර ඇවතකට පැමිණේ ද යි. විනය ඉක්මවීමෙහි දුකුළා ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ පස්වැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෘශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ පස්වැනි සලාකය බහාතබමි.

6. වහන්ස, ආචිණ්ණකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ ආචිණ්ණකප්පය නම් කවරේ ද යි. වහන්ස, මෙය මාගේ උපාධ්‍යායයන් වහන්සේ විසින් පුරුදුකරන ලදී. මෙය මාගේ ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් පුරුදු කරන ලද යි (සලකා) එහි හැසිරෙන්නට කැප වේ ද යි. ඇවැත්නි, ඇතැම් ආචිණ්ණකප්පයක් කැප වෙයි. ඇතැම් ආචිණ්ණකප්පයක් නො කැප වෙයි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා, මේ සවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි, විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෘශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ සවැනි සලාකය බහාතබමි.

7. කප්පති භන්තෙ අමථිතකප්පොති. කො සො ආවුසො අමථිතකප්පොති. කප්පති භන්තෙ යං තං ඛීරං ඛීරභාවං විජහිතං අසම්පත්තං දධිභාවං, තං භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං පාතුන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. සාවත්ථියා සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. අනතිරිත්තභොජනෙ පාචිත්තියන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං සත්තමං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං සත්තමං සලාකං නික්ඛිපාමි.

8. කප්පති භන්තෙ ජලොගිං පාතුන්ති. කො සො ආවුසො ජලොගීති. කප්පති භන්තෙ යා සා සුරා අසුත්තා අසම්පත්තා මජ්ජභාවං, සා පාතුන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. කොසම්බියං සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. සුරාමෙරයපානෙ පාචිත්තියන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං අට්ඨමං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං අට්ඨමං සලාකං නික්ඛිපාමි.

9. කප්පති භන්තෙ අදසකං නිසීදනන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. සාවත්ථියා සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. ඡෙදනකෙ පාචිත්තියන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං නවමං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං නවමං සලාකං නික්ඛිපාමි.

10. කප්පති භන්තෙ ජාතරූපරජතන්ති. නාවුසො කප්පතීති. කත්ථ පටික්ඛිත්තන්ති. රාජගහෙ සුත්තවිභඞ්ගෙති. කිං ආපජ්ජතීති. ජාතරූපරජතපටිග්ගහණෙ පාචිත්තියන්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං දසමං වත්ථුං සඞ්ඝෙන විනිච්ඡිතං. ඉතිපිදං වත්ථුං උද්ධම්මං උබ්බිනයං අපගතසත්ථුසාසනං. ඉදං දසමං සලාකං නික්ඛිපාමි.

7. වහන්ස, අමථිතකප්පය කැප වේ ද යි. ඇවැත්නි, ඒ අමථිතකප්පය නම් කවරේ ද යි. වහන්ස, යම් කිරක් කිරිබව හළේ ද දීබවට නො පැමිණියේ ද අයිරිත් නො කළ ඒ කිරි (දන් වළඳා) අවසන් ව පවාරණය කළ භික්ෂුව විසින් බීමට කැප වෙයි ද යි. ඇවැත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්‍ෂෙපකරන ලද ද යි. සැවැත් නුවර දී ය. සුත්තවිභඞ්ගයෙහි යැ යි. කවර ඇවතකට පැමිණේ ද යි. අනතිරිත්ත භොජනයෙහි පචිති ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ සත්වැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්වය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෲශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ සත්වැනි සලාකය බහාතබමි.

8. වහන්ස, ජලොගිය බොන්නට කැප වේ ද යි. ඇවත්නි, ඒ ජලොගිය නම් කවරේ ද යි. වහන්ස, යම් සුරාවක් නො පැසුණා ද, මද්‍ය බවට නො පැමිණියා ද එය බොන්නට කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වෙයි. කොතැන දී ප්‍රතික්‍ෂෙප කරන ලද ද යි. කොසඹෑ නුවර දී ය. සුත්තවිභඞ්ගයෙහි යැ යි. කවර ඇවතකට පැමිණේ ද යි. රහමෙර පීමෙහි පචිති ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ අටවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්වය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි, ශාස්තෲශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ අටවැනි සලාකය බහාතබමි.

9. වහන්ස, දහවලු රහිත නිසීදනය කැප වේ ද යි. ඇවැත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්‍ෂෙප කරන ලද ද යි. සැවැත් නුවර දී ය. සුත්තවිභඞ්ගයෙහි ය යි. කවර ඇවතකට පැමිණේ ද යි. සිඳිය යුත්තෙහි පචිති ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ නවවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්වය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෲශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ නවවැනි සලාකය බහාතබමි.

10. වහන්ස, රන්රිදී කැප වේ ද යි. ඇවත්නි, නො කැප වේ යැ යි. කොතැන දී ප්‍රතික්‍ෂෙප කරන ලද ද යි. රජගහ නුවර දී ය. සුත්තවිභඞ්ගයෙහි යැ යි. කවර ඇවතකට පැමිණේ ද යි. රන්රිදී පිළිගැනීමේ පචිති ඇවතට යැ යි. වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ දසවැනි වස්තුව සඞ්ඝයා විසින් විනිශ්වය කරන ලදී. මෙසේ මේ වස්තුව ද ධර්මයෙන් බැහැර කරන ලද්දකි. විනයෙන් බැහැර කරන ලද්දකි. ශාස්තෲශාසනයෙන් ඉවත් කරන ලද්දකි. (එහෙයින්) මේ දශවැනි සලාකය බහාතබමි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමානි දස වත්ථූනි සඞ්ඝෙන විනිච්ඡිතානි. ඉතිපිමානි දසවත්ථූනි උද්ධම්මානි උබ්බිනයානි අපගතසත්ථුසාසනානීති. නිහතමෙතං ආවුසො අධිකරණං සන්තං වූපසන්තං සුවූපසන්තං. අපි ච මං ත්වං ආවුසො සඞ්ඝමජ්ඣෙපි ඉමානි දසවත්ථූනි පුච්ඡෙය්‍යාසි තෙසං භික්ඛූනං සඤ්ඤත්තියාති.

22. අථ ඛො ආයස්මා රෙවතො ආයස්මන්තං සබ්බකාමිං සඞ්ඝමජ්ඣෙපි ඉමානි දසවත්ථූනි පුච්ඡි. පුට්ඨො පුට්ඨො ආයස්මා සබ්බකාමී විස්සජ්ජෙසි. ඉමාය ඛො පන විනයසඞ්ගීතියා සත්ත භික්ඛුසතානි අනූනානි අනධිකානි අහෙසුං. තස්මායං විනයසඞ්ගීති සත්තසතිකාති වුච්චතීති.

## සත්තසතිකක්ඛන්ධකං.

ඉමම්හි ඛන්ධකෙ වත්ථූ පඤ්චවීසති.

තස්සුද්දානං:

1. දසවත්ථූනි පුරෙත්වා කම්මං දූතෙන පාවිසි
   චත්තාරො පුන රූපඤ්ච කොසම්බී ච පාවෙය්‍යකො.

2. මග්ගා සොරෙය්‍ය සඞ්කස්සං කණ්ණකුජ්ජං උදුම්බරං
   අග්ගළං සහජාතං ච අකස්සායි කතන්නු ඛො මයං.

3. පත්තනාවාය උජ්ජවී රහොසි උපනාමයං
   ගරූ සඞ්ඝො ච වෙසාලී මෙත්තා සඞ්ඝො උබ්බාහිකාති.

4. කම්මං ච පරිවාසො ච සමුච්චයො සමථොපි ච
   ඛුද්ද සෙනාසනං භෙද වත්තුපොසථ භික්ඛුනී
   පඤ්චසතී සත්තසතී ඛන්ධකා චූලවග්ගම්හි

[වුත්තා එකාදසමා සියුං]

## චූලවග්ගො නිට්ඨිතො.

වහන්ස, සඞ්ඝයා මබස් අසාවා. මේ දශවස්තූහු සඞ්ඝයා විසින් විනිශ්චය කරන ලදහ. මෙසේ ද මේ දශවස්තූහු ධර්මයෙන් බැහැර කරන ලද්දහ, විනයෙන් බැහැර කරන ලද්දහ, ශාස්තෘ ශාසනයෙන් ඉවත් කරන ලද්දහ. ඇවැත්නි, මේ අධිකරණය සිඳින ලදී. ශාන්ත කරන ලදී. සන්හිඳුවන ලදී. මනාව සන්හිඳුවන ලද්දේ ය. ඇවැත්නි, තව ද නුඹ වහන්සේ සඞ්ඝයා මැද ද ඒ භික්ෂූන්ගේ දැනගැනීම පිණිස මේ දශවස්තූන් අසන්නහු නම් මැනවැ යි.

22. ඉක්බිති ආයුෂ්මත් රේවත තෙරණුවෝ සඟමැද ද ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවන්ගෙන් මේ දශවස්තූන් විචාළහ. විචාරන ලද විචාරන ලද ආයුෂ්මත් සබ්බකාමී තෙරණුවෝ විසඳූහ. මේ විනය සංගීතියට අඩු නැති ව වැඩි නැති ව සත්සියක් භික්ෂූහු වූහ. එහෙයින් මේ විනය සංගීතිය සත්තසතිකා යි කියනු ලැබේ යි.

## දෙලොස්වැනි සත්තසතිකක්ඛන්ධක යි.

මේ ඛන්ධකයෙහි වස්තු පස්විස්සෙකි.

එහි උද්දානය:

1. දශවස්තු, (ලෝ තලියක් ජලයෙන්) පිරවීම, (පටිසාරණීය) කර්මය, අනුදූතයකු සමග පිවිසීම, උපක්ලෙශ සතර, රන්රිදී පිළිබඳ දෙශනා, කොසඹෑ නුවරට පැමිණීම, පාවෙය්‍යක භික්ෂූහු,
2. දීර්ඝ මාර්ගය, සොරෙය්‍ය, සඞ්කස්ස, කණ්ණකුජ්ජ, උදුම්බර, අග්ගළ, සහජාත යන නගරවලට පැමිණීම, වෙසාලික භික්ෂූන් ඒ පුවත ඇසීම, අපි කවරකු පක්ෂ කරගනිමු දැ යි සිතීම,
3. පැමිණි නැවකින් උඩුගං බලා යෑම, රහොගත ව විසීම, පිරිකර එළවීම, ගුරුන් ඇසුරෙහි විසීම, සඞ්ඝයා විසාලා නුවරට පැමිණීම, මෙත්තාවිහාරය, සඞ්ඝයා රැස්වීම, භික්ෂූන් තෝරාගැනීම ද (යන වස්තූහු වෙත්.)
4. කම්ම, පරිවාස, සමුච්චය, සමථ, ඛුද්දක (වත්ථු), සෙනාසන (සඞ්ඝ) භෙද, වත්ත, උපොසථ (පාතිමොක්ඛට්ඨපන), භික්ඛුනී, පඤ්චසතික, සත්තසතික යැ යි චුල්ලවග්ගයෙහි කියන ලද ඛන්ධකයෝ දොළොසෙක් වෙත්.

## චුල්ලවග්ග නිමි.

# ගාථාදිපාදානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| අදුට්ඨස්ස හි යො දුබ්භෙ | 316 |
| අන්ධකාරෙන ඔනද්ධා | 570 |
| අප්පමාණො බුද්ධො | 16 |
| අපාදකෙහි මෙ මෙත්තං | 16 |
| ආපායිකො නෙරයිකො | 322 |
| එවමෙව තථාගතං | 316 |
| තතො වාතාතපො ඝොරො | 130 |
| තාදිසං මිත්තං කුබ්බෙථ | 316 |
| දණ්ඩෙනෙකෙ දමයන්ති | 294 |
| දදෙය්‍ය උජුභූතෙසු | 132 |
| පණ්ඩිතො'ති සමඤ්ඤාතො | 316 |
| ඵලං වෙ කදලිං හන්ති | 268 |
| මහාවරාහස්ස මහිං විකුබ්බතො | 312 |
| මා කුඤ්ජර නාගමාසදෙ | 294 |
| මා ච මන්දෙ මා ච පමාදෙ | 294 |
| මා ජාතු කොචි ලොකස්මිං | 316 |
| මා මං අපාදකො හිංසි | 16 |
| මිච්ඡාජීවෙන ජීවන්ති | 570 |
| යස්සන්තරතො න සන්ති කොපා | 256 |
| යෙහි උපක්කිලෙසෙහි | 570 |
| යො වෙ න බ්‍යථති පත්වා | 312 |
| රාගදොසපරික්කිලිට්ඨා | 570 |
| විරූපක්ඛෙහි මෙ මෙත්තං | 16 |
| විහාරදානං සඞ්ඝස්ස | 132 |
| විහාරෙ කාරයෙ රම්මෙ | 132 |
| සතං හත්ථී සතං අස්සා | 160 |
| සබ්බදා වෙ සුඛං සෙති | 162 |
| සබ්බා ආසත්තියො ඡෙත්වා | 162 |
| සබ්බෙ සත්තා සබ්බෙ පාණා | 16 |
| සමුද්දං විසකුම්භෙන | 316 |
| සීතං උණ්හං පටිහන්ති | 130 |
| සුකරං සාධුනා සාධු | 304 |
| සුඛා සඞ්ඝස්ස සාමග්ගී | 324 |
| සුඡන්නමතිවස්සති | 434 |
| සුරං පිවන්ති මෙරයං | 570 |
| සො පමාදමනුචිණ්ණො | 316 |

# සඤ්ඤානාමානුක්කමණිකා


**අ** පිට්ඨඞ්කා

අග්ගාළ පුරං 578
අග්ගාළවචේතිය 208
අචිරවතී 428, 432
අජාතසත්තු 258, 266, 276
අජාතසත්තුනා 550
අජිතො 592
අජිතො කෙසකම්බලො 18
අඩ්ඪකාසී 526
අනාථපිණ්ඩිකං 166
අනාථපිණ්ඩිකස්ස 162, 334, 490, 568
අනාථපිණ්ඩිකො 158, 162, 166
අනුපියං 246, 256
අනුපියායං 246, 256
අනුරුද්ධො 246, 252
අම්බලට්ඨිකායං 550
අවන්තිදක්ඛිණාපථකානං 574
අස්සජිපුනබ්බසුකා 204
අහො ගඞ්ග (පබ්බතෙ) 574

**ආ**

ආනන්දෙ 20, 252, 286, 304, 424, 470, 478, 548, 550
ආනන්දස්ස 584
ආළවී 208, 222

**උ**

උත්තරො 584
උදයී 494
උදුම්බරං 578
උදෙනො 558
උප්පලවණ්ණාය 488
උපනන්ද 196, 574
උපාලි 198, 252, 454, 548, 550
උරුවෙලකස්සපෙ 114

**එ**

එරාපථං 14

**ක**

කකුධො 258, 260
කටමොරකතිස්සො 296

**ක** පිට්ඨඞ්කා

කණ්ණකුජ්ජං 578
කණ්හාගොතමකං 14
කපිලවත්ථුස්මිං 468
කලන්දක නිවාපෙ 2, 128, 266, 570
කලන්ද පුත්තං 548
කාකණ්ඩකපුත්ත 566, 568, 574, 578
කිම්බිලො 252
කීටාගිරි 204
කුසිනාරං 544
කූටාගාරසාලා 40, 170, 468
කොකනදෙ 68
කොකාලිකො 296, 308
කොමාරභච්චො 42
කොලියපුත්තො 258
කොසම්බී 256, 266, 558, 574, 596
කොසලෙසු 100

**ඛ**

ඛණ්ඩදෙවියා පුත්තො 296
ඛුජ්ජසොභිතං 590

**ග**

ගඞ්ගා 428, 432
ගයාසීසං 306
ගාමණී 570, 572
ගිජ්ඣකූටස්ස 286
ගිරග්ගසමජ්ජං 10
ගොතමී 468, 472, 480
ගොතමො 544
ගොධිපුත්තො 272, 274

**ඝ**

ඝොසිතාරාමෙ 256, 562

**ච**

චම්පෙය්‍යකෙ 594

**ඡ** පිට්ඨඞ්කා

ඡන්නො 558, 562
ඡබ්බග්ගියා 2, 10, 12, 24, 172, 348.
ඡබ්‍යාපුත්තං 14

**ජ**

ජීවකම්බවනෙ 550
ජීවකො 42
ජෙතවනෙ 334, 490, 568
ජෙතස්ස (රාජකුමාරස්ස) 168

**ත**

තිමි 430, 434
තිමිඞ්ගලො 430, 434
තිමිරපිඞ්ගලො 430, 434
තෙකුල 100

**ද**

දක්ඛිණාගිරිස්මිං 556
දෙවදත්ත 252, 256, 258, 266, 272, 274, 276, 296.

**ධ**

ධනියං 548

**න**

නාලන්දං 550
නාලාගිරි 292
නිග්‍රොධාරාමෙ 468, 480
නිගණ්ඨො නාතපුත්තො 18

**ප**

පකුධොකච්චායනො 18
පසෙනදිකොසල 200
පාචීනකා 582
පාවාය 544
පාවෙය්‍යකා 574, 582
පිණ්ඩොලභාරද්වාජො 18
පුබ්බාරාමෙ 424
පුරාණො 556
පූරණකස්සපො 18

**බ** පිට්ඨඞ්කා

බ්‍රහ්මජාලං 550
බ්‍රහ්මදත්තං 550
බිම්බිසාර 12, 158, 164, 278

**භ**

භග්ගා 68
භග්ගෙසු 72
භගු 252
භද්දිය 248, 250, 252, 256
භාරද්වාජ 20
භෙසකලාවනෙ 68

**ම**

මක්ඛලිගොසාලො 18
මණිචූළකො 570, 572
මහාකස්සපො 544, 548, 550
මහානාමො 246
මහාපජාපතී 468, 472, 480
මහාමොග්ගල්ලාන 18, 258, 260, 426.
මහාවනෙ 40, 468, 566
මහී 428, 432
මාගධකානි 258, 260
මාගධස්ස 12
මාගධා-සෙනියො 158, 164
මිගාරමාතුපාසාදෙ 424

**ය**

යමුනා 428, 432
යමෙළු 100
යස 566, 568, 574, 578

**ර**

රාජගහ 2, 10, 128, 158, 222, 266, 270, 274, 276, 292, 300, 304, 548, 550, 556, 570, 574, 594, 596.
රාජගහකො සෙට්ඨී 128, 130
රෙවත 576, 578, 590, 598

ව පිට්ඨඞ්කා

වග්ගුමුදතීරියෙ 550
වජ්ජිපුත්තකා 566, 574, 580
වජ්ජීසු 566
වඩ්ඪස්ස ලිච්ඡවිස්ස 66
වාලිකාරාමෙ 592
වාසභගාමිකං 590
විරූපක්ඛං 14
විසාඛා 72
විසාඛා මිගාරමාතා 200
වෙදෙහිපුත්තෙන 550
වෙසාලි 40, 42, 68, 170, 172, 468, 470, 490, 548, 550, 566, 580, 586.
වෙසාලිකා 566, 574, 580.
වෙළුවන 2, 128, 222, 266, 556, 570.

ස

සක්කෙසු 468
සඞ්කස්සං 576, 578
සඤ්ජයො බෙල්ලට්ඨිපුත්තො 18
සඤ්ජිකාපුත්තං 68
සබ්බකාමී 586, 588, 598

ස පිට්ඨඞ්කා

සම්භූත 574, 578, 586, 588, 590
සමුද්දදත්තො 296
සරභූ 428 432,
සහජාති 578, 582
සාකියානීහි 470
සාණවාසී 574, 578
සාමඤ්ඤඵලං 550
සාරිපුත්ත 104
සාරිපුත්ත–මොග්ගල්ලානා 204
සාවත්ථී 72, 100, 166, 196, 204, 334, 424, 488, 490, 508, 526, 568, 594. 596,
සාළ්හ 582, 590
සීතවනං 162
සීවකො–යක්ඛො 160
සුංසුමාරගිරෙ 68
සුදත්ත 162
සුදින්නං 548
සුප්පියං 550
සුභද්දෙ 544
සුමනං 590
සොරෙය්‍ය 576, 578

# විසෙසපදානුක්කමණිකා


| අ | පිට්ඨංකා |
|---|---|
| අක්කවාටකා | 132 |
| අකරණීයානි | 520, 530 |
| අකාරකො | 84 |
| අකාලො | 160 |
| අකුප්ප | 464 |
| අක්කොසිතබ්බො | 474 |
| අක්ඛරිකාය | 114 |
| අක්ඛෙත | 114 |
| අග්ගඛුරං | 176 |
| අග්ගපිණ්ඩං | 174 |
| අග්ගළවට්ටි | 44, 48, 108, 208 |
| අග්ගළවට්ටිකං | 132 |
| අග්ගාසනං | 174 |
| අග්ගිසාලං | 400 |
| අග්ගිට්ඨානං | 46 |
| අග්ගිසාලා | 168, 340, 366 |
| අග්ගොදකං | 174 |
| අඞ්ගරාගං | 10, 502 |
| අඞ්ගරාගමුඛරාගං | 502 |
| අඞ්ගජාතං | 490 |
| අඞ්ගුලිමුද්දිකං | 8 |
| අඞ්ගුලියො | 86 |
| අචක්ඛුස්සා | 134 |
| අච්චයො | 280 |
| අච්චුස්සන්නං | 144 |
| අච්ඡචම්මං | 218 |
| අච්ඡින්දෙන | 456 |
| අච්ඡින්නදසානි | 504 |
| අජකා | 154 |
| අජිනප්පවෙණි | 182, 200 |
| අජ්ජතනා | 522 |
| අජ්ඣාචරිතුං | 580 |
| අජ්ඣාචිණ්ණං | 580, 594 |
| අජ්ඣාපජ්ජන්තං | 442 |
| අජ්ඣාපත්ති | 442 |
| අජ්ඣාපන්නාය | 472 |
| අජ්ඣොකාසෙ | 162, 148 |
| අඤ්ජනිං | 90 |
| අඤ්ජලිකම්මං | 472 |
| අඤ්ඤතිත්ථියා | 480 |
| අඤ්ඤපටිවෙධො | 430 |
| අට්ටීයමානො | 562 |
| අට්ඨපදෙ | 112 |

| අ | පිට්ඨංකා |
|---|---|
| අට්ඨපාදකං | 140 |
| අට්ඨානෙ | 4 |
| අට්ඨිමයං | 36 |
| අට්ඨිලෙලන | 502 |
| අඩ්ඪං | 566 |
| අඩ්ඪකායිකානි | 140 |
| අඩ්ඪකුඩ්ඩකං | 146 |
| අඩ්ඪකුසි | 232 |
| අඩ්ඪපල්ලඞ්කං | 534 |
| අඩ්ඪමණ්ඩලං | 232 |
| අඩ්ඪයොගං | 128 |
| අඩ්ඪයොගෙ | 210 |
| අඩ්ඪරකං | 86 |
| අතරමානෙන | 356 |
| අතික්කන්තමානුසිකාය | 576 |
| අතිචිරං | 354, 356 |
| අතිමුත්තකමාලං | 474 |
| අතිලහුකං | 354, 356 |
| අතිසහසා | 354, 356 |
| අතිහරිතබ්බං | 346 |
| අතිහරිතුං | 46 |
| අතෙකිච්ඡා | 324, 326 |
| අත්තභාවපටිලාභො | 258 |
| අත්තවධාය | 268 |
| අත්තාදනං | 454 |
| අත්ථවසං | 374 |
| අත්ථිකානං | 166 |
| අදසකං | 566, 580 |
| අධිකරණකාරකො | 196 |
| අධිවාසනං | 164 |
| අධිගතො | 270 |
| අනගාරියං | 468 |
| අනග්ඝානි | 590 |
| අනජ්ඣාවුත්ථං | 334 |
| අනණා | 512, 516 |
| අනතික්කමනීයො | 472 |
| අනභිරති | 384 |
| අනන්තරහිතාය | 396 |
| අනාකප්පසම්පන්නා | 348 |
| අනාගාමී | 174 |
| අනාලින්දිකා | 148 |
| අනාසා | 458 |
| අතිබද්ධනියො | 142 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අනිමිත්තා | 512, 514 |
| අනිස්සරො | 504 |
| අනුද්දකො | 568 |
| අනුපබ්බජ්ජ | 348, 398 |
| අනුපාදිසෙසාය | 432 |
| අනුපුබ්බකිරියා | 430 |
| අනුපුබ්බනින්නො | 428 |
| අනුපුබ්බපටිපද | 430 |
| අනුපුබ්බපබ්භාරො | 428 |
| අනුපුබ්බපොණො | 428 |
| අනුපුබ්බසික්ඛා | 430 |
| අනුමතිකප්පො | 566, 580 |
| අනුවාතං | 34 |
| අනුවාතො | 232 |
| අනුවාදං | 524 |
| අනුව්‍යඤ්ජනසො | 458 |
| අනොවස්සකො | 344 |
| අන්තරාමග්ගෙ | 166 |
| අන්තරාමුත්තකො | 194 |
| අන්තරාවොසානං | 314 |
| අන්තෙපුරං | 276 |
| අන්තෙවාසිනී | 488 |
| අන්තොපූතිං | 426 |
| අන්ධකාරෙ | 164 |
| අන්ධකාරො | 160, 162 |
| අපගතකාළකං | 162 |
| අපගතසඤ්ඤුසාසතං | 594 |
| අපචයස්ස | 296 |
| අපචයාය | 482 |
| අපඤ්ඤත්තා | 554 |
| අපමාරො | 512, 516 |
| අපරජ්ජු | 522 |
| අපරජ්ජුගතාය | 194 |
| අපරප්පච්චයො | 164, 282 |
| අපරිසංසෙන්තා | 338 |
| අපරිසඞ්කිතං | 300 |
| අපරිසුද්ධඤාණදස්සනො | 264, 288 |
| අපරිසුද්ධධම්මදෙසනො | 262, 288 |
| අපරිසුද්ධවෙය්‍යාකරණො | 264, 288 |
| අපරිසුද්ධසීලො | 288 |
| අපරිසුද්ධාජීවො | 262, 288 |
| අපස්සෙනඵලකං | 220, 338, 366, 380, 400 |
| අපාදකො | 16 |
| අපිධානං | 106 |
| අපෙතජාතරූපරජතා | 566, 572 |
| අප්පතිමංසෙන | 456 |
| අප්පනිග්ඝොසං | 166 |
| අප්පපුරිසකානි | 476 |
| අප්පමත්තකවිස්සජ්ජකං | 230 |
| අප්පහරිතෙ | 358 |
| අප්පාකිණ්ණං | 166 |
| අප්පාණකෙ | 358 |
| අප්පාතඞ්කං | 68 |
| අප්පාබාධං | 68 |
| අප්පොස්සුක්කා | 248 |
| අප්පොයෙන්ති | 114 |
| අබීජං | 14 |
| අබ්භං | 568 |
| අබ්භානාරහො | 384 |
| අභබ්බ | 278 |
| අභික්කමන්තන | 128 |
| අභිරූපො | 292 |
| අභිසන්නකායා | 42 |
| අමථිතකප්පො | 566, 580 |
| අමනුස්සා | 160 |
| අය්‍යකා | 200 |
| අය්‍යපුත්ත | 168 |
| අය්‍යා | 478 |
| අය්‍යො | 164, 572 |
| අරක්ඛියා | 290 |
| අරණිසහිතං | 358, 360, 362 |
| අරහං | 174 |
| අලං | 506 |
| අලක්ඛිකො | 294 |
| අලොහිතා | 512, 514 |
| අල්ලවණො | 62 |
| අල්ලෙන | 336, 342 |
| අල්ලෙහි | 34 |
| අවක්කාරපාති | 358 |
| අවගණ්ඩකාරකං | 352 |
| අවඞ්ගං | 502 |
| අවන්දියො | 490 |
| අවලෙඛනකට්ඨං | 108, 374 |
| අවලෙඛනපිඨරො | 108, 374 |
| අවස්සුතං | 426 |
| අවස්සුතො | 432 |
| අවාතපානකා | 134 |
| අවිප්පටිසාරකරං | 456 |
| අවිප්පටිසාරො | 460 |
| අවිසය්හං | 358 |

| අ | පිට්ඨඞ්කා |
|---|---|
| අවිස්සජ්ජියානි | 202 |
| අවෙභඞ්ගියං | 206 |
| අවෙභඞ්ගියානි | 206 |
| අසක්‍යපුත්තියධම්මො | 572 |
| අසඞ්කිලිට්ඨං | 262, 290 |
| අසඞ්ඝට්ටනෙත්ථ | 338 |
| අසන්දිද්ධො | 312 |
| අසභාගවුත්තිකා | 176 |
| අසමුච්ඡෙද | 554 |
| අසම්භොගො | 66 |
| අසල්ලෙක්ඛෙත්වා | 354 |
| අසිචම්මං | 280 |
| අසුචි | 432 |
| අසුත්තා | 580 |
| අස්සත්ථරං | 182, 200 |
| අස්සතරි | 268 |
| අස්සද්ධා | 276 |
| අස්සමණධම්මො | 572 |
| අස්සා | 160 |
| අස්සුකෙන | 554 |
| අස්සුමුඛී | 468 |
| අහි | 16, 132, 148 |
| අහිච්ඡත්තා | 334 |
| අහිමෙඛලිකාය | 258 |
| අහිරාජකුලානි | 14 |
| අංසකූටෙන | 504 |
| අංසබද්ධකො | 36 |
| අංසබන්ධකො | 232 |

| ආ | |
|---|---|
| ආගතාගමො | 576, 578 |
| ආගතානාගතස්ස | 130 |
| ආචමනකුම්භි | 110, 340, 366, 390 |
| ආචමනපාදුකං | 110 |
| ආචමනසරාවකො | 110 |
| ආචයාය | 482 |
| ආචාරවිපත්ති | 438 |
| ආචිණ්ණකප්පො | 566, 580 |
| ආජීවකො | 544 |
| ආජීවවිපත්ති | 438 |
| ආණිචොළකං | 510 |
| ආතාපිනී | 480 |
| ආතාපී | 562 |
| ආදාසෙ | 10 |
| ආදිස්ස ආදිස්ස | 198 |

| ආ | පිට්ඨඞ්කා |
|---|---|
| ආදීනවං | 162 |
| ආදෙය්‍යවචො | 166 |
| ආදෙසනාපාටිහාරියානුසාසනියා- | 310 |
| ආනන්තරිකං | 348 |
| ආනිසංසං | 162 |
| ආනුපුබ්බිකථං | 162 |
| ආපණං | 282, 284, 502 |
| ආපත්තිගාමිනියො | 486 |
| ආපත්තිවුට්ඨානතා | 462 |
| ආපාදිකා | 472, 556 |
| ආමලකවට්ටිකපීඨං | 138 |
| ආයතකෙන | 428 |
| ආයොග | 90 |
| ආරඤ්ඤිකා | 298, 300, 576 |
| ආරඤ්ඤිකෙන | 360 |
| ආරාමවත්ථු | 202 |
| ආරාමිකපෙසකො | 234 |
| ආරාමූපචාරෙ | 76 |
| ආරාමෙ | 76, 166 |
| ආරාමො | 202 |
| ආලකමන්දා | 146 |
| ආලම්බනබාහං | 36, 52, 44, 48, 108, 146, 150, |
| ආලින්දං | 148 |
| ආලොකසන්ධිකණ්ණභාගා | 338, 380, 398 |
| ආලොකසන්ධිකණ්ණමත්තෙන | 208, 210 |
| ආලොකිතෙන | 128 |
| ආලොකො | 160, 162 |
| ආලොපො | 352 |
| ආවරණං | 492 |
| අවසථචීවරං | 510 |
| ආවාසකප්පො | 566, 580 |
| ආවාහො | 158 |
| ආවිඤ්ඡනච්ඡිද්දං | 44, 48, 108 |
| ආවිඤ්ඡන රජ්ජුං | 44, 48, 108, 132 |
| ආවෙණිං | 320, 322 |
| ආවෙසනවිත්ථකං | 36 |
| ආවෙළකං | 112 |
| ආසත්තියො | 162 |
| ආසනපඤ්ඤාපකං | 592 |
| ආසනෙ | 162, 166 |

| ආ | පිට්ඨඞ්කා |
|---|---|
| ආසන්දි | 114, 182, 200 |
| ආසන්දිකො | 136 |
| ආහච්චපාදකො | 136 |
| ආළිං | 476 |

| ඉ | |
|---|---|
| ඉස්සාසං | 142, 144 |
| ඉච්ඡාගතං | 258, |
| ඉට්ඨකාචයං | 36, 42, 44, 48 |
| ඉට්ඨකායො | 170 |
| ඉට්ඨකාපාකාරං | 48 |
| ඉට්ඨකාසොපානං | 36, 44, 48 |
| ඉත්ථත්තාය | 526 |
| ඉත්ථන්තරෙන | 526 |
| ඉත්ථිපණ්ඩකා | 512, 514 |
| ඉත්ථියුගන්තෙන | 526 |
| ඉද්ධං | 346 |
| ඉද්ධිපාටිහාරියං | 80 |
| ඉද්ධිපාටිහාරියානුසාසනියා | 310 |
| ඉද්ධිපාටිහාරියෙන | 258 |
| ඉද්ධිපාද | 432 |
| ඉද්ධිමා | 18 |
| ඉන්ද්‍රියානි | 432 |

| උ | |
|---|---|
| උක්කාසිකං | 6 |
| උක්කුටිකාය | 350, 352, 356 |
| උක්කුට්ඨිං | 508 |
| උක්ඛිත්තකාය | 350, 352, 356 |
| උක්ඛෙපනීයකම්මං | 574 |
| උක්ඛෙපනීයං | 384 402 |
| උක්ලාපං | 336, 340, 370, 388 |
| උග්ගවාදිනිං | 312 |
| උග්ඝාටනකිටිකං | 148 |
| උච්චවත්ථුකං | 36, 42, 48, 52 |
| උච්චාසද්ද | 286 |
| උච්ඡඞ්ග | 258 |
| උච්ඡුඛෙත්ත | 476 |
| උජ්ජග්ඝිකාය | 350, 352, 356 |
| උජ්ඣානසඤ්ඤිතා | 352 |
| උණ්ණනාභි | 16 |
| උණ්ණාභිසිං | 140, 142 |
| උණ්හකාලො | 382 |
| උතුකාලං | 194 |
| උතුනියො | 510 |

| උ | පිට්ඨඞ්කා |
|---|---|
| උතුපමාණං | 520, 530 |
| උත්තමඞ්ග | 474 |
| උත්තරත්ථරණං | 560 |
| උත්තරපාසකං | 108, 132 |
| උත්තරවාසකං | 44, 48 |
| උත්තරිභඞ්ගං | 350 |
| උත්තරිභඞ්ගානි | 158 |
| උත්තරිමනුස්සධම්මං | 20 |
| උත්තරිමනුස්සධම්මෙ | 550 |
| උත්‍රසෙනා | 256, 258, 276, 280 |
| උදකදොණිකාය | 370 |
| උදකනිද්ධමනං | 46, 48, 110 |
| උදකපොස්ස | 10 |
| උදකපටිග්ගාහකො | 350 |
| උදකවාහනරජ්ජුං | 52 |
| උදකසරාවකං | 46 |
| උදකසාටිකා | 514 |
| උදකාධානං | 46 |
| උදග්ගචිත්තං | 162, 282 |
| උදග්ගො | 300 |
| උදපානසාලායො | 168 |
| උදපානෙ | 168 |
| උදරවාතාබාධො | 104 |
| උදරං | 176 |
| උදුක්ඛලිකං | 44, 48, 108, 132 |
| උද්ධලොමිං | 182 |
| උද්ධලොමිකං | 200 |
| උද්ධුධං | 148 |
| උද්දිසන්තෙන | 198 |
| උද්දිසාපෙන්තෙන | 198 |
| උද්දෙසභත්තං | 222 |
| උද්දෙසෙන | 404 |
| උද්දොසිතො | 530 |
| උද්ධම්මං | 594 |
| උද්ධසොත | 424 |
| උන්දූරෙහි | 38, 132, 134, 148 |
| උපක්කිලෙසා | 568 |
| උපචාරකා | 276 |
| උපචිකාහි | 38, 132, 134 |
| උපජ්ඣායානං | 172 |
| උපට්ඨාකො | 584 |
| උපට්ඨානසාලං | 148, 340, 400 |
| උපට්ඨානසාලාය | 336 |
| උපට්ඨානසාලායො | 168 |
| උපදහාතබ්බා | 460 |

උ පිට්ඨඞ්කා

උපද්දුතා 202
උපනද්ධං 40
උපනික්ඛමන්තො 128
උපරිදූස්සකතං 336
උපරොපෙ 154
උපස්සයං 508, 530
උපාසකං 164
උපාහනත්ථවිකං 38
උපාහනපුඤ්ඡන චොළකං 336
උපාහනා 232, 376
උපොසථද්ධජකං 472
උපොසථ සංයුත්තෙ 594
උපොසථිකං 222
උප්පලමාලං 474
උබ්බාහිකාය 590
උබ්බිග්ගා 258, 276, 280
උබ්බිනයං 594
උභතොබ්‍යඤ්ජනකං 200, 512, 516
උභතොලොහිතකූපධානං 182
උභතොවිභඞ්ගෙ 550
උම්මිදෙදන්ති 502
උය්‍යානං 168
උරං 2
උරච්ඡදං 112
උල්ලිත්තාවලිත්තං 44, 48, 46, 134
උල්ලොකං 142
උල්ලොකා 338, 380
උසූයකා 276
උස්සඞ්කී 256, 258, 276, 280
උස්සන්නං 508, 510
උස්සොළෙහන්ති 114

ඌ

ඌරුං 2, 490

එ

එකන්තලොමිං 182
එකන්තලොමිකං 200
එකපරියාකතං 500

ඔ

ඔකාරං 162
ඔකාසං 168

ඔ පිට්ඨඞ්කා

ඔක්ඛිත්තචක්ඛුනා 350, 352, 356
ඔගුණ්ඨිතා 334
ඔගුණ්ඨිතෙන 350, 352, 356
ඔගුම්ඵෙත්වා 38, 44, 46, 134
ඔට්ඨනිල්ලෙහකං 352
ඔට්ඨො 26
ඔතරන්තානං 370
ඔත්ථරකං 42
ඔදනො 84
ඔනද්ධපීඨං 142, 510
ඔනද්ධමඤ්චං 142, 510
ඔනීතපත්තපාණිං 130, 166
ඔපිලාපෙතබ්බං 358
ඔභොගෙ 376, 388
ඔරකං 168, 276
ඔරමත්තකෙන 316
ඔරොධො 558, 560
ඔලොකනකෙන 502
ඔවටො 474
ඔවට්ටිකං 8
ඔවරකං 354
ඔවාදට්ඨපිතාය 492
ඔවාදූපසඞ්කමනං 472, 496
ඔවාදෙ 174
ඔසක්කනීයං 576
ඔසරකං 148
ඔළාරිකෙ (නිමිත්තෙ) 556
ඔළාරිකෙ (ඔභාසෙ) 556

ක

කක්ඛළං 576, 582
කච්ඡුරොගාබාධො 6
කඤ්චුකං 504
කට්ඨතාලං 132
කට්ඨමයං 36
කට්ටිස්සං 182, 200
කට්ඨෙන 372
කටච්ඡුං 356
කටච්ඡුපරිස්සාවනං 38
කටිසුත්තකං 8, 510
කඨිනං 34
කඨින මණ්ඩපං 36
කඨිනසාලා 36
කණ්ඨසුත්තකං 8

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කණ්ඨෙ | 98 |
| කණ්ණකිතා | 338, 398 |
| කණ්ණ ගූථකෙහි | 90 |
| කණ්ණමලහරණිං | 90 |
| කණ්ණා | 90 |
| කත්තරදණ්ඩා | 336, 342, 362 |
| කත්තරිකාය | 88 |
| කතකං | 72, 114 |
| කතකම්මා | 486 |
| කතිකසණ්ඨානං | 336, 342 |
| කද්දමොදකෙන | 490, 492 |
| කදලී | 268 |
| කන්දරායං | 128 |
| කප්පට්ඨිතිකං | 302, 322 |
| කප්පට්ඨො | 314 |
| කප්පියකුටියො | 168 |
| කපිසීසකං | 44, 48, 108, 132 |
| කබලාවච්ඡෙදකං | 352 |
| කබලො | 352 |
| කම්බලං | 200, 218 |
| කම්මකරෙ | 158 |
| කම්මප්පත්තායො | 486 |
| කරකටකං | 52 |
| කරණීයං | 166 |
| කලලවිත්තං | 162 282 |
| කලහකාරකො | 196 |
| කලහජාතා | 486 |
| කලාබුකං | 92 |
| කලිම්බකං | 34 |
| කවාටං | 28, 44, 48, 152 |
| කවාටපිට්ඨං | 338, 366, 380 |
| කසම්බුජාතං | 426 |
| කසම්බුජාතො | 432 |
| කසාවං | 144 |
| කහාපණං | 566 |
| කළන්දකනිවාපෙ | 556 |
| කංසපත්ථරිකා | 90 |
| කංසපාතිං | 566 |
| කංසභණ්ඩ | 90 |
| කාජං | 96 |
| කාදලිමිගපවරපච්චත්ථරං | 200 |
| කාදලිමිගපවරපච්චත්ථරණං | 182 |
| කාමානං | 162 |
| කාමෙසු | 162 |
| කායං | 2 |
| කායප්පචාලකං | 352, 356 |
| කායබන්ධනං | 232, 376 |
| කායබන්ධනානි | 500 |
| කාලං | 166 |
| කාලකා | 134 |
| කාළවණ්ණකතා (භූමි) | 398 |
| කාළවණ්ණකරණමත්තෙන | 208, 210 |
| කිබ්බිසං | 302, 322 |
| කිමඞ්ග | 452, 480 |
| කිමි | 370 |
| කිලාසො | 512, 516 |
| කුක්කුච්චං | 384, 408 |
| කුක්කුරස්ස | 268 |
| කුක්කුසං | 536 |
| කුට්ඨං | 512, 516 |
| කුඨාරි | 204, 208 |
| කුඩ්ඩං | 170 |
| කුඩ්ඩපාදෙ | 46 |
| කුඩ්ඩලෙපනමත්තෙන | 208 210 |
| කුඩ්ඩෙ | 4,38, 66 |
| කුණ්ඩිකමත්තිකං | 144 |
| කුන්තකං | 182, 200 |
| කුද්දාලො | 204, 208 |
| කුප්පං | 84 |
| කුම්භං | 294 |
| කුම්භකාරිකං | 114 |
| කුම්භකාරපුත්තං | 548 |
| කුම්භථූණකෙහි | 476 |
| කුරුවින්දක සුත්තියා | 6 |
| කුල්ලකවිහාරො | 588 |
| කුලකුමාරීහි | 112 |
| කුලිත්ථීහි | 112 |
| කුලදාසීහි | 112 |
| කුලධීතාහි | 112 |
| කුලවං | 562 |
| කුලසුණ්හාහි | 112 |
| කුලානුද්දයාය | 296 |
| කුලුඞ්කපාදකං | 146 |
| කුලූපිකං | 506 |
| කුසි | 232 |
| කුළීරපාදකං | 136 |
| කුළීරපාදකො | 136 |
| කූටාගාරසාලායං | 566 |
| කෙයූරං | 8 |
| කෙවලපරිපුණ්ණං | 458 |

| ක | පිට්ඨඞ්කා |
|---|---|
| කෙසා | 86 |
| කොච්ඡං | 138 |
| කොච්ඡෙන | 8 |
| කොටිසම්ඵරෙන | 168 |
| කොට්ටාපෙන්ති | 502 |
| කොට්ටෙත්වා | 562 |
| කොට්ඨකං | 48, 168 |
| කොට්ඨකො | 40, 152, 340, 366 |
| කොණෙ | 94 |
| කොපීනං | 20 |
| කොසජ්ජාය | 482 |
| කොසෙය්‍යං | 182, 200 |

ඛ

| | |
|---|---|
| ඛජ්ජකභාජකො | 230 |
| ඛජ්ජකං | 230 |
| ඛණ්ඩඵුල්ලං | 170, 548 |
| ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං | 548 |
| ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණමත්තෙන | 208, 210 |
| ඛත්තියා | 432 |
| ඛන්තිං | 324, 326 |
| ඛම්භකතෙන | 350, 352, 356 |
| ඛලිකාය | 114 |
| ඛාදනීයං | 70, 166 |
| ඛායිතබන්ධනානි | 132 |
| ඛුද්දානුඛුද්දකානි | 552 |
| ඛුරභණ්ඩං | 86 |
| ඛුරසිපාටිකං | 86 |
| ඛුරසිලං | 86 |
| ඛුරං | 86 |
| ඛෙත්තං | 246 |
| ඛෙළං | 372 |
| ඛෙළමල්ලකො | 220, 338, 366, 380, 398 |
| ඛෙළාසකස්ස | 270 |

ග

| | |
|---|---|
| ගඞ්ගාමහියා | 526 |
| ගණ්ඨිකං | 94, 350, 376 |
| ගණ්ඨිකාඵලකං | 94 |
| ගණකමහාමත්තා | 76 |
| ගණභොජනෙ | 296 |
| ගණ්ඩමත්තිකං | 144 |
| ගණ්ඩිකාධානමත්තෙන | 210 |
| ගෙණ්ඩා | 512, 516 |

| ග | පිට්ඨඞ්කා |
|---|---|
| ගන්ධබ්බහත්ථකෙන | 6 |
| ගබ්භපමුඛෙ | 586 |
| ගමිකා | 344 |
| ගරුධම්මං | 384, 532 |
| ගරුධම්මෙ | 472 |
| ගරුනිස්සයං | 586 |
| ගහපති | 160 |
| ගහපතිකා | 12 |
| ගහපතිචීවරං | 298 |
| ගහපතිං | 162 |
| ගාමක්ඛෙත්තානි | 258, 260 |
| ගාමකාවාසං | 196 |
| ගාමකො | 166 |
| ගාමන්තරකප්පො | 566, 580 |
| ගාමපොද්දවා | 2 |
| ගිරග්ගසමජ්ජො | 140 |
| ගිහීගතානි | 552, 554 |
| ගිහිනිවත්ථං | 96 |
| ගිහිවිකතං | 182 |
| ගුණකං | 92 |
| ගුත්තාගුත්තං | 226 |
| ගෙරුකපරිකම්මකතා | 338, 398 |
| ගෙරුකපරිකම්මං | 38, 44, 48, 142 |
| ගෙරුකපරිකම්මකරණමත්තෙන | 208, 210 |
| ගොසංසිකාය | 38 |
| ගොණකං | 182 |
| ගොණකො | 200 |
| ගොයොනියා | 82 |
| ගොලොමිකං | 86 |
| ගොහනුකෙන | 502 |

ඝ

| | |
|---|---|
| ඝටකං | 72 |
| ඝටිකං | 44, 48, 108, 132, 334 |
| ඝටිකාය | 114 |
| ඝටීකටාහෙ | 30 |
| ඝංසාපෙන්ති | 502 |
| ඝොසො | 160 |

ච

| | |
|---|---|
| චක්කභෙදං | 296 |
| චක්කභෙදය | 302 |
| චක්කලිකන්තරිකාය | 134 |
| චක්කලිකං | 218 |

ච — පිට්ඨඞ්කා

චක්ඛුමන්තා 164
චක්ඛුමං 42
චඞ්කමණවෙදිකං 44
චඞ්කමණසාලා 44, 168
චඞ්කමා 162
චඞ්කමෙ 168
චණ්ඩස්ස 268
චතුක්කණ්ණකං 96
චතුරස්සකං 86
චන්දනගණ්ඨි 18
චන්දනසාර 18
චන්දිමසුරියානං 568
චප්පු චප්පු කාරකං 352
චම්මපවෙඨන 500
චමරිවීජනිං 74
චයො 36, 42, 48; 150
චරති 562
චලකානි 30
චාතුද්දිසස්ස 130
චික්ඛල්ලං 46, 170
චික්ඛල්ලෙන 562
චිඞ්ගුලකෙන 114
චිත්තකං 182
චිත්තකො 200
චීරපත්තං 588
චිලිමිකා 140
චීවරපටිග්ගාහකො 226
චීවරභාජකො 228
චීවරභිසිකා 562
චීවරරජ්ජු 38
චීවර රජ්ජුං 44, 50. 148, 390
චීවරරජ්ජුයා 374
චීවරවංසං 38, 44, 50, 148, 374, 390
චුණ්ණං 370
චුණ්ණෙන 536
චෙලපත්තිකං 70
චොළකං 38, 380
චොළපවෙඨන 500
චොළභිසිං 140
චොළවට්ටියා 500
චොළවෙණියා 500

ඡ

ඡඩ්ඩිතං 508
ඡත්තපග්ගාහිතා 334

ඡ — පිට්ඨඞ්කා

ඡත්තං 76
ඡදනෙසු 292
ඡන්දගතිං 226
ඡන්නං 298
ඡබ්බග්ගියා 490
ඡළිහිතත්තං 162, 168
ඡමාය 26, 34, 134, 350
ඡමායං 176
ඡළභිඤ්ඤා 174, 176
ඡවස්ස 270
ඡවිං 140
ඡළභිඤ්ඤා 174, 176
ඡාපො 176
ඡාරිකා 370
ඡින්නපපාතං 544
ඡෙදනකෙ 596

ජ

ජඝනං 502
ජතුමයං 36
ජන්තාඝරං 42, 44, 390, 406
ජන්තාඝරපීඨං 46, 370, 390, 408
ජන්තාඝරෙ 168, 368
ජන්තාඝරසාලං 50
ජන්තාඝරසාලායො 168
ජනෙත්තියා 472, 556
ජලොගි 566
ජලොගිපාතුං 580
ජාතරූපරජතං 566, 570
ජායායො 482, 484, 486, 494
ජාරියො 482, 484, 486, 494
ජාරෙන 506
ජාලවාතපානං 134
ජිගුච්ඡමානො 562
ජිණ්ණා 270
ජිව්හානිච්ඡාරකං 352

ඣ

ඣාතමනුස්සා 168

ඤ

ඤාතධම්මො 428

| ත | පිට්ඨඞ්කා |
|---|---|
| තගර | 572 |
| තජ්ජනීයං | 384, 402 |
| තථාගතප්පවෙදිතෙ | 468 |
| තන්තකං | 92 |
| තන්තභණ්ඩකං | 92 |
| තාලච්ඡිද්දං | 44, 48, 108, 132 |
| තාලවණ්ටං | 74, 96 |
| තාලානි | 132 |
| තිකභොජනං | 296 |
| තිකොටිපරිසුද්ධං | 300 |
| තිණචුණ්ණං | 38, 108 |
| තිණච්ඡදනං | 46 |
| තිණච්ඡදනා | 134, 148 |
| තිණභිසිං | 140 |
| තිණසන්ථාරකං | 26, 34, 134 |
| තිණ්ණවිචිකිච්ඡො | 164, 282 |
| තිත්තිරො | 174 |
| තිත්ථායතනං | 534 |
| තිමණ්ඩලං | 350 |
| තිරච්ඡානවිජ්ජං | 102 |
| තිරීටකං | 504 |
| තිරොකරණීයං | 146 |
| තිංසවස්සිකං | 210 |
| තුන්නවායස්ස | 170 |
| තුම්හො | 262, 264 |
| තුම්බකටාහෙ | 28 |
| තූලිකං | 182, 200 |
| තූලිකා | 140 |
| තෙචීවරිකා | 576 |
| තෙලං | 232 |
| තෙලපජ්ජොතං | 164 |
| තෙවිජ්ජා | 176 |
| තොරණං | 156 |

| ථ | |
|---|---|
| ථකිතා | 90 |
| ථද්ධං | 472 |
| ථනං | 492 |
| ථෙමෙත | 4 |
| ථරුසිප්පං | 114 |
| ථාලිපාකසතානි | 258, 266, 268 |
| ථුසපිණ්ඩං | 142,144 |
| ථෙව | 402 |

| ද | |
|---|---|
| දණ්ඩකථිනං | 34 |
| දණ්ඩපරිස්සාවනං | 42 |
| දණ්ඩසත්ථකං | 30 |
| දණ්ඩසම්මුති | 78, 80, |
| දණ්ඩසික්කං | 78 |
| දණ්ඩසික්කාසම්මුති | 82 |
| දන්තකට්ඨං | 98, 372, 406 |
| දන්තමයං | 36 |
| දන්තමංසං | 502 |
| දබ්බා | 60 |
| දවඩාහෙ | 98 |
| දසා | 92 |
| දළිද්දස්ස | 170 |
| දයිකං | 86 |
| දානකථං | 162 |
| දානානි | 166 |
| දායං | 98 |
| දාරුමයං | 36, 42, 44, 48 |
| දාරුපත්තං | 114 |
| දාරුපාකාරං | 48 |
| දාරුපාදුකං | 114 |
| දාරුභණ්ඩං | 114, 204, 208 |
| දාරුසන්ථරං | 46 |
| දාරුසොපානං | 36, 44, 48 |
| දාසෙ | 158 |
| දිට්ඨධම්මසුඛවිහාරං | 270 |
| දිට්ඨධම්මො | 164, 182 |
| දිට්ඨසුතපරිසඞ්කිතො | 442 |
| දිට්ඨිං | 324, 326 |
| දිට්ඨිගතං | 384, 408 |
| දිට්ඨිවිපත්ති | 438 |
| දිවාදිවස්ස | 276 |
| දිසාකුසලෙන | 362 |
| දිසාභාගං | 358, 360 |
| දීඝදසානි | 504 |
| දීඝාසනෙ | 200 |
| දුක්ඛී | 468 |
| දුචුල්ලං | 322 |
| දුබ්බුද්ධිනො | 276 |
| දුභරතාය | 482 |
| දුම්මඞ්කූනං | 296 |
| දුම්මනා | 468 |
| දුරක්ඛාතධම්මො | 480 |
| දුරනුසිට්ඨා | 514 |
| දුස්ස පවෙට්ටන | 500 |

ද — පිට්ඨඞ්කා

දුස්සවණ්ණිජ්ජං 560
දුස්සවට්ටියා 500
දුස්සවෙණියා 500
දුස්සීලො 432
දුස්සෙහි 70
දූතෙය්‍යං 312
දෙඩ්ඩුභකං 92
දෙව 164
දෙසන්තරො 460
දෙසාගතිං 226
ද්වඞ්ගුලකප්පො 566, 580
ද්වාරං 160, 370
ද්වාරට්ඨපනමත්තෙන 208, 210
ද්වාරවාතපානං 344

ධ

ධනා 458
ධනුකලාපං 280
ධනුකෙන 114
ධම්මං 164
ධම්මකථා 384
ධම්මකථිකො 174
ධම්මකරකං 38, 582, 584
ධම්මකරකො 232
ධම්මචක්ඛුං 162, 282
ධම්මමුදිතස්ස 462
ධම්මවොදකස්ස 462
ධම්මදෙසනා 162
ධම්මො 164
ධාරාසම්ඵස්සං 536
ධුවචොළා 512, 516
ධුවලොහිතා 512, 514
ධූමකාලිකං 210, 252, 554
ධූමනෙත්තං 46
ධූමරජො 568
ධොතපාදකං 72

න

නක්ඛත්තපදානි 358, 360, 362
නඛච්ඡෙදනං 86
නඛෙහි 84
නන්දිමුඛී 424
නමතකං 56, 86 502
නලාටිකං 114
නවකම්මං 170, 208, 530

න — පිට්ඨඞ්කා

නහානං 378
නළමයං 36
නළො 268
නාගදන්තකං 148
නාගදන්තෙ 38
නාගො 292
නානාසංවාසකො 178
නාළිකාගබ්භං 146
නික්ඛිත්තමණිසුවණ්ණා 566, 572
නික්කුජ්ජිතං 164
නිඛාදනං 204, 208
නිදහිතබ්බා 388
නිප්පාතිතා 254, 254
නිප්පීළියමානා 506
නිප්පීළියමානො 584
නිබ්බුජ්ඣන්ති 114
නිමන්තනං 222, 298, 300
නිමිත්තමත්තා 512, 514
නියස්සං 384, 402
නිරූපධි 162
නිරොධධම්මං 162, 282
නිල්ලොකෙතබ්බා 336
නිසීදනපච්චත්ථරණං 338, 366, 380
නිස්සයෙ 520, 530
නිස්සිමෙ 194, 212
නිහතං 598
නීචවත්ථුකා 36
නීචවත්ථුකො 42, 48
නෙක්ඛම්මෙ 162
නෙත්ථාරං 402

ප

පකරණෙ 196
පකුඩ්ඩං 148
පක්ඛමානත්තං 472
පක්ඛිකං 222
පඝාහිකසාලා 560
පඞ්සරන්ති 512, 514
පසනං 748
පඩගණෙ 362
පඩගවීරෙන 114
පච්චක්ඛාතකො 442
පච්චාදන කථා 442
පච්චාසිංසිතබ්බා 472
පච්චුට්ඨානං 472

ප — පිට්ඨඞ්කා

පච්චූස සමයං 162, 588
පච්ඡායායං 286
පච්ඡාසමණං 376
පච්ඡිමකො 194
පජාපති 354
පඤ්චපටිකං 38, 44, 48, 52, 144
පඤ්චඞ්ගුලිකං 54
පඤ්චුත්තරාසඞ්ඝසතානි 558, 560
පටඞ්ගිං 98
පටලිකං 182
පටලිකා 200
පටි ක්කෙන්තෙන 128
පටිකං 182
පටිකා 200
පටිකාතබ්බා 484
පටිග්ගහං 36
පටිච්ඡන්නං 164
පටිච්ඡන්නකම්මන්තං 426
පටිනිවාසනං 388, 376, 406
පටිපථං 282, 284
පටිභානචිත්තං 144
පටිවිංසං 566
පටිසල්ලානසාරුප්පං 166
පටිසාමෙතබ්බං 358
පටිසායිතුං 232
පටිසාරණීයං 384, 402
පටිසාරණීයකම්මං 568
පටිසොතෙ 536
පට්ටිකාය 224
පෙටවිත 500
පණ්ඩකං 200
පණ්ඩකො 178
පණ්ණභිසිං 140
පණීසම්ඵස්සං 534
පතිකුටිතො 294
පතිමානෙන්තා 198
පත්තකණ්ඩොලිකං 26
පත්තගාහාපකො 234
පත්තධම්මො 164, 282
පත්තනිල්ලෙහකං 352
පත්තපරියාපන්නං 376
පත්තමාලකං 26
පත්තමණ්ඩලානි 24
පත්තාධාරකං 24
පත්තමූලං 506
පත්තාළ්හකෙන 114
පත්තුක්කුජ්ජනං 64, 66
පත්ථොදන 280
පථව්‍යා 586
පදක්ඛිණං 164
පදරසිලං 48, 110, 154
පන්නලොමො 256
පපටිකා 286
පපාතො 428
පබ්බාජනීයං 34, 402
පරචිත්තවිදූනො 436
පරදවුත්තා 256
පරවිසයං 252
පරාභවාය 268
පරාමසන්තා 294
පරිකම්මං 374
පරික්ඛාරං 582, 580
පරික්ඛාරො 404
පරිත්තානකිටිකං 148
පරිපුච්ඡාය 404
පරිප්ඵොසිත්වා 338
පරිභණ්ඩං 34, 232, 370, 562
පරිභණ්ඩකරණමත්තෙන 208, 210
පරිභණ්ඩෙන්ත 26
පරිභාසිතබ්බා 474
පරිමණ්ඩලං 350
පරිමණ්ඩලො 352
පරිමුඛං 86
පරියත්තා 588
පරියාදින්නචිත්තස්ස 258
පරියාදින්නචිත්තො 314
පරියුට්ඨිතචිත්තො 556
පරියුට්ඨිතා 526
පරියොගාළ්හධම්මො 164. 282
පරියොදනං 262
පරියොසිතං 210
පරිවාසං 384
පරිවෙණං 110, 366, 400
පරිවෙණානි 168
පරිසඞ්කාය 524
පරිසුද්ධකායසමාචාරො 456
පරිසුද්ධසීලො 262
පරිස්සාවනං 38, 232, 582, 584
පරිහාරපථෙ 112

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පරිහීනලාභසක්කාරො | 294 |
| පරූපක්කමෙන | 288 |
| පලාලපීඨං | 138 |
| පලාලපුඤ්ජ | 128 |
| පලාලානි | 246 |
| පලිඝං | 156 |
| පලිතං | 88 |
| පලොකධම්මං | 544 |
| පල්ලඞ්කං | 114 |
| පල්ලඞ්කෙන | 534 |
| පල්ලත්ථිකා | 200 |
| පල්ලත්ථිකාය | 350 |
| පවත්තිනී | 512, 516 |
| පවාළං | 430, 432 |
| පවුත්ථපතිකා | 506 |
| පසන්නචිත්තං | 162 |
| පසාදෙ | 168 |
| පසාරිතෙන | 128 |
| පසුකා | 154 |
| පස්සාවං | 106 |
| පස්සාවකුටියො | 168 |
| පස්සාවකුම්භිං | 106 |
| පස්සාවදොණිකං | 108 |
| පස්සාවපාදුකං | 106 |
| පහට්ඨකණ්ණවාලො | 292 |
| පහරණිං | 114 |
| පහිතත්තා | 480 |
| පහිතත්තො | 562 |
| පංසුකිතං | 34 |
| පංසුකිතානි | 134, 218 |
| පංසුකූලිකා | 298, 300, 576 |
| පාටඞ්කිං | 526 |
| පාටිපදිකං | 222 |
| පාතිමොක්ඛට්ඨපනං | 436 |
| පාතිමොක්ඛුද්දෙසකො | 496, 592 |
| පාදං | 566 |
| පාදකඨලිකං | 340, 342, 390 |
| පාදකොච්ඡං | 502 |
| පාදපංසුනි | 294 |
| පාදපීඨං | 340,342,390 |
| පාදපුඤ්ඡනිං | 218 |
| පාදපුඤ්ඡනියො | 560 |
| පාදෙසු | 162 |
| පාදොදකං | 376 |

| ප | පිට්ඨඞ්කා |
|---|---|
| පානාගාරං | 502 |
| පානීයං | 150 |
| පානීයථාලකො | 352 |
| පානීය සඞ්ඛං | 152 |
| පානීය සරාවකං | 152 |
| පාපධම්මො | 432 |
| පාමඞ්ගං | 8 |
| පාසකං | 94 |
| පාසකඵලකං | 94 |
| පාසාදං | 156 |
| පිට්ඨමද්දං | 142 |
| පිට්ඨිං | 2 |
| පිට්ඨිසඞ්ඝාටං | 44, 48, 108, 132 |
| පිණ්ඩනික්ඛෙපමත්තෙන | 208, 210 |
| පිණ්ඩපාත පටික්කන්තො | 304 |
| පිණ්ඩපාතිකා | 576 |
| පිණ්ඩපාතො | 376 |
| පිණ්ඩුක්ඛෙපකං | 352 |
| පිතාමහා | 248 |
| පිත්තං | 98, 268 |
| පිසාචිල්ලිකා | 88 |
| පීඨං | 204 |
| පීඨභිසිං | 140 |
| පීඨිකං | 138 |
| පීඨිකා | 138 |
| පුග්ගලිකං | 530 |
| පුඤ්ජං | 246, 344 |
| පුත්තා | 252 |
| පුථුපාණිකං | 6 |
| පුප්ඵදසානි | 504 |
| පුබ්බණ්හසමයං | 70, 166 |
| පුරාණමල්ලී | 504 |
| පුරිමකො | 194 |
| පුරිසන්තරෙන | 526 |
| පුරිසත්ථෙනෙ | 536 |
| පුරිසබ්‍යඤ්ජනං | 508 |
| පුරිසයුත්තෙන | 526 |
| පූගස්ස | 14, 84, 346 |
| පෙසලානං | 296 |
| පෙසියමානා | 234 |
| පොක්ඛරණියො | 168 |
| පොටකිතූලං | 140 |
| පොත්ථනිකං | 276 |
| පොරාණං | 176 |

| ඵ | පිට්ඨඞ්කා |
| --- | --- |
| ඵණකෙන | 8 |
| ඵණදසානි | 504 |
| ඵරසු | 204, 208 |
| ඵලං | 176 |
| ඵලකං | 138 |
| ඵලකපාදකං | 138 |
| ඵලභාජකො | 228 |
| ඵලමයං | 36 |
| ඵාණිතං | 232 |
| ඵාසුකෙ | 500 |
| ඵාසුවිහාරං | 68 |

| බ | |
| --- | --- |
| බ්‍යාහරිතබ්බං | 352 |
| බ්‍රහ්මං | 302, 324 |
| බ්‍රහ්මචාරිපටිඤ්ඤං | 426 |
| බ්‍රහ්මදණ්ඩො | 558, 562 |
| බන්ධනමත්තං | 90 |
| බන්ධනරජ්ජු | 38 |
| බන්ධනසුත්තකං | 36, 38 |
| බබ්බජං | 204, 208 |
| බහිද්වාරකොට්ඨකා | 426 |
| බහිද්වාරකොට්ඨකෙ | 470 |
| බහුඉජ්ජිකානි | 476 |
| බහුමිත්තො | 166 |
| බහුස්සුතො | 458 |
| බහුසහායො | 166 |
| බාහුප්පචාලකං | 352, 356 |
| බාහුල්ලාය | 302 |
| බාහුලිකො | 302 |
| බාළ්හතරං | 508, 510 |
| බිදලමඤ්චකං | 134 |
| බිම්බොහනං | 140, 200, 204 |
| බුද්ධපමුඛං | 164 |
| බුන්දිකාබද්ධං | 136 |
| බොජ්ඣඞ්ගානි | 432 |

| භ | |
| --- | --- |
| භගිනී | 84 |
| භගිනිපතිකො | 158 |
| භණ්ඩනකාරකො | 196 |
| භණ්ඩනං | 456 |
| භණ්ඩනජාතා | 486 |
| භණ්ඩාගාරිකො | 226 |

| භ | පිට්ඨඞ්කා |
| --- | --- |
| භත්තං | 98, 164 |
| භත්තග්ගෙ | 346 |
| භත්තපටිපාටි | 42 |
| භත්තවිස්සග්ගං | 582 |
| භත්තානි | 158 |
| භත්තාභිහාරො | 258, 266, 268 |
| භත්තිකම්මං | 142 |
| භත්තුද්දෙසකං | 222 |
| භද්දපීඨං | 136 |
| භද්දෙ | 258 |
| භද්‍රානි | 16 |
| භයාගතිං | 226 |
| භස්සකාරකො | 196 |
| භස්සානි | 590 |
| භාතරෙ | 252 |
| භාවං | 324, 326 |
| භිංකච්ඡාපා | 312 |
| භික්ඛග්ගෙන | 566 |
| භික්ඛුදූතෙන | 528 |
| භික්ඛුනූපස්සයං | 482 |
| භික්ඛුනොවාදකො | 496 |
| භික්ඛුසඞ්ඝං | 164 |
| භිත්ති | 170 |
| භිත්තිඛීලං | 148 |
| භිත්තිඛීලෙ | 38 |
| භිය්‍යො | 352 |
| භිසමුළාලං | 312 |
| භිසි | 204 |
| භිසිච්ඡවියො | 560 |
| භිසිබිබ්බොහනං | 336, 380 |
| භුජිස්සා | 512, 516 |
| භුත්තාවිං | 166 |
| භුම්මත්ථරණං | 336, 366, 380, 382, 398, 560 |
| භූමි | 588 |
| භුසිකා | 246 |
| භූතකාලො | 514, 516 |
| භූතා | 16 |
| භෙදානුවත්තකා | 310 |
| භොජනීයං | 70, 166 |

| ම | |
| --- | --- |
| මංකු | 508 |
| මංසප්පමාණෙන | 86 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මක්කටො | 174 |
| මක්කටදන්තකං | 22, 38, 44, 48, 52, 144 |
| මකසකුටිකං | 42 |
| මකසවිජනී | 74 |
| මග්ගං | 164 |
| මඞ්ගලිකා | 104 |
| මච්ඡමංසං | 298 |
| මච්ඡවාළකං | 96 |
| මජ්ජං | 112 |
| මජ්ඣිමපටිපදා | 138, 336, 338, 366, 380, 382 |
| මඤ්චභිසිං | 140 |
| මඤ්චො | 204 |
| මඤ්ජරිකං | 112 |
| මඤ්ජෙට්ඨිකා | 476 |
| මණ්ඩනකජාතිකො | 474 |
| මණ්ඩපෙ | 168, 336 |
| මණ්ඩලං | 232 |
| මණ්ඩලිකං | 46 |
| මත්තං | 14 |
| මත්තිකං | 536 |
| මත්තිකා | 370 |
| මත්තිකාදොණිකං | 46 |
| මත්තිකාභණ්ඩං | 114, 204, 208 |
| මද්දවීණං | 92 |
| මධු | 232 |
| මධුසිත්ථක | 88 |
| මන්දාරවපුප්ඵං | 544 |
| මනසානුපෙක්ඛිතා | 458 |
| මනුස්සරාහසෙය්‍යකං | 166 |
| මනුස්සවිග්ගහෙ | 550 |
| මනුස්සො | 166 |
| මනොසිකාය | 114 |
| මනොසිලිකාය | 502 |
| මරුම්බං | 48, 152 |
| මල්ලකෙන | 6 |
| මල්ලමුට්ඨිකා | 2 |
| මස්සුං | 86 |
| මසාරකං | 134 |
| මසාරගල්ලං | 430, 432 |
| මහග්ඝිකො | 168 |
| මහන්තතරො | 174 |

| ම | පිට්ඨඞ්කා |
|---|---|
| මහාපුරිසවිහාරො | 588 |
| මහාමත්තා | 168 |
| මහායඤ්ඤෙ | 158 |
| මහාසඤ්ඤ | 286 |
| මහිකා | 568 |
| මහිලාථූපො | 536 |
| මළොරිකං | 56 |
| මාණවො | 68 |
| මාතිකාධරො | 576, 578 |
| මාතුගාමො | 200 |
| මාතුච්ඡා | 472, 556 |
| මානත්තාරහො | 384 |
| මානස්සිනො | 254 |
| මාලාගන්ධවිලෙපනං | 112 |
| මාලාවච්ඡං | 112 |
| මාසකරූපං | 566 |
| මිගභූතෙන | 256 |
| මිච්ඡාජීවා | 570 |
| මීළ්හෙන | 24 |
| මීසිං | 134 |
| මුක්කං | 196 |
| මුඛනිමිත්තං | 10 |
| මුඛමත්තිකං | 46 |
| මුඛරාගං | 502 |
| මුඛසන්ධි | 486 |
| මුඛොදකං | 376 |
| මුච්ඡිතො | 562 |
| මුඤ්ජං | 204, 208 |
| මුට්ඨස්සතිනියා | 488 |
| මුදුචිත්තං | 162 |
| මුරජං | 92 |
| මූලදායකා | 586 |
| මූලායපටිකස්සනාරහො | 402 |
| මූසිකා | 16 |
| මූළ්හස්ස | 164 |
| මෙත්තාවිහාරෙන | 588 |
| මෙථුනධම්මා | 568 |
| මෙථුනධම්මෙ | 548 |
| මෙරයං | 568 |
| මොක්ඛචිකාය | 114 |
| මොඝපුරිස | 2, 174, 196, 260 |
| මොඝසුත්තකං | 34 |
| මොහාගතිං | 226 |

**ය** පිට්ඨඞ්කා

යථා අකුසලං 280
යථාබාලං 280
යථාමූළ්හං 62, 280
යථාවජ්ජෙන 114
යථාවුඩ්ඪං 478
යන්තකං 132
යමකකවාටං 156
යාගු 158, 376, 406
යාගුභාජකො 228
යානුග්ගසාතෙන 526
යාවජීවිකං 210

**ර**

රක්ඛාවරණගුත්තියා 286
රජ්ජං 292
රජතං 162, 402
රජෙන 380
රජොකිණ්ණෙන 470
රජොහරණං 562
රත්තියා 70 160, 162
රථකෙන 114
රථපුරං 182, 200
රථිකාය 24, 484, 486, 504
රථියාය 508
රසහරණියො 98
රාජඤ්ඤතක 292
රාජන්තෙපුරෙ 570, 572
රාජභටී 512, 516
රාහු 568
රුක්ඛතූලං 140
රුක්ඛමූලිකා 298
රුක්ඛමූලෙ 172
රුදමානා 468
රුහිරං 286
රොමන්ථකො 82

**ල**

ලුඤ්චන්ති 502
ලතාතූලං 140
ලසුණං 104
ලහුට්ඨානං 68
ලාභසක්කාරසිලොකං 268
ලාභසක්කාරසිලොකෙන 258
ලුබ්භසනකා 298

**ල** පිට්ඨඞ්කා

ලෙසකප්පෙන 188
ලොකායතං 100
ලොණරසො 428
ලොමං 402
ලොමහංසො 160, 162
ලොහකටාහං 204, 208
ලොහකුම්භී 204, 208
ලොහතාලං 132
ලොහභණ්ඩං 90, 114
ලොහභාණකං 204, 208
ලොහමයං 36
ලොහවාරකො 204, 208
ලොහිතමක්ඛා 430, 432
ලොහිතකූපධානං 200

**ව**

ව්‍යාකරමානො 572
වූළ්හෙ 484, 486
වඞ්ගුලියො 134
වඩ්ඪනකෙන 114
වච්චං 106, 176
වච්චකුටියො 168
වච්චකුටිං 108
වච්චකූපං 106
වච්චකූපම්හි 372, 374
වච්චපාදුකං 108
වච්චපාදුකාය 374
වච්චමග්ග 370
වච්ඡිතො 344
වචනපථො 478
වට්ටං 92
වටංසකං 112
වඩ්ඪීං 502
වණ්ටිකමාලං 112
වණ්ණෙන 272
වණ්ණපටිකම්මං 534
වත්ථං 162
වධකචිත්තො 280
වධො 286
වනපත්ථො 128
වරං 478
වල්ලිකං 8
වල්ලී 204, 208

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| වස්සාවාසං | 166 |
| වස්සිකමාලං | 474 |
| වස්සිකසාටිකං | 554 |
| වාකභිසි | 140 |
| වාතපානකවාටකං | 134 |
| වාතපානචක්කලිකං | 134 |
| වාතපානභිසිකං | 134 |
| වාදනුපාතො | 572 |
| වාලං | 576, 582 |
| වාලමිගානි | 130 |
| වාලෙ | 200 |
| වාසි | 204, 208 |
| වාසිතකාය | 536 |
| වාසෙතුං | 46 |
| වාළන්තරායෙන | 444 |
| වික්ඛිත්ත රූපො | 158 |
| විකතිකං | 182, 200 |
| විකාලභොජනෙ | 592 |
| විකාලෙ | 112 |
| විග්ගහපරිකම්මං | 6 |
| විග්ගහො | 456 |
| විගතකථංකථො | 282, 164 |
| විඝාතපරිළාහා | 314 |
| විච්ඡිකා | 16, 132 |
| විජනවාතං | 166 |
| විජායන්ති | 512 |
| විතානං | 148 |
| විතුදන්ති | 486 |
| විදලකං | 34 |
| විදිතධම්මා | 164, 282 |
| විධූපකං | 142 |
| විධූපනං | 74 |
| විනයධරො | 174 |
| විනයපරියත්තියා | 198 |
| විනයපුරෙක්ඛාරතා | 462 |
| විනයවඤ්ඤුසම්ං | 594 |
| විනයසංගීති | 564, 598 |
| විනන්ධනරජ්ජුං | 34 |
| විනන්ධන සුත්තකං | 34 |
| විනයාතිසාරෙ | 594 |
| විනිවෙඨියති | 38 |
| විනීවරණචිත්තං | 162, 282 |
| විබ්භන්තා | 534 |
| විමානෙත්වා | 484, 486 |

| ව | පිට්ඨඞ්කා |
|---|---|
| විමුත්තිරසො | 432 |
| විලීවෙන | 500 |
| විලොකිතෙන | 128 |
| විවාදකාරකො | 196 |
| විවාදපන්නා | 486 |
| විවාහො | 158 |
| විසජ්ජිතාවිසජ්ජිතං | 230 |
| විසාණතාලං | 132 |
| විසාණමයං | 36 |
| විසෙසකං | 502 |
| විහාරවත්ථු | 202 |
| විහාරෙ | 166 |
| විහාරො | 202 |
| වීයං | 92 |
| වීසංවස්සසතිකො | 586 |
| වීසතිමට්ඨං | 86 |
| වීසතිවස්සිකං | 210 |
| වුඩ්ඪපබ්බජිතො | 544 |
| වුත්තවාදී | 572 |
| වූපකට්ඨා | 480 |
| වූපකට්ඨො | 562 |
| වෙදිකාවාතපානං | 134 |
| වෙපුරිසිකා | 512, 514 |
| වෙමකං | 92 |
| වෙය්‍යාබාධිකං | 164 |
| වෙලං | 428 |
| වෙස්සා | 432 |
| වෙසාරජ්ජප්පත්තො | 164, 282 |
| වෙසිං | 602 |
| වෙළුගෙග | 18 |
| වෙළු | 204, 208, 268 |
| වෙළුමයං | 36 |
| වෙළුරියො | 430, 432 |
| ඉවළුවට්ටං | 154 |
| වෙහාසං | 574 |
| වොදකං | 380, 388, 390, 406 |
| වොහාරිකෙ | 168 |

ස

| | |
|---|---|
| ස්වාගතානි | 458 |
| සංකස්සරසමාචාරං | 426 |
| සංකිලෙසං | 162 |
| සංකෙතං | 498 |
| සංගීති | 520, 530 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සංයොගාය | 482 |
| සංවෙල්ලියං | 96, 510 |
| සංසරණකිටිකං | 148 |
| සඋත්තරච්ඡදං | 182 |
| සක්‍යපුත්තියා | 432 |
| සක්‍යපුත්තියො | 574 |
| සකටෙහි | 168 |
| සකදාගාමී | 174 |
| සකවණ්ණං | 258 |
| සකාසාවා | 534 |
| සග්ගකථං | 162 |
| සඞ්කච්චිකං | 514 |
| සඞ්කස්සරසමාචාරො | 432 |
| සඞ්කසායන්තියො | 520 |
| සඞ්කාරං | 338, 380 |
| සඞ්ඛනාභිමයං | 36 |
| සඞ්ඛිත්තෙන | 480 |
| සඞ්ඛො | 430, 432 |
| සඞ්ගණිකාය | 482 |
| සඞ්ඝත්ථෙරො | 586 |
| සඞ්ඝනානාකරණං | 456 |
| සඞ්ඝභත්තං | 222 |
| සඞ්ඝභෙදය | 302 |
| සඞ්ඝභෙදං | 296 |
| සඞ්ඝභෙදෙ | 456 |
| සඞ්ඝරත්තෙන | 396 |
| සඞ්ඝරාජි | 318, 456 |
| සඞ්ඝරිනවා | 362 |
| සඞ්ඝවවත්ථානං | 456 |
| සඞ්ඝාටිකණ්ණෙන | 368 |
| සඞ්ඝාටිකණ්ණො | 40 |
| සඞ්ඝාටිපල්ලත්ථිකා | 90 |
| සඞ්ඝාටියො | 356, 376, 406 |
| සඞ්ඝිකං | 202 |
| සඞ්ඛො | 158 |
| සච්චකාලො | 514, 516 |
| සච්චෙ | 464 |
| සඤ්ඤත්තියා | 598 |
| සණ්ඩාසං | 88 |
| සණ්හවත්තිකං | 142 |
| සණ්හෙන | 460 |
| සත්තඞ්ගං | 136 |
| සත්තරසවග්ගියා | 188 |
| සත්තසතිකා | 598 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සත්තාහපරිනිබ්බුතො | 544 |
| සත්තිකාය | 114 |
| සතපදියො | 132 |
| සතපදී | 16 |
| සතවල්ලිකං | 96 |
| සතිපට්ඨානා | 432 |
| සතියා | 160 |
| සත්ථක | 36, 38, 232 |
| සත්ථාරො | 262 |
| සත්ථුසාසනෙ | 164 |
| සද්ධිවිහාරිකා | 376 |
| සන්ථානකං | 338, 380 |
| සන්දස්සිකා | 476 |
| සන්දස්සිතො | 558 |
| සන්දිට්ඨෙ | 454 |
| සන්නිධිකතං | 508 |
| සන්නිධිකාරකභොජනෙ | 592 |
| සන්නිසජ්ජං | 218 |
| සන්තිසින්නගබ්භා | 532 |
| සප්පි | 232 |
| සපදානං | 352 |
| සබ්බකණ්හානි | 504 |
| සබ්බද | 162 |
| සබ්බනීලකානි | 504 |
| සබ්බපීතකානි | 504 |
| සබ්බමඤ්ජෙට්ඨිකානි | 504 |
| සබ්බමහානාමරත්තානි | 504 |
| සබ්බමහාරඞ්ගරත්තානි | 504 |
| සබ්බලොහිතකානි | 504 |
| සබ්බාවන්තං | 426 |
| සම්පත්තං | 294 |
| සම්පහංසිතා | 476 |
| සම්පහංසිතො | 558 |
| සම්බාධෙ | 86 |
| සම්භන්තෙන | 454 |
| සම්භින්නා | 512, 514 |
| සම්මජ්ජිතුං | 72 |
| සම්මිඤ්ජිතෙන | 128 |
| සම්මුඛීභූතෙ | 434 |
| සම්මුඛාපටිඤ්ඤං | 426 |
| සමතිත්තිකො | 350 |
| සමසූපකො | 350, 352 |
| සමාදපිතා | 476 |
| සමාදපිතො | 558 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සමාදානං | 506 |
| සමානාසනිකො | 198 |
| සමුත්තෙජිතො | 476, 558 |
| සමුදයධම්මං | 162, 282 |
| සරජා | 340 |
| සරබූ | 16 |
| සරභඤ්ඤ | 12 |
| සරභාණකං | 578 |
| සරසිං | 312 |
| සරාගාය | 482 |
| සරාජිකාය | 270 |
| සරෙ | 12 |
| සල්ලෙඛවුත්තිනො | 302 |
| සල්ලෙඛස්ස | 296 |
| සලාකං | 34, 324, 326, 594 |
| සලාකහත්ථං | 222 |
| සලාකවාතපානං | 134 |
| සලාකහත්ථෙන | 114 |
| සලාකාය | 224 |
| සවචනීයං | 524 |
| සවත්තියො | 428 |
| සහධම්මිකො | 572 |
| සහිතාසහිතස්ස | 312 |
| සාකියා | 252, 254 |
| සාගාරං | 532 |
| සාටියගාහාපකො | 232 |
| සාමග්ගිං | 446 |
| සාමණකං | 582, 584 |
| සාමණෙරපෙසකො | 234 |
| සාමණෙරෙ | 98 |
| සාමීචිකම්මං | 472 |
| සාමුක්කංසිකා | 162, 282 |
| සාරෙතබ්බා | 524 |
| සාලික්ඛෙත්ත | 476 |
| සාලින්දං (පාසාදං) | 200 |
| සාලොකෙ | 502 |
| සාසපකුණ්ඩං | 144 |
| සික්ඛාය | 18, 80 |
| සික්ඛාසම්මුතිං | 80 |
| සික්ඛාපච්චක්ඛානං | 534 |
| සිඛරිණී | 512, 514 |
| සිඞ්ගිලොණකප්පො | 566, 578 |
| සිඞ්ඝාටකෙ | 484, 486 |
| සිත්ථතෙලකං | 144 |

| ස | පිට්ඨඞ්කා |
|---|---|
| සිත්ථතෙලකෙන | 8 |
| සිත්ථානි | 84 |
| සිත්ථාවකාරකං | 352 |
| සිනානං | 406 |
| සිරිංසපන්තරායෙන | 444 |
| සිරිංසපානි | 16 |
| සිරිංසපෙ | 130 |
| සිලාචයං | 36, 42, 44, 48 |
| සිලාපාකාරං | 48 |
| සිලාසන්ථරං | 46 |
| සිලාසොපානං | 36, 44, 48 |
| සිවිකං | 526 |
| සිවිකාගබ්භං | 146 |
| සීතකාලො | 382 |
| සීතිභූතො | 162 |
| සීලකප්පං | 162 |
| සීලවිපත්ති | 438 |
| සීසපච්ඡවාලකං | 352, 356 |
| සීසප්පමාණං | 140 |
| සුකොට්ටිත | 336, 342 |
| සුඤ්ඤතාවිහාරෙන | 588 |
| සුඤ්ඤාගාරෙ | 166 |
| සුත්තකං | 510 |
| සුත්තන්තරිකායො | 34 |
| සුත්තන්තිකො | 174 |
| සුත්තවට්ටියා | 500 |
| සුත්තවිභඞ්ගෙ | 594 |
| සුත්තවෙණියා | 500 |
| සුත්තසො | 458 |
| සුතධරො | 458 |
| සුතසන්නිචයො | 458 |
| සුද්දා | 432 |
| සුද්ධාවාසකායිකා | 582 |
| සුප්පටිවිද්ධා | 458 |
| සුප්පධංසියානි | 476 |
| සුප්පවත්තිනි | 458 |
| සුපටිච්ඡන්නෙන | 352, 356 |
| සුරං | 568 |
| සුරුසුරුකාරකං | 352 |
| සුවිනිච්ඡිතානි | 458 |
| සුසංවුතෙන | 352, 356 |
| සුසානං | 404 |
| සූචි | 232 |

ස පිට්ඨඞ්කා

සූචිකං 30, 38, 44, 48, 108, 132
සූචිඝටිකං 426
සූචිඝරං 582, 584
සූචියො 36
සූනං 502
සූනෙහි 470
සූපානි 158
සෙඛසම්මතානි 336, 342
සෙට්ඨි 158
සෙතට්ඨිකා 476
සෙතවණ්ණකරණමත්තෙන 208, 210
සෙනාසනං 194, 218
සෙනාසනගාහා 194
සෙනාසනගාහාපකං 190
සෙනාසනපඤ්ඤාපකො 224
සෙම්හං 98
සෙය්‍යායො 172
සොතාපත්තිඵලසච්ඡිකිරියාය-පටිපන්නො 434
සොතාපන්නො 174
සොපාණකලෙබරං 70
සොපාණෙ 108
සොභකං 92
සොසානිකො 134
සොසො 512, 516

හ පිට්ඨඞ්කා

හට්ඨා 300
හත්ථකොච්ඡං 502
හත්ථත්ථරං 182, 200
හත්ථනිද්ධුනකං 352
හත්ථනිල්ලෙහකං 352
හත්ථඵණකෙන 8
හත්ථහත්ථං 142
හත්ථවට්ටකං 526
හත්ථවිකාරෙන 358
හත්ථවිලඞ්ඝකෙන 358
හත්ථාභරණං 8
හත්ථිනාගො 174
හත්ථිභණ්ඩා 292
හත්ථිසොණ්ඩිකං 96
හත්ථී 160
හන්ද 196, 202, 204, 506
හම්මියං 128
හම්මියගබ්භං 146
හම්මියෙසු 292
හරායමානො 562
හරීතකපත්තිකං 502
හිරඤ්ඤං 168, 566

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි

32 ඛුද්දක නිකාය - ජාතක පාලි I

33 ඛුද්දක නිකාය - ජාතක පාලි II

34 ඛුද්දක නිකාය - ජාතක පාලි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාලි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම විදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රුදැවන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

### ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෲවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR

## 助印功德主名錄

**Book Title：BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume1～Volume 14**

**書名：斯里蘭卡巴利文大藏經，第一冊～第十四冊**
**Book Serial No., 書號：SR201～SR214**

**N.T. Dollars：**

401,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,127,200：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,528,300；Print 1,000 sets**
**以上合計，新台幣 1,528,300 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，
崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿毘跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此案所需金額龐大，且分四批出版，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第七冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; January 2013

SR207 - 10864